සිකියම් සහිත

ශ්‍රී සද්ධම්මාවවාද සඞ්ඝයා



සිතියම් සහිත

ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය

සෙංඛඩගලානුවර පොහොයගමඵ විහාරයේ නායක ධූරය දරණ

තිබ්බොටුවාවේ

ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිතාභිධාන

මාහිමියන් විසින්

සම්පාදිතයි.

විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය

පණ්ඩිත වේරගොඩ අමරමොලි

නාහිමියන් විසින් සංශෝධිතයි.

කොළඹ රත්නාකර පොත් වෙළඳ හල මගින්

සීමාසහිත රත්නාකර මුද්‍රණාලයයෙහි

මුද්‍රා පිතයි.

2499

1956

සංක්ෂේපනය

මේ ශ්‍රී සද්ධම්මවංශ සංග්‍රහය වනාහි "ඉතිපි සෝ භගවා" යනාදි පාඨයෙහි සඳහන් වන භව විඩ බුද්ධ ගුණයන්ට අයත් 'සත්ථා' යන පාඨය මුල් කොට ගෙණ සෙංකඩගල නුවර පොහොය මළු විහාරයේ නායක ධුරය ඉසිලූ ව්‍යක්ත බහුශ්‍රැත **කිඹිඹොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිතාභිධාන** මාහිමියන් විසින් හෙළු බසින් සදහම් වැණීම් මුඛයෙන් සම්පාදනය කරණ ලදී.

බුද්ධ වර්ෂ 2289 දී ලඞ්කා රාජ්‍යයට පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා **වැලිවිටි ශ්‍රී ශරණංකර සඞ්ඝරාජ** මාහිමියන් වහන්සේගේ අධිෂ්ඨානුත්තර සහාය ලැබ සියඹ රටින් **උපාලි මහාස්ථවිර** ප්‍රමුඛ සඞ්ඝයා වහන්සේ වැඩමවා ලක්දිව සාකල්‍යයෙන් ම පිරිහී තුබූ උපසම්පදාව නැවතත් පිහිටුවා ලීය. එදා සිදුවූ ප්‍රථම උපසම්පදා වාරයෙහිදීම ඉහතොක්ත නිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිතාභිධාන මාහිමියෝ පස්වෙනිව එම් මාලකයෙහිදී උපසපන්බව් ලැබූහ.

එසේම පොහොය මළු විහාරයේ නායක ධුරයටද රිදී විහාරයේ අධිපති ධුරයටද පත්වූහ.

සතිපට්ඨාන සූත්‍රයට ව්‍යාඛ්‍යානයක් ද, සද්ධම්මෝපායන සන්නයක්ද නිපදවූ මේ මාහිමියෝ කුරුණෑගල පණ්ඩිත පරාක්‍රම බාහු රජතුමන් කල පටන් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් තෙක් ඉතිහාසය **පාලි** පද්‍යයෙන් රචනා කොට මහාවංශයට එකතු කළහ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාට ශ්‍රී මුඛ පාලි සහිත අට්ඨාදශ තෝරා දී බණ කීමෙහි නියුක්තවූද, සාතිරෙක ත්‍රිශතාධික සම්‍ය රාත්‍රික ධම්ම දෙශනාවන් පැවැත්වූද මුන්වහන්සේ වැලිවිට සංඝරාජ මාහිමියන් වහන්සේ ජීවමානව වැඩ සිටියදීම අපවත් වූහ. රාජ නියමයෙන් පෙළහැර කරවා රිදී විහාරයට ගෙණ යනු ලැබූ ශ්‍රී දේහය එහිම ආදාහන කරවා අලු තැන්පත් කරවා එහිම දාගැබක් බැන්ද වීය.

මේ ග්‍රන්ථය වනාහි මහනුවර සමයට අයත් බු: ව. 2316 දී රචිත මාහැඟි ග්‍රන්ථරත්නයකි. ශාසන්‍යභ්‍යුදය අතින් ප්‍රපාතයට වැටී තිබුනු මේ කාලය ක්‍රම ක්‍රමයෙන් එහි දියුණුව

උදුවන්නට ඇරඹුනක් හෙයින් මෙකල භාෂාව ව්‍යක්ත යයි ගණන් ගත නො හැකිය. එහෙත් වර්තමාන භාෂාත්‍රය දියුණුවේ ආරම්භය මෙය වෙයි.

මේ ග්‍රන්ථ කරණයෙහිදී පූජාවලිය හා සාරාර්ථ සංග්‍රහය ඉතා පිහිට වූ බැවි මෙහිම සඳහන් වේ. ශාස්ත්‍රය අතින් එයේ වුවත් ධර්මය අතින් ඉතා ගැඹුරුය. බෞද්ධයෙකු විසින් දන යුතුවූ හැම ධර්ම කොට්ඨාසයක් ම මෙහි සවිස්තරව දක්වා තිබේ. කාට වුවත් මේ ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් පහසුවෙන්ම බහුශ්‍රැතයෙකු ධර්මධරයෙකු විය හැකිය.

බුද්ධ වර්ෂ 2445 දී මුල්ලේරියාවේ පිටුවහල් මහාසංඝරාජ පාදයන් වහන්සේ විසින් සංශෝධිතව මුද්‍රිත වූ ග්‍රන්ථය අපට මේ ශුද්ධියෙහි දී බෙහෙවින් ප්‍රයෝජනවත් විය. එහෙත් එය බොහෝ සෙයින් ආකුල ව්‍යාකුලවයෙන් යුක්තය. ශුද්ධිය ද දුර්ලභය. සැලකිය යුතු ශුද්ධියක වහලක් නො ලැබූ මේ ග්‍රන්ථය දෙදහස් පන්සියයේ සම්බුද්ධ ජයන්ති උත්සවය නිමිත්තෙන් රටේ විසුරුවා හැරීම පිණිස සංශෝධනය කර දුනගොත් මැනවැයි කොළඹ වේල්ල වීදියේ රත්නාකර පොත් වෙළඳහල හිමි ජී. පී. ඩී ගේබ්‍රියෙල් මහතාගේ නියමය පරිදි ඒ මහතාගේ පුත්‍ර සැදුහැවත් ජී. පී. ඩී. ශේනාරත්න මහතා අපට ආරාධනා කෙළේය. ඒ ආරාධනය පිළිගත් අපි මෙය මහත් ආශාසයෙන් තරමක් දුර සංශෝධනයකට පත් කෙළෙමු. මෙහිදී අපට දෙරණියාවේ නාන්දසාර සථවිරයන්ගෙන් ලැබුනු පිටුවහල මේ ග්‍රන්ථ සංශෝධනයෙහිදී ඉතාම පහසු විය. එබැවින් ඒ සථවිරයන්ට ද, ශෝධ්‍යපත්‍ර කියවීමේ දී අතිශයින් උපකාර වූ බද්දේගම ආනන්ද කුඩා උන්නාන්සේට ද රත්නාකර මුද්‍රණාලයා යත්න කාර්‍යමණ්ඩලයේ මහතුන්ට ද අපගේ අවඛක සතුතිය හිමි විය යුතුයි.

පණ්ඩිත වෙරගොඩ අමරමොලි
නායක සථවිර

2499
1956 3. 22 දින
විද්‍යෝදය පිරිවෙණේ දී ය.

අනුක්‍රමණිකා

		පිටු
1.	ආරම්භය	1
2.	'ඉතිපි සෝ භගවා' යනාදී පාඨයෙහි විස්තර වර්ණනා	3
3.	බුද්ධ ගුණ	5
4.	පරිවේදය සංක්ෂේපය	9
5.	පරමාර්ථය	11
6.	ධර්මශ්‍රවණානිසංස	15
7.	ත්‍රිවිධ ශික්ෂා විභාගය	19
8.	කල්ප විභාගය	24
9.	මහා ප්‍රණිධානය	28
10.	ශත්‍රුනාප නම් රජව බුදුබව පැතූ පරිදි ...	31
11.	බ්‍රහ්මදත්ත තාපසයෝ	34
12.	දීපඞ්කර බෝසතාණෝ	36
13.	බ්‍රහ්මදේව බුදුරදුන් කල	39
14.	පුරාණ ගෞතම බුදුරදුන් කල ...	42
15.	තණ්හඞ්කර බුදුරදුන් කල	47
16.	මේඛඞ්කර බුදුරදුන් කල	48
17.	සරණඞ්කර බුදුරදුන් කල	48
18.	දීපඞ්කර බුදුරදුන් වහන්සේ ...	49
19.	සුමේධ තාපසයන් වහන්සේ ...	55
20.	කොණ්ඩඤ්ඤාදී බුදුවරුන් කල ...	61
21.	සිදුහත් කුමරු මහණවීම	68
22.	නිරිපිඬු පිළිගැන්වීම	69
23.	මාර යුද්ධය	71
24.	බුදුවීම	74
25.	සත්සතිය	75
26.	බ්‍රහ්මාරාධනය	77
27.	ධර්මයක් දෙසන්ට වැඩමවීම ...	80
28.	ධර්මයක් දෙසීම	81
29	යස කුල පුතුගේ පැමිණීම	82
30.	ප්‍රථම ධර්මදූත සේවය	85
31.	භද්දවග්ගිය කුමරුන්	86
32.	උරුවෙල් කසුප් දමනය	87

		පිටු
35.	රජගහ නුවරට වැඩමවීම	89
34.	වෙළුවන පූජාව	92
35.	සැරියුත් මුගලන් දෙනම	94
36.	බිම්සර රජහු ප්‍රධාන පිරිසට දහම් දෙසීම ...	97
37.	සුදෙවුන් රජු දූතයන් ඇවීම ...	98
38.	කිඹුල්වත් පුරට වැඩමවීම	101
39.	නැඹන්ගේ මානඝ බිඳීම	104
40.	ශමඝ ප්‍රාතිහාර්‍යය	107
41.	අනාගත වංශ දෙශනාව	114
42.	නිග්‍රොධාරාමය පිළිගැණීම	125
43.	කිඹුල්වතෙහි පිඬු සිඟීම	128
44.	සඳ කිඳුරුදු දෙසීම	135
45.	නන්ද හාමුදුරුවෝ	136
46	රාහුල හාමුදුරුවෝ	138
47.	අනේපිඬු සිටාණෝ	145
48.	දෙවරම් වෙහෙර කරවීම	150
49.	පූර්‍වාරාමය කරවීම	154
50.	විශාඛා උපාසිකාවෝ	158
51.	ෂට් ශාස්තෘන්	161
52.	පෙළහර පාන්ට අවසර ඉල්ලීම ...	164
53.	යමා මඟ පෙළහර පෑම	167
54.	තව්තිසා දෙවලෝ වැඩමවීම ...	169
55.	අභිධම් දෙශනාව	181
56.	දේවෝරෝහණය	184
57.	බුදුරදුන්ගේ ප්‍රශ්න විසඳීනය ...	194
58.	මෛත්‍රේය බෝසතුන් මහණවීම ...	196
59.	බුදුරදුන්ගේ තුරිතා තුරිත වාරිකාව ...	199
60.	පිරිනිවන් පාන්නට වැඩමවීම ...	204
61.	වෛත්‍ය කිරීමට සුදුස්සන්	224
62.	ශ්‍රී දෙඟ ආදාහන පූජාව	234
63.	ධාතු බෙදීම	243
64.	මහා ධාතු පරිනිර්‍වාණය	246
65.	ධර්‍මකාය සමපද් විහාගය	249
66.	ප්‍රථම සංගායනාව	253
67.	ද්විතීය සංගායනාව	263
68	තෘතීය සංගායනාව	266

		පිටු
69.	චතුර්ථ සංගායනාව	272
70.	අටුවා ලිවීමෙන් කළ පංචම සංගායනාව ...	285
71.	ටීකා සම්පාදනය කළ පරිදි ...	294
72.	සඩම් ගුණ වර්ණනා	299
73.	චතුර්විධ ශිෂ්‍යපුත්‍රයන්ගේ පුවත් ...	306
74.	ශාසනාභ්‍යන්තර්ධානය	321
75.	සරණ විභාගානිසංස	325
76.	අකුශල කම් විභාග	357
77.	නීවරණ ධම් විභාග	382
78.	අකුශල මූල	387
79.	එකොළොස් කම් විපාක විභාග ...	393
80.	අකුශල කම් ඵල භූම් (අපාය විභාග) ...	404
81.	ප්‍රේත දුක්ඛ විභාග	426
82.	පංචසීලාදි සමාදාන ප්‍රභේද ...	454
83.	දශකුශලකම් විභාගානිශංස ...	487
84.	සඩම්ශ්‍රවණානිශංස	510
85.	දිවිඇප්ජකම්ම විභාගානිශංස ...	513
86.	චක්‍රවර්ති රාජ්‍ය සම්පත්	515
87.	දිව්‍යරාජ්‍ය සම්පත්	522
88.	බඹලෝ විභාග	532
89.	ආර්‍ය්‍ය පුද්ගල විභාග	536
90.	පසේබුදුවරුන් වහන්සේ	540
91.	සම්‍යක් සම්බුඩියන් වහන්සේ ...	543
92.	රාජධම් විභාගානිශංස	544
93.	ගෘහපතිධම් විභාගානිශංස	557
94.	සාමාන්‍ය සඩම්නුශාසනා	580
95.	ආචාර්‍යොපදාන	581
96.	අවසානය	585

ශ්‍රී සද්ධම්මාවවාද සඞ්ග්‍රහය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

ජිනානුගතමුනිඳං ධම්මසඞ්ඝඤ්ච නත්වා
ඔජිඤාණවිලාසෝ නාමස්ස සම්බුද්ධරංසෙසු,
තිභව - භතවරණෙණසෙකවරණං භහෙත්වා
සකලජනහිතත්ථං වණණයිස්සං ගුණංසුං

සවගී මනුජී පාතාල සංඛ්‍යාත ජගත්‍රය වාසී බ්‍රහ්ම සුරාසුර ගරුඩ ගන්ධබ්බ සිඛි විද්‍යාධර නර නාගා දී සමස්ත සත්ත්ව සමූහයන් තෘප්ති සංයුක්තයෙහි නිරතාභිලාෂී වූ මහාකාරුණික පූජ්‍යපූජනීය දෙවාතිදෙව වූ බුද්ධාදි රත්නත්‍රයට නමස්කාර කිරීමෙන් සඤ්ජනිත වූ කුසලානුභාවයෙන් සමෝපද්‍රව දූරී කරණයෙන් ආයුරාදි චතුර්විධ ධම්මනිවධිනය කොට ගෙණ සද්ධම් සංග්‍රහයක් කරණු කැමැති අප විසින් පළමුකොට ම කෙවල ගාථාවෙන් ඉෂ්ට දෙවතා නමස්කාර කරණු පිණිස,-

ආයාම විස්තාරයෙන් නවලක්ෂ පණස් තනුත දෙසිය හැත්තෑ දුහුලක් පමණ භූමි ප්‍රදේශයෙහි ප්‍රස්තාර කටයුතු වූ තිස්දෙදහස් සත්සිය හැට අවක් වෘත්ත ඇති අතිශක්වරිනම් ශ්‍රද්ධසෙහි සාර දහස් සතිඝ හැත්තෑ දෙවනි තැනින් පාද සතර ම උහුළුවා ගෙණ නගණ දෙනක් මගණ එනක් හා යගණ දෙකකින් සමූපලක්ෂිත වූ මාලිනී නම් වෘත්තයට නාමාරවනාකරණ ලද්දුවූ සතර පාදයෙහි ම විසි ගණයක් හා අකුරු සැටකින්ද, මාත්‍රා අසූ අටකින්ද, ගුරු විසි අවකින්ද, ලඝු දෙතිසකින්ද, විශ්‍රාම අටකින්දැයි මේසේවූ වණී විශෙෂයක් ඇති සම ගණ සම වණී සම මාත්‍රා සම ගුරු සම ලඝු සම ගණව සිටි සම පාද සතර සමඛණ්ඩි වූ ත්‍රිවිධ රත්නාභිවාදනය පිණිස විරචිත මේ ගාථාවෙහි අභිප්‍රාය නම්,-

කෙලෙස මාර දෙවපුත්‍රමාරාදි පස්මරුන් බිඳ දිනූ හෙයින් ද, සම්භාර සොභන සද්ධර්ම නොඳ දෙසීනිය වූ ගමන් ඇති හෙයින් ද, ඒකාන්ත සුන්දරාමෘත නිර්වාණපුරයට පැමිණි හෙයින් ද අගාරික අනගාරික සෙබ අසෙබ ප්‍රත්‍යෙක මුනි සංඛ්‍යාත පඤ්චප්‍රකාර වූ මුනීන්ට ශ්‍රෙෂ්ඨවූ හෙයින් ද. ජිතයුගත මුනීන්ද්‍ර වූ, සුරාසුර නරාදි සමස්ත සත්ත්ව චිත්ත සන්තාන ප්‍රවර්ත්තිත පාප තිමිර විධ්වංශන වතුරතර සතරංසි කිරණයමාණ තථාගත වර ධම්මචක්‍රවර්ති සවාමි වූ සම්‍යක් සම්බුද්ධ සඞ්ඝ රාජෝත්තමයාන්න් වහන්සේ ද, ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසිත හෙයින් සවාකඛාතාදි ගුණොපලක්ෂිත මාගී ඵල නිර්වාණය හා පාලි ධම්ම සඞ්ගීත වූ දශ ප්‍රකාර සද්ධර්මය ද, මනා දෘෂ්ටි ශීල ශ්‍රාමාණ්‍යාදි ගුණ සමූහයන්ගේ සංඝටිත භාවයෙන් සංඝ නම් වූ සුප්‍රතිපන්න ඍජු ගණ ගණාඛ්‍ය සඞ්ඝත ඒකොරස පයත්‍රිජති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සංඛ්‍යාත ත්‍රිවිධ සඞ්ඝීනු පාලිත සමස්ත ලොක වාසීන්ගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ අෂ්ටාශ්‍රී පුද්ගල සංඝයා ද යන මේ සම්සත්ත්ව සම්භිමතාධි ප්‍රදූන යෙන් සුරදැම විනතාමණී හද්‍ර ඝටානුසාර වූ විසුඛ බුඩාදි රත්නත්‍ර යට භය ලොභ කුලාවාරාදීන් දුරුවැ භක්ති ප්‍රෙමාවනතව මාගේ උත්තමාඛ්‍යය කරණකොටගෙණ කායාදි වාරත්‍රයෙන් සදාසා වැද එම වන්දනාමය කුසලානුභාවයෙන් සම්සාරාරය සඛ්ලෙෂපද්‍රව විහත විධ්වංශනය කිරීමෙන් ජයාභිප්‍රාප්තවැ අනන්ත කරුණා සුඛසාගර වූ ඒ සවිනේ ගෙවා දත් බුදුරජාණන් වහන්සේගේ තුන්ලෙවහි පතළා වූ අති විසිතිණී අර්හත්වාදි නවවිධ ගුණ කාරණයන් අතුරෙන් එක් ගුණකාරණයකට වර්ණනාමුඛ යෙන් බැස ගුරුපදෙශ සඞ්ඝීශ්‍රවණ යොනිසො මනස්කාරාදීන් නිපන් මාගේ ප්‍රඥ ශක්ති පමණින් ලෝවැඩ පිණිස මුනි ගුණාඛ්‍ය මාත්‍රයක් වර්ණනා කෙරෙම්.

මෙසේ වූ පූජ්‍යයන්ට කරණලද පූජාව මෙලොව පරලොව දෙකින්ම වැඩ සාදන උතුම් මහුලැයි භාග්‍යවතුන්වහන්සේම වදළ හෙයින් අප විසින් පූජාර්හ වූ බුඩාදි රත්නත්‍රයට නමස්කාර පූජා පිණිස දැක්වූ මේ ගාථාවගේ පූර්වාඞ්යෙහි ප්‍රකාශවූ-**ජින සුගත මුනිඤ්ඣං ධම්ම සඞ්ඝඤ්ඣ නමඤ්ඣා**-යන මේ වන්දනාමය පූර්ව්ක්‍රියාවෙන් සති මඩගලාඛ්‍ය ප්‍රසවය කිරීම් හෙතුකොටගෙණ එහිම අපරාඞ්යෙහි ප්‍රකාශවූ-**තස්ස සම්බුද්ධ රඤ්ඤෝ වණ්ණණත්ථ එකාවණ්ණං වණ්ණ යිස්සං**-යන්නෙන් සම්බුද්ධ ගුණාඛ්‍ය මාත්‍රයක් වර්ණනා කෙරෙම් යන මේ අපරක්‍රියාවගේ අසම්මොහාය අවිගත අඛණ්ඩ අවිකල අචිර පරිසමාප්තිය හා බුඩ සාසනාවසානය තෙක් මේ ප්‍රකරණය තෙම නිත්‍යධ්‍රැව සාර ශුඛ සුඛසම්පත්තියෙන් ශ්‍රොතෘදෙශාදි ලොකාඞ්ප්‍රසවය කෙරේවා යනු මෙහි අභිප්‍රාය යැ.

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධෝ භගවාති.

1. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි අරහං**, සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවිනුදු, සියලු කෙලෙසුන් නැසූ බැවිනුදු, සංසාර චක්‍රයෙහි අර කැපූ බැවිනුදු, ප්‍රත්‍යයාදීන්ට සුදුසු බැවිනුදු, රහසත් පව් නොකරණ බැවිනුදු යන මෙතෙක් අර්ථයෙන් **අර්හත්** නම් වන සේක.

2. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ; **ඉතිපි සම්මා සම්බුද්ධෝ**, සම්මා, මනාකොට; සං, තමා විසින්ම; බුද්ධෝ, සළු ධර්මයන් සර්වඥාරයෙන් දත්සේක. යන මෙතෙක් අර්ථයෙන් **සම්‍යක් සම්බුද්ධ** නම් වන සේක.

3. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි විජ්ජා චරණ සම්පන්නෝ**, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන් සමන්විතය. යන මේ අර්ථයෙක් **විද්‍යාචරණසම්පන්න** නම් වන සේක.

4. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි සුගතෝ**, ශොභන ගමන් ඇති බැවිනුදු, සුන්දර ස්ථානයට ගිය බැවිනුදු, මනා ගමන් ඇති බැවිනුදු, මනා තෙපුල් ඇති බැවිනුදු යන මෙතෙක් අර්ථයෙන් **සුගත** නම් වන සේක.

5. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි ලෝකවිදූ**, සර්වාකාරයෙන් නිමවා සියලු ලෝකය දන්නාසේක. යන මේ අර්ථයෙන් **ලෝකවිදූ** නම් වන සේක.

6. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි අනුත්තරෝ පුරිස ධම්ම සාරථි**, තමන්හට වැඩි කෙනෙකුන් නැති බැවින්ද, පුරුෂදම්‍යයන් විනයකරණ බැවින්ද යන මෙතෙක් අර්ථයෙන් **අනුත්තර පුරිස ධම්ම සාරථි** නම් වනසේක.

7. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි සත්ථා දෙව මනුස්සානං**, දෘෂ්ටධාර්මික සම්පරායික පරමාර්ථ යන මෙයින් සුදුසු සුදුසු පරිද්දෙන් දෙවිමිනිසුන්ට අනුශාසනා කරණසේක. යන අර්ථයෙන් **ශාස්තෘ** නම් වන සේක.

8. **සෝ භගවා**, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි බුද්ධෝ**, සියලු ඥෙය මණ්ඩලය නිමවා දත්සේක. යන මේ අර්ථයෙන් **බුද්ධ** නම් වන සේක.

සෝ භගවා; ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; **ඉතිපි භගවා**, දානශීලාදි සම්භාරත්පාරමිතාවෙන් ජනිතවූ භාග්‍ය ඇති හෙයින් ද රාගාදි කෙලෙසුන් භග්නකළ හෙයින් ද යන මේ ආදි අර්ථයෙන් **භගවත්** නම් වනසේක.

මේ නවගුණය වර්ණනා කරණ පූර්වාචාර්යවරයෝ ඇතැම් තැනෙක **භගවා බුද්ධෝ** යි කියා මූලකි **භගවත්** යන්න හා අන්‍ය යෙහි කි බුඩ යන්නත් ගෙණ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ය යි කියා බුඩ නාමය කිමෙහි යොදු ගෙණ සෙසු පද නවයහට බෙදු අර්ථ වර්ණනා කළහ. මෙහි වනාහි **විශුද්ධිමාර්ග** සන්නයෙහි වූ බුඩානුස්මෘති කාණ්ඩයෙහි ප්‍රකාශ ක්‍රමයන් බලාගෙන එහි මූලකි භගවත් යන්න පමණක් බුඩ නාමය කිමෙහි යොදුගෙන සෙසු පද නවයට බෙදු නවගුණය අති සංක්ෂේපකොට දක්වනලදැයි දත යුතුයි.

මෙසේ නවප්‍රකාරවූ අර්හත්වාදි සකල ගුණ නිධානවූ කාරුණ්‍යයෙන් සිහිල්වූ චිත්ත සන්තාන ඇති අසංඛ්‍යාත බුඩඥානනමැති මහා ප්‍රදීපාලෝකයෙන් දුරුකරණලද ඝනතර මොහාන්ධකාර ඇති අසරණීභූතවූ දෙවී මිනිස් සහිත සියලු සත්ත්වලෝකයාහට අසහාය සරණවූ පාපතිමිර විධ්වංශන වතුරතර සභස්‍රාංශු ප්‍රතිභාග පිවිධොවාද නිරූපිත සඩම් ගඩාප්‍රවාහයට සවණීවලාශමාන වූ බුදුරජාණන් වහන්සේගේ නෛයර්‍යාණික ශාසනාවවර සාධුජන හෘදයාභ්‍යන්තර සුප්‍රතිෂ්ඨිත මාහැඟි පහන් රැකක්මෙන් අතිශයින් දීප්ති මත්වැ බැබලීමෙන් චිත්තානුවර්තී මොහාන්ධකාර විධ්වංශනයකොට සත්ත්වෝපකාරවූ යටින් අවීචිය පටන් උඩින් බඹලොව අවසන් වූ විටින් අනන්තාපරිමාණ සක්වළවල ඉතා උස්ව පිහිටි ණිවූ පවත් නාවූ **"ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුඩෝ"** යනාදි මේ නවගුණ පාඨයාගේ නවපෙදෙහි සඩහැකිතව සිටි අතුල්‍යවූ අනුපමවූ අති ගම්භීරවූ අතිපරිශුඩවූ අර්හත්වාදි නවගුණනිධින්ගේ මෙහි පළමුකොට දක්වූයේ අතිසංක්ෂේපාර්ථයයැ.

විස්තාරවශයෙන් වර්ණනා කරන්නේ නොත් අනෙකාර්ථ ඇති ඒ අර්හත්වාදි නව පදයන් කෙරෙහි ඇතුළත්ව සිටි සියලු අර්ථයන් තෝරා වෙන් වෙන් කොට ගෙන එකොකි අර්ථයෙහි එකොකි ධර්මප්‍රකරණයක් බැගින් පූජාවට සුදුසුය යන අදහසෙහි දැක්වූ **පූජාවලිය** සේ එහි අර්ථ ගණනායෙන් වෙන් වෙන්ව ධර්මප්‍රකරණ උපදවාලීමෙහුදු නො ගෙවෙන නො නිමෙන අර්ථ ඇති චින්තා විෂයාතික්‍රාන්තවූ බුදුසසුන් වැද හැසිරෙණ තාක් හැමදෙනාගේ තුඩක් තුඩක් පාසා සිතුක් සිතක් පාසා අනවරතයෙන් පවත්නා සුළුවූ සිත් නමැති කොමුදයන්ගේ සර්ඛුශල දුශ්චිනමැති මිණි දැදිරි කෙරෙමින් පුබුදුවා මහත් පෙම් වඩා වඩා සර්ී සත්ත්වෝපකාර

ලොභ සම්භාවනා කටසුයුතුවූ මේ නවගුණ පාඨයාගේ නවමහා ගුණය අතුරෙන් එක් ගුණයක් වර්ණනා කෙරෙමිසි යන මේ මාගේ විත්තානතොමෝ අනන්තවූ ආකාශය අතුලෙන් මැන නිමවමිසි කියාද, මහමුහුදු ජලස්කන්ධය බින්දු වසයෙන් ගැණ ලක් තබමිසි කියාද, අබඇට ඇතුළෙහි මහාමේරුව සඟවාලමිසි කියාද, නබාහු යෙහි මහපොළොව සඟවාලමිසි කියාද, පුලුන් රළකින් හැක තුන් දහසක් යොදුන් හිමවුගල සොලවමි සි කියාද, මදුරු තුඩින් එක් ලක්ෂ අටසැටදහසක් යොදුන් පමණවූ මහා මේරු පර්වතය විද නිම වමිසි කියාද, නෙළුම්දඹු නූසින් මහත් ප්‍රවණ්ඩ හස්තියෙකු බැඳ සිටුවමිසි කියාද, ඉදිනටු මල සිදුරෙන් මහගඟ ජලස්කන්ධය හරිමිසි කියාද පවත්වන චිත්තාවක් වැන්නිය.

මේ හැම එසේම සාරන්ට ලොව මහත් ශ්‍රද්ධිමත්තනට හැකිවී නමුදු බුදුගුණ මුහුදුපරතෙර දැක්ම තුන්ලෙවිහි එබඳු කිසිවක්හු වසිනුත් නොපිළිවන්මයැ. කිහේ මැනෝ,

සක්කා වෙ නභ මඩ්ඩුලෙන මිනිතුං සිඤ්චිදකං බින්දුනෝ
මෙරුං සාසප භාජනෙ නිදගිතුං භූමිං නඛග්ගන්තරෙ
කාතෙපතුං ධරණීධරං නිමධරං ආහච්ච තුලංසුනා
නො වෙ නාථ ගුණෝදධිං පතරිතුං කෙනාපි ලොකත්තයේ'සි

තවද, සියල්ල දන් බුදුහු වීසිනුදු බුදුවූ දවස පටන් ආයුෂ්කල්ප ය මුළුල්ලෙහි වැඩ හිඳ අනිකෙක නො යෙදී එක් බුදුකෙනෙකුන් ගේ ගුණ ම වදුරත් කල්පය ගෙවියත් මුත් නො ගෙවෙන බුදුගුණ එසේ අනිකෙහු වසින් වර්ණනා කිරීම එකාන්තයෙන් නො පිළිවන් වන්නේ මයැ. වදලේ මැනෝ,

බුධොපි බුධසස භණෙය්‍ය වණණං
කපපම්පි වෙ අඤ්ඤ මහාඝමාතෝ
ඛීයෙථ කපෙපා චිරදීඝමන්තරෙ
වණෙණා න ඛීයෙථ තථාගතසස'සි.

මෙසේ අවින්ත්‍යානතොපමෙය වූ අසාධාරණවූ බුදුගුණ වර්ණනා කිරීම අපවැනි පුහුදුන්ගේ නුවණට ඉතා අවිෂයවූ නමුදු "ඉතා දුක සේම ලත් මේ මනුෂ්‍යසම්පත්තිය සාර්ථකකොටගෙණ අඟට ධම්මසමොධානයෙන් යෙදී මතු මෙත් බුදුන් දැක්මන් පලමුවෙනි නියත විවරණශ්‍රීලාබ එතැන්පටන් ලොව ඇතිවන සියලු බුදුවරයන් නුවිළාව දැක්මෙන් ආමිෂ පූජාය ප්‍රතිපත්ති පූජාය යන විප්‍රකාර පූජාසෙයින් පුදු කෘතාධිකාරීව හැම පාරමී ධම්මයන් මස්තකප්‍රාප්ත

කොටගෙණ බුදු වෙම්වා" යන මාගේ අභිමත ප්‍රාර්ථනා සංසිඳිය හා ලෝවැඩ පිණිසැ ශාස්තෘවූ මුනිගුණ වර්ණනා මුඛයෙන් ධම් ප්‍රකරණයක් උපදවනු කැමැත්තෙමි. එතකුදු වුවත් ලෝවැඩ පිණිස සත්වයන්ගේ සිත් හසර දැන ඇඳින ලගන්වා බණකිම ධර්මරාජන් වූ බුදුරජානන්ටම මුත් කප් කෙළලක්ෂ ගණන් පාරමිතා පිරූ මහාපිණැති ආයුෂ්මත්වූ දම්සෙනෙවි **සැරියුත් මහ තෙරුන් වහන්සේය, ආනන්ද සථවිරයන් වහන්සේය,** රෙවත **මහතෙරුන් වහන්සේය** යන මහ උතුමන්ටද නො පිළිවන් ම ය. එබැවින් ලෝකයෙහි කාරණා කාරණ නො සලකාම දුටු ශ්‍රමිතියි අරමුණක් ඇතුළත්හි සැවෙමින් මුළාවගන්නා සුවහාව ඇති සත්ත්වයන්ගේ සිත්හසර දැනහැඳින සමීකාරයෙන් පහදවා බණ කිම ලොවුතුරා බුදුන්ට ම මුත් අප සේ වූ දිවස් නැති අනුන් සිත් නො හඳුනන පෘථග්ජන අල්පඥානවූ සත්ත්වයන්ට ඒකාන්ත යෙන් නො පිළිවන්ම ය.

එතෙකුදු වුවත් සියල්ල දත් හැමසතුන් සිත්හැඳින වදරණ මාගේ සවාමිදරුවූ බුදුරජානන් වහන්සේ විසින්ම වදරණලද පිටක තුය පාලිය ද ඒ බුඩ භාෂිත පෙළ හා සමවූ විශුද්ධිමාගී සුමඟල විලාසිනියාදිවූ අටුවා කථාද, සාරත්ථමඤ්ජුසාදී ලීනාර්ථකථාද ඒ සේ ම මහාවිහාර පරම්පරාගත මහා සථවිරයන්වහන්සේලා විසින් රචනාකරණලද විශුද්ධිමාගී ව්‍යාඛ්‍යානාදි නොයෙක් සන්න ගැටපද සහලුපොත්ද, බුඩභාෂිතවූ එම පෙළ අටුවාදියට සමව පෙණෙන හෙයින් ඉම් හැමපොත් බලා සංග්‍රහකොට සවභාෂාවෙන් ධම් ප්‍රකරණ උපදවාලීම බුදුරජානන්වහන්සේගේ ධම්දෙශනාවට නො විරුඬ හෙයින් ධම් සංග්‍රහකරණයෙහි ආකාංක්ෂාව හවගත් උත්සාහ ඇතිව පාළි අර්ථකථාදිය බලා සෑක දුරු කොට මෙහි ගතයුතු සඩ්මාථ කථාවත් විභාග කොටගෙණ මෙම පාඨයාගේ නවපදය අතු රෙන් අරභ යන අකුරු තුණකින් උපලක්ෂිත පදයගෙණ එහි විද්‍ය මාන පඤ්ඤා අවයන් අතුරෙන් සුතරක් කැර "බුදුහු පුජාවට සුදුසු ය." යන අර්ථය ගෙණ වර්ණනාකිරීමෙන් මොහරපාපිරුවන්ගිම් මහාසථවිර සවාමීන් විසින් පින්වත් පණ්ඩිත පරාක්‍රමබාහු මහරජ හට බොධිසත්වචරිතය හඟවා බුදුබව පැතීමෙහි උත්සාහ වඩවන පිණිස කරණලද **පූජාවලි** නම් ධම්ප්‍රකරණය හා බුඩො යන අකුරු දෙකකින් සමුපලක්ෂිත පදය ගෙණ බුදුහු සිඟල්ල දත්සේකැයි වර්ණනාකිරීමෙන **නරෙන්ද්‍රසිංහ** මහරජානන්ගේ ආරාධනාවෙන් අපගේ ආචාරීන්වහන්සේ විසින් කරණලද **සාරත්ථසංග්‍රහය** ඇතුළුවූ නොයෙක් ධම්ප්‍රකරණයන්ද බලා එහි පැවති ගුරුපදෙශ ධම්මාගී යන්ද ආශ්‍රයකොට මෙම නවගුණ පාඨය ගෙණ නවමහා ගුණොප ලක්ෂිතවූ නවපදය අතුරෙන් **සත්ථා** යන තන්හි සාසු අනුසිට්ඨිමාගී ඝතධාතු සාසු කියා සිටි කල්හි ඕහට "භූවාදයෝ ධාතවෝ"

යන සූත්‍රයෙන් ධාතු සංඥව, ඒ ධාතුහු කෙරෙන් පරව "සාසාදිහි රඤ්ඤ" යන සූත්‍රයෙන් රඤ්ඤ ප්‍රත්‍යය වැ "පුබ්බමඩොඝිත මස්සරං සරෙණ වියොජ්යෙ" යන පරිභාෂා සූත්‍රයෙන් ඒ රඤ්ඤ ප්‍රත්‍යයා සම්බන්ධ වූ රකාරසථ සවරපභව රානුබන්ධ ප්‍රත්‍යයා පර කල්හි ඒ රකාරයා හා සමග අනෙක සවරවූ ධාතුහුගේ අන්තයහව "රම්හි රඤ්ඤා රාදි තො" යන සූත්‍රයෙන් ලොප්ව ධාතුහුගේ පුන් සකාරසථ සවර පහ ව ප්‍රත්‍යයයා පරනිමිත්තින් පුළු සවරයහට සර ලොපාදී සූත්‍රයෙන් ලොප්ව යට සිටි සවර රහිතවූ ව්‍යංජනතෙමේ 'නඤෙ පරං යුඤෙන' යන පරිභාෂාසූත්‍රයෙන් පරාක්ෂරයා කරා පැමිණ කිතන ප්‍රත්‍යයා තමා අලිහුගෙයින් "තඤිත සමාස කිතකා නාමං වා තවෙතූනාදී සු ව" යන සූත්‍රයෙන් තම් වත්ව ඔහු තෙරෙස් පරව 'නතො ව විහත්තියෝ' යන සූත්‍රයෙහි ව ශබ්ද ග්‍රහණයෙන් සි විහක්තිවැ සි විහක්ති පරකල්හි සඤ්ඤ ශබ්දයාගේ අන්තයට "සඤ්ඤ පිතාදීනමා සිස්මිං සිලොපො ව" යන සූත්‍රයෙන් ආකාරාදෙස හා සි විහක්ති ලොප්වැ සවර පැමිණ සිඹවූ සඤ්ඤා යන මේ අකුරුදෙසකින් සමූපලක්ෂිත වූ පදය ගෙණ එහි දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් මෙලොවම දැක්ක යුතුවූ අනිත්‍යාදි ලක්ෂණත්‍රය හා ධාතුආයතන පඤ්චස්කන්ධ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයන් ප්‍රකාශ කිරීමෙන් හා පරලොව දැක්කයුතු වූ කුශලාකුශල කර්මවිපාක සතර අපාදුක් දෙව්ලෝ බඹලෝ සම්පත් ප්‍රකාශකොට දැක්වීමෙන් සියලු දෙව් මිනිසුන්ට කරණලද උතුම් සබ්මීනුශාසනා ඇති හෙයින් බුදුහු ශාස්තෘනම් වනසේකැයි යන මේ අර්ථය වර්ණනා කිරීමෙන් බුඩානුසාසනාවන්ගේම සංග්‍රහයක් කරන්නෙමි.

ශාසනානන්තඩ්ඨාය දක්වා ම ලෝකොපකාරිව සිටි සියලු බුඩකෘත්‍යයන් සාධන අනුශාසනී ප්‍රාතිහාර්‍යය නම් ලද ඒ ඒ තන්හි විස්තීර්ණවැ පවත්නා බුඩානුශාසනාවන්ගේ සංග්‍රහකිරීම මහත් ලෝවැඩෙකැයි දක්වන්නෙමි.

ඒ කෙසේද? යත්,

අප බුදුහු නාලන්දුවෙහි වූ පාවාරික නම් අඹ වනයෙහි වැඩ වසන කල කෙවට්ට නම් එක් ගෘහපතියෙක් බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ සවාමීවූ බුදුරජාණන් වහන්ස! මේ නාලන්දු නම්වූ රට සර්‍ධිසම්පන්නින් සමෘඩය. පිරි තිබෙන අවු කොටු ඇත්තේ ය. බොහෝ ශ්‍රඩාසම්පන්න ජනසමූහයාගෙන් ගැවසී ගත්තේය. එහෙයින් ලෝවැඩ පිණිස අහසට නැඟී මාසාඩ්මාස අතරතුරෙහි සෘඩි ප්‍රාතිහාර්‍යය දක්වන්ට භික්ෂූන්වහන්සේ තමකාට අවසර දෙවා වදු ලොත් බොහෝදෙන බුදුසස්නෙහි පැහැද දශකුශලධර්මයන් රැස් කරන්නාහුයයි කියා දෙතුන්විටෙක ම යාචඤ්ඤාකොට සිටි කල්හි ඒ ගෘහපති සූත්‍රයාට බුදුරජහු වදරණ සේක්, "එම්බා ගෘහපතිසූත්‍රය,

මාගේ ශිෂ්‍යව බුඩඥනයෙන් බුදුවූ දිනයෙහි බොධි මූලයෙහිදී ම සමාඩවූ ප්‍රාතිහාර්‍යයෝ තුන්දෙනෙක් වන්නාහු ය. එහින් එකෙක්ව සිට බොහෝ දෙනෙකු සේ පෙණීම බොහෝව සිට එකකුසේ පෙණීම පොළොව කිමිද යාම, අහස්හි පලක්බැඳ හිඳීම යාම ආදි වශයෙන් පවත්නාවූ ඍඩිප්‍රාතිහාර්‍යයද අනුන් සිත් බලා දැන ඒ ඒ විත්ත ප්‍රවෘත්ති ලෙස කථා කිරීම ආදි, දෙශනා ප්‍රාතිහාර්‍යද යන මේ ආදි ප්‍රකාර වූ ප්‍රාතිහාර්‍යත්‍රයද දැක්වූකල ඒ ප්‍රාතිහාර්‍යය දෙකම ලොක සාධාරණවන බැවින් මිත්‍යාවාදිහු ඒ දැක මේ කිමෙක්දැයි නොසතුටුවම ගඩ්ගරී නම් විද්‍යුයෙනුත් අහසින් යාම් ආදි ඍඩි දැක්වීම් පිළිවනැයි කියාද, මණ්ඩික නම් විද්‍යුයෙනුත් අනුන් සිතු සිත් දැනගැන්ම පිළිවනැයි කියාද, පිරිහෙලා අවඥා කොට මේ ඇති ගුණයෙක් කොට වෙයි. නිදු කල කල්හි ඒ වචනය අසා ලෝවැසියෝත් සැක කරන්නාහුය.

එහෙයින් ගෘහපතිය, ඒ ප්‍රාතිහාර්‍යය දෙක දැක්වීමෙහි මේ ආදි නොයෙක් දෙශ දක්නෙමි මමද ඒ ප්‍රාතිහාර්‍යය දැක්වීමට පිළිකුල්වෙමිසි ගර්හාකොට වදරා, තවද ගෘහපතිය, තුන්වැනිවූ අනුශාසනී ප්‍රාතිහාර්‍යය නම් ලද ගිහිගෙය හැර පැවිදිව කුශල ධර්මය කටයුතු ය, අකුශල ධර්මය නොකටයුතුයයි මේ ආදි ක්‍රම යෙන් දෙවම්නිසුන් සහිතවූ සියලු ලෝවැසියන්ට වැඩ පිණිස මා විසින් කරණලද මාගේ ශාසනාරක්ෂාවෝ ඇද්ද ඒ සියලු අනුශාසනාවෝ ම මා නැති කල්හිදු සියලු ලෝවැඩ වඩා මා සිවින්නාන්මෙන් සියලු බුඩකෘත්‍යයන් කොට සත්ත්වොපකාර වන බැවින් ඒ මාගේ අනුශාසනී ප්‍රාතිහාර්‍යයම මාගේ විශිෂ්ටවූ බුඩඥන යෙන් විශෙෂයෙන් දැන මම උතුමැයි කියමියි දීඝනිකායෙහි වූ කෙවට්ට සූත්‍රයෙහි "න බො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි-පෙ-ඉදම්පි ඛුවච්ච කෙවට්ට අනුසාසනී පාටිහාරියං නාමරං ඉමස්ස්ත්තාසාති" යනාදිපාලිය ප්‍රකාශ කළ හෙයින් එබදු ප්‍රශස්ත බුඩානුශාසනාවන්ගේ සංග්‍රහකිරීම මහත් ලෝවැඩකැයි දැන, අත්‍රෙලොකතෙකික ශරණවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ගේ උතුම් ශාසනාරාමයෙන්ම ප්‍රසිඩවූ සියලු බුඩානුශාසනාවන් අතු රෙන් ත්‍රිවිධ කල්‍යාණ යනාදී අප්‍රමාණ වූ ගුණවිශෙෂ ඇති ත්‍රිවිධ ශික්ෂාවිෂ්ඨ ප්‍රකාශකොට සියලු බුදුවරයන් විසින් ලොකානුශාසනා පිණිස වදරණ ලද,

'සඩ්ඩ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පද,
සචිත්ත පරියොදපනං එතං බුඩාන සාසනං'යි

මේ ගාථා රත්නයෙහි ප්‍රකාශව පෙණෙන ආදිමධ්‍ය අන්ත ශොභනාදීමෙන් ත්‍රිවිධ කල්‍යාණව සිවි සිලය සමාධිය ප්‍රඥය යන මේ ත්‍රිවිධ ශික්ෂාවෙම මහත් ගුණානිශංස ඇත්තාහු. ය. එහෙ

ඔබ් අප බිසින් දක්වනලදැ.මේ ප්‍රකරණයෙහිද "සීල සමාධි පඤ්ඤා මුඛෙන නිද්දිට්ඨෙ විසුද්ධිමග්ගෙ" යන තන්හි සීලය සමාධිය ප්‍රඥය යන මුඛත්‍රයෙන් බැස වර්ණිතා කළ විශුද්ධිමාර්ගය යේ සීලාදී මුඛ මාත්‍ර වූ මෙම ගාථාවෙහි "සබ්බ පාපස්ස අකරණං" යන පදයෙන් ප්‍රකාශවූ පළමුවන සීල මුඛයන් බැස මේ ශාසනයෙහිද සියලු වැඩට සීලයම මුල්ව සිටි බැවින් එහි ප්‍රකාශව පෙණෙන විරති සීල කථා දී නොයෙක් සීලකථාවන්ගේ ප්‍රභෙද ආදීනවානිසංස කථා වන් වෙන් වෙන්වැ වර්ණිතා කිරීමෙන් ද "කුසලස්ස උපසම්පදා" යන පදයෙන් ප්‍රකාශ වූ දෙවන සමාධිමුඛයෙන් බැස ලෞකික ලොකොත්තර වශයෙන් විප්‍රකාරව සිටි කම්මට්ඨාන සමාධිභාවනා වෙන් පවත්වන්නා වූ දානාදි අනෙක ප්‍රකාර කුශල කම් පථ විභාගා නිසංස කථාවන් වෙන් වෙන්වැ වර්ණිතා කිරීමෙන් ද "සචිත්ත පරියොදපනං" යන මේ පදයෙන් ප්‍රකාශවූ තුන්වන ප්‍රඥා මුඛයෙන් බැස ලොභාදි සියලු අකුශලයන් කෙරෙන් සිත මුදා පිරිසිදුකර ගැනීම ලෞකික ලොකොත්තර සම්පත්තිප්‍රතිලාභයෙන් සත්ත්වයාගේ නිවන්පුර පැමිණීම නුවණින්ම කළමනා කෘත්‍යයක් වන බැවින් මේ ශාසනයාගේ පත්‍යවසානවූ ප්‍රඥා සම්පත් විභාගා නිසංස හා ලෞකික ලොකොත්තර සම්පත් වෙන්වෙන්ව වර්ණනා කිරීමෙන්ද මෙහි පවත්වන්නාවූ සියලුම ධර්ම කථාවන් සත්ථා යන පදාර්ථයෙහිම ඇතුළත් කිරීමෙන් අප බිසින් කරණලද මෙම ප්‍රකරණයාගේ කරණ ප්‍රකාරය හා ධර්මානිසංස ත්‍රිවිධ ශික්ෂා ප්‍රභෙදානිසංස ප්‍රකාශ කථා සංග්‍රහ වූ **පළමුවෙනි ධර්මානිසංස වර්ණනා** පරිච්ඡේදය ය;

මනෝ ප්‍රණිධානයෙහි පවත් ධාතුපරිනිර්වාණය දක්වා පැවැති බුදුගුණ ප්‍රකාශ කථා සංග්‍රහවූ **දෙවැනි සම්බුද්ධ ගුණ වර්ණනා** පරිච්ඡේදය, ප්‍රථම ධර්මසඛ්‍යාත්‍යානාවෙහි පවත් පඤ්ඤප්ති අනාඛ්‍යාත දක්වා පිටකත්‍රය ධර්ම ප්‍රවෘත්ති ප්‍රකාශ කථා සංග්‍රහවූ **තුන්වෙනි ධර්ම ගුණ වර්ණනා** පරිච්ඡේදය, සුප්‍රතිපන්නාදී අපරිමිත ලොකොත්තර ගුණ විභාගය හා ශ්‍රාවකාදි ප්‍රතිපත්ති ශාසනාවසානවැ සඛර්ම භාජනවැ සිටි සංඝගුණ ප්‍රකාශ කථා සංග්‍රහවූ **සතරවෙනි සංඝ ගුණ වර්ණනා** පරිච්ඡේදය, සරණ ගමන ප්‍රභෙදානිසංස ප්‍රකාශ කථා සංග්‍රහවූ **පස්වෙනි සරණාගමන විභාගානිසංස වර්ණනා** පරිච්ඡේදය, පාණාතිපාතාදි අකුශල කම්පථ ප්‍රභෙදාදීනව ප්‍රකාශ කථා සංග්‍රහය වූ **සවෙනි අකුශලකම්පථාදීනව වර්ණනා** පරිච්ඡේදය, සතර අපාය ප්‍රභෙද දුඃඛවර්ණනා කථා සංග්‍රහවූ **අටවෙනි අකුශල කම්ඵල භූමි විභාග වර්ණනා** පරිච්ඡේදය, නිත්‍ය ශීල උපෝෂථ ශීලාදී ප්‍රභෙදානිසංස ප්‍රකාශවන කථා සංග්‍රහවූ

අටවෙනි **ශීලවිභාගානෘශංස වර්ණනා** පරිවෙජ්දය, දානාදී කුශල කම් ප්‍රභෙදානෘශංස ප්‍රකාශ කථා සංග්‍රහය වූ **නවවෙනි කුශල කම් විභාගානෘශංස වර්ණනා** පරිවෙජ්දය, කාමාවචර රූපාවචර භූමි වශයෙන් ත්‍රිප්‍රකාරවූ කුශල කම්ඵල භූමි සම්පත් ප්‍රකාශකථා සංග්‍රහය වූ **දසවෙනි කුශල ඵල භූමි වර්ණනා පරිවෙජ්දය**, රාජ ධම්මානුශාසනා කථා සංග්‍රහය වූ **එකොළොස්වෙනි ශාමාන්‍ය ධම්මානුශාසනා** පරිවෙජ්දය, ගෘහස්ථොපාසක උපාසිකා ධම්මානුශාසනා ප්‍රකාශ කථා සංග්‍රහය වූ **දොළොස්වෙනි ගෘහපති ධම්මානුශාසනා** පරිවෙජ්දය, සමීසාධාරණ ධම්මානුශාසනා කථා සංග්‍රහය වූ **තෙළෙස්වෙනි සාමාන්‍ය සඞ්ඝධම්මානුශාසනා** පරිවෙජ්දයයි. මෙසේ තෙළෙසක් පමණ පරිවෙජ්දයන්හෙන් ප්‍රතිමණ්ඩිත වූ "ශ්‍රී සඞ්ඝමංගවාදය සංග්‍රහ" නම් ධම්ප්‍රකරණයක් හෙලුවසින් දක්වමහ. එසේ සඞ්ඝමය ප්‍රකාශකොට දැක්වීම නම්:-

ධම්මාරාමෝ ධම්මරතෝ ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සඞ්ඝෙමෝ න පරිහායති. සි

"යමෙක් ධම්මාභිරත ද, හැම වේලෙහි ම ධම්ම විතර්කා කරණුයේ ද, හෙතෙම **සත්තිස් බොධිපාක්ෂික ධම්මයන්** කෙරෙන් හා නව විධවූ **ලොකොත්තර ධම්මයෙන්** නො පිරිහෙන්නේය"යි වදළ හෙයින් ද, තවද යමෙක් මාර්ගඵල ප්‍රාප්තවැ ප්‍රතිවෙධ මූලිකවැ වාසය කරන්නේ වී නම් හේ බුදුන් පුදන්නේ නම් වෙයි. යමෙක් චාරිත්‍ර ධම්මයෙහි පිහිටා පිළිවෙත් පිරීමෙන් ප්‍රතිපත්තිමූලිකවැ වාසය කරන්නේ වී නම් හෙ ද බුදුන් පුදන්නේ නම් වෙයි. යමෙක් පිටකත්‍රය පාලි ධම්මයාගේ ශ්‍රවණ ධාරණාදි වශයෙන් පර්‍යාප්ති ධම්මයෙහි යෙදී වාසයකරන්නේ වී නම් හේ මෙමේ ද බුදුන් පුදන්නේ නම් වෙයි. මෙසේ පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් තුන් ප්‍රකාරවූ ගුණ මූලික වීමෙන් සිඛවන ප්‍රතිපත්තීපූජාව ශ්‍රඛාමූලික වූ ආමිස පූජාවට වඩා විශෙෂයෙන් ම උතුම් වන්නේයි.

තවද මේසේ උතුම්වූ ඒ ප්‍රතිපත්ති පූජාවම පවත්වන්නාවූ පුද්ගලයන්ගේ වශයෙන් සත්ප්‍රකාර වේ. ඒ කෙසේ ද? යත්,

යම්කෙනෙක් කෙහෙ ලොමින් බැඳ එල්ලා කඩුව ගට සඥාය කරන්නෙකු සේ හැමවේලෙහි ම හත ඇතිවැ වාසය කෙරෙද් ද

ගම් කෙනෙක් දුශ්ප්‍රතිපත්තින් කෙලෙසීමක් කොවැ අනවතප්ත ජලාශය සේ නිම්ලවැ පිරිසිදු ශීලය රක්‍ෂාකෙරෙමින් වාසය කෙරෙද්ද, යම්කෙනෙක් පිනිදියෙන් සතුටු වන රෙඛාවන් සේ ශථාලාභාදී ත්‍රිවිධ සන්තොෂයෙන් සතුටුව වාසය කෙරෙද්ද, යම් කෙනෙක් පාංශුවෙන් වැසීගිය ජාතිරඛ මාණික්‍ය රත්නයක් සේ ගණ සඛඝණිකාවෙන් දුරුව විවේකයෙහි ඇලුම් ඇතිව වාසය කෙරෙද්ද, යම්කෙෂෙනක් ඇත්ගොදුරු වටුගොදුරු දෙක්හිම සමවූ වියඞ්ඇති සි හරාජයන්සේ ලද දෙයෙනින් සැපි අල්පවූ ඉවසා ඇතිව වාසයකෙරෙද්ද, යම්කෙනෙක් නිධානාරක්‍ෂාකරන්නාවූ දිව්‍ය නාග රාජයන් සේ සඛම් තමැති මහානිධානය තමන්ගේ ලෙහි ධරා ගෙණ වාසය කෙරෙද්ද, යම්කෙනෙක් ප්‍රිය පුත්‍රයන්ට ප්‍රේමයෙන් අවවාද දෙන මවුපියන් සේ තමන් උගත් සඛම්යෙන් තමන්ට ද අනුන්ට ද අවවාද කිරීමෙන් සවඝතානන පරඝතානන දමනයෙහි යෙදී යහපත්ව වාසයකෙරෙද්ද, මෙසේ කරණලද පුද්ගලයන්ගේ වශයෙන් සත්ප්‍රකාරවූ පශ්‍යාජ්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් තුන් ප්‍රකාර වැ ඔිටි උතුම් ප්‍රතිපත්ති පූජාවෙන් යමෙක් බුදුන් පුදන්නේ ඉතාම ඒ පූජාව අග්‍රවන්නේයි. මෙම වදුළේමැනෝ,

යෙ වජ්ජහිරූ පරිසුඛසිලා සන්තොඝසාරා පවිවෙකරාමා
අපපිවඡතා ධම්මඛරානුයොගී තෙ ලොකනාථං අභිපූජයන්ති'යි

මෙසේ බුදුන් ඔසින් ප්‍රශස්තවූ විශිෂ්ටවූ පූජාවෙකැයි වදුරණ ලද නොයෙක් ප්‍රභෙද ඇති ප්‍රතිපත්ති පූජාවන් අතුරෙන් පශ්‍යාජ්ති ඛම් සඛ්‍යාත පිටකත්‍රය පාලි ඛම්යෙන් යවත් පිරිසෙසින් එක් සූත්‍ර යක් පමණවත් ලෙහි ධරාගෙණ ඒ ධම්ානුශාසනා වූ පරිද්දෙන් තුමූත් පිළිපැද වතුපාරිශුඛිසීලයෙහි පිහිටා සමථ විදර්ශනාභාවනාදි ප්‍රතිපත්ති ධම්යෙහි යෙදී වසම්න් තමන් පිහිටි ඒ ගුණ ධම්යෙන්ම අනුශාසනා කරන්නාවූ ප්‍රඥ සම්පන්නවූ යම් පණ්ඩිත පුරුෂ කෙනෙක් ලොව ඇතිවූවාහු නම් සෙස්සන් කෙරෙන් නිදහස් ගහී තා ලබන්නාහ, තා කෙලෙසෙන්නාහ. මෙම වදුරණලද මැයි.

අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො.

එහෙයින් තුමූත් සඛම්යෙහි පිහිටා අනුන්ද දඝඛම්යෙන් අනු ශාසනාකිරීම උතුමැයි දැන එහි ආදර උපදවා යමෙක් තුමූත් සිල සම්පන්නව පශ්‍යාජ්ති ධම්යෙහි යෙදී මාඝධි භාඝාදියෙන් සංක්ෂිප්තව වැසිනිඛන සඛ්‍ානුශාසනා අව කථාවන් සංග්‍රහ කොට සියඛසින්

ධම්ප්‍රකරණ උපදවා පාලිධම්ය දිප්තිමත් කොට පවත්වාලිමෙන් උතුම් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදන්නේ විතම් හෙතෙම ඒ ප්‍රතිපත්ති පූජාව හෙතුකොටගෙණ ආත්මාථ පරාථ සඞ්ඛ්‍යාත උභයාථ සංසිඳියට පැමිණෙන්නේයි. එහි ආත්මාථය අවිශෙෂව මෙහි එකක් වුවද පරමාථය වූ කලී රාජරාජමහාමාත්‍යාදීන්ගේ වශයෙන් අනෙකප්‍රකාර වේ.

ඒ කෙසේ ද? යත්;

ලෝකයෙහි රජසිරි පැමිණ ආදීනව බහුලවූ සියලු රාජ්‍ය භුර විහාරිමෙන් හා අනෙකප්‍රකාරවූ රාජ ක්‍රීඩාවෙහි යෙදී ශ්‍රී සම්පත් විඳීමෙන් ප්‍රමාදව ශාස්තෘ ධම් අභ්‍යාසකිරීමට අවකාශ නො ලැබ වසන රජදරුවන්ට බුදුන්ගේ මහාසමුද්‍රය සේ ගම්භීරවූ ආකාශය සේ අනන්තවූ ධම්ය බලා ත්‍රිවිධරත්න ගුණ නොගෙක් බුඬානුශාසනා හා රාජධම්දිය දැන හැඳින ගෙණ උභයාථය නො නසා යහපත්ව රාජ්‍යය කිරීම උගහට බැවින් ලද ලද අවකාශයෙහි නුවණින් යෙදි වැඩඅවැඩ නම් මේ මේ යයි දැන මෙසේ වූ සවහාශා ලිඛිත ධම්ප්‍රකරණයන් ගෙන්වා බලා බුදුන්ගේ ආගම විශෙෂ මහත්තිය හා කුශලාකුශල කම්පථ විභාග ධම්ානුශාසනා අනෙක ප්‍රකාර ඒසිතුරු සූක්ෂ්ම ධම්කථාවන් සැපසේ සිතට නහා ගෙණ වඩාගත් නුවණින් ලොකශාසන ආරක්ෂාවෙහි නොපමාව ආත්මාථ පරාථ මෙලෝ පරලෝ වැඩ සැපසේ සිඩකොට පෙර මහා පිණැති ධම්ාශොකාදි මහරජුන් සේ තමතමන්ගේ ගුණකීර්තියත් පවත්වා තබා ලෝ සසුන් බබුලුවා යහපත්ව රජකිරීම එක් ලෝවැඩෙක.

තවද රාජ මහෙසිකා ආදිවූ ගේ මිස දෙර නො අදුනන තරම් ආරක්ෂා ඇතිව ඇතුළු රජගෙවල වසන පින්වත් ස්ත්‍රීන්ට ඔවුන් ගේ සිත්සේ ඒ ඒ තැන ඇවිද විහාර වෛත්‍ය වැඳපුදා පින් රැස් කිරීමෙන් හා බණඇසීමෙන් නුවණ වඩාගෙන මෙලෝ පරලෝ කුශලාකුශලාදි නොයෙක් විභාග දැනගැන්මට අවකාශ මද බැවින් හා යහපත් නුවණැති ධම් කථිකයන් ගෙන්වා සිතූ සිතූ විට බණ ඇසීමෙන් සිත ඇති ශඞ්කාදිය දුරුකොට ධම්මීමාංසය දැනගැන්මට අවකාශ නැති සෙසින් එසේවූ පින්වත් ස්ත්‍රීහු අකුරුකිම පමණක් ඉගෙණ මෙබඳු ධම් කථා ලියවී තිබෙන පොත් ගෙන්වා තමතමන් සිත් සේ බලා ධම් දෙහළ පිරිසෙන් ධම්විහාගය දැන හැඳින දන ශීලාදි පින් රැස්කිරීමෙන් අප්‍රමාදව වාසය කිරීමද එක් ලෝවැඩෙක.

තවද ශ්‍රීමත් මහාරාෂ්ට්‍ර සේනාධිපති ප්‍රධානීන්වද හැම වේලෙ හිම රජදරුවන්ගේ කායික්‍රියාකායික්‍රියාවෙහි යෙදී වසන නෙසින් පිටකත්‍ර යෙහි විසතිණිව පවත්නා බුදුන්ගේ සඞ්ඝිය සකසා තෝරා දැන

ඇඳිනගෙණ පිළිපැදීම දුෂ්කර හෙයින් ඒ ශ්‍රීමතුනු දු ලද ලද අවකාශයෙහි මෙසේ මෙසේවූ සඩ්ඝාවවාද ත්‍රිවිධරත්න ගුණ විචිත්‍ර ධම්කථාවන් සිත්සේ බලාගෙණ රාජනීති ලෝකනීති ධර්ම නීති කාල ව්‍යවහාර ලෝකව්‍යවහාර දෙශ ව්‍යවහාර ධම් ව්‍යවහාර මේලෝ පරලෝ වැඩ අවැඩ විශෙෂයෙන් දැනගැඳින රජුන්වද ලෝවැසියන්වද තමන්වද අවැඩ වනසේ අමිහියෙහි තො ගොස් සියල්ලට ම දෙලොවින් වැඩ වන සේ පරීක්ෂාකාරිව මැහියෙහි ගොස් තම තමන් ලද සම්පත් නිෂ්ප්‍රයෝජන නොකොට පරලොව පිණිස ම නිධාන තෙරෙමින් නොයෙක් ලෙසින් වැඩ සැදීමද එක්ලෝවැඩෙක.

තවද ශාසනාරක්ෂාවෙහි අප්‍රමාදිවූ මහාසථවිරයන් ගරුවූ ඝානානතර ලදින් වසන හෙයිනුත් නොයෙක් ශාසනධුර විවාරා පිරිමැසීමෙහි නියුක්ත හෙයිනුත් ලෝවැසියන් තෙරෙන් මහත් ආදර ගෞරව බහුමාන ලැබෙන හෙයිනුත් අසංඛ්‍ය නයින් බබළන සඩ්ඝ සාගරයෙහි පෙළ අටුවාදිය බලා අර්ථ පිමසිම් වශයෙන් කිමිද දැන එහි පිහිතුරු ධම්කථාදිය උගුළුවා ගැන්ම සුලභ නොවන හෙයින් ඔවුනුදු ලද අවකාශයෙහි මෙබදු ධම්ප්‍රකරණ ගෙන්වා සිත්සේ බලා තම තමන් දත් ආගමෙහි පැවති ධම්කථාවන් හා උපමා සහිත පූජිකපිතකයන්ගේ ව්‍යවහාර වාක්ප්‍රබන්ධ අසා දැන සතුටුව ප්‍රඥ වැඩීමද එක් ලෝ වැඩෙක.

තවද අධිකතර ශ්‍රඩ්ධාවෙන් බුදුසසුන් වැද මහණව අකුරු කිම පමණක් ඉගෙණ විදර්ශනා භාවනාවෙහි යෙදී සීලසුගන්ධය පතුරුවා වසන්නාවූ ශ්‍රඩ්ධාවත් බොහෝ සබ්‍රහ්මචාරීන් මෙබදු ධම්ප්‍රකරණ බලා ශාසන ධම්විභාගය දැන හැඳින ශ්‍රඩ්ධා ප්‍රඥ වැඩීමෙන් ආදර ඇතිව පිළිවේත් පුරා නිවන් සැප සෑදු ගැන්මද එක් ලෝ වැඩෙක.

තවද නොයෙක් සූත්‍රානන ඉගෙණ බණකීමෙහි දක්ෂවූ මහා පණ්ඩිතවරුන් මෙසේ මෙසේවූ පූජි කථිකයන්ගේ වාක් ප්‍රබන්ධ බලා නොයෙක් ධම්ප්‍රකරණාදිය අමූතුවෙන්ම උපදවා ගැන්මට මහ දැක ඒ ඒ පූජිකථිකයන් කෙරෙහි ඉතාප්‍රසන්නව තමතමන්ගේ වාක්පථ නමැති මහා ගඩොවන් නිම්ලකිරිමෙන් අමූතු නොයෙක් ධම්ප්‍රකරණ උපදවාලීමද එක් ලෝවැඩෙක.

තවද ශ්‍රඩ්ධාවත් මහා අදහස් ඇත්තවුන් අකුරු කිම පමණක් ඉගෙණ සාවද්‍ය කම්නන හැර නිරවද්‍යවූ ධම්යෙන් ආත්මාථී පරාථී සැදීමෙන් දැහැමෙන් ජීවත්වෑ ලෝකවාසීන්ට ඒ ඒ තැන ධම් දෙනය දීම ද එක් ලෝ වැඩෙක.

තවද මහා සම්පත් ඇත්තවුන් විසින් විසිතුරු ධම්පූජා පවත්වා කරණලද ආරාධනාවෙන් අලංකාත ධම්මණ්ඩප මඩ්‍යයෙහි පණවන ලද මාඤ්ඡි ධම්මාසන මස්තකප්‍රාප්තව ජනයා සහිතවූ මහ පිරිස් පිරිවරා නිසාකර ලිලෝපෙතව පලහ හිද බණ කියන තරම් දක්ෂවූ ධම්තපිකයන් හා එබදුවූ මහා සම්පත් ඇති පින්වතුන් ලොව දුලබ හෙයින් එබදු ශ්‍රීමතුන්ගේ පැමිණීමක් වත් දැකීමක් වත් නොලබන නොයෙක් ප්‍රත්‍යන්ත වාසිවූ බොහෝ ස්ත්‍රී පුරුෂයන් මෙබදු බණ පොත් සපයා ගෙන්වා අක්ෂර දන්නවුන් ලවා කියවා සවහාශාවෙන් ප්‍රකාශව තිබෙන සඛීම්‍ය අසා ඒ ඒ ප්‍රත්‍යන්තවාසීන් සියලු වැඩ සෑදී ගැනීමද එක් ලෝවැඩෙක.

මෙසේ ආත්මාර්ථාදි වශයෙන් නවප්‍රකාරවූ සිරි නවාඞ්ගයෙකින් උපලක්ෂිත වූ බුදුසස්න සේ, ඇසිරියයුතු නව සත්තාවාසය සේ, නව විධ වූ බඹලොව සේ, නවප්‍රකාර වූ ලොකොත්තර ධම්ය සේ, දුරුකට යුතු වූ නව ආඝාත වස්තූන් සේ, නො සෙවිය යුතු නවවිධ මානය සේ, නවප්‍රකාර වූ නවරත්නය සේ, දනයුතු නවවිධ වූ වේදනානුපස්සනා ධම්ය සේ, අසුභසඤ්ඤාදසවිධ ආර්ය්‍යන්ගේ නවවිධ අඟුදුනය සේ, ඇල්ම සතුන් විසින් සිහිකටයුතු වූ බුදුන්ගේ නවගුණය සේ, සද්ධම්ය හෙලු බසින් දක්වා ලීමෙන් වන්නාවූ නව මහා වැඩෙක් ප්‍රකාශව පෙණුන හෙයින් ඒ සියලු වැඩ සාධන අභිප්‍රාය ඇතිවැ ලෝකයෙහි ප්‍රකට රොගවූ ජ්වරඅතීසාරාදි අනෙකාකාර රෝගයෙන් පීඩිතවූ සත්ත්වයන්ට සුව පිණිස ධන්වන්තරි භාරවාජාදි ඍෂිවරයන් විසින් පහළකරණලද වෛද්‍යගමය සේ ලොභ වෙශ මොහ මද මාන මාත්සර්‍යාදි නොයෙක් කෙලෙස් රෝගයෙන් පීඩිතවැ සියලු සසර දුක් විඳිනේ වෙහෙසෙන සතුන්ට සුව පිණිස එකොළොස් රෝග පිළියම් ප්‍රකාශකොට බුදුන් විසින් වදළ සඞ්ඝානුශාසනාවන් ඒ ඒ පරිද්දෙන් වෙන් වෙන්ව සංග්‍රහකොට අප දැසින් සියලු ලක්දිව ඇවිද බණ කීම නො පිළිවන් බැවින් හා නොයෙක් උපද්‍රවයෙන් අයිරවූ ඉතා මදවූ ආයු ඇති මේ ජීවිතයෙන් බොහෝකලක් ජීවත්වැ හිද අනවද්‍යවූ ධම්දනය පැවැත්වීම උගහට හෙයින් මෙසේ එකතැන්හි හිද ලක්දිව කොයෙක් තැන් හා මතු බොහෝ කලක් පින් කැමති ධම් ලෝහීන්ට උතුම් ධම්දනයක් පවත්වාදීමෙන් මිතු බුදුව දහම් දෙසීමට නය නහා තබම් යි යන මහත් ප්‍රේමයක් ඇතිව සියලු දුකට හාජනවූ මේ සංසාරසාගරයෙහි කෙලෙස් තමැති මහවතුරෙහි ගැලි සිටි පවා දහම්රස පිමෙන් උපන් අස්වැසිලි ඇතිව, සඞ්ඝයෙහි අකොපිව තදනුගත ප්‍රීති වේගයෙන් එහි දක්වනලද මේ සඞ්ඝානුස්සනා කථාවින් හෙලුබසින් වී තමුත් නිවන් ම රස කොට බුදුන් දෙසූ ධම්යම් වන බැවින් බුද්ධභාසිතමය යි දැන කවර

තරම් පත්‍රයකින් ගෙණ පානය කළත් වෙනස් නොව එකාකාර රසව සිටිනා මධුර රසය සේ මේ ධර්මයද අමාමහනීවන් ම රසකොට ඇත්තේය යන දී ක්‍රමයෙන් අප්‍රමාණවූ ධර්මානුශංස මහත්ත්වය ඇලකිමෙන් ආදර උපදවා, මෙහි පූර්ව්‍යාපර විරෝධයක් දුවද ඒ හැම නොසලකා දිය මිශ්‍ර කිරිරස වෙන් කොට පානය කරණ හ්‍රතරාජ්ඨ හංසයන් සේ ධානි සමාහි ශ්‍රද්ධාදිගුණ සම්පන්න සත්ප්‍රුෂයන් විසින් මෙහි මතු පහළවන ත්‍රිවිධ ශික්ෂාවෙහි ඇතුළත්ව සිටි අනුශාසනී ප්‍රාතිහාර්‍යයිය නම් ලද මේ සිව්වැනි බුඩානුශාසනාවෝ ශ්‍රවණ ධාරණාදි වශයෙන් මනාකොට ගතයුත්තාහුය.

මෙසේ ශ්‍රවණ ධාරණාදි වශයෙන් ගතයුතුවූ මේ සබ්මානුශාසනාව තම ලෝකයෙහි සිටුවූ දහමතා ධර්මයන් අතැඟිලක් සේ දත් අප භාග්‍යවතුන් වහන්සේ සියලු ලෝවැඩ වඩමින් සැවැත් නුවර නිසා දෙදිරම්හි වැඩ වාසය කරණසේක එසමයෙහි තදන්ත මහතෙරුන් වහන්සේ උපස්ථාන ශාලාවෙහි වැඩහිඳ භික්ෂූන්ට ධර්මකථාවෙන් මෙලෝ පරලෝ වැඩ දක්වා, ධර්මයෙහි සිත් පිහුණුවන ලෙස සාධු සාධු යි කියා ප්‍රශංසා කරණලෙස විසාරද ව වාක් ලීලා යෙන් බණ වදාරණ සේක. එදවස්හි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සවස්වේලෙහි කළමනා බුදුකිස නිමවා අද තදන්තයාගේ රාත්‍රි බණ අසමි සිතා වදාරා ගඳකිළියෙන් නික්ම වැඩ උපස්ථාන ශාලාවාරයෙහි ආවිඤ්ඡන රජ්ජුව ගෙණ තුන්යම රැ සිපිපියෙහි ම වලාහැඬකින් නික්මුණු පුන්සඳක් සේ වැඩසිට ධර්මකථාව අසා වදාරා අලුයම දෙශනාවගේ කෙලවර ප්‍රකාශව පෙණී ගිය පුන්සඳක් සේ සියලු බණ පිරිසට පෙණී පෙණී තදන්ත! නෝ ධර්මය කී සේ ඉතා යහපතැයි සතුතිකොට සාධුකාර දී වදළසේක.

එකල්හි භූමසථ නාග සුපර්ණී යක්ෂයන් හා දෙවතාවන් පවත් ඛඹලොව දක්වා සියලු දෙවියෝ ම ධර්මපූජා පිණිස බුදුරජහු සාධුකාර දුන්සේක. තව අපි මෙහි කුමක් කරමෝදැයි සිතා එක පැහැර සක්වළ පැතිර යන සේ සාධුනාද පූජාකළාහුය ඒ ක්ෂණයෙහි තදන්ත මහතෙරුන් වහන්සේ බුදුරජානන් වහන්සේගේ සාධුකාර නාදය අසා හැඳින හුනස්නෙන්, නැඟී හොස් ශ්‍රීපාදමූලයෙහි වැද දැතිර සවාමිනි කවර වේලෙක පොතකට වැඩිසේක්දැයි විවාල කල්හි තදන්ත තා විසින් සූත්‍රය ආරම්භ කළ වේලෙහි පැමිණියෙමියි වදළහ. එවට තදන්ත මහ තෙරහු සවාමිවූ බුදුරජානෙනි, බුඩසුකුමාලව තුන්යම රැ සිපි පියෙහි ම වැඩසිටි සේ දුෂ්කරය. ඉදින් මෙසේ වැඩ බැවි මම දන්නෙමි තම් මෙතෙක්කල් බණ නො කියමියි දුන්වූ කල්හි බුදුහු වදාරණ සේක් තදන්ත සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි සියලු පාරම්ධර්මයන් රැස්කරන්නාවූ මම වනාහි මෙම ධර්මයාගේ ප්‍රතිවෙධය පිණිස ම උත්සාහ කෙළෙමි. විධුර,

මහාගොවිඤ, කුද්දාල, අරඤ, ජෝතිපාල, බොධිපරිබ්බාජක, මඝදෙවඛපණ්ඩිතාදිවූ සෙයෙක් ජාති කෝටි ශත සහස්‍රයෙහි අනුන්ට දහම් දෙසිමෙන්වත් අනුන්ට දෙසක ධර්මය ඇසිමෙන්වත් තෘප්තියට නො පැමිණියෙමි. එසේ ධර්මයෙහි ම හැසිරීමෙන් ප්‍රඥා පාරමිතාව පිරූ ජාති මාගේ මෙතෙකැයි පමණ නැත. එසේ වූ මම දැන් බුදුව ධර්මය ඇසීම පිදීම කවර විස්මයෙක් ද? ඉදින් තෘෂ්ණා ආයුෂ්කල්පය මුළුල්ලෙහි තෙල ආසක්තයෙන් නො බැස බණ කියනු යෙහි වී සමුත් මම්ද මාගේ ආයුෂ්කල්පය මුළුල්ලෙහි මෙසේ ම සිව් බණ අසමිසි වදරා ධර්මශ්‍රවණානිසංසය නොයෙක් ලෙසින් ප්‍රශංසා කොට වදාළහේක

සුඛාභිධම්මරසපාන මනොම පඤ්ඤ
සක්කච්ච සොත පථ හත්ථ පුථා පිවන්තු
ධම්මිස්සරොපි භගවා සකලම්පි රත්තිං
ගෙහාවිරම්පි සිතසෝව සුණීථ ධම්මං-යි.

මේසේ ධර්මරාජන්වූ බුදුන් විසිනුදු ශ්‍රවණය කර වදරමින් ගරු තෘෂ්ණා කැබූ මහත් මහිම ඇති ධර්මයෙක.

තවද,

ධම්මමේව සුණිස්සාම ධම්මෙ මෙ රමති මනො
නහි ධම්මා පරං අත්ථි ධම්ම මූලං හිසම්පදං.

දාසෝ හොමි පභාගෙහං රාජත්තං දෙසසාසස මෙ
ඉච්චාහ සො මහිපාලෝ අහො ධම්මෙසු ලොලතා.

යනුවෙහින් මෙම කල්පයෙහි දහම්සෙබ රජවැ උපන් අප මහ බෝසතාණන් පුරී ජාතිවලද අතලන්ව ධර්මය පුරුදුකළ හෙයින් සෙසු සියලු සම්පත්තියෙහි පැවැති ලෝභයන් දුරුකොට ත්‍රිවිධ සම්පත්තියට මූල්කාරණයවූ උතුම් සඩ්ඝදානයෙන් බණදන්නා කෙනෙකුන් විමසා නැති හෙයින් ගාථාවකින් පමණවත් බණ කියන්ට නිසි කෙනෙකුන් ලදහොත් ඒ දිනක දෙම්. දෙදහසක් දෙම්. යනාදි ක්‍රමයෙන් කෝටි ප්‍රකෝටි ගණන් වස්තුව දෙමි කියාද, නැති හෙයින් බරණැස සියලු සම්පත්තිය දෙමි කියා ද, රාජ වෙසය හැර දැසවැ මෙහෙ කරම් කියාද, විමසා බණ දන්නා කෙනෙකුන් නො ලැබ අහෝ මෙසේ ධර්මයන් වෙන්ව රාජ්‍යය කිරීමේනෝ මට ප්‍රයෝජන කිමිදැයි සිතා සියලුම රාජ්‍ය සම්පත්තිය හැරපියා එකලාව මහ වල වැද දිවි පුදා සෙවූ ඒකාන්ත දුර්ලභවූ මහත් මහිමඇති ධර්මයෙක.

නඳු තෙරුන් දම් දෙසද්දී බුදුරදුන්ද අසා සිටීම (15 පිට)

සියලුම දිවය බ්‍රහ්මාදීන් විසිනුදු නොයෙක් දිව්‍ය ක්‍රීඩා ධ්‍යාන සැප පවා හැර ධර්මලෝභයෙන් දෙව්බඹුනට ඉතා පිළිකුල්වූ මිනිස්ලොවට අවුත් බුදුන් දැක බණ ඇසීමෙන් සතුටුවෑ අප්‍රමාණ වූ සතුති පූජා කළ ප්‍රශස්තවූ ධර්මයෙක.

බුඩ පුත්‍රවූ සියලුම මහා සංඝයා වහන්සේ විසිනුදු සඩම් හාජනවැ සිට සාදරව ශ්‍රවණ ධාරණාදි වශයෙන් එක අකුරකුදු නොපිරිහෙලා සම්පූර්ණව රක්ෂාකෙරෙමින් පවත්වාගෙණ ආ අග්‍රවූ ධර්මයෙක. ලොවැ රජපැමිණි හැම ගුපාලයන් විසින්ම නොහැර දුරියයුතු මාහැගි රත්න ක්‍රීවාභරණයක් සේ ශ්‍රවණාද්ග්‍රහණාදි වශයෙන් ඒ ඒ කලට පැමිණි පින්වත් රජදරුවන් විසිනුදු ප්‍රමාණාතික්‍රාන්ත වූ උදර තර පූජා සත්කාර පැවැත්වීමෙන් සුරක්ෂිතව රක්ෂාකළාවූ ප්‍රවරතර සඩම්යෙක. ඔතර අපාය ආදි අනෙකප්‍රකාරවූ දුකින් ම ගැවසීගත් දුක් බහුල සෝරතර සංසාර සාගරයෙන් එතරවන්නා කැමැති දිව්‍යබ්‍රහ්මාදි සියලු සත්ත්වයෝ ම බණ ඇසීම නමැති මහ නැව් කැඟිමෙන් එතරව ගොස් අමාමහ නිවන්පුර වැද සැනසී ගිය හෙයින් සත් රුවනින් ම කළ නැවක් වැනිවූ මේහිම ඇති සඩම් රත්නයෙකැයි කියාද,

නිවන් පුර වදනා කැමැත්තවුන්ට බණ ඇසීම යාළුවූ රජ මහවතක් වැනිය යි කියාද, දිව්‍ය මනුෂ්‍ය සම්පත් ආදිවූ සියලු සම්පත් තමන් අත්පත්කිරීමට බණ ඇසීම හසුසාර වසතුවක් වැනිය යි කියාද, සදෙවිලොවට හා සොළොස් බඹතලයට සැප සේ නැඟී යනු කැමති හැම සත්තට බණ ඇසීම අවල රුවන් හිණක් හා සමානය යි කියාද, සියලු සත්ත්වයන්ගේ ආයු ඇතිවීමට නිරෝග වීමට රූපසම්පන්නවීමට මහෙශාක්‍යවීමට මහාත්‍රාභාවසම්පන්න වීමට මහත් හොඳ ඇතිවීමට උත්තමවංශ ඇතිවීමට මහත් පුණ්‍ය ඇතිවීමට මේ බණ ඇසීම මූල්කාරණා වන්නේය යි කියාද, මේ ආදී නොයෙක් ප්‍රකාරවූ ධර්ම ගුණ මහත්ඵල ඇති කිමෙන් මතු පහළවන ධර්මයෙහි ආදර උපදවා අභිඤ්ඤා විතත ඝනතාභයෙන් යුක්තව ඇසියයුතු.

තවද අංගුත්තර නිකායෙහි වූ ජානුස්සෝණි සූත්‍රයේ ධර්මශ්‍රවණ කාරණ මහත්ඵල වදාරණ බුදුහු "ඉධ භික්ඛවෙ එකච්චෙවා හෙට්ඨා සද්දමපි සවණාය ගච්ඡති, විමානසද්දම්පි සවණාය ගච්ඡති, නිමානසද්දම්පි සවණාය ගච්ඡති" යනාදි ක්‍රමයෙන් භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට වදාරණසේක් මහණෙනි මේ ලෝකයෙහි සමු

හර සත්ත්වකෙනෙක් හෙරිශබ්දය අසනු පිණිස යන්නාහ. භිණ්ඩි ශබ්දය අසනු පිණිස යන්නාහ. ගීතශබ්දය ඇසනු පිණිස යන්නාහ. අවශෙෂවූ කී නොකී ශබ්දයන් අසනු පිණිස යන්නාහ. වරදවා පිළිපන් නපුරු මිථ්‍යාවාදිවූ මහණ බමුණන්ගේ ධර්මය අසනු පිණිස යන්නාහ. එසේ නිෂ්ප්‍රයෝජන අවැඩ දැයකවූ ඇසීමෙක් ද ලොව ඇත්තේය යි වදරා, මහණෙනි ඒ හෙරි ශබ්දාදීන්ගේ ශ්‍රවණය වූ කලී ලාමක ය, ග්‍රාම්‍ය ය, ලෞකික සත්ත්වයන්ගේ ස්වභාව වන බැවින් පෘථග්ජනික ය, බුද්ධාදි ආර්‍යයන්ගේ සවභාව නොවන බැවින් අනාර්‍ය ය, අනර්ථයෙන් නිශ්‍රිතවන්නේය යි යනාදීන් වදරා කෙමෙත වදාරණසේක් මහණෙනි යමෙක් තථාගතවූ බුදුන්ගේ හෝ තථාගත ශ්‍රාවකයන්ගේ හෝ ධර්මය අසනු පිණිස පිහිටවනලද ශ්‍රද්ධා භක්ති ඇතිවැ අතිප්‍රසන්නවැ ඒ බණ අසන්නේ වේද, මහණෙනි ඒ ධර්ම ශ්‍රවණය ම ලොව පවත්නා හෙරි ශබ්දාදීන්ගේ ශ්‍රවණයට වඩා නිරුත්තරවූ ශ්‍රවණයෙක. මහණෙනි, ඒ ධර්මශ්‍රවණය ම සත්ත්ව යන්ගේ රාගාදි කෙලෙසුන් දුරුවීමෙන් පිරිසිදුවීම පිණිස ශොකපරිදෙවයන්ගේ නික්මීම පිණිස දුක් දෙමනස් දෙදෙනාගේ අතුරුදන්වීම පිණිස අර්හත් ඥානසංඛ්‍යාත නිර්වාණධර්මයාගේ ක්ෂාත් ක්ෂාත්කිරීම පිණිස වන්නේය. පිහිටවනලද ශ්‍රද්ධා භක්ති ඇතිවැ අතිප්‍රසන්නවැ තථාගත බුදුන්ගේ හෝ බුද්ධශ්‍රාවකයන්ගේ හෝ ධර්ම ධර්මශ්‍රවණය කිරීමෙක් ඇද්ද, මහණෙනි මේ ශ්‍රවණොත්තරිය නම් වන්නේය යි වදළසේක.

තවද ධර්මලොභිවූ පින්වත් සත්පුරුෂ ජනයන් විසින් සමයේත් සැලකීමෙන් බණ ඇසියයුතු. කෙසේද? ඔත්, අපට වැඩ සඳහා මේ සියලු ධර්මය දෙශනාකරණ පිණිස අප බුදුරජානන් වහන්සේ මෙතෙ වාක් ප්‍රණිධානයෙහි පටන් ප්‍රමාණාතික්‍රාන්ත දුක් විඳීමෙන් සියලු පාරමී ධර්මයන්ගේ මහාසම්භාරයන් පුරා පිරූ තැන් පටන් සැවුරුදිදක් මුළුල්ලෙහි අන් කිසිවක්හු විසින් සෙකලහැකි නොසිතියහැකි අති දුෂ්කරවූ දුෂ්කරක්‍රියා කිරීමෙන් සපරිවාර මාරපරාජයකොට ලොව්තුරා බුදුවූ තැන් පටන් එකම ඒහාරාගක වැඩ නොසිටී අනෙකාසංඛ්‍යෙය මහාකල්පයක් මධ්‍යමණ්ඩලය මහාමණ්ඩලය යන මණ්ඩලත්‍රයෙහි හැසිරීමෙන් හා දෙවිලෝ බඹ ලෝ ආදිවූ ඒ ඒ තන්හි වැඩ අනෙකප්‍රකාර ඍද්ධි ප්‍රාතිහාර්‍යය දැක්වීම් ආදි වශයෙන් ලෝවැඩ ම කිරීමෙන් පන්සාළිස් හවුරුදිදක් ජීවත් ව වැඩ සිද අපට ම මේ සියලු ධර්මය දෙශනාකොට නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ පසුදු සිවුපිළිසිඹියාපත් රහත් මහානුභාව සම්පන්නවූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාත් සියලු ධර්මය අක්ෂිකථා සහිතව සිත්හි ලා දරා රක්ෂාකොට පවත්වාගෙණවුත් අපට ම වැඩ පිණිස පොත්වල ලියා තැබූ උතුම් ධර්මයකැ යි කිඹෑද, එසින් මෑත

හාඟයෙදී අලෙවිණි, සතුතුවෙ ආයුර්වංශානුපාලිත ශීලාචාරාදි ලෞකික ගුණරත්නාලංකෘත කල්‍යාණපෘථග්ජන වූ බුඩපුත්‍රයාණන් වහන්සේලා විසිනුත් ශ්‍රවණෝද්ග්‍රහණ-ධාරණ ලෙඛනාදී වශයෙන්, අප හැමට වැඩ පිණිස මහොත්සාහයෙන් පවත්වාගෙණ ආ ආගමයක් වත් ධම්මකාමි කියාද, සබහාෂාවෙන් ධම්ප්‍රකරණ උපදවන ධම්කථිකයන් වහන්සේලාත්, අනෙකප්‍රකාරවූ ව්‍යායාමයෙන් මෙබදු ධම්ප්‍රකරණ උපදවා පවත්වාලූසේත්; මෙසේ මෙසේ ධම් ශ්‍රවණයෙහි යෙදවාලිමෙන් අප හැමට වැඩ සාධන අභිප්‍රායෙක්මය.

එහෙයින් එම්බා පින්වත් සත්පුරුෂයෙනි, මෙම ධම්ය මෙසේ අප කරා පමුණුවාදීමෙන් අප හැමට සියලු වැඩ සාධන කරුණාවෙන් අප මහබෝසතාණන්වහන්සේ පළමුවෙනි මහානුත්‍රණීධාන යෙහි පවත් බුදුව මේ දහම් දෙසීම දක්වා අප නිසා කරණලද ව්‍යායාම සියල්ල වෙන වෙනම නුවණින් යෙදී බැලූකල සිතුකල දුන් මේ බණ ඇසීමට සිත එකඟව හිද මෙහි මදවූ කලක් අප විසින් කළ මහා මේ ව්‍යායාම, පරමාණුවක් මෙන් ඉතා මදව පෙණෙන්නේය. මෙසේ නිදි දුරුකිරීම් ආදි වශයෙන්, අප විසින් දුන් මෙහි කළ මහා සවල්ප තරම් ව්‍යායාමක් කොට, බණ නොඇසුවහොත් ඒ උතුමන් හැම මේ ධම්ය නිසාම අප වෙනුවෙන් කළ ව්‍යායාම අපට නිරර්ථක වෙයි. එසේ කිරීම එකාන්තයෙන් ම අපට නුසුදුසුය යි සිතා, ව්‍යායාම වැඩිමෙන් හා ශ්‍රබා ප්‍රඥා ගුණ නුවණ උපදවා ගැන්මෙන් කුසීත නොව අප්‍රමාදීතව දෙහොත් මුදුන්දී සාධුකාර පවත්වා, හය ලජ්ජා සහිත දොදර ඇතිව, සෙසු දිගක් නොබලා, ධම්කථිකයාහි මුඛව හිද සිසි කෙනෙකුන් හා සඨා නොකොට, බලත් පමණ කැමටවත් ප්‍රමාද නොව, නිදි දුරුකිරීමෙන් එඟවූ සිත් ඇතිව, ධම් මහත්වය ඇලක සලකා, මේ බණ ඇසීමෙන්ම අන්වැඩ පර වැඩ, මෙලෝ පරලෝ ලොව ලාවුතුරා සම්පත් සිඩියට ම උත්සාහ කළ මැනවි.

එහි ත්‍රිවිධ ශික්ෂාවන්ගේ විභාගානිසංස කෙසේද? යත්, විශිෂ්ටවූ ත්‍රිවිධාගම් ආදිවූ අප්‍රමාණ ගුණානිශංස ධම්යන්ගේ ප්‍රතිලාභය හා අමෘතමහා නිර්වාණ පුරප්‍රවෙශ වනු කැමැති සත්ත්වයන් විසින්, එම ශීලාදී ගුණධම්යන්හි ශික්ෂියයුතු බැවින් ම ඔහු ශික්ෂාවෝ නම් වෙත්. සත්ත්වතෙම සසර හැසිරීමෙන් විත්ද යුතු හවභොග සම්පත් ප්‍රාර්ථිත රක්නා සීලය සීල නම් වෙයි. සසරින් මිදී නිවන්පුර වදනා ප්‍රාර්ථිත රක්නා සීලය අධිශීල ශික්ෂා නම් වෙයි. එසේම සසර සම්පත් ප්‍රාර්ථිතවූ හවභාග්‍යසම්පත්ති සම්බන්ධ නම් වෙයි. විභව සංඛ්‍යානතිර්වාණයාහි සම්බන්ධිය අධිවිත්තත ශික්ෂා නම් වෙයි. එසේම සසර සම්පත් ප්‍රාර්ථිතවූ

භවභාමී ප්‍රඥව ප්‍රඥ නම් වෙයි. විභව සංඛ්‍යාත නිර්වාණගාමී ප්‍රඥව අධිප්‍රඥ ශික්ෂා නම් වෙයි. මේසේ ත්‍රිවිධවූ මේ ශික්ෂාවෝ ම බුඩානුශාසනා කමූදු වන්නාහුයි. එසේම ලද නම් ඇති, ත්‍රිවිධ ශික්ෂාවන්ගේ ශ්‍රවණධාරණාදි වශයෙන් එහි යෙදුනු සත්ත්වයනට ත්‍රිවිද්‍යාවන් ආදිවූ නොයෙක් විශෙෂ ගුණානිශංස ධර්මයන්ගේ ප්‍රතිලාභය ඇති වන්නේය්. ඒ කෙසේද? යත්,

ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් යමෙක් අඛණ්ඩාදි භාවයෙන් පිරිසිදුකොට, රක්ෂා කරණලද අධිශිල සංඛ්‍යාත සම්පූර්ණ ශිලය ඇත්තේද, ඔහට පූර්වේනිවාසානුස්මෘති ඥානය යි කියනලද, සත්ත්වයන් පෙර විසූ පැවැත්ම සිහිකරන්නාවූ විද්‍යාව ද, දිව්‍ය චක්ෂුරභිඥානය යි කියනලද සත්ත්වයන්ගේ වුති උප්පත්ති දෙක දක්නා විද්‍යාවද, ආශ්‍රවක්ෂයකරඥානය යි කියනලද කාමාශ්‍රවාදි සියලු ආශ්‍රවයන් ක්ෂයකිරීම දන්නා විද්‍යාවද යන මේ උතුම් ත්‍රිවිධ විද්‍යාවන්ගේ ලැබීමද ඇතිවන බැවින් සිලය උතුම් වේ. "සමාහිතෙ යථාභූතං පජානාති" කී හෙයින් සිත එකඟකිරීම් වශයෙන් අධිචිත්ත සංඛ්‍යාත සමාධි භාවනායෙහි යෙදී වසන සත්ත්වයාට මහාප්‍රඥය, පුථු ප්‍රඥය, භාසු ප්‍රඥය, තීක්ෂණ ප්‍රඥය, නිර්වේධික ප්‍රඥය යන මේ ෂට්ප්‍රඥාවන්ගේ ලැබීමද, එම සමාධි භාවනා බල යෙන්ම ඇතිවන හෙයින් ඒ සමාධියද උතුම් වේ. "පඤ්ඤාපභෙදං පාපුණාති" යූ බැවින් ප්‍රඥ සම්පත්තියෙහි යෙදී වසන සත්ත්වයාට අවි, ධම්, නිරුක්ති, ප්‍රතිභාන යයි ප්‍රභෙදවූ සිවුපිළිසිඹියාවන්ගේ ලැබීමද, අධිප්‍රඥ සංඛ්‍යාත එම උතුම් ප්‍රඥබලයෙන් ම ඇතිවන හෙයින් ඒ ප්‍රඥවද උතුම් වේ. එපමණක් මතු නොවෙයි. පසේබුදු බවද ලොවුතුරා බුදුබවද ප්‍රඥ සම්පත්තිය නිසා ම සිඹවන හෙයින් ප්‍රඥාවෙන් සිඹ නොවන සම්පත්තියෙක් නම් නැති. සිඟල්ල ම සිඹ කර් දෙන්නියයි දතයුතු. තවද,

එහි ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන්, ශිලසංරක්ෂණ යකරන්නාහු වසනු කාමකෙලාසකාමයන්හි නොයෙදී වසන හෙයින් දුරුකොටයුතුවූ කාමසුඛල්ලිකානුයොගය යි කියනලද පළමුවෙනි අන්තය සෙවනය ත්‍යාගකිරීම හෙතුකොටගෙණද ඒ සීලය උතුම් වේ. ඛ්‍යානභාවනා වෙහි ඛ්‍යානයෙ ව යෙදී වසන්නාහු ශරීරය ප්‍රණීත රූපයෙන් පැහැර සිටි ශ්‍රී ශොභාව ඇතිවන බැවින් අත්තකිල මථානුයොගය යි කියනලද පඤ්චතාපයෙන් තැවීම, කටුපැලලි මතුයෙහි සැතපීම ආදිවූ අනෙකප්‍රකාරවූ දුකඛයෙන් ආත්මයට පීඩා කිරීමෙන් දුක් අනුභවකොට සසරදුක් නැති කෙරෙමි යන මිථ්‍යාකල්පනාවෙන් කායකිල මථයෙහි යෙදීමය යන දෙවෙනි අන්තය.ගේ දුරුකිරීම හෙතුකොට ගෙන් ඒ සමාධි භාවනාවද උතුම් වේ. බුදුව පළමුවෙන් ම දෙසූ ධම්

වක්‍රගෙඟිදු "මෙ මෙ ඟිකඛවෙ අනනා පබබජිතෙන න සෙවි තබබා" යනුවෙන් දුරු කටයුතුයැ යි වදළ පෘථග්ජනිකවු, අකාශ්‍යවු, අකථයෙන් මිශ්‍රවු, මේ අනනවය, ශිල සමාධි දෙදෙනාගේ ආනුභාව යෙන් දුරුවන බව මෙසේ දතයුතු. නුවණින් දැන පිළිපැද්ද යුතු. සම්‍යක් දෘෂ්ටි ආදි මඛ්‍යම ප්‍රතිපදා යෙවනයෙන් සත්ත්වතෙම සියලු සසර දුක් ඉක්මවා නිවන්පුර වදනා හෙයින් ප්‍රඥව අභිශය උතුම් වේ.

තවද ඒ ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් සීලසම්පන්න පුද්ගලතෙම මරණින් මත්තෙහි සතර අපායට නොගොස් මිනිස්ලොව සහිතවු සප්තවිධ කාම සවනියෙහි ම උපදනා හෙයින් සීලය ම උතුම් වේ. ධ්‍යානභාවනා වෙහි යෙදුනු සත්ත්ව තෙම කාමභූමි තුම් ලද සදෙවි ලොවත් ඉක්මවා ගොස්, බ්‍රහ්මලෝකයෙහි ම උපදනා හෙයින්, භාවනාව උතුම් වේ. ඥනවත් පුද්ගලතෙම සසර උපදින බව දැක කාමභවාදීවූ තව භවය ම ඉක්මවා ගොස්, අමාමහ නිවන්පුර වදනා හෙයින් ප්‍රඥවද උතුම් වේ.

තවද ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් "පාණාතිපානා වෙරමණි" යනාදි ඒ ඒ ශික්ෂාපදදින්ගේ සමාදන්වීම හෙතුකොටගෙන ආලොකයෙන් දුරුවන අඳුර සේ, ඒ ඒ කුශලාඞ්ගයෙන් ඒ ඒ අකුශලාඞ්ගයන් තදඞ්ග ප්‍රහාණයෙන් දුරුවන හෙයින් ශීලය උතුම් වේ. ඝටප්‍රහාරයෙන් ජලය මත්තෙහි පවත්නා දියසෙවෙල් පහ වීම සේ වඩනලද සමාධිභාවනා බලයෙන් කාමවිතර්කයන් ඒ ඒ පාප කම් බලය අවකාශ නොදී කෙලෙසුන් ඔබාගැන්මය යන විෂ්කම්භණ ප්‍රහාණයෙන් ඔවුන් දුරුවන හෙයින් සමාධිභාවනාවද උතුම් වේ. ඥනවත් පුද්ගල තෙම නුවණින් සියලු කෙලෙසුන්ගේ දෙහ දැක ඔවුන් හැම මූලොච්ඡනයෙන් සමුච්ඡේද ප්‍රහාණයෙන් තනා රහත් වන හෙයින් ප්‍රඥවද උතුම් වේ.

තවද ඒ ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් ශීලසමාධිඛ්‍යානයන් හේතු කොටගෙන කාමරාගාදි, ව්‍යාපාදාදි දෙකින් සිඳුවන සියලු අකුසල් දුරුවන බැවින් සීලය උතුම් වේ. ධ්‍යාන භාවනාවෙහි යෙදීම හෙතු කොටගෙන ඝන වැළඳගෙන සිටින කෙලෙසුන් දුරුවන හෙයින් සමාධියද උතුම් වේ. ඥනවත් තෙම තමාගේ ඥනයෙන් බලා, ඝන උපදනා කාමරාගාදි පාපධර්මයන් දුරුකොට, තනා ආත්මභාවයේ ඥනය සිඳකටයුතු හෙයින් ප්‍රඥවද උතුම් වේ. මෙබඳු විශිෂ්ට ශොභනවූ මේ ත්‍රිවිධ ශික්ෂාවෙහි අඩුවක් නොව සම්පූර්ණව පිහිටන්නාහු කවුරුදෝ යත්,

පළමුවෙනි ත්‍රෝවාන්මාර්ගයෙන් දිටසි විචිකිච්ඡා සීලබබත පරා මාස යන අකුශල ධර්මයන් මුල්සිඳ නැසීමෙන්ද, පාරාජිකා සංඝාදි සෙස යන මහා ශීල ශික්ෂාපද නොඉක්මවා රැකීමෙන්ද, ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද ඉක්මවා පැමිණි වරදෙන් වහා නැගිමෙන්ද, කැවත පිරිස යුතු සිල්යෙහි අඩුවක් නොකොට, රැකි සම්පූර්ණ ශීලය ඇති හෙයින් ත්‍රෝවාන් පුද්ගල තෙම ශීලයෙහි සම්පූර්ණ කාරි වෙයි. සෙසු සියලු පෘථග්ජන සත්ත්වයෝ එසේ නොව ශීලයාගේ එක් ප්‍රදේශයක් ම රක්නා බැවින් සීලයෙහි ප්‍රභෙදකාරී වේ. ත්‍රෝවාන් සකෘදාගාමී යන මේ අර්ය දෙදෙන ම සමාධියට විරුඬවූ කාමරාග ව්‍යාපාද යන අකුසලයන් හා ප්‍රඥාවට විරුඬවූ මෝහ මුල්සිඳ සලීකාරයෙන් නොනැසූ බැවින් ඒ දෙදෙන සමාධි ප්‍රඥා දෙක්හි ප්‍රදේශයක් ම කරණ බැවින් එහි ප්‍රදේශකාරීහු වෙත්. අනාගාමී පුද්ගල තෙම වනාහි කාම රාග ව්‍යාපාද යන මේ අකුශලයන් මුල්සිඳ නැසූ හෙයින් සීලයෙහිද සමාධියෙහිද අඩුවක් නොව සම්පූර්ණකාරී වේ. රහත් තෙම සලීකාරයෙන් මුල්සිඳ මොහය නැසූ හෙයින් ඕ හට අවිෂය නැතැක් නැත්තුසි ශීල සමාධි ප්‍රඥා යන මේ ත්‍රිවිධ ශික්ෂා වෙහි සම්පූර්ණකාරී වේ.

මෙසේ සීලයෙන් වන කාය විවේකයද, සමාධියෙන් වන චිත්ත විවේකයද, ප්‍රඥාවෙන් වන නිරුපධි සංඛ්‍යාත උපධි විවේකයද යන මේ ත්‍රිවිධ විවේකය පහළවීම් ආදිවූ ප්‍රමාණානික්‍රාන්ත ගුණානිශංස යන්හේ ප්‍රතිලාභයට කාරණවූ විශිෂ්ට ශෝභන මෙම ත්‍රිවිධ ශික්ෂා වන්හේ ප්‍රභෙද අනිශංස මේ ආදී ක්‍රමයෙන් ප්‍රකාශකොට දෙව් මිනිසුන් සහිත සියලු ලොකයාහට කරණලද තුන්ලෝව පතළවූ උතුම් ධර්මානුශාසනාවන් ඇති හෙයින් සමන්තාභද්‍ර ජගදේකශරණවූ මාගේ බුදුරජාණන් වහන්සේ "ශාස්තෘ" නම් වන ශේෂ එසේ හෙයින් කියනලදී.

දෙවාසුරමනුස්සානං, ලොකෙ අග්ග ඵලං දද-,
දදන්තං දමිතත්තානං, පුරිසාජඤ්ඤ තෙ නමෝ සි.

ඛන්ධානුශංස විභාග වර්ණනා නම්වූ
ප්‍රථම පරිවෙජ්දය.

මෙසේ පළමුවෙනි ධම්මානුශාස විභාග වණ්ණනා පරිච්ඡේදයෙන් ධම්මානුශංස මහත්ත්වය ප්‍රකාශකොට ලෝවැඩ දක්වා තදනන්තරව දැක්විය යුතු සීල කථාවන් අතුරෙහි **සරණාගමනය** ආදියෙහි දැක් විය යුතුය. ඒ සරණගත වන්නහු විසිතුදු ත්‍රිවිධ **රත්න** ගුණානුස්ම රණයෙන්ම ඒ සරණයට පැමිණියයුතු බැවින් තුන්ලොවට ශිවඞ්කර වූ, මොහදුරව දිවාකරවූ, මරසෙනගට භයංකරවූ, අප බුදුරජාණන් වහන්සේගේ පූර්ව ප්‍රණිධියෙහි පවත් ගුණාංශ මාත්‍ර යක් මෙහි දක්වනු ලැබේ.

එහි පූර්ව ප්‍රණිධි සංඛ්‍යාත නිදාන කථාව වනාහි **ඛාකිරනිදානය, මහානිදානය, අවිදූරෙ නිදානය, දූරෙනිදානය, අවිදූරෙනිදානය, සන්තිකෙනිදානය** යි සැවැදෑරුම් වේ.

එයින් අප මහබෝසතාණන් යවගිය දවස පළමුවෙන් මාතු පොසඛ ධම්සෙහි පිහිටා නමා වැදූ මවට උපසථාන කෙරෙමින් සුබවාසවාසී බ්‍රහ්මරාජයාගේ සහායයෙන්; බුදුවීමෙහි සිත බැඳගත් තැන් පටන් අප්‍රමාණ බුඩකාරක ධම්පූරණයෙන් සසර ඇවිදිනා කල ගජප්‍රියවූ ඉත්‍රැනාප නම් රජව, සසර කලකිරීමෙන් බ්‍රහ්මර්ෂි තාපසව ව්‍යාඝ්‍ර ධෙනුවට සවකිය ශරීර මාංස දානය දීමෙනුදු, පුරාණ දීපංකර බුදුන් සමයෙහි සහෙතුක කුශලකම් බලයෙන් රාජ කුමාරිකාවක්ව ඉපද, අඛතෙල් දන්දීමෙනුදු, සිතින්ම බුදුබව ප්‍රාර්ථනාකෙරෙමින් මෙයින් විශතාසංඛ්‍ය කල්ප ලඝුයකින් ඔබ්බෙහි දානශීලාදීවූ සුවරිත ධම් පූරණයෙහි යෙදී හැසුරුණුබව, **ඛාකිර නිදාන** නම් වේ. ස්ත්‍රී ව සිට සිතින් ම බුදුබව ප්‍රාර්ථනාකල තැන් පටන් **පුරාණ** ගෞතම බුදුන් සමයෙහි මනොප්‍රතිඛාත්‍යයාගේ මුදුන්පත්ව වාක්ප්‍රණිධානයට පටන්ගත් තැන් දක්වා ශතාසංඛ්‍ය යක් ඇතුළත පැවති බොධිසත්ත්වචරිතය, **මහානිදාන** නම් වේ. ඒ වාක් ප්‍රතිඛානය පටන්ගත් තැන් පටන් මෑත දීපංකර බුදුන් සම යෙහි අෂ්ටධම් සමොධානයෙන් නියත විවරණශ්‍රී ලැබීම් දක්වා නව අසංඛ්‍යයක් ඇතුළත පැවති බොධිසත්ව චරිතය, **අවිදූරෙනිදාන** නම් වේ. ඒ දීපංකර පාදමූලයෙහිදී විවරණශ්‍රී ලත් තැන් පටන් වෙස්සන්තර රජවීම් දක්වා පැවති බොධිසත්ත්වචරිතය, **දූරෙනිදාන** නම් වේ. ඒ වෙස්සන්තර රජවූ තැන් පටන් බොධිමූලයෙහි වැඩ හිඳ බුදුවීම දක්වා පැවැති බොධිසත්ත්වචරිතය, **අවිදූරෙ නිදාන** නම් වේ. බුදු වීමෙහි පටන් කුසිනාරානුවර පිරිනිවන් පෑම දක්වා ඒ ඒ තන්හි පැවැති භාග්‍යවතුන්වහන්සේගේ සියලු බුඩචරිතය **සන්තිකෙනිදාන** නම් වේ.

මෙසේ ඡවිප්‍රභෙදවූ නිදාන කථාවන්ගේ මේ දැක්වූයේ අති සංක්ෂේපය වේ. විස්තර වශයෙන් දක්වත්හොත් ඉතා මහබෙව එදකුදු වුවත් අසංඛ්‍යාරණවූ බොධිසත්ව චරිතය දැන එහි ආදර උපදවා, බුඩකාරසඩම් පූරණයෙහි යෙදෙනුකැමති ශ්‍රඩා බුඩිසම්පන්න සත්පුරුෂ ජනයන්ගේ උත්සාහ වඩවනු පිණිස සොළසැකි නිදාන යෙහි හා, සොදනතක නිදානයෙහිද, මහාසම්පිණඩ නිදානයෙහිද, ආ ක්‍රමයෙන් එම බාහිර නිදානාදි මෙහි දැක්විය යුතු විසිතුරු නිදාන කථාවන් සංග්‍රහකොට දක්වම්හ. ඒ වනාහි සත්පුරුෂ ජනයන් විසින් සිත්හි ලා සාදරව ඇසීමෙන් අත්වැඩ පරවැඩ සැදීමෙහි උත්සාහ සවයුතු. එහි මාතෘපොසත ධර්මයෙහි යෙදී බුඩ්මරාජ්‍යාගේ සහායෙන් බුදුවීමට සිත් යොමුකළ පරිදි කෙසේ ද? යත්:

මේ මහාභද්‍ර කල්පයට විසතුසංඛ්‍යයක් හා කල්ප ලක්ෂයකින් ඔබ්බෙහි කල්ප අසංඛ්‍යයක් යනතුරු අතර බුදුවර කෙනෙකුන් වහන්සේගේ ලොව නොඉපදීමෙන් බුඩශූන්‍යවිය. එහෙයින් ඒ අසංඛ්‍ය ශූන්‍ය අසංඛ්‍ය නම්විය. මෙහි කල්ප අසංඛ්‍යෙයකැයි කියා නම් ලුහුඩුකොට කිබව මුත් දවස් මාස් අවුරුදුවශයෙන් කල්පය මෙතෙකැයි ගණන් ප්‍රමාණ නියමකොට දක්කයුතු ලුහුඩු කාලයක් නො වෙයි. උපමා වශයෙන් කල්පනා කටයුතු වූ මහත් දීඝ කාලයෙකි. අසංඛ්‍යයද එසේම ඉතා මහත් දීඝදෙයකි. අවුරුදු කල්පාදි වශයෙන් ඒ ගමතොකැයි යන ගණනක් නැති හෙයින්ම **අසංඛ්‍ය** නම් වෙයි. එයට වඩා මහා බෝසතාණන්ගේ පාරමිතා භූමිය දීඝ කාලයක් වන බව හඟවනු පිණිස කල්පවිභාගය ප්‍රඥා වානුගත පමණක් මෙහි දක්වනු ලැබේ. කල් යනතෙම **අසංඛ්‍ය කල්පය, සාවතිකල්පය, සංවත්තඨායිකල්පය, විවතිකල්පය, විවතිඨායි කල්පය, මහාකල්පයයි** පරියාය වශයෙන් සතෙක් වේ

එහි අසංඛ්‍යකල්පය නම් කවරහ? යත් සත්වයන්ගේ කුසල සමාදානය හෙතුකොටගෙණ දසඇවිරිදි මිනිසුන් පවත් ආයුෂ ක්‍රමයෙන් වැඩි හොස් අසංඛ්‍යයට පැමිණ සත්ත්වයන්ගේ අකුසල සමාදානය හෙතුකොටගෙණ අසංඛ්‍යයෙහි පවත් තැවත ආයුෂ ක්‍රමයෙන් බැස දස හවුරුදු වන තැන් දක්වා මේ දෙ අතර එක් **අසංඛ්‍යකල්පයෙක්** නම් වෙයි. හේ දහසක් අවුරුද්දෙන් අහලක් වඩනා පොලොව එක් ගොදුන් තුන්ගව්වක් උස වඩනා පමණ කල් වන්නේය. ඒ අසංඛ්‍යකල්පය පෙරළෙන කාලයෙහි මිනිසුන්ගේ **ලොභාධිකචිතතම්** සත්ත්වයෝ රෝගයෙන් නස්නාහු ය. **මොහාධිකා** වී නම් ශස්ත්‍රයෙන් නස්නාහුය. **දුර්නිසයෙන්** නස්නාහුය.

සංවර්තාදි චතුෂ්ප්‍රකාරවූ අසංඛ්‍ය කල්පයෝ කවර හෙයින්ද? යත්-

මොහු මෙතෙක් වර්ෂ සියදහසක, දහදහසක, ලක්ෂයෙකැයි ඇතාදි ක්‍රමයෙන් සංඛ්‍යා නොකොට හැක්කෙන්, අසංඛ්‍ය කල්ප නම්වූහ. කල්පවිනාශ මහාමේඝදෙකි පවත් ලෝලෝපවේදය දක්වා ලොව නසිමින් සිටි කාලය සංවර්තකල්ප නම් වේ. ඒ ජ්වාලාසිඳීමෙහි පවත් කෙළලක්ෂයක් සක්වළවල එක පැහැර පිරී සිටි සමපත්ති කර මහා මේඝය දක්වා ලොව නැසී සිටි කාලය, සංවර්තස්ථායි කල්පය නම් වෙයි. සමපත්ති මහා මේඝයෙහි පවත් වළඳ සූර්‍ය්‍යයන්ගේ පහළවීම දක්වා ලොව උපදිමින් සිටිකාලය විවර්තකල්ප නම්වේ. වළඳ සූර්‍ය්‍යයන්ගේ පහළ වීමෙහි පවින් කැවෙන කල්ප විනාශ මහාමේඝය දක්වා ලොව ඉපද සිටි කාලය විවර්තස්ථායි කල්ප නම්වෙයි.

මෙයින් එක් අසංඛ්‍ය කල්පයෙක් නම් යථාකි අනන්‍යකල්ප ගණනින් සූසැට අනන්‍ය කල්පයක් වන්නේයි. මෙම කිහ ලොඝ දීපසාරයෙහි; "සංවට්ටස්ථායි අසංඛ්‍යෙය්‍යං, චතුඝනි අනන්තරඝඛඝ හෝති" එහෙයින් අනන්‍යකල්ප දෙසිය පණසක් පමණවූ කාලය මහාකල්පයෙක් නම් වෙයි. හේ දිගින් සතරඟවූ පළලින් සතර ගවූ උසින් සතරඟවූ පමණවූ, අටුවෙක මුදුන්ව වූළිකා බැඳ, අබ පුරාලූකල එයින් පුරුෂයෙක් වර්ෂ සියයක් ගියකල එකඑක අබ ඇවක් නහා හැරීමෙන් ශිෂ්‍රව ඒ මහා ඝර්ෂපරාශිය ගෙවී යන්නේය. කල්පයෙහි අවුරුදු නො ගෙවෙන්නේ යයි කියාද, තවද එපමණ දිග පුළුල ඇති උස ඇති එකඝනවූ මහා පර්වතයක් වර්ෂ සියයක් සිය යක් ගියකල, කසී සළුවකින් එක එක වරක් බැගින් පිරිමැදීමෙන් ඝිදුරු නැති ඒසා මහා පර්වතය වහා ගෙවී යන්නේය. නපෙර අවුරුදු එනෙක්කල් ගියත් නො ගෙවෙන්නේ යයි කියාද බුදුන් විසින් වදාරණ ලදි.

මෙසේ ඝර්ෂපෙපමාවෙන් හා පර්වතොපමාවෙන් කල්පනා කට යුතු බැවින් කල්පනම්වේ. ඒ කල්පඝද; ශූන්‍ය කල්පය අශූන්‍ය කල්පයයි විප්‍රකාරවේ. එහි බුඩ ප්‍රත්‍යෙකබුඩ ශ්‍රාවක, චක්‍රවර්ති ආදින්ගේ ඉපදීමක් නැති කල්පය ශූන්‍යකල්පනම්වෙයි. ඒ බුඩ-දින් උපදනා කල්පය, අශූන්‍යකල්ප නම්වෙයි. අශූන්‍යකල්පඝද, සාර කල්පය, මණ්ඩකල්පය, වරකල්පය, සාරමණ්ඩකල්පය, භද්‍ර කල්පයයි පඤ්චප්‍රකාරවේ. එයින් එකම බුදුවර කෙනෙකුන් වහන්සේ උපදනා කල්පය සාරකල්පය නම්වෙයි. බුදුවරයන් දෙදෙනෙකුන්වහන්සේ උපදනා කල්පය මණ්ඩකල්පය නම්වෙයි. බුදුවරයන් තුන්දෙනෙකුන් වහන්සේ උපදනා කල්පය වරකල්පය නම් වෙයි. බුදුවරයන් සතරදෙනෙකුන්වහන්සේ උපදනා කල්පය සාරමණ්ඩකල්පය නම්වෙයි. බුදුවරයන් පස්දෙනෙකුන්වහන්සේ උපදනා කල්පය භද්‍රකල්පය නම්වෙයි. ගුණසාර විරහිතවූ සියලුම

ශූන්‍ය කල්පයන්ට වඩා උතුම්වූ සාරගුණ උපදනා කල්පය සාර කල්පයයි ලද නම් ඇති; මේ සාරකල්පාදි අශූන්‍යකල්පයෝ පස් දෙන තම තමන්ගේ අන්වර්ථ නාමවශයෙන් එකිනෙකාට වඩා විශිෂ්ටවූ, ලෞකික ලෝකොත්තර ගුණයෙන් දෙවිමිනිසුන් සහිත සත්ත්වයන්ම උපදනා හෙයින් හා, පළමුව බුදුවූ බුදුහු දෙවෙනිව උපදනා බුදුන් ප්‍රකාශකොට දක්වනලේක. දෙවන, තුන්වන, සතරවන බුදුවරයන් වහන්සේලාද එසේම වදාරණ සේක්ලාය, ඒ අසා සත්ත්වයෝද, ඉතා සතුටුව, ඒ ඒ බුදුන් දැක, අප අප ලද ජීවිතය සඵලකොට ගණුම්හයි ප්‍රාර්ථනාකොට, අතිශයින් අප්‍රමාදව, වියැවී වඩම්න්, දන සීලාදිවූ සුවරිත පිරීමෙන් අත්වැඩ පරවැඩ සාදා ගැණීමෙහි යෙදෙන්නාහුයි. පස්බුදුකෙනෙකුන් වහන්සේලා උපදනා කල්පයෙහි උපදනාවූ සත්ත්වයෝ, බුඩප්‍රත්‍යේක බුඩ ආර්‍යශ්‍රාවකාදී උතුම් කල්‍යාණමිත්‍ර සෙවනසෙන් සැප බහුලව ලබන්නාහුය! බොහෝසේ ත්‍රිහේතුක සත්ත්වයෝ සෝලෙසුන් සහා රහත්වන්නා හුය. ත්‍රිහෙතුක සත්ත්වයෝ සප්තවිධ කාමසවග්‍රහයෙහි උපදනාහුය. අහෙතුකයෝ කල්‍යාණ මිත්‍ර යොගය නිසා හෙතු සම්පත් ලබන්නා හුය. එසේ හෙයින් ඒ කල්පය බොහෝසත්ත්වයන්ට යහපත්, සැප බහුල වන බැවින් භද්‍රකල්පනාම්විය. ඒ භද්‍රකල්පයට වඩා බුඩාදීන් ගෙන් සැරහුනු අනිත් කල්පයක් නැත. එසේවූ භද්‍ර කල්පයක් ලැබීමද, නුග දිඹුල් රුක්වල මල් හට ගැණීමක් සේ ඉතා දුර්ලභ වන්නේයි.

එකෝ බුඩෝ සාරකප්පෙ මණ්ඩකප්පෙ ජිනා දුවේ
වරකප්පෙ තයෝ බුඩා-සාරමණ්ඩ චතුජ්ජිනා
පඤ්චබුඩා භද්දකප්ප- තන්තා තන්තධිකා ජිනාති.

මෙසේවූ මහාකල්පයන්ගේම අසංඛ්‍යයක් එක්වූ අති දීඝී මහා කාලයට කප්පසංඛ්‍යයයනු කමෙක. එහි අසංඛ්‍යනම් කොපමණෙක් දැයි කිව හොත් "තස්ස අසංඛෙය්‍යානි න සංඛෙය්‍යා, අසංඛෙය්‍යාව එකාදිවිසෙන ගණෙහවා, යාව පමාණකතෝ වා සංඛෙයෝ නාම, තතොපරං ලකඛංවා, පමාණංවා අකතවා, අසංඛෙය්‍යා නාම වුවචති" යනාදි ක්‍රමයෙන් සොළසැකි මහානිදාන යෙහි දැක්වූ බැවින්; අසංඛෙය්‍යකම් ගණන් වශයෙන් සංඛ්‍යාවට නොපැමිණ නොහැඟි සිටි ගමිකිසි වස්තුන්ගේ රාශි යෙක් ඇද්ද ඒ රාශිය අසංඛ්‍යනම්. එකය දෙකය, යනාදි වශයෙන් සංඛ්‍යාවට නගා ගෙණ ගම්නාක් ගණනින් පමණ කරණ ලද්දාහුද ඒ නාක් සංඛ්‍යාවට සුදුසුවූ ගණනට නැගෙන කරම් වසතුහු

සංඛ්‍යා නම්වෙති. එයින් මත්තෙහි ගණනක් හෝ, ප්‍රමාණයක් හෝ නොදක්නාට, සිවිමඟ අසංඛ්‍ය නමැති කියනු ලැබේ.

තවද එහිම "ගණනායං නාම මේ අනනානි හොන්ති, ඛත මානි මේ අනනානි? ආළ්හනනසහස්සඛණානි ගනනසහස්සානි'ගණනදීන් කී බැවිනුදු ගණන නම්, ආදි අනන්තයින් කෙළවරදෙකෙක්වෙත්. අසංඛ්‍යයට එහේ අනන්ත කෙළවර නොපෙණෙන්නේ වී නම් එකම අසංඛ්‍යයයි නොකියා කවරකාරණයකින් දෙතුන් අසංඛ්‍යයක, සතර අසංඛ්‍යයක, පන් අසංඛ්‍යයක, දස වැනි අසංඛ්‍යයයි කියන ලද්දේද? යත්; මෙහි එහේ කියයුතු නො වෙයි. එකය දෙකය යනාදි ක්‍රමයෙන් ගැණගෙණ ගොස්, සංඛ්‍යාවූ දෙකෙළවර ඇති මහා කථනය යන ගණනට බඳිබෙහිවූ, අසංඛ්‍යෙය්‍ය යන නාම ව්‍යවහාර යට පැමිණි නැන නැවත එයින් නැවති දෙවන අසංඛ්‍යය ද, එකය, දෙකය යනාදීන් වියින් යට කී පරිද්දෙන් සංඛ්‍යාකරණ බව එම සොළසැකි නිදානයෙහිම දැක්වූ හෙයින්ද; අසංඛ්‍යයට බඳිබෙන් ගණනක් නැති හෙයින්ද, මහාපෘථිවිය ආදි ඒසා මහත් වස්තු පවා අසංඛ්‍යයට ලක් නබන්නට නොසැහෙන හෙයින් දැයි යනාදි නොයෙක් කාරණා ඇති බව සැලකීමෙන් අසංඛ්‍ය ප්‍රභේදය නුවණැත්තන් වියිනි දතයුතු. මේසේ සංඛ්‍යාකවියුතු වූ අසංඛ්‍යගණනයෙන් ම වියිඅසංඛ්‍යයක් හා කප් ලක්ෂයකින් බඳිබඟි එසේ මහා කල්ප අසංඛ්‍යයක් ඉක්ම යනතුරු එකම බුදුනෙනෙකුන් ලොව නුපන්සේක.

එකල්හි ඒ ශූන්‍ය අසංඛ්‍යයවත් බඳිබෙහිවූ යටගිය දවස බුදු වරයන් ඇතිකල සෝවාන් ආදි මාගීඵලලැබ, සියලුම දිව්‍යලෝක වල, බ්‍රහ්මලෝකවල ගහනව සිවිඅවූ යථාක්‍රමයෙන් දිව්‍ය බ්‍රහ්ම සුව විඳ ගොස්, අකනිෂ්ඨාවට පැවිණ, ස්කන්ධපරිනිර්වාණය වීමෙන් බොහෝ ආශ්‍චර්යත්වයන් ක්‍ෂය‍ව ගියකල්හි හවතාණෝ අධික බැවින් ඒ හැමට පසුවසිටි, සෝවාන් සකෘදාගාමිහු ඒ ඒ දෙවිලෝව ආයු සම්පත්වූ පරිද්දෙන් සියලු පඤ්චකාම සැප අනුභවකොට, නිම්මා, පරනිර්මිත වසවර්ති දෙවිලොවසිට, කාමවිරාග භාවනාව වඩා බඹිලොව ඉපද, ඒ ඒ බ්‍රහ්ම ලොකවලද ආයුසම්පත්වූ පරිද්දෙන් ධ්‍යාන සුවවිඳ, වෙහප්ඵලනම් බඹලොව සිවි භාවනාවඩා, අන, ගාමිව; සුඛාවාසයෙහි ඉපිද; එහිදු ආයු සම්පත්වූ පරිද්දෙන් බ්‍රහ්ම සුවවිඳ; ක්‍රමයෙන් ගොස් මහාකල්ප සොළොස් දහස්කට ආයුෂ ඇති අකනිට්ඨ බඹලොව ඉපද, එහි ආයු ප්‍රමාණයෙන් ධ්‍යානසුව විඳිමින්, රහත්ව; වසන පස්වීමවූ එක් බ්‍රහ්ම රාජයෙක් ධ්‍යානයෙන් නැගී, ලොව බලනුයේ සුඛාවාසවල බ්‍රහ්ම රාජයන් බොහෝ නැතිබව දැක, මෙසේ සවල්පතරවීමට කාරණා කිම්දැයි පරීක්ෂාකොට, බුදු

කෙතෙකුත් නුපන් හෙයිනැයි දැක මහත් සංවේගයට පැමිණ බුද්ධ කාරක ධම්පූරණයෙහි දැඩ සිත් ඇති පුරුෂයන් සියලුසක්වලවල විමසා, බලනුයේ සෙසු අනන්තාපරිමාණ සක්වලවල නැති සේ දැක මේ මහල්සක්වල බලා එකලට බුදුබව පැතිමෙහි නියුක්තව සිටි නොයෙක් දහස්ගණන් බොධි සත්ත්වයන් දැක සතුටු සිත් ඇත්තේ; වඩ වඩා ලෝවැඩ වඩනු පිණිස, "කරුණා විය්‍යී සම්පන්න පුරුෂයන් ලවා බුදුබව ප්‍රාර්ථනා කරවමියි," සිතා, නැවතද ලොව බලනුයේ එකෙනෙහි කරුණා විය්‍යී සමංගිතායෙන් මූහුදු වැද, පිහිතත අප මහබෝසතානන් දැක විත්තාබභ්‍යනතර ගතව, බුදුබව ප්‍රාර්ථනාකරවිය.

අප මහබෝසතානන් මූහුද පිනු පරිදි කෙසේද? යත්:- යට කියන්නලද ඉතාවූ අසංඛ්‍යයෙහි, අප මහබෝසතානෝ හංසාරාරව දිළිදුකුලයෙක ඉපද වැඩිවිය පැමිණ, මවුපියන් විසින් විවාහකිරීමට යාවිඤ්ඤකළ කල්හි ගේ නොකැමිනිව, "දෙමවුපියන්ට කළමනා උපස්ථානම අප්‍රමාදව කරමි"යි කියා, දෙමවුපියන්ට උපස්ථානකරමින් වාසනුවෝ කල්යාමෙන් පියානන් මිය පරලොව ගියකල්හි මැනියන් විසිනුදු පෙරසේ විවාහගුල් කරණු පිණිස යාවිඤ්ඤකළකල්හි ඒකොකැමැතිවූහ. එතැන්පටන් සිහිනුවණින්යෙදී අතරණවූ මව රක්ෂාකරන්නාහු ආරණ්‍යයට වැද, දරපලා සපයාගෙණවුත්, විකුණා එයින් ලද මිලයෙන් මැනියන්ට උපස්ථානකරමින් වසනුවෝ, එක්දවසක් වල් වැද, ඇවිද, ශ්‍රීෂ්මඃඟිතප්තව, පිපාසිතව, පැන්බී ගංතෙරට නුදුරුවූ කුහරුක්කක්මූල මදකලක් සැතපී, නැවත පිබිදැ; සිතනුවෝ මම දැන් සරණව බලසම්පන්නවූ සෙමි. මෙපමණ දුක් ඉවසන්ට හැකි සෙමි. මහලුකල හෝ ව්‍යාධියක් පැමිණිකල කුමක් කෙරෙම්දැයි සිතා එසෙණෙහි සිතන්නාහු "මම වෙළඳුන් සමග සවණ් භූමියට ගොස්, රන්ගෙණවුත් සැපසේම, මවට උපස්ථාන කෙරෙමියි සිතා වෙළඳුන් කරා ගොස්, ප්‍රධාන වෙළඳුනන් සම්පයෙහි සිටි කල ගෙතෙම "දරුව, කුමක් පිණිස ආයේදැ" යි, විමාළේය. එවිට කමන් සේ අභිප්‍රාය වෙළඳ දෙවුහට දන්වන්නාවූ මහබෝසතානෝ.—

දළිද්දෙ දුන්ඛං සාමි, සඤාමා'ස්මි ආගතෝ
සවෙ මං අනුකම්පාති, තාහං සඞ්ගං ගමිස්සාහනාති.

යන මේ ගාථාවෙන් තම දිළිදුබව හා අනුකම්පා කරන්නෙහි ඔහුම තොප හා සමග වෙළඳුමේ යන පිණිස ආවිහයි දන්වූහ. ඒ ඇසූ නාවිකතෙම, ආරෝහ, පරිනාහ, බලසම්පන්නවූ ඒ පුරුෂයා දැක, ඉතා සතුටුව, දන්වනුයේ.

සාධු තාත සුභාසෙහි, ඛිපමෙහි මමන්තිකං
යත්තකං වෙතනං තුයහං, තත්තකං තෙ දදාමහං
අඤ්ඤම්පි සම්බලං දෙමි, යදා ඵං ඛන ලච්ඡසි
තෙන තාත සුඛී ජීව, යාවදෙව යථිච්ඡිතං'ති

යන මේ ගාථා දෙකෙන්, දරුව, තෝකිගේ මැනව; මා සමීපයට එව; යම්පමණ මිලයකින් තට ප්‍රයෝජන වී නම් එපමණ දෙමි. යම් කලෙක තෙපි ධන ලබන්නෙහිද? ඒ තාන් අහෑවූ මාගේපකාරණිද දෙමි. එසින් දරුව, තොප දිවිහිමියෙන් කැමැතිගේ, සුවයෙන් ජීවත් වෙවයි කීය. ඒ ඇසූ බෝසතාණෝ ඔහු වැඳ, වහා න්‍යග්‍රොධ මූලයට ගොස්, නැවත සිතනුවෝ ඉදින් මම සවඥීහුමියට ගොස් එකතුරු මෑගේ මවට කවරෙක් උපස්ථාන කරන්නේද? එහෙයින් මා ඔයින් සිතුයේ නුසුදුස්සෙක. පලමුකොට මැනියන් විවාරා ඔවුන්ගේ සිත දැන පසුව දනිමි" සිතා ඒ සපඤාතත් දර, පලාහාර යන් උසුලාගෙණ ගෙට ගොස්, මදක් කල්යවා බත් අනුභව කොට මුවසෝදා මව සමීපයට ගොස්, වැඳ දන්දෙනුවෝ මැනියෙනි, සෙසු දවසට වඩා අද දවස මම වකලයෙහි ඇවිද මහත් දුකට පැමිණියෙමි එහෙයින් කිසම මැනියෙනි, මම දැන් තරුණව බලසම්පන්නයෙමි. මෙබඳු බර ඉසිලිම් ආදි කාය්‍යයෙහි සමර්ථවෙමි. මහලුකල හෝ, ව්‍යාධි පැමිණිකල හෝ කුමක් කෙරෙමිද? එහෙයින් මැනියන් වහන්ස, මා හා සමග යන්ට පිළිවන් වීනම්, සවඥීහුමියට යනු කැමැත්තෙමි" යි දැන්වූහ.

බෝසතාණන්වහන්සේගේ වචනය අසා කියන්නී, "දරුව මාගේ ජීවිතය තා පිළිබඳය. එහෙයින්, යම් කැනකට යනු කැමැත්තේහි වී නම් තොප හා සමග නික්ම යෙමි" යි කීවාය. ඒ ඇසූ බෝසත්තෙම මව වැඳ අවසරගෙණ, නැවත වෙළඳුනන් සමීපයට ගොස් කියනුගේ සවාමීනි, මම එකලාව නොයමි. මෑගේ මැනි තොමෝ, සවාමි මල හෙයින් අසවාමිකවූවාය; මහලුවූ දිළිදු දුක්පත් ඒ මවට මාහැර උපස්ථානකාරන්නාවූ අනික් පුතෙක් දිසනි කෙනෙක් මුකුබුරෙක් නැත. එහෙයින් මැනියන් හැර යන්ට නොහැක්කෙමි. මැනියන් සඳහ යන්ට අවසර දුනහොත් යෙමි. නැත හොත් නොයමියි දැන්විය. ඒ ඇසූ වෙළඳතෙම සතුටුව, "දරුව මිනව, තාගේ මැනියන් හෝ පුත්‍ර දරුවන් හෝ වහා ගෙණ එව; ඔවුන්ට වැටුප් වියදම් මම දෙමියි කීය. බෝසත්තෙම, ඒ අසා, සතුටුව, තමාගේ ගෙට ගොස්, ගෘහයෙහි යම් කිසිවක් ඇත්නම් ඒ හැමගෙණ, මවුන් දැන් එක්වම, වෙළඳුනන් සමීපයට ගියේය. වෙළඳ තෙම ඔවුන්ට සත්කාර කොට, කීපදවසක් වැස කැවි කැගෙන කල්හි බෝසතුන් කැඳවා, දරුව, මෙතැන් පටන් සියලු

ධනය හෝ මාංශෝපසඤ්ඤ හෝ නැවද තොපට හාරය සි කියා සියලු කෘත්‍යයන් භාරකොට, බෝසතුන්ට දිරුයතු සියල්ලම දී, සංග්‍රහ කෙළේය.

එකල්හි අප මහබෝසත්තෙමේ සියලුකෘත්‍යයන් කොට තමාගේ මව නැවට නංවා, වෙළඳුන් හා නැව් නැගී යනුගේ සත්වයෙක් මුහුදු පිට නැව දුවනකල්හි ගමන් අඩිනබැවින් නැවතිදි මුහුදු ගැලින. එකල්හි සියලු වෙළඳන්ගේ තොරතුරක් විප්‍රකාරයට පැමිණියානුත. බෝසතාණෝ, තමන් දිවි රක්නා පිණිස මදක්නැන් පිනාගොස්, මැණියන් සිහිකොට, නැවත බලනුවෝ එක් දඬුකඩා ළඳබසිටි මැණියන් දක, එතනට ගොස්, මැණියන් උසුලාගෙණ, මුහුදු පිනන්ට පවන්හත්ත. එකණෙහි යටකියනලද ක්‍රමයෙන් සුබාවාසමාසි බුහ්ම රාජතෙම බුබඤාරක ධම්පුරණයට කරුණා වියැ සම්පත්‍ය සත්ත්වයන් පරිභෝගකරණුගේ, තමාගේ මැණියන් පිණිස ජීවිත පරිත්‍යාග කොට, වියැකරන්නාවූ; ඒ මහාපුරුෂයා දක "මෙතෙම, සමුද්‍රය ඉතා මහත් ගැඹුරුබවද, කෙළවරක් ගොඩක් නොපෙණන බවද නොසලකා, තමාගේ ජීවිත පරිත්‍යාග කොට, සබඤ්ඤ මව එතර කරණු කැමැත්තේය. මෙබඳු දුසවියැ ඇති තැනැත්තේ බුබඤාරක ධම්පුරණට සමවිය" සි සිතා; ඔහුගේ සිතට ප්‍රවේශව, බුදුබව පැතීමෙහි සිත්ගොමුකරවිය; මෙසේ ඒ බ්‍රහ්මරාජයා විසින් උත්සාහිතවූ මාතුපොසක ධම්යෙහි පිහිටි ඒ මහාපුරුෂයාතෝ රළ පතර වෙහයෙන් මුහුදු ගැලෙන්ට ආරම්භවූකල්හි, මේ මුහුදමැද මැණියන් හා සමග මරණට පත්වෙමි; එහෙත් මම එක සත්‍යක්‍රියා වක් කෙරෙමි සි සිතා,

බුද්ධාහං ඛොබඩිස්සාමි, මුත්තෙනාහං මහාවණෙ පරෙ
තිණ්ණොණාහං තාරයිස්සාමි, සංඝාරොයා මහාඉතඃ,

යෑකෑදින් මතු බුදුව මුලුලෝ වැස්සන් ගලවම්හැ සිනින්ම බුදු බව ප්‍රාප්තිනාකොට, මෙසේ සිතුවගත් උත්තමාඩ්‍යාසයෙහි ආකුතාව යෙන් හා එම බ්‍රහ්මානුභාවයෙන් දෙතුන් දවසක් ගියතාන මැණියන් සමග සැපසේ මුහුදින් ගොඩකැඟි, එක්තරා ගමකට පැමිණ මැණියන්ට කළමනා උපසථාන දුකසේ කිරීමෙන්, දිවිහිමියෙන් කුසල් කොට, දෙව්ලොව ඉපද, දිවසැප විඳින්ට වන්හ. මැණි තොමෝ කම් වූ පරිදි දෙන් මිය පරලොව ගියාය. අප භාග්‍යවතුන් වහන්සේ බුදුව සහම්පති මහාබ්‍රහ්මාදිවූ, දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍ය සමූහයා ඉසින් ආරාධිතව ධම්දෙශනාකරණ සමයෙහි තමන් වහන්සේගේ පූර්වප්‍රණිධිය සිහිකර වදාරා; සොළසැකි මහානිදාන යෙහි දක්වනලද ක්‍රමයෙන් මේ ගාථා වදාළසේක.

බුඬොහං බොධයිස්සාමි, ඉති යං පඨමං කතං
තෙන පතෙතාසම් සමබොඩිං, හඤ්ච බොධෙමි පාණිනං.

මුත්තොහං මොචයිස්සාමි, ඉති යං පඨමං කතං,
තෙන මුත්තොසම් සංසාරා, හඤ්ච මොචෙමි පාණිනං.

තිණ්ණොහං තාරයිස්සාමි, ඉති යං පඨමං කතං
තෙන තිණ්ණොසම් සංසාරා, හඤ්ච තාරෙමි පාණිනං ති.

මෙපණකින් අප මහබෝසතානන් පූර්ව්‍රප්‍රණිධානඵල කියා නිමවන ලදී.

ශත්‍රුඝාත නම් රජව සසර කලකිරී බුදු බව පැතූ පරිදි කෙසේ ද? යත්

ඒ මහසත්තෙම, දෙවලොවින් චුතව අවුත් නැවත දඹදිව මෙකලට බරණැස නම් එකල සිරිමතිනම් නුවර ඉහ්මදත්ත රජහට පුත්ව ඉපද, ශත්‍රුඝාත මහරජ යනනමින් ප්‍රසිඩව, සියලු දඹදිව වැසි රජදරුවන් ජිනින් පුදනලදුව, දිවයුරි වැනි රජ ඉසුරු විඳිමින් වසනුයේ ඇත් කෙළියෙහි නියුක්තව, සෙසු ඇතුන් හා දළින් දළ අන්වා, නිරන්තරයෙන් ඇත්කෙළි කෙළින්නේය. එකල්හි: එම නුවර වසන එක්තරා වැද්දෙක් දඹගොස් වනයෙහි ඇවිදින්නේ එක් විලක් අසල සිටි සවිලක්ෂණ සම්පන්න වූ මහත් ඇත්රජකු දැක, නුවරට අවුත්, එපවත් රජහට දන්වීය. රජ ඒ අසා මහසෙනග පිරිවරා තුමූම ගොස්, ඇතු බඳවා, නුවරට ගෙණවුත්, සියළු ඇතුරුවන්ට ප්‍රධානවූ එක් හස්ත්‍යාරොහයකු කැඳවා, "එම්බා ආචාරිනි, මීට සත්වන දවස්, මොහු පිරිට පැනනැඟී, මා නුවර ප්‍රදක්ෂිණාකොට, නැකැත්කෙළි කෙලනා පරිද්දෙන් මේ ඇතු සුශික්ෂිත කොට, හික්මවා, වහා ගෙණවයි," කියා ඇතු පාවාදින.

එද "යහපතැ" යි හිඳිස, එම සත්දවස ඇතුළත ඇතු සුශික්ෂිත කොට හික්මවා, ගෙණවුත්, රජහට පාවාදින. රජ ඇතා ඉතා සුමිනීත සේ දැක සතුටුව, රන්සැත් රන්පොරෝදු කුම්භාලඞ්කාර සෝවැනි කණිවුළිකා කොකාවැල, ගලමුතුමාලාදි නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් අතු සරහා ඒ ඇතුට පැනනැඟී, සිවුරඟ සෙනග සම ගින් නුවර ප්‍රදක්ෂිණා කොට, ඇවිදින්නේ රිට පලමුවෙනි තුදුස්වක් දින රාත්‍රියෙහි බොහෝ ඇත් සෙනග වලින් අවුත්, උයනට වැ, අඹ, දඹ, පොල්, පුවක් ආදී නොයෙක් වෘක්ෂජාති සිඳ බිඳ හෙලා, සුණු විසුණුකොට, දියසලා ඉලත්තිලා උයන පාළුකොට, ගියාගයි යන මේ ප්‍රවෘත්තිය උයන් ගොවිවාගෙන් අසා ඒ මහරජ ඇතුපිටින්ම උයනට ගොස්, ඇත් සෙනග කළ විප්‍රකාරය බලා, ඇවිදිනාකල්හි ඇතින්නගේ ශරීර ගන්ධය ආඝ්‍රාණය කොට, මදනැඟී මත්ව ශරීරය සොලවා පිවඵන් ඇතරුවා ඇදහෙලා, ඇතින්නන් ගිය දිසාවට අභිමුඛව දිවන්ට වන.

එකල රජ්ජුරුවෝ උඩබලා වැදහොත් ඒ ඇතරුවා දැක, තෙමේම අඟුස්ස ගෙන තමාගේ වෙරපමණින් කොටකොටා, ඇදන් ඇතු සිටුවා ගතනෙ ඕ මහසෙනඟ නොබලාම ඇතු කෙරෙහි ලොභයෙන් නො හැරම ගොස්, වන මඩ්‍යයට වන්කල්හි ජීවිත ලෝභයෙන් වෘක්ෂශාඛාවෙහා එල්බ සිටගත්හ. ඇතු සිතුලෙස දිව ගොස්, ඇතින්නත් හා මිශ්‍රභාවයට පැමිණියේය. එකෙණහිම සෙනඟ හස්තිපාදානුසාරයෙන් මලට ඉගාස්, රුහට නැගිහුන් රජ්ජුරුවන් පිරිවරාගෙන පෙරළා නුවරට වන්හ. නැ න රජ්ජුරුවෝ ඇතරුවා කැඳවාගෙණ නොසතුටුව එළබල හස්ත්‍යාචාර්‍යයි, තා විසින් දමනය නොකළ ඇතුපිටට මෙසේ මා නංවන්ට කරුණු කිමිදැයි විචාළහ. එවිට හස්ත්‍යාචාර්‍යයෙනම කියනුයේ; දෙවයන්වහන්ස, මටා ක්ෂමාවුව මැනව. ඇත්රජ ඉතා සුශික්ෂිතව, මනාකොට දමුනේය. සහපත් කුලෙහි උපන් ඇතෙක. ඇතින්නන්ගේ ගඤ්ඣරාගයෙන මෙසේ විප්‍රකාර වූයේය. එතකුදුවුවත් දෙවයන් වහන්ස, සෝක නොකළ මැනව. ඒ හස්තිතෙම විශෙෂයෙන්ම විනීතය. තමාගේ ජාතිය සිහිකොට නොබෝ දවසකින් එන්නේය. රිට සැන නොසිතා වදාළ මැනවයි දැන්විය

ඒ අසා මදක් මොලොක් සිත්ඇති රජ්ජුරුවෝ එසේවී නම් ආචාරිනී, නෙපි මෙසින් බැහැර නො යව. ඇත්රජ එසේ නො ආයේවිනම්, නොපගේ ජීවිත ඥ නොයිනවයි කිහ. ඇත්රජද ඇතිනි මූලනරා ගොස් තමාගේ මනොරථය පුරාගැන්මෙන් සද; වසක් එහි වැස සත් වන දවස අවුත්, ඇත්ගලම සිටගත. හස්ත්‍යාචාර්‍යී තෙම එදවස් අළුයම ඇත්ගලට ගොස්, ඒ ඇතු දැක එපවත් රජහට දැනවිය. එබස් ඇසූ රජ්ජුරුවෝ, ඇත්ගලට දිවගොස්, ඉතා සාන්තදැනත ලීලාවෙන් සිටි ඇත්රජු දැක, ඔහුගේ හිස පිරිමැදමැද හස්ත්‍යාචාර්‍යියාගට කියනුයේ; ආචාරිනි, මෙ බදු විනීතවූ ඇත්රජ, මාගේ බලපමණින් අඟුස්සෙන් කොටකොටා, අදිමින් යනාගමන වළකන්ට නොහැකිවූයේ කුමකින්දැයි විවාළහ. එවිට හස්ත්‍යාචාර්‍යිතෙම දන්වනුයේ දෙවයන් වහන්ස., කවර කාරණයකිස මෙසේ වදුරණ සේක්ද? රාගය නම් අඟුස්සටත් වඩා අවිනීතය. ඔන්නටවත් වඩා උග්‍රය. නාගවිෂටත් වැඩි සොරවිෂයෙක. එහෙයින් යන ගමන වළකන්ට නොහැකි වියයි දැන්විය. රජතෙම ඒ අසා, දැන් කුමකින් ඒ ඇතු තෙමේම නැවත ආයේදැයි විවාළහ. හස්ත්‍යාචාර්‍යී තෙම මාගේ මන්ත්‍රෞෂධබලයෙන් ආයේයයි දැන්වූ කල්හි එසේවිනම්, තාගේ මන්ත්‍රෞෂධ බලය මට දක්වාලවයි කිහ. රජහට යහපත දෙවයන් වහන්සැයි, කියා, මහත්වූ ලොහ ගුලියක් ගෙන්වාගෙන, දිලිසෙන ඔනි අඟුරක්සේ කඹුරන්

ලවා රත්කරවා අඹුවෙන් යවට ගෙණ තමාගේ මන්ත්‍රානුභාවය කියා, හස්ත්‍යාවාශ්‍යීතෙම ඇතු කැඳවා කියනුයේ මහාශ්චර්යය මේ ලොහගුලිය ගණුව. මම නැවත කියනතාක්කල් නොදමවයි කියා ඔහට දිනා. ඇත්රජ සොඬ දිගු කොට දිලියෙන යවටගෙණ, තමාගේ සොඬ දෑ සිටිකල්හිදු හස්ත්‍යාවාශ්‍යීයන්ට හසින් අත් නො හැර සිටියේය. මහරජ ඒ දැක ඇතු මියයෙයි යන හසින් දිලිසෙන යවට දම්මවා, අහෝ රාගය නම් ඉතා වණ්ඩය. මහත් සොරය. බොහෝ උපද්‍රව ඇත්මය. රාගය නිසාම මේ සියලුසත්ත්වයෝ සංසාර සාගරයෙහි ගැලෙන්නාහ. රාගය නිසා අව මහනිරයෙහිද එක්සිය අටවිසිදුත්ඔද, නරකවලද පැසෙන්නාහුය. එසේම ප්‍රෙත ලොකයෙහිද අනෙකප්‍රකාර තිරිසන් ජාතිවලද උපදනාහුයයි කියා, සසර කලකිරුණාවූ අප මහබෝසතාණන් වහන්සේ,

රාගාතුරෙතිමෙ සත්තා, පිතා පුත්තම්පි ඝාතයි,
පුත්තොපි පිතරං හන්ති, මාතරෝ හන්ති ධීතරං.

රාගාතුරෙතිමෙ සත්තා, ධීතා මාරෙති මාතරං
භාතරෝ භාතරං හන්ති, භගිනී ඝාතෙති භාගිනිං.

රාගාතුරෙතිමෙ සත්තා, සුඛං හාපෙන්ති සබ්බදා
නස්සන්ති කුසලා ධම්මා, සුගති ච ගහං නිවාරයෙ.

රාගාතුරෙතිමෙ සත්තා, ලොභ දෙස වසංගතා,
වඩ්ඪන්ති භව සංසාරා, අපායා විනිපාතිකා

මේ ආදී නොයෙක් ගාථායෙන් නොයෙක් සසරදුක් ප්‍රකාශ කොට නෙපි කියේ සැබෑසේ සතුටුව, හස්ත්‍යාවාශ්‍යීයාට බොහෝ සම්පත්දී මෙසේවූ සසර දුක්විඳිනා සත්ත්වයන් කෙසේනම් සසරින්. මුදම්දෝහෝයි පරික්ෂාකොට, බුබහාරඤ්ඣමය ගැර අන්කිසි උපායක් නැත. එහෙයින් බුදුබව ප්‍රාර්ථනා කරමිසි සිතා,

බුඩ්ඣිහං බොධයිස්සාමි, මුත්තොහං මොචයෙ පරෙ,
තිණ්ණොහං තාරයිස්සාමි, සංසාරොඝා මහබ්භයා ති.

යනාදීන් මහොප්‍රණිධානය කොට, රාජ්‍යය හැර හිමාලය වනයට හොස් තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණව, දිවි හිමියෙන් තපස් කොට, ආයු කෙළවර දෙව්ලොව උපන්සේක.

මේ පමණකින් දෙවන මහොප්‍රණිධාන කථාව
කියා නිමවන ලදි.

බ්‍රහ්මර්ෂිනම් තාපසව ව්‍යාඝ්‍රඛෙනුවට ශරීර මාංශය දීමෙන් බුදුබව ප්‍රාර්ථනා කළ පරිදි කෙසේ ද? යත්; ඒ අප මහබෝසතානෝ අනික් අත්බැවක දෙව්ලොවින් චුතව මගධරට උලිද්දිය නම් බමුණුගම නායකබමුණාගේ දේවින්කුස පිළිසිඳ දසමස් ඇවැමෙන් බිහිව බ්‍රහ්මරාජයාගේ වර්ණය වැනි ඉතා යහපත්ව බැලුබැලුවන්ට ප්‍රියමනාපවූ ශරීර වර්ණයක් ඇතිබැවින් බ්‍රහ්මකුමාරයයි තබනලද නම් ඇතිව වසන්නාහු අන්කිසි තර්ණතයක් නොකොට බ්‍රාහ්මණ ශිල්ප තම්ලද වෙදත්‍රයෙහිද අක්ෂර, ලිඛිත, ගණිත, ගාන්ධර්වාදි අෂ්ට දශවිද්‍යාස්ථානයෙහිද ශාස්ත්‍රීමති සව්‍යාකරණාදිවූ සූසැටකලා ශිල්පයෙහිද යන සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි තමන්ගේ ප්‍රඥව මහත් බැවින් සොළොස් හැවිරිදි වයස් අතුරෙහි නිෂ්ප්‍රාප්තියට පැමිණි යහ. එකල්හි මහතාගස් සම්පයෙහි පන්සියක් පමණ බමුණු කුමරුවෝ ත්‍රිවේදය ඉගෙණ නිමවූහ. ඉක්බිති ඒ මහතාගෝ මවු පියන්ට කළමනා අත්පා මෙහෙ නිමිකල්හි තමන්ගේ අතවැසිවූ පන්සියක් පමණ බමුණු කුමරුවන් ලඟට කැඳවා, සෙසු උගතමනා ශිල්පශාස්ත්‍ර උගන්වා, තමන් සන්තකවූ සියලු ධනරාශිය ඔවුන්ට හස්සොදක කොට දන්දී, අවවාදකොට, ගිහි ගෙයින් නික්ම හිමාලය වනයට වැද, තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව, මෙකල ඒරාණක නම්වූ එකල මුණ්ඩ නම්වූ පර්වතය සම්පයෙහි පන්සලක වෙසෙහි.

එකල බොහෝ කුලපුත්‍රයෝ බෝසතුන්කෙරෙහි පැවිදිව, කිසිඤ්ඤ පිරියම් ඉගෙණ තමතමන්ගේ සිතට සැපවූ විවෙක ස්ථාන වල ඉඳ, කිසිඤ්ඤ පිරියම් කොට ධ්‍යානඋපදවා අපරිහීණ ධ්‍යාන යෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්හ. බෝසතුන්ගේ අතවැසිවූ ශටකියන ලද පන්සියක් පමණ බමුණු කුමරුවෝ තමතමන්ගේ මවුපියන් ඇවැමෙන් බෝසතුන් සම්පයට ගොස් මහණව, පූජා ස්නේහයෙන් ශාස්තෘන් අත්නොහැර වසන්නාහුය. ඔවුන් අතුරෙන් මතු බුදුවන මෙතේ මහබෝසතානෝ ඒ ශිෂ්‍යයන්ට ප්‍රධානව අප මහබෝසතානන්ට අග්‍ර ශිෂ්‍ය වූහ. එකල්හි එක් දවසෙක මහබෝසතානෝ සෙසු තාපසයන් ඵලාඵල සොයා ඒඒ දික් භාගයකල්හි, ප්‍රධාන ශිෂ්‍යයානන් හා සමග තුමූද ඵලා ඵල පිණිස ඒ මුණ්ඩ නම් පර්වතයට නැඟී, එක් දසාවකින් පර්ණ ශාලාවය බැලුවාහු; එහි දරුවන් වැඳ, කිප දවසක් නිරාහාර හෙයින් කෘශ ශරීරඇතිව ක්ෂුධාව ඉවසිය නොහී ක්ලාන්තව තම හා සමග කෙළනා දරුපැවටුන් කනුකැමතිව, රුරුඇත හෙරව ශබ්ද කෙරෙමින් ඇස්දල්වදල්වා, කණ්ඨියන් හා තනුට සලමින් හොත්තාවූ ව්‍යාඝ්‍රඛෙනුවදැක, කරුණා උපදවා සසරකලකිරී; අහෝ සංසාරය ඒකාන්තයෙන් නිරර්ථකය. තමාගේ දිවි රක්නා පිණිස තමාගේ ලෙයෙන් උපන් දරුවන් කනු කැමති වූවාය. එහෙයින් මේ සංසාරයට නිබ්බි

වේවාසි යනාදීවශයෙන් මහත්වූ බෙදයට පැමිණ ප්‍රධාන ශිෂ්‍ය යානන් කැඳවා, සබඳ, තෙපි මේ වනයෙහි බලා ඇවිද සිංහව්‍යාඝ්‍රා දීන් විසින් මරණලද මාංශයක් දුටහොත් වහාගෙනවුත් මේ ව්‍යාඝ්‍ර ධෙනුවට දෙවයි කියා, මෙතේ බෝසතුන් නික්මවා නැවත ගිතන සේක්, මාමිසින් නුසුදුස්සක් කරණලද්දේය. අනිකෙකුගේ මාංශ සම්පාදනයෙන් මට ප්‍රයෝජන කිම්දැයි සිතා, හැම්ඵලයින් භය උපද්‍රව සහිතවූ නිස්සාර අසුචි දුගඳ්වූ කුණපයෙන් පිරුණාවූ, නුවණැස් අති පණ්ඩිත පුරුෂයන් විසින් නින්දිතවූ මේ ශරීර නැමැති නුවරනම්, නොයෙක් ජාතිභය හා බොහෝ තැතිගැණුම් ඇත්තේය. ජරාරෝග විඵම්පනය ඇත්තේය. වධබන්ධනාදී ව්‍යාඝ්‍ර කුලවාසය ඇත්තේය. මරණීත් මඛන්‍ය ලද්දේය. ශොකසන්තාප බහුලය. හැඩිම් වැලපීම් දුක්දෙම්නස් උපායාස බහුලය. මකු ගුණ පිඩා යන මෙයින් ආකුලය. සියලු දුකට ආකරය. රාග නැමැති ඇත්කුලන්ට වාසස්ථානය. වෙෂනැමැති සපී වාසයට බිලයක් වැන්නේය. මොහනමැති භූතගණයාට වාසස්ථානය. ක්‍රොධ නැමැති රාක්ෂසයෙවිතය. වෛරනමැති ව්‍යාඝ්‍රවාසය වෛර බහුලය මකුගුණ නැමැති කුම්භාණ්ඩයෙවිතය.

ඊර්ෂ්‍යා නැමැති සතුරන් විසින් ගැවසි ගත්තේය. දුශ්චරිත නැමැති දිය නිකුත්වීම් ඇත්තේය. විෂමලොභය පෙරදැරිකොට ඇත්තේය. තන්දිරාග මහායොධ වාසස්ථානය. මිථ්‍යාධම් විනිශ්චය ඇත්තේය. නුගුණ නමැති මැස්සන් විසින් ආකුලය. මදය ප්‍රමාදය සෙවුනේය. දෘෂ්ටි නිස්සන්ද බහුලය. අනුසය නැමැති බමුණන්ට වාසස්ථානය. සංයෝජන නැමැති මහ ඇමතියෝ ඇත්තාහ. මෙසේ නොයෙක් ආදීනව ඇති සකකාය නගර තම්ලද මේ ශරීරයෙහි අවිද්‍යා නමැති අඥනය ප්‍රධානව රජ කම් කරන්නේය. මේ ආදී ක්‍රමයෙන් ශරීරස්වභාව සලකා ජීවිත යද අසාරය. සාරවිරහිතය. ඉතාඅවලාසාරය. බොහෝ දුක් ඇත්තේය. මරණය කෙළවරකොට ඇත්තේය. තණඅග පිනි බිදුමෙන් දියබුබුලමෙන් නස්නා සුභාව ඇත්තේයයි දැන, ශිෂ්‍යයා එන ගමන බලමින් නැවත සිතනුවෝ මෙබඳු අනෙකප්‍රකාර දුක් අනුභව කරණ සංසාරගත සත්ත්වයන් කවර ධර්මයකින් ගලවම්දෝ හොඳ සිතනුවෝ පෙර පුරුදුවශයෙන් බුඩකාරකධර්මයන් දැක සිතන්නාහු කරන්ට ඉතා දුෂ්කර දේ නොකොට, හරින්ට දුෂ්කර වූ දේ නොහැර, දෙන්ට උගහට දේ නොදී, ඉවසිම දුෂ්කරවූදේ නොඉවසා, බුදුවීම නොහැක්ක. නොයෙක් ආදී නව ඇති වහා බිඳෙන සුළු මේ ශරීරය ආශ්‍රයකොට පවත්නා විතතය එක අරමුණෙක නොසිටිනේය. එහෙයින් මම බුදුබව පිණිස මේ උපන් ශ්‍රද්ධාව ඇතිවිට මා සියලු සතුන්ට හිතපිණිස මේ සජීව ශරීරය මේ ව්‍යාඝ්‍රධෙනුවට දන් දෙමි. අනික් බාහිර දානයෙන්

කිම්දැසි සිතා, මේ මාගේ ජීවිතය සඟිතවූ ශරීරදැන කුශලයෙන් මතු බුදුව සසරදුකින් සතුන් මුදන්නෙමියයි සිතින්ම බුදුබව ප්‍රාර්ථනාකොට, සතුටුයිත් ඇතිව, දෙවියන්ට පින්දෙන්නාහු,

තස්ස මේ අනුමොදනතු, එහෝ නාරද පබ්බතා,
ඉන්දෙව බ්‍රහ්මාව පජාපතිව, සොමෝ යමෝ වෙස්සවණෝව රාජා,
සබ්බෙ දෙවානුමොදනතු, යදිදං පුඤ්ඤං කතං මයා.

යනාදින් දෙවියන්ට පින්දී, මාංස සොයා යැවූ ශිෂ්‍යයාගේ ආගමනයට පළමුවෙන්ම පළිත මුදුනට නැඟී ව්‍යාඝ්‍ර ධෙනුවගේ අභිමුඛයට පිහුහ. එවිට ව්‍යාඝ්‍රධෙනු තොමෝ පළිතය මුදුනෙන් එන්නාවූ බෝසතුන් දැක, ඇගේ දරු පැටවුන් හැර ඒ බෝසතුන්ගේ ශරීර මාංසය අනුභව කළාය. එකෙණෙහි බෝසතානෝ දෙව්ලොව උපන්සේක

මෙපමණකින් තුන්වෙනිවූ මනොප්‍රණිධාන කථාව කියා නිමවන ලදී.

පුරාණ දීපඞ්කර නම් බුදුරජානන් වහන්සේ සොළසඅසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව. එක් සාරනම් කල්පයෙහි දඹදිව වඹපාවති නුවර රජ කුලයෙහි ඉපද දසදහසක් අවුරුදු ගිහිගෙයි වැස, සතර පූර්ව නිමිත්තදැක, මහඛිනික්මන් නික්ම, මහණව, සත්දවසක් ප්‍රධන්වීර්‍යකොට, බෝමැඩ අරා බුදුව, දහතුන් නමැති රත්නවමීං වස්වමින් සඞ්ඝයන් සතුටු කරවා, වසනසේක එකල්හි පශ්චිම දීපඞ්කර බෝසතානෝ; මහත් භොගසමපත ඇති බ්‍රාහ්මණකුලයෙහි ඉපද යෞවන අවස්ථාවට පැමිණ, ගිහි සම්පත් විදිකාහු කාමයෙහි ආදීනව දැක, ගිහිගෙන් නික්ම, බුදු ශාසනයෙහි මහණව, පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභීවූහ. එදෙ වසන්නාවූ ඒ බොධිසත්ත්ව භික්ෂූන්වහන්සේ එක්දවසෙක නෙ යෙක් ලක්ෂගණන් රහතන් පිරිවරණ ලද්දාවූ පුරාණ දීපඞ්කරන බුදුරජානන් වහන්සේගේ හොහොමත්වූ ආත්මභාවය දැක, මම මතු මේ සම්බුදුවන්වහන්සේ සේම ලොවුතුරා බුදුවන්නෙමි නම් යහපතැයි සිතා, තමන්ගේ පාත්‍රය ගෙන තෙල් සිඟා ගෙනවුත් බුදුන් වැඩහිඳිනා ගඳකිළියෙහි සිවුදෑ ගඳින් පිරිබඳගෙන, බුදුදෙ උදෙසා රාත්‍රිය මුළුල්ලෙහි නොයෙක් ලක්ෂගණන් පහන් පූජා කොට, ඒ රාත්‍රිය පහන්වූකල සියලු භික්ෂු සංඝයාවහන්සේ බුදුදෙ සරා වැඩි කල්හි නැවත සංඝයාවහන්සේටද පහන් පූජාකොට බුදුන් සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ, ශ්‍රී පාදමූලයෙහි බැ

හෙට බුදුන්ට දිවිපුදා, "ස්වාමිනි භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්ස, ඔබ්බේ ඔබ දීපඞ්කර නම් ලොවුතුරා බුදුව සියලු සත්ත්වයන් සංසාර ඛණ්ඩනයෙන් මුදා සුවපත් කළසේක්ද, එපරිදෙන් මමද මේ පහත් පුජාවේ අනුභවයෙන් හා නුඹවහන්සේට දිවිපිදුවාවූ මේ කුශලානුභාවයෙන්ද මතු දීපඞ්කර නම් ලොවුතුරා බුදුව සංසාර ගත සත්ත්වයන් එයින් ගොඩනගා නිවන් දැක්විය හෙමිවා" යි ප්‍රාර්ථනා කළාහ. එකල බුදුහු අනාගතඥානය පතුරුවා, ඔවුන්ගේ ප්‍රාර්ථනාව සිඩවනසේ දැක, භික්ෂූන්වහන්සේට ආමන්ත්‍රණයකොට එම්බා මහණෙනි, ඊයේ තුන්යම රාත්‍රියෙහි පහත් පූජාකොට දුන් මට දිවිපුදා හොත්තාවූ මේ ඒහණතෙම මතු මාසේම දීපඞ්කරනම් බුදුවන්නේයයි යනාදීන් විවරණදී වදාළසේක. මෙසේ විවරණ ලද්දාවූ දීපඞ්කර නම් මහබෝසතානෝ එතැන්පටන් නිරන්තරයෙන් තෙල් සිහාගෙනවුත් බුදුන්ට පහත්පූජා කරන්නාහු දවසෙක නුවර මූළුල්ලෙහි සිහා තෙල් නොලැබ රජගෙට ගොස් වන්හ.

එසමයෙහි යටකියකලද අපමහබෝසතානෝ පෙරජාතියෙහි තමන් විසින් කරණලද අපරාපර්‍යායවෙදෑවූ කිසි අකුශලකම්බලය කින් දෙවිලොවින් චුතව ඒ පුරාණ දීපංකර නම් බුදුරජානන් වහන්සේට දෙඛිනින්නන් දරුව රජකුලෙහි ඉපද රජගෙයි සත් මාල්පාසක මතුමහල් තලයෙහි හුන්නාහු නොවිලේ රජගෙ වඹතාවූ ඒ දීපඞ්කර නම් මහබෝසතුන් දැක, එක් දැසගණු කැඳවා එම්බල තෙල එක් හික්ෂුකෙනකුන්වහන්සේ රජගෙට වැඩසේක. නෝ උන්වහන්සේ සමීපයට ගොසින් කුමක් පිණිස වැඩසේක්දෝ හොයි විචාරා නියම දැන වහා අවුත් මට කියාලවයි කියා යවූහ. යහපතැයි හිවිස ගොස් වැඩ කාරණා විචාරා පහත් තෙල් සිහා වැඩබව අසා එපවත් රාජකුමාරිකාවන්ට දන්වූවාය. රාජකුමාරිකාවෝ එතෙපුල් අසම්ග්ම හිඳිනා ආසනයක් පණවා, එහි වැඩහුන් දීපඞ්කර මහබෝසතුන්ගේ පතුල් සෝදවා, තෙල්ගල්වා, පසඟ පිහිටුවා වැඳ, ඉක්බිති ඝනරන් තලියක රන්වන් පැහැඇති අබතෙල් පුරා තමින් හිස මුදුනෙහි තබාගෙන මේ කුශලානුභාව යෙන් සියලු සත්ත්වයන්ට හිතපිණිස මා බැහැවහන්සේ පරිද්දෙන් මමද මතු ලොවුතුරා බුදුවෙමිවයි, මා බුදුවන ජාතියෙහි මේ සිදුහතු තෙලේ නමින් සිඛාදී නම් වෙම්වයි කියා, මෙසේ සිතින්ම ප්‍රාර්ථනා කොට, තෙල් තලිය ගෙනවුත් මහ බෝසතුන්ගේ පාතු ගෙහි වත්කොට බෝසතුන්ට කියන්නාහු; ස්වාමිනි, බුඩ පූජාවට මේ සිදුහතු තෙල් දුන්නාවූ කුසලයෙන් මමද මතු ලොවුතුරා බුදු වනු කැමැත්තෙමි. මා බුදුවූ කල්හි මේ සිදුහතු තෙලේ නමින්

යුක්තව සිඩ්ඛී නම්වනු කැමැත්තෙමි. එබැවින් මේ තෙල් ගෙන ගොස් පාන්කොට ඉක්බිති මා මෙසේ ප්‍රාර්ථනා කළ බව් බැඟන් වහන්සේට දන්වුවමැනවයි කිහ. දීපඩකර මහබෝසතානෝද යහපතැයි හිමිය බුදුන්කරු එලඹ පහන් පූජාකොට, ඉක්බිති බුදුන් වැඳ, ස්වාමිනි අද මේ පහන් සිඟල්ලම නුඹවහන්සේගේ කැඟතිවූ රාජකුමාරිකාවන් නම්ම පූජාකෙළෙමි. ඒ නුඹවහන්සේ සේගේ නැඟනියෝද සිදුහත් තෙල් දුන්තාවූ කුශලානුභාවයෙන් මතු බුදුවනු කැමැත්තාහ. බුදුවූකල්හි එම සිදුහත් තෙලේ නම්ම සිඩ්ඛීතම්වනු කැමැත්තාහයි දන්වූහ. එතෙපුල් අස මිත්ම බුදුහු එම්බා මහණ, මා නැඟනියෝ ස්ත්‍රී බැවිනි සිවිඟෙයින්. විවරණ ලැබීමට අයෝග්‍යයයි වදළසේක්කා.

ඊට කාරණා කවරේදයි විවාළ කල්හි; බුඩකාරකඩම් පූරණය නම් ඉතා දුෂ්කරය. එබැවින් යම්කිසි කෙනෙක් දස්වියෑ ඇතිව තොයෙක් කප්කෙළගණන් මුළුල්ලෙහි පාරමිතා පුරා බොහෝ වාරයක් ප්‍රාර්ථනාකොට හෙවත් ශතසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල් ලෙහි තෙ විශ්‍යීකොට, නවසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි වාක්විශ්‍යීකෙ ව, මෙසේ සොළසසංඛ්‍ය කල්පලක්ෂයක් ගියකල්හි අෂ්ටඛම් සමොධානයෙන් යුක්ත වූවාහු විනම් එකල්හි විවරණ ලද හැක්කැයි වදළසේක. ඒ අසා දීපඩකර මහබෝසතානන් වහන්සේ එසේකල සවාමිනි, නුඹවහන්සේගේ කැඟනියෝ බුදු වෙම්වයි කළාවූ ප්‍රාර්ථනාව සිඩ්වේදෝයි විවාළකල්හි, බුදුරජා නන්වහන්සේ අතීතඥානය මෙහෙයා ඔට ගියදවස තුන්ආත්මභාව යක තමන් සිතින් බුදුවෙම්වයි පැතුබව දැක, කැවත අනාගත ඥානය මෙහෙයා මතු බුඩකාරකඩම්යන් පුරා බුදුවන්ට සමර්ථවූ බව දැක මෙයින් මතු තවාසංඛ්‍ය [1] කල්පලක්ෂයක් ගියකල්හි සාරමණ්ඩකම් කප; තොප මාසේම දීපඩකරනම් බුදුවූ කල මා නැඟනියෝ ඒ තොපගෙන් නියතවූ සම්මුඛ විවරණලබ, එයින් සාරාසංඛ්‍යකල්ප ලක්ෂයක් ගියකල ලොවුතුරා බුදුවන්නේයි වදළ සේක. දීපඩකර බෝසතානෝ; ඒ අසා සතුටුව වැද ප්‍රදක්ෂිණා කොට ගියහ. අප මහබෝසතානෝද එකල ඒ අබතෙල් දුන් කුශලානුභාවයෙන් ස්ත්‍රීභාවයෙන් මිදී තුසිතපුර උපන්හ.

මෙසේ තමන්වහන්සේගේ පූර්ව චරිත සංඛ්‍යාත බාහිරනිදා නය ප්‍රකාශකොට, දෙවිමිනිසුන් සහිතවූ සියලු ලෝකයාහට කරුණලද සබඹිඤ්ඤාණා ඇතිහෙයින් අසහාය නෙතුවූ මාගේ බුදු රජානන්වහන්සේ ශාසනා නම්වනසේක. එසේහෙයින් කියසැලදී.

---

1 සොළසාසංඛ්‍ය

දෙව යකඛ මනුස්සානං, ලොකෙ අග්ග ඵලං දදං,
දදනතං දමයනතානං, පුරිසාජඤ්ඤ තෙ නමෝ' සි

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඞ්ඝාවවාද සංග්‍රහයෙහි
මෙතෙකින් බාහිර නිදානය කියා නිමවනලදී.

මේ මහාභද්‍රකල්පයට කල්පලක්‍ෂයක් ඉතුරුකොට ඇති විසි අසංඛ්‍යයෙන් පළමුවන නාඳනම් අසංඛ්‍යයෙහිවූ සියලු ගුණජනක සාර තම් කල්පයෙහි ර්ව පූජිතයෙහි අවාඝංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව බුදුවූ බ්‍රහ්මදෙවනම්වූ බුදුරජාණන්වහන්සේ ධම්චක්‍ර දෙශනාව පිණිස කාරණ්ඩකනුවර සම්පයෙහිවූ සියලු බුදුවරයන් විසින් අභිජාතසථානයට වැඩිසේක.

එකල්හි එම බ්‍රහ්මදෙව බුදුරජාණන්වහන්සේගේ ශරීර ශොභා යෙන් සියලු නුවර දහසක් හිරුමඬල එකවිටකැංගෑසේ ශොභා මත්ව බැබළී ගියේය. එකල්හි යට කියනලද අප මහබෝසත්තෙම දිව්‍ය මනුෂ්‍ය ලොකදෙක්හි සැරිසරා, කොයෙක් අප්‍රමාණ සැප විඳිමින් වසනුවෝ එම කාඳනම් අසංඛ්‍යයෙහිවූ සාරකප දෙවි ලොවින් චුතව, කරණ්ඩකනම් නුවර රජකුලයෙහි ඉපද වැඩිවිය පැමිණ පියරජු ඇවැමෙන් රාජාභිෂෙක ප්‍රාප්තව අනිඳදෙවනම් රජව චක්‍රවර්තිලීලාවෙන් රජකරණ කල්හි; ඒ රජහට මෙත්‍රෙය බෝධිසත්වයාණන්ද සිරිඉත්තනම් අමාත්‍යව අවියෙන් ධම්යෙන් අනුශාසනා කරන්ව වූහ. ඒ අතිදෙවනම් රජ එක් දවසක් උඩුමහල් තලයෙහි ඇමති ගණයා පිරිවරා රාජාසන මස්තකයෙහි හුන්කල්හි මූළුනුවර ඒකාලොක කරමින් නුවරට අභිමුඛව වඩනා ඒ බ්‍රහ්මදෙව තම බුදුරජාණන්වහන්සේ දැක, පළමුවෙන් බුදුරුවක් නුදුටුහෙයින් මෙතෙම දෙවියෙක්දෝ බඹෙක්දෝ හොයි යනාදි වශයෙන් සැක සිතා, කිසිවක් නොදැන, කම්පිතව, රාජාසනයෙන් බස්නා කැමති වූහ.

ඒ දැක රජහට අභිමුඛව හුන් සිරිඉත්තනම ඇමතිතෙම මේ කිමෙක්දෝහොයි! සිවුමැදුරු කවුළුවෙන් පිටතබලා, දෙතිස්මහ පුරුෂලක්‍ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් ශොභමානව, ව්‍යාම ප්‍රභා මණ්ඩලයෙන් පිරිවරණලදුව, කේතුමාලාලඞ්කාරයෙන් අලඞ්කෘතව, නීලපීතාදී සවණක් රැසින් දිලිහි දිලිහී වඩනා බුදුන් දැක, ර්ව පූජිතාගයෙහි බුදුන් ලොව පහළවූ ඔහි තමන් ඇසූ හෙයි හුත්; පෙර කොයෙක් සියගණන් බුදුවරයන් දැක දානමානාදි වශයෙන් බොහෝසත්කාර කොට තමන් බුදුබව ප්‍රාර්ථනා කරමින් ආවාවූ කෘතාධිකාර මහපිණැති හෙයිනුත්; පළමුවෙනි දැක්මෙහිම බුදුන් බව දැක, වහා හුනස්නෙන් නැඟී, රජහට අභිමුඛව සිට, දකුණත ඔසවා, මහරජ හයකොටුව මැනව, මේ එනුයේ

අක්කිසි සත්ථු කෙනෙක් නොවෙති සම්බුදු බුදුරජානන්. වහන්සේසයි බුදුගුණ ප්‍රකාශකොට කියන්නෝ,

එස බුද්ධෝ මහාරාජ, ලොකෙ උත්තමෝ පුග්ගලෝ,
සබ්බසත්තහිතත්ථාය, ලොකෙ උප්පජ්ජී සෝ ජිනෝ.
අයඤ්ච ඛෝ මහාරාජ, බ්‍රහ්මදෙවෝ තථාගතෝ,
හාසෙන්තෝ විවියා මජ්ඣෙ, පඤ්ඤෙන්තං පුනප්පුනං.

යකෘදින්; මහරජ! මේ ආශ්චර්‍යවත් මහනර පෙළහරක් ඇති මහා පුරුෂයානෝ තම්; සියලු සත්වයන්ට හිතසැප පිණිස ලෝක යෙහි පහළවූ දෙවෘති දෙවවූ ශක්‍රයා ශක්‍රවූ බ්‍රහ්මාභිබ්‍රහ්මවූ බ්‍රහ්ම දෙවතාම් බුදුරජානන්වහන්සේය. එබැවින් කිසි හයක් නො වුව මැනවයි, රජ්ජුරුවන් අස්වසා ඉක්බිති බුදුන්ට වඳා පින් කෙනක් ලොව නැති බව නහවනු පිණිස,

සතං හත්ථි සතං අස්සා, සතං අස්ස තරිරථා
සතං කඤ්ඤා සහස්සානි, ආමුත්තමණි කුණ්ඩලා,
එකස්ස පදවීතිහාරස්ස, කලං නාග්ඝන්ති සොළසිං ගි.

මේ ගාථාව බ්‍රහ්මදෙව තම් බුදුන් සමයෙහි සිරිගුත්ත නම් මෛත්‍රෙය බෝසතානන් විසින් කියනලදි. එයින් බුදුදැ රත්නත්‍ර යෙන් උතුම රත්නයක් උදෙසා හෝ තමා හුන් තැනින් නික්මයා මෙන් සිඹන පදවීතිහාර කුශලයම ඉතා මහත් බව වණිනාකොට දක්වා, මහා රජ වහා හුනස්නෙන් නැගි ඒ ලොකාග්‍රවූ බුදුන්ට පෙර ගමන් නික්ම ගිය මැනවයි කිය

එබස් අසමින්ම අනිදෙව තම් රජවූ අප මහබෝසතානෝ ප්‍රීති වෙගයෙන් මත්ව, උඩුමහලෙන් බස්නා හිණිමං ආදී විභාගය දැන ගතනොහි. මතුමහල් තෙලෙහි සිවූ මැදුරු කවුළුවෙන් බිමට පන, තමන්ගේ ශ්‍රද්ධා බලයෙන් මහපොළොව පලා ගෙණැදගසක් පෙත් තෙන් ගැවසී ගත්තාවූ රථසක්‍රක් පමණ මහ පියුමක් නැගි තමාගේ පාපියුම පිළිගත් කල්හි, ඒ පියුමෙන් බැස, පියවි ගමනින් බුදුන් කරා ගොස් සමන් මලින් පුද, නැවත සප්තරත්නමයවූ රුවන්මල් තුණකින් හා ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් බුදුන් පුද, පඤ්ච පතිට්ඨිතවූ වැඳ, ප්‍රදක්ෂිණාකොට පූජා හෙතුසම්පත් ඇති හෙයින් පළමුවෙනි දක්මෙහිම බුදුවීමෙහි ආසාව උපදවා, ඝටකී පරිද්දෙන් සිතින්ම බුදුබව ප්‍රාර්ථනා කළහ. ඒ අනිදෙව තම් රජානෝ තමන්ගේ උයන්හි ලක්ෂ යක්විහාර පිරිවර කොට ඇති ගඳකිළියක් කරවා, බුදුපමණක් මහ සඟනව පිළිගන්වා, ඒ බ්‍රහ්මදෙව බුදුන් ප්‍රධානවූ ලක්ෂයක් භික්ෂූන්

වහන්සේට සිවුපස දානය දීමෙන් බුදුවීමෙහි ආදර උපදවා ආයු කෙළවර දෙව්ලොව උපන්හ. සිරිගුත්ත නම් ඇමතිද දෙවිලොව උපත. බ්‍රහ්මදෙව නම් බුදුරජාණන් වහන්සේ සිවුලු බුඩකෘත්‍යයන් නිමවා නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වළඟසේක.

බ්‍රහ්මදෙව නම් බුදුරජාණන් වහන්සේට ඉක්බිතිව, එම පළවූ වෙනි භද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ පන්දහසක් පමණ බුදුවරයන් හා දෙවෙනිවූ සුනන්ද නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ නවදහසක් පමණ බුදුවරයන් හා, තුන්වන පෘථිවි නම් අසඞ්ඛ්‍ය යෙහි ලොව පහළවූ දශදහසක් පමණ සර්ෂ්වරයන් හා සතරවන මණ්ඩ නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ එකොළොස්දහසක් පමණ බුදුවරයන් හා පස්වන ධරණී නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ විසිදහසක් පමණ බුදුවරයන් හා සවන සාගර නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ තිස්දහසක් පමණ බුදුවරයන් හා සත්වන පුණ්ඩරික නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ සතළිස් දහසක් පමණ බුදුවරයන් හා මෙසේ මේ සත් අසඞ්ඛ්‍යය ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂ පස් විසි දහසක් පමණවූ සර්ෂ්වරයන් නොවරදවා දැක එක්ලක්ෂ පස් විසි දහසක් ජාතිවල පුර්වෙහිදු මහ පිණැති බැවින් හෙතු සම්පන්න ව උපන් අප මහබෝසතාණෝ "මම ද මෙසේ ම මතු බුදු වෙම්වා" යි සිතින් ම බුදුබව පතා මහදන් දී මනොප්‍රණිධානය මහාකප්‍රාප්ත කළසේක. මෙසේ චදරණලද මැයි සොළසැනි මහා නිදානයෙහි:-

නත්‍රෙ සුනත්‍රෙ පථවී, මණ්ඩ ධරණී සාගරෝ,
පුණ්ඩරීකොති මෙ සත්තා, අසඞ්ඛය්‍යා පකාසිතා
මනසා පත්ථනා මයහං, නිදදිත්‍ථං සංඛියා ඉමේ,
තමහි භද්‍ර අසඞ්ඛය්‍යෙ, තගරෙ කරකණ්ඩකෙ.
අතිදෙවොති නාමෙන, රාජා ඝුවා මහබ්බලෝ,
අහං තේන සමයෙන, පාසාද පවරෙ සිතෝ.
සිරිගුත්තොා නාමමේකෝ, නිසින්නොා පූරතෝ මම,
එකඞ්පප දානඞ්ගං බාහුං, දසෙසසි ලෝකනාථකං.
තත්‍ථ ඨත්වා විවිත්තෙනසිං, සුත්වා වසස සුභාසිතං
බුබෝ බුබොති විත්තෙන්ත්‍වා, තත්‍ථ බුබං විලොකයිං.
දිසවා අහං බ්‍රහ්මදෙවං, පුඤ්ඤවන්තං ජිතින්ද්‍රියං,
පෘහෘද පෘතත්‍ථිත්වාන, අත්තානං පත්ථිතම්ලෙ.
මම සඞ්ඛාතු භාවෙන, උට්ඨිතෙ පදුම මත්ථකෙ,
අධ්‍යාසිං ඔතරිත්වාන, අගම්ං ඉෙන වඤ්චිමං.

පූජේසිං ජාති පූජපථහි, තෙජවන්තං මහායසං,
කාරෙත්වා තීණි පූජථානි, රතනමාලාය පූජයිං.

සත්තරත්න යුත්තෙහි, පූජයිත්වා තථාගතං,
අභිවන්දිත්වා බ්‍රහ්මදෙවා, අඤ්ජිං පත්ථනං අහං.

තම්හි තාදි අසඞ්ඛෙය්‍යෙ, අධිකාරෝ මයා කතෝ,
පඤ්ච බුඞ්ඛ සහස්සානං, මහාදානං පවත්තයිං.

සුනන්දම්හි අසඞ්ඛෙය්‍යෙ, අධිකාරෝ මයා කතෝ,
තව බුඞ්ඛ සහස්සානං, මහාදානං පවත්තයිං.

මේ ආදි ක්‍රමයෙන් ශතාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂ පස්විසි දහසක් පමණවූ සියලු බුදුවරයන් තොවරදවා දැක බුදුබව පතා [මහ දන් දී, අප මහබෝසතාණන් මතොප්‍රණිධානය මුදුන්පත් කළසේක. මෙසේ තමන් වහන්සේගේ මතොප්‍රණිධානය ප්‍රකාශකොට, දෙවි මිනිසුන්ට කරුණලද සද්ධම්මානු ශාසනා ඇති හෙයින් මාගේ බුදුරජාණන් වහන්සේ ශාසන නම් වනසේක එසේ හෙයින් කියනලදී.

දෙව යක්ඛ මනුස්සානං, ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දම්මදන්තානං, පුරිසාජඤ්ඤ තෙ නමෝ සි.

ලෝවැඩ පිණිස කරුණලද මේ සද්ධම්මවංශ සංග්‍රහයෙහි
මෙතෙකින් මහානිදාන කථාව කියා නිමවනලදී.

මේසේ පුරුණලද මතොප්‍රණිධානය ඇති අප මහබෝසතාණන් තොයෙක් සියගණන් ශූන්‍ය කල්පවල දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි අප්‍රමාණවූ ශ්‍රී සම්පත් විඳ ඇවිදිනාහු එක් ජාතියක මිනිස්ලොව ඉපද වැඩිවි පැමිණ පූජිතෙතු බලයෙන් බුදුබව පතා තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණව ප්‍රථමධ්‍යානය ප්‍රණිත වශයෙන් භාවනා කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්හි උපදවා නොපිරිහුනු ධ්‍යාන යෙන් ගොස් එක් අසඞ්ඛ්‍ය කල්පයකට ආයු ඇති බ්‍රහ්මලොව නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යාන සැප විඳදහු මේ මහා භද්‍ර කල්පයට පෙළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් ඔට මාක්ප්‍රණිධානයට පවත් ගත්හ.

ඉන් සැම අවුත් පළමුවන සමීහද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි බුදුවර යන් සතර දෙනකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාර මණ්ඩ නම් කල්පයෙහි දඹදිව ඔසදසවතී නම් නුවර රාජවංශ යෙහි උපන්හ. එකල ඔවුන්ට ඝාතර කුමාර යයි නම් තැබූහ.

ඒ සාගර කුමාරතෙම පිය රජු ඇවැමෙන් රජ පැමිණ දශරාජ ධර්ම යෙන් රජ කරණුයේ පුරෝහිත බ්‍රාහ්මණයකු විසින් උගන්වනලද දශවිධවූ සක්විතිවත් පුරා නිමිකල චක්‍රරත්නාදි සප්තවිධ රත්න යන් ලදින් සාගර නම් චක්‍රවර්ති රජව මේ මුළු සක්වළට අධිපති චක්‍රවර්ති රාජ්‍යය කරණ කල්හි සොළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ධර්ම ඇති පුරුණ ගෞතම බුදුරජානන් වහන්සේ මේ සවී හද්‍ර නම් අසංඛ්‍යයෙහිවූ සාරමණ්ඩ නම් කප දඹදිව මඛ්‍ය මණ්ඩල යෙහි සිරිනිවාස නම් නුවර යශනිවාස නම් රජහු නිසා විමලා නම් මහ දෙවිත් කුස පිළිසිඳ දසමස් අ.වැමෙන් බිහිව ක්‍රමයෙන් වැඩි විය පැමිණ පන්දහසක් අවුරුදු ගිහිගෙයි වැස සතර පූර්ව නිමිති දැක මහබිනිෂ්මන් නික්ම අඩමසක් මහාවිද්‍යාය කොට බොධි පර්‍යාඩ්කාරූඪව මරසෙනඟ බිඳ බුදුව සත්යති යම බ්‍රහ්මරාධනා යෙන් ධර්මචක්‍රය දෙසූසේක.

එකල්හි ඒ ධර්මානුභාවයෙන් දසදහසක් සක්වළ මේ මහ පොළොව කම්පාවිය. මෙරගල් තැම්ම හා කොයෙක් ආශ්චර්‍ය්‍ය පහළවූවාහුය. මේ මහාපෘථිවියගේ කම්පාවීමෙන් කියනලද සාගර නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ චක්‍රරත්නය පිහිටි සථානයෙන් බැස මදක් පාත්විය. ඒ කාරණා විමසනු පිණිස ඇමතිවරු සිව්වූ මහත් සාර ගැමි දෙනෙක් දෙපාර්ශ්වයෙහි හිදුවා එහි සූත්‍ර දෙකක් බැඳ එක් සූත්‍රයෙක් චක්‍රරත්න මස්තකයෙන් ද එක් සූත්‍රයක් යටින් ද බැඳ චක්‍රරත්නය මැදිකොට තබති එහෙයින් ඒ පොළොව කම්පාවීම හා චක්‍රරත්නය ද අහස තුබූ තැනින්ම වළඳුවල මදක් බැස ගැම් දෙක බැඳි සූ දෙනට පාත්ව සිටියේය. ඒ චක්‍රරත්නය පිදීමෙහි නියුක්ත පිරිවර ජනයෝ ඒ කාරණා දැක රජහට දැන්වූහ. රජ ඒ බලා කලකිරුණු සිත් අතිව පරීක්ෂා කරණුයේ "රාජ මහා ඕත්‍යාදි සියලු ලෝවැසියන් විසින් නිරන්තරයෙන් පුදනලද මේ චක්‍රරත්නය දැන් තුබූ තැනින් පහව්වට කාරණා කිම්දෝ හෝ මාගේ ජීවිතයට අන්තරායෙක් වත් රාජ්‍යයට අන්තරායෙක් වත් වේදෝ" යි සිතා නිමිත්ත පාඨකයන්ගෙන් විමාළ තැන 'මහරජ් ජ්‍රුරුවන්ගේ චුතවීමෙන් හෝ මහණවීමෙන් හෝ තථාගතවූ සම්බුඛවරයන් බුදුවීමෙන් හෝ චක්‍රරත්නය නිශ්ශොභව තුබූ තැනින් කම්පාවීමෙන් අතුරුදන් වන්සේය. දැන් මේ ලොක යෙහි බුදුන් උපන් හෙයින් බුඛානුභාවයෙන් කම්පාවිය. එහින් නුඹවහන්සේට අනික් අන්තරායෙක් නැත මහරජ, ගෞතම නම් බුදුකෙනෙකුන් වහන්සේ මේ ලොකයෙහි උපන්සේක. ඒ බුදුරජා නන් වහන්සේගේ "ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුඛො"

යනාදීන් කල්‍යාණවූ උතුම් කීර්ති ශබ්දයෙක් කෙළ ලක්‍ෂයක් සක්වළ එකහෙළා පැතිර ගොස් ඉතා උස්ව පැන නැංගේ ය" යි කියා තොයෙක් බුදුගුණ වර්ණනා කළ කල්හි රජතෙම 'බුදුනැ" යි යන නම ඇසූ පමණකින්ම පස්වණක් ප්‍රීතීන් පිණාගිය ශරීර ඇතිව කාවතත් තෙපි "බුදුනැ" යි කියන්නාහු වේද? යි විමාරා අපි "බුදුනැ" යි කියමිහ යි දන්වන ලදුව මෙසේ තුන්විටෙකම විමාරා දැන "ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් කොයි වාසයේක් ද" යි විමාලාවූ රජහට දන්වන්නාවූ එක් බුවණැති නිමිත්ත පාඨකයෙක් උතුරු සළුව එකාංශකොට ගෙන, එකල බුදුන් වාසය මිණිවින උගන යම් දිශාභාගයෙක්හි ද ඒ දිශාභාගයට පසඟ පිහිටුවා වැඳ කැඟී දෙගොස් මුදුන්දී සිටී, බොහෝ දෙනාට ඇසෙන සේ මහත් කොට අඩගා කියනුයේ:—

එස බුඩෝ මහාරාජ, ලෝකනාථෝ අනුත්තරෝ,
ලෝකෙ ව අසමෝ ජේට්ඨෝ, මහෙසි අඤ්ඤපුඤ්ඤලෝ.
සබ්බඤ්ඤූ බුඩෝ භගවා, සක්‍යමුනිනි විස්සුතෝ,
නිසාභාගිමං ධඤ්ඤවතිං, මිගාවිත වනෙ වසි'නි .

යනාදීන් බුදුගුණ ප්‍රකාශකොට, "මහරජ, ඒ ලෝක ස්වාමිවූ සම්‍යක් සම්බුඩවූ ගෞතම නම් ශාක්‍ය මුනීන්ද්‍ර බුදුහු දැන් මෙම ධඤ්ඤවතී නුවර නිසා මිගාවිත වන නම් උයන්හි වැඩ වසන සේකැ" යි දන්වීය.

එබස් ඇසූ සාගර නම් ඒ චක්‍රවර්ති රජ මහත්වූ සතොසෙන් හා පිණ පිණා ප්‍රීතීන් පිණාගිය ශරීර ඇතිව එමෙවිට තොයෙක් ආල්ගණන් සුවඳ මල්, සුවඳ සුණු, දීප, ධූපාදිවූ බොහෝ පූජා භාණ්ඩ ගෙන්වාගෙණ සතිස්සෝදනෙක පැතිර සිටි මහසෙනඟ සමඟින් නුවරින් නික්ම ගොස් මිගාවිත නම් උයනට වැඩ බුදුරුවට සලකුණුවූ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන යෙන් හා බ්‍යාමප්‍රභා කෙතුමාලාලඞ්කාරයෙන් විරාජමානවූ ඇත්ම භාවයක් ඇතිව සවණිගිරි ගුහාවාරණක හුන්නාවූ කෙසර සිංහ රාජයෙකු මෙන් ද, උදයගිරිමුදුන් පත් බාලසූර්‍යයා මෙන් ද, අලඞ්කෘතවූ බුඩාසන මසාරකයෙහි සවණක්ර්‍රයින් දිලිහි දිලිහි හුන් බුදුන් දැක ඉතා විස්මයපත්ව, අමාතැල්ලක ගැලෙන්නාසේ වැඩ, සවණක් රශ්මි මාලාවන් පිහිරාසෙන බුදුන් කරා ගොස්, තමා උපන් ජාතිය සඵල කෙරෙමින් පසඟ පිහිටුවා වැඳ, අනොපමවූ බුඩ ශ්‍රී බල බලා, සිත උපන් ප්‍රීතිවෙගය උතුරුවා කියන්නාහු:-

සුදිට්ඨං වත මෙ දිට්ඨං, පස්සිතබ්බංව පස්සිතං
සඵලං ජීවිතං මය්හං, යං පස්සාමි තථාගතං.

තතො සමෝ කොචි මනුස්ස ලොකෙ,
සමෝ'පි තෙ නත්ථි ච දෙවලොකෙ;
සදිසෝ'පි තෙ නත්ථි ච බ්‍රහ්මලොකෙ,
තමෙව නාථං අසමං නමාමි

යනාදීන් බුදුන්ගේ තුන්ලෙවිහි පතලාවූ නව අරහාදි ගුණ සමූහයන් අරභයා නොයෙක් ලෙසින් සතුතිකොට, සුවදින් මලින් බුදුන්ට පුදා, දෙලොස් යොදනෙක පැතිර සිටිනා තූර්‍යසේනාවක් හා පස්විසි යොදනෙක පැතිර සිටිනා බ්‍රාහ්මණ මණ්ඩලයක් හා අට සාළිස් යොදනෙක පැතිර සිටිනා අමාත්‍ය මණ්ඩලයක් හා අනූ යොදනෙක රන්කොත ගෙන සිටිනා යොධ මණ්ඩලයක් හා පන් සියයක් යොදනෙක පැතිර සැරසී සිටිනා මහපිරිස් මණ්ඩලයක් හා මේ සෑ මහත් පිරිසකින් පිරිවරණ ලදුව; දිලිහි දිලිහි, චක්‍රවාටය වටකෙරෙමින්, මහමෙර ගිසාරා ගමන් ගත් චක්‍රරත්නය සේ, බුදුන් සිසාරා ප්‍රදක්ෂිණා කොට, පසඟ පිහිටුවා වැඳ, අවසර ගෙන, තුවරට අවුත්, දෙවතාවන් ලවා හිමාලය වනයෙන් වණී ගඬ සම්පන්නවූ රත්ඟදුන් හර ගෙන්වා ගෙන, තුන් සතර පස්මහල් ආදිවූ ප්‍රභේද ඇති රකනවඳනමයවූ ප්‍රාසාද ලක්ෂයෙක, කූටාගාර ලක්ෂයෙක, රාත්‍රී සථාන ලක්ෂයෙක, දිවාසථාන ලක්ෂයෙක, සක්මන්මලු ලක්ෂයෙක, මණ්ඩප ලක්ෂයෙක, ලතාගෘහ ලක්ෂයෙක, භොජනශාලා ලක්ෂයෙක, ගිනිහල් ලක්ෂයෙක, යනාදි වශයෙන් වාසල්, දෙරටු පැන්හල් ආදිවූ සියල්ලම මාහැගිකොට රත්සඳුන් හරින්ම කරවා විහාරය වට සුරක්ෂිත කොට පවුරු පදනම් බඳවා, වාරයොදා සඞ්ඝයා වහන්සේට කප්පිය භාණ්ඩයන් සදවා, සියලු විහාර කම්මන්ත නිමිකල,

විහාරය හා රාජභවනය සඟිතවූ මූළු නුවර සම්‍යලඞ්කාරයෙන් අනූනව සරහා නිමවමින්, සතිස් යොදනෙක පැතිර සිටි මහසෙනඟ සමඟින් බුදුන් කරා එළඹ, පසඟ පිහිටුවා වැඳ නැගිසිට, මූදුනෙහි ඇඳිලි බැඳ සඞ්ඝම්වූ 'බුදුරජාණන් වහන්ස! නුඹවහන්සේ උදෙසා මෙවිසින් විහාරයක් කුරවන ලද්දේය. මා කෙරෙහි අනුකම්පායෙන් වැඩ, දැන් ඒ විහාරය පිළිගත මැනැවැ"යි ආරාධනා කොට, මූළු ලොව උතුරුවා යන පරිද්දෙන්, මහත්වූ පූජෝත්සව කරමින්, බුදුන් වඩා ගෙනවුත්, විහාරය පිළිගන්වා, ප්‍රණීතවූ නොයෙක් කන බොන දෑ ආදියෙන් බුදුන් වළඳවා නොයෙක් රත්නයෙන් බුදුන්ට පූජාකොට, බුදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි බැසගෙව වැඳ. දෙහොත් මූදුන් දී, පළමුවෙනි වාග්භෙද ප්‍රාථිතාව කරණ අප මහබෝසතා නන් වහන්සේ, 'සඞ්ඝම්වූ බුදුරජාණන් වහන්ස! යම් සේ නුඹ

වහන්සේ දැන් ශාක්‍ය වංශයෙහි ඉපද ගෞතම නම් බුදුවූ සේක් ද, එසේම මමද මේ කලාවූ කුශලයෙන් මතු ශාක්‍ය වංශයෙහි ඉපද, ගෞතම නම් බුදු වෙමිව"යි කියා, මෙසේ වචනයෙන් ප්‍රාර්ථනා කළසේක.

එකල්හි පුරාණ ගෞතම බුදුරජානන් වහන්සේ බුධ කාරක ධර්මයන් පුරා බුදුවීම ඉතා දුෂ්කර නියාව, කොසෙක් උපමායෙන් දක්වා වදරා, 'එම්බා මහරජ, බුබකාරක ධර්මයන් පිරීමනම් ඉතා දුෂ්කරය. ඉදින් බුදුවනු කැමැත්තෙහිවිනම් අධිකතර වීර්‍යයඇතිව අනෙක ප්‍රකාර දුෂ්කර ක්‍රියාකොට, අභිධර්ම සමොදනයෙන් යෙදී, නියත විවරණ ශ්‍රී ලදින් දානාදි දශපාරමිතා ධර්මයන් අඛණ්ඩකොට රක්ෂා කරන්නෙහි නම් මාසේම මතු ලොවුතුරා බුදු වන්නේය" යි, යනාදීන් මෙසේ අනියත විවරණ දුන්හ.

මෙසේ ඒ බුදුන්ගේ අනියත විවරණ පමණක් ලදින්, එදිවස ම ලැබෙන බුදු බවක්සේ, මහත්වූ සනෙත්‍යාශයට පැමිණියාවූ මහ බෝසතානෝ; සප්තවිධ රත්නයන් හා සමඟ සියලු චක්‍රවර්ති සම්පත්තිය බුදුන්ට පුදා සසුන් වැද, මහණව, ධ්‍යානඋපදවා, බ්‍රහ්ම ලොකයෙහි උපන්හ. මෙසේ ජාතියෙන් ජාතිය, සසර සැරිසරා ඇවිදිනාවූ අප මහබෝසතානෝ; තවද, එම සඳිහඳ්‍ර නම් අසංඛ්‍යයෙහි, ලොව පහළවූ පණස් දහසක් පමණ බුදුවරයන් හා, දෙවන සඳ් ඳුල්ල නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ අසූදහසක් පමණ බුදුවරයන් හා, තුන්වන සඳිරක්න නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ අනූදහසක් පමණ බුදුවරයන් හා සතරවන උසභකඛණ්ඩ නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ සැත්තෑ දහසක් පමණ බුදුවරයන් හා, පස්වන මානිභද්ද නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ සැටදහසක් පමණ බුදුවරයන් හා පදුම නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ විසි දහසක් පමණ බුදුවරයන් හා, සත්වන උසභ නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ දශ දහසක් පමණ බුදුවරයන් හා අටවන ඛණ්ඩක්ඛ නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ පන්දහසක් පමණ බුදුවරයන් හා, නවවන සඳිසෙල නම් අසංඛ්‍යයෙහි ලොව පහළවූ දෙදහසක් පමණ බුදුවරයන් හා, මෙසේ නවාසංඛ්‍යය ඇතුළත ලොව පහළ වූ තුන්ලක්ෂ ශතාසූදහසක් පමණ බුදුවරයන් දැක බුදුබව පතා අප මණ වස්තු පරිත්‍යාගයෙන් මහදන් පවත්වා වාක්ප්‍රණිධානය, මස්තකප්‍රාප්ත කළහ. ඒ ම වදරණ ලදමැයි, බුදුන් වීසින්:-

සඛබහුදෙ ව ථුල්ලෝ ව රතනෝ සහකඛණ්ඩකෝ,
මණිඝදෙ ව පදුමෝ, උසභෝ ඛණ්ඩක්ඛ මේව ච.

සබ්බසෙලෝ අසංඛෙය්‍යෝ, නවමෝනි පවුච්චති
වවසා පඨමා මග්ගං. නිද්දිට්ඨා සංඛයා ඉමේ
තෙසු නව අසංඛෙ සුජාතා ලොකහිතෙ කතෝ
තීණි සත සහස්සානි සත්තාසීති සහස්ස ච.
එත්තකානං මහෙසීනං වවසා පඨමා කතා,
දුතෙය්‍ය මෙ සමෝ තත්ථි එසා මෙ දූත පාරමී-යි

මෙසේ අප මහ බෝසතාණෝ; යට කියනලද ක්‍රමයෙන් **මනෝ ප්‍රණිධානය** පිරීමෙන් සත් අසංඛ්‍යයක් හා **වාක්ප්‍රණිධානය** පිරීමෙන් නව අසංඛ්‍යයක් හා යන මේ සොළසසංඛ්‍යයක් ඇතුළත, ලොව පහළවූ සලඹ දෙලොස් දහසක් පමණ බුදුවරයන් දැක බොකෝ පින්රැස් කෙරෙමින් මනොවිවි ප්‍රණිධානයන්ගේ මස්තක ප්‍රාප්තවූහ. එයින් මෑතභාගයෙහි මේ මහා භද්‍රකල්පයට සාරා සංඛ්‍ය කප්ලක්ෂයකින් යට බුදුවරු සතරදෙනකුන් වහන්සේ ගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් එක් කල්පයෙක් විය. ඒ කප තණ්හඞ්කරය මෙධඞ්කරය සරණඞ්කරය දීපඞ්කරය යි සතර බුදු කෙනෙක් වූහ

එයින් සොළඟාසංඛ්‍ය කප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දහි දිව **පුෂ්පවති** නුවර **සුනන්ද** නම් රජහු කීසා **සුනන්දා** නම් බිසව කුස පිළිසිඳගත් තොණෙහි ඒ බිසවට පැවිදිමිමෙහි සිත් උපන් හෙයින් බිසව එපවත් රජහට දන්වා එතැන් පටන් අත්‍යන්ත පිරිසුදු බ්‍රහ්මචරියාව රැකීමෙන් දශමස් පිරුණුකල මවුකුසින් බිහිව වැඩිවිය පැමිණ දසදහසක් අවුරුදු ගිහිගෙයි වැස ඇත්යානින් මහාභිනික්මන් නික්ම සතියක් ප්‍රධන්වියත්කොට **රුක්අත්තන** බෝමුල්හි වැඩහිඳ, බුදුව අවුරුදු ලක්ෂයක් ආසිරි වළඳ වැඩහුන් **තණ්හඞ්කර බුදුන්** සමයෙහි අප මහබෝසතාණෝ **සුරිඤවති නුවර සුදස්සන** නම් චක්‍රවර්ති රජව දිවසිරිවැනි රජසිරි විඳිනුමෝ බුඬානුභාවයෙන් චක්‍රරත්නය පහළබැස සිටි බුඬානුභාවය මහත්සේ දැන සිවිරඟ සෙනඟ සමඟින් චක්‍රරත්නය කරා ගොස් දණ්ඩන නමස්කාරයෙන් වැඳ මාගේ පින්බලෙන් උපන් චක්‍රරත්නය යථා, සථානයෙහි පිහිටුවා, චක්‍රරත්නය නුඹවහන්සේගේ ආනුභාව යෙන් මාගේ චිත්තප්‍රසාද වශයෙන් බුදුන්ට **සත්කාර**කොට රාජ්‍යය පුදා පැවිදිවෙමිද ඒ තෘෂ්ණා කල් බැලුව මැනවයි යාචිඤුව චක්‍රරත්නයට ආරාධනා කොට යථාසථානයෙහි තබාගෙණ, අනූයොදුන් පමණ වටඇති මහපිරිස් පිරිවරා, බුදුන් වඬනා පෙරට ගොස්, පසඟ පිහිටුවා වැඳ ආරාධනා කොට, චක්‍රරත්නානුභාවයෙන් තුන්ගවු පමණ සත්රුවන් මණ්ඩපයක්, මවා සම්පාලඞ්කාරයෙන් අලඞ්කෘතකොට, බුඬාසනය පටන්

සඩ්ඝනවකාසනය දක්වා යථාක්‍රමයෙන් මහාඝීවූ ආසන පණවා, එහි වඩා හිඳුවනලද සාරල්‍යෂයක් පමණවූ බුදුපාමොක් මහසඟනට සතියක් මහදන් දී අනිසතවූ විවරණ ශ්‍රී ලදින්, සුවූද්‍ර පරියන්තවූ සතර මහාඵිපයෙහි වක්‍රවර්ත්තිරාජ්‍යය බුදුපාමොක් මහසඟනට සිවූ පසය පිණිස දන්දී දඹදිව අසූසාරදහසක් රජුන් හා සමග බුදුසස් නෙහි පැවිදිව පිටකත්‍රයධාරීව දිවිහිමියෙන් ගත පවාරණාවත් පුරා සමථ විදර්ශනා දෙක්හි යෙදී වාසයකොට දෙවිලොව උපන්හ

තවද එම කප දෙවන අසංඛ්‍යා කල්පලෙහි අටාසංඛ්‍ය කප්ලක්ෂ යක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මේඛලානුවර සුදෙව නම් රජහු නිසා යශොධරා නම් අගබිසව කුස පිළිසිඳ බිහිව වැඩිවිය පැමිණ, අවිදහසක් අවුරුදු ගිහිසැප විඳ, මහබිනික්මන් නික්ම. මහණව, අඛමසක් ප්‍රධන්වීර්‍යය කොට රක්කැල බෝමුල්හි වැඩහිඳ, බුදුව අසූදහසක් අවුරුදු ආයිරි වළඳ, ලෝවැඩ වැඩූ මෙඛඞ්කර බුදුන් සමයෙහි, අප මහ බෝසතාණෝ සොමනස්ස නම් නුවර, බමුණු මහසල් කුලයෙහි ඉපද. සොමනස්ස නමින් ප්‍රසිඛව වෙදත්‍රයෙහි පාරප්‍රාප්තව, ජනපද චාරිකායෙන් එනුවරට පැමිණි, මෙඛඞ්කර බුදුන් දැක, තුමූ බුඛ මන්ත්‍රයෙහි දක්ෂඛවීන් නිසැකින්ම බුදුහු යයි දැන, ආදර උපදවා, සරණ ගෙණ, ආරාධනා කොට, සාරල්‍යෂයක් භික්ෂූන් හා සමඟ, බුදුපාමොක් මහසඟනට මහදන්දී, නිස්දහසක් පමණ මහාවිහාර කරවා, පිළිගන්වා සසුන්වැද මහණව, පිටකත්‍රය ධාරීව ප්‍රතිපත්ති පූජායෙනුදුපද, ඒ බුදුරජානන් වහන්සේගෙන් අනිෂත විවරණ ශ්‍රී ලැඛ, සඛගීයෙහි උපන්හ

තවද, එම කප තුන්වන අසංඛ්‍යාකල්පයෙහි, අටාසංඛ්‍ය කප්ලක්ෂ යක් පිරූ පාරමිතා ඇතිව, විපුල නම් නුවර සුමඛල නම් රජහු නිසා, යසවතී නම් අගබිසව කුස ඉපද, වැඩිවිය පැමිණ සත්දහසක් අවුරුදු ගිහිසැප විඳ ඇත්වාහනයකින් මහබිනික්මන් නික්ම මහණව, මසක් ප්‍රධන් වීර්‍යයකොට, පුලින බෝමුල්හි වැඩහිඳ බුදුවී සැත්තෑ දහසක් අවුරුදු මුදුල්ලෙහි ආසිරි වළඳ, ලෝවැඩකළ සුමඞ්ගල බුදුරජානන් වහන්සේගේ සමයෙහිදු, අප මහබෝසතාණෝ සුනන්දවතී නම් බමුණුගම, අපරිමිතවූ කෙලඟණන් ධනසමෘද්ධීන් සමෘද්ධවූ බමුණු කුලයෙක ඉපද, යස මහත් බැවින් යසවන්තයන නමින් ප්‍රසිඛව වසනුමෝ, පන්සියයක් මානවකයන් පිරිවරා ගොස් තමන් වසන ගමට සාරල්‍යෂයක් පමණ භික්ෂුසඞ්ඝයා වහන්සේක් පිරිවරා වැඩි ඒ සරණඞ්කර බුදුන් දැක ඉනා සතුටු බුදුපාමොක් මහසඟණට උතුම්වූ මධුරවූක්ෂීර පායාසය වළඳවා ආරා ධනා කොට සත්රුමනින් මාඟඟි විහාර කරවා පිළිගන්වා වැ



සුමෙධ සිවුතුමාගේ වසතු පරිත්‍යාගය (52 පිට)

තුන් මස ද කළමනා සියලු උපස්ථාන කෙරෙමින්, ඔබගෙනුදු අනියත විවරණ ලදින් ගිහිගෙයි ආසාව හැර මහණව පඤ්ඤාභිඥ අෂ්ට සමාපත්තී උපදවා ආයු කෙළවර බ්‍රහ්ම ලොකයෙහි උපන්හ.

තවද, එම සාරමණ්ඩනම් කප සතරවන අන්‍යතාකල්පයෙහි අවු රුදු ලක්ෂයකට ආයු බැස සිටිකල දඹදිව සවී සමාපත්තියෙන් සමෘද්ධවූ ශාක්‍යපුරයෙහි සෞභාග්‍යවත් මහත් අමරවතී නම් නුවරෙක් විය. එනුවර ශත්‍ර ප්‍රතිබාහනය පිණිස කරණලද තිස්රියන් උස ඇති මනොසිලාවර්ණී ප්‍රාකාරයෙහි අතුරු තැතිව අවරය යන නමක් ඇති මත්ස්‍ය රූපවලින් අලඞ්කෘතව ගැවසීගත් බැවින් එනුවර අවරවතී නම්විය.

එසමයෙහි අප මහබෝසතාණන් සවිසක්නට සරණවූ සරණ ඞ්කර බුදුන් දවස බඹලොව උපන් තැන් පටන් බුබුනතරයක් මුලුල්ලෙහි දෙව් මිනිස් සැපත් විද දීපඞ්කර බුදුන් ලොව ඉපදීමට පළමුවෙන්ම අමරවතී නුවර නොයෙක් කෙළගණන් වසතුවෙන් ආඪ්‍යවූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි ඉපද පණ්ඩිතත්ව ලක්ෂණවූ ප්‍රඥා සම්පන්නතායෙන් සුමෙධ පණ්ඩිත යන නමින් ප්‍රසිඛව වැඩිවිය පැමිණ තමන්ගේ පිතාවූ ආනන්ද නම් අග්‍ර පුරෝහිත බ්‍රාහ්මණයා විසින් හා මාතාවූ වසී නම් බ්‍රාහ්මණිය විසින්ද මෙහෙයනලදුව ශිල්ප උගන්නා පිණිස කහවණු දහසක් ගෙන තක්සලා නුවරට ගොස් දිශා ප්‍රමුඛාචාර්‍යවරුන්ගෙන් වෙදත්‍රය සහිත සියලු ශිල්පයන් අසා කොබෝකලකින් නිමවා ඉගෙන ගුරුන් වැද අවසර ගෙන තමන්ගේ නුවරටම අවුත් දෙමවුපියන්ට ශිල්ප දක්වා සතුටුවූ ඒ දෙමව්පියන් විසින් කුටුම්බ සණ්ඨාපනය කරණලදුව සියතණින් මාණවකයන්ට මන්ත්‍ර ඔදුරමින් ගෘහවාසයෙහි වසනුවෝ මවුපිය දෙදෙන මිය පරලෝ ගිය කල්හි ඔවුන්ගේ ශරීර ආදාහන කරවා කිස් සෝධා නහා සියලු ධනය පිළිපදින භාණ්ඩාගාරිකයන් විසින්; ස්වාමිනි! නුඹ වහන්සේගේ මාතා පිතා සන්තක රත්නගබඩා බැලුව මැනව යි දැන්වූ කල්හි සුමෙධ පණ්ඩිත තෙම ගද විලවුන් ඇඟ ගල්වා සවීාභරණ විභූෂිතව රුවන් ගබඩා බලනු පිණිස නික්මියේ භාණ්ඩාගාරිකයන් විසින් රත්න පිරූ රුවන්ගබඩා ක්‍රමයෙන් දෙරටු හැර මාතා පිතෘ වංශගත සියලු භොග සම්පත් පළමු ලිය මන් හා සමග විඥාන වශයෙන් මේ මේයැයි දන්වනලදුව, දරුවෙනි, මේ මේ සම්පත් රැස්කළාහු දැන් කොයි ගියේදැයි විවාළහ. මිය පරලොව ගියාහුය යි දැන්වූකල කුමකින් තමතමා රැස්කළ සම්පත් නොගෙන ගියාහුදැයි විවාළ තැන සවාමිනි කිමෙක්ද? ලොකයෙහි

මේ කාරණය නුඹවහන්සේ විසින් පෙර කොා අසනලද ද? මේ සියලු භොගයන් හැර යායුතුමය. මිය පරලොව යනකලට යම්තක් පිරිසෙසින් අඛම්ස්සක් නණ කෙන්දක් පමණවූ ඉතා මදදෙයක් වත් මෙයින් ගෙන යාමක් නැත. සම්පත් ගෙනයාම තබා තමාගේ ශරීරයමුත් ගෙනයාමක් නැත. තම තමා කරගත් කම්යම එක්ව යන්නේයයි දන්වූකල්හි සුමෙධ පණ්ඩිත තෙම කලකිරුණු සිත් ඇතිව කියනුයේ, කිමෙක්ද? දරුවනි, මා විසින්ද ඔවුන් ගිය මාගී යෙන්ම යායුතුදයි විචාරණලදුව, සවාමිනි මේ කාරණය සියලු සත්ත්වයන්ගේම සවභාව ධම්ම යි දන්වූකල්හි සුමෙධ පණ්ඩිත තෙම තමන් මහත් නුවණැති හෙයින් එකාන්තයෙන් උපන් සත්ත්වයා මිය යායුතුයා යි දැන සසර කලකිරී අහෝ මේ සංසාරගත සකල සත්ත්වයෝ අවිද්‍යාන්ධකාරයෙන්ම ඇවිදිනාහුය. භවසංවාදයෙන් චුර්වණ්ව ත්‍රිවිධ දුක් අනුභව කිරීමෙන් කෙලෙස නමැති කටු වෙන් ගැවසී ගෙන මිථ්‍යාදෘෂ්ටි නමැති ලතා ගහණ මහ අකුලෙහි බැඳී දුශ්චරිත නමැති බැහැ ලේඛෝත මැස්සන්ගෙන් බාධිතව මාන නමැති කණුවෙන් ගැවසිගත් වෙන වෙන උපමා කියත් නොහෙවන මහත් දුක් හා නොයෙක් ආදීනව ඇති සංසාර කාන්තාරයෙහි තමහට පිහිටක් සෙවීම නමැති මහ ඔබ්නොබ ඇවිදුනාහුය.

මම වනාහි මේ අනි බාල හිතාහිත නොදන්නා නුවණ මඳ සත්ත්වයන් මෙන් හිතාහිත සෙවීමක් නොකොට සසර ආසාව බැඳ ගෙන කොා හැසිරෙමි. එහෙයින් මම තමහට පිහිට සොයමින් හැසිරෙමි' යි සිතා එම කල්පයෙහිම බුදුවූ තණ්හඞ්කරාදි තුන් බුදු වරයන් කාලයෙහිදු සසුන් වැද මහණව හාවනායෙහි යෙදී වඩාගත් නුවණින් යෙදී ගෘහවාසයට හැකුලුනු මහණ විමට අභිමුඛව දිවන සිත් ඇති හෙයින් තෙමේ සියලු සසර දුක් ඇතිකල නිවණැයි යන දෙයක් ඇතිබව නොයෙක් උපමා කාරණා සැලකිමෙන් දැන මේ සංසාරයෙහි සත්ත්වයාගේ විසිමතම් යොදනක් පුළුල් ඇති මහ දැලක් කටියෙහි බැඳ ගෙන තුන්යොදුන් පමණවූ මහත් කණ්ටක ගහණ යක්හුගේ අතික්‍රමය නොහැක්කාසේ ඉතා මහත් පළිබෝධයක් ඇත්තේය.

එහෙයින් ගෘහවාසයෙහි වසන්නාවූ මට එබඳුවූ සංසාර දුක්ඛ යාගේ අන්තයට පැමිණීම නොපිළිවන පැවිදි වෙස් ගෙන පිළිව කැයි දැන නොයෙක් උපමාවෙන් ගිහි හෙන් නික්ම යාම නිශ්‍රිතවූ අපිය සලකා අපරිමිතවූ භොගස්කඞ්ධය හැර පැවිදිවනු කැමතිවූ ඒ සුමෙධ පණ්ඩිතයාන්ත් වහන්සේට මෙසේ වූ සිතිවිල්ලක් උපන. ධනය නම් සත්ත්වයන් තුළ ලෝභ උපදවන්නේ වෙයි. එබැවින්

මේදවූද සම්පත ඇතුන්ට අනන්තරායය කරන්නේය. මාගේ වූකලී අපරිමිතවූ මහත් සම්පත්තියෙක. රජ දරුවන් විසින්ද කැමතිවියයුතු දෙයක. අන්‍යවූ සම්පත් ඇත්තවුන්ගේ විතතප්‍රවෘත්තිය ගැන කිය නුම කවරේද? මම එසේ වූ මේ සම්පත් සෙස්සවුන්ට පරිත්‍යාග නොකොට වනාහට ගියෙම් නම් අන්තරායකරය. එහෙයින් මම රජ්ජුරුවන්ට කියා දිවාරි ආඝ්‍ය වූද මදවූද, වස්තුවෙන් ප්‍රයෝජන ඇති සිගල්ලන්ට පරිත්‍යාගකොට ගෙම්' යි නියමකොටගෙන රජ්ජුරුවන් කරා ගොස් දන්වනුයේ, මහරජ මාගේ ගෙයි අනන්තවූ සම්පත් ඇත්තාහුය. මුහුදු වෙරළ වැලිමෙන් නිමාවක් දක්නට නොහැක්ක. සියලු දවස්හි මුහුදු දිය මෙන් සියලු භාණ්ඩාගාර යෝම පිරී සිටිනාහ. ඒ සිගල්ල දෙවයන් වහන්ස, නුඹවහන්සේ පිළිපැද වදුල මැනව. තමන්ගේ රාජ පුරුෂයන් යවා ගෙන්වූව මැනව. නොහොත් සියල්ල ලේකම් බලා ප්‍රත්‍යක්ෂකොට, එහිම නිබුව මැනවයි දැන්විය. ඒ අසා මහරජ කියනුයේ; සුමේධ පණ්ඩිත යෙනි, තෙපි කුමක් කරන්නහුද" යි විචාළකැන, මහරජ මා විසින් කාමයෙහි ආදීනවද, මහණවීමෙහි ආනිසංසද විශෙෂයෙන් දක්නා ලද්දේය. ඒ මම සියලු පළිබෝධයන් සිඳ පැවිදිවනු කැමැත්තෙම්" යි දැන්විය.

එකල්හි මහරජ සිතනුයේ මෙහුගේ පිතාවූ ආනන්දනම් පෙරමි බමුණු නැසියිය කල්හි මා විසින් මොහුට පරිසන්ථාර නොකරණ ලද්දේය. එහෙයින් මේ තෙම දෙමිනස්ව සියලු සම්පත් පරිත්‍යාගකොට පැවිදිවීම කැමති වූයේය. එහෙයින් මම මොහුට වඩා සම්පත් දීමෙන් සන්තර්පණය කරම්' යි සිතා කියනුයේ, සුමේධ පණ්ඩිතයෝ නම් අපරාධ ඉවසිමෙන් පණ්ඩිත යයි කියනු ලැබෙති. පණ්ඩිතය නුඹගේ පියානන් දිව්‍යබවට පැමිණීකල නුඹට මා පරිසන්ථාර නොකළ කාරණයෙන් දෙමිනස් වූයෙහි ය යි මම හඟිමි. තොපට සත්කාර නොකරණු කැමතිව එසේ කෙළෙම් නොවෙමි. නුඹ පියානන් නැතිකලෙක පියානන් සතක පුරොහිත තනතුර නුඹට දෙම්' යි සිතා කල්බලා සිටියෙමි. දැන් වනාහි පුරොහිත තනතුර හා පිතා සන්තක සියලු දෑගෘද සමස්ත පිළිපැද්ද මැනවයි කියා. ඒ ඇසූ සුමේධ පණ්ඩිත තෙම, මහරජ ධනයෙන් හෝ යශ තනතුරකින් හෝ මට කවයුත්තක් නැත. මේ සියල්ලම අනවරාග්‍රසංසාරයෙහි දුටු විරිමි. නොවින්ද විරු නුදුටු විරු නිරාමිස නිවන් සැප දක්නා කැමැත්තෙමි. එහෙයින් මම ප්‍රව්‍රජ්‍යාව කැමැත්තෙම්' යි දැන්වූ කල්හි, රජතෙම කැවත කියනුයේ සුමේධ පණ්ඩිතය, තොප කැමති පරිද්දෙන් සීලස්කන්ධ සම්පන්න කැවක සත්‍රින් හා අන්‍යවූද ධන සම්පත් අනුභව දෙමි. නුඹ මට අවවාද කෙරෙමින් මෙහිම වසව, එසේ නොව මා අනාථ නොකරවයි කියා, නොයෙක් ලෙසින් යාච්ඤා කෙළේය.

ඉක්බිත්තෙන් සුමෙධ පණ්ඩිත තෙමේ කියනුයේ; මහරජ, මේ සිංහ
සාත්මාවන්ගේ ජීවිත අනිත්‍යය. විදුලිය දියබුබුලු මෙන් අස්ථිර
එහෙයින් අනිත්‍ය නොවන නිර්වාණ ධර්මය උතුම. තොපට අවව
කරන්ට නොහැක්කෙමි. මෙහි තොප හා කථාසල්ලාප කිරීම
මට ප්‍රමාදයක් මෙන් වැටහෙන්නේය. කුකුස් නොව මාගේ ධන
හෙන්වා ගත මැනව. මම පැවිදිවෙමියි කිහ. මහරජතෙනි ඒ අ
පණ්ඩිතය, එසේවිනම් තෙපි තමාගේ ධනය කැමති මේ ප්‍රයෝජ
ඇත්තවුන්ට දෙවයි කිහ. එවිට පණ්ඩිත තෙමේ කියනුයේ මහර
එසේවිනම් තොපවද අපවද මේ ධනයෙන් ප්‍රයෝජන නැ
අර්පින්ට දෙමිහ. එහෙයින් මහරජ ශ්‍රාවකයන් රැස්වහයේ මු
නුවර බෙර ලැවුව මැනවැයි කියා එසේ බෙර ලවා රැස්වූ ශ්‍රාව
සමූහයාට සුමෙධ පණ්ඩිතයන් වහන්සේ භාණ්ඩාගාරයන් දෙ
හරවා පැමිණි ශ්‍රාවකයන්ගේ භාජන පුරා වස්තු දෙමින් සතියෙ
මුලුල්ලෙහි මහදන් පවත්වා එක රුවන් ගබඩාවක තුබූ රුවන
පමණක් නොනිමී හෙයින් ඒ දක මෙසේ සත්දවසක් මුලුල්ලෙ
මහදන් දීමෙනුදු මේ එක රුවන් ගබඩාවක් පිරූ රුවන් නොනි
කල අනිකුත් මාගේ දෙලොව් දහස් පන්සියයක් පමණ රුවන
ගබඩාවල පුරා තිබෙන රත්න රාශිය මේ නියායෙන් දන්දී කව
දවසෙක නිමාවට ගේද එසේ කල් යවා මෙහි ප්‍රමාදවීමට නුසුදුසුය

එහෙයින් මම ඒ තාක් සියලු භාණ්ඩාගාරවල ඇතුරු මුදු නුව
මැද තබා යමෙකුට ධනයෙන් ප්‍රයෝජන ඇත්නම් හෙතෙම සිත්
හැරගණිවා, සියලු ධනය මා විසින් දෙනලද්දේමය' යි කියා කැ
නත් බෙර ලවා රජපුරුවන් කරා ගොස්, තමාගේ සියලු දුසි දු
යන් හා නය ගැතියන්ට සිත්සේ සම්පත්දී ඔවුන් නිසා පැවැ
සියලු ලියමන් විනාශකොට, දුසිදැසයන් නිදහස් කොට, ක
සමූහයාට අවවාද දී ගිහිගත් හෙයකින් නික්ම යන්නෙක්. මේ
ගිහිගෙන් බඹභාගාරයෙහි අපෙක්ෂාවක් කැතිවම ශත්‍රුමඩ්‍යගැ
මඟත් හිරුක පුරුෂයෙක් මෙන්ද, වස්තුකාම ක්ලේශකාම දෙ
කැර අමරවතී නුවරින් නික්මී ගොස් තමන් සිත්සේ හිමාලය වැ
ගට වැද වන ගහණ කඳුරුළි බලමින් උඩුගඟට යනුයේ, ගං
කරකැවී කියතැන නෛෂ්ක්‍රම්‍යාභිරතව ඍෂි ප්‍රව්‍රජ්‍යාශ්‍රයන් පැමි
වන, බොධිසත්වයන්ගේ කුශලධර්මාභිවර්ධියට සර්වානවූ හෙතිර
ධාර්මිකය යන නමින් ප්‍රසිද්ධවූ එක පර්වතයක් මී ය.

ඒ ධාර්මික පර්වතයට ඍජූදක පුෂ්ප ඵල පල්ලවාංකුරයෙර
සමලඞ්කෘතවූ ශුභ්‍රවර්ණ මෙවලිලුවූ වැලිතලා ඇති භූමිභාගයෙ
ශක්‍රදෙවේන්ද්‍ර විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් ශ්‍රමණ සාරූ
ගුණ අවකිර්ණ සමූපෙතව නිර්මිතාලද සිංහාකාරවූ ගන්ධමණ්ඩ

බිසිබිමෙබෑහෑනාදි අනෙක ප්‍රකාරවූ තවුස් පිරිකර හා රාත්‍රිසථාන දිවාසථාන සහිත පඤ්ච දෙඉසකින් දුරුව පඤ්චානිසංසයකින් යුක්තවූ, පුළුල දෙරියන් හමාරක් හා දිග සැටරියන් පමණ ඇති සක්මන සහිතවූ පන්සලක් මවා ගම්කිසි ප්‍රව්‍රජිතයෙකුට මෙසින් ගම උපකාරණයකින් ප්‍රයොජන ඇත්තම් කුකුස් නොව පරිභොග කෙරේවා, මේ හැම්දෙන ලද්දේමයැයි ඍද්ධි ගෙයි අකුරු පිහිටා, තුබූ ඒ පන්සලට පැමිණ කිසියේත් පැවිදි කෙනෙකුන් කොදුක දෙර හැර විමසා බලනුයේ ඔත්තියෙහි අකුරු දැක කියවා සුමෙඛ පණ්ඩිතයන් වහන්සේ යහුවූව ගිහි වෙසය වූ තව දෙඉසකින් යුත් සාවක යුගලය හැර ප්‍රව්‍රජිතයන්ව අනුරූපවූ දෙලෙස් ගුණයකින් යුත් වැහැරි සිවුරු හැඳ, අනොදු මල් වණිවූ කසාවසත්‍රයක් පෙරවා, දෙඔමල් වැනි සියුම් පුප් ඇති අඳුන් දිවි සමක් එකාංශක කොට ගෙණ තුන්වහක් ඇති ඛාරිකාජය හා තවුස් පිරිකරද ගෙණ සිනිදුවූ වට කාළසාරමය දක් සැරයටියක් දකුණතින් ගෙන පන්සලින් නික්ම සැරයටියෙන් සක්මනෙහි සක්මන් කෙරෙමින් තමන්. ගත් ප්‍රව්‍රජ්‍යාවෙශය බලා ඉතා තුටුපහටු සිත් ඇතිව අහො සුඛං, අහො පරම සුඛං, යනු වෙන් උදන් අනා සුමෙඛ තාපසයන් වහන්සේ ප්‍රීතිවාක්‍යය පවත්වා තමන්වහන්සේ තමන්ට අවවාද කරණසේක්,

පණ්ඩිතය, තා විසින් නාපස ප්‍රව්‍රජ්‍යාව ලබනලදුග. එසෙයින් අද තාගේ මනොරථය පිරිගියේග. ගෘහවාස නමැති ඛිරගෙයින් මිදි ගියෙහිග. නිවීණ ඵලයද උපදනා විවේක සැප දෙන වඤ්චාසයට පැමිණියෙහිග. ඒ මම දැන් ත්‍රි කුසිතව මාගීඵලය උපදවා ගැනමට උත්සාහ කෙරෙමි' යි සිතා ඛාරිකාජය එක්පසෙක තබා සක්මන හරි මධ්‍යයෙහි මුවන් ගල් පුවරුව පිට අගීත කෙශර සිංහරාජ යෙක් මෙන් නිර්භීතව හිඳ සවස් වේලෙහි පරසලට වැද ගහන්හි සිංහසෙය්‍යාව කොට අලුයම නැඟි තමාගේ ආගමනය සිතසේක්; මම ගෘහවාස පළිබෝධය හිඳ, විවේක කැමතිව වසයට පැමිණ යෙමි. තණ්හාදි අකුශල චිතකි නමැති මැස්සෝ මා ලුහුබඳනාහුග. එසෙයින් දෙවනිර්මිතවූ මේ පන්සල විසිමත් දෙවෙනි ගිහි ගෙයක විසිමක් වැන්නයි සිතා දෙඉස අටකින් ගැවසීගත් පන්සල දෙඉස දැක එහි ආසාව හැර දශ ගුණයකින් සමන්විතවූ වෘක්ෂමූලය අනුසස් සේ දැක හෙතෙම දෙවෙනිද උදුසන ගොදුරු ගමට එලඹ භික්ෂාචාරය කොට එහි ඉනිසුන් දුන් භික්ෂාව එහිම හිඳ වළඳා නැවත එම ආශ්‍රමයට ගොස් රුක් මූලසට පැමිණ අට තපස් අනුරෙන් අතිඅල්පෙච්ඡ උත්කෘෂ්ටවූ විශ්‍රීය තමන්ට ඇති බැවින් තුමූම නවුගෙන් ගිලිහී ගිය පත්‍ර ඵල ආහාර කොට ඇති තාපස ප්‍රව්‍රජ්‍යාව සමාදන්ව නිරන්තරයෙන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණයන් සිහිකිරීමෙන් සෙය්‍යාව හැර හිඳීම් සිටීම් සක්මන්

තිරිමී යන ත්‍රිවිධවූ ඉරියව් පැවැත්වීමෙන් සත්දවස ඇතුලත පවෘත්තිඥ අමට සම්පත්ති උපදවාගෙණ, අහසින් ගොස් මහ දඹ රුකෙන් දඹ ඵල ගෙණවුත් වළඳ, උතුරුකුරු දිවයිනට ගොස් එහි දිවාවිහාර කොට සඳමඬල හිරුමඬල පිටාවු කොට හිද එයින් බැස පොළොව කිමිද ගොස් මේර මූදුනට නැගී සිටිනාහ. ලෝවැසි සත්ත්වයෝ ඒ ප්‍රාතිහාර්‍යය දැක අගීත් සම්‍යක් සම්බුදුවූ බුද්ධරාජයා යයි සිතූහ. ඒ සුමේධ තාපසයානන් වහන්සේ මහ ජන සමූහයාට ධර්ම කථායෙන් මෙලෝ පරලෝ දක්වා කුශල ධර්මයෙහි සිත් සමාදන් කරවීමෙන් නිස්ක්‍රමණ වන සේ ප්‍රශංසා කරණසු ලබතෝක.

එසමයෙහි සොළසඅසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව රම්මවති නුවර සුමේධ මහරජහු නිසා සුමේධා නම් අගබිසව කුස පිළිසිඳ දශ එකබමස් ඇවෑමෙන් මවුකුසින් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ දශදහසක් අවුරුදු සුරභානන් බදු වරභානන් පිරිවරා දිව සැප වැනි රජ සැප විඳ ස්ත්‍රීන් ලක්‍ෂයකට ප්‍රධාන වූ පියුම් නම් අග බිසව කුසින් උසහකඛ්ති නම් පුත් රුවන වැයූ ද අසූසාර දහසක් ඇතුන් පිරිවර කොට ඇති මිගුලැන් වාහනයකින් මහබිනික්මන් නික්ම කෙළක් පුරුෂයන් හා සමඟ ගොස් මහණව දසමසක් ප්‍රධන් වියයිය කොට වෙසඟමැදිපෝහෝදු මහණ ගණයා පිරිවරා, එක්තරා ප්‍රත්‍යන්ත නුවරකට පිඬු සිඟාවැඩි දෙවතා කෙනෙකුන්ට පිළියෙල කළ කිරිබතක් පිළිගෙණ එකුන් පණස් පිඬක් කොට වළඳ, නිල්තලා ගංතෙර සුපිපි සල් උයන්හි දහවල් කල් යවා සවස් වේලෙහි ගණයා හැර සල් වෙතෙන් එකලාව නික්ම ගොස් සුනන්ද නම් ආජීවකයා දුන් තිතණ අටමිටක් ගෙණ පුළුල් බෝධිඝ කරා ගොස් තිතණ සලා ගෙලා පණස් රියන් වප්‍රාභාගයාරුඪව අනූ රියන් බෝකදට පිටලා ත්‍රිසන්‍ධිපඤ්ඤඔඝය බැඳ චතුරඔඝ ව්‍යාඝාධිෂ්ඨානයෙන් වැඩහිඳ මාරබලය විධ්වංශනය කොට තාම්‍රවණී අරුණෝදයයෙහි සර්ව්‍වඥතාඥානයට පැමිණ සත් සති යවා බ්‍රහ්මාරාධනාව පිළිගෙන සුනාසුරාමයෙහිදී ධර්මචක්‍ර දෙශනාව වදාරා කෙළසිඟයක් දෙව්මිනිසුන් අධිගමප්‍රාප්තකොට කෙළක් පමණ භික්ෂූන් රහත් ඵලයට පමුණුවා එහි භික්ෂුභාවයෙන් පැවිදි කොට සුමඛලය නිසසය යන අග්‍රශ්‍රාවක දෙනමක් හා තාපුය සුනාපුය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති සාගර නම් භික්ෂු කෙනෙකුන්ගෙන් උපසම්පදා ලදින් සාරලක්‍ෂයක් පමණ මහ රහතන් පිරිවරා අවුරුදු ලක්‍ෂයක් ආසිරි වළඳ, ලෝවැඩ කළ දීපඞ්කර බුදුරජාණන් වහන්සේද මහා මණ්ඩලයෙහි දානවි සැරිසරා වඩනා සේක් රඹගම් නුවරය යන ප්‍රත්‍යන්ත නුවර සමීපයෙහි සුදර්ශන

මහා විහාරයට පැමිණි කල්හි එනුවරවාසී මිනිස්සු බුදුන් වඩනා බව අසා පෙර ගමන් ගොස් සතුටු සොමනස්ව බුදුන් ප්‍රමුඛවූ සංඝලක්ෂ යක් භික්ෂූන් වහන්සේලාට ආරාධනා කොට දන වසතු පිළියෙළ කෙරෙමින් නුවර මඩ්‍යයෙහි මහත් මණ්ඩපයක්කොට නිල්මහනෙල් මලින් සෙයා ලද පස් මල් ඉස උඩුවියන් බඳවා සුවඳ මල්දම් එල්වා අනිකුදු නොයෙක් පූජෝපකරණ රැස්කොට ඉක්බිති කැඳි උඳුළු කෑදෑ යවුල් ආදිය ගෙනගොස් මංගල්‍ය විසමතැන් සමකෙරෙමින් තොරන් නඟමින් පුන්කලස් තබමින් ධජකොඩි පතාක නංවමින් සුදුවැලි ඉසිමින් සාධු සාධුනි කියමින් වැඩිමහත් සතුටින් පිණපිණා මඟ සරහන්වා පවත් ගත්හ.

එකල්හි යට කියනලද ක්‍රමයෙන් පැවිදිව හිමාලයෙහි වසන සුමේධ තාපසයන් වහන්සේ ඒ දීපඞ්කර මහබෝසතාණන් මව්කුස ඉපදීමෙහිද නික්මීමෙහිද බුදු වීමෙහිද ධම්මචක්‍රය දෙසීමෙහිද යන මේ සතර තන්හිම දසදහසක්සක්වළ කම්පාවීම් හෙත් ආලෝක පැතිරීම් ආදිය ඇතිවූ කල්හි ධ්‍යානයට සමවැද හුන් බැවින් එයින් කිසිවකුත් නොදන්හ. ශබ්දයකුත් නොඇසූහ. එහෙයින් බුදුන් ලොව පහළවූ බව නොදැන වසනුවෝ ලුහු ඇඹුල් සෙවුනා පිණිස තිමවත ආශ්‍රම පදයෙන් අහසට නැඟි ගොදුරු ගම බලා ක්‍රමයෙන් මනුෂ්‍යපථයට පැමිණ රඹගම් නුවර මුදුතෙන් යනුවෝ මහත් සන්තෝෂයෙන් මඟ සරහන්නාවූ මිනිසුන් දැක කාරණ කිම්දෝ හෝයි සිතා ආකාශයෙන් බැස විවාරන්නාහු පින්වත්නි, තොප විසින් මේ මංගල්‍ය කවරෙක්හට සරහනු ලැබෙද? තොපි සෙසු දවස මා දැක මහාබ්‍රහ්මයා මෙන් සිතා නම තමන්ගේ කම්නන හැර මට අභිවාදන පවත්වනුයේ අඤ්ජලි කම් සාමීචි කම් කිරීමෙහි ව්‍යාපෘතවන්නාහු; දැන් වනාහි මා හිඤ්ඤා ශ්‍රවණයෙකු මෙන් බලන්නාහුය. මිට කාරණ කිමිදැයි විවාළකල එපවත් දන්වන මනුෂ්‍යයෝ කියන්නාහු "හා තාපසයන් වහන්ස, අධිකාර විධිවං ගත මහා ප්‍රදීපයක් මෙන් සුදෑසලොකයෙන් අවිදූඛකාරය හරනා දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. ඒ බුදුන් වඳනට මංගල්‍ය අපි සරහම්හයි දන්වූවාහුය.

එකල්හි සුමේධ තාපසයන් වහන්සේ පස්වණක් ප්‍රීතීන් පිණා ගිය ශරීර ඇතිව සිතනසේක් අහෝ මහත් ආශ්චර්‍ය අද්භූතයක. මේ බුදුනැයි යන ශබ්දය නොයෙක් කල්ප සියදහස් ගණන් ඉක්ම ගිය කඹුදු අසන්ව අතිශයින් දුලබිහුවු දෙයක. ඒ බුදුනැයි යන නාමය අද දැන් මා විසින් අසන ලද්දේය. එහෙයින් මා ලද ජීවිතය සඵලැයි දැන ඉතා සතුටුව ඉදින් සැබවින්ම බුදුන් වඳින පිණිස සරහන මංගල්‍යක් වීනම් මවද මෙයින් භාගයක් දෙවයි කිකල්හි මනුෂ්‍යයෝ මේ තාපසයන් වහන්සේ මහත් ශ්‍රද්ධාභූතාව ඇති

සේක. එහෙයින් මහත් ගැඹුරු දුර්ගස්ථානයක් නුවුත් සමකල හැක්කැයි සිතා උදක වහනයවන කලල් මඩ ඇති මහත් ගැඹුරු කඳුරැලියක් දුන්හ. එකල්හි සුමේධ තාපසයන් වහන්සේ සිතන සේක් මා අත උදල්ලක්වත් කූඩයක්වත් නැත. එහෙයින් සෘඩි බලයෙන්වත් රුවන්මිය පොළොව මවාලීම හැකි විනවුදු කායව්‍යා වෘතය මෙන් මාසිත සහවූ නොවන්නේයයි සිතා කූඩයක් ගෙණ මිනිසුන් බිම කැනිතැනින් පස් ගෙණවුත් උදකශ්‍රොතයෙහි දමදමා පුරවමින් කලල් මාගි ප්‍රදෙශය නොනිමි කල රඹගම් නුවර වාසීන් ගේ ආරාධනායෙන්සාරලක්ෂයක් පමණ රහතන් වහන්සේ පිරිවරා රන් මෙරක් සේ ඒ මාගීයෙහි දීපඞ්කර බුදුරජාණන් වහන්සේ වඩින්ට පටන් ගත් සේක.

එසෙණෙහි දහසක් සක්වළ දෙවියෝ අද සුමේධ තාපසයන් වහන්සේ දීපඞ්කර ජිනෙන්‍ද්‍රයන් සම්පයෙන් බුදුවීමට එකාසනයෙන් විවරණ ලබනසේකැයි දැන ඔවුන් කැඳවා ඇසිල්ලකින් මේ සක්වළට රැස්වූහ. එම නියත විවරණශ්‍රී ලබන ධර්මතා බලන්ට එදවස ලොක විවරණ ප්‍රාතිහාර්‍යද ඇතිවූහ. එහෙයින් දෙවියෝ මනුෂ්‍යයන් දක්නාහ. මනුෂ්‍යයෝද දෙවතාවන් දක්නාහ. එහෙම ඔවුනොවුන් කැඳවා ඇදිලි බැඳ බුදුන් අනුවම යන්නාහ. එසේම දිව්‍යවූද මානුසිකවූද අනෙකප්‍රකාර තූර්‍යයෙන් දෙපාර්ශ්වයෙහි දෙවතාවන් හා මනුෂ්‍යයෝ පුද පුදා යන්ට පටන් ගත්තාහ. එකල්හි සුමේධ තාපසයන් වහන්සේ එසේ යන දෙව් මිනිසුන් හා මහ රහතන් පිරිවරා වඩන බුදුන්දැක මාවිසින් ගත් භූම්ප්‍රදෙශය අලඞ්කාතනොවිය. විෂමව ම්ඩ සහිතව තිබෙයි. ඊට දැන් කුමක් කෙරෙම්දැ යි මේ ලොකයෙහි බුඩොත්පාදයක් ලැබීම අත්‍යන්ත දුර්ලභය. එහෙයින් අද මම ශ්‍රාවක සඞ්ඝයා සහිතවූ මේ බුදුන්ට ආත්මීය පරිත්‍යාග කෙරෙමි'සි සිතා තමන්ගේ නීලවණීවූ කෙසකලාපය බුදු දළ මඩුලු හා අදුන් දිවිසම් වැහැරි සිවුරු කලල් මතුවෙහි අතුට මුහුණින් හෙව මේ සාරලක්ෂයක් රහත් පිරිවර සහිතවූ බුදුරජාණන් වහන්සේ මඩ නොමැඩ මාපිට මැඩගෙන වඩනා සේක්වා. ඉදින් මම කැමැත්තෙම් නම් අදම සකල ක්ලෙශයන් නසා අග්‍රවූ රහත්ඵලයට පැමිණ බුදු පාමොක් මහ සඞ්ඝයා හා රඹගම් නුවරට වැද පිණ්ඩපාතය පිළිගන්ට සමර්ථයෙමි. එසේ අප්‍රමිඩ වෙශයෙන් එකලාව නිවන්පුර වැදීමෙන් මට ප්‍රයොජන කිම්ද? එහෙයින් සර්ව්ඥතාඥානයට පැමිණ දෙව්යන් සහිත සත්ත්වලොකයා නිවන් පුරයට පමුණුවන්නෙමි. ඉදින් මම බුදු නොවන්නෙම් නම් මා ඉක්මවා නොමැඩ

භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිනා සේක්වා, නොහොත් බුදු වන් නෙමි නම් මා ඉක්මවා වඩනා සේක්වා, මෙසේ ඇති කල්හි මාගේ ප්‍රාර්ථනා සමෘද්ධ දකිමිසි සිතා සැතපුනුසේක. එකල්හි අති උදුර බුඩ වෙෂයෙන් දිලිහි දිලිහි දෙව්මිනිසුන් විසින් පිරිවරණලද දීපංකර බුදුරජාණන් වහන්සේ සුමේධ පණ්ඩිතයන් වහන්සේ සමීප යට වැඩ විශුඩ බුඩ වක්‍ෂුයින් ඒ තාපසයන්ගේ. චරිතය බලා මේ සත්ත්වතෙම නිස්සණ ප්‍රඥඇත්තේය. මොහුගේ ප්‍රාර්ථනාව සිඩවේ දෙගෝසි නොවේදෝ හෝසි වෙතොපරියඥනයෙන් සුමේධ තාපස යන්ගේ සිත්ගෙණ අංගුලියඩ්‍යාශයෙන් අතොදු මලක් ගත්තෙක් මෙන් අනාගත ඥනයෙන් ඒ තාපසයන්ගේ ස්කඩ්ධපිළිවෙළ බලන සේක් එකාවජ්ජිත චිත්තයකින් ම සාරාසඩ්ඛ්‍ය කප්ලක්‍ෂයක් පමණ මහත් දිඝි කාලය ඉගවා, මේ තාපසයන්ගේ ප්‍රාර්ථනාව සිඩවන්නේ යයි දූන වදුරා දිව්‍ය මනුෂ්‍ය සමූහයා මඩ්‍යගතව මේ සුමේධ පණ්ඩිත යන්ට ව්වරණ දෙවා වදුරණ දීපංකර බුදුරජාණන් වහන්සේ අඡවාඩඝ සමින්විත අත්‍යන්ත කණ්හිරසාගන බ්‍රහ්මස්වර විහිදුවා භික්‍ෂු සඩ්ඝයාට ආමන්ත්‍රණය කොට වදුරණසේක් –

පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතෝ කප්පෙ අයං බුඩෝ භවිස්සති.

යනාදීන් ව්වරණදී ඉක්බිති ඒ තාපසයන්ව පුදනු කැමති බුදු රජාණන් වහන්සේ සාමණේරයන් බලා වදළසේක.

එකල්හි එබව දත් සෘඩිසමපන්න සාමණේරයෝ ඇඟිල්ලකින් හිමවතට ගොස් ජලජ ඵලජ මනාසුවඳැති මල්ගෙණවුත් එළවූහ. භාග්‍යවතුන් වහන්සේ ශ්‍රීහස්තයෙන් එයින් මල් අටමිටක් ගෙණ තාපසයන් මත්තෙහි වහුරුවා හෙලමින් පූජා කළසේක. ඒ හිම වතින් ගෙණා මල් අටඛාරියක් පමණ වූයේය. ඉක්බිති. දීපංකර බුදුරජාණන් වහන්සේ ඒ සුමේධ තාපසයන් අවට ප්‍රදක්‍ෂිණාකොට වැඩිසේක. වඩනට වන් කල්හි ඒ තාපසයන්ගේ ශ්‍රඩා බලයෙන් හොත්තාවූ ඒ භූමිප්‍රදේශය පමණක් කුඩුල් සකක්මෙන් කරකැවී සුමේධ තාපසයන්ගේ ශීර්ෂ බුදුන්ගේ ශ්‍රීපාදයට අභිමුඛව සැදී ගියේය. බුදුරජාණන් වහන්සේද සාරලක්‍ෂයක් රහතන් හා සමඟ මල් පුදු වට ප්‍රදක්‍ෂිණා කොට වැඩි පසු සෙසු දෙව්යන් සහිත ලෝ වැසියෝද ධාතු සහිත සඩ්ඝ්‍යූපයකට මෙන් ප්‍රදක්‍ෂිණාකොට පසඟ පිහිටුවා වැඳ සතුටුව ඒ තාපසයන්ගේ ගුණකියා ප්‍රශංසා කරමින් නැවත නැවත බලමින් ගියාහ.

සුමේධ පණ්ඩිත තාපසතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ දශීනුපචාරය ඉක්ම ගියකල්හි මඛපිට හොත් තැනින් නැගී සමාධි පර්‍යඩ්කයෙන් හුන්සේක. එකේණෙහි දසදහසක් සක්වළ පෙර

බුදුවරයන් දුටු ශුඛාවාසවාසී මහාබ්‍රහ්මරාජයෝ අප මහ බෝසතා නන් නියත විවරණ ලැබූ ධර්මතා බලයෙන් උපන් තොයෙක් සිය ගණන් ප්‍රාතිහාර්‍යයන් දැක සුමේධ තාපසයන් වහන්සේ කරා පැමිණ උත්සාහ දන්වා බුදුවීම නියත බව හා තථාගතයන් වහන්සේගේ වචනය නිබොරු බවද ප්‍රකාශ කිරීමෙන් ප්‍රශංසා කොට මේ ගාථා කිවහුය.

යං පුබ්බෙ බොධිසත්තානං, පල්ලඞ්කවර මාභුජේ,
නිමිත්තානි පදිස්සන්ති, තානි අජ්ජ පදිස්සරෙ.

සිතං ව්‍යපගතං හොති, උණ්හඤ්ච උපසම්මති,
තානි අජ්ජ පදිස්සන්ති, ධුවං බුද්ධො භවිස්සසි.

මහාවාතා න වායන්ති, න සන්දන්ති සවන්තියෝ,
තානි අජ්ජ පදිස්සන්ති, ධුවං බුද්ධො භවිස්සසි.

නිරයෙපි දස සහස්සි, අග්ගි නිබ්බන්ති තාවදෙ,
තෙපජ්ජ නිබ්බුතා අග්ගි, ධුවං බුද්ධො භවිස්සසි

රාහෝ තදු නත්‍ථි හොති, දෙසෝ මොහොපි නස්සති,
තෙපජ්ජ විගතා සබ්බෙ, ධුවං බුද්ධො භවිස්සසි.

ඛුතිව උපපත්තිව, ඔණෙ තස්මිං නවිජ්ජති,
තානි අජ්ජ පදිස්සන්ති, ධුවං බුද්ධො භවිස්සසි.

දල්හං පග්ගණ්හ විරියං, මා නිවත්ත අයික්ඛම,
මග්ගං එතං විජානාම, ධුවං බුද්ධො භවිස්සසි'ති.

යනාදි වශයෙන් තොයෙක් කාරණයන් ගෙණහැරදක්වා බ්‍රහ්මරාජයන් විසිතුදු ඒකාන්තයෙන් ඔබ බුදුවනසේකැයි දන්වූ කල්හි සුමේධ තාපසයන් වහන්සේ දීපඞ්කර නම් භාග්‍යවතුන් වහන්සේගේ වචනයද ශුඛාවාසවාසී බ්‍රහ්මරාජයන්ගේ වචනද අසා උපන් මහත් වීර්‍යය හා අතිශයින් තුටු පහටු සිත් ඇතිව.

අමෙඣ්ඣ වචනා බුද්ධා, අමොඝ වචනා ජිනා,
විතථං නත්‍ථි බුද්ධානං, ධුවං බුද්ධො භවාමහං.
හන්ද බුද්ධ කරෙ ධම්මෙ, විවිනාමි ඉතො චිතො,
උඩ්ඪං අධෝ දසදිසා, යාවතා ධම්ම ධාතුයා.

යනාදි බොහෝ කාරණයන් සැලකීමෙන් තමන් බුදුවන බව නියතකොට දැන බුඞ්කාරක ධර්මයන් සොයන්ට පටන්ගත්තේක.

තෙහුම්කවූ සියලු සත්ත්වයන්ගේ ජීවත්වීම ඒකාන්තයෙන් ආහාර ප්‍රත්‍යයෙන්ම වන්නේය. ඒ හොජන ශ්‍රාද්ධාවාසාදි ආහාර ප්‍රත්‍යයන් නැතිවීමෙන් මේ සියලු සත්ත්වයන්ගේ දිවි නැසීම වන්

නේය. එහෙයින් ඍත්පුරුෂයන් විසින් පළමුකොටම දන්දීම සුදුසු ය. ඒ දානයදෙන්නාවූ සුමේධපණ්ඩිතය! තාවිසින් පැමිණි යාචකයන්ට යටිකුරු කළ දිය කළයක් නිරවශේෂව නික්මෙන්නා සේ ධන හා පුත්‍රදාරාදි සියලු වස්තූන් කෙරෙහි නිරාලයව දීමෙන් දානපාරමිතාවද ශරීරාවයවයන් දීමෙන් දානඋපපාරමිතාවද ජීවිතය දන්දීමෙන් දාන පරමාර්ථපාරමිතාවද යන මේ ධනාඛ්‍ය ජීවිතපරිත්‍යාගයෙන් ත්‍රිවිධවූ පූජ්‍ය බුදුව ්යන් විසින් ආසෙවිත නිසෙවිතවූ පළමුවෙනි දාන පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙන 'තමන් වහන්සේ තමන්ට අවවාද කොට ඉක්බිති බුඩකාරක ධර්මයන් සොයනසේක් පූජ්‍ය බුදුරජාන් විසින් ආසෙවිත නිසෙවිත වූ දෙවෙනි ශීල පාරමිතාව දැක සුමේධ පණ්ඩිතය යම්සේ සෙමරනම් මාගධෙනුතොමෝ තමාගේ ජීවිතයද නොබලා වාලඝියම රක්නීද, එපරිද්දෙන් තෙපි මෙතැන් පටන් බාහිර ධනාඛ්‍ය ජීවිතයද නොබලා චතුපාරිශුද්ධි ශීලය අඛණ්ඩ අවශ්ඡිද්‍රතාදි අෂ්ටාඩ්‍ය සමන්නාගතව රක්ෂාකිරීමෙන් ශීලපාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ;

ඉක්බිති පූජ්‍යබුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ තුන්වෙනි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දැක සුමේධ පණ්ඩිතය! යම්සේ ඛඩ්ගනා ගාරයෙහි දීඝිකාලයක් දුකින් පිඩිතව විසූ පුරුෂයෙක් එහි ආසාව නුපදවාද එසින් මිදීමම සොයන්නේවේද, එපරිද්දෙන් සියලු සසර දුකින් මිදීම පිණිස ගෘහවාසයෙන් නික්ම පැවිදිවීමට අභිමුඛ වීමෙන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ, ඉක්බිති එසේම පූජ්‍ය බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ සතර වෙනි ප්‍රඥාපාරමිතාව දැක මෙතැන් පටන් සුමේධ පණ්ඩිතය! තෝ ප්‍රඥාපාරමිතාව පුරන්නෙහි විනම් යම්සේ පිඹු පිණිස හැසිරෙණ භික්ෂුවක්හු හීනාදි නොයෙක් හෙද ඇති කුලයන් අතුරෙන් කිසියම් කුලගෙයක් නොහැර පිළිවෙළින් පිඬු සිහා යාමෙන් තමා ඇපෙන පමණ භික්ෂාව ලබන්නේ වේද, එපරිද්දෙන් හීන මධ්‍ය උත්කෘෂ්ට කිසිවකුදු නොහැර සියලු පණ්ඩිත පුරුෂයන්. කරා පැමිණ ප්‍රශ්න විවාරීමෙන් බණ ඇසීමෙන් ප්‍රඥාපාරමිතාව පුරවයි කියා තරකොට ඉටාගෙණ, ඉක්බිති බුඩකාරක ධර්මයන් සොයන සේක් පූජ්‍ය බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ පස්වෙනි වීර්‍ය්‍ය පාරමිතාව දැක සුමේධ පණ්ඩිතය මෙතැන් පටන් වීර්‍ය්‍ය පාරමිතාව පුරන්නෙහි විනම් යම්සේ සිංහරාජ තෙම සියලු ඊර්‍ෂ්‍යා පථයෙහි දඝවීර්‍ය්‍ය ඇතිවේද එපරිද්දෙන් තෙපිද උපනුපන් ජාතිවල සියලු ඊර්‍ෂ්‍යාපථයෙහි දැඩවූ නොපසුබට වීර්‍ය්‍ය ඇතිව වීර්‍ය්‍ය පාරමිතාව පුරවයි කියා තරකොට ඉටාගෙණ, ඉක්බිති බුඩකාරක ධර්මයන් සොයනසේක් පූජ්‍ය බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ

සමෙනි **ක්ෂාන්තිපාරමිතාව** දැක සුමේධ **පණ්ඩිතයා** මෙතැන් පටන් ක්ෂාන්ති පාරමිතාව පුරන්නෙහි විනම් යම්සේ පාපිමයෙහි සඳුන් කොකුම් සුවඳ මාලාදිවූ සුවිදුද සපි සුනඛ මනුෂ්‍ය කුණපයන් හා ගූථ මූත්‍ර කෙල සොටු ආදිවූ අසුචිදුද බහාලන කල්හි එයින් පාපිච් තොමෝ ස්නෙහ ප්‍රතිඝ දෙකම නොකොට සමව ඉවසා පවත්නේද එපරිද්දෙන් තෙපිද සියල්ලන්ගේ සම්මාන අවමාන දෙක්හි සමවූ සිත් ඇතිව ඉවසීමෙන් ක්ෂාන්ති පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ, ඉක්බිති බුඩකාරකධම්මයන් සොයන්නේක් පූජිබුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ සත්වෙනි **සත්‍ය පාරමිතාව** දැක සුමේධ පණ්ඩිතයා තෙතැන් පටන් සත්‍ය පාරමිතාව පුරන්නෙහි විනම් යම්සේ ඔසධි තාරකාව හැම සත්වලෝ තමාගේ ගමින් විපිය නොහැර සවකිය විපියෙහිම යන්නේද එපරිද්දෙන් තෙපිද මස්සකයෙහි අසනිපතනයවන්නේ විනාමුදු ධනසම්පත් ආදි කිසිවක් නිසා ජීවදි කියිඅහනියකින් සත්‍යයහැර මුසාවාද කොඛිණීමෙන් සත්‍යපාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ;

ඉක්බිති මත්තෙහිදු බුඩකාරක ධම්මයන් සොයන්නේක් අට වෙනි **අධිෂ්ඨාන පාරමිතාව** දැක සුමේධ පණ්ඩිතයා! මෙතැන් පටන් අධිෂ්ඨාන පාරමිතාව පුරන්නෙහි විනම් යම්සේ සුප්‍රතිෂ්ඨිත පෘථිවිය සියලු දිගින් හමන බලවත් වාතයෙන් කම්පා නොවේද වලතය කොවේද සවකිය ස්ථානයෙහි සිටින්නේද එපරිද්දෙන් තෙපිද ගමක් ඉටුමයහි විනම් ඒ අධිෂ්ඨානයෙහි නිශ්චලව පිහිටා සිටීමෙන් අධිෂ්ඨාන පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ, ඉක්බිති බුඩකාරකධම්මයන් සොයන්නේක් පූජී බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ නවවෙනි **මෛත්‍රී පාරමිතාව** දැක සුමේධ **පණ්ඩිතයා** ඉදින් බුදුබව කැමැත්තෙහි විනම් යම්සේ ජලය යහපත් කල්‍යාණ ජනයන් හා නපුරු පවිවූ ජනයන්ට සමවූ ඵලශීව ඵවූකොවුන්ගේ ශරීර ප්‍රතිබඩ ආගනතුක රජස් හා ශරීර මල පිරිසිදු කෙරේද එපරිද්දෙන් තෙපිද අහිතයන්ටද හිතයන්ටද සතුරන්ටද මිතුරන්ටද යන හැමදෙනාටම සමසිතව මෛත්‍රීසිත් වැඩීමෙන් මෛත්‍රී පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගෙණ, ඉක්බිති බුඩකාරක ධම්මයන් සොයන්නේක් පූජී බුදුවරයන් විසින් ආසෙවිත නිසෙවිතවූ දසවෙනි **උපෙක්ෂාපාරමිතාව** දැක සුමේධ පණ්ඩිතයා! ඉදින් මෙතැන් පටන් බුදුබව කැමැත්තෙහි විනම් සුවි අසුවි දෙක බහාලීමෙහි යම්සේ මහපොළොව හිතාහිත නොව සමව පවත්නේද එපරිද්දෙන් තෙපිද සුවදුක් දෙක්හි හැම කල්හිම වෙනස් නොව තුලාවක් මෙන් මැදහත්ව උපෙක්ෂා පාරමිතාව පුරවයි කියා දැඩිකොට ඉටාගත්සේක.

ඉක්බිති සුමේධපණ්ඩිතයන් වහන්සේ මේ දසපාරමි ධම්මයන් ආදි මධ්‍ය පරියොසාන වශයෙන් විභාග කොට සිතා මේ

ලෝකයෙහි බොධිසත්ත්වවරයන් විසින් පිරිය යුතුවූ බුඩකාරක ධම් යන් මෙපමණෙක්මය. මෙයින් අන්‍යවූ බුඩකාරක ධම් කෙනෙක් නැත. මේ දානාදි දශපාරමිතා ධම්යෝ වනාහි උඩ ආකාසයෙහිත් නැත. යට පෘථිවියෙහිත් නැත. පූර්වදිගාදි දික්හිදු නැත. මාගේ හෘදය මාංශයාගේ ඇතුළත්හිවූ සිත්හි පිහිටා සිටිනාහුයයි දැන එහැම පාරමිතාවන්ම මාරයන් විසිනුදු කම්පාකොට ගත නොහැකි සේ දැඩි කොට ඉටාගෙණ, නැවත නැවත අනුලොම ප්‍රතිලොම වශ යෙන් සම්මර්ශනයකොට මෙසේ දානාදි සමතිංශත් පාරමී ධම්යන් අනෙක ප්‍රකාරයෙන් සිහිකරණ මහබෝසතානන් වහන්සේගේ ධම්තෙජසින් දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනඇති පුළුලවූ මේ දශදහසක් සක්වළ මහා පෘථිවිතෙමෝ ත්‍රාසයන කරණලද උක්ඛන්ත්‍රයක් හා තෙල් යන්ත්‍රයක් මෙන්ද දණ්ඩකින් ප්‍රහාර ලත් ලොහොං තලියක් මෙන්ද ඝනතරාව සහස්‍රාව වශයෙන් සාධුනාද පවත්වා කම්පා වූවාය. මෙම කියන ලදුයේමැයි.

එතඤ්ඤායෙව තෙ ලොකා, යෙ ධම්මා බොධි පාවනා
තතුඛං නාවි අඤ්ඤත්‍ර, දළ්හං තස්ස පතිට්ඨහ
ඉමෙ ධමෙව සම්මසතෝ, සභාවසරස ලක්ඛණෙ,
ධම්ම තෙජෙන වසුධා, දසසහසී පකම්පථ.
චලති රවති භූමි, උවජ්ජනනාංව පිළිතං,
තෙල යනෙන යථා චක්කං, එවං කම්පති මෙදිනී, සි

මෙසේ මේ තමන් වහන්සේගේ වාග්ප්‍රණිධානය ප්‍රකට කොට දෙවි මිනිසුන්ට කරණලද සබ්මිත්‍රසාසනා ඇතිහෙයින් සදේලෝක පූජ්‍යවූ මාගේ බුදුරජානන් වහන්සේ ශාස්තා නම් වන සේක. එසේ හෙයින් කියනලදී

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අත්ත ඵලං දදං
දදනතං දම්මසත්තානං පුරිසාජඤ්ඤ තෙ නමොංගි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සබ්මිංවවාද සංග්‍රහයෙහි මෙතෙකින් අතිදූරෙ නිදානය කියා නිමවන ලදී.

———o———

එයින් මෑත භාගයෙහි බුඩශූන්‍යවූ සෙල නම් එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල ඤොණඤඤ නම් සම්බුදුන් වහන්සේ ලෝක යෙහි පහළවූසේක. එසමයෙහි පුරණලද බොධි සම්භාර ධම් ඇති අප බුදු බෝසතානෝ විජිතාවී නම් චක්‍රවර්ති රජව කෙළලක්ෂයක්

පමණ බුදුජාමොක් මහාසංඝයා වහන්සේට මහදන්දී ඒ කොඩඤ්ඤ නම් බුදුන් සමීපයෙහුදු බුදුවීමට විවරණශ්‍රී ලැබ බණ අසා චක්‍රවර්ති රාජ්‍යයෙන් පූජාකොට මහණව තුන්පිටකය ඉගෙණ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණාවූ ධ්‍යාන ඇතිව බ්‍රහ්මලොක යෙහි උපන්නාහුය. සල්කලණ බෝරුක්මුල්හි වැඩහිඳ බුදුවූ ඒ කොණ්ඩඤ්ඤ බුදුරජානන්වහන්සේ අපරිමිත ශ්‍රාවක ගණ පිරිවරා අවුරුදු ලක්ෂයක් මුලුල්ලෙහි වැඩ සිට සියලු බුඩකෘත්‍යය කොට වඳුරාරාමයෙහිදී පිරිනිවන් පෑසේක.

එයින් මෑතභාගයෙහි හාස තම්වූ එක් අසංඛ්‍යයක් කප් ඉක්ම යියකල එකම කල්පයෙක්හි මඛ්ඛලය සුමනය රෙවතය සොභිත යයි යන බුඩදිවාකරයෝ සතර නමක් ලෝකයෙහි පහළවූහ. එයින් මඛ්ඛල නම් බුදුන් සමයෙහි අප මහ බෝසතානෝ සුරුචි නම් බ්‍රාහ්මණව කෙළ ලක්ෂයක් පමණ බුදුපාමොක් මහසඟනට සතියක් මුලුල්ලෙහි ගවපාත නම් දානයක් දී බණ අසා මේ මහ පුරුෂතෙම මෙයින් දෙයාසංඛ්‍ය කප්ලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවන්නේ යයි විවරණශ්‍රී ලැබ ඒ බුදුන් සමීපයෙහි මහණව පිටකත්‍රයධාරීව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආයු කෙලවර බ්‍රහ්මලොකයෙහි උපන්සේක.

එයින් මෑතභාගයෙහි ලොවැ පහළවූ සුමන නම් බුදුරජානන් වහන්සේගේ සමයෙහි අප මහ බෝසතානෝ මහත්වූ ඍඬ්‍යනුභාව ඇති අතුල නම් දිව්‍යනාඝරාජව ඉපද බඹු සමූහයා විසින් පිරිවරණ ලදුව නාගභවනයෙන් නික්ම අවුත් කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ පිරවර කොට ඇති බුදුන්ට දිව්‍යමයවූ පඤ්චාංගික තූර්‍ය්‍ය නාදයෙන් පූජා කරවා මහදන්දී බුදුපාමොක් මහ සඟපිරිසට වෙන වෙනම එක එක දිවසළු සඟළු බැගින් දන්දී සරණසීලයෙහි පිහිටා ඒ බුදුන් සමීපයෙහුදු මෙතෙම අනාගතයෙහි ගෞතම නම් බුදුවන්නේය යනාදීන් විවරණශ්‍රී ලත්සේක.

එයින් මෑතභාගයෙහි බුදුවූ රෙවත නම් බුදුන් සමයෙහි අප මහ බෝසතානෝ අතිදෙව නම් බ්‍රාහ්මණව ඒ රෙවත නම් සම්බුදුන් වහන්සේ කරා පැමිණ බණ අසා සරණයෙහි පිහිටා ශ්ලෝක දහසකින් බුදුන්ට සතුතිකොට දහසක් වටිනා උතුරුසළුවෙන් පූජා කොට මෙතෙම මතු ගෞතම නම් බුදුවන්නේය යනාදි ක්‍රමයෙන් විවරණ ශ්‍රී ලත්සේක.

එයින් මෑත භාගයෙහි බුදුවූ සොභිත නම් බුදුන් සමයෙහි අප මහබෝසතානෝ සුජාතන්මබ්‍රාහ්මණව ඒ බුදුන් කරා පැමිණ බණ අසා සරණසීලයෙහි පිහිටා බුදුපාමොක් මහසඟපිරිස මහදන්දී මෙතෙම මතු බුදුවන්නේ යයි යටකී නයින්ම විවරණශ්‍රී ලත්සේක.

එසින් මෑත භාගයෙහි වය තම් එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල එකම කල්පයෙක්හි අනොමදස්සිය පදුමය නාරද යයි සම්බුදුවරයෝ තුන්නමක් උපන්නාහුය. එසින් අනොමදස්සි තම් බුදුන් සමයෙහි අප මහ බෝසතාණෝ මහත්වූ ඍඬ්ධානුභාව ඇති කෙළ ලක්ෂයක් පමණ යක්ෂයන්ට අධිපති වූ මහෙශාක්‍ය යක්ෂ සෙනාධිපතියෙක්ව ඒ බුදුන් කරා පැමිණ බුදු පාමොක් මහ සඟ නට මහදන් පවත්වා මෙතෙම අනාගතයෙහි මෙසින් එකාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් ඉක්ම ගියකල ගෞතම නම් බුදු වන්නේය යන්‌ආදීන් විවරණ ශ්‍රී ලත්සේක.

එසින් මෑත භාගයෙහි ලොවැ පහළවූ පදුම නම් බුදුන් සමයෙහි අප මහ බෝසතාණෝ සිංහරාජයෙක්ව ඉපද ඒ බුදුන් අශ්‍රමක අරණ්‍යයෙහි වසනක ලහි නිරොධසමාපත්තියට සමවන්නාවූ බුදුන් දැක ප්‍රසන්නවූ සිත් ඇතිව වැඳ පෑදකුණුකොට තුන්වලක් සිංහනාද කොට සතියක් මුළුල්ලෙහි බුඩාලම්බන ප්‍රීතිසැපයෙන්ම ගොදුරු පිණිස නොගොස් ජීවිත පරිත්‍යාගය කොට උපස්ථාන කෙරෙමින් සිටියේය. බුදුහු සතියක් ඇවැමෙන් නිරොධ සමාපත් තින් නැගී සිංහයා බලා භික්ෂූසංඝයා කෙරෙහිත් සිත පහදවා සංඝයා වදනේ යයි භික්ෂූසංඝ තෙම එවයි සිතූසේක. භික්ෂූන් වහන් සේත් එකෙණෙහිම වැඩිසේක. සිංහරාජ තෙම සංඝයා කෙරෙහි සිත පැහැදවූයේය. සම්බුදුන් වහන්සේ ඔහුගේ අභිප්‍රායබලා අනාගතයෙහි බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එසින් මෑත භාගයෙහි නාරද නම් බුදුහෙතෙකුන් වහන්සේ ලෝකයෙහි පහළවූසේක. එසමයෙහි අප මහ බෝසතාණෝ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්තියෙහි පුරුදුකරණ ලද සිත් ඇතිව හිමවත වසනසේක. එකල්හි නාරද නම් බුදුරජාණන් වහන්සේ ඍද්ධිබලයෙන් රහතන් හා අනාගාමී ඵල ප්‍රාප්ත දශ දහසක් උපාසකවරුන් පිරිවරා ඒ ආශ්‍රමයට වැඩ ඔවුන් මවාලූ ආශ්‍රමයෙහි සතියක් වැස උතුරුකුරු දිවයිතෙන් ගෙණවුත් දුන් ආහාරය සපිරිවරින් වළඳා ධර්ම දෙශනා කොට හිමවතින් ගෙණ පිටු අනඹ රත්සඳුන් හරය පිළිගෙණ මෙතෙම මතු ගෞතම නම් බුදු වන්නේ යයි විවරණ දුන්සේක.

එසින් මෑත භාගයෙහි රුචි නම් එක් අසඞ්ඛ්‍යයක් කප් ඉක්ම ගියකල්හි මෙසින් කප්ලක්ෂයකින් මත්තෙහි එක්කල්පයෙක එකම සුසුමතුර නම් සම්බුදු කෙනෙක් ලොවැ පහළවූ සේක එසමයෙහි

අප මහබෝසතාණෝ ජටිල නම් මහරැවිව බුදුපාමොක් ම
සහනව සිවුරු සහිතවූ මහදන් දුන්නාහුය. ඒ සම්බුදු මෙතෙ
මතු බුදු වන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මැන භාගයෙහි සැත්තෑ දහසක් කප් [1] ගියකල එ
කපෙක සුමේධය සුජාතය යි සම්බුදුයෝ දෙනමක් ලොව පහළවූ
එයින් සුමේධ නම් බුදුන් සමයෙහි අප මහ බෝසතාණෝ උත්ත
නම් මාණවකව නිධානකොට තුබූ අසූකෙළක් ධන විසදම්කොට
බුදුපාමොක් මහසඟ පිරිසට මහදන් දී බණ අසා සරණයෙහි පිහිටි
මහණව මෙතෙම මතු බුදුවන්නේ යයි ඒ බුදුන් කෙරෙහි
විවරණ ශ්‍රී ලන්සේක.

එයින් මැන භාගයෙහි ලොව පහළවූ සුජාත නම් බුදුන් ස
යෙහි අප මහබෝසතාණෝ චක්‍රවර්ති රජක්ව බුදුන්කර
පැමිණ බණ අසා බුදුපාමොක් මහ සඟනට සත්රුවන් හා සම
සතරමහා ව්පයෙහි රාජ්‍යයපුදා මහණවූසේක. සියලු රාජ්‍යවාසිය
රවින් උපන් අග ගෙණ ආරාමික කෘත්‍ය සිඹකොරෙමින් බු
පාමොක් මහසඟ පිරිසට නිරන්තරයෙන් මහදන් දුන්නාහුය.
සම්බුදුයන් වහන්සේත් අනාගතයෙහි මෙතෙම බුදුවන්නේ ය
විවරණ දුන්සේක.

එයින් මැන භාගයෙහි මෙයින් එක්සිය අවලොසක් කපින
මත්තෙහි එක් කල්පයෙක පියදස්සිය අත්‍රදස්සිය ධම්මදස්සි ය
සම්බුදුවරයෝ තුන්නමෙක් ලොව උපන්නාහුය. එයින් පියදස්
නම් බුදුන්සමයෙහි අප මහබෝසතාණෝ කාශ්‍යප නම් බ්‍රාහ්මණ
මාණවකව වෙදත්‍රයෙහි පරතෙරට පැමිණ ඒ බුදුන්කරා පැමිණ
බණ අසා කෙළ ලක්ෂයක් ධන විසදම්කොට සඞ්ඝාරාමයක් කරවා
සරණශීලයෙහි පිහිටියහ. ඒ සම්බුදු මෙතෙම මෙයින් එක්සි
අවලොස් කපකින් මත්තෙහි බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මැන භාගයෙහි ලොවැ පහළවූ අත්‍රදස්සි නම් බුදු
සමයෙහි අප මහ බෝසතාණෝ මහත් ඍධ්‍යනුභාව ඇති සුසි
නම් තාපසව බුදුන් කරා පැමිණ බණ අසා පැහැද දිව මදුරුම
පියුම් පරසතු කොබෝලීල ආදිවූ මල්ගෙණවුත් සතර මහාවි
යෙහි එක පැහැර වස්නාවූ මහා මෙඝයක් මෙන් මල්වර්ෂාව
වස්වා හාත්පස්හි මල් මණ්ඩප මල් ඇඟැ මල් තොරන් ආදියද මදු
මදුරුමල් කුඩයකින් බුදුන් පිදුහ. ඒ සම්බුදු අනාගතයෙ
මෙතෙම බුදු වන්නේ යයි විවරණ දුන්සේක.

1 තිස් දහස් කප්.

සුමේධ තවුස් තුමා දීපංකර බුදුරදුන්ගෙන් නියත විවරණ ලැබීම (57 පිට)

එයින් මෑත භාගයෙහි ලොව පහළවූ **ඛම්මදස්සි** නම් බුදුන් සමයෙහි අප මහ බෝසතාණෝ සක්දෙව් රජව දිවසුවඳ දිවමල් දිවදුම් දිවපහන් ආදියෙන්ද දිව්‍යමයවූ පඤ්චාංගික තූර්‍යනාදයෙන්ද පූජාකළහ. ඒ සම්බුදුරජාණන් වහන්සේත් අනාගතයෙහි මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මෑත භාගයෙහි මිට සිවු අනුකපයකින් මත්තෙහි එක් කල්පයෙක එකම **සිඛාදී** නම් සම්බුදු තෙනෙකුන් වහන්සේ ලෝක යෙහි පහළවූ සේක එසමයෙහි අප මහාබෝධිසත්වයෝ උග්‍රවූ තේජස් ඇති අභිඥ බලයෙන් යුක්තවූ **මඛාල නම්** තාපසව මහ දඬදිවට සලකුණුවූ සියක් යොදුන් උස ඇති මහදඬ ගසින් මහ දඬ ගෙණවුත් සම්බුදුරජාණන් වහන්සේට පිළිගැන්වූහ. බුදුරජාණන් වහන්සේ අනුකෙළක් භික්ෂූන් පිරිවරා සූරසේන වෙහෙරදී ඒ දඬ වළඳ මෙතෙම මෙයින් සිවුඅනු කපින් මත්තෙහි බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මෑත භාගයෙහි මිට දෙයානුකපයකින් මත්තෙහි එක් කල්පයෙක **නිස්සභ** නුසභයි සම්බුදුවරයෝ දෙනමක් උපන්නාහුය. එයින් **නිස්ස** නම් බුදුන් සමයෙහි අප මහබෝසතාණෝ මහත්වූ සම්පත් හ, මහත්වූ යස පිරිවර ඇති **සුජාත නම්** රජව ඒ රජසිරි හැර සෘෂිප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව මහත්වූ ඍඛ්‍යානුභාවයට පැමිණ බුදුන් ලොව පහළවූ බව අසා දිව මදරාමල් හා දිව පියුම් පරසතු කොබෙලිල ආදිවූ මල්ගෙණවුත් සිවුවණක් පර්ෂද්මධ්‍යයෙහි වැඩ වූන් බුදුන්ට පිදූහ. ඒ සම්බුදුද මෙතෙම මෙයින් දෙයානුකපින් මත්තෙහි බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මෑත භාගයෙහි **පුෂ්‍ය** නම් සම්බුදුයන් වහන්සේ ලොව පහළවූ සේක. එසමයෙහි අප මහාබෝධිසත්වයෝ **විජිතාවී** නම් රජව මහත්වූ රාජ්‍යය හැර බුදුන් සමීපයෙහි මහණව තුන්පිටකය ඉගෙන මහජනයාට ධර්මදේශනාකොට ශීලපාරමිතාව පිරූහ. ඒ සම්බුදුද මෙතෙම මතු බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මෑත භාගයෙහි මිට එකානුවන කප **විපස්සි** නම් සම්බුදු කෙනෙක් ලොව පහළවූ සේක. එසමයෙහි අප මහබෝසතාණෝ මහත් ඍඛ්‍යානුභාව ඇතිව **අතුල නම් නාගරාජව** සත්රුවන් කම්මතනක සඑණි මහා පියයක් බුදුරජාණන් වහන්සේට පිළිගැන් වූහුය. ඒ සම්බුදුයන් වහන්සේත් මෙයින් අනුවනකපින් මත් තෙහි මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මෑත භාගයෙහි මිට එක්තිස්වන කප **සිඛිය වෙස්සභූ** යයි බුදුවරයෝ දෙනමක් ලොව පහළවූවාහුය. එයින් සිඛි නම් බුදුන් සමයෙහි අප මහ බෝසතාණෝ **අරින්දම නම් රජව** බුදු

පාමොක් මහසඟපිරිසට සිවුරු සහිතවූ මහදන් පවත්වා සත්රුවන් නින් අලංකෘතවූ ඇත්රුවන දන්දී ඒ ඇතුලසට කප්පිය භාණ්ඩ දුන්නේය. ඒ සම්බුදුන් වහන්සේද මෙයින් තිස්වන කපින් මත්තෙහි මෙතෙම බුදුවන්නේයයි විවරණ දුන්සේක.

එයින් මැතභාගයෙහි වේස්සභූ නම් සම්බුදුන් වහන්සේ ලොව පහළවූ සේක. එසමයෙහි අප මහබෝසතාණෝ සුදර්ශන නම් රජව බුදුපාමොක් මහසඟපිරිසට මහදන්දී මහණව ආචාර ගුණයෙන් යුක්තව බ්‍රහ්මවිහාරයෙහි ආදර හා ප්‍රීති බහුලවූය. ඒ සම්බුදුන් වහන්සේ ද මෙයින් තිස්වන කපින් මත්තෙහි මෙතෙම බුදුවන්නේයයි විවරණ දුන්සේක.

එයින් මැත භාගයෙහි තිස් කල්පයක් බුඛශූන්‍යව ගියකල්හි බුදු කෙනෙකුන්ගෙන් උතුම් වූ මේ භද්‍රකල්පයෙහි ක්‍රකුසඳ කොණාගමන කාශ්‍යප යයි සම්බුදුවරයෝ තුන් නමක් ලෝසයෙහි පහළවූහ. එයින් ක්‍රකුසඳ නම් බුදුන් සමයෙහි අප මහබෝසතාණෝ ඛෙම නම් රජව බුදුපාමොක් මහසඟනට පාදු සිවුරු සතහිවූ මහදන් හා අදුන් ආදිවූ බෙහෙත් බඩු දන්දී බුදුන්ගෙන් බණ අසා මහණ වූහුය. ඒ සම්බුදුන් වහන්සේද අනාගතයෙහි මෙතෙම බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

එයින් මැත භාගයෙහි කොණාගමන නම් සම්බුදුන් වහන්සේ ලෝකයෙහි පහළවූසේක. එසමයෙහි අප මහබෝසතාණෝ පබත නම් රජව අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව බුදුන්කරා ගොස් බණ අසා බුදුපාමොක් මහසඟනට මහදන් පවත්වා පත්තුන්න දෙශයෙහි පිළිද වීන දෙශයෙහි පිළිද පලස් හා දුහුල් පිළිද දන්කම් කළ පටපිළිද දන්දී බුදුන් සමීපයෙහි මහණවූවාහුය. ඒ සම්බුදුන් වහන්සේද අනාගතයෙහි මෙතෙම බුදුවන්නේයයි විවරණ දුන්සේක.

එයින් මැත භාගයෙහි කාශ්‍යප නම් සම්බුදුන් වහන්සේ ලොව පහළවූසේක. එසමයෙහි අපමහ බෝසතාණෝ ජෝතිපාල නම් මාණවකව වෙදත්‍රයෙහි පරතෙරව පැමිණ භූමියෙහිද ආකාශයෙහිද ප්‍රසිද්ධවූ ඝටිකාර නම් කුම්භකාරයා හා මිත්‍රව ඒ මිත්‍රයා හා එක්ව බුදුන්කරා එළඹ බණ අසා මහණව වඩනලද වියත්‍රය ඇතිව තුන්පිටකය ඉගෙණ සම්පත්තියෙන් බුදුසසුන් බැබළවූහ. ඒ සම්බුදුන් වහන්සේද අනාගතයෙහි මෙතෙම අපව දෙවෙනිව ගෞතම නම් බුදුවන්නේ යයි විවරණ දුන්සේක.

මෙසේ දීපංකරාදි වූ සුවිස්සක් පමණ සම්බුදුරජාණන් වහන්සේලා ගෙන් ලබනලද විවරණ ඇති ඒ බෝසතානෝ අවීචිය ලොකාන්තරික නරකය නිජ්ඣාමතණ්හිකා නම් ප්‍රේතයොනිය කාලකඤ්ඤක නම් අසුර යොනිය වට්ටකුරුල්ලන්ට කුඩා තිරිසන් යොනිය අසංඥ සත්ත්වයිය ගුඛාවාසයෙහි උත්පත්තිය ජාත්‍යන්ධතාය ජාතිබධිරතාය ජාතිමූගතාය ස්ත්‍රීබවය උභතොබ්‍යංජනක භාවය පණ්ඩක භාවය සෝවාන් ආදි නොවන බැවින් ව ර්තමානයෙහි පඤ්චානන්තරිය කර්මය හැමතන්හි අශුභ ගොචරතාය මිථ්‍යාදෘෂ්ටිය කර්මක්‍රියාවන්ගේ අදශීකය යන මේ අටලෙස් අභව්‍ය ස්ථානයන් කරා නො පැමිණ ශඝජාතකය සංඛපාලජාතකය වුල්ල සුතසොමජාතකය මූගපක්ඛජාතකය සකතුහඤ්ඤජාතකය මහා සුතසොම ජාතකය ඛණ්ඩහාලවාද ජාතකය මහාජනක ජාතකය එක රාජජාතකය ලොමහංස ජාතකය යන මේ ආදිවූ ජාතිකොටි ශත සහස්‍රයෙක්හි අඞ්ගපරිත්‍යාගය ධනපරිත්‍යාගය ජීවිතපරිත්‍යාගය කරන්නාහු. දැන පාරමිතාය දැන උපපාරමිතාය දැනපරමත්ථපාරමිතා ය යනාදි සමන්ත්‍රිංශත් පාරමිතා ධර්මයන් පුරා, ධජ විහෙඨ ජාතකාදි අනෙක ජන්ම කොටි ශතසහස්‍රයෙහි ලොකාර්ථචර්‍යාව පුරා හද්‍රඝට ජාතකාදි අනෙක ජන්මකොටි ශතසහස්‍රයෙහි ඤාතාර්ථචර්‍යාව පුරා මහා උම්මග්ගජාතකාදි අනෙක ජන්ම කොටි ශතසහස්‍රයෙහි බුද්ධිචර්‍යාව පුරා මේ ත්‍රිවිධචර්‍යාවෙහි කෙළ පැමිණ සිවිජාතකාදි අනෙක ජන්ම කොටි ශතසහස්‍රයෙහි අඞ්ගපරිත්‍යාගය කළහ.

ශඝජාතකාදි අනෙක ජන්ම කොටි ශතසහස්‍රයෙහි ජීවිත පරිත්‍යාගය කළහ. කුරුධම්ම ජාතකාදි අනෙක ජන්ම කොටි ශතසහස්‍රයෙහි වරබෝධිපරිත්‍යාගය කළහ. වෙස්සන්තර ජාතකාදි අනේක ජන්මකොටි ශතසහස්‍රයෙහි පුත්‍රපරිත්‍යාගය කළහ. දාරපරිත්‍යාගය කළහයි මෙසේ මේ පඤ්චමහා පරිත්‍යාග යන්ද පරිත්‍යාග කොට වෙස්සන්තරාත්මයෙහි සිට සන්තුසිත මහා කම්පාකිරීම පෙරදුරිකොට ඇති මහදන්දී වෙස්සන්තරාත්මභාව යෙන් චුතව ගොස් තුසිත දිව්‍යලොකයෙහි සන්තුසිත නම් දිව්‍ය පුත්‍රව උපන්හ. මෙසේ තමන්වහන්සේගේ පූජිප්‍රණිධිය ප්‍රකාශ කොට දෙවිමිනිසුන්ට කරුණ ලද උතුම් සබ්බඤ්ඤුතඥාන ඇති හෙයින් ලොකාග්‍රවූ ම ගේ බුදුරජ ශාස්තෘ නම් වනසේක. එසේ හෙයින් කියනලදී.

දෙවයකඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදනතං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමොං සි.

ලෝවැඩ පිණිස කරුණලද මේ ශ්‍රී සද්ධර්මාවතාර ග්‍රන්ථයෙහි මෙතෙකින් දූරෙනිදානය කියා නිමවන ලදි.

මෙසේ පුරණලද බොධිසම්භාර ධර්මයන් ඇතිව තුසිතභවන යෙහි උපන් අප මහාබෝසතාණන් වහන්සේ ගේ බුදුවීමට දහසක් අවුරුදු කල් තිබෙද්දී ශුද්ධාවාසවාසී බ්‍රහ්මරාජයෙක් බ්‍රහ්මවෙශයෙන් සැරසී මහත් ප්‍රීති සොම්නසින් පිරිහිය සිත් ඇතිව මෙසින් අවුරුදු දහසක් ගියකල බුදුවර කෙනෙක් ලොව පහළවන සේකැයි කියා මිනිස්ලොව ඇවිද හඬගැසූ කල්හි ඒ ශබ්දය ඇසූ දශදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ මේ මහුල්සක්වළට රැස්ව බුදුවන ඒ බෝසතාණන් කරා පැමිණ දිව මල් දිව සුවඳ ආදියෙන් පුදා බුදුවීමට යාචඤ්ඤා කළකල්හි කාලය දීපය දෙශය කුලය මාතෘය යන පස්මහා බැලුම් බලා ඤාලෝ මේ මාදිස බුඛභාවාශ යනුවෙන් දෙවිබඹුන්ට සංග්‍රහ කොට සතුදි යළා තුසිතපුර වැසි දෙවියන් විසින් පිරිවරණ ලදුව සියලු දෙව්ලොවම ඇති බැවින් එහිදු ඇති ඤාදනොදනාගට වැද එහි සෙසු දෙවතාවන් විසින් නිදුකාණන් වහන්ස මෙයින් චුතව සුගතියට යව සුගතියට යවයි, කියා පෙරකළ කුශල ධර්මයන් හා කාලය සිහිකරවනු ලබම්න් ඇවිදිනාමවු අප මහ බෝසතාණෝ එයින් චුතව කපිලවස්තු පුරයෙහි සුඛොදන මහරජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්වූ මහාමායා දේවීන්ගේ කුක්ෂියෙහි ගුරුදින උත්සලේ නැකැතින් පිළිසිඳගත්සේක. එදින ඇසළ පුණුපොහෝ දවස වන්නේය.

එදවස්හි නැකත් කෙළියව සොඹණය කළ හෙයින් මහ ජනයෝ රැස්ව නැකැත් කෙළි කෙළනාහු ය. එකල්හි ඒ පෞර්ණමී දිනයට පළමුවෙන්ම සත්දවසක පටන් සුරාපාන මාලාගන්ධ විලෙපන සෙවනයෙන් දුරුව මහත් විභූති සම්පන්නවූ ඒ නැකැත් කෙළි බලමින් ක්‍රීඩාවෙහි යෙදී වසන මහ මායා දෙවිතෙමෝ සත්වන දවස්හි උදැසනම නැගී සැදි සුවඳපැනින් හිස් සෝදා නහා සාරලක්ෂණයක් වස්තු විසදමෙන් දන්දී සවිලංකාරයෙන් සැරසී උතුම් හොජනය වළඳා උපොෂිතාඛ්‍යය සමාදන් ව අලංකෘත ශ්‍රී යහන් ගෙට වැද නිද්‍රොපගතවූ කල්හි පශ්චිම යාමයෙහි දෙතිස් මහා පූජිනිමිති පහළකරමින් මවුකුස පිළිඝදගත් ඒ මහ බෝසතාණෝ දසමස් ඇවැමෙන් මවුකුසින් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ එකුන්තිස් අවුරුද්දක් ගිහිගෙයි වැස යශොධරා නම් බිසව කුසින් රාහුල නම් පුත්රුවන උපන් කල්හි සතරවැනි නිමිති දැක කන්ථක නම් අශ්වයාණයෙන් මහබිණික්මන් නික්ම අනොමා නම් ගංතෙරදී මහබඹු දුන් අටපිරිකර පිළිගෙණ පැවිදිව එතැන් පටන් සතියක් මුළුල්ලෙහි අන්කිසි ආහාරයක් නොවළඳ පැවිදි සැපයම වළඳ රජගහ නුවරට වඩ පිඬු සිඟමෙන් හැසිර නුවර වැසියන් හැම කුල්මත්කරවා පාණ්ඩව පර්වතාභ්‍යාශයෙහි වැඩ

හිඳ ආහාර විළඳ එත්තාට පැමිණි බිම්සර මහ රජහු විසින් රාජ්‍ය යෙන් පැවරුකාල්හි ඒ රාජ්‍යය ප්‍රතික්ෂේපකොට බුදුව පළමුකොටම මේ නුවරට එමිසි ප්‍රතිඥ දී එයින් නික්ම අනුක්‍රමයෙන් දහවුසැරි සරා ඇවිදිනාසේක් මහත් යස පිරිවර ඇති සප්තසමාපත්තිලාභිවූ ආලාරතාපසඝන් හා හරණුලද ලොකඝාද විෂය ඇති අෂ්ට සමා පත්තිලාභිවූ උද්දඝ තාපසඝන් ද යන මේ තාපසවරුන් දෙදෙනා කරා ගොස් කිපදවසක් එහි වාසඝකොට අෂ්ටසමාපත්තීන් උපදවා ගෙන ධ්‍යාන මාත්‍රාවකින් බුදුව මිස ලෝවැඩ කළ නොහැක්කැයි සිතා එහිත් ලොභය හැර ඒ තපස්වීන්ගේ සමයෙහිත් නිවන් නැති බව විශෙෂයෙන් දැන එයිනුදු නික්ම දෙවිමිනිසුන්ට තමන් වහන් සේගේ ඒකාන්තයක්වම්සිසිතා උරුවේලානම් දනව්වටවැඩ නෙරඤ්ජරානම් ගඹහාතීරයෙහිවූ විසාල සාලවනයෙහිදී මහත්වූ ඒකාන්ත පුණ්‍ය ඔහම්වූ දුෂ්කරක්‍රියාකොට මෙසේ අප මහබෝසතානෝ පළමුවෙන් දිව්‍යඔහතාදින් විසින් පිරිවරණ ලදුව දිව්‍යලොක සැප අනුභව කරන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් මෙන් කිහුල්වත් පුරයෙහි රාජ්‍යශ්‍රී සැපය බොහෝ කලක් අනුභව කිරීමෙන් කාම සුඛල්ලිකානුයොග සඛ්‍යාත රූප ශබ්දාදිවූ පඤ්චකාමගුණයෙහි සිතින් ඇලීමෙන් සහ කයින් යෙදීමෙන් නිවන් නැතිබව ලොවට ප්‍රකාශ කොට නැවත ආකාශපථය ගැටලන්නාක්හු මෙන්ද පොළොව පෙරළන්නාක්හු මෙන්ද කිසිකෙනෙකුගේ විසින් නොකොට හැකි දුෂ්කරක්‍රියා කෙරෙමින් අතකිලමථානුයොග සංඛ්‍යාතවූ ශරීරපීඩායෙහි යෙදී මෙන් නිවන් නැතිබව දක්වා මධ්‍යම ප්‍රතිපත්තිවූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි පිළිපදනාසේක් ඔජදුරිකවූ ආහාරපාන වශියන් අනුභව කිරීමෙන් ශරීරය පිණවාගෙණ වෙසක්මස මැදි පොහෝදිනයෙහි උදයගිරි පර්වතයට සිඛාමාණ්ඩික්‍යයක් බඳුවූ හිරු නැඟිකාල්හි උදුසනම ගොස් පිබූ සිහන්නාවූ වේලා පරිභෝගකරන්නේ අජපාල න්‍යග්‍රොධ වෘක්ෂයෙහි සියලු වෘක්ෂයන් රන්වන්කොට මෙස පවලග්කින් නික්මුණු සුවර්ණමණ්ඩලයක් මෙන් බබළමින් හුන්සේක.

එකල්හි උරුවෙලා නම් දනව්වෙහි සෙනානි නම් කෙළෙඹි පුත්‍රයාගේ දුවු සුජාතා නම් උත්තම ස්ත්‍රියක් වැඩිවිය පැමිණ ඒ අජපාල න්‍යග්‍රොධ වෘක්ෂයෙහි ප්‍රාර්ථනාවක් කොට පිරුණාවූ මනදෙළ ඇත්තී වෙසක්මස මැදි පොහෝ දිනයෙහි අද වෘක්ෂදෙවතාවාට බලිකම් කෙරෙම්සි සිතා උදුසනම අති මධුරවූ ක්ෂීරපායාසය පිස ලක්ෂයක් වටනා ඝනරන්තලියක්මැද ඒ ක්ෂීරපායාසය පුරා එසේම ලක්ෂයක් වටනා ඝනරන් තලියකින් වසා ඉස තබාගෙණ සුවඳමල් ආභරණයෙන් සැදුම්ලද උතුම්වූ රූපසොභා ඇති ඒ සුජාතා

තෙමෝ අනෙකප්‍රකාරවූ ආභරණයෙන් හා විචිත්‍ර වස්ත්‍රමල්දම් ආදි
යෙන් සැරහී සුගන්ධාඛරාගයෙන් යුක්තවූ භාව හාවයෙන් ලීලෝ
පෙතවූ තරුණ ස්ත්‍රීන් විසින් පිරිවරණලදුව සපුටවූ පටහෙරි
ඛනිප්‍රබන්ධයෙන් සියලු සක්වළ පුරන්නාක් වැන්නි සියලු ලොක
ධාතුව මලින් ගැවසීගත්තාක් මෙන් ද සුවඳින් ගැවසිගත්තාක්
මෙන් ද කෙරෙමින් යන්නි ඒ ත්‍යාග්‍රොධවෘක්ෂය හා අධිකවූ කුශල
සම්භාරානුභාවයෙන් නිපන් බැවින් රූපවත්වූ ශ්‍රී මහාබොධිසත්ත්වි
යන් දුරදීම දැක උපන්නාවූ ප්‍රීතිසොමනස් ඇත්තී වෘක්ෂදෙවතාවා
යයි සිතන්නී දැක්ම හා සමඟ නැමි නැමී ගොස් ලහිරුඹඳලක් බදු
රන්තලිය ඉසින් බා ඒ මහා බොධිසත්ත්වයන්ගේ රතැඹුල් මලක්
බදුවූ කෝමලවූ අත්ලෙහි තබා පොළෝතෙලෙහි තබනලද නලල්
තමැති අඹසඳ ඇත්නි මාගේ මනදෙළ යම්සේ සමාඛඛිදා, එපරිදි
දෙන්ම නුඹවහන්ගේගේත් මනොරථය සිඛවේවායි කියා ඉතා
සිත්කළුවූ තෙපුල් කිමෙන් සතුටුවිය ගියාය.

ඉක්බිත්තෙන් ලොකඝාම්වූ ඒ මහා බොධිසත්ත්වයෝ ද රන
තලිය ගෙණ ගංගානිරයෙහි හටගත්තාවූ වෘක්ෂයෙන් වගුල මල්රෙ
ණින් රන්වන්වූ තෙරඤ්ජරා නම් ගංතෙරට ගොස් ඒ ගංතෙර සුදු
තිඹ්ඨිත නම් කොව ගුහුවූ වැලිතලාව මත්තෙහි ඒ ක්ෂීරපායසය
තබා අපරසාගරයට බස්නාවූ සූර්‍යමණ්ඩලයක් මෙන් ගංනාවට
බැස පොළොවට බට ආකාශතලයක් බදුවූ ජලතලාව දේදුනු දහස
ගණන් බබුළුවන කාලක්මෙන් ශරීරාලොකයෙන් බබුළුවමින් ගැලි
ජලස්නානය කොට පුළි සාගරතටයෙන් නැංගා වූ සූර්‍යියාමෙන
ගඟින් ගොඩනැඟී ගංතෙර හිඳ ක්ෂීරපායසය අනුභවකොට උඩුග
බලා ගේවසි රන්තලිය ගඟ හැර ඒ ගංගානිරයෙහි සුවද මලින
සැදුම්ලද සල්වෙනෙහි දිවාවිහරණය කොට සවස්වේලෙහි දෙව්
යන් විසින් සරහා පිළිගෙළ කරණලද අටඉස්සක් පමණ පුළුල ඇඳ
මාගීයෙන් දෙවියන් විසින් සරහා පිළිගෙළ කරණලද අනෙකප්‍රකා
රවූ පූජා විදිමින් වඩනාවේක් සොතිය නම් බමුණකු විසින් දෙන
ලද ඊතණ අටමිටක් ගෙණ ඉතා වටමට සෑපුවූ කඳ ඇති සනකොර
බඳනාලද මොනර පිල් කළඹෙක්හි පිල් මඩුල්ලක් බදුවූ නිල්වූ පඳු
යෙන් හා පබලුපෙති වැනි රත්වූ පලලවපත්‍රයෙන් සොභමානවූ
ශාඛා මණ්ඩලයක් ඇති තමන් උපන් දවස්හිම උපන්නාවූ හැඳි
බුදුන් බුදුවන ජයභූමියෙහි හටගත්තා වූ කරුණායෙන් සිහිල් වූ
තමන්ගේ ලය සේ සිහිල් වූ සෙවන ඇති ඇසටු මහබෝරුක කර
එළඹ තුන්ගලක් පැදකුණුකොට ඉසානකොණ සිට තණසලා තෙද
අඟින් පිරිහුන්නාක් වැනිව උපන්නා වූ තුදුස්රියන් පමණ තණ

ඇතිරිය දැන ඒ තෘණාසනය මස්තකයෙහි මාගේ සම් මස් ලේ ඇට නහර වියලී සුළුවිසුළු වනකල්හිද සම්‍යක් සම්බෝධියට නොපැමිණ මාගේ වීර්‍යය නොහකුළුවමියි පලක්බැඳ බොධිවෘක්ෂයට පිටලා නැගෙනහිරට අභිමුඛව වැඩහුන්සේක.

එකල්හි මහා බොධිසත්ත්වයන්ට ශක්‍රදෙවෙඳ තෙම එක්සිය විසිරියනක් පමණ දිග ඇති භුවනොදරයෙහි ව්‍යාප්තවන ඛනි ඇති මිජ්‍යුතකර නම් සඟ පිඹිමින් සිටියේය. එසේම පවසිඛ නම් ගඤ්ඡ දිව්‍යපුත්‍ර තෙම තුන්ගව්වක් පමණ දිග ඇති බෙලුවපාණ්ඩු වීණාව ගෙණ ගායනා කෙරෙමින් සිටියේය. සුයාම නම් දිව්‍යපුත්‍රද තුන්ගව්වක් පමණ දිග ඇති ශරත් කාලයෙහි වඳුමරිවි සමූහයක් සේ සත්‍රිකවූ දිව්‍යවාමරය මදින් මද සලමින් සිටියේය. සන්තුසිත නම් දිව්‍යපුත්‍රද මැණික් තල්වටක් ගෙණ සැපවූ මාරැහැපරම් පරාවෙන් පිණවමින් සිටියේය. සඟමපති මහාබ්‍රහ්මතෙම තුන් යොදුනක් පුළුලඇති දෙවෙනි පුන්සඳක් වැනිවූ සේසත මස්තකයට දරමින් සිටියේය. කාල නම් නාගරාජතෙම අසුදහස් පමණ නාවිකාවන් විසින් පිරිවරණලදුව සතුති වචන සහස්‍රයෙන් ගායනා කෙරෙමින් සිටියේය. දෙතිස් දිව්‍යකුමාරිකාවෝ දිව්‍ය පුෂ්පයෙන් සම්පූර්ණවූ අනෙක ප්‍රකාර රන්කරඬුගෙණ පුදමින් සිටියාහුය. සියලු දශදහසක් සක්වළ දෙවියෝ සැණෙවෙස් ගෙණ හාත්පසින් නහනලද ඛජපතාක හා කෙහෙල් තොරන් හා මල්දම් ගත් අත් ඇත්තාහු ගන්නා ලද පුන් කලස් හා දුම්මාලා හා මිණිදඬු වැට පහන් ඇත්තාහු දරණ ලද අටමඟල හා රුවන්කැවිපත පඬික්ති ඇතිව පෘථිවිතලයෙහි පටන් අකනිට්ඨ බ්‍රහ්මලොකය දක්වා අතුරක් නැතිව හිඳී ගැවසී සිටියාහුය.

එකල්හි සියලු පෘථග්ජන ලොකයා තමා වසඟයෙහි පවත්වන හෙයින් වශවර්ති නම්වූ වශවර්ති නම් දිව්‍යලොකයෙහි **මාරදිව්‍ය පුත්‍රතෙමේ සිඛාඊ** කුමාරයා එකාන්තයෙන් අසිඛවූ අටු ඇත්තා **කෙරෙමියි** අත්දහසක් මවාගෙන දිලියෙන්නාවූ වත්තිමයවූ අසි සත්තිතෝමර හෙණ්ඩිවාලාදිවූ අනෙක ප්‍රකාරවූ ආයුධයන්ගෙණ යෙළ සියක් ගොදුන් උස ඇති ගිරිමෙඛලා නම් වණ්ඩහත්ති රාජයා පිටට පැනනැඟී සිංහ ව්‍යාඝ්‍ර යක්ෂ රක්ෂසාදිවූ අනෙක ප්‍රකාර මුහුණු ඇති ගිනි ඇවිලියාක් වැනි තඹවන් කෙස් ඇති රත්වූ පිටතට නික්මුණාවූ ඇස් ඇති පිටතොල් ඛාහමෙන් භයඔකර වූ මුහුණු ඇති සම්හරණයෙන් සැරසී අනෙකප්‍රකාරවූ ආයුධ ගත් අත් ඇති පිට තට නික්මුණු මහත් දළ ඇති සකල ශරීරයෙන් හා මුඛයෙන්

නික්මෙන්නාවූ වග්නිජීවාලාවන් ඇති සරොස්වූ කල්පාන්ත වග්නි යක්සේ දිලියෙන්නා වූ භයානක විසුළුවත් වූ ප්‍රමාණාතික්‍රාන්තවූ මාරසේනාව විසින් පිරිවරණ ලද්දේ දහසක් යොත්තෙහි පටන් ගර්ජනාකාරණලද ප්‍රලයකාලයෙහි මේඝමාලාවන්ගේ සෂිණයෙන් උපන්නාවූ ප්‍රචණ්ඩවූ සෙතහඬ දහස් සුංහස් නැගෙනකලක්මෙන් දරුණුවූ ගොරබිරම් හඬින් සියලු ලෝකය එකතින්නාදකොට, සිඹාපී කුමාරයා ගණුම්, මරව, විදුව, දෙකකුල් ගෙණ සමුද්‍රයෙන් එපිට දමවයි විධාන කරන්නේ කල්පාන්ත මාරුතවිගයෙන් ගසා දමනලද පුලුන්රලක් පරිද්දෙන් තමාගේ දුක්ම හා සමග දිව්‍ය බ්‍රහ්මාදිවූ සියලු දෙවතාවන් පලවන්නේ හ ත්පසින් පසිත සවක යක්සේ මැඩගෙණ අභිතව මෙඝධනියක් බදුවූ ගමසිර ධීරනාද ඇති භයඛකරවූ ප්‍රචණ්ඩ වූ අරමඹ ඇති වායුවේගයක් මවා ඒ මාරුත වේගයෙන් කන්දලියාගේ දළිය දුරුකරන්නාවූ ඒ මහා පුරුෂයානන් වහන්සේගේ සිවුරුකොණක් පමණකුත් සොල වන්ට අසමර්ථවූයේ ප්‍රලයකාලයෙහි වඩවාවෙගයක් බදුවූ වේග ඇති මහත්වූ වඩාවක් වස්වා ඒ වඩාවෙන් හිම බින්දුවක් පමණකුත් ජල බින්දුවක් අතඛඬවජය සිදහෙළූ ඒ මහබෝසතානන්ගේ සම්පය වත් ඵලවන්ට අසමර්ථවූයේ.

හත්පසින්ම නික්මෙනලද වග්නි ශිඛා ශතසහස්සයෙහි ගිනි පුපුරු සමූහයෙන් ගැවසි ගන්නා වග්නිජීවාලාවෙන් වළඳනාලද පාෂාණවර්ෂාවක්ද, ආයුධවර්ෂාවක්ද, කිඹිරහුරුවර්ෂාවක්ද උණුඇළ වර්ෂාවක්ද, කලල් වර්ෂාවක්ද, වැලි වර්ෂාවක්ද වස්වා ඒ සියලු වර්ෂාවන් අතුරෙන් පාෂාණවර්ෂාව මල්වටබවට හා ආයුධවර්ෂාව මල්දම් බවට හා අඟුරු වර්ෂාව මල්වැසි බවට හා භෂ්මවර්ෂාව සඳුන්සුණු බවට හා වැලි වර්ෂාව මල්රොන් බවට හා කලල් වර්ෂාව දිවසුවඳ විලවුන් බවට පැමිණියා දැක ලෝඇදිරි මහතරකයෙක අඳුරුයේ දරුණුවූ භයානකවූ අන්ධකාරයෙක් මවා අවිද්‍යා නමැති අන්ධකාරය පවා තහන්කාවූ ඒ මහා පුරුෂයානන් වහන්සේගේ ශරීරරශ්මියෙන් හිරු දහස් නැගිසිටුලක් මෙන් උපන්නාවූ ආලෝක දැන කෝපයෙන් රත්වූ මුඛමඩලයෙහි පැලඹෙනලද බැම බිඳීමෙහි භයානකවූ වේස් දරන්නේ මේරුමන්දරාදිවූ පර්වතයන් හුණ්ඩිලුලක් මෙන් කඩාකරන්නාවූ ඉතා තියුණුවූ දිව්‍යානුභාවයෙන් යුක්තවූ කරමුවත්ඇති චක්‍රායුධය දමා ඒ චක්‍රායුධය ඒ මහාබෝධිසත්ත්වයන් වහන්සේගේ මස්තකයෙහි මල්කුඩයක්මෙන්සිටියාදැක මාරසේනාව විසිකුදු දමා ලද්දාවූ මහත්වූ මාරානුභාවයෙන් යුක්තවූ දුවන්නාවූ දිලිසෙන්නාවූ ඵලිතාකූටයන් මල්වට බවට පැමිණියා දැක උපන්නාවූ ශෝක ඇත්තාවූ වශවර්ති මාරතෙම, ඒ මහාබෝසතානන් කරා එළඹ සිඛාවී

කුමාරයෙනි, නැඟිසිටුව. මේ පයාසිඛකය මව පැමිණෙන්නේය' යි කියා, ඒ නොදිනියගැකි වික්‍රම ඇති මහාපුරුෂයානන් විසින් එම්බල වශවර්ති මාරය, මේ පායාසිඛකය ලබන්නට කාරණවූ කුශලධර්මයන් කිරීමෙහි තට සෑහී කවුරුදු යි' කී කල්හි මොහු ඇමදෙනා සෑහී ය'යි මාරසේනාව අභිමුඛ කොට අතක් දික් කොට ප්‍රලය සාගරයෙහි ඝෝෂාව පරදවන්නාවූ ගොරබිරම හඬින් මම සෑහීය මම සෑහීය'යි කීයා මාරසේනාව ලවා සෑහී බව කියවා සිඛාඵී කුමාරයෙනි! නොපව සෑහී කවුරුදුයි කියා ඒ අසාධාරණවූ පරාක්‍රම ඇති මහාපුරුෂයානන් විසින් මව මෙතැන්හි සවෙත නිකවූ සෑහී කෙනෙක් නැතැයි කියා රත්වලා ගැබකින් නික්මුනාවූ රත්විදුලියක් මෙන් විවරගර්භයෙන් දක්ෂිණ ශ්‍රීහස්තය පිවත්කොට පොළොවට අභිමුඛකොට පාරමිතා භූමියෙහිදී නොයෙක්වර ගජීතාකොට දුන් කවර කාරණයකින් නිශ්ශබ්දවූ යෙහිදැයි කියා මහාපාථිව විසින් එබස් අසා නොයෙක් සිය දහස් ගණන් ගජීතා සංඛ්‍යාතවූ ඛවනි පැවැත්වූ කල්හි පෙර අනුන් තමා විෂයෙහි පවත්වන්නාවූ ඒ වශවර්ති මාරතෙම දැන් තෙමේ තමාවිෂයෙහි පවත්නට අපොහොසත්ව හඬින් ත්‍රස්තාවූයේ ඉන් පූ දිසාවෙන් දිවන මාරසේනාව හා සමඟ ගන්නා ලද ආයුධයන් හා වස්ත්‍රාභරණයන් දමා වක්‍රවාට පර්වතය දක්වා පැරද පලා ගියේය.

මේසේ ඒ මහාපුරුෂයානන් වහන්සේ තිරු අසුනට යන්නට පූජාභාගයෙහිම මාරසේනාව විධ්වංසනය කොට අභෙද්‍යපරාජිඛකය, විරපරාජිඛකය, ජයපරාජිඛකය, වරපරාජිඛකය, මඛිලපරාජිඛකය' යි ඒ නියකලද මහාබෝධිපරාජිඛකයෙහි හුන්සේක. එකල්හි පූජෝත්කර්ෂ ක්‍රමයෙන් දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදීහු දිවිමල් දිවසුවඳ ආදියෙන් සක්වළ කුහරය පුරා අනෙක ප්‍රකාර පූජෝත්සව පැවැත්වීමෙන් එකසෙහා එකොළුවලින එකොත්සව එකකොලාහල කරන්ට පවත්ගත්හ. එසේ ඇති කල්හි මහාපුරුෂයානෝ පෙරයම "එකම්පි ජාතිං වෙපි ජාතියෝ තිස්සොපි ජාතියෝ චතස්සොපි ජාතියෝ පඤ්චපි ජාතියෝ දසපි ජාතියෝ වීසතිම්පි ජාතියෝ තිංසම්පි ජාතියෝ චත්තාරීසම්පි ජාතියෝ පඤ්ඤාසම්පි ජාතියෝ ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ට කප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ අමුත්‍රාසිං එවං නාමෙමා එවං ගොත්තෝ එවං වණ්ණෝ එවඞ්ගාරෝ, එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ, සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛ පටිසංවේදී එවමායුපරියන්තෝ සෝ තතෝ චුතෝ ඉධූපපන්නොති ඉති හාකාරං සඵද්දේසං අනෙක විහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි-සි.

මෙසේ දක්වනලද පෙර විසූකඳ පිළිවෙළ සිහිකරන්නාහු ප්‍රමාණාතික්‍රාන්තවූ අතීතකාලයෙහි පැවැත්තාවූ මොහනමැති අඛිකාරය නසා, මධ්‍යමයාමයෙහි:-"සෝ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප පන්නා ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී සුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප පන්නාති, ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි" යි.

මෙසේ දක්වනලද චුතවන්නාවූද උපදනාවූද සත්ත්වයන් දිවැසින් බලන්නාහු ප්‍රමාණාතික්‍රාන්තවූ අනාගත කාලයෙහි පවත්නාවූ මොහ නමැති අඛිකාරයන් නසා පශ්චිම යාමයෙහි වනිවිෂාන කාලයෙහි පැවැත්තාවූ අවිද්‍යා නමැති අඛිකාර සමූහයද නසන පිණිස අසාධාරණවූ අපාරවූ ප්‍රතීත්‍යසමුත්පාදනමැති ඍාගරයෙහි මහා ප්‍රඥා නමැති මෙරමත බහා අලලන්නාක්හුමෙන් "අවිජ්ජාපච්චයා සංඛාරා" යනාදීන් නැඟී ජරාමරණ පර්‍යන්තවූ වාදඝාඛ්‍යය වනිමාන "අවිජ්ජා නිරොධා සඛ්ඛාර නිරොධෝ" යනාදීන් නැඟී ජරා මරණ පර්‍යන්තවූ වාදඝාඛ්‍යය විවර්තනම. මෙසේ වනි විවර්ත වශයෙන් ආදිය පටන්ගෙන අන්තය දක්වා ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන වශයෙන් සම්මර්ශනය කිරීම අනුලෝම නම් වෙයි. අන්ත යෙහි පටන්ගෙණ ආදිය දක්වා සම්මර්ශනය කිරීම ප්‍රතිලෝම නම් වෙයි. මධ්‍යයෙහි පටන් ආද්‍යන්ත කෙළවර දක්වා සම්මර්ශනය කිරීම උභතොවර්ධන නම් වෙයි. ආද්‍යන්ත දෙකෙළවර පටන්ගෙණ මධ්‍යය දක්වා සම්මර්ශනය කිරීම මධ්‍ය සංක්ෂෙප නම්වෙයි. පළමුවන අවිද්‍යා ප්‍රත්‍යය සම්මර්ශනයකොට දෙවැනිවූ සංස්කාර ප්‍රත්‍යාන්තයට ගොස් එයින් සම්මර්ශනයකොට නැවත පළමුවන අවිද්‍යාප්‍රත්‍යයට ඵැ ක්‍රමයෙන් වාදඝාඛ්‍යය දක්වා නැඟී පළමුවන අවිද්‍යාප්‍රත්‍යය

දක්වා බැස සම්මර්ශනය කිරීම ශතෝත්තර විංශති ප්‍රත්‍යාගතනම් වෙයි. මෙසේ අනුලෝම ප්‍රතිලෝමාදි මහාපඤ්චකයන් වශයෙන් සම්මර්ශනය කරණසේක් දශබල වතුවෛශාරද්‍යාදීවූ ගුණ නමැති රතනයෙන් පිරිවරණලද සම්භෘතාඥත නමැති අමාතය සමඟ කොට ගෙණ වාසනා සහිතවූ කාමාදිවූ ආශ්‍රවයන් ඕද "ආසවානං ඛයා අනාසවං චෙතෝ විමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨේව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරාමි"-යි:

දක්වනලද ආශ්‍රවක්ෂයකර ඥානය සමධිගමය කොට අනිත්‍යතා ගතවතීමාත්‍රයකි කියනලද කාලත්‍රයවර්තීවූ සංස්කාර විකාර ලක්ෂණ නිර්මාණ ප්‍රඥප්තිය ඝන පඤ්චවිධස්කන්ධය මණ්ඩල ලක්ෂණවූ සියලු පදාර්ථය අත්ලෙහි තුබූ ජාතිරඹ මාණික්‍යාකාරතනයක් මෙන් නිරවශෙෂ කොට දැක වදළසේක. සම්පූර්ණවූ මනොරථය ඇති ඒ තිලොහුරු බුදුරජාණන් වහන්සේ ප්‍රීතිවෙග යෙන්:—

"අනෙකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසනෙතා, දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨොසි, පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා, ගහකූටං විසංඛිතං,
විසංඛාරගතං චිත්තං, තණ්හානං ඛයමජ්ඣගා-සි.

මෙසේ සම්භෘතපදප්‍රාප්තවූ මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ බුදුවූ පළමුවන සතියෙහි මේ බොධිපක්ෂ්‍යිකය කාරණා කොට පඤ්චමහා පරිත්‍යාගාදිය කිරීම් ආදි වශයෙන් පාරමිධර්මයන් පූරණය කිරීමෙන්ම මෙතෙක්කල් සසර දිව ඇවිද්දෙමි. ඒ පක්ෂ්‍යිකයෙහි හුන්නාහු මාගේ සියලු මනදෙළ පිරිහියේය. එහෙයින් තව මේ පක්ෂ්‍යිකයෙන් නොනැගෙමියි සිතාවදාරා නොයෙක් කෙළ ගණන් සමාපත්ති සමවැද නිවන්සැප වළඳමින් වැඩ උන්සේක.

ඊට ඉක්බිතිව සමහර දෙවතා කෙනෙකුන් තුළ බුදුවූසේක්දෝ හෝ නොවේදෝහෝයි උපන් සැකය දුරුකරණ පිණිස ආකාශයට පැනනැඟී ප්‍රාතිහාර්‍යය දක්වා තදනන්තරව බොධිපක්ෂ්‍යිකයට පූජෝපහාර දිශාභාගයෙහිවූ භූමි ප්‍රදෙශයෙහි සිවිපියෙහිම වැඩසිට පස්පෑ දිස්නා නෙත්‍රාඤ්ජනයෙන් බොධිදෘමය ඇසිපිය නොහෙලාම බලා වදාරමින් අනිමිෂලොචන පූජාවෙන් දෙවන්නතිය අතික්‍රාන්ත කළ සේක. ඉක්බිතිව බොධිවෘක්ෂයටද තමන්වහන්සේ වැඩසිටි ස්ථාන යටද දෙගාතුරෙහි දසදහසක් සක්වල දසදහසක් මහමෙර මත් තෙහි මවනලද දිව්‍යමයවූ බිම්පලසෙවෙනි ආදි සම්පත්ත කම්

නිර්මිත **රූවන්සක්මණෙහි** අනෙකප්‍රකාර ප්‍රාතිහාර්‍යය දක්වා සක්මන් කිරීමෙන් තුන්වනසතිය අතික්‍රාන්තකළසේක. ඊට ඉක්බිතිව බෝමැඩට පශ්චිමොත්තර දිශාභාගයෙහි දෙවියන් මැවූ **රූවන් ගෙයි** වැඩහිඳ පන්සාළිස්ගවුරුද්ද මුළුල්ලෙහි දෙසන සියලු ධර්මය සිහිකර වදරමින් සතරවන සතිය අතික්‍රාන්තකළසේක. ඊට ඉක්බිතිව **අජපාල නම් නුගරුක්මුල** වැඩහිඳ නිවන්සැප වැළඳිමෙන් පස්වන සතිය අතික්‍රාන්තකළසේක. ඊට ඉක්බිතිව මුවලිදු නම් විලෙහි මහ මිදෙල්රුක්මුල සත්දවසක් මුළුල්ලෙහි ධාරානිපාත යෙන් වස්නා මහ වර්ෂාව මුවලිඳුනම් නාගරාජයාගේ දරණගහී යෙහි වැඩහිඳ ධ්‍යානසැපයෙන් සවනසතිය අතික්‍රාන්තකළසේක. ඊට ඉක්බිතිව **කිරිපළඳරුක්මුල** ගලස්නක වැඩහිඳ සත්වන සතිය ධ්‍යාන සැප වැළඳිමෙන් අතික්‍රාන්තකළසේක.

මෙපණකින් සත්සතිය සම්පූර්ණවිය. මේ එකුන්පණස් දවස මුළුල්ලෙහි මුවසේදීම් ආදි ශරීරප්‍රතිජග්ගනය කිරීමක් හා ආහාර කෘත්‍යයෙක් නුවූයේය. ධ්‍යානසුව මාඟිසුව ඵලසුව විඳිමෙන්ම කාලය නික්‍රමණය කෙරිණ. එකුන් පණස්වෙනි දිනයාගේ අවසානයෙහි ඒ කිරිපළඳරුක්මුල වැඩුන් බුදුරජානන් වහන්සේට මුවසෝදම් යන සිතක් උපන. එවිට ශක්‍රදෙවෙන්ද්‍ර තෙම ශාක්‍යවූ බුදුරජානන් වහන්සේගේ ඒ අභිප්‍රාය දැන හිමවතින් නාලියදහැටු හා අනවතප්ත ජලාශද ගෙණැවිත් පිළිගැන්විය. බුදුරජ ඒ දෑහැලිදිය පිළිගෙණ මුව සෝදා වදරා එම රාජායතන මූලයෙහි වැඩඋන්සේක.

එසමයෙහි තපස්සුහල්ලුක නම් වෙළඳදෙබෑයෝ උතුරුදනව් වෙහි සිට පන්සියයක් ගැලින් බඩුපුරා ගෙණ මධ්‍යම මණ්ඩලයට යන්නාහු ඒ කිරිපළඳනයට පැමිණි කල පෙර ඔවුන්ට නාවූ දෙවතා දුවක් ඒ වෙනෙහි වැසෙන්නී ඒ මඟ යන වෙළඳ දෙබෑයන් දැක මොවුන් ලවා බුදුන්ට දෑ නයක් දෙමිසි සිතා ඒ ගෙණ යන පන්සියයක් ගැල් නාහි දක් වා පොළොව ගලාපුව. ඒ දැක භයපත්වූ වෙළඳුන්ට දෙවිදූ දෙවිපියාණන් පිරිවරා අහස සිට ඔවුන්ට පෙණී කියන්නී මාගේ බුදුහු බුදුවූද, පවත් එකුන්පණස් දවසක් මුළුල්ලෙහි ආහාරයක් නොවළඳ, නිරාහාරයෙන් මාගේ මේ වෙනෙහි පින්කෙත්ව වැඩඋන්සේක. එහෙයින් තොපටත් මවත් පින්පුරා ගන්නා පිණිස බුදුන්ට අග්‍රභෝජ්‍යනයක් දෙවාලනු කැමැත්තෙමි කිව. ඒ යහපතැයි ගිවිසිකල බිම ගැරී සිටි ගැල හැරපුව. එකෙණෙහි පහන්සිත් ඇති වෙළඳ දෙබෑයෝ මීපිඬුගෙණ ගොසින් බුදුන්ට පෙරටුව සිට ආරාධනා කළහ. මහණවූද, ඉක්මයා දුන් පාත්‍රය කිරිපිඬු පිළිගත් විට

අතුරුදන්වූ හෙයින් කිරිපිඬු පිළිනත් තලිය නාගභවනට ගිය හෙයිනුත් මිපිඬු පිළිගන්නට පාත්‍රයක් නැත්තෙන් සතරවරම්හු මූංවන් ශෛලමය පාත්‍ර සතරක් ගෙණවුත් පිළිගැන්වූහ. බුදුහු ඔවුන් සතරදෙනාටම අනුකම්පා පිණිස ඒ සතරපාත්‍රයන් මතුමත් තෙහි තබා එකක් වේවයි ඉවා සිවු රෙඛා දක්වමින් එක් පාත්‍රයක්ව සිටි කල ඒ පාත්‍රයෙන් මිපිඬු පිළිගෙණ වළඳ ඒ වෙළඳ දෙබැයින්ව අනුමෙවෙනිඛණ වදුලකල්හි බුත්සරණ දහම්සරණ දෙක්හි පිහිටා මෙමාවික නම් උපාසකව අපට නිති වැඳපුදුගන්නාසේ පූජනීය වසතුවක් දෙවාවදුලමැනවැයි කිහ. එවිට සවාම්දරුවෝ ශ්‍රී හස්ත යෙන් සිරස පිරිමැද නෙසඛාතු ඔවක් දුන්සේක. ඔහු රුවන්කරඬුවකින් ඒ කෙසඛාතුව පිළිගෙණ රථයෙහි තබා සියනුවරට ගෙණ ගොස් පිදුවාහුය.

බුදුරජාණන් වහන්සේද කිරිපළු රුක්මූලින් නික්ම නැවත අවෘවනි සතියෙහි අජපාල නම් නුගරුකමුලටම වැඩ එහි විවෙකව වැඩහිඳ තමන් වහන්සේ විසින් අවබොධකරණලද ධර්මයාගේ ගම්භීරත්වය සිහලු බුදුවරුන්ගේ ධර්මතාව වශයෙන් "අධිගතෝ ඛෝම්‍යායං ධම්මෝ" යනාදි ක්‍රමයෙන් සිහිකර වදරා එසේවූ ගැඹුරු ධර්මය රාගයෙන් රත්වූ මෙඟයෙන් දුෂ්ටවූ මොහයෙන් මුලාවූ මේ ලෞකික සත්ත්වයෝ කෙසේ නම් අවබොධ කෙරෙත්ද? එසේවූ සත්ත්වයන්ට මෙසේවූ ගැඹුරු ධර්මය දෙසීමෙන් ප්‍රයෝජන කිම් දැයි කියා ධර්මගම්භීරත්වය සැලකීමෙන් හා එකලට ලෝක සත්ත්වයෝ ත්‍රිවර්තරාජයාම ශ්‍රෙෂ්ඨයයි කියා ගරුකොට වසන්නාහ. එහෙයින් ඒ ත්‍රිවර්තරාජයාගේ ආරාධනාවෙන්මි ධර්මය දෙසූකල එකාන්තයෙන් ඝාතනවූ ප්‍රණීතවූ උතුම් ධර්මඝෙඝැයි කියා ඇදහීම් වසයෙන් සත්ත්වයෝ ශ්‍රවණය කරන්නාහුයයි යන කාරණා ඥෙන්ද බුදුරජාණන් වහන්සේ ධර්මදේශනාවට මඤ්ඤත්ථායභව වැඩඵන් කල්හි ඒ පරිවිතක්කිය දුටු සහම්පති මහාබ්‍රහ්මරාජතෙම "නස්සන්ති වත භො ලොකෙකා විනස්සන්ති වත භො ලොකෙකා" යනාදි ක්‍රමයෙන් තමාගේ ත්‍රිවර්තඥානවසයෙන් මහත් හඬ විඟිදුවා කියමින් බඹලොවින් නික්මුණු කල්හි ඒ අඩ අසා එක්වූ දශදහසක් සක්වළ දිව්‍ය ත්‍රිවර්තදේනාව පිරිවරා ඇසිල්ලකින් අවුත් ත්‍රිවර්තරාජ තෙම බුදුරජාණන් වහන්සේගේ ඉදිරිපිට දකුණු ඌතබල කිමට ඔබා උතුරු සළුව එකාංශ කොට ගෙණ හාත්‍යවුන් වහන්සේට දෙතොත් මුදුන්දී දන්වනුයේ සවාමිනි බුදුරජාණන් වහන්ස මදවූ කෙලෙසුන් ඇති අල්පරජස්ක සත්ත්වයෝද ඇත්තාහ. ඒ හැම දෙන නොඇසීමෙන් ධර්මයෙන් පිරිහෙන්නාහුය. පූජ්‍ය බුදුවරයන්

කෙරෙහි දශපුණ්‍ය ක්‍රියා වශයෙන් කෘතාධිකාරවූ සුඃඛීරශ්මිස්පර්ශයෙන් ප්‍රබෝධවන පද්මයන් සේ ධර්මදේශකාවම පතා සිටිනා සත්ත්වයෝ ඇත්තාහ. චතුෂ්පදික ගාථාවකින් දෙසූ ධර්මයෙන් ආශ්‍රී භූමියට වදනාහු එකෙක් දෙන්නෙක් කෝවෙති. කොයෙක් සත්ත්වයෝ ධර්මය අවබෝධ කරන්නාහුවෙති. බුඛවහන්සේ ධර්මය කොදෙසූ කල්හි අනික් කවරෙක් ලොකයාට පිළිසරණ වේද? බුඛවහන්සේ අපරිමිත කල්පවල අසංඛ්‍ය දුක් අනුභව කොට සියලු ලොකයා ඝසරින් ගොඩනඟන පිණිස්සම පාරමිතා පුරා මේ සම්බුදුකඳහටම පැමිණියේක. බුඛවහන්සේ බුදුවීමට පලමුවෙන් මඟඛරට අඟුඩධම්මියෙක් පහළවිය. එහෙයින් අනාථවූ ලොකයාට වැඩ පිණිස 'දෙසෙතු භගවා ධම්මං දෙසෙතු සුගතෝ ධම්මං' යනාදීන් ධර්මදේශනාවට ආරාධනා කෙළේය.

එකල්හි මහාකරුණාව උපදවා බුදුඇසින් ලොව බලනසේක් ධර්මයේ ලෝකයෙහි උපුල්වනයෙක්හි හෝ පියුම්වනයෙක්හි හෝ එදවස් හෝ දෙතුන්වෙනි දවස්වල හෝ පිපෙන මල් වෙන් වෙන්ව ප්‍රකාශව පෙණෙද්දැ? හැමවි යව දියපත්ලෙහි සිටි කැකුළුමල් ඝස්කැසුප් ආදීන්ට හොදුරු විමෙන් විකාශ වේද? යන මෙසේවූ ඝනාකාර ප්‍රකාරයන්ව සිටි පුද්ගලයන්සේ ලෝකයෙහි උද්ඝටිතඥ විපචිතඥ ඥෙය පදපරම වශයෙන් චතුෂ්ප්‍රකාරවූ සත්ත්වඝයන් දැක වදාරා ඔවුන් අතුරෙන් යමෙක්හට ගාථාඛියක් පමණවූ සංක්ෂේප ධර්මදේශනාවක් ඇසීමෙන් ධර්මාභිඝමය වන්නේවිනම් ඒ සත්ත්ව උද්ඝටිතඥ නම් දේසි යමෙක්හට චතුෂ්පදික ගාථාවකින් පමණවූ සංක්ෂේප දේශනාවෙහි විස්තරයක් අවවිහාතවූ ධර්මදේශනාවක් ඇසීමෙන් ධර්මාභිඝමය වන්නේ වි නම් ඒ සත්ත්ව විපචිතඥ නම් වෙයි. යමෙක්හට පාළිය ඇසීමෙන් අවකථා ඇසීමෙන් නොනිසෙ, මනස්කාර කල්‍යාණමිත්‍රඝෙවනාදියෙන් ධර්මාභිඝමය වන්නේ වි නම් ඒ සත්ත්ව ඥෙය නම් වෙයි. යමෙකුහට බොහෝ ධර්මය ඇසීමෙනුදු දැරීමෙනුදු ඒ ජාතියෙහි ධර්මාභිඝමය කොවන්නේ වි නම් ඒ සත්ත්ව පදපරම නම් වෙති. මෙසේ එදවසද දෙතුන්වෙනි දවස්වලද පිපෙන මල් වැනිවූ උද්ඝටිතඥදි තුන්දෙනාවම ඒ ජාතියෙහිම අධිගම සිඛවීම හා නොපිපෙන මල් වැනි පදපරම සත්ත්වයන්ට අනාගතභවයෙහි වාසනාවීම පිණිස හේතුවන්නේය.

එහෙයින් සියලු සත්ත්වයන්වම වැඩ සාධකවූ ධර්මදේශනා කිරීමට කරුණා උපදවා තුන්භවයෙහිම සත්ත්වයන් හඳුනාගත්ත්වයන් වශයෙන් බලනසේක් එයින් කම්මාවරණාදියෙන් සමන්විත අහෙතුක පුද්ගලයන් හැර යම් පුද්ගල කෙනෙක් කම්මාවරණ ක්ලේශාවරණයෙන් සමන්විත නුවූවාහුද ශ්‍රද්ධා ප්‍රඥාදි ගුණසම්පන්න නිවන්පුර වැදීමට නිසිව

කුශලධම්යෙහි යෙදී වසන්නාහුද එසේවූ හව්‍ය පුද්ගලයන් ඥන යෙන් තෝරා පරිග්‍රහණය කොට ඒ හැම ලෝකයෙහි පූජ්‍ය බුදුවර යන් කෙරෙහි කෘතාධිකාරවූ ලොකවෙනෙය්‍ය බුඩවෙනෙය්‍ය පුද් ගලයන් පස්කොටසක් කොට බලනසේක් ප්‍රථමඛෝධිසම්භාරද බුදුවූ පසලොස් අවුරුද්ද ඇතුළතද මධ්‍යමබෝධිසම්භාරද දෙවෙනි පස ලොස් අවුරුද්ද ඇතුළතද පශ්චිම බෝධි සම්භාරද තුන්වන පස ලොස් අවුරුද්ද ඇතුළතද පිරිනිවීකලද බුදුන් විසින් විනයනය වන සත්ත්වයන් මෙතෙක. ශ්‍රාවකයන් විසින් විනයනයවන සත්ත්ව යන් මෙතනක මෙතෙකැයි වෙන්වෙන්ව මෙසේ පස්කොටසක් කොට බලා හැම පිරිසිද අභිඥබෝධියෙහි පවත් පිරිනිවන්පෑම දක්වා විසි අංඛ්‍යයක් හා සතිස්කෝටි ශතසහස්‍ර අසුකෙළක් පමණවූ බුඩවෙනෙය්‍ය පුද්ගලයන් හා ඝතර අසංඛ්‍යයක් හා සත ළිස්කෝටිශතසහස්‍ර පණස්කොටි සහස්‍රසියක් කෙළක් පමණවූ ලෝක වෙනෙය්‍ය පුද්ගලයන් දැකවදරා මේ හැම පුජ්‍යබුදුවරයන් කෙරෙහි කෘතාධිකාරව සුඝ්‍යරශ්මිස්පශියෙන් ප්‍රබොධවන පියුම් වනයක් මෙන් දෙශනා රශ්මිසමාගමයෙන් නිවන්පුර වදනාහුයයි නියම කොට බුදු ඇසින්ම දැන මහාබ්‍රහ්මරාජයාගේ ආරාධනාව පිළිගෙණ සත්ත්වයන්ගේ කෙලෙශදරථ ව්‍යපශමනය පිණිස උතුම් ධම්මක්ෂී වස්වමියි සිතාවදරා මහාබ්‍රහ්මරාජයාහට මේ ගාථාව වදළසේක.

අපාරුතා තෙසං අමතස්ස දාරා
යෙ සොතවන්තෙත්‍ථ පමුඤ්චන්තු සඩ්ධං,
විහිංස සඤ්ඤි පගුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ-ති.

එකල්හි මහාබ්‍රහ්ම රාජතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ධම් දෙශනාවට අවකාශ කරණලදැයි දැන අතිශයින් සතුටුවූ සිත් ඇතිව භාග්‍යවතුන් වහන්සේට අප්‍රමාණ වන්දනයෙන් සතුතිකොට සවාමිවූ භාග්‍යවතුන් වහන්ස! මහජන සංග්‍රහය සඳහා ආර්‍ය අෂ්ටාංගිකමාර්ග නමැති කොස්සෙන් නිවන්පුර දෙරහැර අදනතයන් දමනයකොට ගෙණ තුන්භවයෙහි වතුස්සත්‍යාවබොධයට නිසි බඳුන් සතරසති පට්ඨාන නමැති භූමියෙහි හොවා සතරසම්‍යක්ප්‍රධාන නමැති සතර පයින් ඇක්ම ශ්‍රද්ධා නමැති හස්තයෙන් ධම්දෙශනා නමැති ශස්ත්‍රය ගෙණ අවිද්‍යා නමැති ගඩ පලා කෙලෙස් නමැති අර්බුද දෙමහ හැර විදශීනා නමැති ක්ෂාරය දී මෛත්‍රී නමැති දියෙන් සෝදා චතුස්සත්‍ය නමැති බෙහෙත් ආරෝප්පකොට මනා සිහිල් සිල නමැති පවන් දී අභ්‍යන්තරය සිහිල්කරණ නිවන් නමැති රස පොවා දුරුවධම් සැප විහරණ නමැති බෙහෙත් කවා සියලු භවොත්පත්තිය ක්ෂයකොට

සියලු දුක් නිවා සතුටුකර වදළමැනවයි කියා බ්‍රහ්ම රාජතෙම බුදුන්ව පඤ්ච පිණිවුවා වැඳ තෙවරක් ප්‍රදක්ෂිණාකොට සපිරිවරින් අතුරුදන්ව බ්‍රහ්ම ලොකයටම ගියේය.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍ර බුදුන් වැඳ "දෙසෙතු භගවා ධම්ම. දෙසෙතු සුගතෝ ධම්මං" යනුයෙන් ධම්දෙසනාවට ආරාධනා කොට භාග්‍යවතුන් වහන්ස යම් සත්ත්ව කෙනෙක් බුඩවහන්සේගේ ආඥාවෙහි කොපවත්නානු වීනම් ඔවුන්ට අපි ආඥාකරම්හ. එහෙයින් බුදුවහන්සේට ධම් චක්‍රයවේවා. අපව ආඥාචක්‍රය වේවයි ප්‍රතිඥා කොට වැඳ අවසර ගෙණ සපිරිවරින් දෙවිලොව ගියේය.

මේසේ ලොකාග්‍රවූ භාග්‍යවතුන් වහන්සේ අටවන සතියෙහි කිප දවසක් බෝමැඩ සමීපයෙහිම පිඬු පිණිස හැසිර වාසයකොට ඇසැලුමිස ප්‍රථම පඤ්චයෙහිවූ තුදුස්වක් දිනයෙහි බ්‍රහ්මාරාධනාව පිළිගෙණ මම පළමුකොට කවරක්නට දහම් දෙසම්ද? කවරෙක් මේ ධම්ය වහා දැනගණ්දැයි ලොව බලනසේක් වහා ධම්ය දැන ගත්ත නිසි ප්‍රඥාදි ගුණ සම්පන්න ආලාරඛාලාම උද්දඛරාමපුත්‍ර දෙදෙන ඕයපරලොව ගිය බව දැන පඤ්චග මහණහු දුෂ්කරක්‍රියා හූමියෙහිදී මව උපස්ථාන කිරීමෙන් බොහෝ උපකාරිවූහ. එහෙයින් මම පඤ්චග මහණුන්ට පළමුකොට ධම්දෙසනා කරම්. කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණද ඒම අග්‍රධම්ය පිණිස පියුම්තුරා බුදුරජානන් වහන්සේගේ සම්පයෙහි දී ප්‍රාර්ථනා කළතැන් පටන් කල්ප ලක්ෂයක් අධික තර පින්කම් කෙළේය. ඒපස්සී නම් බුදුන් සමයෙහි සැට අව ලක්ෂයක් පමණ බුදුපෑමෝක් මහ සඟනට නවවරෙක අග්‍රඝ්‍ය දානය දුන්නේය. ඒ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා හැර අග්‍ර ධම් ප්‍රතිවේධ කරන්ට සමර්ථවූ අන් කිසිවෙක් නැත්තේය. දැන් ඒ පඤ්චගමහණහු කොතැන්හි වාසය කෙරෙද්දැයි බලනසේක් බරණැස ඉසිපතන්හි වාසයකරන්නාහුයයි දිවැසින් දැක වදරා නැවත භාග්‍යවතුන් වහන්සේ ඇසළමස පුර පසළොස්වක්දා උදැසන අජපාල නම් නුග රුක මූලින් තමන්වහන්සේගේ පා සිවුරු ගෙණ නික්ම උරුවෙලා සෙනිවූ සෙනානි නම් නියම් ගම පිඬුපිණිස හැසිර වළඳා ඉක්බිති බරණැසට යෙමි සිතා වදරා පාසිවුරු ගෙණ අවලොස් ගොදුන් මාර්ගයට වක්‍රලක්ෂණාදීන් ශොභාමාන ශ්‍රීපාද යුග්මයෙන් පිළිපන්සේක.

එකල්හි බෝමැඩවිද ගයානම් ගමදී අතුරුමඟ වඩනා බුදුන් දැක අවිඤ්ඤාණොපමවූ රූපශ්‍රියෙන් පැහැද නුඹ කවරෙක්දැයි විචාළාවූ උපකනම් ආජීවකයාට අනන්තජිනයෝ නම් මමයහි වදරා සුදුසු පටිඤ්ඤාරයෙන් ඔහුපහදවාගෙණ අවලොස් ගොදුන් මඟ ගොවා බරණැස ඉසිපතනයට එදවස් සවස් වේලෙහි වැඩිසේක.

දුෂ්කර ක්‍රියාව (63 පිට)

ඒ ආජීවක තැවත බුදුන් කරා අවුත්, පැවිදි උපසම්පදා ලදින් අනෑගාමිව ශුඛිවාසයෙහි උපන්නේය. ඒ ද විසඳරාර්පින් මිසින් පූජාවලියෙහි ප්‍රකාශ ක්‍රමයෙන්ම බලා දතයුතු.

පස්වග මහණහු දුරින්ම වඩනා ශාස්තෘවූ බුදුන් දැක, මෙසේවූ කතිකාවක් කළාහුය. ඇවැත්නි, ශ්‍රවණ හවත් ගෞතම තෙම පුණ්‍ය බාහුල්‍යයෙන් සම්පූර්ණවූ ශරීර ඉඳුරන්යෙන් ඇතිව, සවර්ණවර්ණව, දිලිහි දිලිහි වඩනාසේක. ශාක්‍යවංශයෙහි උපන් බැවින් හිඳිනා අසුන් පණවාදෙන පමණ මුත් අභිවාදනාදියක් නොකරම හ සි කතිකා කොට සිටිකල්හි බුදුරජානන්වහන්සේ ඒ පස්වග මහණුන්ගේ චිත්තාචාරය දැන වදරා සියලු ලෝකධාතුගත සත්ත්වයන් කෙරෙහි හිමි විශෙෂ නොකොට එකාකාරව, පතුරුවාලිමෙහි සමවූ තමන් වහන්සේගේ මෛත්‍රී චිත්තය හකුළුවා, ඒ තාපසයන් පස්දෙනා කෙරෙහි පවත්වා වදළසේක. මේස් භාග්‍යවතුන්වහන්සේගේ මෛත්‍රී චිත්තය මිසින් සපෂ්ලද ඒ තාපසයෝ බුදුරජ සමීපව වඩනාකල්හි තමන් කළ කතිකාවෙහි නො සිව, පෙර ගමන් කොට අභිවාදනාදී සියලු ආතෘතුකත්ව සම්පාදනය කළාහුය. භාග්‍ය වතුන් වහන්සේ තමන් වහන්සේ බුදුවූබව ඔවුන්ට දන්වා ඇඹ හූමිවූ ඉසිපතනාරාමයෙහි උතුම්වූ බ්‍රඹ්මචක්‍රය හැ වැඩහිද උතුරු සළේ නැකත පවත්නා කල්හි තුන් අසංඛ්‍යයක් දෙවියන් හා අව ලෝස් කෙළක් බ්‍රාහ්මණයන් මිසින් පිරිවරණලද පස්වන මහණුන්ට අඩගා වදරා මගුල් දම්සක් පැවතුම් සූත්‍රය දෙශනාකර වදළකල්හි අඤ්ඤාකොණ්ඩඤ්ඤ සථවිරයන් වහන්සේ කෙළ දහසක් කෙලෙ සුන් නසා, දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන්ඵලය පසක් කිරි මෙන් පිරිවරා සිටි දෙවි බඹ පිරිස් සමගින් නිවන්පුර පැමිණිසේක. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේ කොණ්ඩඤ්ඤ තෙම මා විසින් දෙසූ දුෂ්කර ගම්භීර ධර්ම්‍ය පළමු කොටම දැන ගත්තේය. එහෙයින් දෙවි බඹ පිරිස් මැද "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤ, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤ" යි වදළසේක. එහෙයින් ඒ ආයුෂ්මත්වූ කොණ්ඩඤ්ඤ සථවිරයන්ට මේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ යයි යන නමෙක් වූසේය.

ඉක්බිති දශවෙධර්මාදී අපරිමිත ලෝකොත්තර ගුණසම්පන්න අවලප්‍රසාදයෙහි පිහිටි ඒ කොණ්ඩඤ්ඤ සථවිරතෙම හුනස්නෙන් නැඟී, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි වැද හෙව, දෙහොත් මුදුන් දි සුගතවූ සවාමීන් වහන්ස, මා පැවිදිකර වදළ මැනවැ යි යාච්ඤා කෙළේය. එකල්හි වෛකෙය ජන කුමුදුවන

විකාසත ප්‍රවිණවූ භාග්‍යවතුන් වහන්සේ චීවර ගහිගෙන් දකුණු ශ්‍රීහස්තය ගෙණ දිගුකොට වදරා, "එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මාදුක්ඛස්ස අන්තකිරියාය" යනුවෙන් අඩගා, වදළකල්හි උන් වහන්සේගේ තාපස වෙසය අතුරුදන්ව, පූර්ණකුශලාකුරුපවූ සෘඞ්මය පෘසිවුරු ආදි අවපිරිකර සඞ්කිය ශරීරයෙහි පහළව, ඊර්ය්‍යාපථ සම්පන්න භික්ෂුභාවයෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජ දෙවෙනි දවස්හි එම ඉසිපතනාරාමයෙහි වස්ඉටා වදරා, වපස තම් තෙරුන්ට අවවාද කරමින් විහාරයෙහි ම වැඩවුන්සේක. සෙසු සතරතම පිඬු පිණිස නික්ම ගියකල්හි වප්පතෙරුන්වහන්ශේ ශාස්තෘන් වහන්සේගේ ධර්මකථා ශ්‍රවණයෙන් පෙරවරුම සෝවාන්ව, පැවිදි ඉල්වා, එසේම එහි භික්ෂුභාවයෙන් පැවිදිවූසේක.

මෙම තැන්හි ඊට දෙවෙනි දවස්හි භද්දිය තෙරුන් වහන්සේද, ඊට දෙවෙනි දවස්හි මහානාම තෙරුන් වහන්සේද, ඊට දෙවෙනි දවස්හි අස්සජි තෙරුන් වහන්සේ දැසි යන හැම්දෙනම එක එක දවස සෝවාන් ඵලයට පමුණුවා, එහි භික්ෂු භාවයෙන් පැවිදිකොට පස්වෙනි දවස්හි භික්ෂූන් පස්නම එක්කොට "රූපං භික්ඛවෙ අනත්තා" යනාදි ක්‍රමයෙන් අනාත්ම ලක්ෂණ සූත්‍ර දෙශනාව දෙශනාකොට වදාළ කල්හි පස්වග මහණුන් වහන්සේලා සකල ක්ලේශයන් නසා රහත් ඵලයට පැමිණියාහුය.

එකල්හි එම බරණැස සුජාතා නම් සිටුදුව වැදී යස නම් කුල පුත්‍රයාකෝ තුන් ඍතුවට කරවා දුන් තුන්පාසාදයෙහි දෙවඟනන් වැනි වරඟනන් පිරිවරා, යට මාලයට නො බැස, උඩුමහල්හි දිවසිරි වැනි මහත් ශ්‍රී සම්පත් අනුභව කරණුවෝ එක් දවසක් නිදි පිබිද, දිලියෙන පහන් ආලෝකයෙන් සාංවික ස්ත්‍රීන්ගේ විකාර දැක, අනිත් ලකුණු මෙනෙහි කොට, සසර කලකිරී, වීඟසම පහසෙන් නික්ම, රන්මිරිවැඩි පය ලාඟණ උඩුමහලින් බැස, දෙවියන් හළ දොරටුවෙන් නික්ම, බලව පවිචුසයෙහි ඉසිපතනාරාමයට අභිමුඛව යන්නාහු බුදුරජ අලුයම්හි සියලු ලොව බලා වදාරණසේක. පැවිදි වීම පිණිස නික්ම, එන ඒ කුලපුත්‍රයා දැක, වදරා උනස්නෙන් නැඟිට, ඒ කුලපුත්‍රයාගේ ආගමනය බලමින් සක්මින් කරණසේක්, දුරින්ම එන්නාවූ සියලු ගෘහවාස ය උපද්‍රවයේ දැක, හඟපත්ව, එන ඒ යසකුලපුත්‍රයා දැක, සක්මණින් බැස, බුඬාසනයෙහි වැඩවුන් සේක. ඒ කුලපුත්‍රයාද ඉසිපතනයට වැද, උදැගිරි මුදුනෙන් පත් ලඟිරුමඬල සේ දිලිහෙන බුදුන් දැක, උපන් මහත් ප්‍රීතිසොමනස් ඇතිව, වහා පයලූ වහන් ගලවා, භාග්‍යවතුන් වහන්සේට නුදුරු

තන්හි සිටි කුලපුත්‍රයාට "මෙහේ මා කරා එව යස!" යි වදළසේක. කන්හි අමා වක්කළෙක් වැනි අති මධුරවූ ඒ බුඩවවනය ඇසීමෙන් අතිශයින් සතුටුව, ඉතා ඔදවැනි සිත් ඇතිවූ හෙතෙම බුදුන් සමීප යට ගොස් වැඳ, එකත්පස්ව හුන්නේය. එකල්හි ඕහට භාග්‍ය වතුන් වහන්සේ පිළිවෙල කථාවෙන් බණ වදරා, එම රාත්‍රියෙහි ම සෝවාන්ඵලයට පමුණුවා වදළසේක.

එකල්හි දෙවන දා උදෑසන ම සුප්‍රාතා නම් මැනියොමේ ප්‍රාසාදයට නැගී පුතණුවන් කොදුක වහා සිවිනන් කරා ගොස් ඒ බව කීය. එකල්හි හෙතෙම සතරදිග ම දුරුකැත්වල ගෙස් විවාරණ සේ අසුන් දී මිනිසුන් යවා තුමූ ඉසිපතනයට ගොස් යස නම් පුත්‍රයාගේ පයින් ගලවා තිබූ රන්මිරිවැඩි සඟළ දුක ඒ සලකුණෙන් ගොස් බුදුන් දිට. මහා කාරුණිකවූ බුදුරජ්ජ දුරින්ම එන ගෘහපතියා දැක යස නම් පුත්‍රයා ඕහට නොපෙණෙන සේ අධිෂ්ඨාන කළ සේක. බුදුන් දැක්මෙන් ම ඉතා සතුටුවූ ගෘහපතිතෙම බුදුන්කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ සවාමීන් වහන්ස, යස කුලපුත්‍රයා දුටු සේක්ද යි විවාළේය. එකල්හි වදරණසේක් එසේ නිනම් ගෘහපතිය මෙහි හිඳුව; මෙහි හුන් තෝ මෙහි හුන් යස කුලපුත්‍රයා දක් නෙහිය යි වදළකල්හි අනිශයින් තුටුපහටු සිත් ඇතිව එකත්පස්ව හුන්නාවූ ඒ ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළ කථා දෙන් බණ වදළසේක. එකල්හි සහසු නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයට පැමිණ ප්‍රසන්නාකාර දක්වා බුදුන් වැඳ සරණ ගොස් හෙතෙම මේ බුදුසස්නෙහි පළමු උපාසක වූයේය.

ඒ පියානන්ට දෙශනා කරවදුල ධර්මය අසා යස කුලපුත්‍රයාගේ සිතද සියලු කෙලෙසුන් කෙරෙන් මිදි ගියේය. එකල්හි ඒ දෙදෙනා ඔවුනොවුන් දක්නා ලස අධිෂ්ඨාන කළසේක. එ කෙණෙහි ගෘහපති තෙම එහිම හුන් යස නම් කුලපුත්‍රයා දැක විසමය පත් ව පුත්‍ර සෙනහයෙන් කම්පාවූ සිත් ඇතිව මැනියන්ද දුක් දෙමනස්ව වසන ඔව කියා එම්බා පින්වත් යස නම් මාගේ පුත්‍රය! නුඹ කෙරෙන් වෙන්වූ කාරණයෙන් මැනියන්ගේ මරණය වන්නේය. එහෙයින් පුත්‍රය නුඹ නැවත ගොස් මව ඇස පෙණීයාමෙන් උන්ගේ ජීවිතය දෙවයි කීයේය. එකල්හි යස කුලපුත්‍ර භාග්‍යවතුන් වහන්සේගේ දසාව බැලිය එවිට බුදුහු වදරණසේක් ගෘහපතිය ඒ කුමකැයි නොහඟි ද? යස කුලපුත්‍රයාගේ අශෛක්ෂඥාන දර්ශනය යි කියනලද ඥාණ දර්ශනයෙන් ධර්මය දක්නා ලද්දේය. සියලු ආශ්‍රවයන් කෙරෙන් සිත මිදිනා, එහෙයින් නිහිව පක්කම්රය විදීමට යස කුලපුත්‍ර සොහය නොවෙයි වදළසේක, ඒ ඇසූ ගෘහපති තෙම එ:ස්ස සවාමීන් පිහන්සැයි ප්‍රතිවචන දී සවාමීවූ බුදුරජාණන් වහන්ස, එසේ වී නම්

යස කුලපුත්‍රයන් පසු මහණ කොට වැඩ අද දවස පිණ්ඩිය මාගේ බත ඉවසා වදාළ මැනවැ යි ආරාධනා කෙළේය. බුදුරජ තූෂ්ණීම් භාවයෙන් ඉවසා වදාළසේක. එකල්හි ගෘහපතිතෙම බුදුන් ඉවසා වදාළ බව දැන වැඳ අවසර ගෙණ ප්‍රදක්ෂිණා කොට ගෙට ගියේය. යස කුලපුත්‍රයෝ ගෘහපතියා ගිය කෝබෝ ඇසිල්ලකින් බුදුන් වැඳ පැවිදි ඉල්ලූහ. බුදුරජ එහි භික්ෂු භාවයෙන් පැවිදි කළ සේක. එකල්හි ලොව රහත්හු සත්නමක් ඇතිවූවානුය

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු උදෑසන ම හැඳ පෙරව පා සිවුරු ගෙණ ආයුෂ්මත් යස තෙරුන් හා සමග ගෘහපතිවූ සිටා නන්දගේ ගෙට වැඩ පණවනලද උතුම් බුද්ධාසනයෙහි වැඩඋන්නේසේක. එකල්හි ආයුෂ්මත් යස තෙරුන්ගේ මැනියෝ ද පුරාණ දුතියිකාවද බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළ කථාවෙන් බණ වදාළසේක. ඒ දෙදෙන සෝවාන්ව ආයතී ශ්‍රාවිකාබවට පැමිණ බුදුන් වැඳ සරණ ගොස් මේ බුදුසස්නෙහි පලවූ වෙනි උපාසිකා වූවාහුයි. නැවත ඔහු හැමදෙනම බුදුරජාණන් ද යස තෙරුන් ද ප්‍රණීතවූ බාද්‍ය භෝජ්‍යයෙන් සියතින් වළඳවා. ඉක් බිති වැඳ එකත්පස්ව හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අනුරූප ධර්මදේශනා කොට සතුටු කරවා ඉඝිපතකයට ම වැඩිසේක.

එකල්හි යස තෙරුන්ගේ ගිහිකල යහළුවූ බරණැස විමලය, සුබාහුය, පුණ්ණජිය, ගවම්පතිය යන සිවුදරුවෝ සතරදෙනෙක් වූවාහුය. ඔහු මහත් යස ඇති යස කුලපුත්‍ර ගිහිගෙය හැර පැවිදිවූ බෙහි යි අසා එකානතෘතෙන් ඒ ධර්ම විනය ලාමක නො වෙයි, ඒ ප්‍රව්‍රජ්‍යාවද ලාමක නො වෙයි යි තෘතෙන ආයුෂ්මත්වූ යස තෙරුන්කරා ගොස් වැඳ එකත්පස්ව හුන්කල්හි ආයුෂ්මත් යස තෙරුන්වහන්සේ ඒ ගිහි යහළුවන් සතරදෙන කැඳවාගෙන බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව හිඳ සව මිවුන් භාග්‍යවතුන් වහන්ස! මෙනම් මෙනම් වූ මාගේ මේ ගිහි යහළුවන් සතරදෙනාට අවවාදානුශාසනා කර වදාළ මැනවැ යි ආරාධනා කළසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළ කථාවෙන් බණ වදාළසේක. ඒ අසා සිවුපුත්‍රයන් සතර දෙන හුනස්නෙහි ම හිඳ සෝවාන්ව පැවිදි විමට ශ්‍රවසූ කල කල්හි බුදුරජ එහි භික්ෂුභාවයෙන් පැවිදි කළසේක. ඒ භ.ම ශ්‍රාඛිමය පා සිවුරු ආදි අවපිරිකර දරා සියවස් පිරි සිවි තෙරුන් මෙන් ඊර්යාපථ සම්පන්නව හුන් කල්හි නැවත වදාළ ධර්මදේශනාව අසා සියලු කෙලෙසුන් නසා රහත් වූවාහුය.

ආයුෂ්මත් යස තෙරුන්ගේ යහළුවූ බරණැස දනව්වැසි අන්‍ය වූද පණස්දෙනෙක් යස කුලපුත්‍ර පැවිදිවිය යි අසා ඔවුනොවුන් එක්ව ගොස් පෙරසේ ම යස තෙරුන්ගේ සහායයෙන් බුදුන් වැඳ එකත්පස්ව හුන්කල්හි පිළිවෙළ කථාවෙන් බණ වදාරා හැමදෙන ම සෝවාන්කොට නැවත යාවැඳුම් සිරිකල්හි බුදුහු එහි නිඝ්‍රහාව යෙන් පැවිදි කොට රහත්ඵලයෙහි පිහිටුවා වදාළසේක. මේ යසාදි පස්පණස් යහළුවෝද පෙර කෙසේවූ පිණකින් මෙසේ ලොකාග්‍රවූ බුදුන් දැක සසර දුකින් මිදුනාහුද? යත්;

ඉටගිය දවස මේ පස් පණස්දෙන දුන් සේ ම ඔවුනොවුන් යහළුව ඇවිදිනාහු දැරි ඇති ගැහැණියක් අකාථව ඕය වනමැද වැද හොත්තිය දුක ඇ කෙරෙහි කරුණා උපදවා පින් නිසා දරාසැයක් බැද ඇ දවන්කාහු මිනිය දහවිලෙහි ඇ ඇඟින් දඩ කැඟෙන බුබුලු දුක බුබුලු ගැසුනු වේලෙහි පොතු ගැලවූ කුකුළලාලයක් සේ සියොලඟ සුදුවූවා දුක අනිත්ලකුණු උපදවා මේ හැම සතුන්ගේ සභාවයෙකැයි තිලකුණු මෙනෙහි කළහ. මෙසේ ඒ ජාතියෙහි ඒ මිනිය දවා අනිත්ලකුණු සිහිකළ පින්කමින් දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි සැරිසරා ඇවිද බොහෝ සැපවිඳ නැවත බරණැස ඉපද සෑම මයවූ පා සිවුරු ලදින් මේ පණස්දෙන ම රහත්වූහ යි දතයුතු.

මෙසේ බුදුරජානන් හා සමග එක්සැටනමක් පමණ රහතන් ලොව ඇතිවූ කල මාගේ සවාමිදරුවෝ වප්මය මැදිපොහෝදවස් හි පවරා ඉක්බිති සැවතනමක් පමණවූ මහරහතන් ලඟට කැඳවා-

පරසත්තං චනතනතෝ අත්තං ඝරොතතා පඨවිං ඉමං
ව්‍යාහරතනතා මනුස්සානං ධම්මං චරථ භික්ඛවෝ.

විහරථ විවිතෙතසු පබ්බතෙසු වනෙසු ච
පඤ්ඤාසඤතනතා සඛම්මං ලොකසස සතතකං මම.

යනාදි ගාථා සතකින් මධුරාක්ෂරවිලාසිනියෙහි අා ක්‍රමයෙන් බොහෝ වවන වදාරා, "මහණෙනි! මේ ලොකයෙහි සත්ත්වයෝ බුදු රුවන් ලොව පහළවූ බව නො දනිති. එහෙයින් තෙපි හැම දෙදෙ නෙක් එකමන නොව. සැටදෙන වෙන වෙන ම සැටමාගියකින් ගොස් ගිය ගිය දෙස දුටු දුටු සත්ත්වයන්ට මා උපන් පරිදි නිගා ලොකාවිවෘත්‍තිය කරව්. ලෝකඝාට නොයෙක් උපමා කාරණ දක්වා කීමෙන් බුදුන් දැක්මෙහි ලොභ වඩන සේ සසුන්වැද මහණවන සේ ධම්මදේශනා කොට පැවිදිවනු කැමැත්තන් සරණගමන උපසම්පද වෙන් උපසම්පද කරව්" යනි අනුදන භික්ෂූන් යවා තමන් වහන්සේ

බරණැසින් නික්ම එකලාව පා සිවුරු ගෙන උරුවෙලාවට වඩනා සේක් භද්‍රවර්ගික රාජකුමාරවරුන්ගේ හෙතුසම්පන්න බව දැක වදුරා කරුණා උපදවා මගින් ඉවත්ව කප්පාසික වනයෙහි රුකක් මූල සවණක් රැසින් දිලිහි දිලිහි වැඩඋන්සේක.

එ සමයෙහි කොසොල් රජහුගේ තිස්දෙනෙක් පමණ රජකුම රුවෝ රූපයෙන් ද විත්තයෙන් ද යසපත් හෙයින් භද්‍රරාජකුමාර යෝය සි ලද නම් ඇතිව යාම ඊම කෑම පීම හිඳීම ආදි නොයෙක් තැන බොහෝසෙයින් එක්වම ඇවිදිනාහු කොසොල්රජ දුන් දනව් වෙක සමගිව රජකරන්නාහු කප්පාසික නම් වනය ඉතා රමණීය සි අසා එහි සෙලතට යන්නාහු එක්කෙනෙකුන්ට ප්‍රජාපතීන් නැති හෙයින් උන් නිසා වෙහෙසවක ගෙණ ගියහ. ඕ තෙමේ රජකුමරු වන් ක්‍රීඩාවෙන් ඇවිදිනා කල්හි ඔවුන්ගේ ප්‍රමාදයක් දැක ඒ රාජ කුමාරයන්ගේ ආභරණ සහිත ගෙණ වල්වැද ගියාය. එවේලෙහි ඔබිසෙබ බලා ආභරණත් ඇත් නො දැක තිස්දෙනාම එක්වගෙණ ඇ ගිය පද සලකුණින් වල සොයා ඇවිදිනාහු ඒ රුහුවුල වැඩ හුන් සවණක් රැසින් දිලියෙන බුදුන් දැක වැද එකත්පස්ව සිට මෙසේ ආ වෙහෙසාව දුටුසේක්ද නුදුටුසේක්ද සි විමාළහ බුදුහු කුමක් නිසා ඇ සොයව් දැ සි විමාළසේක. එකල්හි රජකුමරුවෝ ඒ ප්‍රවෘත්තිය තතු සේ බුදුන්ට දන්වූහ. ''බුදුහු තමා සෙවීම උතුම් ද? අනුන් සෙවීම උතුම් ද'' සි විචාළසේක. බුදුහු තමන් හෙතුසම්පන් ඇති හෙයින් බුදුන් වදාළ වචනයෙහි අර්ථ දැන ''අනුන් සෙවීමට වඩා තමා සොයා ගනහොතින් ඒ සෙවිල්ලම උතුම් වේදැ'' සි කීහ. එවේලෙහි සවාමිදරුවෝ එසේ නෙපි තොප සොයනු කැමතියහු නම් ඉදුව සි වදුරා ඔවුන් එකත්පස්ව හුන් කල්හි අනුරුපවූ බණ වදුරා ඒ රජකුමරුවන් තිස්දෙනා ම මාර්ග ඵල ප්‍රාප්ත කොට එහි භික්ෂුභාවයෙන් පැවිදිකළසේක.

එයින් හැමට බාල කුමරු සෝවාන් විය, හැමට ජෙෂ්ඨ කුමාර අනාගාමී විය. රහත්වූ හෝ පසේබුදුන වූ හෝ කිසිවෙක් නැත. සාඩිමය අවපිරිකර දරා සිවුවස් පිරි සිවි තෙරුන් මෙන් ඊර්ෂ්‍යාපථ සම්පන්නව බුදුන් පිරිවරා සෙලෙස් ධ්‍යානාභිඥ සමාදන් ව සිටි කල්හි ඒ භික්ෂූන්ට පෙරසේ ම නුදුසු අවවාද වදුරා ''මහණෙනි! නෙපි තිස්දෙන තිස් මාර්ගයකින් ගොස් බුදුරුවන් දමුරුවන් සඟුරුවන් උපන් වග ලෝවට කියා කුසල්හි හැසිරෙණ සේ අවවාද හා බුදුගුණ කියා ලොකාවබෝධාව සළ මැනවැ'' සි වදුරා පශ්චිම දිශාවට හැර වදළසේක.

ඒ රජකුමරුවෝ තිස්දෙන ද කෙසේවූ පිණක් කොට මේවූ බුදුන් දැක නිවන්සැප ලද්දේද? යත්; පෙර මෘගේ බුදුන් තුණ්බිල නම් සූකර රජව ඉපද බරණැස් රජුට බණ වදරණ ද බෝසතුන් බැඳ අල්වා ගෙණ මරා ඇඟමස් කම්හසි පොලු මල ගෙණ සිසාරා සිට ගත් ඒ රාසොඬුන් තිස්දෙන තුණ්ඩිලොවාද නම් ඒ දෙශනාව දෙලොස් යොදනක් තැන් අසෙක සේ කරත් කරත් අත තුබූ පොලු මල හෙලා සාධුකාර දී බණ අසා එදා ලත් අවවාදයෙන් සැට දහසක් අවුරුදු පන්සිල් රක්ෂාකොට එතැන් පටන් සදෙව්ලොව සැරිසරා ඇවිද සැප විඳ එකල උතුම්වූ රජකුලයෙහි ඉපිද ඒ පන්සිල් රක්ෂාකළ පිණින් අසාධාරණවූ රූසිරි ලදින් මොහොතක් කල් පමණ බණ ඇසූ පිණින් අප බුදුන් දැක අමාමහ නිවන් දුටහ සි දතයුතු.

මෙසේ ලෝකයෙහි එකානූවක් රහත්සහුන් ඇතිවූකල මෘගේ සවාමිදරුවෝ උරුවෙල නම් දනව් වැසිසේක. එහි නිල්දරා නම් ගංතෙර උරුවෙල කාශ්‍යපය නදී කාශ්‍යපය ගයා කාශ්‍යප යයි ඉන ජටිලයෝ තුන් බැකෙනෙක් අපි රහතුම්හයි කියා මිථ්‍යාදෘෂ්ටි ගෙණ ලෝවැස්සන් වංචාවෙන් පහදවා ලාභයෙහි යසසෙහි අග්‍රවෙවසති. එසින් උරුවෙල කාශ්‍යපයන්ගේ පන්සියයක් අතවැසියෝය, නදී කාශ්‍යපයන්ගේ තුන්සියයක් අතවැසියෝය. ගයා කාශ්‍යපයන්ගේ දෙසියයක් අතවැසියෝය. මෙසේ වූ මේ දහසක් දෙනම හෙතුසම්පත් ඇතියහ. මිථ්‍යාදෘෂ්ටි ගෙණ අපාය ගතවන ඔවුන් කෙරෙහි උපන් මහා කරුණාවෙන් මෘගේ සවාමිදරුවාණන් උරුවෙල කාශ්‍යපයන්ගේ පන්සලට වැඩ "පූජාවලියෙහි" ප්‍රකාශ ක්‍රමයෙන් දක්වාලූ නාගදමනාදී තුන්දහස් පන්සිය සොළොස් ප්‍රාතිහාර්‍යයන් දැකත් හෙතෙම තමා රහත්මි යන මිථ්‍යාදෘෂ්ටිය නො හැරියේම ය. එසේ හෙයින් බුදුහු මොහුගේ මිථ්‍යාදෘෂ්ටි තමැති ව්‍යාධියට මෘගේ ධර්ම නමැති දිව්‍යඖෂධය දී ගොඩනගමිසි සිතා මුඛ නමැති කරඹුවෙන් නික්ඛිණාවූ සුවඳඉතින් සියලු වනලැහැබ සුවඳපිඹක් සේ කර වමින් මධුර සවර විහිදුවා සඛම් දෙශනාවට පවත්වාගෙණ මෘගේ සවාමිදරුවානන් ආකාශ ගඞ්ගාව ගෙණගැර දක්වන්නා සේ මහා නිධානයක් පිධානය ගැර දක්වන්නා සේ වරිතානුකූලවූ ධර්මදේශනාව කරත් කරත් කෙළදහසක් පමණ කෙලෙසුන් නසා දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන්පෙලෙහි පිහිටා මහත් අදුරෙක ප්‍රදීප්ත ලෝකයක් කැගුවාසේ මෙලොවමෙය පරලොව මෙය බුඩරත්නය නම් මෙය ධර්මරත්නය නම් මෙය, රහත්හු නම් මෙය සි විශෙෂයෙන් දැන හැඳින බුදුන්ගේ ශ්‍රීපාදය තමන්ගේ ඉස්මුදුනේ තබාගෙණ දකිමි සවාමිනි! හැඳින්කෙමි සවාමිනි! බුදුව සියල්ල දත්වේලෙහි

පළමුකොට ගැත්තවූ මා දැන වදාළසේක්ද? තුඹවහන්සේ බුදු වෙසින් මට හිතයෙන් ම ආ මැනකෙනෙක. පියාකෙනෙක ගුරු කෙනෙක. කල්‍යාණමිත්‍ර කෙනෙක. මෙතෙක් දවස් සවාමීබව නො දත්තෙමි. දැන් හැඳින්නෙමි. ගැත්තහු නො දැන කළවරද ක්‍ෂමා කළ මැනව සවාමිනි, ගතාදි නොයෙක් අදෝනා සතුති වවන කිය කියා වැඳ සවාමීනි! දැන්ම ගැනීවූ මම මහණවනු කැමැත්තෙමි සි ආරාධනා කෙළේය.

එබසට බුදුහු කාශ්‍යපයෙනි, තොපගේ පමිත් ගි අදහස් බලා ගෙණ එවසි වදාළකල්හි උරුවෙල කාශ්‍යප පන්සියයක් ජටිලයන් කරා ගොස් දරුවෙනි අපගේ අග්‍රම පදයෙහි මෙතෙක් දවස් වේලාම ලොවුතුරා බුදුහු වැඩඋන්සේක. දැන් මම දනිමි. ඇඳින් නෙමි, බණ ඇසිමි, ඒ මම ඒ බුදුන් සොරෙහි ම මහණ වෙමි, තෙපි කුමක් කරවිදැයි විවාළේය. එවිට ඒ පන්සියයක් දෙනම තුඹ මහණ වෙනොත් අපිදු මහණවෙමිග සි කියා ජටාමඩ්ලු හා තවුස් පිරිකර ගඟදියට දමා බුදුන් කරා දිව අවුදින් බුදුන් පරිවරා සිටියහ. එ වේලෙහි මාගේ සවාමිදරුවෝ ඒ පන්සියයක් දෙනාගේ චරිත බලා බණ වදරා සෝවාන්කොට හැමදෙන ම එහි භික්‍ෂුභාවයෙන් ම මහණකළසේක. ගඟදියෙහි යන ජටාමඩ්ලු හා තවුස් පිරිකර යට ගඟ වසන නදී කාශ්‍යපය ගයා කාශ්‍යපය යන දෙබිඹෝ දැක පන් සියයක් ජටිලයන් හා සමඟ අවුදින් මෙ පවත් දැන තුමූද ජටාමඩ්ලු ඉවත දමා බුදුන් දැක බණ අසා සෝවාන් ව එහි භික්‍ෂුභාවයෙන්ම පැවිදිවූහ. මෙසේ පැවිදිලත් හැමදෙකම ගෙණ බුදුරජාණන් වහන්සේ ගයානම් ගං ඉස ගයා නම් පබිත මුදුනට වැඩ එහිදී ආදිත්ත පරියාය සූත්‍රය දෙසනාකොට දහසක්දෙනා වහන්සේම රහත්කළසේක.

ඒ උරුවෙල කාශ්‍යප ආදිවූ තුන්බෑ දහසක්දෙනා වහන්සේ පෙර කෙබඳු පිණක්කොට මෙසේවූ බුදුසස්නෙහි මහණව සසරින් ගැලවී නිවන් දුටුසේක්ද? යත්, මිට දෙයාතුකපින් යට උපන් පූසස නම් බුදුන් සමයෙහි මේ තුන්බෑයන් වහන්සේ ඒ බුදුන් සුළුමවුන් දරුව මිල්වූ තුන්බෑ රජකුමාරව මෙකල පිරිවරවූවා සේ ම තුන් කොටසක්ව සිටිය අමාත්‍ය පිරිවර හා දහසම එක්ව. බුදුන් පවරා තුන්මසක් මහදන් දෙන්නාහු ඒ තුන්මස මුළුල්ලෙහි ඒ දහසම සම ගිව සිල් රක්‍ෂාකලාහුය. ඒ පිණින් එතාතුකපක් මුළුල්ලෙහි දෙවි මිනිස් සැපත්විද ඇවිද මේ කල අප බුදුන්ගේ ශාසනයෙහි මහණව අර්හ මහ නිවන් දැක සසරින් ගැලවුනාහුය.

ඉක්බිති බුදුරජ උරුවෙල කාශ්‍යපාදි දහසක් රහතන් පිරිවරා බිම්සර රජහට පළමුවෙන්ම දෙවා වදළ ප්‍රතිඥව සඳහා දුරුතුමස මැදි පොහෝදා ප්‍රදීප සහස්‍රයෙන් දිලියෙන පහන් ඇඟයක් සේ රජගහනුවරට තුන්ගව්ව පමණ තැන වැල්මිවැල වැලඳී. හෙතින්

ලඹිවත නම්වූ උයනට වැඩ එක් රුකක්මූල සවණක්රැසින් දිලිහි දිලිහි දහසක් රැසින් දිලිහෙන හිරමඩල සේ දහසක් තරුමැද දිලිහෙන සඳමඩල සේ දහසක් අංකුරයෙන් දිලිහෙන සඛණීාංකුර යක් සේ දහසක් පමණ රහතන් පිරිවරා වැඩඋන්සේක.

එකල බිම්සර රජ්ජුරුවෝ බුදුන් තමන්ගේ උයනට වැඩ හුන් පරිදි උයන් ගොව්වා අතින් අසා එක්ලක්ෂ වීසිදහසක් ඇමති බමුණු සිටු සෙනහ ගෙණ දිව අවුදින් සඳ සිසාරා සිටි (සඳ) මඩුල්ලක් සේ ත්‍රිමුඛය සිසාරා වටින් සරියන් සරියන් පමණතැන රැළි දිදී නොගෙක් පැහැයෙන් සිවගත් ව්‍යාමප්‍රභාමණ්ඩලය මැද දිලිහෙන ශ්‍රී ශරීරය ඇතිව වැඩ හුන් මාගේ සවාමිදරුවූ බුදුරජානන් දැක පස්වණක් ප්‍රීතීන් පිණා පියුම්ගැබකට බස්නා රාජහංසයකුසේ ශ්‍රීපාදපද්මයට නැමී පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව හිඳගත්හ. උරුවෙල කාශ්‍යපයෝ තම් එනුවර කැඟු ධජයක් සේ ඉතා ප්‍රසිඛයහ ඒ කාරණයෙන් සමහර පිරිසෙක් සිතන්කැඟු කිමෙක් දෝ හෝ උරුවෙල කාශ්‍යපයන් නිසා ශ්‍රමණ හවත් ගෞතම තෙම වෙසේ දෝ හෝ උරුවෙල කාශ්‍යපයෝ ශ්‍රමණ හවත් ගෞතමයන් නිසා වෙසෙත් දෝ හෝ යි සැක සිතුවාහුය. බුදුරජානන් වහන්සේ ඔවුන් සිතූ සිත් දැන ඒ මහතෙරුන් මූහුණ බලා -

> 'කිමෙව දිස්වා උරාමවෙලවාසි
> පහාසි අග්ගිං කිසමකා වදඤ්ඤා
> පුච්ඡාමි තං කස්සප එතමත්ථං
> කථං පහීනං තව අග්ගිහුත්තන්නති" යි.

යන මේ ගාථාව වදාරා "උරුවෙල කාශ්‍යපය! තෑගේ පඤ්දෙහි සැක තෝ ම හරව" යි වදාළසේක. එකෙණෙහි උරුවෙල කාශ්‍යප නම් මහ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ අවසර ඉල්වා ගෙණ -

> රූපෙ ච සද්දෙ ච අථෝ රසෙ ච
> කාමිත්ථියෙ වා පි මදඤ්ච යඤ්ඤං
> එතං මලන්ති උපධීසු ඤත්වා
> තස්මා, න යිට්ඨේ න හුතෙ රමිංසූති.

මේ ගාථාව කියා තමන්ගේ ශ්‍රාවක භාවය ප්‍රකාශ කරමින් කිම හෙව "ශාස්තෘවූ බුදුරජානන් වහන්ස! මම සවාමීන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි" කියා බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ චතුර්ඛ්‍යානයට සම්වැද අහසට තලක් පමණ තැන් පෑ කැඟි නොමයක් වාරයෙහි

දුමා යාමෙන් දිලිහිමෙන් අතුරුදන් වීමෙන් සක්මන් කිරීමෙන් සෙසු නොයෙක් ප්‍රාතිහාර්‍යය දක්වා ලිමෙන් නැවතත් එසේම බුදුන් වැඳ අවසර ගෙණ දෙ තලෙක තුන්තලෙක යනාදි ක්‍රමයෙන් එකිනෙකි වාරයෙහි වැඳ වැඳ එසේම දන්වා නැවත නැවත අහසට නැගීමෙන් ප්‍රාතිහාර්‍යය දක්ව දක්වා සත්වෙනි වාරයෙහි අහසට නැගි එසේම ප්‍රාතිහාර්‍යය දක්වා බිම්බිසර නැවතත් එසේම බුදුන් වැඳ අවසරගෙණ දෙතලෙක තුන් තලෙක යනාදි ක්‍රමයෙන් එකි නෙකි වාරයෙහි වැඳ එසේම දන්වා නැවත නැවත අහසට නැගි මෙන් ප්‍රාතිහාර්‍යය දක්ව දක්වා සත්වෙනි වාරයෙහි අහසට නැගි මෙන් එසේම ප්‍රාතිහාර්‍යය දක්වා බිම්ට බැස බුදුන් වැඳ ආදරයෙන් නැමී සිට ඒ පිරිසට දක්වන සේක් "අඥන සැවෙනි! මාගේ සවාමි දරුවන්නි මා සමකොට නො සිතව්. බුදුහු මහමෙර සේ උස්වූ ගුණ තුවණ ඇතිසේක. මම වතාහි ලිප්කැවසේ ඉතා මිටිවූ ගුණ තුවණ ඇතියෙමි ය නාදි ක්‍රමයෙන් නොයෙක් උපමා කාරණයන් දක්වා ලිමෙන් අවිනාශ්‍ය අප්‍රමේයවූ බුදුගුණ එක්ලක්ෂ විසිදහසක් පමණවූ ඒ මහාසෙනාවට ඇසෙන සේ කියා බුදුන් වැඳ එකත්පස්ව වැඩ හුන්සේක.

එවේලෙහි මහපිරිස මහතෙරුන් කළ ප්‍රාතිහාර්‍යය දැක ඉතා මහත්වූ සාධුකාර දී කුල්මත්වූවාහු බුදුහු මහානුභාව ඇති සේක. මෙසේ වූ මිථ්‍යාදෘෂ්ටි ඖන රහතුම්හ සි බොහෝ කලක් ඇවිද්දවූ උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි බිඳ විශෙෂයෙන් දමනය කරණ ලදුයි සතුති කළහ. එකල මාගේ සවාමිදරුවෝ ඒ කථාව අසා ඒ මහපිරිසට මේ අවෝත්පත්තියෙහිදී "මහානාරද කාශ්‍යප ජාතක දෙශනාව" වදරා වතුරාර්‍යය සත්‍යයන් ප්‍රකාශකොට වදළසේක. ඒ ධර්මදෙශනාවෙ අසා බිම්බිසාර රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති එක් ලක්ෂ දසදහසක් දෙන දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන්ඵල ප්‍රාප්තවූහ. රජු පිරිවරා ගොස් බණ ඇසූ දෙලොස් නහුතයෙන් ඉතිරි දස දහසක් දෙන ද සරණශීලයෙහි පිහිටියහ. ඒ බිම්බිසාර රජ්ජුරුවන් හා එක් ලක්ෂ විසිදහසක් පමණවූ පිරිස පෙර කෙසේවූ පිණක්කොට මෙසේවූ බුදුවර කෙනකුන් දැක මෙහේ අග්‍රවූ ධර්ම දෙශකාවක් අසා අග්‍රවූ නිවන්සැප ලද්දේද? යත්,

මිට දෙයාතුවන්කල්පයෙහි ඵුස්ස නම් බුදුන්ව මල්බැවූ තුන්බෑ රජුන් තුන්මසක් පවරා දන්දෙන සමයෙහි මේ බිම්බිසාර රජ්ජු රුවෝ එක්ලක්ෂ විසිදහසක් පමණ අයකැමියන්ගෙණ තුමූ ඔවුන්ට ප්‍රධානවූ අයකැමිව තුන්මස මුළුල්ලෙහි අප්‍රමාදව දන්විධාන කරවා

අනුන්දෙන දෑයි නො සිතා තමන්ගෙන් ම දෙන දෑයක් සේ සිතා ශ්‍රද්ධාවෙන්ම දන් විධාන කළාහුය. ඒ කුශලබලයෙන් දෙයාතු කල්පයක් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය ලෝක දෙක්හි බොහෝ සම්පත් වීඳ මේ ජාතියට අටවන ජාතියෙහි චාතුර්මහාරාජික දෙව්ලොව දිව්‍යරාජව ඉපද අනූලක්ෂයක් අවුරුදු දිව්‍ය සැප වීඳ එයින් අවුදින් පි පිට සවාරයක් මෙසේ ම දඹදිව රාජ්‍යය කළහ. මේ ජාතියෙහි තුන් සීයක් සොඳුන් අහු මගධ දෙරටින් හා අසූදහසක් නියම්ගමින් සැදියාවූ මේ රජගහ නුවර සොළොස් හැවිරිදි වැ ඔටුනු පැලඳ එකුන්නිස් හැවිරිද්දෙහි අප මහා ගෞතම බුදුන් දැක බණ අසා පිරිවර හා එක්ව කළ පිණින් එකවිටම සෝවාන්ව එතැන් පටන් සතිස් අවුරුද්දක් මුළුල්ලෙහි බුදුන්ට උපාසකව මෙසේ සැට සත් අවුරුද්දක් ජීවත්ව අනුන්ගේ දන් සමයිතින් ම විවාරූලූ පිණින් අමා මහ නිවන් දැක සසරින් ගොඩනැංගාහුය සි දතයුතු.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බුදුන් වැඳ ලොකොත්තර සරණ ශීලයෙහි පිහිටා දෙවන දවසට ආරාධනා කොට බුදුන් ප්‍රදක්ෂිණා කර වැඳ අවසර ගෙණ නුවරට ගියහ. දෙවන දා උදැසන ඇතුළු නුවර පිවිතුවර වසන අටලොස් කෙළක් පමණ මනුෂ්‍යයෝ ඊයේ දවස් ලොවුතුරා බුදුන් යන උතුමාන කෙනෙක් අපගේ නුවරට අවුය. අපගේ රජ්ජුරුවෝ බණයයි කියන හොඳ දෙයක් ඇසුල නිවණැ සි යන මනා රසයක් වැළදුලු. ඒ බුදුහු කෙසේවූ කෙනෙක් දැයි යනාදි කාරණයෙන් වෙන වෙන සලකා කියමින් එ නුවර ඇලලී ගොස් අඵයම් වේලෙහි පවන් මහසෙනහ නික්ම බුදුන් වැඩ හුන් උයනට තුන්ගව්වක් පමණ මහ සිදුරක් නැති සේ උයනද අව කාශ නැතිව පිරි සිටගත, මනුෂ්‍යයෝ බුදුන්ගේ රැසිරු බල බලා ඇස් අයාගත නොහෙති. බුදුන් සිහාවබනට මහෙති අවකාශයෙක් නැත. බුදුහු ජනයන් කෙරෙහි කරුණාවෙන් රැසිරි දිදී වැබහිදිනා සේක්මය. එදා බුදුන් සුන්බත්වන හෙයින් බුදුන්ගේ පුණ්‍යානු භාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය රත්කළ යව ටක් සේ හුණුවිය. එකල්හි ශක්‍රයාගේ තුන්ගවු උස ශරීරය සුගන්ධ තාපයෙන් තැවූ ඉටිකදක් සේ කකියා එකෙණෙහි ආසනයෙන් නැගී ශක්‍රදෙවෙන්ද බිමට පැන මරණ හයින් හඟපත්ව කිමේක්දෝ ගෝ සි පරීක්ෂා කරණුයේ තමා උපෙක්ෂා උව හොත් එදා බුදුහු සුන් බත් වෙති දැන තරුණවූ අභියුක්තාක වෙසක් මවාගෙණ සෝලුලියක් අතින් ගෙණ බුදුන් අරහයා සතුතිකොට කොට බුදුන්

ඉදිරියෙහි සිටගෙණ තමාගේ ශක්‍රානුභාවයෙන් තුන්ගවු පමණ තෙන සිටගත් ඒසා මහත් පිරිස දෙබෑ කොට පියා දකුණත ඔසවා ගෙණ අඩගා ඒ පිරිසට ඇසෙනසේ:—

දෙනෙතා දෙනෙතහි සහ පුරාණජටිලෙහි
විපජමුතෙතා විපජමුතෙතහි
සිංහි නිකඛසවණෙණා
රාජගහං පාවිසි භගවා.

මේ ආදීන් බුදුගුණ කිය කියා පිරිස් දෙබේ කොට නික්මිණ. එකල්හි දෙපාර්ශ්වයෙහි බෙදිසිටි මහපිරිස හැම ඒ තරුණ පුරුෂයාගේ රූපශ්‍රිය හා චිත්‍රමය දැක අහෝ මේ දරු විශිෂ්ටවූ රූ ඇත්තේය. ඉතා දශීනිය ය. ඉතා බුහුටිය. මෙවැනි තරුණ පුරුෂයෙකු මෙතෙක් දවස් මෙනුවර අපි නුදුටුවිරුම්හ. තෙපි කොහි සිට ආ කෙනෙක් දැයි විචාරති. එඩස් ඇසූ මාණවක වෙස් ගත් ශක්‍රතෙම:-

යො ධිරෝ සඛඛි දෙනෙතා සුඛෝ අපජපිපුඤ්ඤලෝ
අරහං සුගතෝ ලොකෙ තසසාහං පරිවාරකෝ නි-සි.

මේ ගාථායෙන් මම තුන්ලෝ මුදුන්පත් බුදුන්ට පක්ෂපාතවූ එක්තරා අභිසුක්‍රතක කෙනෙක්මි කිය. එවිට බුදුරජාණන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍ර අවකාශකොට දුන් මාගියෙන් දහසක් පමණරහත් භික්ෂු සඞ්ඝයා පිරිවරා දුටු දුටුවන් ඇස්වමින් සිත් නිවමින් රූපශ්‍රියෙන් දිලිහි දිලිහි වැඩ රජගහනුවරට වන්සේක.

බිම්බිසාර රජ බුදුන් පෙරමඟට අවුත් වඩාගෙණ ගොස් රජගෙයි පණවනලද ආසනවල වඩාහිඳුවා බුදු පාමොක් මහසඟනට මහදන් දී වළඳ අනතුගෙයි එකත්පස්ව හිඳ **"ස්වාමිනි! මම ජීවිතාන් තය දක්වා තුණුරුවන් හැර වාසය කළ නොහෙමි"** එහෙයින් මා සිතු සිතු යම් විටෙක වැඳගන්නා කැමැත්තෙමි. ලෂ්ටිවන නම් උයන ඉතා දුරය. මාගේ මේ වෙළුවන නම් උයන ඉතා නුදුරු නො ලං ගමනා ගමන සම්පන්නය. විවෙක සාරුප්‍රය. සිසාරා සිටගත් නිල්වලා රුසක්වන් නුණවතයකින් පරික්ෂිප්තව ඉතා සෞම්‍යවූ හෙයින් **"වෙළුවනය"** යි කියාත් කියනු ලැබෙයි. කලන්දක නම් ලෙහෙණුන්ගේ නම ඔවුන්ට ඒ උයන්හිදී තබාදුන් බත් වැට්ප් ඇතිහෙයින් **"කලන්දකනිවාප"** නමකුදු විය. මෙසේ නාමවය කින් ප්‍රසිඩ ඒ උයන "පිළිගතමැනැවැයි" ආරාධනා කොට බිම්සර රජ්ජුරුවෝ ඒ උයන නඳුනොදුනය සේ පවිත්‍රකොට සරහා උයන පවත් රජගෙය දක්වා මඟ සුදුවැලි අතුට මිසිතුරුකර ධජ පුන් කලස් ආස්වියන් ලද පස්මලින් සඳ බුදුන් වඩාගෙණ ගොස් ජන

සම්බාධ නැති විවෙකසැප යුත් ඡායූදකසම්පන්න සිහිල්ගල්තලා යෙන් අලංකෘත උතුම් රමණීය භූමිප්‍රදේශ ඇති සුරභිකුසුම වෘක්ෂ පන්තීන් අතුරුනැති රමණීය ප්‍රාසාද හර්ම්‍යය විමාන විහාර අධි යෝග මණ්ඩපාදීන් ප්‍රතිමණ්ඩිතවූ මේ මෘගේ වෙළුවනාරාමය බුදු පාමොක් මහසඟනට දෙමි කියා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී හස්තයෙහි සවර්ණීකාරයෙන් පැන් වත්කොට පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ආරාමය පිළිගත්සේක. එකෙණෙහි බුද්ධ ශාසනයාගේ මූල්බටැ සි සතුටුව සාධුකාර දෙන්නියන සේ මහා පෘථිවිතොමෝ කම්පාවිය.

දඹදිව වෙළුවන මහාවිහාරය හැර මහපොළොව කම්පාකරවා පිළිගත් අනික් සෙනස්නක් නම් නැත. මෙසේ භික්ෂුසඞ්ඝයාට සේනාසන පිණිස වෙළුවනාරාමය පිළිගෙණ අනුමෙවෙනි බණ වදුරණ බුදුරජාණන් වහන්සේ බිම්බිසාර රජතුමා විහාරදානානිසංස ප්‍රභාෂකොට වදුරා අනොපමවූ බුබලීලාවෙන් හා අනන්නවූ බුද්ධ ශ්‍රීන් දිලිඹි දිලිහි නොයෙක් බ්‍රහ්මවිහාරයෙන් වෙළුවනාරාමයෙහි වෙනෙය ජනයන් බල බලා වාසයකරණසේක. කියේ මැනෝ-

අභිළනෙ වෙළුවනෙ විහාරෙ
තථාගතො තත්ථ මනොභිරාමෙ
නා නා විහාරෙන විහාසි බිම්බෝ
වෙනෙය්‍ය කාලං සමුදිකඛමානො.

එසමයෙහි රජගහනුවරට නුදුරුතෙන කොලිතය උපතිස්සය යන බමුණුගම් දෙකෙක්විය. එහි සත්මුත්තකසිට ඔවුනොවුන්ට මිත්‍රවූ බ්‍රාහ්මණ මහාසාර දෙකුලයන උපන් පින්වත් **කොලිතය උපතිස්සය** යන කුමරුවෝ දෙදෙන පන්සියයක් පන්සියයක් පිරිවර ඇතිව උයන්කෙළි ආදියට යන්නාහ. එසින් කොලිත කුමාරයන් කැටුවම අසුන් යෙදූ රථ පන්සියයක් නික්ම යෙයි. උපතිස්ස කුමාරයන් කැටුව ම රන්සිවිගෙවල් පන්සියයක් නික්ම යෙයි. මෙසේ ක්‍රීඩාභූමියෙහි දු එක්ව ම හැසිරීමෙන් කෙළි නාටකාදිය බලා දෙදෙන ම මහත් නුවණැති හෙයින් සසර කලකිරී මේ කෙළි නළු නම් සසරින් ගැලවීයන උපායෙක් නො වෙයි. එහෙයින් මෙතැන් පටන් කෙළි නළු නො සොයා නිවන් සොයම්හ යි මන්ත්‍රණය කොට කවුරුන් ගුරුකොට වසමෝ දෝ හෝයි පරීක්ෂාකොට එසමයෙහි රජගහනුවර ලාභයෙන් යසසෙන් අග්‍රව වසන සඤ්ජය නම් පරිබ්‍රාජකයන්ගේ සවරූප අසා පන්සියයක් රථ හා පන්සිය යක් සිවිගෙවල් පන්සියයක් දෙනා අත ගමට යවා පන්සියයක්

අතවැස්සන් හැරගෙණ ගොස් ඒ සඤ්ඣය පරිබ්‍රාජකයන් ලඟ තාපසව කිපදවසක් උන් කෙරේ වැස තමන් මහනුවණැති හෙයින් උන්ගේ සමයෙහි නිවන්මඟෙක් නැතැයි දැන මුළු දඹදිව තෙසැව දහසක් නුවරවල නුවණැත්තන් කරා ගොස් ඔවුන් විවාළ ප්‍රශ්න යන් තමන් දෙදෙන විසඳීම් මිස තමන් විවාළ ප්‍රශ්න විසඳන එකද කෙනෙකුන් නැතිහෙයින් නිවන්මඟ පානාතරම් ගුරුකෙනෙකුන් නොදැක නැවත රජගහනුවරටම අවුදින් අප දෙදෙනා අතුරෙන් යමෙක් පලමුව නිවන්මඟ දුටුවේ නම් හෙතෙම අනෙකාට කිය යුතුයයි ඔවුනොවුන් මන්ත්‍රණය හොව වෘසය කෙරෙති. එකල මෘගේ සහාමිදරුවූ බුදුරජාණන් වහන්සේ පෙර කී ලෙස වෙළුවනා රාමයෙහි වසනසේක. පස්වග මහෂීන් වහන්සේ අතුරෙහි අස්සජි නම් මහතෙරුන් මුළු දඹදිව ඇවිද බුදුන් උපන් පරිදි බොහෝදෙනාට කියා ලෝවැඩකොට නැවත බුදුන්කරා අවුත් වෙළුවනාරාමයෙහි දී බුදුන් දැක එදා රැ එහි වැස දෙවෙනිදා උදැසන රජගහනුවරට වැද ගෙපිළිවෙළින් පිඬු සිහනසේක.

එ දවස් පෙර කී දෙ යහළුවන් අතුරෙන් **උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ ඒ අස්සජි මහතෙරුන් දැක** මේ උපසමය ඉතා සන් හුන් වේසයකැ යි දැක පැහැද පසුපස්සෙහි ගොස් වළඳනවේලෙහි තමන්ගේ පරිබ්‍රාජක පුටුවපිට වඩාහිදුවා වළඳා අනතයෙහි කුණ්ඩි කාවේ පැන් අතට ගෙණලා මෙසේ පලමුකොට ඇදුරුවතින් ආදර දක්වා "සවාමිනි! නුඹගේ ඉන්ද්‍රියයෝද ඉතා ප්‍රසන්නයහ. නුඹගේ කායවාක් සමාචාරයෝද මට ප්‍රියවන්නාහ. එසේහෙයින් නුඹ නිවන් මහ දුටුයෙහි යි සිතමි. හිමි නුඹගේ ගුරු කවුරුදැ" යි විවාළහ. එබසට තෙරුන් වහන්සේ භවත මෘගේ ගුරු සවිනේ ගෙවා දත් බුදුරජය යි වදළසේක. ඒ ඇසූ පරිබ්‍රාජක කියනුයේ සවාමිනි! නුඹගේ ගුරුන් වදළ අවවාද පදයක් මටත් දී වදළමැනවැ යි කිහ. ඒ අසා අස්සජි මහතෙරුන් වහන්සේ මේ පරිබ්‍රාජකාවරු නම් බුදු සස්නට ප්‍රතිඃක්ෂයහ. එබැවින් මෝහට බුදුන්ගේ ධර්මය මහත්බව කියා භයගන්වමි යි සිතාලා මම අලුත මහණවූයෙමි පින්වත. දහම් ඉතා ගැඹුරය. විශෙෂයෙන් කියා නට දක්වාලීම මට පිළිවන්දැ යි වදළසේක. එබසට උපතිස්ස පරිබ්‍රාජකතෙම "සවාමිනි, මට බොහෝ කොට වදරා දුක් නොගතමැනව. සංක්ෂෙපකොට එකානයකින් කී දෙය මම සියක් දහසක් ලක්ෂයක් නයින් විස්තර යෙන් සිතාගන්නා නුවණ ඇතියෙමි" යි කිහ. එවිට අස්සජි මහ තෙරුන් වහන්සේ–

"යෙ ධම්මා හෙතුප්පභවා, තෙසං හෙතුං තථාගතො, ආහ
තෙසංච යො නිරොධො, එවංවාදී මහාසමණො"–ති.

මේ ගාථාවගේ පූර්වාර්ධ දෙපාදයෙහි සොළොස්වන අක්ෂරයට වදුල වේලෙහි ශතසහස්‍ර නයින් සඩ්ගීය කාරතලාමලකයක් සේ **දන උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ සෝවාන් ඵලයෙහි පිහිටා** නැවත අන්‍ය දෙපාදය සෝවාන්ව සිට අසා නිමවා සාධුකාර දුන්නාහ. මෙසේ සෝවාන් ව එම සෝවාන් භූමියෙහි නිශ්චලව පිහිටා ශ්‍රද්ධාදී ගුණ ඇති හෙයින් නිවන් මහ හා තුණුරුවන් ගුණ වීමසා මහත්වූය ඉදුරා දන ගැදින මාගේ බුදුහු දන් කොයිද යි විචාරා වෙළුවනාරාමයෙහි වැඩවසන සේකැ යි අසා තෙරුන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ අවසර ගෙණ **ඤොලිත පරිබ්‍රාජකයන් කරා** ගොස් නිවාණ ධර්මය දුටුයෙම් වේදැ යි කියාලා බුදුන් උපන් පවත් කිහ. එබසට කොලිත පරිබ්‍රාජකතෙම බුදුහැ යි යන බස හා නිවණැ යි යන බසට ලොමු දහඉගන්වා සතුටුව තොප ඇසූ බණ මවත් කියවයි කිහ. උපතිස්සයෝ එවිට තමන් ඇසූ ගාථාව නොවරදවා කිහ. කොලිතයෝ ඒ ගාථාවගේ සතරපදයම අසා නිමිවේලෙහි අනන්‍යාක්ෂරය ඇසීම සමගම සෝවාන්වූහ.

ඉක්බිති බුදුහු දන් කොයිදැ යි විචාරා වෙළුවනයේ යයි අසා **අපගේ ගුරුන් සඤ්ජය පරිබ්‍රාජකයන්ටත්** කියා අප ලද නිවන් රස දෙමිහ යි ඔවුන්ගේ ආරාමයට ගොස් බුදුන් උපන් පරිදි කියා අපි දන් බුදුන් කෙරේ මහණවන්නට යමිහ අප හා. සමග බුදුන් කරා ගොස් මහණවුව මැනව යි කැඳවූහ. එවිට සඤ්ජය පරිබ්‍රාජක "පෙර බොහෝ කලක් මම බොහෝදෙනාට ගුරුකම් කොට ඇවිද්දෙමි. එහෙයින් හවත් ගෞතමයන් කරා ගොස් මහණව උන්ට අතවැසි නො වෙමි. මෙලොව අඥතයෝ බෙහෙව. නුවණැතියෝ මද. එහෙයින් අඥතයෝ මාකරා එති. එසේ හෙයින් මාගේ පණිත් බොහෝ වෙයි. එබැවින් මම නොයමි" කියා එබස් නොඉවිස්සාහ. ඉක්බිති කොලිත උපතිස්ස නම් යහළුවෝ දෙදෙන ආවාරින් නොයෙක්ලෙස කැඳවා නොඉවිස්නා හෙයින් බුදුන්කරා අපි යම්හයි කියා නික්මුණාහ

එකෙණෙහි සඤ්ජය පරිබ්‍රාජකයන්ගේ පන්සියයක් පණිත් එකෙකුත් නොරදා ආරාමය සිස්කොට ඒ දෙදෙනා හා කැටුව නික්මුණාහුය. සඤ්ජය පරිබ්‍රාජකයෝ සිස්වූ ආරාමය දැක ශෝකයෙන් ලය රත්ව හුණුලේඟැල්ලක් නගාපිහ. එවේලෙහි ඒ පන්සියයක් පණිදින් දෙසියපණස්දෙනෙක් ගුරුන්කෙරෙහි කරුණාවෙන් රදා පිහ. අනික් දෙසිය පණස්දෙනා හැරගෙණ දෙදෙන වෙළුවනාරාම යෙහි බුදුන් දක්නට නික්මුණාහ. එකල්හි ලොකානුකම්පා ඇති

බුදුරජ සිවුවණක් පිරිස් මඩ්‍යයෙහි ධර්මාසනාරූඪව වැඩහිඳ බණ වදාරණසේක් දුරින්ම එන්නාවූ උපතිස්ස කොළිත ඝන (සැරියුත් මුගලන්) දෙනාඵවන් දැක වදාරා අජ්ඣත්ත සම්භාවගත බ්‍රහ්මස්වර යෙන් භික්ෂූන්වහන්සේට අඩබා වදාරා "මහණෙනි, තෙල එන්නා වූ පරිබ්‍රාජක දෙදෙන මාගේ අග්‍රශ්‍රාවකයෝ වෙති" වදාරා ඔවුන්ට පෙර ගමන් පිණිස සවණක් රැස් හැර වදාළසේක. ඒ දෙදෙනා බුඩ රශ්මි ස්පර්ශයෙන් අතිශයින් ප්‍රසන්නවූ සිත් ඇතිව බුඩහෞරව යෙන් නැමී නැමී ගොස් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි බැස හෙව "සවාමිවූ භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේගේ සම්ප යෙහි අපි පැවිදි උපසම්පදා ලබනු කැමැත්තමහ යි දැන්වූ කල්හි භාග්‍යවතුන් වහන්සේ චීවරගතියෙන් දක්ෂිණ ශ්‍රීහස්තය නිකුත් කොට "එථ භික්ඛවෝ සාවකාකාතෝ ධම්මෝ චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය" යි වදාළ කල්හි ඒ වචනානන්තර යෙහි ම සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ප්‍රමුඛවූ පරිබ්‍රාජක දෙසියපණස් දෙන ම පැමිණෙනලද ඍද්ධිමය පා සිවුරු ඇති ව සියක් වසියක් මහණදම් පිරූ මහතෙර පෙළක් සේ ඊර්යාපථ සම්පන්න ව බුදුන් වැඳ පිරිවරා වැඩඋන්සේක්ලාය.

එකල්හි බුදුරජ කරවදාළ ධර්මදේශනාව අසා සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ හැර සෙසු දෙසිය පණසක්දෙනා වහන්සේ ම රහත් වූසේක. අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේට සාවක පාරමීඥාන යාගේ මහත් බැවින් උපරිමාගීත්‍රය සාධකවූ කෘත්‍යය නො වැට හෙන්නේය. මුගලන් මහතෙරුන් වහන්සේ මහණවූ සත්වෙනි දවස්හි මගධරට කලුවාල නම් ගම නිසා වසමින් ශ්‍රමණධර්මය කර මින් පිනම්බයට පැමිණිකල්හි ඝාතනාවූ බුදුන් විසින් සංවෙගදනවා පිනම්බය දුරුකොට බුදුන් විසින් දුන්නාවූ ධාතුකම්ඨානය අස අසා සකෘදාගාමී අනාගාමී අර්හත් යන මාගීඵලයන්ට පැමිණ අග්‍ර ශ්‍රාවක පාරමිතා ඤාණය මස්තකප්‍රාප්ත කළසේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ ද මහණවූ පස්ලොස් දවසකින් බුදුන් හා එම රජගහනුවරට නුදුරුතෙන හුරන් විසින් කළ ලෙ ා වසනසේක් තමන් වහන්සේගේ බැණවූ දීඝනඛ නම් පරිබ්‍රාජකයන්ට වෙදනා පරිග්‍රාහක නම් සූත්‍රදේශනාව බුදුන් දේශනාකර වදාළකල්හි ඒ දෙශනානුසාරයෙන් ඤාණය හැර අනික හට බෙදූ ඛතක් උදුරා ගෙණ කන්නකු සේ සැරියුත් මහතෙරුන් වහන්සේ සෙදගැමි අතැගැමි රහත් යන මාගීඵලයන්ට පැමිණ අග්‍රශ්‍රාවක ඥානයෙහි බුදුන් පැමිණිසේක.

මෙසේ ඒ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ම රහත්ඵලයට පැමිණි ඉක්බිත්තෙන් ඒ සැරියුත් මහතෙරුන් රහත්වූ දවස්හි ම වෙළුවනාරාමයෙහිදී ශ්‍රාවකසඞ්ඝයාවහන්සේ රැස්කොට ඒසැරියුත්

මාර පරාජය (73 පිට)

මූගලන් දෙදෙනා වහන්සේට ම අග්‍ර ශ්‍රාවක තනතුරු දෙවා වදාරා එ දවසට ම පැමිණි නවම් මස මැදි පෝයෙහි චතුරඞ්ගයකින් සමන්විතව රැස්වූ එහි භික්ෂුභාවයෙන් ම රහත් ව සිටි එක්දහස් දෙසිය පණස් නමක් පමණ වූ මහරහතන් හා සමඟ දසදහසක් සක් වළින් රැස්වූ දිව්‍ය බ්‍රහ්මයන්ගේ මඩ්‍යයෙහි වැඩහිඳ අනන්තා පරිත්‍යාගවූ රජදරුවන් විසින් ලෝකයෙහි තොහැර දුරිය යුතු මුක්තාහාරයක් සේ අනන්තාපරිත්‍යාගවූ බුදුවරයන් විසින් මුඛාලඞ්කාර කොට දෙශනා කරණලද,

"සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං"

යන මේ පූර්වෝක්ත ගාථා රත්නයෙන් අලඞ්කාර කොට පාමොක් දෙශනා කර වදාළසේක.

එතැන් පටන් ආකාශය හොබවමින් ඇවිදිනා හිර සඳ දෙදෙනා සේ සැරියුත් මූගලන් දෙදෙනා වහන්සේද බුදුරජාණන් වහන්සේට අනුව ම ශාසන නමැති ආකාශය බබුළුවා වැසය කළසේක.

මෙසේ කුදෘෂ්ටි පාපඨ්ඨංශන සමර්ථවූ මාගේ බුදුරජාණන් වහන්සේ බුදුවූ පළමුවෙනි වර්ෂයෙහි ම මහාපවාරණයට ඉක්බිතිව රජගහනුවර උරුවෙලාවට වැඩ එහි දැඟි ඕථ්‍යාදෘෂ්ටි නමැති මහා ප්‍රපාතයෙහි වැටිහුන් කාශ්‍යපාදි දහසක් ජටිලයන්ට අනෙකප්‍රකාරවූ සඞ්ඛ්‍යානුශාසනා ශාඛ්‍රාතිහාර්‍යය කිරීමෙන් ඔවුන් ගොඩ නගා රහත්ඵල භූමියෙහි පිහිටුවාලූ හෙයින්ද, බිම්බිසාර රජ පෙරදුරිව එතනට පැමිණි මහපිරිස්හි අදහස් බලා ධම්මදෙශනා කොට ඒ බිම්බිසර රජ ප්‍රධානවූ එක්ලක්ෂ දසදහසක් ඇමැතියන් සෝවාන් ඵල යට පමුණුවා දසදහසක්දෙනා සරණශීලයෙහි පිහිටුවා ලූ හෙයින්ද දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනය ඇති මේ මහපොළව වෙවුල්වා පිළිගත් වෙළුවන මහාවිහාරයෙහි ව්‍යාඝ්‍රකර්මින් එම බිම්බිසාර මහරජතුගේ ආරාධනාවෙන් ධම්මදෙශනා කොට අසූකාර දහසක් ප්‍රෙතාත්මන් ප්‍රෙත අපායෙන් ගලවා දිව්‍යාත්ම ශ්‍රී සම්පත්හි යෙහි හා අමෘත මහා නිර්වාණයෙහි පිහිටුවා ලූ හෙයින්ද, අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේ හා ඔවුන් අතවැසි දෙසිය පණස්දෙනකු තමන් වහන්සේ එහි භික්ෂුභාවයෙන් රහත් ව නිවන්පුරට ම වදාළ හේ කරණලද ප්‍රණීතවූ ධම්දෙශනාවන් ඇතිහෙයින් ද, එසේ එහි භික්ෂු භාවයෙන් රහත්ව සිටි එක්දහස් දෙසියපණසක් භික්ෂූන් හා දස දහසක් සක්වළින් රැස්වූ දිව්‍ය සමාගම මඩ්‍යයෙහි පවත්වනලද

උතුම් ධම්දෙසනාවන් ඇතිහෙයින් ද, මෙසේ මෙසේ සත්ත්වානුග්‍රහ පිණිස දිවසානුදිවස වශයෙන් පවත්වනලද ප්‍රමාණාතික්‍රාන්තවූ සඩමිානුසාසනාවන් ඇති හෙයින් ද, ලොක ශිවඩ්කරවූ මට ම සරණවූ මාගේ බුදුරජ "ශාස්තෘ" නම් වනසේක. එසේ හෙයින් කිය්නලදී.

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දම්මසාන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො යි.

ලෝවැඩ පිණිස කරණ්ද මේ ශ්‍රී සඩමිංවවාද සඩ්ග්‍රහයෙහි මෙතෙකින් අප බුදුන් බුදුව දනවු සැරිසරා රජගහ නුවරට වැඩි පලමුවෙනි ගම්තෙහි උරුවෙල කාශ්‍යප බිම්බිසාරතරවරාදි බොහෝ සතුන්ට වැඩ සැදීමෙන් වෙළුවනාරාමය පිළිගෙණ ලෝවැඩ කළ ප්‍රවෘත්තීන් යුත් මිනිස පරිච්ඡේදය කියා නිමවන ලදී.

—o—

ත්‍රිභුවන චූඩාමණිවූ ලෝකනායක මාගේ බුදුරජාණන් වහන්සේ මෙසේ ලෝවැඩ වැඩීමෙන් වෙළුවන මහා විහාරයෙහි වසන කල සුබොදන රජ්ජුරුවෝ මාගේ පුතනුවූ සිද්ධත්ථ කුමාරයෝ උතුම් සම්‍යක් සම්බොධියට පැමිණ දම්සක් පැවතුන් සුත්‍ර දෙශනාවන් වදරා දැන් රජගහනුවර බිම්බිසාර රජහුගේ වෙළුවන නම් විහාර යෙක්හි වාසය කරණ සේක් ල. තව දක්වාත් මා ඇස දක්නට වත් නො පැමිණ සෙස්සන්ට සඩ්ග්‍රහ කොට උපකාරවූ මට සඩ්ග්‍රහ නො කරණසේකැ යි සිතා එක් අමාත්‍යයකු කැඳවා සොදුරුවූ අමාත්‍යය" තෝ සුදුපිළි හැඳ මුලුවෙස් ගෙණ දහසක් පුරුෂයන් පිරිවර රජගහ නුවර වෙළුවනයට ගොස් ම පුතනුවූ හාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ මාගේ වචනයෙන් මෙසේ දන්වව. "සුබොදන රජ්ජුරුවෝ නුඹවහන්සේ දක්නා කැමැතිසේකැ යි යන බව ද ඒ මා මහලුව ගිය බව හා පුත්‍රවියොග දුඃඛයත් ඉවසිය නො හෙන බව ද "ලොව බොහෝ දෙනාට දහම් දෙසා නිවන් යන අමාරස යක් බෙදා දෙති" යනු බොහෝදෙනා කෙරෙන් අසා මටත් ඒ දහම් යන දෙයත් අසා නිවන් යන උතුම් රසයක් ලැබීමෙහි මහත් තණ්හා ඇති බව ද ඉදුරා කියා ඔබත් මාගේ පුතනු කෙනෙක් වූ නම් මෙතන ඔබගේ පියාන කෙනෙක් වීම් නම් වහා නික්ම මෑකරම එන සේක්ව" යි යනාදි නොයෙක් සරුව දන්වීමෙන් ම පුතනුවන් වහා ගෙණ එවයි කියා නියොග කළ කල්හි ඒ ඇමති ද ඊන වයි හිඳිස වහා නික්ම සැවොදුන් මඟ ගෙවා ගොස් බුදුරජ මහ

පිරිස්වැද ධම්මසභාරුක්ඛ ච්ඡේද බණ වදාරණ වෙලෙහි වෙළුවනාරාම යට වැද හිරුමඬල වැනි තේජසින් හා සඳමඬල වැනි සෞම්‍යගුණ යෙන් යුත් අප්‍රමාණ ශ්‍රීවිභූතීන් දිලිහෙන බුදුරජානන් වහන්සේගේ ශ්‍රීවූඛ මණ්ඩලය දුරින් ම දැක උපන් ප්‍රීති සොම්නසින් පිණ පිණා දම් සහා මණ්ඩපයට ගොස් පිරිවර දහසක්දෙනා හා පිරිස කෙළවර සිට බණ අසන්නාහු මහරජ කී හසුන තිබ්බා. අප දුන් මෙසේ බණ ඇසීමට සුදුසු යයි දැන ශාස්තෘන් වහන්සේගේ සඬ්ඝදෙශ නාව සපිරිවරින් අසනුවෝ එසේ සිටියේ ම සිට ඒ දහසක් පුරුෂ යන් හා රහත් ඵලයට පැමිණ දෙශනා කෙළවර බුදුන් කරා ගොස් පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට පැවිදිවීමට යාචඤ්ඤා කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ "එථ භික්ඛවෝ" යි වදාරා ශ්‍රී හස්තය දිගුකළකල්හි ඍද්ධිමය පාත්‍ර සිවුරු ධරා හැමදෙනා වහන්සේ ම සියක් වසී ගිය මහ තෙරුන් සේ රූපශ්‍රීපථ සම්පන්නව බුදුන් පිරිවරා හුන්නාහුය.

එසේම ඔවුනු රහත්වූ තැන් පටන් අනුනය ප්‍රතිඝයෙන් දුරුව මඛ්‍යස්ථ ගුණයෙහි පිහිටි හෙයින් රජහුගේ හසුන් බුදුරජානන් වහන්සේට නො දන්වා ම එහි වාසයකළසේක. එසේ රජ්ජුරුවන් සඳහන්කොට වචනමාත්‍රයක්වත් කියා ගෙණ යන එන කෙනෙකුන් නැති හෙයින් මෙඝය පතන මයූර රූපයකු සේ බුදුන් දැකීමම පත පතා පෙරමඟ බල බලා විඛාව තැවත අනික් අමාත්‍යයකු කැඳවා ඕහට දහසක් පුරුෂයන් පිරිවරා මගුල්වෙස් ගෙණ යන ලෙස පෙර සේ ම උගන්වා යවා ඒ අමාත්‍යයා ද එසේ ම පැමිණ පිරිවර සහිතව බණ අසා රහත්ව එහි භික්ෂුභාවයෙන් ම මහණ ව තුන්නිම් හුතව එහිම වාසය කෙළේය. මහරජ ද මේ නියායෙන් ම තැවත තැවතත් සත්වරෙකැයි මෙසේ නවවරෙක නවදහසක් පුරුෂ යන් හා අමාත්‍යයන් නවදෙනෙකු යවා ඒ ගිය ගිය ඇමතියෝ සපිරිවරින් ම බණ අසා රහත්ව එහි භික්ෂුභාවයෙන් ම මහණවූහ. මෙසේ නිවන් සැප විඳිමින් එයින් එකද කෙනෙකුන් ඒ රජ යැවූ හසුන් සඳහන් කොට නො ආ හෙයින් රජ්ජුරුවෝ සත්රුවන් පතක සක්විති රජෙකු සේ බුදුන්ගේ දැක්ම ම පත පතා පෙරමඟ බල බලා විඛාව තැවතද මිට කුමක් කෙරෙමි දෝ හෝ යි කියා, සියලු රජපිරිස බලනුවෝ බෝසතාණන් හා එකද උපන් වැලි කෙළියෙහි පවන් පුරුදුව විසූ කාලුදයි නම් ඇමතියන් දැක ඔහු කැඳවා "පුත! කාලුදයිනි! තොප යකඵවූ මපුතනුවන් සිඹාවී කුමා රයන් කැඳවන පිණිස නවදහසක් පුරුෂයන් හා ඇමැතිනි තව

දෙනෙකු නවවරෙක යැවීමෙන් එයින් එක් හසුන් මාත්‍රයක්වත් නො ඇසීමි. එසේ හෙයින් දරුව දහසක් පුරුෂයන් පිරිවරා මහු ල් වෙස් ගෙණ නික්ම වහා මපුතනුවූ බුදුන් මා ඇස දක්වන්ට නො හැකි වේද" යි විවාළකල්හි "දෙවයන් වහන්ස!, පැවිදිවීමට අව සර ලදිම් නම් ඒ මට පිළිවනැ" යි දැන්විය. එවිට රජ්ජුරුවෝ කියනුවෝ දරුව නෝ පැවිදි වෙව යි පැවිදි නො වෙව යි මපුත නුවූ බුදුන් මා ඇස දක්වව'යි කියේක.

ඉක්බිත්තෙන් ඒ කාලුදායි නම් ඇමැති තෙම මැනවැයි සමු ගෙණ දහසක් පුරුෂයන් හා සුදුසුදුන් ඇඟගල්වා සුදුපිළි සුදුමල් පැලඳ පිරිසිදු බුදුන් දක්නට යනුයේ පෙරසේම ගොස් වෙළුවන මහවිහාරයෙහි බුදුන් බණ වදාරණ වේලෙහිම පැමිණ පිරිස් කෙළ වර සිට බණ අසා සපිරිවරින් රහත්ව එහි නිඝ්‍රුහාවයෙන් ම මහණ විය. පෙරසේ ම බුදුන් පිරිවරා හුන් ඒ කාලුදායි සථවිරයන් වහන් සේ එතනට පැමිණ පැවිදි ලත් සත්අවදවසක් ඉක්ම ගියකල මැදින් දින මැදි පොහොය සම්ප්‍රාප්ත විය. එදවස්හි උන්වහන්සේ සිතන සේක් දන් හෙමනත කාලය ඉක්මගොස් වසනත කාලය පැමිණියේය. එහෙයින් දශබලධාරිවූ බුදුන්ගේ සැතපි සඩ්ගුහය කිරීමට කල් වන්නේය යි දැන භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ පසඟ පිහිටුවා වැඳ ශාස්තෘන් වහන්සේට අභිමුඛව මහාබ්‍රහ්මයා මෙන් බිම දණ හැන දෙහොත් මුදුන් දී ආදර ගෞරව සහිතව හිඳ ගමන වණ්නා කරණ කාලුදායි සථවිරයන් වහන්සේ:-

අගාරිනො දනි දුමා භදන්තෙ එලෙඝිනො ඡදනං විපහාය
තෙ අව්හිමත්තෙ ව පහාසඝනහි සමයො මහාවීර භගිරථානං
නාතිසිනං නාතිදුණ්හං නාතිදුබ්භිකඛජාතකං
සද්දලා හරිතා භූමි එස කාලො මහාමුනි.

මේ ආදි ගාථා සැටකින් මාගිය වණ්නා කොට කියා සවාමි දරුවූ බුදුරජාතෙනි! හෙමන්තය ඉක්ම දැන් වසනතකාලය පැමිණි හෙයින් නානාප්‍රකාර වෘක්ෂයෝ තම තමන්ගේ පුරාණ පත්‍රයන් හැර අභිනව පත්‍රයෙන් ගැවසී සිටියහ. මාගියෙහි පිටිමං හැර මහ අවුරා සිටි කෙත්වල ශස්‍යයන් කපා ගෙණ වැටකඩුලු නැතිව නුඹ වඩනා මාගිය ද නිරවුල් විය. සියලුජනයන්ගේ රොගදුක් සංසිදී කොටුගෙවල් පිරී ඉතිරී තිබෙන ධාන්‍ය ඇති කාලය හෙයින් බත් බුලත් ආදීන් ද සමෘඩ්ධිය. ඉතා සිහිල් ඉතා ග්‍රීෂ්ම නො ව සමවූ කලැ යි යනාදීන් දන්වා ගමන පිණිස යාවඤ්ච සිටිකල්හි බුදුරජා නන් වහන්සේ කිමෙක්ද? කාලුදායි සථවිරයෙනි! කවර කාරණය

කින් තෝ මාගිය වර්ණනාකරන්නෙහිදැ සි විචාරා වදාළ කල්හි කාලුදායි ස්ථවිරයන් වහන්සේ දන්වනසේක්, සවාමිදරුවූ බුදුරජාණන් වහන්ස! දැන් සුඛෝදන රජ්ජුරුවෝ ජීවිත්‍ව මහලුව සිටිති. නුඹ වහන්සේගේ වියොග දුඃඛස්පර්ශයෙන්ම අභිභූතව ඉතා කෘශවූ ලිහිල් ශරීරව නුඹවහන්සේ දක්නාකැමතිව මා ඇතුළුවූ දසදහසක් අමාත්‍යයන් දහවාරයෙක දූතමෙහෙවර පිණිස ම එවා තව දක්වාත් දූතගත නොගි මහ බල බලා නුඹවහන්සේගේ දක්ම ම ප්‍රාර්ථනා කර කර ගිදිති. එසේම නුඹවහන්සේගේ සියලු බන්ධුවරයෝ ද නුඹවහන්සේගේ දක්ම ම පත පතා ගිදිනාහුය. එහෙයින් ඒ සුඛෝදන රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති හැම බන්ධුසමාගමයට අනුග්‍රහ කොට වැඩවදුළ මනාකාලය සි ආරාධනා කළසේක.

ඒ වේලෙහි සවාමිදරුවෝ පූජිබුදුවරයන් බන්ධුන්ව සඞ්ග්‍රහ කළාවූ කාලය ද මේ යසි දැන ඒ මාගේ ප්‍රවේණිවංශ චාරිත්‍රය කෙරෙමි සි සිතා වදරා කාලුදායිය! මම බන්ධු සංග්‍රහයට යෙමි, එබැවින් ගම්කවත් පුරා නික්මෙන සේ භික්ෂුසඞ්ඝයාට තෝ ම කියා රැස්කරව සි වදළසේක. උන්වහන්සේ ද ඒ අසා බුදුන් වදළබස් මුදුනෙන් පිළිගෙණ එතොණෙහි ම එ පවත් භික්ෂුසඞ්ඝයා වහන්සේට දන්වූ කල්හි අහු මගද දෙරටින් මහණව රහත්වූ දස දහසක්දෙනා වහන්සේය, කිඹුල්වත් නුවරින් රජමෙහෙවරින් අවුත් මහණව රහත්වූ දසදහසක් දෙනා වහන්සේය යි මෙසේ විසිදහසක් පමණ රහතන් වහන්සේ සියලු ගම්කවත් සපඟ, සොභාසම්පන්නවූ සුරක්ත පාංශුකූල චීවරයන් ධරාගෙණ අවුත් බුදුරජාණන් පිරිවරා සිටගත්සේක. එ කෙණෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දුරුතුමස පවන් මැදින්මහ දක්වාම දෙමස මුළුල්ලෙහි නිබඳ වාසයකළාවූ වෙළුවනාරාමයෙන් එම මස මැදි පොහෝදා නික්ම ඒ විසිදහසක් පමණ රහතුන් වහන්සේ පිරිවරා ගෙණ ඒ රජගහ නුවර පවන් කිඹුල්වත දක්වා සැටයොදුන් පමණ ඍාගීය සැටදවසකින් යෙමි සි සිතාවදරා දවස දවස යොදනක තැන් බැඟින් මහ ගෙවා අතරමහ ගම ගම දී මහත්වූ ධර්ම දෙශනාවන් පැවැත්වීමෙන් බොහෝ සතුන් සඟමොක් පුරට පමුණුව පමුණුවා අවිච්ඡාතානුපමවූ බුබලීලායෙන් තමන් වැනි විතරාගී විතදෝසී විත මෝහී බුදුපිරිසෙන්ම පිරිවරණලදුව තරු පිරිවැරූ පුන්සඳමඬල සේ දුටු දුටුවන් ඇස් නිමවමින් සිත් නිමවමින් පින් පුරවමින් මහත් ආශ්චර්‍යවූ අපරිමිත බුබලීලා යෙන් වඩින්ට පටන්ගත්සේක.

ඒ දැක කාලුදායි නම් තෙරුන් වහන්සේ බුදුන් නික්මුණු දෙවෙනි දා උදැසනම බුදුන් වඩනාබව රජ්ජුරුවන්ට දන්වා පහද වමි යි සිතා ආකාශයෙන් වැඩ රජ්ජගයි පෙණී ගියසේක. එකල්හි සුඛෝදන රජ්ජුරුවෝ ඒ මහතෙරුන් වහන්සේගේ ශාන්ත දැන්ත සුවිනීතවූ විශිෂ්ට ශ්‍රී විලාසය දැක ඒ දුටු පමණින් ම මපුතනුවූ බුදු රජානන් වහන්සේ ද වඩනාබව නියතය යි දැන බුදුන් දුටුවා සේ සතුටුව පෙරමගට ගොස් තෙරුන් වහන්සේ අතින් පාත්‍රය ගෙණ සිංහාසනයෙහි වඩාගිදුවා කිමෙක්ද? ම පුතනුවන් වහන්සේ මොබ එන සේ නුඹ විසින් කරණලද ආරාධනාව පිළිගත් සේක්ද? උන් වහන්සේගේ වෙශයත් නුඹවැනිදැ යි විවාළහ. එබසට තෙරුන් වහන්සේ එසේය, මහරජ දැන් මොබට වඩනා පිණිස විසිදහසක් රහතුන් වහන්සේත් පිරිවරා නික්ම මග වඩනාසේක. ඒ වෙශයත් මාගේ මේ ප්‍රව්‍රජිතවෙශය හා සමවී නුබුදු ඒ ශාස්තෘන් වහන්සේ මහත් බුබලිලාගෙන් සියදහස් ගුණයෙන් විශිෂ්ට සේකැ යි දැන්වූ සේක.

ඒ අසා රජ්ජුරුවෝ බුබලිලාව කෙබඳුදැ යි විවාළහ. එවිට මහරජ සියලු දිව්‍ය මනුෂ්‍යවූ ලීලාවන් අභිභවා සිටිසේකැ යි යනා දීන් මහාසම්පිණ්ඩනීදානයෙහි ප්‍රකාශවූ ක්‍රමයෙන් බුබලිලාව වර්ණනා කොට වදාළසේක. ඒ අසා අතිශයින් සතුටුවූ රජතෙම තමන් පිණිස පිළියෙලකළ භොජනයෙන් පාත්‍රයපුරා දන් දී වළඳ, ඉක්බිති ඒ පාත්‍රය සෝදා සුවඳසුන්නෙන් උලා පිරිසුදු කොට පෙර ගිහිව වසනකල අනුභවකොට පුරුදු අඟවූ තුන්හවුරුදු සුවඳ කවා තුබූ සුවඳ ඇල්සාලේ බත් හා නොයෙක් සූප ව්‍යඤ්ජන රසයෙන් පාත්‍රය පුරා ම පුතනුවන් මා කෙරෙහි ප්‍රේමය ඇතහොත් අනික් දැනෙක් නො වළඳ මාගෙන් ම යැවූ බත් වළඳන්වා වදාළමැනවැ යි කියාත් ආරාධනා කොට මෙ නුවරට වඩනා කාක්කල් අතුරුමහට මෙයින් පිණ්ඩපාත දැනය නුඹවහන්සේ ම ගෙණ යනසේක්ව යි කියා පාත්‍රය තෙරුන් වහන්සේ අත ම තබාලූහ

එකල්හි තෙරුන් වහන්සේ මේතන පටන් ආකාශයෙන් මා යන නියාවත් පාත්‍රය බුදුන්ට පිළිගන්වන නියාවත් බුදුන් බත්වළඳන නියාවත් රජහට පෙණේව යි අධිෂ්ඨාන කොට නුනස්තෙන් තැගී හැමදෙනා බල බලා සිටිය දී පාත්‍රය නිලහාඛරාජයෙකු සේ පෙරටුව හැර අහසින් ම වැඩ පාත්‍රය ගෙණ බුදුන්ගේ ශ්‍රීහස්තයෙහි තබාලූසේක. බුදුරජද ඒ බත් වළඳ වදාළසේක. මෙම ක්‍රමයෙන් තෙරුන් වහන්සේ ද දවස දවස බත් පාත්‍රයක් බැහින් එසේ ම ගෙණගොස් පිළිගන්වනසේක. බුදුහු ඒ බත් ම වළඳ වදරණසේක, වළඳ අන්තයෙහි එම තෙරුන් වහන්සේ ද දවස දවස රජගෙට ගොස් අද බුදුරජ මෙතෙක් තැන් ඉක්

මෙවා දැක්වේකැ සි යනාදීන් එම මහාසම්පිණ්ඩ නිදානයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් අනෙකප්‍රකාරවූ බුදුගුණ ප්‍රතිසංයුක්ත ධාර්මික කථාවන් කියා කියා ඒ සුඛෝදන රජ ප්‍රමුඛවූ සියලු රජකුලය බුදුන් කෙරෙහි පහදවන්නේක. ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ "එත දග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං කුලූපකානං යදිදං කාලුදායි ති" යනුවෙන් එතදග්ග පාලිය වදාරා මේ ශාසනයෙහි කුලයන් පහදවන්නවුන් කෙරෙහි කාලුදායි තෙරුන් වහන්සේ අග්‍රතාන්පත්තොට තනතුරු දුන්සේක. මෙසේ සැටදවසකින් වැඩ වෙසක්මස මැදි පොහෝදා බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුරයට පැමිණිසේක.

එකල්හි එක්ලක්ෂ සැටදහසක් පමණවූ ශාක්‍ය රජදරුවෝ අපගේ නෑ උතුමානන් වහන්සේ දක්නට ලදුම්හ සි සතුටින් රැස්ව විසිදහසක් රහතුන් වහන්සේ හා අප භාග්‍යවතුන් වහන්සේට විසි මව විවෙක සථානයක්ම වියයුතු බැවින් කවරනම් තැනක් සුදුසුදෝ හෝසි පරික්ඛාකරන්නාහු න්‍යග්‍රොධ නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ උයන ඉතා රම්‍යය. එහි විහාරය කළමනාය සි මන්ත්‍රණය කොට ඒ හැම ශාක්‍යරජදරුවෝ අභිමානය බලවතරහෙයින් මෙසේවූ ද කතිකාවක් කළාහුය. සිඛාවීකුමාරයෝ තමන් බුදුවූබවමිස අප අපගේ බාල මලනුවෝය බැනනුවෝය පුතනුවෝය මුනුබුරාවෝය එහෙයින් ඇමදෙන ම වදින්නත් නොහැකිවම්හ. සෙසු ලොකයෙහි මහලු රජදරුවෝ ද දැන් උන් වදිත්මය. මිනිසුන් තබා දෙවියෝ දක්වාත් උන් වඳිත්මය. එසේ ඇතිකල අප නො වැඳ සිටින ලොව මහත් අසඝකුදු උපදනේය. අහෝ මෙයට අපි කුමක් කරමෝදැයි කතිකා කරන්නාහු ඔවුන් අතුරෙන් සමහර කෙනෙක් කියන්නාහු අපි මෙයට හොඳ උපායක් දනුම්හ. ඒ සියලුම ලදරු කුමාරයන් ඉදිරියෙන් සිටුවා ඔහු හැම වඳිනා කල්හි අපිද වඳින්නාහු මෙන් ඔවුන්ගේ පිටිපස ලස්ව ම හිඳගණුම්හ. එවිට මේ අපගේ සිදුර කියා වෙක් නෙ. දක්නේය සි කිවුය. ඒ අසා හැම ශාක්‍ය රජදරුවෝම සමාධිව මේ උපාය අනික්කට්හට නො හඟවා රැක්කයුතුය සි සම්මත කොට ගෙණ බුදුන් වඳනා මඟ යොදනක් පමණ තැන් අලඞ්කාත කරවා වඳනට පෙර ගමන්කරන්නාහු සියලු අලඞ්කාරයෙන් ශොභමානවූ සොළොස්හැවිරිදි සිටුකුමරුවන් පන්සියයක් දෙනා සරහා සුවඳමල් දී පළමුකොට ම පෙරමඟට යවා සොළොස් හැවිරිදි සිටුකුමරියන් පන්සියයක් සරහා මහනෙල්මල් මිට අතට දී

දෙවැනිව යවා ඊට ඉක්බිත්තෙන් පන්සියයක් ශාක්‍ය කුමරුවන් සරහා මහපෙළහරින් තුන්වැනිව යවා පන්සියයක් ශාක්‍ය කුමරියන් සරහා එසේම සතරවැනිව යවා අනිකුදු ගිතෙල් මී ශර්කරාදි නොයෙක් පානවර්ගයන් හා විසිතුරු ධජ පතාක දඹුවැට පහන්ආදි නොයෙක් පූජොපකරණයන්ද යවා තෙපි හැම ශාස්තෘවූ අප භාග්‍ය වතුන් වහන්සේ පිරිවරාගණ මේ සියලු පූජොත්සව පැමැත්වීමෙන් ගංගාතීරයට එව සි කියා සලස්වා තුමූ හැමදෙනද න්‍යග්‍රොධ ශාක්‍ය යන්ගේ උයන්හි සියලු ප්‍රාසාද කූටාගාර මණ්ඩපසාලා රාත්‍රිස්ථාන දිවාස්ථානාදීන් සමලංකෘතකොට විහාරය කරවා එහි සිවුදිග ද සම්මිශ්‍ර නිලවර්ණ ගොමයෙන් උලා ලදපස්මල් විසුරුවා සුදුවැලි න් බදවා සවර්ණිකාරකායෙන් හා සුවදමල්දම් ආදීන් අලංකෘතකොට ඒ ඒ තන්හි සවර්ණ රජතමය වූ අනෙකප්‍රකාර වෙහෙරාසිටි ප්‍රදීපා ධාරයන් පිහිටුවා හාත්පසින් පද්මෝද්පල කුසුමයන් හාරවූ පුන් කලස්තබ්බවා විසිතුරු තොරණපංකතින් නහා අනෙකප්‍රකාරවූ මල් ඇඟැ පහන් ඇඟැයෙන් අලංකෘතකොට ඒ උයන්හි වෘක්ෂයන්ගේ කඳ අතුපතරවල නානාප්‍රකාරවර්ණපිළියෙන් වෙලා ඒ උයනද ශක්‍ර යන්ගේ නන්දනවනය සේ සරහා නිමිනල්හි ඒ හැම ශාක්‍ය රජදරු වෝ ම තම තමන්ගේ විභවානුරූප අලඞ්කාරයෙන් සැරහි තමන් පස්වැනිව එක්ලක්ෂ සැවදහසක් ශාක්‍ය රජදරුවෝ බුදුන් වඳනා පෙරට නික්මුණාහුය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ ඛන්ධවූ ශාක්‍ය රජකුමරුවන් විසින් පිරිවරණසේක් අනොපමවූ බුඛවිලාසයෙන් දිලිහි දිලිහි රොහිණී නම් ගංගාතීරයට සම්ප්‍රාප්තවූ සේක. ශාක්‍ය රජදරුවෝ එහි භාග්‍යවතුන් වහන්සේ ව ද විසිදහසක් පමණ භික්ෂු සඞ්ඝයා වහන්සේට ද ඒ රොහිණී නම් ගඟින් එතරවන පිණිස විසිතුරු කම්මන්තයෙන් බොබනා න්වූ සඳු එහි රත්නමණ්ඩපයන් නංවා හාත්පසින් මල්දම් සවණී ජාලයෙන් පරික්ෂෙප කොට නහනලද ධජ පතාකාදීන් සශ්‍රීකවූ ඒ මණ්ඩප මධ්‍යයෙහි මහාඝි රත්නාපයර්ඞ්ඛයක් සාදු දිවම්මනක් මෙන් සජ්ජිත කළාහුය. එකල්හි සර්ගුණ රත්න මැදිරාගමානවූ අප භාග්‍යවතුන් වහන්සේ ඒ රත්නමණ්ඩප මධ්‍යගත රුවන්ආසන මස්තකයෙහි සහස්‍රරශ්මීන් බරජනා සූර්‍යමණ්ඩලය සේ දිලිහි දිලිහි වැඩඋන්සේක. භික්ෂු සඞ්ඝයා වහන්සේ ද එසේම සජ්ජිත කරණලද ශෛලමාන තැවුලක සැදී වැඩඋන්සේක. එසේ ඇතිවූ කල්හි අන්‍යත්‍ර ශ්‍රීඝනවිලාසශ්‍රීන් විරාජමානවූ භාග්‍යවතුන් වහන්

සේගේ හැමසතුන් නෙත් සිත් පැහැරගන්නා අවිතෘප්තිජනක වූ බුඩශ්‍රී විලාසය දැක දැක දෙ ගොඩ සිට ශාක්‍යවංශ ඥාතිසමූහයා විවිත්‍ර වස්ත්‍ර සුවඳ මාලාභරණයෙන් සැ හී ධ්වජපතාක පූර්ණඝට ප්‍රදීප වාමරාදි ද්‍රව්‍ය ගත් අත් ඇති ව ගංගා මස්තකයෙහි අප්‍රමාණ වූ ශ්‍රී විලාසයෙන් දිලිඟි දිලිඟි වඩනා බුදුන් ම බල බලා සතුටු සතුටු ව නොයෙක් පුද පවත්වමින් සැදී සිටියාය. එ වේලෙහි සර්වජන ප්‍රිය ඔකර වූ භාග්‍යවතුන් වහන්සේ තැවෙන් බැස ගංගාතීරාභිමුඛ විසි දහසක් පමණ වූ මහරහතන් වහන්සේත් පිරිවරා සවණක් රැසින් දිලිඟි දිලිඟි වැඩසිටියේක. තැවත ඤාතිසමූහයා විසින් පිරිවරණ ලද සුඛෝදන මහරජ තම සම්භාවනා ප්‍රතිමණ්ඩිත රාජ්‍යශ්‍රීවරූ දරු ලදරු රාජකුමාරයන් පෙරදැරිකොටගෙණ ඒ ගංගාතීරය පටන් න්‍යග්‍රෝධාරාමය දක්වා මහත් උදාරතර වූ පූජා පෙළහරින් විසිදහසක් ක්ෂීණාශ්‍රව ශ්‍රාවකයන් වහන්සේ හා බුදුරජාණන් වහන්සේ වැඩමකරවා ගණ න්‍යග්‍රෝධාරාමයට ගොස් සරහා පිළිගෙලකරණ ලද ඒ විහාරය පිළිගැන්වීය. ලොකාභිමි වූ බුදුරජාණන් වහන්සේ එහි විසිදහසක් රහතන් වහන්සේ පිරිවරා බුඩාසන මස්තකයෙහි සවණක් රැසින් දිලිඟි දිලිඟි උදයගිරි පර්වත මස්තකයට පැමිණි බාලාර්කමණ්ඩලය සේ වැඩඋන්සේක. ඒ දැක බුදුගුණ නො දන් ඒ හැම ශාක්‍යරජදරුවෝ ලදරු රජකුමරුවන් ලඟට කැඳවා කන් කොදුරමින් කතිකාකළ ලෙස මෙසේ මෙසේ කියති. "දරුවෙනි තෙපි අපට පෙරට පෙරටම සිට සිඛාණ්ඩිකුමාරයන් වැඳලව. අපි නොපැහැමට පසුවලා නො ගඟවා හිඳුම්හ. මේ වග කාටත් නෝ දන්වමා"යි උගන්වා උගන්වා ලූහ. එබස් අසා බුදුන්ව බාලවූ රජකුමරුවෝ පෙරටුව සිට බුදුන් වැඳ මහලු නැයන්ට අවකාශ නො දී ම දහස් ගණනෙක් ඉදිරිපිට ඉඳගත්හ. ඉක්බිතිව සුඛෝදන රජ්ජුරුවන් ප්‍රමුඛවූ මහලු නැයෝ ද ඔවුන් අසුඅස්සෙහි සැඟවී හිඳගත්තාහුය.

මෙසේ ඒ ශාක්‍ය නැයෝ තමන් වහන්සේ නො වැඳ උන් හෙයින් පස්පැදිස්නා නෙත්‍ර උන්මීලනය කොට ඤාතිගණයා බලන සේක් වෙතොපරිය ඥානයෙන් ඔවුන්ගේ අදහස් දැන වදාරා මාගේ මේ නැයෝ හැම මොහයෙන් වැඩිමහලු හෙයිනුත් බුදුන් බල නො දත් හෙයිනුත් මා නො වඳනාහුය. පූර්ව බුදුවරයෝ නැයන් ගෙන් වැදුම් කෙසේ ලද්දාහුදැයි බලනුවෝ ලොව අද්භූතවූ බුදුබල ප්‍රකාශකොට යමකප්‍රාතිහාර්‍යය දක්වා මුළුලොව විස්මයපත්කොට නැඟන්ගෙන් වැදුම් ලද්දාහුයයි දැන අනන්තාපර්‍යන්තවූ බුදුවර

යන්ගේ චාරිත්‍රවූ ඒ මාගේ වංශචාරිත්‍රය කිරීමෙන් ම නැගෙන්ගෙන් වැදුම් ලබම් සි සිතා වදරා:- පිතකසිණ සමාපත්තියට සමවැද මා ඇඟින් නික්මුණු ප්‍රභාඝණයෙන් දසදහසක් සක්වල එකාලෝක වේවා සි අධිෂ්ඨාන කොට ශ්‍රී බුඩශරීරයෙහි අඟලක් සාතැනින් රන්වන් බුදුරුස්කදෙක් නික්මවූසේක. ඒ බුදුරුස්නද දිවගොස් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වට ඇති සක්වලගැබ මුළුල්ලෙහි වට තුන්යලක් දිව මේ සක්වලගැබ වට අවකාශ මද හෙයින් අකනිටා බඹලොව දක්වා නැඟි මේ සියලු සක්වල කුහරය ඒ රන්වන් රැසින් ම පුරාසිට එසින් ඉතිර නික්ම ගොස් මේ සක් වළට හාත්පස්හි දසදහසක් සක්වල මුළුල්ලෙහි ද මෙම ක්‍රමයෙන් ම රන්වන් බුදුරැසින් ම පුරාගෙණ හිරු දහස් සුවහස් පැහැනැංගා සේ එකාලෝක කෙරෙමින් සිටගත. ඒ ශරීරප්‍රභාව බඹමොබ දිවන්නා දක දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්ම සෙනාව අපගේ බුදුහු අද විශෙෂවූ ධර්මදේශනාවක් දෙශනා කරණ සේක්වනැ සි ඉතා සනකුළුව අනෙකප්‍රකාර පූජාභාණ්ඩයන් ගෙණ ඔවුනොවුන් පරයා දිව ආකාශය මුලුල්ලෙහි විහිදපු සිකියම් කඩක් සේ දිලිහි දිලිහි මේ සක්වල ගැබ පිරි ගහණව සිටගත.

එ කෙණෙහි මාගේ ම සවාමිදරුවූ භාග්‍යවතුන් වහන්සේ අභිඥපාදක චතුර්ථධ්‍යානයට සමවැද මේ දසදහසක් සක්වල පමණට රුවන් සක්මනක් මැවියෙව සි අධිෂ්ඨාන කොට ආකාශය බලා වදළසේක. ඒ ඇසිල්ලෙහිම මෙරගල් මුදුනෙහි දසදහසක් සක්වලම් පූර්වක්‍රමාවය පවන් පශ්චිම වක්‍රමාවය දක්වා දිගින් එක්දහස් දෙසිය තුන්කෙළ පන්සෘෂ්ස් ලක්ෂයක් යොදුන් හා පුළුලින් දස දහසක් යොදුන් තැන් පැතිර සිරිතාවූ ඒ දසදහසක් යොදුන් තැන ලොහිත වණ්වූ රුවන් වැලිතලාවෙන් හා ඒ ලොහිතඛ්ක රුවන් වැලිපටව දෙපාර්ශ්වයෙහි පලලින් දෙදහක් යොදුන් පමණ තැන මුතු පබළු පලිඟු වෛදූර්‍ය්‍ය මසාරගල්ල මරකත කොමලවිද්‍ය ආදිවූ සප්තවිග්‍රහ රුවන් වැල්ලෙන් හා මිශ්‍රක රුවන් වැලිපව දෙකින් දෙපටක් පලල දෙදහක් යොදුන් තැන ඉඳුනීලමාණික්‍යාමය වූ රුවන් වැල්ලෙන් හා මෙසේ ගැවසී ගත්තාවූ පූර්ණසක්වල පඩින් පශ්චිම සක්වල මුවවිට අතරදිග කෘතාවකාශ රුවන් වැල්ලෙන් විසි තුරු සිතියමක් තඟා පැහැ සිවිගා ඔපලුවක් මෙන් අතිශයින් ශොභාසම්පන්නවූ රුවන්සක්මනක් මැවී තිබේග.

ඉක්බිත්තෙන් සවාමිදරුවෝ ඒ රුවන්සක්මන දක වදරා උදයගිරිපර්වතයෙන් පැන නැඟි ලඝිරු මඬලක් සේ කල්පාන්ත වාතවේගයෙන් අහස්කුසට පැන නැඟි ඝනරත්න මෙරක් සේ සවණක් රැසින් දිලිහි දිලිහි ඒ රුවන්සක්මණට නැඟි වදරා තමන් වහන්සේට අභි

මානයෙන් කොවැඳ හුන් නැගණිගේ හිස්මුදුන්හි පස් වගුරුවන් තා සේ එහි සක්මන්කරන්ට පටන් ගෙණ මේ දසදහසක් සක්වල මුළුල්ලෙහි බ්‍රහ්මයෝ ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද සිවුපාවෝද පක්ෂීහුද දියෙහි ගොබෙහි වෘක්ෂ සත්ත්ව ද හැම නරකවල සත්ත්ව ද ලොකාන්තරික නාරකාදි හැම නරකවල දුග්ගන්තා සත්ත්වයන් හා ප්‍රෙතයෝ ද යටත් වෘක්‍යයෙන් මේ දසදහසක් සක්වළ මුළුල්ලෙහි කිහිබි කුහුබුවන් දක්වාත් හැම සත්ත්වයෝ ම තොවැරද තොමුලාව මාගේ මේ බුබ විලාසශ්‍රිය දකිත්ව යි අධිෂ්ඨාන කෝට වදළසේක.

ඒ අධිෂ්ඨාන චිත්තය හා සමගම දසදහසක් සක්වල මුළුල් ලෙහි කුරු කුහුබු ආදි ක්ෂුද්‍ර ප්‍රාණීන් පටන් මහබඹුන් දක්වා සියලු සත්හුම ඔවුනොවුන් සිත්සේ බුදුන් බලන්නට පටන්ගත්හ. එපමණක් මතු තොවෙයි, ඒ හැම සත්හු ම ඔවුනොවුන් දකිති. එහි බ්‍රහ්මයෝ කුහුබුන්ට පෙණෙති. කුබුහුවෝ බ්‍රහ්මයන්ට පෙණෙති, දසදහසක් සක්වල මනුෂ්‍යයෝ තම තමන් ගෙදෙර සිට ඒ සක් මන්කරණ බුදුන් තම තමාගේ අභිමුඛයෙහි මෙන් දකිති. එසේම වදරණ බණ අසන්නාහුය. තවද දසදහසක් සක්වල සෙළෙස්ලක්ෂ සැවදහසක් පමණ නරකවල ගිනි නිවී එහි පියුම් පෑනතැංහාහ. එකෙණෙහි ඒ නරකවල දුක්විඳිනා හැම සත්ත්වයෝ ම දුකින් මිදී සිහිල්වූ ශරීර ලද්දාහ පියුම් පිටට පැනතැඟි බුදුන් දැක දෙහොත් මුදුන් දී අනේ බුදුරජානෙනි! සෙලෙ සක්මනින් පහනාවන්න අනේ හිමියානෙනි! මේ නරකවල නිවූ ගිනි නැවත දැල්විය කෝ දෙන්න. අනේ සවාමීනි බොහෝ දවසක් දුක්ගෙණ දැන් මේ ගැලවී ගියම්හ යි යනාදීන් ඉතා බැගෑ අඳෝනා තෙපුල්ම කියා කියා බුදුන්ම බල බලා සතුටු සතුටුව සිටගත්තාහුය. තවද මේ දසදහසක් සක් වළ මුළුල්ලෙහි අරුනල අසංඥකලවල සත්ත්වයන් හැර සෙසු සියලු දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණී ගරුඩ ගන්ධර්ව සිබවිදුරාදීහු ද තමා තමන් බල පමණින් අනෙකප්‍රකාර පූජාභාණ්ඩ ගෙණ යටකී ක්‍රම යෙන්ම මේ සක්වළට රැස්ව ලෝකනාථයනවූ බුදුරජානන්වහන් සේව පූජාකරමින් එකපැහැර සාධුකාර දුන්හ.

මෙසේ දසදහසක් සක්වළ එක්ම මතුල් ගෙයක් මෙන් ලිලෝ පෙතව ඇරහි සිටිගත් වේලෙහි අඩවණ්ණන බුඩරශ්මි මාලාවක් දස දිග විහිදුවා කෙළගණන් සමාපත්තියට සමවැද පුළුසක්වළ මුව විවින් පශ්චිම සක්වළ මුවවිවරද පශ්චිම සක්වළ මුවවිවරින් පුළු සක්වළ මුවවිවරට ද ඔබනොබ සතරරියන් පමණවූ සක්මණෙක්හි

සක්මන් කරන්නා සේ බණ වදරමින් සක්මන් කරණසේක් තෙජෝකසිණ සමාපත්තියට සමවැද දසඳහසක් සක්වල දුම්වැටි ඉවා සියලගිනිම් ගිනිකඳ හරින්ට පවත්ගත්සේක. එකෙණහිම ආපොකසිණ සමාපත්තියට සමවැද එසේ ම දියකඳ හරින්ට පවත් ගත්සේක. එයින් ගිනිකඳ සඳහා තෙජෝකසිණ සමාපත්තියට සමවැද දකුණු උරමඬලෙන් නාඹතල්කඳක් සා ගිනිකඳක් හළ සේක. එවිට බුදුගිරි බල බලා සිටි දිව්‍ය මනුෂ්‍ය සේනාව ඔවුනොවුන් ඉහිලා බලා අර කිමෙක් ද, දකුණු උරමඬලෙන් මහත් ගිනිකඳක් නැගෙන්ට වනැයි කියා ශ්‍රුස්ම නොහෙලන තුරුම දියකඳ සඳහා ආපොකසිණ සමාපත්තියට සමවැද වම්උරමඬලෙන් නාඹතල් කඳක් සා දියකඳෙක් හළසේක.

ඒ දැක එමබල කොල මෙවිට බලා ගන්න ව වම් උරමඬලෙන් ද දියකඳෙක් නික්මිනැයි කියා බස නොහරිණ අතුරෙහිම දියකඳ නැගී උරෙන් ම ගිනිකඳෙක් බසින්ට වන. ඒ දැක මේ කිමෙක් ද? දියකඳ නැගි නැනින් ගිනිකඳ බසින්ට වනැයි බබළන කල ම දියකඳ බට උරෙනුදු ගිනිකඳෙක් නැගෙන්ට වන. ඒ දැක මේ කවර ආශ්චර්‍යයෙක් දැ යි බලන්ම එවිහස දකුණුකන් සිදුරෙන් එසේම ගිනිකඳෙක් නැගෙන්ට වන. ඒ දැන තෙල කිමෙක්ද? දකුණුකන් සිදුරෙන් ගිනිකඳක් නැගෙන්ට වනැයි කියන්ම වම් කන් සිදුරෙනුදු එසේම නාඹතල්කඳක් සා දිය කඳෙක් බසින්ට වන. ඒ දැක අහෝ මේ කුමන විස්මයෙක්දැයි කියා නො නිමෙන තුරුම ගිනිකඳ නැගි දකුණු කන්සිදුරෙන් ම නාඹ තල්කඳක් සා දියකඳෙක් බසින්ට වන, ඒ දැකද මේ කුමන විස්මයෙක් දැයි බල බලා සිට මි සබදිනි මේ දියකඳෙක්හි සිහිලසයක් බලවයි කියති. එවිට සමහරු දියෙහි සිහිලස කියනු ම කිමිද? මේ ගිනිකඳ දියකඳ වත් වඩා ඉතා සිහිලසය, මේ බලව බලවයි කියති. ඒ බලා ඇසිපිය නො හෙලකල් අතුරෙහි ම දකුණුකානෑ සිදුරෙනුදු වම්කානෑ සිදුරෙනුදු දකුණු ඇසෙනුදු වම් ඇසෙනුදු එසේ ම දියකඳ සා ගිනිකඳ බසින්ට වන. දියකඳ සා ගිනිකඳ නැගෙන්ට වන. දැන දසඟලිවලිනුදු දෙපය දසඟලිවලිනුදු එ සිය අසුවක් සඤ්ඡවලිනුදු අවුතුන් කෙළක් පමණ කෙසධාතූන්ගේ කැවිවූ තුන් සියඇවක් කෙත්පුඩු වලිනුදු එසේම නිකඳ සා දියකඳ බසින්ට වන, එසේම දියකඳ සා ගිනිකඳ නැගෙන්ට වන, නවඅනුදහසක් රෝමකූපයන් අතුරෙහිදු එසේ ම රෝමකූපයක් රෝමකූපයක් පාසා නාඹතල්කඳ නික්මෙන්නාසුග, එකෙණෙහි ඒ ඒ රෝමකූපයක් රෝමකූපයක් පාසා දියකඳ ද නික්මෙන්නාසුග, නැමුත එම අසුඅස්සෙහි

සියලු බුඩශරීරයෙන් හරණ සවණක් රැසින් දසදහසක් සක්වළ පිරී ගැවසී ඉතිරගෙණ බැබළෙන්ට වන. එසින් ශ්‍රීකාදඳ හරණ ඝණයෙහි තෙජොකසිණ සමාපත්තියට සමවදනා සේක. දිගකද හරණ ඝණයෙහි ආපොකසිණ සමාපත්තියට සමවදනාසේන නිල්බුදුරුස් හරණ වෙලෙහි නීලකසිණ සමාපත්තියට සමවදනා සේක. රන්වන්රැස් හරණවෙලෙහි පීතකසිණ සමාපත්තියට සමවදනාසේක. සුදුබුදුරුස් හරණකල ඔදාතකසිණ සමාපත්තියට සමවදනාසේක. සෙසුරුස් හරණකලත් වෙන වෙනම සමාපත්තියට සමවදනාසේක. නොයෙක් රැස් එකවිට හරණකලද නොයෙක් සමාපත්තියට එකවිට ම සමවදනාසේක.

එදු බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් නික්මුණා වූ දියකදින් දසදහසක් සක්වළ මුලුල්ලෙහි වතුරෙන් උතුරවා ගියබැවින් අල්ලක් සාත් නො තෙමුනාවූ බිමෙක් නැත්මය. එසේ හෙයින් මේ දසදහසක් සක්වළය යන බුදුන්ගේ ජන්ම ක්ෂෙත්‍රයෙහි මහපොළොව පස්පවා විමසා බැලුවහොත් ධාතුකොට සිතා පුදත් නමුත් සුදුසු ම ය. එදු එසේ ගලාගිය දියෙන් කුහුඹුවකුටවත් වූ හානියෙක් නැත. එහි තෙමෙනු කැමැත්තන් තෙමේ සි නො කැමැත්තන් නො තෙමෙයි එසේ ම දසදහසක් සක්වළ මුලුල්ලෙහි බම බමා දිවෙන ඒසා මහත් ගිනිකදින් මකුළුහුයක් වත් කළුවිමෙක් වන පමණ හානියක් වත් නො වූයේ ය. තවද එදු දසදහසක් සක්වළින් රැස්වූ බ්‍රහ්මසේනාව ඒ රුවන් සක්මනින් එක් ඇලයෙක තුන්ගවු සාසේසත් ගෙණ සිටගත්හ. එසේම දසදහසක් ශක්‍රසේනාව ද එහි ම අනික් භාගයෙහි එක්සිය විසිරියන් ජයතුරාසක්ගෙණ සැදී සිට ගත්හ, එසේම සුයාම සන්තුසිතයෝ පෙළින් පෙළ සැදී මැණික් මය වැමර මැණික් මය තල්වැට ගෙණ මද මද පවන් පූජාවට පවන් ගත්හ. සෙසු දෙවියෝ මල්වරුසා වැස්වීම් ආදි අනෙප්‍රකාර පූජාපැවැත්වීමට පවන් ගත්හ.

මෙසේ දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ අප්‍රමාණ පූජාත්සව පවත්-මින් ම සිටියදී, ඒ මා ගේ ම සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ ඒ සියලු පූජා විඳ විඳ රුවන්සක්මන සක්මන් කරණ සේක් දසදහසක් සක්වළ මුලුල්ලෙහි ඇවිදිමින් සක්මන් කරණ සේක. එසේ සක්මන් කරණසේක් නමුත් මේ දසදහසක් සක්වළ හැම සතුන්ට ම නො වරදවා එකවිටම පෙණී පෙණී යන සේක.

යටකී ප්‍රමාණයුත් ඒ සෑ මඟත් රුවන්සක්මන මහතැසි කියා බුදුහු මහාශරීරයක් මවාගත්තේත් නැත. තමන් වහන්සේගේ ශරීර ප්‍රමාණය කුඩා යයි කියා ඒ සක්මන කුඩාකොට ගත්සේකුත් නො වෙයි. එසේ ද වුවත් ඒ සක්මනට ම ගොඩනාතරම් නිසි රූප ශ්‍රියකින් යුක්තව හැම සතුන්ට ම පෙණෙනසේක. ඒ මෙබඳු ය යි බුඩවිෂය අවින්ත්‍යවන බැවින් කිසිවක්හු විසිනුත් නො දැක්ක හැක්ක. නො සිතිය හැක්ක. එසේ අවින්ත්‍යවූ මේ බුදුගුණ මහිමය මෑ ඇතුළු වූ හැම සතුන්ට ම වාසනා වේවා. මෙසේ අවින්ත වූ රූප විලාසයක් ඇති මාගේ ම සවාමිදරුවූ බුදුරජානන් වහන්සේ එසේ ම අවින්ත්‍යවූ දෙසනා විලාසයක්ද ඇති බැවින් බණක් වදාරණ කලත් මේ අපසේ පැකිළ පැකිළ නො වදරා දසදහසක් සක්වලින් රැස්වූ මේ සෑ පිරිසෙහි මේ සත්වයා රාග චරිතය, වෙෂ චරිතය, යනාදි ක්‍රමයෙන් එකෙකි සත්වයකුගේ සිත සැතපුන් ආකාරය කින් වෙන වෙන ම බලා ඇසිල්ලකින් තෝරා දැන ඉතා නිපුණව තුඩ තොවකා අනන්තවූ අවින්ත්‍යවූ දෙසනා විලාසඥින් යුක්තව බණ වදාරණ සේක්ම ය.

මේ දසදහසක් සක්වල මෙසේ එකම බුදුන්ගේ බුඩශ්‍රියට අව කාශ ස්ථාන බැවින් එහි හැම සත්ත්වයෝ ම අප බුදුරජානන් වහන් සේගේ රූපශ්‍රී ප්‍රාතිහාර්‍යය බල බලා ඇස් හයාගත නොහී ඉතා විස්මයපත්ව සිටිකල දෙවැනි හිරමඩලක් නැහෙන්නා සේ ලොව විස්මය පත්වීමට ම කාරණවූ දෙවන බුදුකෙනෙකුත් මැවූසේක. එසඳ උණපුරුකක පුරාවූ රන්සුණු සමූහයක් මෙන් මේ සක්වල කුහරය පුරා ගලාසිටිනා මිනිසුන් හා සියලු දෙවි බඹ පිරිස්හු කුල් මත්ව ඔල්වරහඬ නගමින් අර කිමෙක් ද? ආදි එක් බුදුකෙනෙ කුත් වහන්සේය, දැන් මේ දෙදෙනෙකුත් වහන්සේ ය, යි අහෝ විස්මයයි කියමින් ම එකෘහැර තුන්ලෝ වෙවුල්වා ඝාඩ්ගාර දුන්හ. ඒ නිර්මිත බුදුහු සක්මන් කෙරෙමින් බණ වදාරණසේක් වී නම් අප බුදුහු වැඩහිඳ, බණ වදාරණසේක. වැඩහුන් බුදුන් සක් මන් කරණසේක් වී නම් සක්මන් කළ බුදුහු වැඩහිඳිනා සේක, සම හර විටෙක දෙදෙනා වහන්සේ ම සක්මන් කරණසේක, සක්මන් දෙකෙළවර සිට අවුත් මැදිවී දෙදෙනා වහන්සේ ම ආදර දක්වා සමවම අවසර හැර සක්මන් දෙකෙළවරට වැඩ නැවතත් දෙදෙනා වහන්සේ ම ඉදිරියට අභිමුඛවන සේ වැඩ ලංවෙමින් ප්‍රශ්න විවා රණසේක. නිර්මිත බුදුහු විවාලප්‍රශ්න අප බුදුහු විසඳජිතය කරණ සේක. අප බුදුහු විවාලපැන නිර්මිත බුදුහු විසඳනසේක. දෙදෙනා වහන්සේ ම එක්වැනි ව සමීකාරයෙන් සමානවූ රූපවිලාසයක්

ඇතිසේක. එසේම සමානවූ ප්‍රභාවන් ඇතිසේක. සමානවූ බ්‍යාම ප්‍රභා මණ්ඩලයක් ඇතිසේක. සමානවූ ගමන් ඇතිසේක. සමානවූ දෙශනා ඇතිසේක. සමානවූ කටහඬ ඇතිසේක. මෙසේ හැම ලෙසින්ම සමානවූ ඒ බුදුවරයන් දෙදෙනා වහන්සේ මෙසේ දස දහසක් සක්වළ මුලුල්ලෙහි හැම සතුන්ගේ ඇස් පුරමින් සිත් පුර මින් අවිච්ඡාවූ අනොපමවූ බුඩශ්‍රී පාතා වේලෙහි අප්‍රමාණවූ ප්‍රීති වෙගයෙන් පිණ පිණා සතුටු සතුටුව බල බලා සිටි හැම දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීහු ම අතිශයින් විස්මයපත්ව අහෝ මේ කුමන විස්මයක්ද? පෙර අප එක බුදුහෙතෙකුන් වහන්සේගේ බුඩශ්‍රිය දකිමින් සිටි කල ඒ හැම බුදු සිරි දක්නට අප අපගේ නෙත් මදවගියහ. රූප ශ්‍රිය ම මේ දහසක් සක්වළ ඉතිරි ගියාය. එසේ ම එක බුදුහෙතෙකුන් වහන්සේගේ දෙශනා විලාසය ද අස අසා සිටියකල ඒ දෙශනා ශ්‍රිය අසා ගැන්මට අප හැමගේ කන් මදවගියහ. ඒ බුදුවරයන් වහන්සේගේ දෙශනාශ්‍රිය ම ඉතිරිව සිටියාය. එසේ ම දුටු දුටු බුදුසිරි සලකනකල අප හැමගේ ම සිත් මදව ගියහ. අනන්නවූ බුඩ මහිමය ම ඉතිරිව ගියේය. එසේ ඇතිකල දැන් මේ බුදුවරයන් දෙදෙනා වහන්සේගේ බුඩශ්‍රිය අනේ අපි කෙසේ දකිමෝ ද? අනේ අපි කෙ‍ස් අසමෝ ද? අනේ අපි කෙසේ සිතමෝ ද? අහෝ අපි හැමටත් ඔබසේවූ බුදුබලය ම ලදමෝ නම් ඒ හැම නොහැකි නමුදු මෙයට වඩා දැක්ක හැක්ක, ඇසිය හැක්ක, සිතිය හැක්ක, එසේ නොව නො දතහැකි මේ බුදුවරුන් දෙදෙනා වහන්සේගේ බුඩශ්‍රියෙන් ම මේ හැමතැන පිරිගියේ ය.

එකෙණෙහි සතරරියන් ගඩඩා ගෙයකට එකවිට ම හිරමඩල දෙකක් සඳමඩල දෙකක් වැද ආලෝකව ගියා සේ මේසා දස දහසක් සක්වළ මේ බුදුවරු දෙදෙනා වහන්සේගේ අප්‍රමාණවූ බුඩශ්‍රිය ව මේ ප්‍රමාණ නියම ඇති ලොකශ්‍රිය ඉතා පටුව සම්බාධව ගියාය. මෙසේ පටු වූ මේ දසදහසක් සක්වලෙහි බුදුවරු දෙදෙනකුන් වහන්සේ ප්‍රාතිහාර්‍යය පාතා වේලෙහි ලොව කුඩාවූ නියාව වත් බුදුසිරි බොහෝවූ නියාවටත් තරම්වූ සුදුසු උපමාවෙක් අහෝ මාගේ දැසට නො පෙණෙන්නේය. අහෝ මාගේ සිතට නො හැඟෙන්නේය. එතකුදු උවත් දෙලොස් ගොදුන් පමණවූ ගවුගණනින් සතළිස්අටගවු පමණ ඇති ඒ සා මහත් බ්‍රහ්මරාජ යන් දෙදෙනෙකු එක් කැබපතෙක පෙණීගිය බව මෙතැයි සිතන වගමුත් අනොපමය යි මුලකි හෙයින් ඒ කියන්ට ද මම නො හැක්කෙමි. මෙසේ අද්භූතවූ ආශ්චර්‍යවූ අසදෘශවූ අප්‍රමාණවූ ලොව එකහෙලා විස්මයපත්වූ බුදුසිරි ප්‍රාතිහාර්‍යයන් ලොව ඇම දක්ව දක්වා ඒ රුවන්සක්මන සක්මන්කරණ වේලෙහි මහත් ඥානඇති

ඡොඛඡඛිඛ ප්‍රඥයෙන් සමන්විත සිවුපිළිසිඹියාවට පැමිණි දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන් වහන්සේගේ දිව ඇසින් සියලු පිරිස බලා සිටින සේක් මේ ඤාතිගණයා සහිත මහපිරිසෙහි ගම්භීරවූ බුදුගුණ ප්‍රකාශවීමෙන් වන ධම්දෙසනාවක් පහළවීමට සුදුසුය. එහෙයින් මම මෙයින් පන්සියයක්දෙනා හා අදෘශ්‍යමානව සැටගොදුන් තැන් රජගහනුවරට ගොස් ගිජ්ඣකූට පර්වතයෙහි සිට ලොව ඇමට පෙණෙන්නාසේ ඍද්ධිවිකුර්ණය දක්වා එයින් රුවන්සක්මනට ගොස් ආරාධනා කෙරෙමියි සිතා වදුරා එකෙණෙහි නිලකසිණ චතුර්ඛ්‍යාන සමාපත්තියට සමවැද මහ පිරිසට නො හඟවා ම පිරිවර පන්සියයක් භික්ෂූන් වහන්සේ හා රජගහනුවර ගිජ්ඣකූටයට වැඩ එහි සිටි ඒ තමන් පිරිවර කැඳවා ඇවැත්නි! මේ සියලු දසදහසක් සක්වළ හැසිර සිටි මහපිරිස පෙණී පෙණී බුදුන්කරා ගොස් කථාවක් කරම්හයි කියා ඔවුනොවුන් හා අහසට නැගී එසේ අධිෂ්ඨානකොට හැම සතුන්ට පෙණී පෙණී රුවන්සක්මන බලා නික්මුනුසේක.

එවිට දසදහසක් සක්වළ සියලු සත්ත්වයෝ සැරියුත් සාමීන් වඩනා ඒ ශ්‍රී විලාසය දැක එම්බල කොල පළමු එක් බුදුකෙනෙක පසුව දෙ බුදුකෙනෙක දැන් බල තවත් බුදුකෙනෙක් එති. ඒ තුන් බුදුන්ගේ ම බුදුසිරි දක්නට ලදුම්හයි කිය කියා සතුටුව බලනකල පස්සෙහි වඩනා පන්සියයක්දෙනා වහන්සේ දැක අනේ බල දෙතුන් බුදුකෙනෙකුන් වහන්සේලා නොවෙත්. පන්සියයක් බුදුවරයන් වහන්සේලාය. තෙල අර ගැන ගණුව සි කිය කිය, සතුටු සතුටු ව සිටියදීම මහත්වූ ප්‍රාතිහාර්‍යය දක්ව දක්වා පන්සියයක් රහතුන් පිරිවරා ගෙණ රුවන්සක්මන කෙළවරට වැඩ චක්‍රවර්තිරජක්හු සමීපයට පැමිණි ප්‍රධාන පුත්රුවනක්සේ මහත් ආදර දක්ව දක්වා අප මණවූ සනෙතාෂයෙන් බුදුන් වැඳ වැඳ අහස්හි මොරජනා ගිර මඬලසේ බුදුන්ගේ ශ්‍රී මුඛමණ්ඩලය බල බලා සිට:-

සාරිපුත්තෝ මහාපඤ්ඤෝ, සමාධිඤ්ඤාණ කොවිදෝ
ගිජ්ඣකූටෝ සිතෝයේව පස්සති ලොකනායකං

සුපුල්ල සාලරාජංව වඤ්ඣෝ ගගනෙ යථා
මජ්ඣන්හිකෝඛව සූරියා, ඵුල්ලොඛෙනි නරාසභං-සි

යනාදී මහාසම්පිණ්ඩ නිදානයෙහි ආ ක්‍රමයෙන් බුදුන් කරා පැමිණි ඒ මාගේ හිමි සැරියුත් මහතෙරුන් වහන්සේ දෙහොත් මුදුනහි තබාගෙණ සියලු සතුන්ට පෙණී පෙණී ඒ හැමට ඇසෙන සේ මෙසේ ආරාධනා කළසේක. ඒ කෙසේ ද? යත්.

කිඳිසෝ තෙ මහාවීර අභිනිහාරෝ නරුත්තම
කමනි කාලෙ තයා ධීර පත්ථිතාබොධිමුත්තමා-සි.

යන මේ ගාථාව වදුරා සවාමිදරුවූ ලොවුතුරා බුදුරජාණන් වහන්ස! මේ දසදහසක් සක්වළ මුලුල්ලෙහි නුඹ වහන්සේගේ මේ සියලු බුඩශ්‍රිය පැහිර ඉහිර ගියේය. මෙබඳුවූ බුදුසිරි ලැබීමට කවර කලෙක කවර බුදුකෙනෙකුන් දැක කවර තරම් පින්කමක් කොට කෙසේවූ ප්‍රාර්ථනාවක් කළසේක් ද? ඒ ඔට විශෙෂයෙන් වදුළ මැනවැ යි කියා බුඩවංශ දෙශනාවට ආරාධනා කළසේක.

එකල්හි මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ අසව ශාරිපුත්‍ර සථවිරය යි වදුරා මෙයි යට කියනලද ක්‍රමයෙන් අඟවඩම් සමොධානයෙන් යෙදී ප්‍රථමාභිනීහාරය කළතැන් පටන් ගෙණ තමන් වහන්සේගේ පූර්වචරිතයවූ අපදානය සුවිසිව්‍යවස්ථානයකට පමුණුවා නිවිඩ කාල්‍යාණකොට අඟවාඩහසමුපෙත බ්‍රහ්මස්වරයෙන් දෙශනා කරණසේක්, මෙසේ සාරිපුත්‍ර සථවිරය, මේ ලොවුතුරා බුදුබව නම් එසේ මෙසේ සාධාරණතැනැකි සම්පත්තියෙක් නොවෙයි. යම්සේ ඉඤ්ඣගඟන් මහ ගංගාජලය මහමුහුදට හැම වේලෙහි ම වැදීමෙන් ඒ මුහුද උතුරුවා නොයේ ද, කාලපයක් මුලුල්ලෙහි වස්සා වශී ජලයෙන් වත් යම්සේ මුහුද පුරවාලීම නොහැකිවේ ද, එසේම මේ ලොවුතුරා බුදුබවට ද කෙනෙක් කුශලසම්භාරයන් රැස්කළත් පාරමිතාවන්ගේ අග පැමිණීම නොහැකි මය. පාරමිතාවන් වඩා වඩා පිරුසේ බුඩශ්‍රියාවත් වැඩි වැඩි ම ඵල දෙන්නි ම ය. එහි විභාග දීපංකරාදි බුදුවරයන්ගේ චරිතාපදාන බුඩශ්‍රිය ඇසීමෙන් දනයුතු.

මෙසේ ප්‍රථමාභිනිහාරයෙහි පටන් ලොව පහළවූ සියලු බුදුවරයන් නොවරදවා ම දැක මාගේ ධන පමණකින් ඒ ඒ බුදුවරයන්ට පූජාකිරීමෙන් සම්තුෂ්ත පාරමීධම්මයන්ගේ කොටි ප්‍රාප්තව ලොවුතුරා බුදුවී මෙන් දැන් මේ සියලු ලොවට අග්‍රව ධ්‍යානපුව විදිනෙමිසි යනාදීන් තමන් වහන්සේගේ පූර්වචරිතාපදාන සංඛ්‍යාත බුඩවංශය වියිතුරුවූ ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිත කොට ගෙණහැර නිමවා දක්වා වදුළසේක. මේ බුඩවංශ දෙශනාවගේ කෙළවර අසංඛ්‍යයක්දෙවියෝ සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. අසංඛ්‍යයක් දෙවියෝ සකෘදාගාමි ඵලයෙහි

පිහිටියාහුය. අසංඛ්‍යයක් දෙවියෝ අනාගාමී ඵලයෙහි පිහිටියා
හුය, කෙළලක්‍ෂයක් දිව්‍ය බ්‍රහ්මයෝ සතරවන අර්හත් මාර්ගයෙන
නිවන්පුර වැද සියලු සසර දුකින් මිදී ගියාහුය.

මෙසේ අප බුදුරජාණන් වහන්සේ තුන් අසංඛ්‍යයක් දෙවියන
හා කෙළ ලක්‍ෂයක් පමණ බ්‍රහ්මයන් නිවන්පුර පමුණුවා බුඩවංශ
නිමවා වදාළකල්හි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ
පරසිත් දක්නා නුවණින් දෙවතාවන්ගේ ධර්මශ්‍රවණ ලොභය තෘ
නො සිදුනේ යයි දැක වදාරා සුරකතාවිවරය එකාංශකොට පොරෝ
ගෙණ මහත් ආදර ගෞරව දක්ව දක්වා පියවර ඔසව ඔසවා ඉදිරි
යට ගොස් බුදුරජාණන් වහන්සේට මදක් ලංව නමිනහුතා
දෙහොත් මුදුනෙහි තබාගෙණ දන්වනසේක් මාගේ සවාමිදරුවූ
බුදුරජාණන් වහන්ස! නුඹ වහන්සේගේ මේ විශෙෂවූ දෙශනා
අසා මාගේ ද සියලු සතුන්ගේ ද ශංකාවෝ දුරුව ගියහ. දැන
ඒ දෙශනායෙහි ඇතුළත් කොට මාගේ සවාමිදරුවූ නුඹ වහන්සේ
විසින් ම මෙම කප මතු මෛත්‍රෙය නම් බුදුවර කෙනෙක් උපදන
සේකැයි වදාරණ ලදහ. ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ කව
කලෙක උපදනසේක් ද? කෙසේවූ බුඩශ්‍රීයක් ඇතිසේක් ද? ඒ
විශෙෂයෙන් අසනු කැමැත්තෙමි. එසේ හෙයින් සවාමිදරුවූ බු
රජාණන් වහන්ස! මේ හැම දෙපි බඹ පිරිස් මඩ්‍යයෙහි ඒ කාරණ
ප්‍රකාශකොට වදාළ මැනවැයි ආරාධනා කළසේක. කියේ මැනෝ:

සාරිපුත්තෙනා මහාපඤ්ඤෙ, උපනිස්සෝ විනායකෝ
ඛණ්ඩසෙනාපති ධීරෝ උපෙච්චා ලොකනායකං.

අනාගතං ජිනාරමහ අපුච්ඡි කඞ්ඛමත්තනෝ
තුස්සානානන්තරිකෝ ධීරෝ බුඩෝ කිදිසකා තදෙ
විස්සාරෙනෙවංහං සොතුං ඉච්ඡාමාවිඤ්ඣ වඤ්ඣුම.

මෙසේ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසිඳ
ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ වර්‍ෂණයක්පිට වර්‍ෂණයක් වස්ස
සේ අනාගතවංශ දෙශනාවට පවත්ගෙණ වදාරණසේක් ශාරිපුත්
සථවිරය! මේ මාගේ කරුණාශාසනය මා නැති පන්දහසක් අවුරු
නො නැසී පවත්නේය. එසින් මත්තෙහි ලොව අබුඩොත්පාද
වන්නේය. එකල්හි සත්ත්‍වයන්ගේ ආයුෂය අකුශලයන්ගේ වැ
මෙන් ක්‍රම ක්‍රමයෙන් පිරිහී ගොස් දශඅවුරුද්දකට පමණ ආයුෂ
ඇතිවෙයි. එකල ලොව මිනිස්සු තිරිසනුන් වැනියහ. මවුපියයි දැ
කරණ ලොකවාරිත්‍රය පමණක්වත් නො කරන්නාහ. එහෙයි

මේ නැගනියෝය බුහුනනියෝය මයිලනුවෝය බැනනුවෝය පුතනුවෝය දියනියෝය යනාදි ව්‍යවහාර නැතිව තමන් තමන් කෙරෙහි ම ප්‍රේම කෙරෙති. පස් වැනි කුමරුවන්ට පස් වැනි කුමරියන් සරණපාවා දෙති. සියලු රසයම අනනඛාන වෙයි. හැල්මී අනනඛාන වෙයි. වරාසාලෙ බත් රජදරුවන්ට අග්‍රභෝජන වෙයි. මෙසේ ලොව සියලු දෙයින් හීනවූ කල ත්‍රිවිධ අනනාකල්පයන් අතුරෙන් දැන් සත්වයන්ගේ ආයුෂය උත්සන්නවීම හෙතුකොටගෙණ ශස්ත්‍රාන්තර නම් කල්පවිනාශයෙන් ලොකවිනාශය වෙයි. එහි අනනාකල්පවිභාගය හා මහාකල්පවිභාගය කුශලඵල භූමිපරිච්ඡේදයෙහි එක් නිස්තලවිභාගය දක්වන තැන මතු ප්‍රකාශවන්නේ ය. එය විසතාරාර්ථයින් විසින් එසින් බලා දතයුතු.

මෙසේ අකුශලයන්ගේ බහුල වීමෙන් ම ලොව විනාශවන කල මැගසංවතනය යි යන ලොකසන්ධියක් සියලු ලොකවාසීන්ට පෙණී පවි කිරීමෙහි ආදීනව දැක කලකිරි භයපත්ව ඉතිරිව සිටි මනුෂ්‍යයෝ ප්‍රාණාතිපාතයෙහි දෝෂ සලකා මහත් කරුණා උපදවා අපි ජීවත්වූ ගණන ඔවුනොවුන්ගේ ආත්මාරක්ෂාවෙහි අප්‍රමාදවම්හසි කතිකාකොට ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී ඇතිව ඒ හැම මෙතැන් පටන් අපි ප්‍රාණඝාත නො කරම්හ යි කියා පළමුකොට ම ප්‍රාණාතිපාත අකුශලයෙන් ම දුරුවෙති. ඒ කුශලබලයෙන් ඔවුන් නිසා උපදනා දරුවන්ට විසිහවුරුද්දකට ආයුෂය ඇති වෙයි. ඔහු දෙවැනිව අදත්තාදාන අකුශලයෙන් දුරුවෙති. ඔවුන් නිසා උපදනා දරුවන්ට නිස්හවුරුද්දකට ආයුෂය ඇති වෙයි. තුන්වැනිව පරදර අකුශලයෙන් දුරුවෙති. ඔවුන් නිසා උපදනා දරුවන්ට සතළිස් හවුරුද්දකට ආයුෂය ඇති වෙයි. සතරවැනිව මුසාවාද අකුශලයෙන් දුරුවෙති. ඔවුන් නිසා උපදනා දරුවන්ට පණස්හවුරුද්දකට ආයුෂය ඇති වෙයි. පස්වැනිව පිසුනාවාචා අකුශලයෙන් දුරුවෙති. ඔවුන් නිසා උපදනා දරුවන්ට සැටහවුරුද්දකට ආයුෂය ඇති වෙයි. මේ ආදි ක්‍රමයෙන් දශවිධවූ අකුශල ධම්මයන් කෙරෙන් දුරුව දශවිධවූ කුශලධම්මයෙහි පිහිටන්නාහුය. ඒ කුශලධම්මයන්ගේ ම ආනුභාවයෙන් ක්‍රම ක්‍රමයෙන් ම ආයුෂය වැඩි වැඩී ගොස් දෙසියයක් හවුරුද්දකට ආයුෂය ඇතිවූකල්හි මේ දඹදිව ඉතා රම්‍යවූ සම්බඝසම්පන්න බරණැස්නුවර නම් පෙරළී එම නම්ම ප්‍රසිඛ වෙයි. එසින් මත්තෙහිදු එසේ ම වඩ වඩා ම කුශලධම්මයන්ගේ සමාදානයෙන් ම ආයුෂය වැඩිගොස් අනූදහසක් හවුරුද්දට ආයුෂ ඇතිවූකල්හි බරණැස්නුවර නම පෙරළී දිහින් පුළුලින් යොදුන්

පමණවූ උත්පල නම් නුවරෙක් වෙයි. එයින් මත්තෙහිදු එසේම ආයුෂය වැඩි ලක්ෂයක් හවුරුදේදව ආයුෂය ඇතිවූකල්හි එම නාමය පෙරළී අයම් විතරින් සත්යොදුන් පමණවූ පදුම නම් නුවරෙක් වෙයි. එයින් මත්තෙහිදු එසේ ම ආයුෂය වැඩි අසංඛ්‍යයකට ආයු ඇතිවූකල එම නාමය පෙරළී දෙලොස් යොදුන් පමණවූ මන්දර නම් නුවරෙක් වෙයි. ඒ කාලයෙහි මිනිස්ලොව දෙවිලොවිවත් වැඩි තරම් ආයු සම්පත් ඇත්තේය. එහෙයින් උපන්කල් නො දනිති. මිය යනකල් සෝ දනිති. ජරාවිළිපිළි නැත. රොගාබාධයක් නැත. මෙසේ සුව විදීම හෙතුකොට ගෙණ දුක් නම් කෙසේ බවත් නො දන සත්ත්වයෝ කුසල් කිරීමෙහි ප්‍රමාද වෙති. ඒ අකුශලයෙන් ආයු පිරිහීමට පැමිණ අසංඛ්‍යයෙහි පවත් ක්‍රම ක්‍රමයෙන් පිරිහි ගොස් අසූදහසක් හවුරුදේදව ආයුෂය ඇති වෙයි. එකලට මන්දර නම් නුවරෙහි තම පෙරළී කෙතුමතී නම් රාජධානියෙක් වෙයි. කියන ලද මෙ යි –

තදා කෙතුමතී නාම රාජධානී භවිස්සති
වාදසයොජනායාමා සත්තයොජන විත්ථතා-යි.

යනාදි ක්‍රමයෙන් වදරණසේක් සාරිපුත්‍රස්ථවිරය! ඒ කෙතුමතී නම් නුවර දිගින් දෙලොස් යොදුන, පළලින් සත්යොදුක, අවරින් අටනිස් යොදුන් පමණ වන්නේය ඒ නුවර වට සිටි පොළොව පලා පැනනැඟි සත්රුවන් පවුරු සතකින් රැ දුවල් දෙක වෙනසක් නොව ආලෝක පැතිර දිලිහි දිලිහි සිටිනේය. එහි අතරතුරෙහි රිදීමයවූ කඳ ඇති ඉන්ද්‍රනිල මාණික්‍යමයවූ පත්‍ර ඇති ඝනරත්නමයවූ ඵලඇති තල්රුක් පෙළවල් සතකින් අලඬකෘතවිය. සතරදිශාවෙහි සත්රුවන් වාසල් සතරෙක් මැවී සත්සත්මහල් ඇතිව රැ වෙන සක් නො දක්වා බබළන්නාහුය. ඒ වාසල් සතරෙහි පොළොව පලා පැනනැඟි කප්රුක් සතරෙක් ඇත්තාහ. එහි අනෙක ප්‍රකාර විසි තුරු සම්පත්තීන් සැදී සිටි ඒ කප්රුක් අතුරෙන් එක් කප්රුකකින් මූලු දඹදිව වැසියන් තම තමන් කැමති පරිද්දෙන් වස්ත්‍රාභරණාදි සම්පත් ඒ අසූදහසක් අවුරුදු මුළුල්ලෙහිත් ගෙණ නිමවාගත නොහැක්කේ ය. තවද එනුවර මැද පැනනැඟි සත්රුවන්මයවූ ශාලාව කුදු ඇත්තේය. ඒ ශාලාව සතරදිග ද මහා කප්රුක් සතරෙක් මැවී නිබෙන්නේය. ඒ කෙතුමතීනම් නුවර දඹදිපත් ආදියෙන් කළ ගෙයක වසන එක ද සත්ත්වයෙකුත් නැත්තේය. හැමදෙන ම රන් රිදී මුතු මැණික් වෛදූර්‍ය්‍ය වජ්‍රප්‍රවාල සංඛ්‍යාතවූ සත්රුවන්මය ගෙවලම වාසඝරන්නාහුය. දිව්‍යමයවූ උඟන් පොකුණු ආදියෙන්

සමලඞ්කෘතය එ සලට එ සා දඹදිව මුලුල්ලෙහි සියලු මිනිසුන් කෙරෙන් සානසොනෙක් වපුරණකෙනෙක් වෙණදුම් නවාම් කරණ කෙනෙක් වත් බඩනිසා දුක්ගන්නා වෙහෙසෙන එක ද මිනිසෙ කුත් නැත්තේය පොළොව පලාගෙණ සවයඤ්ජාතවූ රත්හැල් පැනකැඟි කරල්වල කුඛුදසවෙය්‍යා නැතිව මුතුදැල් සේ සහල් ගෙණ තිබෙයි. එක බිජුවටක් හුනු නැනින් නැඟි පදුරෙන් කරල්කඩා මැඩගත් කල දෙදහස් දෙසිය දෙසැත්තෑ ගැලක් පුරා දහසාමුඤු අවලාස්සක් සාල් ඉතිරිව තිබෙ යි, ඒ සාල් මැණික් බදනෙගිලා මැණික් උදුනෙහි ම පැසවා හැම සත්ත්වයෝ ම අනුභව කෙරෙති. ඒ හැම මලමූත්‍ර පහකරම්හ යි සිතූ ඇසිල්ලෙහි නිල්වලාකඩෙක් දිවගෙණ අවුත් නිරයක් සේ සිසාරා වටව සිටගණී. එකෙණෙහි පොළොව පැලී මහ වළෙක් මැවියෙ යි. එහි ශරීර කිස පැවැත්වූ කල වළ අනතඛිනව පැන් පොකුණෙක් මැවී යෙයි. එයින් උදක කෘත්‍යයන් කළකල වටවතුබූ වලාඤඹ අනතඛීන වෙයි. එසම යෙහි ඒ කෙතුමතී නම් නුවර මෙසේ දිව්‍යපුරයක් සේ සමාඛ වන්නේය.

තවද සාරිපුත්‍ර සථවිරය! පෙර ඛවදඛු කම්ගෙන් ජීවත්ව සිට දිඹුල් දණ්ඩින් ගෙයක් නංගා වස්වසා පින්කළාවූ කුඵපොතු දෙපුතු පියන් අතුරෙන් පුතනුවෝ මාගේ ශාසනයෙහි හද්දිය නම් සිටුවල නිවන් දකිති. පියානෝ තමන් කළ පින් නොමූ කළ හෙයින් මේ බුබානතරය මුලුල්ලෙහි සදෙවිලොව සැරිසරා ඇවිද එකල ඒ කෙතුමතී නම් නුවර සඛ නම් වක්‍රවර්ති රජව උපදනාහ. ඒ රජ පෙරකළ ආචාසදූනයාගේ කුශලයෙන් පෙර මහාපනාද රජ්ජුරු වන් අසඛ්‍යයක් හවුරුදු මුලුල්ලෙහි රාජ්‍යය කළ පස්විසි යොදුන් උස ඇති සියක් මහල් ඇති අසූසාරදහසක් රුවන්ගඩඹ ඇති ඉඳු නීල මාණික්‍යාමය බිම් ඇති ඝනරත්නමය වූ ටැම් ඇති රිදීමය වූ කොතුරු හා පේකඩ ඇති ප්‍රවාලමය වූ ව්‍යාඝ්‍රප ඕකති ඇති රත්නමයවූ පලසෙවෙනි ඇති පස්විසි යොදුන් පමණ වූ ඒ රත්නමය ප්‍රාසාදය ආකාශගට පැනනැඟි දෙවන සඳමඩලක් සේ දිලිහි දිලිහි අවුත් නුවරමැද පිහිටා යෙ යි. එකල්හි එම පින් බෙලෙන් ඒ රජගට වක්‍ර රත්නය මාණික්‍යරත්නය ගජතිරත්නය අශ්වරත්නය පරිනායක රත්නය ගෘහපතිරත්නය ස්ත්‍රීරත්නය යනි යන සත්රුවන්නුදු පහළ වෙයි. ඒ රජගට තමා හා සමබල ඇති පුත්‍රයන් දහසක් ඇති වෙයි. අඟසින් යන මහත් ශෘඩි ඇති වෙයි. ශරීරයෙන් සදුන් සුවඳ හමයි. මුඛයෙන් මහතෙල් මල් සුවඳ පැතිරෙයි. දෙවියෝ සතර දෙනෙක් සතරදිග කඩුගත් අත්ඇතිව රැකවල්ගෙණ සිටිති සහිස්සොදනෙක

පැතිර පවත්නා මහ පිරිස ගෙණ සතරමහ ඕපයෙහි එකදු ඇඹිද ඒ සියලු සතුන්ට පන්සිල් රකුවසි යනාදීන් අවවාද කියා ලා දුවල් ඔතට තමන් එසන නුවරට ම එන්නේය. මෙසේ ම ශංඛ නම් චක්‍ර වර්ති රජ දිබුල්දබු බටදඬු ගෙණ ගෙය නංනා තැණයෙන් වසා ඒ ගෙයකළ කුශලානුභාවයෙන් එසාමහත් ප්‍රාසාදයෙක් ඔහු වලැබෙයි. ඒ ගෙයි සැදූ ඇදෙහි පිණින් අසූසාර දහසක් යහන් ලැබෙයි. එහා ඇතිරිලියෙහි පිණින් අසූසාරදහසක් විසිතුරු ආස්තරණ ලැබෙයි. බැලමෙහෙ කොට දුන් ආහාර දානයෙහි පිණින් උදය සවස එක සැළෙක දසදෙනාට සැහෙන පමණ බත් බැහින් අසූසාර දහසක් අසූසාරදහසක් සැළ පුරා දිව්‍යභෝජන ලැබෙයි. ඒ ලැගූ ගෙයි තුබූ පුටුවෙහි පිණින් අසූසාරදහසක් සිංහාසන ලැබෙයි. මෙසේ ශඛ නම් රජතුමා එකල සමයිනින් දන්පිසූ ස්ත්‍රිය ප්‍රධාන කොට අසූසාරදහසක් බිසෝවරු පිරිවරති. පන්සල වටා වැට කළ පිණින් නුවරවටා සත්රුවන් පවුරු සතක් ලැබෙයි. ඒ වෙහෙර වට හිදුවූ ඒ තල්පෙලෙහි අනුසසින් සත්රුවන්මය වූ තල්ගස් නුවර සිසාරා සිරි සත්වලල්ලකින් සොහොමාන විය. ඒ පන්සලෙහි සත්වරෙක වස්වැසූ පිණින් සත්රුවන් ලැබෙයි. වස් අනතයෙහි නො වරදවා දුන් වස්වාසික සිවුරුපිළියෙහි පිණින් ඒ සා මහත් කප්රුක් ලැබෙයි. මෙසේ ඒ ශඛ නම් චක්‍රවර්ති රජ එකල තෙතුමනි නම් නුවර ශක්‍රදෙවෙන්‍රයා සේ අප්‍රමාණවූ මනුෂ්‍යසුව විඳිනේය. වදලේ මැනෝ:-

සඛෝ නාම අසෝ රාජා අනනබලවාහනෝ
සත්තරතන සම්පන්නෝ චක්කවත්තී මහබ්බලෝ-සි.

යනාදීන් ශඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ කුශල විශෙෂය මෙසේ සංක්‍ෂෙපයෙන් වදරා,

තවද සාරීපුත්‍ර සථවිරය! ඒ මෛත්‍රෙය නම් බුදුහු පෙර මිහුර්ත නම් බුදුකෙනෙකුන් සමයෙහි ප්‍රභාවත් නම් චක්‍රවර්තිරජව මෑසේ ම අෂ්ටඛම් සමොධානයෙන් සෙදී ප්‍රථමාභිනිහාරය දින් එ තැන් පටන් සොළසාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් පාරමිධම්යන්පුරා මේ දෑතුරෙහි ලොව පහළවූ බුදුහු දහසක් දෙනා වහන්සේ අතින් විවරණ ලදින් කෙළවර වෙසසනතරාත්මයෙන් සැව තුසිපුරයෙහි ඉපද එසමයෙහි එසේ දිවසිරි විඳිමින් සිට දශදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මඝන්ගේ ආරාධනාව දෙවසා පස්මහ බැලුම් බලා බ්‍රාහ්මණ වංශය උතුම් සේ දැන ඒ කෙතුමනි නම් නුවර ශංඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍රමහෙසිකාවූ සුබ්‍රහ්ම නම් බ්‍රාහ්මණ මහාසාරයන්ගේ බ්‍රහ්මවති නම් බැමිණි දෙවින් කුස පිළිසිඳ දසමස් පුරා වැස දශදහසක් සක්වළ

දෙවිබඹුන් මඩ්‍යයෙහි මෛත්‍රීපිඬක් සේ මහාබ්‍රහ්මයා අතට බිඹිව අජිත තම් කුමාරව තරුපිරිවැරූ සඳ සේ ක්‍රමයෙන් වැඩි දෙලොස් දෙලොස් ගවු උස ඇති වඩිමානකය සිඩාඩිය වඤ්ඣායයි යන සත් රුවන් මිය වූ තුන් ඍතුවට ම නිසි සේ වෙන වෙනම තුන්පායෙක් ඇති වෙයි. එකි එකි ප්‍රාසාදයෙක්හි සත් සත් මහල. එකි එකි මහ ලෙක්හි ලක්ෂයක් ලක්ෂයක් කුඩුගෙවල් ඇත්තේ ය. එකි එකි පාඨ වට සත්සත් රුවන් පවුරුය. එසේම රුවන්මය සත් සත් වාසලය. ඒ තුන්පායෙහි ම පඤ්චාංගික තූර්‍යනාද පවත්වා රන්රසුදුල් එල්වා තිබෙයි. මුදුනෙහි සත්රුවන්මයවූ ධජ නගා තිබෙයි. ඒ ධජ කකුල්වල බඳනාලද රන්මිණි සොඟාවෙන් නුවර එකතින්නාද වෙයි. ඒ ප්‍රාසාදයන් තුන්දෙනාගේ නිත්තිවල සත්රුවන්මය වූ තාලපංක්තිය මකරපංක්තිය සිංහපංක්තිය ව්‍යාඝ්‍රපංක්තිය හස්ති පංක්තිය අශ්වපංක්තිය රථපංක්තිය මයූර පංක්තිය හංසපංක්තිය යනාදි වූ නිර්මිත කාමිනතයෙන් ඉතා ශෝභාමත්ව බබළන්නේය.

දවස්පතා මල්වැසි වස්නේය. එකි එකි මාලයෙක සත්සියයක් සත්සියයක් රුවන් ගබඩා ගෙවලය. සත්සියයක් සත්සියයක් සිංහාසනය. සත්සියයක් සත්සියයක් සේසත් ය. සත්සියයක් සත්සියයක් යහන් ය. එකි එකි පාඨවට ශ්‍රද්ධන්න නම් හස්තිරාජයා ප්‍රමුඛවූ සත්දහසක් සත්දහසක් මඬගල හස්තීහු සරහා සිටිති. වලාහක අශ්ව රාජයා ප්‍රමුඛවූ සත්දහසක් සත්දහසක් අශ්වයෝද සරහා සිටිති. සත්රුවන්ධජ නාගු හිරුමඬල සඳමඬල වැනිවූ සත් සියයක් සත් සියයක් රථපංක්ති සරහා තිබෙයි. එකි එකි මාලෙහි සත්දහසක් සත්දහසක් නාටක ස්ත්‍රීහු සැරහි සිටිති. මේසේ මහත්වූ ශ්‍රීවිභූතීන් යුක්තව තුන්ඍතුවට සුදුසුවූ ඒ තුන්පායෙහි මෛත්‍රෙය බෝසතානෝ වාසය කෙරෙති. ශඛ නම් චක්‍රවර්තිරජ ආදිවූ දඹදිව අසූසාරදහසක් රජදරුවෝ මහුල්කඩුගෙණ බෝසතුන්කරා අවුදින් ඒ හැමදෙන ම හිමි නුඹ සේවය කරම්හ යි කියති. එවිට බෝසතානෝ මාගේ පෂීත් බෙගෙව. තොප තොපගේ ම රාජ්‍යශ්‍රී විඳුව යි කියා යවන්නාහු ය. බෝසතානන් කැවිව දෙව්ලොවින් අවුදින් එකදු උපන් අටලොස්කෙළක් පමණ ඇමතියෝ නිරන්තර යෙන් ම ඒ බෝසතුන්ව අරක්ගෙණ සිටිති.

මේසේ ඒ අජිත තම් මෛත්‍රෙය බෝසතානෝ බුදුවූබයකිනුත් කියා නිමවාගත නොහැකි මහත්වූ ශ්‍රී සම්පත් විඳ අටදහසක් හවු රුදු ගිහිගෙයි වැස දෙවියන් මිසින් දැක්වූ තුන්පූර්වනිමිති දැක්මෙන් සසර කලකිරී සතරවැනි ව දැක්වූ පැවිදි වෙසක් දැක මහණවනු

කැමතිව වන්දුමුඛි නම් අගබිසව් බ්‍රහ්මවඩන නම් පුත්‍රුවන වැදුදු මහණවෙමි සිතා එකෙණෙහි ම එම රන්පායෙහි ම පලක්බඳ මතු මහල් තෙලෙහි හිඳ සත්දවසක් දුෂ්කරක්‍රියා පුරණතුරු සංඛ නම් වක්‍රවර්ති රජ්ජුරුවෝ අසූසාරදහසක් රජුන් හා අසූසාරදහසක් බිසෝවරුන් පිරිවරා පූජාභාණ්ඩ ගෙණ බෝසතානන් වැඩහුන් ප්‍රාසාදය සිසාරා ඒ සත්දවස ම අඟුල්ගෙණ සිටිනාහුය. එසේ ම දශ දහසක් සක්වල දෙවියෝ ද දිව්‍යපූජාභාණ්ඩ ගෙණ අහස්කුස් පුරා සිටිනාහුය. මෙසේ සද්දවසක් දුෂ්කරක්‍රියා පුරා කිසිකෙනෙකුන් හා මුවෙන් නො බැණ කිසිකෙනෙකුන්ගේ මුහුණ නොබලා දවස්යවා හැම බුදුන් බුදුවන වෙසක්මස මැදිපොහොදු මහබිණික්මන් කෙරම් සිතූ ක්ෂණයෙහි ඒ රන්පාය සත්පවුරුසත්දෙරටු පිරිවරා සිටි මහ සෙනහ හා සමගින් ම ආකාශයට පැනනැඟි බෝමැඩසා වට නික්මෙන්නාහ. කැවිව මහණවනු කැමති සියලු මනුෂ්‍යයෝ ම සිටි සිටි පලින් අහසට පැනනැඟි පියුම් විලකට දුවන රාජහංස පෙළක් සේ යෙති. මෙසේ මහත්වූ පුණ්‍යප්‍රභායෙන් ගොස් ඒ රන්පාය මහා සෙනහ හා බෝසතුන් ගෙණ බෝමැඩකරා බසී. එකෙණෙහි මතුල්කවුව විදුලිය පතක් සේ හයා කෙස්වැටිය කපා අහසට දමා මහබඹුදුන් සිවුරු පිරිකර පිළිගෙණ මහණ වනසේක.

තවද මේ බුඩෙත්පාදයෙහි පින්කොට ප්‍රාර්ථනාකළාවූ සත්පුරු ෂයෝ බොහෝදෙන එවිට ම මහණවන්නාහුයි. වතුර්වේදයෙහි නිපුණවූ බ්‍රාහ්මණයෝ අසූසාරදහසක් එකවිට මහණවෙති. මේ ශාස නයෙහි පින් කළ ඉසිදත්තය පුරාණය යි යන දෙබැතෙනෙක් අසූ සාරදහසක් අසූ සාරදහසක් පිරිස් ගෙණ මහණ වෙති. තවද ජිත මිත්‍රය විජිතය යන මහාපණ්ඩිතවරු දෙදෙනෙක් අසූ සාරදහසක් අසූ සාරදහසක් පිරිස් ගෙණ මහණ වෙති. තවද මේ ශාසනයෙහි පින්කළ සිබාළි නම් සිවානකෙනෙකුන් හා සුබ්‍රා නම් සිවුදියනි යක් අසූ සාරදහසක් අසූ සාරදහසක් පුරුෂ ස්ත්‍රීන් හා මහණවෙති. තවද මේ ශාසනයෙහි ම පින්කළ සඛ්‍ය නම් උපාසක කෙනෙකුන් හා සංඝා නම් උපාසිකාවක් අසූසාරදහසක් අසූසාරදහසක් පුරුෂ ස්ත්‍රීන් හා සමග මහණවෙති. තවද මේ ශාසනයෙහි යසවතිය විසා ඛාය යන යෙහෙලියෝ දෙදෙනෙක් අසූසාරදහසක් අසූසාරදහසක් ස්ත්‍රීන් හා මහණවෙති. අවශෙෂවූ රජ බමුණු වෙළඳ ගොවීන්ගෙන් නොයෙක් ලක්ෂගණන් එම දා ම මහණවෙති. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයෝ මහණව ලා එම වන්දුමුඛි නම් අග්‍රදෙවීන් දුන් කිරිපිඬු වළඳ, එමදා සවස අපරාජිත ස්ථානයෙහි පැනනැඟි විදුරසුන් නැඟි නාගශ්‍රීබොධියට පිවලා වැඩහිඳිනාසේක.

ඒ නාගබෝධිය නම් රිදීකඳක් සේ සමව වටවූ කඳ එක්සිය විසිරියන් උසය. පඤ්ච මහාශාඛාවෝ ද එක්සිය විසිරියන් එක්සිය විසිරියන් උසය. මූලපටන් අග දක්වා දෙසිය සතළිස්රියන් උස ය. පූර්ව ශාඛාග්‍රයෙහි පටන් පශ්චිම ශාඛාග්‍රය දක්වා දෙසිය සතළිස් රියන. උත්තරශාඛාග්‍රයෙහි පටන් දක්ෂිණශාඛාග්‍රයට දෙසියසතළිස් රියන. ශාඛාමණ්ඩලය වටින් සත්සිය විසිරිය තය. ඉඳුනීලමාණික්‍ය මය ඡත්‍රයක් සේ හැමදා ම ශොභාමත් ව තිබේ සි. හැමදා ම ඒ රුකෙන් වියලී ක්ෂයව වැගිරෙණ පත්‍රයකුදු නැත, පඬෙර පැහැවන් පතකුදු නැත. මුහුකළ පත් ඉඳුනීල මාණික්‍යමයය. තවද අසු අස්සෙහි ලිය හා අංකුර ප්‍රවාල ම ය ය. එකෙණෙහි ම ඒ නාගශ්‍රී බෝධිය මූල පටන් අග දක්වා මලින් සැදී සිටිනේ ය. දිය දෙළොස් නැළියක් ගන්නා පමණ කැකුළු වෙසි. පිපිමල් මහ නැළියක් පමණ වෙ සි, එකි එකි මලෙක්හි නැළියක් පමණ රේණු වෙසි. ඒ බුදුවන දු පිපිමල් අසුදහසක් හවුරුදු පරනොවී තිබී ඒ බුදුන්ගේ පරිනිර්වාණය හා සමඟ ම හැම මල් පරව නටුගෙන් ගිලිහී පෙත්තකුත් බිම නො වැටී ආකාශයෙන් ගොස් දරසැයෙහි වැගිර බුදුන් හා සමඟ ආදහනවෙසි. තවද ඒ බෝමැඩ සිසාරා වටින් දෙගවු දෙගවු පමණ තැන සත්රුවන් වැලි තැනී තිබෙ සි. ඒ වට සත්රුවන් මය වූ ප්‍රාකාරයක් වෙසි. එයින් පිටත වට දෙළොස් දෙළොස් ගව්ව පමණ තැන තන් විසිතුරු වූ සුවඳ මල්ගස් සමූහයෝ හැමදෙනම ඒ නාගශ්‍රී බොධියට වැඳුම් ගෙණ එක පංක්තීන් සිටිනාහු ය.

මෙසේ ඒ මෛත්‍රෙය බුදුහු තමන් සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂ යක් මුලුල්ලෙහි උතුම පිරූ පාරමිතාවන්ගේ මහිමයෙන් ලබන ලද මෙබදු වූ නාග ශ්‍රී බොධියට පිටලා අවපණස් රියන් විදුරුසුන් තැගි චතුරඛණ්ඩවිශාඛි ඤාණයෙන් දශදහසක් සක්වළ දෙවිබඹුන්ගේ පූජාවිදිමින් වැඩහිඳී. එකෙණෙහි වසවර්තිමාරයා මහත්වූ මරසෙනඟ ගෙණ ඔහු අද බුදුවිය නොදී දෙකකුල ගෙණ පරසක්වළ ගසමි කිපි දිව අවුත් සක්වළ මෝළිට සිට ඒ මෛත්‍රෙය නම් බුදුන්ගේ මෛත්‍රීපිඩක් බදුවූ ශ්‍රී මුඛය දැක ලඟාවිය නොහී හඬින් වෙවුලා පැරදී දිවෙසි. මෙසේ මරසෙන් බිඳ එදු රැ අළුයම් රාත්‍රියෙහි ලොවුතුරා බුදුව අනන්තාපරිමාණවූ සක්වළවල බුදුරැස් කඳ විහිදුවන සේක.

තවද සාරිපුත්‍ර සථවිරය! ඒ මෛත්‍රෙය නම් බුදුහු ‘අජිතකාය බ්‍රහ්මදෙව ය’’ යි යන අගසවු දෙදෙනෙකු හා සමඟ මහත්වූ ශ්‍රාවක සමූහයා විසින් පිරිවරණසේක. හැමදා රැ දුවල් දෙක්හි පස්විසි යොදනෙක පවත්නා බ්‍යාමප්‍රභා මණ්ඩලයක් ඇතිසේක. තවද ඒ මෛත්‍රෙය බුදුහු අව අසූරියන් උසකින් අසාධාරණවූ බබළන,

ශ්‍රීමත්වූ බුඩකායයෙකින් යුක්තව දම්සක් පැවතුම් සූත්‍රදෙශනාදි අප්‍රමාණවූ ධර්මදෙශනා කොට දනව් සැරිසරා සියලු සතුන් සංසාර සාගරයෙන් ගොඩ නඟා නිවන්පුර පුරවමින් අසූදහසක් හවුරුදු ආයුසමපත් වළඳා ලෝවැඩ කරණසේක.

එකල ශඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ ඒ මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේ දැක ධර්මචක්‍රය අසා පැහැද බුදුවූ ඇසිල්ලෙහි ධර්ම චක්‍රානුභාවයෙන් පසුබැස සිටි චක්‍රරත්නය හා සත්රුවනින් චක්‍රවර්ති රාජ්‍යයෙන් බුදුන් පුදා තමන්ගේ පස්විසි යොදුන් පමණවූ රත්න ප්‍රාසාදය බුදුපාමොක් මහසඟනට සඞ්ඝාරාමයක් නොට පිළිගන්වා සියලු චක්‍රවර්තිරාජ්‍යය බුදුන්ට පුදා පෙර තමන් දිඹුල්දණ ඩෙන් ගෙය නඟා වස්වසවා කළ පින්බලයෙන් ම කැටිව පින්කළ යහිනි හා සමඟ නවකෙළදහසක් පුරුෂයන්ගෙණ මාගිඵල ප්‍රාප්ත වූ එහි භික්ෂුභාවයෙන් මහණව අමාමහනිවන් දක්නාහුය.

මතු බුදුවන ඒ මෛත්‍රෙය නම් බුදුන් නොදක්නෝ කවුරුදැ? දැක සසරින් ගැලවෙන්නෝ කවුරුදැ? යත්,

මවුන් මැරුවෝ, පියන් මැරුවෝ, රහතුන් මැරුවෝ, බුදුන් ඇඟින් ලේ සෙල්වූවෝ, සඞ්ඝභෙද කලෝ යන මේ පඤ්චානන්තරිය කර්මය කළාවූ සත්ත්වයෝ ද, දැඟලි බිඳ බොධිෂාඛා කපා රන්පිළිම ඛණපොත් සිඳ බිඳ විනාශකිරීමෙන් ආනන්තරිය කර්මයෙහි ඇතුළත් අකුශලකර්ම කළෝ ද, සඞ්ඝයා වහන්සේට ආක්‍රොශ පරිභව කිණුවාවූ සත්ත්වයෝ ද සිල්වත් තැන්වලට බොරුවෙන් වරද ඉපද වූවෝද ධර්මයට අනාදර කිණු සත්ත්වයෝ ද යන මොහු ඒ මෛත්‍රෙය බුදුන් දැක නො ගෙත් ම ය. දන්වැට කැවෝ ද, බුදුන් සතුදෙය කැවෝ ද, ධර්මය සතුදෙය කැවෝ ද, සාංඝිකදෙය කැවෝ ද, අළුගා මිථ්‍යාදෘෂ්ටි ගෙණ මෙලෝ පරලෝ නැතැ යි ඇවිදිනා සත්ත්වයෝ ද. සිර සඳ දෙවියන්ට හා වැසිවලාහක දෙවියන්ට දෙස් කළාවූ සත්ත්වයෝ ද යන මේ හැම පව්කළ සත්ත්වයෝත් ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නො හෙත් ම ය. නරක තිරිසන් අසුර යන තුන් අපායෙහි උපන්නාවූ සත්ත්වයෝ ද, ඒ බුදුන් දැක ගැලවිය නොහෙත් ම ය. අරූතල අසඤ්ඤතල පරසක්වළ යනාදියෙහි උපන්නාවූ සත්ත්වයෝත් ඒ බුදුන් දක්ක නො හෙත් ම ය.

තවද මේ බුඩොත්පාදයෙහි ඛණ අසා මෙලෝ පරලෝ දැන තම තමන් ශක්ති පමණින් දන් පින් කලෝ ඒ මෛත්‍රෙය බුදුන් දකිති. තවද සිල් රක්ෂා කලෝ දකිති. පෙහෙවස් සමාදන්ව රක්ෂා කලෝ දකිති. ඛඩසරවස් රක්ෂාකලෝ දකිති. දැඟලි දැකරඩු කර

වූවෝ දකිති. බොධි පිහිටුවූවෝ දකිති. පුෂ්පාරාම ඵලාරාම කර වූවෝ දකිති. ගේදඹුලැවුවෝ දකිති. මාවත් හෙළිකලෝ දකිති. අම්බලම් හොනවටු කරවූවෝ දකිති. ලින් පැන් පොකුණු සැදුවෝ දකිති. නවබුන් වෙහෙර කරවූවෝ දකිති. බණ කියා ලෝවැඩ කළෝ දකිති. බණ කියවූවෝ දකිති. ධම්ශාලා හැංවූවෝ දකිති. ධම්ඡන කරවූවෝ දකිති. ධම්ශාලායෙහි ඕයන් බැන්දෝ දකිති. බණපොත් ලියවා දන්දුන්නෝ ඒ පොත අකුරුගණනින් චක්‍රවර්ති සම්පත් ආදිවූ බොහෝ සැපත් ලදින් සුවවිද ඒ මෙතේ බුදුන් දැක නිවන් දකිත් මය. සබලිදණ්ඩාදාන බණවැසුන් ලැවුවෝ දකිති. ධම් කථිකයන්ගේ පා සේදුවෝ දකිති. බණ කියනවුන් උපචාරයෙන් සත්කාරයෙන් වඩා ගෙණාවෝ දකිත් මය. බණ කියනකල සාධුකාර දුන්නෝ දකිත් මය. බණට අඩගැවෝ දකිත් මය. විජිනිපත් දන්දුන්හෝ දකිත් මය. විජිනිපත් අතට ඔසවා දුන්හෝ දකිත් මය. ආවාහ කරවා දුන්නෝ දකිත්මය. ධම්ඡනයෙහි මල්සුවඳ පිදුවෝ දකිත් මය. වස්ත්‍රාභරණ පිදුවෝ දකිත් මය. බණ කියන ගෙහි පහන් දැල්වූවෝ දකිත් මය. මේ සියල්ල නිමවා බණ පැවැත් වූවෝ දකිත් මය. ගිලනුන් අත්හා මෙහෙ කලෝ දකිත් මය. විවර පිණ්ඩපාත කරවා දන්දුන්නෝ දකිත්මය. ලඟබත් පොහොබත් අවධිබත් දන්දුන්නෝ දකිත් මය. මවුපියන්ට අත් පා මෙහෙ කළෝ දකිත් මය. යටත් වෘහෙන් එක මලක් එක පහකක් එක බත්කොළඟක් පමණ වත් දන් දී වේ ව සි තුණුරුවන් කෙරෙහි සිත පහදවා වේ ව සි යම් යම් කෙනෙක් මෛත්‍රෙය බුදුන් දකිම් ව සි කියා මාගේ මේ බුඩොත්ඵාදයෙහි ප්‍රාර්ථනා කළාහු විනම් සාරිපුත්‍ර සථවිරය! හැම ඒ මතු මෛත්‍රෙය බුදුන් දැක සංසාර සාගරයෙන් ගොඩ නැගෙන්නාහු මයසි යනාදි ක්‍රමයෙන් මේ අනාගත වංශ දෙශනාව නිමවා වදළසේක.

මෙසේ මාගේ සවාමිදරුවෝ තමන් නො වදුම්හ යි මිනිස කොව උන් සතුති ගණයා මධ්‍යයෙහි ආකාශයට පැන නැගි ඒ විසි තුරු රුවන්සක්මනෙහි දී යමක ප්‍රාතිහාර්‍යය දක්වා ප්‍රථම අග්‍ර ශ්‍රාවකවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ ආරාධනා වෙන් මෙසේ බුඩවංශ අනාගතවංශ දෙශනාව ප්‍රකාශකොට නිමවා වදුරා නැඟන්ගේ මානය බිඳ ආකාශයෙන් බස්නා පුන්සඳක් සේ බැස පළමුව වැඩහුන් බුඩාසනයෙහි ම පෙණී හිඳසේක.

ඒ ආශ්චර්‍යය දුටු සුබොදන රජ්ජුරුවෝ පුතනුවන් වහන්සේගේ ශ්‍රී පාදමූලයට ගොස් දෙඅොත් මුදුනේ තබා ගෙණ සතුටු කදුලෙන් දෙනුවන් තෙම තෙමා සාමිනි! මේ මාගේ බුදුරජානෙනි, ඕගේ සිඩාර්ථකුමාරවූ පුතනුවන් වහන්ස, පුත්‍රව්‍යාජයෙන් ලොව

ඇමට වැඩ පිණිස මාගේ හෙයි උපන් මාගේ ම පියාණන් වහන්ස! අද පටන් නුඹ වහන්සේ මට දරු නොවන දැස. මම නුඹ වහන්සේගේ දරුවෙමි. එසේ හෙයින් මාසේවූ නුඹගේ දැසයෙකුත් නොවටහා හිතවූ පියෙක්හට මෙබදු ප්‍රාතිහාර්‍යදක්වා මුලුලෝ වෙවුල්වා කුමක් නිසා වෙහසුනු සේක් ද? මම නුඹ වහන්සේ උපන්දා කාලදෙවල තම් සෘෂින්ගේ තලල්මැද නුඹගේ තෙල ශ්‍රී පතුල්දෙක පෙණිගිය ප්‍රාතිහාර්‍ය දැක සතුටුව එදවස් ම මම ද මේ පතුල්දෙක තලල තබා වැන්දෙමි. ඒ මාගේ පළමුවෙනි වැදීම ය. තවද නුඹ වහන්සේ පස්මැසිකල වප්මිතුල් කරණ දා දඹගස මුලදී කලාවූ ප්‍රාතිහාර්‍යය දැක සතුටුව එදත් මේ සිරිපතුල් දෙක වැන්දෙමි. ඒ මාගේ දෙවෙනි වැදීම ය. අද මා වැනි පියකු තබා දිව්‍ය බ්‍රහ්මයන් විසිනුදු නුදුටු නොඇසුවිරු මෙබදු ප්‍රාතිහාර්‍යය් දැක රාජ්‍යය පුදු පියම තම් ඒ නුඹ අලුයම දමූ කෙලපිඬක් සේ පිළිකුල් කොට හැරපියා ගිය රාජ්‍යය හෙයින් තරම් නොවෙයි. ජීවිතය පුදු පියම තම් නුඹගේ බුබළී වඩ වඩා දකිනා ලොභය මාගේ වැඩිතරම් හෙයිනුත් ජීවිත පූජාව නුඹ නොඉවසන හෙයින් ජීවිතයක් පුදුපිය හෝ හෙමි යනාදි නොයෙක් කාරණයන් කිය කියා බුදුන්ගේ ශ්‍රීපාදදෙක හිස් මුදුනෙහි තබාගෙණ මේ තුන්වන වැදීම යයි කිය කියා ඒ සුබෝදය රජ්ජුරුවෝ සිරිගත නොහී මූලින් සිදහෙලූ කන්‍යාක රූපයක් සේ බුදුන්ගේ පාමුල්හි වැද පෙරළී හියහ. එසේ රජ්ජුරුවන් වැදී කල එක්ලක්ෂ සැටදහස්හක් පමණ ශාක්‍ය රජදරුවෝ සිටි සිටි තැන සිට ගත නැංහි යුගාන්ත වාතයෙන් හුනු මහසල් වනයක් සේ වැද පෙරළී හියාහුය.

එවිලෙහි ශක්‍රදෙවෙන්ද්‍රයා මලාහිය මල්නෙක පෑන් ඉස්නා ශ්‍රද්ධාවන්ත පුරුෂයකු සේ බුදුන්ගේ ශාක්‍යකුල නමැති බන්ධු කුසුමයන් සනෙත්තාභ කාවා මහත්වූ පොකුරු වැස්සක් වැස්විය. ඒ පොකුරු වැස්සෙහි තඹවන් දිය යට පොළොවින් දිවෙයි. තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නොතෙමෙනු කැමැත්තෝ නොතෙමෙති. ඒ ආශ්චර්‍ය දැක විසිදහසක් භික්ෂූන් බුදුන්ගේ බන්ධු සමාගම යහි වට පොකුරුවැස්සෙක මහිම බලවයි සතුති කළසේක. ඒ කාරණය අසන්නාවූ සක්දෙවිඳු කොට ගෙණ මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ මහණෙනි! දැන් මතු නොවෙයි. පෙරත් මෙසේම මාගේ බන්ධු සමාගමයෙහි පොකුරු වැසි වටුයේ ම වේ දැයි වදරා දහසක් ගාථා වෙත් ප්‍රතිමණ්ඩිතවූ මහාවෙස්සන්තර ජාතකය ගෙණ හැර දක්වා ධර්මදේශනාකොට වදාළසේක. එවේලෙහි බොහෝ ප්‍රාණීහු සෝවාන් ආදිවූ මාර්ග ඵලයට පැමිණියාහුය.

ඉක්බිත්තෙන් ශාක්‍ය රජදරුවෝ බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට සඩ්මිංමෑතයෙන් අභිෂෙක ලදින් සන්නාහයෙන් සිණා මත්ව නුවරට ගන්නාහු සඩ්මිප්‍රීතින් ම සිහි මදව එක් රජෙක් වේ ව සි එක බිසෝ කෙනෙක් වේ ව සි බුදුරජාතන් වහන්සේට පසුවද දවස්හි දන් දෙන පිණිස ආරාධනාවක් නො කොට අභිමුඛව දැක වදුරණ තාක් තැන් පසු බැස බැස ගොස් දශීනය මුවහවන තැන් සිට නැවත නැවත ප්‍රභ පිහිටුවා වැඳ ශාක්‍යසිංහ ශාක්‍යකෙතු යනාදීන් බුදුන්ව ප්‍රශංසා කොට ගියාහුය.

මාගේ සවාමිදරුවූ බුදුරජාතන් වහන්සේ එදා රාත්‍රෝධාරාම යෙහි දවස් යවා පසුවදා උදෑසන කලමනා සිවලු බුබකාෘත්‍යයන් නිමවා ගන්ධකුටි වාරයෙහි වැඩ සිටි කල්හි සුවිනීතවූ ශාන්තවූ ඉඳුරන් ඇති ශාන්තවූ සිත් ඇති ශීල සමාධි ප්‍රඥා විමුක්ති සම්පන්නවූ තමන් වහන්සේ වැනි විසිදහසක් පමණ රහතන් වහන්සේ විසින් පිරිවරණ ලදසේක් පුළු බුදුවරයෝ කුලගමට ගියද කෙසේ පිඬු සිඟා වදලෝ දෝ ගෝ සි පුළු බුබවරිතයන් බලා වදරා ඒ හැම බුදුහු ම ප්‍රාතිහාර්‍ය්‍ය දක්ව දක්වා ගෙපිළිවෙළින් ම සිහුන සි දැක අද මම ද එසේ ම ප්‍රාතිහාර්‍ය්‍යයෙන් යෙදී සිඟම් සිතා වදරමින් දකුණු ශ්‍රීපාදය ඔසවා වදලසේක. එකෙණෙහි මහත් ගැල්සකක් සා පියුමෙක් පැන නැගි ඒ ශ්‍රීපාදය පිළිගත්තේය. නැවත වාම ශ්‍රීපාදය ඔසවා වදුල කල්හි එසේ ම අනික් මහපියුමෙක් පැන නැගි ඒ ශ්‍රීපාදය ද පිළිගත්තේය. එසේ ඇති කල්හි මාගේ සවාමිදරුවූ බුදුරජාතන් වහන්සේ පියුමක් පිට පියුමක් තබන්නා සේ ඒ පැන නැගි පියුම්පිට සිරිපා පියුම් තබ තබා වඩිනට නික්මුණු සේක. නැගූ නැගූ පත්ලෙහි පියුම් පෙණෙහි ඔය. එසවූ එසවූ පත්ලෙහි පියුම් අන්තර්ධාන වේ මය. මෙසේ මාගේ සවාමිදරුවූ බුදුරජාතන් කිබුල්වත් පුරයට මහත්වූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්ව දක්වා තුන්ලොව ම කියා ගිවිත්වා ලිය හෝ හැකිවූ කියා දිව හඬාගත නො හැකිවූ අනොපමේයවූ අසදෘශවූ අදිභූතවූ අසාධාරණවූ බුබශ්‍රීන් දිලිහි දිලිහි වැඩ දක්ෂිණ ශ්‍රීපාදය එතුවර මහවාසලය මුදුනෙහි පළමු සොට තබා වදුලසේක. එකෙණෙහි ඒ ශ්‍රීපාදය ඇතුලට දිගු කිරීම හා සමගම ඒ පය පඤ්චාඞ්ගුලියෙහි පඤ්චාර්චිස්ත්‍රයෙන් පළමුකොට ම බුදුරැස් කඳ පසෙක් පඤ්ච මහාගඞ්ගාව දිවුවා සේ ඇතුළුනුවරට දිවගන්නාහු සියොලගින් නික්ම ගිය සවණ්ණරැස් හැම එක්ව ම ගොස් නුවර තුන්යලක් සිසාරා පවුරු හිත්ති අට්ටාලවල ගෘහි කිරි මුහුදු රළපතර සේ පෙළින් පෙළ රළ නැගි නැගි දිව හැම නුවරෙහි හැම තැන්හි ව්‍යාප්තව ප්‍රාසාද කූටාගාර හිත්ති පවුරු පදනම්

පොරණ අවලු වංසල කවුළු වලද යනාදිය රන්පව රිදීපව පොර වන්නා සේ රන්දිය කිරිදිය වන්කරන්නා සේ ඒ ඒ රසයෙන් පුරන්නා සේ හැම තැන්හි ව්‍යාප්තව එතුවර දිව්‍යපුරයක් සේ සියලු බුදුරැසින් සැරසී ආලෝකව ගියේය. එකල්හි ඒ හැම නුවරවැසිහු කුල්මත්ව කොල මේ මේ කාරණයෙන් බුදුහු වැඩියහ. තව මෙහි කුමක් කරමෝ දැයි කිය කියා මුලු නුවරවාසි සත්ත්වයෝ ම මුහුද රළපහර දිවන්නා සේ බුදුන් වඩනා පෙරමඟට දිවන්ට පටන් ගත්හ.

ඉක්බිත්තෙන් මැණේ සව්‍යම්භූරැවූ බුදුරජානන් වහන්සේ මෙබඳුවූ ප්‍රාතිහාර්‍යයෙන් යෙදී ඒ වංසල් එලිපතෙහි වැඩසිට පෙර බුදුවරයෝ කුලකුවරට පැමිණ සුබිතයන්ගේ දෙර ම සිතූ දෙ හෝ ගෙවල් පිළිවෙළ නො වරදවා ගෙපිළිවෙළින් ම සිතූ දෙ හෝ සි පූජී බුඩවංශ චරිතය බලා අසන්නා බුදුවරයන් අතුරෙන් එකද බුදු කෙනෙක්වත් ගෙපිළිවෙළ ඉක්මවා පිඬු පිණිස නිය ගමනෙක් නො දක හැම බුදුවරයෝ ම ගෙපිළිවෙළින් ම සිතූහ සි දැන ද මැණේ ඒ බුඩවංශ චාරිත්‍රය නො වරදවා ම සිහිමෙන් මැණේ ප්‍රවේණිය ද රැක්කයුතුය; මිතු මා බලා මා අනුව ම භික්ෂූන මැණේ ශ්‍රාවකයෝ ද සපදානයෙන් පිඬු පිණිස හැසිරීමෙන් පිණ්ඩචරියා වත් පුරා උතුම් ශාසන ප්‍රතිපත්ති පූජාවෙන් මා පුදන්නාහු ය සි වදුරා ශුචි අශුචි කැන් වෙනසක් නොව සමව පවත්නා චන්ද්‍රකාන්තිය සේ හීන මධ්‍යම උත්කෘෂ්ටවූ හැම සතුන් කෙරෙහි සමව පවත්නා තමන් වහන්සේගේගේ මහා කරුණාව හැම දෙනා කෙරෙහි පතුරුවා වංසල්දෙර සමීප කෙළවර ගෙය පවත් කෙයක් ගෙයක් කරා නො ගොසින් සපදානචාරිකාවෙන් ම ඒ විසිදහසක් රහතන් පිරිවරා එදු ගෙපිළිවෙළින් ම සිඟන්ට පවන් ගත්සේක.

එකල්හි ආරාධනා කිරීමත්, පාත්‍රා ගැණීමය යනාදි ව්‍යවහාර දන්නා කෙනෙකුත් ලොව නැති හෙයින් කිරි ඉතිර වැගිරෙණකල සිත උපන් සන්සලයෙන් අර බල අර බලව සි කියන බව මුත් දරු හැද දමා පියන්නවුන් නැත්තා සේ, හැම මනුෂ්‍යයෝ ම බුදුන් දැක විස්මය පත්ව බල බලා ම සිටිති. එබැවින් බත් සැන්දක් ගෙණෙන සේත් නො දනිත් මය. එ වේලෙහි දෙමහල් තුන්මහල් පස්මහල් සත්මහල් මිනිපෑවල උඩුමහලින් යටිමහලට නො බස්නා ශ්‍රීමත් බිසෝවරුන් හා ස්ත්‍රී සමූහයෝ සිවුමැදුරු කවුළුවල දෙර හැර මුඛ මණ්ඩලයෙන් පිටත් කොට ඒ අනෙපමවූ බුඩ ශ්‍රී බල බලා එහි රසද පිද විද දකින්ට පටන්ගත්හ. එකෙණෙහි රාහුල කුමාරයන් වහන්සේව මවුවූ යශෝදරාදේවි ද එසේ බුදුන් දෙර දෙර පිඬු සිඟති අසා සිබාඑ කුමාරයෝ පෙර මෙම තුවර රන් රථයකට පැන නැඟි

සුසැටක් ආභරණ පැලඳ රුවන් රසින් දිලියෙන අසපිවූ ඔටුන්
නක් පැලඳ ලක්ෂයක් අඟනාවූ මුත්හරයකින් උරමඬල පුරාගෙණ
නොයෙක් ලක්ෂණින් ඇමතියන් හා නළුවරිස් පිරිවරා ගෙණ ශක්ර
දෙවෙඳ ලීලායෙන් රාජ්‍ය ශ්‍රී විඳ විඳ ඇවිදිමින් කල්යවූ ඒ මාගේ
සවාමියාණෝ දැන් කෙස්මැවි දැළිරිවුලු කපා ඒ ශරීරය මසා කාෂ්‍යය
වස්ත්‍රයක් පොරවා මැවිපාත්‍රයක් අතින් ගෙණ මෙම නුවර පෙරළා
මෙම ජනීයෙහි දෙර දෙර සිඟමින් සිටිත්ල, උත්වහන්සේ මහණ
වීමට ගියදා ම මාගේ දිවි නොහැසි තුබූ අදිකවයෙන් ලාමකවූ
කණට අමධුරවූ සිතට අමනොඥවූ හෘදයවස්තුව හුණු කරවන්නාවූ
මෙසේවූ නපුරුතෙපුලක් ඇසිමි. අහෝ කිමෙක් දෝ ඒ සිඬාළු
කුමාරයන් දුටු යම්ම කෙනෙක් උත්තරාභිමහත්වූ ආනුභාවය ම
කියති. උන්ගේ සිඟමනුත් දුටු දුටුවන්ට ඉතාම රිසියෙන ප්‍රියතර
ය යි කියති. ඒ මහණ වෙසයත් උන්ට නොබිඳේ හෝ නොහොබි
දේ හෝ දැන් මා විසින් බැලුව මැනවැ යි සිතාලා සත්බුමූ මහපා
යෙහි සිංහපඤ්ජර කවුළුවෙහි දෙර හැර රත්කලහක කරක් බදු
ශ්‍රීවය දිගු කොට බලන්නී බුදුන්ගේ දෙතිස්මහා පුරුෂ ලක්ෂණ
යෙන් හා අසුඅනුව්‍යඤ්ජනයෙන් බබළන සිඟලගින් දිවන සවණක්
බුදුරැස්කදින් ලඹිරුඹුලක් සේ දිලිහි දිලිහී විසිදහසක් මහ රහ
තන් පිරිවරා ඉතා සත්සුත්ව සිරිපතුල් ඉදිරියෙන් තබ තබා වැඩ
වැඩ සිඟන්නාවූ බුදුරජාතන් වහන්සේ දැක දෙ අත් මුදුනෙහි
තබාගෙණ තුන්යලක් සාධුකාරදී අමෘවලෙක ගලා තගාලූ රන්
රුවක් සේ සිඟලඟ ලොම් දැහ ගන්වමින් පස්වණක් ප්‍රීතින් පිණා
මන්ව අහෝ සිඬාළු කුමාරයන් වහන්ස! එදා ඔබ්‍යම රාත්‍රියෙහි
මා වැනි පක්ෂපාත සත්ත්‍වයකටත් නොකියා රාහුල කුමාරයන් වැනි
එක්වැනි පුතනු කෙනෙකුන් බල බලා උන් අඟ අතහැ සිඹ
සැනසීමත් නොකොට අප හැර සැහවී එකලාව පලාගියේ මෙසේවූ
වෙශවයාී විශෙෂයක් ඇති ගමනකට ද මෙසේ වූ ශරීර ප්‍රභාවක්
මෙසේ වූ සුවිනීත පඬිදක් සොයා මේ නුවර හැර ඔබ ගිය සේ
යහපත් මය. ඕබ රජසිරි හැර මේ මහණවූ සේ ඉතා යහපත් මය.
ඔබ ලද සැපත එකෑනතයෙන් ඔබට ම හොබනේය. පෙර ඔබගේ
දිවසිරි වැනි මේ සා රාජ්‍යශ්‍රියට වඩා දැන් ඔබගේ සිහන රාජ්‍යය
මට ඉතා ප්‍රිය වන්නේ යයි කිය කියා:-

සිනිඳ නිල මුදු කුඤ්චිත කෙසෝ
සුදිය නිමාල තලාභි ලලාටෝ
යුත්ත තුඛය මුදුකායතනාසෝ
රංසිජාලවිතතෝ නරසීහෝ.

යනාදි කරසිඟඟාථා අවක් කියා බුදුන්ගේ කෙශාග්‍රය පවත් තබාගුය දක්වා රූපය වර්ණනා කොට, එම විශය ම මයිලතුවූ සුඛෝදන රජ්ජුරුවන්ගේ ගෙට ගොස් සවාමිවූ මයිලතුවන් වහන්ස තුඹ පුතතුවන් සිඛාර්ථී කුමාරයන් දුන් සත්ඟවුරුද්දකින් තමන් ගේ ම තුවරට ආ තැනැත්තවුන්ට අද එක දවසකට වත් කොස සිඟවා බතක් දී ලිය කොහෙන්නේ තුඹ සිඟා කෑ නොනෙක් ද? දුන් උන්වහන්සේ දෙරින් දෙර පිඩු සිඟමින් සිටිසේක. තුඹ සේ වූ දරුවන්ට දුඹ කෙනෙක් නැත. තුඹ මේ ගෙයි ඔිද කුමක් කරන් නෙඔි දැයි යනාදීන් සුඛෝදන රජතුමා කිය.

රජ්ජුරුවෝ බුදුන් හා විසිදහසක් මහරහතන්ට පැන් නොවකා මහුම්බුරුයෙන් කිරිපිඩු පිඟන්නාහු යෙහෙලිනියන් අතින් පුතතුවන් වහන්සේ සිහති යන බස් අඟ කදුළු පිරුණු ඇස් ඇතිව ඉතා මහත්වූ ලජ්ජායෙන් එකතින් සළුපට රඳව රඳවා දිවගොස් සවඥී සාගරයෙහි දිය පිරා දිවන අනනත නම් නාගරාජයා ගේ රන්වන් බුදුරුස් පිඔිර පිඔිරා බුදුන් කරා දිව ක්ඔිරසාගරයෙහි ගැලෙන්නකු සේ පුතතුවන් වහන්සේගේ වරණ තබ මසුඛයෙහි ගැළි ගැළි වැද සවාමිනි මාගේ ප්‍රිය පුතතුවන් වහන්ස! මව මේ සා නිදුවක් කුමක් නිසා කර වදලසේක් ද? අද මේ මුළු දඹදිව තෙසැවදහසක් තුවර වල තෙසැවදහසක් රජුන් හා මහසෙනහ අවු නමුත් පැන් නොවකා සුවද හැල්සෑල් කිරිබත් දෙතත් පොහොසත්මි. එසේවූ මම විසිදහසක් රහතන් හා තුඹ වහන්සේට අද දවස බත් දී ලිය නොගෙනිසි සිතුසේක් ද? සවාමිනි! කුමක් නිසා මට නින්ද කොට දෙරින් දෙර සිට සිඟා වදරණ සේක් දැයි කිය.

එකල්හි බුදුරජ වදරණසේක් මහරජ මේ අපගේ වංශයෙහි සිරිතෙක් ම ය. එහෙයින් එසේ නොසිතව සි වදලසේක. ඒ ඇසූ රජතෙම සවාමීන් වහන්ස කුමක් වදරණසේක් ද? තුඹ වහන්සේගේ වංශය නම් මහාසම්මතාදි රාජවංශය ය. තුඹ වහන්සේගේ ඒ වංශයෙහි මුත්තතුවූ එක් රජෙක් ලත් සෙසු සම්පත් තබා කථාවක් කළ කල එකෙණෙහි මහකෙල්මල් සුවද මුඛයෙන් සතර ගව්වක් තැන් දිවෙයි. එක් මුත්තතු රජෙක් අඟස බලා අත්පොළසන් දුන් කල එකෙණෙහි දෙව්ලොව වෙවුල්වා සතිස් යොදනක් තන්හි දත පමණ කටි පමණ සත්රුවන් වැසි වස්නේය. එක් මුත්තතු රජෙක් අමාත්‍යයන්ට ප්‍රසාද දෙමි කියා පතුල්දෙක ර්ව නඟාලූ වේලෙහි විනතාමණික්‍ය සේ එසිස් කැමැති කැමැති සම්පත් පහළවන්නේය. මේසේ මෙසේවූ තුඹ වහන්සේගේ වංශයෙහි තුන්ලඟ සුතිස්දහස් පස්සිය එකානුවක්

ශුඛෝදන රජතුමා බුදුරදුන් සැරෑ දිවයාම (128 පිට)

පමණ මං ඇතුළුවූ මේ හැම රජුන් අතුරෙන් මේ තුඹ සේ සිහෑ කැ එක ද රජෙකුත් නැත. එසේ ඇති කල මේ සේ සිහෑ වැලඳිම අපගේ වංශ වාරිත්‍රයකැ යි කියා මෑගේ වංශයට නිත්ද කොට නො වදළ මැනවැයි" කිහ.

එවිට සඟමිදරුවෝ "මහරජ! ඔබපගේ මේ මහ සම්මතාදි රාජවංශය යැ. මාගේ දීපඞ්කරාදී බුඩවංශය යැ. ඒ මාගේ වංශ යෙහි පෙර එක් බුදුවර කෙනෙක් මවුකුස වසනකල පවා අසූ රියන් ගෙයි පහන් කැටුව මැනවැ යි යන්නක් නැත. එක් බුදුවර කෙනෙකුන්ගේ ඇඟින් නික්මුණු රැසින් දසදහසක් සක්වල බබලා හිර සඳ පවා කඳෙකිමියන් සේ නිෂ්ප්‍රභ කොට දිලිහුනු සේක. මෙසේ මෙසේ වූ ආනුභාව සම්පන්නවූ මාගේ වංශයෙහි දීපඞ්කර කොණ්ඩඤ්ඤ මඞ්ගල සුමන රේවත ශොභිතාදි ක්ෂාශ්‍යපාවසාන වූ සුවිසි බුදුවරයෝ ද, එයින් අන්‍යවූ ද අනන්තාපරිමාණවූ සර්ව්ඥවරයෝ නිස්සාරයෙහි හැසිර ගෙපිළිවෙළින් සිහිමෙන් ම දිවි පැවැත්වූවාහුය. එසෙයින් මේ සිහිමත් ජීවිකාර්ථි වූ ලාමක යන්ගේ සිහිම සේ නො ව අනන්ත වූ බුදුවරයන්ගේ වංශවාරිත්‍රය නො හැර පවත්වන මාගේ උතුම් පිණ්ඩපාත ආර්‍යවංශ තම් ලද මේ බුඩවංශයෙහි තමන් වහන්සේගේ වංශය ප්‍රකාශ කොට වදාරා ඇතුළු වීපියෙහිම වැඩසිට පියරජ්ජුරුවන් මුහුණ බලා තමන් වහන්සේගේ සඞ්ඝ නාමැති මහා නිධානයෙන් ගංථා නමැති රුවනක් දෙනු කැමතිව ගෙපිළිවළින් ගොස් දෙර දෙර සිට ලැබිය යුතු භික්ෂාවාත්තියෙහි ප්‍රමාද නො වන්සේය. එසේ පිණ්ඩවාරික වත ගෙ පිළිවෙළ නොඉක්මවා දෙර දෙර සිට බික් සිඟන බැවින් නො පමාව හැසිරීමෙන් එකවිසි අකෙස්තෙන් දුරුව සපදනවාරීව වඤ්ඤ සුලු මහණ මෙලෝ පරලෝ දෙක්හි සතර ඉරියව්වෙහි ම සැප සේ වාසය කරන්නේ යි යන අර්ථය ප්‍රකාශ කරන්නේ:-

උත්තිට්ඨෙ නාපමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච

යන මේ ගාථාවෙන් පියරජහට බණ වදළ කල්හි ඒ සුබෝදන රජතෙම කෙළ දහසක් කෙලෙසුන් ගෙවා දහසක් නසින් සම්පූර්ණවූ සෝවාන් ඵලයට පැමිණ දක්නාලද චතුස්සත්‍යඛමීයන් ඇතිව දෘෂ්ටි ඔඝයන් එතරව සිටි ශ්‍රද්ධාදි සප්තධනයෙන් සමන්විතව භාග්‍ය වතුන් වහන්සේගේ පාත්‍රාග්‍ර ලබාගෙණ විසිදහසක් භික්ෂු සඞ්ඝයා වහන්සේ හා බුදුරජාතන්වහන්සේ ඇතුළු රජගෙයි මහා ප්‍රාසාදය වැඩමවාගෙණ ගොස් පණවනලද ආසනවල වඩා හිඳුවා ප්‍රණීතාහාරයන් වළඳවා ඉක්බිති එතනට රැස්ව බුදුන් වැඳ එකත්පස් ව

හුන් මහාප්‍රජාපතිගොතමී තෙම බිසව ප්‍රධානවූ අන්තඃපුරවාසි සත ළිස් දහසක් පමණ නාටක ස්ත්‍රීන් සහිතවූ මහ පිරිසට බණ වදාරණ අප බුදුරජාණන් වහන්සේ:-

ධම්මං චරේ සුචරිතං න තං දුච්චරිතං චරේ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

යන මේ ගාථාවෙන් බණ වදාළ කල්හි ගාථාවගේ අන්තඃක්ෂය යට පැමිණීම හා සමග මහා ප්‍රජාපති ගොතමී තෙම බිසව සෝවාන් ඵලයට පැමිණියාහ. පිතාවූ සුඩොන රජ සකෘදාගාමි ඵලයට පැමිණියේය. එකල්හි රජ්ජුරුවෝ අන්තඃපුරවාසීන් අතුරෙහි රාහුල මාතාවන් තොදුක ඒ යෙහෙළිනියන් සඳහන්ව මාගේ දරුවූ යශොධරාදේවි ද අවුදින් බුදුන් දැක වැඳ ශොක දුරුකරගණුව සි කියා ඇවූකල එපවත් ඇසූ යශොධරාදෙවි කමපාවූ සිත්ඇතිව කඳුලෙන් පිරිහිය මුහුණින් යුක්තව කියන්නී "මම පෙර උන්වහන්සේට පක්ෂපාත ව විසිම නැම් ඒ සවාමීන් කෙරෙහි සැබෑවූ ස්ථිරගුණයකුත් ඇතියෙම් වීම් නම් මා කෙරෙහිදු කරුණා කොට මේ ගෙව ද ඒ හිමිතුමානෝ! වඩිනාසේක්මය. එසේ වැඩිකල වදිමි කියා නොගියාය.

සුඩොදන රජ්ජුරුවෝ එපවත් බුදුන්ව සැලකළකල්හි බුදුහු ඒ යශෝධරා දෙවීන් සඳර බොහෝ කලක් පක්ෂපාත ව ආ නිසා, ඇ මුල්කොටම පාරමිතාවන් කුළුගන්වා, උන්හේම සහායයෙන් පුත්‍ර භාර්‍යාදි පරිත්‍යාගකොට දුන් ලොවුතුරා බුදුව මේ මුළුලොවට වැඩ කෙරෙමින් සිටියෙමි. එහෙයින් කෘතොපකාරයෙහි මුදුන් පැමිණීම ම සුදුසුය යි සිතා වදුරා බුඩාසනයෙන් පැනනැඟී මහරජ පාත්‍රය තෙපිම ගෙණ පෙරටුව යව යි වදුරා පියරජ්ජුරුවන් අතට පාත්‍රධාතූන් වහන්සේ දීලා රජ පළමුකොට යවා තමන් වහන්සේ පස්සෙහි වඩනාසේක් සැරියුත් මුගලන් අගසවු දෙදෙනා වහන්සේ පමණක් කැටිව කැදවා ගෙණ වඩිමින් සිටි උන්වහන්සේලාට වදාරණසේක් මහණෙනි! මම රාහාදි කෙලෙස් මුහුදු පිනා ගොඩ දැක සිටියෙමි. ඒ යශොධරා දෙවී තවද කෙලෙස් මුහුදුම ඇවිදිනිය. තව මා නැඟී තොටට නැංග සෙ හැකිවූවාය. ඇ සංසාරයෙහි දී මට බොහෝ දුක් ගත. මා කෙරෙහි දීඝිකාලයක් සෙ නැසි පැවති මහත්වූ ප්‍රෙම සමූහ ඇත්තිය. ඇ සඳරින් ගොඩසගාගන්නාසෙක් ඇගේ ම චරිතාලය හැඩිමට අවසර දී සතුටුකරවමින් එසේ හඩා පියන අ.සවාදයක් ඕ තොමෝ සෙ ලද්දේ නම් මා කෙරෙහි ශොක යෙන් ලය පැළී මියෙයි. එසේ ආසවාදයක් ලද්දෙනම් මාගේ සසුන් වැද මහණව දහක් බිසෝවරුන් හා සමග අමාමහ නිවන්පුර

වදිසි. එහෙයින් ඇ තමා සිත්සේ හඬා වැලප ශොක නිවාගන්නා තෙක් කවර කෙනෙක්වත් ඒ හැඩිම නො වළක්වව" යි පළමුවෙ ට වදාරමින් රාහුලමාතාවන්ගේ ශ්‍රීඃහන්ගෙට පියරජ කැවිව ම වැඩ පණවනලද බුඬාසනමණ්ඩකයෙහි වැඩහුන්සේක. යශොධරා දේවිද එදු බුදුන් තමන්ගේ ගෙට වඩනාබැව දැන පන්සියයක් පරිවාර ස්ත්‍රීන් හා සමග කෙස්වැටිය කපාහැර කසාවන්පිළි එකාංශ කොට පෙරවගෙණ වඩකාබව බල බලා සිටියාය. බුදුරජ අවුදින් වැඩලන වේලෙහි සෘරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි වැළැක්මක් නැතිව එක්ව දිවූ ප්‍රෙම තමැති මහගඬාව නවතාගත නොහි එම ප්‍රෙම යෙන් ම උමතුව මම වූකලි ස්ත්‍රීයක් වෙමි. මුන්වහන්සේ ලොවුතුරා බුදුවූසේකැ යි සිහිඵලවාගතනොහි බුදුන්ගේ ශ්‍රීපාදමූලයට ගොස් මුලින් සිද හෙලූ රන්ලිහක් සේ ශ්‍රීපාදමූලයෙහි වැටී බුදුන් දෙපස ගොප්මස් අල්වාගෙණ සිරිපාපියුම් තමන් හිස්මූදුනෙහි තබාගෙණ හඬ හඬා ශොක සංහිදුවා සිහි ඵලවාගෙණ නැවත බුදුන් කෙරෙහි හා මහිලනුවූ රජ්ජුරුවන් කෙරෙහි උපන් මහත්වූ ලජ්ජා භය ඇතිව මේ මා කෙළේ කුමක්දෝ හෝ යි සිතා භයපත්ව එකත්පස්ව උන්නාය.

ඒ දුටු සුඬොදන රජ්ජුරුවෝ මේ කිමෙක්දෝ හෝ මේ ලෝක යෙහි කිසි දෙවියෙක් බ්‍රඹ්මයෙක් රජෙක් සිටෙක් බමුණෙක් යන මොවුන් අතුරෙන් මාගේ බුදුන් ඇඟ අතගෑනට පොහොසත් වූ එකද සතෙක් නැත. මා ගේලිනිය ස්ත්‍රීව සිට බුදුන් ගේ පය අල්වාපුව. එහෙයින් අනාදර විදේ හෝ යි සිතා දන්වන්නාහු සවාමීනි! මාගේ යෙ හලිනිවූ මේ යශොධරා දේවි තුඹවහන්සේ කෙරෙහි අධිකවූ ප්‍රෙම ඇත්තිය. තුඹවහන්සේට ඉතා බොහෝ පක්ෂපාතය. තුඹවහන්සේ මහබිනික්මන් කළද තුඹ වහන්සේ සවභාසනයෙන් හිසකේ වැටිය කපා දැමූහ යි අසා තුමූද ලෙහි අත් ගසාගෙණ මේ ශ්‍රීයහන්ගෙට ම දිව අවුදින් උනාපිකාල විළිම පැහැර තුන්පවකින් රැළිදිදී සිටගන්නාවූ අදුන් රැසක්වන් හිසකේ වැටිය තමා සිදුණින් ම කපා දමාපුව. තවද තුඹවහන්සේ කාසාය වස්ත්‍ර හැඳ පෙරවගතැ යි අසා තොමෝද සසියළු නො හැඳ මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි මේ අද දක්වා කසාපිළිම හඳිනිය. තවද තුඹවහන්සේ එක්වේලේ වලඳිනි යි අසා තොමෝ ද මේ සත්හවු රුද්ද මුලුල්ලෙහි අද දක්වා ම රුබතෙක රස නො දන්නිය. තවද තුඹ වහන්සේ මැටිපාත්‍රයක් ගෙණ සිඟාවළඳිති යි අසා තොමෝ ද මේ සත්හවුරුද්ද මුලුල්ලෙහි රන්වලඳකින් නො කා මැටිපාත්‍රය කින් ම කැව. තවද තුඹවහන්සේ උසසුන් මහගස්නෙන් මල්සුවඳ පැලඳිමෙන් දුරුවූසේකැ යි අසා මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි අද

දක්වා ම තොමෝ ද උසසුන් මහත්තෙන් දුරු ව මල්සුවඳ දුරමෙන දුරුවූවාය. තවද මාගේ බොහෝවූ නෑ රජදරුවෝ අපි රකුම්හ අපි රකුම්හ යි කියා වෙන වෙන ම බොහෝ පඬුරු එවූකල ඒ තෙපුල් ගිවිස්නා තබා ඔවුන්ට තමාගෙන් තෙපුලක් පමණකුත් නොදී නුඹවහන්සේට පක්‍ෂපාතව විසූව. මෙසේ මාගේ යෙහෙළි නියෝ නුඹවහන්සේ කෙරෙහි වෙන වෙනම ඉතා මහත්වූ ගුණ පක්‍ෂපාතකම් ඇතියහ. එහෙයින් ඇ තොං දුන කළ වරද සාමිනි ක්‍ෂමා කොට වදාළ මැනවැයි" කිහ.

සාමිදරුවූ බුදුරජාණන් වහන්සේ මනාහි වෙස්සන්තරජාතක යෙහි බමුණා බැඳ දන්දෙන වේලෙහි කාෂ්ණජිනා නම් ප්‍රියවූ දිය නියන් තමන් වහන්සේගේ පය අල්වාගෙණ හඬන වේලෙහි උපන් මහාකරුණාව සේ ම ඒ දේවීන් කෙරෙහි ද පියකු පය අල්වාගෙණ හඬන දුවකකොට සිතා උපන් මහාකරුණා පතුරුවා වැඩහුන් සේක්මය. ඊට කාරණා කිම? යත්; පෙර සාරාඝංඛ්‍ය කල්පලක්‍ෂය කින් යට මාගේ බුදුන්ට පළමුවෙනි විවරණ දුන්නාවූ දීපඞ්කරනම් බුදුන් සමවතින් එම රම්‍යවතී නුවර කුලස්ත්‍රියක් ව සිට ඒ බුදුන් ගිහිකල අගමෙහෙසුන්වූ පදුමා නම් බිසවුන්ගේ ශරීරප්‍රභා යෙන් අසූරියන් ගෙයි ඇතුන් තොං දල්වා ආලෝක ව තිබෙන ශරීරාලෝකය හා රූපශ්‍රීය දුක ඒ කුලස්ත්‍රීතොමෝ මම ද මෙසේ වූ රූපශ්‍රීය ලදිමි නම් යහළුනි යි සිතා රුව ලබන පින්කම් කර රේදු යි කියා දනුමැතියන් අතින් විචාරා සිල් රක්‍ෂාකළ ස්ත්‍රීහු රූපශ්‍රීන් අග්‍රවෙති යි අසා ඕතොමෝ ද බොහෝ ධනහැර තාපස වෙශය හැරගෙණ පරිබ්‍රාජිකාව සිල්රක්‍ෂාකරන්නී මේ පිණින් මම ද මතු රූපයෙන් අග්‍රව එක්තරා බුදුකෙනෙකුන් බුදුවන ජාතියෙහි මේ පදුමා සම් අගබිසව ඉස් ම දහස් ගණන් ස්ත්‍රීන් පිරිවරා අග බිසෝ වෙමිවා යි පත පතා එම ජාතියෙහි දු බොහෝ පින්කම් කරන්නාවූ ඒ පරිබ්‍රාජිකාවෝ එදා මාගේ බෝසතාණන් විවරණ ලබන කල්හි බුදුන් පෙරමඟට මල් ඇඟ පහස් ඇඟ බුලත් ඇඟ මල් තොරණ පහන් තොරණ බුලත් තොරණ මල්මිටි මල්කදු සුවඳකදු ගෙණ පින් ලොභයෙන් ඔවුනොවුන්පරයා දිවන මිනිසුන් දුක තුමූ ද මහනෙල්මල් මිටි අවක් ඉස තබාගෙණ දීපඞ්කර බුදුන් වඳනා පෙරමඟට දිවගොස් ඒ බුදුන්ගේ අසූරියන් බුඞ්ගරීර යෙන් දිවන සවණක්ගහ බුදුරැස් කදකින් හා දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලකුණෙන් දිලියෙන රූප ශොභාව දැක විස්මයපත් ව මහත් සතුටින් පිණ පිණා කියන්නී

මේ ලොකයෙහි පින්ඇති ස්ත්‍රීහු නම් මේ සවාමීන් වැනි සවාමියක් ඔට පක්‍ෂපාතවූ ස්ත්‍රියක් ම ය යි කිය කියා බල බලා සිටිනා තැනැත්තී පස්සෙහි වඩනා ඒ බුදුන් ගිහිකල පුත්ව උපන් සඳ එක්ව යන නකත්තරුවක් වැනි උසහකඛ්‍ධ නම්වූ පුත් මහ තෙරුන් වහන්සේ ද දැන ඒ බුදුන්ගේ ශ්‍රී මුඛය හා පුතාකුවන් වහන්සේගේ ශ්‍රී මුඛය ඒකාකාර සේ බලා අනේ මම ද මෙසේ මතු බුදුකෙනෙකුන් හා එක්වැනිවූ මෙ වැනි වූ පුත්රුවනක් වදපිම නම් ඉතා යෙහෙක. එ හෙයින් මෙබඳු පුත්සිරි මවත් වාසනා වේවා යි සිතූහ මෙසේ ලෝකයෙහි සෙසු ස්ත්‍රීන්ගේ මනා රූපශ්‍රී බල බලා මෙබඳු රුව මවත් ඇතිවේවා යි සිතීම ද, පුරුෂයන්ගේ ශොභාවික්‍රම බලා මේ පුරුෂයා මට ම හිමි ව වල්ලභ වේවා යි සිතීම ද, අතුන් වැදූ දරුවන්ගේ සුරතල් ලීලා විලාස දැන මෙ වැනි දරුසිරි මවත් ලැබේවා යි සිතීම ද, සියලු ස්ත්‍රීන්ගේ ම සවභාව ධම්‍ය යෙක්මය. ඒ කාරණයෙන් යට කීසේ සිත සිතා බුදුන්ගේ ශ්‍රී බල බලා ඔබට පුත් මහතෙරුන් එන ලීලා ද බල බලා ඔවුන් මවු පදුම නම් කිසවුන්ගේ දරු සිරි ද සිත සිතා දෙහොත් මුදුන් දී දී බුදුන් වැඳ වැඳ එන්නාවූ පබ්බ්‍රාජකාවෝ රන්හෙයක් සේ කඳුරුළියේ දී දිවි පුදු වැදහොත් අප මහ බෝසතාණන් දිවකුරු බුදුරජ දැක වදුරා "මහණෙනි! මේ සුමෙධ තාපසයෝ නම් ගෞතම නම් බුදු වෙති" යි කියා යට කීසේ බුදුන් වදළ විවරණ කථා අසා මාගේ මේ ප්‍රාණීනාව ද මේ විරපුරුෂයා නිසා එකාන්තයෙන් ම සිඛවෙම ය යි සිතා එම විටම බෝසතුන් කෙරෙහි ප්‍රෙම බැඳ තමා හිස තබා ගෙණ යන මහනෙල්මල් අටමිටියෙන් පස්මිටියක් ගෙණ සුමෙධ තාපසවූ බෝසතුන් නමට පුද මේ සවාමිහු මතු බුදුවනකල් දක්වා ඔහු සිත් සේ වාසය කොට ඔබ බුදුවන ජාතියෙහි මේ බුදුහු දැන් විවරණ කථාවෙහි වදළ යශොධරා නම් අගබිසෝ තනතුර මට ම ලැබේවාහි ද ඒ රාහුලකුමා පුත්රුවන ද මාගේ කුසින් වදා දෙවම්මැ යි ද කියා මහබෝසතාණන් වට තුන් ගලක් ප්‍රදක්ෂිණා කොට පළමුවෙනි ප්‍රාණීනාව කළාය එවිට බෝසතානෝ මුවෙන් නො බැණ ඉවසූහ.

ඒ නිසා පරිබ්‍රාජිකා නොමෝ මේ මා කළාවූ ප්‍රාණීනාව එකාන්තයෙන් සිඛවෙමය යි කියා අනිශයින් සන්තොෂවූවාය. ඒ පරිබ්‍රාජිකාවෝ නම් දැන් මේ යශොධරා දේවී ම ය. සෙසු අගසවු අසුමහසවු ආදීවූ මහාශ්‍රාවකයෝ පවා කප්ලක්‍ෂයක් හෝ පෙරුම් පුරා ආවාහුය. මේ යශොධරා දේවී දුරෙනිදනයෙහිදී ම මෙසේ ප්‍රාණීනා කොට වේ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂය මුලුල්ලෙහි අප මහ බෝසතාණන් හා සමඟ ම බෝසතාණන් අත් නො හැර මහත් පක්‍ෂපාතව ආවාය. මේ බුඩශාසනයෙහි මේ යශොධරා දේවීන්ට

වඩා හෙතුසම්පත් ඇතිව ජාති ජාතිවල බුදුන් හා එක්ව පින්කළාවූ අන් කිසිකෙනෙකුන් නැත්මය. එසේවූ පූජි ප්‍රාර්ථනා බලයෙන් ම එක්වූ තැන් පටන් මාගේ සහෝදරවානන් සසර ඇවිදින නොයෙක් අසංඛ්‍යගණන් ලක්ෂගණන් කල්පයන් හැර බුදුවන මෙම කල්පයෙහි උපන් අනාගතජාති දූ හැර උදයභද්ද ජාතක්ෂයෙහි උදයභද්ද නම් රජ ව දශරාජධර්මයන් පුරාගන්නා සමයෙහි රන්රුවක් වැනි ස්ත්‍රීරූපයෙන් සත්සියක් හවුරුදු එකයහෙ සැනපි එතාක්කල් මුළුල්ලෙහි එතදවසක්වත් බ්‍රහ්මයාගේ හෙදයක් නො කොට පිරිසුදු ශීලයම රක්ෂා කොට බෝසතානන් වහන්සේ පළමුවෙන් මිය ශක්‍රදෙවෙඳුව ඉපද පෙර කළාවූ ප්‍රතිඥව ලෙස උපන්තැන් හඟවන පිණිස දේවීන්කරා ගොස් ඔවුන්ගේ ශීලය ද විමසනු පිණිස ලක්ෂයක් අගනා රන්තලියෙක අනාගි ඝතරන් පුරා අල්ලෙහි තබාගෙණ මධ්‍යම රාත්‍රියෙහි දෙවෙඳුවිලාසයෙන් තෝ දක්වා කියන්නාහු දෙ දෙවිලොවට අධිපති ශක්‍රදෙවෙඳු නම් මමය, මාගේ අඹතුන්කෙළක් සුරඟනන් හැර තොප කෙරේ ලොභයෙන් ආයෙමි. තොප හිමි රජ මළහෙයින් තෙපි පරදුරාදෑ නො වෙති. මිළ පිණිස මේ ඝතරන් පුරාලු රන්තලිය දෙමි. අද මේ එක රැයකට මට අවසර දෙවයි කිහ. එවේලෙහි "තෝ දෙවිරජෙක් වෙව යි මාහේ හිමිවූ උදඝභද්ද නම් රජ්ජුරුවන් හැර අනිකෙකු නො පතමි ශක්‍රය! තෝ අනික් දවසට මේ දිසාවටත් නො අවුත් ඉා කෙරෙහි ආලය හැර යව" යි අභිනන්දා පවත්වා ශක්‍රයා යවා දශදඝඝක් හවුරුදු මුළුල්ලෙහි පනිවුනා ධර්මය ම මළ හිමියන්වූ බෝසතානන් නමට රක්ෂා කොට ශිල් ගුණ පුරා පඤ්ච පාත ව සිටියාත් මේ යශොධරා දෙවිමය.

මෙසේ අන්‍යවූ ද නොයෙක් ජාති කොටි ශතසහස්‍රවල මහා වෙස්සන්තරජාතකයෙහි මද්‍රිදේවී ව මහත් පඤ්චපාතකම්හි මහ බෝසතානන් හා මහවල් වැද තපස් කරමින් පින් පුරා ගත්කල් දක්වා ඒ බෝසතුන්ට ම පඤ්ච පාත ව ඕතොමෝ පින්කම්හි හැසිරීමෙන් අප මහ බෝසත් තිසාම දුක් ගත්බැව් වෙන් වෙන් ව ලියත් හොත් නො නිමෙන හෙයින් බුදුගුණ ආදි අන් කිසිවක් මෙහි නොසේ ලියමෝ ද? එ හෙයින් එම දේවීන්ගේ ගුණ කථා වන් විස්තර වශයෙන් අසනු ලබනු කැමැත්තන් විසින් ජාතක කථාවන් අසා බලා දතයුතු.

මෙසේ රාහුල මාතාවෝ බුදුන්ට ම පඤ්චපාත ව ආ බැවින් ඒ ඒ පූර්වචරිතයන් පරීක්ෂාකොට අතීත ඥානයෙන් බලා වදුරා පියරජ තෙන් යෙහෙළිනීවූ ඒ යශොධරා දේවීන්ගේ ගුණ පඤ්චපාතකම්

භගවා කී බසට බුදුරජ වදරණසේක් මහරජ මා මෙසේ බුදුවන ජාතියෙහි ඇ රහත්වන ජාතියෙහි ඉපද සිට මව මෙසේ පඤ්ච පාත ව ඔසු සේ ආශ්චර්‍යයියෙක් නො වෙයි. පෙර නුඹුහුකළ නුවණ ඇතිකල සඳ කිඳුරුව උපන්නැන පවා මා කෙරෙහි ප්‍රේමයෙන් ම මාගේ ජීවිතය රැක දී නොයෙක් ලෙසින් උපකාර මා කෙරෙහි කළාවේදු සි යනාදීන් යශොධරා දේවීන්ගේ ගුණකථා ප්‍රතිසංයුක්ත වූ "විසූ කිණ්නරී ජාතක" දෙශනාව කර වදළසේක. ඒ ධර්මය අසා සතුටු ව එ කෙණෙහි යශොධරා දෙවි පස්වණක් ප්‍රීතින් පිණා ගියාය. පියරජහට ද මහත් ප්‍රීති පහළ විය.

ඉක්බිත්තෙන් මාගේ සවාමිදරුවූ බුදුරජාතන් වහන්සේ බුඩා සනයෙන් නැගිසිට එයින් නික්ම ත්‍යග්‍රොධාරාමයට වැඩ එහි එදා රාත්‍රි භාගයෙහි දවස් යවා ඊට දෙවන දා උදෑසන ම රජගෙට වඩිනා සේක් සවකිය මාතාවූ මහමායා දේවීන්ගේ වියොග ආපදයෙහි තමන් වහන්සේ වඩා රක්‍ෂාකළ කුඩා මැනියන් වූ මහාප්‍රජාපති දේවීන් විසින් වදනලද සුඛෝදන රජ්ජුරුවන්වදුව උපන් නන්ද කුමාරයන්ගේ කඩු බඳනා මඟුල, හෙවදනා මඟුල, ජනපද කල්‍යාණී නම් රාජකුමාරි සරණකරණ මඟුල යන මඟුල් තුනම එ දවසට පැමිණියාහ. මා කිඹී වූ සියල්ල දත් බුදුරජ ද ඒ ප්‍රවෘත්තිය බුඩ ඥනයෙන් දැක වදරා, මාගේ මලනුවූ නන්දකුමරුවා කාමබන්ධනයෙහි බැඳී ගියේ නම් සසරින් මුදුගත නො හැක්ක. එ හෙයින් මම දැන් ම ගොස් ඔහු මහණකරවා ගණිමි සිතා වදරා විසිදහසක් රහතන් වහන්සේ ගෙණ මෙහත්වූ බුඩශ්‍රීන් දිලිහි දිලිහි ඒ නන්දකුමාරයන්ගේ මඟුල් මාලිගාවට වැඩ පණවනලද බුඩාසන යෙහි වැඩහිඳ:-

තපො ච බ්‍රහ්මචරියං ච අරියසච්චාන දස්සනං
නිබ්බාණ සච්ඡිකිරියා ච එතං මඞ්ගල මුත්තමං.

යනාදීන් මඟුල් බණ වදරා මලනුවන් පැවිදි කරගැන්මට විහාරයට ගෙණයනු පිණිස පාත්‍ර ධාතුව නන්දකුමාරයන් කරා දිහුකොට වදළසේක. එ කෙණෙහි නන්දකුමාරයෝ සම්භාරණයෙන් සැරහි මඞ්ගලවිධාන කරන්නාහු ම බුදුරජ දිහුකළ පාත්‍රය ආදරයෙන් ම දෙ අත්ලෙහි තබාගෙණ සිවිකල්හි බුදුහු එකෙණෙහි බුඩාසනයෙන් නැඟිසිට ත්‍යග්‍රොධාරාමය බලා නික්මුණුසේක. නන්දකුමාරයෝත් පාත්‍ර ධාතුව ගෙණ බුදුන්ට පසු යනුවෝ ගිණිමං පඬිය මුලදී දෙර කඩ දී පාත්‍රය ගෙණ වදරණසේක් දෝ හෝ යි සිත සිතා පසු පස් සෙහි එක්ව ම යන්නාහ. බුදුහු පසු නො බලා ම වඩනාසේක්ම ය

එකල ජනපදකල්‍යාණී නම් රාජකන්‍යාව ඒ ගන නන්දකුමාරයන් දැක තමා වසන ප්‍රාසාදයෙහි මතුමාලේ තාවුළුවහැර ත්‍රිවිය දිහුකොට කුමරුවන් මූහුණ බලා හිඳී ඔබ නොරදා වහා දිව එවයි කිව. එතෙ පුල් අසා නන්දකුමාරයන්ගේ ලය කම්පා ව මහත් ආයාස විඳ දිද මි යනුවෝ පාත්‍රය වහල්කබ දී වත් හැරගන්නාසේක් ලෙ හෝ සි සිතා ගොස් බුදුරජ පසු නො බලා ම වඩනා හෙයින් හැම ලෙයින් ම ජ්‍යෙෂ්ඨ බුදුන් කෙරෙහි ආදර ගෞරව සිතින් පාත්‍රය ගතමානැවැසි කියාගත නො හි නො රිසියෙන් ම විහාරයට ගියහ. එකල්හි බුදුහු නන්දකුමාරයන් ලඟට කැඳවා 'නන්දය! චක්‍රවර්ති රාජ්‍යය හැර මා වැනියන් මහණවූකල නා වැනියන්ට ගිහිගෙයි ආලය කිම්? දැන් ම තෝ මහණවෙව යි" වදාළසේක. නන්දකුමාර තෙම බුදුන් වදාළ බසට අනික් උත්තරයක් කියනොහී ජනපද කල්‍යාණීන් සිත සිතා සිටියහ. එවිට ම බුදුහු නන්දයා මහණ කරවයි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට වදාළෙන් ඔහු හිස කෙස් කපා මහණකළසේක.

මහණවූ නැන් පටන් ඒ නන්ද සාමණේර තෙම භික්ෂිය යුතු ශීලාදී ගුණධර්මයන් හැර ජනපදකල්‍යාණීන්ගේ රූප සිත සිතා එදා තුවන් කෙළවරින් බැලූ බැලුම් හා එදා එදා කී බස ම සිත සිතා කදුළු ගෙණ ගෙණ ජනපදකල්‍යාණිය කෙරෙහි ශෝක කෙරෙයි. සමහර භික්ෂූහු ඒ කාරණය දැන "ඇවැත්නි! තෙපි බුදුන්ගේ මලනුවූ මහරජ කුලෙන් පැවිදිවූ සුඛිතයෙක තොපට දුක් කිමිද? දවසින් දවස දුර්ලභීමට කාරණා කිමැ යි" විවාළ තැන නන්දසාමණේරයෝ ඒ අසා "සවාමීනි! අන් කිසි දෙයකින් මට දුකෙක් නැත. ජනපද කල්‍යාණියට ශෝක බලවත් හෙයින් දුර්ලභ වෙමියි කීසේක. භික්ෂූන් වහන්සේ එ තෙපුත් අසා බුදුන් කරා ගොස් දන්වූසේක. බුදුහු ඒ නන්ද සාමණේරයන් කැඳවා සැබෑද නන්දය තෝ මා වැනි බුදු කෙනෙකුන් කෙරෙහි මහණ ව ස්ත්‍රිය කෙරෙහි කළ ලොභයෙන් ශෝක කොට වාසය කෙරෙහි දැ යි විවාළසේක. නන්ද සාමණේර යන් වහන්සේ "එසේය සවාමීනි! ජනපදකල්‍යාණී එ දවස් මා පාත්‍රය අතින් ගෙණ නුඹවහන්සේ කැවි ව එන වේලෙහි හිමියා නෙති! ලස්ව ම එව යි කියා රන්කලසක කරක්වන් තමාගේ කර දිහුකොට මා මූහුණ බැලුව. ඇඟ රුසිරු සිතූකල මට ඉතා මහත් දැඩි ශෝක උපදනේය. ඉන් මාගේ ලය නිරන්තරයෙන් කකියන් නේය යි" කිව. ඒ අසා බුදුහු "නන්දය! තාගේ ජනපදකල්‍යාණී නම් ස්ත්‍රියගේ රූව හොඳ දැ යි" විවාළ සේක. එවිට නන්ද සාමණේර තෙම ලොව හැම පිරිමින් බැඳෙන බැඳෙන සේ සදෘ ශ මලක් වැනි ඒ ජනපදකල්‍යාණීන්ගේ රූපය තමා රූවලෙයින් දන්

හෙයින් බුදුන් ඉදිරියෙහි සිට වර්ණනා කළේය. එකල සවාමිදරුවෝ නිදන් බලා බෙහෙත් කොට ව්‍යාධි සංහිදුවන ඉතා දක්ෂ වෙදෙකු සේ මාගේ මලනුවන්ගේ සත්‍රිලොහය කෙසේ දුරුකෙරෙම් ද? යි සිතා වදුරා රිට නිසි උපදෙසක් දුන "නඳය! තෝ ජනපදකල්‍යාණියට වඩනා රුව ඇති ගැණුන් ලොව නැතැයි" කිව. ඇට වඩන ගැණුන් තෝ දක්නා කැමැත්තෙහිද" යි වදළසේක. ඒ ඇසූ නඳ තම් මහණ තමා රූපමලෙහි බැඳිහුන් හෙයින් කියනුයේ "සවාමීනි! එසේවී නම් මට උන් දක්වා වදළමැනවැ" යි කිහ. එකෙණෙහි මාගේ සවාමිදරුවෝ නඳ සාමණෙරයන්ගේ අත අල්වාගෙණ ඍද්ධිබලයෙන් මහත් රුසිරි ඇති මාගමුන් ඇති ශක්‍ර පුරයට වඩනාසේක් අතරමඟ මහත් වනමඩයෙක්හි අලුත දැගිය දැලිඹේනක් මවාලා ගින්නෙන් දැ සිටි කණුවෙක එම ගින්නෙන් දැ මියගිය කන් නාසා නහුටු නැති වැඳිරිමැහැල්ලක් දත් නියා ගෙණ ඉතා විරූපි ව උන්නා සේ දක්වා පෙන්නමින් "නඳය! තෙල දැ ගිය වැඳිරිමැහැල්ල තොපි දිටිදැ" යි විවාරා වදළසේක. එවිට මමත් දිටිමි සවාමිනි යි කියා කමපාවූසේක.

ඉක්බිත්තෙන් බුදුරජ ශක්‍රයාගේ නඳනොඳුනයට වැඩ ඔහුගේ දිව්‍යසත්හු මෙ තැනට රැස්වෙත්වාසි සිතා වදළසේක. එ කෙණෙහි ශක්‍රයාගේ කකුටපාදිනී නම් දිව්‍යාඞ්ගනාවෝ පන් සියයක් අවුත් බුදුන්වැඳ සිටියහ. ඔවුන්ට ඛණවදුරා නඳ සාමණෙරයන්ට ඒ දිව්‍යසත්‍රීන් ද පෙන්වා ශක්‍රපුරයෙන් වැඩ නැවත නඳසාමණෙරයන් කැඳවා "නඳය! මේ දිව්‍යාඞ්ගනාවෝ ජනපද කල්‍යාණියගේ රුවට වඩනා රූ ඇත්තාහුදැ" යි විවාළසේක. හෙතෙම කියනුයේ "සවාමීනි! දිව්‍යාඞ්ගනාවන් දුටු ඇසට ඒ ජනපද කල්‍යාණියන්ගේ රුව පළමු දුටුවාවූ දැගිය සේනේ දැලිකුණු වෙහි දැ මිය හොත් වැඳිරි මැහැලි කුණසේ ම ඉතා පිළිකුල්ව සිතමි" යි කීසේක. ඒ අසා බුදුහු නඳය! එසේවූ දිව්‍යාඞ්ගනාවන් ලබනු කැමැත්තෙහි නම් තෝ මාගේ ශාසනයෙහි නිමිලකොට සිල් රක්‍ෂාකරව. එසේ සිල් රක්‍ෂාකළවුන්කරා දිව්‍යාඞ්ගනාවෝ තුමූ ම එති. ඒ දෙවඟනන් මාකරා අවුදින් වැඳසිටි ලෙස තෝ ම දුටුයෙහිවේදැයි වදුරා කමටහන් උගන්වා වදළසේක. ඒ නඳ සාමණෙර ද දිව්‍යාඞ්ගනාවන් ලබම් යන සිතින් ඒ නිමිලවූ ශීලය ම රක්‍ෂාකොට නො බෝ කලකින් කමටහන්ගත් ලෙස විදර්‍ශනා වඩා රහත්ව නඳ මහතෙරුන් වහන්සේය යන් නමින් බුදුසසුන නමැති ආකාශයෙහි පුන්සඳක් සේ ප්‍රසිඞ්ධවූසේක.

මෙසේ බුදුරජානන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩි තුන් වෙනිදා නඳකුමාරයන් මඟණ කරවා සත්වෙනිදා විසිදහසක් රහ කන් පිරිවරා සවණක් රැසින් දිලිහි දිලිහි පියරජහුගේ රජගෙයි දී

වළඳන්ට වඩනා සේක. එකල්හි යශොධරා දේවී තමන් පුත්වූ සත් හැවිරිදි රාහුල කුමාරයන් කැඳවා ඇසෙහි හිඳුවා ගෙණ සිඔ සහහා පුතණුඩ රාහුල කුමාරයෙනි! තොප පියාහන් වහන්සේගේ සතර මහ නිධානයෙක් ඇත. එයින් එක් නිධානයෙක් ගව්වෙක. එක් නිධානයෙක් දෙගව්වෙක. එක් නිධානයෙක් තුන් ගව්වෙක. එක් නිධානයෙක් සතර ගව්වෙක ප්‍රමාණ වටින් ඇත්තේය. ගැඹුර මෙතෙකැ යි පමණ දන්නෝ නැත. තොපගේ ඒ පියාහන් වහන්සේ මහණවූ තැන් පටන් එම සතරමහ නිධානයෝ කොතන බවත් දන්නෝ නැත. තවද ඔබට පහළවන්ට තිබූ සත්රුවන් හා චක්‍රවර්ති රාජ්‍යයකුත් ඇත. පියාහන් සන්තකවූ සම්පත් දරුවන්ට අයිතිවීම ලොක ධම්මතායෙකි. එහෙයින් තොප පියාහන් වහන්සේ කරා ගොස් ඒ සතර මහානිධානය හා සක්විතිරාජ්‍යය ඉල්ලා ගණුව යි කිය. රාහුල කුමාරයෝ තමාගේ මුත්තාහනුවූ සුඩොදන රජ්ජුරුවන් හඳුනන බව මුත් තමන් උපන්කල ම මහණ වීමට නික්ම ගිය පියාහන් වහන්සේ කවුරුද යන බවත් තමා නොදන්නා හෙයින් අම්ම! මපියානෝ නම් කවුරුද යි විවාලහ. එවිට යශොධරා දෙවි ඒ රාහුල නම් පුතනුවන් වඩා ගෙණ සිවුමැදුරු කවුළුවෙහි දෙර හැර රාජවීථියෙහි දෙනිස්මහා පුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණ ශ්‍රී ශොභායෙන් දිලිහි දිලිහි රන් කඳක් සේ සවණක් රැස් විහිදුව විහිදුවා අනොපමවූ බුබලිලියෙන් යුක්තව විසිදහසක් පමණ රහතන් වහන්සේත් පිරිවරා ගෙණ දුරින් ම වඩනා බුදුන් දැක පුතණුඩ! අර වඩනා බුදුරජාහන් වහන්සේ තොප පියානෝ යයි අතදිහු කොට පාලා:-

චක්කවරඞ්කිත රත්තසුපාදෙ ලක්ඛණ මණ්ඩිත ආයතපණ්හි
චාමර ඡත්ත විභූසිත පාදෙ එස හි තුය්හ පිතා නරසීහෝ.

සඛ්‍යකුමාරවරෝ සුකුමාරෝ ලක්ඛණ විචිත්ත පුණ්ණසරීරෝ
ලොකහිතාය ගතෝ නරවීරෝ එස හි තුය්හ පිතා නරසීහෝ

පුණ්ණ සසඞ්ක නිභෝ මුඛවණ්ණෝ දෙව නරානපියෝ
නරනාගෝ
මත්ත ගජින්ද විලාසිත ගාමී එස හි තුය්හ පිතා නරසීහෝ.

ඛත්තියස සමාහව අග්ග කුලිනෝ දෙව මනුස්සනමස්සිත පාදෙ
සිල සමාධි පනිහිත චිත්තෝ එසහ තුය්හ පිතා නරසීහෝ.

ආයත යුත්ත සුසණ්ඨිත නාසෝ ඔපවුමෝ අගිනිල
සුනෙත්තෝ
ඉන්දඛනු අගිනිල හමූකෝ එස හි තුය්හ පිතා නරසීහෝ.

ඔට්ඨ සුඔට්ඨ සුසණ්ඨිත ගීවෝ සිහහනු මිගරාජ සරීරෝ
කඤ්චනසුච්ඡවි උත්තමවණ්ණෝ එස හි තුය්හ පිතානරසීහෝ

සිනිඛ සුගමහිර මඤ්ජු සුඛොසො ගිඛ්ගුලඛණ්ඩුර ඛානසුජිවිහෙ,
විසති විසති සෙතසුදසනා එස හි තුය්හ පිතා නරසිහො.

අඤ්ජන වණණසුනිල සුඛෙසො කඤ්චන පටවිසුඛලලාටො
ඛසඛි පණ්ඩර සුඛසුඵණණා එස හි තුය්හ පතා නරසිහො.

ගච්ඡති නිලපථෙ විය වෙජ්ජ තාරගණා පරිවෙසිත රූපො
ඛාවඛ මජ්ඣගතො සමණ්ඩෙජ්ජ එස හි තුය්හ පිතා නරසිහො.

යන මේ නරසිහ ගාථාවන් බැඳ ගෙණ පෙර තමන් බුදුවන්ට පළමුව එක්ව විසූ ඒ බෝසතානන්ගේ වියොග දුඃඛයෙන් නිරන්තර යෙන් ශොක කරමින් ගායනා කොට හුන් ඔවුන්ගේ ම රූප වණී නාවූ ඒ ගාථාවන් පුතාහුවන්ට උගන්වා "පුතණ්ඩි! තොප පියාණන් වහන්සේ නම් එසේ මෙසේ සවලාපකෙනෙක් නොවෙසි. දෙපතුල් පුරා සිටි දෙසිය සොළසක් මහුල් ලකුණෙන් හා රන්වැටි බදු ඇඟිලි පෙළෙන්ද ක්‍රමොන්නතවූ රන්වන් ජඞ්ඝායුග්මයකින් හා රන්කදක් බදු බුදුබදෙකින් හා කලාදෘම ශාඛා යුග්මයක් බඳුවූ ශ්‍රී හස්ත දෙකින් හා පුන්සඳක් වැනි ශ්‍රී මුඛයකින් හා මිදුලිය වැනි කන් සඟලෙකින් හා රන්අකුස්සක් වැනි උස්වූ නාසිකාවෙකින් හා පස්පැයෙන් දිස්නා ඉඳුනිල මාණික්‍ය යුග්මයක් වැනි ඇස් සඟලකින් හා දෙවු දුනු වැනි බැම සඟලකින් හා රන්ගල්මුදුනෙහි දිලිහෙන පුන්සඳක් වැනිවූ තලල්තෙල බබලන දක්ෂිණාවර්තාව අක් උඩුව සිරි උණ රොමයකින් හා ඉඳුනිල මාණික්‍යය සේ නිල්වන් සිරසකින් හා වඩුරියකක් උස සිරස මුදුනෙන් නිකුත්ව දිලිහෙන කෙතුමාලා නම් ලද රශ්මි කදම්බයකින් හා හිරුරැස් කලඹ වැනි සිඟලඟින්ම නික්ම යන සවණක් රැසින් බබළන්නාවූ ඇත් රජක්හුගේ ගමන් පරයන මනොහර ගමන් ඇති හැම ලෝවැඩ පිණිස අනිකක් මිශ්‍ර නො ව එක ම කරුණාගෙයන් මවාලූ රූවක් වැනි එසේ ම මෛත්‍රීගෙන් මුදිතාගෙන් උපෙක්ෂාගෙන් දානගෙන් ශීලගෙන් ප්‍රඥාගෙන් වෙන් වෙන් ව එකිනෙක ගුණගෙන් ම මවාලූ රූවක් වැනි බුදුවදමල් වැනි සුරක්තවූ පාංශුකූලචීවර සඟලෙකින් තමන් වහන්සේගේ රන් වන්වූ ශරීරය වසාගෙණ හිරු පරදවන තෙජසින් සදු පරයන සොම්භාවයෙන් බැලූ බැලූවන් ඇස් නිමවමින් කන් නිවමින් සිත් නිමවමින් පිදූ පිදූවන්ට දෙවි බඹ සැපත් දෙවමින් තුඹ තුඹ සාධුකාර දෙවමින් විසිදහසක් රහතන් පිරිවරා ගෙණ මඹුලු සඳක් සේ සිසාරා සිවගත් බ්‍යාමප්‍රභා මණ්ඩලය මැද මහබඹු සේ රූ සිරින් දිලිහි දිලිහී වඩතෝ තොප පියාණන් වහන්සේ ඇයි ඔබ අතුල් පතුල් සේ තොපගේ අතුල් පතුල් එක්වැනි බව බැලුවම් නැතැවැ" යි යනාදී තොයෙක් කරුණු කියා මේ මේ කාරණයෙන් සැබවින් ම

ඔබගේම පියාතන් වහන්සේ ම ය. එහෙයින් හය නොව ම ලඟට ගොස් සිවුරු කොණ අල්වාගෙණ සිටි හැම ලෙයින් තෙපත සමානවූ එක්වැනි රූ ඇති බව දක්වාලා සොඳ සුරතල්වූ ප්‍රිය තෙපුල් කියා ඔබ කෙරෙහි දයා පෙම්බර වැඩිකොට ගෙණ දරු දැයාද ඉල්වාගත මැනව. එසේ ගෙණ පුතණුබු නුඹ සතර මහදිවඹහට අධිපතිව වක්‍ර වර්තිරාජ්‍යය කරන්නැ යි උගන්වා කැවත පුතනුවන් වඩා ගෙණ ම සත්බුදු මහපෑගෙහි යටමහලව බැස මහපඬි කඳපිට සිටුවා සජීවහරණයෙන් සැරහූ රාහුල කුමාරයන් යවා තුමූ මතු මහලව කැඳී සිංහපඤ්ජරයෙන් බල බලා නො පෙණී සිටියාය.

එකල්හි ඒ කුමාර තෙම කුමාර පිරිස් පිරිවරා යහුගේ බුදුරජ පියානෝ යයි කිය කියා අස අසා සතුටු සතුටුව දිව මවුන්දැ කීලෙස ම නොබා ගොස් බුදුන්ගේ සිවුරුකොණ අතින් අල්වා ගෙණ අවතු රාසියක් මගුල් ලකුණෙන් ශොභමානවූ ශ්‍රීපාදයට නුදුරුනැන පිහා තන් වහන්සේය යන ප්‍රේමයෙන් හය කැතිව තමන්ගේ පතුල් සුන් දෙක සමකොට තබා සිව බුදුන්ගේ ශ්‍රී මුඛය බල බලා මපියානන වූ මහණුන් වහන්ස! මට ඔබගේ දයාද හැම දුන මැනව, මට ඔබගේ රුවම ඉතා ප්‍රියතරය. ඔබ ඇතින් දිවන රිස් ම මා ඇඟට හොඳ සැපය. එහෙයින් ඔබ මාගේ පියානෙව් ම යයි කිය කියා ශ්‍රීමුඛය බල බලා ලඳ බොලඳවූ කොයෙක් සොඳ සුරතල් වචන කිහ. එකල්හි ඒ කුමරුයේ ම සියල්ලෝ දරුකොට ගත් මාගේ බුදුරජ නන් වහන්සේ රාහුල කුමාරයන්ගේ ඇඟිල්ල ශ්‍රීහස්තයෙන් ම අල්වාගෙණ වරෝ දරුව මා ලත්දැ නව දයාදකොට දෙමි කිය කියා කුමර සිත තන තනා සිංහ පැවතකු එක්ව ම ගෙණ යන සිංහ රාජ යෙකු සේ පුත්රුවන හා එක්ව ම රජගෙය කරා වැඩියේක.

එදා දවස ශාක්‍ය කෝලිය දෙනුවරින් රැස්වූ රජදරුවන්ට හා සියලු සතුන්ට ධර්මාමෘත පෙළහැර දී මෙන් ඉතා මහත් සන්තෝෂ උපන. ඒ දක විස්මයපත් වී සාධුකාර නුදුන් එකද සත්ත්ව කෙනෙක් නැත. අහෝ දරු සිරි නම් මෙබඳු දෙයකැයි සතුටු කදුලෙන් දෙනුවන් කොතෙමූ එක ද දරුලත් කෙනෙක් නැත. හැම සත්හු ම මෙවැනි පෙළහරෙක් මේවෙනි මහිමයෙක් මෙවෙනි වික්‍රමයෙක් මේවෙනි බුහුටි කෑමක් මේවෙනි නිර්ගීත කමෙක් අනේ මා දරුවන්වත් වෙවයි කිය කියා සිත සිතා බලා සිටියාහුය. එසේ හැම දනන් සතුටු කරවා රජගෙට වැද පණවන ලද බුඬාසන මාහාත්මයෙහි වැඩහිඳ වළඳ වළඳවේක. එවිට රාහුල කුමාරයෝ ද දයාද ඉල්ව ඉල්වා බුදුන් ලඟ සිවුරු කොණ අල්ව අල්වා සිටිත්මය. බුදුහු වළඳ අනතයෙහි රජගෙන් නික්ම වඩනා කල්හි ද රාහුල කුමාර සිවුරුකොණ හැවි හැවීම දයාද ලොභයෙන් පෙරසේ ම ඉල්ව ඉල්වා යන කල්හි

බුදුහු රාහුලය නෝ නැවතී සිටුව සි වදුරණ අවසරයක් නැති හෙයින් ඔවුන් නවත්වා සිටුවා ගන්ට නිසි අන් කිසිකෙනෙක් එහි නැත් ම ය. මවු වූ යශොධරාදේවි එසේ බුදුන් කැවිවම යන පුතනු වන් බල බලා අනෝ කිමෙක් දෝ හෝ නඳකුමරුවා සේ මපුතනු වන් ගෙණ ගොස් මහණකරගන්නා සේක් දෝ හෝ මම දැයාද සම්පත් නඹා මපුතුන් පමණවත් ලදිමි නම් යශපතැයි සිත සිතා කඳුලෙන් නුවන් තෙම තෙමා ශොකපත්ව හඬමින් බලාසිටියාය. බුදුරජ රාහුල කුමාරයන් එක්වම විහාරයට වැඩ සිතා වදුරණසේක් මේ කුමාර තෙම තමන් පිතුසතතක ලෞකික ධනයම උතුමැයි සිතා ඉල්වන්නේ ය. ඒ ධනය වනාහි තමා බාල බැවින් ම පතයි. සියලු දුක් සන්සිදිම ය යන නිර්වාණය පිණිස නොවන බව නො දන්නේ ය. ඒ ධනය ලොව ඇති හැම දුකට මුල්ව සිටින්නේය. තමා සපයා විඹාවූ ගිමියන් හැර වෙන්වීමම සවභාව කොට එකාතත යෙන් ම ඇතියේ ය. එහෙයින් රන් රිදී කෙත් වත් ඇත් අස් ආදි හැම ලෞකික සමපත් ම ලොව රජදරුවෝ ද පැහැර ගන්නාහුය. සොරහු සොරා ගන්නාහුය. දියගිනි අප්‍රියයන් කෙරෙනුදු නැසී යන්නේ ය. එම ධනය නිසා කාය වචී මනො යන තුන් දෙරින් සඛයාට හැම අකුසල් ම පිරෙන්නේ ය. තණ්හාවද විශෙෂයෙන් වැඩෙන්නීය ඒ තණ්හාදිය නිසා ම ආයුධ දඬුමුගුරු ගෑණිමෙන් කලහ විග්‍රහ විවාදදියට පැමිණ අනෙකප්‍රකාරවූ ලාමක අකුශල ධම්මෝ පහළ වන්නාහු ය. එහෙයින් මම පාරමිතා බලයෙන් බෝමැඩ දී ලත් ශ්‍රඩාදී සප්තවිධ වූ උතුම් ආඃර්‍ය ධනය ම දී එයට හිමි කරමිසි සිතා වදුරා සැරියුත් මහතෙරුන් කැඳවා "සාරිපුත්‍රස්ථවිරය! මේ රාහුලකුමරු මා අතින් දැයාද සමපත් ඉල්වයි, එහෙයින් මෝ හට නො නස්නා ධනය ම දෙන පිණිස මහණ කරවා ලවයි" වදළසේක. රාහුලකුමාර ද තමා කෘතාධිකාර මහ පිණැති හෙයි නුත් බොහෝ ජාතිවල බුදුන්ට දරුව කිකරුව ම ආ හෙයිනුත් මහණ කරවයි වදළ බස් අසා මපියාණෝ මට අද උතුම් ධනයක්ම දී වැඩක් ම සාධනසේකැ යි සිත සිතා සතුටු සතුටුව සිටියේ ය. එවේලෙහි සැරියුත් මහතෙරුන් වහන්සේ රාහුල කුමාරයන්ගේ ඉසකේ කපා බුදුන් අභිමුඛයෙහි දී ම මහණකළ සේක.

සුඛොදන රජ්ජුරුවෝ මූනු බුරාණන් මහණ කළහ යි අසා මහත්වූ ශොකයෙන් බුදුන් කරා දිව මහ හඬින් හඬා බුදුරජාණන් වහන්ස! නුඹ වහන්සේගේ ශාසනය අවිවාර වූ සස්තෙක් ද? මවු පියන් කෙරෙහි ගරු සරු නො කරණ ශාසනයෙක් ද? නුඹවහන්සේත් මට නො කියා සැහවී ගොස් මහණ වූ කල්හි අනල්පවූ දුක් මට උපන. එසේ ම මාගේ කුඩා පුතනු වූ නඳකුමාරයිනුත් නො දන්වා උදුරාගෙණ මහණ කොට ගත්සේක. මාගේ මූනුබුරාණන්

උපන්ද ම නුඹවහන්සේ මහණවන්ට ගිය හෙයින් මා විසින් වඩා ඇති කොට ගෙණ නුඹ වහන්සේගේ අතුල් පතුල් ආදි හැම පුරුෂ ලක්ෂණ වැනි බවුන්ගේ රැසිරැ ම බල බලා ඔබ නො දැක් මෙන් මට උපන් මහා ශොක තුනී කොට ගතිමි. එසේවූ ඒ රාහුල කුමා රයන් ද මහණ කොට ගත්සේක. එසිනුදු මට නො ඉවසිය හැකිවූ අධිමාත්‍ර දුක් උපන. සවාමිවූ භාග්‍යවතුන් වහන්ස! මම වනාහි බුදු මාමකය ධම් මාමකය සඞ්ඝ මාමකය. එසේත් ඇති ව සිට තමන්ගේ පියාගන් විසින් ම පුතනුවන් මහණ කළ කාරණයෙන් උපන්දුක් ඉවසාගත නොහෙන කල සෙසු ජනයෝ දරු මුනුබුරන් පැවිදි වූ කල්හි කසේ තම් දුක් ඉවසන්නාහු වෙද් ද, එහෙයින් මාගේ ම සවාමිදරුවූ බුදුරජාණන් වහන්ස! අද මට උපන් දරු ශෝකය සේ දරු ලත් ලොව සියලු දෙමවුපියන්ට ශෝකයක් නො වනු කැමැත්තෙම්. එහෙයින් මට අනුකම්පා පිණිස නුඹවහන්සේ දෙමවු පියන් විසින් අනුනොදත් දරුවන් මහණ නොකරණ සේ ඒ වරය මට දුන මැනව යි කියා යාවඤ්ච කළහ. එකල්හි ඒ රජහට භාග්‍යවතුන් වහන්සේ ඒ වරය දෙවා වදුරා මෙලෝ පරලෝ දක්වා කරණලද ධම් - ථායෙන් රජ්ජුරුවන් සතුටු කරවා අවසර දී යවා ඉක්බිතිව භික්ෂුසංඝයා රැස්ක වා 'න භික්ඛවෙ අනනුඤ්ඤාතෙ මාතාපිතූහි පුත්තෙන පබ්බාජෙතබ්බා" යි යනුවෙන් දෙමවු පියන් විසින් අවසර නුදුන් දරුවන් පැවිදි නො කරණ සේ ශික්ෂා පද පණවා වදුළසේක.

බුදුරජාණන් වහන්සේ ඊට දෙවෙනි දිනයෙහි පෙරවරු හැඳ පෙරව විසිදහසක් රහතන් වහන්සේත් පිරිවරා රජගෙට පිඬු පිණිස වැඩ පණවනලද ආසනයෙහි වැඩහිඳ උදය කැඳ අවුලුපත් වළඳ දහවල් බත් වළඳන වේලා එනතෙක් පියරජ්ජුරුවන් හා සමඟ සතුටු විශයුතු ධම්සාකච්ඡා කරමින් වැඩහුන්සේක. එවිට සුබෙ, දන රජ්ජුරුවෝ සවාමිනි නුඹ වහන්සේ දුෂ්කරක්‍රියා කරණ කල එක් දෙවිදුවක් රාත්‍රි භාගයෙහි අවුදින් මට කියන්නී නොප පුතනුවෝ සිඩ්ඨී කුමාරයෝ බත් නැතිව වියලී ගොස් සක්මන් තෙළවර වැටී මළහ යි කිව. ඇ කී බස් අසා මම මාගේ පුතනුවෝ ලොවුතුරා බුදුව මුත් නො මියනසේකැ යි කිමි කිහ. ඒ අසා ඔහොමෝ දෙවැනි තුන්වැනිවත් එසේ ම කිව ඒ මම නො ඇදහිමි යි කිහ. බුදුහු එතෙපුල් අසා මහරජ දැන් මා බුදුවන ජාතියෙහි නොප රහත් වන ජාතියෙහි සිට මා නැසිනැ යි කිබස් මෙසේ නො ගිවිසිම විස්ම යෙක් නො වෙයි. නුමුහුකළ ඥානයෙන් සසර ඇවිදින කල එසේ කිබස් නො ගිවිසිම ම විස්ම ය යි වදුරා ඒ කෙසේදැ යි ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ:-

ඇටගිය දවස කසිරට ධම්පාල නම් ගම එනම් ජ්‍යෙෂ්ඨයෙක් විය. ඔවුන්ගේ කුලයෙහි කෙලි කොල්ලන් දක්වාත් ඇම්දෙන ම රා නොබොනී, බොරු නොකියති, සොරකම් නොකරති, සතුන් නොමරති, කේලාම් හා පරුෂබස් නොකියති, මහණ බමුණන් කුල ජ්‍යෙෂ්ඨයන් දැක ආදර ඇතිව පුදන්නාහ, වැඩි සිටියන් දැක උසහ නොඉදිනාහ, පන්සිල් රකිති, පෙහෙවස් රකිති, හැමලෙසින් ම කුසල් කිරීමෙන් ධර්මය ම පාලනය කෙරෙති. එසින් ඒ කුලය ධම්පාල කුලය යි ප්‍රසිද්ධ විය. එසේ ධර්මිෂ්ඨව සත්මුත්තෙක පටන් පවත්වන්නාවූ කුශල ධර්මයන්ගේ බලයෙන් ඒ කුලයෙහි උපන් හැමදෙනම පිළිසඳ පටන් ආයු කෙළවරමුත් අන්තරාය මරණින් මිය නොයන්නාහ. එකල්හි අප මහබෝසතාණෝ ධම්පාල රජුන් නිසා එහි ධම්පාල නම් කුමාරව ඉපද වැඩිවිය පැමිණ ශිල්ප ඉගැන්මට ගියතැන නැසී ඔවුන් දවාලු සොහොන්හි තුබූ මේ ඇටකැබලි යකි වඤ්චායෙන් ගෙණවුත් දැක්වූ ඇට දැක පවා එකලට ධම්පාල නම් රජවූ බඹ තොඇදහූ වෙහි වේ දැයි ය්‍යාදි කාරණයන් ප්‍රකාශ කොට විස්තර වශයෙන් ධර්මපාල ජාතකය ගෙණහැර දක්වා ම ළඟේක. එ හෙණෙහි සුඛොදන රජ්ජුරුවෝ අනේ මෙම පුතනුවන් වහන්සේ දැන් පම්ණක් මට දරුවූසේක් නොවෙයි පෙරත් මට දරුවූසේක්ම යයි කියා උපන් සතුදෙන් අනාගාමි මාගි ඵලයට පැමිණියහ. මෙසේ බුබ පිතාවූ ඒ රජතෙම බුදුන් සිහා වැඩි දා ඒපියෙහි දී වදළ ධර්මයෙන් සෝවාන් ව ඇතුළු රජගෙයි දී වදළ ධර්මයෙන් සකෘදාගාමීව තැවත එසේ ම වදළ ධම්පාල ජාතක දේශනාවෙන් අනාගාමී ව පසුව පිරිනිවන් පානා දා දළපුඩු සේසතින් යුත් යහන්හි වැදගෙව අමාමහ නිවන්පුර වැද සැනහී ගියසේක.

මෙසේ මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ පෙර වෙළු වනයෙහි වසන කල කිඹුල්වත් පුරයෙන් ම තමන් වහන්සේ කැඳ වාගෙණ යන පිණිස ආ දශදහසක් ඇමතියන්ට ඔවුනොවුන්ගේ චරිත බලා කරණ ලද අනෙකප්‍රකාරවූ සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද, එසින් නික්ම කිඹුල්වතට වඩනා සැටයොදුන් මහ අතර ඒ ඒ තැන රාජවගිය මහාජනයාට කරණ ලද අප්‍රමාණවූ සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද, න්‍යග්‍රොධාරාමය පිළිගෙණ එසින් අහසට පැන නැගී රුවන් සක්මනෙහි සක්මන් කරමින් සිට දශදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්ම ගරුඩ ගාන්ධර්ව කර නාගාදි සියලුම සතුන්ගේ චරිත ලෙස බුඩවංශ අනාගතවංශ දෙක දෙශනාකර වදරමින් කුහුඹුවන් පවන් මහබඹුන් දක්වා හැම සතුන් ම ඔත්ගෙණ අප්‍රමාණ සත්ත්වයන්ට කරණලද අප්‍රමාණවූ සඞ්ඝානුශාසනාවන් ඇතිහෙයින්ද,

සොවාන්මාගීාදි තුන්මග තුන් ඵලයෙන් නිවන්පුර වැදි සැනසීගිය සුඛෝදන නරවරාදි එක්ලක්ෂ සැටදහසක් පමණ ශාක්‍ය නැයන් හා අප්‍රමාණ සත්නට වැඩ සැදීමෙන් ප්‍රාතිහාර්‍යයෙන් ගෙදී පිඬු සිහා වැඩ වේ මග පුරාසිටි පියරජ ප්‍රධානවූ මහපිරිසට උතුම් ගාථාරත්නයකින් දෙසන ලද සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද, ඇතුළු රජ ගෙයි එම රජ හා මහාප්‍රජාපතීන් ප්‍රමුඛවූ සතළිස් දහසක් පමණ අන්තඃපුර වාසී මහපිරිස හිත් බලා පවත් වනලද උතුම් සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද, එම රජ සහිත වූ පිරිවර සත්‍රින් පන් සියයක් දෙනා හා යශෝධරා දේවීන්ගේ චරිතලෝභ කරණලද සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද, නන්දකුමාරයන් හා රාහුලකුමාරයන් මහණකරවා පියරජ ප්‍රධාන වූ සවකිය බන්ධුවර්ගයෙහි හැම නැයන්ට තමන් වහන්සේ වත් නිවන්පුරවම පැවිදිවීමෙන් හා සොවාන් සකෘදගාමි අනාගාමි රහත් මාර්ගයෙන් ම වැදී සැනහෙන සේ මෙසේ නොයෙක් වර කරණලද ප්‍රමාණාතික්‍රාන්තවූ සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් ද ලොවට සරණවූ මට ම හිතවූ මට ම පිහිට වූ මාගේ ම ස්වාමිදරුවූ බුදුරජාණන් වහන්සේ ශාස්තෘ නම් වනසේක. එසේ හෙයින් කියනලදී.

දෙවමනුස්සානං ලොකෙ අග්ගං ඵලං දදං
දදනතං දමයතානං පුරිසාජඤ්ඤ තෙ නමො-ඔ.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඞ්ඝාවවාද සංග්‍රහයෙහි මෙතෙකින් අප බුදුන් කිඹුල්වත්පුරයට වැඩි පළමුවෙනි ගමනෙහි බඹුන්ට වැඩ සැදීමෙන් න්‍යග්‍රොධාරාමයෙහි වැස සියලු ලෝවැඩ කළ ප්‍රවෘත්තිය කියා නිමවනලදී.

—(o)—

මෙසේ අප බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි පළමුවෙනි ගමනෙහි ම තමන් වහන්සේගේ පිතාවූ සුඛෝදන නරවරාදි එක්ලක්ෂ සැටදහසක් ශාක්‍ය නැයන් ඇතුළුවූ අප්‍රමාණ සත්ත්වයන්ට වැඩ සාදු වදුරා එසින් නික්ම එම විසිදහසක් රහතන් වහන්සේත් පිරිවරා රජගහ නුවරට වැඩ එහි සීතවන නම්වූ මහවෙහෙහි වාසය කළසේක. එකල රජගහනුවර මහ ධනසිටාණන් හා සැවැත්නුවර අනේපිඬු මහ සිටාණෝ ඔවුන් දෙදෙනාගේ නැගනිවරුන් ඔබ නොබ ආවාහ විවාහ වශයෙන් ගණුදෙනු කිරීමෙන් නැවත ඤාති බන්ධනයෙන් හා මිත්‍රබන්ධනයෙන් දැඩතරව බැඳී විශ්වාසව ඔවුනොවුන් ඒ ඒ නුවරවලට යොදනක් පමණතැන් එන යනවිට පෙර ගමන් පසුගමන් යාම් ඒම් ආදි වශයෙන් කරණලද මහත් ආදර ගෞරව සත්කාර ඇතිව වසන්නාහුය.



ඇසොඩරා දේවිය බුදුරදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි අඩාවැටීම (131 පිට)

එයින් අනේපිඬු මහසිටාණෝ එක් දිනයෙක ගැල් පන්සියයක් ගෙන්වාගෙණ රජගහනුවරට ගියහ. එදවස රජගහනුවර සිටාණෝ බුදුන්කරා ගොස් බණ අසා සෙටදවසට දන්දෙම් යි කියා ආරාධනා කොට අවුත් දන් විධාන කරමින් සිටි දවසෙක. එහෙයින් පෙර සේ ම ඉදිරියට එන ගමනක් නැති හෙයින් අතරමඟදී මහල් කඩ දී දෙරමිදුලේ දී එත් දුන් දුන් මාගේ නෑ මිත්‍ර සිටානන් දකිම් යි සිත සිතා ආවාවූ අනේපිඬු මහසිටාණෝ කිසි තැනකදීත් කෝ දූක අහෝ ඕහට කිසියම් ආයාසයක් ඇතිවනැයි සිතා ගෙදර ඇතුළ වම පැමිණිකල්හි දූක වැඩි සාමීචිකථාවකටත් අවකාශ නැති හෙයින් සිපගෙණ කිමෙක්ද? මහසිටානෙනි! මහනිදුක් ව සුවසේ ආදැ ද? බාල දරුවන්ට දුක් නැද්ද? යන මේ වචන දෙක පමණක් කියා දර දිග ගෙණෙව. මෙසේ මෙසේ ඛාද්‍ය භොජ්‍ය සදවි යනාදි වශයෙන් නො පමාව දූක විධානය ම කරවමින් සිට සවස අනේපිඬු මහසිටානන් කරා ගොස් සුවදුක් කථාකරමින් සිටි හෙයින් ඒ සිටානන් කෙරෙන් විවාරණුවෝ "පෙර මා මේ නුවරට ආකල සේ පෙර ගමන් ආදියත් නො කොට ගෙට ම පැමිණිකලවත් එසේ ම සත්කාර වචන කථා ආදියත් අද නො කළදැය. මහත්වූ මඟුල විධානයකුත් කරව. කිමෙක්ද? සිටානෙනි! මෙනුවර රජ්ජුරුවන් හා මහසෙනහට අමුතු බතක් දීමෙක් ද?" යනාදි කරණු විවාළතැන රජගහනුවර සිටාණෝ කියනුවෝ "අනේ මාගේ යහළුවූ අනේපිඬු මහසිටානෙනි! නුඹ නො ඇසූ සේද? සුඛෝදනරජ පුත් සිඛාඤ්ඤී කුමාරයෝ දැන් ලොවුතුරා බුදු ව දහම්වැසි වස්වා සතුන් පිණවමින් දෙවි බඹුන් ලවා පාමුල්හි වන්දවා ගෙණ කුල දූසයන් සේ ඔවුන් ගෙන් මෙහෙ ගණිමින් සිටිති. බුදුරජානන් වහන්සේ දැන් අපගේ නුවරට වැඩ මේ සිතවෙනෙහි වාසය කරණසේක. මම ඒ බුදුන් කරා ගොස් බණ අසා දහම් රසයෙන් මත් ව සෙට දවස ඒ බුදුන්ට දන් දෙන පිණිස මහත්වූ දානවිධානයක් කෙරෙමි. එසේවූ මම තොප හා කුමන කථාවක් කෙරෙමි දැ සිහිහ.

ඒ ඇසූ අනේපිඬු මහසිටාණෝ තමන් මහපිණැති හෙයින් බුදුහුය යි කී වචනය හා සමඟ උපන් මහත් සන්තෝෂයෙන් සිය ලඟ ලොමු දැහැගන්වමින් ඉතා විස්මයපත් ව අනේ මාගේ යහළු ව නොවළහා ඇති තතු ම්ට කියව සැබවින් ම ලොවුතුරා බුදුකෙනෙක් දැයි විවාළහ. එවිට යහළුව සැබවින් ම ලොවුතුරා බුදුකෙනෙක් මය. එයට නෙපි සැක නො කරව යි කිහ. දෙවෙනි තුන්වෙනිවත් විවාරා එසේ ම දැන්වූ හෙයින් අනේපිඬු මහසිටාණෝ මේ ඇසූ වචන ය කප් කෙළ සුවහසෙකිනුත් ලැබඟත නො හැකි උතුම් වචනයකි. එහෙයින් මට වූයේ මහා වැඩෙක. මේ නුවරට මා

ආයෙන් වූයේ යෙහෙක, යහළු කුඹ දයා ඇති නම් දැන් ම මා ගෙණ ගොස් බුදුන් දක්වා ලව යි කීහ. ඒ අසා රජගහනුවර සිටානෝ කියන්නාහු 'මාගේ යහළුවුමහසිටානෙනි! බුදුන් ඒ සිතූ සිතූ විටම දකලිය නොහැක්ක. නොවේලෙහි ගියකෙනෙක් ඇත් නම් බුදුහු බුඩසනයෙහි වැඩහිදිනාසේක් නමුත් ගඹකුටියෙහි ගඹමාලයෙහි වැඩහිදිනාසේක් නමුත් නොපෙණෙන සේක්මය. ඇතැම් විටෙක ධ්‍යාන සුවයෙන් වැඩහිදිනා සේක. දෙවිබඹුන්ගේ ප්‍රශ්න හෝ විසඳනසේක. සක්දෙවිරජහු වැනියෝ පවා නොවේලෙහි බුදුන් කරා ගොස් දැක්ක නොහිඇපස්සෙහි පලායෙති. බුදුන්ගේ අදහස් දැනගත නොහැක්කේය. සොහොන්හි නමුත් වයනසේක. එහෙයින් දැන් බුදුන් දැක්මවේලාවකුත් නොවෙයි. සෙට උදැසනම කැදවාගෙණ ගොස් බුදුන් දක්වාලම්. අද මේ එකරියකට සැනපි ගණුව සි කියා සන්හිදුවා අනේපිඬු මහසිටානන් සත්මහල් මහා ප්‍රාසාදයෙහි මතුමාලේ යහන්ගබඩාවේ සැතැප්පවූහ.

ඒ අනේපිඬු මහසිටානෝ බුදුන්ගේ නම ඇසුවේලෙහි පවන් කිසිහාණ්ඩියකගේ විඛානයකුදු නොකොට පිරිවර ජනයන් හා කිසියම් කථාවකුත් නොකොට බුඩාලඹන ප්‍රීතින් මත් ව ගියා සේ "බුඩෝ බුඩෝ" සි කිය කියා යහනේ වැද හෙව සෙසු දවස් සේ නිස්පැයකින් ම හිරු නොනැගී අද කිපැයකින් ම පහන් වි නම් යහපතැ සි සිතා නිදන්නාහු පළමුවන යම් සිඟිනෙන් පිබිදියා සේ දැක ඇස දල්වා බුඩාලඹන ප්‍රීති ශ්‍රඩාවෙන් පහන් දහස් ගණන් දැල්වූවාසේ ඇතුළ දැක පහන්ව ගිය හිර පැනකැංගේ වන අහෝ කල්යවා නිදුපිම් මා කෙළේ මේ කිමෙක් දැයි සිත සිතා ගබඩාවෙහි දෙර හැර ගොස් සඳැල්ලට බැස අහස බලා හිරුමඩල නොදැක අහස මුදුන්පත් සඳමඩල දැක සඳ පියවර බලා දසපැ ගියේ යැයි දැන නැවතත් ඇතුළගෙට වැද නිදන්නාහු දෙවන යාමෙහි දු එසේ ම ආලෝක ව දෙරට ගොස් එසේ ම බලා විසිපැය ගියේය යි දැන නැවතත් ගෙට වැද නිදන්නාහු තුන්වන යාමෙහිදු එසේම ආලෝක දැක සැබවින් ම පහන්වූහ සි සිතා අලු යම් රාත්‍රියෙහි ම බුදුන් දක්නට නික්මිණ,

එ කෙණෙහි සිටානන්ගේ ශ්‍රඩාබලයෙන් දෙවියෝ මෙතෙම් මතු තුණුරුවන්ට තමා ගෙයි දෙර විවෘතඛන කරණ මහතෑන කෙනෙකැ සි සිතා සිටානන් කෙරෙහි පැහැද සත්මහලෙහි ම දෙරවල්හැර ආලෝක කොට සිටගත්හ. එසේ ඇති කල්හි අනේපිඬු මහසිටානෝ මහවාසල්කඩින් පිටත්ව යනුවෝ අමුසොහොනකට පැමිණ එහි මිනිකුණුවල පය පැකිල ඇගකල අති සිහිල් බව වැටහිත. මිනිකුණුගන්ධය කාසයට දැනුනි. එ කෙණෙහි ම මිනි කුණප වනැ සි උපන්නාවූ මහාපිළිකුල් සිතින් බුඩාලඹන ප්‍රීතිය අඩුවූ හෙයින් සිටානන්ට පෙණීගිය ආලෝකය අනතඩාණ විය.

දසදිග අදුරු විය. එ වෙලෙහි රාත්‍රිය බව දුන් අමූසොහොනට පැමිණියෙමි සිතා මහත්වූ භයට පැමිණ ආපසු යෙමි යි සිතා මඳක් පසුවිය. එ කෙණෙහි ම ඒ සොහොන්හි රුක්දෙවතාවා ඒ සිටානන්ට උපන් භය දැන මෙතෙම මතු බුදුන්ට අග්‍රුපස්ථායක වන මහ පිණැත්තෙක. ඕහට සහාය වූව මැනව යි සිතා ආකාශ යෙහි විදුලියක් සේ පෙණි කිඹකිණික නාදයක් සේ හඬ නොගණුව යි කියා:-

සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්ත මණිකුණ්ඩලා
එකස්ස පද විතිහාරස්ස කලං නාගඝනන්ති සොළසිං.

යන මේ ගාථාව කියා, ඇතුන් ලක්ෂයක් අසුන් ලක්ෂයක් රථ ලක්ෂයක් දෙවහනන් බදු වරහනන් ලක්ෂයක් යාචකයන්ට දන් දුන්නේ වී නම් එසේවූ දානවිපාකයටත් වඩා යමෙක් බුබාදි තුණු රුවන් අරහයා වඳින්ට යෙමි, බණ අසන්ට යෙමි යි සිතා විහාරය කට යේ නම් ඔහු සන්සිඳි යන ගමනෙහි එක්පියවරක් ඉදිරියට ඔසවා තිබූකල ඒ පය අග්‍රාංගුලි කෙළවර දක්වා අතුර මිටිරියන් පමණ වූ පදවිතිහාර නම් භූමිය සොළොස් කොට්ඨාසයක් කොට එයින් එකභාගයක් ගෙණ එයිදු සොළොස් කොට්ඨාසයක් කොට බෙදූ මෙසේ මෙසේ සොළොස්වාරයක් බෙදූකල අස්ලොමක් පමණ ඉතා සූක්ෂම වූ භූමියක් වෙයි. එ පමණවූ භූමිය ගෙවා යාමෙන් සිඹ වූ කුශල සම්භාරය ම සුවහස් ගුණෙන් වඩනේය. එහෙයින් "සිටා නෙති! නොමැලි ව යව. දැන්ම හොස් බුදුන් දකුව ආපසු නො යව නො යව යි" කිහ. ඒ අසා අනේපිඬු මහසිටානෝ අහස බල, දෙවතාවා දැක මම මෙතැන් පටන් එකලාව නො වෙමි. දෙවියෝත් මා හා සමඟ ඇත්තාහු යයි දැක උපන් භය සංසිඳුවා ගෙණ නැවත බුබාලම්බන ප්‍රීති උපදවා ගෙණ පෙර සේ ම ආලෝක උපදවා ගෙණ ඉදිරියට යන්නාහු නැවත දෙවන තුන්වනුවට මළ මි ා කුණපවල පැකිලිමෙන් උපන් භය දෙවතාවා ම එසේ සංසිඳුවාලූ හෙයින් දෙව තාවාගේ, සහායෙන් හා ශ්‍රද්ධාබලයෙන් අනේපිඬු මහසිටානෝ අලුයම් රාත්‍රියෙහි බුදුන් වසන විහාරයට යම්න්සිට සිතනුවෝ ලෝක යෙහි අපි බුදුමහ යි අපි බුදුමහ යි කිය කියා ඇවිදිනෝත් ඇත. ඉදින් මුන්වහන්සේ සැබෑ බුදුකෙනෙක් වී නම් මාගේ මවුපියන් තුබූ තම මා මිස මාගේ අබුදරුවෝ වත් නො දනිති. ඒ නම කියා මා කැඳවා කථා කළසේක් වී නම් සැබෑ බුදුකෙනෙක් මය. එසේ විමසා ගෙණ මම වදිමි පුදමි සත්කාර කෙරෙමි, එසේ නැතහොත් මේ කිසිවක් නො කොට ආපසු ම කැරකැවී එමි යි සිතූහ. එවේ ලෙහි මාගේ සවාමිදරුවෝ එකසතෙකු තබා අනන්ත ලොකධාතු යෙහි සතුන් සිතූ සිත් තමන් වහන්සේගේ එකසිතින් දැනගන්නා

තරම් අසාධාරණවූ බුඩඟුන ඇතිහෙයින් ඒ සිවාතන් සිතූ සිත දූකා මා වැනි බුදුකෙනෙකුන්ට අග්‍ර උපස්ථායකත වෙමි යි ප්‍රාර්ථනාකොට ආ පුණ්‍යවන්තයා පෙරමගට දැන්ම යෙයි සිතා වදුරා ගඩිකුටියෙන් බාහිර ව ගඩිමණ්ඩලමාලකයෙහි සක්මන් කරමින් වැඩ සිට සිවාතන් එන පෙරමඟ බලා වදුරමින් ඕහට අභිමුඛව බුඩසනඟඟහි වැඩහිඳ සුදත්තය මෙසේ මා කරා එව යි වදුළුවේක. සිවානෝ සුදත්තය යි කී එකබස කණට හිම හා සමගම මුන්වහන්සේ සවිනේ ගෙවා දත් සැබෑ බුදුකෙනෙකුන් වහන්සේම වනැයි විශෙෂයෙන් දූන බුදුන් කෙරෙහි පැහැද බුදුන්කරා වහා දිවගොස් අමාවිලක් දුටු පිපාසිතයකු සේ බුදුන්ගේ චරණාඩමයුඛ නමැති අමාවිල්හි ගැලී ගැලී සිත් සනහ සනහා පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව දෙහොත් මුදුන් දී ඟිඳ මහත් ප්‍රීතින් පිණාකිය මුඛයෙන් බුදුන්ගේ මුඛපද්මය බල බලා කිමෙක්ද? මාගේ සවාමිදරුවූ සවිනේ ගෙවා දත් බුදුරජනෙනි! මාගේ නම කියාලූ එකබසින් ම නුඹවහන්සේට කුලගැනි වීමි. සවාමීනි! කෙසේ රාත්‍රිය ඉක්මවා යිගේ ද සුවයෙන් සැතපුනුසේක්ද යි විවාළහ. එ වෙලෙහි ඔහු කී බස ම ගෙණ ඕහට බණකියා සසරින් ඔහු ගොඩ නඟම් යි සිතා වදුරා:–

සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණෝ පරිනිබ්බුතෝ
යෝ න ලිම්පති කාමෙසු සීතිභූතෝ නිරූපධි
සබ්බා ආසත්තියෝ ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං
උපසමෙනා සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසෝ–යී.

යන මේ ගාථා දෙකින් එසේය සිවානෙනි! යමෙක් සවාසනා කෙලෙසුන් නසා ශාන්තියට පැමිණියේ වී නම් සුවයෙන් සැන පෙන්නේ වේද යි යනාදි ක්‍රමයෙන් සිවානන්ට අනුරූපවූ ධර්ම දෙශනා කළසේක. එ වේලෙහි අනේපිඩු මහසිටානෝ කෙළදහ සක් කෙලෙසුන් ගෙවා දඟසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන්ඵල යෙහි පිහිටා ඒදුරුපොළොවෙක ගලා හිදුවූ වළුබිලයක් සේ බුඩ ශාසනයෙහි සිරිරව පිහිටියාවූ අවලශ්‍රඩා ඇතිව බුදුන්ට ඝතසඝස්‍ර වනඳයන් සතුති කොට සවාමීනි! ගැත්තහු මේ නුවරට ආගනතුකවී ආවත් මාගේ ශ්‍රඩා පමණින් දූනයක් දී ගන්නා කැමැත්තෙමි, සෙට දවස ගැත්තහුට අනුග්‍රහකළ මැනවැයි බුදුන්ට ආරාධනා කොට සුහුරුබුඩු සිවානන්ගේ ගෙට ගොස් නොයෙක් භාණ්ඩයන් පරිත්‍යාග කොට දූනවස්තූන් රැස්කරන්ට පවන්ගත්හ. රජගහ නුවර සිවානෝ එ පවත් දූන යහළු තෙපි මේ නුවරට ආගනතුකවූව මම නේවාසික වෙමි, එහෙයින් තොප වෙනුවෙන් දූන පරිත්‍යාගය මාගෙන් ම කෙරෙමි යි තෙපි යෙහෙන් හිඳුවයි කීහ. ඒ අසා අනේපිඩු මහසිටානෝ එසේ නො කරමි. මාගේ පන්සියයක් ගැල්

පුරා ගෙණා බඩු දැක දවසක් තබා තුන්මසක් මුළුල්ලෙහි දන්දෙනත් දැනපරිත්‍යාගයට ඇති බැවින් මාගෙන් ම දන් දෙමි කියා නො ගිවිස් සාහ. එම රජගහනුවර අසූදහසක් නියම්ගමට නායකවූ නේසාද ගම ජ්‍යෙෂ්ඨයාණන් අනේපිඬු මහසිටාණන් හා අති විශ්වාසබැවින් එසේම දැන්වූ තැන උන්ගෙනු දු කිසිවකුත් නො ගත්හ. බිම්බිසාර රජ්ජුරුවෝ ද තොපගේ ගමක් රටක් නො ව අපගේ භාණ්ඩාගාර යෙන් ම සියලු දෑ ගෙණ දන්දී ගණුව යි කී කල්හි දු අඩුදෙයක් ඇත්නම් සැලකරන්නෙමි යි කියා රජ්ජුරුවනු දු යහා තමන්ගේ පිරිවර ජනයන් ලවා ගිනි දර පැන් ලිප්ගල් දක්වාත් ඕළදී ම හැර ගෙණ මහදන් සරහා දෙවන දවස්හි බුදුන් වඩාගෙණවුත් තමන්ගේ නැගනියන්ගේ මහාප්‍රාසාදයෙහිදී ම බුදුන් ප්‍රධානවූ විසිදහසක් මහ රහතන් වළඳවා වළඳ, අන්තායෙහි "සවාමිනි! අපගේ සැවැත්නුවර නම් ඉතා රම්‍යවූ නුවරෙක, සත්පණස්ලක්ෂයක් කුලගෙවල් ඇත් තේ ය. සත්කෙළක් මනුෂ්‍යයෝ ඇතිසහ. හවුරුදුපතා ලක්ෂ නිමවන අසූ දහසක් නියම්ගම් ඇතියේ ය. තුන් තුන් සියයක් යොදුන් කසී කොසොල් දෙ රටින් නුවරට සතරදිගින් වදනාවූ අය මුහුදු රළ පෙළ දිවන්නා සේ මුත් අනික් උපමාවෙක් නැත, සවාමිනි! අපගේ එසේවූ නුවරට වැඩවදුළහොත් ගැත්තවුන්ගේ ද කෙළගණන් ධන නිධානකොට තිබෙයි. කෙළගණන් ධන පොලි පිට තිබෙයි. කෙළ ගණන් ධන අනුභවයට තිබෙයි. මුතුන් මිමුත්තන් රැස්කළ ධන මෙතෙකැයි පමණ නැත, එයින් අටලොස්කෙළක් ධනය දුන්නැන සිහිනැති ව ගියේ ය, අටලොස් කෙළක් ධන නිධානකළ තැන මුහුදු බත් විය. ගැත්තහුගේ එසේ නිශ්ප්‍රයෝජනව නස්නා සිටු සැපත සවාමිදරුවන්ගේ ශාසන නමැති සරුකුඹුරෙහි ඉහපියනු කැමැත්තෙමි. කරුණාකර වදුළ මැනමැ" යි ආරාධනා කළහ.

එවේලෙහි බුදුරජ අනාවරණ ඥානඥයන් අනන්තාපරිමිතවූ බුදුන් සඹම්ප්‍රවාහ කළාවූ ධ්‍යානක්‍රිඛා මණ්ඩල හුමියක් ම වන කියා වත් දන වදරා එනුවරට මාත් ගිය මනාකල් මය යි යිතා "සිටා නෙනි! සම්බුදුවරයෝ නම් ශූන්‍ය ගෘහයෙහි රමණය කරන්නාහු වෙත් දැයි වදුළසේක. එවේලෙහි සිටානෝ ඒ ඇසූ පමණකින් ම බුදුහු මා ලවා විහාරයක් කරවනු කැමතිසේකැයි දැන අදහස් දනිමි සවාමිනි! වෙහෙරක් කරවාලා ගැත්තවු ආරාධනා කොට එවූ කල වැඩවදුළ මැනවැයි ආරාධනා කොට බුදුන් අතින් ම සියලු ප්‍රතිඥ ලදින් වැඳ අවසර ගෙණ සැවැත්නුවරට යනුවෝ අතරමග යොදු නින් යොදනෙහි මනුෂ්‍යයන් රැස්කොට මනුෂ්‍යයෙනි! බුදුරජා නන් වහන්සේ මේ මහ වඩනාසේක. නෙපි මාගිය සරසව්. විහාර කරවව් පමා නොවව්" යි කිය කියා බුදුගුණයෙන් බොහෝදෙනා

පහදව පහදවා පන්සාළිස් යොදුන් පමණවූ මහ යොදනෙන් යොද නෙහි එකිනෙක විහාරයක් බැගින් පන්සාළිස් ලක්‍ෂයක් වසතු විය දම් කොට විහාර පන්සාළිසක් කරවා සැවැත්නුවරට ගොස් නුවර සිසාරා බලා ඇවිද ජේතනම් රාජකුමාරයාගේ උයන නුදුරු නො ලංව සවියන් සිත් සේ ගොස් වැදපුදා ගන්නා පරිදෙන් විහාරය කරවන්ට ඉතා හොබනේ ය යි දූක ඒ රාජකුමාරයන් කරා ගොස් වහන්ස නුඹගේ උයන්බිම මාගෙන් මිල ගෙණ වෙහෙරක් කරණ පිණිස මට දුනමැනවැයි කිව. එබසට රාජකුමාරයෝ මද මිලයක් තබා එ බිම මුළුල්ල කහවනු ලස්සෙන් සිටුවා රනින් වසා පුරා මිල දුන්නේ වී නමුත් මාගේ උයන නො දෙමි යි කීහ.

ඒ ඇසූ සිටුතෙම එකඟසින්ම මට උයන දිපු දූය හැරගතිමි කිය කියා ඇතයේ අත් ගසා සිනාසුනේය. එවිට රජකුමර උයන මම නුදුන්මි කිව, සිටානෝ කැවතාත් එසේ ම කිහ. එවිට ද රාජ කුමාරයෝ මා උයන දුන්නා නැත සිටානෙනි! කුමක් දෙඛාදූ යි කීහ. මෙසේ ඔබිනොබ දෙ තුන් විටෙක ම කිමෙන් වචනය නො නිමෙන හෙයින් සිටානෝ ද අප දෙදෙනා හා මේ කිමෙන් කම්නැත, අධිකරණ ස්ථානයෙහි යුක්ති දන්නෝ කිවත් ගණුම්හයි කියා අධිකරණ සභාවට ගොස් අප දෙදෙනාගේ මේ අධිකරණ යුක්තිය මැදහත්ව කිව මැනවැයි කිහ. එකල්හි අධිකරණ නායකයෝ දෙදෙනාගේ ම බස් අසා රාජකුමාරයන් මූහුණ බලා යම් වෙළඳමක් කරණකල වස්තු සාමියා නො වවිනා මහත් ගරු අගයක් පළමුකොට කියා පිම් නම් වසතුව මිලකළ නියාමය, නුඹ ගරුකොට මිල කියාපි බැවින් ඒ සැපි සිටානන් මිල දී ගත්තේවි නම් උයන සිටානන්ගේ ම ය යි කියා යුක්තිය නිගමනය කළහ.

එවිට රාජකුමාරයෝ ද පැරද මාගේ උයන අයමින් විතරින් වඩුගණනින් දහස්රියන් ඇත. එහෙයින් එක් ශාළ දෙළසාමුණක් වප ගන්නාවූ මහා බිමෙක, ඒ සා බිමක් වසා රන්හු ලස්සෙන් අතුරුවාදීමට කවරෙක් සමර්ථ වෙද, යුක්ති කිමෙන් පැරද ගිය නමුත් රන්දීමෙන් මොහු පරදවා මාගේ උයන නො දෙම්ම ය යි සිතා සිටානෙනි! තෙපි එසේම තත්පර බැඳින් උයන නොපව ම දින් මි. දුන් ම මට රන් දුන මැනවැයි කිහ. ඒ අසා ඉතා සතුටු වූ සිටානෝ රාජකුමාරයන් හා උයනට ගොස් එහි විහාරයට නො තරම් නිෂ්ප්‍රයෝජන ගස්මුලින් ම සිදුවා හැර සදුන් කපුරු හා සපු නා පනා අඹ දඹ දෙඹ ආදි මාහැඟි ගස් ඉතිරිකොට සැමළුයන් බිම සමකරවා සිටානන්ගේ ලියන්නන් මෙල්ලාහකවරුන් කැඳවා මාගේ සත් මුත්තන පටන් දෙර නොහැර තුබූ අසවල් නිධානයෙහි පිධානය හැර එහි තුබූ මසුරන් ඇද මේ බිම ඇසිල්ලකින් පුරවයි නියම කළහ. ඒ අසා රජ කුමර මෙහු මේ කියන්නේ කිමෙක්ද? එක නිධානයෙක වැඩිව තිබේනම් දහලක්‍ෂයක් හෝ විසිලක්‍ෂයක්

හෝ වැඩි විනම් ඔසක්ලක්ෂයක් හෝ තිබෙයි. එ ව්වරකින් මෙව්වර බිමක් රන්හු ලස්සෙන් ලස්ස සිවුවා පුරාලිය හැකිදැයි ඔත සිතා උන්හ. සිවානන්ගේ මෙහෙවර ඇසුවාවූ ලැසගණන් පිරිවරජන යන් වහා දිවගොස් සත්පවුරු ඇතුළෙහි තුබූ ඒ නිධානයෙහිපිඩා කය හැරලා ඇදලා යුවලනින් රන් මැන මැන ඔවුනොවුන් පරයා ඇද ඇසිල්ලකින් අනුයාලක් පමණ උසන මැද සැලූ හ. එකෙණෙහිම ඒ හැම රන් ලැසගණන් ජනයෝ ඔවින් ඔව ගෙණ ඒ සා බිම කිසිවකුත් නො පෙණෙන සේ රන්හු ලස්සෙන් ලස්ස සිවුව සිවුවා බුම්තුරණ සේ වසාගෙණ යන්ට පටන්ගතහ. ඒ හැම දැක සිටා නෝ ද සක්විති රජය ලබන දවසක් සේ මහත් වූ සන්තොෂයෙන් පිණ පිණා තමන්ගේ පිරිවර සිවුවරුන් ඇරගෙණ උසන විමසා බල නුමෝ සඳුන් ආදි හසින් වැසි සිටි බිම රන් අතුවලිය නො හැක් කෝය. එසේ වූකල මෑ ත් පින්හම අඩුවගියේ නම් නපුරුසි සිතා පිණෙහි ලොභ වැඩි හෙයින් සියලු රුක් සිසාරා වට මැන මැන ඒ ඒ පමණවූ සෙසු බිම්වල ඒ මාරුවෙහි රන් පුර පුරා යන්නාහු ම ය වාසල් බිම තබා අනිකුත් හැම උසන්බිම රන්හු ලස්සෙන් ම සිටුවා වැසූහ.

සිවානෝ ඒ වාසල්බිම රන්ඳුලු අඩුව දැක මෙතනද වසා රන් පුරවසි කිහ. එකෙණෙහි ලියන්නෝ අවුත් සිවානන් වහන්ස! නුඹගේ සත්වැනි මුත්තනුවන් වහන්සේ ඒ නිධානයෙහි තැබූයේ අටලොස් කොළක් මසුරන් ය, ඒ හැම දැන් මෙතනට ගෙණෙනලදී. ඒ නිධානයෙහි අනික් අලෙවියක් නො වූ නියාවට මේ ලේකම් අසා වදාළමැනවැයි කියා එම නිධානයෙහි සංග්‍රහකොට තුබූ තඹපත අකුරු පැවාහුය. එවිට සිවානෝ අනික් නිධානයකින් ගෙණවුත් පුරවසි කිහ. ඒ ඇසූ රාජකුමාරයෝ ඒසා සමපත් වසතු පරිත්‍යාග යෙහි දෙම්නසකුත් නො ව මහත් සතුටුසිත් ඇති නියා දැක සිටා නෙති! යුකති කිමෙනුත් මිලදීමෙනුත් මා පරදවා නුඹම දිනුයේ ය. එසේ තව තවත් මා බොහෝකොට නො පරදවා මේ වහසල්බිම තොප උපකාරයෙන් මටදෙව. ඒ බිමට රන් නො ගෙන්වම තොප ගේ පිණෙහි මාත් එක්කොට ගණුව සි කිහ. සිවානෝ ද මා කරණ කටයුත්තෙක මෙ වැනි ප්‍රසිඛ වූ රජදරුවන් එක්විමෙන් දෙශ නැතැයි දැන එහි රන් නො අතුරවසි කියා රාජකුමාරයන්ටම වාසල් බිම හැර එසේ වී නම් තොප අසිතිවූ රන් ලස්ව ගෙණ මට බිම අව කාශ කොට දෙදැයි කිහ. එකල්හි රාජකුමාරයන්ගේ සේවකයෝ සියදහස් ගණන් ගොවි පෝරු ලා ලා හැද මසුරන් උසතින් පිටත රැස්කොට බිම අවසර කළහ. එහි අනේපිඬු මහසිටානෝ විහාර කර්මාන්තයට පටන්ගෙණ අනන්නාපසය්‍යිනතවූ බුදුවරයන්ගේ ශයන ස්ථානවූ අවිජහිත භූමියෙහි බුදුන්ට වැසීමට නිසි විසිතුරු ගඳකිළි යක් කරවා ඒ වට සඛ්‍යාරාම රාත්‍රිස්ථාන දිවාස්ථාන චඞ්ක්‍රමණ

මණ්ඩප පුෂ්කරණී විල් පතැස් පුෂ්පාරාම ඵලාරාම ආදිවූ සියලු ආරාම කම්නාතෙස් දෙවියන්ගේ ද සහායයෙන් දිව්‍ය කම්නාතය හා විශ්වකර්ම නිර්මිතයක් සේ ඉතා මනොහර කොට නිම්වා ඒ වටා සාරදහසක් රියන් හා උසින් අටලොස් රියන් පමණවූ මහපවුර කරවා නොබෝ දවසකින් නිමකරවූහ.

ඒ පවුර ඇතුළත ම කෙරෙරුය යන වරුණරුක දෙරටුවට නුදුරු ව සිරි බැමින් "කෙරෙරු කුටිය" යි කියා ද, එසේ ම "කොහොඹිය කුටිය" යි කියා ද, "සලලඝරය" යි කියා ද, එකි නෙක ප්‍රාසාදයට ලක්ෂයක් ලක්ෂයක් වසතු විසදූ කළ ප්‍රාසාද සතරක් ද ඇත්තාහුය. එයින් සලලඝරය කොහොල්රජ කරවිය. සෙසු ප්‍රාසාද අනේපිඬු මහසිටාණන් ඊයින් ම කරවිය. ඒ මධ්‍යයෙහි වූ බුදුන්ට ම කරවූ ගඳකිළිය සිහක්ලක්ෂයක් මසුරන් වියදම් කොට කෙළක් අගනා සේ කරණලද්දේය. ඒ සියලු විහාරකම්නත ම එක් නිධානයෙක පුරා තිබූ අටලොස් කෙළක් මසුරන් වියදමින් නිම්මය්ය.

ඒ අනේපිඬු මහසිටාණෝ තම කල්‍යාණමිත්‍රයන් බොහෝ ඇති කෙනෙක. එහෙයින් අපගේ සිටාණන්ගේ පින්කමෙහි අපි අපි ද එක්වම්හ යි කිය කියා විශ්වාසයන් බවුලොවුන් පරදවා කරණලද කම්නත හා උන්ගේ ධනපරිත්‍යාගය මෙතෙකැ යි පමණ කැත. අවශෙෂවූ සත්ත්වයන් විසිනුදු බුදුන්ගේ නම අසා අපි අපිදු ඒ උතුමානන්ට සත්කාරකරම්හ යි කිය කියා සත්ත්වයන් වෙන වෙනම කරවාපු කම්නත හා වෙන වෙන ම කළාවූ දානපරිත්‍යාගය ද මෙතෙකැ යි පමණ කැත. ජේත නම් රාජකුමාරයෝ ද සිටාණන් කරවන්නාවූ ඒ විහාරකම්නතයෙහි පැහැද සිටක්නුගේ සම්පත් රජ්ජකට ඇයි ද? ඔහු දුන් මිල ඔහුගේ විහාරකම්නාතයට ම පරිත්‍යාග කෙරෙම් යි සිතා කැගෙනහිර වාසල් භූමියෙහි එක්සිය විසිරියනක් දිගු පුළුල් යුත් සත්මාල් මහාමාලිගාවක් වාසල් කොට කරවා සෙසු දක්ෂිණ පශ්චිම උත්තර යන තුන් දිශාවෙහි වාසල් ද එසේ ම මනොහර කොට නිම්වා කරවමින් කිම දී ගත් අවලොස් කෙළක් මසුරන් එම වෙහෙර සතර මහවාසල් කම්නතයට ම පරිත්‍යාග කළහ.

මෙසේ සියලු විහාරකම්නත නිමිකල්හි අනේපිඬු මහසිටාණෝ පළමු ප්‍රතිඥ ලෙස ම බුදුන් පවරා ඇවූ ඉක්බිති වඩනා බුදුරජාණන් වහන්සේ යොදනින් යොදනෙහි එම සිටාණන් කරවූ විහාරයෙන් විහාරයෙහි සැතපි සැතපි පන්සාළිස් දවසකින් සැවැත්නුවරට වැඩිසේක. සිටාණෝ විහාරය මුළුල්ලෙහි ධජ පතාක පුන්කළස් කෙහෙල්ගස් පිළිතොරණ රන්තොරණ ආදියෙන් දිවමිනක් සේ සරහා තමන්ගේ පුතනුවන් සිඟිහරණයෙන් සරහා පන්සියයක් සිටුකුමරුවන් පාවා දී පස්පැහැයෙන් දිලිහෙන පන්සියයක් ධජ

පෙළ හා සමඟ යවා ඔවුන් පස්සෙහි මහා සුභද්‍රාය චූල සුභද්‍රාය යන සිටු දූන් දෙදෙනා දෙවිකුමරියන් සේ සරහා සමවූ වයස් ඇති පන් සියගණක් ස්ත්‍රීන් හා සමඟ පන්සියගණක් රන්කළස් දී යවා ඔවුන්ට ඉක්බිති ව සිටුතනන්ගේ අග්‍රවූ සිටුදියනියන් පන්සියගණක් කුල ස්ත්‍රීන් හා සමඟ සම්භාරණයෙන් සරහා පන්සියගණක් රන්පැන දී යැවූහ. සිටුදූන්ට ඉක්බිතිව කොසොල් මහරජ්ජුරුවන්ගේ දියනි යෝ සුමනා නම් රාජකුමාරිකාවෝ පන්සියගණක් රජකුමරියන් පිරිවරා පන්සියගණක් රථ නැගි සම්භාරණයෙන් සැරසී ශක්‍රපුරයෙන් නික්මුණු දෙවඟනන් රැසක් සේ සුවඳමල් කරඬු ගෙණ එකපෙළට සැදී නික්මගත්හ. ඔවුන්ට පසුව පන්සියගණක් ඇමතියනුදු සම්භාරණයෙන් සැරසී මල්මිටි ගෙණ නික්මගත්හ. ඔවුන්ට ඉක්බිතිව මහනුවර වැසියෝ සියලු පූජාභාණ්ඩ ගෙණ ගණන් නැති ව නික්ම ගියාහුය.

ඒ ඇම දෙන ම මෙසේ ගියකල අනේපිඬු මහසිටාණෝ පන්සියගණක් සිටුවරුන් හා සමඟ අළුත් සුදුවළු පිළී ඟැඳ පූජාමහල් වෙස් ගෙණ සුවඳමල් අතින් ගෙණ බුදුන් වඳනා පෙරමහට ගොස් දුටහ. එකල්හි මාගේ සවාමිදරුවු බුදුරජානන් වහන්සේ මේ මහ පිරිස් පලමුව පූජා පැවැත්වීමෙන් යෙදී නික්මුණු වේලෙහි තමන් වහන්සේ තරු පිරිවැරූ සඳ සේ අනොපමවූ බුඩශ්‍රීස් ශොභාමානව විසිදහසක් රහතන් වහන්සේත් පිරිවර සවණ්කරුසින් දිලිහි දිලිහී මහපෙළහරින් නොයෙක් පූජා විද විද අප්‍රමාණ විලාස ශ්‍රීන් වැඩ ජෙතවන මහාවිහාරයට පැමිණිසේක. එවිට අනේපිඬු මහසිටා තෝ බුදුන් වැඳ සවාමීනි මේ වෙහෙර කෙසේ මම පිළිපදිම්ද සි විවාරා සිටි කල්හි බුදුරජානන් වහන්සේ "මහසිටු! මේ විහාරය මෙතනට පැමිණි නො පැමිණි හැම භික්ෂූන් උදෙසා සාංඝිකකොට දෙව"යි වදාළබස් මුදුනෙන් පිළිගෙණ සිටාතෝ සවණ්භික්ෂාරය අතින් ගෙණ 'සතරදිග්හි වඩිනා බුදුපාමොක් මහසඟනට මේ වෙහෙර සාංඝිකකොට දිනිමි"යි කියා බුදුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන් වත්කළහ. එසේ මාගේ සවාමිදරුවූ බුදුරජානන් වහන්සේ දෙවිරම වෙහෙර පිළිගෙණ එහි කරණලද ධම්මණ්ඩපයෙහි පණවන ලද බුබාසන මස්තකයෙහි වැඩහිඳ:—

සීතං උණ්හං පටිහනති තතො වාලමිගානි ච
සිරිංසපෙ ච මකසෙ සිසිරෙ වා 'පි වුට්ඨියො.

යනාදීන් ආවාසදානයෙහි අනුසස් සුදත්ත ගෘහ පතියා සහිත මහපිරිසට එ දවස්හි දෙශනාකොට බොහෝ සතුන් සසරින් මුදා වදාළසේක. සැවැත්නුවරට වැඩි පලමු ද ම බුදුන්ව මෙසේ දෙව් රම් වෙහෙර පිළිගන්වා එදා පටන් අනේපිඬු මහසිටානෝ දවස දවස මහපූජා කිරීමෙන් නවමසක් මුලුල්ලෙහි අටලොස් කෙළක් ම ධන විසදමෙන් අප්‍රමාණ පූජාකළහ. මේ විහාරභූමිය නම් අනන්තා පරිමාණවූ සියලු බුදුවරයන්ට ම ඒ ඒ කාලානුරූප පරිදිදෙන්

අයම් විතරින් වැඩි වැඩි සිටියා මේ විහාරභූමිප්‍රදේශයෙහි අප්‍රමාණ ධනඇති සිටුවරුන් විසින් තොයෙක් ප්‍රකාරකොට මෙසේ ම රතින් වසා මිලදී ගෙණ විහාරය කරවා පිළිගන්වාලීම සවභාව ධම්තාවෙක් මය. අහෝ පින්කැමති ලොව ඇම සත්පුරුෂයෙනි! අනේ සුදත්ත නම් ශ්‍රාවකනිවූ අනේපිඬු මහසිටාතන්ගේ මේ විහාර පින්කමෙහි කරණලද සියලු ධනපරිත්‍යාග හා ඇම විහාරකම්තතය ද විසිදහසක් රහතන් වහන්සේ පිරිවරා බුදුන් වැඩි ලීලා බුදුසිරි සියල්ල ද සත්කෙළක් මිනිසුන් ඇති සැවැත්නුවර මහසෙනඟ හා එක් රැසපිරිවර රජදූන් සිටුදූන් ඇමදෙන ම සැදී පැහැදී විසිතුරු ධජ පෙළ ආදී නොයෙක් පූජාභාණ්ඩ ගෙණ බුදුන් වඳිනා පෙරමහට එදවස්හි ඇම් ර්ම් පූජාකිරීම් බණ ඇසීම් ආදී වශයෙන් එහි පැවති තාක් පින්කම් සියල්ල ද එදු රන්කෙණ්ඩිය අතින් ගෙණ බුදුන්ට ලංව කැමි සිට අනේපිඬු මහසිටාතන්ගේ සිත සතුටුවිමෙන් උපන් ප්‍රීති සොම්නස් ශ්‍රී විභූතිය ද යන සියල්ල ම වෙන වෙන ම සිතුකල අනේ කෙතෙකැ යි පමණ නැත්තේය, එහෙයින් අප හැමටත් මේ බණ අසා සතුටුවහිය කුශලානුභාවයෙන් එසේවූ බුදුසිරි දැකිමත් එබදු පින්කම් කිරිමත් එසේ කුශල්ගැණ සතුටු සොම්නස් ලැබීමත් උපනුපන් ජාතිවල වාසනාවේවා යි.

——(o)——

තවද: ජේතවන විහාරයට නුදුරුව විසාඛානම් උපාසිකාව විසින් කරවා පිළිගැන්වූ පූර්ණාරාම විහාර ප්‍රවෘත්ති කථාව කෙසේ ද? යත්;

ඒ විශාඛාවන්ගේ ඉපදීම් ආදි මහත් පින්බල ප්‍රකාශවූ සියලු ප්‍රවෘත්ති කථාවන් විස්තර වශයෙන් අසනු කැමැත්තන් විසින් රත්නාවලියෙහි විසාඛා වස්තුව හා පූජාවලියෙහි පූර්ණාරාම පූජා කථාවෙන් අසා දතයුතු.

එසේ ශ්‍රවණීයවූ කුශලඵල විශෙෂ ඇති විශාඛාවෝ සැවැත් නුවර මිගාරසිටාතන් පුත් පූර්ණවර්ධන කුමාරයන් කරා සරණ මතුල්වී ආපසු ඒ කුලයෙහි හැමදෙනාගේ මිථ්‍යාදෘෂ්ටි හරවා සම්‍යක් දෘෂ්ටි ගැන්වූ හෙයින්, එම මයිල්වූ මිගාරනම් සිටුහු විසින් විශාඛාවන්ගේ ගුණ සලකා තමන්ට මවු තනතුරෙහි තුබූ තැන් පටන් "මිගාරමාතාවෝය" යන නමින් ප්‍රසිද්ධව මේ බුදුසස්නෙහි ශ්‍රද්ධා සම්පන්න සියලු උපාසිකාවරුන්ට අගතනතුරුලදින් සියලු සඞ්ඝයා වහන්සේව ම මවු තනතුරෙහි පිහිටා දවස තුන්වාරයක යන ගමන අතුරෙන් උදෑසන යනකල පෙරවරු භාගයෙහි වැළඳියයුතු බාහුදි යද මධ්‍යාහ්න භාගයෙහි යනකල පස්වරු භාගයෙහි වැළඳියයුතු පානවගියන් ද සවස් වේලෙහි යනකල මල් සුවඳ පහන් තෙල් බෙහෙත් පස ආදි මේ සියල්ල ද ඒ ඒ කලට නිසිලෙස ම ගෙන්වා ගෙණ විහාරයට යන්නාහුය.

එසේ තුණුරුවන් කෙරෙහි මමත්වයෙන් යෙදී අප්‍රමාද ව වසන ඒ විශාඛාවෝ එක්දවසක් බුදුන් දැක පසඟ පිහිටුවා වැඳ "සාමිවූ බුදුරජාණන් වහන්ස! මෙතැන් පටන් මාගේ ජීවිතාන්තය දක්වා නුඹවහන්සේ කරා ආගන්තුකව යම් පමණ භික්ෂූහු වැඩියාහු නම් පළමු පැමිණිදු අනික් දෙරකට නො වැඩ විශාඛාවන්ගේ දෙරට ගැමදෙන ම අද සිඟා යව සි වදුරණ වරයෙක. මා දිවි පමණින් පන්සියයක් භික්ෂූන් වහන්සේට නිති දන් තබාදෙනු කැමැත්තෙමි. එසේවූ වරයෙක. මේ බුදුසස්නෙහි ගිලන්වූ සාමීන් වහන්සේලා ගිලන්පස පිණිස සිඟා මා දෙරට යවා වදුරණ වරයෙක. ගිලනුන් බලා පිරිමසන යම් කෙනෙකුන් වහන්සේ ඇත්නම් ඒ ඇමිට මා ගෙන් ම දන් දෙවා වදුරණ වරයෙක. හැම දවස් ම මාගෙන් පන්සියයක් භික්ෂූන් හා සමඟ කැඳ අවුළුපත් වදුරණ වරයෙක. වස් අත්තයෙහි අවුරුදුපතා වස්වාසික ලාභකොට පන්සියයක් අටපිරිකර පිළිගන්නාවූ වරයෙක. හැමදෑම බෙහෙත් පස බෙහෙත් බඳු හැමදෙනා වහන්සේට ම මාගෙන් පිළිගන්නා වරයෙක. බුදු සස්නෙහි හැමදෙනා වහන්සේට ම අවුරුදුපතා සත් කිළිසන් සිවුරු දන්දෙනු කැමැත්තෙමි. එසේවූ වරයෙක, ඉන මෙසේවූ අටවරයක් මට දෙවා වදාළ මැනවැ යි ආරාධනා කළහ.

එවිට බුදුරජාණන් වහන්සේ "සාධු සාධු විශාඛාව" යි තුන් ගණක් වදාරා ඒ යාචඤ්ඤා කළ ලෙස ම වරඅට දෙවාවදාළසේක. මෙසේ අටවරයක් ලදින් අප්‍රමාණ ව මේ බුදුසස්නෙහි පින් රැස්කළාවූ ඒ විශාඛාවෝ නිරෝගි පුත්තු ම දහදෙනෙක, නිරෝගිවූ දුන් දහ දෙනෙකැයි මෙසේ දුන් පුතුන් විසිදෙනෙකු විසිඅවුරුද්දක් ඇතුළත ම වැදූහ. ඒ දරුවෝ විසිදෙනද එසේම දරුවන් විසිදෙනා විසිදෙනා බැගින් ලැබූහ. ඒ මුනුපුරෝ ද එසේ ම විසි විසිදෙනා ලැබූහ. මෙසේ විශාඛාවන්ගේ කුසින් ම වැදූ දරුවෝ විස්සෙක, මුනුපුරෝ සාරසියයෙක, මී මුනුපුරෝ අටදසෙක, මොහු හැම දෙනම නිරෝගිහ. එයින් අකාලමරණයකට පැමිණියාවූ එක ද දරු මුනුපුරු නෙනෙක් නැත; එක්සියවිසිවයස් දක්වා ඒ විශාඛාවන්ගේ ඉස නරකෙසකුත් නුදුටුයේය. දන්ත වලනයෙක් වේවයි ඇඟ රැළිදීමෙක් පමණ වත් ජරාවට කාරණයෙකැ යි නො පෙණුනේමය. හැම දවස් දිවෙදළින් ඔජ නැහූ කනකාරූපයක් වැනියාහ. සොළොස්හැවිරිදි යෞවනය ඇති කුමාරිකාවක් වැනියාහ. මෙතෙක් දරු මුනුපුරන් පිරිවරා විහාරාදියට ඒ විශාඛාවන් නික්ම යන කල නොහඳුනන්නෝ දරු මුනුපුරන් කාගේ විශාඛාවන් කා හෝ යි දැනගත නො හෙන්නාහුය. ඒ විශාඛාවන් ගමන් යනකල දුටු දුටුවෝ අනේ යනකල ම ඉතා හොඳනාදැය යි කියා කියා බලාසිටිති. සිටිනා වෙලෙහි ද උන්ගේ සිරිම ඉතා

හොඳනේය සි කියති. උන්වේලෙහි අනේ වැදහුන් රුවම හොඳ නේය සි කියති. වැදහොත් වේලෙහි ද අනේ වැදහොත් රුවම් ඉතා හොඳනේය සි කියති. මෙසේ සතර ඊර්ෂ්‍යාපථයෙහි ම සෞඳ මනා ප්‍රියකරුවූ රූපසම්පත්තියක් ඇතියාහ. ඇතුන් පස්දෙනෙ කුගේ බල ඇතියාහ. කොසොල්රජ ඒ අසා සත්‍රියකටත් ඇතුන් පස්දෙනෙකුගේ බල ඇද්ද සි සිතා විපිය මැද විශාඛාවන් එන ගමන් බලා විමසන පිණිස ඇතෙකු කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලුහුබඳවා යවූකල ගුගුරා දිවඑන ඇතු දැක ඇත්ගොව්වකු දිවූ සිංහඩෙනුවක සේ කිසි හඬක් නැතුව ඔට සොඬ අකුලා කට ලාගෙණ පෙන කදු ගස ගසා ලඟට අවුත් වැදගිය ඇතු දැක මොහු දැඩිකොට අල්වා ගනිමි නම් ඇතු මි යෙයි එසේ වීම කපුරු සි සිතා දැඟිලිහස්සෙහි සොඩ ලා ගෙණ මදක් මිරිකාලූහ. එවේලෙහි මහ අඹුවකින් කෙහෙල් මැඩලූවා සේ ඇතුගේ සොඬට මහත් වේදනා විය. එකෙණෙහි ඇත් දිය සළා ඉලැත්ති ලා මරණභයින් හඬ හඬා ආපස්සෙහි දිව පිය. ඒ ආශ්චර්‍යය දුටු රජපිරිස ඝාඩ්‍යකාර දුන්හ. රජ්ජුරුවෝ ද සතුටුව විශාඛාවන්ට තුටු පඬුරු යවූහ. මෙසේ ඇත්බල ඇති අභිමඬල සම්මතවූ ඒ විශාඛාවන් හා ඔවුන් දරු මුනුපුරන් හැමදෙනාම සත්කෙළක් මිනිසුන්ගෙන් ගහණවූ සැවැත්නුවර හැමදෙනම තම තමන්ගේ පින්කමෙහි මහුලෙහි කැඳවාගෙණ ගොස් කවා පොවා සත්කාර කරන්නාහුය.

මෙසේ සියල්ලෙන් ප්‍රසිඬ ව බුදුසස්නෙහි ඉතා ප්‍රසන්නව බුදුන් ගෙන් බණ අසන විශාඛාවෝ තමන්ගේ නවකෙළ ලක්ෂයක් අගනා, මේල පලඳනාව එක්දවසෙක බණ අසා යන වේලෙහි සිහිමදව ධර්ම ශාලායෙහි තබා ගොස් නැවත පරීක්ෂා කොට එහි තුබ්බව දැන සිහිමදව වත් විහාරයෙහි තුබ්බදුය. බුදුන්ට පුදම් සි කියා බුඩ ගෞරවයෙන් ඒ මේල පලඳනාව තමා පැලඳීමට නො ගෙණ එම පලඳනාවෙන් එසේ ම විහාරයට ප්‍රයෝජන නැති හෙයින් එයට මිල ගෙණ විහාරයක් කරවා බුදුන්ට පූජාකෙරෙමි සි සිතා ඒ මේල පලඳනාව රථයෙක තබා යම්කිසි කෙනෙක් මිලදී මේ පලඳනාව ගතමැනවැසි කියා මුළුනුවර ඇවිදුවා මිල දී හැරගන්නා තරම් අනිත් සත්‍රියෙක නැති හෙයින් තුමූ ම නවකෙළ ලක්ෂයක් දී හැරගෙණ ඒ නවකෙළ ලක්ෂයක් මිල දී කිරිඔක් පමණ බිමක් ගෙණ සැවැත්නුවරට නැගෙනහිර දිග්භාගයෙහි පුෂ්පාරාමය කරවනකල එහි භාග්‍යවතුන් වහන්සේගේ වැසයට නිසි ගඳකිළිය එක්දහස් පන්සියයක් වැම් හිඳුවා දෙමාල් මාළිගාවක් කොට කරවා යටමාලේ පන්සියයක් ගබඩා, ගෙවල මතු මාලේ පන්සියයක් ගබඩා ගෙවල ය සි මෙසේ ත්‍රිසිතුරු දෑසක් ගබඩා නිමවා රන්කොත් පලඳවා එ කලා මේ ප්‍රාසාදය පමි

ණක් නො හොබනේ යයි සිතා ඒ ප්‍රාසාදයන් ද පන්සියයක් පමණ සුළු ප්‍රාසාදයන් ද මහත් දිඹුලා පන්සියයක් ද කරවා නිමකොට දියකළ සැටක් පැන් ගන්නා මහත ඇති ගතරන්මුවා පාදෙණිය ද ලවා සැට සැට කළය බැගින් පැන් ගන්නා ගතරන්මුවා මහදියකළ සැටක් ලවා සෙසු රන්නොතලා රන්කෙණ්ඩි හා රන්වලින් රිදී වලින් සාංඝිකකොට ලවා මැවියෙන් කළ වළඳක් මගේ මේ විහාර සීමාව ඇතුළට ගෙණ වැද්ද නො හෙත්ව යි කි සේ නියොග කොට මේ සියල්ලටත් තමන්ගෙන් ම රැකවල් ලවා වටා සිටි පවුරු වාසල් දොරටු පැන්පොකුණු උයන් ආදී සියලු කම්මන්තය ම නව මසකින් නිමවා අසුමහසවිවත් ඇතුළුවූ සතළිස්දහස් පන්සිය අසූ එක්තමක් පමණවූ බුදු පාමොක් මහසඟපිරිසට ආරාධනා කොට මූළුතුවර ඇලලියන සේ කරණලද මහාපූජාවෙන් බුදුපාමොක් මහ සඟන වඩාගෙණවුත් දුසක් ගබඩා වෙන වෙන ම දිව්‍යවිමාන සේ අලඬකාතකොට සරඟා දහසක් පමණ යහන් ද දහසක් පමණ බුබා සන ද පණවා ඒ දහසක් ආසන මූදුතෙහි විසිතුරු රුවන් කම්මන්ත යෙන් දිලියෙන දහසක් සේසත් නංවා ඇතුළෙහි විහාරමලුව කෙළවර දක්වා මාහැගි බුමුතුරුණින් බිම වසා වෙන වෙන ම ඒ ශ්‍රියහන් ගබඩා ගෙවලින් බුදුන්ට ම සුදුසුකොට සැදූලෙස බුදුන් අත පැන් වත්කොට ඒ පූජාභාරය විහාරය පිළිගැන්වූවාහුය.

එසැල්හි බුදුරජාණන් වහන්සේ විශාඛාවන්ගේ පින් ලොභය ඉතා මහත් සේ දැක වදුරා මේ විහාරදානය ද මහත් උතුම්සේ දක්වා ඇගේ බුබාලම්බණ ප්‍රීතිය අද වඩවමි යි යන කරුණායෙන් ඒ මාලිගාව පිළිගෙණ මධ්‍යයෙහිවූ ශ්‍රියහන් ගබඩාවෙහි පණවනලද බුබාසනයෙහි වැඩහිඳ මාසේ ම දහසක් බුදුහු මේ දහසක් ගබඩාවල වැඩහිඳිත්ව යි අධිෂ්ඨාන කොට වදළසේක් එකෙණෙහි දහසක් ගබඩාවල නිර්මිත බුදුවරයන් වහන්සේලා සවණක් රැසින් දිලිහි දිලි හි වැඩහුන් සේක්ලාය. එවිට විශාඛාවෝ බුදුහු කවර ගෙයක වැඩහුන් සේක් දෝ හෝ යි බලනුවෝ ඒ දහසක් ගබඩාවල දහසක් ගෞතම බුදුන් දැක මහත් ප්‍රීතීන් පිණා මත්ව උදානගාථා පතුරුවා ඇම ගෙවල ම බුදුන් හෙයින් එක්තෙනකත් සිටගත නොහී නැවත ඒ මහාප්‍රාසාද දොර කඩ ම සිටියාහ.

එවේලෙහි විශාඛාවන්ගේ යෙහෙලි වූ එක් කුලස්ත්‍රියක් මේ පිණෙහි මමත් සමාදන්වෙමි යි සිතා දුසක් අගනා පලසක් ගෙණ ඔවුන් පෙරට ම සිට සවාමිනි තුඹගේ මේ ගෙයි මාගේ මේ වස්ත්‍රය බුමුතුරුණු කොට අතුරනු කැමැත්තෙමි, අවසරයක් දුනමැනවා යි කිව. විශාඛාවෝ වස්ත්‍රය දැක මේ පිළිය එහි බුමුතුරුණුවත් නොසැ හෙයි කිවුනම් මැ සිත කලකිරියෙයි එසේ කිරීම තුසුදුසු යයි සිතා

නුවණින්ම ඒ කාරණය ඇට හඟවමි යි සිතා බුහුතනියෙනි තෙපිම මේ පායෙහි දහසක් ගබඩාවල බලා තෙල පිළියම අඩු පිළියක් දුටු නම් ඒ පිළිය ඉවත්කොට තොපගේ මේ පිළිය අතුට පින් පුරාගණුව යි කීහ. ඒ ස්ත්‍රිය ද දහසක් ගෙවල්වල අසුගිවූ බුමුතුරුණු බලා තමාගේ පිළිය හැමට ම අඩු සේ දැක තැවත අවුදින් මෙසා මහත් පින්කමෙහි එක්ව ගතනුහුනුයෙමි යි මහා හඬින් හඬා හඬා මලුයෙහි ම සිටියාය. අනඳමහ තෙරුන් වහන්සේ ඒ හඬන්නා දැක මෙසා පූජායෙහි කුමට හඬාද? නැගෙනියෙනි විචාරක් ඒ අඹන කාරණය දැන තොපගේ පලස අතුරණතෙනක් මම දනිමියි වදාරා විශාඛාවන් නො සැලකු තැනක් දැන සඳහබපාණ හා කියනලද ඝනරන්මය පාදෙණිය අතුරෙහි පාසිඳ්නා බිසිකොට ලවා වදුළසේක. මෙසේ මාහැගිවූ පූජාරාම විහාර පූජාව සාරමසක් මුළුල්ලෙහි නො කඩව පැවැත්වූවාහුය. එහි විහාරබිම ගත්තාවූ තව කෙළ ලක්ෂයක් ධනය, විහාරකමිනන්නයට නවකෙළ ලක්ෂයක් ධනය, විහාරදැනපූජාවට නවකෙළ ලක්ෂයක් ධනය යි මෙසේ සත්විසිකෙළ ලක්ෂයක් පමණ ධන සම්පත් ඒ එකම පූජාරාම විහාරයට ම තුණුරුවන් උදෙසා විශාඛාවන්ගෙන් ම පූජාකළාහුය.

මෙසේ මහ පිණැති විශාඛාඋපාසිකාව නම් මේ කල්පයට ලක්ෂයක්වන කපින් මත්තෙහි පියුමතුරානම් බුදුන් සමයෙහි වූ ශ්‍රද්ධා සම්පන්න එක් උපාසිකාවක්ව ඒ බුදුන් ප්‍රමුඛවූ දහසක් මහසඟනට මහදන් පවත්වා ඒ බුදුන් පාමුල්හි වැද හෙව මතු ඔබවහන්සේ වැනි බුදු කෙනෙක්හට අග්‍ර උපසථාසිකා වෙම්වා යි ප්‍රාර්ථනා කොට එතැන් පටන් කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දෙවිමිනිස්ලෝ දෙක්හි හැසිරෙමින් අපමණවූ දෙවිමිනිස්සැපත්වින්ද අප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හද්දියනුවර මෙණ්ඩක මහසිටානන්ගේ පුත් ධනඤ්ජය සිටානන්ගේ ගෙයි සුමනා නම් දේවියකුස පිළිසිඳ ගෙණ මවුකුසින් බිහිවූකල විසාඛාවෝ යයි නමනලද නම් ඇතිව උපන් සත්හැවිරිදිකල ඒ හද්දිය නම් නුවරට බුදුන් වැඩිපවත් අසා පන්සියයක් කුමාරිකාවන් හා සමඟ ඒ වඩනා පෙරමහට ගොස් බුදුන්ගේ පළමුවන දැක්මෙහි ම ඛණ අසා ඒ පිරිවර පන්සියයක් පමණවූ කුමාරිකාවන් හා සමඟම දහසක් නසින්යුත් සොවාන්ඵලයට පැමිණ උතුම් ආර්ය්‍ය ගුණයෙහි පිහිටා වසන්නී එසින් මැතභාගයෙහි සැවැත්නුවර මිගාරසිටානන්ගේ පුත්‍රවූ පූර්ණවර්ධන කුමාරයන් හා විවාමගුල් බඹයෙන් බැඳී පතිකුලයට යනකල්හි දියනි යන්ට පැලඳ යන සේ ධනඤ්ජය නම් පිය මහසිටානන් විසින් මහා ලතා පලඳනාව යයි යන නමක් ඇති මහත් පලඳනාවක් කරවනු ලැබිය. එහි මහාඕවූ රන් සතරනැළියෙක එසේම උතුම් මුතු එකොළොස් නැළියෙක විශිෂ්ටවූ ප්‍රවාල දෙවිසි නැළියෙක අනඟි

මැණික් තිස්තුන් නැළියෙකැ යි යන මෙසේ සඛ්‍යා ප්‍රමාණ විසින් නියමවූ මේ රත්නයන් හා අක්‍යවූ ද බොහෝ ඝප්තප්‍රකාර වණී සවපන්නවූ උතුම් රත්නජාතින් එක්කොට ලක්‍ෂයක් වටකා කම්නත මිල දීමෙන් ශොභමානව කරවනලද පෙරව ගත් කල්හි හිස පවන් දෙපතුල් දක්වා සියලඟ වසා ඉතා දීප්තිමත් ව බබලන්නාවූ මූදුන්හි සවී රත්නමයවූ දුරසිට බලන්න වුන්ට ඝජීව මයූරරාජයෙකු සේ ලිලොපෙත ව පෙණෙන්නාවූ මයූරරූපයකින් අලඞ්කෘතවූ ඇතුන් පස්දෙනෙකුගේ බල දරන්නා මහත් බල ඇති ස්ත්‍රියඟ ම ඛරන්නාවූ එසා මහත් පලදනාවක් විශාඛාවන්ට ලැබින.

පුරුෂභාවය ලද්දාහු අවපිරිකර දන් දුන් කල එම කුශලානුභාවයෙන් ඍඞ්ධිමය පාඨිවුරු ලැබී එහි භික්‍ෂුභාවයෙන් පැමිදිවීම් සේ අවපිරිකර දන්දුන් ස්ත්‍රින්ට ද මෙසේ වූ මේලපලදනාව ලැබීමත් සවභාව ධර්මතායෙක්ම යයි දතයුතු. එහෙයින් මේ විශාඛාවෝද ගිය දවස අවපිරිකර දන්දුන් පිණෙන් මෙසේවූ මේ පලදනාවක් ලැබුහ. කාශ්‍යපබුදුන් සමයෙහි කිකි නම් රජ්ජුරුවන්ගේ කුඛාදූ සඞ්ඝදාසීව පන්සිල් රක්‍ෂා කළ පිණෙන් පඤ්චකල්‍යාණයෙන් යුක්තවූ උතුම් විශිෂ්ටවූ දුටු දුටුවන්ගේ කෙත්සිත් පැහැරගන්නා රූපශ්‍රී සම්පත්තියක් ලදහ. පෙර බොරුවක් නොකී පිණෙන් තමා හා සමවූ දූ පුත්තු ලදහ. බෙහෙත්පස ශීලානුන්ට දන් දුන්නාවූ පිණෙන් තුමූ ද නිරොගිව එසේ ම නිරොගිවූ දරුමුනුපුරන් ලදහ. බුදුන් සහුන්ට කිරි දන්දුන් පිණෙන් ස්ත්‍රී ව සිට ඇතුන් පස්දෙනෙකුගේ බල ඇතිවූහ. ගියදවස භික්‍ෂූන්ට ආරාධනා කොට සවහත්‍ථයෙන් ම වළඳවන කල වළඳ අනතයෙහි එක් බත් ඇලෝපයක් වළඳවාලූ පිණෙන් පතිකුලයට යන දවස්හි දෑහැ සරක් දුන් පමණට වඩා එක්ලක්‍ෂ විසිදහසක් පමණ ගවයෝ ගාල්කඳ පැන වැගිර නික්ම ගියාහ. මෙසේ පෙර කරණලද කුශලබලයෙන් ම සියල්ලෙන් අඩු නොවූ ඉතා මහත් උදරතර නොයෙක් සම්පත් ලදින් එසා මහත් පලදනාවකින් ආත්මභාවයද අලඞ්කෘත කොට ගත. ලොව කුශල ඵල කැමැති සියලු ස්ත්‍රීහු ද ලොකඥා විසින් අපි අපි ද විශාඛාවන් සේ ශ්‍රඞ්ධි ගුණ ආයු රූප සැප බල යසො කීර්ති දරු මුනුපුරු දැසි දස් ගව මහිෂාදී සියලු සම්පත් ලබම්වා යි ප්‍රාර්ථනා කරණ සේ ලොක ප්‍රසිඛවූ මේ බුඩොත්පාදයෙහි සෙසු ස්ත්‍රියක් නො කළ නොයෙක් පින්කම් කිරීමෙන් හා තමන් පැලදි පලදනාව පවා විය දම්කොට මිලගෙණ ඒ මිලයෙන් එසා මහවිහාරයක් කරවා මේ ශාසනයෙහි සියල්ලට වැඩිතරම් බොහෝ සම්පත් නිඛානකිරීමෙන් අන් ස්ත්‍රියක් නො ලද අග්‍ර උපසථාඞිකා තනතුරු ලදින් සොවාන්ඵල පැමිණ සසර ඉනිරි ව සිටි ජාති ගණනටත් හැම සම්පතෙන් අඩු

කොට ව ජාතියෙන් ජාතියට වඩා වඩා තමා අලඞ්කාර කොට සරහා ගත් විඤ්ඤාණන්ගේ මේ ප්‍රවෘත්තිකථාව අසා සතුටුවූ සිත් ඇති සත්පුරුෂයෙනි! ලොව පින්කිරීම නම් මේසේ ඉතා සඟපත් දෙය කැයි දැන ආදර උපදවා පින් කළයුතුයි.

ඒ සා දරු මුනුබුරු ආදි මහා සම්පත් පවා ලදින් එයින් ප්‍රමාද නො වැ දවස තුන්මිටෙක විහාරයට එළඹ දන් දීමෙන් බණ ඇසීමෙන් සිල් රැකීමෙන් මෙසේ උපත් ආත්මය සඵල කොට ගත්කල මෙසා ඉතා සුවිශාල සම්පත් ආදියක් ලදින් එයින් අප පමාවන්ට කාරණ කිමිදැයි සලකා දැන දිවා රාත්‍රී දෙක්හි ම අප්‍රමාද ව කුශල කරණයෙහි යෙදී වසනුවන් විසින් මතු උපනුපත් ජාතිවල ආයු රූප ශ්‍රී සම්පත් ආදිය කැති කොට දුක් දෙන ප්‍රාණාතිපාත ක්‍රෝධ ඊර්ෂ්‍යාදි පාපයෙන් දුරුවැ ඒ හැම සම්පත් ඇති කොට දෙන නිත්‍ය පඤ්චශීලාදි සිල් රක්ෂාකිරීමෙන්ද තමන් නිවන්දක්නා මෙදුතුරෙහි ඒ විඤ්ඤාණීන් සේ හැම දෙයින් අඩු කොට මිහත් භවභෝග සම්පත් තින් ලැබීමට කාරණවූ නොයෙක් ප්‍රභේද ඇති දැන වසනු මසුරු නො ව දන ලක්ෂණ දැන ඇඳින දීමෙන් ද සඟරින් ගොඩ කැඟි නිවස්පුර වැදීමට ම කාරණවූ බුදුගුණ නිලකුණු ආදි භාවනා සිහි කිරීමෙන් ද මේ හැම කුශලාකුශල ධර්මයන්ගේ විභාග දැන ඇඳින ගැන්මෙන් නුවණ වැඩීමට ම කාරණවූ බණ ඇසීමෙන් ද මෙලෝ පරලෝ දෙකෙන් ම වැඩ සාදගැන්මෙන් තම තමන් ලද සිරිලු සම්පත් සෘජික කොට ගැන්මෙහි උත්සාහ කවයුතු.

මෙසේවූ ජේතවන පූජාරාම විහාරදෙඟ පිළිගෙණ අනාථපිණ්ඩික විඤ්ඤාදි ශ්‍රද්ධාවත් ජනයන් නිසා පස්විසි වසීයක් සැවැත්නුවර වාසය කළ බුදුරජාණන් වහන්සේ එක් ඇතුළු වසක් දෙවිරම්හි විසුවමහත් දෙවැනිවස පූජාරාමයෙහි වසනසේක. මෙසේ ඒ විහාරදෙක්හි ම වාසය කිරීමෙන් අප්‍රමාණවූ දිව්‍ය බ්‍රහ්මයන්ට ද කොසොල නරවරාදි මනුෂ්‍යයන්ට ද යකාදි අප්‍රමාණ සත්ත්වයන්ට මෙලෝ පරලෝ වැඩ දක්වා කරණලද අප්‍රමාණ සඛමීනුශාසනා ඇති හෙයින් මාගේ සවාමිදරුවූ මට ම සරණ වූ බුදුරජාණන් වහන් සේ ශාසනා නම් වනසේක. එසේ හෙයින් කියතලදී:-

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදනානං දමයතානං පුරිසාජඤ්ඤ තෙ නමෝ-ඔ.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඛමීවවාද සංග්‍රහයෙහි මෙතෙකින් ජේතවන පූජාරාමවිහාරප්‍රතිග්‍රහණයෙන් ලොකානුශාසනය කළ ප්‍රවෘත්තිකථාවකියා නිමවනලදී.

———:o:———

රහල් කුමරු බුදුරදුන්ගෙන් දයාද ඉල්ලීම (140 පිට)

මෙසේ මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ සියලු දිව්‍ය බ්‍රහ්මාදීන් හා අනු මගධ දෙරට වැසිවූ ද කසී කොසොල් දෙරට වාසිවූ ද මිනිසුන්ට මෙලෝ පරලෝ වැඩ දක්වා අනුශාසනා කර මින් වැඩවසන සමයෙහි දඹදිව මිනිසුන් අතරෙහි පෙර බොරු වචන කියා මේ බොරු ම නම් මතු බුදුන් නො දකිමෝවයි කියා බොරුවෙන් දිවුවගෙණ අනික් පිණකින් මිනිස් පියලදින් වසඟ මහපවිටු මිනිසුන් නොයෙක් සියගණන් එක්කොටගෙණ අපිත් බුදුමිහයි කියා නොයෙක් දුෂ්ටි විරූප වෙස් ගෙණ ලාභ සත්කාර පිණිස ලොව මුළාවේ හෙලා ජනයන් වඤ්චාකරමින් ඇවිදිනාවූ පූරණකාශ්‍යපය, මක්ඛලි ගොසාලය, අජිත කෙසඝම්බලය, කකුධ කාත්‍යායනය, සඤ්ජය බෙල්ලට්ඨිපුත්‍රය, නිගණ්ඨ නාථ පුත්‍රයයි ප්‍රසිද්ධවූ පන්සියයක් පන්සියයක් පිරිස් ඇති මිථ්‍යා දෘෂ්ටිහු සදෙනෙක් විසුවාහුය.

ඔවුන් සදෙනාගේ ප්‍රවෘත්ති කථාවන් හා **රත්නදුන්හර** පාත්‍රය නිසා දැක්වූ ප්‍රාතිහාර්‍යය අරහයා බුදුන් ශ්‍රාවකයන්ට ශික්ෂා පද පැණවූ කාරණයෙන් ඒ තීර්ථකයන් හැම අපගේ ප්‍රාතිහාර්‍ය කිරීමට දැන් අවකාශයයි දැන අපිත් ප්‍රාතිහාර්‍යය පාමිහයි කියා තම තමන්ගේ දෘෂ්ටිගතුවන් සමාදන් කරවා ලක්ෂගණන් වස්තු වියද මෙන් සැවැත්නුවර වාසල් දෙරට නුදුරුව කොටගත් මණ්ඩපය සහ ඔවුන් හැමදෙනා විනාශපත්වූ පරිදි හා බුදුරජ අඹරුක මූලදී ප්‍රාතිහාර්‍යය පානා සේකැයි යනු අසා එම තීර්ථකයන් විසින් වඩා වඩා ඉලදීමෙන් සැවැත්නුවර අඹරුක් කප්පවා නැතිකළ හෙයින් බුද්ධානුභාවයෙන් සුරතුරක් වැනි අඹරුකක් පැනනැඟි බව හා ඇසළමස මැදිපොහෝදිනයෙහි බුදුරජ ගමා මහ පෙළහරක් පානා සේකැයි යනු අසා මහපිරිස් රැස්වූ ක්‍රමය ආතුළුවූ එදවස්හි පැවැති යමක ප්‍රතිහාර්‍යය ආදි නොයෙක් කථාප්‍රවෘත්ති විභාගය විස්තර වශයෙන් අසනුකැමැත්තන් විසින් පූජාවලියෙහි ගණ්ඩඹඛනම් රුක්මූලදී ලද යමක ප්‍රාතිහාර්‍යය පූජාකථාවෙන් අසාදතයුතු. මෙහි විනාශි එළින් ගුණාංශුමාත්‍රයක් පමණ දක්වනු ලැබේ.

එසේ ලොව අසඟරණවූ බුද්ධානුභාවයෙන් හා දෙවානුභාවයෙන් කල්පානන වානයෙන් ඉපිළ යන පරඩලා පත් සේ තීර්ථකයන් හැම දුරුව පරාජය වූ කල්හි මාගේම සවාමිදරුවූ බුදුරජාණෝ එදවස පස්වරු අනනසාපයාමනවූ බුදුවරයන්සේ යමා මහපෙළහර දැක්වූ සත්පැයසමාරක් ගිය ඉක්බිති හැම සඟ

යන්ගේ සිත්සේ පැවැත්මෙන් වන සැප පහසු දීමට ඔවුනොවුන්ගේ උත්සවයට නිසිකල් බලා ඊට හොබනා සුදුසුවේලෙහි බුඩ සිහසෙය්‍යාවෙන් නැගිට වදුරා සශ්‍රීක වූ සුගත් පාංශුකූල චීවරයඩරා නැඟුනැඟු පත්ලෙහි මහපියුම් දක්ව දක්වා තෙම්ම මිහෑතවූ දෙර ඇති ගඩ කුටියෙන් රත්ගල්ගුහාවෙකින් නිකුත් අහිත කෙශර සිංහරාජයක් හුගේ වික්‍රම අවික්‍රම කෙරෙමින් කිසි ශංකාවක් නැති වම ගදකිළි පෙරට වැඩ දිලිහිදිලිහි සිටියේක. එකෙණහි උදය ගිරි පර්වතයෙන් පැනනැගි හිරුමඩලින් නිකුත් සුවහස් ගණන් රැස් සේ සඩාම්දරුවන්ගේ ශ්‍රී ශරීරයෙන් නිකුත් බුදුරැස්කද තුන් වීවක් බුදුන් වට කරකැවී එයින් ගොස් ඒසා සැවැත්නුවර රන් පවක් අතුරන්නාසේ හැමතැනම හැම වස්තුම රන්වන්කොට එයින් ගොස් මුළුඳඹදිවද ව්‍යාප්තව විසිතුරු රන්නැවපතක්සේ බබුළුවා එයින් ගොස් මේසා සක්වළගල සිසාරා තුන්වාරයක් වට ඇවිද මුළුසක්වළ රන්මුහුදු කෙරෙමින් එයින් අහස්කුසට පැන නැඟී සදෙවිලොව හා සොළොස්බඹලොව සියලු දෙවිබඹුන්ගේ ශරීර හා නොයෙක් රන්විමන් හිරුදුටු කඳෙපැණියන්සේ නිෂ්ප්‍රභ කෙරෙමින් ආලෝක පතුරුවා එයින් ඉසෙ අජවාකාශයෙහි ගැසී ගැසී සිටගත. ශ්‍රීපාදවලින් නිකුත් බුදුරැස්කද දෙලක්‍ෂ සතළිස් දහසක් යොදුන් සෘඝනඝඩ මහාඛෝල් පොළොව රන්වන් රහයෙන්ම තෙමා රන්පොළොව සේ කෙරෙමින් යට සාරලක්‍ෂ අසූදහසක් යොදුන් දියපොළොවට වැද එසිදු රන්මුහුදසේ හැම දිය රන්වන් කෙරෙමින් එයින් යට නවලක්‍ෂ සැවදහසක් යොදුන් වායුපොළොවට බැස එහැම තැනම රන්වන් කෙරෙමින් එයින් යට අජවාකාශයෙහි ගැසී සිටගත.

මෙසේ මෙහේ සඩාම්දරුවන්ගේ එසැම ශ්‍රීශරීරයෙන් නිකුත් බුදුරැසින්ම මේසා මුළුතුන්ලොව කෙළසුවහස්ගණන් පහන් දුල්වූ පහන්රුකක්සේ ඉතා දිලිහි මහත් ශ්‍රීවන්තවූ නියාවට තමිතමන්ගේ ශරීරාලොකයෙන්ම තුමූ තුමූම දිලිහෙන ලොව එලිකරණ දෙවි බඹ රන්විමන් පවා බුදුරැසින්ම රැදිගිය නියාවට කාලවණ්ණී පර්වතාදී ලොව හැම වස්තූන් රන්පර්වතාදියසේ රන්වන්වූනියාවට නොයෙක් පැහැඇති හැමසත්වයන් රන්වන්ව එක්පැහැව ගිය නියාවට අනික් සුදුසුවූ උපමාවෙක් නොදක්ම. දෙසියසතළිස් ගවු දිග හා පුළුල දෙසියයක් ගවුඇති පාණ්ඩුකම්බල ශෛලාසනය සඟළ සිවුර සතරපටින් වසාලුවාසේ මෙසා මුළුතුන්ලොව සියලු

සතුන් හා හැම පැතැනිදි සියලු වස්තූන් තමන්වහන්සේගේ අතින් ධවජතම් ලද එම සිවුරෙන්ම එදවස් වසා සරහා ගෙණ වැඩසිටි සේක්වනැයි සිතමු.

එසේ මාගේ සවාමිදරුවු බුදුරජාණන්වහන්සේ ගඬකුටිවාර යෙහි හැඹලෙසින් දිලිසෙන සඳමඬලක්සේ ඉරමඬලක්සේ මුළුලොව සතහන අමාපිඹක්සේ නිවන් පිඹක්සේ අමාවිලක්සේ හැමසතුන් සැනසීමෙන් ඉතා දිප්තිමත්වැ සිටිවේලෙහි ඒ බුබමහිමි දක්නට එහි රැස්ව ආගංමක විසාරයෙන් දෙලොවසොදනක් හා වට සිසාරා සතිස්සොදනක් මානයෙහි තලමිදක් අහසට දමාලූකල ඉස් ඇවකුත් බිම වැටිය නොහැක්කාසේ ගහණව සිටියවු එසා මහපිරිසින් එවේලෙහි අනිකක් බැලුවෝ නැත. අනිකක් සිතුවෝ නැත. හැමදෙනම "අහෝ බුඩෝ අහෝ බුඩෝ" යකාදීන් එක පැහැර කියමින් දෙහොත් මුදුන්දී සාධුනාද පුජාකිරීමෙන් බුදු සිරි දක්නට පවත්ගත්හ. එපමණක් මතු නොවෙයි. එසේ තුන් ලෝ තිලකයක්සේ දිලිහි දිලිහී වැඩසිටිවේලෙහි මාහිමිවූ බුදුන්ගේ අදහස් දත් කෝටිගණන් ශ්‍රාවකයන් වහන්සේ පෙළින්පෙළ සැදී අවුත් බුදුන් සිසාරා වට රත්පලස් කඩතුරාවක් ඇද්දසේ සැදී පැහැදී සිටගත්සේක එකෙණෙහි දෙවියෝ ද අහසින්දිව පරසතුමල් වැස්වූහ. දසදහසක් සක්වළ සියලු දෙවියෝම ආකාශ යෙහි විසිතුරු සිතියම් රෙදිකඩක් ඇද්දසේ හැමතැනට පෙණී පෙණී දෙහොත්මුදුන්දී අහස්කුස වසා සිටිගත්හ.

එකල්හි අප බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකා ඇසි මෙන්ම අනාගාමිව සිටි සාඩිසමපන්නවූ ඝරණීකම් එක් කුලස්ත්‍රී යක් අවුත් බුදුන්වැඳ සවාමිනි මාවැනිවූ දුවක සිටියදි නුඹවහන් ස් පෙළහර පෑනෝ කුමටද මම මෙහි පෙළහර දක්වමිසි කීය. එවිට බුදුරජ උන්ලවා සිංහනාද සරවඥකැමතිව නී කෙසේ පෙළ හැරදක්වාදැයි වදළසේක. සවාමිනි මම මේ සක්වළගැබ දියවිලක් මෙන් කොට සියදහසක් යොදුන් මහත්වූ දියකා වෙහස් මවා ගෙණ එහි පුළිඟක්වලින් දිය ඝටින්ගැලී පත්වම සක්වළින් නැඟී මතු වෙමි. එසේම පත්වම සක්වළින් ගැලී උතුරුසක්වළින් නැගෙමි. එයින් ගැලී දකුණුසක්වළින් නැගෙමි. වට සක්වළගල සියසාරා කර තහතහා සියදහස්ගණන් වාරයෙහි හැමට පෙණී පෙණී ඇවිදිමි. එසේ ඇවිදින්නේ නොයෙක් සුවහස්ගණන් වෙස්මවා ඒ ඒ තැන්හි හිස්තහා ඇවිදිමි. එවිට තෙපි කවුරුදැයි විවාළ දෙවිබඹු කෙනෙක් ඇත්නම් තිලෝගුරු බුදුන්ගේ පාදරජස් ඉස්මුදුනෙන් පිළිගෙණ

ඒ අවවාදානුශාසනාවෙහි පිහිටි දුවකිම්සි කියම් කිහ. බුදුරජාණෝ ඒඅසා තී එබඳු ඍඞ්ධිබල ඇතිබව මමත් දනිමි නී නැවතී සිටුවයි වදාළසේක.

ඊට ඉක්බිතිව සුළුඅනේපිඩුමහසිටියානෝ අවුත් බුදුන් වැඳ සවාමිනි මම මෙහි පෙළහරක් පාමිසි කිහ. නා පාතාපෙළහර කියවසි වදාළකල්හි සවාමිනි මම ඇසිපියහෙලා නොලන ඇසිල්ලෙහි අහසට පැනනැගි මේ මහපිරිස බලබලා සිටියදී මාගේ මේ වෙසඟ අනතඹානඤාණාට සත්ගවු සමාරක් දිග පතුල් ඇති දෙලොස් ගවු දිගරියන් ඇති සගවුදිග වියත්ඇති සොළොස්ගවුදිග මිණි ඔටුනු ඇති ගතළිස් අටගවු මහබඹවෙසක් මවාගෙණ එකගිල්ලක් ඔසවා දහසක්සක්වළ එකාලොකකෙරෙමින් දසගිලිඹසවා දසදහ සක් සක්වළ මහත් ආලෝක පතුරුවා මුළුතුන්ලොවවම ඇසෙන සේ මහත්කොට අත්පොළසන්දිදී සියලු දිව්‍යමනුෂ්‍යසෙනාව වෙවුල්වා සත්‍යයෙනි මම අනිකෙක් නොවෙමි. තිලෝගුරු බුදුන් ගේ එක්තරා උපාසකයෙක්මි කියා තිමිබල කියම් කිහ.

ඊට ඉක්බිතිව සත්හැවිරිදිවූ විරාගම රහත් සාමණේරි කෙනෙක් සුවහස්ගණන් භික්ෂුණීන් පිරිවරාගෙණ අවුත් බුදුන් වැඳ ඉතාකුඩා අතුල්සුන්දෙක ඉස්වූදුනේ තබාගෙණ සවාමිනි සවාම් දරුවන්ගේ මේ ශාසනයෙහි ලද බිලිදු කල ම රහත්වූ මාවැනි දුවකසිටියදී සවාමිදරුවෝ කුමට ප්‍රාතිහාර්‍යය පාතාසේක්ද? ශ්‍රාවක යෝත් ප්‍රාතිහාර්‍යපාතාදුද? මෙහි මම ප්‍රාතිහාර්‍යය දක්වා මේ තීර්ථික යන් හා බවුන්ගේ ලබ්ධිනත් ඡින්නිපුරුෂයමූලඝාද ලදුරියන්ද පරදවා ජයගණිමින් මේ මහාපිරිස පරදවම්සි කිය. එවිට සවාම් දරුවෝ ඔවුන් ගුණ හැමදෙනාට පලකරණ කරුණාඇතිව නොප වසන්ඇති සෙසු කුඩාකෙල්ලෝ බවුන්ගේ තතයෙන් තව දක්වා තුබකොහැර කිරිබොන්නාහ. එසේ; තී කුමන පෙළහරක් දක් වන්නෙහිදැයි වදාළසේක. සාමණේරි දක්වන්නී සවාමිනි මිඩියගේ බලය සවාමිදරුවන්ට දැනේමය. එසේවදුවත් මම මෙරගල සක්විල ගල හිමවුගල යන පවිතතුණ ලාලිවටතුණක්සේ මෙතනම සිට මේ හැමට පෙණී පෙණී මාකරා හැදගෙණ සවාමිදරුවානන්ගේ අභි මුඛයෙහි තබාලා මම රාජහංසඛේතුවෙසක් ගෙණ එක්පවිතය කින් කිම්දබැස එක් පවිතයකින් නැගෙමි. නැවත ඒ පවිතයෙන් කිම්ද අනික් පවිතයෙන් නැගෙමි. නැවත ඒ පවිතතුණම ලාලිවට තුණක්සේ අහසටදමා කිම හිගහොදී ලාලිකෙළිකම්වූ පෙළහරක් කොරම්සි දැන්වූදැය. එකෙණෙහි ඒසා මහපිරිසින් සාධුකාර

නුදුන් එකද සත්ත්වයෙක් නැත. ඒ බුදුන් දරුබිලිදුසුරතල් වවනය අසා සතුටුකදුලෙන් නුවන් නොතෙමු නොහැඩූ එකද කෙනෙක් නැත. දරුලද හැම සත්‍රිහුම ඒ විස්මයෙන් ලය කකිය කකියවා වඹාවඩා හඬන්ට පටන්ගත්හ. ඒ දැක මිත්‍යාදෘෂ්ටිවූ සුවහස් ගණන් ස්ත්‍රීපුරුෂයෝ පැරද ඒ ඒ දිග දිවන්ට පටන් ගත්හ. එබසට සවාමිදරුවෝද එබදු පෙළහරක් නෙපි පානාබව සැබෑමය. මේ මා පානා පෙළහරනැයි වදළසේක.

ඊට ඉක්බිත්තෙන් සිවුපිළිසිඹියා මහරහන්බවලත් සත්හැම් රිදිවූ වුන්දසාමණේරයන්වහන්සේද මහරහත් සඟපිරිස් පිරිවරා ගෙණ පියුමිවනයකින් නැංගාවූ පියුම් කැකුළක්සේ පැනනැඟී අවුත් සිට සවාමිනි මම පෙළහැර පානෙමිසි කී කල්හි ඒ සිවුපිළිසිඹියාපත් රහත් සාමණේරගුණයද මහපිරිසට හඟවන පිණිස කෙසේවූ පෙළහරෙක්දැයි විවාරාවදළසේක. උන්වහන්සේද සවාමිනි මම පන්සියයක් යොදුන් උස ඇති හිමවුගල මුදුනෙහි සිට සියක්යොදුන් මහදඹගස අතින් ගෙණ ඇතෙකු පිළ අත්තක් සලස්නාසේ දඹරුකසොලවා දඹපල ගෙණවුත් මේ සතිස්යොදැ නෙක පුරාසිටි මෙසා පිරිසට සවාමින්ගේ ආනුභාවයෙන් පැන නැඟී අඹරුක අඹකැමෙන් දැන් මේ සතුටුවූවාසේ දඹකවා සතුටු කරවමි. තවද ශක්‍රදේවෙන්ද්‍රයාගේ සියක්යොදුන් පරසතුන්ස කොඛෝලිළ අත්තක් සලන්නාසේ සලා වගුරුවා ගවුදෙගවු සා මහත ඇති පරසතුමල් වැස්සක් වස්වා මේ මහපිරිස විස්මයපත් කරවමි කීයේය.

ඊට ඉක්බිතිව අප බුදුරජාණන් වහන්සේගේ මෙහෙණවර ශාස්තෘයෙහි සෘද්ධිමත් ශ්‍රාවකාවන් කෙරෙහි අගතැන්පත්වූ උපුල් වන් මහාසාරිපුත්‍රවහන්සේ දිව්‍යඅශ්වයන් සතරදෙනෙකු යෙදූ දිව්‍යරථයක් මවා අශ්වවේගයෙන් මහපිරිස දෙඇබ් කෙරෙමින් පෙළහර පාසිට පන්සියයක් මෙනෙණින්නත් පිරිවරා අවුත් බුදුන් වැඳ සිට සවාමිනි අපවැනියන් සිටියදී ලෝතුමානෝ පෙළහර පාන සේක් ඇයිද? එසේ ඇතිකල අප ඍද්ධිමතුන් කෙරෙහි අගපැමිණීමේ ප්‍රයෝජන කිමිද? මේ දසදහසක්සක්වළින් රැස්වූ දෙවිබඹ සහිත හැමපිරිසට මම පෙළහර පාන්නෙමිසි කීදැය. බුදුහු ඒ කවර පෙළහරෙක්දැයි විවාළකල්හි සවාමිනි මම මේ මහපිරිස බල බලා සිටියදී ආකාශයට පැනනැඟිලා මා කරණ පෙළහරක් මේ බලවයි තුන්ලෝ පුරාසිටි හැමපිරිසට අඩගා කියාලා මාගේ මේහිඹුණී

වෙශය අන්තධාතකොට මේ බිම පුරා සතිස්යොදනෙහි සිරි වක්‍ර වර්ති පිරිසක් මවාලා මම වක්‍රවර්තිරජවෙස් මවාගෙණ ආකාශයෙහි ම සිට සත්රුවන් පිළිවෙළින්ම සවාමීන් අභිමුඛයට මෙහෙයා ඒ වස්තුන සත්දෙනාගේ පූජාව පෙරදැරිකොට අටවැනිව මම ඒ මහ පිරිස හා සමග ආකාශයෙන් බැස සවාමීන් වැඳ වැඳ සිට මහත් සක්විතිරජ නම් පූජාවක් කෙරෙමිසිද කිදුග.

නැවත යාඩිමතුන් කෙරෙහි අග්‍රවූ මුගලන්මිහතෙරුන් වහන්සේද පන්සියක් සඟපිරිස් ගෙණ අවුත් බුදුන් වැඳගෙණ සවාමිනි මෙහි දක්වන පෙළහර මටම හාරය එසේම හැකිබවත් මේ දෙවි මිනිස් හැමදනිත්මය. එහෙයින් ම මම අවසර දෙවා වදුලමැනවැයි සැලකළසේක. ඒ කෙසේවූ පෙළහරෙක්දැයි වදුලකල්හි සවාමීනි මම එක්ලක්ෂ අටසැ දහසක් යොදුන් මහමෙර අතින් මැඩ රිදු ඇවක්සා කුඩා කොටගෙණ දත්හස්සේ සඟවා ගණිමි. එසේම හැම දෙනා බල බලා සිටියදීම දසදහසක්සක්වළ දසදහසක් මෙරග ලත් එසේම මානරා හැදගෙණ ඒ හැම වෙන වෙනම දත්හස්සේ සඟවාගණිමි. තවද මේසා මහපොළොව කළාලයක්සේ හකුලා ඇඟිලිහස්සේ තබාගණිමි. තවද මේ මහපොළොව කුඹල්සක්සේ පෙරළා යට තුබූ අමෘතය සියලු සතුන්ට බෙදදීලමිසි කියාද, තවද මේ සක්වළ මහපෙ ලොව සක්වළගල හිමවුනල සප්තකුට පර්වතයන් හා මෙරගල එක්අතකින් ඔසවාගෙණ මේසා සක්වළක ලමිසි කියාද, තවද මේ මහපොළොව පරණලාපුතක්සේ හැමටම පෙණී ඔසවාගෙණ මහමෙරමත්තෙහි තබාලා මෙරගල කුඩ දණ්ඩක්සේ අතින්ගෙණ පත්කුඩයක් හිසට අල්වාගෙණ සක්මන් කරණ මහණකෙනෙකුන්ගේ ලීලාදක්වා මේ හැම බලබලා සිටියදී සක්මන්කෙරෙමිසි කියාද, වෙන වෙනම තමන්වහන්සේ විසින් දැක්වියයුතු ප්‍රාතිහාර්‍යතම් මේමේයයි ප්‍රකාශකොට දැක්වූකල්හි මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ සිංහසේනාවකගේ ගර්ජනා අසන සිංහරාජයෙකුසේ ශ්‍රාවකයන්ගේ පෙළහර සිංහනාද අසාවදුරා මුගලන්මහාසථවිරය මෙතැන ශ්‍රාවකයන් විසින් දැක්විය යුතු ප්‍රාතිහාර්‍යයෙක් නොවෙයි කියා ලොව සම්බුද්ධ විනෙජන පුද්ගලයෝද වෙන්ව ඇතිබැවින් මෙතැන්හි අනන්තාපරිමාණබුදු වරයන්සේ ලොවුතුරාබුදුවූ මාවිසින්ම දැක්වූවමනා පෙළහරබුර යෙක. ඒ අනිකෙක් උසුලාලිය නොහැක්ක. ඒ බව මේ බුදුවූකල් තබා අග්‍රශ්‍රාවකවූ ආජාතීය වෘෂභරාජන්ට උපන්කල පවා මා හදනා ගැල්හැදූලු කෙතෙක් නැතැයි වදුරා:—

යතෝ යතෝ ගරුධුරං යතෝ ගම්භීරවත්තනි
තදස්සු කණ්හං යුඤ්ජන්ති සවාස්සුදං වහතෙ ධුරං
මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචන
මනුඤ්ඤං භාසමානස්ස ගරුංභාරං උදබරි
ධනඤ්ච සං අලබ්භෙසි තෙනවත්ත මනෝ අහූං

යනමේ ගාථාදෙකින් කණ්හජාතකය හා තන්දිවිසාලජාතක යෙන් බණවදුරා මහණෙනි තෙපි හා මට එසේ පිළිවන්බැව් සැබෑ මය. එසේවුවත් ෙතපි සිටිවු මාගේ සමන්‍රිශත් බුඩකාරක ධම්යන් ගෙන් අද පසලොස්වන ධම්ය සිඩවන දවසය. අද මා පානාවූ පෙළ හර මාසේවූ අනික් බුදුකෙනෙක්මුත් කිසිවක් හටත් විෂය නො වෙයි. බුදුන්ගේ පාරමිතා නැමැති මහකප්රුක අම්මහනිවන් ඵල අදලොවට දීමෙන් මහත්වූ ලෝවැඩෙක් වන දවසෙකැයි වදුරා ගදකිළිඉනිඉසමත්තෙන් ගඩමණ්ඩල මාලයට බැස ආකා ශය බලාවදළසේක. එකොණෙහි සක්දෙවිරජ මාහිමිතුමන්ගේ පෙළහර දක්නටරැස්වූ ජනයන් හැමදෙනාටම ආනපාදියෙන් වෙහෙසක් නොව සිත්සේ පෙළහර දක්නට සදමිසි සිතා දිගින් පුළුලින් දෙලොස්යොදුන් අවටින් සතිස්යොදුන්තැන් පමණ තැන වසා සිවිනා සේ දිව්‍යමය වූ නිලුපුල්මණ්ඩපයක් මැඹ ය.

ඒ මණ්ඩපයෙහි සියලු දිව්‍යකම්නානයන් අහස සඳමඩල පෙණෙන්නාසේ හැමසත්ත්වයන්ටම විශෙෂයෙන් පෙණෙන් නේය. දසදහසක් රත්මෙර රන්වැම් සැදුවාසේ තැනී ඒ මතුයෙහි එක්දහස් දෙසිය තුන් කෙළපත් සාළිස් ලක්ෂ සත්යොදනක් දිගඇති මහාරුවන් සක්මණද යට කියන ලද ක්‍රමයෙන්ම මැවිගියේය. ඒ රුවන්සක්මනද හැමසතුන් ටම ඉඳුජාලයක් දෙවුදුනු රූපයක්සේ ප්‍රකාශව පෙණෙන් නේය. එවේලෙහි මහපිරිස එසපැහැර සාධුකාර දෙමින් ඔල්වරසන් දෙමින් අසුරුසන් දෙමින් උතුරුසළු හිසසිසාරමින් කොල මේ කිමෙක් දැ? මේ කුමන පෙළහරෙක් දැ? අනේ මෙවැන් නක් පෙර දුටුවිරුවෝ කවුරුදැයි කියමින් අනිකක් බැලුවෝ නැත. අතිකක් සිතුවෝනැත. අහෝ සාධු අහෝ සාධුයයි යන සාධු නාද පැවැත්වීමෙන් මහත් උත්සවකිරීමට පටන්ගත්හ. එකල්හි මාගේ සවාමිදරුවූ බුදුරජාණන්වහන්සේ උදයගිරිමුදුන් පත් සරා හිරමඩලයේ සතුන් ඇසිපියනගා බලන ඇසිල්ලෙහි ඒ රුවන් සක්මණට පැහැනැගිසේක. ඒ දැක අවීචිගෙඹ පටන් භවාග්‍රගදක්වා ලෝකුස් පුරාසිටි දිව්‍යමනුෂ්‍යාදි සියලු සේනාවම එකපැහැර සාධු කාරදී දෙගොත්මුදුන් දුන්හ. එකෙණෙහි දසදහසක් ශක්‍රයෝද

දසදහසක් ශංඛධ්වනිපූජාවට පවත්ගත්හ. දසදහසක් සුයාම දිව්‍යරාජයෝද දසදහසක් දිව්‍යවෘමරපවනින් බුදුන්ට සුවපහස දෙමින් පෙළඟැදී සිටගත්හ. දසදහසක් සන්තුෂිත දිව්‍යරාජයෝ ද ඝිරම්බුලු සේ දිලියෙන දස දහසක් මැණික් තල්වැට ගෙණ එසේම පෙළ සැදී සිටගත්හ. දසදහසක් සුනිර්මිත දිව්‍යරාජයෝද රන් කැටපත් රිදීකැටපත් මැණික්කැටපත් ආදී නොයෙක් නොයෙක් පූජාපෙළහර පංක්ති ගෙණ පෙළ පෙළ සැදී සිටගත්හ. දසදහසක් පරනිර්මිතදිව්‍යරාජයෝද රන්හාරඛු රුවන්හාරඛු ආදී නොයෙක් මහුල්පූජාපෙළහර ගෙණ පෙළ පෙළ සැදී සිටත්හ. දස දහසක් සක්වළ සතළිස්දහසක් වරම්රජදරුවෝද තමන්ගේ දිව්‍ය සේනාව හා සමග නොයෙක් පූජාපෙළහරයෙන් අවුත් පෙළපෙළ සැදී සිටගත්හ. දසදහසක් සහම්පතිබ්‍රහ්මරාජයෝ ද සඳ මඩුලුයේ දසදහසක් සේසත් ගෙණ අවුත් පෙළසැදී සිටගත්හ. සෙසු සියලු දිව්‍යබ්‍රහ්මසේනාවද දිවමල් දිවසුවඳ ආදියෙන් බුදුන් පුද පුද තුන්ලෝ පුරා සිටගත්හ. එකෙණෙහි ම දෙනිස්මහා පුවි නිමිත්ත නම්වූ බුදුන්ගේ අද්භූත පූජාද බුදුවූ දවසේ සේ ම පහළවූහ.

එකෙණෙහි බුදුහු පිතකඹිණ සමාපත්තියට සමවැද සියොළඟින් බුදුරැස්හැර දසදහසක් සක්වළ අවිචිය පටන් භවාග්‍රය දක්වා එකාලෝකකෙරෙමින් හැම සත්ත්‍වයන් සිත්සේ මා බලත්වයි එසේම ඔවුනොවුනුදු විශෙෂයෙන් දකිත්වයි අධිෂ්ඨානකොට ලොකවිවරණ ප්‍රාතිහාර්‍යයක් කළසේක. එවිට සියලු සත්වයෝම එසේ දක්නට පටන්ගත්හ. බුදුරජානන් වහන්සේද කිඹුල්වත බඹු සමාගමයෙහි එදවස දැක්වූ යමකප්‍රාතිහාර්‍යය මෙන් රුවන් සක්මණෙහි සක්මන්කෙරෙමින් නොයෙක් සමාපත්තීන්ට අනේ කාෂාරව සැමවැදීමෙන් ලොව අවශෙෂ ඍද්ධිමත්නට අවිෂයවූ බුදු වරයන්ටම විෂයවූ යමාමහාපෙළහර දක්වා බණවදාළහ. එවේලෙහි කෙළදහසක් ප්‍රාණීහු අමාමහ නිවන්පුර වැදී සැනහි ගියාහුය.

මෙසේ තුන්ලෝ පුරාඝිටි දෙව්බඹඅදී මහපිරිස හැමසතුන් සිත්බලා දැනහැඳින වැඩසාදු කරණලද විශිෂ්ටවූ සබ්බඤ්ඤුශාසනා ඇතිහෙයින් සබ්බඤ්ඤුන්වූ මාගේ බුදුරජ "ශාස්තෘ" නම් වන සේක. එසේහෙයින් කියනලදී.

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ – යි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සබ්බඤ්ඤුවාද සංග්‍රහයෙහි මෙතෙකින් සැවැත්නුවර ගණ්ඩම්බවෘක්ෂමූලයෙහිදී තීර්ථක දමනය පිණිස දැක්වූ යමකප්‍රාතිහාර්‍යය කථාව කියානිමවන ලදි.

මෙසේ මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ ප්‍රථම බොධි යෙහි බුදුවූ සත්වනහවුරුදුයෙහි ඇසළමැදිපොහෝ ලද ඵත්‍රඝළ නැකතින් තීර්ථකමථනය කොට, රුවන්සක්මණෙහිදී අනන්‍යාපරි යත්තවූ බුදුවරයන්ගේ වංශානුගත චාරිත්‍රයවූ පරිද්දෙන් සමාමහ පෙළහර දක්වා, පූර්බුදුවරයෝ කුමක් කළෝදෝහෝයි බලාවදුරා, මෙයින් ඉගාස් තව්තිසා භවනයෙහි ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛ ලාසනය පිළිගෙණ එහි වස්වැස අභිධම්පිටකය දෙසූහයි දැන ඒ බුඩවංශාගත චාරිත්‍රධර්මය නොවරදවාම මෙද කෙරෙමියි යන කරු ණාවෙන් දෙවිලොව නැගෙමියි සිතා, තවුතිසාදෙවිලොව දිසාව බලාවදුරමින් සතිස් යොදනෙක පුරා යිටි තරනෑරඳු ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස් අභිමුඛයෙහිවූ සාඛාවිටප පුෂ්ප ඵල පල්ලවා ලඞ්කෘත සුරදෘමප්‍රතිහාර්‍යවූ සැවැත්නුවර වහසල්දෙරට නුදුරුව පිහිටි තරුණාම්බාඹරාජයාගේ මූලයෙහි වැඩසිට, විශිෂ්ට චක්‍රලක්ෂ ණාදී අථෝරාසියක් මහල්ල කුණෙන් සැදුම් ලත් දක්ෂිණශ්‍රිපාදය මිටිරියනක් පමණ උස නිරාශ්‍යාසයෙන්ම තබා වදාළසේක.

එකෙණෙහි මාගේ සවාමිදරුවන් විසින් නොයෙක් ජාතිජාති වල දෙනලද සයනාසන උපාහනදානාදී කුසලබලයෙන් අසූසාර දහසක් යොදුන් උස ඇති යුගන්ධරපර්වතය හුයාපු වේඛ අගක්සේ සක්විති රජක්හු දුටු වණ්ඩාලයකුසේ නැමිනැමී අවුත් සවාමිදරු වන්ගේ ශ්‍රිපාදය මූදුනෙන් පිළිගත. දෙවැනිවූ වාමශ්‍රිපාදයද එසේම මිටිරියන් පමණ උස ඔසවාවදාළසේක. එකෙණෙහි එක්ලක්ෂඅට සැටදහසක් යොදුන් උස ඇති මහාමෙරුපර්වතරාජයාද එසේවූ ආදරයෙන්ම නැමී පිළිගත. මෙසේ මිනිස්ලොව පියවරෙක, යුගදුරු මුදුනේ පියවරෙක, මෙරුමුදුනේ පියවරෙකැයි ශක්‍රභවනයට තුන් පියවරෙකින් වැඩි මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ මිටි රියන් පමණට වඩා දෙවෙනිපදවාරය සිඳ, ශ්‍රිපාදය දිගුකොට තබා වදාළසේකැයි නොසිතියයුතු, හේ කුමක්හෙයින්දැයි කිවහොත්, බුඛ විෂය අවින්‍යාත්‍යමය. එසේ අවින්‍යාත්‍යවූ බුදුන් විසින් අවින්‍යාත්‍යව පුරණ ලද පාරමිතානුභාවයෙන් ජනිතවූ චතුලක්ෂණබලයෙන් අසූසාර දහසක් යොදුන් යුගන්ධරපර්වතයද එක්ලක්ෂ සැටඅට දහසක් යොදුන් මහාමේරුපර්වතයද ශ්‍රිපාද සම්පර්ශයට තුවූතුමූම නැමීනැමී අවුත් පිළිගත්තාහුය. ශාස්තෘන්වහන්සේ ශ්‍රිපාදයන් තබා වදාළ කල්හි ඒ පර්වතාග්‍රයෝ නැවත යථාස්ථානවලම පිහිටියාහුය. එසේ ඕගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ අසූසාරදහසක් යොදුන් ගෙවා ශක්‍රභවනයට තුන්පියවරෙකින් වැඩිබව කවර විස්මයෙක්ද?

මුදුලෝ විස්මයපත්වන මහත් මහිම ඇති ඒ අපසවාමිදරුවෝ, නුමූහු කළ පිණින් සසර ඇවිදිනාකල පවා 'බදිරඛහාර' ජාතකාදි නොයෙක් ජාති සහස්‍රවල දන්දෙමි, දෙවුලෝයෙමියි යනාදි වශයෙන් සිතා, පය කැඟකෙණෙහිම ඟිනි පලා පිපි පියුමෙන් දිව්‍ය රථයෙන් පවා පය පිළිගත්බැවිනුදු, තවද ඔබ සරණ ගියාහු පවා යම්මහපෙළහර පානා දවස්හි වක්‍රවාටමෙරුපර්‍වතාදිය මාකරා හැදගෙණ මෙසේවූ පෙළහරක් පානොමියි ඊට අවසර අපට දුන මැනවැයි කියා යාවසාව සිටිබැවිනුදු, ත. වද ඔබවහන්සේගේ ශාසන යෙහි මදපිණක් කළ සතුන්ට පවා මේ මෙසේයයි නොසිතිය හැකි මහත් කුශලඵල ඇතිවනබැවිනුදු, එසේ මේ ලඟ පින්වත් රජෙක් ගඩොළුයෙන්කළ ඇතකු බලා, තෝවත් මට පිටදේදැයි කී කෙණෙහි අවුත් පිට ඔදුවාගත්බැවිනුදු, දැන් සමනිස්පෙරුම් පුරා තුන්ලෝ ඔදුන්පත් ලොවුතුරුබුදුවූකල තමන්වහන්සේ මවු කුස ඉපදීම් ආදි හැම බුදුමගුලෙහි තළුවකු සේ නවා සිටි මෙරගල නැමී ශ්‍රීපාදය පිළිගත්බව අමුතු විස්මයෙක් නොවෙයි.

ඔබ කෙරෙහි ජාති ජාතිවල පවා විද්‍යමානව පැවති ඇති ගුණයෙක්මයයි කියා, මා දත්බවවූත් මේ මෙසේයයි එකාන්තයෙන් නොදත්මි. එසේවූ නොදතහැකි විද්‍යමාන අසාධාරණ බුදුගුණ සිඟිකිරීමෙන්ම අහෝ මාසිත උපදනා සංසාරතාවිල්ල පවා නිවී සැනඟි යන්නේය. එබදු සිත්සතහන අනන්ත ගුණඇති මාගේ සවාමිදරුවූ බුදුරජානන් වහන්සේගේ මෙසේ මෙසේවූ සතුන් ලඟ කකියවන ඉතා විස්මයව, සිවි අතිකක්හට අවිෂයවූ ගුණානුභාව සිඟිකිරීම තබා ඔබ ශ්‍රාවකවූ සැරියුත්මුගලන් ආදි බුදුසව්වන්ගේ එසේවූ විශෙෂ ගුණානුභාව සිඟිකිරීමෙනුදු, ඔබගේ ශාසනයෙහි ඉතා මදපිණක් කළ සතුන්ට පවා එයින් වන විපාකය එසේ ඉතා ඵලතර මහත් බව සිඟිකිරීමෙනුදු අහෝ මාසිත සැනඟී නිවී යන්නේය. එහෙයින් අනේ ලොව ඇම සත්හුම එසේවූ සිත් සැනඟිමක්ම ලද්දහුවිනම් අපා දුකිනුදු මිදුනාහු, දෙවිලොව සැපද ලද්දහුනම්වෙත්. එපමණක් මතු නොවෙයි. නිවන්සැපද ලද්දහු නම්වෙත්. එබදුවූ සියලු ලෝවැඩවම කාරණවන බුදුගුණය ද, බුදු සවගුණය ද, කුශලඵලය ද මෙසේ ලියා කියා මදක්වත් හාඳනා කළ මෙම පිණින් උපනුපන් ජාතිවල සවසත්නට දහම් අවබොධ කෙරෙම්වා. එයින් ඔවුනුදු ලදජාතිය සඵල වේ ම ය.

ශක්‍ර දෙවඳුතෙම එසේ වඛනා බුදුරජානන්වහන්සේ දැක, දිව්‍යසමූහයා සමඟ නොයෙක් දිව්‍යපූජාභාණ්ඩ ගෙණ පෙරගමන්

ගොස්, ආදර දක්වා, වැඳ, මෙසේ අපකරා වැඩි ශාස්තෘන්වහන්සේ මා නිසාම වස්වසන අභිප්‍රාය ඇතිසේක්වනැයි දැන් මාගේ ශක්‍රපුර යෙන් කවරතම් තැනෙක දුරජ්ඣව සැපවිහාර වේදෙහෝයි පරිකල්පනාකරණුයේ තමාගේ එකාපුණ්ඩරික උයනමැද පිහිටි, සියක් යොදුන් පරසතුමඳරාගසමූල පණ්ඩුකම්බල නම් ශෛලාසනයම උතුම් සේ දැක ඒ ආසනය දිග සැටයොදුන්, පුළුල පණස්යොදුන් පමණවේ නිලෝහුරු බුදුන්ට ඒ හොබිදෙන්හෝ, නොහොබිදෙහෝයි සිත සිතා, එසේද වුවත් ඊට වඩා උතුම්ආසනයක් දෙවිලෝ වත් නැති හෙයින් මූඑතුන්ලොවට උතුම්වූ බුදුන්ට මාගේ මේ උතුම් ආසනය පිදීම සුදුසුයයි සිතා, දෙදෙව් ලොව දිව්‍යසේනාව හා එක්ව, මහත් පූජාපෙළහරින් මහත් උත්සවයෙන් බුදුන් වඩාගෙණ ගොස්, පණ්ඩුකම්බලශෛලාසනය පිළිගැන්වීය.

එකෙණෙහි මාගේ සවාමිදරුවෝ දෙලෙස්රියන් බුඛශරීරයෙන් පසලොස් යොදුන් උස ඇති ඒ ආසනය මුල වැඩසිට ශක්‍රයා ආදිකොට ඇති ඒ සියලු දිව්‍යසෙනාවට අහස්කුසනැගූ යන්ත්‍රපාතයක් සේ ඉතාඋස්ව පෙණී වදාළසේක. ඒ දැක සිසාරා සිටි දිව්‍යසෙනාව කර නහා බුදුන්ම බල බලා විස්මියවපත්ව, සාධුකාර දුන්හ. මාගේ සවාමිදරුවූ බුදුරජද ඇසිපිය නහා නොහෙලන ඇසින්ලෙහි ශක්‍රයා තමාගේ ආසනය මහතැයි සිතූ සිත දිවැසින් දැක, වදුරා, මෙහි පළමුකොටබුඛානුභාව ප්‍රභාසතෙරෙම්හි සිතාවදුරා, තමන්වහන්සේගේ පුගත් වියතින් දිග තවවියත්, පුළුල සවියත්, සඟලසිවුර විද, සියලු දිව්‍යසෙනාව බලා සිටියදීම සතරපිරින් පත්කොට හකුලාගෙණ එසින් දිග දෙසියසතළිස්ගවු පුළුල දෙසියඅසූගවු උස සැටගවූ වටින් අටසිය අසූගවූ පමණ ඇති ඒසා මහත් ආසනය වසා හෙළාවදාළසේක.

එවිට මහාතෙලිසමක් කුඛාපුටුවක අතුට ඇවිලුවාසේ ඒ සතර පටක්ව හිටිය සඟල්සිවුරෙන්ම ආසනය වැසිගියේය හාත්පස්හි සිටිදෙවියන්ට ආසනයෙන් කිසිවකුත් නොපෙණෙන හෙයින් බැලුබැලූ අතම සඟළසිවුරම පෙණෙයි. එවේලෙහි සවාමිදරුවෝ පලඟබැඳ ආසනයෙහි වැඩහුන්සේක. එකල්හි බුදුන්ටම ආසනය හොබනේය. ආසනයටද බුදුහුම හොබනාසේක. බුදුන් නිසා ආසනය කුඛාවූයේත් නොවෙයි. ආසනය නිසා බුදුහු මහත් වූයේත් නොවෙයි! අහෝ, සාධුසාධු. මෙසේ අවින්නාවූ බුඛවිශයෙන් සියලු ලොව අභිභවා දුලුසක්වලට නහාවූ මහාප්‍රදීපයක් සේ පණ්ඩුකම්බල ශෛලාසන මස්තකයෙහි දිලිහිදිලිහි මේ සක්වළපවන් දසදහසක්සක්වළ මූඑල්ලෙහි සිටි දිව්‍යබ්‍රහ්මසෙනාවට විශෙෂයෙන් ප්‍රකාශව පෙණෙනසේක. කියේ මැනෝ.

තාවතිංසෙ යදා බුඩො, සිලායා පණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තකමූලසම්මිං, විහාසි පුරිසුත්තමො,

දසසු ලොකධාතූසු, සන්නිපතිඩ්ඣාන දෙවතා,
පසිරූපාසනත්ති සම්බුඩං, වසන්ත තහ මුඩනි,

න කොවි දෙවො වණ්ණෙත්ත, සම්බුධස්ස විරොවති,
සබෙබ දෙවෙ අධිගය්හ බුඩොවෙකො විරොවති, සි

ඝනුහෙයින් හාත්පසින් සාරසියසක් ගවු ආලොක පැතිරෙ මින් ශොභාමත්ව සිටි පරසතුරුක, මූ ෘ පණ්ඩුකම්බලශෙලාසන මස්තකයෙහි තුන්ලෙෝ තිලකයක්සේ අතිශයින් දිලිහි දිලිහී අවි නත්‍යානොපම ශ්‍රීබුඩවිලාසයෙන් වැඩහිඳ එදවස්හි දසදහසක් සක් වළින් රැස්වූ සියලුදිව්‍යබ්‍රහ්මයන්ගේ දිව්‍යශරීර, දිව්‍යවස්ත්‍ර, දිව්‍යමය කිරීටාභරණ රත්නමයවූ දිව්‍යවිමාන ශ්‍රීශොභාසියල්ලම මැඩපවත් වමින් එසේ කිසියම් ආභරණයකුත් නොපැලඳ වඩුදෙලොස් රියන් පමණවූ රන්වන් බුඩශරීරය කාෂායවස්ත්‍රයකින් වසා ගෙණ, තමන්වහන්සේම ඒහැම අතිහවා විශෙෂයෙන් දිලිහි දිලිහි සියල්ලෝ සිත්නෙත් පැහැර ගැන්මෙන් සඩම්ලිලා වෙන් බබළමින්, වැඩහුන් ඒ විලාසයට තරම්වූ සුදුසු අමුතු උපමා වක් අනේලොව නැත්මය. මගේ සිතට නොහැහෙයි. නුවණැසට නොදැනෙයි. මසැසවද නොපෙණෙයි. එනකුදුඋවත් අනික් වැඩි යක් නැති බැවින් සක්වළ කුළුපවුපෙළෙන් මැදව සිටි රන් මෙරක්සේ, කුලගැතියන් පිරිවරා හුන් සක්විතිරජෙකුසේ, තරු පිරිවරු සඳමඩලසේ, අහස්කුස දිලියෙන හිරමඩලසේ, ප්‍රියාවන් ගෙන් පිරිවරු ශක්‍රයාසේ, බඹසන් පිරිවරු මහබඹුසේ, විශෙෂ යෙන් බබළනසේකැයි, ලොවහැම කියතුදු, හෙද මෙහි නුසුදුසු බැවින් ඒකාන්තයෙන් මම නොකියමි. කියමිනම් ඔබසේම දස පෙරුම්පුරා විදුරසුන් අරා, පස්මරැස් මරා, ලොව්තුරා බුදුව, ඔබ සේම යමාමහ පෙළහර දක්වා, තුන්පියවරකින් දෙව්ලෝ වැඩ දස දහසක් සක්වළින් රැස්වහුන් අප්‍රමාණ දිව්‍යබ්‍රහ්ම සෙනාව පිරිවරා, ඔබසේම දිවපරසතුමුල දිග සෑව ගොදුන් පුළුල පණස් ගොදුන් උස පසළොස් ගොදුන්, පණ්ඩුකම්බල ශෙලාසන්ආරූඪව විජම්බණ දෙසනාවට සඩම්රාජලීලාවෙන් වැඩහුන් ලොව්තුරා බුදුකෙනෙකුන්වහන්සේ නමක් මෙනැති නිසැකින්ම කියමි. නිසැ කින්ම සිතමි. එසේ ලොව උපමාවශයෙනුදු නොදැක්ක නොසිතිය හැකිසේ, තුන්ගවු දෙලොස්ගවු උස රන්රුවන් කඳක්වැනි

දෙව් බඹ සිරුරුවල තන්විසිතුරු රත්නාභරණ හා මාණික්‍යාරත්න මය ඔටුනුපෙළින් සියල්ලම සැදී සැරහී රත්නමයවූ කූටාගාර පවිත්‍ර විමානතොරණ පඬික්ති සේ පෙළ පෙළ සැදී සිටි ගණන් මෙතෙකැයි පමණ නැති දසඳහසක් සක්වළ දෙවිබඹුන් පිරිවරා ඒ මැදට රැස් නැති දහවල් තරු සේ ඒ හැම අභිභවා මාගේ සවාමිදරුවන් ඒ වැඩවුන් විලාසය ද, දහම් නැමැති කැටපත ගෙණ හුවණැයින් බැලීමෙන් අහෝ මා ඔත් පිණවන්නේය. එසේ හැමවේලෙහිම ධර්මය බල බලා ලය නැකිය නැකියා ම සිත උපදනා බුඩාලම්බණප්‍රීති තොමෝ අනේ මෙතෙකැයි නොදන්නෙමි. අනුන්ට ද ඇඟවාලිය නොහැක්කෙමි. දැන් මුව නොපොහොනා බැවින් එසේවුවද විශෙෂ කුසලබලයෙන් මතු උපනුපන් ජාතිවලම මේ බුදුගුණයම විශෙෂයෙන් ප්‍රකාශකෙරෙම්වා. හැම සතුන් සිත් පුරවම්වා, මෙසේ මා ඇතුළු සියලු ලොව විස්මය පත්වන උතුම් බුදුගුණය මා දෙමවුපිය ගුරුවරුදී ඥාතිඥාති මැදහත් හැම සත්හු ද, අප සේ ම මෙම පින් බෙලෙන් නිවන් ලබත්වා. නො පිරිහෙත්වා

එසේ මිනිස්ලොව ගණ්ඩම්බවෘක්ෂාගාරයෙහි රුවන් සක්මණෙහි අත්‍යභිඥාබල තුන්පියවරකින් දෙවිලොව වැඩිකල බුදුන් නුදුවුවා වූ සතිස්යොදතෙක සිවි මහපිරිසව් හිර හිළිහුනු කැක් සේ සඳ හිළිහුනු කලක් සේ, ලොව අන්ධකාර විය. එකල සඤ්ඤෝ-

> ගතොනු විතතකූටං වා, කෙලාසං වා සුගන්ධරං
> කුතෝ දකෙඛම සම්බුඩං, ලොකජෙට්ඨං නරාසභං,
> පවිවෙකරතො ධීරෝ, න ඉමං ලොකං පුනෙතිහි,
> තතෝ දකෙඛම සම්බුඩං, ලොකජෙට්ඨං නරාසභං.

යනාදි ගාථා කිය කියා, අනේ අප බුදුහු සිතුකුළුපවිවට ගියසේක් දෝ හෝ! කෛලාශකූටපවිත්‍රයට ගියසේක් දෝ හෝ! අප බුදුන් කවර දවසෙක දකුමෝ දෝ හෝ සි යනාදි මහත්වූ විලාප යෙන් හඬාගෙණ, මුගලන් මහතෙරුන් වහන්සේ සරා ගොස්, සවාමිනි, අප බුදුහු කොහිදැයි විචාළහ. ඒ කාරණය තමන් වහන් සේව විශෙෂයෙන් දැනෙතුදු නොකියා අනුරුඬ මහතෙරුන් වහන් සේගේ ගුණ ප්‍රසිඬ කෙරෙමිසි සිතා, අනුරුඬ මහාසථවිරයන් අතින් විචාරවයි වදළසේක. එකල මහපිරිස් ගොස් අනුරුඬ මහතෙරුන් වහන්සේ අතින් විචාළාය. ඔබ වදුරණසේක් උපාසකවරුනි, බුදුහු තව්තිසාභවනයෙහි වස්වැස දෙවියන්ට විජම්බණ දෙසන්ව වැඩිසේක. තුන්මසක් දෙව්ලොව වැස, වප්මස මැදිපොහෝ

ලද මහාප්‍රවාරණ දිනයෙහි මිනිස්ලොවට වඩාත්ම කැපී වදාළ සේක. එබස් අසා මහපිරිස අප බුදුන් දුටු දවසෙක මුත් නොයම් හසි කියා, එම සතිස්ඝොදුන් බිම අතුරා ගොදි කඳවුරු බැඳ උනි. එතැන්පටන් ඒ භූමි පිරිසට ආකාශය ම ගෙය විය. එකල සුළු අනේපිඬුමහසිටාතෝ කියනුමෝ පින්වත් සත්ත්වයෙනි, මේ භූමි මාගේ බුදුන් දක්නා තෙක් කිසිසේම උකවලියක් නොව, බත්බුලත් වස්ත්‍රාභරණ හෝනා හිදිනා කිසිසේම උපභොග වස්තු වක් නොසොයා, මේ සියල්ල ම මාගෙන් ගණුවයි කියා කඳවුරුමැද බෙර ලවා එතෙක් සත්ත්වයන්ට ඒ තුන්මස මුළුල්ලෙහි ම සියලු ම බත්බුලත් වස්ත්‍රාභරණ මල්සුවඳ ආදාබොන බත්පැන් ගිනිදර දක්වා තමන්ගෙන් ම සපයා දුන්හ

ඔහු අමිතභොගී සිටාතසෙණෙක් නොවෙති. කෙසේ සපයා දුන්නුද? යත්, බුදුන් රහතුන් දෙවියන්ගේ ආනුභාවයෙන් ම දුන් හසි දනයුතු.

ඒ තුන්මස මුළුල්ලෙහි මුගලන් මහතෙරුන් වහන්සේ ම ඒ මහපිරිසට බණත් වදාළසේක. සත්ත්වයන් විවාරණ ප්‍රශ්නත් වදාරා හැමදෙනාට ම කලකිරීමට අවකාශත් නොදී අනුශාසනා කළසේක. ඒසා මහපිරිසේ මලමූත්‍ර ගඬගෙක් නොවී. උතුරු කුරුදිවසින සත්ත්වයන් සේ ම සියලු කුණප මහපොළොවට ම අන්තර්ධාන වෙයි. දෙවියෝ ගඬමාදන පර්වතයෙන් සුවඳමදපවන් මෙහෙයා හැම පිරිස ම සුවඳපිඬක් සේ කොට හැමවිලෙහි ම සන්තර්පණ කරවති. ඒ තුන්මස මුලුල්ලෙහි ඒසා මහපිරිස් ඔවුනොවුන් කෙරෙහි ඔවුනොවුන්ට ආක්‍රොශ පරිභව අවනොඥා පරුෂ අප්‍රිය නුසුදුසු වචනයෙක් වේවයි ඔවුනොවුන්ට නොසතුටුව අමෛත්‍රියෙන් බලන බැල්මක් පමණකුදු නැත්තේය. හැමදෙනාම ඔවුනොවුන් කෙරෙහි ප්‍රේම ඇතිව, දරුවන් දෙමවුපියන් කල්‍යාණ මිත්‍රයන් සේ මෛත්‍රියෙන් ම යෙදී වාසය කළහ. ඒ තුන්මස මුළුල්ලෙහි සියලු සත්ත්වයන්ට ම කාමවිතර්කාදි පාපවෙතනාවෙක් තම් ම නොවිය. මේ සියල්ල ම බුද්ධානුභාවයෙන් ම වියයි දනයුතු.

මෙසේ බුද්ධානුභාවයෙන් ම සියල්ලෙන් ශොභමාන ව සැදී පැහැදී මනුෂ්‍යයන් බුදුන් ම පත පතා සිටි කල්හි, එම බුද්ධානුභාවයෙන් ම රැස්වූ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසෙනාව පිරිවරා තුන්ලෝතිලකයක් සේ දිලිහි දිලිහි පාණ්ඩුකම්බලශෛලාසන කැඟී යවකි ක්‍රමයෙන් සබ්බඤ්ඤ ලීලාවෙන් යුක්තව වැඩහුන් කල්හි

පෙර මිනිස්ලොවදී මෙම බුඹෙන්පාදයෙහි ම සිල්වත් කෙනෙකුන් වහන්සේට එක්බත්සැන්දක් පිළිගන්වාලූ ඉන්දක නම් දුගියෙක් එම පිණින් ශක්‍රපුරයෙහි මහෙශාක්‍ය වූ දිව්‍යරාජයෙක් ව උපනි. තමා ඇගින් නිකුත් රශ්මින් සියලු දෙවියන් අභිභවා වසන ඉන්ද්‍රක නම් වූ ඒ දිව්‍යපුත්‍ර ද, පෙර අබුඹෙන්පාදයෙහි එබදු ශීලසම්පන්න තැන් කොට ලැබ දෙලොස්යොදනක් මානයෙහි කැවිනි කැට ගස්වා ලිප් බඳවා දසදහසක් ගවුරුදු මුළුල්ලෙහි මුළුදඹදිව යාවකයන්ට මෙදන් දී දින් කලාවූ අඹුකුර නම් රජෙක් එම පිණින් මහෙශාක්‍ය දිව්‍යරාජ ව උපනි. නොයෙක් ලක්‍ෂගණන් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා දසන ඒ ඉන්දක දෙවිපුතු හා අඹුකුර නම් දිව්‍යපුත්‍ර ද යන මේ දිව්‍යරාජයෝ දෙදෙන, බුදුසසුනාවුන් හා එක්ව අත්වැල් බැඳගෙණ කථාකරන්නාහු අද බුදුරජානන් වහන්සේ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහිඳ විජම්භණ වදාරණසේක. ඒ විජම්භණ ඉතා දැඩි දෙයෙක්ලු! අපි දෙදෙන බුදුන්ට ලංව සිට සිත් සේ බණ අසමිහ. දැන් ඇසිල්ලකින් බොහෝ දෙවියෝ රැස්වෙති. එකල අපට අවසර නොලැබෙයි. එහෙයින් අපි දෙදෙන පළමු ගොස් සම්පව හිඳ ගණුම්හයි, මන්ත්‍රණය කොට ගොස් ඉන්ද්‍රක නම් දිවැරාජ බුදුන්ගේ දකුණුදනමබලට හුදුරුව ඉඳගත.

එකෙණෙහි ම ශක්‍රපුරයට බුදුන් වැඩි බව අසා මානා නම් වූ පුරුෂදිව්‍යරාජන් ව තුසිතභවනයෙහි උපන් මහාමෝග්ගල්ලාන වූ මෑනියන්වහන්ෂේ මපුතනුවන්වහන්සේගේ දහම්අමා මා සිත් සේ අද අසා ගන්නාවූ දවසෙක, මේ කප්ලක්‍ෂ මුළුල්ලෙහි නොයෙක් ජාතිකොටිගණනි මවිසින් ඔබට කලාවූ දරුකනාවෙහි ඵලවිඳගන්නාවූ දවසෙක, මහෞෂධපණ්ඩිතවූ කල මට දිව්‍යඖෂධයකින් සංග්‍රහකල සේක, වෙස්සන්තර රජවූ කල උපන් විශසම සතුටු සිතින් මා මුසුණ බලා අම්ම, දන්දෙන වස්තුවක් මා අත තබවයි යන මධුර බසක් කීදුග. මේ බුදුවන ජාතියෙහිදු ම. කුසින් උපන් කෙණෙහි ඇත්පියවරක් ඉදිරියට ගොස්, මහත් ජයසිංහනාදකොට මා සිත සතුටු කළදුග. සෙසු ජාතිවලද මට කළ සුරතල් මෙතෙකැයි පමණ නැත. දැන් ලොවුතුරා බුදුව තුන්ලෝ මුදුන් පැමිණි සමයෙහි මට මිහිරිවූ විජම්භණ දෙසා නිවන්අමා දෙනවේකැයි සිතා ඉතා සතුටුව තුන්ගවු උස දිව්‍යශරීරයකින් සැවගැලක් පුරාලන දිව්‍යාභරණයෙන් අලඞ්කාතව, විසිඅමුණක් සුවඳ විලවුන් දරා ලක්‍ෂකොටිගණන් දිවනළු මහපිරිස් පිරිවරා තුසිපුරයෙන් බැස සියලු දෙවියන්ගේ ශරීරප්‍රභා නිෂ්ප්‍රභ කෙරෙමින් පුතනුවන් වහන්සේගේ ශරීර ප්‍රභාවයෙන් එකාලෝක කෙරෙමින් අවුදින් සියලු දිව්‍යසෙනාවට

පළමුකොට පුතනු වූ බුදුරජානන් වහන්සේගේ දැහැණපාර්ශ්වයෙහි දෙහොත් මුදුන් දී සිටගත්හ.

එකොණෙහි දසදහසක්සක්වළ ඝතළිස්දහසක් වරම්රජදරු වෝය. දසදහසක් ශක්‍රදෙවෙන්ද්‍රයෝය, දසදහසක් සුයම්රජහුය, දස දහසක් සන්තුසිතරජහුය, දසදහසක් සුනිර්මිතරජහුය, දසදහසක් පරනිර්මිතරජහුය, එක්ලක්ෂපණස්දහසක් මහාබ්‍රහ්මරජහුයයි යනාදීවූ සියලු දිව්‍යබ්‍රහ්මරාජසෙනාව ඔවුනොවුන් පරයා දිව්‍යඅවුදින් වන්හ. මෙසේ මහානුභාවසම්පන්න දෙවිසන් එත් එත් අලප ශාක්‍යදෙවියෝ පසුබැස බැස ගොස් සමහරු සක්වළගල මුදුනේ මදක් අවකාශ ලැබ ගැහැටි ගැහැටි සිටිති. සමහරු යුගන්ධරාදී සත් කුලපවිව දක්වා පසුබැස එහිදු ගැහැටි ගැහැටි සිටිති. සමහර බලවත් දෙවියෝ පසුබැස යොදුන් ලක්ෂයක් දහසක් සියයක් පමණ තැන් පසුබැස ගොස් ගැහැටි ගැහැටි සිටිති.

යටකී අඩකුර නම් දිව්‍යරාජ තෙම පෙර තමාගේ දන් පිළිගන්නා වූ සිල් රක්නා තැනක් නො ලැබුනු අඩුවෙන් පසුබස්නේ මහානුභාවසම්පන්න දිව්‍යරාජයෝ එත් එත් ඔවුන්ට අවකාශ දීමෙන් පසුබැස ගොස් තමා මසුරු නො ව බොහෝ දානවස්තු පරිත්‍යාග කළ මහපින්බල ඇති හෙයින් මදපිණින් දෙවිලොව උපන්නන් සේ ඉතා දුරු ව නො ගොස් චම්දනමඩලට හතළිස්අටගවු පමණ දුරු ව හුන්නේය.

ඉන්‍රක නම් දිව්‍යරාජ තෙම පෙර තමා බුඩොත්පාදයෙහි සිල් රක්නා එක්තමකට එක්ඛත්තැන්දක් වී නමුත් දන් දීමෙන් කර ගත් මෑහැගි කුසල බලයෙන් අගලක් පමණ තැනුත් නො සෙල්වී ම බුදුන්ගේ දකුණුදනමඩල සමීප ව උන්තැන ම සතුටු සතුටු ව නිශ්චල ව හුන්නේය.

බුදුරජානන් වහන්සේ !!ඒ දිව්‍යරාජයන් දෙදෙනාගේ කුසලබල විභාගය පලමුකොට මේ දිව්‍යසෙනාවට ගඟවා දානඵලය ප්‍රකාශ කොට, තෘෂාගවෙතනාවෙහි පිහිටුවා පසුව විජම්බණ දෙසමි" යි සිතා වදාරා, දෙලොස් යොදනෙක හුන් අඩකුර නම් දිව්‍ය රාජයාට අඩකුර යයි මහත්කොට මේ හැම දිව්‍යසෙනාවට ඇසෙන පරිදිදෙන් හඬ ගා වදාළසේක. ඒ ශබ්දය සක්වළගල් පර්‍යන්තය ව බඹලොව ගසා සිටි සියලු දිව්‍යබ්‍රහ්මසෙනාව අසා සියලු බණපිරිස ම

අනේපිඬු සිටුතුමා ජේතවනොද්‍යාන භූමියෙහි කාවරණ
ඇතිරවීම (151 පිට)

නිශ්ශබ්ද ව බුදුන් දිසාව බලා හුන්හ. සැවැත්නුවර සතිස්සොද නෙකි පිරී සිටි මහපිරිස ද බුදුන් අඩිකුරස සි වදුල බස අසා, එකෙණෙහි කොලු අප බුදුන්ගේ කටහඬ අසන් දුන් මේ ඇසි ගියේ යසි ඉතා සතුටු ව හැමදෙන ම නිශ්ශබ්දවව් කිස කියා දෙහොත් බුදුන් දී දෙවිලොව දිසාව බල බලා සිටියාහ. එවේලෙහි මාගේ සවාමිදරුවූ බුදුරජානන් වහන්සේ—

මහාදුනං තසා දින්නං, අඩිකුර දිසමනතරං,
සුවිදූරෙ නිසින්නොසි, ආගවජ මම සනතිකං.

යන මේ ගාථාව සියලු සතුන්ව ඇසෙන සේ මදුරා "අඩිකුරය, පෙර නෝ දසදහසක් හවුරුදු දෙලොස් හොදනෙක ලිප් බදවා මහ දන් දුන්නෙහිය. එහෙයින් මොබ අවුත් මේ ඉඳුකයා සේ ම මා සමීපයෙහි බණ අසා ගණුව" සි වදුලසේක. ඒ අසා අඩිකුර තම් දිව්‍යරාජයා හුනස්නෙන් නැගි වැඳ සිව—

අයං සො ඉඳුඛො යකෙඛා, දජ්ජා දුනං පරිතතකං,
අනිරොචති අමෙහකි, එතෙදු තාරාගණෙ යථා.

යන මේ ගාථාව කියා සවාමීනි, පෙර මම අබුබොන්පාදයෙහි මිනිස්ලොව ඉපද සිල් රක්නා තැන් කැති බැවින් බොහෝ දනවස්තු පරිත්‍යාග කොට, දන් දී හඬුකුබුරෙක යාළුක් වපුව පැලක් ගන්නා සේ නො සිල්වතුන් විසයෙහි බොහෝ වූ පින්කම් කොට මෙසේ සවල්ප වූ ආනුභාවයක් ලදිමි. තෙල ඉඳුක තම් දිව්‍යරාජයානෙනෝ, ඔරුවූ කොතක පැලක් වපුව යාළුක් ලබන්නා සේ බුබවහන්සේගේ මේ බුදොත්පාදයෙහි ම සිල්වතුන් විසයෙහි ඉතා සවල්ප වූ පින කොට අපමණ වූ මහානුභාව ලදින්, අප හැම අතිහවා තරු මැද සඳක් සේ සවාමිනි, තුඹු ම දිලිහෙන්නාහ.

එවේලෙ බුදුහු ලඟ වුන් ඉඳුකයන් බණව, නෝ කළ පිණ ද කියව සි වදුලසේක. ඒ අසා හුනස්නෙන් පැන නැගි බුදුන්ට දෙහොත් බුදුන් දී සිට, "සවාමීනි, පෙර මම ඉඳුක තම් දුඃඛිත යෙක්ව දෙරින් දෙර හික්ෂාවනාය කොට ඇවිදින්නෙම් එක්දරෙක සිඟා සිටි කල, ඒ නෙසි මිනිස්සු මා දුක මහත් කරුණාව උපදවා මට

දෙන්ට බත් සැන්දක් ගෙණාහ. එවෙලෙහි ම බබවහන්සේගේ සත්තෙහි අනුරුබ තම මහතෙරුන් වහන්සේ ද පසු ව එම දෙරට සිහා වැඩිසේක. මම එකල උත්වහන්සේ දුක, මහත් සැදුහැයෙන් ම මා උදෙසා ගෙණා බත්සැන්ද ඔබ පාත්‍රයට ම පිළිගන්වාලිමි. එපමණ පිණින් මේ දෙවිලොව උපන් මිෑගේ ශරීරයෙන් නිකුත් ප්‍රභා හැම දෙවියන් මැඩගෙණ පවතිනා ලෙසත්, මා අභිමුඛයෙහි හිදගත හැකි දේවතාවෙකු කැති හෙයින් එසේ වූ මිෑගේ තේජස් හා පිරිවර මේ බලා වදළ මැනවැ යි කීසේක. එවේලෙහි දන ඵලානිසංස දක්වා වදාරණ බුදුරජානන් වහන්සේ—

විවෙය්‍ය දුග්ගං සුගතපථ සඤ්ඤං, යෙ දායකිණෙය්‍යා ඉධජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි, බිජානි වුප්පාගි ඝථා සුඛෙත්තෙ.

යනාදීන් දන් දෙන්නහු විසින් තුන්සිත පිරිසිදු කොට, දන් පිළිගන්ට නිසිවූ ශීලවන්තයන් පින්කෙත් දැන, හැඳින, බලා විමසා දන් දීමෙන් මහත්ඵල වන බව ප්‍රකාශ කොට, දානානිසංස විභාග දක්වා දිව්‍යමනුෂ්‍යයන්ට බණ වදළ කල්හි, අඹකුරය ඉන්දකඝ යන දිව්‍යරාජයෝ දෙදෙන සෝවාන් වූහ. අවශෙෂ වූ බොහෝ දෙවියෝ මාර්ගඵල ලදහ. සැවැත්නුවර සත්ත්වයාදනෙහි පිරී සිටි මනුෂ්‍යයේඤාව ද, ඒ පිරිස බුදුන් වැඩහිඳ වදළ බණ සේම විශෙෂයෙන් තම තමන්ට ඇසෙන හෙයින් දහම්රස විඳවිඳ ම බණ අසා බොහෝදෙනා මාර්ගඵල ලදින් සතුටු ව, සාධුකාර දුන්හ. ඒ හැමදෙනාට බුදුරුව කොා පෙණේ. බණ වදාරණ ශබ්දය පමණක් ඇසිකිය හෙයින් "අනේ අප බුදුන්ගේ මිහිරි වූ කටහඬ දුන් ඇසුම්හ" යි යනාදිය කියා කියා උත්සව කළහ.

එකල ත්‍රිලෝගුරු බුදුරජානන් වහන්සේ සුවහස් පහන් දැල්වූ පහන් රුකක් සේ, මුදුතෙහි දිලියෙන මහාප්‍රදීපයක් සේ, දස දහසක් සක්වළ දිව්‍යතෙජාව මඩ්‍යයෙහි දිලිහි දිලිහි, බුඩම්ම දක්ව දක්වා, යට කියනලද ක්‍රමයෙන් සියල්ලන් සිත්තෙත් පැහැර ගැන්මෙන් සඩම්ලීලාවෙන් වැඩඋන් කල්හි, සංසාරයෙහි අපමණ ජාතිවල තමන්වහන්සේට ම මැනි වූ, මෙම බුදුවන ජාතියෙහිදු ඒ මහාමායා බිසෝ තම් ලදුව දස එකඩමයක් කුසින් උපුලා, උපන් ඇතියෙන් චුත ව ගොස් තුසිතභවනයෙහි පුරුෂාත්ම ලදින් මාතෘදිව්‍යරාජ ව උපන් ඒ මැනියන් වහන්සේ ප්‍රධාන වූ සියලු

දිව්‍යසෙනාව දෙහොක් මුදුන්දී යිට "සබෑම්වූ බුදුරජාණෙනි, බුදුවහන්සේ දුටු දවස් පටන් හැම දෙවියෝ ම අභිධම්මාමතය සවර දවස් පටන් දෙසනසේක් ලෝ ඉයි ප්‍රාර්ථනා කෙරෙති. ඒ හැමෙහි ඉත් පුරා විජම්බණ දෙසා වදළ මැනව" යි ආරාධනා කළාහ.

එවෙලෙහි බුදුරජාණන් වහන්සේ ඒ මාතෘදිව්‍යපුත්‍ර නම් ලද මැනියන්වහන්සේ ප්‍රධානවූ සියලු දිව්‍යබ්‍රහ්ම සෙනෝවගේ ඇස් නිමවමින් කන් නිමවමින් බැණ නැඹි බසින් ශ්‍රීවුඛයෙන් නිකුත් සුවදින් මුඛස්ක්වළ සුමදකරඛුවක්සේ කෙරෙමින් "කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා" යනාදී සප්ත ප්‍රකරණයකින් යුක්තවූ විජම්පිටකය හළලා අභිධම්දෙශකාවට පවත්ගත්සේක. කෙසේද? යත්,

එදවස්හි මෑගේ සවාමිදරුවූ බුදුහු අඤ්ඤාපඨවීඤාතවූ බුදුවර යන්ගේ ඥානයට ම විෂයවූ, දිව්‍යබ්‍රහ්මාදී අන් කිසිවක්හවත් විෂය නොවූ, පරමගම්භීර අභිධම්යෙන් දෙවියන්ගේ නුවණට මෙපමණක් කිරීම නැහෙයි සිතා වදාරා, මෝහොතක් කල් සිතියම්කඩක් විදා පානා සේ සියල්ලට ම දුකෙන පරිද්දෙන් උත්තානවූ දෙශනා දෙශනා කරණ කල්හි, දිව්‍යබ්‍රහ්මයෝ විශෙෂයෙන් දුක සතුටු ව සාධුකාර දිදී "මේ අභිධම්ය නම් මහත් ගම්භීර දුඩි දෙයෙකැයි පෙර ශ්‍රැතපරම්පරාවෙන් අසා දනුම්හ; දැන් අපට ඉතා උත්තාන ව වැටහෙන්නේය. අනේ අභිධම්ය ඉතා දුඩි දෙයෙක් නො වෙයි. ඉතා මොලොක් දෙයෙකැ" යි සිත සිතා අසති. එකල බුදුහු දෙවියන්ගේ සිත් බලා අභිධම්දෙශනාලීලාව ක්‍රමයෙන් දුඩි කරන්වී පවත්ගත්සේක. එවිට හැම දෙවිබඹුනට ඡායාවෙන් පෙණුන රූපයක් සේ ඇසෙන පමණ මුත් ඔකඡ නො දුනෙයි. සුඛක් සුඛක් දුනෙයි. එසේද උවත් මදින් මදින් සාධුකාර දිදී අසති. තවද එසේ ම දෙවිඉඹුන්ගේ සිත් බලා දුඩිකොට ගම්භීර කාරයෙන් දෙශනා කර වදරණ කල්හි සියලු දිව්‍යබ්‍රහ්මයන් ම අදුරු ගෙයකට වන්නා සේ කිසිවකුත් නො දුනේය. එවිට හැම දෙවිබඹුහු ම මේ බුදුරජ වදරන්නේ කිමෙක්ද ලෝ යි සිත සිතා, ගලක ඉන්නක් ඇන්නා සේ කිසිවකුත් නො දැන, තුෂ්ණීම්භූත ව සිටුවම ඇඳි රූපය සේ සිටියාහුය. එවිට බුදුහු නැවත දෙවියන්ට දුකෙන සේ වදරණ කල්හි සාධුකාර දිදී "අනේ පෙර සේ ම ගැඹුරු නො කොට වදරණසේකැ" යි නැවත නැවත ද වඩිවඩාලා සාධුකාර දිදී "අභිධම්ය මොලොකැ" යි කියා කියා අසති. කැළුත

කැවතත් දෙවිබඹුන්ගේ සිත් බල බලා ක්‍රම ක්‍රමයෙන් දැඩි කොට මෘදු කොට කොයක් ප්‍රකාරයෙන් දිවාරාත්‍රි දෙක්හි ම ශිෂ්‍ය භාවයෙන් වදරණසේක. ඒ කෙසේද? යත්,

සෙසු ශ්‍රාවකයන් එක අකුරක් කියාලන ඇසිල්ලෙහි අනඳමහ තෙරුන් වහන්සේ අකුරු අවක් කියාලන සේක. ඒ අනඳ සාමිනි එක අකුරක් කියාලන ඇසිල්ලෙහි දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ අකුරු අවක් කියාලන සේක. එසැරියුත් මහ තෙරුන් එක අකුරක් කියාලන ඇසිල්ලෙහි බුදුහු අකුරු අවක් වදරණසේක. එබැවින් ලොව මෙසේ සාමාන්‍ය මනුෂ්‍යයන් එස් බසක් කියන ඇසිල්ලෙහි බුදුහු පන්සිය දෙළසක් බස් වදරා නිමි වන තරම් මෙබඳු ශිෂ්‍ය වූ දෙශනා ඇති බුදුහු දිව්‍යඥනයට අතිශිෂ්‍ය කොට වදරණසේක. බුදුන් පෙරඛත කළමනා බුඩකාත්‍ය නිමිව පසුබත සඳහාබපත්‍යතෙහි වැඩසිට ත්‍රිපාදය සොඳ පැ දිය විඇලෙන අතුරෙහි එතනට රැස්වූ භික්ෂූන්වහන්සේට මහණෙනි, බුඩොත් පාදය දුලිහැ, මනුෂ්‍යත්වය ලැබ ගැන්ම දුලිහැ, ක්ෂණසම්පත් දුලිහැ, ඉණ ඇසිම දුලිහැ, ප්‍රව්‍රජ්‍යාව දුලිහැ, අප්‍රමාද ව ත්‍රිවිධශික්ෂාවන් සම්පාදනය කරව් යනාදීන් දවසින් දවස වදරන්නාවූ සුගතොවාද නම් සඩ්ඛෙප දෙශනාවක් කරණසේක. ඒ දෙශනාව පොත් සංගායනා කරතොත් දික්ඇගිය මැදුම්යගිය පමණ වෙයි.

තවද මේ මිනිස්ලොවින් හවුරුදු සියයෙක් නම්, ඒ දෙව් ලොවින් එක් දවසෙක. ඒ නියායෙන් බුදුන් ඒ තුන්මහ මුළුල්ලෙහි ශිෂ්‍යගතියෙන් නො කඩව වදලාවූ අභිඛම්දෙශනාව විස්තරවශයෙන් පොත් සඩ්ගායනා කරත් මිනිස්ලොව සිට ඔබ වැඩහුන් දෙව්ලොව පාණ්ඩුකම්බලශෛලාසනය දක්වා පොත් ලියා ගොඩ කරත්හොත් ඒ උස් තැනෙකැ යි නො සිතමි. තවද මේ මිනිස්ලොව අවුරුදු සියයක් ඒ දෙව්ලොවට දවසක් වන බැවින් මෙහි අවුරුදු සියයකට දෙවාරයක් එහි දෙවියෝ අනුභව කරත්නාහ. එහෙයින් අප බුදුහු තුන්මහ මුළුල්ලෙහි දෙව්ලොවදී ම වළඳනසේක් වී නම් "බුදුහු නිරන්තරයෙන් වළඳනසේකැ" යි දෙවියෝ සිතන්නාහු යයි දැන වදරා, මිනිස්ලොවට අරුණුනැගෙනවේලෙහි තමන්වහන් සේ ම එක්වැනි ව නිර්මිත බුදුරූකෙතකුන් මවා, ඒ අස්නේ හිඳුවා මාගේ දෙශනාලීලාවෙන් මේ බුදුහු විජම්දේශනා කෙරෙත්ව" යි මේ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසෙනාව අතුරෙන් කිසිවෙකුත්

මා බැහැරයිය බව නොදනිත්වා'යි අධිෂ්ඨානකොට හිමාලය පර්වත යටබෑ එහි අනොතත්තමිල අනන්නාපයන්හනවූ බුදුවරයන්ට නියතව තිබෙන සුගත් නම් මහතොවට බෑස නාළියදුවටු වළඳ මුඛ සොධනයකොට, සැවයොදුන් රත්තල්තලා මුදුනෙහි කෙලවර පිහිටි සත්යොදුන් මහසල්ගසමුල වැඩසිට රත්වලාකඹකින් සඳමඬල වසන්නාසේ, සුගත් මහා පංශුකූලචීවරය පෙරව වැඩ සිටිකල්හි බුදුන්ගේ සිතහා සමග පාත්‍රධාතූන් වහන්සේ සවකිය ස්ථානයෙන් අහසට පැනනැගි ගොස් ත්‍රිභස්තයෙහි පිහිටිකල්හි අසුරුසණක් සලිග් උතුරුකුරුදිවසිනට වැඩ දිව්‍යභොජන පිළි ගෙණ නැවත හිමාලයට වැඩ එම සල්රුකමුලම වැඩහිඳ, වළඳ වදරණසේක.

එකල දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ සැවැත් නුවරදී බුදුන් යමාවහපෙළහර පැදවස් බුදුසස්නේ පැහැද, තමන් වහන්සේ ලභ මහණවූ පන්සියයක් පමණ වග්ගුලිභික්ෂූන් ගෙණ, සකස්පුර දෙරට ගොස්, එහි වස්වසනසේක්, බුදුන් වළඳ අවසන් කල්හි සකස්පුර දෙරින් වැඩ, බුදුන් දැක, බුදුරජ වැළඳු පාත්‍රය සෝදා, කළමනා වත්තොට, වැඳ එකත්පස්ව හිඳ, සවාමිනි රිගේ පත්වාත්හක්තයෙහි පටන් අද අරුණුනැගෙන මේ පන්සාළිස් පැය මුළුල්ලෙහි ඔබවහන්සේ දෙසූ දෙශනා හා නිර්මිත බුදුන් කළ දෙශනා මට වදාළ මැනවැ''යි ආරාධනා කළකල්හි බුදුහු වදරණ සේක් 'ශාරීපුත්‍රය දෙවියන්ට දෙසූ ලීලාවෙන් දහතුදු දෙශනාකෙරෙමි නම්, එතෙක්කල් මෙහි පමාවෙයි. එහෙයින් තොපට සංක්ෂෙපයෙන් කියම්. විස්තර වශයෙන් ධරාගණ්ඨවයි දිදරා, ඊගේ මෙතෙක් දෙශනා කොළෙමි. නිර්මිත බුදුහු මෙතෙක් දෙසූහ'යි සංක්ෂප කොට ඇසිල්ලකින් වදරා 'තොපගේ වග්ගුලි මහණුන් පන්සියයට මේ විශෙෂයෙන් උගන්වව ඔවුහු ප්‍රඥ වන්තයහ. එතු මාගේ ශාසනයෙහි සප්තප්‍රකරණාචාරිහුවන්නා හුය''යි වදරා. දෙව්ලෝ වැඩ නිර්මිත බුදුන් අන්තර්ධානකොට ඒ ආසනයෙහිපෙණී නිර්මිත බුදුන්ගේ දෙශනාසඛ්‍යෙහි පටන් අතුරු නැතිවම දිව්‍යසේනාවට බණවදරණසේක

මෙසේ බුදුන් දෙව්ලෝ වැඩිකල සැරියුත් මහතෙරුන් වහන්සේද සකස්පුරදෙරට වැඩ, එහිවසන පන්සියයක් වග්ගුලි භික්ෂූන් කැඳවා, ''ඇවැත්නි අපබුදුහු මනුෂ්‍යයන්ට නොදනෙන හෙයින් අභිධම්මනම් දෙශනා දෙවියන්ට දිව්ලොවදී වදරණ සේක. එසින් හිමාලයට වැඩිකල බුදුන් කරා දවස දවස මම ගොස් ඉගෙණගෙණ එමි. තෙපි හැමදෙනම දවසින් දවස

මෑකෙරෙන් අසා ඉගෙණ, මතු විජම්පිටකයට ආවාරී වෙව්"යි කියා තමන්වහන්සේ උගත් පරිද්දෙන් උගන්වනසේක.

යථාක්‍රමයෙන්ම බුදුරජ ඒ වස් තුන්මස මූළුල්ලෙහි විස්තර වශයෙන් අභිධර්මදේශනාව කළසේක. ඒ දෙශනාව හා සමගම සැරියුන්මාහිමියන්වහන්සේ ඉගෙණ, තමන් අනවැසි පන්සියයක් භික්ෂූන්ට ඉගැන්වූසේක. ඒ හැමදෙනා වහන්සේත් අභිධර්ම ඉගැන්ම හා සමගම අමාමහනිවන්පුර වැදී සැනති ශියසේක.

ඒ පන්සියයක් භික්ෂූහු, මෙම සාපතුන්වැනිව බුදුවූ කාශ්‍යප බුදන් සමයෙහි කිරිවවුලෝ පන්සියයක්ව, ඉපද, එක් පබ්භාර යෙක වාසයකළෝය. එකල්හි එක්තරා මහතෙරහු දෙදෙනෙක් විජම්පිටකය නිමවා ඉගෙණ රට හුදුරු පබ්භාරයෙක නිරන්තර යෙන් වාසය කෙරෙමින් දෙදෙනා වහන්සේ විජ්මනය සාකච්ඡා කොට, පාවච්ඡාප්‍රතිපාවච්ඡාවශයෙන් අභිධර්මය පිරිවානසේක. ඒ අභිධර්මදේශනා ශබ්දය අසා සිටි කිරිවවුලෝ පන්සියය එයින් මියගොස්, ශබ්දමාත්‍රයක් අසූ එම පිණින් පන්සියයක් දෙවහනන් පිරිවරා දෙවලෝ ඉපද බුබානන්තරයක් මූළුල්ලෙහි අපායනොදුක දිව්‍යසම්පත් විඳ. අපබුදුන්සමයෙහි දෙවලොවින් චුතව, සැවැත්නුවර පන්සීයක් කෙළඹිකුලවල ඉපද, විඤ්ඤාණ යෙන්ම ඔවුනොවුන් කෙරෙහි එක්වම ශ්‍රී සම්පත් විඳ වැනිවිය පැමිණ, වතිබඛිතයෙන් ඇවිදිනාහු බුදුන් ඝමාමහාපලහර පාහා දවස පැහැදී බුදුසසුන් වැද, සැරියුත් සාමින් කෙරෙහි මහණව. එක්වම මහණදම් පුරා, එම අභිධම්ශබ්දය ඇසූ ඝුසලින් මෙසේවූ විජම්පිටකයත් දෙවිලොව බුදුන් වදුරමින් වැඩ සිටිය දීම මිනිස්ලොව ශිඳ නිමවා ඉගෙණ, එම පිණින්ම නිවන්පුර වැදුනාහුය.

එහෙයින් ලොව පින්කැමති එම්බා පින්වත් භාත්ම්යෙනි, මෙසේධම්ය යන සංඥාවක් නැතිවම, ශබ්දය පමණක් ඇසීමෙන් සියලුසම්පත් ලත්කල ධම්යයි දැන, ආදර උපදවා, ඇසීමෙහි ඵල ඉතා විශිෂ්ටයයි දැන, ධම්ගුණ සැලකීමෙන් වඩවඩා ආදර උපදවා, ඛණ ඇසියයුතු.

මෙසේ ශබ්දමාත්‍රයක් කණගුනු නිරිසන්සත්ත්ව පවා අපා දුකින් මුදා, සියලු වැඩට පමුණු වන මහිම ඇති උතුම් අභිධම් දෙශනාව මිනිස්ලොව ගණනිත් තුන්මසක් මූළුල්ලෙහි නිබඳම පවත්වා නිමවා, වදුළකල්හි මාතෘදිව්‍යරාජන්ව උපන්නාවූ මෑනි

යන්වහන්සේ කෙළදහසක්කෙලෙසුන් නසා, දහසක්ඤසින් ප්‍රති මණ්ඩිතවූ සෞමාන් පෙළෙහි පිහිටා, සියලුදිව්‍යසෙනාවට් පළමු කොට හුනස්නෙන් නැගී දෙහොත් මුදුන්දිසිට, සඞ්ඛ්‍යාමිනි 'අනන්තා පරිමාණ ජාතිවල මටම ප්‍රේමයෙන් මටම දරුව, මටම බොහෝ සමපත් දෙවූ මාගේ බුදුරජාණන්වහන්ස, පියුමතුරාජානම් බුදුන් දැක ප්‍රාර්ථිතාඤ්ඤතැන් පටන් මේ කල්පලක්ෂය මුළුල්ලෙහි ඔබ අනික් මෑනිකෙනෙකුන් නොසෙවීදැය; මමද අනික් පුතකු කෙනෙකුන් නොසෙවුවෙමි. දැන් මේ බුදුවන ජාතියෙහිදු කිඹුල්වත සුදොවුන් රජහට අගබිසෝ මහාමායා දේවි ගන මාකුස පිළිසිඳ දසදහසක් සක්වළ මහපොළෝ සක්වළ ගල් මෙරගල් කුළුපවු නළුවන්සේ නටවා, ලොව දෙගිස්මහාපුවි නිමිති පහළ කරමින් ඔබ මා කුසින් උපන් වේලෙහිම දෙපි බඹුන් අනික් පවා මට වන්දවා මා උතුම් කොටගත් මාගේ බුදුරජාණන්වහන්ස, මේ ලොකයෙහි පුතුන් පතන්කාවූ සත්‍රිහු ඔබ වැනිවූ පුතුන්ම ප්‍රාර්ථිතාකෙරෙත්වා, පෙර ජාතිවල මා ඔසින් පෙවූ තනකිරට වඩා දැන් ඔබවිසින් මා පෙවූ දහම්රසම ඉතා බෙහෙව. සඞ්ඛ්‍යාමිනි, බුදුකෙනෙකුන්ට මවුවීමෙහි ආනිසංස දැන් ලදිමි. ඔබ වැදූ පියණින්ම සත්‍රිආත්මයෙන් ගැළවී මෙසේවූ පුරුෂාත්මයකුදු ලදිමි. මතු සත්ජාතියකින් වඩා සසර නොඇවිදිමි. ඒ සත්ජාතියෙහි දෙවිලෝ බඹලෝ ඕනා අන්දැනෙක නුපදිමි. එම පියණින් මාගේ සියලගින් නිකුත් දිව්‍යශ්‍රී ශොභාවෙන් මේ දසදහසක් සක්වළ දෙවි බඹුන් මැඩපවත්නා ලෙසද මේ බලා වදාළමැනව''යි යනාදි වශයෙන් සියදහස් ගණන් වවන කියා බුදුන්ට ස්තුතිකිරීමෙන් සාධුනාද පවත්වා නමස්කාරකළහ. සක් වළගැබ පුරා සිටි සෙසුදිව්‍යබ්‍රහ්ම සෙනාව අතුරෙනුදු එම ධර්මදේශ නාවගේ කෙළවර අසුකෙළදහසක් පමණ අමාමඟ නිවන්දුටුවාහුය. කියේ මැනෝ.

නං දෙවදෙවෝ දෙවානං, දෙවදේවෙහි පූජිතෝ
දෙසෙසි දෙවලොකස්මිං, ධම්මං දෙවපුරක්ඛතෝ-යි.

අපබුදුන් බුදුව වැඩහුන් පන්සාලිස්හවුරුදිද මුළුල්ලෙහි මෙසේ දසදහසක්සක්වළ දෙවි බඹහු රැස්ව, තුන්මසක් නොකඩව, බණ ඇසීමෙන් බුදුන් පිදූ මෙබදු සමාගමයෙක් අනික් කිසි කලෙකත් නුවූයේය. මේ සමාගමයනම්, අනන්තා පරිමාණ බුදුවරයන් ඔසින් එකිඑකි වාරයෙක්ම ලබන්නාවූ එකාන්ත ධම්සමාගමයෙක්මය. මේසේ දෙවාතිදෙවවූ, බ්‍රහ්මාතිබ්‍රහ්මවූ, මාගේම සඞ්ඝිදරුවූ

බුදුරජාණන්වහන්සේට යට කියනාලද ක්‍රමයෙන් ලෙවිලෝ වැඩ, පාණ්ඩුකම්බල ශෛලාසනය පිළිගෙණ වස්තුන්මය අනුදහසක් මුළුල්ලෙහි අප්‍රමාණවූ විජම්භණෘද්ධිහාර්යයකින් දසදහසක් සක්වළින් රැස්ව අප්‍රමාණ දිව්‍යබ්‍රහ්මපෂදාවට අප්‍රමාණව, කරණලද විශිෂ්ටවූ සඛමීඥාසනා ඇතිසෙයින් ශාසනා නම් වනසේක එසේහෙයින් කියනලදී.

දෙව සක්ක මනුස්සානං, ලොකෙ අත්‍ථඵලං දදං
දදනතං දමයනානානං, පුරිසා ජඤ්ඤතෙ නවෙවා-සි

මෙතෙකින් මේ ශ්‍රී සඛමීවවාද සංග්‍රහයෙහි තුන්මසක් මුළුල්ලෙහි දෙවිලෝ වැඩකිද අයිඛම්දෙශනාව කරවදාල ප්‍රවෘත්ති කථාව කියා නිමවනලදි.

මෙසේ අපබුදුහු තවතිසාභවනයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි සත්වෙනි වය වස්වසා දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මපෂදාවට අභිඛම්දෙශනා කොට, ඒ වස්අනන යෙහි මහාපවාරණදිනයට සදිදවසක් පමණ කල් ඉතිරිව තිබද්දී, යට කී යමාමහපොළහර දක්නට රැස්ව, සැවැත්නුවර සනිස්ගොද නෙක පිරිසිවි මහවිරිය අපබුදුන් දැක මුත් අපි නොයමිහ යි සිට වප්මස පුර අටවක් ලද පොහෝ දිනයෙහි මුගලන් මහතෙරුන් වහන්සේ කරා රැස්ව, සවාමීනි අප හැමෙදනම අපබුදුන් නො දැක් මෙත් අසූහුන් දවසක් විය. කවර දවසෙක මිනිස්ලොවට වඩනා සේක්ද? ඒ අපට නියම දැන වදාල මැනවයි කිහ. ඒ අසා මුගලන් මහතෙරුන්වහන්සේ මම බුදුන්කරා තවතිසාභවනයට කැඟෙමි. නෙපි හැම ඒ බලාසිටුව යි කියා තමන් වහන්සේ සිරිතෙනිත්ම වැද දෙලඟ සතළිස්දහසක් ගොදුන් ඝනඇති මහපොළොව කිමිද ගොස්, මහමෙරපත්ලෙහි දසදහසක්ගොදුන් ත්‍රිකූට, පණ්ඩගස් දරා සිටි මහගල්පොළොව පලා පැන නැගි ඉඳුනීලසාගරයෙහි දිලි යෙන ප්‍රවාලාංකුරගස්සේ දිලිසි දිලිනි වැඩසිට මෙතන පටන් මා නැගෙන සැටි සියලු සත්ත්වයෝ ම විශෂයෙන්ම දකිත්වා යි අධිෂ්ඨාන කොට, එක්ලඟඅවසැවිදහසක් ගොදුන් ඌර්ධ්‍ව ඇති මහ මෙරපත්ල පවන් විදුරුතොරපතකින් සිදුරු කොට විද නැගෙන්නා සේ කිමිද, යාමෙන් නැගෙන්ට පටන්ගත් සේක. එවේලෙහි නීලවර්ණවූ මෙරපෘෂ්ඨාදිසාවෙහි පිහිටි කොදෙවු පන්සියයක් හා ජම්බුවිපවාසිවූ සියලු සත්ත්වයන්ට

ඉඳුනිලමාණික්‍යකින් රන්හුයක් අදනාසේ පෙණෙනසේක. එසේම රක්තවර්ණ මෙරපැත්ත දිසාවෙහි පිහිටි අපරගෝයාන වාසී සත්ත්වයන්ටද, සවර්ණවර්ණවූ මෙරපැත්ත දිසාවෙහි පිහිටි උතුරු කුරු වාසීන්ටද ඔන මේ දෙදහසක් ක්ෂුද්‍රද්වීපවාසීන් සහිතවූ සතරමහ වාසීහැමසත්ත්වයන්ටම ඒ ඒ මාණික්‍යාරත්නයන් විද, රන්හුයක් අදනාසේ මෙර පලා වඩනාබව විශෙෂයෙන් ප්‍රකාශව පෙණෙනසේක. මෙසේ මහමෙරුව සතරදිසාවෙහිවූ සතර මහද්වීප වාසීන්ට සතරමහ පෙළහරක් එකපැහැර දක්වදක්වා; අහස්හි තැනෙන විදුරක්සේ හෝ පැකිල වඩනා මහෂතරුන්වහන්සේ දැක, සතුටුවූ සක්‍රයෝ "අප මහෂතෙරුන්වහන්සේගේ පෙළහරක් බලව. අප මහතෙරහු අප බුදුන්සේම අනුජාතපුත්‍රවූ සේක. කොල තෙල බල අප මහෂතෙරහු පන්සියයක් යොදුන් උස ඇති අර පෙණෙන පළ මුවන උරගාලින්දයට නැගිසේක, එසේම දෙවන ගරුඬාලින්දයට තුන්වන දනවාලින්දයට සතරවන යක්ෂාලින්දයට පැනනැගිසේ කැයි කිය කියා බලාසිටිනාහු යොදනක්තැන් ගෙවා, නැගිසේක. දෙයොදනක්, දය යොදනක්, සියක්යොදනක්, දහසක්යොදනක්, ගෙවා නැගිසේක. යුගඛරපර්වත මුදුන ගෙවා නැගිසේක. අනේ වාතුම්මාරාජික දෙවිලොවක් පසුකොට මතුව නැගෙනසේක. අහෝ මහමෙරමුදුනට ලංව නැගිසේකැ" යි; යනාදී වශයෙන් කිය කියා දෙහොත් මුදුන් දිදී, ඇඟිකාරදිදී, දුල්වූ ඇඟිපිය හෙලාලිය නොහී, දුල්ලූ කට පියාලිය නොහී, නැඟූ හුස්ම හෙලාලිය නොහී, ඉතා මහත්වූ සන්තොෂයෙන් අතිශයින් විස්මයපත්ව අසුරඇන්දෙ මින් ඇඟිකාරදෙමින් දෙහොත් මුදුන් දෙමින්, කොල මේ කිමෙක් දැයි කියමින්, එම පෙළහරින් මත්ව සතරමහඵවාසීහුම බලා සිටිනාහුය

එකල්හි මාඝමිවූ මුගලන්මහතෙරුන් වහන්සේ මෙසේවූ මහපෙළහර දක්වීමෙන් මුලුසත්වයන් විසමය පත්කරවා; මහ මෙරමුදුන ගෙහා ගොස්, එයි පිහිටි සැටගවූ උස පණ්ඩු කම්බලසෙලාසනය ද කිමිද ගොස්, මාෘගේ සවාමිදරුවූ බුදු රජාණන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි තමන්වහන්සේගේ සිවුරුකණ කෙවිනසේ ඉතා ලංව, තමන් සවාමිදරුවන්ට ඉතා පසාදතව, ගැනිවූ බව මුලුතුන්ලොවැසියන්ට ප්‍රකාශව පෙණෙනසේ වැඳවැද සිටිකල්හි ඒ පෙළහර දුටු හැම සත්ත්වයෝම; "අහෝ දහදහසක් ඔක් වළින් රැස්ව හුන් මෙසා මහත් දිව්‍යසේනාවක් මැද තුන්ලෝ

මුදුන් පත් අපබුදුන් ලඟවම අවුත් අප මුගලන්මහතෙරුන් වහන්සේ පෙණ්ගිය සේ ඉතා විස්මයකැ" යි, ඇතුවුව තුන්ලෝ පුරා වෙවුල්වා ඉතිරියනසේ සාධුකාර දුන්හ.

මෙසේ දෙවිලෝ පත් මුගලන්තෙරුන්වහන්සේ බුදුන්ට අනුව නැමී වැඳසිට, "සර්‍වාමී වූ බුදුරජානෙනි, ඔබවහන්සේගේ අඟඩාරණවූ පෙළහර දැක්මෙන් හා මනොහරවූ ධර්මදෙශනා ඇසීමෙන් මහත්වූ මුළුදඹදිව සත්වයෝම මේ තුන්මස මුළුල්ලෙහි අපි බුදුන් අද දකුම්හ; සෙට දකුම්හ" යි සිත සිතා, විඛාව, සර්‍වාමීවූ බුදුන් දැක මෙහි අධිකතර ලොභිව සිරිති. මිනිස් ලොවට වඩිනේ කවර දවස්ද? කවර තම් තැනකට ද?" යි, විවාල කල්හි; මෑගේ සර්‍වාමිදරුවූ බුදුරජාණන්වහන්සේ, මෙඉද්ධලාභයන සර්‍වඥ, මෙයින් සද්දවසක් ගියකල වප්මස මැදි පොහෝ දවස් සකස්පුර දෙරට බස්නෙමි. තෙ:ප භ්‍රාතෘඃඃරීපුත්‍ර සර්‍වඥයෝද එහිම වස්විසූහ. මෑගේ ආනුභාවයෙන් ඒ මහපිරිස සකස්පුර දෙරටම රැස්කරව" යි වදළසේක.

එවේලෙහි මුගලන් මහතෙරුන් වහන්සේ නැවතත් බුදුන් වැඳ, අවසර ලබාගෙණ, එසේම මෙරවුදුනෙන් කිමිද, බස්නේ මහමෙර පතුලට බැස, එක්ලඝවිසිදහසක් ගල්පොළොවී හා එපමණවූ පත් පොළොව කිමිද ගොස්; සැවැත්නුවර මහපිරිස මැද සරාභිරම්බලයේ හැමදෙනාට පෙණී පැන නැගිසේක. ඒ දැක මහපිරිස විස්මය පත්ව මහතෙරුන් වහන්සේට ඍධිකාර පූජාකොට වැඳ සර්‍වාමීනි, අප බුදුහු කුමක් වදළසේක්ද? කවර දවසෙක දකුමෝද? යි, විවාළහ. එවිට මහතෙරුන් වහන්සේ "උපාසක ජනයෙනි, බුදුහු මිට සත්වෙනිදා සකස්පුර දෙරට බස්කෑසේක. එහි රැස්විය යුතුයයි වදළකල්හි මෙ ව සකස්පුර දෙර කෙතෙක්තැන් දැයි විවාරා එක් සිහවිසිවූ පමණ දුරුතැනෙකැ" යි, වදළකල්හි, මනුෂ්‍යයෝ සර්‍වාමීනි, මෙතනට රැස්වූ බාලදරුවෝද, ජරාදුර්ලයෝද. පසින් යා නොහෙන ශ්‍රීවත්තයෝ ද, ඉතා බබෙහව ඔහු හැම දෙනම එතෙක් තැන් කෙසේ පලාගෙදදැයි විවාළහ.

එබස් ඇසූ මහතෙරහු "උපාසකවරුනි, ඒ ගමනින් කිසිවෙකුවත් කිසිපීඩාවක් නොව, බුබානුභාවයෙන් හා මාගේ ආනුභාවයෙන් ගමන පාසුවෙයි. එබැවින් ඉතාදුරකැයි නොසිතා, හැමදෙනම නික්මෙත්ව" යි වදළසේක. ඒ වචනය හා සමගම මියර බිදී නික්මගත් මහවතුරක්සේ; මහපිරිස එක්වීවම සෙලවී නික්මුණාය. එකෙණෙහි බුබානුභාවයෙන් මහපිරිස අහසින් යන සක්විති පිරිසක් සේ, කිසියම් පීඩාවකුත් නැතිවම යන්නාහු, සමහරු මුඛයෙහි තුබූ බුලතට සුණු දමන, නිස්ගොදුන්මග ගෙවා ගොස්, සකස්පුර දෙරදී කැවෙනුස, හිසකේ බැඳ බැඳ යන්නාහු ඔබ පැමිණිකල බැඳ නිවූහ.

එක්කණක කණ්ඨාභරණ සැදැත්නුවරදී පැලඳ, අනික්කණෙහි කණ්ඨාභරණ සකස්පුරදෙරදී පැලඳ නිමවූහ. තවද ඔවුනොවුන් පරයා නික්මුණාහු එක්අතක හස්තාභරණ පැලඳ, අනික් අත ආභරණ සකස්පුර දෙර පැලැන්දහ. එසේ නික්මයන සන්සලයෙන් සුවහස් අගනා මුතුහර කරට දමා කර බදිනා පමාවෙන් යතුරු ගන්වහන්වා ගොස්, එහි පැමිණි අහතෝද ගණන් නැත්තාහ. එසේම දත්මැදි නොනිමෙනතුරුද මුහුණ තෙල්ගා නොනිමෙන තුරුද: ඇස අදුන්ගා නොනිමෙනතුරුද: රන්කැටපත් වමනින් ගෙණ මුහුණ බලබලා නොනිමෙනතුරුද: සක්පත් කණක තබා නොනිමෙනතුරුද: එක්මලක් ඉස හන්වා නොනිමෙනතුරුද: දරු වඩා යෙමිසි දැත් දිගුකොට වඩා නොනිමෙනතුරුද: එසා දුරු මග ගෙවා, සකස්පුරදෙරට ගොස්, එදවස පැමිණි ස්ත්‍රීපුරුෂයෝ මෙතෙකැයි පමණ නැත්තාහ තවද එසා පිරිසෙහි මෙතෙකැයි නිමවා නිය නොහැකි අනුරුපවූ නන්විසිතුරු ඒ ඒ කායඃයෙහි පවතිමින් සිටි සක්විති පිරිස සේ එකෙණෙහි හැමදෙනම සැදැත් නුවරසිට නිස්ගොදුන්මග ගෙවා පැනක් බී කොපියන ඇසිල්ලෙහි බුලතක් කා යොදු නොගන්නා දූතුරෙහි ඇසිල්ලකින්ම සිතිනෙන් ගිය ගමනක්සේ කිසිවෙහෙසක් නොව, සකස්පුර දෙරට මාගේ සහෝදරවූ බුදුන්ගේ ආනුභාවයෙන් පැමිණ උපන් සහෝතාපයෙන් උත්සවකෙළි කෙළ එහිම කදවුරු බැඳඋන්හ.

ඉක්බිත්තෙන් බුදුරජාතන්වහන්සේ වප්මස මැදිපොහෝ දිනයෙහි පාණ්ඩුකම්බලශෛලාසනයෙහිදීම වස්පවරා, අනනුඥයෙහි එදවස්ම "ශාක්‍යදෙවෙන්දුය, අප මිනිස්ලොවට ගිය මනාකලැ" යි වදාළසේක. එවේලෙහි සක්දෙවිරද "ගැත්තක්හුගේ ගෙයි ලැග සහෝදරුවක්හු යනකල ගැත්තහු ඒසින් කිසියම් සත්කාරයක් කෙරෙහි පසුගමනත් කළමනාය. එසේගෙයින් මමද මාගේ බුදුන්ට ශක්ති පමණින් පූජාවක් කොට පසු ගමන් යෙමි' යි මාගේ පුරයට වඩනා අඟළමැදිපොහෝදා 'තුන්පියවරින් බුඩානුභාවයෙන් වැඩිසේක. දැන් මාගේ පුරයෙන් මිනිස්ලොවට වඩනා ගමන දිව්‍යානුභාවයෙන් මහත් පූජාපෙළහරින් වැඩියමනාය. එහෙයින් සත්ත්වයන් ගිත්සේ දෙව්ලෝ බඹලෝ නිවන්පුර සැපසේ වැදීමට උතුම් සඩ්ගානුශාසනා නැමැති සෝපානයක් සැදූ මාගේ බුදුරජාතන්වහන්සේට මමද මේ දෙව්ලොව ගිට මිනිස්ලොවට

වඛනාපරිද්දෙන්, දිව්‍යසොපානමාඝියක් සදම්"යි, සිතා; මහමෙර මුදුනපවන් සකස්පුරදෙර දක්වා විසිතුරු සත්රුවන්මයවූ රුවන්ඟිනක් මවා, ඊට දකුණුලයෙහි එසේම රන්ඟිනක්, වම් ඇලයෙහිදු එසේම රිදිඟිනක් මැවූයේය. එයින් බුදුරජ වඛනා පිණිස මඛ්‍යයෙහි ඒ මැවූ සත්රුවන්ඟිනෙහි එක්පෙත්තක් රත්රන්මය, එක්පෙත්තක් රිදීමයය, එක්පෙත්තක් ප්‍රවාලමයය, එක්පෙත්තක් දැවානමයය, එක්පෙත්තක් ලොහිතඔකාමයය, එක් පෙත්තක් මසාරගල්මයය, එක්පෙත්තක් ඉඳුනිලමයය, එක් පෙත්තක් සත්රුවන්මයය, එහි වෙන වෙනම නිර්මිතවූ දිව්‍ය කමිනනයෙහි හොඛනා අසාධාරණ දිව්‍යසොපාන තුණම ඉඳු වාපසේ සඛියන්ට විශෙෂයෙන් පෙණේමය. ඒ දැන මනුෂ්‍යයෝ නොල! තෙල බල! මේ කුමන පෙළහරෙක්ද!? පෙර මෙසේවූ පෙළහරක් දුටුවෝ කවුදු! සි, කියකියා, දෙගොන් මුදුනෙහි තබාගෙණ, තුන්ඟිනෙහි කමිනනයන් තමන් අත්පත්දෙයක්සේ බලබලා; සාධුකාරපූජා පවත්වා, සිටිකල්හි; මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්සේ පාණ්ඩුකම්බ ශෙලාසනයෙහි වැස, ඛණ අසා ඔවි දිව්‍යසෙනාවට පින්දී, එම සියලු දිව්‍යසෙනාව පිරිවරා මෙරමුදුනෙහිවූ සත්රුවන්මය දිව්‍යසොපාන මඤකයෙහි; රුවන්ඇඟැයක් මුදුනෙහි අනේකවැටි දල්වාලූ දිව්‍යමය වූ මහාප්‍රදීපයක්සේ; දිලිහි දිලිහි; දසදහසක්සක්වළ මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය සමූහයන් විසින් පවත්වනලද නොයෙක් පූජා සත්කාර සම්මානයන් දැකවදරා, "සියලු ලොකධාතුගත සඛයෝම සිත්සේ විශෙෂයෙන් බවුනොවුන් හා මා දකිත්ව"යි, අධිෂ්ඨාන කළසේක.

ඒ අධිෂ්ඨානවිත්තය හා සමගම; දසදහසක් සක්වළ මුළුල්ලෙහි ඔවින් අවිවිය පටන් උඩින් භවාග්‍රය දක්වා; එකාඛ්‍රහණ විය. එකෙණෙහි දෙතිස්මහාපුරිසිතිමිති පූජාවෝද පහළවූහ. දසදහ සක්සක්වළ සියලු සඛයෝම ආකාශයෙහි සඳමඬල බලන්නවුන් සේ බුදුරජානන්වහන්සේගේ දෙතිස්මහාපුරුෂලක්ෂණයන් හා අසූ අනුව්‍යඤ්ජන ශ්‍රී ශොභාවන් අත්ලෙහි තුබූ සේ විශෙෂයෙන් බලන්නවුන්සේ තමතමන් ඔත්සේ බලන්ට පටන්ගත්හ. එපමණක් මතුනොවෙයි, දෙවිවරු මිනිසුන්ට පෙණෙති. මිනිස්සු දෙවියන්ට පෙණෙති. බ්‍රහ්මයෝ කුරුකුහුඹුවන්ට පෙණෙති. කුරුකුහුඹුවෝ බ්‍රහ්මයන්ට පෙණෙති. සුවඟස්පහන් දැල්වූ පහන් ගඛඩාවක්සේ උඩින් යටින් බැලුවන්ට සකසා පෙණෙන්නාසේ, මේ දසසහස් ලොකධාතුවෙහි සියලු සත්ත්වයෝ; ඔවුනොවුන් සිත්සේ බලන්ට පටන් ගත්හ. එවේලෙහි බුදුරජානන් වහන්සේ

මඛ්‍යයෙහි මැවූ රුවන් හිත, රුවන් පෙතිවල, ශ්‍රී පාදයෙන් ශ්‍රී පාදය තබතබා, නැඟු නැඟු, ශ්‍රීපාදයෙහි අටතුරාසියක් මඟුල් ලකුණු සියලු සත්ත්‍වයන්ට දක්වදක්වා අවිච්ඡින්නාකාරයෙන් බුබුලිලාවෙන් බස්නට පටන්ගත්සේක. ඒ බලාසිටි සියලු සත්ත්‍වයෝ මාණික්‍යමය වූ රුවන්කැටපත් පෙණෙන්නාසේ විශෙෂයෙන් දිලිසෙන බුදුන්ගේ ශ්‍රීපාදයන් හා ඒ බුදුන් වඩනාලීලා දැක, සතුටු සතුටුව, 'දැන් අප බුදුරජාතෝ, සුරක්තවූ ශ්‍රීපාදය තෙල පෙණෙන රන්පෙත්තෙහි තැබුසේක. අනිත් ශ්‍රීපාදය රිදී පෙත්තෙහි තැබුසේක. දෑමානපෙත්තෙහි තැබුසේක. ඉඳුනිල මැණික්පෙත්තෙහි තැබුසේක. ලොහිතඞ්කපෙත්තට බටසේක. මසාරගල්ල පෙත්තට බටසේක. සත්රුවන්හිණි පෙත්තට බටසේක. කොල! තෙපි කුමන බැල්මෙක් ද? බුදුන් දකුණු පත්ල ඔසවන්නා අරබලව්, වම්පත්ල ඔසවන්නා අරබලව්. බුදුන්ගේ ශ්‍රීපාදයෙහි සක් ලකුණු බලව, සුවහස් දූවි පෙණෙන්නා අර බලව්, ඡද්දන්ත පෙණෙන්නා බලව, සවසති කෝටි අටොරාසියක් මඟුල් ලකුණු වෙන වෙනම බලා ගන්නැ" යි යනාදි වශයෙන් කියකියා, දෙවියන්ගේ රුවන් හිණිපෙනිවල පිහිතුරුද බලා, 'එයට වඩා අප බුදුන්ගේ ශ්‍රීපාදවල මහිමම අනේ බලව" යි 'අපට හොබනේ ය" යි කියකියා මුව නොපොහොනාසේ අපමණ සාධුනාද කෙරෙමින් නගාගත් ශ්‍රීවයෙන්, හැවූ කටින්, දුල්වූ ඇසින්, බුදුසිරි බලබලා සිටිනාහුය.

එසැල්හි ශක්‍රදෙවෙන්‍ද්‍ර, බොහෝ පඤ්චපාත හුදී ජනයෙකුසේ බුදුන්ගේ ඝඟලසිවුර හා පාත්‍රය තමාගේ ගිස්මුදුනෙහි තබාගෙණ දැනකින් ඒ සිවුර හා පාත්‍රය වසාගෙණ අනික් දැනින් තමාගේ විජයතුරඟඝන තුඩ තබා පිඹපිඹ, තුන්ලොවට ඇසෙන සේ මහත් සංඛනාදයෙන්, බුදුන් පුදපුදා බුදුන් වඩනට පෙරටම දෙදෙවු ලොව දෙවිපිරිස් එක්වම දකුණු පාර්ශ්වයෙහි රත්හිණෙන් බසින්වනසේක. එසේම දසදහසක් ශක්‍රදෙවෙන්‍ද්‍රයෝ, දස දහසක් රන්පෙතිවල සැදිසිට, දසදහසක් ජයතුරාසක් තුඩතුඩ තබා පිඹිමින් සංඛනාද පූජාවට පටන්ගත්හ. දසදහසක් සුසාමරජහුද දසදහසක් හිණිපෙනිවල සැදිසිට, දසදහසක් මිණිවාඹර පවනින් පූජාකරන්ට පටන්ගත්හ. දසදහසක් සනතුසිත රජහුද, දසදහසක් හිණිපෙනිවල සැදිසිට දසදහසක් හිරම්වුලු සේ

දිලියෙන දසදහසක් මිණිකල් වැට ගෙණ, පූජාකරන්ට පටන්ගත්හ. දසදහසක් සුනිර්මිත රජහුද, එසේම දිව්‍යමයවූ අනේකප්‍රකාර පූජාභාණ්ඩ ගෙණ, දසදහසක් හිණිපෙනිවල සැදිසිව පූජාකරමින් බස්නට පටන්ගත්හ. දසදහසක් පරනිර්මිත රජහුද දසදහසක් හිණිපෙනිවල සැදි, මහත් උත්සවයෙන් බදුන් පුදපුදා ඉසින්ම පටන්ගත්හ. දසදහසක් සහම්පති මහා බ්‍රහ්මයෝ සඳමඩලක්සේ දසදහසක් සේසත් ගෙණ, වම්පිදී හිණෙහි දසදහසක් හිණිපෙනිවල සැදී, බුදුන් පුදපුදා බස්නට පටන්ගත්හ. අවශෙෂවූ බ්‍රහ්මරාජයෝද, රිදීමයවූ හිණිපෙනිපාසා සැදී පුදමින් බස්නට පටන්ගත්හ. එකල්හි දකුණුලඟේ රන් හිණෙහි සක්‍රස්පුරදෙර පටන් මෙර මුදුන දක්වාම එකාකාරයෙන් හිණිපෙත්තක් හිණිපෙත්තක් පාසා අතුරුකොදි සැදී සිට ගත් තාවූ බ්‍රහ්මසෙනාවද දිව්‍යමයවූ මහත් ප්‍රදීපශිඛා පංක්තියක් සේ එකාකාරයෙන් ම පෙණෙන්ට වත.

මෙසේ දිව්‍යබ්‍රහ්මසෙනාව පිරිවරා මැඟේ සම්මිදරුවූ බුදු රජාතන්වහන්සේ බස්නා මැද සත්රුවන්හිණෙහි පය ගානා වූ එකද දෙවියෙක් බඹෙක් නැත. එසේ අතුල්‍ය අසහාය, අද්විතීයවූ පෙළහරකුදු සියලුසත්ත්වයන්ට දක්වා දිව්‍යබ්‍රහ්මසෙනාව මධ්‍යගත රන්මෙරක් සේ සියලු ලෝ අභිභවා, දිලිහිදිලිහි මුලුලෝ සාධුකාර දෙවිමින් හැමසතුන් සිත්නෙත් තමන් වහන්සේ කරා ම පැහැර ගැන්මෙන් අනොපම වූ බුඩලීලාවෙන් යෙදී. යටකී ක්‍රමයෙන් බස්කාදේක. එකල පෙරටව පාසිවුරුගෙණ, රන්හිණෙන් බස්නා ශක්‍රදෙවෙන්ද්‍රයාට දිව්‍යබ්‍රහ්මසෙනාවන්ගෙන් ගහනව අවකාශ නැති ගෙයින් දසදහසක් පඤ්ච සිඛදිව්‍යපුත්‍රයෝ තුන්ගවු පමණ ඇති දසදහසක් බේළුවපාණ්ඩුවිණා ගෙණ සුවහස්ගණන්තන්හි සරහා. ගවු පමණ දසදහසක් වීණා තන්හි එකපැහැර හැම දෙනාම බුදුගුණ ගායනය කෙරෙමින පණස්පණස් යොදුන් තන්හි රහමඬිලු බැඳගෙණ, පෙළපෙළ සැදී බස්නට පවන්ගත්හ.

තවද දසදහසක් මාතලී නම් දිව්‍යරථාචාරියු දසදහසක් දිව්‍ය අශ්වයන් යෙදූ දසදහසක් වෛජයන්ත රථයානාවල් ගෙණ, තොයෙක් ධජපතාකාදි පූජා පෙළහරින් අලංකෘතකොට මේසේ තමතමන්ගේ සුවහස්ගණන් දිව්‍යසෙනාව ගෙණ, පෙළ පෙළසැදී බස්නට පටන්ගත්හ. දසදහසක් පමණ ඓරාවත නම් දිව්‍ය හස්තිරාජයෝද තෙනිස් තෙනිස් කුම්භස්ථල හා එහිමවූ දළ හා දලෙහි මැවූ පොකුණු හා පෙ කුණු වල මැවූ පියුම් හා, පියුම්වල ඉපනිවල ඔව් කටින දෙවඟනන්

හා සමග තුන්ලක්ෂයතෙනිස්දහසක් දිව්‍ය ඇත්සොඬ උඩනගා, තුන්ලක්ෂයතෙනිස්දහසක් සේසත් අල්වාගෙණ බුදුන්ම පුදමින්; ආකාශයෙන් පෙළපෙළ සැදී බස්නට පටන්ගත්හ.

මෙසේ අනෙකප්‍රකාරවූ නාට්‍යාදියෙන් හා ගී කිය කියා, දිව මෙණ ගගා, දිවකුලල් පිඹපිඹ, නොයෙක් පරිද්දෙන් බුදුන් ම පුද පුදා, අහසින් එදවස්හි බස්නා දෙවහතන් හා දිවතළුවෝ මෙතෙ කැපී පමණ නැත්තාහ. මෙසේ නොයෙක් පුද පෙළහරින් අහස් කුස මුළුල්ලෙහි දෙවියෝ මැවූ, දිවමඩුලු, දිවතොරණ, රුවන්ඇඟෑ, පහන් ඇඟෑ, ධජ පුන්කලස් මෙතෙකැයි පමණ නැත්තාහ. බුදු ගුණ සුන් දහස්ගණන් ජයඝාහල කිය කියා, ජයඝාහල පිබිඹි, බස්නා දෙවියෝද පමණ නැත්තාහ. දහවල් අහස තරු පෙණී ගියහ. මහපොළොවෙන් සත්රුවන් ඉපිලගියාහ. මහමුහුද ගැලිසිටි ගියදහස්යොදුන් දිග ඇති, මත්ස්‍යරාජයෝ ඉපිල, පැන නැඟි, මෙසා බුදුසිරි මිදවිද බලන්ට පටන්ගත්හ. එහි අනොපමවූ බුදුසිරි පුද පෙළහර දැක්මෙන් හැම සතුන් ඇස් නිවීගිය, කන් නිවිගිය, සිත් නිවිගිය, අහෝ! බුදුබලනම් මෙසේවූ මහත් දෙයක්ල. ලොඝයෙහි හැම සතුන් පිහින් වත් බලා, නිමවාලිය නොහැක්ක. සිතා නිමවාලිය නොහැක්ක. එසේ අනන්‍යතවූ මාගේ බුදුරජාණන් වහන්සේගේ එබදු ත්‍රි හා බුඛමහිම හා, ඒ බුඛානුභාව හා, ඒ බුඛ ලීලා හා සියලු බුඛපූජා දැක, සතුටුවහිය හැමසත්ත්වයෝම එදවස්හි අහෝ බුදු බව නම මෙසේ ලොව හැමටම වැඩි මහත් උතුම් දෙයකැ" යි දැන, එහි බලවත් ලොභ උපදවා, නිසිවූ අවසථාවිශෙෂ වූ බුඛකාරක ධර්මයන් හා, පාරමිතාභූම්විභාග බුදුබව පැතීම ඉතා අවිෂයදෙයෙක. යනාදි කාරණාද සලකාගත නොහෙන නිසිවක් නොදන්නෝ පවා, ශ්‍රඛාවෙගයෙන් මෙහෙයනලදුව සිත් ඇතුව බුදුබවම පැතුවාහුය. එසේ හෙයින් තුන්ලොව පුරාසිටි එසා මහ පිරියෙන් "මමද බුදුවෙම්ව" යි නොපැතුවාවූ එකද සත්ත්වයකුත් නැත. ඒ සියලු සත්ත්වයෝම "මමද බුදු වෙම්වා, මමද බුදු වෙම්වා" යි කියකියා, වෙනවෙනම ප්‍රාර්ථනා කළහ.

මෙසේ තුන්ලෝ පුරා සිටි දෙව්බඹ සහිත හැම සත්නට බුදු බව උතුම් සේ ගහවා, ඔවුනොවුන් ලවා බුදුබව ම ප්‍රාර්ථනා කරවමින් අහස්කුස වසා, සැදී පිරිසිටි දෙව්බඹපිරිස් සමගින් එම පූජාවිදිමින්, ශක්‍රභවනය පවත් මිනිස්ලොව දක්වා, රුවන්මය සොපාණපඞ්කතියෙන් එදවස්හි මාගේ සවාමිදරුවූ බුදුරජාණන්

වහන්සේ අප්‍රමාද බුදුසිරි දක්වදක්වා, කුරුකුහුඹුවන් පටන් මහ බඹුන් දක්වා, ඇමැතුන් සිත්නෙත් පැහැර ගැන්මෙන් නොයෙක් ශ්‍රීවිලාසයෙන් වැඩිලීලාවද, ඒ දැක මිනිසුන් සහිත දෙව් බඹ පිරිස් එක පැහැර තුන්ලෝ වෙවුල්වා සාධුකාර දීමෙන් දෙහොත් මුදුන් දී, වැඳවැඳ, බලබලා, සැදිසිටි ලීලාවද යන නොයෙක්සේ එහි පැවති බුදුසිරිපෙළහර හැම පුද වෙන වෙන සිතිමෙන් පින් පිරියන්නාසේ අහෝ මා සිතද පිරියන්නේය. එසේ සිත පිරියන මේ සා උතුම් සඛමී නැමති අමාපලෙහි ගැලීමෙන් සිත සතුටුව, දහම්රස විඳගන්නා මේ අත්බැව් මා උපන් තැන පටන් ඉඳුරු විකලයකටද නොපමුණුවා, මා වඩා රකිනකොට, යන්හැවිරිදි වයස් කල මෙසේවූ බුදුසස්නෙහි මහණ කරවා, මට සහායව, සිටි දෙමවුපිය ගුරුවරුදි හිතාහිත මඛ්‍යස්ථ හැමසත්ත්වයටද, මටද මේම කුසල බලයෙන්ම මෙසේ මෙසේවූ බුදුසිරිපෙළහර දැක්මත්, දහම් රස විඳගැන්මත් වාසනා වේවා.

මෙසේ අප්‍රමාණවූ බුඛලීලාවෙන් අප්‍රමාණවූ පූජාපෙළහරින් අප බුදුරජාණන් වහන්සේද අනන්තා පරියන්ත බුදුවරයන්සේ මාණික්‍යාමඝ සොපානයෙන් බැස වඳුරා, සකස්පුර හැම බුදුන් විසින් අවිජහිතස්ථානවූ ගල්තලා මස්තකයෙහි දක්ෂිණ ශ්‍රීපාදය පළමුකොට පිහිටුවා වඳලසේක. ඒ ස්ථානය අවලවෛත්‍යස්ථාන නම් විය.

මෙසේ මේ පොළෝතල පටන් පැමිණ දෙවානිදෙව වූ, බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ රුවන් හිණමුල මඛ්‍යම ප්‍රභාමණ්ඩලය සමගින් අෂ්ටාදශ හස්තප්‍රමාණ වූ ශ්‍රීබුඛකායකින් අතිශයින් ශ්‍රීමත්ව, තුන්ලෝ අභිභවා, දසදහසක් සක්වළ ආලෝක පතුරුවාලීමෙන් මහගිනිකඳක්සේ දිලිහිදිලිහි ශ්‍රී බුඛවිලාසයෙන් වැඩසිටිවේලෙහි අපගිමිවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ බුදුන් පෙරටව, ගොස් සිට, බුදුන්ගේ ශ්‍රී පාදමූලයෙහි හිස තබා, වැඳ නැගී හිරමඬලසේ දිලියෙන බුදුන්ගේ ශ්‍රී මුඛමණ්ඩය බලා, දෙහොත් මුදුනෙහි තබාගෙණ: —

න මෙ දිට්ඨො අතො පුබ්බෙ, නාසුතො උද කස්සචි
එවං වග්ගුවදෙ සත්ථෙතා, තුසිතා ඔරණ්මාගතො-සි.

යනාදීන් බුදුරජාණන්ට සතුතිකරන්නාවූ සැරියුත් මහතෙරුන් වහන්සේ ලොව හැම සතුතිවචන ශ්‍රෙෂ්ඨ වචන උපමා දක්වා කරණ සියලු ප්‍රශංසාවට බුදුරජම සුදුසුවූ ගුණානුභාවයින් ඇති බව හා තමන් අනුබුඛව; මේ බුදුසස්නෙහි විශත්කමින් අග්‍රප්‍රාප්තවූ

බව මුළු සත්තට ගහවා, අප්‍රමාණ වර්ණයෙන් ස්තුතිකොට, "මාගේ සවාමිවූ භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේට ම ගැතිවූ බැමින් මාසේවූ භාග්‍යවන්‍යාගේ නැත්තාහ. සවාමිනී, අද ඔබවහන්සේගේ මේ බුඩගුණබලා සතුටුව, බුදුවෙම්වයි නොපැතූ එක ද දිව්‍ය මනුෂ්‍යයෙකුත් නැත. ඔබවහන්සේගේ පඤ්චමස්කන්ධයෙහි වූ, මේ දස දහසක් සක්වල දිව්‍යබ්‍රහ්මසේනාව හා සතිස්යොදනෙක පුරා සිටි මේ මහපිරිස ද කුරු කුතුඹු සුළු ප්‍රාණීන් පටන් මහමසුන් දක්වා ඕඇලු තිරශ්චීනසත්ත්වයෝ ද, යන හැම සත්හු ම සවාමීන් කෙරෙහි අතිප්‍රසන්නව බුදුබවම පැතුහ. සවාමීන් වහන්ස, ඒ හැම සත්ත්වයන්ගේ ම ප්‍රාර්ථනාසංසිඩිය කෙසේ වේදෝ හෝ" යි විවාළසේක.

එවිට අප බුදුරජ "සාරිපුත්‍රය, බුදුවෙම්වයි පැතූ ඒ සියල්ලවුන්ට ම බුදුබව සිඩවන්නේ ම නොවෙයි. වදුරා වේ ලෝකයෙහි සත්ත්වයන් විසින් කළවනා සියලු ප්‍රාර්ථනාවන් අතුරෙන් බුදුවෙම්වයි කියා බුදුබව ම ප්‍රාර්ථනාකිරීම නම් ඒයෑ ඇති සත්ත්වයන්ටත් නැති සත්ත්වයන්ටත් උතුම් ප්‍රාර්ථනාවක්මය. බුදුවෙම්වයි ප්‍රාර්ථනා කොට, පින්රැස්කෙළෝ අධිකවීයෑ ඇත හොත් ලොවුතුරාබුදුබව ම සාදගණියි. මධ්‍යම වියෑ ඇතහොත් පසේබුදුබව සාදගණියි. ලෝකයා හා සාධාරණවීයෑ අතහොත් ශ්‍රාවකබෝධිය සාදගණියි. එසේහෙයින් සාරිපුත්‍රස්ථවිරය, බුදුබව සියලු සත්ත්වයන් විසින් ප්‍රාර්ථනාකළ මනාමය. තුන්තොටක් ඇති ගඟ පිනන්නවුන් අතුරෙන් පාතකොට බලා ගොස් වැරද ගිය්හොත් තැගීයයුතු තැනක් නැතිබැවි දැන, ධීරපුරුෂ මුදුන්කතාට බලා පිහා පාත්වී නමුදු අනික් පාතතොටකින් වත් ගොඩකැඟී යන්නා සේ ඒකාන්තයෙන් ම බුදුබව පැතුවන්ට මේ තුන් බොධියෙන් එක් බොධියක් සිඩවන්නේ ම වෙයි. ඒ කාරණයෙන් අද මේ සියලු සත්ත්වයෝම මා දැක සතුටුව, මම ද බුදුවෙම්වයි කියා කරණලද ප්‍රාර්ථනාව ඔවුතොවුන්ට සාර්ථකවූ උතුම් ප්‍රාර්ථනාවෙක්මයයි වදුරා, එසේ බුබාදි ධීරපුරුෂයෝ දිව්‍යමනුෂ්‍යාදීන්ට ප්‍රියවන්නාහුව ඇති යන කාරණය ප්‍රකාශකොට මෙසේ ධර්මදේශනාකර වදළසේක.

යෙ ඛානපසුතා ධීරා, නෙකඛම්මුපසමෙ රතා,
දෙවා'පි තෙසං පිහයන්ති, සම්බුධානං සතීමතං-යි

මේ ධර්මදේශනාවගේ කෙළවර නිස්කෙළෙක් පමණ ප්‍රාණීහු අමාමහනිවන් දුටුවාහුය.

ඊට ඉක්බිතිව ධර්මාරූඪවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එහිම වැඩසිට, තමන්වහන්සේගේ ශාසනයෙහි සද්ධර්මානුශාසනා යෙහි පිළිපැදීමෙන් ඇතුළත්ව සිටි, කල්‍යාණ පෘථග්ජනයා පවින් දකුණත්සවු ප්‍රථම අග්‍රශ්‍රාවකයන්වහන්සේ දක්වා ක්‍රමක්‍රම යෙන් ගුණානුවණ වඩවඩා සිටි බුඞ්ශ්‍රාවකයන්ගේ විශෙෂගුණ ඇතිබවද, අන්‍යතීර්ථකයන්ගේ ගුණ ශූන්‍යබවද ප්‍රකාශ කොට දක්වා වදරණ පිණිස එසා පිරිසෙහි රැස්ව සිටි සියලු කල්‍යාණපෘථග්ජන බුහුශ්‍රැත පුද්ගලයන්ට විෂයවූ ගැඹුරු නොව වැටහෙන ප්‍රශ්නයක් පළමුකොට විවරා වදළසේක. ඒ ප්‍රශ්නය කල්‍යාණපෘථග්ජනයෝ විසදූහ. ඊට ඉක්බිතිව සියලු පෘථග්ජන ලෝකයාට අධිකතර ලෝකොත්තරගුණයෙහි පිහිටි ආර්‍යශ්‍රාවකයන් කෙරෙන් සෝවාන් පුද්ගලයන්ගේ ද, සකෘදාගාමි පුද්ගලයන්ගේ ද, අනාගාමිපුද්ගල යන්ගේ ද, රහත් පුද්ගලයන්ගේ ද, ත්‍රිවිද්‍යාවන් දන රහත්වූ පුද්ගලයන්ගේ ද, ෂඩභිඥවන් දන රහත්වූ පුද්ගලයන්ගේ ද, සිව් පිළිසිඹියාවන් දන රහත්වූ පුද්ගලයන්ගේ ද දෙවැනි අග්‍රශ්‍රාවකවූ වමත්සවු මුගලන්මහතෙරුන් වහන්සේගේ ද, ප්‍රථම අග්‍රශ්‍රාවකවූ දකුණත්සවු සැරියුත් මහතෙරුන් වහන්සේගේ ද යන මේ හැම බුදුසවිවන් ගේ ම ගුණ ඥන ප්‍රමාණය දන, බුදුරජ ඔවුනොවුන් අතින් විවාරා වදළ ප්‍රශ්නයන්, ඒ ඒ ශ්‍රාවකයෝ ම තමතමන්ට විෂයවූ පරිදිදෙන් විසදූහ. ඔවුනොවුන්ට වැඩිතරම්ව සිටි ශ්‍රාවක යෝ මෙස අඩුතරම් ශ්‍රාවකයෝ ඒ ඒ ප්‍රශ්න විසඳීමයට අසමර්ථ වූවාහුයි. එහෙයින් ඥානයෙන් අග්‍රවූ සැරියුත් සාමීන්ගෙන් විවාර, වදළ ප්‍රශ්නය තෝරා කියන්ට ඒ හැම ශ්‍රාවක දෙවිබඹ මිනිසුන් අතුරෙන් සමර්ථවූ අන්කිසිකෙනෙක් නැත. දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ම සියුම්කරයකින් ඇඹුලදණ්ඩක් කපන්නා සේ කොපැකිළ ම ඒ පැනය තෝරා වදළසේක.

නැවත බුදුහු බුඞ්ඥානය අතිගම්භීරබව හා මොහුගේ නුවණ ප්‍රසිඞ්ධ කෙරෙමිසි සිතා වදරා, බුදුකෙනෙකුන් මුත් අන්කිසිවක්හු විසිනුත් දනගත නොහැකි, අතිගම්භීරවූ ප්‍රශ්නයක් විවාරා වදළසේක. එවේලෙහි සැරියුත් මහතෙරුන් වහන්සේ බුඞ්විෂයවූ ඒ ප්‍රශ්නයෙහි අවිදනගත නොහී මුහුද පිනා ගොඞක් නොදන ඔහිමොඞ ඇවිදින වීරපුරුෂයෙකු සේ සඞ්ගීසාගරයට වැදී හළලා බලා නොයෙක් ලෙසින් කල්පනා කොට දනගත නුහුනුසේක.

එවිට මාගේ සවාමිදරුවෝ "හූතමිදං **සාරිපුත්ත සමනුපස්සාමි**" යනු වදුරා මෙසේ අකුරු සතරකින් කිසියම් නයක් දුන්සේක. එසේ නය දක්වා බුදුන් වදුළ බසවත් ඒ හැම පිරිසින් ඉඟියිනිය අන්කිසි කෙනෙක් නැත. මාගේ හිමිතුමන්වූ සැරියුත් මහ තෙරුන් වහන්සේ වදුළ නය වහා දැනගත, ඒ කාරණාමාත්‍රය කින් ම බැස, බුදුන් වදුළ ප්‍රශ්නයෙහි අවි දැක, එහි සිය දහස් ලක්ෂකෝටි ගණන් නය දක්වදක්වා, ප්‍රශ්නය තෝරා කියන්ට පවත්ගත්සේක.

එවේලෙහි අප භාග්‍යවතුන් වහන්සේ සැරියුත් සාමීන්ගේ ඒ ප්‍රශ්නව්‍යාකරණයෙන් අතිප්‍රසන්නව සාධු සාධු ශාරිපුත්‍රයයි වදුරා, තෝ ඉතා සූක්ෂම වූ නය දන්නා සූක්ෂමඥන ඇතියෙහිය. එහෙයින් බුදුන්ගේ අදහස් නොවරදවා ම මේ තෝ කියන්නෙහිය. මාගේ බුඩසුඥණයට අනුව පවත්නා මහත් ඥණසම්පත්තියක් ඇත්තෙහියයි යනාදීන් සැරියුත් සාමීන්ගේ ඥනමහත්තිය ප්‍රකාශකොට වදුරා, සතුතිකර වදුළ කල්හි, ඒ සැරියුත් මහ තෙරුන් වහන්සේ ද බුදුන් වැඳ දෙහොත් මුදුන්දී සිට, සැලකරණ සේක්, සවාමිවූ භාග්‍යවතුන් වහන්ස, කල්පයක් මුළුල්ලෙහි නොකඩව වස්නා වඩිවෙහිදු මෙපමණ දියබින්දු මහාසමුද්‍රයෙහි වැටුනාහුය. මෙපමණ දියබින්දු භූමියෙහි වැටුනාහුය. මෙපමණ දියබින්දු පළිතවල වැටුනාහුයයි, කියා ම සියලු වඩිජලය බින්දු වශයෙන් ගණන් ලක් තබා දක්වන්නට මම සමර්ථයෙමි' යි කියා තමින් වහන්සේගේ ප්‍රඥමහත්තිය ප්‍රකාශ කොට:—

ගඞ්ගාය වාලුකා යීයෙ, උදකං යීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා යීයෙ, ලකෙඛන මම බුඩියා—යි.

යනුයෙන් සියලු ගඞ්ගාවල වැලි ද, සතරමහාසාගරයෙහි ජලස්කඞ්ධයද, මහපොළොව පස්ද, යන මෙසා මහත් වස්තු පවා මාගේ නුවණට ලක් තබන්ට නොසැහෙන්නාහුය. ඒ හැම වස්තු ඉක්මවා මාගේ ප්‍රඥතොමෝ සිටිනියයි කියා ඥනගජිතා කිරි මෙන් බුදුරජානන් අභිමුඛයෙහි ම සිංහනාද කළ කල්හි; ප්‍රියපුත්‍ර යෙකුගේ සෞඳ සුරතල ප්‍රියබස් අසන පෙම්බර පියානකෙනෙකුන් සේ, සිංහනාද වචනය භාග්‍යවතුන් වහන්සේ අසා වදුරා, "එසේය ශාරිපුත්‍රස්ථවිරය, තාගේ සම්පජිභාවය එසේ ම මම දනිමි" යි වදුරා මේ ශාසනයෙහි සියලු ඥනවතුන් කෙරෙහි සැරියුත් මහතෙරුන් වහන්සේ ම අගතැන් පත්කොට වදුළ සේක. මෙම කිහ.

ලොකනාථං ඨපෙත්වාන, යෙ වඤ්ඤෙ අනීඝා පාණිනෝ,
පඤ්ඤාය සාරිපුත්තස්ස, කලං නාග්ඝන්ති සොළසිත්ති.

මෙසේ සකස්පුරදෙරදී සැරියුත්සාමින් ලවා ප්‍රශ්නවිස්සජ්ජනය කරවා, ඒ සැරියුත් මහාතෙරුන් වහන්සේ සතුණවන්නයන් කෙරෙහි අගතැන් පත්කොට වදුළ දවස්හි ම, මෛත්‍රෙය බෝසතාණන් වහන්සේ ද පැමිදිව, තැවත අප බුදුන් කෙරෙහුදු විවරණපතුල් ලත්සේක. ඒ කෙසේ ද? යත්:-

මේ භද්‍රකල්පයෙන් සොළසැසැංඛ්‍ය කල්පලක්ෂයකින් ඔබ්බෙහි බුදුවීමට නියත විවරණ ශ්‍රී ලැබුතැන් පටන් ලොව උපනුපන් බුදුවරයන් දැක, සියලු බුඩකාරකධර්මයන් පිරිමෙන් මෙම කප පස් වැනිව බුදුවන මෛත්‍රෙය බෝසතාණෝ මේ බුඩෙත්පාද කාල යෙහි ද දෙවිලොවින් චුතව අවුත්, සැවැත්නුවරට නිස්යොදුන් පමිණවූ සංඝස්සනම් නුවර මහත්භොග සම්පත් ඇති ශ්‍රී වඩින ගෘහපති මහාසාරයන්ගේ අගමෙහෙසුන් කුස ඉපිද, දසමස් ඇවැමෙන් බිහිව, මහත් ඉසුරුසැප පෙරහැරෙන් වැඩි සියලු ශිල්ප ඉගෙන, මවුපියදෙදෙනාගේ ඇවැමෙන් සියලු දයාදසම්පත් ලදින් මහපිරිවරින් වසනුවෝ අප බුදුරජාණන් වහන්සේ දෙවො රොහණයෙන් බැස, සංකස්ස නම් නගරවාරයෙහි වැඩසිට, සැරියුත්සාමින් බණවා විචාරා වදුළ ප්‍රශ්න තෝරා කිමෙන් සතුටුව, බුඩකාරක ධර්මයන් පිරිමෙන් මුත් බුදුවිය නොහැක්කසි දැන, ගෘහවාසය ශිඳ එහෙයින් පැවිදිවෙමියි සිතා, එදවස්ම, සඳුනි වගියා හා මහත් භොගස්කඛ්‍ය ගැර තමන්ගේ පිරිවර දහසක් පුරුෂයන් හා සමග පැවිදිව, ලබනලද උපසම්පදා ඇතිව, ත්‍රිපිටක බුඩවචනය ඉගෙන, නොයෙක් සියගණන් භික්ෂූන්ට බුඩවචන උගන්වා, වසනුවෝ දක්ෂිණා විභංග සූත්‍ර දෙශනා සමාගමයෙහි මහාප්‍රජාපති නම් දේවිය දුන් වස්ත්‍රයුගලයක් තමන් වහන්සේට වස්සාග්‍රයෙන් පැමිණිකල පිළිසඟළ ලැබගෙණ, ඉන් එකවස්ත්‍රයක් අප බුදුන්ගේ ගඤ්ඤකුටියෙහි වියන් කොට බැඳ, දෙවැනිවස්ත්‍රය කපා වියන කෙළවර පනතිකොට එල්වා පූජාකළ සේක. එකල්හි දැනානාශංඝ කොවිප්‍රජ්ජත අප භාග්‍යවතුන් වහන්සේ ඒ මෛත්‍රෙය බොධිසත්ත්ව භික්ෂූන් වහන්සේගේ අඛ්‍යා සය දැන වදුරා, භික්ෂුසඞ්ඝයා වහන්සේට අඩගා වදුරා මහණෙනී,

තෙපි වසත්‍යුගලයකින් බුබපුජාකළ ක්‍රමයෙන් මේ නිඝ්‍රහම බලව්. මෙතෙම අනාගතයෙහිවූ මේ මහාභද්‍රකල්පයෙහි ම මෛත්‍රෙය නම් බුදුවන්නේය. මෙම බරණැස්නුවර නම පෙරළි එකලට කෙතුමති නම් නුවරෙක් වෙයි යනාදින් අනාගතවංශ දෙශනාවෙහි ප්‍රභාශකොට වදාළ ක්‍රමයෙන් ම වදාරා, විවරණශ්‍රී ද්දවා වදාළසේක.

ඒ අසා උපන් ප්‍රීතිසොම්නසින් අනිප්‍රසන්නවූ, මෛත්‍රෙය බෝසතානන් වහන්සේ දෙවෙනි දවස් පැමිණිය යුක්තක් මෙන් සිතනුලබමින් වඩවඩා සතුටුසොම්නස්ව, කරණලද උත්සාහයෙන් බුඩිකාරක ධර්මයන් පරිනිෂ්පාදය කොට, දිව්‍යභෙළුවර තුසිතභවන යෙහි ඉපිද, එහි දිව්‍යමයවූ ආයු, වර්ණ, සැප, ආධිපත්‍යාදි දශ කාරණයකින් සෙසු දෙවියන් අභිභවා මහත් දිව්‍යඵෙශ්වර්‍ය්‍ය සම්පත් අද දක්වා ම විඳිනාසේක. ඒ බෝසතානෝ එහි දැන් දිවඉසුරු විඳිමින් වසනබව මේ මතු දක්වන කථාවෙහුදු අසා දනයුතු.

මෙම ලඞ්කාවිපයෙහි රුහුණුරට කාම්බෝජ නම් දනවිවෙහි මිලියදෙව ස්ථවිර නම් රහත්කෙනෙකුන් වහන්සේ නමක් වාසය කරණසේක. උන්වහන්සේ එක්දවසක් පෙරවරු හැඳපෙරව, පාත්‍රය අතින්ගෙණ, එම කාම්බෝජ නම් ගම පිඬු පිණිස වඩනා කල්හි එක්තරා පුරුෂයෙක් දැක පහන්සිතින් වැඳ, මහනෙල්මල් අටක් දින. තෙරුන්වහන්සේ ඒ ගෙණ සිතනසේක් මෙබදු වණී ගඞ්ධ සම්පන්නවූ මල් ගෙණ ගොස්, පිණ්ඩපාතකාලය සම්ප්‍රාප්ත වනතුරු නවිනිභාගවනයෙහි වූ වුළාමණී චෛත්‍යයෙහි පුදා වැඳ එමිසි සිතා, එකෙණෙහි අහසට නැඟි ඇසිල්ලකින් ගොස් වෛජයන්ත ප්‍රාසාදයාගේ අතිමුඛයෙහි අප බුදුන්ගේ කෙසධාතු හා දනතධාතූන් වහන්සේ වඩා, ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් කරණ ලද, සතරගව්වක් උස ඇති මාණික්‍යාමයවූ සිඵමිණිසෑ නම් දගොබට ඒ මහනෙල්මල් අට පුදා වැඳ, ප්‍රදක්ෂිණාකොට, එක් පාඤිවයෙන වැඩසිටිසේක. එකල්හි සක්දෙවිරජ එසේ වැඩසිටි මිලියදෙව මහ තෙරුන් වහන්සේ දැන සපිරිවරින් ගොස් වැඳ සිටියේය. එවිට තෙරුන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රය මෛත්‍රෙය බෝසතානෝ මේහි

එන්නාහු දැයි විමැලසේක. ඒ ඇසූ ශක්‍රදෙවෙන්ද්‍ර එසේය, සවාමි
මහන්ස, අද අටවක් දිනයෙහි එනසේක. හෙතෙම පඤ්ච
වෘතුද්දසී, පණ්ණරසී තුන්පොහොයෙහිදු මේ චෛත්‍යය වඳන
එනසේකැයි දැන්විය. එසේ දැන් එනසේකැයි කියමින් සිටියදී
මහපිරිවරින් යුත් එක් දිව්‍යපුත්‍රයෙක් ආයේය. ඒ දැක
මෛත්‍රෙය බෝසතාණෝ දැයි විමැරූ වදාළ කල්හි සක්දෙවිඳ
තැන සවාමීන් වහන්ස, මෙතෙම පෙර අනුරාධපුරවර සුවිසා
යෙන් ජීවත්වීමෙන් බොහෝ පින්කම් කළ තැනත්තවුයයි දැන්වී
තැවත අනික් දිව්‍යපුත්‍රයෙක් ද මහපිරිවරින් ආයේය. ඒ දැක
තෙරුන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රය මෙතෙම මෛත්‍රෙය බෝධිසත්ත්ව
දැයි විව ළසේක. එවිට සක්දෙවිරජ තැන සවාමිනි මෙතෙම පෙ
දුටුගැමුණුරජ මලණු වූ ශ්‍රඹාභය නම් රජ යයි දැන්විය. තැව
එක් දිව්‍යපුත්‍රයෙක් මහපිරිවරින් එනුයේ ඒ දැසා ද තෙරුන් වහ
සේ මහරජ මේ මෛත්‍රෙය බෝධිසත්ත්වයෝ දැයි විමැලසේක. එවි
සක්දෙවිරජ තැන සවාමිනි, මෙතෙම පෙර රත්නාවලි නම් අගදා
චෛත්‍යය කරවාලූ දුටුගැමුණුරජ යයි කිය.

මෙසේ කොයෙක් දිව්‍යපුත්‍රයෝ ඔවුනොවුන්ගේ ශරීරශෝ
වෙන් දසදික් බබුළුවා, මහපිරිස් පිරිවරා අවුත් සිළුමිණිසෑ වැ
ප්‍රදක්ෂිණා කොට සිටි කල්හි ඔවුන් හැමදෙනාට පසුව මහත් උද
තර දිව්‍යශ්‍රීශොභාවෙන් පුසිදිශොභාගය හොබවමින් එන දිව්
රාජයා දැක මලියදෙව් මහතෙරුන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රය,
කවරේ දැයි විමැරූ වදාළ කල්හි, සවාමින්වහන්ස, මේ මෛත්‍රෙ
බෝසතාණන් වහන්සේය' යි දන්වා ඔවුන් පිරිවරා එන දිව්‍යප්‍රජ
වන්ගේ ද ප්‍රවෘත්ති විමැලූ තැන ඔවුනුදු වෙන වෙන ම කළ කුස
මේ මේ යයි දැන්විය. එකල්හි මෛත්‍රෙය බෝසතාණෝ දසදි
බබුළුවමින්අවුත්, සිළුමිණිසෑය වැඳ, ප්‍රදක්ෂිණා කොට, මලියදෙ
මහතෙරුන් කරා පැමිණ වැඳ, එකත්පස්ව සිට සවාමින් වහන්
කොයින් මෙයට වැඩියේක් දැයි විමැලූහ. ඒ අසා තෙරුන් වහන්
මහරජ දඹදිවින් ආමිහයි වදාළසේක. එකල්හි බෝසතාණ
සවාමිනි කිමෙක් ද? දඹදිව මිනිස්සු මා ප්‍රාර්ථනා කෙරෙද්ද
විමැලූහ. එවිට තෙරුන් වහන්සේ එසේය; දෙවරජ හැමකල්හි
කුසල් කොට, මෛත්‍රෙය බුදුන්ගේ දැක්ම ම ප්‍රාර්ථනා කරන්නා
යයි වදාළසේක.

එබස් ඇසූ මෛත්‍රෙය බෝසතාණෝ කියන්නාහු, එසේ
කුශලයක් කොට සසරහයින් ඒත ව මා පතන්නාහු ද, ඔවුන් සි
හයින් මම ද මුදුලිය්‍යහෙම්බාහි කියා, මේ ආදී නොයෙක් කරු

මලියදෙව මහතෙරුන් වහන්සේට දන්වා, අවසරගෙණ මෛත්‍රෙය බෝසතානෝ තුසිපුර දෙවිලොවට ම යියාහ. තෙරුන් වහන්සේ ද මිනිස්ලොවට වැඩ එම කාම්බෝජ නම් ගමට පිඬු පිණිස වැඩ වඳුල සේක. එතැන් පටන් මෛත්‍රෙය බෝසතානන් තුසිපුර දෙවිලොව දිව්‍යසම්පත් විදිමින් වසන බව විශෙෂයෙන් මිනිස්ලොව ම ප්‍රකාශවිය.

මෙසේ මෛත්‍රෙය බෝසතානෝ, අප බුදුන්කරා පැමිණ පැවිදිව විවරණශ්‍රී ලාබ, දන් තුසිපුරෙහි වසනබව නොයෙක් බුදුගුණ සඞ්ගීකථාවන්හි සංග්‍රහකොට දක්වූ "මහාසම්පිණ්ඩි නිදානයෙහි" "තදුත්තරිඤ්ච ඛොපනස්ස භගවා අභියඤ්ඤ මෙනාය ඛ්‍යාකාසි තත්‍රඤ්ඤතරඤ්ඤ භික්ඛුං මහජ්ඣාසයං විදිත්වා භික්ඛුසඞ්ඝස්ස මජ්ඣෙ නිසින්නෙ භික්ඛුං ව්‍යාකරණං කරොන්තො: පඤ්ච තුම්හෙ භික්ඛවෙ, ඉමං භික්ඛුං වන්දිත්ථ තමෙන බුද්ධපූජා කතා අනාගතෙ කාලෙ ඉමස්මිං යෙව භද්දං කප්පෙ මෙත්තෙය්‍යො නාම සම්මා සම්බුද්ධො භවිස්සති" යනාදී ප්‍රකාශක්‍රමයෙන් බලා දතයුතු.

ලෝවැඩපිණිස කරණලද මේ ශ්‍රී සඞ්ඝීවවාද සංග්‍රහයෙහි මෙතෙකින් අප බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ගණ්ඩම්බ වෘක්ෂමූලයෙහි යමාමහපෙළහර දක්වා බුඛානුභාවයෙන් දෙවිලෝ වැඩ, ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහිඳ, තුන් මසක් මුළුල්ලෙහි කරණලද අභිධම්දෙශනාවෙන් දසදහසක් සක්වළින් රැස්වූ, අප්‍රමාණදිව්‍යබ්‍රහ්ම සෙනාවට අප්‍රමාණ අනුශාස කොට්‍රීමෙන්, මාතෘදිව්‍යපුත්‍රාදීන්ට වැඩසාදූ, බුඛානුභාවයෙන් හා දෙවානුභාවයෙන් නිර්මිත අප්‍රමාණ පූජාසත්කාර විදීමෙන් දසදහසක් සක්වළ සියලු සතුන්ටම බුදුසිරි දක්ව දක්වා, රූප විලාසයෙනුදු අප්‍රමාණ ලෝවැඩසාදූ දේවෝරෝහණයෙන් සකස් පුරදෙරට බැස එහි වැඩසිට ලෝකානුශාසනාකළ, ප්‍රවෘත්තිකථාව කියා නිමවනලදී.

මෙසේ ම සත්වානුකම්පා ඇති බුදුරජාණන් වහන්සේ තුරිතා තුරිත වාරිකාවශයෙන් දෙවිලොව ද, බඹලොව ද, මිනිස්ලොව ද, හැසිරීමෙන් දිව්‍යමනුෂ්‍යාදිවූ අප්‍රමාණ සත්ත ව අප්‍රමාණවූ සඞ්ඝීවානුශාසනා කළසේක. ඒ කෙසේ දැ? යත්.

තුරිත වාරිකාකිරීමෙන් සඞ්ඝානුග්‍රහකරණ අප භාග්‍යවතුන් වහන්සේ පැවිදිවෙස් ගෙණ තමන් වහන්සේ කරා එන මහාකාශ්‍යප සථවිරාදීන් නිසා ඇසිල්ලකින් තූන්ගව්ව්මග ගෙවා යාමේන්ද, අංගුලිමාල ආලවකාදීන් නිසා එසේ ම එසිය විසිගව්ව මගගෙවා යාමෙන් ද ධනියසථවිරාදීන් නිසා දෙදුස්අටසියයක්ගව්ව ද, වුලෝදරමහෝදරාදීන් නිසා අන්‍යවිපයෙහි ද, මහාබ්‍රහ්මලෝකයෙහි ද මාතෘදිව්‍ය පුත්‍රාදීන් නිසා දිව්‍යලෝකයෙහි ද, එඤ්ඤණයෙහි පෙණ්ඩියමෙන් ඔවුනොවුන්ට නොයෙක් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය හා ධම්දේශනාදිය කිරීමෙන් අප්‍රමාණවූ සත්ත්වයට වැඩ සාදා වදාළ බව තුරිතවාරිකා නම් වේ.

තවද අතුරිත වාරිකාවශයෙන් දනවු සැරිසරා වැඩ සඞ්ඝානුග්‍රහ කරණ බුදුරජාණන් වහන්සේ, දඹදිව අනොතාමණ්ඩලය, මඬ්‍යමණ්ඩලය, මහාමණ්ඩලය යන මණ්ඩලත්‍රයෙහි ගම්නියම්ගම් රාජධානි දනවු පිළිවෙළින් දවස යොදනක් අඩයොදනක් ප්‍රමාණ තැන් මග ගෙවා වැඩ, පිණ්ඩපාතවය්‍යාදිවශයෙන් ලොකසාරට අනුග්‍රහ කෙරෙමින් හැසුරුණු බව අතුරිතවාරිකා නම් වේ.

.. එසිත් නවසියයක් යොදුන් පමණවූ මහාමණ්ඩලයෙහි, යම් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැරිසරා වඩනාකැමැතිසේක්වී නම්, වජ්ජිස මැදිපොහෝලද මහාපවාරණදවස්හි පවරා, ඊට දෙවෙනි පැලඹිය දිනයෙහි මහ සඟපිරිවරින් නික්ම, වඩනට පටන් ගන්නාසේක. එකල්හි ඒ වඩනා තැනට වට හාත්පසින් සාර සියක් ගවුපමණ තැන, මනුෂ්‍යපිරිසින් ගහණව එක කොලාහල වෙයි. එසේ මහපිරිස් ගහණබැවින් පළමු පළමුව ම ආවාහුම, බුදුන් දැක සිත්සේ ආරාධනාකිරීමට අවකාශ ලබති. සෙසු මණ්ඩලදෙක්හි මනුෂ්‍යයෝ ද; අෂ්ටකප්‍රකාර පූජාසත්කාර ගෙණ, ඒ මහාමණ්ඩලයෙහි ම රැස්වන්නාහුය. එකල්හි බුදුරජාණන් වහන්සේ ඒ ඒ ගම්නියම්ගම්වල එක් දවසක් දෙදවසක් තුන් දවසක් බැගින් වැස ඒ මනුජයාගේ ආමිස පිළිගැන්මෙන් අනුකම්පාකොට ඒසා මහපිරිස් අදහස් බලා ඔවුන්ගේ චරිතලෙස ධම්දේශනා කිරීමෙන්, ඒ රැස්වන තාක් හැම සතුන්ට නිර්වාණගාමී කුසලධම්යන්ගේ වඩිනයකර වදාරා, නව මසකින් ඒ කොටිමණ්ඩලවාරිකාව නිමවා වඩනාසේක. ඉදින් ඇතැම් අවුරුද්දෙක වස් ඉටා විසූ තුන්මස ඇතුළත නිඝණ්ටුන්ගේ සමථවිදර්ශනාවෝ තරුණව, අධිගමය නොලද්දහු නම් යට කියනලද ක්‍රමයෙන් මහාපවාරණය දවස්හි පවාරණය නොකොට, පවාරණ සංඛ්‍යය දී ඉල්මස මැදිපොහෝ දිනයෙහි පවාරණය කොට, පැලඹිය දවස්හි මහාභික්ෂු සඞ්ඝයා

වහන්සේත් පිරිවරා නික්ම සැසියයක් යොදුන් පමණ වූ මධ්‍යමණ්ඩලයෙහි කියන්නාවූ ක්‍රමයෙන් යොදුන් සියක් එකෙණෙහාලාහල කෙරෙමින් සත්වයන්ට කුසලරාශි සංවර්ධනයෙන් වඩනට පටන් ගත්තා සේක. එකල්හි සෙසු මණ්ඩල දෙක්හි සිටියාවූ පූජා සත්කාර ද නොණ ඒ මධ්‍යමණ්ඩලයට රැස්වන්නාහුය. එසේ රැස්වූ මහජනයාට පළමුවූ පරිද්දෙන් ම අනුක්‍රමපා කිරීමෙන් කුසල වර්ධනය කොට ලෝවැඩ සාදා අවමසකින් ඒ මධ්‍යවර්ණාල වාරිකාව නිමිවා වඩහාසේක.

ඉදින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඇතැම් අවුරුද්දෙක දන් වනාලද ක්‍රමයෙන් එක් විෂ්කාරයෙක සාරමසක් ම වස්වසා විනෙය ජනයන්ට අනුශාසනා කිරීමෙනුදු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ මුනුකලාහු ඒ තම් ඔවුන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ මුනුකිරීම බලනාස්ක් එසේ ඔබ්බෙහි අන්‍යවූ ද එක්මාසක් හෝ දෙමසක් හෝ තුන්මසක් හෝ සාරමසක් හෝ එහි ම ව්‍යාඝයකරවදුරම්න් ඒ විනෙය පුද්ගලයන්ට වැඩ සාදා වදුරා ඊට ඉක්බිතිව මහඇත පිරිවරින් නික්ම තුන්සියයක් යොදුන් පමණ අන්‍යෝන්‍යමණ්ඩලයෙහි දනවූ සැරිසරා වඩනා සේක. ඒ වඩනා කාලට ද ඖත්පත්තිකව ගව සාරසියයක් පමණ තැන් එකතෙණෙහාලාහල ව රැස්වන මහපිරිස් සඩම්භානුශාසනා කිරීමෙන් නවත්ව නවත්වා, ඒ ඒ තන්හි දවසක් හෝ දෙතුන්දවසක් හෝ වැඩසිට, පිණ්ඩපාතවශයෝදි වශයෙන් සත්ත්වානුකම්පා කොට, ඔවුනොවුන්ගේ වරිත බලා සඩම්භවිත්‍ර වස්ව එස්වා, වඩිනට පටන් ගත් කල්හි ඉතරිව සිටි මහාමණ්ඩලය, මධ්‍යවර්ණාලය යන මණ්ඩල දෙක්හිදු පූජාසත්කාර ගෙණවුත් ඒ හැම බුදුන් වඩනා අන්‍යෝන්‍ය මණ්ඩලයෙහි ම රැස්වන්නාහුය. ඒ සියලු මහජනයාට මෙලෝ පරලෝ වැඩ දක්වා සඩම්භානුශාසනා පැවැත්වීම් ආදී වශයෙන් නිට්ඨාණගාමී කුසලමාගීය පාදා සත්වානුග්‍රහ කොට ලෝවැඩසා, සත් මසකින් හෝ සමසකින් හෝ පස්මසකින් හෝ සාරමසකින් හෝ අන්‍යෝන්‍යමණ්ඩල වාරිකාව නිමවා වඩහාසේක. මෙසේ මේ ත්‍රිවිධ මණ්ඩලයෙහි දනවූ සැරිසරා වඩනා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විවරාදි සම්කිසි ප්‍රත්‍යයලාභයක් පිණිස වඩහාසේක් නොවෙයි. අන්‍යවූ කෙනෙක් කාරණා හේතුකොට ගෙණ අන තනවූ බුදුවරයන් වහන්සේ ලෝවැඩ පිණිස ම වඩනසේක් මය. ඒ කෙසේද? යත්,

ඒ ජනපදවාසියෙහි වසන දුගී දුප්පත් ජනයෝ ද, බාල ලදරු වෝ ද, ජරාජීර්ණ මහලු සත්වයෝ ද, අනෙකප්‍රකාර ව්‍යාධිපීඩිත

සත්වයෝ ද යන මොවුහු කවර දවසෙක කෙසේ කම් අවුත් තථාගතවූ මා දක්නට සමර්ථවේද්ද, එහෙයින් මා දනවූ සැරිසරා ගිය කල්හි ඒ හැමදෙනා හා මහජන සමූහයෝ බවුනොවුන් සිත් සේ මා දැක වැඳපුදා බණ අසා ගැන්මෙහි අවකාශ ලබන්නාහුය. එහි සමහර කෙනෙක් සිත් පහදවා ගෙණ කුශලසහගත ප්‍රීතියෙන් කුසල් වඩාගන්නාහුය. සමහර කෙනෙක් මාලාදි අනෙකප්‍රකාර පූජා වස්තුවෙන් පුදන්නාහුය. සමහර කෙනෙක් බත් සැන්දක් පමණවත් භික්ෂාදානය දෙන්නාහුය. සමහර කෙනෙක් මිථ්‍යා දෘෂ්ටිය හැර සම්‍යක්දෘෂ්ටි වන්නාහුය. එසේ සියලු කුශල ධර්ම යන්හේ රැස්කිරීම ඔවුන්ට බොහෝ දීඝකාලයක ගිහ සැප පිණිස වන්නේයයි දැන වදාරා ලෝකසත්වයන් කෙරෙහි පතල මහාකරුණාවෙන් අප බුදුරජානන් වහන්සේ ද අනන්තාපරිමාණවූ බුදුවරයන්ගේ ප්‍රවේණි ධර්මය නො හැර දනවූ සැරිසරා වඩිමින් මෙසේ සත්වානුග්‍රහ කළසේක.

තවද, එපමණක් නොවෙයි. අන්‍යවූ ද චාරිකාවිහාරවශයෙන් ගමන්යාම හෙතුකොටගෙණ ශරීරඵාසුව පිණිස ද, අත්‍යොත්පත්තිකාරණ කල් බලන පිණිස ද, භික්ෂූන්ට ශික්ෂාපද පණවන පිණිස ද, ඒ ඒ තන්හි වසන්නාවූ ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, ස්මෘති, සමාධි, ප්‍රඥ යන පඤ්චේන්ද්‍රියයන්ගේ වැඩීමෙන් පින් මෝරා ගිවි විනෙයජනයන්ට චතුස්සත්‍යාවබෝධය පිණිස ද යන කාරණා සතරක් හෙතුකොටගෙණ සියලු බුදුවරයෝ ම දනවූ සැරිසරා වඩනාහුය. තවද, එසේ ඇති කල්හි ඒ ඒ ජනපදදෙසෙහි වසන සත්වයෝ බුත්සරණ යන්නාහුයයි කියා ද, දහම්සරණ යන්නාහුයයි කියා ද, මහත් ධර්මානුශාසනා වශීයෙන් සිවුවණක් පිරිස් සතපිණිස කෙරෙමියි කියා ද යන මේ කාරණා සතරකින් හා තවද ඒ ඒ තන්හි වසන සත්වයෝ පාණාතිපාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මෘෂාවාද, සුරාපාන යන අකුශලයන්ගෙන් දුරුවන්නාහුයයි කියා ද යන මේ කාරණයන් හා තවද එසේ ම ඒ ඒ සත්වයෝ සුගතොවාද උපදෙශ ලදින් ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාශානඤ්චායතනධ්‍යානය, විඤ්ඤාණඤ්චායතනධ්‍යානය, ආකිඤ්ඤ

සඤ්ඤගතඤාණය, කෙවසඤ්ඤ නාසඤ්ඤගතඤාණය යන මේ අෂ්ටසමාපත්තිලාභී වන්නාහුගයි කියාද යන මේ කරුණු අවිකින් හා තවද සෝවාන් මාර්ගය, සොවාන් ඵලය, සකෘදගාමී මාර්ගය, සකෘදගාම් ඵලය, අනාගාමී මාර්ගය, අනාගාමී ඵලය, අර්හත් මාර්ගඵලය, යන මේ සතරවැනි සතරඵලයට සත්වයෝ පැමිණෙන්නාහුගයි කියාද, යන කාරණා අවකින් හා මෙසේ මෙසේවූ නොයෙක් කාරණා හෙතුකොටගෙන සියලු බුදු වරයන්ගේ බුදුසිරිත්ලෙස දනවු සැරිසරා ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් අවුරුදුපතා වඩිමින් ලොකානුග්‍රහකා කොට බුදුව වැඩහුන් පන්සාළිස් අවුරුද්ද මූළුල්ලෙහි මාගේ සවාමිදරුවූ බුදු රජානන්වහන්සේද මෙසේ සත්වානුග්‍රහකලශේක.

මෙසේ ලෝවැඩ කිරීමෙන් බුදුවවැඩවුන් පන්සාළිස් හවුරුද්දෙන් පළමුවන හවුරුදු බරණැස්නුවර ඉසිපතනාරාමයෙහි වස් වැස, දෙවක, තුන්වන, සතරවන හවුරුදු පිළිවෙළින් රජගහනුවර, වෙළුවනාරාමයෙහි වස්වැස, පස්වනහවුරුදු වෛශාලීමහනුවරකූටා ගාරශාලාවෙහි වස්වැස, සවකහවුරුදු මංකුලපර්වතයෙහි වස්වැස, සත්වනහවුරුදු සක්දෙවි රජහුගේ තව්තිසා දෙවිලොවෙහි පණ්ඩුකම්බලශෛලාසනයෙහි වස්වැස, අවවනහවුරුදු සුංසුමාරගිරි නම් පර්වතයෙහි වස්වැස නවවන හවුරුදු කොසඹෑනුවර ඝෝසිතාරාමයෙහි වස්වැස, දසවන හවුරුදු පාරිලෙය්‍යවනයෙහි පාරිලෙය්‍ය නම් හස්තිහුගෙන් උපස්ථාන ලදින් සල්රුක් මූල ගල්අස්නෙක වස්වැස, එකොළොස්වන හවුරුදු කාලාගම බඹුණුගම කාලකාරාමයෙහි වස්වැස දෙළොස්වන හවුරුදු වෙරඤ්ජානම් බඹුණුගමෙහිද වස්වැස, තෙළෙස්වන හවුරුදු වාලි නම්, පර්වතයෙහි දෙවියන්ගේ ආරාධනාවෙන් වස්වැස, තුදුස්වන හවුරුදු දෙවිරම්වෙහෙර වස්වැස, පසළොස්වන හවුරුදු කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි මිණිඟුහාසනෙක වස්වැස, සොළොස්වනහවුරුදු අලවිනුවර වස්වැස, සතළොස්වනහවුරුදු රජගහනුවර වෙළුවනාරාමයෙහි වස්වැස, අටළොස්වන වස වාලිගනම් පර්වතයෙහිම වස්වැස, පිටපිට දහනව හවුරුද්දක් දෙවිරම්වෙහෙර වස්වැස, එසේම පිළිවෙළින් සාවුරුද්දක් විසාඛාවන්ගේ පූර්වාරාමයෙහි මිගාරමාතුනම් ප්‍රාසාදයෙහි වස්වැස, අනික් තුන්හවුරුද්දෙහි අනිබබවාසව ඒ බුදුව වැඩහුන් පන්සාළිස් හවුරුද්ද ඇතුළත යටකී පරිද්දෙන් දවස දවස එකෙක, දෙකෙක, දසයෙක, සියයෙක, දහසයෙක, ලක්ෂයෙක, ඝනාදී වශයෙන් ණොයෙක්වර නොයෙක් දෙගනාවෙන් සතරින්

ඛොඛඤ්ඤ සත්ත්වයන් හැර සුමතඹාලාකාර සමාගමාදිවූ සුවිසි සම්ඉගමයෙහි සුවිසිතෙනෙක වැඩහිඳ, සුවිසිවාරයෙක වදළ වූ සුවිසිඩම් දෙසඋාවෙකින් සුවිසිඅසංඛ්‍යයක් සත්වයන් සෝවාන් කොට සුවිසි අසංඛ්‍යයක් සත්වයන් සකෘදාගාමිකොට සුවිසි අසංඛ්‍යයන් සත්වයන් අනාගාමිකොට සුවිසි අසංඛ්‍යයක් සත්ව යන් රහත්කොට අමාමහ නිවන් දක්වා ලෝවැඩ සාදු ඝාඋාකාවූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පෑමට දසමාසයක් පමණ කල් ඉතිරිව තිබැද්දි ඔට කියකලද ක්‍රමයෙන් අනිවඩිවාඋවූ අනතිම තුන්හවුරුද්ද අතුරෙන් කෙළවර පන්සාළිස්වනි වස ම්සාලා මහනුවර සම්පයෙහිවූ බෙළුවගමට වැඩ වස්වසනඋාලය ඇමිප බැවින් භික්ෂුසඛ්‍යයා කැඳවා එහි සෙනෙසුන් ඛොඋාඉෙහා හෙයින් හා භික්ෂාව දුලිහ හෙයින් මේ භික්ෂූන්ට සැපපහසු තැන් බලා වස් විසීමට තෙපි යව් කියා අවසර දුනහොත් දුරුකතරතැනි ඇමෙන් එ හැම මාගේ පිරිනිවන් පෑම නොදැක අප බුදුරජ අහෝ අපව් පිරිනිවන් පෑනාඛව ඛොදුන්වූසේකැයි සිතා මහත් විපිළිසර වන්නාහුය.

සම්පතැන්වල වස්වසා විසීමෙන් මාඋයකට අවවරක් බැහින් මා දක්නට අවුත් බණ අසා සුගතොවාද ලබන්නාහුය. ඇත ඛොඉෙක් කාරණ බුදුඇසින්ම දැක වඳුරා මහණෙනි, තෙපි හැම මේ විඋාලාමහනුවරම වස්වසව්. මම්ද මෙහිම වස්වසඉිසි නියමකොට වදුරා එම බෙළුවගම්හිවූ විහාරයෙහි අප හ.ගාඋවතුන්වහන්සේ වස් වසා මාඋය කරණකල ක්‍රැරවූ මාරණාන්තික තද ආඛාධයක් උපන. එවිට සිහිය මනාඋකොට සිහිවුවා නුවණින් පිරිසිඳ දැක වදුරඉින් වෙඉෙසීමක් හෙව වෙදනානුවත් වඉෙයන් ඔබ මොඛ ඛොඋෙපරළී නිදුක්ව සමාධිබලඉෙයන් ඒ රොඉවෙදනා ඉවසනසේක්, මේ ලෝක යෙහි බලසම්පන්න පුරුෂයෙක් යම්සේ පොකුණකට බැස හස්ත පාදප්‍රහාරයෙන් මතාකොට දුරුකරණ ලද දියඉෙවල් විරකාල ඉෙන් එක්වීම වේද එසේම සමාධිබලඉෙයන් මැඩපවත්වා දුරුකළ දුඛවෙදනාවන් නැවත දඉම්ය්ක් හැර ඉපදීම ධර්මතාවක් ඛැවින් ඒ රෝගඋද ඒඋාක්කල් ඛොඉපද ජීවිතසංස්කාරය පවත්නාසේ අධිෂ්ඨානකොට බුදුවනදු බෝමැඩදී අභිනව විදර්ශනාව තැබීම සේ මහා විපස්සනා වඉෙයන් වේදනාව මැඩපවත්වා සමාපත්ති සම වැදීමෙන් මේසේ ඒ ආඛාධය උපසාඋකාඉන්ව ඛොදන්වා ඉවස වදළසේක.

ඉක්බිති ඒ භොභික්ෂුසඛ්‍යයා වහන්සේත් පිරිවරා අනුක්‍රමයෙන් ගැවැත්තුවර ජෙතවනාරාමඋම වැඩිසේක. බුදුරජාණන්වහන්

සේගේ පිරිනිවන්පෑමට පළමුවෙන් අහුශ්‍රාවක දෙදෙනා වහන්සේ ගේ පිරිනිවන්පෑම හැම බුදුවරයන්ගේ කාලයෙහිම නියත ධම්‍ම තාවකින්ම වන බැවින් එසේම දෙවිරමට පැමිණ බුදුන් වැඩවසන කල තමන් වහන්සේගේ පිරිනිවන්පෑම සහියකින්ම වන්නේයයි දැන අඩසර ඉල්වූ සැරියුත් මහතෙරුන්වහන්සේට නාලකතම් ගම උපන්ගෙයිදී පිරිනිවන්පෑමට අවසරදී වදාරා, නැවත වුඳතෙ රුන්වහන්සේ විසින් සැරියුත්සාමින්ගේ ආදහනකෘත්‍යය නිමිම, ධාතුගෙණවූත් භාග්‍යවතුන්වහන්සේට දක්ෂිණ කල්හි ශ්‍රීහස්තයෙන් ඒ ධාතු ගෙණ තෙරුන්වහන්සේගේ ගුණ ගාථා පන්සියයකින් වදාරා ජේතවනාරාමයෙහි ඒ ධාතූන්ගෙන් චෛත්‍යකරවා නැවත රජ ගහනුවර වඩනා පිණිස අනඳසාමින් ලවා භික්ෂුසංඝයා රැස්කරවා ඒ මහාසඟපිරිවරින් රජගහනුවරට වැඩ මහජනයාට සඩම් දෙශනා කිරීමෙන් ලෝවැඩ වඩා වසන සේක් මුගලන්මහතෙරුන් වහන්සේට කළුගල්ලෙනදී පිරිනිවන්පෑමවද අවසරදී ඉක්බිති ඒ ධාතූන්ගෙණ චෛත්‍යය කරවා, මහා භික්ෂුසංඝයාවහන්සේ හා සමග රජගහනුවරින් නික්ම, අනුක්‍රමයෙන් ගංගාහිමුහුණ උරු ව ලාවට වැඩ ඒ ගංගානිරයෙහි භික්ෂුසංඝයා පිරිවරා වැඩහිඳ, සැරි යුත් මුගලන් දෙදෙනාවහන්සේගේ පරිනිර්වාණය ප්‍රතිසංයුක්තවූ ධම්දෙශනාකොට එසින් නික්ම මහාභික්ෂුසඞ්ඝයාවහන්සේත් පිරි වරා කැවතද විසාලාමහනුවරටම වැඩිසේක.

එහි භාග්‍යවතුන්වහන්සේද විසාලාමහනුවර පෙරවරු පිඬු පිණිසවැඩ පස්වරු භාගයෙහි නැවත වඩනාසේක් ආනන්ද සථවිර යන් ලවා වැඩහිඳින පත්කඩ ගෙන්වාගෙණ වාපාලචෛත්‍යනම් විහාරයටවැඩ එහි පණවනලද බුඩාසනමණ්ඩලයෙහි වැඩහිඳ එකත් පස්ව හුන් ආනඳමහ තෙරුන්වහන්සේට අඩගා වදාරා ආනන්දය, විසාලාමහනුවර ඉතා රමණීයය. එහි පිහිටි උදෙනිචෛත්‍ය නම් විහාරයද, ගෞතමචෛත්‍යය නම් විහාරයද, සත්තම්බක චෛත්‍යය නම් විහාරයද, බහු පුත්තකචෛත්‍ය නම් විහාරයද යනාදි විහාරයෝත් ඉතා රමණීය වන්නාහ. ආනන්දය යම්කිසිවෙක් විසින් සතරඍඞ්ඉපාදයෝ භාවිතා කිරීමෙන් වඩා ලද්දාහුද, නැවත නැව ත කිරීම් වශයෙන් බොහෝකොට කරණලද්දාහුද, යුක්ත සථාන යක් මෙන් සිතා ඒ සතර ඍඞ්ඉපාදයෝ භාවිතාකරණ ලද්දාහුද, පිහිටවන අඩියෙන් උතුම් වස්තුවක් මෙන් අධිෂ්ඨිත වශයෙන්

භාත්පසින් පුරුදු කිරීමෙන් මනාකොට පවත්ගන්නා ලද ඒයම්යෙන් එම සතරඍද්ධිපාදයෝ යහපත්ව වඩා පුරුදුකරණ ලද්දාහුද, හෙතෙම කැමැත්තේවිනම් ඒ ඒ කලට නියමවූ ආයුෂ්කල්පය මුළුල්ලෙහි හෝ, ශෙෂයක් හෝ සිටින්නේය. ආනන්දය තථාගත යන් විසින් ඒ සතරඍද්ධිපාදයෝ එසේ භාවිතාකරණලද්දාහුය. ඒ තථාගතතෙම කැමැත්තේවිනම් ආයුෂ්කල්පය මුළුල්ලෙහි හෝ ඉන්ශෙෂයක් හෝ සිටිනාසේකැයි වදළසේක.

මෙසේ බුදුරජානන්වහන්සේ වාපාලවෛත්‍යය නම් විහාරයෙහි වැඩහිඳ ආයුසංස්කාරයාගේ හැරීම පිණිස මහත් ඔෞදාරිකනිමිත්ති, ඔභාසකථාවන් අනදමහතෙරෙන්වහන්සේට දන්වා වදළ කල්හි, උන්වහන්සේ එවිට පවිටුවූ මාරාවෙශ ඝිත් ඇතිබැවින් ඉන්නිසිවක් නොදත්සේක. දෙවන තුන්වෙනුවට ද බුදුරජ එසේ ඔභාසකථාවන් පවත්වා වදළකල්හි, මෙකලට නිසි වූ ආයුෂ්කල්පය මුළුල්ලෙහි වැඩ සිටීම පිණිස යාචඤ්ඤාකරන්ට අනදමහතෙරුන්වහන්සේ නොදත් සේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුදුරුතැන එක් රුක්මූලකට දිවාවිහාර පිණිස යවා, එකලාව වැඩවුන්කල්හි පවිටුවූ මාරදෙවිපුත් අපභාග්‍යවතුන් වහන්සේ කරා අවුත් එකත්පස්ව සිට දන්වනුයේ භාග්‍යවතුන්වහන්ස, පිරිනිවන් පෑවදැළමැනව. ඔබවහන්සේගේ අභිසම්බොධියෙහි පවත් අවවැනි සඝියෙහි අජපාල නම් නුගරුකමූල වැඩහුන් තැනට ගොස් සවාමිවූ භාග්‍යවතුන්වහන්සේ යම්තක් පිණිස පාරම්ධම් පුරණ ලද්දාහුද ඒකාරණයට පැමිණෙන ලද්දේය. සම්ඵුනාඤ්ඤය ප්‍රතිවෙධය කරණලද්දේය. ලෝක පිවාරණයෙන් ඔබවහන්සේට දැන් ප්‍රයෝජන කවරේද? එහෙයින් භාග්‍යවතුන්වහන්සේ දැන් පිරිනිවන් පෑ වදරණසේක්වයි කියා මම ආරාධනාකෙරෙමි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ වචනය මට වදාරණලදී. ඒ කෙසේදැයි පවිටු මාරය, යම්තාක්කලකින් මාගේ ශ්‍රාවකවූ භික්ඛුභික්ඛුණී උපාසක උපාසිකා යන සිවුවණක්පිරිස්හුම මේ ශාසනයෙහි මාගීවශයෙන් ව්‍යක්තවෙත්ද, එසේ මාගීවශයෙන් මනාකොට භික්මෙත්ද, දඤ්ඤවෙත්ද, පිටකතුය වශයෙන් බහුශ්‍රැතවෙත්ද, එසේම ධම්ධරවෙත්ද, නොගොත් පඨාපත්ති ප්‍රතිවෙධ බහුශ්‍රැතවීමෙන් එම ධම් දෙදෙනාගේ දැරීමෙන් ධම්ධර වෙද්ද, ආඝාධම්මයට අනුධම්වූ විදර්ශනාභාවනා මාගීය පිළිපැදීමෙන් ධම්ානුධම්පිළිවෙත්හි යෙදෙද්ද, සුදුසු පිළිවෙත්හි හැසිරීමෙන් සාමීචිප්‍රතිපදයෙහි යෙදෙද්ද, අනුධම්චාරිව

ධර්ම්ය අනුව හැසිරෙණ සවභාව ඇතිවෙද්ද, ආවාර්ය්වාද. ඉශෙන අනුන්ට දක්වන්නාහුවෙද්ද, උපන් ශම්කිසි පරප්පවාදයක් හේතු සහිතවූ කාරණා සහිතවූ වචනයෙන් සුතිග්‍රහීතයට නිග්‍රහකොට නිර්වාණමාගිය දක්වා ධර්ම්ය දෙශනාකෙරෙද්ද, ත්‍රිවිධශික්ෂා කැමැති ශාසනබ්‍රහ්මචර්‍ය්‍යාව ධ්‍යානසවාදවශයෙන් වෘද්ධියට පැමිණේ ද, අභිඥාසමාපත්තිවශයෙන් සම්ඵාලිපුල්ලභියට මහත්බවට පැමිණේද, ඒ ඒ දිශාභාගයෙහි පිහිටීම්වශයෙන් ශාසනය විස්තර වේද බාහුජඤ්ඤතාම් ලද මහජනයාගේ අභිසමය වශයෙන් බොහෝසත්වයන් විසින් නිර්වාණධර්ම්ය ප්‍රතිවෙධකරණලදද, සම්භාරවශයෙන් යම්කලෙක විස්තීර්ණබවට පැමිණෙනලදද, දෙවිමිනිසුන් කෙරෙහි ප්‍රසිද්ධවූ යම්පමණක් ලෝකයෙහි සුවණ්ණති දිව්‍ය මනුෂ්‍යාදීහු ඇත්තාහුද, ඒ සියල්ලන් විසින් ඉතා මැනවැයි ප්‍රශංසා කරණලදද, එසේ මාගේ බුද්ධශාසනය වර්ධනයවූ කල්හි මම පිරිනිවන් පානෙම්යි මට වදුලසේක. එ සිවුවණක් පිරිස්හුම දන් එසේවූ ව්‍යක්තතාදි එ සියලු ගුණසම්පන්නව ඔබවහන්සේගේ ශාසනය විසාරවිය, එබැවින් දන් පිරිනිවන් පෑවදැළ මැනවයි දන්විය.

මෙසේ මාරදෙවිපුත් දන්වූ කල්හි භාග්‍යවතුන්වහන්සේ තමන් වහන්සේගේ අනාවරණවූ බුද්ඥානයෙනුදු එ මාරදෙවිපුත් කිලෙසම ශාසනය විස්තාරවූබව දන වදරා, එම්බල මාරය තෝ උත්සාහ නොකරව. නොබෝකලකින් තථාගතයන්ගේ පිරිනිවන් පෑම වන්නේයැයි වදුලසේක. එවිට වශවර්ති මාරතෙම ලද ලාභ යක්මෙන් ඉතාසතුටුව එහිම අන්තර්ධානව ගියේය.

මෙසේ අප බුදුරජාණන්වහන්සේ වාපාල චෛත්‍යතම් විහාරයෙදී සිහිනුවණින් යෙදී වදරා ආයුසංස්කාරය හැර නිම්යාවූ ක්ෂණයෙහිම දියපොළව අවසන්කොට ඇති මේ මහා පෘථිවිතාමෝ කම්පාව්ය. එකල්හි ආයුෂ්මත් අනදමහතෙරුන් වහන්සේ භාග්‍යවතුන්වහන්සේ කරා ගොස් වැඳ එකත්පස්ව මෑත් සවාමිදරුවූ බුදුරජාණන්වහන්ස, දන් මේ භයානකවූ පෘථිවිකම්පාවට කාරණ කවරේ ද? එ මට වදුලමැනවැයි ආරාධනාකළකල්හි බුදුරජාණන් වහන්සේ ආනන්දය, මේ මහපාථිවිය දියපොළොවෙහි පිහිටියේය. දියපොළොව වාපොළොවෙහි පිහිටියේය. ශම්කලෙක වාපොළොව කම්පාවිනම් දිය පොළොව හා මේ පස් පොළොවද කම්පාවෙයි. මෙසේ ධාතු ක්ෂොභවශයෙන්ද පින්වතුන්ගේ සාඛ්‍යානුභාවයෙන්ද කම්පාවෙයි. තවද මහබෝසතාහුන්ගේ මවුකුස ඉපදී මෙහිද, එසින් නික්මීමෙහිද පුණ්‍යතෙජසින් කම්පාවෙයි. බුදු

විමෙහි ඥානතෙජසින් කම්පාවෙයි. මඛාදධම්දෙශ්‍රයෙහි සාධු කාරදානවශයෙන් කම්පාවෙයි. ආයුසංස්කාරය හැරීමෙහි තථාගත චිත්තය හැකිලීමෙහි ඉවසා ගත නොහී කරුණාසවභාවශයෙන් කම්පාවෙයි. පිරිනිවන් පෑමෙහි හැකිවීමවශයෙන් කම්පාවෙයි. මේ ආනන්දය අවකාශණයකින් පොළොව කම්පාවීම වන්නේයැයි මෙසේ කාරණා නියමකොට දක්වා වදාළ කල්හි එපමණකින් ආයුස්මත් අනඳමහතෙරුන්වහන්සේ මේ ශාසනාවූ බුදු-ජානන් වහන්සේගේ ආයුසංස්කාරය හැරීමනොදැන, මහත්වූ කම්පාවීමට පැමිණි සිත් ඇතිව මාගේ සවාමිදරුවූ භාග්‍යවතුන්වහන්සේ දෙවිමිනිසුන් සහිත සියලු සත්වලෝකයාට හිත පිණිස, සැප පිණිස වෑඩ පිණිස ලොකානුකම්පාවෙන් ආයුෂ්කල්පය මුළුල්ලෙහි ම ජීවත්ව සිටි වදාළ මැනවැයි යනාදීන් ආරාධනා කළ කල්හි බුදුරජ වදාරණසේක් ආනන්දය, දැන් එසේ තථාගතයන්වහන්සේට නිසි කාලය නොවේ. මා විසින් ඒ ආයුසංස්කාරයාගේ හැරීම අරහයා මහත් නිමිත්තොත්හාස මහාඋත්පාවන් පාවැත්වූ කලහි ඒ කාරණය දැන ගත්තෙහි තුෂ්ණීම්භූතව ප්‍රමාදවූයෙහිය. එහෙයින් ආනන්දය මේ තොප කෙරෙහි පැවති වැරදීම යයි වදාළසේක.

ඒ ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ එසේම දෙවනතුන් වතාවද "භණෙන භගවා කප්පං ඨපේතු තිට්ඨතු" යනාදීන් ආරාධනාකළකල්හි බුදුරජාණන්වහන්සේ, නැවත නැවතත් පලමුකොට වදාළලෙසම ආනන්දසථවිරයන්ට දන්වූසේක. එවිට විශෙෂවූ සල්ලක්ෂණින් හෘදයවස්තුව ප්‍රදෙශයෙහි විදිමින් වෙතෙසට පත් සත්තියෙකු මෙන් සිහිවිලාව ඇසිවක්වත් කියා ගතනොහී අනඳමහතෙරුන්වහන්සේ තුෂ්ණීම්භූතවූසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔවුකොවුන් අස්වැසීමෙන් වදාරණසේක් ආනන්දය "සබ්බෙහෙවපියෙහිමනාපෙහිනානාභාවොවිනාභාවොවා" යනුවෙන් ලෝකයෙහි සියලුම ප්‍රියමනාප වස්තූන්කෙරෙන් අවශ්‍යන්යේ වෙන්වීම මරණයට පැමිණීම සවභාවකොට ඇත්තේයැයි කියා, මේ කාරණා මා විසින් පලමුකොට කිසිලදුහු නොවෙත්ද, එහෙයින් ලෙව් හැම සංස්කාරයන් අතුරෙන් එකසුවරූපයෙන් පවත්නා එකද වස්තුවක්නම් නැත. එසේ එකසුවරූපයෙන් සිටිනා ගම් ඒ කාරණයෙක් සෙයි කොහින ලැබේද, තවද ආනන්දය ප්‍රථමසම්‍යක්සම්බුධියෙහි පවත් අවැනි සත්මයෙහි මාදෙව්පුත් මාරයා අදුන් පිරිනිවන්පෑවදැයි මැනවයි දන්වූ කල්හි, මාගේ ශ්‍රාවකවූ සිවුවණක්පිරිස්හුම සියලු බුඩධම්මයෙහි සම්මවූ ත්‍රිවිධ

ශිෂ්‍යාශාසනය විසඳාර වූ කල පිරිනිවන් පානෙමියි කියා මා විසින් පළමුකොට අප්පාල නම් නුගරුක මුලදීම ආයුසංස්කාරය හරණ ලද බැවින් මාර දිව්‍යපුත්‍රද මාගේ සිවුවණක් පිරිස් විමසා බලා බුදු සිසින් බැලූ කල එසේම දක්මි. හැම බුදුවරයන්ගේ සිරිත් ලෙස මමද දැන් පිරිනිවන්පෑමට නිසිවූ ආයුෂයාගේ පස්වැනි කොටසයට පැමිණ සිටිනෙමි. එහෙයින් මේ පිරිනිවන් පෑමට නිසි කාලයයි දැන, සිහිනුවණින් යෙදීම ආයුසංස්කාරය හරණ ලද්දෙමි. එසේ තථාගතයන් වහන්සේ විසින් හරණලද දෙයක් නැවත නො ගන්නා බවය. එසේවූ දෙයක් වෙහි නැත යන කාරණය ආනන්දයන තෙපි නොදන්නහුදූයි, යනාදීන් ශොකසල්ලය උපුටා වදාරා,

නවම්මස මැදිපොහෝදිනයෙහි මෙයින් තුන්මසක් ගියකල පිරිනිවන් පානෙමියි කියා වාපාලචෛත්‍යයෙහිදී මෙසේ සිහි නුවණින් යෙදී, දසදහසක් සක්වළ මහපොළෝ කම්පාකිරීමෙන් ආයුසංස්කාරය හැර එයින් නික්ම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් සමග මහාවන කූටාගාර ශාලාවට වැඩ එහි උපස්ථාන ශාලාවෙහි විශාලාමහනුවර වසනාතාක් සියලු භික්ෂූන් රැස්කරවා පණවන ලද බුඩාසන මස්තකයෙහි වැඩහිඳ, භික්ෂුසඞ්ඝයා වහන්සේට අඩගා වදාරා "හෙතදවෝ භික්ඛවෙ ආමන්තයාමි වො, භික්ඛවෙ වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ. න චිරසෙව තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති" යනාදීන් මහණෙනි, සියලු සංස්කාරයෝම නස්නා සුභාව ඇත්තාහ. එහෙයින් තෙපි අප්‍රමාදවව්. මෙයින් තුන්මසක් ගියකල තථාගත පරිනිර්වාණය වන්නේයයි වදාළසේක.

එකල්හි එහි රැස්වූනාක් පෘථග්ජන භික්ෂූන්වහන්සේලා කඳුලුධාරාවන් දරාගත නොහී හඬන්ට වන්හ. රහත්ව සිටි ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා වනාහි ධර්මසංවේගයට පැමිණියාහුය. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙණ විසාලාමහනුවරට වැඩ භික්ෂාචාරය කොට වළඳා වදාරා ඉක්බිති සවස් වේලෙහි නුවරින් නික්ම වඩනාසේක් ඒ විසාලාමහනුවර බලමිසි සිතා වදාළසේක. ඒක්ෂණයෙහි මහාපෘථිවිය කුඹුල්සකස් සේ බුඩානුභාවයෙන් කැරකැවී විසාලාමහනුවර බුදුන්ට අභිමුඛව සිටගත. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එසේම වැඩසිට නාගාපලොකන වශයෙන් බලාවදාරා ආනන්ද ස්ථවිරයන්ට අඩගාවදාරමින් ආනන්දය, මාගේ මේ විසාලාමහනුවර පශ්චිම දර්ශනය වේ. මෙයින් ඔබ්බෙහි තථාගත බැල්මක් නොවන්නේයයි වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේ කුමක් නිසා මෙසේ විසාලාමහනුවර බලාවදුළසේක්ද? යත්; එනුවර වාසි සියලු ලිච්ඡවී රජදරුවන්ගේ ඒකාභාසයද, තුන්ගවුරුද්දකින් වනගෙඩින් එසේ ආසන්න මරණයට පැමිණි ඔවුන්කෙරෙහිපතළ මහාකරුණාවෙන් ඒ බලා වදුළ තැනම නාගාපලොකිතතම් වෛත්‍යයක් කොට, සුවඳ මාලාදින් පූජාකෙරෙති. - එසේ පිදීම ඔවුන්ට බොහෝ දීර්ඝ කාලයකට හිත සැප පිණිස වන්නේයඩිද, දැනවදුරා අනුකම්පාවෙන් එසේ නාගාප ලොකිතයකළසේකැයි දතයුතු.

මෙහි නාගාපලොකිතයතම් ලෝවැසිමහජන සමූහයාගේ ශරීර අස්පිහු කෙළවරින් කෙළවර සපගිව, නහරවැලින් බැඳිගිටිනාහුය. පසේ බුදුවරයන්ගේ ශරීර අස්පිහු අඹුසයන්ගේ එක්ගිමසේ එකි නෙක කෙළවරින් කෙළවර ලග්නවිමෙන් බැඳිගිටිනාහුය. සම්‍යක් සම්බුදුවරයන්ගේ ශ්‍රී ශරීර ගත ඝියලු අස්පිහු එසේ නොවෙති. සංඛලිකනම් ලද දම්වැල් සඤ්ඤයේ එකිනෙක අස්පියෙන් අස්පිය බැඳි සිරිවර සිටිනාහුය. ඒ කාරණයෙන් බුදුරජාණන් වහන්සේ යම්කිසි කරුණකින් ආපසු බලනු කැමති සේක්නම් ශරීරාවයව අර්ධයක් කරකවා ඇඹරි බැලීමට නොහැකිසේක. එහෙයින් අසාධාරණවූ බුබානුභාවයෙන් මහාපාපිවිය කරකැවි පිටිපසදසාව අභිබුධයට පැමිණිකල සිටිසේම වැඩසිට බලාවදුරණසේක. එසේ තැතඹොත් කරඇඹරා ආපසු බැලිය නොහැකි නාගසම්මත හස්ති රාජයෙකුසේ සකල ශ්‍රීඹශරීරය ආපසු දසාවට අභිමුඛට හරවා ලීමෙන් බලා වදරණ සේක. ඊට නාගාඹලොකනය යනු නමකි.

මෙසේ විසාලාමහනුවර වහසල් දෙර අභිමුඛයෙහි වැඩ සිට නාගාපලොකනය කොට මහසඟපිරිවරා බුදුරජ එයින් නික්ම ගොස් හණ්ඩගාමයට වැඩ, එහි බොහෝ භික්ෂුසඞ්ඝයාවහන්සේට ධම්කථා පවත්වා වදුරණසේක්; ශීලයනම් මෙසේය. සමාධියනම් මෙසේය. ප්‍රඥාවනම් මෙසේය. විමුක්තියනම් මෙසේය. ඒ ශීලයෙන් යුක්තව වසන්නාහුගේ ශීලපරිභාවිතවූ සමාධිභාවනාව මහත්ඵල මහානිසංස වන්නීය. එසේ සමාධිභාවනාව මිශ්‍රවූ ප්‍රඥාවද මහත්ඵල මහානිසංස වන්නීය. ඒ ප්‍රඥාව හා මිශ්‍රව පවත්නාවූ චිත්තයද මහණෙනි මනාඅකාව නාමාශ්‍රවාදි සියලු ආශ්‍රවයන් කෙදෙන් මිදී පරිශුධව පවත්නේය. යනාදීන් ධර්මදේශනාකොට වදුළසේක.

මෙසේ භික්ෂූන්වසඛමිනුශාසනා කිරීමෙන් භණ්ඩගාමයෙහිඅති ප්‍රාශකාලයක් වාසයකොට, මහසඟ පිරිවරා එයින් නික්ම හස්ත්‍යාම්ය, අම්බගාමය, ජම්බුගාමය, භොගනගරය යම්යම් තැනෙක්හිද ඒ ඒ තනකිවැඩ භොගනගරයෙහිවූ ආනන්දචෛත්‍යයෙහි

අභිප්‍රාය කාලයක් මාසයකොට, ආනන්දය, පාවානම් නුවරට යම්හසී වදුරා මහසඟ පිරිවරින් පාවානම් නුවරට වැඩ, එනුවර චුන්ද නම් කම්මාර පුත්‍රයාගේ අඹුලයන්හි මාසය කරණ කල්හි එපවත් අසා කම්මාරපුත්‍රතෙම සතුටුව තමාගේ අඹුලයන්හිවූ ඛාද්‍ය යෙහි මාසය කරණ භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් වැඳ, එනන්පස්ව හිඳ මෙලෝ පරලෝ වැඩ දන්මා, එහි සමාදන්වන සේක. ඔහ ශික්ෂණයවනසේ සාධු සාධුයි ප්‍රශංසා කරණසේක. ධර්මදේශනාකර වදුළකල්හි ඒ කම්මාරපුත්‍රතෙම ඉතා සතුටුව, අදවෙනි දවස්හි බුදුපාමොක්ක් මහසඟනට දන් දෙනු පිණිස ආරාධනා කොට වැඳ, අවසරගෙණ, තමාගේ වාසස්ථානයට ගොස් ප්‍රණීතවූ බොහෝ ඛාද්‍යභෝජ්‍යයන් සම්පාදනය කරණුයේ ත්‍රිකෝටිපරිශුද්ධ වශයෙන් සම්හවූ ඉතා තරුණ නොවූ ඉතා ජීර්ණ නොවූ මෘදු සිනිදු සූකරමාංසයක් පිසවන කල්හි දෙදහසක් භික්ෂුවරිප පිරිවරවූ මේ සත්වරමහවිප වාසි දෙවනාවෝ පාවිවරස දිව ඔජස් එහි ප්‍රක්ෂෙප කළාහුය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පාන දවස්හි පූර්වාහ්නසමයෙහි මහා කොට හැඳපෙරව කයින් චීවරය හා අතින් පාත්‍රය ගෙණ, ඔහා නිස්සැඹෙයා වහන්සේ සමග කරණ ලද ආරාධනා ඇති ඒ චුන්ද නම් සඛණිකාරපුත්‍රයාගේ නිවේසනයට වැඩ, පණවනලද බුඛාසනාමස්තකයෙහි වැඩහිඳ චුන්ද නම් සඛණිකාරපුත්‍රයාට අඛගාමදුරා වූසය, තා ඔසින් යම් සූකර මද්දවයක් පිළියෙළකරණ ලදද; එසින් මා වළඳවා අන්‍යවූ යම් ඛාද්‍ය භෝජ්‍යයෙක් ඇද්ද, එසින් නිස්සැඹෙයා වළඳවසි වදුළ සේක. බුදුරජ කුමක් පිණිස මෙසේ වදුළේක්ද? යත්:- දන්දෙන පිණිස පිළියෙළ කරණලද ඒ සූකර මද්දවයෙහි මේ සතරමහ ඊපයෙහි සියලු දෙවනාවන් ඔසින් බුදුබුනදු සුජාතාව දුන් කිරිඛතෙහි දිවඔජස් බහාලුවා සේ දිවඔජස් බහා බුදුන්ටම පිරිනමා කරණ ලද්දේය. එබැවින් ඒ සූකරමද්දවය වළඳ බුදුන් හැර දෙවිමිනිසුන් සහිතවූ සියලු ලොහයා අතුරෙන් යම්කිසිවක්හු ඔසින් සැපසේ ජීර්ණඛවට පළුණුවාගත නොහැකි බව අනාවරණ ඥානයෙන් දැන, මහාකරුණාවෙන් බුදුරජ පරොපවාදයෙන් මිදීම පිණිස මෙසේ වදුරා, වළඳ ඉනිරි සූකරමද්දවය අන්කිසිවක්හට නොදී මිනාඝකරවයි වදුළසේක. ඒ ඇසූ කම්මාරපුත් එසේය, සවාමීන්වහන්සැයි කියා, ඒ සූකරමද්දවයෙන්ම බුදුන් වළඳවා සෙසු ඛාද්‍යභෝජ්‍යයෙන් නිස්සැඹෙයා වළඳවා, ඉක්බිති ඉනිරිවූ සූකර මද්දවය අනිකාක්හට නොදිරණ හෙයින් ප්‍රාණීන් නැති තැනක දම්මවා ඉක්බිති බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව හුන්නේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහට මෙලෝ පරලෝ

වැඩ දැක්වීම් ආදි වශයෙන් බණ වදාරා ගුනස්තෙන් නැගී වැඩිසේක.

මෙසේ ඒ කුමාරපුත්‍රයාගේ බත වළඳ නිමිකල්හි බහුලවෙදනා ඇති මරණාන්තිකවූ ලෝහිතපක්ඛන්දිකානාම ක්‍රෑර ආබාධයෙක් උපන්නේය. ඒ ආහාරය වැළඳූකාරණයෙන් උපන් රෝගයෙක් නොවෙයි. එසේ නොවළඳ සිට රෝගය උපන්නේවීනම් ඉතා ක්‍රෑරවූ වේදනා උපදනේ ය. ඒ මෘදුසිනිදු හොජනය වැළඳුබැවින් අධික වේදනානොවීය. පළමුව බේළුවගම්හි වස්වසා වසනකල උපන් මෙම රෝගය සමාධිබලයෙන් මැඩපවත්වාගත්‍ත ඉදිරියෙන් දශමාසඅඛාට නූපදනාසේ පිහිටි සමාධිබලයද මෙකලට නිම්වෙයින් මෙදවස්හි ඒ රෝගයාගේ ඉපදීමද සඩිභාවධම්මතාවෙක්ම යයි දතයුතු.

එවිට අප භාග්‍යවතුන්වහන්සේ සිඟිනුවණින් යෙදිවෙහෙසීමක් නොව වෙහෙස ඉමසා වදාරමින් ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය, කුසිනාරානුචරට යම්හසි දිදරා, එහි රැස්වූනාක් මහාසිඟු සඛ්‍යයාවහන්සේත් පිරිවරාගෙණ, අඛානමාගියට පැමිණ වඛනා සේක් අතරමගදී මහින් පහව රුක්මූලට වැඩ ආනන්දය මම කලානතයෙමි. එහෙයින් මෙහි හිඳිමි, සඟළසිවුරසතරපටකින් පණවයි වදාළසේක. එකල්හි අනඳමහතෙරුන් වහන්සේ සඟළ සිවුර එහි අතුවා වදාළසේක. භාග්‍යවතුන්වහන්සේ එහි වැඩහිඳ ආනන්දය පිපාසිතයෙමි, පැන් ගෙණෙව, වළඳමියි වදාළකල්හි අනඳමහ තෙරුන්වහන්සේ භාග්‍යවතුන්වහන්සේට මෙසේ දන්වූ සේක. ඒ කෙසේ ද? යත්;

මාගේ සවාමිදරුවූ බුදුරජානන්වහන්ස, දැන් පන්සියයක් පමණ ගැල් මේ මාර්ගයෙහි ගෙණ ගියාහු ය. ඒ ගැල්සක් ස්පර්ශයෙන් බිම බිදි මේ අනිඤ්ඤුද්‍රනදියෙහි ඉතා මදදිය ඇලලී බොරවීමෙන් වහනය වන්නේය. සවාමින්වහන්ස, මේ කුකුත්ථනදිතොමෝ ඉතා ක්‍ෂුද්‍රවය. එහි දිය ප්‍රසන්නය, මධුරය, සීතලය, මඬනැතිව ඉතාමරමණීයය, මනාවබස්නා කොට් ඇත්තීය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ එහි පැන් වළඳ ජලස්නානයෙන් ශ්‍රීශරීරයද සිහිල්කරණසේක්වයි කියා මෙසේ යාච්ඤ කළකල්හි; භාග්‍යවතුන්වහන්සේ දෙවන තුන්වනවරද ආනඳය, පැන් ගෙණෙව, වළඳනු කැමැත්තෙමියි, වදාළකළ ආයුෂ්මත් අනඳමහ තෙරුන් වහන්සේ පළමු දන්වූලෙසටම සම්පවූ උදකසථානය මහ ගැල්යාමෙන් කැළඹි බොරවූබවත් කුකුත්ථනදිය ඉතා ක්‍ෂුද්‍රර ය, රමණීය යන බවත් දන්නා නැවත නැවතත් එසේ බුදුඅණ ඉක්මවා ගත නොහී, එසේය සවාමින්වහන්සැයි, කියා ප්‍රතිවචනදී පාත්‍රය ගෙණ, ඒ ක්‍ෂුද්‍රනදිය යම්තැනෙක්හිද එතැනට උන්වහන්සේ පැමිණි ඇසිල්ලෙහි යට කියන ලද ක්‍රමයෙන් ඇලලී බොරව ගිය දිය

බුබාහුභාවයෙන් පැහැදී ප්‍රසන්නවිය. එකල්හි ආයුෂ්මත් අනද මහතෙරුන්වහන්සේ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ඒ කාරණය දැක ඉතා සතුටුව, අතිශයින් විස්මයපත්ව, පාත්‍රයෙන් පැන්ගෙණවුත් බුදුන් කරා පැමිණ සවාමීන්වහන්ස, දුන් ගැල් පන්සියයක් පමණ යාමෙන් ඇලලී මඩ මිශ්‍රව ගියාවූ සුවල්ප උදකය එහි මා පැමිණි කල්හි පැහැදී ප්‍රසන්නවිය මේ කථාගතවූ සවාමීන්වහන්සේගේ ඍඛ්‍යානුභාවයෙහ. ආශ්චර්‍ය්‍යයෙකැයි, අද්භූතයෙකැයි, ඔහුනි කොට පැන්වළඳ, වදුළමැනවැයි ආරාධනාකළකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ පැන් වළඳුවදුළසේක.

එකල්හි ආලාරකාලාමයන්ගේ ශ්‍රාවකවූ පුක්කුසනම් මල්ල පුත්‍රද එතනට පැමිණියේය. කෙසේ පැමිණියේද?යත්, මල්ලරජ දරුවෝ හැමදෙනම වාර බෙදා ගෙණ රජකරන්නාහුය. ඔවු නොවුන්ට වාරය පැමිණෙනතාක් කල් සෙස්සෝ වෙළඳම්කරති. එබැවින් පුක්කුස නම් මල්ලපුත්‍රතෙම සාත්තුවාහකයන් හා ගැල් පන්සියයක් පෙරටුව යවා පසුව සම්පත්නමය යානෙහ හිඳ, කුසිනාරානුවරින් නික්ම පාවානම් නුවරටයනුයේ අතරමගදී ඒ වෘක්ෂ මූලයෙහි ශොභමානවූ බුදුන් භාග්‍යවතුන් වහන්සේ දැක, එතනට හොත් මනාව බුදුන් වැඳ පිළිසඳර කථා කොට එකත්පස්වූහුන් සේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඔහට මෙලෝ පරලෝ වැඩ දක්වාලීම් වශයෙන් බණ වදුළසේක. ඒ ධම්දේශනාව අසා අති ප්‍රසන්නව දන්වතුගේ සවාමීවූ බුදුරජාණන්වහන්ස, ඔබවහන්සේ ගේ ධම්ශ්‍රවණයෙන් සතුටුවූ ඒ මම මා හුරුවූ ආලාරකාලාමයන් කෙරෙහි පැවැති මාගේ ගම් ප්‍රසාදයෙක් ඇද්ද, ඒ පැහැදීම ඔබ වහන්සේගේ ධම්දෙශනා කැමැති මහාවානයෙහි පොලා හැර විනාස කෙළෙමි. එසේම සිඟුවූ උදකස්‍රොත ඇති දෙශනා නමැති ගඩොෑවෙහි බහාලීමි. එසේ මා වරදවාගත් දෘෂ්ටිය හැර දුන් ශුබවූ බැවින් අදපටන් ජීවිතාන්තය දක්වා ඔබවහන්සේගේ සරණ ගතවූ උපාසකයෙකැයි කියා මා භාග්‍යවතුන්වහන්සේ දරණ සේක්වයි දන්වා ඉක්බිතිව ඒ පුක්කුසනම් මල්ලපුත්‍රතෙම සිංඛ සවණීයට බදුවූ වණ්ණඇති මටසිලුටුවූ මහත් සැණකෙළි දවස්හිම ඔහුවිසින් දුරියයුතුවූ මාඟැහි වස්ත්‍රදෙකක් ගෙන්වාගෙණ සවාමිවූ භාග්‍යවතුන් වහන්ස, මේ රන්වන් වස්ත්‍රයුගලය මට අනුකම්පා උපදවා පිළිගෙණ වදුළමැනවයි ආරාධනාකළකල්හි මෙසින් එක්වස්ත්‍රයක්, මට දෙව, එක්වස්ත්‍රයක් ආනන්ද සථවිරයන්ට දෙවයි වදුළසේක. ඒ අස්, 'ඒ පුක්කුසනම් මල්ල පුත්‍රතෙම එසේය සවාමීන්වහන්සැයි ප්‍රතිවචන දී එක්වස්ත්‍රයෙකින් බුදුන් පුදා එක් වස්ත්‍රයකින් ආනන්ද සථවිරයන් පුදා, ඉක්බිත්තෙන් ඒ මල්ල පුත්‍ර තෙම බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට අවසර ගෙණ ගියේ ය.

බුදුරජානන්වහන්සේ එසේ කුමක් පිණිස වදාළසේක්ද? යත්: අනඳමහතෙරුන්වහන්සේ මෙබඳුවූ ලාභ ප්‍රතිග්‍රහණයකොට පැමිණි උන්වහන්සේගේම උපස්ථායන කෘත්‍යය මෙදවසට මස්තකප්‍රාප්ත බැවින් උස්විසි වස්සියක් බුදුන්ට උපස්ථානකරන්නාවූ ආනන්ද ස්ථවිරතෙම බුදුන් සමීපයෙන් කිසිවක් නොලැබූසේකැයි යන අනුන්ගේ වචනාකාශයිදිම හා ආනන්දස්ථවිරතෙම ඒ වස්ත්‍රය ගෙණ මවිසේ පුදන්නේය. ඔවුන් පිදූකල මල්ලපුත්‍රයා විසින් සංඝයා වහන්සේද පිදූවානම් වෙයි. යන කාරණය පිණිස බුදුරජ එසේ වදාළසේක. ඒ බව දැන ආනඳමහතෙරුන් වහන්සේද ඒ වස්ත්‍රය ලැබ බුදුන්වම පිදූසේක.

බුදුරජ ඉන් එක්රන්වන් වස්ත්‍රයක් හැඳ එක්වස්ත්‍රයකින් රන් වන් බුදුබඳ වසා පෙරවගත්කල්හි බලන්නවුන්ට පහවූ ගිනිසිල ඇතිව දිලියෙන ගිනිඅතුරු රැසක්මෙන් ඉඛාප්‍රභාව වැවහෙන්ට වන. ඒ දැක ආනඳමහතෙරුන්වහන්සේ අභිභූයින් විස්මයපත්වූ සිත්අතිව මාගේ සැපවූ බුදුරජානන්වහන්ස, සවණියෙහි සවණිය සේ බබ ශරීරය ඉතා දීප්තිමත්ව දැන් බබළන්නේය. මේ මහත් ආශ්චර්‍යාද්භූතයෙකැයි දැන්වූකල්හි බුදුරජ එසේ ය ආනන්දය, සම්මාසම්බෝධියට පැමිණිසේක්ද ආනන්දය, තථාගතයන් වහන්සේ සම්මාසම්බෝධියෙක්හි අනුපාදිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදුරණසේක්ද, මේ දෙදවස්හි තථාගත ශරීරය අභිභූයින් පිරිසිදුවූ ජ්‍යෝවර්ණයෙන් දීප්තිමත්ව බබළන්නේය. ඒ කුමන් හෙයින්දැ? යත්; ඒ දෙදවස්හි භාග්‍යවතුන් වහන්සේ විසින් වැළඳියයුතු ආහාරයෙහි මේ සක්ඛලි මූඵල්ලෙහි ඔබලූ දෙවතාවෝ දිව්‍යඕජස් බහාලන්නාහුය. එසේ දිව්‍යඕජස් එක්වීමෙන් ප්‍රණීතවූ ඒ මධුරභොජනය කුක්ෂිගතව ආහාර ස සේවනයෙන් නැගි රූපයාගේ ප්‍රසන්නබැවින් මනස ඔවැනිකොට ඇති වක්ඛුරාදී ඉන්ද්‍රියයෝ ඉතාදීප්තිමත්ව බැබළෙන්නාහුය. බුදුවනදා අනේක කෝටිශතසහස්‍රජාතිවල වඩා පවත්වා ආ කෙලෙශරාශිය අදම මම ප්‍රහීණකෙළෙමි කියා බුදුන්ට බලවත් ප්‍රීතියොමින්ස් ඉපදීමෙන් ඝන ප්‍රසන්නවෙයි. එසේ ඝන ප්‍රසන්නවූ කල්හිදු සිඟලු බුඛශරීරයෙහි ලේ ප්‍රසන්නවෙයි. ලේ ප්‍රසන්න වූ කල්හි මනස ඔවැනිවූ වක්ඛුර දී ඉන්ද්‍රියයෝ සදෙන අභිභූයින් බබළෙන්නාහුය. පිරිනිවන් පාන අද මම් කොයෙක් දහස්ගණන් බුදුවරයන් විසින් ප්‍රහීණවූ අමාමහනිවන් පුරයට ප්‍රවිෂ්ටවෙමි කියා ආවර්ජනාකරණ බුදුරජානන් වහන්සේට බලවත් සන්තෝෂ ඉපදීමෙන් එකොළොස් ප්‍රසන්න වස්ත්‍රයෝ ය. එසේ ඝන ප්‍රසන්නවීමෙන් ලේ ප්‍රසන්නව

ඡවි ප්‍රසන්න ව මනස සවැනි වූ ඉන්ද්‍රියයෝ අභිශයින් දීප්තිමත් ව බැබළෙන්නාහුය.

මෙසේ ආනන්දය ඒ දෙදවස්හි වැළඳූ ආහාරවිශේෂයෙන් ද ඉතා බලවත් ඔතුටු සන්තෝෂයෙන් ද යහ මේ දෙකාරණයෙන් බුඛශරීරය විශේෂයෙන් බැබළීම සිහලු බුදුවරයන්ගේ ම ධර්මතා වෙක. එහෙයින් ආනන්දය අද රාත්‍රියෙහිවූ පශ්චිමයාමයෙහි කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් සල්වනයෙහි සල්රුක්දෙදෙනා අතුරෙහි තථාගතපරිනිර්වාණය වන බැවින් මාගේ ශරීරය මෙසේ දිලියෙන්නේ වෙයැයි වදළසේක. එසේ ඉහයින් කියනලදී. ධර්මඛණ්ඩාගන්‍යාකාලයෙහි :-

සිංගිවණ්ණං සුගං මටටං, පුඤ්ඤඤ්ඤා අසිහාරය
තෙන අච්ඡාදිකා සත්ථා, හෙමවණ්ණා සඤ්ඤතෝ ති

තෑවන භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද මහතෙරුන් වහන්සේට අඛ්‍යාත වදුරා ආනන්දය, කුකුත්ථනදිය ගම්තැනෙක්හි ද, එතනට ගම්හයි වදුරා, මහාභික්ෂුසඞ්ඝයා වහන්සේත් පිරිවරා කුකුත්ථනදිය තරා වැඩ, ජලඝාටකය හැඳ ගඟට බැස වදුරමින් පැන් සතහ වදළසේක. එසේ භාග්‍යවතුන් වහන්සේ හැන් සතහන කල්හි ඇතුළුනදියෙහි මැඟි කැසුප් ආදිහු ද දෙගොඩ වැලිතලා භූමිභාගයෝ ද වතලැහැප් ද ආකාශය ද ඒ සියල්ල ම බුඛශරීරය සේ සවණ්ණවණ් විය. බුදුහු ජලත්තානය කොට පැන් වළඳ, ගඟින් ගොඩට වැඩම කොට එම ගංගාතීරයෙහිවූ අඹවනයට පැමිණිසේක. එකෙණෙහි ආනන්දමහතෙරුන් වහන්සේ බුදුන්ගේ ජලඝාටකය උදකපීළනය කරමින් මදක් පමාවූසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ අඹුයන්හි ආනන්දස්ථවිරයන් නො දුක සම්පයෙහි සිටි චුන්ද ස්ථවිරයන්ට අඛ්‍යාත වදුරා, චුන්දය, මම කලාන්තයෙමි. සැනපෙනු කැමැත්තෙමි. තෙපි සඟළසිවුරඅතරපටින් පණවා සි වදළසේක. එවිට චුන්දතෙරුන් වහන්සේ එසේය වහන්ස සි ප්‍රතිවචන දී සඟළ සිවුර එසේ පැණවූසේක.

භාග්‍යවතුන් වහන්සේ එහි දක්ෂිණ පාර්ශ්වයෙන් සිහි කුවණින් යෙදී උට්ඨානසංඥ සිත්හි කිරීමෙන් සිංහශය්‍යාව කළසේක. ආයුෂ්මත් චුන්දතෙරුන් වහන්සේ වනාහි එහිම අභිමුඛයෙහි හුන්සේක. සියලු භික්ෂුසඞ්ඝයාවහන්සේ ද බුදුන් පිරිවරා වැඩහුන්සේක. එකල්හි ආනන්ද මහතෙරුන්වහන්සේ ද බුදුන් කරා පැමිණ වැඳ ශ්‍රීපාදය සමීපයෙහි හුන්සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වදුරණසේක් චුන්ද තම කණිෂ්ඨපුත්‍රයාට ඔහුගේ පශ්චිම පිණ්ඩපාතය වළඳ, තථාගතයන් වහන්සේ පිරිනිවි සේකැයි කියා කිසි විපිළිසරයෙක් ඉඩකඩෙක්හි ඉපදුනේ නම්

ඔහුට ඳුනානිසංස සෙස්සන්ට සේ නොවීමෙන් පුණ්‍යවිශෙෂයෙක් ලදනමුදු මනුෂ්‍යත්වය දුර්ලභවද, එසේම වැරදි යාමෙන් අලාභ පිණිස යාමෙක් වෙයි. එහෙයින් ආනන්දය, තොපවිසින් චුන්ද නම් ඒ කම්මාරපුත්‍රයාගේ විපිළිසරය මෙසේ දුරුකටයුත්තේය. ඒ කෙසේද? යත්;

ඇවැත්වූ චුන්දය, තා විසින් දෙනලද පශ්චිම පිණ්ඩපාතය වළඳ, තථාගතයන්වහන්සේ පිරිනිවිසේක්ද; තා විසින් ඒ පිණ්ඩ පාතඳුනානිසංස සඛ්‍යාත දෘෂ්ටධර්මසම්පරායික කුශලලාභය ලබනලද, ඒ තා විසින් පුණ්‍යවිශෙෂයෙක් ලද, මේ මනුෂ්‍යත්වයද මනාව ලද්ද නම් වෙයි. ඇවැත්වූ චුන්දය, මාවිසින් මේ කාරණය භාග්‍යවතුන්වහන්සේගේ සම්මුඛයෙන් අසනලද්දේය. සම්මුඛ යෙන්ම අසා පිළිගන්නාලද්දේය, තථාගතයන්වහන්සේ යම් පිණ්ඩපාතයක් වළඳ, නිරුත්තරවූ සම්‍යක්සම්බොධියට පැමිණෙන සේක්ද, යම්පිණ්ඩපාතයක් වළඳ, තථාගතතෙම අනුපාදිසෙස නිර්වාණධාතුවෙන් පිරිනිවන්පානාසේක්ද, මේ පිණ්ඩපාත දෙකම සමවූ ඵලවිපාක ඇත්තාහ. සෙසු පිණ්ඩපාතඳුනයටවඩා මහත්ඵල මහානිසංස තරවන්නාහුය. එසේහෙයින් චුන්දනම් කම්මාරපුත්‍රය තා විසින් ආයුසංවත්තනිකවූ-පෙ ආදිප්‍රත්‍යය පිණිස පවත්නාවූ නිර්වාණය පිණිස පවත්නාවූ උතුම් කුශලය රැස්කරණලද්දේයයි, කියා ආනන්දය, ඒ පශ්චිම පිණ්ඩපාතය දුන් චුන්දනම් කම්මාරපුත්‍ර යාගේ විපිළිසරය තොපවිසින් මෙසේ දුරුකටයුත්තේය.

සුජාතාවවිසින් දෙනලද පිණ්ඩපාතඳුනය, තථාගතයන් වහන්සේ සරාග සදෙස සමෝහකාලයෙහි වළඳ, බුදුවූසේක් නොවේද, චුන්දනම් කම්මාරපුත්‍රයා විසින් දෙනලද පිණ්ඩපාත ඳුනය විතරාග විතදෙස විතමෝහ කාලයෙහි වළඳනලද්දේය. එසේ ඇතිකල්හි කවරකාරණයකින් මේ පිණ්ඩපාතඳුන දෙක සමසමවූ ඵලවිපාක ඇතිවෙද්දැ? යත්; පිරිනිවන්පෑම සමබැවින්ද, සමාපත්තිසමවැදීම සමබැවින්ද, අනුසස් සිහිකිරීම සමබැවින්ද, සමවන්නාහු වෙති. කෙසේද? යත්; භාග්‍යවතුන්වහන්සේ සුජාතාව විසින් දෙනලද පිණ්ඩපාතය වළඳ, උපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවිසේක. චුන්දනම් කම්මාරපුත්‍රයා විසින් දෙන ලද පිණ්ඩපාතය වළඳ, අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක. බුදුවන දවස්හිද සුජි කෙළලඤ්ඤයක් ඛාපත්ති සමවැදුනුසේක. පිරිනිවන්පාන දවස්හිදු ඒ සියලු සමාපත්තිනුත් එසේම සමවැදුනුසේක. සුජාතාව විසින් මැන භාගයෙහි ඇගේ බත නුගරුක මුලදී එදවසෙහි වැළඳුයේ රුක් දෙවිඳුත්, තෝව අඛඹහසත්තෙම ඒ වළඳ, නිරුත්තර සම්‍යක්

සම්බෝධියට පැමිණීමේකැයි යනු ඇසුවාය. ඒ ඇසූ සතුටින් ම මේ මව් වූයේ එසැණෙහෙත් මෙහෙල්ලාහයනි සලකා සත්දවසක් නිරාහාරව බලවත් ප්‍රීතිසොම්නස් උපදවා ගෙණ වාසය කළාය. චුන්ද තම කණිෂ්ඨ සහෝදරයාහට ද බලවත් ප්‍රීතිසොම්නස් පහළවූයේය. මෙසේම පිරිනිවන්පෑම සම්බන්ධවිනුදු සමාපත්තීන්ගේ සම්වැදීම සම්බන්ධවිනුදු ඒ පිණ්ඩපාත දෙක සමසම වූ ඵලවිපාක ඇතිවන්නාහුමැ.

ඉක්බිත්තෙන් ගාඟෘවතුන් වහන්සේ ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය හිරණ්‍යවතීනම් ගංගාවගේ පරතීරය යම් තැනෙක්හි ද කුසිනාරානුවර මල්ල රජදරුවන්ගේ උපවර්තනම් සල්වනය යම්තැනෙක්හි ද, එතනට යම්බසි වදරා, අඹවෙනෙහිවූ සිංහාසනය වෙන් කැගි බුදුරජාණන්වහන්සේ පළමුවෙන් බේළුව හමිනි වස්ත්‍ර ය ව්‍යාකාශල බුඩ ශරීරයෙහි උපත් ආබාධ දුඃඛවේදනාව සමාධිබලයෙන් මැඩපැවැත්වූ තැන් පටන් ඒ බුදුරජ්ජ කොබෝකාශයින් පිරිනිවන්පාන්සේකැයි යනු අසා, එතැන් පටන් දසමාසයක් මුළුල්ලෙහි බුදුන් දක්නට දසදහසින් රැස්වූ භික්ෂූන් අතුරෙන් එසිටි බැහැරට නික්මෙන එකද භික්ෂුනමකුත් නැත. එහෙයින් එසේ ගණන් නැති මහාභික්ෂූසඞ්ඝයාවහන්සේත් පිරිවරා පාවා නුවර පටන් තුන්ගව්වු මගගෙවා කුසිනාරා නුවරට පැමිණෙන අතරෙහි ලොකඛ්මිනා බැවින් බුදුබල පවා දුර්ලභ පත්විසි තෙනෙක වැඩහිඳ, මහත් උත්සාහයෙන් ශ්‍රීඃදයෙන්ම වඩනා සේක් ඛාණ්ඩදවතීනම් ගඟින් එගොඩ කුසිනාරානුවර මල්ලරජ දරුවන්ගේ උපවර්තනම් සල්වනයට සඤ්ඤාකාලයෙහි වූ ඛිර ගලා වැටෙන වේලාවෙහි ප්‍රවිෂ්ටවූසේක. එහි බුදුබල කම් කවරහ? යත් සියලු ලෝකඃ හා අසඃඛාරණවූ ඥානබල දශයක් හා කායබල දශයක් ඇතිසේක, මෙසේ දශබලධාරීවූ බුදුරජාණන් දහන්සේගේ ඒඃ මහත් කායබලයක් පවා චුන්දකම් කම්මාරපුත්‍රයාගේ පිණ්ඩපාතය වැලඳුනැන්පටන් පඞ්කහනපකඛිතෙනාදකය මෙත් පරිභෝගව ගියේය.

මෙසේ රෝගඃතෙම සියලුම නිරෝගබව මැඩපවත්වාගෙණ පැමිණෙන්නේය. එහෙයින් සියලු ලෝකඃහට සංවේගකර වූ ඒ ඛාරණය ප්‍රකාශකොට දක්වන්නාවූ අප හාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් කැඳවා, ආනන්දය ශාලවෘක්ෂයන් මදදෙනා අතුරෙහි උත්තර ශීර්ෂකව මඤ්චකය පණවව. මම ක්ලාන්ත ශෝමි. සැතපෙනු කැමැත්තෙමියි වදළසේක. එකල්හි අතදම්හ තෙරුන්වහන්සේ එසේය, සවාමීන්වහන්සැයි. කියා ප්‍රතිවචනදී

ඒ උයන්හි රාජකුලයාගේ සැනසිමසුවසය ගෙණ එසේම පැණවූ සේක. භාග්‍යවතුන් වහන්සේ යුග්මශාලයන් අතුරෙහි උත්තර ශිඛිකාව පැණවූ ඒ සයනාසනයෙහි හැවත හැඟී නොසිටිනා සංඥාව සිත්හි කිරීමෙන් දක්ෂිණ ශ්‍රීපාදය මඤ්ඤකයෙහි වාම ශ්‍රීපාදය මදක් ඉක්ම : සුඛානුකොව තබා, හොඳින් සිහි ඇතිව ජාතුමවන් ජාතුවසංඛවිනාසවන සේ තැබූකල්හි එක්වන්ව නිරන්තරයෙන් වේදනා උපදනේය. එහින් සිත එකඟකොවන්නේය. එහේතින් යම් සැනසීමක් එසේ හැටීමක් අඛාසුවෙක් කොවේද එපරිද්දෙන් මතුවූ ශ්‍රීපාදය ඉන්නාමදක් පසුව ඊබෙනසේ තුබුකල්හි ඒ වේදනා නුපදිද, සිහිඑකඟවේද සැනසීම ඇතවීම ඇතැවීම ඇතැවීම ඇතැ

මල් ගොතා නොයිමි හෙයින් ඒ පළමුවන බුදුවමහුලට එක්වශත නොහි ප්‍රමාදව එයේවිනම් දශවාසාර්ධ ඛාත්‍යයක්වැස මවුකුසින් නික්මෙන දවස්හි ගෙණගොස් පුදමියි කියාද, මල්හෙතීමෙන්ම ප්‍රමාද බැවින් එකුන් තිස්හවුරුද්දක් ගිහිගෙයි වැස මහවිනික්මන් නික්මෙන දවස්හි ගෙණගොස් පුදමි කියාද, සාවුරුද්දක් ප්‍රධන්වියෂ්කොට බුදුවනදවස්හි ගෙණගොස් පුදම් කියාද, යමකප්‍රාතිහාර්‍යය පාඨදවස්හි ගෙණගොස් පුදමි කියාද, බුදුවූ සත්වන හවුරුදු සැවැත්නුවර ගන්ධකුටිවරුක්මූලදී තිස්තිනදමනය පිණිස යමකප්‍රාතිහාර්‍යය දවස්හි ගෙණ ගොස් පුදම් කියාද, දෙවිලොව තුන් මසක් වස්වැස දෙවෝරෝහණයෙන් බිත්නාදවස්හි ගෙණ ගොස් පුදම් කියාද, ආයුසංස්කාරය හරණදවස්හි ගෙණ ගොස් පුදම් කියාද, පිරිනිවන් පානාදවස්ගෙණ ගොස් පුදම් කියාද, මේසේ මහබෝසතානන් වහන්සේගේ මවුකුස පිළිසිඳගැන්මෙහි පටන් අනුපාදිශෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑම දක්වා, පැවති මේ සියලුම බුදුවිගුල් අතුරෙන් එකිනෙක බුදුමහුලක් නිමිශේයසි යනු අසා රට දෙවැනි නොවැනිවූ බුදුමහුලට මෙයටත් වඩා මල් ගෙනාගෙණ හැටියා යෙමියි කියා මල්හෙතීමෙන් ප්‍රමාදව අසු හවුරුද්දක් අතික්‍රාන්තව පරිනිවන් පානා දවස්හිද මල් ගොතන්නාවූ ඒ දිව්‍යපුත්‍රයා දැන සෙසු දෙවතාවෝ මෙසේ කිව්ල, නෙපි කවරක්හට පුදන පිණිස මෙ මල්දම ගොතන්නෙහිද? මේ අදදවස්හි බුදුරජාණන් වහන්සේ අසුහවුරුද්දක ආයුසිරිවළඳ කුසිනාරාකුවර යමක ශාලයන් අතුරෙහි සයනවිඤ්ඤකයෙහි දකුණුලයෙන් සිහි කුවණින්ගේ යදී නැවත නැගි නොසිටිනා සිංහසෙය්‍යාවට දුන් පැමිණි සේක. අදබලව පව්වුසයෙහි පිරිනිවන් පානා සේකැයි කිවාහුය.

ඒ අසා තැවත එම වරවාරණ දෙවිපුත් කියනුයේ අහෝ! මේ කී මක්ද? මහබෝසතානෝ අද දවසම මවුකුස පිළිසිඳ ගෙණ අද දවසම මවුකුසින් නික්ම අද දවසම මහාභිනික්මන් නික්ම අද දවසම බුදුව අද දවසම ධර්මචක්‍රය පවත්වා අද දවසම යමක ප්‍රතිහාර්‍යය දක්වා අද දවසම දෙවිලොවින් බැස අද දවසම ආයුසංස්කාරය හැර අද දවසම පිරිනිවන්පානා සේක්ලු, දෙවෙනි දවස්හි කැඳක් වළඳන පමණ කල්වත් සිටියයුතුසේක් නොවේද? දශපාරමිධර්මයන් පුරා බුදුබවට පැමිණි ඒ උතුමානන්වහන්සේට මෙසේ වීම ස්‍රුදුපුදුසි කියා මහත් විතාවික්ෂෙපයට පැමිණ එ ස්වී තමුන් මිකිස්ලොව ගණනායෙන් අසුහවුරුද්දකට වැඩිකලක් ගොතා ගෙන්වත් මා සිත්සේ නම්වාගත නුහුනු අඛාලවූ මේ මල්දම කුඹුරුකවූදු කුශලය එයවත් වැඩිමහකැයි දැන මෙපමණ මල් අත්කරවූත් බුදුන්ට දිවිඇතිකාලම පුදමි සිතා මහා ශ්‍රෙෂ්ඨවූත්

මෙසා සක්වළතුළ අවකාශ නැතිගෙයින් වක්‍රවාට මුදුනෙහි සිට අහස්කුස වැසියනතරම් ඒසාමිල්දමින් බුදුන්ට පූජාකොළේය. සෙසු දිව්‍යසමූහයෝද අනෙකප්‍රකාර දිව්‍යමයවූ අප්‍රමාණ පූජාපවත්වා වක්‍රවාටමුඛවටය දක්වා හැසිර පිරි ඔවුකොවුන් හස්තයෙන් හස්තය ග්‍රීවයෙන් ග්‍රීවය වැළඳගෙණ මහත් ශොකාතුරවෙසයෙන් සිට තුණුරුවන් ගුණ අරභයා දෙතිස්මහපුරිස් ලකුණු සවණක් රැස් දසපාරමිතාවන් පන්සියපණස් ජාතකයන් වුදුසමිධ බුබ ඥනයන් ඇතුළු නොගෙක් බුදුගුණ කිය කියා ගායනාකිරීමෙන් අවසන්හි ගෙ සහාය සෙ සහායයි කියනිසා හාත්පස්හි අප්‍රමාණවූ පූජා කෝලහල පවත්වන්ට පවත්ගත්හ.

මේසේ දිව්‍යබ්‍රහ්මාදීන් විසින් ඒ දිව්‍යසංනිති පැවැත්වීම් ආදී වශයෙන් අහස්කුස වසා බුදුන් උදෙසා මහාපූජොත්සව පවත් වමින් සිටිකල්හි ශමකශාලයන් අතුරෙහි දක්ෂිණපාර්ශ්වයෙන් වැද හොන් අපභාග්‍යවතුන් වහන්සේ පෘථිවිතලය පවන් වක්‍රවාටය අවසන්ව බඹලොව දක්වා අතුරු නොදී වතුරුමෙන් රැස්වූ එසා මහපිරිස විසින් අප්‍රමාණව පූජොත්සව පැවැත්වීමෙන් කාරණ මහත් උත්සාහය දැනවදුරා, ආනන්දස්ථවිරයන් කැඳවා, ආනන් දය, මේ පොළෝතලය පවන් වක්‍රවාටපර්‍යන්තනව අකනිවා බඹ ලොව දක්වා සියලු ආකාශ කුහරය වසා පුරා දැන් මේ රැස්වඟිරි දිව්‍යබ්‍රහ්මාදීන් විසින් දිවමල් දිවසුවද දිව්‍යතූර්‍යසඝෝෂනාදී අප්‍ර මාණවූ මේ පූජොත්සව දැන් මේ බුබපූජා පිණිස පවත්වන්නා හුය. ආනන්දය මෙපමණකින් හෙවත් මෙසේවූ ආමිසපූජා පැවැත්වූ පමණකින්ම තථාගතවූ බුදුන් පිදුයේ නොවෙයි. එසේ ආමිසපූජාවෙන් මා පිදු පමණකින්ම ගරුකාරකෙළේ නොවෙයි. බහුමාන කෙළේ නොවෙයි. පූජාකෙළේ නොවෙයි. ආනන්දය දීපඞ්කර පාදමූලයෙහි වැදහෙව අඤ්ඤබ්‍යාමෝදන යෙන් යෙදී අභිනීහාරය කරන්නාවූ මාවිසින් මල්සුවඳ තූර්‍යසංඝනි ආදී යම් කිසි මේ ආමිසපූජාවක් ලබන පිණිස පාරමිතාවන් එසා න්නයෙන් පුරණලද්දෙම් නොවෙමි. එහෙයින් ආනන්දය මෙසේ ආමිසපූජාවෙන් මා පිදු පමණකින්ම බුදුන් පිදුයේ නොවෙයි. යම් කිසි භික්ෂුභික්ෂුණී උපාසක උපාසිකාකෙනෙක් ධම්මානුධම්මප්‍රති පත්තියෙහි යෙදී වාසයනොරෙද්ද, ධම්මානුගහ පිළිවෙත්හි යෙදී වාසයකිරීමෙන් එසේ පුදන තැනැත්තහුම උතුම් පූජාවෙන් මා පුදන්නලද්දේ නම් වෙයි. ඒ කාරණයෙන් ආනන්දය තොප විසින් ධම්මානුධම්ම ප්‍රතිපද නම් ලද නවලොකොත්තර ධම්මයාගේ අනුධම්මවූ පූජාභාග ප්‍රතිපදාවය ඇත උතුම් ශීලාචාර සමාපත්ති ධ්‍යානාභිඥසමාධ්‍ය නාදියෙන් යෙදීමෙන් නිත්තිය යුතුයයි වදාළසේක.

කවරකාරණයකින් බුදුරජාණන්වහන්සේ සෙසු තථාගත එකම දිය මෙනෙරිය මලකින් පමණවත් කරණලද බුබපුජාසෙකි විපාකය මෙතෙකැයි කියා බුදුනුවණින් දුටු බලා නිමවා වර්ණනාකොට ගත නොහැකියයි වදරා; මෙහි මෙසේ මෙසා මහත් පූජාව ප්‍රතික්ෂේප කළ සේක් දැයි කිවහොත්; තමන්වහන්සේගේ ඔවුවණක් පිරිස්නි පැවති අනුකම්පාවෙන්ද, ශාසනායාගේ විරාත් කාලයක් සිටීම් කැමති බැවින්ද, දෙසිමසෙහෙයාවට පැමිණ මෙසේ වදළසේකැයි කියා කාරණ දක්වා ධම්මඩිකාඋකසාඨවිරයන් විසින් එහි අතිවර්ණනා කරණලදි. ඒ කෙසේද? යත්:-

ඉදින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ පිරිනිවන් පානාතැනදී ආමිසපූජාව වලකා ප්‍රතිපත්තිපූජාවම උතුම්කොට නොවදළසේක් වීනම්; අනාගතයෙහි සත්ත්වයෝ සිල් පුරණතැනදී ශීලපූරණයෙහි නොයෙදෙන්නාහුය. සමාධිපූරණ තැන සිත එකඟකොට ගෙන සමාධිපූරණයෙහි නොයෙදෙන්නාහුය. විදර්ශනා පූරණතැන පඤ්ඤා නම්ගේ උදයව්‍යය දර්ශනවූ විදර්ශනා ඥානයන්විමෙහි නොයෙදෙන්නාහුය. උපාසකයන උපාසක උපාසිකාවන් සමාදන් කරවා ආමිස පූජා කිරීමෙහිම යෙදීන්නේය. මේ ආමිස පූජාව වළකා එක් දවසක් පමණවත් එකමකෙදක් මලදන කාලයක් පමණවත් මේ බුද්ධශාසනය දරාසිටුවන්ට නොහැකි වන්නීය. එහෙයින් මහාවිහාරය සදෘශවූ විහාර දහසක්ද, සදෘශ වූ චෛත්‍ය දහසක්ද කිරීමෙන්වත් ශාසනය පවත්වන්ට නො පිළිවන. ඒ සියලු පින්කම් යමෙකු විසින් කරණලදද ඒ ඔහුටම වෙයි. ඒ ආමිසපූජාව පිණිස පාඨීනාකොට බුදු රජද බුදුවූසේක් නොවෙති. එතුමහුගේ මහාප්‍රතිපත්තිපූජාවම තථාගතයන්වහන්සේට සුදුසුය. වර්ණනීයය. ඒ ප්‍රතිපත්ති පූජාවම ඒ බුදුන් විසිනුදු ප්‍රාර්ථනා කරණ ලද්දීය. එහෙයින් බුඩ ශාසනයාගේ ස්ථිතිවට ඔහොමෝ සමර්ථවන්නීය. ඒ කාරණයෙන් යම් භික්ෂු කෙනෙක් තමා විසින් ගරුකොටයුතුවූ බුඩ, ධම්, සඞ්ඝ, ශික්ෂා, ප්‍රතිසන්ථාර, අප්‍රමාද යන මේ සතැන්හි ගෞරව නැතිව බුදුන් පණවා වදළ ශික්ෂාපද ඉක්මවාද, එක්විසි අන්වෙනතෙන් ජීවිකාව කෙරේද, හෙතෙම ධම්ානුධම් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදන්නේ නොවෙයි. යම් භික්ෂුකෙනෙක් තමාට වැඩ පිණිස පණවා දුල සියලු ශික්ෂාපද නමැති ජීනවෙලාන්තය ජීනසීමාව ජීනකාලසූත්‍රය ඉතා සවල්ප මාත්‍රයක්වත් නොඉක්මවාද, අනුශාසනාප්‍රඥජීවූ පරිදෙන් ශික්ෂාපද රක්ෂාකෙරේද, මෙතෙම යහපත්ව ධම්ානුධම් ප්‍රතිපත්ති පූජා වශයෙන බුදුන් පුදන්නේවෙයි. භික්ෂුභික්ෂුණී ඌම ණෙර සාමණෙරි යන හැම පැවිදි තැන් විසිනුදු ප්‍රතිපත්ති පූජාවෙන් පිදීම මෙසේ මැනි. යම් උපායක කෙණෙක් පස්පව කිරීමෙන්ද දශ අකුශල කම්පථශෝධනයෙන් ගෙදී පව් කරන්නේ ඒ තමා හෙතෙම

ධම්මානුධම්මප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පූජාකරන්නේ නොවෙයි. යම් උපාසක කෙනෙක් සරණගමනාදියෙන් තුන් සරණෙහි පිහිටා පඤ්චසීල යෙහි දශසීලයෙහි පරිපූර්ණාචාරවත් සිල් රකියා කරේද, මාසයකට වරක් බැගින් පෙහෙවස් සමාදන්ව වාසය කෙරේද ශක්තිය පමණින් දන් දෙන්නේද, සුවිසුදු පූජාමල් පූජා කෙරේද, මවුපියන්ට උපස්ථාන කෙරේද ධාර්මික මහණබමුණන්ට උපස්ථාන කෙරේද මෙතෙම තමන්ට නියම වූ ධම්මානුධම්මප්‍රතිපත්ති පූජාවෙන් මනාකොට බුදුන් පූජාකරන්නේ වෙයි. උපාසිකාවන් විසින් ධම්මානුධම්මප්‍රතිපත්තිපූජාවන් පිදීමද මේ පරිදිමය. අනන්දය මේහේ උතුම්වූ ප්‍රතිපත්තිපූජාවෙන් යම් කිසි භික්ෂුභික්ෂුණී උපාසක උපාසිකා කෙනෙක් මා පූජාකරන්නේ විශාල හෝතම මාගේ ශාසන නාමැති අග්‍ර බුදුහේ පුන්‍යබලය යේ බලවත්කොයි මෙසේ ප්‍රශංසා කොට දක්වා වදාළසේක.

එසමයෙහි ආයුෂ්මත් උපවානස්ථවිරයන්වහන්සේ එසේ යම් හෙයි දෙර සැතපුනු භාග්‍යවතුන්වහන්සේගේ අනිමිවඛයෙහි සිට බුදුන්ව පවත් සලකින් සිටිසේක. එවිට බුදුහු දෙවතාවන්ගේ අතිප්‍රාය දැන මෙසිත් තොප පහවෙවයි වදාළසේක. එකෙණෙහි උන් වහන්සේද තල්විට අතින් තබා එතන් පස්ව සිටිසේක. ඒ දක අනඳමහතෙරුන වහන්සේ බුදුන් වැඳ භාග්‍යවතුන්වහන්ස මේ උපවානස්ථවිරයන්වහන්සේ ප්‍රථමබොධියෙහි පටන් උපස්ථාකව සම්පෑයෙහි කැපුරුණු කෙනෙක. දැන් කුසිත් පිණිස බුදුරජ අනිමිඛ යෙන් දුරුකළසේක් දැයි විවාළසේක. ආනන්දය අද රාත්‍රියේ පස් විමයාමයෙහි මාගේ පිරිනිවන් පාමියයි කියා තථාගතවූ මා දක්නා පිණිස දසදහසක් සක්වළින් මේ සක්වළට රැස්වූ දෙවතාවෝ ඉතා බෙහෙව. මේ කුසිනාරා නුවර සල්වනයට හත්පැසින් දෙලෝන් යොදුන් පමණ තැනින් මහෙසාක්‍ය දෙවතාවන් විසින් ස්පර්ශනොවූ කෙස්ලොම් අගක් අන්තෝමණුවූ භූප්‍රදෙශයකුදු නැත. බුදුරජ සමීපයෙහිවූ කෙස්ලොම් අගක් අන්තාපමණ කිමක සියුම්වෙස් ගෙණ මහෙසාක්‍යදෙවියෝ දසදහසදෙනා බැගින් සිටියානුය. එසිත් ඔබ්බෙහි එසා නැත විසිවිසිදෙනා බැගින්ද, එසිත් ඔබ්බෙහි එසේම තිස්තිස්දෙනා බැගින්ද, ඊවුන්ට ඔබ්බෙහිත් සතළිස්සතළිස්දෙනා හා ඔවුන්ට ඔබ්බෙහත් සැට්සැට්දනා හා යනාදී ක්‍රමයෙන් සියුම් වෙස් ගෙණ දෙවතාවෝ සැදිසිටිනාහ. එසේ ගහණවිනාවූද ඒ කාම ඔවුනොවුන්ගේ හස්තපාද වස්ත්‍රාභරණාදියෙක් නැතුවම බුබ ගෙරවයෙන් අන්ඳිදී සිටිනාහ. මේසා මහත් දිව්‍ය සමාගම බවු නෝවුන් සිත්සේ නිරුත්සුකවූ සෙසේ මුහුණ දක්නට අවකාශ නොලදින කලකිරුණු සිත් ඇත්තාහ. සවභාවයෙනුම මහත් ශරීරයක් ඇතිව පංඉකුලුවරයක් පෙරළාගෙණ මා අන්ත්‍රාවසානයෙහි සිටි මේ

උපවානසථවිර ඝණිණාශ්‍රව බැවින් හා පෙරත් කාශ්‍යපබුදුන්ගේ ධාතුචෛත්‍යය රක්‍ෂාවෙහි නියුක්ත මහානුභාවසම්පන්න දෙවතා වෙක්වූ බැවින් සෙසු දෙවියෝ පෘථග්ජන සඤ්ඤයන් විනිවිද දක්නාසේ තෙජස් අධික බැවින් මොහු විනිවිද දක්නට අසමර්ථ වන්නාහුය. ආනන්දය, ඒ කාරණයෙන් මා අභිමුඛයෙන් පහසොළෙමි. මාගේ පුත්‍රයාගේ අන් කිසි ඡෙෂයෙක් නැතැයි වදළසේක.

එකල්හි අනඳමහතෙරුන්වහන්සේ බුදුන් වැඳ මාගේ සවාමි දරුවූ බුදුරජානන්වහන්ස, ඔබවහන්සේගේ පිරිනිවන්පෑම දෙව තාවෝ කෙසේ සිත්හි කෙරෙද්ද, කෙසේ ඉවසද්දැයි විවාළසේක. එවිට භාග්‍යවතුන්වහන්සේ වදරණසේක් ආනන්දය, මාගේ පිරි නිවන් පෑම අරභයා ශොකාතුරව දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍ය සමූහයා අතුරෙන් පෘථග්ජනික දෙවතාවෝ උපන් ශොක දරාගත නොහී මේ ප්‍රකෘතිපොළුව දෙවතාවන් දැන්ට නොහැකී බැවින් අහස්හි පොළෝ මිදිමගණ එහි හඬාවැලපෙනාහු හිසකේ උනා විසුරුවාගෙණ ඊන්නවු පුපාතිල වැටියන්නාහුය. එතන මෙතන ඔසොබ වැටී පෙරළී විලාප කියන්නාහු ඉතා කඹනමින් අප බුදු රජ පිරිනිවන්පානසේක් අහෝ ලොව නුවණැස් අතුරුදන්වන් නේයයි යනාදී නොයෙක් කාරණා අපෙනා කියමින් දෙපස දිගු කොට එක්වීටෙක ඉදිරියට වැටෙන්නාහුය. එක්වීටෙක පිටිපසට එක්වීටෙක වමැලයට එක්වීටෙක දකුණැලයට දැවී වැටී හඬා පෙර ළෙන්නාහුය. නිශ්වලගුණයෙන් සිලාසථවිභවැනි පහවූ රාග දෙම් තස් ඇති අනාගාමී ඝණිණාශ්‍රවදෙවතාවෝ සිහිනුවණ ඵලවා ශොකය ඉවසන්නාහු සියලු සංස්කාරයෝම අනිත්‍යවන්නාහුය. එසේ නොව සථිරවස්තුවෙහි මෙහි කොසින් ලෑබෙදුයි කියා අනිත්‍ය සැලකිමෙන් ධර්මසංවේගයට පැමිණෙන්නාහුයයි වදළ සේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ බුදුන් වැඳ සවාමීන්වහන්ස, තථාගතශරීරයෙහි අපි කෙසේ පිළිපදිමෝ දැයි විවාළසේක. එවිට බුදුහු, ආනන්දය තථාගතශරීර පූජාවෙහි තොපි ව්‍යාපෘත නොවව. උත්සාහ නොකරව. ඵලමාත්‍රී නම්වූ රහත් ඵලයට පැමිණීමෙහි උත්සාහකරව. එම සවකියාඥානම් ලද රහත් ඵලයෙහි යෙදෙව. එම ආත්මාර්ථය සාදාගැන්මෙහි සිහියෙන් වෙන් නොව අප්‍රමාදව කෙලෙසුන් තවනාවීර්‍යයි වඩාගණ කාය ජීවිත දෙක නොඅලා ආත්ම ආලය හැර ප්‍රතිපත්තියම උතුම් කොට ගෙණ වාසයකරව. ආනන්දය කාරණ කාරණ දන්නා පණ්ඩිතනිලක්‍ෂණ වූ ක්‍ෂත්‍රියපණ්ඩිතයෝ ද බ්‍රාහ්මණ පණ්ඩිතයෝ ද ගෘහපතිපණ්ඩිතයෝ ද ලොව්තුන්නාහුය. ඔහුද තථාගතයන් වහන්සේ කෙරේද විශෙෂයෙන් ප්‍රසන්නසිත් ඇත්තාහ. එහෙයින් ඔවුහු තථාගත ශරීරපූජා කෙරෙති වදළසේක.

එකල්හි ආනන්දස්ථවිරතෙම එකාන්තයෙන් ඒ ක්ෂත්‍රියාදීහු මා විසාරනි. ඔවුන්ට කෙසේ මම ප්‍රතිවචන දෙමිදැයි සිතා මාගේ සවාමීවූ තථාගතඅග්‍රන්වහන්ස, තථාගතශරීරයෙහි කෙසේ පිළිපැද්ද යුතුදැයි විවාළසේක. ආනන්දය චක්‍රවර්ති රජදරුවන්ගේ ශරීර යෙහි පිළිපදනාසේ තථාගතශරීරයෙහිද පිළිපැදියුතුය. ආනන්දය තථාගත චෛත්‍යය සතරමංසන්ධියෙක්හි තබාදුතුයයි වදළසේක.

ආනන්දය චෛත්‍යකිරීමට නිසි පුද්ගලයෝ ලෝකයෙහි සතර දෙනෙක් වන්නාහුය. ඔහු කවරහු? යත්; තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධය, ප්‍රත්‍යේකබුද්ධය, තථාගතශ්‍රාවකය, චක්‍රවර්තිය යන මොහුයි. ආනන්දය, එසින් අදිවිශයෙන් යම් යම් සත්වකෙණෙක් තථාගත චෛත්‍ය දැක මේ තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ චෛත්‍යයයි ආදර උපදවා එහි මල්පහන් පුදවදුම් පිදීමෙන් හෝ ධජපතාක තැබීමෙන් හෝ වැඳීමෙන් හෝ සිත සතුටුවීමෙන් හෝ පින් රැස්කළාවූ විනම්, ඒ හැම කාබුන් මරණින් මත්තෙහි සුඛගීසංඛ්‍යාත දෙවිලොව උපදනාහුය. ආනන්දය මේ පසේ බුදුවරයන් වහන්සේගේ චෛත්‍යයයි ආදර උපදවා එසේම පිදීමෙන් හා සතුටුවීමෙන්ද බොහෝ සත්වයෝ දෙවිලොව උපදනාහුය. ආනන්දය මේ තථාගත ශ්‍රාවකයන්වහන්සේගේ චෛත්‍යයයි ආදර උපදවා මල්පහන් ආදියෙන් පිදීමෙන් හා සතුටුවීමෙන්ද බොහෝ සත්වයෝ දෙවිලොව උපදනාහුය. ආනන්දය මේ චක්‍රවර්ති රජහුගේ චෛත්‍යයයි ආදර උපදවා එහි මල්පහන් ආදියෙන් පිදීමෙන් හා සතුටුවීමෙන්ද බොහෝ සත්වයෝ දෙවිලොව උපදනාහුය. ආනන්දය, මෙසේ අවිවශයෙන්ම මේ බුබාදී ශ්‍රේෂ්ඨපුද්ගලයෝ සතරදෙන චෛත්‍යකිරීමට සුදුසුවන්නාහුයි.

නැවත බුදුහු වදරණසේක් ආනන්දය, ශම්කිසිකෙණෙක් පහන්සිතින් අසවල් විහාරය වඳිම්හයි කියා චෛත්‍යවන්දනාව පිණිස ඇවිදිනාහුද ඒ හැම ඒ ගමන් අතර කාලක්‍රියාකළහොත් නිසැකින්ම සුගතියෙහි උපදනාහුයයි වදළසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ සවාමීවූ බුදුරජානන්වහන්ස, ස්ත්‍රීන්කෙරෙහි අපි කෙසේ පිළිපැද්දමෝදැයි විවාළසේක. එවිට බුදුහු ආනන්දය ස්ත්‍රීන්ගේ නොදැක්මම පැවිදි නොපට උතුම් ශාසනප්‍රතිපත්තියෙකැයි වදළසේක. මෙසේ කුමක් පිණිස වදළසේක්ද? යත්; සෙනස්තට වැද දෙර වසා ගේ හුන් භික්ෂුතෙම යම්තාක්කල් වාරණයකි අවුත් සිපි ස්ත්‍රිය නොදක්නේද, ඒ තාක් ඔහුගේ ලොභය නූපදින්නේය. චිත්තයවලිත නොවන්නේය. දුක්ම අතිකල්හිම ඒ දෙකාරණයෝ උන්නාහුය. එහෙයින් ස්ත්‍රීන්ගේ නොදැක්මම වදළසේක. සවාමීන්වහන්ස භික්ෂාදනාදී කෘත්‍යය

කින් ස්ත්‍රීන්ගේ දුක්ම ඇතිවූකල්හි කෙසේ පිළිපැදියමෝදැයි විමසූසේක. ආනන්දය කථානොකිරීම උතුමැයි වදුලසේක. එසේ කුමක් පිණිස වදුලසේක්ද? යත්; ඉදින් කවුහුත් අත්ඇතිව මා හා සමග කථාකළහොත් මෙහි ම තාගේ හිසසිඳ ගෙලම් කියා සිටි මිනිසෙකු හෝ ඉදින් මා හා සමග කථාකලහොත් මෙහිම තා පටපටයන අඟුකරණපවත්වා කා විනාශකෙරෙමියි කියා සිටි යකින්නක් හෝ එක්ව පවත්වන කථාව හේතුකොට ගෙණ එයින් එක් අත්බැමකම් විනාසයවෙයි. අනන්තකාලයක් අපා දුක්විඳිමෙක් නැත. එහෙයින් ඒ උතුම; ස්ත්‍රියක හා සිහිනුවණින් දුරුම කථාකිරීමක් ඇති කල්හි විශ්වාස වන්නේය. විශ්වාස ඇතිකල්හි ඕනාර ඔහින්නසින් ඇති තැනැත්තේ ශීල හෙදයට පැමිණ එයින් සතර අපායකට පැමිණෙයි. ජාති ජරාමරණාදි සියළු දුකින් නොමිදෙයි. එහෙයින් කථා නොකිරීමම උතුම් ප්‍රතිපත්තියෙකැයි වදුලසේක. ඉදින් සවාස්වූ බුදු රජානන්වහන්ස, යම් ස්ත්‍රියක් දවස හෝ විවාහනම් සිල්සමාදන් වීමට හෝ ශාවකකලාහනම් බණඇසීමට හෝ කැමතිවූවා නම් ප්‍රත්‍යයක් හෝ විවාහනම් ප්‍රව්‍රජිතයන් විසින් කලමනා කම්බදුවූ හෝ කාන්‍යයක් පැමිණේවේනම් එබදු කථාකිරීමක් ඇතිවූකල්හි කථානොකොට තුෂ්ණීම්භූතවීම නුසුදුසු බැවින් එකාන්තයෙන්ම කථාපැමැත්වීම යුතුවෙයි. එබඳ කථාපවත් වන පැවිදිතැන් වියින් කෙසේ පිළිපැදිද යුතුදැයි පිළිවිසිවිට මවුතෙතුරෙහි තබාගැන්මට නිසි ස්ත්‍රියකෙරෙහි මාතෘ චිත්තය පිහිටුවා ගැන්මෙන් හා හහිනිධිභාව වීමට තරම්වූ ස්ත්‍රීන් කෙරෙහිද හහිනිධිතා ඇත් පිහිටුවාගෙණ මෙසේ සිහිනුවණින් ගෙදී ස්ත්‍රීන් හා කථා කිරීම සුදුසුයයි වදුලසේක.

ඉක්බිත්තෙන් අනඳමහතෙරුන්වහන්සේ අහෝ අද එකාන් තයෙන් ඉදුරජ පිරිනිවන්පානෘස්කැයි සිතා බලවත් දෙම නෘව පැමිණ මෙසේ බුදුන් සම්පෘඥයෙහි සිට හැඬීම ඇසුනො වෙයි. එක්පාශියකට ගොස් හැඬිමෙන් ශොක තුනීකෙරෙ මියි සිතා එයින් ගොස් මණ්ඩලමාලයට වැද අතුල්ටැඹෙහි එල්බසිට හඬමින් මම වනාහි සෝවාන්වූ බැවින් ශෛක්ෂයෙමි. රහත්නොවූ හෙයින් මත්තෙහි කළමනාකටයුතු ඇත්තෙමි. මාගේ ශාස්තෘවූ බුදුරජද පිරිනිවන් පානසේක. දැන් සෙට දවස පවන් කවරක් හට මුඛඩොවන පැන්දෙම්ද, කවරක්හට පාදඩොවන පැන් දෙම්ද, කවරක්හුගේ පාදඩොවනය කෙරෙම්ද, කවරක්හුගේ සෙනසුන්වත් කෙරෙම්ද කවරක්හුගේ පාසිවරු ගෙණ අනුව හැසිරෙම්දැයි යනාදි කොයෙක් අදෙනා කියමින් බොහෝසෙ හැඬුසේක. එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසඞ්ඝයාමඩ්‍යයෙහි ආනන්දස්ථවිරයන් නොදැක මහණෙනි,

ආනන්දස්ථවිර කොසිඹියෝදැයි විචාරා වදුළසේක. සවාමිනි මණ්ඩල මාලයට වැද අතුල්වැඩෙහි එල්බ හඬනසේකැයි දැන්වූකල්හි ඒ අසා භාග්‍යවතුන්වහන්සේ එක්තරා හික්ෂූනමක් කැඳවා මහණ තෙපි ගොස් මාගේ වචනයෙන් ආනන්දයා කැඳවවයි වදුළසේක. එවිට උන්වහන්සේ එසේස වහන්සැයි කියා ගොස් එපවත් දැන්වූකල්හි අනදමහ තෙරුන්වහන්සේ බුදුන්හරා පැමිණ වැද එකත්පස්ව හුන්සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආනන්දය තෙපි හඬාවැලපා සෝකාකිරීමෙන් ප්‍රයෝජනකිම්ද? ලොව සියළු ප්‍රියමනාපයන් කෙරෙන් වෙන්වන බව්‍ය යන මේ කාරණය මා විසින් පළමුකොටම කියන ලද්දේනොවේදැයි යනාදී වශයෙන් නොයෙක් කාරණා දක්වා වදරා; ආනන්දය, බොහෝ දීඝකාලයක් හථාගතයන්වහන්සේ තොපවිසින් මෛත්‍රීන් යුක්තවූ අප්‍රමාණ කායවාඩ්මනෝ යන ත්‍රිවිධකර්මයෙන් අප්‍රමාදව ගිතයෙන්ම උපස්ථාන කරණලද්දේය. එහෙයින් ආනන්දය, තෙපි කල්පලක්ෂයක් අනිනීහාරකරණ ලද්දෙහිය. පින් ඇත්තෙහිය. එසේවූවත් මෙපමණකින් නහමක් විශ්වාසවව. ප්‍රමාද නොව වියාී කිරීමෙහි යෙදෙව. එසේ ඇතිකල්හි වහාම අනාශ්‍රවව ධර්මසංගායනා කාලයෙහි රහත්ඵලයට පැමිණෙන්නේය. මාවැනි බුදුකෙනෙක්නව කරණ ලද උපස්ථානය තොපට නිෂ්ඵල නොවන්නේයයි යනාදී කාරණා ප්‍රකාශකොට දෘඪවිය ප්‍රස්තාරකරන්නාසේ ආනාශය විස්තාර කරන්නාසේ වක්‍රවාටය උපුටන්නාසේ මහාමෙරුව තගන්නාසේ ආයුෂ්මත් අනදමහතෙරුන්වහන්සේගේ ගුණය නොයෙක්පරිද්දෙන් භික්ෂූසඞ්ඝයාට දක්වාවදුළසේක.

ඉක්බිත්තෙන් අනදමහ තෙරුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට දන්වනසේක් සවාමීන්වහන්ස, මෙනුවර වැනි සම්බාධවූ මේ ක්ෂුද්‍රපුරයෙහි උජ්ජඞ්ගලනම්ලද විෂම පුරයෙහි සාධා පුරයෙහි නහමක් පිරිනිවන්පානසේක්මා. අභ්‍යවූ වම්පානුව රය, රජගහ නුවරය, සැවැත් නුවරය, සාකෙත නුවරය, කොසම්බ්‍යනුවරය, බරණැස් නුවරය යන මේ ප්‍රසිඛ නගරයන් අතුරෙන් එක්තරා නුවරෙක පිරිනිවන් පානසේක්මා. එහි ක්ෂත්‍රිය මහාසාලාදීහු බුදුන්සෙරෙහි ඉතාප්‍රසන්නයහ. ඔවුහු තථාගත ශරීරපූජාකරන්නාහුයි ආරාධනා කළසේක. එකල්හි බුදුරජ ආනන්දය ක්ෂුද්‍රනගරයයි එසේ නොකියව. පෙරවූදෙයක් කියම් වදරා තමන්වහන්සේ පූර්වයෙහි සුදර්ශනනම් චක්‍රවර්ති රජව දශවිධ ශබ්දයෙන් එකකොලාහලවූ සියලු සම්පත්තියෙන් සමාඛවූ දෙවනුවරක්වැනි එකලව කුසාවතිනම් රාජධානි නම්ලද එම කුසිනාරානුවරෙහි දිවයිරි වැනි රජසිරි විඳිවව ප්‍රකාශකොට මහාසුදර්ශන සූත්‍රදෙශනාව නිමවාවදුරා ආනන්දය තෙපි ගොස් කුසිනාරානුවර මල්ලරජදරුවන් මා දක්නට වහා

කැඳවයි වදුලසේක. ඒ ඇසූ අනදමහතෙරුන්වහන්සේ එසේය
සවාමීන්වහන්ස‍යි කියා භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී
මහාකෙට හැඳ:පරව පාසිවුරුගෙණ තමන්වහන්සේ දෙවෙනි
කොට අනික් භික්ෂූනමක් හා සමග කුසිනාරානුවරට වැඩ
කිසිකාරණයකින් සන්ථාඝර නම් මන්ත්‍රණශාලාවෙහි රැස්ව
බුදුන් වැඩිබවද දැනදැනම සිරි මල්‍යරජදරුවන් කරා පැමිණ
එදවස් රාත්‍රියගේ පශ්චිමයාමයෙහි බුදුරජ පිරිනිවෙන් පානා
ප්‍රවෘත්තිය ඔවුන්ට දන්වා, වාසෙට්ඨය, වහා නික්මෙව. අපගේ
නුවර පිරිනිවන්පානා බුදුන් පශ්චිමකාලයෙහි අපි දක්නට
නොහැකිවුම්හයි නැඳින පිපිළිසර නොවුව මැනවයි වදුලසේක.

එසෙණෙහි ඒ ප්‍රවෘත්තිය ඇසූ සියලු මල්‍යරජදරුවෝද මල්ල
රාජකුමාරයෝද මල්ලෙහෙලිනියෝද මල්ලප්‍රජාපතියෝද ඝන
හැමදෙනම උපන් දුක්ඇතිව කිසියම්සතුටක් නැතිව විත්ත
දුකසයෙන් දෙමිනසින් සුසානව හඬමින් වලපමින් යන්නාහු
සමහරෙක් හිස කේපත විදහා ගැන්මෙන්ද සමහරෙක් හිස අත
බැදිමෙන්ද හඬති. ශිල්ලාප්‍රපාතයෙහි වැටීමෙන් වැටී බිමි
තොබ පෙරළිපෙරළී හඬහඬා අහෝ ඉතාඝනිනමින් අප භාග්‍ය
වතුන්වහන්සේ පිරිනිවන් පානාසේකැයි යනාදී නොයෙක්
අදෝනා කියමින් ඒ හැම ප්‍රදීපමාලාදීවූ පුජාසත්කාරයන්
ගෙණ සල්වනයට ගොස් අනදසාමීන්ට දැන්වූකල්හි අනද
සාමීන්ගේ දක්ෂතායෙන් වහා බුදුන් දක්වා නිමවන පිණිස
ඒ සියලු රජදරුවන් එකිනෙක කුලපරිවර්තන වශයෙන් කුලසං
ක්ෂෝභවිසභාගවශයෙන්ද වෙන්වෙන්ව කොට්ඨාසකොටගෙණ
බුදුන් දක්වන වේලෙහි, සුභාමීන්වහන්ස, පුත්‍රභාර්‍යාදීන්
අමාත්‍යපරිවාරජනයන් සහිතවූ මෙනම් මල්‍යරජතෙම මසසාන
යෙන් ශ්‍රීපාදයන්වදනේයයි දන්වදන්වා මේම උපායෙන් ප්‍රථම
යාමයෙහිම සැටදහසක් මල්ල රජදරුවන් බුදුන් වදවා නිමවූ
සේක එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ මල්‍යරජදරුවන්ව
අනිත්‍යතාප්‍රතිසංයුක්තවූ ධර්මදේශනා කොට අවසරදෙවා වදුළ
සේක.

එසමයෙහි අයූතෙළක් ධන නිධානගතව තබාවනු විසිඅමුණක්
දවස අයවෙමින් දශඅමුණක් ව්‍යයවන උදිවව බ්‍රාහ්මණ
මහාසාර කුලයෙන් බාහිර ශාසනයෙහි පැවිදිවූ, සුභද්‍රනාම පරි
ව්‍රාජකතෙම එම කුසිනාරානුවර වාසයකර නේය. හෙතෙම අද
රෑ පශ්චිමයාමයෙහි යමසාශාලානන්තරයෙහි බුදුන්ගේ පිරිනිවන්
පෑම වන්නේයයි යනු අසා තමා පෙර කොණ්ඩඤ්ඤ නම්
මහ තෙරුන් හා දෙබෑකෙනෙක්ව එසා ඇල්ලෙනෙන් නව අග්‍ර
දානයක් දෙනකල්හි පළමුකොටම එක්වගත කාහි අරහතම
ඵලයෙන් අනතිම ශ්‍රාවකවන බැවින් බුදුන් දක්මෙහි හවගත්

උත්සාහ ඇතිව බුඩොත්පාදය ලැබීම දුර්ලභයයි සිතා භාග්‍යවතුන් වහන්සේ කෙළවර දුක ප්‍රත්‍යවේක්ෂණ කරමින් ගොස් රිට අවකාශ යක් බලනුයේ අනදමහතෙරුන්වහන්සේකරා පැමිණ පින්වත් ආනන්දඝවීරයෙනි, මම දෙතුන්රාජපරම්පරාවක් ඉක්මූනාවූ වයොවෘඩ මහලු ආචාර්යවරයන් ගෙන් අසිත් සම්‍යක්සම්බුඩ තථාගතයන්වහන්සේ ලොකයෙහි කිසිකලෙක්හි උපදනාසේ සැයි යනමේ වචනය ඇසීමි.

ඒ තථාගතතෙම අදරාධියගේ පශ්චිමයාමයෙහි පිරිනිවන් පාන්සේක්ලු, මාගේ ශංකාධර්මයෙක් ඇත. ඒ කාරණය විසඳ බුදුරජ ධර්මදේශනාකළසේක්විනම් මේ ලබ්ධිය හැර ඔබසරණ යෙමි. එහෙයින් ආනන්දඝවීරයන්වහන්ස, ඒ ශ්‍රමණ හවත් ගෞතමයන්වහන්සේගේ දැක්මට අවකාශ ලදම්නම් ඉතා යෙහෙකැයි දන්වූයේය. ඒ අසා අනදමහතෙරුන් වහන්සේ "අලං ආවුසො සුභද්‍ර මා තථාගතං විහෙඨෙහි" යනාදීන් දන් වතසේක් මේ අන්‍යතීර්ථකයෝ නම් තමන් ගත් දෘෂ්ටිය නොහැරගන්නාහුය. දෘෂ්ටිය හරවන පිණිස බොහෝකොට වදරන්නාවූ භාග්‍යවතුන්වහන්සේට වෙහෙසවන්නේය. දැන් සවභාව යෙන්ම ක්ලාන්තසේකැයි සිතාවදරණසේක් "ඇවැත්වූ සුභද්‍රය මෙතෙක්කල් නෝ ප්‍රමාදව සිට දැන් තථාගතයන්වහන් සේට වෙහෙස නොකරව. භාග්‍යවතුන්වහන්සේ ක්ලාන්තය" සි දන්වූසේක.

ඒ පරිබ්‍රාජකතෙම මේ නිඝ්‍රන්තම මට අවකාශ නො දෙනසේකැයි සිතා ප්‍රයෝජනයක් ඇත්තහු විසින් අනුව පැවැත්මෙන් නැවත නැවතත් යාචඤ්ඤියයුතු බැවින් දෙවනු තුන්වනුවවද එසේම අනදඝමීන්ට යාචඤ්ඤාලකල්හි නැවත නැවතත් අනදමහතෙරුන්වහන්සේ සම්පවාරයෙහි සිට එසේ වළකාවදරණ ඒ ප්‍රඥප්තිය බුදුරජ ප්‍රකෘතිශොත්‍රයෙන්ම අසා වදරම්නම් ඒ සුභද්‍රයාට වැඩපිණිස මහත් උත්සාහයෙන් විතෙයජනානුකම්පා ඇති තමන්වහන්සේ වැඩ බැවින් කරුණා පරිහාවිත වචනයෙන් "අලං ආනනදාති" යනාදී ක්‍රමයෙන් ආනන්දය, සුභද්‍රයා නොවළක්වව, හෙතෙම යම්කිසිවක් මා විවා රන්නේවි නම් ඒ සියල්ල දැනගන්නා කැමැත්තෙන්ම විවා රන්නේය. මා වෙහෙසන පිණිස විවාරන්නේ නොවෙයි. ඕහට මම මදක් කිකල්හි හෙතෙම වහාදැනගන්නේය. එහෙයින් ආනන්දය සුභද්‍රයාට මාදක්නට අවකාශදෙවයි වදළසේක. එකල්හි ආනන්දඝමීන් දුන් අවසරයෙන් බුදුන් දක්නට ගොස් වැඳ භාග්‍යවතුන්වහන්සේ හා සමග පිළිසඳරකථාකොට එකත්පස්ව හිඳ දන්වනුයේ හවත් ගෞතමයානන්වහන්ස, පූරණකාශ්‍යප මක්ඛලිගොසාලාදීන්ගේ ප්‍රතිඥෝ නෛයාත්‍රානික වේදෙහෝ නොවේදෙහෝයි කියා අන්‍යතීර්ථක ලබ්ධි ප්‍රතිසංයුක්තවූ ප්‍රශ්න යක් විමාලේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ

ප්‍රතිඥ අසෙඛ්‍යනිකහාව කථනයෙන් නො ගෙදීමෙන් ද අවකාශ නැති බැවින් ද "අලං සුභද්‍ර" යනුවෙන් ඒ වචනය ප්‍රතික්ෂෙප කොට වදුරා ඔහට සුදුසු පරිද්දෙන් ධර්මදෙශනා කරණසේක් සුභද්‍රය යම් ධර්මවිනයෙක්හි "අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ න උපලබ්භති" යනාදි ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ග දක්නට නො ලැබේ ද, සෝවාන් වූ පළමු වෙනි ශ්‍රමණ ද එහි නැත්තේය. දෙවෙනි වූ සකෘදාගාමී තුන් වෙනි වූ අනාගාමී ඝතරවෙනි වූ රහත්ශ්‍රමණ ද එහි නැත්තේ යම් ප්‍රථම දෙශනාවෙන් මෙසේ අනියමයෙන් වදුරා කැවත තමන් වහන්සේ ශාසනය නිරූම කොට වදුරණසේක්; සුභද්‍රය මේ ධර්ම විනයෙහි එම ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දක්නට ලැබෙන්නේය. මෙහි ම සුභද්‍රය පළමුවෙනි සෝවාන් ශ්‍රමණ ද දෙවෙනි සකෘදාගාමී ශ්‍රමණ ද තුන්වෙනි අනාගාමී ශ්‍රමණ ද සතරවෙනි රහත් ශ්‍රමණ ද ඇත්තේය. මෙහින් පිටත් අනෘවාදීහු දුටු සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන මෙම මාර්ගඵල වශයෙන් අටදෙනෙකු හා අන්‍ය වූ සතර ආර්‍යපුද්ගලයන්ගේ ප්‍රතිලාභය පිණිස විදර්ශනාභාවනා වඩා උත්තම කරණ ආරබ්ධ විදර්ශකයන් සතර දෙනා හා යන මේ දෙලොස්දෙනෙක් ම සිටි ආර්‍යශ්‍රමණයන්ගෙන් හිස් වන්නාහුය. සුභද්‍රය මේ ශාසනයෙහි ශ්‍රමණයෝ තමතමන් පැමිණි මාර්ගඵලයන් අනිකක් අනිකක් කව් කියාදී ඒ සෝවාන් මාර්ගාදියට පමුණුවන්නේ වේද, ඒ ආරබ්ධ විදර්ශක භාවනාදියෙහි යෙදී වසන්නාවූ තමන්ට ප්‍රගුණ වූ කර්මස්ථානය කියාදී අනිකකු සෝවාන්මාර්ගාදිය පිණිස ආරබ්ධවිදර්ශක කරන්නේ වේද, සුභද්‍රය මේ ශාසනයෙහි ඒ මාදෘශවිධ වූ භික්ෂුහු මහා විහරණයෙන් එසේ ගමන්නක් කල් වසය කරන්නාහු වෙද්ද, ඒ තෘක් කල් රහතුන් ගෙන් ලෝකය හිස් නො වන්නේ යැයි වදුළසේක.

නැවත ද බුදුරජ වදුරණසේක්; සුභද්‍රය, එකුන්තිස්වයස් කල මම සම්බුදුකාඥන ඥාන්‍යාත උතුම් කුසලපරියෙසනයෙන් පැවිදිවිමි. ඒ පැවිදි වූ තැන් පටන් සමාධික වූ පණස් වසියෙක. සුභද්‍රය, උතුම් ආර්‍යශ්‍රාවක සංඛ්‍යාත අෂ්ටාඞ්ගිකමාර්ගයාගේ ම ප්‍රදේශයක් ව සිටි විදර්ශනාභාවනා මාත්‍රයෙක්හිදු පැවැත්මෙන් හැසිරෙන්නාවූ එහෙයින් ප්‍රදේශවර්ති වූ ද මාගේ ශාසනයෙන් පිටත් අනික් ශ්‍රමණයෙක් නැත. ඒ ප්‍රථම ශ්‍රමණ වූ සෝවාන් ආදි මාර්ගඵලලාභීහු ද එහි නැතැයි වදුළසේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න විසර්ජනයෙන් ධර්ම දෙශනා කර වදුල කල්හි සුභද්‍ර නම් පරිබ්‍රාජක තෙමේ ත්‍රිපාදවූල ගෙහි වැද භෞව භාග්‍යවතුන්වහන්ස, ඔබවහන්සේගේ ධර්මදෙශනාව

ඉතා ඇගවයිය, ඉතා අද්භුතය. අනේකප්‍රකාරයෙන් දෙශනා කර වදාළ ඒ ධර්ම ශ්‍රවණයෙන් ප්‍රසන්න වූ මේ භාග්‍යවතුන් වහන්සේ ද ධර්මයද සඞ්ඝයා ද සරණ යෙමි. භාග්‍යවතුන් වහන්සේගේ සමීප යෙහි මට පැවිදි උපසම්පදා දෙවා වදාළ මැනවැයි ආරාධනා කෙළේය. ඒ අසා වදාරා භාග්‍යවතුන් වහන්සේ සුභද්‍රය; මේ ධර්මවිනයෙහි යම්කිසි අන්‍ය තීර්ථකයෙක් ප්‍රව්‍රජ්‍යොපසම්පදාව කැමති වූයේ නම් චතුර්මාසයක් පිරිවස්වා බලා සාරම්භයන්ගේ ඇතැම් න් ආරාධනා ඇති හෙවත් කැමති වූ භික්ෂූහු ඔවුන් පැ දිවාරෙහි වදාළ කල්හී සුභද්‍ර පරිව්‍රාජක කියනුයේ ඉදින් සර්වඥයින් වහන්ස, මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව කැමති අන්‍ය තීර්ථකයෝ එසේ සාරම්භයක් පරිවාස වසන්නාහු චතුර්මාසයින් වහන්ස, යහතැ අවුරුද්දක් වෙමි. ඒතාක් කල් බලා සතුටු සිත් ඇති භික්ෂූහු මා පැවිදි කොට උපසම්පදා කරණසේක්ලෝවයි කියා කැවතත් පැවිදි වීරිය ආරාධනා කළ කල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් කැඳවා ආනන්දය, සුභද්‍රයා පැවිදි කරවයි වදාළසේක. එකෙණෙහි ඒ සේය, ස්වාමීන් වහන්ස යි කියා අනඳමහතෙරුන් වහන්සේ ප්‍රතිවචන දී ඒ පරිව්‍රාජකයා එක් පාර්ශ්වයකට කැඳවාගෙණ පැන් ලබ්බෙන් දිය දී හිස තෙමවා තවත්සඳුක කම්ස්ථානය කියා දී හිසකේ රවුලු කප්පවා කාෂාය වස්ත්‍රයන් හඳවා තුන්සරණ දී බුදුන් සමීපයට නෙණ ආසේක. එවිට බුදුරජ උපසම්පදා කොට කමටහන් ඉගැන්වූසේක. පශ්චිමශ්‍රාවක වූ හෙතෙම ඒ කම්ස්ථානය ගෙණ එම සල්ලැයතෙහි එක් පාර්ශ්වයෙක ඔක්මත් කරමින් විදර්ශනා වඩා එකෙණෙහි සිවිපිළිසිඹියා හා සමඟ රහත් ඵලයට පැමිණ අවුත් බුදුන් වැඳ මහඟඟ මැද වැඩහුන්සේක.

එදවසම මධ්‍යමයාමය අතික්‍රාන්තව පශ්චිමයාමය පැමිණිකල්හි භික්ෂුසඞ්ඝයාවහන්සේට බුදුරජ අවවාදකරණසේක් ආනන්දස්ථවිරයන් කැඳවා ආනන්දය, තොපට අපගේ ශාස්තෘන්වහන්සේ දැන් නැත. එහෙයින් ශාස්තෘපාවවන ඉක්මිනැයි යන මෙසේවූ විපිළිසරයෙක් වන්නේන, ආනන්දය ඒ එසේ දැක්කයුතු නොවෙයි. ආනන්දය මා විසින් තොපට යම් ධර්මවිනයෙක් දෙසනලදද අණ වන ලදද ඒ ධර්මවිනයතෙම තොපට මා ඇවැමෙන් ශාස්තෘකම් වනසේකැයි යන කාරණය දක්වා වදාරණසේක් "ආනන්දය, ජීවත්වසිටියාවූද මා විසින් වකාහි මේ ලහුකා පත්තියය, මේ ගරුකා පත්තියය, මේ සතෙකිවජ්ජය, මේ අනෙකිවජ්ජය, මේලොක වද්‍යය, මේ ප්‍රඥප්තිවද්‍යය, මේ වරද පුද්ගලසම්පත්තියෙහි ශුද්ධවන්

නේය, මේ වරද ගණ්ඩඃසම්පයෙහි ශුඛවන්නේය, මේ වරද සඛ සම්පයෙහි ශුඛවන්නේයැයි කියා සප්තාපත්තිස්කන්ධවශයෙන් ඛණ්ඩපරිවාරවූ උභතොවිභඞ්ග මහාවිනය නම්වූ යම් විනයපිටක යෙක් දෙශකලදද ඒ විනයපිටකය මා පිරිනිවිකල්හිද තොපට ශාස්තෘකෘත්‍යය ඉදන්නේය. ජීවත්ව සිටින්නාවූද මා විසින් මේ සතරසතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චේන්ද්‍රිය පඤ්චබලය, සප්තබොඛ්‍යඞ්ගය, ආර්‍යඅෂ්ටාංගික මාර්ගයයි කියා ඒ ඒ ආකාරයෙන් මේ මේ ධර්මයන් විභාග කොට සූත්‍රපිටකය දෙනලදද; ඒ සියලු සූත්‍රපිටකය මා පිරිනිවි කල්හිද තොපට ශාස්තෘ කෘත්‍යය ඉදන්නේය. ජීවත්ව සිටින්නාවූද මා විසින් මේ පඤ්චස්කන්ධය, ආදර්‍යායතනය, අවිද්‍යාඥාතෘෂ්ණය, චතුඃසත්‍යය, ඉන්ද්‍රියත්‍රිත්වය, ප්‍රතීත්‍යසමුත්පාදය, චතුර්විධ ආහාරය, සප්ත ස්පර්ශය, සප්තවේදනාය, සප්තසංඥය, සප්ත චේතනාය, සප්ත චිත්තය යැයි කියා එහිදු මෙතෙක් ධර්මයෝ කාමාවචරයහ. මෙතෙක් ධර්මයෝ රූපාවචරයහ. මෙතෙක් ධර්මයෝ අරූපාවචරයහ. පරියාපන්නයහ. අපරියාපන්නයහ. ලෞකිකයහ. ලෝකොත්තරයහයි කියා, මේ ධර්මයන් විභාගකොට සුවිසි සමන්තපට්ඨාන අසංඛ්‍ය නය මහාපට්ඨානයෙහි ප්‍රකීර්ණකීර්තිවූ යම් අභිධර්ම පිටකයෙක් දෙශනාලදද; ඒ සියලු අභිධර්මපිටකය මා පිරිනිවිකල්හිද තොපට ශාස්තෘකෘත්‍යය ඉදන්නේය.

මෙසේ අභිසම්බෝධියෙහි පටන් පිරිනිවන්පෑමදක්වා පන්සාළිස් හවුරුද්ද ඇතුළත දෙශනාලද මේ සියලු තුන්පිටකය, පඤ්චනිකාය, නවාඞ්ගධර්මස්කන්ධවශයෙන් මෙසේ ප්‍රභේදගත මහත් අසූහාරදහසක් ධර්මස්කන්ධයෝ තොපට අනුශාසනා පිණිස සිටිනාහුය. මම එකලාව පිරිනිවන්පාමිය. දැන් මම එකලාව හිඳ තොපට අවවාදානුශාසනා කෙරේමි. මා පිරිනිවිකල්හි ශාස්තෘ නම් ලද ධර්මස්කන්ධ සංඛ්‍යාත මේ අසූහාරදහසක් බුදුවරයෝ තොපට අවවාදානුශාසනා කරන්නාහුයයි මෙසේ බුදුරජ බොහෝ කාරණා දක්වා වදාළසේක.

නැවත බුදුරජ භික්ෂූන්ගේ අභාගතාචාරය දක්වනසේක් ආනන්දය, දැන් මා ඇතිකල සියලු භික්ෂූහු ඔවුනොවුන්ට ආවුසො, ආවුසොයි, කියා ආවුසෝවාදයෙන්ම කථාකරන්නාහුය. මාගේ ඇවැමෙන් ඔවුනොවුන් මෙසේ කථාකවුත්තේය. කෙසේද?යත්; ආනන්දය, සථවිරභික්ෂූන් විසින් නවකතර භික්ෂූන්ට නවකයයි නොකියා, ලෞව ව්‍යවහාර නාමයෙන් හෝ, ගොත්‍රයෙන් හෝ, ආවුසෝවාදයෙන් හෝ කථා පැවැත්විය යුතුමැ. නවකතර භික්ෂූන් විසින් සථවිරවූ ජ්‍යෙෂ්ඨතරභික්ෂූන්ට ගත්තෙයි, කියා හෝ ආයස්මාතියි, කියා හෝ භන්තෙ නම්හ, ආයස්මා නම් සයහි, කියා හෝ මෙසේ ඔවුනොවුන් කෙරෙහි මෙහිත්මතු

කථාපැවැත්විය යුතුයැයි වදාළසේක. ආනන්දය, සඞ්ඝසම්මත කැමැත්තේවීනම්, මා ඇවැමෙන් ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද සමූහයන් කය කෙරේවයි කියා එකාසනයෙන් සෝවදාරා එකල්පවරන ලෙස් මහාකාශ්‍යපස්ථවිර ධර්මසඞ්ගායනා කාලයෙහි දුෂ්කාශ්‍රව, දුර්භාෂිත යන ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපද නොහරණබව දැනවදාර මිත්‍ර ශික්ෂාගාරවාදී සඞ්ඝගුණ ප්‍රකාශවන පිණිස මෙසේ වදාළ සේක. ආනන්දය ඡන්නනම් භික්ෂූහු මා ඇවැමෙන් බ්‍රහ්මදණ්ඩකර්ම කවියයුතුයැයි වදාළකල්හි ආනන්දස්ථවිරතෙම සවාමීන්වහන්ස බ්‍රහ්මදණ්ඩවනැම් කවරේදැයි විවාළසේක. ආනන්දය, ඡන්න භික්ෂූන් යම්සේ කැමතිනම් ඒ කියන්නේහි, හෙතෙම භික්ෂූන් විසින් කියයුතුනොවෙයි. අවවාදකවයුතුනොවෙයි. අනුශාසකයා කැරයුතු මනාවෙයි කියා මේ බ්‍රහ්මදණ්ඩවමෙහි හෙතුම හැරිය යුත්තේයැයි වදාළසේක. කැවත භික්ෂූඅඹැයෝ වහන්සේට අඩකාවදරා, ඉදුව වැඩිවුන් පන්සාළිස් අවුරුද්දද මුළුල්ලෙහි දෙසූ සියළු ධර්මයෙහි ශඞ්කාවිමතියෙක් නොවව් ආදීදැයි විවාරා වදාළතැන ඒ සියලු ධර්මය සඞ්ගරන්නය කෙරෙහි මනාව පිහිටිබව දැන අනඳමහ තෙරුන් වහන්සේ විසින් ප්‍රශංසා කිරීමෙන් සියලුධර්මය සඞ්ගිරව අනුභව අනධිකව පවත්වනාබව ප්‍රකාශවිය.

එකල්හි සදීලෝක පූජ්‍යපූජනීය මාඇන්ගේ සවාමිදරුවූ බුදුරජාන් වහන්සේ භික්ෂූඅඹැයාට අඩකාවදරා "භූතපුබ්බං භික්ඛවේ ආමන්තනාමි වෝ වඃධම්මා සඞ්ඛතධම්මා අපපමාදෙන සම්පාදෙථ" යනුයෙන් පන්සාළිස් අවුරුද්ද මුළුල්ලෙහි සියලු දෙනකෑ ඔව් දෙසනලද සියලු බුඬවචනදැන් මේ එකම අප්‍රමාද පදයෙහිම ඇතුළත් කොට මේ පශ්චිම බුඬවචනයෙන් මුලුලෝවැසියන්ට අවවාදකොට ඒ කාරණයට පැමිණ තුෂ්ණීම්භූතවීමෙන් හා භාග්‍ය වතුන්වහන්සේ ප්‍රථමධ්‍යානයට සමවැදුන්සේක. ඒ ප්‍රථමධ්‍යානයෙන් නැගී ද්විතියධ්‍යානයට සමවැද, ද්විතියධ්‍යානයෙන් නැගී තෘතියධ්‍යානයට සමවැද, තෘතියධ්‍යානයෙන් නැගී චතුර්ථධ්‍යානයට සමවැද, චතුර්ථධ්‍යානයෙන් නැගී ආකාසානඤ්චායතන සමාපත්තියට සමවැද, එයින් නැගී විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවැද, එයින් නැගී ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැද, එයින් නැගී නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවැද, එයින් නැගී සඤ්ඤාවේදයිත නිරොධසමාපත්තියට සමවැදුන් සේක. ඒ සඤ්ඤාවේදයිත නිරොධ සමාපත්තියට සමවන්කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාස සංඛිදින. එකල්හි ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ ඒ ආශ්වාස ප්‍රශ්වාස යන්ගේ නොවීම දැක ආයුෂ්මත් අනුරුඬ සථවිරයන්වහන්සේට සවාමිවූ අනුරුඬ සථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේකැයි දැන්වූසේක. ඇවැත්වූ ආනඳසථවිරය, භාග්‍ය වතුන්වහන්සේ පිරිනිවන්පැසේක් නොවෙයි. සඤ්ඤාවේදයිත නිරෝධසමාපත්තියට සමවන්සේකැයි දැන්වූසේක. අනුරුඬ සථවිරයන්වහන්සේ වනාහි භාග්‍යවතුන්වහන්සේ හා සමග ඒ

නිරෝධ සමාපත්තියට සමවන්නේක් යම්තාක් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තීන්ගේ නැගීම ද, ඒතාක් නැන් සමවැදී මෙන් ගොස් දැන් දැන් මේ භාග්‍යවතුන් වහන්සේ නිරෝධසමාපත්තියට සමවන්සේක. ඒ නිරෝධසමාපත්තිය ඇතුලෙහි විත්තය පවතිමින් සිටි කල්හි කාලක්‍රියාකිරීමෙක් නැතැයි දැන මෙසේ වදාළසේක.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ඒ සඤ්ඤාවෙදයිත නිරෝධසමාපත්තියෙන් නැගී, අනුලෝමක්‍රමය නිමවා ප්‍රතිලෝම යෙන්ද සමවදනාසේක්; නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට සමවැද, එයින් නැගී ආකිඤ්ඤඤ්ඤායතන සමාපත්තියට සමවැද, එයින් නැගී විඤ්ඤාණඤ්ඤායතන සමාපත්තියට සමවැද, එයින් නැගී ආකාසානඤ්චායතන සමාපත්තියට සමවැද, එයින් නැගී චතුත්‍ථධ්‍යානයට සමවැද, එයින් නැගී තෘතීයධ්‍යානයට සමවැද, එයින් නැගී ද්විතීයධ්‍යානයට සමවැද, එයින් නැගී ප්‍රථම ධ්‍යානයට සමවැද, එයින් නැගීමෙන් ප්‍රතිලෝමය නිමවා, නැවත ද අනුලෝම ක්‍රමයෙන් ද්විතීයධ්‍යානයට සමවැද, එයින් නැගී තෘතීය ධ්‍යානයට සමවැද, එයින් නැගී චතුත්‍ථධ්‍යානයට සමවැද, නිවන්පුර වදනාවූ සබ්බඤ්ඤුවරවක්‍රවර්ති සම්මාසම්බුදු භාග්‍යවත් බුදුරජානන් වහන්සේ මෙසේ සුවිසිකොළ ලක්ෂයක් පමණ සමවත් සමවැදීමෙන් අභ්‍ය දෙශයකට යන පුරුෂයෙක් ඤතිජනයා වැලඳගෙණ යන සේ ඒ සියළු සමාපත්ති සැප අනුභව කොට පැමිණි චතුත්‍ථධ්‍යානයෙන් නැගී ධ්‍යානසමනන්තර ව ධ්‍යානාඛ්‍යයන් ප්‍රත්‍යවෙක්ෂා කොට, ඊට අනතුරු ව භවාඛ්‍යයට පැමිණ, දුඃඛසත්‍යගත අව්‍යාකෘතවිත්ත යෙන් පිරිනිවන්පෑ වදාළසේක.

මේ ශ්‍රී සඛමීඅවවාද සංග්‍රහයෙහි මෙතෙකින් සන්තිකෙ නිදාන කථාව කියා නිමවනලදී

—○—

මෙසේ පිරිනිවී කල්හි ඒ පරිනිර්වාණය හා සමග මහාපෘථිවි කම්පාවීම් ආදි නොයෙක් කාරණා පහළවිය. එකෙණෙහි සහම්පති මහාබ්‍රහ්මතෙම මේ ගාථාව කියේය.

සබ්බෙව නික්ඛිපිස්සන්ති, භූතා ලෝකෙ සමුච්ඡයං,
යථා එතාදිසෝ සත්ථා, ලෝකෙ අප්පටිපුග්ගලෝ,
තථාගතෝ බලප්පත්තෝ, සම්බුද්ධෝ පරිනිබ්බුතෝ-ති.

එකෙණෙහි ශක්‍රදිව්‍යරාජද මේ ගාථාව කීයේය.

අනිච්චා වත සඞ්ඛාරා, උප්පාදවයධම්මිනෝ,
උපජ්ජිත්වා, නිරුජ්ඣන්ති, තෙසං වූපසමෝ සුඛෝ-ති.

එකෙණෙහි ම ආයුෂ්මත් අනුරුද්ධස්ථවිර ද මේ ගාථාවන් වදළසේක.

නාහු අස්සාසපස්සාසා, සිතවිත්තස්ස තාදිනෝ,
අනෙජෝ සන්තිමාරබ්භ, යං කාලමකරි මුනි,
අසල්ලිනෙන චිත්තේන, වෙදනං අජ්ඣවාසයි,
පජෝතස්සෙව නිබ්බානං, විමොක්ඛෝ චෙතසෝ අහු-ති

එකෙණෙහි ම ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ ද මේ ගාථාව වදළසේක

තදහි යං භිංසනකං, තදහි ලෝමහංසනං,
සබ්බාකාරවරූපෙතෝ, සම්බුද්ධෝ පරිනිබ්බුතෝ-ති

මෙසේ අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ තන්හි දස දහසක් සක්වළින් රැස්වූ දෙවතාවන් සහිතවූ ඒසා මහපිරිසින් දෙමතස් ප්‍රතිඝ නොකළ බැවින් සෝවාන් සකෘදාගාමී වූවන් හා පෘථග්ජන සත්වයෝ සකභාවයෙන් සිටින්ට නොහැකි ව, යව කිහනලද් ක්‍රමයෙන් නානාවර්ණාකාර විරූප වෙස් ගෙණ අහෝ බුදුරජ අහිමියිනි ම පිරිනිවිසේන, ලුවණැස් ලොව අතුරුදන් වියයි යනාදි නොයෙක් අදේනා කියමින් හඬන්ට වන්හ.

එසේ ම පහතොවූ රාගවෙහෙ ඇති සමහර භික්ෂූහු ද භිය අත බැඳගෙණ හඬමින් බුදුරජ පිරිනිවිසේක. මෙසින් මතු අපට කවරෙක් අවවාදානුශාසනා කරන්නේ ද, ධම්දෙශනා කරන්නේ ද, එහෙයින් අනාථවූ අපි මෙතැන් පවත් මහා පැදෑ ඇති රන් කැබපත් සේ සප්‍රභ ශොභාසම්පන්නවූ ශාස්තෘ මූඛමණ්ඩලය දක්නට නොලබම්හ. දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ශ්‍රීශොභයෙන් ප්‍රතිමණ්ඩිත ශ්‍රීඝනරූපසම්පත්තිය දක්නට නොලබම්හ. අහෝ බ්‍රහ්මස්වර මධුරෞදාරවචන සම්පන්නවූ ධම්දෙශනා ශබ්දය අසන්ට නොලබම්හයි, යනාදි වචන කිය කියා හඬා වැලපුනානුග්‍ය.

පහවූ රාගවෙහෙ ඇති අනාගාමී රහත්හු සිහිබුවණින් යෙදී ඉවසීමෙන් "අනිච්චා වත සංඛාරා" යනාදී යට කී ක්‍රමයෙන් ම ධම්ානුස්මරණයෙහි යෙදුනාහුග්‍ය. භාග්‍ය වතුන් වහන්සේ අරුණට පළමුව බලවපවූඃයෙහි පිරිනිවන් පෑ වදළ බැවින් පස්විමයාමයෙහි ඉතිරි ව සිටි ඒ සුලු කාල සංඛ්‍යාත රාත්‍රි ශෙෂඃ ආයුෂ්මත් අනුරුද්ධමහතෙරුන් වහන්සේ ද, ආයුෂ්මත් ආනඳ මහතෙරුන් වහන්සේ ද, භික්ෂූන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධම්කථා පැවැත්වීමෙන් ඉක්මවන්නාහු; ඇවැත්නි දෙව්බඹුන් සහිතවූ සියලු ලෝව අසමිවූ අප්‍රතිපුද්ගලවූ දශබල ධාරිවූ වජ්‍රශරීරයක් සේ උතුම් දෙහයක් ඇති සම්‍යක්සම්බුද්ධයන් වහන්සේවි පවා අහෝ මේ බලවත් මාත්‍යුමාර යන මරණ

සවභාවය පැමිණියේය. කෙතෙක් සියලු ලොවහසුන්නේය. ලජ්ජා නැත්තේය. නොබයා නොහොරණියැයි, යනාදිවූ අනිත්‍යතා යෙන් යුක්තවූ මෙබඳුවූ ධම්කථා පැවැත්වීමෙන්මි කාලාති ක්‍රමණය කළාහුයි.

එසේ ඒ කථා පවත්වමින් සිරිකල්හි ඇඹිල්ලකින් අරුණු නැංගේය. එකල්හි ආයුෂ්මත් අනුරුඬ මහතෙරුන්වහන්සේ අරුණෝදය දැක ආයුෂ්මත් අනඳමහතෙරුන් කැඳවා ඇවැත්වූ ආනන්දය, තෙපි ගොස් කුසිනාරානුවර මල්ලරජදරුවන්ට මෙය වත් දන්වවයි වදාළසේක. ඒ අසා අනඳමහතෙරුන්වහන්සේ පෙරවරුම පාසිවුරුගෙණ තමා දෙවැනිකොට කුසිනාරානුවරට වැද එසමයෙහි සන්ථාගාර නම් ශාලාවෙහි එවකාලයුත් තෙන්ම රැස්වසිටි මල්ලරජදරුවන්කරා පැමිණ වාසෙට්ඨාදී මල්ලරජදරුවන්ට භාග්‍යවතුන්වහන්සේ පිරිනිවිබව දන්වා තෙපි ර්ව කල්දනිත්වයි වදාළසේක. ආයුෂ්මත් අනඳයන්ගේ මේ වචනය අසා ඒ සියලු මල්ලරාජයෝ ද, මල්ලරාජකුමරුවෝද, මල්ලරාජයෙහෙලිනියෝද, මල්ලප්‍රජාපතියෝද ඇට කියහලද ක්‍රමයෙන්ම මහත්දුකට පැමිණ හඬාවැලප අනිශ්‍රව බුදුරජ අඟෝ පිරිනිවිසේකැයි යනාදී නොයෙක් අදෝනා කියකියා කුසිනාරානුවර මල්ලරාජපුරුෂයන්ට ආඥාකරන්නාහු එසේ වීකම් සියල්ලෝම සුවඳමල් ආදියද සියලුම තූර්‍යභාණ්ඩයන්ද සියලු තාලාවචරයන්ද රැස්කරවයි කියා පන්සියයක් වස්ත්‍ර යුගලයන් හා ඒ පිරිනිමන් පැතැන්ත බලමනානාක් සියලු පූජාවිධි සදහෙණ, උපවහනකම් ගල්වනසඟි භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය ඔම් තැනෙක්හිද එතනට පැමිණියාහුය.

එසේ පැමිණ බුඩශරීරයට සුවඳමල් ආදියෙන්පුදු අනිරේකාකාර ගීතවාදිත පැවැත්වීමෙන් සත්කාර ගරුසාර බහුමාන කොට මහත් පූජා පවත්වන්නාහු ඒසිතුරු වෙළුම්වලින් මණ්ඩලමාලාඇඳක්කොට ඝරහා පිළිගෙල කරන්නාහු; මෙසේ පූජාවිධි පැවැත්වීමෙන්ම එදවස කෘත්‍යක්‍රියාන්තරකළාහුය. එකල්හි කුසිනාරා නුවර මල්ලරජදරුවන්ට මෙබඳු සිතිවිල්ලෙක් විය. කෙසේදෝ යත්, භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය ආදාහනකරන්නට අද දවස අතික්‍රාන්තවගිය හෙයින් කොපිළිවන. සෙටදවස්හි මෙයට වැඩි අතිරේකතරවූ නාතාගීතවාදනයෙන් හා සුවඳමාලාදීන් පූජාපවත්වා, ඇදහනකරම්හයි කියා මහත්පූජා පැවැත්වීමෙන් දවස ඉක්මගියහෙයින් මෙසේ දවසින් දවසට වඩවඩා පූජා සත්කාර පවත්වම්හයි කියා කියා, එසේම පූජාපැවැත්වීමෙන්ම

සදවසක් අතික්‍රාන්තකොට සත්වැනි දවස් පැමිණිකල්හි; සියලු රටවාසී මනුෂ්‍යයෝද අනෙකප්‍රකාර පූජාසත්කාරයන් හා ධජ පතාකාදිය ගෙණ ගොස් සියල්සල්වනය අලඞ්කාත කළාහුය. එසේම බ්‍රාහ්මණ ගෘහපති මහා සාලයන් විසින් කරණලද සත්කාරද මෙතෙකැයි කෙළවරක් නැත්තේය. දෙවතාවන් විසින් කරණලද පූජාසත්කාරද පාපිවිතලය පවත් බ්‍රහ්මලෝකය දක්වා අප්‍රමාණවිය. එකල්හි කුසිනාරානුවර මල්‍යරජදරුවෝ අපි භාග්‍යවතුන්වහන්සේගේ ශරීරය නාට්‍යගීතාදී මහත් පූජාසත්කාර ගරුකාර බහුමාන කිරීමෙන් දක්ෂිණදිශාභාගයෙන් දක්ෂිණයට ගොස් ඇතුළුනුවරට නොවැද පිටතින් වඩාගෙණ ගොස් නුවරට දකුණෙන් බුඞ්ගරීරය දවමිහයි කියා නියම කොටගෙණ මඞ්ගල්‍යවයස් ඇති බලසම්පන්නවූ ප්‍රධානමල්‍යරජදරුවෝ අටදෙනෙක් හිස්සෝදා, තාන්වස්ත්‍ර හැඳ, බුඞ්ගරීරය අපි ඔසොවාගෙණ යම්හයි කියා රන්වන්වූ බුඞ්ගරීරය සවීරත්න විභූෂිතවූ දිළිගෙන සඞ්ඛ්‍යපය්‍යඞ්කය හා තගන්නට උත්සාහ කොට නොහැකිවූවාහුය.

එකල්හි මල්‍යරජදරුවෝ ආයුෂ්මත් අනුරුඞ්ඝස්ථවිරයන් කරා පැමිණ එපවත් විවාළතැන වාසෙට්ඨය, තොපගේ අභිප්‍රාය අනිකෙක. දෙවතාවන්ගේ අභිප්‍රාය අනිකෙකැයි වදළසේක. සවාමීන්වහන්ස, දෙවතාවන්ගේ අභිප්‍රාය කෙසේදැයි විවාළකල්හි වාසෙට්ඨය, සම්බුඞ්ගරීරය මහත් පූජාසත්කාරයෙන් ගෙණ දකුණෙන් නුවරට බාහිරයෙන් යම්හයි සිතූ ඒ තොපගේ අභිප්‍රායසේ නොව, දෙවතාවෝ උත්තරදිශාභාගයෙන් ගොස් උත්තරවාරයෙන් නුවර ඇතුළට වැද, නුවර මධ්‍යයෙන් බුඞ්ගරීරය ගෙණ ගොස්, පූර්වාරයෙන් නික්මගොස් නුවරට පූර්වදිග මල්‍යරජදරුවන්ගේ මකුටබන්ධනචෛත්‍යතම් ලද ශාලාවට පැමිණ, එහි බුඞ්ගරීරය අද්‍ය නකරණු කැමැත්තේයයි වදළසේක. ඒ ඇසූ මල්‍යරජදරුවෝද එසේම් කම් වහන්ස, දෙවියන්ගේ ඒ අභිප්‍රාය ලෙසම වේවයි කියා සමසිත් වූවාහුය. එකල්හි කුසිනාරානුවර හැමතන්හිම මල් ඇතිරියක් අතුව කිම් වහාලූවාසේ අහසින් වස්නාලද දිවම්දරුමල් වර්ෂාවෙන් දානපමණ උස පිරිහියේය. ඒ සියලු නුවර වාසිවුද, රට වාසීද, මහජනයාමුහයෝ මේ අපගේ බුඞ්ගරීරයාගේ පශ්චිම දර්ශනයයි සිතා සුවඳමල් ධජපතාකාදී නොයෙක් පූජාගෙණ රැස් වූවාහුය.

ඉක්බිත්තෙන් මල්‍යරජදරුවෝ අවදෙන බුඞ්ගරීරය උසුලා ගෙණ නික්ම යනකල්හි දෙවතාවෝ කුසිනාරානුවර මල්‍යරජදරුවෝද, එසේගෙණ යනු ලබන්නාවූ බුඞ්ගරීරය දිව්‍යමයවූ මානුෂිකවූ නෘත්‍යගීතවාද්‍යයෙන්ද, මල්සුවඳ ආදියෙන්ද එක පැහැර පිදීමෙන් මහත්සත්කාර කෙරෙන්න් නුවරට උතුරෙන් ගෙණ ගොස් උතුරුවහල්දොරින් ඇතුළු නුවරට වැද, නුවර මධ්‍යයෙන් යන්නාහු එහේ මහත් පූජා සත්කාර වඩවඩා ඇවැත්වීමෙන් සඞ්ඛ මඞ්ඛතයෙහි

හොවා බුඩශරීරය ගෙණ යනකල්හි පෘථග්ජන දෙවි මිනිස්සු ඒ දැක සඩකියහාවයෙන් සිවිනට අසමර්ථව හඬා වලපනට පටන්ගත්හ. එකල්හි බන්ධුලමල්ලසෙනාධිපතියාගේ භාර්‍යාවූ මල්ලිකාදෙවි තමාගේ ඒ සවාමිපුරුෂයාගේ කාලක්‍රියා වෙයි පටන් කොපැලඳතුබූ විසාඛාවන්ගේ මේල පලඳනාව වැනිවූ මහාලතාපලඳනාව ගෙණ මෙන් බුදුන් පුදමි සිතා ඒ පලඳනාව මැද පිරිසිදුකොටගෙණ සුවඳපැනින් සෝදාගෙණ දෙරකඩසිට එසේ බුඩශරීරය වඩාගෙණවුත් එතනට පැමිණි කල්හි ඒ බන්ධුලමල්ලිකාතොමෝ සඩකිය පලඳනාව තමා අතින්ම පුදනපිණිස, දරුවෙනි; මේ සවණ්ඩිමණ්ඩපකය පාත්කර වසි කියා, පාත්කරවාගෙණ ඒ පලඳනාව බුඩ ශරීරයෙහි බහාපැලඳවූකල්හි සිරොධාතුව පටන් ශ්‍රීපතුල් දක්වා වැසී, රන් වන් බුඩශරීරය සම්පූර්ණතමයවූ ඒ ප්‍රසාධනයෙන් ප්‍රසාධිතව අතිශයින් දීප්තිමත්ව බැබලීගියේය. ඒ දැක ඉතා සතුටුසිත් ඇතිව ප්‍රාර්ථනා කරන්නාවූ ඒ බන්ධුලමල්ලිකාතොමෝ සවාමිවූ භාග්‍යවතුන්වහන්ස, යම්තාක්කල් මම සංසාරයෙහි සෙස්සන් විසින් දක්නාලබම්ද, ඒතාක්කල් උපනුපන්ජාතිවල වෙන අමුතුපලඳනාවකින් කටයුත්තෙක් මට නොවේවයි සළුපලඳ නාව පැලඳ අලඬකාතවූවාක් මෙන්ම මාගේ ශරීර ශොභාව ඇතිවේවයි කියා, බුදුන් වැඳ ප්‍රාර්ථනා කළාය.

ඉක්බිත්තෙන් මල්ලරජදරුවෝ බුඩශරීරය උසුලාගෙණ නුවරමඩ්‍යයෙන් නික්ම නුවරට පූර්වදිගින් මකුටබන්ධන ශාලා නම් රාජමඩලසථානයට පැමිණ එහි බුඩශරීරය තැබුවාහුය.

නැවත මල්ලරජදරුවෝ ආයුෂ්මත් අනඳසාමීන් කරාපැමිණ සවාමිවූ ආනන්දසථවිරයන්වහන්ස, බුඩශරීරයෙහි අපි කෙසේ පිළිපදිමෝදැයි විවාළාහුය. එවිට පින්වත් අනඳමහ තෙරුන් වහන්සේ වදාරණසේක්, වාසෙට්ඨය චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ ශරීරය තාන් කසිසළුවෙන් පළමුව වෙලා එහි ඔසුමව තෙල් නොරඳනා බැවින් ගසා නැගු පුලුතෙන් දෙවනුව වෙලා, කැවතත් එසේම තාන් කසිසළුවෙන් වෙලා, කැවතත් එසේම පුලුන්පටින් වෙලා, මෙම ක්‍රමයෙන්ම දහසක්පිළිපටින් දහසක් පුලුන්පටින් වෙලා, සුවඳතෙල් පිරූ රන්දෙනක වඩා අනික් රන්දෙණකින් වසා ඔසලු සුගඬද්‍රව්‍යයන්ගෙන් විතකය කරවා චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ ශරීරය දැන්නාහුය. එසේම වාසෙට්ඨය, බුඩශරීරයෙහිද තොප විසින් පිළිපැද්ද යුතුයයි වදාළ සේක. ඒ ඇසූ වාසෙට්ඨාදී මල්ලරජදරුවෝ මැනවැයි කියා බුඩශරීරයෙහිද ඒ කියනලද ක්‍රමයෙන් පිළිපැද රන්දෙනකට වඩාගෙණ දිගින් එක්සිය විසිරියනක් පමණවූ උසින් සත්

විසිරියන් පමණැති චන්දනසාරමය සම්සුඛිදුම්ය සම්මිශ්‍රවූ විතකඝකරා මහත්සත්කාර සම්මානාදයන් රන්දෙන සහිතවූ බුබ්ඝරීරය එයටවඩා අප්‍රමාණවූ දෙවිමිනිසුන්ගේ පූජා සත්කාර පැවැත්වීමෙන් මෙසේ සත්වෙනිදිනයෙහි ආදාහන පූජාවට උත්සාහකරන්නාහු විතකයෙහි කළමනාකාරක් සියලුකටයුතු නිමවා, සඳුන්දරසැයෙහි ගිනිදල්වම්හයිකියා ප්‍රධානවූ මල්‍යරජ දරුවෝ සතරදෙනෙක් ඉසඝෝදා නා තාන්පිළිහැඳ ගිනිදල් වන්ට උල්කාවන් දෙනක් දෙනක් එක්කොට ගෙණ මහත් උත්සාහකිරිමෙනුදු නොහැකි හෙයින් කැවතත් එසේම අට දෙනෙක, සොළොස්දෙනෙක, දෙතිස්දෙනෙකැයි මෙසේ නොයෙක් මල්‍ය රජදරුවෝ එක්ව උල්කාදණ්ඩවැට පහන් ගෙණ දහස් ගණන් තල්ඳැට පවන් දීමෙන් කඹුරු සම්ගෙණ පිබිමින් නොයෙක් ලෙසින් උත්සාහකොට විතකයෙහි ගිනිදල්වන්ට නොහැකි වූවාහුය.

එකල්හි මල්‍යරජදරුවෝ ආයුෂ්මත් අනුරුඬ ස්ථවිරයන් කරා පැමිණ මිට කාරණාකිම්දැයි කියා එපවත් විමාළනැන වැසෙවිය මේ දෙවතාවන්ගේ අභිප්‍රායෙකැයි වදාළසේක. ඒ දෙවතාවන්ගේ කුමන අභිප්‍රායෙක්දැයි විමාළකල්හි, කාරණා දන්වනසේක් අසුමහසවවන් වහන්සේලා කෙරෙහි සිත්පහද වාගෙණ උපසථායක කුලයෝ අසූදහසක් අසූදහසක් කුල වැසියන් බැහින් දෙවිලොව උපන්නාහුය. එසින් ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ කෙරෙහි සිත් පහදවා ගෙණ සවකීයෙහි උපන් දෙවතාවෝ ඒ බුදුන් පිරිනිවිතැනට රැස්වූ සංඛ්‍යාපථානිඛ්‍රාන්න මහානිඝ්‍රසමාගමයෙහි තමන්ට කුලූපගවූ ඒ මහතෙරුන් නොදැක කොතැන්හි වසනසේක් දෝහෝයි බලන් නාහු හිමාලයෙහි වැස එසින් නික්ම පාවානම් නුවරවවැඩ සිටු සිහා ළඳ අතරමගට පැමිණ පිරිවර පන්සියයක්දෙනාවහන්සේ හා වඩනාබව දැන අපගේ කුලූපග මහතෙරුන්වහන්සේ මෙහි පැමිණ බුදුන්වැඳ නිම්කල්හි ඔන් විතකයෙහි ගිනි නොදල්වෝවාසි කියා ඒ දෙවතාවෝ ඉටුගසි වදාළසේක. මල්‍ය රජ දරුවෝ ඒ අසා වහන්ස, එසේවීනම් දෙවතාභිප්‍රාය ලෙසම වේවයි දැන්දුවාහුය. අහෝ! මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ පන්සියයක් භික්ෂූන්පරිවරාගෙණ දශබලධාරිවූ බුදුන්ගේ පා වඳිමි කියා මග වඩනාසේක් උන්වහන්සේ නොපැමිණි කල්හි විතකයෙහි ගිනිදල්වාගත නොහැක්ක. මෙබදු ගුණානුභාව සම්පන්න භික්ෂූන් සිවිකල්හි දශබල පරිනිර්වාණය නම් කිම්දැයි කියා සම්භරු පුවඳමාලාදින් ගත් අත්අැතිව පෙරමගට ගියාහුය. සම්භරු එළිමැගි විසිතුරුව සැදූ වඩනාමාගීය බලාසිටියාහුය. එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ කුසිනාරා නුවර මකුට බන්ධන ශාලානාම චෛත්‍යයට පැමිණ

ඊවරය එකාංශකොටගෙණ ඇදිලිබැඳ විනකයමට තුන්විටක් ප්‍රදක්ෂිණාකොට, ඒ ප්‍රදක්ෂිණා කෙරෙමින්ම සිට ශ්‍රීපාදයන් මේ ස්ථානයෙහි යයි යලකාගෙණ මහතෙරුන්වහන්සේ අභිඥා පාදක චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී, චතුලක්ෂණප්‍රතිමණ්ඩිතවූ බුදුන්ගේ ශ්‍රීපාදයෝ සප්පාසපවලයන් හා දහසක් පිළිපට රන්දෙන සදුන්දරසැය යන මේ සියල්ල දෙබෑකොට ගෙණ මාගේ ශිස්මුදුන්හි පිහිටන්වයි අධිෂ්ඨානකළසේක්, ඒ විනනය හා සමග පිළිපට ආදී සියල්ල දෙබෑකොට ගෙණ වලාහකාභ්‍යන්තරයෙන් උපවූ ප්‍රත්‍යේකබුදුසේ ශ්‍රීපාදයෝ පිවතට නික්මූනාහුය. එකල්හි මහතෙරුන්වහන්සේ සුපිපි රක්තොත්පල දෙකක් වැනි හස්තයන් දිගුකොට රන්වන්වූ බුදුන්ගේ ශ්‍රීපාදවල ඔප්මිය දැඩිකොට අල්වාගෙණ තමන්වහන්සේගේ ශිස්මුදුන්හි පිහිටුවා ගෙණ මාගේ සවාමිවූ ලොකනායකයන් වහන්ස, මේ ශ්‍රීපාදවලින් පෙර තුන්යොදුන් මගගෙවා මට පෙර ගමන් වැඩිසේක. දැන් මෘතාවශෙෂව වැඩසිට පවා මට පෙර ගමන් කළසේක. අහෝ මෙසේ මට අනුකම්පා ඇති භාග්‍යවතුන්වහන්ස, මේ බබවහන්සේගේ පශ්චිම ශ්‍රීපාද දර්ශනය, මේ මාගේ පශ්චිම වන්දනාවයයි කියා, නැවත නැවත උතුම් මාඛයෙන් ශ්‍රීපාදාංශනයකොට පන්සියක්දෙනාවහන්සේ හා ශ්‍රීපාදයන් වැඳ ස්තුතිකොට බුදුන්ගේ රූපය වර්ණනාකරණසේක්.

සසසිරිකතරෝ නාථෝ, සෙතුමාලායය ලඞ්කතෝ,
දකඛිණාවත්තකෙසොඞි, නිලාමලසිරොරුහෝ.

යනාදී ගාථා සියයකින් රූපය වර්ණනාකොට මහතෙරුන්වහන්සේ වැඳිකල්හි ශ්‍රීපාදයෝ රන්ඳෙන ඇතුළට වැද යථාස්ථානයෙහිම පිහිටියාහුය. ඒ ආශ්චර්‍යය දැක එහි රැස්ව සිටි සියලු නිස්ක්‍රමුදු සතුටුව නමස්කාර කළසේක්මය. මහජනසමූහයාද එකප්‍රහාරයෙන් නානාපවත්වා සුවඳමල් ආදීන් පූජාකොට නමස්කාර කළාහුය. එකල්හි භාග්‍යවතුන්වහන්සේගේ විනකය තෙමේම ගිනිදැල්වී ගියේය. එකෙණෙහි කුමුදෙත්පල පුණ්ඩරීක සෞගන්ධිකාදීවූ කුසුමයෝ ආකාශයෙන් විනකය පිට වැටුනාහුය. මේ ආදී නොයෙක් ආශ්චර්‍යයෝ පහළවූහ. ආදාහනවන්නාවූ භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි කිසිවක්ත් අලු නොපෙණුනේය. පුළියෙහි එකඝනවූ ශරීරය භාග්‍යවතුන්වහන්සේගේ අධිෂ්ඨානවශයෙන් දැසමන් කැකුළුමෙන්ද, ශුඛ මුතුමෙන්ද විසිරගියාහුය. දීඝාඝුෂ්ඨ බුදුන්ගේ ශරීරය රන්කඳක්මෙන් එකඝනවන්නේය. අප භාග්‍යවතුන්වහන්සේ අල්පඝුෂ්ඨ බැවින් ලොකානුකම්පා චිත්තයෙන් මෙසේ සිතා වදළසේක.

මම නොදැක්කලක් සිට පිරිනිවන් පාමි, මාගේ ශාසනය මෙප මණකින් හැමතන්හිම විස්තාරකොවූයේය. එහෙයින් පිරිනිවන්පෑමැ මාගේ ධාතු විසිරයෙත්වා. යමෙක් සම්‌පමාත්‍රවූ ධාතුව කුදු ගෙණ චේතය කොට පිදුවේ නම් ඔහු සවඉගොත්පත්තිය වන්නේගහි සිටා ධාතු විසිරෙණසේ අධිෂ්ඨාන කළසේක.

කෙතෙක්ධාතු විසිරගියහු ද? කෙතක්ධාතු විසිර නොගියහුදැ?යත්:

සතරදනතධාතුය, දෙඅකුධාතුය ලලාටධාතුයයි යන මේ සත් ධාතුහු විසිර නොගියාහුය. සෙසු ධාතුහු විසිරගියාහුය. එහි හැමට කුඩාධාතු ඉතිපෑත්‌තුවි, මඩ්‍යමධාතු සඩඝාල්පමණවි, මහත්ධාතු මුංපියලි පමණවි සිටියාහුය. එකල්හි විතකයෙහි ගිනි ඇතිත. එකල ආකාශයෙන් හා පොළොවින් ජලධාරාවෝ ප්‍රාතුර්භූතවූහ. විතකය පිරිවිරාසිරි ශාලවෘක්ෂයන්ගේ ශාඛාවන් තරයෙන් උදකධාරා නික්මුණාහුය. කුසිනාර නුවර මල්ලරජදරු වෝද රන්කළ රිදීකළ පුරාගෙණ සුවඳපැන් වත්කිරීමෙන් වඳනවිතකයෙහි ගිනි නිවුවාහුය.

ඉක්බිත්තෙන් මල්ලරජදරුවෝ තමන්ගේ නුවරවැද සන් ථාගාරයෙහි සිවුදොරින් පිරිබඳගෙණ, ලදපස්මල් ඉස, රන්තරු රිදීකරුවෙන් විවිත්‍රවූ විතාන්බැඳ, මල්දම් රන්දම් රුවන්දම් එල්වා වීතිරඇද, සන්ථාගාරයෙහි පවන් බුදුන් ආදහනකල ඒ මකුටබන්ධනතෙම වෛත්‍යය දක්වා දෙපෙළ තිර ඇද අහස විහන්බැඳ ධජපතාකා කංවා, දෙපෙළ රන්කලස් තබ්බවා, දඹු වැටපහන් තබා අලඞ්කෘතවූ හස්තිස්කන්ධයෙහි ධාතුසහිත රන් දෙන තබා, සුවඳින් මලින් පූජාකොට මහත් උත්සව ක්‍රීඩා කෙළිමින් දෙවිනුවරක්වැනි තමන්ගේ ඇතුළුනුවරට වැද, සන්ථාගාරමඩුයෙහි සප්තරත්නමය පල්ලිඞ්කයෙහි ධාතුවඩා, මිස්තකයෙහි සේසත් තබා, කඩුගත් යොධයන් පදනම් වසා උරෙන්උරගසා සිටුවා, එයින් පිටත කුඹින්කුඹගසා ඇස්පෙළක් සිටුවා, ඒ වටා කණින්කණගසා අශ්වයන්පෙළක් සිටුවා ඒ වටා සකින්සක ගසා රථපෙළක් සිටුවා, එයින්පිටත උලෙන් උලගසා යොදිසඤ්ඤයක් සිටුවා, එයින්පිටත පෙළින්පෙළ ගසා දුනුගත් සෙනගක් සිටුවා, මෙසේ වට යොදනක් මැකයෙහි සන්තකයෙකින් වැසුවාසේ අතුරක් නොදී සතුරන් නියෑ රැක වල්ගතහ.

මෙසේ මල්ලරජදරුවෝ ධාතුමලට රැකවල් ගත්වා උත් සවකෙළි කෙළිමින් මහත් පූජාවට පවත්ගත්නාහුය. එකල්හි රජගහනුවර අජාසත් රජ්ජුරුවෝ එපවත් ඇසූහ. කෙසේ ඇසූදැ?යත්:



(233 පිට)

පළමුවෙන් අමාත්‍යයෝ බුදුන් පිරිනිවිබව අසා පෘථග්ජන ශ්‍රද්ධාවනතයන්ගෙන් අපගේ රජ්ජුරුවන්ට වඩා බුදුන් කෙරෙහි ප්‍රේම ඇති රජෙක් නැත. මෙපවත් රජහට මේ ලෙසම කීවොත් හෘදය පැළී නැසෙන්නේය යි සිතා ඔරුතුණක් ගෙන්වා ගෙණ වතුම්බුරයෙන් පුරවා රජ්ජුරුවන් කරා ගොස් දෙවයන් වහන්ස ඔබවහන්සේට නපුරුවූ කාරණයක් දුටුම්හ. ඒ නපුර අසා පියන පරිද්දෙන් සුදුහඬක් ගැඳ නාසය හා කන්සිදුරු නො ගැලෙනසේ තෙළ ඔරුවෙහි ගැලී හොත් මැනවැයි කීවාහුය.

එ කල්හි රජ්ජුරුවෝ අමාත්‍යයන්ගේ වචනය අසා මැනවැ යි පිළිගෙණ පළමු ඔරුවෙහි ගැලී හොත්කල එම ඇමති තෙමේ හිසකේ වීදු පිට හෙලා අවමතුල් වෙසක් ගෙණ රජ්ජුරුවන් පෙරටුව සිට ඇදිළි බැඳ රජ්ජුරුවන් වහන්ස, ලොක නායකවූ අප මහා ගෞතම බුදුහු කුසිනාරා නුවරදී පිරිනිවන් පෑ වදුලසේ කැයි කීය. රජ්ජුරුවෝ ඒ බස කණ හුනුවේලෙහි දෙකණ ගැසූ යහුල් දෙකක් සේ වෙවුලා ගොස් බුදුන් කෙරෙහි උපන් ශොකාග්නියෙන් මූර්ඡා වූහ. රජ්ජුරුවන්ගේ සඕඛභය රත්කරපු ගකඳක් සේක කියා ඔරුව පිරූ සිහිල් වතුම්බුරය කකියවාපු ලෝදිය සේ සුරු සුරු යන අනුකරණ දක්වා හුණුව ගියේය.

එවේලෙහි අමාත්‍යයෝ රජ්ජුරුවන් ඒ ඔරුවෙන් ඔසවා දෙවෙනි ඔරුවෙහි හොවාලූහ. එවේලෙහි රජ්ජුරුවෝ ශීතලෙහි ගැළීමෙන් සිහි ඵලවාගෙණ අමාත්‍යයන් අතින් දරුවෙනි තොප කිවේ කුමක්දැයි විවාළහ. නැවතත් අමාත්‍යයෝ කියන්නාහු හිම් තොපගේ බුදුහු පිරිනිවන් පෑ වදුලසේකැ යි කීවාහුය. ඒ අසා රජ නැවතත් විසංඥව ඒ ඔරුවද හුණු කෙළේය.

නැවත අමාත්‍යයෝ රජ්ජුරුවන් තුන්වන ඔරුවෙහි හොවා ලූහ. එහි ගැලී ආශ්වාද ලදින් නැවතත් ඇමතියන් අතින් දරුවෙනි තොප කි බස් කුමක් දැයි විවාළේය. දෙවයන්වහන්ස බුදුහු පිරිනිවන්පෑහ යි කීවාහුය. ඒ අසාද රජ විසංඥ විය. එවේලෙහි අමාත්‍යයෝ රජ්ජුරුවන් ඔසවාගෙන පැන් සොළොස් කළයකින් ඉස් සෝදා නාවා සිංහාසන මඤ්චකයෙහි හිඳුවාලූ හ.

එවේලෙහි රජ්ජුරුවන් ආශ්වාද ලදින් සුවඳ කවනලද මණිවණ්ණ හිසකේවැටිය රන්පෝරුවක් වැනි පිටමැද හෙලාගෙණ ප්‍රවාලාඞ්කුර වැනි දැතින් ඝිය ලෙහි පැහැර මතැතෙකු සේ මහ හඬින් ගුගුරා වියරු හුනු පුරුෂයෙකුසේ අනතර විටියට බටකල්හි

නාවක සත්‍රිහුද තථාගත වියොගයෙන් ශොකාතුර රජහුගේ ඕජ්‍ර කාරය දැක කම්පාවූ සිත් ඇතිව කදුලෙන් තෙමිනිය මුහුණු ඇතිව අඩම්න් වලපමින් රජ්ජුරුවන් සමග නික්මුණ හුය.

එකල්හි රජ්ජුරුවෝ නාවක සත්‍රින් පිරිවරා නුවරින් නික්ම පළමුකොට වෙළුවනයට ගොස් මාගේ බුදුහු මිහිතත ගුහු රුවා පළමුව පිළිගත් වෙහෙරය යි කියා එතන හිඳ අඩා එයින් නැගි ජීවකාරාමයට ගොස් එහි තමන් පළමුව බුදුන් දුටු පැණ දිවාළ ගඳකිළියට වැද එතන්හිදී අඩා එයින් නැගී ධම් ශාලාවෙහි බුදුන් වැඩහුන් බුඩාසනය වැළඳගෙණ වලප්නාහු "සවාමිනි, භාග්‍යවතුන්වහන්ස, මේ සථානයෙහි වැඩහිද මට ධම් දෙශකාකාලයේක. දෙශනා නමැති නිමිල ගිනලොදහායෙන් මාගේ ශොකාග්නිය දුරුකළසේක. ඔබවහන්සේගේ ධම්දෙශනායෙන් මාගේ සොකසල්ලය හැරියසේක. ඔබ සරණගියාවූ මට කිසිවන යක් නො වදරන්නේ කවරේද? සෙසුදවස ඔබවහන්සේ භික්‍ෂු සඞ්ඝයා පිරිවරා දඹදිව සැරිසරා වඩින බව අසමි. දැන් මම ඔබ වහන්සේට නුසුදුසු අසුකන ප්‍රවෘත්තියක් ඇසීමි" යනාදීන් ගාථා සැටකින් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කියා වැලප නැවත සිහි ලවාගෙණ දැන් මා හැඩිමෙන් කමිනැත. බුදුන්ගේ ධාතු ගෙණ බුදුන් දුටුවා සේ පුදම් සිතාලා මාගේ බුදුහු කොසිදී පිරිනිවි සේක්ද යි විවාරා කුසිනාරානුවරදීයයි අසා මාගේ බුදුන්ගේ ධාතු බලයෙන් ගෙණවුත් පුදම් සිතාලා එකෙණෙහි ම රජගෙව දෙවෙ නිව නො වැද අවලොස් කෙළක් පමණ මහසෙනග ගෙණ ලඤ්ඡ ගණන් ඇත් අස් ඇණි රථඇණි බළඇණි ගෙණ මහ මුහුදින් දිවූ මහරැළපෙළක් සේ දුරුමග ගෙවා දිව කුසිනාරා නුවර සඳවුරු බැඳ හිඳගත්හ.

තවද මෙපවත්අසා විශාල මහනුවර සත්දහස් සත්සිය දෙනෙකු පමණ ඇති ලිච්ඡවී රජදරුවෝද තම තමන්ගේ බලපිරිස් ගෙණ එලෙසින්ම දිවගොස් එම නුවර පිරිවරා හිඳගත්හ. මෙසෙ සින්ම කිඹුල්වත්පුරගෙහි ශාක්‍යරජදරුවන් හා මහ සෙනහය, අල්ලකප්පකම් නුවර රජුන් හා මහ සෙනහය, රාමනම් නුවර කොළිය රජදරුවන් හා මහ සෙනහය, වෙඨනම්නුවර රජදරු වන් හා මහ සෙනහය, පාවෙය්‍ය නම් නුවර රජදරුවන් හා මහසෙන හයයි මෙසේ සත්සත්රාජ්‍යයෙක සත් සෙනහක් හා රජදරුවෝ

දිවගොස් නුවර සිසාරා සිටගෙණ "ධාතු අපට එවන්නේය අපට එවන්නේය"යි වෙනවෙනම වාසි කියා වහා යුඛකරන්නේය ධාතු හෝ අපට දෙන්නේයයි කියා ඉල්වන්නාහුය. එබස් අසා මල්ලරජ දරුවෝ කියන්නාහු අපගේ නුවරදී පිරිනිවන්පෑ මැනවැයි කියා, අප බුදුන්ට ආරාධනා කළේත් නැත. බුදුහු තමන්වහන්සේම අපගේ නුවරට වැඩ පිරිනිවිසේක. තමතමන්ගේ නුවර යම් යම් රුවනෙක් උපන්නේ නම් තම තමන්ට හිමිනියා සේම අපගේ නුවර උපන්නාවූ ධාතුරත්නය අපටම හිමිය. තෙපි කිරිබොනදු අපි මෝරු නො පුම්හ. තොපගේ මතු නො වෙයි. අපගේත් ඇත් අස් රථ බල සෙන් ඇත. තොපගේ මතු නො වෙයි. අපගේත් කඩු මුවහත් ඇතැ යි යනාදීන් මන්වඛනා වහයිබස් කියා කලහ වැඩුහ. ඉදින් යුඛ ජීතම් සත්නුවරක් තබා දඹදිව තෙසැට දහසක් රාජධානිවල රජසෙනඟ ආවත් ධාතු තුබූ නුවර හෙයිනුත් ලඝු ගණන් රහතුන්ගේ අධිෂ්ඨානබලය ඇති හෙයිනුත් සියලු දෙවතාවන්ගේ ආරක්ෂාබල ඇති හෙයිනුත් කුසිනාරානුවර මල්ලරජහු ජය ගණිත්තමය.

එසමයෙහි දඹදිව සියලු රජදරුවන්ට ශිල්ප දුන් රාජගුරුවූ බිඳි සෙන් වූවත් සමඟි නිරිමෙහි කැමතිවූ ද්‍රෝණනම් බ්‍රාහ්මණ ආචාර්යතෙම කුසිනාරානුවර වසන්නේය. හෙතෙම ඔවුන්ගේ විවාදය අසා මේ රජදරුවෝ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑ තැනදී සැලහ කරගත්තාහු නම් සුදුසු නොවන්නේය. එහෙයින් මම මේ විවාදය සංසිඳුවමැයි සිතා සඞ්ග්‍රාම භූමියට ගොස් උන්නත සථානයෂ සිට මහත් ශබ්ද පවත්වා බණවර දෙකකින් ද්‍රෝණ ගජිනා නම් ගජිනාවක් කෙළේය. එහි පළමු බණවරෙහි එක පදය කුත් නොඇසුවාහුය. දෙවෙනි බණවර අනතයේදී ඒ ශබ්දය අසා, තොල ඇසෙන්නේ අපගේ ආචාරීන්ගේ ශබ්දය නොවේදැයි කියා සියල්ලෝම නිශ්ශබ්දවූහ. එකල්හි මෙසේ කීයේය.

සුණනතු හොනතො මම එකවාකෂං
අමහාක බුඩො අහු ඛනතිවාදෙ
න සාධ යං උතතමපුඝලසස
සරිරභඩෙඝ සියා සමපහාරො.

සබෙබව හොනතො සහිතා සමඝා
සමෙමාදමානා භාරොමථ භාගෙ
විසථාරිතා හොනතු දිසාසු ථූපා
බහුජජනො එකඛුමනො පසනෙනාති.

මෙසේ දෝණ බ්‍රාහ්මණතෙම කියනුයේ පින්වත්නි, බුදුන් උදෙසා ඔවුනොවුන් හා යුඩ නොකරව්, බුදුහුනම් ක්‍ෂාන්තිවාදී සේක, සියලු සතුන්ට සාධාරණසේකැයි යනාදීන් බණ කියා ගිම්සු යේය. ඒ අසා රජදරුවෝ සතුටුව එසේවිනම් ආචාරිනී තොපි ම භාග්‍යවතුන්වහන්සේගේ ධාතු අටකොටසක් හොට බෙදුව මැන වැසි කිවාහුය. දෝණ බ්‍රාහ්මණද රජදරුවන්ගේ ඒ වචනය අසා මැනවැසි කියේය.

මේ පමණකින් භාග්‍යවතුන්වහන්සේගේ අභිප්‍රාය සමෘඩ විය, කවර අභිප්‍රායක්ද? යත්; ත්‍රිවිධ කාරණයක් නිසා බුදුහු කුසිනාරා නුවරට මහොත්සාහයෙන් වැඩිසේක. හේ කවරේද? යත්; භාග්‍ය වතුන්වහන්සේ අනික් තෙතකදී පිරිනි වන්පෑ කල්හි මහාසුදර්ශන සූත්‍රය දෙසීමට අපොහොත්පත්ති නොවන්නේය. කුසිනාරානුවරදී පිරිනිවන්පානාකල්හි දෙවිලොවදී පින්දැයුතුවූ සම්පත්තියක් මිනිස් ලොවදී විඳපුබව ප්‍රභාශවූ බණවර දෙනාකින් ප්‍රතිමණ්ඩිතවූ මහා සුදර්ශන සූත්‍රය දෙශනාකරම්. ඒ දෙශනාව අසා බොහෝ ජනයෝ කුශලයනම් කටයුතුදෙයෙකැයි සිතන්නාහුය යන මේ එක්කාරණ යෙකා. අනික්තෙතනකදී පිරිනිවිකල්හි සුභද්‍රයා මා නොදක්නේය හෙතෙම බුඩ වේනෙස පුද්ගල වන්නේය. ශ්‍රාවකයන් විසින් විනඝනය කරන්ට නොහැක්කේය. කුසිනාරානුවරදී පිරිනිවන් පානාකල්හි හෙතෙම මාකරා අවුත් ප්‍රශ්න විවාරා විසඡ්ජනාවසාන යෙහි සරණයෙහි පිහිටා මා සම්පයෙහි පැවිදිව උපසම්පද ලදින් කම්සථානගෙණ මා ධරමාන කල්හිම රහත්ඵවට පැමිණ පශ්චිම ශ්‍රාවක වන්නේය යනුද එක්කාරණයෙක. තවද අනික් නුවරනදී පිරිනිවන් පෑකල්හි ධාතුබෙදීම නිසා මහත් කලහයක් ව ලොහිත නදීව පවත්නේය. කුසිනාරා නුවරදී පිරිනිවිකල්හි දෝණබ්‍රාහ්මණ තෙම ඒ විවාදය සංඝිදුවා ධාතු බෙදා දෙන්නේය යන මේ ත්‍රිවිධ කාරණයන් දැක වදුරා භාග්‍යවතුන් වහන්සේ මහොත්සාහයෙන් කුසිනාරානුවරටම වැඩිසේක. එකල්හි දෝණබ්‍රාහ්මණයාගේ වචනය අසා රජදරුවන්ගේ විවාදය සංසිඳීගියකල මේ ත්‍රිවිධ කාරණයෝම සමෘඩවූවාහුය.

ඉක්බිත්තෙන් දෝණබ්‍රාහ්මණතෙම සමගිවූ රජදරුවන්ගේ මඩ්‍යයෙහි සිට ධාතු වැඩ රන්දෙණය හැරියේය. එකල්හි රන්වන් රශ්මිනු දිළිහි දිළිහි නික්මුණාහුය. ඒ දැක රජදරුවෝ විසමයට පත්ව කම්පාවූ සිත් ඇතිව කඳුලුධාරාවෙන් තෙමීගිය මුහුණු ඇතිව දෙහොත් මුදුන් දි සිට කියන්නාහු සවාමිවූ බුදුරජාණන් වහන්ස, පෙර ඔබවහන්සේගේ දෙතිස්මහා පුරුෂ ලඤඤණයෙන් ප්‍රතිමණ්ඩිතවූ සවණක්රසින් දිළිහෙන රන්වන්වූ ශරීරය දුටුම්හ.

දැන් වනාහි රන්වන්ධාතුහු අවසිඔවවූවාහුය. සවාමීනි! මේ ඔබ වහන්සේට සුදුස්සෙක් නොවෙයි කියා අඩා වැලපුනානුය. එකල්හි ද්‍රෝණබ්‍රාහ්මණතෙම ඒ රජදරුවන්ගේ කිසි ප්‍රමාදයක් බලා දකුණු දළදු වහන්සේ සොරාගෙණ හිස්වෙළුමෙහි සඟවා තිබුයේය. එවේලෙහි සක්දෙවිරජ සියලු සතුන්ට ධර්මදේශනාකලාවූ මුඛයෙහි ජාත දන්තධාතුවට පූජාකරන්ට මේ බමුණු සුදුසු නොවන්නේයයි සිතා සුසම්මවූ අතක් මවාගෙණ දන්තධාතුව ඔහු හිසින් සොරා ඇරගෙණ රුවන්කරඬුවකට වඩා ශක්‍රපුරයට ගෙණගොස් සිළුමිණි සැයට වඩා අද දක්වාම පූජාකරන්නේය.

ඉක්බිති බමුණු ධාතු අව නොවසක් සෝව මගධනැළියෙන් දෙනැළිය දෙනැළිය බැගින් අවද්‍රෝණයක් ධාතු රජදරුවන්ට බෙදා දී පසුව ඉස අතගාබලා දළදු නොදැක ශොක කොට මවත් වඩා සොරෙක් අරගතැයි සිතා ලජ්ජාවෙන් කාටත් නොකියා ධාතු මිනු ලාසය රජදරුවන්ට කියා ඉල්වාගත්තේය. එකල්හි පිප්ඵලි මෝරිය රජදරුවෝද බුදුහු කුසිනාරානුවරදී පිරිනිවන්පෑ බව අසා පළමු රජදරුවන් මෙන් යුඩයට සැරහී අවුත් ධාතුඛෙදගත් ප්‍රවෘත්තිය අසා තමන් පසුව ආහෙයින් කිසිවකුත් කියාගත නොහි ආදහන ස්ථානයේ අඟුරු හැරගෙණ ගියාහුය.

මෙසේ ධාතු බෙදු ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරුවෝ තමන්ගේ ධාතු කොටස ගෙණ ඒ කුසිනාරානුවර පටන් රජගහ නුවරට පස්විසියොදුන් මාර්ගය පුළුල අටඉස්බක්තැන් හෙරිතල යක්සේ තනා අන්තරන්තරයෙහි විටි සල්පිල් සාදා බුදුන්ගේ ධාතු සත්රුවන් මඩුවකට වඩා තමන්ගේ ආඥාක්ෂේත්‍රයෙහි මනුෂ්‍යයන් රැස්කොට නොයෙක් ලෙසින් ධාතු පූජාකොට රන්රථයෙන් වඩාගෙණගොස් රජගහනුවරට වැද මහත්වූ දගැබක් බඳවා එහි ධාතු වඩා ශක්‍රනිපමණින් පූජාකළාහුය. සෙසු රජදරුවෝද තම තමන්ලත් ධාතුකොට්ඨාසයන් ඡථා ශක්තීන් පුදා පුදා තම තමන්ගේ නුවරවලට ගෙණගොස් වෙන වෙනම දගැබ් බඳවා මහත්වූ පූජාකළාහුය. ද්‍රෝණතම් බමුණානෝද ධාතුමිනු නැළිය ගෙණ තමන්ගේ නුවර කුම්භතම් දගැබක් බඳවා තමන් ධනපමණින් පූජාකළාහ. පසුව ධාතු සොයා ආ පිප්ඵලිමෝරිය නම් දෙනුවර රජදරුවෝ ධාතු නොලදින් මේ අපට ධාතුයයි ආදහන භූමියෙහි රැස්කෙට කිබූ අඟුරු රන්කරඬුයෙන් වඩා මහා පෙළහරින් ගෙණගොස් අඛාර ථූප නම් දගැබක් බඳවා තමන් ශක්ති පමණින් පූජාකළහුය.

කියේමැනෝ:-

එකෝ ථූපෝ රාජගහෙ එකෝ වෙසාලියං පුරෙ
එකෝ කපිලවත්‍ථුසමීං එකෝ ච අල්ලකපපකෙ,

එකෝ ථූපෝ රාමගාමෙ එකෝ ච වෙඨදීපකෙ
එකෝ පාවෙය්‍යකෙ මල්ලෙ එකෝ ච කොසිනාරකෙ,

එතෙ සාරීරිකා ථූපා ජම්බුදීපෙ පතිට්ඨිතා
අඛාරකුම්භ ථූපෙහි දසථූපා භවන්ති මෙ.

දස ථූප කථා නිමි.

මෙසේ මේ දසථූපයන් පිහිටියාසින් පසු මහාකාශ්‍යපස්ථවිර යන්වහන්සේ ධාතුවලට වන අනතුරුවන් දැක අජාසත්මහරජ හට දැන්වූසේක්හි ඒ රජහු විසින් රජගහනුවර කරවනලද අනෙක ප්‍රකාර විසිතුරු කම්මතනයෙන් නිර්මිතවූ මහාධාතුනිධාන කථා වෙහි විභාගද අප බුදුන් පිරිනිවි දෙසිය අවුරුදු වැන්නෙහි සකල ජම්බුවීපයෙහි එකඡත්‍ර නාථ රාජ්‍යශ්‍රී ලත් මහානුභාව සම්පන්නවූ ධර්මාශෝක රජහු විසින් කරවනලද අසූසාරදහසක් චෛත්‍යකථාද එසින් මැතභාගයෙහි ලක්දිව රජපැමිණි දෙවන පැතිස්ස දුටුගැමුණු තරවරුදින් විසින් කරවනලද අනුරාධපුර යෙහි මහාචෛත්‍යාදි කථාද ථූපවංසයෙහි ප්‍රකාශිත ක්‍රමයෙන් බලාදතයුතු.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඛර්මාවවාද සංග්‍රහයෙහි අප බුදුන්ගේ ස්කන්ධපරිනිර්වාණ කථාව කියා නිමවනලදි

මතුවන ධාතුපරිනිර්වාණ කථාව කෙසේද යත්?

සඛර්මගුණ වර්ණනා පරිවෙජ්දයෙහි ද සඛඝගුණවර්ණනා පරිවෙජ්දයෙහිද දක්වනලද ක්‍රමයෙන් පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ යන ත්‍රිවිධ ශාසනය ම අන්තර්ධානවූ කල්හි වෙසඟ මැදි පොහෝ ලද විශාඛාදෙවියගේ යෙදුනු දවස් සියලු මේ ලඞ්කාවීපයෙහි මහියඞ්ගනාදිවූ සුවහස්ගණන් මහ දකුස්වල පිහිටි නොයෙක් ධාතූන් වහන්සේ එකක්ෂණයෙහිම ඒ ඒ දකුස්හැර ආකාශගත පැතනාගි ගමන්ගත් නැකත්තරුපෙළක්සේ අනුරාධපුරයෙහි රුවන්මැලි මහසෑකුස දුටුගැමුණු රජ්ජුරුවන් කරවූ අසූරියන් මහාධාතුගර්භ යෙහි මැද පිහිටුවූ කෙළක් අගනා රත්නමය ගඩොල්හි පස්පෙලක් පමණ ධාතූන්වහන්සේ හා එකතැනට පැමිණෙනසේක. එකල්

දක්වා ඒ දුකුස නැඟ තෙල්පහන් කොනිවී නිවී එදවස් ඒ පහන්ද නිවියෙයි. එවේලෙහි සියලු ලක්දිව ධාතූන්වහන්සේ එතනින් අහස් කුසට පැනනැඟි එකහුඹක අමුණාලු මුතුඇට පෙළක්සේ ඔවු නොවුන් පසුපස්සෙහි නික්ම නාගදිවයින එදවස් දෙ මසිල් නා රජුන්ගෙන් පිළිගෙණ අප බුදුන් වැඩහිඳ බණදෙසූ මණිපලඟ මතුයෙහි රැස්වනසේක. එයින් නොයෙක් කෙළඟණන් දිව්‍ය නාගරාජයන්ගෙන් පූජාලදින් ඒ මණිපලඟ හා සමඟ ආකාශයට පැනනැඟි ගොස් බෝමැඩ අප බුදුන් මරසෙන්බිඳ බුදුවූ අපරාජිත භූමියට බස්නාසේක. එතෙණෙහි දිව්‍යලෝක බ්‍රහ්මලෝක නාගලෝකාදි ඒ ඒ තන්හි පිහිටි ධාතූන්වහන්සේද අවශෙෂවූ ඒ ඒ කොදෙව්වල පිහිටි ධාතූන්වහන්සේද දඹදිව ඒ ඒ රාජධානි වල පිහිටි දශත්‍රුපාදියෙහි ධාතූන්වහන්සේද, ඒ ඒ තැනින් පැන නැඟී පියුම් විලක්කරා දිවන රාජහංස සමූහයක්සේ බුදුන්ගේ පශ්චිම දශන තමැති මෙඝකාලයෙහි ගුවන්කුස පැනනැඟී දිවන බලාකාපඞ්ක්තියක්සේ ආකාශයෙන් බැස බෝමැඩ එම ධාතූන් වහන්සේ හා එක්වනසේක.

එකල බුදුවූ දවස් සේම පොළොව පලාගෙණ තුදුස්රියන් වප්‍රාඝනයෙක් පැනනැඟි ඒ ධාතු පිළිගන්නේය. එවේලෙහි සියලු ධාතූන්වහන්සේම ජීවමානවූ බුදුන්ගේ රූපය මවා ලලාට ධාතූන්වහන්සේ ලලාටයෙහිම පිහිටනසේක. අකුයෙහි අකු ධාතූන්වහන්සේ පිහිටනසේක. සතර දළදැවහන්සේ සතර දන්තඝාඨනයෙහි පිහිටනසේක. ශ්‍රීවාධාතූන්වහන්සේ ග්‍රීවයෙහිම පිහිටනසේක. දෙකෙළ පණස්ලක්ෂයක් පමණ කෙසධාතූන් වහන්සේ ඒ ඒ ස්ථානයොවරදවාම පිහිටනසේක. සවඅනූදහසක් ලෝමධාතූන්වහන්සේද ඒ ඒ ලොමකූප නොවරදවාම පිහිටන සේක. අවශෙෂවූ තුන්තරමෙහි විසුරුණාවූ බුදුන්ගේ දෙලොසා මුණක් පමණ ධාතූන්වහන්සේද තමතමන්වහන්සේ පෙර පිහිටි ඇවූ ස්ථාන නොවරදවාම පිහිටනසේක.

ඉක්බිත්තෙන් දෙතිස්මහාපුරුෂලක්ෂණ හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණ පෙරසේම නිර්මිතවෙයි. එකල බුදුවූ දවස් සේම සියයෝ ලගිත් සවණක්රැස් හැර සියලු ලොකධාතු එකාලොක කරණ සේක. එවේලෙහිද දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ බුදුරැස් දැක අප බුදුන්ගේ ධාතුපරිනිර්වාණ දිනයවන කෙළවර පානා පෙළහර බලම්හයි කොයෙක් පූජාභාණ්ඩගෙණ අවුදින් බෝමැඩ සිසාරා තුන්ලෝපුරා සිටගණිත්. එවේලෙහි ධාතු බුදුහු ආකාශයට පැන නැඟී ගඞ්ගාඔබනම් වෘක්ෂමූලයෙහිදී පැ යමකප්‍රාතිහාර්‍යය සේම මහාපෙළහර දක්වා නැවත ආකාශයෙන් බැස බෙ මැඩ විදුරුසුන් නැඟී වැඩහිඳිනාසේක. එවේලෙහි ධාතුඝඤ්ඣයෙන් පැන නැඟී තෙජෝඝඤ්ඣයෙන් බෝමැඩපටන් බ්‍රහ්මලෝකයට ඇවිල්ලිවි

ගෙණ ධාතුආදහනවන්ට පවත්ගණී. එවේලෙහි දසදහසක් සක්වලින් රැස්වූ දෙවියෝ අපබුදුන්ගේ මේ පශ්චිමදේශීනය අද තුන්වැනිවූ ධාතුපරිනිර්වාණයයැ. බුදුකෙනෙකුන්ගේ නමක් කප් අසඛ්‍යයයකිනුත් ඇසිය නොහැක්ක. දුක්කනොහැක්ක. එසේවූ බුදුහු අද අනන්තඥානවෙති. අහෝ බෙදය අහෝ බෙදය ලොකය ශූන්‍යවිය ශූන්‍යවියයි කිය කියා අහස්තුඩ් පුරාසිටි දෙවියෝ මිහි මඩලයෙහි කඳුලුධාරා තමැති වැසිවස්වති. එකල අබ බිඳුවටක් සා ධාතුවකුත් නොතිබී හැමධාතු ආදහනවූකල්හි ගිනිහඳ තෙමේම අනන්තඥානවෙයි. එකෙණෙහි ඒ ඒ තන්හි පිහිටියාවූ දිව්‍ය නිර්මිතාදි ප්‍රතිමාද ශිලාරූප කාංචරූප රජතසුවණ්ණරූපාදි සියලු බුබ ප්‍රතිමාද අනන්තඥානවෙති. එකල දසදහසක් සක්වළ ආකාශයෙහි සිටියාවූ එක්ලක්ෂ පණස්දහසක් මහාබ්‍රහ්මරාජයෝ බෝමැඩට බැස තමතමන්ගේ භොග පමණින් මහත්වූ දිව්‍ය පූජාකරන්නාහු පරිනිර්වාණපූජාව සේ ම අප්‍රමාණවූ පූජාකොට යන්නාහුය.

මෙසේ සමන්තසත්වියන්ගේ වාක් විෂයාතික්‍රාන්ත වණ්ණියවූ රූපවිලාසයක් ඇති සුගතතථාගත ශිවඞ්කරවූ මාගේ බුදුහු ප්‍රථම බොධියෙහි පවත් කුසිනාරාතුවර මල්ලරජදරුවන්ගේ උපවත්තන නම් ශාලවනොද්‍යානයෙහිදී පිරිනිවන්පෑම දක්වා පන්සාළිස් අවුරුද්ද මුළුල්ලෙහි සතරාමර සපිලොකයාගට කරණලද අනන්ත තයින් ප්‍රතිමණ්ඩිතවූ සඞ්ඝානුශාසනාවන් ඇති හෙයින් සඞ්ඝවර වක්‍රවර්ති සඞ්ඝරාජවූ මාගේ බුදුහු "ශාස්තෘ" නම් වන්සේක. එසේ හෙයින් කියනලදි.

දෙවමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමථන්තානං පුරිසාජඤ්ඤ තෙ නමොඃ-සි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ
යෙහි මෙතෙකින් සම්බුද්ධගුණවර්ණනා නම්වූ

විතීය පරිවෙජ්දය

නිමවනලදී.

මෙසේ දෙවැනිවූ සම්බුඛ ගුණවර්ණනා පරිච්ඡේදයෙන් අසා ධාරණ බුදුගුණ වර්ණනා කිරීමෙන් රූපකාය සම්පත් ප්‍රකාශ කොට ලෝ වැඩ දක්වා තදනන්තර ව දැක්විය යුතු ධම්කාය සම්පද්විභාගය ද මදක් මෙහි දක්වනු ලැබේ. හේ කෙසේද යත්?

සම්බුඛානං දුවේ කායා රූපකායෝ සිරිධරෝ,
යෝ තෙන දෙසිතෝ ධම්මෝ ධම්මකායෝ ති වුච්චති.

යනු හෙයින් සර්ව ධර්මාධිරාජවූ බුදුරජාණන්වහන්සේගේ සුප්‍රතිෂ්ඨිත[1] පාදලක්ෂණතාදි දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් බබළන රූපය ම ර පකාය නම් වෙයි. ඒ බුදුන් විසින් දෙශිතවූ ධර්ම ය ම ධර්මකාය නම් වෙයි. එසේ විවිධ වූ කාය සම්පත්තීන් අතුරෙන් රූපකායයාගේ විභාගය යට දක්වූ ක්‍රමයෙන් ම දතයුතුයැ. එහි නොදක්වූ ධර්මකාය තෙම **පර්‍යාප්ති ධර්මය, ප්‍රතිපත්ති ධර්මය ප්‍රතිවෙධ ධර්මය** යි තුන් ප්‍රකාර වන්නේයැ. එයින් පිටකත්‍රය ධර්මය පර්‍යාප්ති ධර්මය නම් වෙයි. සෝවාන් මාර්ගාදි සතරමග සතරඵලය යන අව හා නිර්වාණය යන නව ලොකොත්තර ධර්මය සත්වයන් විසින් ප්‍රතිවෙධ කටයුතු බැවින් **ප්‍රතිවෙධ ධර්මය** නම් වේ. ඒ නව ලොකොත්තර ධර්මයට පැමිණෙන සත්වයන් විසින් භාවිතාකටයුතුවූ සිල ධ්‍රුතාඛ්‍ය සමථ විදර්ශනා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගාදීවූ සියලු පිළිවෙත් පිරීම **ප්‍රතිපත්ති ධර්මය** නම් වේ. ඒ සියලු මාර්ග පිළිවෙත් හා නවවිධවූ ලොකොත්තර ධර්මයන් ප්‍රකාශ කොට වදාළාවූ පිටකත්‍රය පාලිධර්මය **පර්‍යාප්ති ධර්මය** නම් වේ.

ඒ පර්‍යාප්ති ධර්මය ධර්ම විනයාදි වශයෙන් නොයෙක් ප්‍රභේද වේ. ඒ කෙසේද යත්? සප්ලෝකෛකනාථවූ භාග්‍යවතුන්වහන්සේ සර්වඥාලෝකයෙන් සියලු ලෝකවල ආලෝක පතුරුවා සර්ව සත්ව ඝාත මාර යුගාතිල වෙග ස්පර්ශයෙන් නිර්ගිය මහා ප්‍රදීපයක් මෙන් නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදාළ කල්හි ඒ පරිනිර්වාණ මඞ්ගල්‍යයට රැස්ව උන් සත්ලක්ෂයක් පමණ ගණප්‍රධාන මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේලාට සඞ්ඝසථවිරවූ ආයුෂ්මත් ඇති මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරව සිතින් හිමාලයට වැඩ බුදුන් පිරිනිවි කල මේ රැක මල් පරව වැගිරේවා යි අධිෂ්ඨාන කොට එහි වාසය කරණකල පිරිනිවි සත්වෙනි දිනයෙහි ඒ රැක මල් වැගිර තිබෙන බව දැක දිවසින් බලා මාගේ සවාමිදරුවූ බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑසේකැ යි දැන සංවේගවැ පන්සියයක් රහතුන් වහන්සේ සේ පිරිවරා දෙවෙනි බුදුකෙනකුන් මෙන් සුර බඹ පුද විදිමින්

හිමාලයෙන් නික්ම වැඩ පාවා තම් නුවර සිහා වළඳ කුසිනාරා නුවරට වඩනා මගට පැමිණ සිහිල් රුක් සෙවනක හැමදෙනා වහන්සේ ම වැඩහුන්තැනදී කුසිනාරා නුවරින් එන ආජීවක යකුගෙන් බුදුන් පිරිනිවි බව නියම කොට අසා දැන පාඨක්ජන භික්ෂූන් වහන්සේලා ගඩා වලප්නා කල්හි නමින් සුභද්‍රවූ ගුණ යෙන් අහද්‍රවූ මහළුකල පැවිදිවූහෙයින් බුඩිඝපබ්බජිතය යි ලද නම් ඇති අශ්‍රබා දුර්ජන පාපී නපුරු මහණෙක් පූර්වයෙහි එක්දව සෙක ආතුමා නම් නුවරට බුදුන් වැඩිකල්හි අකැප සමාදනයෙන් තමා සැදූ කැදක් නොවළඳිය යුතුය යි වදළ බණට නො සතුටුව හිතෙහිව වැඩ පිණිස වදුළ බුදුබණට අනාදර කොට වෛර බැඳ එතැන් පටන් රොසයෙන් කිපී හුන්නේය.

එදවස් බුදුහු පිරිනිවන් පෑහ යි අසා සතුටුව එතැන්හි ශෝක යෙන් වලප්නා ඒ හැම භික්ෂූන්ගෙන් එකී එකී නමක් සම්පයට ගොස් සතුටු සතුටු ව ඔවුන් ඉදිරියට මදක් මුහුණ දිහුකොට හිස සල සලා බැම තටවමින් මදක් සිනා දක්වා ඇයි ඇවැත්නි, දැන් තෙපි කුමක් පිණිස හඬව්ද? මේ කැපය මේ අකැපය මේ කළමනා දෙයය මේ නො කළමනා දෙයය මේ කාරියය මේ අකාරියය යි අප ඇමට ම කියා වෙහෙස දෙන්නාවූ මහ මහණහු පිටු දැකපුම්හ. ඉන් අපි හැම මෙයින් මතු කැමැත්තක් කරම්හ. නොකැමැත්තක් නොකරම්හ. එසේ හෙයින් මේ තන්හි අපි සතුටුවනා තැන කුමක් පිණිස දෙමින්ස්වූ ද බුදුරජාණන්වහන්සේගේ වචන නමැති මලෙහි බැඳි බොහෝ වෙහෙස විඳ දැන් සැප සේ මිදියම්හ. අපි ඇමදෙනා සැප සේ අභිප්‍රාය ලෙස වසම්හ යි' කිය කියා ගඩන භික්ෂූන් සංගි ඳුවා ඇවිදිනා ප්‍රවෘත්තිය මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ තමන් වහන්සේම දැක වදුරා මෙබඳු පවිටු භික්ෂූහුගේ කර නිවූ සිවුර කෑ උදුරාගෙණ හිස කසාකබඩක් සිසාරා වණ්ඩාලකොට හළමැනවැ යි සිතා කැවතත් සිතනසේක් බුදුන් පිරිනිවි ඇසිල්ලෙහි උන්ගේ ශ්‍රාවකයෝ උනුන් සිවුරු උදුරන්ට වන්නාහගි නිර්‍ලජයෝ නිඳු කරන්නාහුය.

එ හෙයින් පසුව ඊට සුදුසු කාරිය දනුම්හ යි සිතා වදුරා සංඝිදී ගොස් කැවත ධාතු බෙදන පොසොන් පුර විසෙනි දින යෙහි එම මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ බුදුන් පිරිනිවි පළමු වන සතියෙහි තමන් වහන්සේ හිමාලයෙන් නික්ම වඛනාගමනේ ආතුමා නම් නුවරට එන අඛාත මාඝියෙහි සැතපිහුන් තැනදී ආජීවක වචනය අසා ගඩන භික්ෂූන්ට කියන ලද ඒ පාපී භික්ෂු වචනය සිහිකර වදුරා එකී රැස්වූ සඛ්‍යාපථානිඤ්ඤාතවූ මහා භික්ෂු සඛ්‍යයා වහන්සේ මඛ්‍යයෙහි සථවිර භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට ඒ පාප භික්ෂු වචනය ද ප්‍රකාශ කොට කියම්න් ඉදිරියේ දවස මෙබඳු පාපී භික්ෂූහු මේ පාලි ධර්මය වෙන වෙන පක්ෂ බලා ගෙණ නො බෝ දවසකින් නසන්නාහුය. ඉදින් ධර්ම විනය

සඞ්ඝායනා කිරීමෙන් දීප්තිමත්කොට පිහිටවූයේ වී නම් බුදුන් වැඩ සිටියාක් වැනි වෙයි. එබැවින් අපි ඇම රැස්ව ධර්ම පංක්තිකොට තිබුව මැනව. එසේ නො කළහොත් අධර්ම දීප්තිමත් වෙයි. ධර්ම පසුබසී. අවිනය දීප්තිමත් වෙයි. විනය පසුබසී. අධර්මවාදීහු බල වත් වෙති. ධර්මවාදීහු දුර්වලවෙති යි කීසේක.

ඒ ඇසූ භික්ෂුසඞ්ඝයා වහන්සේ කියනසේක් මහාකාශ්‍යප සථවිරයන්වහන්ස, එසේ වීනම් ධර්ම පංක්තිකොට ගන්නාලෙස පුදුසුවූ භික්ෂූන් වහන්සේ අදම තෝරාගත මැනව යි කීහ. එබසට මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ යහපතැ යි ගිවිස එතැන්හි රැස්වූ ගණනායක සත්ලක්ෂයක් මහාසථවිර සඞ්ඝයා වහන්සේ ප්‍රධාන නවාඞ්ග ශාස්තෘ ශාසන ප්‍රභේද පඤ්චප්‍රතිබර පෘථග්ජන ශ්‍රෝතාපන්න සකෘදාගාමි අනාගාමි ශුෂ්කවිදර්ශක සමථයානික මහානුභාව සමාපන්න නොයෙක් කොටිගණන් භික්ෂු සඞ්ඝයා වහන්සේලා අතුරෙන් ත්‍රිපිටක පඤ්චප්‍රති ප්‍රභේදධරවූ චතුපටිසම්භිදු ප්‍රාප්ත සාරසිය අනූනව තමක් පමණ භික්ෂූන්වහන්සේ තෝරා ගෙණ ආනන්දස්ථවිරයන් වහන්සේ රහත් නුවූගෙයින් නැවත රහත්වූකල ඇතුළත් කළයුතු ය යි කියා පන්සියගට නමක් අඩු කළසේක.

ඉක්බිති නොතැන්හිදී ධර්මසඞ්ගායනා කරමෝදැ යි සංඝස්ථා කොට් රජගහනුවරදී යහපතැයි නියමකළසේක එකල්හි හැම දෙනා වහන්සේ ම කියනසේක් එසේවිනම් මේ හවුරුද්දෙහි කියි කෙනෙකුන්වහන්සේත් රජගහනුවර හැර වස්වසන පිණිස නො යායුතුය යි කතිකාකොට භික්ෂූන්ට අස්වා දඹදිව සැරිසරා ඇවිද ඒ ඒ තන්හි බුදුරජානන්වහන්සේගේ පිරිනිවන්පෑම නිසා ශොකයෙන් පිඬිතවූ මහජනයා අස්වසමින් රජගහනුවරට වැඩිසේක.

අනද මහතෙරුන් වහන්සේද බුදුරජානත් වහන්සේගේ පා සිවුරු ගෙණ භික්ෂුසඞ්ඝයාවහන්සේ විසින් පිරිවරණ ලදුව කුසි නාරා නුවරින් නික්ම දනව් සැරිසරා වඩනාසේක් තමන්වහන්සේ පැමිණි පැමිණි සථානයෙහි "ස්වාමීනි ආනන්දසථවිරයන්වහන්ස, සම්බුදුන් වහන්සේ කොයිතබා වඩනාසේක්ද" යි යනාදී නොයෙක් අදෙනා කියමින් මහඟින් හඬා වලපන්නා මහජනයාට අනු ශාසනා කරමින් ක්‍රමයෙන් සැවැත් නුවරට පැමිණ එහි බුදුන්පිරි නිවි දිනයෙහි මෙන් මහජනයාගේ මහත් හැඬීම වැලපීම වූ කල්හි අනිත්‍යතාවෙන් යුක්ත ධර්මකථාවෙන් ඒ මහාජනයා සංසි දුවා ජේතවනාරාමයට වැද දසබලධාරී වූ බුදුරජානන් වහන්සේ

වාසයකරණ ලද ගඳකිළියෙහි දෙර හැර ගෙට වැද බුදුරජානන් වහන්සේ ජීවමාන කාලයෙහි කළමනා සියලු වත් කොට බුදුන් ගේ සියලු ගුණ නැමැති අමෘත රසය දත් බැවින් බුදුරජානන්වහන් සේ කෙරෙහි පිහිටියාවූ ප්‍රේම ඇතිව ක්ෂීණාශ්‍රව නොවූ හෙයින් ලෞකගණන් ජාතිවල ඔවුනොවුන්ට කරණලද උපකාරයෙන් උප න්නාවූ මොලොක් සිත් ඇතිසේක් වනාවත්කොට ඉක්බිත්තෙන් ගඳකිළියට වැද "ස්වාමීනි, බුදුරජානන්වහන්ස" මේ ඔබවහන්සේ පැන්සතහනවේලාව කොවේද? මේ ඔබවහන්සේ හිඤ්ඡුන්වහන් සේට අවවාද දෙන වේලාව නොවේද? මේ සිහසෙය්‍යාවෙන් සැත පෙන වේලා නොවේද? මේ ඔබවහන්සේ දැවිටි වළඳන වේලා නො වේදැ"යි යනාදි වූ ක්‍රමයෙන් අඩනසේක් එක්තරා දෙවතාවකු විසින් "ස්වාමීනි ආනන්දස්ථවිරයන්වහන්ස ඔබවහන්සේ හඬන කල සෙස්සන් කෙසේ අස්වසනසේක්ද"යි කියා සංවේග ඉපදවූ කල්හි ලය තද කොට ශෝක දුරුකිරීමෙන් විහාරයෙහි සුන්බුන් තැන් සකස්කොට කරවූහ. වස්වසන දවස සම්පවූ කල්හි ඒ හැම භික්ෂුසඞ්ඝයා වහන්සේ ම රජගහනුවරට වැඩසේක.

ඉක්බිත්තෙන් එහි පත් උතු පන්සියයක් රහතුන් වහන්සේ ඇසළමස පුරපසළොස්වක්දිනයෙහි පොහොය කොට අවපැළ විය දවස වස්වැස "ඇවැත්නි, බුදුරජානන්වහන්සේ විසින් සුන් බුන්තැන් සකස්කිරීම් වශයෙන් විහාර පිළිදුගුම් කිරීම වණිනා කරණලද බැවින් පළමුවන මස සුන්බුන් තැන් සකස්ක වා විහාර පිරියම් කරවා දෙවෙනි දවස් අජාසත් රජ්ජුරුවන්ට දන්වා උන්ගෙන් මිනිසුන් ගෙණ සමීඳ වචනයට පූජාකරණ පිණිසත් ශ්‍රමණ භවිත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ උන් විසූමාන කාල යෙහි ප්‍රඥප්ති පුරා විහාර පිරියම් කළහ. දැන් උන්වහන්සේ පිරි නිවී හෙයින් විහාර හැරපියා ඒ ඒ තැන පලාගියාහ"යි යන තීර්ථ කවාදයෙන් ගැලවීම පිණිසත්, හරණලදින් වැටී කසල ව ගියාවූ අටලොස් මහාවිහාරයෙහි සුන්බුන් තැන් සකස් කරවා "මහරජ්ජුරුවෙනි, විහාර පිරියම් නිමියේය. දැන් ධම්මි විනය සඞ්ගායනා කරමහ"යි කීසේක.

ඒ අසා රජ්ජුරුවන් විසින් "යහපත ස්වාමීනි, ධම්මසඞ්ගායනා කළ මැනව. මම මාගේ ආඥාචක්‍රය පවත්වම්. ඔබවහන්සේලා විසින් ධම් චක්‍රය පැවැත්වූව මැනව. ස්වාමීනි, අනිකුදු කළමනා කාර්‍යයෙක් ඇත්නම් ඒ මට වදළ මැනවැ"යි ආරාධනාකළ කල්හි ධම්මසඞ්ගායනා කරන්නාවූ භික්ෂූන්වහන්සේට රැස්වහිදිනාවූ සථා නයක් වූව මැනැවැයි කීසේක. ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරු වන් විසින් ස්වාමීනි, කොතැන්හි කෙරෙම්දැ යි විචාළකල්හි

වෙහාර පවිත්‍ර ප්‍රාණතයෙහි සප්තපර්ණි ගුහාචාරයෙහි කරන්ට වට නේය යි වදාළසේක. ඒ ඇසූ රජ යහපතැයි හිඹිස විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවනලද්දක් සේ මනාකොට කරණලද හිතකියාතමහ සොපාන මාලකාදියෙන් සම්පූර්ණතවූ අනෙක ප්‍රකාර මාලාකර්ම ලතාකර්මයෙන් විසිතුරුවූ ලොකයෙහි සිත්කලුවූ වසතු ඇතිතාක් රැස්කොට නිර්මිත කළාක්වැනිවූ දැක්ක යුතු සාර භූෂණයන් ඇති මණ්ඩපයක් කරවා අනෙක ප්‍රකාර ඔලම්බක කුසුමදාමයන් ඇති වියන් හා වටතිර බැඳ බිම නොගෙක් පැහැ ඇති සුවඳ මල් තනා අතුට ලූවාක් වැනි විවිත්‍රකර්මාන්ත සිනියම්කොට ඒ ධර්මමණ්ඩපය බ්‍රහ්ම විමානයක් මෙන් සරහා ඒ මණ්ඩපමධ්‍යයෙහි පන්සියයක් භික්ෂූන් වහන්සේට වෙන වෙන ම පන්සියයක් කැපපසතුරුණු ඇති ආසන පණවා දකුණු දිගට පිටලා උතුරු දිගට අභිමුඛ කොට සප්තවිර අසනයක් ද මණ්ඩප මධ්‍යයෙහි නැගෙනහිරට අභිමුඛකොට බුද්ධාසනයක් හා සමාන ධර්මාසනයක් ද පණවා ඒ ධර්මාසන මස්තකයෙහි දළකඩමයවූ විවිත්‍ර විජිනිපතක් තබා ඒ මණ්ඩපය සිසාරා ඇත් අස් රථ පාබල ධනු ඛඩග කොන්නාදීන් සත් වලල්ලක් වට ආරක්ෂා ලවමින් මගඩෙඟවර අජාසත් රජතෙම මහ සඞ්ඝයාවහන්සේට පිළිවෙළින් පසඟ පිහිටුවා වැඳ දන්වනුයේ "සවාමිනි, මා විසින් කළමනා කවයුතු කොට නිමවනලදු"සි දැන්විය.

එ දවස් භික්ෂූන්වහන්සේ විසින් "ඇවැත්නි, සෙට සන්තිපාත දිනය වන්නේය. නෙපි වූකලී ශෛක්ෂ වූ, මත්තෙහි කළමනා කවයුතු සහිතවූව. එසේ හෙයින් නොපව ඒ සන්තිපාතයට මත්තෙහි කළමනා කවයුතු ඇතිව සිට යන්ව සුදුසු නො වෙයි. ප්‍රමාද නො වෙව"සි ආයුෂ්මත් අනඳ මහ තෙරුන් වහන්සේට කී කල්හි උන්වහන්සේ බොහෝ සේ එදා රාත්‍රියෙහි කායගතාසති කම්සථාන යෙන් කල් යවා අධිකකොට වඩනාලද විර්‍යය ඇති බැවින් සකෘදගාමි මාර්ගඵලවූ මාර්ගඵල විශෙෂයක් උපදවාගන්ට අසමර්ථවූ සේක. එබැවින් මේසේ සිතුසේක. මම විර්‍යය සම්බන්ධයෙහි යෙදෙම් යි සිතා අළුයම්වේලෙහි සක්මනින් බැස ගෙට වැද ඇඳමත් තෙහි මදක්කාල් සැතපී කාය පීඩා සංසිඳුවා ගණිමි යි කාය ඇඳට නැමූසේක. එකල්හි අනඳමහතෙරුන් වහන්සේගේ දෙපය බිමින් ගැලවී ගියේය. ඉක්බිත්තෙහි නො පැමිණියේය. මේ දූතුරෙහි කාමාශ්‍රවාදී සියලු ආශ්‍රවයන් නසා රහත්වූසේක.

ඊට දෙවෙනි දවස් හිලවළඳ ඉක්බිති සෙසු සියලු සථවිර භික්ෂූන් වහන්සේ ම පාසිවුරු තැන්පත්කොට තබා සඞ්ඝ්‍යා වලාපවසේ රත්පැහැඇති පාංශුකූල චීවර පෙරව මාණික්‍යමයවූ සත්තාහ සන් නඬ හස්තිරාජයන් පරිදි දෙන් අජාසත් රජතෙම කරවා දුන් ධම්ම

මණ්ඩපයට රැස්ව මහළු පිළිවෙළ නොයික්මවා තම තමන් වහන්සේට පැමිණි ආසනවල වැඩහිඳිනාසේක් අනද මහතෙරුන්වහන්සේට ආඥනයක් තබා හුන්සේක. ඒ තන්හි සමහර කෙනෙකුන් වහන්සේ මේ අස්න කාටද යි විවාරා ආනන්ද සථවිරයන්වහන්සේයයි කීකල්හි ආනන්ද සථවිරයෝ කොයිදුයි විවාළසේක. එකල්හි අනද මහතෙරුන් වහන්සේ අර්හත් ඵලයට පැමිණිබව දක්වනු කැමතිසේක් සෙසු සථවිරයන්වහන්සේ හා සමග නොගොස් ධර්ම මණ්ඩපයෙහි ආනන්දසථවිරයෝ කොයි හියෝදැ යි යන කථාව උපන්කල්හි දැන් මට එතනට යන්වි වේලාව වන්නේය යි සිතා තමන්වහන්සේගේ ආනුභාවයෙන් පොළොව කිම්ද ගෙණ ගොස් තමන්වහන්සේට පැමිණි අස්නෙහිම හිඳ ඒ බව හැමදෙනා වහන්සේට දක්වූසේක.

එකල්හි මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ ආයුෂ්මත්වූ අනද මහතෙරුන් වහන්සේගේ මුඛපද්මය දැක වදුරමින් ම නටුයෙන් ගිලිහි හිය තාල ඵලයක් වැනිවූ ද රන්පලඟක් මත්තෙහි තබනලද ජාතිරඹිහ මාණික්‍යයක් බඳුවූද වලාකුල් නැති ආකාශයෙහි තැංගාවූ පූර්ණ චන්ද්‍රමණ්ඩලයක් බඳුවූද බාලාකිරණ්ම ස්පර්ශයෙන් සුපුෂ්පිත රෙණුයෙන් රත්වන්වූ ගඟ ඇති පද්මයක් බඳුවූ ද, පිරිසිදුවූ ප්‍රභාසම්පන්නතායෙන්ම රහත් ඵලයට පැමිණිසේකැයි දැන වදුරා සෙසු භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට වදුරණසේක් පින්වත්නි, ආනන්ද සථවිරයෝ අර්හත් ඵලයට පැමිණ විශෙෂයෙන් බැබලී සිටිති. ඉදින් බුදුරජානන්වහන්සේ ජීවත්වී වැඩ උන්සේක් වී නම් අද ඒකාන්තයෙන් ම මේ ආනන්ද සථවිරයන්ට සාධුකාර දෙවා වදුරණසේක. ඒ බුදුන් විසින් දියහුතු සාධුකාර අප විසින් පවත්වනට වටනේය යි වදුරා හැමදෙනාවහන්සේ ම ලවා තුන්විටෙක සාධුකාර දෙවා වදුළසේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂු සඞ්ඝයා මධ්‍යයෙහි මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට "ඇවැත්නි, කිමෙක්ද? පළමුකොට විනය සඞ්ගායනා කරමෝ ද ධර්ම සඞ්ගායනා කරමෝදැ" යි විවාළසේක. එකල්හි අනුරුඬාදි සථවිර භික්ෂූන් වහන්සේ වදුරණසේක් සවාමීවූ මහාකාශ්‍යප සථවිරයන්වහන්ස, **විනයනම් සමීඤශාසනයට ආයුෂයක් වැන්න, විනය සම්තාක් කල්පවත්නේ ද ඒ තාක්කල් ශාසනයත් පවත්නේ වෙයි,** එහෙයින් අපි පළමුකොට ම විනය සඞ්ගායනා කරම්හ යි දැන්වූවාහුය. එකල්හි මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ කවර භික්ෂු කෙනෙකුන් ප්‍රධාන කොට විනය

සඞ්ඝයාගෙන් කථායුතුදැ යි අනුරුබුදු සථවිර භික්ෂූන්ගෙන් විවාළ කල්හි ආයුෂ්මත් උපාලි සථවිරයන් ප්‍රධානකොට විනය සඞ්ඝයාගෙන් කරමහයි කිවැහුය. එකල්හි මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ විනය විවාරණ පිණිස තමන්වහන්සේ විසින් ම තමන් සම්මන්නා නය කරණසේක් "ඇවැත්නි, සඞ්ඝයා මා කියන්නක් අසනසේක්වා, ඉදින් සඞ්ඝයාගෙන් ප්‍රාප්තකල් ඇත්තෙම් වීම් නම් මම උපාලි සථවිරයන් කෙරෙන් විනය විවාරමි" යි සඞ්ඝයාට අස්වා තමන් සම්මන්නා නය කළසේක.

එකල්හි උපාලි සථවිරයන් වහන්සේ ද විනය විසජ්නය කරණ පිණිස තමන්වහන්සේ විසින් ම තමන් සම්මන්නා නය කරණසේක් "සඞ්ඝයා වහන්සේ මා කිඹන්නක් අසන සේක්වා! ඉදින් සඞ්ඝයා වහන්සේගෙන් ප්‍රාප්තකල් ඇත්තෙම් වීම් නම් මම මේ ආයුෂ්මත් මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ විසින් විනය විවාරණ ලද්දෙම් විසජ්නය කෙරෙමි" යි සඞ්ඝයා වහන්සේ අස්වා තමන් සම්මන්නා නය කළසේක. මෙසේ සම්මන්නා නය කෙරෙමින් මහා සථවිර භික්ෂූන්ට නමස්කාර කොට අවසර ගෙණ දන්නා බවින් විජනිය අතින් ගෙණ පූර්ව දිශාභිමුඛව ධර්මාසනයෙහි වැඩහුන්සේක.

එකල්හි සථවිර ආසනයෙහි වැඩහුන් ආයුෂ්මත් මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ ඇවැත්වූ උපාලි සථවිරයෙනි, ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය කොතැන්හි දී පණවනලදදැ යි ආයුෂ්මත් උපාලි සථවිරයන්ගෙන් විවාළසේක. එකල්හි උන්වහන්සේ ස්වාමීන් වහන්ස, විශාලා මහනුවරදී පණවන ලදැයි කීසේක. කවර පුද්ගල යෙකු අරභයා දැ යි විවාළ කල්හි සුදින්න නම් කලඳක පුත්‍රයන් අරභයාය යි කීසේක. කවර වස්තුවෙක්හි දැ යි විවාළ කල්හි මෛථුනධම්මවස්තුවෙහි ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය පණවන ලදැ යි කීසේක. මෙසේ ආයුෂ්මත් උපාලි සථවිරයන්ගෙන් ප්‍රථම පාරාජිකාවට වස්තුව ද විවාළසේක. ප්‍රඥප්තිය ද විවාළසේක. අනුප්‍රඥප්තිය ද විවාළසේක. ආපත්තිය ද විවාළසේක අනාපත්තිය ද විවාළසේක. යම්සේ ප්‍රථම පාරාජිකාවට විවාරණලද ද එසේම දෙවන තුන්වන සතරවන පාරාජිකාවන්ට ද වස්තු ආදි ගිහිල්ල විවාළසේක. විවාළ ඊවාළ දෙය උපාලි සථවිරයන්වහන් සේ ත් විසඳූ සේක.

ඉක්බිත්තෙන් මේ සතර පාරාජිකාවෝ පාරාජිකා කාණ්ඩ නමැ යි සංග්‍රහයට කගා තෙරස සඞ්ඝාදිශේෂයෝ තෙරස කාණ්ඩ ය යි නම් තිබුවාහුය. ශික්ෂාපදයෝ දෙදෙනෙක් මෙඇතිගතැයි නම් තිබුවාහුය. ශික්ෂාපදයෝ තිස්දෙනෙක් නිසඝිපවිතිය යි නම් තිබුවාහුය. ශික්ෂාපදයෝ අනූදෙදෙනෙක් පවිතිය යි නම් තිබුවාහුය. ශික්ෂාපදයෝ සතරදෙනෙක් පාටිදෙසනීය යි නම් තිබුවාහුය. ශික්ෂාපදයෝ පන්සැත්තෑ දෙනෙක් සෙඛියය යි නම් තිබුවාහුය.

සප්තධර්ම සංගායනාව අධිකරණසමථයයි නම් වූවාහුය. මෙසේ මහාවිහාරික සංඝයාට හේතු භික්ෂුණී විභාගයෙහි ශික්ෂාපදයෝ අටදෙනෙකු මේ පාරාජිකා කාණ්ඩය යි නම් වූවාහුය. ශික්ෂාපද සතලොසක් සත්තරස කාණ්ඩය යි නම් වූවාහුය. ශික්ෂාපද තිස් දෙනෙකු නිසඟි පවිත්තිය යි නම් වූවාහුය. ශික්ෂාපදයෝ සැට සදෙනෙකු පවිත්තිය යි නම් වූවාහුය. ශික්ෂාපදයෝ අටදෙනෙකු පාටි දෙසනීය යි නම් වූවාහුය. ශික්ෂාපදයෝ සැත්තැපස්දෙනෙකු සෙඛියාය යි නම් වූවාහුය. සප්ත ධර්ම සංගායනාව අධිකරණසමථ යෝය යි ද නම් වූවාහුය. මේසේ මේ භික්ෂුණීවිභාගය යි කියා සංග්‍රහයට හේතු මෙම ක්‍රමයෙන් ම බික්ඛු පරිවාරයෙහි දු තැබුවා හුය. මේසේ උභතෝ විභාග සහිතවූ බික්ඛු පරිවාරයත් විනය පිටකය යි සංග්‍රහයට හේතු ඒ සියල්ල ම පිළිබඳ මහාකාශ්‍යප සථවිර යන් වහන්සේ විවාළ විවාළ දෙය උපාලි සථවිරයන්වහන්සේ විසඳූ සේක. මේසේවූ පෘච්ඡා විස්සජ්ජනාවසානයෙහි පන්සියයක් පමණ මහරහතුන් වහන්සේ ධර්මසංගායනාවට නැඟි ක්‍රමයෙන්ම ගණ ස්ජඣායනා කළසේක එසේ විනය සංගායනා කොට නිමිකල්හි මහාපෘථිවිය කම්පාවූවාය.

එකල්හි ආයුෂ්මත්වූ උපාලි සථවිරයන් වහන්සේ දනතධවිත විජනිය අතින් හෝ ධර්මාසනයෙන් බැස සථවිර භික්ෂූන් වහන්සේ ලාට වැඳ අවසර ගෙණ තමන් වහන්සේට ප්‍රාප්ත ආසනයෙහි වැඩ උන්සේක.

මෙම කිහ සද්ධර්ම සංග්‍රහයෙහි

"සත්ත සත සහස්සානි තෙසු පාමොක්ඛ භික්ඛවෝ,
ථෙරෝ මහාඛස්සපෝ ච සඞ්ඝත්ථේරෝ තදා අහු.

ලෝකනාථෝ දඅබලෝ සත්තාහ පරිනිබ්බුතෝ,
දුබ්භාසිතා සුභද්දස්ස බුඞ්ඛස්ස වචනා සරං.

භික්ඛූ පඤ්චසතේ යෙව මහාඛීණාසවේ වරේ,
උවවිනිත්වා මහාථෙරෝ මහාසංගීතිං කාතවේ.

වස්සානං දුතියේ මාසේ දුතියේ දිවසේ පන,
රුවිරේ පවවයෙ තස්මිං ථෙරා සන්නිපතිංසු තෙ.

මහාථෙරෝව අත්තානං විනයං පුවජිතුං සයං
සමමන්නි පාලිත්ථේරෝ ච විස්සජේජතුං තමේ ච තු

ථෙරාසනෙ නිසීදිත්වා විනයන්තමපුවජි සෝ,
ධම්මාසනෙ නිසීදිත්වා විසජේජසි තමේවෙ සෝ.

විනයං සුණමානත්තා විස්සජ්ජිත කමෙන තෙ,
සබ්බ සජඣායමකාසුං විනයෙ නයකොවිදා" ති.

මෙසේ විනය සඞ්ගායනා කොට නිමවා ඊට ඉක්බිතිව සඞ්ගීය සඞ්ගායනා කරණු කැමති ආයුෂ්මත් මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ ධර්මසඞ්ගායනාකරන්නාවූ අපවිසින් හෝ වර පුද්ගලයෙකුගේ ප්‍රධානකොට ධර්ම සඞ්ගායනා කටයුතුදැයි අනුරුද්ධාදි සථවිර භික්ෂූන් අතින් විමැලසේක. එකල්හි උන්වහන්සේලා ආනන්ද සථවිරයන් ප්‍රධානකොට ධර්මසඞ්ගායනා කරම්හයි කීවාහුය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ ධර්ම විචාරණ පිණිස තමන්වහන්සේ විසින් ම තමන් සමඟ ඤාණය කළසේක. ආනන්ද සථවිරයන් වහන්සේ ද ධර්ම විසඳීම්හය කරණු පිණිස තමන්වහන්සේ විසින්ම තමන් සමඟ ඤාණය කළසේක. එසේ සමඟ ඤාණය කොට ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේ හුනස්නෙන් නැඟී සිවුර එකාංශ කොට පොරවා ගෙණ සථවිර භික්ෂූන් වැඳ අවසරගෙණ ධර්මාසනයෙහි වැඩහිඳ දනනඛවිතවිජනිය අතින් ගත්සේක.

එකල්හි ථෙරාසනයෙහි වැඩහුන් මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ ඇවැත්වූ ආනන්දසථවිරය! භාග්‍යවතුන්වහන්සේ විසින් බ්‍රහ්මජාලසූත්‍රය හොතැන්හි දී වදරණලදදැ සි කියා ධර්ම ආනන්ද සථවිරයන්ගෙන් විමැලසේක. එකල්හි උන්වහන්සේ විසඳාසේක්. සවාමිනි! රජගහ නුවරට ද නාලන්දාවට ද මධ්‍යයෙහිවූ අම්බලට්ඨිකා නම් උයන්හි භාරණලද රාජ්මඳිරයෙහිදී ය සි දැන්වූසේක. භාවර පුද්ගලයෙකු අරභයාදැයි විමැලකල්හි සුප්පිය නම් පරිව්‍රාජකයා ද බ්‍රහ්මදත්ත නම් මානවකයා දැ සි යන මේ දෙදෙනා අරභයා වදරණලදැ සි දැන්වූසේක. එකල්හි ආයුෂ්මත්වූ මහාකාශ්‍යපසථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද සථවිරයන් කෙරෙන් බ්‍රහ්මජාල සූත්‍රයට නිදානය ද විමැලසේක. පුද්ගලයා ද විමැලසේක. මෙසේ විමැරා ඊට අනතුරුව ඇවැත්වූ ආනන්ද සථවිරයෙනි! ශ්‍රාමණ්‍යඵල සූත්‍රය කොතැන්හි දී වදරණ ලදදැ සි යනාදිය විමැලසේක. එකල්හි අනදම්හ තෙරැන්වහන්සේ සවාමීන්වහන්ස, රජගහනුවර ජීවකඹන්ගේ අඹුඋන්හි දී යසි දැන්වූසේක. භාවරක්ෂු අරභයාදැ සි විමැල තැන වෙදෙහි පුත්‍රවූ අජාසත් රජ්ජුරුවන් අරභයා වදරණ ලදැ සි දැන්වූසේක. මෙසේ ආයුෂ්මත් මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ ආනන්ද සථවිරයන් වහන්සේ කෙරෙන් ශ්‍රාමණ්‍යඵලසූත්‍රයට නිදානය ද විමැලසේක, පුද්ගලයා ද විමැලසේක. මේම ක්‍රමයෙන් ම බ්‍රහ්මජාලසූත්‍රාදි සූතිස් සූත්‍රයක් පමණ ඇති දීඝනිකාය විමැරා සඞ්ගායනාමඟකාට මේ දීඝනිකාය නමැ සි කියා ගණසජ්ඣායනා කොට ඉක්බිතිව ඇවැත්වූ ආනන්දසථවිරයෙනි,! තොප නිශ්‍රිත තැන්වලට කියවා රජකාරව සි කියා ආයුෂ්මත් ආනන්ද සථවිරයන්ව භාරකළසේක. ඒව

ඉක්බිතිව මූලපර්‍යාය සූත්‍රාදී එක්සිය දෙපණහක් පමණ සූත්‍රයන් ඇති මජ්ඣිමනිකාය විවාරා සඞ්ගායනා කොට දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ නිශ්‍රිත භික්ෂූන්ට මේ මජ්ඣිම නිකාය තොප විසින් රක්ෂාකරවයි කියා භාරකළසේක. ඊට ඉක්බිතිව ඔඝතරණ සූත්‍රය ආදිවූ සත්දහස් සත්සිය දෙසැවක් පමණ සූත්‍ර ඇති සංයුත්තනිකාය විවාරා සඞ්ගායනා කොට සර්‍වාමීන් වහන්ස, මේ සංයුත්තනිකාය ඔබවහන්සේගේ නිශ්‍රිත භික්ෂූන් වහන්සේලාට කියවා රක්ෂාකරණසේක් ව සි කියා මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේට භාරකළසේක. ඊට ඉක්බිතිව විත්තපරියාදාන සූත්‍රය ආදිවූ නවදහස් පන්සිය සත්පණහක් පමණ සූත්‍ර ඇති අංගුත්තර්‍රනිකාය විවාරා සඞ්ගායනාකොට නමවා මේ අංගුත්තර නිකාය ඔබවහන්සේගේ නිශ්‍රිත භික්ෂූන්වහන්සේලාට කියවා රක්ෂා කරනසේක්ව සි කියා අනුරුද්ධස්ථවිරයන්වහන්සේට භාරකළාහුය.

ඊට ඉක්බිතිව ක්ෂුද්‍රකපාඨය, ධම්පදය, උදානය, ඉතිවුත්තකය, සූත්‍රනිපාතය, විමාන වස්තුවය, ප්‍රෙතවස්තුවය, ථෙරගාථාය, ථෙරිගාථාය, ජාතකය, මහානිද්දේශය, චූලනිර්දේශය, පටිසම්භිදාය, අපදානය, බුද්ධවංශය, චර්‍යාපිටකය යන ක්‍රමයෙන් පසළොස් ප්‍රභෙදවූ කුදුගොත් සහිත විවාරා සඞ්ගායනා කොට මේ සූත්‍රපිටකය සි නම් තබා, ඊට ඉක්බිති ව ධම්සඞ්ගණිය, විභඞ්ගය, ධාතුකථාය, පුද්ගලප්‍රඥප්තිය, කථාවස්තුය, යමකය, පට්ඨානය යන මහාප්‍රකරණයන්ගේ වශයෙන් සත්ප්‍රකාර වූ ප්‍රකරණයක් විවාරා සංගායනාකොට මේ අභිධම්පිටකය නමැයි මෙසේ සංගායනාවට නැගූ සියල්ල මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ විවාළසේක. එසේ විවාළ විවාළ දෙය අනද මහතෙරුන් වහන්සේ විසඳුසේක. පුර්‍වෂ විස්සර්ජනයාගේ කෙළවර පන්සියයක් පමණ රහතන් වහන්සේ සංගායනාවට නැගූ ක්‍රමයෙන් ම ගණසජ්ඣායනා කළාහුය. ඒ ධම්සංගායනාවගේ අවසානයෙහි මහාපෘථිවි තොමෝ කම්පාවීය. එකල්හි අයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ දන්තධවිත ව්‍රජනිය අතින් තබා ධම්ආසනයෙන් බැස ස්ථවිර භික්ෂූන් වැඳ අවසර ගෙණ තමන් වහන්සේට පැමිණි ආසනයෙහි වැඩහුන්සේක.

මෙම කියතලදුගේ මැයි,

අත්‍ථං බහුස්සුතා නීතා කොසාරක්‍ඛ මහෙසිනෝ
සම්මන්නිත්‍වාන අත්තානං ථෙරෝ ධම්මම්පුව්‍ජ සෝ.

තථා සම්මන්නි අත්තානං ධම්මාසන ගතෝ සයං,
ව්‍රිස්සජ්ජේසි තමානන්ද ථෙරෝ ධම්මසෙසනෝ ති.

මේ සියලු බුඩ වචන රස වශයෙන් ඒකවිධ වෙයි. ධම්ම විනය වශයෙන් ද්විවිධ වෙයි. ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධවෙයි. පිටක වශයෙන් ද ත්‍රිවිධ වෙයි. නිකාය වශයෙන් පඤ්චවිධ වෙයි. අංග වශයෙන් නවවිධ වෙයි. ධම්මස්කන්ධ වශයෙන් අසූහාර දහසක් ස්කන්ධයෝ වන්නාහුය යි දතයුතු. එහි සියලු ධම්මය රසවශයෙන් එකවිධවූ පරිදි කෙසේ ද? යත්;

සඩ්ගීතාරූඪ දෘඪකාවූ අප ගාරුඩාවතුන්වහන්සේ සම්‍යක් සම්බෝධියට පැමිණ යම් කාලෙක අනුපාදිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවන්පෑ වදුළසේක්ද, මේ දූතුරෙහි පන්සාළිස් හවුරුද්දක් ඇතුළත දිව්‍ය මනුෂ්‍ය නාග යක්ෂාදීන්ට අනුශාසනා කරන්නාවූ හෝ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ හෝ ඒ භාග්‍යවත් ලෝකාචාර්‍යයන් වහන්සේ විසින් යම් යම් ධම්මයක් වදාරණලද ද අවබෝධකරණලද ද ඒ සියලු ධම්ම ම එකම විමුක්තිය යි කියනලද සියලු දුකින් මිදීම වූ අමෘත මහා නිර්වාණය ම රසකොට ඇත්තේය. මෙසේ ධම්ම රස වශයෙන් එකවිධ වේ. ධම්ම විනය වශයෙන් ත්‍රිවිධවූ පරිදි කෙසේද? යත්, විනය පිටකය ම විනය නම් වෙයි. අවශෙෂවූ සූත්‍රාභිධම්මපිටකවය ධම්ම නම් වේ. මෙසේ ධම්ම විනය වශයෙන් දෙකක් වේ. ප්‍රථම මධ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධවූ පරිදි කෙසේද? යත්,

අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තෝ දුක්ඛා ජාති පුනප්පුනං.
ගහකාරක දිට්ඨොසි පුනගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං;
විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා ති.

මේ ප්‍රථම බුඩවවනය යි. සමහර කෙනෙක් "යදා හවෙපාතු භවනත්තිධම්මා" යනාදි ඛන්ධකයෙහි උදාන ගාථාව ප්‍රථම බුඩවවනය යි කියන්නාහුය. ඒ ගාථාතොමෝ බුදුවූ දවසට දෙවෙනිවූ පැළවිය දිනයෙහි සප්තසතාඥනයට පැමිණ සොමනස්ස ඤාණයෙහි පිහිටා ඔට ප්‍රත්‍යයාකාර ධම්මයන් සිහිකරන්නාවූ බුදුරජාණන් වහන්සේට උපන් ප්‍රීතිය පහළ කළාවූ උදාන ගාථාය යි දතයුත්තිය.

මහාපරිනිර්වාණ කාලයෙහි භික්ෂූන්ට අඩගා වදාරා "හන්ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො වය ධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යනුවෙන් වදාළ යම් අන්තිම බුඩ වවනයෙක් ඇද්ද ඒ ප්‍රථම බුඩවවනය නම්වේ. මේදෙයතුරෙහි පන්සාළිස් අවුරුද්දක් ඇතුළත

වදාරණලද යම් යම් බුඩ වචනයෙක් ඇද්ද, ඒ හැම මඩ්‍යම බුඩ වචන නම් වේ. මෙසේ සියලු ධර්මයම ප්‍රථම මඩ්‍යම පශ්චිම වශයෙන් ත්‍රිවිධ වේ. පිටක වශයෙන් ත්‍රිවිධවූ පරිදි කෙසේද? යත්, සියලුම බුඩවචනය විනයපිටකය, සූත්‍රපිටකය, අභිධර්මපිටකය යි කියා තුන් ප්‍රකාර වේ. ඒ ප්‍රකරණයන්ගේ ප්‍රභෙදය මෙහි ධර්ම සඩ්ගායනා ප්‍රවෘත්තියෙහි ප්‍රකාශවූ බැවින් ඒ පිටකත්‍රය විභාග දැක්වූ ගාථා පාලික්‍රමය එම නයින් මෙහි දක්වන්නු ලැබේ. ඒ කෙසේද? යත්,

තෙසු පාරාජිකා කණ්ඩං පාචිත්තියමථාපරං,
නික්ඛිත්තානං ච භඩ්ගං ච මහාවග්ගෝ තථා පරෝ;
චූලවග්ගෝ ච පරිවාරෝ විනය පිටකන්ති නං මතං.

මෙසේ ප්‍රකරණ වශයෙන් පසක්වූයේ විනය පිටකය නම් වේ.

චතුතතිංසෙ ච සුත්තානි තිවග්ගෝ යස්ස සංගහෝ,
එස දීඝනිකායෝ ති පඨමෝ අනුලොමිකෝ.

දියඩ්ඩ සත සුත්තන්තා වෙව සුත්තානි යට්ඨ සෝ,
නිකායෝ මජ්ඣිමෝ පඤ්ච දස වග්ග පරිග්ගහෝ.

සත්ත සුත්ත සගස්සානි සත්ත සුත්ත සතානි ව,
මාසඩි වෙව සුත්තන්තා එසෝ සංයුත්ත සංගහෝ.

නවසුත්ත සහස්සානි පඤ්ච සුත්තා සතානිව,
සත්ත පඤ්ඤාස සුත්තානි සංඛා අංගුත්තරෙ අයං.

ඛුද්දපාඨෝ ධම්මපදං උදානං ඉති වුත්තකං,
සුත්ත නිපාත විමානං පෙතවත්ථු මථාපරං.

ථෙර ථෙරී ව ජාතකං නිද්දෙසෝ පටිසම්භිදා,
අපදානං බුඩවංසෝ චරියාපිටකමෙවව;
පණ්ණරසපභෙදෙයං නිකායෝ ඛුද්දකෝ මතෝ.

මෙසේ නිකාය වශයෙන් පසක්වූයේ සූත්‍රපිටක නම්වේ.

ධම්ම සඩ්ගණී විභඩ්ගඤ්ච ධාතු කථා තථා පරං,
තතෝ පුග්ගල පඤ්ඤත්තිං කථාවත්ථුප්පකරණං.

යමකං අථ පඨානං ඉමෙ සත්තප්පභෙදතෝ,
අභිධම්මෝ ති පිටකං සම්මාසම්බුඩ දෙසිතං ති.

මෙසේ ප්‍රකරණ වශයෙන් සතක්වූයේ අභිධම්ම පිටක නම්වේ.
මෙසේ මෙ ධර්මය පිටකවශයෙන් ත්‍රිවිධ වූ පරිදි දතයුතුයි.

එහි සියලු බුඩවචනය ම නිකාය වශයෙන් පසක්වූ පරිදි කෙසේද? යත්, දීඝනිකාය ය, මජ්ඣිමනිකාය ය, සංයුත්ත නිකාය ය, අංගුත්තරනිකාය ය, ඛුද්දකනිකාය ය යි, පඤ්ච ප්‍රකාර නිකායයන් අතුරෙන් දීඝනිකායාදි සතර සතරක් කොට ම ගැණ අවශෙෂ සියලු විනයාභිධම් ඇතුළුවූ බුඩවචනයෝ ඛුද්දක නිකායෙහි ම ඇතුළත් කොට පස්නිකායක්වූ බැව් දතයුතුයි.

මෙම කියනලද මැ සි, පූර්වාචාර්යවරයන් විසින්,

එපෙච්චා චතුරෝ පෙතෙ නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුඩ වචනං නිකායෝ ඛුද්දකෝ මතෝ ති.

මෙසේ නිකාය වශයෙන් පඤ්චවිධ වේ.

මේ සියලු ධර්මය ම අඩගවශයෙන් නවවිධවූ පරිදි කෙසේද? යත්, සූත්‍රය, ගෙය්‍යය, වෙය්‍යාකරණය, ගාථාය, උදානය, ඉති වුත්තකය, ජාතකය, අබ්භූතධර්මය, වෙදල්ලයයි කියා අඩග වශයෙන් නවප්‍රභෙද වේ. එහි භික්ෂු විභඩගය භික්ෂුණී විභඩග ය යි කියන ලද උභතෝ විභඩගය නිර්දෙශය ඛඩක පරිවාරාදිවූ ද සූත්‍ර නිපාතයෙහි මංගල සූත්‍ර, නාලකසූත්‍ර තුවටක සූත්‍රයන් ද, අන්‍යවූත් සූත්‍රය යන නම් ඇති යම් බුඩවචනයක් ඇද් ද, ඒ සිය ල්ල ම සූත්‍රය යි දතයුතු.

ගාථා සහිතවූ සියලු සූත්‍රය ගෙය්‍ය යයි දතයුතු. විශෙෂයෙන්ම සංයුත්තගයෙහි සියලු ම සගාථක වගිය ඇතුළත් වේ. සියලු අභි ධර්ම පිටකය හා ගාථා නොමැති සූත්‍රයන් ද අන්‍යවූ ද අවශෙෂ අංග අට හා සංග්‍රහනොවූ යම් බුඩවචනයක් ඇද් ද ඒ සියල්ල වෙය්‍යාකරණය යි දතයුතු. ධර්මපදය, ථෙරගාථාව, ථෙරීගාථාව, සූත්‍රනිපාතයෙහි සූත්‍රයයි නම් නැති සුබ්‍රහ්මගාථාවෝ ද ගාථාය යි දතයුත්තිය. උපන් සතුටු සොම්නස් ප්‍රකාශ ගාථායෙන් යුක්තවූ දෙ අසූ සූත්‍රාන්තයෝ උදානය යි දතයුතු. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදැ යි යනාදි වශයෙන් පවත්නාවූ ද සූත්‍රාන් තයෝ ඉතිවුත්තකය යි දතයුතු. අපණ්ණකජාතකය ආදිවූ පන් සිය පණස් ජාතකයෝ ජාතකය යි දතයුතු. වත්තාරෝ මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භූතා ධම්මා ආතන්දෙති" මේ ආදි කථ ප්‍රවෘත්තවූ සියලු ම ආශ්චර්‍ය අද්භූත ධර්මප්‍රවෘත්ති සංයුක්තවූ සූත්‍රාන්තයෝ අබ්භූතධර්මයෝය යි දතයුතු. චූලල වෙදල්ල මහා වෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සංඛාරභාජනීය මහාපුණ්ණසූත්‍රාදි සියල්ල ම වෙදය ද තුෂ්ටිය ද ලැබ ලැබ විචාරිමෙන් පහළවූ සූත්‍රාන් තයෝ වෙදල්ල ය යි දතයුතු. මෙසේ මේ ධර්මය අඩගවශයෙන් නවවිධවේ. එහි ධර්මස්කන්ධ වශයෙන් අසූඅාර දහසක් වූ පරිදි කෙසේද? යත්.

වාසිතිං බුද්ධතෝ ගණ්හිං වෙ සහස්සානි භික්ඛුතෝ,
චතුරාසීති සහස්සානි යෙ මෙ ධම්මා පවත්තිනෝසී.

මෙසේ සියලු ධම්ස්කන්ධ ගණනයෙන්වූ අසූඅාර දහසක් අතු රෙන් විනය පිටකයෙහි වූ ධම්ස්කන්ධයෝ විසිඑක් දහසෙක. සූත්‍ර පිටකයෙහි ධම්ස්කන්ධයෝ විසිඑක් දහසෙක. අභිධම්පිටකයෙහි ධම්ස්කන්ධයෝ සතළිස්දෙදහසකැ යි මෙසේ ප්‍රකාශ ධම්ස්කන්ධ විශ යෙන් අසූඅාරදහසක් ප්‍රභෙද වේ. එහි එකානුසන්ධික සූත්‍රය එක් ධම්ස්කන්ධයෙක. යම් සූත්‍රයක් නොයෙක් අනුසන්ධි ඇත්තේ ද එහි අනුසන්ධි වශයෙන් ගෙවත් සන්ධිගණනින් ධම්ස්කන්ධ ගණන වන්නාහුය. ගාථා බන්ධනවල ප්‍රශ්න විවාරීම් එක්ධම්ස්කන්ධ යෙක. එම ප්‍රශ්නයාගේ විසඳීම එක් ධම්ස්කන්ධයෙක. අභිධම් යෙහි එකි එකි නික දුක හාජනීය එකි එකි චිත්තවාරය බැගින් බෙදූ වෙන්වෙන් ව සිටි චිත්තවාර හාජන ගණනාවෙන් එකි එකි ධම්ස්කන්ධ නම් වේ. විනය පිටකයෙහි වස්තු ඇත. ඒ ඒ ශික්ෂාපද යන්ගේ අතික්‍රම වස්තු මාතිකා ඇත. පදභාජනීය ඇත, අනන්තරා පත්ති ඇත. අනාපත්ති ඇත, එහි ඒ වස්තු ආදීන් වෙන් වෙන් කොට දක්වූ ඉති ශබ්දයා සම්බන්ධ වූ නිකාරයෙන් ශේදව වෙන් කොට සිටියේ එක එක ධම්ස්කන්ධයකැයි දතයුතුයි මෙසේ මේ සියලු ධම්ස්කන්ධ වශයෙන් අසූඅාරදහසක් ප්‍රභෙදය වන්නේය.

මේ ආදී නොයෙක් ප්‍රභෙද ඇති සියලු ධම්යම සංගායනාකරන්නාවූ මහාකාශ්‍යප සථවිරාදී වූ නිඝ්‍රූ සංඝයා වහන්සේ විසින් මේ ධම්ය මේ විනය යි යනාදී ක්‍රමයෙන් ව්‍යවස්ථා කොට ධම් සංගායනා කිරීමෙන් සත්මසකින් නිමවනලදී. ඒ ධම්සඞ්ගායනාවගේ කෙළවර අහෝ මහාකාශ්‍යපසථවිරයන් වහන්සේ විසින් දසබල ධාරීවූ බුදුරජානන් වහන්සේගේ උතුම් නෛයාණික ශාසනය පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පවත්නා සේ සථිරකරණලදැයි කියා උපන් සතුටුඅතුව සාඛුකාර දෙන්නියකමෙන් දියපොළොව අවසන්කොට ඇති මේ මහා පෘථිවි තොමෝ අනෙක ප්‍රකාරයෙණ් කම්පාවූවාය. පූර්වදිශාදි ඒ ඒ දිගට යෙමින් කම්පාවූවාය. හාත්පසින් නැමී අත්ඛමරක්මෙන් විශෙෂයෙන් කම්පාවූවාය. එනල්හි අනිකුදු නොයෙක් අශ්චර්‍යයෝ ද පහළවූවාහුය. ඒ ධම් සඞ්ගායනාව පැවැත්වූ සථවිර භික්ෂූන්වහන්සේලා ද ආයුප්‍රමණින් වැඩසිට පිරිනිවන් පෑවාහුය. මෙම දක්වනලදමැයි පූර්වාචාර්‍ය වරයන් විසින්

සතෙහි පඤ්ඤහි කතා තෙන පඤ්චසත්තානි ව,
ථෙරෙහෙව කතත්තා ව ථෙරිකා ති පවුච්චති.

එවං සත්තහි මාසෙහි ධම්ම සංගීති නිට්ඨිතා,
සබ්බලොකා හිතාවහොය සබ්බලොක හිතෙසිහි.

මහාකස්සප ථෙරෙන ඉදං සුගත සාසනං,
පඤ්චවස්ස සහස්සානි සම්පථං වත්තතෙ තතං.

අතීව ජාත පාමුජ්ජා සංඛාරඤ ජලනතිකා,
සංගීති පරියොසානෙ ඡ්ධාකම්පි මහා මහි.

අවජ්රියානි වාහෙසුං ලොකෙ නෙනානි නෙකධා,
ථෙරෙ ගෙ ච භතත්තා ච ථෙරිකා යං පරම්පරා.

පඨමං සංගහං කත්වා කත්වා ලොකහිතං බහුං,
තෙ යාවතායුකා ත්වා ථෙරා සබ්බෙව නිබ්බුතා නි.

මෙසේ අනුබුබවූ මහානුභාව සම්පන්න මහාකාශ්‍යප සථවිරාදි පන්සියයක් පමණ මහරහතන්වහන්සේ එක්ව වැඩහිඳ සත්මසක් මුළුල්ලෙහි සඛනායනා කාරණ තරම් විවිධ විශෙෂණයෙන් බබළන සඛම්මානුශාසනා සඛ්‍යාත උතුම් ධම්කාශසම්පත්තියක් ඇති හෙයින් අවින්නාවූ මාගේ බුදුරජානන්වහන්සේ ශාස්තෘ නම් වනසේක.

එසේ හෙයින් කියනලදී.

දෙව යක්ඛ මනුස්සානං ලොකො අගග ථලං දදං,
දදන්නං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ සී.

ලෝවැඩ පිණිස කරණ ලද මේ ශ්‍රී සඛම්මවාද සංග්‍රහ ශයහිවූ ප්‍රථම ධම්ම සඛ්‍යායනාකථාව කියා නිමවන ලදි.

මේ පළමුවෙනි ධම් සඛ්‍යායනාව මෙසේ කරවා බුඛ ශාසනය පවත්වාලීමෙහි සහායව සිටි අජාසත් මහරජතෙම සමි සමෘද්ධි සම්පන්න විසාලා මහනුවර ලිච්ඡවි රජදරුවන්ගේ ප්‍රතිඛ්ඛනය පිණිස පඤ්චමහා ගඛ්ගාවන් අතුරෙන් ප්‍රධානවූ ගඛ්ගානදී නදියගේ ගෙතුම නම් තිණ්ඩයට නුදුරුතැන්හි පාටලී ග්‍රාමයෙහි පාටලීපුත්‍ර නම්වූ මහත් නුවරෙක් ඇතිකොට බුදුන් පිරිනිවි කල්හි මහා ධාතු නිධානකළ ඉක්බිත්තෙන් රජගහනුවර හැරපියා ගොස් එම පැළලුප් නුවර විසූසේය. ඒ අජාසත් රජ හට ඉක්බිත්තෙන් එම පැළලුප්නුවර ම විසූ උදයභද්‍ර නම් රජය, අනුරුඛ නම් රජය, මණ්ඩ නම් රජය, නාගදාස නම් රජය, සුසුනාග නම් රජය යන මේ මහ රජදරුවන් සදෙනෙකු අවැමෙන්

රාජ්‍යාභිෂේකයට පැමිණියාවූ කාලාසෝක රජුදරුවන්ට දස වෙනි අවුරුද්දෙහි එතනට බුදුන්පිරිනිවි අවුරුදු සියයක් ඉක්ම ගියකල්හි ආයුෂ්මත් සාණක්‍ඛ පුත්‍ර නම්වූ යස මහ තෙරුන් වහන්සේ වැදරට වාරිකා කොට ඇවිදිනාසේක් විසාලාමහනුවර වසන වජ්ජිපුත්‍රක භික්ෂූහු දශ වස්තුවක් අමුතුවෙන් ප්‍රකාශ කොට කියා එහි ඇවිදින් ය යනු ඇසූසේක.

ඒ දස වස්තුව නම් කවරහ? යත්,

යම්හිසි හෙයක් ලාභන්ත තමා පරිහරණය කළ ලුණු යාව කාලික වස්තුව හා මිශ්‍රකොට වළඳීමට වටනේය. සන්නිධි නොවෙයි යනු එහෙයි, 'යාවකාලික වස්තු පස්වරු ඉර නැමුනු දුහුලක් දක්වා වළඳන්ට වටනේය යනු එහෙයි, පැවරි ඇවැත් තේ කැප කොට කළ හොජනය අන්තගමන දී වළඳන්ට වටනේය යනු එහෙයි, මහා සීමාව ඇතුළත නොයෙක් ආවාසවල වෙන වෙනම පොහෝ පවුරුණු ආදිය කරන්ට වටනේය යනු එහෙයි, ඇතුළු සීමාවෙහි සිටියවුන්ගෙන් ඡන්දය හා පාරිශුද්ධිය නො ගෙණ එක්ව පොහෝ පවුරුණු ආදිය කොට පසුව ඒ නිස්සූන්ගෙන් අනුමැතිය ගන්නට වටනේය යනු එහෙයි, ප්‍රඥාවායුක්ත වරයන් කැලැවූ කැප අකැප වස්තුවෙහි ඔවුන් කෙලේමේ ය යි එසේ කැප අකැපට පැමිණ නමාවත් කිරීම වටනේය යනු එහෙයි, පැවරීම අඛ්‍රක්තාදි කැප නොකොට වළඳන්ට වටනේය යනු එහෙයි, නොළා නුමුහුකළ රහ පීම වටනේය යනු එහෙයි, දැනැති නිසදුන් වටනේය යනු එහෙයි, රන් රිදී මසු කහවණු ආදි වස්තුව පිළි ගෙන්ට වටනේය යනු එහෙයි.

මෙම කියනලදමැයි.

"කප්පති සිඞ්ගි ලොණ කප්පෝ, කප්පති ඡංගුලකප්පෝ, කප්පති ගාමන්තරකප්පෝ, කප්පති ආවාස කප්පෝ, කප්පති අනුමති කප්පෝ, කප්පති ආචිණ්ණකප්පෝ, කප්පති අමථිත කප්පෝ, කප්පති ජලොගි පාතුං, කප්පති අදසකං නිසීදනං, කප්පති ජාත රූප රජතං"යි.

මෙබඳු දශවස්තුවක් වජ්ජිපුත්‍රක භික්ෂූහු ප්‍රකාශකොරෙත් යනු අසා යම් ඒ මාවැනි තෙරණුවොනෙක් මෙබඳුවූ සම්ඝයන් වහන්සේගේ ශාසන විපත්තිය අස අසා නිරුස්සාහි ව වැඩහුන්නාවූ නම් ඒ මට සුදුසු නො වන්නේය. එ බැවින් මම අඛම්මවාදීන්ට නිග්‍රහ කොට ධර්ම ප්‍රකාශකොරෙමි සිතා දෙලොස් ලක්ෂයක් භික්ෂූන් මහ වන මෙහෙර කූටාගාරශාලාවට රැස් කරවා ඒ භික්ෂූන් වහන්සේලා මධ්‍යයෙහි රේවත සථවිරයන් වහන්සේ ලවා "සබ්බාමිනි අහ දුණු ලා පරිහරණයකොට වළඳීම කැපද? යනාදී ක්‍රමයෙන් පිළි විස්වා අනදමහතෙරුන්වහන්සේගේ සඛ්විහාරික සම්ඝයන් දුටු විරු එක්සිය්සි අවුරුද්දකට ආයු ඇති, සම්භාම් සථවිරයන්

"ඇවැත්නි! අහ පුණු ලා පරිහරණය කොට එදවස් පිළිගත් යාව කාලික වස්තූන් හා මුසු කොට වළඳන්ට නො වටනේය" යනා දින් වීනය විසඳර්ජනය කරවා, ඒ දශවස්තූන් ම ධම්මයෙන් ශාස්තෘ ශාසනයෙන් පහකොට නැවත ධම්මිනය සංගායනා කරම්හ සි කියා ඒ දෙලොස් ලක්ෂයක් පමණ නිඝ්ඝූන් අතුරෙන් ත්‍රිපිටකධාරී සිවුපිළිසිඹියාපත් ක්ෂීණාශ්‍රවවූ සත්සියයක්දෙනා වහන්සේ තෝරා ගෙණ විසාලාමහනුවර වාලුකාරාමයෙහි රැස්ව හිඳ කාලාසොක රජ්ජුරුවන් විසින් සරණලද ආරක්ෂා සහාය ඇතිව සියලු ශාසන මලය සුඛසොට මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ පරිද්දෙන් නැවතත් පිටකාවශයෙන්ද නිකායවශයෙන්ද අඛ්‍ය වශයෙන් ද ධම්මස්කන්ධ වශයෙන් දැ යි සියලු ධම්මිනය සංගායනා කොට අට මසකින් නිමවා ආයුපමණින් වැඩසිට සියලු ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා ම පිරිනිවන් පෑවාහු ය.

මෙසි කියනලදමැයි පුරාතනයන් විසින්,

අතිතෙ දසමෙ වස්සෙ කාලාසොකස්ස රාජිනො,
සම්බුඛ පරිනිබ්බාණා එකවස්ස සතං අහු.

තදා වෙසාලියා භික්ඛූ අතෙකා වජ්ජි පුත්තකා
දසවත්ථූනි දීපෙසුං තපපඤ්ඤා නි අලජ්ජිනො.

සතෙහි සත්තහි කතා තෙන සත්ත සතානි ව,
පුබ්බෙ කතං උපාදාය දුතියාතිව වුච්චති.

යෙහි ථෙරෙහි සංගීතා සංගිති තෙ සුවීස්සුතා,
සබ්බකාමී ව සාළ්හො ව රෙවතො ඛුජ්ජ සොභිතො

යසො ව සාණ සම්භූතො එතෙ සද්ධි විහාරිනො,
ථෙරා ආනන්ද ථෙරස්ස දිට්ඨපුබ්බා තථාගතං

සුමනො වාසභගාමී ව ඤෙය්‍යා සද්ධි විහාරිනො,
චෙ ඉමෙ අනුරුඛස්ස දිඨපුබ්බා තථාගතං.

දුතියෝ පණ සංගීතෝ යෙහි ථෙරෙහි සඞ්ඝහෝ,
සබ්බෙ ඔහිත භාරා තෙ සත්ත හි සිඛා අනාසවා

සබ්බකාමිපපුතයෝ තෙපි ථෙරා මහිඛිකා,
අග්ගිකඛන්ධා ව ලොකම්හි ජලිත්වා පරිනිබ්බුතා ඉ-

මෙසේ ආනන්දස්ථවිරයන්වහන්සේගේ සධිවිහාරික බුදුන් දුටු වීරු සබ්බකාමි සථවිරාදි වූ උපසාළහය, රෙවතය, සොභිතය,

යසය, සාණසම්භූතය, යන බුඩ පුත්‍රයන් වහන්සේලා හා එසේ ම අනුරුඩ සථවිරයන්වහන්සේ ගේ සද්ධිවිහාරික වූ සුමනය, වාසභගාමිය යන බුඩපුත්‍ර දෙදෙනා වහන්සේ ද ඇතුළු වූ මහත් ශ්‍රඩ්‍යානුභාව ඇති සත්සියයක් පමණ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා ම එක්ව වැඩහිඳ අටමසක් මුළුල්ලෙහි සඩහායතන කරණ සේ අසංඛ්‍යතයින් ම බබළන අනෙක ප්‍රකාර සඩමානුශාසනා ඇති හෙයින් සඩම් රත්න නිධි නිකෙතවූ මාගේ බුදුරජාණන්වහන්සේ ශාස්තා නම් වනසේක. එසේ හෙයින් කියනලදි:-

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දම්මදන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ.

මෙතෙකින් මේ ඵල්වැඩ සිරිත කරණලද ශ්‍රී සඩම්ාවවාද සංග්‍රහයෙහි දෙවෙනි ඩම් සංඝායනා කථාව කියා නිමවනලදි.

මෙසේ ඒ කාලාසොකරජු දවස එම රජහුගේ සඝායෙන් ඉතා නිම්වූ යසස් ඇති යස මහාතෙරුන්වහන්සේ හා සමග සන්නිපාතයෙන් පිවත්කරණලද රාගාදි මලඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා එක්ව වැඩහිඳ දස දහසක් පමණ පාප භික්ෂූන් ශාසනයෙන් පිවත්කොට නෛෂ්ක්‍රමික ධම්මය තෝරා පරිශුඩ කොට අටමසක් මුළුල්ලෙහි සඩහායනාකිරීමෙන් පැවැත්වූ සථවිරවාද නම්වූ බුදුන් විද්‍යමාන කාලයෙහි පවන් ආකාශ ගඩහා ජල ප්‍රවාහයක් මෙන් නිම්ල වූ ජාතිරඩහ මාණික්‍යයක් මෙන් පිරිසිදු වූ පදුමපත්‍රය හා එක් නොවන්නාවූ ජලබින්දුවක් මෙන් අන්‍ය නිකාය වාසීන්ගේ ධම්මය හා අමිශ්‍රව ලොකයාහට අමෘත මහා නිර්වාණ රසය ම වහනය කොට දෙන්නාවූ පූර්ණචන්ද්‍රයා මෙන් දෙවි මිනිසුන් සහිත ලොකයා පිණවමින් අද දක්වා ම පවත්නා අර්ථකථා සහිත පිවකත්‍රය ධම්මය ද පවතිමින් යිවිය දී මහාබොධියෙන් කපා හළ පිළිල මෙන් එකල අධම්මවාදිභූය යි තෝරා හළ දසදහසක් පමණ පාප භික්ෂූහු මහාසංඝික නම්වූ සඩම්යට විරුඩ ආවාය්‍ය වාදයක් කළහ.

ඊට ඉක්බිතිව විශ වෘක්ෂයෙකින් නික්මුනාවූ පඤ්ච ශාඛාවක් මෙන් ඒ මහාසංඝික නිකායයෙන් ම භෙද කොටගෙණ ගොකුලිකය, එකබොහාරිකය, පණ්ණත්තිවාදය, බාහුලිකය, චෙතියවාදය යන මේ ආවාය්‍ය වාදයන් පසක් කළහ. ඉක්බිතිව එම පාප භික්ෂූහු ම මහිංසාසකය, වජ්ජිපුත්තකය, ධම්මුත්තරියය, භද්‍රයානිකය, ඡන්නාගාරිකය, සම්මිත්තිය, සඩබත්තිවාදය, ධම්මුත්තරිකය, කස්සපිය, සඩකන්තිකය, සුත්‍රවාදීය යන

මේ එකොළොස් ආචාර්ය්‍යවාදයන් කළහ. මෙසේ සථවිර වාදයෙන් සතළොස් වාද කෙනෙක් වන්දනාකඛ්‍යයකින් නික්මුනාවූ ගිනි කඳන් මෙන් බුදුන් පිරිනිවී දෙවෙනි අවුරුදු සියයෙහි උපන්හ. එයින් මත්තෙහ ලාභ සත්කාර නිසා ගන්නාලද භික්‍ෂුවේස් ඇති වෙදනුයෙහි පරතෙරට පැමිණි ශාසකයෙන් පිහිට කොලැබ ගියාවූ අන්‍යනිජිකයෝ බුදුන්ගේ ධර්මය නිජික ධර්මයෙහි බහා ඒ නිජිකධර්මය බුධධර්මය හා එක්කොට ගොදුගෙන පාථග්ජන ලොකවාසීන් වංචාකොට ඒ ඒ සත්ත්‍වයන්ට කියා ඇවිදිමින් අඳුන සත්වයන්ට වණී ගන්ධ රස ආදියෙන් මියුරු අඹඵලවැනිවූ කිමපකක නම් විෂඵල මෙන් අධර්ම ධර්ම ලෙස දක්වා සඳහ වචනය සි ව්‍යවහාරකරන්නා වූ භික්‍ෂු වෙසධාරී නිජිකයෝ හෙමවතගය රාජගිරිය, සිධාර්ථිකය, පුබ්බසෙලිකය, අපර සෙලිකය, වාජිරිකය යන මේ ආචාර්ය්‍යවාද සයක් ඉපදවූහ. මෙසේ මේ සූත්‍රස්සඛ් පමණ ආචාර්ය්‍යවාදයෝ දඹදිව උපන්හ.

එකල්හි බුදුන්පිරිනිවී දෙසියවිසිඅවවන වර්‍ෂයෙහි සැටදහසක් පමණ සියලු නිවුකයෝ පිරිහුණු ලාභ සත්කාර පතා තුමූ තුමූම හිස මුඩුකොට කාෂාය වස්ත්‍ර හැඳ පෙරව භික්‍ෂුවෙශ ගෙණ විහාර වල ඇවිදිමින් උපොසථකර්මාදියට වැදීමෙන් නිමිලවූ බුධශාසනයට අර්බුදමල ඉපදවූවාහු ය. එහෙයින් සියලු ජම්බුමණ්ඩලයෙහි ශාසපත් භික්‍ෂු සඞඝයාවහන්සේ සහවුරුදද්දක් උපොසථකර්ම නොකළ සේක. එකලට ධර්මාශොක රජහු රාජ්‍යාභිෂෙක ලත් පසළොස් වර්‍ෂයෙක් විය. ඒ ධර්මාශොකරජතෙමේ බුධශාසනය නිමිලව ශුබ කොට පවත්වනු කැමතිවැ එකලට සංඝසථවිර වූ මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන්වහන්සේ සුපිපි රුක් ලියෙන් ගැවසීගත් තමන්ගේ උද්‍යානයට වඩාගෙණ ගොස් පිටතින් තුන්වලල්ලෙහ රුකාවල් ලවා තුමූ ම තෙරුන්වහන්සේගේ පය සොධා තෙල් ගල්වා වඩාහිඳුවා සමීපයෙහි සතියක් මුළුල්ලෙහි වැස එම තෙරුන් වහන්සේගෙන් ආගම ධර්මයද උද්ග්‍රහණය කෙළේය.

කෙසේ ඉගැන්නු ක්ද?යත්; අප බුදුහු සාරාසංඛ්‍ය කප් ලක්‍ෂ යකින් මත්තෙහි සුමේධ නම් තාපසව දීපංකර සම්බුදුයන්වහන්සේ සමීපයට පැමිණ හස්තප්‍රාප්තවූ නිර්‍වාණධර්මය හැරපියා භවදුගී යට වැද සමතිස් පෙරුම් පුරා තුසිපුර පැමිණ දසදහසක් සක්වළ දෙවබ්‍රහ්මයන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත ඉපිද ක්‍රමයෙන් වැඩී මහාභිනික්මන්කොට බෝමැඩ වැඩහිඳ සවඤ්ඤුතඥානය සම්පාදනා සම්බුදුවූ සැටියෙන් ධර්මචක්‍රප්‍රවර්තන සූත්‍රය දෙසා සඳහ සඤ්ඤාතඥානය සම්බන්ධකොට ඉසිපතන මිගදායෙහිදී දම්සක් පැවතුම් සූත්‍ර දෙශනාකොට සිඟලු සත්වයන් සංසාර නමැති සාගරයෙන් ගොඩ නගමින් සංසාර නමැති කාන්තාරයෙන්

එතර කෙරෙමින් සංසාර තමැති බඹසයෙන් මුදමින් වෙනෙය ජන තමැති ඇඹුලවනය ප්‍රබෝධ කෙරෙමින් ධර්මාමෘත වර්ෂාව වස්වමින් පන්සාළිස් හවුරුද්දක් මුළුල්ලෙහි දැඩසිට සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් දෙසන්නාවූ සම්බුදුයන් වහන්සේ ත්‍රිසිත් ලොකයෙහි සඩමීය හා සමානවූ ධර්මයක් උපදනා සේ දැක මහ සුජ මහතෙරුන්වහන්සේට සඩමී ප්‍රතිරූපනවූ සූත්‍රය දෙසූ පරිදි දක්වූසේක. සඩමීය පරික්ෂාකොට ගතමනා පරිදි දකිමින් සඩඝයාවහන්සේට මහා ප්‍රදේශ නම් සූත්‍ර දේශනාවක් කළ පරිදි දැක්වූසේක. අනාගතයෙහි සත්තට වදනාවූ පස් භයක් දැක ගන්නා හෙයින් භය නම් සූත්‍රදේශනාවක් දැක්වූසේක. බුදුන් සූවිසි අසංඛ්‍යයක් දිව්‍ය මනුෂ්‍යයන් අමා මහ නිවණට පමුණුවා යමක සල්ගස් අතර සැතපී පිරිනිවි කල්හි මහසුජ මහතෙරුන් වහන්සේ ප්‍රධානකොට ඇති පන්සියයක් රහතුන් වහන්සේ සවිඥානඥන, අනාවරණඥන, මානීඥන, ඵලඥන නැමති රුවන් ආකාරයෙහි උපන් දහම් රුවන් ගෙණ රුවන්දමක් මෙන් ගොතා සථවිර නිකාය නැමති රත්න මංජූසායෙහි නිධානකළ පරිදි දැක්වූසේක.

ඉක්බිති මහාසඩඝික නිකායාදි සප්තරස නිකාය වාසිවූ භික්ෂූන් ඒ ඒ සූත්‍රපදයෙහි නුනුවණින් අර්ථ වරදවාගෙණ අනේකප්‍රකාරවූ ලබ්ධි උපදවා උද්භූතකාල පරිදි දැක්වූසේක. ඊට ඉක්බිතිව හෙමවතාදී වූ ඡඩි නිකායවාසි භික්ෂු ප්‍රතිරූපක තිත්ථකයන් විසින් බුදුන්ගේ ධර්මය නිවාණධර්මයෙහි බහා එක්කොට ගොදුගෙණ පාථග්ජන ලොකයා වඤ්චා කොට අධර්මය ධර්මලෙසයෙන් දක්වා සම්බුදු ශාසනය හෙදයට පමුණුවා සඩමීය හා සමාන කොට වඤ්චිපිටකාදි ග්‍රන්ථ කළ පරිදි දැක්වූසේක. ඉක්බිත්තෙන් මේ සියල්ල ම ප්‍රභාස්වර රූපයෙන් සිටියාවූ සථවිරනිකාය කැමති පුණ්ඩරීකමුම්බඤ්ඵලයක්මෙන් නිකායාන්තර ලබ්ධි නැමැති අභ්‍රමණි ධූම රජස් රාහු යන පඤ්චාපක්ලේශයෙන් නො කිළිටුවූ අමෘත රශ්මියෙන් සත්ව නමැති කුමුදු වනය පුබුදුවමින් සියලු ලොව සනහමින් පවත්නා පරිදි දැක්වූසේක. මේ පරිදිදෙන් ඒ මොග්ගලී පුත්‍ර තිස්ස මහතෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට සියලු සමාධානාන්තර ඉගැන්වූසේක.

ඒ ධර්මාසෝක මහරජ ඵ සහිය ඇතුළත තමා සමීපයට ආවාවූ යක්ෂයන් දෙදෙනෙකු ලවා සියලු ජම්බුවීපයෙහි භික්ෂූන් වහන්සේ අසෝකාරාමයට රැස්කරවා සත්වන දවස් තෙරුන් වහන්සේ කැඳවා ගෙණ විහාරයට ගොස් නිරය ඇතුළෙහි තෙරුන් වහන්සේගට එක්තත්පස්ව හිඳ සමය විලබ්ධි ඇත්තාවූ භික්ෂූන් එක්තැනෙනට රැස්කරවා ඉන් එකි එකි භික්ෂු සමූහයා සමීපයට කැඳවා ගෙන්වා ගෙණ සර්වාමීනි බුදුහු කවරවාදීයේක්දැයි විචාළේය.

එකල්හි ආත්මය නිත්‍යය යි ගත් වතුර්විධශාස්වතවාදීහු බුදුහු ශාශ්වතවාදීවූයේකැ යි කිහ. එසේ ම සංස්කාර ඇතැම් කෙනෙක් අනිත්‍යයහ යි ගත් වතුර්විධ එකාත්‍ය ශාශ්වත වාදීහු බුදුහු එකාත්‍ය ශාශ්වතවාදි සේකැයි කිහ. එසේම ආත්මයාගේ අන්‍යය ඇත්තේය යි කියා ද නැත්තේ ය යි කියාද ගත්තාවූ වතුර්විධ අන්තානන්තිකවාදීහු ද එසේ ම තමතමන්ගේ ලබ්ධි විවාළ කල ඒ තබා අනිත් දෙයක් කියා වික්ෂෙප කරන්නා වූ වතුර්විධ අමරා වික්ෂේපික වාදීහු ද සියලු ලෝකවාසීහු සත්වයෝ කුසලා කුසලාදි වූ හෙතු වක් නැතිව නිෂ්කාරණයෙන් උපන්නෝ යයි ගත්තාවූ විවිධ අධිත්‍ය සමුත්පන්නිකවාදීහු ද ආත්ම සංඥඇත්තේය යි ගත්තාවූ ෂොඩශප්‍රකාර සංඥවාදීහුද, ආත්මසංඥව නැත්තාවූ අෂ්ටප්‍රකාර අසංඥවාදීහු ද, ආත්මසංඥව ඇත්තේයයි කියාද නැත්තේය යි කියාද ගත්තාවූ අෂ්ටප්‍රකාර නෙවසංඥ නාසංඥවාදීහුද මරණින් මත්තෙහි ආත්මය යි දෙයක් මතු උත්පත්තියෙක් නැතැයි ගත්තාවූ සප්ත ප්‍රකාර උච්ඡෙදවාදීහුද මුඛය දක්වා රුධිර පානයකොට සම්පූර්ණවූ කල චිත්තනිවාත්නිය වන්තාවූ ජලූකා වන් මෙන් රූප ශබ්දාදි වූ පංචකාම කොට්ඨාසය අනුභව කල කල්හි තෘෂ්ණා නිවාත්නිය වන්නේය එම නිර්වාණයයි ගත්තාවූ පඤ්චප්‍රකාරදෘෂ්ටධම්ම නිර්වාණවාදීහු ද බුදුහු දෘෂ්ටධම්ම නිර්වාණ වාදියේ කැ යි කිහ. මෙසේ කිකල්හි ධර්මාශොක රජ්ජුරුවෝ පළමුකොටම උගන්නාලද සමය ඇති බැවින් මොවුහු භික්ෂූහු නොවෙති. මොවුහු අන්‍ය තීර්ථකයහ යි දැන ඔවුන්ට සුදු පිළි දී සැටදහසක් නිර්ග්‍රන්ථයන් සිවුරු හරවා දුරුකොට භික්ෂූන් වහන්සේ ද සමීප යට කැඳවා සවාමිනි බුදුහු කවර වාදියේක් දැයි විචාරා "මහරජ්ජු රුවෙනි සම්බමියන් සම්භාරයෙන් විභාගකොට කියනහෙයින් බුදුහු විභජ්ජ වාදියේකැ යි කිකල්හි සවාමිනි බුදුහු විභජ්ජවාදි සේක්දැයි කියා මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන් වහන්සේගෙන් විචාරා එසේය මහරජ්ජුරුවෙනි කී කල්හි, සවාමිනි දැන් ශාසනය සුඛයට ගියේය. භික්ෂූසඞ්ඝයාවහන්සේ පොහෝකරණ සේක් වයි කියා දුරුකොට හැරිය යුත්තන් හැර වට රැකවල් ලවා නුවරට වන්නාහුය.

ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ මොග්ගලිපුත්ත තිස්ස මහ තෙරුන්වහන්සේ සමඟි සඞ්ඝයා හා එක්ව සමඟි පොහෝ කොට ඒ සමාගමයෙහි සැසැවලක්‍ෂයක් පමණ භික්ෂූන්වහන්සේ මධ්‍යයෙහි පරවාදීන්ගේ වාද මඩිමින් බුදුන් විසින් දෙසනලද මාතෘකා ඇති කථාවස්තු ප්‍රකරණ නම් ධර්මයක් විස්තරකොට වදුරා ඒ සිවුසැට ලක්‍ෂයක් භික්ෂූන්වහන්සේගෙන් තෝරා ත්‍රිපිටක

පඤ්චාප්තිධරවූ වතුප්‍රතිසම්භිදාප්‍රාප්ත ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූ දහ සක් භික්ෂූන් වහන්සේ තෝරාගෙණ අසොකාරාමයෙහි රාජ්‍යාභිෂේක ධර්මාශොක රජ්ජුරුවන් විසින් කරණලද ආරක්ෂාඇතිසේක් සියලු ශාසනය ශුද්ධකොට මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ මෙන් ද යස සථවිරයන් වහන්සේ මෙන්ද සියලු ධර්මවිනය සඞ්ගායනා කොට නවමසකින් නිමවූ සේක. එතැල්හි ශාසනසථිතිය කාරණා කොට සාධුකාර දෙන්නයක සේ ධර්මසංගායනා කෙළවර මහා පාපිවිය නම්පාවිය. ඒ සියලු ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාත් ආයු පමණින් වැඩසිට පිරිනිවන් පෑහුය.

මෙම කියනලදී. සද්ධර්මසංග්‍රහයෙහි:-

සම්බුද්ධ පරිනිබ්බාණා වෙව වස්සසතානි ව,
අඨවීසති වස්සම්හි රාජා සොකෝ මහීපති.

වසනෙතා තස්ථ සත්තාහං රාජ්‍යයානෙ මහාරමෙ,
සික්ඛනෙතා සෝ මහීපාලෝ සම්බුද්ධ සමයං සුභං.

තසම්ං යෙව ච සත්තාහෙ දුවෙ යකෙඛ මහීපති
පෙසෙත්වාන තහිං භික්ඛූ අසෙසං සන්නිපාතයි.

සත්තමෙ දිවසෙ ගන්ත්වා සකාරාමං මනොරමං,
කාරෙසි භික්ඛු සඞ්ඝස්ස සන්නිපාත මසෙසතො.

තෙ මිච්ඡාදිට්ඨිකෙ සබ්බෙ පුවජ්ජිත්වා අඤ්ඤ භික්ඛියෙ,
ඤත්වා සට්ඨිසහස්සානි උපපබ්බාජෙසි භූපති.

"සංඝෝ විසොධිතෝ දානි තස්මා සංඝෝ උපොසථං
කරොතු හනෙත" ඉච්චෙවං වත්වා ථෙරස්ස භූපති.

සංඝස්ස රක්ඛනං දත්වා නගරං පාවිසී සුභං,
සංඝෝ සමග්ගෝ හුත්වාන තදා කාසි උපොසථං.

මහාකස්සප ථෙරෝ ච යසත්ථෙරෝ ච කාරයුං,
යථා තෙ ධම්මසංගීතිං තිස්සත්ථෙරොපි තං තථා.

කථාවත්ථුප්පකරණං පරවාදප්පමද්දනං,
අභාසි තිස්සත්ථෙරෝ ච තසම්ං සංගීති මණ්ඩලෙ.

එවං භික්ඛූ සහස්සෙන රක්ඛියාසොක රාජිනෝ,
අයං තවඞ්ගි මාගෙහි ධම්ම සංගීති නිට්ඨිතා.

කතියං සංගහං කත්වා තත්වා ලොකහිතං බහුං,
තෙ යාවතායුකං ඨත්වා ථෙරා සබ්බෙ පි නිබ්බුතා සි.

මෙසේ මොග්ගලිපුත්තතිස්ස සථවිරාදි දහසක් පමණ මහ රහතුන්වහන්සේ රැස්ව වැඩහිඳ නවමසක් මුළුල්ලෙහි සඞ්ගායනා කරණසේ අවිත්‍යතොපමවූ දිව්‍ය මනුෂ්‍යාදීන්ට ශිවඞ්කරවූ සඞ්ඝානුශාසනා ඇති හෙයින් සමන්තභද්‍රවූ මාගේ බුදුරජාණන් වහන්සේ ශාසනා නම් වනසේක. එසේහෙයින් කියනලදී.

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දම්මදන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො සි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඞ්ඝපාලවාද සංග්‍රහයෙහිවූ තුන්වෙනි ධර්මසඞ්ගායනා කථාව නිමි.

—(o)—

මෙසේවූ තුන්වෙනි ධර්මසඞ්ගායනාව නිමවා මිහිදු මහතෙරුන් වහන්සේට තාම්‍රපර්ණි විෂයට ගොස් එහි ශාසනය පිහිටුවව සි උපාධ්‍යායගණන්වහන්සේ විසිනුදු නිෂ්ක්‍රමණය වහන්සේ විසිනු දු කරණලද ආරාධනා ඇතිසේක්, මට තාම්‍රපර්ණිවිෂයටගන්ට කල්දෙ කල් නො වෙදෙ සි පරීක්ෂා කොට තව කල් නො වෙය සි දැන යම් තාක් එයට සුදුසු කල් පැමිණෙන්නේ නම් ඒතාක් නැගත් බලම්ග සි සිතා උපාධ්‍යායගණන්වහන්සේ හා නිෂ්ක්‍රමණය වහන්සේ වැඳ හිල්මස අසොකාරාමයෙන් නික්ම ඉට්ඨිය ය, උත්තිය ය, සම්බලය, භද්දසාල ය යන මේ සථවිරගන්වහන්සේලා සතරදෙනා හා සඞ්ඝමිත්‍රාවන්ගේ පුත්වූ පැමිණෙන ලද ශ්‍රී අභිඥ ඇති සුමන සාමණේරගන්වහන්සේ ද සමග ඍද්ධි සංග්‍රහය සඳහා රජගහනුවර සමීපයෙහි දක්ඛිණගිරි නම් ජනපදයෙදි චාරිකා කරණසේක් සමයක් ඇවැමෙන් වේදිස නම් පුරයට පැමිණ එහි වඳින්නාවූ වේදිස සිටුදු වූ තමන් වහන්සේගේ මැනියන් වන වේදිස මහා දෙවිය දැක ඒ බිසවුන්ද විසින් කරණලද වේදිසගිරි මහාවිහාරයට වැද ඒ විහාරයෙහි මසක් වැස පොසොන් මස මැදි පොහෝදිනයෙහි රැස්ව අපට තාම්‍රපර්ණිවිෂයට යන්ට කලැ සි දැන ශක්‍රදෙව්රජුගන් විසිනු දු ආරාධනාකරණ ලදුව පඬුපලාස අනාගාමි වූ මහණිමෙහි අභිප්‍රාය ඇත්තාවූ වේදිස මහාදෙවීන් නැගනියන්ගේ පුතනුවන් හා සමග තමන්වහන්සේ ඇතුළුව සත්දෙනාවහන්සේ වේදිස පර්වතයෙන් ආකාශයට පැන නැඟී නිමිලවූ පැන් ඇති විලෙක්හි හංස සමූහයා විසින් පිරිවරණලද රාජහංසයකුමෙන් ප්‍රසන්න ආකාශයෙහි බබළමින් ක්ෂණයකින් තාම්‍රපර්ණිවිෂ නම්වූ මේ ලඞ්කාවිපයට අවුත් සර්ව

යන්වහන්සේගේ පරිනිර්වාණයෙන් දෙසිය සතිස්වැනිවූ අවුරුද්දෙහි ධර්මාශොක රජ්ජුරුවන්ගේ අභිෂේකයෙන් අටලොස්වැනි අවුරුද්දෙහි දෙවෙනිපැතිස්ස රජ්ජුරුවන්ගේ අභිෂේකයෙන් සත වැනිමස තමන් වහන්සේ උපසම්පන්නවූ දෙලොස්වසක් ඇතිසේක් අනුකූලයන් සම්පූර්ණ බැවින් අනුරාධපුරය යි ප්‍රසිද්ධවූ නුවර නැගෙනහිර දිශාවෙහි හිඳින්වූ වතලඟබඹුන් හෙළියාවූ සිහිල්වූ ඝනවූ ඡායාවන් ඇති මිහිතුරු ගල් හා පවිත්‍රවූ සුදුවැල් ලෙන් ගැවසීගත් භූමි ප්‍රදේශ ඇති මිඹුරවූ සිගිල්වූ පැන්පොකුණු ඇති පුළු සවිඳුවරයන් තුන්දෙනා වහන්සේගේ පාදස්පර්ශයෙන් පවිත්‍රවූ මිශ්‍රකනම් පර්වතයට බැස අඹතලා පාෂාණයෙහි වැඩ උන්සේක. යම්හෙයකින් පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපුනාවූ බුදුරජානන්වහන්සේ විසින් ලඞ්කාවාසී සත්ත්වයන් පහදවා ගිහි වැඩකිරීමෙහි සමර්ථයෝය යි දෙව සමාගමයෙහි දී ඒ මිහිදු මහ තෙරුන් වහන්සේ පිළිබඳව වදාළ වචනය ප්‍රකාශකොට දක්වා වදාළසේක් ද, එසේහෙයින් ලඞ්කාවට බුදුසෙනෙහුන් වහන්සේ සමානවුසේක් ලඞ්කාවාසී දෙවියන් විසින් විශෙෂයෙන් පූජා ලදුව සමාපත්ති සැප අනුභවකොරෙමින් ඒ අඹතලායෙහි වැඩඋන් සේක.

එදවස් දෙවෙනිපැතිස්ස රජ්ජුරුවෝ සියලු ලඞ්කාවිපවාසී සත්ත්වයන් උත්සව කෙළි කෙළනා පරිද්දෙන් නානාතූර්‍ය්‍ය ශබ්දයන් කරවා පුරවාසිවූ සත්ත්වයන් නකාත්කෙළි කෙළනට පටන්ගත් කල්හි තුමූ සතළිස් දහසක් පුරුෂයන් පිරිවරා මුව දඩයමට යනු කැමතිව සරහා පිළියෙලකරණ ලද්දාවූ නුවරින් නික්ම මිශ්‍රකපර්වතයට අභිමුඛව යන්නාහු තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට දක්වම් යි හිත්වූව වෙසක් මවාගෙණ රජ්ජුරුවන්ට නුදුරුතෙනක තණ පත් අනුභවකරන්නාහු මෙන් ඇතිදිනාවූ දිව්‍යපුත්‍රයා දැක මුවෙක් දෝ හෝ යි සිතා දැන් අවිඥප්තව ප්‍රමාදව සිටි තැනැත්තහු විදින්ට තරම් නො වෙයි සිතා දුනුදිය අපොළන ගඹින් තමන් බලා දුවන්නාවූ ඒ මුවා පසුපස්සෙහි අඹතලාවට නැඟී එනතට පැමිණ අනතඹානවූ ඒ දිව්‍යපුත්‍ර මුවා නො දැක ඇත මැත බලන්නාවූ රජ්ජුරුවෝ මා දකිත්වාසි සෙස්සවුන් නො දකිත්වයි අධිට්ඨාන කොට හිඬුස්ස හිඬුස්ස මෙසේ එවයි, වදාරන්නාවූ මිහිදුමහතෙරුන්වහන්සේ දැක මේ ලඞ්කාවිපයෙහි උපන් කිසිවෙක් මට හිඬුස්ස යි කියා මාගේ තම අස්වන්නේ නැත. එසේ හෙයින් මෙතෙම කවරෙක්දෝ හෝයි මනුෂ්‍යයෙක්දෝ හෝ අමනුෂ්‍යයෙක් දෝ හෝ යි කියා සිතුසේක. එකල්හි තෙරුන් වහන්සේ අමනුෂ්‍යයෙක් නො වනබව හඟවන පිණිස මහරජ්ජුරුවෙනි අපිසවිඤ්ඤ ශ්‍රාවකවූ ශ්‍රමණයෙහ. තොප කෙරෙහි අනුකම්පායෙන් ජම්බුවිපයෙන් මේ ලඞ්කාවිපයට ආමිහයි වදාළසේක. එහෙයින් කියනලදී.

මිහිදු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජුට
ආමන්ත්‍රණය කිරීම (72 පිට)

සම්බුද්ධං මයං මහාරාජ ධම්මරාජස්ස සාවකා,
තමේව අනුකම්පාය ජම්බුදීපා ඉධා ගතා සු.

එකල්හි රජ්ජුරුවෝ තෙරුන්වහන්සේගේ වචනය අසා නැවත අදහට මිත්‍රවූ ධර්මාශෝක රජ්ජුරුවන් ඊසිතුදු ලෝකයෙහි දහසුතු ගම්කිසි පදෙසියක් ඇත් නම් ඒ සියල්ල ම සවගම්හු ඥන යෙන් විශෙෂයෙන් අවබොධකළ බැවින් හා ඍර්ධිඥානඥානයෙන් නිපන්නාවූ අභිත්ඵල සඞ්ඛ්‍යාත මොක්ෂය හෙළුවර කොට ඇති බුදුහුය සි ගත් සවුණෙ දත් බුදුන් ද, තමා බරන්නාවූ සත්ත්වයන් සතර අපායෙහි දු සංසාර වෘත්තියෙහි දු නො හෙළා බරණ බැවින් ධර්මය සි ගත් නෛර්‍යාණික ධර්මය ද, දෘෂ්ටි ශීල ශ්‍රාම ණ්‍යාදියෙන් හැලපුහු බැවින් සඞ්ඝයා ය සි ගත් අෂ්ටාර්‍ය පුද්ගල සඞ්ඝයා ද ඝන තුණුරුවන් මම සරණ ගියෙමි. ශාක්‍යකුල තිල කවූ බුදුරජානන්වහන්සේගේ ශාසනයෙහි උපාසකබවට පැමිණි මයමි. එසේ හෙයින් නරොත්තම වූ රජ්ජුරුවෙනි, තෙපි දු මේ රත් නත්‍රයයෙහි සිත පහදවා හෙණ සැදහැ ඇති ව සරණ ශීලයෙහි පිහිටුවයි කියා:—

අහං බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතෝ,
උපාසකත්තනං වෙදෙසිං සක්‍යපුත්තස්ස සාසනෙ.

ඉමෙසු තීසු වත්‍ථූසු උත්තමෙසු නරුත්තම,
නිම්මි චිත්තං පසාදෙත්වා සද්ධාය සරණං වජ සි.

යනාදි ක්‍රමයෙන් ලියා මෙසේ එවතලද නො බෝ කලෙක ඇසූ අස්න සිහිකෙරෙමින් ආයෂ්මා වූ සඞ්ඝරාවහන්සේ වැඩසේක් දෙ හෝ සි සිතා එකෙණෙහි ම තමා අත තුබූ ආයුධ දමා සුවදුක් කථා කෙරෙමින් එකත්පස් ව හුන්නේය.

ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ සත්ළිස් දහසක් පුරුෂ යන් අවුත් රජ්ජුරුවන් පිරිවරාගත් කල්හි තමන් වහන්සේ හා කැවි ම ආවා වූ අනික් සදෙනා ද දක්වා මොහු කවර දු අවුද සි විවාළකල්හි මහරජ්ජුරුවෙනි මා හා සමග ම ආවාහුය සි කීහ. ජම්බුද්වීපයෙහි සම්බදු වූ අන්‍යවූ සි ශ්‍රමණයන් වහන්සේලා ඇද්දැයි විවාළ කල්හි ඇත මහරජ්ජුරුවෙනි, දැන් ජම්බුද්වීපය කාෂ්‍යප වසත්‍රයෙන් බබලන්නේය. පූර්වේනිවාසානුස්මෘතිඥානය දිව්‍යචක්ෂු රභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන මේ ත්‍රිවිද්‍ය ඇත්තා වූ ද "එකෝ පි භික්ඛු බහුධා හොති" යනාදීන් දක්වනලද සෘද්ධිවිධඥානයට පැමිණියාවූ ද "එවම්පි මහ මෙඝා ඉඛ්පි මෙඝා ඉතම්පි මෙඝා" යනාදීන් දක්වන ලද අනුන්

සිත පිරිසිඳ දැක්මෙහි දක්ෂවූ ද, "යෝ දිබ්බාය සොතධාතුයාඋභෝ සද්දේ සුණාති දිබ්බෙ ච මානුසෙ ච" යනාදීන් දක්වනලද දිව්‍ය ශ්‍රොත්‍ර ධාතු ඇත්තාවූ ද, සන්තානගත සියලු රාගාදි කෙලෙසයන් නැසූ බැවින් අර්හත් නම් වූ සවිඳ ශ්‍රාවකයන් වහන්සේ දඹදිව බොහෝ වසන්සේකැ යි වදාළසේක.

නැවත ද රජ්ජුරුවන් "සවාමීන්වහන්ස! කවර මාගියකින් වැඩිසේක්ද සි විවාළකල්හි "මහරජ්ජුරුවනි! අපි දියෙනු ත් නො ආමිහ. ගොඩිනු ත් නො ආමිහ යි වදරා නැවත රජ්ජුරුවන්ගේ නුවණ විශෙෂ පරීක්ෂාකරණු පිණිස ආසන්න ව සිටි එක් අඹ රුකක් පෑ "මහරජ්ජුරුවෙනි! මේ කිතම් රුකෙක්ද" සි විවාරා, සවාමිනි! මේ අඹගසෙකැ" යි කීකල් හි "මහරජ! මෙ අඹ ගස හැර සෙසු ත් අඹගස් ඇද්ද යි විවාළසේක. "සවාමිනි! අනිකු ත් බොහෝ අඹගස් ඇත්තාහු වෙතියි කීහ. "ඒ අඹ රුක් ඇර, මහරජ! අන්‍ය වෘක්ෂකෙනෙක් ඇද්ද යි විවාළ කල්හි "සවාමිනි! අඹ නො වන්නා වූ වෘක්ෂයෝ ත් ඇත්තාහුය යි කිහ. සෙසු අඹගසු ත් අඹ නො වන ගසු ත් හැර අන්කිසි ගසෙක් ඇද්ද යි විවාළසේක. "සවාමිනි! ඒ දෙකින් පිටත් ව වෙන් ව සිටියේ මේ ගස ම වේදැයි කීකල්හි "යහපත මහරජ්ජුරුවෙනි! තෙපි නුවණැත්තවයි ප්‍රශංසා කොට

නැවත ද මිහිඳු මහතෙරුන් වහන්සේ "මහරජ! තොපගේ නැගෝ ඇද්දු යි විවාරා "සවාමිනි! බොහෝදෙන ඇතැ යි කී කල්හි "රජ්ජුරුවෙනි" තොපගේ නො නැගෙ ත් ඇද්දු යි විවාරා සවාමිනි! නැගන්ට වඩා නො නැගෙ බොහෝ යයි කී කල්හි "තොපගේ නැගනු ත් හැර නො නැගනු ත් හැර අන්කිසි කෙනෙක් ඇද්දු යි විවාළකල්හි "සවාමිනි! එ දෙ පක්‍ෂයෙන් ම වෙන් ව සිටියේ මම් ම වේ දැ යි කී කල්හි 'යහපත රජ්ජුරුවෙනි! ඉතා නුවණැත්තව ප්‍රශ්න විසඳිනා කළ නියා යහපතැයි ප්‍රශංසා කොට, මේ රජ්ජුරුවෝ ධම්ය දැනගන්ට සමර්ථයෝයයි දැන මැදුම්සහියෙහි චූළහත්ථිපදෙපම සූත්‍රාන්නදෙශනාව දෙශනාකොට සතළිස් දහසක් පුරුෂයන් හා සමග රජ්ජුරුවන් සරණසිලයෙහි පිහිටවූසේක. එකල්හි රජහට බත්වසුන් ගෙණ ආ නියාව අසා තෙරුන්වහන්සේ විකාල භොජනයෙන් වැලකිබැවි දැන දැන ත් සදාවාරය රක්නා සඳහා ආහාරයෙන් පිළි විස තෙරුන් වහන්සේ විසින් දැන් මේ වේලේ පත්වරු නො වළ දම්හ යි කී කල්හි එසේ වී නම් "සවාමිනි! නුවරට යම්හයි කියා දන්වූහ. "මහරජ තෙපි යව. අපි මෙහි ම ඉඳුම්හ"යි කී කල්හි එසේ වී නම් "සවාමිනි! මේ කුමාරයා අප හා කැටිව එත්වා"යි කී කල මේ කුමාර වූ කලි අනාගාමි ඵලයට පැමිණියේය. දැන් සොබෝ කලකින් මහණ වන්නේ යයි වදාළසේක. "සවාමිනි! සෙට

උදුසන ම රථයක් එවමි. එ රථයෙන් නුවරට වැඩියමැනැවි"යි කියා ආරාධනා කොට වැඳ අවසර ගෙණ පණ්ඩුපලාස වූ භණ්ඩුක කුමාරයා එක් පාර්ශ්වයකට කැඳවා ගෙණ ගොස් තෙරුන් වහන්සේගේ නම් ගොත් විචාරා තමන්ට යහළුවූ ධ ාශොක රජ්ජුරුවන්ගේ පුතනුවන් වහන්සේ නියාව අසා එකා ාගයෙන් මි වූගේ මහත් ලාභයකැ යි සිතා ඉතා සතුටු ව නුවරට නික්මුණේය.

එකෙණෙහි තෙරුන් වහන්සේ පණ්ඩුපලාසයා රහත් තෙරෙමින් මහණ කරවා සුමන සාමණේරයන් වහන්සේට කථාකොට "සුමනයෙනි, බණ අසන්නට කල් අඩගාවි යි වදළසේක. කිමෙක්ද? සවාමීනි සහස්‍රී ලොකධාතුවට ඇසෙන පරිදිදෙන් අඩගැවිද? මේ සක්වළට ඇසෙන පරිදිදෙන් අඩගාමි ද? මේ ලඛකාවිපයට ඇසෙන පරිදිදෙන් අඩගාමිදැ"යි විවාල කල්හි, මේ ලඛකාවිපයට අස්වමින් සඬම් ශ්‍රවණයට කාලඝොෂා කරව යි වදළසේක. එකල්හි සුමන සාමණේරයන් වහන්සේ සවාමීන් වහන්ස! යහපතැ යි පිළිගෙණ අභිඥාපාදක වාසීඛ්‍යානයට සම් වැද එයින් නැගී අභිඥා කොට එකඟ වූ සිතින් "පින්වත්නි! මේ බණ අහන්ට සලැ" යි තුන්විටෙක් සියලු ලඛකාවිපයට ඇසෙන පරිදිදෙන් බණට අඩගැ සේක.

රජතෙම ඒ හඬ අසා කිමෙක් ද? කිසි උපද්‍රවයෙක් තෙරුන් වහන්සේලා සමීපයෙහි ඇ ිදෑ ෝ යි සිතා එය විමසනු පිණිස දූතයන් යැවූයේය. එකල්හි මිහිඳු මහතෙරුන්වහන්සේ අපට කිසි උපද්‍රවයෙක් නැත. බුඩවවනය කියනු කැමැති ව ධම්ශ්‍රවණයට කාලඝොෂා කරවිමියි වදළසේක. සාමණේරයන්ගේ ඒ ශබ්දය අසා භූමසථදෙවියෝ සාධුකාර දීම් වශයෙන් ශබ්ද ශ්‍රවණය කෙරෙවීවාහුය. මෙම ක්‍රමයෙන් බ්‍රහ්මලෝකය දක්වා ශබ්දය ඉතා උස්ව පැනනැඟේය. ඒ ශබ්දය හේතුකොට ගෙණ මහා දෙවතා සන්නිපාතයෙක් විය. මිහිඳු මහ තෙරුන් වහන්සේ මහත් වූ දෙවතා සන්නිපාතය දැන සමචිත්ත පරියාය සූත්‍රාන්ත දෙශනාව දෙශනාකළසේක. ඒ ධම්දෙශනාවගේ කෙළවර අසංඛ්‍යයක් පමණ දෙවියන්ට ධම්ාභිසමය විය. ඛොඤ්ඤ නාගසුපණ්ණෝද සරණගියාහුය.

එකල්හි දෙවෙනිපැතිස්ස රජතෙම ඒ රාත්‍රියගේ ඇවැමෙන් තෙරුන්වහන්සේලා වඩිනු පිණිස රථය යැවූයේය. රථාවාසී තෙම රථය එක් පාශ්වයක තබා තෙරුන්වහන්සේ කරා පැමිණ වහන්ස! රථය ගෙණ එන ලද්දේමි. එයට නැගී වැඩිය මැනව යි දන්වූයේය. තෙරුන් වහන්සේලා "අපි රථයට නොනැගෙමිහ. නෙ ාව අපි පසුව එම්හ" යි වදාරා අහසට නැගී ගොස් අනුරාධපුර පූර්ව දිශාභාගයෙහි ප්‍රථම චෛත්‍යස්ථානයට බවුවාහුය.

ඒ චෛත්‍යය වනාහි තෙරුන් වහන්සේලා ප්‍රථමයෙන් අවතීර්ණ වූ ස්ථානයෙහි කළ බැවින් ප්‍රථම චෛත්‍යය යි කියනු ලැබේ. ඒ රථා රූඪයා ද තමන් එන්ට පළමුවෙන් ම වැඩ කරබාන් බැඳ සිටුරු පොරවන තෙරුන්වහන්සේලා දැක අභිමානයින් තුටු පහටු සිත් ඇති ව ගොස් රජතට "දෙවඟන්වහන්ස තෙරුන්වහන්සේලා වැඩිසේක්ලා යයි දැන්වූයේය. එකල්හි රජතෙම තෙරුන්වහන්සේලා රථයට නැඟී වැඩියේක්ලා දැ යි විමසූයේය. දෙමයන් වහන්ස රථයට නොං නැඟී මට පසුව නික්ම මට පෙරටු ව වැඩමවා පූජාවාරයෙහි වැඩසිටිනාසේක්ලා යයි දැන්විය. රජතෙම ඒ අසා සතුටු ව පෙරමිගට ගොස් තෙරුන් වහන්සේලා වැඳ මිහිදු මහ තෙරුන් වහන්සේ අතින් පාත්‍රය ලබාගෙණ මහත් පූජා සත්කාර යෙන් සඨවිරයන්වහන්සේලා නුවරට වඩාගෙණ ගොස් ඇතුළු රජගෙයි ආසන පණවා වැඩහිඳිනා සේ ආරාධනා කළකල්හි තෙරුන්වහන්සේ නිශ්චලව පණවාලූ ආසනය දැක අප බුදුරජා නන් වහන්සේගේ ශාසනය සියලු ලක්දිව පැපිවිය මෙන් නිශ්චලව මතු පිහිටන්නේය යි සිතමින් වැඩඋන්සේක.

එකල්හි පින්වත් රාජෝත්තම තෙම තෙරුන් වහන්සේලා ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍යයෙන් සවහස්තයෙන් වැළඳවූයේය. වළඳා ඉක් බිති තෙරුන්වහන්සේ පිරිවර සහිත රජතට ධම්මරත්නවසීතා වස්වන සේක් ප්‍රෙතවස්තු විමානවස්තු හා සත්‍යසංයුක්තයෙන් බණ වදාළ සේක. ධම්දෙශනාව අසා අනුලාදේවීන් ප්‍රධාන කොට පන්සිය යක් ස්ත්‍රිහු සෝවාන් ඵලයට පැමිණියාහුය. බණවදුරා ඉක්බිති පස්වැරු හාගයෙහි අමාත්‍යයෝ තෙරුන් වහන්සේලා මහමෙවුනා උයනට වඩාගෙණ ගොස් එදවස් එහි වැස්වූවාහුය. දෙවෙනි පා තිස්ස රජ දේ රාත්‍රියගේ ඇවැමෙන් තෙරුන්වහන්සේලා සම්පයට ගොස් සැප සේ සශනය කළසේක්දැ යි විමාරා, එසේය මහරජයි කිකාල වහන්ස භික්ෂුසඞ්ඝයා වහන්සේට ආරාම කැපදැයි පිළිවිස කැපය මහරජයි යනු අසා තුටු පහටු සිත් ඇති මහරජ සවණ්ඩිං කාරය ගෙණ මහතෙරුන්හට උදකපාතනය කොට මහමෙ වුනා උයන පිළිගැන්වූසේය. එකෙණෙහි උදක පාතනය හා සමග ම මහා පෘථිවිය කම්පාවිය. මිහිදු මහතෙරුන් වහන්සේ සත්දවසක් ධම්දෙශනා කොට අටදහස්පන්සියදෙනා මාගි ඵලයට පමුණුවා සෙසු තෙරුන් වහන්සේලා සමග මිගින්තලා පර්වතයට වැඩියේක.

ඉක්බිත්තෙන් පින්වත් රජ මිගින්තලාවෙහි අටසැටක් පමණ ගල්ලෙන් ඇතුළු විහාරකම්මාන්ත නිමවා විහාරය පිළි ගන්වා ඇසළ පුණු පොහෝදිනයෙහි ආරාධනා කොට දෙස්ට ක් පමණ රහතන් වහන්සේලා එහි වස් වැසවූයේය. ඒ බුද්ධ

පුත්‍රයන් වහන්සේලා එහි වසමින් රජයට සංග්‍රහකළාහුය. ඊට ඉක්බිත්තෙන් ථූපාරාමයෙහි දකුණු අකු ධාතූන්වහන්සේ පිහිටුවන දවස් සමඟ ප්‍රාතිහාර්‍යය දක සතුටුව පැවිදිවූ රජ්ජුරුවන්ගේ මලනුවූ මහානාග නම් රාජකුමාරයන් ප්‍රධානකොට දහසක් පුරුෂයන් හා ඇතුල්නුවරින් මහණ වූ නිස්සූන් වහන්සේලා ත් සියල්ල ම නිස්දහසක් පමණ වූවාහුය. එසින් පසු ව දක්ෂිණාරාම මහාබොධීන්වහන්සේ පිහිටුවන දිනයෙහි පන්සියයක් පමණ රාජකන්‍යාවන් හා පන්සියයක් පමණ අන්තඃපුර සත්‍රීන් හා සමග අනුලා නම් රජබිසව සඞ්ඝමිත්‍රාස්ථවිරීන් සමීපයෙහි පැවිදි ව නො බෝ කලකින් සප්තවිරීන් අභිඥාප්‍රාප්ත වූහ. රජ්ජුරුවන්ගේ බෑනනු වූ අරිඨ නම් රාජකුමාරයා ද පන්සියයක් පුරුෂයන් හා සමග තෙරුන්වහන්සේගේ සමීපයෙහි පැවිදිව නො බෝ කලකින් රහත්වූසේක. ඉක්බිත්තෙන් දෙවෙනි පෑතිස්ස රජ මිහිදු මහතෙරුන් වහන්සේ කරා පැමිණ "ස්වාමීන් වහන්ස! ලඞ්කා ම්පයෙහි බුද්ධශාසනය පිහිටන ලද්දේදැ" යි විචාළේය. එකල්හි මිහිදු මහතෙරුන්වහන්සේ වදාරණසේක් "මහරජ, බුද්ධශාසනය පිහිටන ලද්දේය. ශාසනයාගේ මුල් තව නො බස්නාලද්දාහුය යි වදාළසේක.

"ස්වාමීන්වහන්ස, ශාසනමූලයෝ කවර කලෙක බස්නාහු වෙද්දැ" යි විචාළේය. "මහරජ, යම් කලෙක්හි ලක්දිව දෙමවුපියන් කෙරෙහි උපන් දරුකෙනෙක් ලක්දිවදී ම පැවිදිව ලක්දිවදී ම ත්‍රිපිටක ධර්මය ඉගෙණ කියවන්නේ වී නම් එකල්හි මහරජ ශාසනයාගේ මුල්බස්නා ලද්දාහු නම් වන්නාහුයයි වදාළසේක. එවිට දෙවෙනි පෑතිස්ස රජ මිහිදුමහතෙරුන් වහන්සේට වැඳ "ස්වාමීන් වහන්ස! ලඞ්කාවාසි මෙබඳු භික්ෂූන් ඇද්දැයි විචාළතැන මහරජ අරිඨනම් භික්ෂුව ඒ කර්මයෙහි බුහුටියයි වදාළසේක. එකල්හි මහරජ තෙම මෙහි ස්වාමීන් වහන්ස මා විසින් කුමක් කටයුතුදැයි විචාරා "මහරජ ධර්ම මණ්ඩපයක් කරන්ට වටනේ ය යි වදාළ කල්හි රජතෙම "ස්වාමීන්වහන්ස යහපතැයි පිළිගෙණ මේඝවණ්ණාභය අමාත්‍යයාගේ පරිවෙණස්ථානයෙහි ප්‍රථම මහා ධර්මසංගීති කාලයෙහි අජාසත් මහරජහු විසින් කරවන ලද ධර්මමණ්ඩපය වැනි වූ මණ්ඩපයක් රාජානුභාවයෙන් කරවා මිහිදු මහරහතන් වහන්සේට දන්වා ධර්මසංගායනා නියම වූ දිනයෙහි නොයෙක් දහස්ගණන් පුරුෂයන් විසින් පිරිවරණ ලදු ව ථූපාරාමයට පැමිණියේය. එසමයෙහි ථූපාරාමයෙහි දහසක් භික්ෂූන්වහන්සේලා රැස්වූවාහුය. මිහිදු මහතෙරුන් වහන්සේගේ ආසනය දක්ෂිණ දිශාභිමුඛව පැණවූයේය. මහා අරිඨ තෙරුන්වහන්සේගේ ධර්මාසනය උතුරු දිසාවට අභිමුඛව පණවනලද්දේය. එකල්හි මිහිදු

මහතෙරුන් වහන්සේ විසින් කරණ ලද ආරාධනා ඇති ව මහා අරිඨ තෙරුන්වහන්සේ සප්විර භික්ෂූන් වැඳ අවසරගෙණ තමන් වහන්සේට අනුරූපව පැමිණි ධර්මාසනයෙහි වැඩඋන්සේක. මිහිදු මහතෙරුන් වහන්සේ ප්‍රබුද්ධ වූ සැට අට නමක් පමණ සප්විරයන් වහන්සේලා ද ධර්මාසනය පිරිවරා වැඩඋන්නාහුය. රජ්ජුරුවන්ගේ කණිෂ්ඨභ්‍රාතෘ වූ මහානාගය තෙරුන් වහන්සේ ධුරග්‍රාහීව විනය උගනිම්සි කියා පන්සියයක් භික්ෂූන්වහන්සේලා සමඟ අරිඨ තෙරුන් වහන්සේ වැඩවුන් ධර්මාසනය පිරිවරා වැඩඋන්සේක. සෙසු භික්ෂූන්වහන්සේලා ද රජ්ජුරුවන් සහිත සියලු රජපිරිස ද තමතමන්ට ප්‍රාප්ත සථානවල හුන්නාහුය. එකල්හි ආයුෂ්මත් මහා අරිඨ තෙරුන් වහන්සේ "තෙන ඛෝ පන සමයෙන බුඩෝ භගවා වෙරඤ්ජායං විහරති නළෙරු පුව්මඤ්ච මූලෙ." යනාදි ක්‍රමයෙන් විනය නිදානය වදාළසේක. එසමණයෙහි අහස්හි මහත් නාද පැවැත්තේය. අකාල විද්‍යුල්ලතාවෝ නික්මුනාහුය. දෙව්වරුන් එකපැහැර සාධුකාර දුන්නාහුය. දියපොළොව අවසන්කොට මහා පෘථිවිය කම්පාවිය.

මෙසේ නොයෙක් ප්‍රාතිහාර්‍ය පූජා පවත්නා කල්හි ආයුෂ්මත් මහා අරිඨ තෙරුන් වහන්සේ මිහිදු මහා සප්විර ප්‍රමුඛ සැට අට නමක් පමණ වෙන වෙනම ගණාවාර්‍යවූ ක්ෂීණාශ්‍රව මහා සප්විරයන් වහන්සේලා විසින් ද එයින් අන්‍ය වූ ද සැට අට දහසක් පමණ භික්ෂූන්වහන්සේලා විසින් පිරිවරණ ලදුව ප්‍රථම කාර්ත්තික මහා පවාරණ දවස්හි ථූපාරාම විහාර මධ්‍යයෙහි දී භාග්‍යවත් ශාස්තෘන්වහන්සේගේ කරුණාසන්දීපක අනුශාසනා ප්‍රකාශ කෘයකම් වචී කම් සංවර සංඛ්‍යාත විනය පිටකය ප්‍රකාශ කොට වදාළසේක. එසේම සියලු ධර්මය ද ප්‍රකාශකළසේක.

යම් සේ මහාකාශ්‍යපසප්විර යසසප්විර මොග්ගලිපුත්තතිස්ස සප්විරයන මහාසප්විරයන්වහන්සේලා පිටක වශයෙන් ද නිකාය වශයෙන් ද අංග වශයෙන් ද ධර්මස්කන්ධ වශයෙන් ද ධර්ම විනය සංගායනා කළාහු ද එ පරිද්දෙන් ම ධර්ම විනය සංගායනා කරන්නාවූ මහාමහෙන්ද්‍ර සප්විරයන්වහන්සේ ලඞ්කා ව්පයෙහි ශාසනයාගේ මූල්බස්වා සතරවෙනි ධර්මසංගායනාව මෙසේ කළසේක. ධර්මසංගායනා කෙළවර අනෙක ප්‍රකාරයෙන් මහාපෘථිවිය කම්පා වූයේය. ඒ ක්ෂීණාශ්‍රව සප්විර භික්ෂූන් වහන්සේලා ද ආයුපමණින් ජීවත්ව වැඩසිට ලොව එලියකොට කැමති නිවිගිය මහාඟිනි කඳක් සේ පිරිනිවන් පෑවාහුය. මේ ධර්මසංගායනා තොමෝ අනියමිත කාලයකින් පරිසමාප්තවිය. මෙම කියකලදමැයි;

සඛමීසංග්‍රහයෙහි:—

සම්බුද්ධ පරිනිබ්බාණා විසු වස්ස සතෙසු ච,
පඤ්චතිංසති හීනකතෙන රාජාසි පියතිස්සකො.

මහාකස්සප ථෙරෝ ච යසෝ තිස්සෝ ච කාරයුං,
යථා තෙ ධම්ම සංගීති මහිඤ්ඤෙ සෝ පි තං තථා.

මහාමහින්දථෙරෝ තු ජින සාසන මුත්තමං,
පරියත්තිං පටිපත්තිං ච පටිවෙධඤ්ච සාධුකං.

ලඞ්කාදීපම්හි දීපෙත්වා ලඞ්කාදීප මහා මුනි,
ලඞ්කාය සො සට්ඨිකප්පෙ කත්වාලංකං හිතං බහුං.

අරිඨසි මහාථෙරෝ ධුරග්ගාහා සමාගතා,
පවෙච්ඡා ගණිනො සබ්බෙ ධම්මරාජස්ස සාවකා.

ඛිණාසවා විසිපත්තා තෙ විජ්ජා ඉද්ධිකොවිදා,
උත්තමත්ථමභිඤ්ඤාය අනුසාසිංසු රාජිනො.

වත්තුඤ්ච සබ්බහං කත්වා කත්වා ලොක හිතං බහුං,
ජලිත්වා අග්ගික්ඛන්ධාව පරිනිබ්බිංසු මහෙසයො නි සී.

මෙසේ මේ ලක්දිව බුදුශාසනය සථිර කොට පිහිටුවා පවත්වා ලීම ද ධම්මසඞ්ගායනා කිරීම ම මූල්කොට වීය. එබඳු විශෙෂ මහිමවත් වූ සඞ්ඝානුශාසනාවන් ඇතිහෙයින් ධම්ධජවූ මාගේ බුදු රජාණන්වහන්සේ ශාසනා නම් වනසේක.

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදනානං දමයන්තානං පුරිසාජඤ්ඤදං තෙ නමො සි.

මේ ශ්‍රීසඞ්ඝාවවාද සංග්‍රහයෙහිවූ ලක්දිව ථූපාරාමයෙහි පැවති සතරවෙනි ධම්සංගායනා කථාව නිමි.

මෙසේ මේ සතරවෙනි ධම්සඞ්ගායනාව කිරීමෙන් සියලු ධම්ය එක්කොට පවත්වා මහා මහෙන්ද්‍ර සථිර අරිඨ සථිරාදි ඒ සියලුම බුදු පුත්‍රයන් වහන්සේලා ද ආයු පමණින් වැඩ සිට පිරිනිවි පසු එම අරිඨ මහා සථිරයන් වහන්සේගේ ම අතවැසි වූ තිස්සදත්ත කාලසුමන දීඝසුමනාදි වූ මහාසථිරයන්වහන්සේලා පුබෙෝකතා ක්‍රමයෙන් ම ආචාර්‍ය්‍ය පරම්පරාවෙන් මේ ධම්විනය පිළිවෙළින් පවත්වාගෙණ ආවාහුය.

තුන්වෙනි ධර්මසඞ්ගායනාවට ඉක්බිති ව මේ ලංකාද්වීපයට මිහිඳු මාහිමියන් ආදිවූ බුඩපුත්‍රයන් වහන්සේලා විසින් සියලු ධර්ම විනය ගෙණ එනලද්දේය. මිහිඳු මාහිමියන් වහන්සේ කෙරෙන් ඉගෙණ අරිඨ ථෙරාදි බුඩපුත්‍රයන් වහන්සේලා විසින් පවත්වා ගෙණ එන ලද්දේය. එතැන් පටන් අද දක්වාම් ඒ මහාසඨවිරයන් වහන්සේලාගේ ම අන්‍යොන්‍යාසික පරම්පරාවෙහි වූ ආචාර්‍ය පරම්පරාව විසින් ධර්ම විනය පවත්වාගෙණ එන ලද්දේය. ඒ ධර්මවිනය කොතැන්හි කවර පුද්ගලයෙකු කෙරෙහි පිහිටා තිබේ ද නිවහොත් යම් පුද්ගලයකු කෙරෙහි ධර්මවිනය පාලි වශයෙන් ද අඨ්ඨ වශයෙන් ද නො හැර මාණික්‍යමය භාජනයෙක්හි බහාලූ තෙලයක් මෙන් නො නැසී අද දක්වා ම පවත්නේ ද මෙබඳු සති ගති ඇති සම්පන්නවූ ලජ්ජී පෙසල ශික්ෂාකාමී පුද්ගලයන් කෙරෙහි මනාකොට පිහිටා තිබේගයි දතයුතු.

එහෙයින් සත්ත්වයන්ගේ විනයනයවීමට නිසි වූ මේ ධර්ම විනය පිහිටුවන පිණිස විනය පඤ්ඤප්ති ධර්මයාගේ ආනිසංස මහන්ත්වය සලකාගෙණ ශික්ෂාකාමී වූ භික්ෂූන් විසින් විනය ධර්මය පුහුණුකළ යුත්තේය. එහි මෙකියන්නේ විනය පඤ්ඤප්තිධර්ම යෙහි ආනිසංස ය.

විනය පඤ්ඤප්ති ධර්මයෙහි සමඤ්ඤ වූ පුද්ගල තෙම බුදුසස්නෙහි පැවිදිලත් ශ්‍රද්ධාසම්පන්න සියලු කුලපුත්‍රතැන්වලට මාතා පිතෘ ඤාතියෙහි පිහිටා සිටින්නේ වෙයි. ඒ සියලු ශ්‍රද්ධා ප්‍රව්‍රජිතයන් වහන්සේලාගේ ප්‍රව්‍රජ්‍යාව ද උපසම්පදාව ද විනය පඤ්ඤප්ති ධර්ම ධරයින්වහන්සේට අයිති වන්නේය. එහෙයින් වත්තානුවත්ත ප්‍රතිපත්ති ආචාර අනාචාර ගොචර අගොචරවල දැක්ම බව හා අල්පෙච්ඡ තුණ පුරණු කැමති තැන් විසින් විනය පඤ්ඤප්තිධර්මය නිසා තමාගේ ශීලස්කන්ධයන් මනාකොට ගුප්තව රක්ෂාකළයුතු වන්නේය. මේ කැප දෙ අකැප දෙ යි යනාදීන් කුකුස් සහාව ඇති භික්ෂූන් වහන්සේලාට පිළිසරණ විය යුතු වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් සංවර මූලකාරණාවූ යම්යම් කුශල ධර්ම කෙතෙක් වදරණ ලද්දාහු ද ඒ සියලු ධර්මයන්ට විනය මූල්වන බැවින් විනයධර පුද්ගල තෙම ඔවුන්ට ධර්මදායාදය දිය යුතු වන්නේය. එහින් වදරණලදමැ යි, "විනයෝ සංවරත්ථාය, සංවරෝ අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරෝ පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සබ්භත්ථාය, පස්සඞ්ඛි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථා භූත ඤාණදස්සනත්ථාය, යථා භූත ඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගෝ විමුත්තත්ථාය, විමුත්ති—පෙ—විමුත්ති ඤාණ දස්සනත්ථාය විමුත්ති ඤාණ

දස්සනං, අනුපාදා පරිනිබ්බාණත්ථාය යදිදං අනුපාදා, චිත්තස්ස විමොක්ඛෝ ති"—එහි අඤ්ඤ නාම-චිත්තයෝ, සබ්බ චිත්තගතය කළ තුන්ලොවට ඇසක් වැනිවූ බුදුරජාතුන් වහන්සේ විසින් පණවා වදාරණ ලද සියලු ධර්ම චිත්තය සංඛ්‍යාත පඤ්ඤත්ති ධර්මයතෙම සංවරත්ථාය, කායාදි චාරිත්‍රයාගේ සංයමය පිණිස වෙයි; සංවරෝ, ඒ සංයමය යි කියනලද චාරිත්‍රයෙන් ශික්ෂාවන නොකවයුතු වැළකීම; අවිප්පටිසාරත්ථාය, විප්‍රතිසාර නැතිවීම පිණිස වන්නේය; අවිප්පටිසාරෝ, විප්‍රතිසාර යැයි කියන ලද කායසාමඤ්ඤ නැතිවිම; පාමොජ්ජත්ථාය, ප්‍රමෝදය පිණිස වන්නේය; පාමොජ්ජං, ඒ ප්‍රමෝදය යි කියනලද තරුණ ප්‍රීතිය; පීතත්ථාය, මුහුකුල ප්‍රීතිය පිණිස වන්නේය; පීති, ඒ ප්‍රීතිය යි කියනලද සන්තොෂය; පස්සබ්ධත්ථාය, ප්‍රශ්‍රබ්ධිය පිණිස වන්නේය; පස්සබ්ධි, ප්‍රශ්‍රබ්ධිය යි කියන ලද කාය චිත්ත දෙදෙනාගේ සංසිදීම; සුඛත්ථාය, සැප පිණිස වන්නේය; සුඛං, සැපය යි කියන ලද කායික චෛතසික සුඛය; සමාධත්ථාය, සමාධිය පිණිස වන්නේය; සමාධි, සමාධිය යි කියන ලද ඒකාග්‍රතා එකඟවීම; යථාභූත ඤාණදස්සනත්ථාය; යථාභූත ඤාණ දර්ශනය පිණිස වන්නේය.

යථා භූතඤාණ දස්සනං, යථාභූත ඤාණ දර්ශනය යි කියන ලද සියලු ධර්මයන්ගේ ඒ ඒ සවභාව ඇතිලෙස තත්ත්වූ පරිද්දෙන් දැකීම; නිබ්බිදත්ථාය, නිර්වේදය පිණිස වන්නේය; නිබ්බිදා, නිර්වේදය යි කියනලද සසර කලකිරීම; විරාගත්ථාය, විරාගය පිණිස වන්නේය. විරාගෝ, විරාගය යි කියන ලද සසර ආලය හැරීම; විමුත්තත්ථාය, විමුක්තිය පිණිස වන්නේය; විමුත්ති විමුක්තිය යි කියන ලද සියල්ල කෙරෙන් සිත මිදීම; විමුත්තිඤාණ දස්සනත්ථාය, විමුක්ති ඤාණ දර්ශනය පිණිස වන්නේය; විමුත්ති ඤාණදස්සනං, විමුක්ති ඤාණදර්ශනය යි කියන ලද උතුම් ඤාණ දර්ශනය; අනුපාදාපරිනිබ්බාණත්ථාය, අනුපාදා පරිනිර්වාණය නම් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසිවක් සිතට නොගැන්මෙන් චිත්තවිමෝක්ෂය යි කියනලද පරිනිර්වාණය පිණිස වන්නේයයි මෙසේ අමෘත මහා නිර්වාණයට පැමිණීම දක්වා වන්නාවූ සියලුම විනය පඤ්ඤත්ති ධර්මානිසංසය ප්‍රකාශකොට වදාළසේක. එහෙයින් මෙබඳු ආනිසංස මහත්ත්වය දක්වූ විනය පඤ්ඤත්ති ධර්මය පුනුණුකිරීමෙහි උත්සාහ කට යුතු වේ.

මෙසේ සබ් සත්ත්වොපකාරිව සිටියේ ධර්ම චක්ෂු යෙහෙන් පවත්වාගෙණ ඒම පිණිස සතරවනවාරයෙහි මෙම සිරිලක අනුරාධපුරනුවර දී අරිෂ්ට සක්විර මහාමහෙන්ද්‍ර සක්විරාදි අවසැටකමක් පමණ ත්‍රිවිද්‍යාදි ගුණ සම්පන්න මහා ක්ෂීණාශ්‍රවයන් වහන්සේ

ප්‍රධානකොට සැවැත්වදහසක් පමණ භික්ෂුසඞ්ඝයා වහන්සේ ථූපාරාම විහාරයෙහි රැස්කොට ධර්මසඞ්ගායනා කරවා ථූපාරාම චෛත්‍යය බඳවා අපරිමිත කුසල රාශි වර්ධනය කිරීමෙන් බුදුසසුන් බබුළුවා දෙවනපෑතිස් නම් පින්වත් රජ සතළිස් අවුරුද්දක් දැහැමින් රාජ්‍යය කෙළේය. ඉක්බිති ඒ රජ ඇවැමෙන් ඔහු මල් උත්තිය යන නමින් ප්‍රසිද්ධවූ රජ අනුරාධපුර නුවර රාජ්‍යය කෙළේය. ඒ දෙවනපෑතිස් රජසමයෙහි උපරාජ්මහානාගය, යවාලතිස්සය, ගොඨාභයය, කාවන්තිස්සය යන රජතුමෝ සතර දෙන දරු මුණුපුරු පරම්පරා වශයෙන් පැමිණ රුහුණු මාගම් නුවර වැස දැහැමින් රජකළාහුය.

බුදුන් පිරිනිවි-තුන්සිය සැත්තෑ සවෙනි වර්ෂයෙහි දුටුගැමුණු නම් රජ රාජ්‍යයට පැමිණ මිරිසවැටි විහාරය කරවා නවමහල් ලොවාමහාප්‍රාසාද නම් පොහොගෙය සමඟ විහාරයද කරවා රත්න මාලි චෛත්‍යය නම් අසදෘශ වෙහෙර බඳවා සයානූ කෙළක් පමණ මහ රහත් භික්ෂූන් වහන්සේ රැස්කරවා මහදන් පවත්වා අප්‍රමාණ වූ කුසල රාශි වර්ධනයෙහි සෙදී සුමිහි අවුරුද්දක් අනුරාධපුර නුවර දැහැමෙන් රාජ්‍යයකොට ආයු කෙළවර තුසිපුර නම් දෙව් ලොවට පැමිණියේය.

එසමයෙහිදු ලඞ්කාවිපවාසී භික්ෂුසඞ්ඝයා වහන්සේ බුඞ්ධශාසන යාගේ වර්ධනය හා ලෝවැඩ පිණිස සියලු අටුවා කථා සහිතවූ ත්‍රිපිටක බුඞ්ධවචනය මුඛපාඨ පරම්පරා වශයෙන් හික්මීමෙන්ම පැවැත්වූවාහුය- මේ කියනලදමැයි, සඞ්ගීතිසඞ්ග්‍රහයෙහි:-

දෙවානං පියතිස්සෝ ච සෝ ලඞ්කිස්මිං සුපුඤ්ඤවා,
වත්තාලීසති වස්සානි රාජා රජ්ජම 'කාරයි.

තස්සච්චයා කණිට්ඨෝ සෝ මත්තාභයෝ නි විස්සුතෝ,
අනුරාධපුරෙ රම්මෙ රජ්ජ 'මකාසි ඛත්තියෝ.

උපරාජා මහානාගෝ යවාලෝ සෝ මහඛ්ඛලෝ,
ගොඨාභයෝ මහාපඤ්ඤ කාකවණ්ණාව විරියවා.

වත්තාරෝ තෙ ච රාජානෝ පුත්තානත්තු පරම්පරා,
ධම්මෙන රජ්ජං කාරෙසුං මහාගාමෙ මනොරමෙ.

සම්බුඛ පරිනිබ්බාණා තීසු වස්ස සතෙසු ච,
ඡ සත්ති මනික්කතෙ රාජා'නු දුඨගාමිණි.

දුඨගාමණී අභයොලඹකිනෙ පුඤ්ඤ පඤ්ඤවා,
චතු වීසති වස්සානි ලඹකා රජ්ජ 'මකාරයි.

එවං පුඤ්ඤානි කත්වාන අනෙකානි මහීපති,
කායස්ස හෙදා සප්පඤ්ඤා තුසිතං 'උපපජ්ජථ. සි

යනුවෙන් යථොක්ත ප්‍රකාරවූ දුටුගැමුණු මහරජ කරවා ලූ අසදෘශ මහා වෛත්‍යය පිහිටා සත් පණස් අවුරුද්දක් ගිය කල්හි වළගම්අබා මහරජ මේ ලඹකාළුපයෙහි රජපැමිණ අභයගිරි ම්හා විහාරය කරවා, එම විහාරයෙහි ධාතු සහිතවූ මහාථූප ප්‍රමාණ මහා වෛත්‍යයක් ද කරවා මහානිස්ස තෙරුන්වහන්සේ ප්‍රමුඛවූ භික්ෂු සඞ්ඝයා වහන්සේට පිළිගන්වා අනෙකප්‍රකාර කුශලරාශි වර්ධන යෙහි යෙදී වාසයකරණුයේ එක්දවසක් ඒ වළගම්අබා මහරජ මහා විහාරයට ගොස් භික්ෂුසඞ්ඝයාවහන්සේ වැඳ එකත්පස් වහුන්නේය.

එකල්හි භික්ෂු සඞ්ඝයා වහන්සේ රජහට දන්වනසේක් මහරජ සිඟලු අටුවා කථා සහිතවූ ත්‍රිපිටක බුද්ධවචනය මූඛපාඨ ක්‍රමයෙන් බුදුන් පිරිනිවි තැන් පටන් පරම්පරා වශයෙන් පවත්වා ගෙණ අවුත් දැනුදු එසේ ම මුඛපාඨ ක්‍රමයෙන් ම සිටිනේය. අනාගත කාලයෙහි වනාහි ලොක ශාසන දෙක මේ ක්‍රමයෙන් ම නො සිට පිරිහීමට පැමිණීම වන්නේය, එකල්හි අටුවා කථා පාළි සහිතවූ සිඟලු ත්‍රිපිටක බුද්ධවචනය ද පිරිහෙන්නේය. එහෙයින් දැන් මූඛ පාඨයෙන් ගෙණ අා අටුවා කථා පාළි සහිතවූ සිඟලු ත්‍රිපිටක බුද්ධ වචනය පොත්වල ලියම්වියයුතු වන්නේය යි වදළසේක. එවිට වළගම්අබා මහරජ දන්වනුයේ සවාමීවූ මහසඞ්ඝයාවහන්ස, මෙ තැන්හි මාවෙසින් කුමක් කටයුතුද? ඒ මට වදළ මැනවයි ආරාධනා කෙළේය.

එකල්හි මහසඞ්ඝයාවහන්සේ වදරණසේක් මහරජ ධම්මණ්ඩපයක් කරවන්ට ද පුස්තකපණී සම්පාදනයකරන්ට ද වට නේය යි වදළසේක. ඒ ඇසූ රජ ද මැනවයි ගිවිස මහා විහාර යෙහි ප්‍රථම මහා ධම්සඞ්ගායනා කාලයෙහි අජාතශත් රජහු විසින් කරවනලද ධම්මණ්ඩපය වැනිවූ රාජානුභාවයෙන් විසිතුරු ධම්මණ්ඩපයක් කරවා සිඟලු පුස්තකපණී සම්පාදනය කොට මහාඝ්‍ය මණ්ඩපය මධ්‍යයෙහි පණවා සවාමිනී මා විසින් කළමනා කායය්‍ය සමෘද්ධිය යි මහාසඞ්ඝයා වහන්සේට දැන්වූයේය. එකල්හි භික්ෂු සඞ්ඝයාවහන්සේ නොයෙක් ලක්ෂගණන් භික්ෂූන්වහන්සේලා අතුරෙන් ත්‍රිපිටක පරියාපත්තිධර සිව්පිළිසිඹියාපත් ත්‍රිවිද්‍යාදි අනෙක ගුණරත්නාලඞ්කෘත භික්ෂූන් වහන්සේගෙන් නොයෙක් දහස් ගණන් භික්ෂූන්වහන්සේ තෝරා ගත්සේක. ඊට ඉක්බිතිව ඒ සථවිර භික්ෂූන්වහන්සේලා තම තමන් වහන්සේලාට ප්‍රාප්ත

ආසන්නවල වැඩහිඳ යමසේ මහාකාශ්‍යප සථවිර යස සථවිර තිස්ස සථවිර මහෙන්ද්‍ර සථවිර යන බුඩ පුත්‍රයන් වහන්සේලා ධම්ම විනය සඞ්ගායනා කලෝ ද, එමෙන් පිටක වශයෙන්ද නිකාය වශයෙන්ද අඞ්ග වශයෙන් ද ධම්ස්කන්ධ වශයෙන් ද ධම්ම විනය මූල පාඨයෙන් එසේම ගෙණ පොත්වල ලියා පස්වා දහසක් කල් මූළුල්ලේ බුඩ ශාසනය පවත්නා සේ චිරසථිති කොට පස්වෙනිවූ ධර්ම සඞ්ගායනා වක් යදුශ කළසේක. සියලු අර්ථ කථා සහිත පිටකත්‍රය ධර්මය පොත්වල ලියා භික්ෂූන් අනෙක ප්‍රකාරයෙන් මහාපාථිවිය කම්පා විය. මේ පිටකත්‍රය ලෙඛනය එක් අවුරුද්දකින් නිම්යේය. මේ කියනලදමැයි. සඞ්ගීසංග්‍රහයෙහි:-

"සම්බුඩ පරිනිබ්බාණා වතූ වස්ස සතෙ පි ව,
නෙත්තිංසති අභික්කනෙන රාජා 'හු වට්ටගාමිණි.

ලංකාවාසී භික්ඛූ සඞ්ඝා පෙක්ඛමානා අනාගතං
භානිං දිස්වාන සත්තානං තදා භික්ඛූ සමාගතා.

තෙපිටකධරා සබ්බෙ පහින්න පටිසම්භිදා,
ඛීණාසවා වසිප්පත්තා විනයෙ සුවිසාරදා.

තස්මිං මහා විහාරෙ ච ථෙරා භික්ඛූ සමාගතා,
පටිපාටියා සන්නිසින්නා ආසනම්හි සකෙ සකෙ.

පිටකත්තය පාළිඤ්ච තස්සා අට්ඨකථඤ්ච තං,
මූල පාඨෙන ආනෙත්වා ලිඛෙසුං භික්ඛූ මහාමතී.

සංගීතියා වුත්තනයා ථෙරා තෙ පිටකත්තයා,
සබ්බෙ සඤ්ඤාය 'මකරුං තස්ස අඪ කථඤ්ච තං.

විරඝිතඤ්ච ධම්මස්ස සාසනස්ස ච වුඩ්ඪියා,
පඤ්චවස්ස සහස්සානි තම්පණ්ණි වත්තතෙ කරුං.

සඞ්ගායිත තයෙනෙව ථෙරා විනය කොවිදා,
සබ්බං විනය පිටකං පොත්ථකෙසු ලිඛාපයුං.

සඞ්ගායිත තයෙනෙව ථෙරා සුත්තන්ත කොවිදා,
සුත්තන්ත පිටකං සබ්බං පොත්ථකෙසු ලිඛාපයුං.

සබ්බම්පි ථෙරවාදං ච සබ්බං අට්ඨකථානයං,
මූලපාඨෙන ආනෙත්වා පොත්ථකෙසු ලිඛාපයුං.

ලිඛිත්වා පරියොසානෙ අභාභිපති මහාමති,
අවජරිගානි චාහෙසුං ලෝකෙ නෙකානි නෙකධා.

පිටකත්තයං ලිඛිත්වා තත්ථ ලෝක හිතං ඛහුං,
තෙ සාවනායුකං යත්වා ථෙරා සඛ්බෙපි නිබ්බුතා 'ති''

මෙසේ මේ අටුවා කථා සහිතවූ සියලු පාළි ධර්මය පොත්වල ලියා ස්ථිරාශ්‍රව මහාඝට්ඨිවරවූ ඒ බුද්ධපුත්‍රයන් වහන්සේලා ආයු පමණින් මැඩසිට උපධිරහිත නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑවාහුය. මෙසේ පිටකත්‍රය ධර්ම ලියවීම් ආදි අපරිමිත කුශල රාශි වර්ධන යෙහි යෙදි දෙලොස්අවුරුද්දක් රාජ්‍යානුශාසනාතළ වළගම්අබා මහරජ ආයුෂොළවර දෙව්ලොව උපන්නේය. මේ කියනලදමැයි:-

වට්ටගාමණි අභයෝ ලංකාරජ්ජ මකාරයි,
ඉති චාදස වස්සානි පඨමාහානි ආදිතො.

එවං පුඤ්ඤානි කත්වාන අනෙකානි මහීපති,
කායස්ස හෙදා සපජ්ඡෙතු සඤ්ඤං සෝ උපපජ්ජථ සි.

මෙසේ මහානුභාව සම්පන්න මහරහතන් වහන්සේ ඇතිකල සිත්හිම පවත්වා ලොකොපකාරව එසේ නැතිකල පොත්වල ලියා පැවැත්වීමෙනුදු පයත්‍රිපිටකි අනතඛ්‍රතය දක්වා පවත්නා ශාසන සම්පත්තිය සි කියනලද ධර්මානුශාසනා ඇතිහෙයින් සලිලොකොඝ ශරණවූ මාගේ බුදුරජානන්වහන්සේ ශාස්තෘතම් වන්සේක.

දෙව යක්ඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්නානං දමයන්තානා පුරිසාජඤ්ඤ තෙ නමෝ, සි

මේ සද්ධර්මවංශ සංග්‍රහයෙහි පිටකත්‍රය ධර්ම පොත්වල ලියා පැවැත්වූ ප්‍රවෘත්ති සංග්‍රහය කියා නිමවන ලදි

මෙසේ මේ යථොක්ත ප්‍රකාරයෙන් සියලු පයත්‍රිපති ධර්මයන් පොත්වල ලියාලූතැන් පටන් ඡන්ඩියසොළොස්වසිරක් අභික්‍රාන්ත තව ගිය කල්හි මේ ලක්දිව මහානාම නම් රජ රජපැමිණ රාජ්‍යය කරණ සමයෙහි දඹදිව මධ්‍යදෙශයෙහිවූ මහ බෝමැඩට නුදුරුවූ එක්ගමෙක බමුණුකුලයෙක්හි උපන් එක් බ්‍රාහ්මණ මාණවකයෙක් වූයේය. හෙතෙම සියලු ශිල්පයෙහි විසාරදව වෙදත්‍රයෙහි පාරප්‍රාප්ත්‍ව දඹදිව ගම් නියම්ගම් දනවි නුවරවල ඇවිද යම් යම් තැනෙක පණ්ඩිත ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වසන්නාහු ද ඒ ඒ තන්හි ගොස් ඔවුන් හා සාකච්ඡාකොට පැණ පිළිවිස ඇවිදින්නේය. ඔහු විසින් විවාල ප්‍රශ්නයක් විසඳීමට සෙස්සෝ සමර්ථනොවන්නාහුය. සෙස්සන් විසින් විවාලනාක් ප්‍රශ්න හේතෙමේ විසඳන්නේය. මේසේ

සියලු දඹදිව ඇවිද පැණ විසඳීමෙන් ජයග්‍රහණය කොට ඇවිදිනා ඒ බ්‍රාහ්මණ මාණවක තෙම එක්දිනක් විහාරයකට පැමිණියේය. එම විහාරයෙහි කොයෙක් සිය දහස් ගණන් භික්ෂූන්වහන්සේලා වාසයකරන්නාහුය. ඒ භික්ෂූන්වහන්සේලාට සඬ්ඝසථවිරවූ ආයුෂ්මත් රෙවත සථවිර නම්වූ පරවාදමර්දනයෙහි සමර්ථවූ පිටිපිළිසිඹියා පත් මහා ක්ෂීණාශ්‍රවයන් වහන්සේ කෙනෙක් වාසය කරණසේක. එකල්හි ඒ බ්‍රාහ්මණ මාණවකතෙම දිවා රාත්‍රි දෙක්හි ම මන්ත්‍ර පරිවර්තනය කොට සම්පූර්ණවූ පදව්‍යඤ්ජන පරිමණ්ඩලයෙන් හදුරන්නේය. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේට ඒ බ්‍රාහ්මණ මාණවකයාගේ මන්ත්‍ර හදුරණ ශබ්දය ඇසී මෙබඳු සිතිවිල්ලක් පහළවිය. මේ බ්‍රාහ්මණ මාණවා තෙම මහත් ප්‍රඥ ඇත්තේය. ඔහු දමනයකරන්ට වටනේය යි සිතා බ්‍රාහ්මණ මාණවකයාඛණවා මෙසේ වදුරණසේක් එම්බා ඔතැන්හි ගදුහරාවයෙන් හඬන තෙල කවරෙක්ද යි විචාරා වදුළසේක. එවිට බ්‍රාහ්මණ මාණවකයා තෙරුන්වහන්සේ කරා පැමිණ කියනුයේ" පින්වත් ප්‍රව්‍රජිතයන් වහන්ස! ගදුහරාවයෙහි අර්ථ කිමෙක්ද? ඒ දන්නාසේක්ද යි විචාළේය.

එකල්හි "එසේය බමුණ දනිමි" යි එහි අර්ථ වදුළකල්හි ඉක්බිත්තෙන් බ්‍රාහ්මණ මාණවකතෙම වෙදත්‍රයෙහි ඉතිහාස පඤ්ච යෙහි යම් යම් ග්‍රන්ථිසථාන කෙනෙක් ඇද්ද යම් යම් පදකෙනෙකුන්ගේ අර්ථය තමා විසින් නො දන්නා ලද ද ඔහුගේ ආචාර්ය්‍යයනු දු තුදුවූ යම් යම් අර්ථයෙක් ඇද්ද එබඳු තෝරාගත නොහැකි ගැඹුරු අර්ථාන්විත වචනයන් ගෙණ ඒ සියල්ල මහතෙරුන් වහන්සේගෙන් විචාළේය. තෙරුන්වහන්සේ සවභාවයෙනු දු වෙදත්‍රයාගේ පාරප්‍රාප්තව දුන් වනාහි සිවුපිළිසිඹියා ප්‍රාප්තයෙක් වූයෙන් ඒ රෙවත නම් මහතෙරුන් වහන්සේට ඒ ප්‍රශ්නයන්ගේ විසඳීමෙහි භාරයෙක් නැත. එහෙයින් පළමුකොට ඔහු විසින් විචාළ ඒ සියලු ප්‍රශ්නයන් විසර්ජනයකොට නිමවා බ්‍රාහ්මණ මාණවකයාහට වදුරණසේක් "පින්වත් බ්‍රාහ්මණය! තා විසින් විචාරණ ලද බොහෝ පැණ මා විසින් විසඳන ලද්දාහ. මම ද දැන් එක් ප්‍රශ්නයක් තොප විචාරම්, ඒ මාගේ ප්‍රශ්නය ප්‍රකාශකොට කියන්නෙහි නිදු"සි විචාළසේක. එසේය "පින්වත් ප්‍රව්‍රජිතයන් වහන්ස! විචාළ මැනව ප්‍රකාශකොට කියමියි කීයේය. එකල්හි තෙරුන්වහන්සේ විතත යමකයෙහි මේ ප්‍රශ්නය විචාළසේක. "යස්ස විඤ්ඤාණං උප්පජ්ජති න නිරුජ්ඣති තස්ස විත්තං නිරුජ්ඣිස්සති යස්ස වා පන විත්තං නිරුජ්ඣිස්සති නුප්පජ්ජිස්සති තස්ස විඤ්ඤාණං උප්පජ්ජති න නිරුජ්ඣති, ති" යන මේ ප්‍රශ්නය විචාරා වදුළ කල්හි බ්‍රාහ්මණතෙම ආදි මධ්‍ය පර්‍යවසාන කිසිවක් නො දැක යම්සේ ගිලගත් යම්

කිසිවක් නහාහරින්ට හෝ ගිලහන්ට හෝ නො හැකි ව යමෙක් වෙහෙසෙන්නේවේද එ මෙන් ඒ ප්‍රශ්නය විසඳන්නට නො හැකි ව "පින්වත් ප්‍රව්‍රජිතයන්වහන්ස! මේ කිනම් මන්ත්‍රයෙක්ද යි විවාළේය. බ්‍රාහ්මණය මේ බුඩමන්ත්‍ර නමැ යි වදාළසේක. එකල්හි බමුණුතෙම "පින්වතුන්වහන්ස! මේ බුඩ මන්ත්‍රය මට දෙන්ට හැකි දැ"යි විවාළේය. බ්‍රාහ්මණය අප විසින් ගත් ප්‍රව්‍රජ්‍යාව හන්නාහට දෙන්ට පිළිවනැ යි වදාළසේක් ඉක්බිත්තෙන් බ්‍රාහ්මණ තෙම මන්ත්‍රය පිණිස පැවිදි ඉල්වූසේය. ඒ තෙරුන් වහන්සේ ත් බ්‍රාහ්මණයා පැවිදිකොට උපසම්පදා කළසේක. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ සියලු ත්‍රිපිටක බුඩවචනය ද උගැන්වූසේක. එහෙම ඉගෙණ ලොකයෙහි ඉර සඳ සේ අභිශයින් ප්‍රසිඩදූසේක. බුදුරජාණන්වහන්සේගේ මෙන් ගම්භීරවූ ඝොෂ ස්වරය ඇතිවන බැවින් මේ කියනලදමැයි සඩමීසංග්‍රහයෙහි:-

බොධි මණ්ඩ සම්පමිහි ජාතෝ බ්‍රාහ්මණ මාණවෝ,
විජ්ජා සිප්ප කලා වෙදී තීසු වෙදෙසු පාරගෝ.

සමමා විඤ්ඤුත සම්මයෝ සබ්බ වාද විසාරදෝ,
නදන්ති පඨිබුදීපම්හි ආභිණ්ඩනෙත්ථ විවාදිකෝ.

විහාර 'මෙත්ථා ආගම්ම රත්තිඤ්ඤිව 'මතඤ්ඤිතෝ,
පරිවතෙතනි සම්පුණ්ණ පදං සුපරි මණ්ඩලං.

තත්‍රෙකෝ රෙවතෝ නාම ථෙරෝ සඩම්ම කොවිදෝ,
මහා පඤ්ඤඤ අයං සත්‍ථෝ දමෙතුං වට්ටතී ති සෝ.

කෝ නු ගද්‍රහරාවෙන විරවන්තෝ ති අබ්‍රවී,
ගද්‍රහානං රවෙ අත්ථං කිං ජානාසී'ති ආහ සෝ.

ආම ජානාමි වුත්තෝ සෝ ඔතාරෙසි සකාමතං,
පුඤ්ඤ පුඤ්ඤ ඵියාකාසි විරුඩ්ඩං පි ව දස්සයි.

තෙන හි ඒවං සකං වාදං වෝහාරෙසි 'නි මොදිතෝ,
පවිපුවිඡි මහා ථෙරෝ අත්ථම'ස්ස න බුජ්ඣි සෝ.

ආහ කාසෙසඅ මන්තෝ ති බුඩමන්තෝනි සෝ බ්‍රැවී,
දෙහී නි වුත්ත තෝ වෙසං ධාරිතෝ දම්මි තං ඉති.

මොදිතෝ පඩ්ඩජෙහි කි මත්තාඨාය ඔපඩ්ඩජි,
කම්මට්ඨාන මදූ ථෙරෝ පඩ්ඩාජ්ජා යථා රහං.

උපසම්පදං මාපත්තෝ උභයේසම්පි පිටකං,
අති වතාකවෝ ආසි වසෙනු වි සුරියෝ වි මහා.

බුද්ධිස්ස විය ධම්මගිරි සෝභං තං විසාකරුං,
බුද්ධඝෝසා ති සෙ සෙන බුද්ධෝ විය ඉතිලෙ ති, සි.

මෙසේ ප්‍රසිද්ධවූ තැන් පටන් ඒ භික්ෂූන්වහන්සේ බුද්ධඝෝෂ තෙරුන්වහන්සේ නමැති මුළුලොකයෙහි ප්‍රකාශවූසේක. එකල්හි ඒ බුද්ධඝෝෂ සඞ්ඝමින්වහන්සේ ඒ විහාරයෙහි දී සඳුණොදහස් නම් ප්‍රකාරණයක් ඝණාව අභිධම්මයෙහි ධම්මසඞ්ගණියට අට්ඨසාලිනි නම් අටුවාඝටාව ද පිරිත් අටුවාඝටාව ද කරන්ට ආරම්භකළ සේක. එකල්හි ආයුෂ්මත්වූ රේවත තෙරුන්වහන්සේ ඒ දැන මෙසේ වදුළුසේක. ඇවැත්වූ බුද්ධඝෝෂය! මෙහි අද දවසේදී පිටඝා ත්‍ර ය පාළිය පමණක් ඇත, ඒ අටුවාඝටා ද ආචාරියවාදයෝ ද නැත්තාහු සි සිංහල පිපයෙහි අටුවා කථා හා ආචරියවාදන් ඇත, ඒ වඤ්ඤි සංගීතිත්‍රයට ආරුළුවූ බුද්ධභාසිතය හා ශාරිපුත්‍ර සථවිරාදීන් විසින් කරණලද අළුත් කථා මාගධ බලා සති මති සම්පන්න මිහිදු මාහිමියන් වහන්සේ විසින් සිංහල භාෂාවෙන් කරණ ලද හෙයින් ම ශුද්ධවූ සීංහල අටුවා, කථා සිංහල පිපසෙහි පවත් නාහ. තෙපි එහි මහාස් ඒ අටුවා කථා අසා පරිඤ්ඤාකොට ගෙණ මාගධ භාෂාවට පරිවර්තනය කරව්. ඒ අළුත් කථා තොමෝ සියලු ලොකයාගට හිත සැප ඵලවන්නී වේයයි මෙසේ උපඛ්‍යායෙයන් වහන්සේ ද භික්ෂු සඞ්ඝයා වහන්සේ ද වැඳ අවසරගෙණ ක්‍රමයෙන් අවුත් නැවතුනාවට පැමිණිසේක, එකල්හි ශක්‍රදෙවෙන්ද තෙම දිව අමා අරළු පලඟක් ද පන්හිදක් ද ඒ බුද්ධඝෝෂ සථවිරින්වහන් සේට ගෙණවුත් දී ශක්‍රභවනයට ම ගියේය.

එසින් උන්වහන්සේ නැවතැති වඩනාසේක් මහාසමුද්‍රය මධ්‍ය ශෙහි දී පට්පථයට පැමිණි ආයුෂ්මත් බුද්ධදත්තසථවිරයන් දැන කථා සල්ලාප කොට එසින් නික්ම අවුත් ලංකාපට්ටනමට පැමිණ මෙහි මහානාම රජ රජ්ජාරම්භකාල ක්‍රමයෙන් අනුරාධපුර මහා විහාරයට පැමිණ එහි භික්ෂු සඞ්ඝයා දැන මහා ප්‍රධානඝරයෙහි සංඝපාල සථවිරයන් වහන්සේ සමීපයට ගොස් සිසුවු සිංහල අටුවාකථා ද පේරවාද ද අසා ධම් සවාමිවූ බුදුරජාණන් වහන් සේගේ මේ අභිප්‍රායයයි නිශ්චයකොට දැන ඒ විහාරයෙහි සඞ්ඝ සන්නි ධානය කරවා මෙසේ දැන්වූසේක. සවාමිවූ මහසංඝරත්නයන්ට පිට කත්‍රයට අටුවා කථා කරන්ට මට පොන් දෙවාවදුල මැනවැයි යාච්ඤා කළසේක. එකල්හි භික්ෂු සඞ්ඝයාවහන්සේ උන්වහන් සේගේ සාමර්ථ්‍යය විමසනු පිණිස ගාථාවක්හි දී නොපමේ සම්බු

බුද්ධඝෝෂ තෙරුන් අටුවා ලිවීම. (289 පිට)

භාවය මෙයින් දැක සියලු පොත් දෙම්හ යි කී සේක. එකල්හි ආයුෂ්මත් බුඩඝොෂ ස්ථවිරයන් වහන්සේ පිටකත්‍රයපාලිය ද අටුවා කථා ද දැක "විසුද්ධිමග්ග නම් ප්‍රකරණයක් කළසේක. එකල්හි දෙවතාවෝ උන් වහන්සේගේ නෛපුණ්‍යය මහජනයා කෙරෙහි ප්‍රකාශ කරණු පිණිස ඒ පොත අන්තර්ධාන කළාහුය. ඒ බුඩඝොෂ තෙරුන් වහන්සේ ද දෙවනු ත් පොතක් කෙළේය. ඒ ද දෙවතාවන් ම අන්තර්ධාන කළ හෙයින් තුන්වෙනුවත් පොතක් කළසේක. එ කෙණෙහි දෙවතාවෝ අතුරුදන්කළ පොත්දෙක ද දුන්නෝය. එකල්හි පොත් තුනෙක් වූහ.

ඉක්බිත්තෙන් බුඩඝොෂ ස්ථවිරයන් වහන්සේ පොත් තුන ම ගෙණ භික්ෂූ සඞ්ඝයා වහන්සේට දුන්සේක. එකල්හි භික්ෂූ සඞ්ඝයා වහන්සේ පොත් තුණම එකතුකොට කියවා ඒ පොත් තුණෙහි ම ග්‍රන්ථ වශයෙන් වත් පදවශයෙන් වත් අක්ෂර වශයෙන් වත් ව්‍යඤ්ජනවශයෙන් වත් අර්ථවශයෙන් වත් පූර්වාපර වශයෙන් වත් ථෙරවාදවලින් වත් පාළියෙන් වත් වෙනසක් නොව පොත් තුණෙහි ම ග්‍රන්ථ අක්ෂරාදි සියල්ල එක් අයෙක් කළා සේ ඒකාකාරව තිබුනු සේ දුටහ. එගෙයින් කියනලදි, සඞ්ගී සංග්‍රහයෙහි:-

තස්ස සත්ථුණෝදයං නාම කත්වා පකරණං තදා,
ධම්ම සංගණියා කාසි ථෙරෝ සෝ අත්ථසාලිනිං.
පරිනිත්තඤ කථං වෙ ව කාතුමාරභි බුද්ධිමා,
තං දිස්වා රෙවතෝථෙරෝ ඉදං වචන මබ්‍රවි.
පාළිමත්තම්පි අත්ථීධ නත්ථි අට්ඨකථාවසා,
තථා වරිය වාදම්හි භින්න රූපාති වජ්ජරෙ
සීහලට්ඨ කථා සුඛා මහින්දෙන මතිමතා,
සංගීතිත්තයඤ මාරුළ්හා සම්මා සම්බුද්ධ දෙසිතා.
සාරිපුත්තාදීහි කතං කථා මග්ගං සමෙක්ඛිය,
කතා සීහල භාසාය සීහලෙසු පවත්තති.
ත්වං තස්ථ ගන්ත්වා සුචිරන්න මාගධාය නිරුත්තියා,
පරිවත්තෙහි සා හොති සබ්බලොක හිතා වහා.
එවං වුත්තෙ පසන්නෝ සෝ නිත්තඛමිත්වා තතෝ ඉමං,
දීපමාගම්ම තස්සෙ ව රඤ්ඤෝ කාලෙ මහා මති.
මහා විහාරං සමපත්තෝ විහාරෙ සාධු සම්මතං,
මහාපධානඝරං ගන්ත්වා සංඝපාලස්ස සන්තිකෙ.

සීහලවිඤ කථං සුත්වා ථෙරවාදං ච සබ්බසෝ,
ධම්මසාමිස්ස එසෝ ච අධිප්පායෝ ති නිච්ඡිය.

තස්ථ සඞ්ඝං සමානෙත්වා කාතුමිටඨ කථං මම,
පොත්ථකෙ දෙථ සබ්බෙ පි ආහ වීමංසිතුං ච තං.

සබ්බෙ ඌථා වයං තස්ස දූසි සාමඤ්ඤියං තව,
එත්ථ දසෙහි තං දිස්වා සබ්බෙ දෙමා ති පොත්ථකෙ.

පිටකත්තය පාළිං ච සඩිං අට්ඨකථාය සෝ,
විසුඩිමග්ගං නාමෙකං සංගහෙත්වා සමාසතො.

තතෝ සඞ්ඝං සමානෙත්වා සම්බුඩ්ධමහාකොවිදෙ,
මහාබොධි සමිපම්හි සෝ තං වාචෙතුමාරභි.

දෙවතා තස්ස නෙපුඤ්ඤං පකාසෙතුං මහාජනෙ,
ඡාදසුං පොත්ථකා සෝ පි එත්තිකම්පාතුං පි තං අහා.

වාචෙතුං තතියෙ වාරෙ පොත්ථකෙ සම්මුහතෙ,
පොත්ථකවග මඤ්ඤම්පි පඨපෙසුං තතෝ මරු.

වාචසිංසු තදා භික්ඛූ පොත්ථකත්තයමෙකතෝ,
ගන්ථතෝ අත්ථතෝ වාපි පුඛ්ඛාපර වසෙන වා.

ථෙරවාදෙහි පාළිහි පාදෙහි ව්‍යඤ්ජනෙහි ච,
අඤ්ඤථත්තම්භූනෙව පොත්ථකෙසුපි නිසුපි නි සි.

මෙසේ බුඩඝෝෂ සථවිරයන් වහන්සේ විසින් කරණලද විශුඩි මාග් නම් ප්‍රකරණ තුණ ම එකතු කොට කියවා නිමිකල්හි අහස මහත් නාදයෙන් හා විදුලිඑලියෙන් ගැවසීගත්තේය. දෙවතාවෝ සාධුනාද පැවැත්වූවාහුය.

එ සමයෙහි මහා විහාරයෙහි නොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේලා රැස්ව ඒ ආශ්චර්‍ය්‍ය අද්භූත කාරණය දැක සතුටු සතුටු ව සාධුකාර දී දී නිසැකයෙන් ම මේ භික්ෂූන් වහන්සේ නම් මෛත්‍රෙය බොධිසත්වයන් වහන්සේ යයි කියමින් ඝොෂාකළාහුය. ඒ ඇසූ මහානාම රජ තෙම මහත් රාජානුභාවයෙන් යෙදී මහ පිරිස් පිරිවරණ ලදු ව නුවරින් නික්ම මහා විහාරයට ගොස් භික්ෂූ සඞ්ඝයා වැඳ සවාමීන් වහන්ස! යම්තාක් කලෙකින් ධම්ප්‍රකරණ කිරීම නිමාවට යෙද්ද ඒතාක්කල් මාගේ රජගෙයින් භික්ෂාව වළ දන සේක්ව යි කියා ආරාධනා කෙළේය. එ කල්හි තුෂ්ණීම්භාව යෙන් ඒ බුඩඝෝෂ සථවිරයන් වහන්සේ ඉවසූ සේක. ඉක්බිත්

තෙන් මහා විහාරවාසී භික්ෂූ සඞ්ඝයා 'වහන්සේ සිංහල අට්ඨා කථා පොත් හා සමග පිටකත්‍රයෙහි පාළි පොත් දුන්සේනා එකල්හි ඒ ආයුෂ්මත් බුද්ධඝොෂ සවාමීන් වහන්සේ ඒ සියලු පොත් ගෙණ මහා විහාරයට දක්ෂිණදිශාභාගයෙහි ප්‍රධාන කරනම්වූ එක්ප්‍රාසාදයෙක්හි වෙසෙමින් සියලු සිංහල අට්ඨාකථා පෙරලා මූලභාෂානම් වූ මාගධික භාෂාවට නහා ඒ තුන්පිටකසට අට්ඨා කථා කරණසේක් සමන්තපාසාදිකායෙහි කියනලද ක්‍රමයෙන් නිර්ඛවූ සිංහල අට්ඨා පොත් ගෙණ කළසේක.

කෙසේ වූ සිංහල අට්ඨා පොත් ද? යත් සිංහල භාෂාවෙන් ලිවූ මහා අට්ඨා කථාව ද, මහාපච්චරිය නම් අට්ඨා කථාව ද, මහා කුරුන්දී කථාව දැයි යන මේ අට්ඨා පොත් තුණ සිංහල අට්ඨා කථා නම් වන්නාහුය. එයින් මහ අට්ඨා කථාව නම් ප්‍රථම මහා ධම්සංගීතියට ආරුළත්වන හෙයින් මහා අට්ඨාකථා නම් විය. මහාපච්චරියඤ කථාව නම් ඒ සිංහල භාෂාගෙන් 'උළුමය'යි කියනලද පසුරෙක් ඇත. ඒ පසුරෙහි හිඳ කරණලද බැවින් පච්චරිය අට්ඨාකථා නම් විය. මහාකුරුන්දී කථාව නම් කුරුන්දිය නම් විහාරයෙක් ඇත, ඒ විහාරයෙහි හිඳ කළ බැවින් කුරුන්දිය අඤ කථා නම් විය. මෙසේ තුන් ප්‍රකාරවූ අට්ඨා කථාවන් අතුරෙන් ආයුෂ්මත් වූ බුද්ධඝොෂ ස්ථවිරයන් වහන්සේ කුරුන්දී කථායෙහි සිංහල භාෂාව පෙරළා මූලභාෂා නම්වූ මාගධ භාෂාවට නහා සියලු විනයපාළියට අයිවූ සමන්තපාසාදිකා නම් සත්විසි දහසක්පමණ ග්‍රන්ථයෙන් ප්‍රනිමණ්ඩිත වූ විනය අට්ඨාව කළසේක. ඒ හෙයින් කියනලදි:-

විනයෙ පාටවත්‍ථාය සාසනස්ස ච වුඩ්ඪියා,
මාගධාය සමාරම්භ විනයඤ කථා ච යා.

සමන්තපාසාදිකා සා සබ්බසො පරිකිත්තිතා,
සත්තවීස සහස්සෙහි ගන්ථෙහි පරිමාණතොා'හි.

ඊට අනතුරුව සූත්‍ර පිටකයෙහි මහ අට්ඨා කථාව සිංහල භාෂායෙන් පෙරළා සුමඞ්ගලවිලාසිනීනම්වූ දීඝාගම අට්ඨාව ද, එසේම ප්‍රපඤ්චසූදනී නම් මැදුම්සඟි අට්ඨාව ද, එසේම සාරාර්ථප්‍රකාශිනී නම්වූ සංයුත්තාගම අට්ඨාව ද, එසේම මනොරථ පූරණී නම්වූ අඞ්ගුත්තරනිකායාගම අට්ඨාව ද, ඛුද්දකපාඨ සහිතයෙහි ඇතුළත් පස්දහ ප්‍රකරණයන්ට පිළිවෙළින් වූ සඞ්ඝම්ප්‍රකරණ නම් වූ සඞ්ඝම්පෝතිකාකම් අට්ඨාව ද, ධම්මපදනම් අට්ඨාව ද, උදානනම් අට්ඨාව ද, ඉතිවුත්තක නම් අට්ඨාව ද, සූත්‍රනිපාත නම් අට්ඨාව ද, විමානවත්‍ථු නම් අට්ඨාව ද, ප්‍රෙතවත්‍ථු නම් අට්ඨාව ද, ථෙරගාථානම්

අට්ඨාව ද, පෙරිසෘථා නම් අට්ඨාව ද, ජාතක නම් අට්ඨාව ද, ප්‍රතිසම්භිදා නම් අට්ඨාව ද, අපදාන නම් අට්ඨාව ද, බුද්ධවංස නම් අට්ඨාව ද, නෙත්තිපකරණ අට්ඨාව ද, ආදි වූ සියලු අර්ථ කථා යථෝක්ත ක්‍රමයෙන් ම පාළියට නගා කළයේක. මෙම කියනලදී.

සුත්තනෙත්ත පාරවජ්ඣාය සාසනස්ස ච වුඩ්ඪියා,
මාගධාය සමාරබ්ධා සුත්තානුත්තඤ්ච අට්ඨා ච යා.

චතු නිකායගථඤ අට්ඨකථා සබ්බසෝ පරිනිට්ඨිතා,
ථේරියේහි සහසෙහි ගන්ථෙහි පරිමාණතෝ.

බුද්ධක නිකායගථඤ අට්ඨකථා සබ්බසෝ පරිනිට්ඨිතා,
සත්තති සත සහසෙහි ගන්ථෙහි පරිමාණතෝති.

ඒව අනුරුව අභිධම්පිටකයෙහි වූ මහාපව්වරි අර්ථකථායෙහි සිංහල භාෂාව පෙරළා මාගධ භාෂාවට නගා අත්ථසාලිනී නම් ධම්මසංගණී අට්ඨා කථාව ද එසේම සම්මෝහ විනෝදනී නම් විභඞ්ග ප්‍රකරණ අට්ඨා කථාව ද පරමාත්ථදීපනී නම් පඤ්ච ප්‍රකරණ අට්ඨා කථාව ද කියනලද ක්‍රමයෙන් ම පාළියට නගා කළ සේක. මේ කියනලදමැයි.

අභිධම්මෙ පාරවජ්ඣාය සාසනස්ස ච වුඩ්ඪියා,
මාගධාය සමාරබ්ධා අභිධම්ම කථා ච යා.

අත්ථසාලිනි නාමාදි සබ්බසෝ පරිනිට්ඨිතා,
තීහි සහස්ස මත්‍රේහි ගන්ථෙහි පරිමාණතෝ ති.

මෙසේ පළමු සථවිර ආචාර්‍යවරුන්ගේ විසින් පාලනය කළ ක්‍රමයෙණ ථෙරවාද නමැති කරණලද සියල්ල ම මාගධ භාෂායෙන් පවත්නා සේ අට්ඨා කථා බුද්ධඝෝෂ සාමීන් විසින් උපදවා වදාළ සේක් මය. ඒ පිටකත්‍රයයෙහි අට්ඨා කථා බුද්ධශාසනය පවත්නා තෙක් සියලු දෙශනානුරූප වාසීන්ට හිතවැඩ සැදී දෙන්නා හුය. එසේ ලොක හිතවූ පිටකත්‍රය අට්ඨා කථා කොට නිමිකල්හි අනෙක ප්‍රකාරයෙන් මහා පෘථිවිය කම්පාවිය. මේ පිටකත්‍රයට අට්ඨා කථා කිරීම එක් අවුරුද්දකින් නිමාවිය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් බුද්ධඝෝෂස්ථවිර යන් වහන්සේ මෙසේ ලක්දිව තමන් වහන්සේ විසින් කළමනා කටයුතු නිමවා මධ්‍ය මණ්ඩලයෙහි මහා බෝධීන් වහන්සේ වඳනා කැමතිව භික්ෂු සංඝයා වැඳ අවසර ගෙණ නැවත දඹදිවට ම වැඩි සේක. මේ කියන ලදි, පුරාතනයන් විසින්:-

සම්බුද්ධ පරිනිබ්බාණා තව වස්ස සතෙසු ච,
ඡප්පඤ්ඤාසා අතික්කතෙන මහානාමෝ නරාධිපෝ;
ධම්මෙන දසවිධෙතෙ ව ලඞ්කාරජ්ජ මකාරයි.

බුද්ධඝොසෝ ති ඝොසෙහි බුද්ධෝ විය මහීතලෙ,
ලඞ්කාදීපං තදාගම්ම ලඞ්කාදීප හිතාවහං -පෙ-

සඞ්ඝා ගාථාවයං දත්වා සීහලට්ඨ කථාය ච,
විසුද්ධිමග්ගං නාමාසා සංඝස්සානුමතිව සා.

අථ උග්ඝාසයි සංඝා හත්ථුච්ඡෝ විසෙසතෝ,
නිස්සංසයංව මෙත්තෙය්‍යෝ ඉති වත්වා පුනප්පුනං.

සබ්බම්බකථා දූසි පොත්ථකෙ පිටකත්තයෙ,
හත්ථඝරෙ වසන්තෝ සෝ විහාරෙ ධුර සාගරෙ.

පරිවත්තෙනයි සබ්බාපි සීහලඞ්ග කථා තදා,
සබ්බෙසං මූලභාසාය මාගධාය නිරුත්තියා.

සත්තානං සබ්බ හාසානං සා අහොසි හිතාවහා,
ථෙරිකා වරියා සබ්බෙ පාළිහි නයමුග්ගහුං.

අථ කත්තබ්බ කිච්චෙසු ගතෙසු පරිනිට්ඨිතං,
වන්දිතුං සෝ මහාබොධිං ජම්බුදීප මුපාගමි.

පිටකට්ඨකථං කත්වා කත්‍වා ලොකහිතං බහුං,
සෝ ඝාවතායුකා ඣත්වා ථෙරොපි තුසිතං ගතෝ.

ලඞ්කවාසි තදා භික්ඛූ කත කිච්චා අනාසවා,
තෙ ඝාවතා යුකං ඣත්වා සබ්බෙපි පරිනිබ්බුතා සි.

මෙහි කියන ලද ක්‍රමයෙන් ම පිටකත්‍රයට අටුවා කථා පොත් ලිවීම ආදිවූ නොයෙක් විසිතුරු පින්කම් කිරීමෙන් මහානාම නම් රජ දෙවිසි අවුරුද්දක් රාජ්‍යානුශාසනා කොට නම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. පිටකත්‍රය පාලියට උපකාරව සිටි සියලු අටු කථා ලියා ලෝවැඩකළ බුද්ධඝෝෂ සාමීන් වහන්සේ දඹදිව් වැඩ ආයු පමණින් වැඩසිට මරණාවසානයෙහි තුසිතපුරයෙහි උපන්සේක. ඒ සමයෙහි ලඞ්කාවාසි ඒ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ලාදු ආයු පමණින් වැඩ සිට ලෝවැඩ කිරීමෙන් පිරිනිවන් පෑවාක්‍රය

මෙසේ පිටකත්‍රය පාලියෙහි අවි වණීනා කෙරෙමි යි සිතා කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි කරණලද ප්‍රාර්ථනා බල ඇතිව ලබන ලද ගම්භීර ඤාණයෙන් ම ප්‍රවිනා කරණලද ප්‍රමාණාතික්‍රාන්තවූ අනුශාසනාවන් ඇති හෙයින් දශවිධ වූ ඤාණබලයක් ඇති මාගේ බුදුරජානන් වහන්සේ ශාස්තෘ නම් වනසේක. එහෙයින් කියනලදී,

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදනතං දමථනතානං පුරිසාජ ඤදං තෙ නමෝ' සි.

මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි පිටකත්‍රය පාලියෙහි සිංහල අර්ථකථා ලියාවූ ප්‍රවාහනී සංග්‍රහය නිමවනලදී.

මේ අවුවා කථා ලියා පැවැත්වූතැන් පටන් සසිය තුන්වතියක් අතික්‍රාන්තව ගිය කල්හි මහාසම්මත පරම්පරානුගත සූර්‍යවංශ සම්භූත පරාක්‍රම්බාහු නම් මහරජානෝ රුහුණු මාතා පිහිටි යන තුන් රජය ම එක්සත්කොට රාජ්‍යානිශෙක ප්‍රාප්තව රාජාධි රාජව සවදෙශ දෙශාන්තරවල අසදෘශ කීර්ති ආඥ තෙජෝ බල පතුරුවා පොළොන්නරු නම් මහා පුරප්‍රවරයෙහි දැහැමින් රජකර වසනුවෝ වළගම්අබා මහරජ දවස පටන් එක්වාදහස් එක්සිය අසූපස් වසියක් වනතුරු ලංකාවාසී සියලු නිග්‍රන්ථාදීන් වහන්සේ ම තුන් කොටසක්ව බෙදි වෙන් ව නිග්නනිකාය ව ශාසනය පිරිහෙලමින් සිටිකල්හි පැමිදි වෙස්ගෙණ අපායමාර්ග වූ දුප්ප්‍රතිපත්ති පූරණ යෙන් අපායගාමී වූ ව්‍යසනයට පැමිණෙන බාලපුත්‍රජන් දැන කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව කෙසේ නම් මම මේ නොඅර්‍යාණිකවූ බුද්ධශාසනය දුප්ප්‍රතිපත්ති නිලුවු හැර සුප්‍රතිපත්ති වඩිනය කොටමිදෙ හෝ යි සිතතුවෝ විහරන්ති වාදි වූ භාග්‍යවත බුදුරජානන් වහන්සේගේ ශාසන තත්ත්වය දන්නා දිඹුලාගල වනවාසි කාශ්‍යප සථවිරයන් වහන්සේගේ සහායය ලදින් එම සවාමිපාදයන් ප්‍රධාන කොට ගෙණ විවාරා නොයෙක් සියගණන් පාප නිස්සූන් නිමිථනය කොට සුදුපිළිදී ගිහිකරවා හැර ශාසනය නිමිලකොට පවත්වා ඔයිතුරු චෛත්‍යගණඝිත ථේතවනවිහාරය, පූර්වාරාමය, දක්ෂිණාරාමය, උත්තරාරාමය, වේලුවනාරාමය, කපිල විහාරය, ඉසිපතනාරාමය, ඝුසිනාරාරාමය, ලංකාතිලක මහා විහාරාදි නොයෙක් මහා විහාරයන්ද කරවා ඵකොළොස් මහලකින් හා දහසක් පමණ ඇතුළු ගබඩා ගෙවලින් හා නොයෙක් සිය ගණන් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිත වීසිතුරු චිත්‍රකම් ලතාකම්දීන් ශොභමාන උපොසථගාරවූ මහා ප්‍රාසාදයක් කරවා බොධි

ථූප පිරිවෙන් ගෙවල් මණ්ඩප පන්තියෙන් ශොභමාන වූ අනෙක ප්‍රකාර තරුණ මෘදු සුකුමාල ගන්ධසම්මෝදමත්තා කොකිලාදි පක්ෂි සමූහයා විසින් සෙවනය කරණලද පදුමොත්පල පූර්ණවිකාසාදීන් ගැවසීගත් සිහිල් දිය ඇති ජලාශයෙන් ගැවසීගත් ජේතවන නම් මහා විහාරයක් කරවා මහා සංඝයා වහන්සේට පිළිගැන්වූහ.

එහි වසන කොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේට සංඝ ස්ථවිරවූ ආයුෂ්මත් කාශ්‍යපස්ථවිරයන් වහන්සේ භික්ෂු සංඝයා රැස්කරවා භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "ඇවැත්නි! පිටකත්‍රය යෙහි අටුවා කථාවල ප්‍රකාශව නො පෙණෙන ලීනාර්ථ ප්‍රකාශය පිණිස යම් අර්ථවර්ණනා පූර්වාචාර්යවරයන් විසින් කරණ ලද ද ඒ සිංහල භාෂායෙන් ලියා තිබෙන බුද්ධඝෝෂ ස්වාමීන් කළ සියලු අර්ථ කථාවල ප්‍රකාශ නොව සැහෙවී තිබෙන ලීනාර්ථ වර්ණනා සිය්ලු දෙශාන්තරවාසී භික්ෂූන් වහන්සේලාට අවිසංවාදිය නොවන්නාහ. කිසි ග්‍රන්ථ පදයෙක් සිංහල භාෂාවෙන් ලියන ලද්දේ ද්‍ය. කිසිතැනෙක්හි මාගධික භාෂායෙන් ලියන ලද්දේය. එහෙයින් භාෂාන්තරයෙන් සම්මිශ්‍රව ආකුලව ලියන ලද ඒ ලීනාර්ථ වර්ණනාවන් අපි භාෂාන්තරය පහකොට අනාකුලවූ පරිපූර්ණ අර්ථ වර්ණනාවන් පාලි භාෂායෙන් කරමිහ" යි දන්වූ සේක.

ඒ භික්ෂූන් වහන්සේලා එසේවීනම් ස්වාමි වූ සථවිරයන් වහන්සේ රාජාදිගෙණ ආඥාවක්‍රය කරණසේක්ව යි කිවාහුය. එකල්හි පිරිවර සහිත වූ පරාක්‍රමබාහු මහරජ කුමරින් නික්ම ඊහාරයට ගොස් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද භික්ෂු සංඝයා වහන්සේ ද වැඳ එනත්පස්ව හුන්නේය. ඉක්බිත්තෙන් ඒ රජහට තෙරුන් වහන්සේ වදරණසේක් මහරජ පිටකත්‍රයට ලියූ අටුවා කථාවන්ගේ ලීනාර්ථ වර්ණනා කාටයුතු වන්නාහ යි වදාළසේක. එවිට මහරජ "යහපත ස්වාමීන් වහන්ස! මම කාය සාමග්‍රිය දෙමි, භික්ෂු සංඝයා වහන්සේ විත්තසාමග්‍රියෙන් විඛ්වාසව එය එසේ කරණසේක්වා" යි ආරාධනා කොට ඉක්බිති භික්ෂු සංඝයා වහන්සේ වැඳ අවසර ගෙණ කුමරුවෝ ම ගියේය. එකල්හි ස්ථවිර භික්ෂූන් වහන්සේලා පරාක්‍රමබාහු නරෙන්ද්‍රයන් විසින් කරණලද ප්‍රාසාදයෙහි රැස්ව වැඩහිඳ විනයපිටකාර්ථ කථාවූ සම්මෝහවිනෝදනී නම් විනය අටුවාවෙහි අර්ථවර්ණනාවට පටන් ගෙණ මාගධික භාෂායෙන් සාරත්ථදීපනී නම් වූ නිස්දහසක් ග්‍රන්ථ ඇති විනය ලීනාර්ථ වර්ණනාවක් කළාහුය. එහෙයින් කියනලදී:

විනයෙ පාඨවසේන සාසනස්ස ච වුඩ්ඪියා,
සංවණ්ණනා සමාරඩ්ඨා විනයට්ඨ කථාය යා.

සාරත්ථදීපනී නාම සඛබසෝ පරිනිට්ඨිතා,
තිංස සහස්ස මත්තෙහි ගන්ථෙහි පරිමාණතෝ ති.

ඊට ඉක්බිතිව සූත්‍රපිටකයෙහි දීඝ නිකායෙහි අට්ඨ කථාව වූ සුමංගලවිලාසිනී නම් අටුවායෙහි අට්ඨ වණ්ණනාවට පටන්ගෙණ මාගධ භාෂායෙන් ම ප්‍රථම සාරාත්ථමංජූසා නම්වූ අට්ඨ වණ්ණනාවක් ද කළාහුය. එසේම මජ්ඣිමනිකායාට්ඨ කථාව වූ ප්‍රපංචසූදනී නම් අටුවායෙහි අට්ඨවණ්ණනාවට පටන්ගෙණ මාගධික භාෂායෙන් දුතිය සාරාත්ථමංජූසා නම් අට්ඨ වණ්ණනාව කළාහුය. එසේම සංයුත්ත නිකාය කථාවවූ සාරාත්ථප්‍රකාශිනී නම් අටුවායෙහි අට්ඨ වණ්ණනාවට පටන් ගෙණ මාගධ භාෂායෙන් තෘතීය සාරාත්ථ මංජූසා නම් අට්ඨ වණ්ණනාවක් කළාහුය. එසේම අංගුත්තර නිකායාට්ඨ කථාවවූ මනෝරථපූරණී නම් අටුවායෙහි අට්ඨ වණ්ණනාවට පටන්ගෙණ මාගධ භාෂායෙන් චතුර්ථ සාරාත්ථ මංජූසා නම් අට්ඨ වණ්ණනාවක් කළාහුය. එම කියනලදි.

සුත්තනෙත්ත පාටවත්ථාය සාසනස්ස ච වුද්ධියා,
සංවණ්ණනා සමාරබ්ධා සුත්තනන්තට්ඨ කථාය යා.

සාරත්ථමංජූසා නාම සබ්බසෝ පරිනිට්ඨිතා,
ඡත්තවුති සහස්සෙහි ගන්ථෙහි පරිමාණතෝ ති.

ඊට අනතුරුව අභිධම් පිටකයෙහි ධම් සඞ්ගණීයාට්ඨ කථාවවූ අත්ථසාලිණී නම් අටුවායෙහි අට්ඨවණ්ණනාවට පටන්ගෙණ මාගධ භාෂායෙන් ප්‍රථම පරමාත්ථ ප්‍රකාශිනී නම් මූලටීකාවක් ද අනුටීකාවක් ද කළාහුය. එසේම විභඞ්ගප්‍රකරණාට්ඨකථාව වූ සම්මෝහ විනෝදනී නම් අටුවායෙහි අට්ඨ වණ්ණනාවට පටන්ගෙණ මාගධි භාෂායෙන් ද්විතීය පරමාත්ථප්‍රකාශිනී නම් මූලටීකාවක් ද අනුටීකාවක් ද කළාහුය. එසේම පඤ්චප්‍රකරණාට්ඨ කථාව වූ පරමාත්ථ දීපනී නම් අටුවායෙහි අට්ඨ වණ්ණනාවට පටන් ගෙණ මාගධී භාෂාවෙන් තෘතීය පරමාත්ථ ප්‍රකාශිනී නම් මූලටීකාවක් ද අනුටීකාවක් ද කළාහුය. එහෙයින් මෙහි කියනලදී:-

අභිධම්මේ පාටවත්ථාය සාසනස්ස ච වුද්ධියා,
සංවණ්ණනා සමාරබ්ධා අභිධම්මට්ඨකථාය යා.

පරමත්ථදීපකාසිනී සබ්බසෝ පරිනිට්ඨිතා,
සත්තවීස සහස්සෙහි ගන්ථෙහි පරිමාණතෝ ති සි.

මෙසේ පරාක්‍රමබාහු නරෙන්ත්‍රමයන් විසින් කරණ ලද ආරාධනා ඇති කාශ්‍යප සථවිරයන් වහන්සේ නොයෙක් දහස් ගණන් සථවිර භික්ෂූන් වහන්සේ හා සමඟ උත්සාහ උපදවා ධම් විනය

සඞ්ඝායනාවක් වැනි වූ පිටකත්‍රයෙහි අටුවා කථා වලට ටීකා අනුටීකා කොට අවුරුද්දකින් නිමවූ සේක. ඒ අනුටීකාවගේ කෙළවර පාපිමකමපතාදි නොයෙක් ආශ්චර්‍යයෝ පහළවූවාහුය. මෙම කියනලදි, සඞ්ග්‍රහයෙහි:—

සම්බුද්ධ පරිනිබ්බාණා වස්ස සහස්සානිකතමේ,
සත්තාසීති පඤ්ඤතෙ රාජිහු පරකකමහුජෝ

උලාර පුඤ්ඤතෙජෙන කත්වා සත්තු විමද්දනං,
පත්තරජ්ජාභිසෙකෙන සාසනුජ්ජොත නජ්ඣගා.

නිස්සාය සීහලින්දෙන යං පරකකම බාහුනා,
කත්වා නිකාය සාමග්ගිං සාසනං යො විසොධිතො.

කස්සපො සො මහාථෙරො සඞ්ඝස්ස පරිනායකො,
දීපසම්ං තම්බපණ්ණිම්හි සාසනොදය කාරිතො.

අපෙක්ඛිතො නරින්දෙන සො පරකකම බාහුනා,
සඞ්ගමට්ඨිනිකාමෙන කත්වා සාසන සඞ්ගහං.

පිටකත්තය වට්ඨකථාගං ලීනත්ථස්ස පකාසනා,
කතා සබ්බස්ස භික්ඛූනං අත්ථං සාධෙති සබ්බසො.

ද්වින්නෙදුදය්‍ය සභාවාය සීහලාය නිරූත්තියා,
ගණ්ඨිපදෙසු නෙකෙසු ලිඛිතං කිංචි කත්ථවි.

මාගධිකාය භාසාය ආරභිත්වාපි කෙනවි,
භාසන්තරෙන සම්මිස්සං ලිඛිතං කිංචිදෙව ව.

අසාර ගණ්ඨිට්ඨානානි තත්ථෙව බහු දිස්සති,
ආකුලංව කතං යත්ථ ද්වින්නෙදුදය්‍යනති අත්ථතො.

ඉතො අපරි පුණ්ණත්ත නාදිසෙ නෙත්ථ සබ්බසො.
කථාමත්තං විජානන්ති නානාදෙස නිවාසිතො.

භාසන්තරං තතො හිත්වා සාරමාදය සබ්බසො,
අකුලං කරිස්සාම පරිපුණ්ණ විනිච්ඡයං.

පිටකත්තය වණ්ණනා ලීනත්ථස්ස පකාසනා,
සාරත්ථ දීපනී නාම සාරත්ථ මඤ්ජුසාපි ව.

පරමත්ථපකාසිනි නාම ථෙරෙනි භාසිතා,
සත්තානං සබ්බ හාසානං සා අහොසි හිතා වහා

පරක්කමභුජෝ නාම ලංකිස්සු පුත්තදත්ත පත්තදවා,
ඛමෙමන දත්විධෙතෙව ලඞ්කාරජ්ජමකාරයි.

කඞ්ඛාපුත්තකුනි නෙසානි පයත්තෝ රත්තත්තයෙ,
ආයුම්හි පරියොසානෙ ගථා කම්ම මුපාගමි යි.

දක්වනලද ත්‍රිවිධෙන් පිටකත්‍රයෙහි අටුවා කථාවලට ලිහාළි වණිනා ලිවීම් ආදී අනෙක ප්‍රකාර කුශල රාශි වඩනය කිරීමෙන් දැහැමින් රාජ්‍යානුශාසනා කොට අනතුරුව රත්නත්‍රයෙහි අති ප්‍රසන්නවූ එ පරාක්‍රම්බාහු නම් පින්වත් මහරජ ආයු සෙළවර කම් වූ පරිද්දෙන් ප ලොකප්‍රාප්තවිය. පිටකත්‍රය පාලි අටුවා කථාවලට ලිහාළි වණිනා කථාවන් මාගධි භාෂාවෙන්ම ලියා නිමකර ලෝ වැඩ කළ මහා කාශ්‍යප යථවිරාදී කල්‍යාණ පාථප්පත්ත වූ ඒ සථවිර භික්ෂූන් වහන්සේලා ද ආයු පමණින් වැඩසිට ලෝවැඩ කිරීමෙන් අනතුරුව කම්වූ පරිද්දෙන් පරලොකප්‍රාප්තවූවාහුය.

මෙසේ ලිහාළි වණිනා සඞ්ඛ්‍යාත පිකාභාරක මහා සථවිර භික්ෂූන් වහන්සේලා දහසක් පමණ රුස්ව ගිද වණිනා කලෝත් බුඩඝොෂ සාමීන් විසින් වණිනා කරණලද අටුවා කථාවලට ප්‍රකාශ කොට සැහෙවී සිටි අර්ථවණ්ණනාවෝ මය. එසේ කප්ලක්ෂයක් මුළුල් ලෙහි අර්ථ වණිනා කිරීමටම ප්‍රාර්ථනා කරමින් පැමිණි මහ උතුමන් විසිනුදු වණිනාකොට නෙ තිමෙන අර්ථඇති පිටකත්‍රය පාලිදෙශනා වකින් සියලු ලෝකයාහට කරණලද ගම්භීරාර්ථ අනුශාසනා ඇති හෙයින් ද එබදු කෘතාධිකාරවූ දක්ෂිණාවිවූ ද මහ සථවිර උතුමන් විසින් වණ්නා කොට ලොකයාහට අනුශාසනා කරණ තරම් ප්‍රකාශව පෙණෙන නොයෙක් සද්ධර්මානුශාසනාවෙන් බබළන පාලි දෙශනා විලාසයක් ඇති හෙයින් ද අන්‍ය දෙශනා විලාස ඇති ඒ මාගේ බුදුරජාණන් වහන්සේ ශාස්තා නම් වනසේක. එසේ හෙයින් කියනලදිඃ—

දෙවමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දම්මරත්නානං පුරිසාජඤ්ඤ මෙත නමොං යි.

මේ ශ්‍රී සද්ධම්මවිවාද සංග්‍රහයෙහිවූ පිටකත්‍රය අර්ථකථාවන්ට ලිහාළි ලියාවූ ප්‍රවෘත්ති කථාව නිමි.

තවද මෙ පිටකත්‍රය පාලිධර්මය අට්ඨකථා සහිතව පන්තිකොට සදමින් දඹදිව පැවති ත්‍රිවිධ සංගායනාවට ද මේ ලඞ්කාද්වීපයෙහි අනුරාධපුරත්‍රුවර ථූපාරාමයෙහි පැවැති ධර්මසංගායනාව හා සෙසුත් නානා ස්ථානවල පැවති අට්ඨකථා ප්‍රස්තාත සංගායනාවලට ද ආරූඪ වූ මෙම සඞ්ගුණ වර්ණනා පරිවෙශ්දයෙහි ප්‍රකාශ වූ ක්‍රම යෙන් ම පිටකත්‍රය දෙශනා පාලියට අට්ඨකථාවෝය, ටීකාවෝය, ලීනාර්ථ වර්ණනාවෝය යන තුන්ප්‍රකාර වූ නොයෙක් නම් ඇති ධර්ම්ප්‍රකරණ ඇති වූහ. ඒ නාමයන් හැර අන්‍යවූ ද අනෙකප්‍රකාර නාමයෙන් ප්‍රසිද්ධ වූ එම පිටකත්‍රය පාලි අට්ඨකථා ආදින්ගේ ම සංග්‍රහය වූ යථොක්තවිශුද්ධිමාර්ගාදී අනෙකප්‍රකාර ධර්ම්ප්‍රකරණයන් දැන් මෙ කල් දක්වා තම තමන්ගේ ත්‍රුවණ පමණින් එසේ ලීමෙන් අප බුදුරජාණන් වහන්සේගේ ධර්ම්කාය සම්පත්තිය ම නොයෙක් ලෙසින් වර්ණනා කොට පැවැත්වූවාහු ය. ඒ කෙසේ ද යත්?

බුඛඝොෂ සාමීන් විසින් කරණලද විශුද්ධිමාර්ග අට්ඨවා කථාගෙහි ලීනාර්ථයන් ප්‍රකාශ කොට ධර්ම්පාල තෙරුන් විසින් කරණලද සාරාර්ථමඤ්ජුසා නම් වූ විශුද්ධිමාර්ග ටීකාවය, අනුරුඛ නම් තෙරුන් විසින් පරමාර්ථය ප්‍රකාශ කොට කරණලද අභිධර්මාර්ථසංග්‍රහය, එහි ලීනාර්ථ ප්‍රකාශ කොට ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය සාමීන් විසින් කරණලද අභිධර්මාර්ථ විභාවිනී නම් ටීකාවය, ආනන්ද තෙරුන් විසින් කරණලද සූක්ෂ්මාර්ථ විනිශ්චය වූ සව්ව සඞ්ඛ්‍යපය, ඛෙම නම් තෙරුන් වහන්සේ විසින් කරණලද පරමාර්ථ ප්‍රකාශ වූ ඛෙම නම් ප්‍රකරණය, කාත්‍යායන තෙරුන් වහන්සේ විසින් කරණලද දීපවුත්තිසා නම් ටීකාවය, එසේ ම විමලබුද්ධි නම් ටීකාවය, බුඛරක්ෂිත තෙරුන් විසින් කරණලද ජිනාලඞ්කාරය, මෙධඞ්කර තෙරුන් විසින් කරණලද ජිනචරිතය, මහාබෝධි තෙරුන් විසින් කරණලද නිග්‍රහාර්ථ කථා නම් සත්‍ය සංක්ෂෙප වර්ණනාවය, එසේ ම පරමාර්ථ විනිශ්චය වර්ණනාවය, ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ ශිෂ්‍ය සාමීන් විසින් කරණලද සාරාර්ථ සාලිනී නම් සත්‍යසංක්ෂෙප වර්ණනාවය හා නොයෙක් ක්‍ෂුද්‍ර ප්‍රකරණ යෝය, කාත්‍යායන තෙරුන් විසින් කරණලද නෙත්ති ප්‍රකරණය, ධර්ම්පාල තෙරුන් විසින් කරණලද ථෙර ථෙරීගාථා අට්ඨකථා වූ පරමාර්ථ ටීකාවය, එසේ ම පරමාර්ථදීපනි නම් විමාන ප්‍රෙත වස්තූන්ගේ වර්ණනාවය, ධර්ම්සිරි නම් තෙරුන් විසින් කරණලද කුදුසික්ඛය, සඞ්ඝරක්ෂිත තෙරුන් විසින් කරණලද සුබොධාලඞ්කාර වුත්තොදය හා කුදුසික ටීකාවය, සම්බුද්ධ ගුණවර්ණනාවය, බුද්ධඝොෂ නම් තෙරුන් විසින් කරණලද විනයවිනිශ්චයය, බුද්ධඝොෂ නම් තෙරුන් විසින් කරණලද කඞ්ඛාවිතරණී ටීකාවය, සාගරමති නම් තෙරුන් විසින් කරණලද විනය සංග්‍රහය, බුඛප්පිය තෙරුන්

මසින් කරණලද රූපසිරි ප්‍රකාශය, ශාක්‍යකුල තිලකවූ ගෞතම ගොත්‍ර ඇති අප බුදුරජාණන් වහන්සේ ජීවමානකාලයෙහි කොසල, බිම්බිසාර, අජාතශත්‍රු ආදිවූ රජදරුවෝ ජීවමාන බුදුන්කරාපැමිණ ඛණ ඇසිමෙන් ලබනලද'ධම්කාය සම්පත් ඇතිව නොයෙක් ලෙසින් ධර්ම පිදීමෙන් ආත්මාථ පරාථ සංසිද්ධිය ද කළාහුය, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිපෑ ජම්බුද්වීපාධිපති කාලාසෝක ධර්මාශොකාදි නරෙන්ද්‍රයෝත් සද්ධර්මාය සම්පත්ති ප්‍රතිලාභයට පැමිණිමෙන් කතව්‍ය අකතව්‍ය මේ මේ යයි දැන ඇඳින අප්‍රමාණ කුශලරාශි වඩා තය කළාහුය.

එසේම මේ ශ්‍රීලඞ්කාධිපති දෙවන පැතිස්ස දුටුගැමුණු ශ්‍රඛා තිෂ්‍ය මහාසෙන වළගම්බාහු කිර්තිනිශ්ශඞ්ක විරබාහු වික්‍රම බාහු පරාක්‍රම්බාහු ආදී නොයෙක් පුණ්‍ය නරවීරයෝ ද අනුරාධපුර පොළොන්නරුපුර ආදියෙහි රජ පැමිණ තම තමන් රජකරණකල මහා විහාරය. මිහින්තලා විහාරය අභයගිරි විහාරය, ජේතවනය, වෙළුවනය ආදී නොයෙක් සියදහස් ගණන් මහා විහාර කරවා දී ඒ ඒ විහාරවල වසන නොයෙක් දහස් ලක්ෂගණන් භික්ෂුසඞ්ඝයා වහන්සේට චීවරාදි ඕවිපස දුනයෙන් උපස්ථානකරම්න් සිංහතෙල් රදන සවණි හාජන වැනිවූ බුඩපුත්‍රයන් වහන්සේලා ලවා අප බුදු රජාණන් වහන්සේගේ ධර්මකාය සම්පත්හි සංඛ්‍යාත සියලුම පිට කත්‍රය ධර්මය අවිකථාදිය සහිතව යථොක්ත ක්‍රමයෙන් පොත්වල ලියවා පවත්වා නොයෙක් ලෙසින් වෛතුල්‍යවාදදී අනෙක ප්‍රකාර අධර්මාර්බුද උපද්‍රව දුරුකොට නිම්ලව චතුර්විධ සංගායනාරූඪ කළ ක්‍රමයෙන් අනූනව අනධ්‍යාව ධර්මකාය සම්පත් දීප්තිමත්කොට බබු ළුවා මිහාවංශාදියෙහි ප්‍රකාශක්‍රමයෙන් අප්‍රමාණ කුශලරාශි වඩනය කිරීමෙන් උභයලොකාර්ථය හා ආත්මාර්ථ පරාර්ථ සැදීමෙන් රාජ්‍ය සම්පත් අනුභව කළාහුය.

එසින් මෑත භාගයෙහිදු බෙලිගල්පුර දඹදෙණිපුර යාපවුපුර කුරුණෑගල්පුර ගඞ්කාසිරිපුර ජයවඩන කෝට්ටය හා මෙකලව පවත්නා සෙංගඞ්ක සෛලාභිධාන ශ්‍රී වඩතපුරාදී තත්තත් නගරයි වාසිවූ ආඥතෙජෝබල පරාක්‍රම ශ්‍රඛා ප්‍රඥාදී ගුණසම්පන්න කාලිඛ විජයබාහු පණ්ඩිත පරාක්‍රමබාහු බෝඝත් විජයබාහු භුවනෙක බාහු පරාක්‍රමබාහු මිතිය තෘතිය චතුර්ථ භුවනෙකබාහු ශ්‍රී පරා ක්‍රමබාහු ප්‍රථම විමලධර්ම විරපරාක්‍රම කරෙඤ්ඤසිංහ ජේජයරාජ සිංහඅ, මෙකල සියලු ශාසනොපභාරයට මූල්වසිවි අපගේ කිර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමානන් දක්වා ම ඒ ඒ කලව රජ පැමිණි තරොත්තමයන් විසිනුදු තම තමන් රජ කරණකලැ නොයෙක් ලෙසින් පැමිණි සඞර්ම විනාශකර නපුරු මිථ්‍යාදෘෂ්ටිකාදිවූ අනෙක

ප්‍රකාර ශාසනොපද්‍රව දුරුකොට පාපයෙහි භය ලජ්ජා නැති අලජ්ජීන්ට නොයෙක් ලෙසින් නිග්‍රහ කොට හයදී ලජ්ජී සුපෙසල ශික්ෂා කාමී සබර්මානුපාලිත බුබපුත්‍රයන් වහන්සේම තෝරා ගෙණ බුදුරජාතන් වහන්සේගේ ධර්මකාය සම්පත් පැමැත්තීමෙහි නියුක්තවසිටි ඒ මහා සඞ්ඝයා වහන්සේ ඒ ඒ නුවරවල ග්‍රාමාරණ්‍ය විහාරකරව, පිළිගැන්වීමෙන් මහොඝයසේ පවත්වන චතුර්විධ ප්‍රත්‍යය ප්‍රතිලාභයෙන් යෙදී වසන නොයෙක් දහස් ගණන් බුබපුත්‍රයන් වහන්සේලවා සපී සඩ්ඛොපකාරවූ ධම්කාය සම්පත්තියම නිමිලව මනාකොට පැවැත්වීමෙන් සබ්මිය ම පුදු ධම්මොදයෙන් සුපරිශුබ්ධ ආත්මභාවයෙන් යෙදී වසනු කැමති ඒ ඒ රාජ කඳනයෝ තත් තත්කාල සම්ුපගත ධර්මවිනයධර මහාසථවිරයන් වහන්සේලාකෙරෙන් අනෙක ප්‍රකාර සබර්මානුශාසනා රාජෝවාද විසිතුරු නත්න් බබළන ධර්ම කථා ඇසීමෙන් කණ්ණාලඞ්කාර කොට සඞ්කිය ආත්මලාභයාගේ සඵලභවයෙන් සනාතුෂ්ට ව ඒ ඒ බුබ පුත්‍රයන් වහන්සේලා විසින්ම අමුතුවෙන් හෙළ බසින් රචනා කොට ඇස්වූ පූජාවලී සබර්මාලංකාර හෙළඛොධිවංශ ශාසනාවතාර සබමීරත්නාකර රාජරත්නාකර සාරාර්ථසංග්‍රහ ආදිවූ ඒ ඒ ප්‍රකරණ වඩ වඩා සතුටුව ඇසි මෙනුදු සබකිය සබකිය කණ්ණාලංකාර කරමින් ඒ ඒ යතිතුමන් කෙරෙහිදු මහත් බැති පෙම් වඩාගෙණ නොයෙක් ලෙසින් ප්‍රසන්නාකාර දක්වා ධම්ය ම පුදු අප්‍රමාණවූ කුශල රාශි වඩිනය කිරීමෙන් දැන් මෙකල් දක්වා සපයඹිජ්ජති ධම්සංඛ්‍යාතවූ නොයෙක් ප්‍රහෙද ඇති අප බුදුරජාතන් වහන්සේගේ මේ උතුම් ධම්කාය සම්පත්තිය තම තමන් ලත් ජීවිත සේ සැරවත් කරවන ලදි.

තවද එසේම පවත්වා ඇ සඞ්ගඞ්ඝා ප්‍රවාහවූ බුදුරජාතන් වහන්සේ ධරමාන කාලයෙහිම "ධම්මදායාදා භික්ඛවෙ හවථ මා ආමිස දායාදා" යනාදී ධම්දායාද සූත්‍රයෙහි භික්ෂූ සඞ්ඝයා වහන්සේට ආමන්ත්‍රනය කොට "මහණෙනි! මා විසින් දෙසූ ධම්ය ම තෙප දායාද ව හිමි ව වාසය කරව් ආමිස සංඛ්‍යාත ලාභ ප්‍රත්‍යය යට හිමි නො වව්" යනාදීන් ඒ වදළ බුඛානුශාසනාව පිළිගත්බවට සුදුසු හෙයින් ද යළිදු බුඛ තුණ වණ්නා පටවෙජ්දෙයෙහි දක්වනලද ක්‍රමයෙන් ම බුදුව සියලු බුඞ්කෘත්‍යයන් නිමවා කුසිනාරානුවර සාල වනොද්‍යානයෙහි වූ ශ්‍රියහන්හි වැදගෙව අප බුදුරජාතන් වහන්සේ පිරිනිවන් පෑනා දිනයෙහි මහා පරිනිබ්බාණ සූත්‍රානුභාවයෙහි ඒ ක්‍රම යෙන් සංඛ්‍යා පථානික්‍රාන්තව කුසිනාරා නුවර රැස් වූ මහා භික්ෂු සංඝයා වහන්සේ අතුරෙන් අනුඋඩාන සිංහසෙය්‍යාවෙන් සැතපුනු බුදුරජාතන් වහන්සේට නුදුරු නොළඟා තිරය ඇතුළත හුන් අනඳ ඍමින් පශ්චිමකාව රැස්ව වැඩහුන් පන්සියයක් භික්ෂුසඞ්ඝයාවහන්සේට අඩහා වදුරා මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් මෙසේ වදුලසේක. කෙසේ ද? යත්

මහණෙනි! මේ සියලු භික්ෂූන් අතුරෙන් එක් භික්ෂුවකට වත් බුද්ධරත්නයෙහි හෝ ධර්මරත්නයෙහි හෝ සඝරත්නයෙහි හෝ මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවෙහි හෝ බුදුරජ සියල්ල දත් සේක් දේ හෝ කොළු වේ දේ හෝයි ඥානදී වශයෙන් ද මා දෙසූ සියලු ධර්මකාය සම්පත්තියෙන් කිසියම් සැකයක් විමතියක් තොරට ඇත්තේවිතම් ඒ හැම වාරවම එසේ නොව මහණෙනි, පසුව පිපිළිසර නොවව මැනවි. ශාස්තෘන්වහන්සේ අපට සම්මුඛීභූතව වැඩවුන් බැල ඒ භාග්‍යවතුන් වහන්සේ සම්මුඛයෙන් මේ මේ කාරණා විමතිකාරණ විචාරා දැනගන්ට අපි අසමර්ථ වූම් හයි යන පශ්චාත්තාපයට නො පැමිණෙව් යන මේ වචනය විචාරා වදාළකල්හි, ඒ ඇසූ සියලු භික්ෂු සඞ්ඝයා වහන්සේ ම බුදුහාමිතය වූ බුඩ ධර්මයෙහි කිසි ශංකා විමතියක් නැති හෙයින් තූෂ්ණීම්භූත ව දැඩහුන්සේක. එකල්හි දෙවන තුන්වනවට ද භික්ෂුසංඝයා වහන්සේට අඩගා වදාරා එසේම විචාරා වදාළ කල්හි මුවෙන් නො බැණ තූෂ්ණීම්භූතව වැඩහුන් සේක්ලා ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ තැවතත් භික්ෂුසංඝයා වහන්සේට අඩගා වදාරා මහණෙනි! තෙපි බුදුන් සමීපයෙහි අපි පැවිදිවූවම්හ. අප පරිභෝගකරණ සිවුපසයෝ ශාස්තෘන් වහන්සේ ඝනනක වන්නාහුමය. එසේවූ අපි ඇමතෙක්කල් ධර්මයෙහි උපන් කුකුස් විචාරා දුරුකොට ගතනොහි සිව අද මේ පශ්චිමකාලයෙහි පරිනිර්වාණ මඤ්ච කයෙහි සැතපී පිරිනිවන් පෑමට ඉතා ආසන්න වූ බුදුරජාණන් වහන්සේගෙන් විචාරීම නුසුදුසු යැයි සිතා දැඩින් බුඩ ගෞරවයෙන් නොවිචාරා තූෂ්ණීම්භූත වූවාහු නම් මහණෙනි! සෙදා ශාස්තෘ සහාය විශ්වාස සහිත භික්ෂු නාමකට ධර්මයෙහි ඇති යම් සැහා යක් විමතියක් දන්වා හෙවත් මා දෙසූ සියළු ධර්මයෙහි ශංකාවිමතියූ කිසියම් දෙයක් ඇත්නම් සහානිඛ භික්ෂුහු බවුනොවුන් හා කරණ කථාවක් මෙන් නොබා විචාරව් එකල්හි මම එසා භික්ෂුනමකට ඒ කාරණය ප්‍රකාශකොට කියම්. ඒ භික්ෂූන්ගේ කථාව අසා සියල් ලෝම ධර්මයෙහි ශංකාවිමති දුරු කරන්නාහ යන මේ බුඩ වචනය අසාත් පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි දෙශනාකර වදාළ සිය ඒ ධර්මඤාය සම්පත්තියෙහි කිසිම ශංක විමතියෙක් එකම භික්ෂු නමකවවත් නැති හෙයින් සියලු භික්ෂුසංඝයා වහන්සේම තූෂ්ණීම් භූතව වැඩහුන් කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට දන්වන සේක් මාගේ සවාමිවූ බුදුරජානන් වහන්ස! භික්ෂු සංඝයා වහන්සේ කෙරෙන් එකම භික්ෂුවකවවත් සවාමිවූ බුදුරජානන් වහන්සේගේ ධර්මයෙහි කිසිදම් ශංකා විමතියක් නැත්තේය. එහෙයින් සවාමීන් වහන්ස! මේ කාරණය මහත් ආශ්චර්‍යයෙකැ, සවාමීන් වහන්ස! මෙබඳු කාරණයක් පෙර නොඇසූ වරු හෙයින් අද්භූතය. එසේ හෙයින් මවම පිහිටවූ බුදුරජානන්

වහන්ස; මේ භික්ෂු සඞ්ඝයා කෙරෙහි මම ඉතා ප්‍රසන්න වූයෙමි කියා අනද සවාමීන් වහන්සේ බුදුන් සම්බුධයෙහි ම පහළකල ප්‍රශංස, වට අනුරූප පරිද්දෙන් ද බුදුව පළමුවෙන් ම බ්‍රහ්මාරාධනාවෙන් ඉසිපතනයට වැඩ "මෙ මෙ භික්ඛවෙ" යනාදීන් භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට දෙශනාවට පටන් ගෙණ පන්සාළිස් අවුරුද්දක් ජීවත්ව වැඩහිඳ භික්ෂුසඞ්ඝයා වහන්සේ කෙරෙහි ම සියලු ධර්මකාය සම්පත් පිහිටුවා පිරිනිවන් පෑනා දිනයෙහි විචාර, වදුලතැන තුෂ්ණීම්භූත වෙමින් ඒ දෙශනාකර වදුල සියලු ධර්මකාය සම්පත්තියෙහි ශංකා විමති නැගිබව ප්‍රකාශ කොට ජීවමාන බුදුන් කෙරෙහි තැබූ කාය ප්‍රතිඥාවට සුදුසු ආකාරයින් ද ආදාහන භූමියට රැස්වූ සත් ලක්ෂයක් පමණ ගණනායකා මහා සථවිර ප්‍රමුඛ සඞ්ඛ්‍යා පථාතික්‍රාන්ත මහා භික්ෂු සඞ්ඝයා වහන්සේ අතුරෙන් එකලව සඞ්ඝසථවිරවූ තෙර සඟුන ගුණාදි අපරිමිත ගුණරත්න නිධි නිකෙතවූ ආයුෂ්මත් මහා කාශ්‍යපසථවිර ප්‍රධානවූ සිවුපිළිසිඹියාපත් මහත් ගුණානුභාව සම්පන්න වූ පන්සියයක් පමණ භික්ෂු සඞ්ඝයා වහන්සේ අජාසත් මහරජහු සහායෙන් සංගීති කථාවෙහි දක්වන ලද ක්‍රමයෙන් ම ප්‍රථම සංගායනා කිරීමෙන් සියලු ම ධර්ම පරිනි කොට ඒ භික්ෂු සඞ්ඝයා වහන්සේ විසින් ම ඔවුනොවුන් වහන්සේලාට නිමලව පවත්වන ලෙස සියලු ධර්මය භාරවූ පසු එපරිද්දෙන් ම උන්වහන්සේලා පවත්වාගණ ආසේන. නැවත උපන් ධර්මය විශවුල් නිසා පැවැති දෙවෙනි ධර්ම සංගායනා කාලයෙහිදු විශාලා මහනුවර රැස්වූ දෙලොස් ලක්ෂයක් පමණ රහතන් වහන්සේ අතුරෙන් සබ්බකාමි සථවිරයන් වහන්සේ හා යස නම් මහ තෙරුන් ඇතුළු වූ සත්සිය යක් රහතුන් වහන්සේ කාලාසොක මහරජ සහායයෙන් ම එනුවර වාළුකාරාමයෙහි රැස්ව වැඩහිඳ අටමසක් මුළුල්ලෙහි ධර්මසංගායනා කිරීමෙන් අප බුදුරජානන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය නිමලව පැවැත්තුවේක.

එයින් පසු තුන්වෙනි ධර්මසංගායනා කාලයෙහිදු පැළලුප්නුවර රැස්වූ සැටලක්ෂයක් පමණ භික්ෂුසංඝයා වහන්සේ අතුරෙන් මොග්ගලිපුත්ත තිස්ස මහා සථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති දහසක් පමණ රහතුන් වහන්සේලා ධර්මාශොක මහරජහු සහායෙන් එම නුවර අශොකාරාමයෙහි රැස්ව වැඩහිඳ නවමසක් මුළුල්ලෙහි ධර්මසංගායනා කිරීමෙන් අප බුදුන්ගේ ධර්මකාය සම්පත්තිය නිමලව පැවැත්තුවේක. එකලව සංඝසථවිර වූ මොග්ගලිපුත්තතිස්ස මහා සථවිරයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ සත් ගුණධර්ම චිනය ප්‍රගුණ කරවීමෙන් දහසක් භික්ෂුසඞ්ඝයා වහන්සේට ජ්‍යෙෂ්ඨ උපසම්පදා වූ තුන්අවුරුද්දක් ඇතුළතම පළමු සංගායනා දෙකට නැගූ අට කථා

සහිත සථිරවාද සියල්ලම උපාධ්‍යායන් වහන්සේගෙන්ම ඉගෙණ තමන් වහන්සේත් එක්ව තුන්වෙනි සංගායනාව පැවැත්තූ පසු ඒ සියලුම ධර්මකාය සම්පත්තිය තමන් වහන්සේගේ සිත්හිම ධරාගෙණ මෙම ලංකාවට පැමිණි මිහිඳු මාහිමියන්ගෙන් වහන්සේ ද ලංකාවිපයට බුදුකෙණෙකු සේ අනෙක ප්‍රකාර සාඞ්ඩ ප්‍රාතිහාර්‍යය ධර්මදේශනාදියෙන් ප්‍රසන්න රාජ ඇලාදියෙන් පැවිදි ලැබ සැවදහස් පමණ ලක්දිව භික්ෂූන් වහන්සේලා ඇති වූ කල්හි ඒ මහා භික්ෂු සඞ්ඝයා අතුරෙන් අටසැට නමක් පමණ මහ රහතුන් වහන්සේ හා දහසක් භික්ෂූන් වහන්සේ ද දෙවෙනිපැතිස්ස මහරජානන් සහායයෙන් ථූපාරාම විහාරයෙහි රැස්ව වැඩහිඳ දඹදිව පැවැති ත්‍රිවිධ සංගායනා ක්‍රමයෙන් සියලු ධර්මය ම සංගායනා කිරීමෙන් අප බුදුන්ගේ සියලු ධර්මකාය සම්පත්තිය අපගේ මේ ලඞ්කාවිපයෙහි දු පිහිටුවා නිමිල ව පැවැත්තූ සේක. එයින් පසු එම මහා සථවිර පරම්පරාවෙන් ම ශ්‍රවණ ධාරණාදි ක්‍රමයෙන් සියලු ධර්මය නො ඇර අනූන ව අනධික ව කිසියම් මිත්‍යාලබ්ධියකට මිශ්‍ර නො කොට පවත්වා අවුත් වළගම්අබා මහරජු දවස පන්සියයක් පමණ රහතන් වහන්සේලා රැස්වී වැඩහිඳ චතුර්විධ සංගායනා කළ පරිදි දෙන් ම පොත්වල ලියා සියලු ධර්මය ම පාලිය ලෙසින් හා අර්ථකථා සිංහල භාෂාවෙන් ම ලියා මනා කොට රක්ෂාකළ සේක.

එතැන් පටන් එසේ ධර්ම ප්‍රකරණ පොත් වශයෙන් පැවති පිටකත්‍රය ධර්මය ලෙඛකෝද්දේශාදි වශයෙන් පවත්වා අවුත් මහානාමරජ දවස මහවංශාදියෙහි ප්‍රකාශ ක්‍රමයෙන් බුඩඝෝෂ ස්වාමීන් විසින් සිංහල භාෂාවෙන් තුබූ පිටකත්‍රය අටුවා කථා පාලි භාෂාවට නඟා අටුවා කිරීමෙන් බුඩ භාෂිත ධර්මකාය සම්පත්තිය ම වර්ණනා කොට පැවැත්තූ සේක. එතැන් පටන් එසේ ම සියලු ධර්මය සඞ්ඝම්භාජන ව සිටි මහ සංඝයා වහන්සේ ම පවත්වා අවුත් පොළොන්නරුපුර පරාක්‍රම්බාහුමහරජු දවස එම මහරජුගේ සහායයෙන් එහි රැස්වූ තොළොස් සියදහස් ගණන් භික්ෂු සඞ්ඝයා වහන්සේට සඞ්ඝසථවිර වූ ආයුෂ්මත් අරණ්‍යක කාශ්‍යප සථවිරයන් වහන්සේ ප්‍රධාන වූ දහසක් පමණ භික්ෂු සඞ්ඝයා වහන්සේ ඒ පේතවන මහ විහාරයෙහි රැස්ව වැඩහිඳ පිටකත්‍රය අටුවා කථාවල අප්‍රකාශ ගම්භීරාර්ථ සියල්ල වර්ණනා කොට සිංහල භාෂාවෙන් ලියා තුබූ ටීකාවේ කථාපොත් ගෙණ පාලිභාෂාවට නඟා දෙවනු ව ටීකාවේ කථා ලියා ත් අප බුදුරජානන් දහන්සේගේ ධර්මකාය සම්පත්තිය වර්ණනා කොට පැවැත්වූ සේක. එයින් මෑත භාගයෙහි ජයවඩ්ඩන කෝට්ටයෙහි ශ්‍රී පරාක්‍රම්බාහු මහ රජ දවස සඞ්ඝරත්නාකරය කරණකල් දක්වාම සියලු ධර්මය ලෙඛන ධාරණ

පරිපුච්ඡා උද්දෙශ වශයෙන් ඒ ඒ කල පැවති ධම්මිකයධර ව්‍යක්ත බහුශ්‍රැත ශබ්ද ශාස්ත්‍රඥ ලෞකික ගුණරත්නාලඞ්කෘත සුම්ඛල වාඝීශ්වර ධම්මකිර්ති ආදි භික්ෂු සඞ්ඝයා වහන්සේ ම ප්‍රශස්ත රාජ ධම් ගුණ කීර්ති පරිපාලිත ශාසන පක්ෂපාත නරෙන්ද්‍ර බල ලදින් අන්‍යවූ නිකායාන්තරයන් හා මිශ්‍ර නො කොට සඞ්ගීය නිම්ල ව පවත්වා ගෙණ එනසේක. අනාගතයෙහි මෙසේ අපවැනි අල්පශ්‍රැත මන්ද බුද්ධින්ට පවා සියලු ම ත්‍රිපිටක පාලි අර්ථ කථාවල එහි ධම්මාර්‍රස විදගන්නා තරම් දක්වා පිටකත්‍රය ධම්යාගේ ම සංග්‍රහ ප්‍රභේද අනේකප්‍රකාර ධම් ප්‍රකරණ හා නොයෙක් සත්ත ගැවපද ද එසේ ම පිටකත්‍රය ධම්යෙහි වැද හැසිරීමට විසිතුරු මාගිවූ නොයෙක් ප්‍රභේද ව්‍යාකරණ ශ්‍රැන්ථ නිසණ්ඩු ඇතුළුවූ සඞ්ගෝපකරණයන් සහිතව රචනාකිරීමෙන් ධම්කාය පමපත් තිය ජ්‍යොතිමිත්කොට පැවැත්තුසේක.

එතැන් පටන් මෙ තැන් දක්වා ම ඒ ඒ කලට පැමිණි ධම් විනයධර මහාසථවිරාදි මෙකල ශාසනාභිවෘධිය පිණිස සියඹ දෙසයෙන් පැමිණි අපගේ උපාධ්‍යායවූ ශ්‍රී උපාලි සථවිරයන් වහන්සේ හා කම්මාචාර්‍යවූ සරණඞ්කරාභිධාන පූජිතාමොප ලක්ෂිත අපාචාර්‍යයන්වහන්සේ ද පර්‍යවශානවූ බුබපුත්‍ර භික්ෂු සඞ්ඝයාවහන්සේ විසිනු දු නෛර්‍යාණික ශාසනයෙහි ධම්ගුණ මහත්ත්වය විශෙෂයෙන් දැන හැඳින ඒ ඒ කලට පැමිණි ශාස්ත්‍ර ධම්ාභිලාෂිවූ ශිෂ්‍ය ගණයාට ද රජ ශුවරජ ඇමති ආදිවූ ලෝවැසි යන්ට සඞ්ගීම්මාත්‍ර කථා ගුණ විශෙෂ පහළකොට දීමෙන් හා විවිත්‍ර තැන්හි බබළන තත් කලානුරූප ශ්‍රවණීයවූ සඞ්ගීත්‍ර ශාසනාභිවෘධිමෙන් තම තමන්ට ද ලෝවැසියන්ට ද අප්‍රමාණ කුශලරාශි වර්ධනය කොට විසීමෙන් අතීතව ධම්ප්‍රකරණව්‍යාඛ්‍යාන නොයෙක් ගද්‍ය පද්‍ය රචනා කිරීමෙත්‍රදු අප බුදුරජාණන් වහන්සේ ගේ ධම්කාය සමපත්තියම වර්ණනා කොට කාලානුරූප වශ යෙන් දැන් මෙකල් දක්වාම ශ්‍රවණොද්ග්‍රහණ ධාරණ ලෙඛනාදි වශයෙන් පැවැත්වූසේක.

එසින් මත්තෙහි දු ලොව පහළවන බුබපුත්‍රයන්වහන්සේ හා රාජරාජ මහාමාත්‍යාදීන් විසින් හිතකාමිවූ කුශලාර්‍ථය විසින්ද මේ සියලු ධම්ය මෙතෙක් කල් පවත්වා පූජි නරවරුදීන් විසින් ප්‍රමාණානික්‍රාන්තවූ ව්‍යර්‍ථයකිරීමෙන් හා ධනපරිත්‍යාගාදියෙන් මෙසේ පවත්වා අා උතුම් ධම්කාය සමපත්තියකැ'යි දැන භක්ති ප්‍රෙම උපදවා මෙහි දැක්වූ පාළිපොත් අටුවාපොත් ආදි පිටකත්‍රය

යෙහි ඇතුලත්වූ මෙහි ප්‍රකාශ සියලු ධම්ප්‍රකරණයන් හා පාළි ධම්ෝපකාරිවූ නොයෙක් ශාස්ත්‍ර පොත් විභාගවශයෙන් විමසා ගෙණ තම තමාගේ ශක්තිපමණින් ලියවා පැවැත්වීමෙන් හා ශ්‍රවණොදෙශ ධාරණාදි වශයෙන් ධම්කාය මනාකොට පැවැත් වීමෙන් සවඞ්ගපවණී සම්පත්ති ප්‍රතිලාභයට ම උත්සාහ කටයුතු.

මෙසේ දෙවි මිනිසුන් සහිත සියලු ලොකයාහට වැඩ පිණිස පිටකත්‍රය පාළියෙහි ප්‍රකාශ සියලු ධම්ානුශාසනා හා තදනුගත ධම්ාථිදෙශනා ඇති අට්ඨකථාචාර්‍ය ධම්කථික මහාස්ථවිරාදීන් ගේ ද ප්‍රමාණාතික්‍රාන්තවූ සඞ්ඝීවානුශාසනා ඇතිහෙයින් මාගේ ධම්ස්වාම්වූ බුදුරජානන්වහන්සේ ශාසනා නම් වන සේක. එහෙයින් කියනලදී.

දෙව සකඛ මනුස්සානං ලොකෙ අග්ග ථලං දදං,
දදනතං දමයනතානං පුරිසාජඤ්ඤ තෙ නමෝ.

ලෝවැඩ පිණිස කරණලද මේ සඞ්ඝීවවාද සංග්‍රහයෙහි මෙතෙකින් **සඞ්ඝීගුණවණ්ණනා** නම්වූ **තෘතීය පරිච්ඡෙදය කියා නිමවනලදී.**

—— :o: ——

මේ පයත්‍යාපත්ති ශාසන නම්වූ ත්‍රිපිටක ධම්ය පිරිහෙන ක්‍රම කෙසේද? යත්, මේ කලියුගකාලයෙහි සත්වයෝ සහපත් ධර්ම මාර්ගයෙන් දුරුව අධම්යෙන් පැවතීමෙන් කල් යවන්නාහ. එකල ලෝකපාල දෙවතාවන්ගේ සිත්හි කරුණාව දහිනා වෙයි. එයින්ම වසු සූඤ්ඡයන් සහ නක්ෂත්‍ර තාරකාදිහු විෂම ව පවත්නාහ. එසේ ඇතිකල්හි කලින් කලට ලොකානුශාසකවූ රජදරුවන්ගේ චිත්තය කැලඹී සත්ව කරුණාව ද රාජධම්ය ද හරිනි. ඔවුන් එසේ රාජ ධම්යෙහි නො පවත්නා කල්හි රාජඅමාත්‍යයෝ ද අධිකතර ශාස්ත්‍ර ව්‍යවහාර ක්‍රමයෙහි නො පවති. අධාර්මිකවෙති. එසේ ඔවුන් අධර්මිෂ්ඨවූ කල්හි ජනපදාධිපතිහු අධර්මිෂ්ඨවෙති. ඔවුන්ගේ අධාර්මිකතායෙන් ජනපද වාසීහු අධාර්මිකවෙති. මේ ඔබ දෙනාගේ අධම්තායෙන් වස්සවලාහකාදි දෙවතාවෝ ප්‍රමාදව කලට වර්ෂා නොපවත්වන්නාහුය එලෙස නො වස්නා කල්හි ශස්‍ය රෝපනාදියට කල්වරදන්නේය. කල් වරදවා කළාවූ හැම ශස්‍යයෝ කලට නො පැසෙති. එකල්හි රාජ්‍යය දුර්භික්ෂවන්නේය. ඒ දුර්භික්ෂය නිසා සත්ත්වයෝ කලට වේලාවට ආහාරපානාදිය නො ලැබ ශරීරදෙශ උත්සන්න වීමෙන් ක්ලාන්ත වන්නාහුය.

එකල්හි භික්ෂාචාරයෙහි ගියදී වසන ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට සිවු පසයෙන් උපස්ථාන කොට ගත නොහෙති. එසේ ප්‍රත්‍යය නො ලැබීමෙන් වෙහෙසන භික්ෂූහු අන්‍යතීර්ථකාදි පිරිස් රක්ෂාකිරීමෙහි නො හැකිවන්නාහුය. එසේ ගුරුවරයන් කෙරෙන් පිහිට නො ලබන අ න්‍යතීර්ථකයෝ ප්‍රත්‍යය සෙවීමෙන් ඒ ඒ තැන සවස්හිදී කාව ඇවිදිනා හෙයින් ගුරුවරයෙකුගේ අවවාදයෙහි පිහිටුවා උගත මනා පර්‍යාප්ති ධර්මය ප්‍රහුණුකොට ධර්‍ය කථා සහිතව දැරීමට නො පිළිවන් වෙති. පාළි වශයෙන් දරා ටීකා අර්ථ කථා ව්‍යවහාරයෙහි සමර්ථ නොවෙති. ඉක්බිත්තෙන් කල්යත් යත් පාළිය ද සැම දරන්ට අසමර්ථ ව ගම්භීර වූ අභිධර්ම පිටකය පළමු වෙන් ම පිරිහෙනකාල ප්‍රස්ථාන ප්‍රකරණය පවත් යමකය, කථා වස්තුය යි විභංගපිටකය මෙසේ ප්‍රතිලෝමයෙන් තෙළවර වූ ප්‍රකරණය පවත් මූලාඛ්‍යාන කොට ක්‍රමයෙන් පිරිහෙයි. මෙසේ අභිධර්මපිටකය පිරිහී ගියකාල්හි දූ සූත්‍රවිනය පිටකමය පවත්නා තෙක් පර්‍යාප්ති ශාසනය නො පිරිහුනේ නම් වෙයි.

ඉක්බිති එයින් සූත්‍රපිටකය පිරිහෙනකල කෙළවර පවත් පිරිහෙන්නේ පළමුවෙන් අඞ්ගුත්තර නිකායෙහි එකාදස නිපාත යෙහි පවත් එකකනිපාතය දක්වා ප්‍රතිලෝමයෙයන් පිරිහෙන්නේ ය. ඊට ඉක්බිතිව සංයුක්ත නිකාය තෙම වක්‍ර පෙය්‍යාල ක්‍රමයෙන් අග පවත් මූල ඔඝතරණසූත්‍රය දක්වා ප්‍රතිලෝම ක්‍රමයෙන් පිරිහෙන්නේය. ඊට ඉක්බිතිව මධ්‍යම නිකායතෙම ඉන්ද්‍රියභාවනා යෙහි පවත් මූලපරියාය සූත්‍රය දක්වා ප්‍රතිලෝම ක්‍රමයෙන් ම පිරිහෙන්නේය. ඊට ඉක්බිතිව දීඝ නිකාය තෙම දසුත්තර සූත්‍රය පවත් බ්‍රහ්මජාලසූත්‍රය දක්වා එසේම පිරිහෙන්නේය. එසේ පිරිහී ගිය කල්හි සූත්‍රපිටකය හැම පිරිහුනේ නම් වේ. එතෙකු දූ වුවත් භික්ෂූහු විනය විවනය හා ජාතක පමණක් ම දරති. ඉතුත් විනය පිටකය පරලෝකාඛ්‍යාශ ඇත්තාවූ ලජ්ජී භික්ෂූහු දරති. ලාභ ලබන්නු කැමැති ලාමක භික්ෂූහු සිතනකල ගැබුරු බණ කීමෙන් අප කෙරෙහි කවුරුත් පහදින්ද? එසේ බණ කීමෙන් ප්‍රයෝජන කිම්ද? ඔවුන් සිත්ගෙණ ලාභ ගන්නා පිණිස බණ කියමහ' යි සිතා බොහෝසේ ජාතක බණ ප්‍රහුණු කොට ලෝවැසියන් සිත්ගෙණ බණ කියති. එසේ කල්යාමෙන් ඒ ජාතක බණ තිපුණව දරාගත නොහී පළමුකොට වෙස්සන්තර ජාතකය පිරිහෙයි. එතැන් පවත් දසරථ ජාතකාදිය පිරිහී මූල අපණ්ණක ජාතකය දක්වා සියලු ජාතක පිරිහෙයි. එයින් ඉක්බිතිව භික්ෂූහු විනය පිටකය

පමණක් දරති. එතෙක් කල් පර්‍යාප්ති ශාසනය පිහිටියේ නම් වෙයි. නැවත ඒ විනය පිටකයෙනුත් පරිවාරය පවත් ප්‍රතිලෝම යෙන් පිරිහෙමින් ගොස් ඛණ්ඩක විභාගය දක්වා පිරිහී කඩඛාවිත රණී ප්‍රකරණය පමණක් දරති. එතැන් දක්වා පර්‍යාප්ති ශාසනය පිරිහුනේ නම් නො වෙයි. ඒ කඩඛාවිතරණී ප්‍රකරණය ද පිරිහී මනුෂ්‍යලෝකයෙහි සතර පදයෙන් යුකත වූ ගාථාවකින් වී නමුත් බුදුගුණයෙක් පවතී නම් ඒ තාක් පර්‍යාප්ති ශාසනය පවත්නේ නම් වේ. යම් දවසෙක ශ්‍රද්ධාවත් රජෙක් බුදුගුණ අසන්ට ලැබී මැනවැ යි සිතා ධම්කථික කෙනෙකුන් විමසා නො ලැබ දහසින් බැඳි පියල්ලක් ඇතුපිට තබා බුදු බණින් ගාථාවක් පමණ දත් කෙනෙක් මේ දහසින් බැඳි පියල්ල ගෙණ බණ කියවයි කියා නුවර බෙර ලවා ත් ධම්කථිකයන් නො ලැබ එසේ නුන්වීවේක බෙර ලැවූ කල ඒ දහසින් බැඳි පියල්ල ගෙණවුත් රජගෙයි කොෂ්ඨාගාරයෙහි ම තබනලෙස පාවා දෙන් ද මෙසේ නොයෙක් උත්සාහ කිරීමෙන් බණ දන්නා කෙනෙකුන් ලැබගත නොහෙන කල්හි පිටකත්‍රය ධම්ය යි කියනලද මේ පර්‍යාප්ති ශාස්‍නය අන්තර්ධානවූයේ නම් වේ. මේ දැක්වූයේ පර්‍යාප්ති ශාසනාන්තර්ධාන යෙහි විභාගය වේ.

මෙසේ දසබලධාරීන්වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි ලෝවැඩ වඩා සියලු බුබකෘත්‍ය යන් සාධාදීමෙන් බුබාධිෂ්ඨාන බලයෙන් ම පවත්නා මේ සියලු ධම්කාය සමපත්තියෙහි අපරිමිතවූ ගුණවිශෙෂ මහිම දන්නා පින්වත් රජදරුවන් වීසිනුදු එසේ ම සම්මාසම්බුදුරජාණන්වහන්සේ වීසිනු දු මහත් ආදර ගෞරව බහුමාන උපදවා මේ සියලු ධම්ය ලෙඛන ශ්‍රවණාදිග්‍රහණාදි වශයෙන් පවත්වා රක්ෂාකොට ලොව් ලොවුතුරා සම්පත් ලැබීමෙහි උත්සාහ කටයුතුය.

මෙසේ තුන්වන පරිවෙජ්දයෙන් ධම්කාය සමපත් වර්ණනා කිරීමෙන් ලෝවැඩ දක්වා ඊට අනතුරු එම සද්ධම්මාජනවූ සඞ්ඝගුණ විශෙෂ විභාග ද මදක් මෙහි දක්වනු ලැබේ. හේ වනාහි සත්පුරුෂ ජනයන් වීසින් සාවධානව ඇසියයුතු.

සම්මාසම්බුරජවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේගේ බෘරස පුත්‍රබවට පැමිණි සඞ්ඝයාවහන්සේ සුප්‍රතිපන්නාදි අපරිමිතවූ විශිෂ්ටවූ ගුණානුභාව ඇතිසේක. ඒ කෙසේද? යත් සුප්පටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ උජුප්පටිපන්නෝ භගවතෝ සාවක

සඞ්ඝා, ඍජු පටිපන්නෝ භගවතෝ සාවකසඞ්ඝෝ, සාමීචිපටි පන්නා භගවතෝ සාවක සඞ්ඝා, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතෝ සාවක සඞ්ඝා ආහුණෙය්‍යා පාහුණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලි කරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.'' මෙහි අථ නම්, භගවතෝ, භාග්‍යවතුන්වහන්සේගේ; සාවක සඞ්ඝා, ශ්‍රාවක සංඝතෙම; සුපටිපන්නා, මනා පිළිවෙත්වූ උතුම් ශාසන පිළිවෙත් පිරීමෙන් පසු සසරදුකට නො පැමිණෙන ගෙයින් නො නවත්නා පිළිවෙනැයි කියනලද අමෘතමහා නිර්වාණය අභිමුඛව සිටි බැවින් අනුලෝම ප්‍රතිපත්තියවූ අපවර්තික පිළිවෙත නම් ලද නුසුදුසු පිළිවෙත් නොව සුදුසු පිළිවෙත් වූ බැවින් නිර්වාණයට අනුලෝමව සිටි උතුම් ධර්මානුධර්ම ප්‍රතිපත්තියට මනා කොට පැමිණියා වූ භාග්‍යවතුන් වහන්සේගේ අවවාදානුශාසනා වන් සකස්කොට අසන්නානු ශ්‍රාවක නම් වන සේක. ඒ අනුශාසනා වූ පරිද්දෙන් පිළිපැදීමෙන් ආර්‍යඥාවය සිඛරදෙන හෙයින් ඒ ශ්‍රවණය ද සඤ්ඤාවශ්‍රවණ නම් විය. සකස්කොට ඛණ අසන ඒ බුඛශ්‍රාවකයන් වහන්සේලාගේ සමූහය ශ්‍රාවක සංඝ නම් වන සේක. නොහොත් ශීලදෘෂ්ටි ශ්‍රමණ ගුණ සමූහයන්ගේ සමාන භාවයෙන් සංඝ නම් විය. ආර්‍යඥ ශීල දෘෂ්ටි ශ්‍රමණ ගුණයන්ගේ එක්වීමෙන්ම ශ්‍රාවක සඞ්ඝ නම් වූ සේක.

අපිව- මෙහි නිරුක්තියෙන් ආර්‍යශීලාදිය මහත් බැවින් ලෞකික ශීලාදිය කෙසේ ගැනේද? යත්: හේ මෙසේ දතයුතු- **''සඞ්ඝෝ භගවතෝ ධම්මවිනයෝ යථානුසිට්ඨං පටිපජ්ජන්තෝපි අපණ්ණක පටිපදං පටිපන්නත්තාපි සුපටිපන්නෝ නාපිමජ්ඣිමාය පටිපදාය අන්තවයං අනුපගමම පටිපන්නත්තා''** යනාදීන් මනා කොට බුදුන් විසින් දෙසන ලද ධර්මවිනය දෙක්හි අනුශාසනා වන් වූ පරිද්දෙන් පිළිපන් බැවිනුදු අපණ්ණක නම් ලද අවිරුඛ පිළිවෙත් පුරණ බැවිනුදු සුප්‍රතිපන්න සඞ්ඝ නැමැයි කියා ද, කාම සැපය ආත්මකිලමථනය යන අන්තවයට නො පැමිණ එයින් දුරුව මධ්‍යම ප්‍රතිපදා නම් ලද සම්‍යක් දෘෂ්ටි ආදි ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයන් පිළිපැදීමෙන් කාය වාඞ් මනෝ යන තුන්දෙර පවත්නා වඞ්කාකුටිල දෙඉරියන් දුරුකරණ පිණිස පිළිපන් බැවිනුදු ඍජු ප්‍රතිපන්න සඞ්ඝයා නමැයි කියාද විශුද්ධිමාර්ගයෙහි ප්‍රකාශ වැහින් ගා ''හෙඡිම කොට්ඨා සරණගත උපාසකෝ සොතාපන්නි ඵල ඨවජ්ඣිකිරියාය පටිපන්නෝ හොති'' යනුවෙන් යටත් පිරිසෙයින් තිසරණගත උපාසකතෙම ශ්‍රෝතාපත්ති ඵලයාගේ සාක්ෂාත් කිරීම පිණිස ආර්‍යමාර්ගයට පිළිපන්නේවෙයි වදළ බැවින් ලෞකික ශීලයෙහි පිහිටි භික්ෂුසඞ්ඝයා ද ශ්‍රාවක සංඝ නම් වන සේක.

භගවතෝ, භාග්‍යවතුන් වහන්සේගේ; **සාවකා සංඝෝ**, ශ්‍රාවක සඞ්ඝතෙම; **උජුපටිපන්නෝ**, අවඞ්ක අකුටිලභාවයෙන් සෘජුවූ පිළිවෙතට පැමිණියේක; **ඤායපටිපන්නෝ**, උපායෙ පිළිවෙතට පැමිණියේක; **සාමීචිපටිපන්නෝ**, පුදුසු පිළිවෙතට පැමිණියේක; **යදිදං චත්තාරි පුරිසයුගානි**, යම් මේ සතර පුරුෂ යුගලකෙනෙක් ඇද්ද, ඒ පුරුෂයුගල වශයෙන් සතරක්ව සිටි **එසඞ්ඝෝ** සෝවාන් මාර්ගයට පැමිණි පුද්ගලයාය, එම සෝවාන් ඵලයට පැමිණි පුද්ගලයාය, යන දෙදෙන ගේ වශයෙන් යුගල එකෙක. මෙම නයින් සකෘදාගාමි අනාගාමි, අර්හත් මාර්ගස්ථ ඵලස්ථයන්ගේ වශයෙන්ම හැම එක්ව සතර යුගලයෙහිම පිහිටි පුරුෂ පුද්ගලයෝ අටදෙනෙකි. එසේවූ ආර්‍යපුද්ගලයෝ; **භගවතෝ**, භාග්‍යවතුන් වහන්සේගේ; **ඒස ඛෝඛ සංඝෝ**, යුගල වශයින් වෙන් වෙන්වූ පුරුෂ පුද්ගලයයි කියනලද මේ ශ්‍රාවක සමූහයා; **ආහුණෙය්‍යෝ**, දුරින්දු ගෙණවුත් දියයුතු සිවුපසය පිළිගන්ට සුදුසු හෙයින්ද; ඒ දායකයන්ට මහත් ඵල කරදෙන හෙයින්ද **ආහුණෙය්‍ය** නම් වනසේක.

පාහුණෙය්‍යෝ අමුතු සරහා දෙන දානයන් පිළිගන්ට සුදුසු හේයින්ද සතර දිගින් සතර අතුදිගින් කල්‍යාමකින් ආ ප්‍රියමනාප නා මිත්‍රවූ ආගන්තුකයන්ට දෙනපිණිස මහත් සත්කාරයෙන් සපයනලද ආහා : පාන වගිදියට සුදුසුය යන අර්ථයෙන් **පාහුණෙය්‍ය** යයි කියනු ලැබේ. ඒ හැම දෑ වෙන්ව ගොස් නොබෝ කාලකින් එන මිත්‍ර ආගන්තුකයන්ට නොදී සඞ්ඝයාවහන්සේට ම දෙන බව එයට වඩා පුදුසුහෙයින් ද ඒ පාහුනය පිළිගන්ට සඞ්ඝයා වහන්සේ සුදුසු හෙයින් ද සංඝයා වහන්සේ හා සදෘශවූ අමුතු සත්කාරයට සුදුසු කෙනෙක් ලොව නැති හෙයින් ද ඒ සංඝතෙමේ බුඞ්නන්තරයක් ඉක්මුණු කල්හි හෝ කිසිකලෙක මහාකල්ප අසංඛ්‍යයක් ඉක්ම ගිය කල්හි හෝ දක්නට ලැබෙන සංඝයාවහන් සේම ආදර ගෞරව බහුමානනාදි සත්ප්‍රකාරයෙන් සරහා දෙන දානයන් පිළිගන්ට සුදුසු හෙයින් **පාහුණෙය්‍ය** නම් වනසේක; **දක්ඛිණෙය්‍යෝ**, පරලොව අදහා දියයුතු දානය පිළිගන්ට සුදුසු හෙයින් ද ඒ දක්ඛිණාසංඛ්‍යාත දාන පිළිගැන්මෙන් ඔවුන්ට උදුර තර විපුල වූ මහත්ඵල සංසිඳිය වන හෙයින් ද **දක්ඛිණෙය්‍ය** නම් වනසේක. **අඤ්ජලිකරණීයෝ**, පින් කැමති සියලු ලොකයා විසින් දෙඅත් හිස්මුදුන් පිහිටුවාගෙණ කරණලද අඤ්ජලිකම්ම සංඛ්‍යාත වැඳීමට සුදුසු හෙයින් **අඤ්ජලිකරණීය** නම් වනසේක. **ලෝකස්ස**, සත්ලොකවාසීන් ගේ; **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං**,

අනික් සත්දෑවයකු නැතිහෙයින් අසදෘශ වූ සියලු කුශල ධර්මයන් හටගන්නා ස්ථානයම වනහෙයින් පුණ්‍යක්ෂේත්‍රවූ සංඝතෙම මේ ලෝක සත්ත්වයන්ට නානාප්‍රකාර හිත සැප ඵලවාදෙන නිරුත්තරවූ පුණ්‍යක්ෂේත්‍ර නම් වනසේක. එහෙයින් දෙවිමිනිස් සැපත් හා බඹලොව නිරාමිස සැපත් පත්නාහුද රාග ද්වේෂ මෝහාදි පාප ධර්මයන් කෙරෙන් දුරින්ම දුරුවූ අමාමහ නිවන් සැප පත්නාහු ද තුන්වෙනි කොට ගතයුතු මේ සඟ සරණය ම වෙත්. අප හැමිගේ අඛණ්ඩ බලයෙන් දිවමන් බුදුරුව දැක සිත් සැනසීමක් නො ලබන නමුදු ඒ බුදුන්ගේ වෙසෙස ශ්‍රුත්තාවූ මේ සඟුරුවන් අප ඇස පෙණෙන්නේ අපගේ මහත් භාග්‍යයෙන්වේ දැයි සලකන තරම් මහිම ඇත්තාවූ බුදුන් උපදනාට පළමුව ලොව පහළ නො වන්නාවූ පස්වාදහසින් ඔබ්බෙහි උපන් ලෝවැසියන්ට දක්නට නො ලැබෙන්නාහ. පැවිදි ව තුමූ දුශ්ශිල ව නරකයට යෙති. නමුදු මොහු බුදුන් දරුවෝ යයි ආදර උපදවා සිතින් ම ගෙදී වැන්දවුන්ට සිදුවුන්ට අමාමහ නිවන්සැප නො වරදවා ම දෙන්නාහ.

පැවිදිවීමට පළමුවෙන් ම කොයෙක් කුලභෙද ඇත්තාහ. පසුව බුදුසස්නෙහි මහණවූ තැන් පටන් ඒ සියලු ම ජාති භෙදය හැර මහාමායා දෙවින්වහන්සේට මුඛපුරුව සුඩෝදන රජ්ජුරුවන්වහන්සේ මුතුන් තැන්හි තබා යසෝදරා දේවීන් වහන්සේ මව් තන්හි තබා ශාක්‍යවංශයෙහි උපන් බුදුරජානන් වහන්සේ පියතන්හි තබා බුඩපුත්‍රවූ රාහුලකුමාරයන්වහන්සේ ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘ තනතුරෙහි තබාගෙණ එක සභාගයන්වහන් සේගේ උතුම් වංශ ලැබ සිටියහ. සියලු පව් වළකන ලජ්ජා හය වැනි ධර්මයන් දෙදෙනා දෙකෙළවර ලා තුමූ මධ්‍යයෙහි සිටියහ. පඤ්චේන්ද්‍රිය නමැති සොරුන් රැක නවතන සිහි නමැති දෙරටුපාලයෝ ලදහ. ශීලය වැනි මහත් පිහිටක් ලදී. එකඟවූ සිත් ඇති සමාධි වැනි මහත් නිධානයක් ලදී. ප්‍රඥාව වැනි දුටු දුටු ආපදයෙහි මුළා නොව නිසිලෙස යොදුගතහැකි ඖෂධයක් ලදී. පඤ්චකාම වැනි ගර්හිතවූ නිඳිත කුණු නො වළඳ දුරු කළහ. නිවන් වැනි මිහැගි රසයක් වළඳන්ට පටන්ගෙණ සිටියහ. සිත වැනි වඤ්චලවූ අභිදුෂ්කර දෙයක් වසඟ කරන්නට නිසිලෙස ම සැදී සිටියහ. තණ්හා නමැති යකින්න දුරු කරන්නට සිටියහ. තුන් භවය පමණ තාක් තන්හි පළල්ව සිටි තණ්හාව නමැති මහ ගංගාව ඒයලවන්නට පටන්ගෙණ සිටියහ. සසර වැනි මහා සිරගෙයකින් නික්ම යන්නට පටන් ගණ සිටියහ. ලාභ සත්කාරාදිය පිණිස ලද ගුණ ප්‍රකාශ නො කරන්නාහ. සඟුරුවන් නැතිදු ම බුඩොත්පාදය නැතැයි කියන

පරිද්දෙන් බුදුන්වම අවශ්‍යව බුදු සසුන් පවත්වා රක්‍ෂාකිරීමෙහි නියුක්තව සිටියහ. සිංහතෙල් තබා රක්නා රන්බඳනක් සේ සඩම් තමැති සිංහ තෙලඟ දරා රක්නා උතුම් සහුරුවනෙක නිධාන රක්නා නාගයන්ගේ සඩම් තමැති මහා නිධානය රක්නාහ. රක්නට බැරි ඇතු පිරිමසා ජීවත්වන ඇත්ගොව්වන් සේ පුරන්නට නො පිළිවන්වූ පිළිවෙත් පුරා තමනුත් රැකි ලෝවැසි සතුන් රක්නාහ. රාජ භයින් වල්වන්නවුන් සේ සසර භයින් ම වන ගහව යන්නාහ. ගුරුළන්ට භයින් මහත් ගල් ගැලපියා සඟනය කරණ නාගරාජයන් සේ සසරට භයින් මහත්වූ දහන් පිළිවෙත්හි යෙදී වාසය කරන්නාහ.

තවද ලෝකයෙහි සියලු මනුෂ්‍යයෝ තමන් විසූ ගමින් පිටතට නික්මෙන්නාහු ඒ නම් එගමිහි පැවති තණ්හාව තුබූ සේ තබා ශරීරය පමණක් ගෙණ යන්නාහ. මාගේ සවාමිදරුවන්ගේ පුන්වූ සහුරුවන් වූකලී එක් තැනෙක්හි වැස අතික් තැනකට විඛින කල්හි පසු පස්සෙහි හඬා එන දූන් පුතුන් හා මෙන්විම ඉවසා ගත නොහි හඬා එන අඹුවන්ද නැතිහෙයින් හුන් හිහාරාදි සම්කිසි තැනෙක් ඇතහොත් රැස්ව තුබූ ගරුභාණ්ඩ ධාන්‍යොපකරණාදි සංඛ්‍යා දැ මිස තමන් සතුව කොටු පුරා රැස්කළ වී සාල් නැති හෙයින් හා ගේ පුරා තුබූ රත්රන් අමු රන් නැති හෙයින් ද ඇති දෙයක් නම් තුන්සිවුරය ඝනාදීන් තමන්ගේ ශරීරයෙහිම දරා ගෙණ එන යන තරම් පිරිකරමය. එහෙයින් අපෙක්‍ෂාවක් නැතිව ම යන්නාහ.

තවද ගොදුරු බිමෙන් ගොදුරු කා යන පක්‍ෂීහු පවා නැවත මෙතනට එම්හයි එතැන්හි තෘෂ්ණාවක් තබා යෙති. අප සවාමිදරුවනන් වහන්සේගේ පූන්වූ සහුරුවන් වූකලී හුන් තැන්හි දූ සිහාම ලබන අහරක් බැවින් යන තැන්හිදූ සිහාම ලබන ආහාරම බැවින් පාත්‍රයෙහි බහාලූ අඟ රක්ම හදුනන බැවින් ලත් දෙයක්ම මිහිරිවන බැවින් නො ලත් දෙයෙහි සිනිවිල්ලක් නැති හෙයින් මල් කුසුම් වන මස්සකයෙන් හමාගන පවන මේ වල හැර කොයට යෙම් ද යන සොකයක් නො කොට යන්නා සේ කිසි තැනෙක්හි ඇල්මක් වත් සොකයෙක්වත් නැත්තාහ. තමන්ට පැමිණි ගොවරයක් ම ගන්නා ඉඳුරියන් සේ මටදෙව සි යන බස් නැතිව සැදුහැ ඇත්තාවුන් දෙන්නක් ම පිළිගන්නාහ. ගොස් පැමිණි තන්හි විහාරයෙක් ඇත. එහි ම වසන්නාහ. එතන රුක්මූලෙක් ඇත එහි ම වසන්නාහ. හෙද නැත. හිස් බිමිහි සතුවින් ම හිඳිනාහ. ඒ ඒ තන්හි මුතුදුල් එල්වූ රන් කම්කළු වියන් බැඳි සිරි ගබ්ඩාගෙහි වසන ප්‍රිකිමත් රජකුමරුවන් සෙයින් විශුබවූ සඳරුස්

නැමැති මුතුදැල් එල්වූ විසිතුරු තරුපෙළ නමැති රන්කම් කළ අහස්වියන් බැඳ අභ්‍යවකාශයෙහි ම සැප සේ ව්‍යවසකරන්නාහ, ගමකට වන්කල අපි පැමිණියෝ ගමට යයි අමතු සතුටක් නැත්තාහ. අප වන්නෝ වනාන්තරයකට යයි වල් වන්කල රැහැනියක් නැත්තාහ. කාන්තාරමහ මිනිසුන් පොළඹා කා විනාශයට පමුණුවන යකුන්ට ම නිවාස වූ යක්ෂපුරයකට පැමිණි නුවණැති පුරුෂතෙම මම යහපත් පුරයකට වන්නෙමි යි සතුටු නො වන්නා සේ සත්ත්වයන් බඳනා පිණිස යක්වෙස් හැර මිනිස්වෙස් ගත් සියලු දුකට කාරණ වූ ගැණුන් විසින් ගැවසීගත් ගමකට වන්නෙමි යි හඟපත් ව සිත් සේ ඒ ඒ දිග නො බලා බිමට නතුකළ ඇස් ඇතිව උවදුරු ඇතැයි විසඳුම් පමණ තැන් බලාගෙණ යන ගමනාදී ශාන්ත ඉරියවු පැවැත්තිමෙන් දමනය කළ ඉඳුරන් ඇති බැවින් ගමකට වැදුනම්හ යි සතුටක් නැත්තාහ. සක්විති රජ වන පිනැති ව මුළු සක්වළ හැරපියා පැවිදි ව අප හැරිය මුළුසක්වළෙහි රජසැප නැවත සිහි නො කරන සේ උතුම් පැවිදිසැපයක් ඇතියාහ.

එබැවින් ගමක් හැර ගමකට යන කල්හි අප හැර ආ ගම යහපතැයි අපේක්ෂාවක් නො කරන්නාහ. ආඥා සම්පන්න වූ රජහුගේ මෙහෙවරට ගොස් මෙ දවස්හි ම එම් යි අවධි නියමය කොට ගත් පුරුෂතෙම ඒ අවධිය නො වරදවන පිණිස දිවන ගමන්හි අතරමහ සම්පත්තීන් සමඟ වූ ගම් දුට ද එහි සැතපෙමි යි යන අදහස් නැති ව මෙහෙවරට දිවන්නා සේ බුදුරජානන්වහන්සේගේ අවවාදානුශාසනා කමටහන් ගෙණ ඒ පිළිවෙත් පුරණු පිණිස වූ විහාරයට යි කල් නො වරදවා සහුරුවන් වහන්සේ මා පැමිණි ගම යහපතැයි එහි ආලයක් නො කරන්නාහ. කිඹුල්වත් පුර වැනි උතුම් නුවරෙක ආලය හැර නික්මගිය බුදුපියාණන් වැනි දරුවෝය. එබැවින් බිජුවටෙහි ඉපැද වැඩී ඒ බිජුවට පැළණු කල්හි එහි අපේක්ෂාවක් ආලයක් නැතිව ම මව පස්සෙහි යන්නාවූ පක්ෂි පොතකයන් සේ ගම්හි ඉපැද වැඩී පැවිදි ව යනකල එගම්හි ආලයක් නැතුව යන මහණහු බුදුන් වදුල පිළිවෙත් පසු පස්සෙක් ම යනබව මුත් ඒ හැර ගම්හි පවත්වන ආලයක් නැත්තාහ. මේ දේ මා කැමතිය, මේ දේ මා නො කැමැතිය යි කියා ගත නො හැකි ඉතා ලදරුකුමාරතෙම මව අතින් මුඛයෙහි තුබූ අහරක් ම කා ඇපෙන්නා සේ සදහැ ඇතියන් තමන්ට දුන් දෑනයකින් ම දිවි පවත්වන බව මුත් මේ මට යහපත, මේ නපුරැ යි යන බෙහෙතක් රස

නො දන්නාහ. මේ බදු වූ උතුම් තිරපෙක්ෂ ගුණ ඇති බුඩශාසන නැමති රත්ගිරිගුහාවෙහි වසන සිංහයන් බදු වූ බුඩශාසන නැමති ජේදනත මිල්තෙර වසන ජේදනත හස්තිපොතකයන් බදු වූ බුඩ ශාසන නැමති චිත්තකුට පර්වතයෙහි සඩ්ඝිහංසපොතකයන් බදු වූ බුඩශාසන නැමති රුවන් ආකරයෙහි පහළවූ මාහැඟි රුවන් බදු වූ බුඩශාසන නැමති සාගර කුක්ෂියෙහි උපදනාවූ රුවන් බදු වූ බුද්ධ ශාසන නැමති පරෘතුරුක්හි හටගත් මහත් මල්නැන් බදු වූ බුඩ ශාසන නැමති බ්‍රහ්මවිමානයෙහි වසන බ්‍රහ්මකුමාරයන් බදු වූ බුඩොත්පාද නැමති වසනතකාලයට පිපී සැරහී ගිය මහසපුමල් පහනියක් බදු වූ උපමාවිෂයාතික්‍රාන්ත වූ ගුණාලඩ්කාරයෙන් සියල් ලෝ සිත් ගෙණ වසන බුදුරුවන් පුත් සගුරුවන්වහන්සේ සිහා වැඩිකල කොටුවෙහි පුරාතු වී සාල් ඇතද ගෙයි රත්රන් අමුරන් පුරා ඇතද හැමලෙසින් සිත්හි ගුණ ම පිරූ සිහාසිරි එ ගෙවල ඇත්තවුන් දුන් දුන් සේ ම පිළිගන්නා බව මුත් ගටත් ව යාවක යන් සේ ඉල්වීමක් වත් බලාත්කාරයෙන් උදුරා හැර ගැන්මක් වත් වඤ්චායෙන් සොරා ගැන්මක් වත් නො කරන්නාවූ,

මහණුන් විසින් දුරුකටයුතුය යි වදාළ එක්විසි අතෙස්තෙන් හා කුහන ලපනාදීන් දුරුව මේ කැපය යි අනුදත් සේ දැහැමින් සෙමින් ලද දෙයකින් ම ජීවත්වන්නාවූ අනුන්ගැනිවූ මිඩිය දුන් කුඩු පූ පවා සතරවරන් දෙවුරජුන් දුන් පාත්‍රයෙන් පිළිගත්තාවූ පියානන්වහන්සේ කළ දෙයක් ම කරන්නාවූ ගමක් කියම්හ යි සිතූකල තමන්ට සවාමි වූ ලොකසවාමි වූ ධර්මසවාමි වූ සම්මාසම්බුදු රජානන් වහන්සේ නො බිණිය යුතුය යි වැළකූ දෙතිස්කථාවට තුඩු නො ලා නො බැණ කියන්නාවූ තමන්ට ද තමන් වන් සන්නට ද නුසුදුස්සක් නො බැණ තමන්ට ද අසන්නවුන්ට ද සඩ්ගීමොක්ෂසම්පත් බාධක වන නිරර්ථක නපුරු වචනයන් නො බැණ බුදුරජ ඇසුව ද කි සේ යහපතැ යි වදරණ පරිද්දෙන් සුදුසු බස් කියන්නාවූ සසුන් පිළිවෙත් පුරණ සේ වැඩිතරම් ධෛර්‍ය්‍ය ඇති බණ දෙසීමෙන් හා ධර්මිඤ්ඤ කථාවක් ම බණවන ව්‍යාජ කථාවකට තුඩ නො පියව යි වදාළ අවවාද දිවි ගියත් නො ඉක්ම වන්නා වූ බෙලිකුස්හි මුතු ම තිබෙසි, නැතහොත් සිස් ව තිබෙසි එහෙයින් ම සගුරුවන් වහන්සේ කියනසේක් වි තම් බණක් දහමක් ධාර්මික කථාවක් ම ය. එසේ නැත මුවෙන් නො බණ සේක. අධර්මකථාවට දුරින් ම දුරු සේක. මුළු ලෝ සතුන් තුඩ තුඹ වැකූ ගුණ ඇති කිසිකෙනෙකුන් හා ත් විරොධයක් නැති කිසි සත්තකෙනෙකුන්ට දණ්ඩනයක්

නොකරණ මේ සියලු දුක් නැමති ගිනිගත් සසරෙහි නිවී සන් සිදී වසන මේ සංසාරබන්ධනය වැනි මනත් බැඳුම් පවා මුදුහැර ගැලවෙන්න තරම් පිළිවෙත් ඇති නිවන්පුර වදනට ම බුදුසස්නෙහි හුනිව සිටි බලන්නවුන් ඇස් මිහිරිවෙස් ඇති සිතන්නවුන් සිත් මිහිරිහුණ ඇති මරහු ඇස් ගැසූ ගිනිගෙණ දිලියෙන යකුටුවැනි සත්පුරුෂයන් ඇසට අමෘතපරිභෝජකයක් වැනි ශ්‍රන්ථධුර විදර්ශනා ධුර දෙක මුත් තුන්වෙනිව සිටි ලෝකයෙහි මුළාවෙන් නොගැසි රෙන බඹලොව ගොස් බඹවිමන්හි වැස භාවනාකරත් මහමුහුදු වැද දිය පිරා ඉන්ද්‍රියලාභීන්ට ගුහාවෙහි හිදිනා සේ ජලගතියෙහි හිඳ භාවනා කරත්, සිහිල් ද හිරුමඩළ ගෙන්වා පාමුල්හි ගිනි කබල් කරත් ශ්‍රීමද සඳමඩලු ගෙන්වා පිටට සිහිල් දෙන පිටංචු කරත්. ඔවුන් සිතූ දෙයක් කරණ පරිද්දෙන් මහත්වූ ඍඩි ඇති අහසට ගැසූ අත් වැදගන්නා කිසිදෙයක් නැත්තා සේ කිසි වස්තුවෙක්හි ලොභ වශයෙන් එක්වීමක් නැත්තාවූ සත්පුරුෂ ජනයන්ට හස්තාභරණ වස්තුවක් වැනිවූ සඞ්ඝරත්නය තෙම අප හැමටම අති වැඩ සාධාදෙන සිතුමිණිරුවනක් වැනිවූ

ශීල නැමැති ආභරණ පැලඳ ශීලනැමති සුවඳ විලවුන් ඇඟ ගල්වා විසිමෙන් සියලු ලොවට ප්‍රියවූ ශාසන පිළිවෙත් වැනි දුෂ්කර ක්‍රියාවක් කරණ මහත් වැර සැර ඇත්තාවූ කලක් සේ ද එසේ තපු රැකි කියන සේ ක්‍රුසුදුසු ද නො කරණ නො කියන උතුම් ගුණ යක් ඇත්තාවූ ශාන්තවූ නිරවුල් නිවන් පුර වැද සැනසීමක් ඇත් තාවූ සිහා වළඳන බතක් වැනි නිරවද්‍ය බතක් වළඳන්නාවූ පාංසුකූල විවරය වැනි නිරවද්‍ය සිවුරක් පොරවන්නාවූ බුදුන් වැනි උතුම් පියාන කෙනෙකුන් ලද්දවූ ධර්මය වැනි ඇසියයුතු දෙයක් අසන්නාවූ විදර්ශනා වැනි භාවනා කර්මස්ථානක් භාවනා කරන්නාවූ නිලකුණු වැනි සිහිකටයුතු දෙයක් සිහිකරන්නාවූ මෛත්‍රිය වැනි අමාගෙක සිත ගලවන්නාවූ ශරීරයාගේ පිළිකුල් සභාව සිහිකරණ කායගතාසති නමැති සිහියත් ලද්දවූ ආහාර පිළිකුල් සංඥාවක් ලද්දවූ සපදානචාරිකාවක් වැනි මනහර චාරි කාවෙක ගැසිරෙන්නාවූ කුසල් නමැති රෝපනය කර්මස්ථානක් රොපනයකරන්නාවූ ප්‍රාණාතිපාත වැනි නො කටයුත්තක් නො කරන්නාවූ මුසාවාද නමැති නො කියයුත්තක් නො කියන් නාවූ සුරාමෙර වැනි නො බියයුත්තක් නො බොන්නා වූ පඤ්ච කාම නැමති ගරම්ල් කුණක් කරින් උනා ගලවා හැරියාවූ නැවුම් තමැති විකාරයන් නො බලන්නාවූ ගී කීම් නැමති නිෂ්ප්‍රයෝජන සංසාර විලාසයක් නො අසන්නාවූ ආත්මක්ලාන්තභාවයකට පත්වූ දුක් දෙන අන්තකිලමථානුයෝග නමැති වඩහුම්

දංගෙඩියකින් මිදිසිවියාවූ මල් සුවඳ විලේපනයන් නමැති ස්පර්ශ විෂයක් ඇඟ ගැවෙන් දුරුවුනාවූ උසසුන් මහස්නෙහි නොහිඳිනා වූ රත්රිදී මසුකහවළු නමැති තණහා වඩනා අපථ්‍ය දෙයක් වෙහෙරින් ම පිටත්කළා වූ විකාලභොජන නමැති ගිනිගෙණ දිලි සෙන යගුලි මුඛයෙහි නොතබා දුරුකළා වූ දහම් වැනි බුබුළුයාද වූ මිහිරි දෙයක් ලෝවැස්සන්ට ත් බෙදා දී තුමූ ත් වළඳන්නාවූ විනය විනිශ්චයෙන් කරණ දෙශනිශ්චයක් ඇත්තාවූ සැරියුත් මුගලන් දෙ අගසව්වන් වැනි කුසයෙහි හොත්තන් ලද්දාවූ මරණයට පවා හය නොවන වික්‍රමයක් ලද්දාවූ බුදුන් වැනි සිහිකළමනා කෙනෙකුන් සිහිකරන්නාවූ සසර වැනි එතරවීමට දුෂ්කර තැන කින් සතුන් එතරකරන්ට සිටියාවූ කාමොඝාදි මහවතුරු සතරෙහි නොගැලී පිහිනන්ට සුදුසු වූ අධික විශ්වාස ඇත්තාවූ රජයය වැනි මහා හයකින් ගැලෙන් සිටියාවූ දෙසැට මිථ්‍යාදෘෂ්ටි නමැති මහ ගිනි වලකින් පැන එතරව ගියාවූ සසර පමණට මහක්වූ ව්‍යසන සාගර යෙහි ඇවිද වෙහෙස විඳිමින් විඩාව සිට බුදුසසුන් වැනි යහපත් පටුනුගමකට පැමිණියාවූ තණ්හාවට ම හැනිකම් කොට අඟහි ව සිට නිදහස් වූ සාරාසඛ්‍ය කප්ලක්ෂයක් බුදුන් ම පතා ලද දරුවන් වූ පායෙන් හැපත් ව වසන්නාවූ බුදුන්ට දිවිපුදා වසන්නාවූ සක්විතිරජුන් ඇති සමයෙහි උපදනා සත්රුවන් සේ බුඩාත්පාද යෙහි ම උපන්නා වූ සඩමියාගේ නිධානයක් වැනි වූ මහණෙනි, මා කියන්නක් අසවයි කැදවා කියන බණ අසන්නට සුදුසු වූ ගුණ මහිම ඇති සතුරුවන්හි මෙසේ මෙසේ වූ නොයෙක් විද්‍යමාන ගුණ යන් ප්‍රකාශ කොට දෙවි මිනිසුන් සහිත සියලු සත්ත්වලෝකයාහට කරණලද උතුම් සඩමීානුශාසනා ඇති හෙයින් සඩර්මවර චක්‍රවර්ති සාමී වූ මාගේ බුදුරජ ශාසනා නම් වනසේක.

තවද ඒ මාගේ සාමිදරු වූ බුදුරජාතන් වහන්සේ එකිනෙක තමකට නිත්‍යපිරිවර පන්සියය බැගින් ඇති අසූමහ සවිවන් ප්‍රමුඛවූ හැම ශ්‍රාවකයන් වහන්සේගේ පූජිප්‍රාඣිතාවූ පරිද්දෙන් චරිත බලා අවවාද කොට මාගේ ඵලාදියට පමුණුවමින් ඒ ඒ තනතුරු දීමෙන් වැඩ සැදූසේක.

තවද මාගේ සාමිදරු වූ සතුරුවන්වහන්සේ ශීලවිපත්තියෙහි මහත් දෙශාදිනව දැක කායවාක්දුශ්චරිතයෙන් හා එක්විසි අනේසන කුහන ලපනාදීන් දුරුව ශීලසම්පත්තියෙහි මහානිසංස බව දැක නිර්මල වූ චතුපාරිශුඛ්ධිශීලයෙන් සමන්විතව එම සීලයාගේ ම පිරිසුදු බවද තෙරසඛුතගුණයෙන් හා ත්‍රිවිධසනෙනාඝයෙන් යුක්තව චතුර්විධ වූ ආර්‍යවංශයෙහි පිහිටා අප්‍රමාදව වාසය කරණසේක.

මෙසේ ලෞකික ලොකොත්තර වසයෙන් විප්‍රකාර වූ සකල ශ්‍රාමණ්‍ය ගුණරත්නාලංකෘත වූ එහෙයින් ම මුළුලොව වාසිවන්ට පින්කෙත්ව සිටි සියලු සඞ්ඝයා වහන්සේ ලොව කෙසේ පහළවන සේක්දයත්? සංඝපිතාවූ සම්‍යක්සම්බුදුවරයන්වහන්සේ ලොව ඇතිකල ඒ ලොවුතුරා බුදුන් සමීපයෙන් ම ලැබියයුතු එහි භික්ෂුභාව උපසම්පදය ත්‍රිවිධොවාද උපසම්පදය සරණගමන උපසම්පදය යන නොයෙක් ප්‍රභේදගත උපසම්පදයෙන් හා එම බුදුන්විසින් ම අනුදත් ක්‍රමයෙන් පඤ්චවග්ගිදිසංඝයා වහන්සේ කෙරෙන් ම ලැබියයුතු දැන් මෙලොව පවත්නා ඤත්ති චතුත්‍ථ කම්මවාක්‍යයෙන් පැමිණෙන උපසම්පදය යන ක්‍රමය නොහැර උපසම්පදා භාවයට පැමිණි භික්ෂුහු ම තම තමන්ගේ පුද්ගල නාමයන් හැර සතරනම පටන් එක්වූ සංඛ්‍යාවක් හා ගුණසමූහවූ පරිද්දෙන් ම සඞ්ඝ නම් වනසේක.

භේද වනාහි චතුවීගීය පඤ්චවගීය අතිරෙකපඤ්චවගීය දශවගීය අතිරෙක දශවගීය විංශතිවගීය අතිරෙක විංශතිවගීයයි කියාද නොයෙක් ප්‍රභේද ඇති සේක. එහි සංඝඤත්ති පිහිටුවා, පාමොක් දෙසීමෙන් කරණ උපොෂිතකම්ය හා සංඝදානාදි ඇතැම් සංඝ කම්මානුරූපව සිටි භික්ෂූන්වහන්සේලා සතරනමට සතරනමට චතුවීගීයයි යන නමෙකි. එසේ පවාරණ කම්ය හා කඨිනචීවර දාන ලැබීම - ත්‍යන්තදෙශවලදී උපසම්පදාව ආදි සංඝකම් කිරීමට තරම්වූ භික්ෂූන් පස්නමට පඤ්චවගී භික්ෂුසංඝයාවහන්සේ යයි කියාද, එසේම සයනම පටන් නවනම දක්වා ම ලද යම් ගණනකට අතිරෙක පඤ්චවගී සංඝයාවහන්සේ යයි කියා ද, එසේම මධ්‍යම දේශයෙහිදී උපසම්පදා කිරීම ආදි නොයෙක් සංඝකම්මානුරූපවූ දශනමට දශවගී සංඝයාවහන්සේ යයි කියාද, එකොළොස් නම පටන් දශනව නම දක්වා ලද යම ගණකට අතිරේක දශවගී සංඝයා වහන්සේ යයි කියාද, භික්ෂූන් වහන්සේලා විසිනමට විංශතිවර්ගික සංඝයා වහන්සේයයි කියාද එසේ ම අබ්භාන කම්ය ආදිවූ සියලු ම සංඝකම් කිරීමට සුදුසුවූ එහින් පිටත් විසි එක නම් පටන් නොයෙක් සියදහස් ලක්ෂ කොටි ප්‍රකොටි ආදි වශයෙන් රැස්වූ යම් භික්ෂූන්වහන්සේලාගේ යම් යම් ගණනක් ඇද්ද අතිරේක විංශතිවර්ගික සංඝ නම් වන සේක. ඒ එසේ වීනම් 'අඨපුරිසපුග්ගලා එත භගවතො සාවක සඞ්ඝා' යනුවදුල ක්‍රමයෙන් ආර්‍යාර්‍යාගී ඵලයන්ගේ ම සාක්ෂාත් කෘතවශයෙන් පැමිණි අෂ්ටප්‍රකාර ආර්‍ය පුද්ගලයෝ ම භාග්‍යවතුන්වහන්සේගේ

ශ්‍රාවකසංඝ නම් වන්නාහ. එහෙයින් දැන් මෙලොව විද්‍යමාන වූ ලෞකික ශ්‍රද්ධා ශීල ප්‍රඥාදි ගුණ සම්පන්න නිඝ්‍රන්ථවහන්සේලා කෙසේ ආර්‍යසංඝයෙවූ සේක්ලා දැ? යත්, හේ මෙසේ දතයුතු.

පටිසම්භිදාමාර්ගයෙහි දී නිර්‍වාණමාර්ගීවූ ආර්‍යමාර්ගය ප්‍රකාශ කොට දක්වන භාග්‍යවතුන්වහන්සේ – "එසෝ ව මග්ගෝ නත්ථි දස්සනසස විසුද්ධියා" යනුවෙන් සෝතාපත්ති මාර්ගාදි වූ ආර්‍යමාර්ගයෝ ම නිර්‍වාණපුරයට මාර්ග වන හෙයින් මේ මාර්ග නම් වෙති. වදුරා නැවත මහාසතිපට්ඨාන සූත්‍රදේශනායෙහි ද "එකායනෝ අයං භික්ඛවෙ මග්ගෝ" යනුවෙන් සංසාරවාරී පාඨග්‍ජනවූ ශෝතාවවරයන් වහින් ඒ ආර්‍ය්‍ය මාර්ගයට පැමිණීම පිණිස එම මාර්ගයාගේ අවබෝධය පිණිස පළමුකොට භාවිතා කවයුතුවූ සතිපට්ඨාන භාවනාමාර්ගයද එම ආර්‍යමාර්ගයන්ගේ ම පූර්‍වභාග මාර්ග නමැයි කියා දක්වා වදාළසේක. මෙහි දු එම අෂ්ටාර්‍යපුද්ගලවූ උතුම් ලෝකොත්තර සංඝගුණ ප්‍රතිලාභයට මූල්ව සිටි සෙයින් පූර්‍වභාගවූ උතුම් මේ ශාසනයෙහි පිළිවෙත් පුරමින් ම වසන හෙයින් ද ඒ අෂ්ටාර්‍ය පුද්ගල සංඝ පරම්පරාගත ව පිළිවෙළ නොඅැර ම බුද්ධශාසන ප්‍රව්‍රජ්‍යාව ලදින් භික්ෂුභාවයට පැමිණි හෙයින් දැයි යනාදි හේතුයෙක් කාරණයෙන් ශාසනාන්තර්ධානය දක්වා ම මෙසේ ලොව ඇතිවන ශීලසම්පන්න වූ සියලු ම පාඨග්‍ජන බුද්ධපුත්‍රයන්වහන්සේලා ද අෂ්ටාර්‍යපුද්ගල සංඝ නම් වන සේක.

මෙසේ අෂ්ටාර්‍ය පුද්ගල සංඝයාවහන්සේ ය යි ලද නම් ඇති අචින්ත්‍යතොපමේය්‍ය අප්‍රමාණවූ ගුණරත්නාලංකාරයෙන් සැරසී අනුබුද්ධඝාත්‍යසම්පාදනාදියෙන් සම්භූත පුත්‍ර වූ සංඝ්‍යාවහන්සේ ම සියලු බුදුවරයන් වහන්සේලාගේ පර්‍යාප්තිප්‍රතිපත්ති ප්‍රති වධ වශයෙන් ත්‍රිවිධවූ ශාසනය පවත්වන සේක. ඒ කෙසේ දැයි කිවැ? කොත්, ක්ෂෙත්‍රයට අධිපතිවූ සවාමි පුරුෂතෙම ඕනට සදුකාලයෙහි ක්ෂෙත්‍රයෙහි ම රදුසිට ඒ කෙත රැකීම දුෂ්කර හෙයින් හස්තපාදාදි අංග සම්පන්නතාදියෙන් තමන් වැනිවූ තොයෙක් පුරුෂයන් සිවුවා ක්ෂෙත්‍රශස්‍යයන් රක්ෂා කිරීමෙහි නියුක්ත කොට යම්සේ ලෝකයෙහි සස්‍යාදීන් රක්නේ ද, එසේ ම සම්‍යක්සම්බුදුවරයන් වහන්සේලා ද හැම සතුන්වෙත පතළ මහා කරුණාවෙන් ශාසනය නිපුණ අනෙකාඛ්‍යාශයානුකූල අර්‍ථව්‍යඤ්ජන සම්පූර්ණ වූ ධර්ම්ය දෙශනාකිරීම් ආදි ක්‍රමයෙන් සත්ත්වයන්ට චතුරාර්‍යසත්‍යය ධර්ම්ාදි ප්‍රමාණාතික්‍රාන්ත ලෞකික ලෝකොත්තර ගුණාවබෝධය කොට එම ගුණරත්නාහරණ

ඉන් හා ශ්‍රමණවෙශයෙන් තමන් වැනි කොට සරහා සිටවන ලද සංඝයාවහන්සේ නිසා ම බුද්ධශාසනයාගේ පැවැතීම ද දශ විධවූ ඥානබලාදි කෞශල්‍ය ඥන ඇති සත්‍යක් සම්බුදුවරයන් වහන්සේලාගේ ම ශාසිමහිමයකැ යි සලකම්. එහි උත්තවිතඥදි මහයුයුක්තවූ සත්ත්වයන්වහන්සේලා හැර බොහෝ කලක් ආයු ඇතිව වැඩසිටි බුදුවරයන්ගේ ශාසනය ඒ බුදුවරයන් පිරිනිවි බොහෝකලක් නො පවත්නා හෙයින් බුදුන් ඇතිකල ම මහණවූ සම්මුඛව සිටි ශ්‍රමණයන් වහන්සේ ලහ දෙවනු ව මහණකිස ගත් භික්ෂූන්වහන්සේලා ඔහා එයින් ඔබ්බෙහි තුන්වැනිවූ භික්ෂූ කෙනෙකුන්ව වෙනනෙනෙකුන් මහණ කරවා නිස දීමෙන් ශාසනය වඩනය කොට පවත්වන්ට නො පිළිවන්වන හෙයින් ඒ තුන්වැනි ව පැවිදිලත් භික්ෂූන්වහන්සේලාගේ ආයුෂය පිරිහි මෙන් පසු බුද්ධශාසනය නො පවත්නේ ය.

මදකලක වැඩසිටි අල්පායුෂ්ක බුදුවරයන්වහන්සේගේ ත්‍රිවිධ ශාසනය ඒ බුදුන් පිරිනිවිකල්හි සංඝයාවහන්සේ ම අනු බුඩ කෘත්‍යය ශිඛ කොට පිළිවෙළින් අවුතු කුලදරුවන් මහණකිරීම් කම්සථාන දීම් ආදි ශාසනයෙහි කළමනා තැක් ශ්‍රමණකෘත්‍යයන් හා ධම් දෙශනාදීන් කොට ලොකශාසනාභිවෘඩිය කෙරෙමින් හේතු ඇති සත්ත්වයන්ට සෝවාන් සකෘදගාමි අනාගාමි අර්හන් මාගීඵල ප්‍රතිලාභය කරවමින් නිවන් දක්වා බුඩඛිඝ්‍යානයෙන්ම කෙලවර කාලානන්තරය මුළුල්ලෙහි සංඝයාවහන්සේ ම පිළිවෙළින් ශාසනය පවත්වනසේක.

එසේ හෙයින් උත්තවිතඥවූ මදකලක් ජීවත්ව වැඩසිටි අපගේ භාග්‍යවත් සඩම්ගංගාප්‍රවාහ සඩණී තළාකාශමානවූ නිලොහුරු බුදු රජානන් වහන්සේගේ මේ නෛයාණික ශාසනය ද ඒ ධම්තාවූ පරිද්දෙන් පිරිනිවි පන් දහසක් අවුරුදු මුළුල්ලෙහි විපරිතවූ අන්‍ය දෘෂ්ටි ලබ්ධින් හා මිශ්‍ර නො කොට නිර්මලව සංඝයාවහන්සේ ම පවත්වනසේක. එසේ සසීසසෙවොපකාරවූ නෛයාණික සසීඥ ශාසනයාගේ නොයෙක් ප්‍රභෙදත්වය දැන හැඳින රක්ෂාකිරීමෙන් පැවැත්වීමෙහි යෙදී වසන අනුනය ප්‍රතිඝය දුරුහොට පක්ෂපෙම් මෙන් නෙ. තැමෙන වජ්‍රපතිතඝස්මෙක් ඝෘජුවූ අවඛක අකුපිල ගුණඇති සුගතතථාගත සසීඥ ඔරස පුත්‍රබවට පැමිණියාවූ බුඩ භාෂිත සඩර්මයාගේ ශ්‍රවණයෙන් ම චතුසත්‍යඝාවබොඛවීමෙන් චතුසත්‍යඝ බුඩ යයි කියා ද, බහුශ්‍රුතභාවයෙක් ශ්‍රුතබුඩඝයයි කියාද, මේ ආදි නොයෙක් ප්‍රභෙද ගුණවිශෙෂයට පැමිණ සිටි සියලු ම අෂ්ටාශීති පුද්ගල සංඝයාවහන්සේ ම එම ගුණයෙන් ලොව ඔබලන ලේක. ශ්‍රුතබුදුවරයෝ නම් කවරහුදැයත් බොහෝදේ ඇසූ පිරූ

තැන් ඇතිව බහුශ්‍රැතව විශුද්ධ වූ බුද්ධාගමත් සිතට නැති හැමඅතුන් වෙත පතලාවූ කරුණා ශ්‍රද්ධාදී ගුණාඛ්‍ය ලදින් සත්ගුරුවරයන්ගේ ශික්ෂාත්‍රයෙහි හැසිර නවලෝකොත්තර සද්ධර්මයවූ පරිද්දෙන් පිළිපැද තමන් ආශ්‍රය කළ අතවැසි ආදින්ට ද මේලොව පරලොවදෙකින් ම වැඩ වඩනු පිණිස අවවාදානුශාසනා කොට මසුරු නොව තමා දත් ධර්මාර්ථදිය අන්තෙවාසිකයන්ට ප්‍රගුණ කරවා ඔවුන් විසින් මතු මතුත් බුද්ධශාසනය වර්ධනය කොට සත්පුරුෂ ජනයාට මේලොවින් පරලොවින් වන අර්ථසිද්ධිය සම්පාදනය කොට ලෝ වැඩ වඩනා උත්සාහ වඩනා උපදෙස් දෙමින් තමා පළමුකොට සුදුසු ගුණධර්ම යෙහි පිහිටා සිට අනුන්ට අනුශාසනා කරන්නේ විනාම හේතෙමේ ලොව බබලන්නේ යයි වදරණ ලද්දේ උතුම් බුද්ධානුශාසනාව ඇදී නොයෙක් බුද්ධානුශාසනා සිත තබා ගෙණ පළමුව සවඥියාත්මය දමන යෙහි යෙදී වසමින්.

ඉක්බිතිව ධර්මානෙතවාසිකය නිස්සයනෙතවාසික්‍ය පබ්බජ්ජ නෙතවාසිකය උපසම්පදනෙතවාසිකයයි චතුර්විධවූ අනෙතවාසික යන්ගෙන් සූත්‍රගෙය්‍යාදි ධර්මය පුහුණුකරගන්නා පිණිස එක්ව වසන්නාවූ ධර්මානෙතවාසිකයන්ට අසණ පිරිමාන තැන් කියාදී සූත්‍රාභිධර්ම විනය සඤ්ඤා ධාතු ආයතන ඉන්ද්‍රිය බල බොජ්ඣඞ්ග ධර්මයන් පුහුණුකරවීමෙන් ද නිස ලබාදෙන වාසයකාරණ නිශ්‍රයා නෙතවාසිකයන්ට ද ඔවුන්ගේ වරද නිවරද හිතෙහිඳ සෙවීමෙන් නිරන්තරයෙන් සුදුසු ලෙස අවවාදානුශාසනා කොට ඔවුන් සත්පථයෙහි යොදා ඔවුන්ගේ මෛත්‍රී විඥානය තමා කෙරෙහි ආමන්ත්‍රණපත්‍රයක් මෙන් අලවා ඔවුන් තමා උදෙසා විසීමට ප්‍රිය මනාපභාවය වර්ධනය කරවීමෙන් ද, තමා විසින් පැවිදිකොට ගත් පබ්බජ්ජනෙතවාසිකයන්ට ද එසේම උපසම්පදනෙතවාසික යන්ට ද තමහට පැමිණෙන පමණින් අනුන්ට සිවුපසයෙන් සංග්‍රහ කොට නිරන්තරයෙන් කෘතඥතා වත්පිළිවෙත් ආදිය ද හස්තපාද පිටසිසම්බාහනය ආදිවූ මෙහෙයයෙන්ද හික්ෂාචාරාදිවූ ගමනාගමන යෙහි ඉදිරිපසු යෑමිම් දෙහැවිදිය පෙරැදීම් ආදිවූ වත්‍රප්‍රතිවත්ත ප්‍රතිග්‍රහණයෙන් නොවෙනස්වන ඔවුන් තමන්වෙත ප්‍රියව වාසය කරණසේ වැසවීමෙන් ද,

තවද ලොව ඇත්තාවූ ම ; නිජාත ශිෂ්‍යපුත්‍රය අනුජාත ශිෂ්‍ය පුත්‍රය සඟජාත ශිෂ්‍යපුත්‍රය අවජාත ශිෂ්‍යපුත්‍රය යන චතුර්විධ ශිෂ්‍ය පුත්‍රයන්ද හැඳින ඔවුන් අතුරෙන් අතිජාත ශිෂ්‍යපුත්‍රයන් විසින් තමන්ට කියාලූ අවවාදයෙහි පිහිටා උභයලෝකාර්ථසිද්ධිය සම්පාදන ශට ඒ කියාලූ සම්‍යක්වචනයන් නොපිරිහෙලා සිත්හි තබාගෙණ ඒ වූ පරිද්දෙන් වැඩ සාධාගෙණ විසීම ද සහජාත ශිෂ්‍යපුත්‍රයන් හා

ධම් සාකච්ඡාදි වූ සාම්චි වචනයෙන් කථා කොට දෙ පක්‍ෂයට දෙලොවින්ම වැඩවන සේ සන්තොෂ වීම ද, අනුජාත ශිෂ්‍යපුත්‍ර යාගේ ශාස්ත්‍රාභිලාෂික චිත්තය නො කළඹා කළකිරීමට නො පමුණුවා අධිගමාදි යම්කිසි තැනක් පිවාළ කල එහි ග්‍රන්ථිසාන විසඳ, පහසු කොට ශාස්ත්‍රාගමාදිය ඔවුන්ට පුහුණු කරවාලීමෙන් බහුමාන භාජනව සිටීම ද, අවජාත ශිෂ්‍යපුත්‍රයන්ට දෘෂ්ඨධම් සාම්පරායික අර්ථසිද්ධියට හෙතුවූ වචනයන්ගේ කිමෙන් ප්‍රයෝජන නැති කරුණු දැන හැඳින ඔවුන් පිපි සිටි පියුම් පත්‍රයක් සේ මුඛසන්තොෂය පමණ දක්වා සිසිල සඳුන් මෙන් මියුරු වචනය කිමෙන් සිත්ගෙණ තමා කෙරෙන් ම උගතමනා ශාස්ත්‍රාගමාදිය ඉගෙණ ඔවුන්ගේ හෘදය තැමැති කතුරෙන් ගෞරව ගුණ නැමැති උත්පල පත්‍රයන් ඡේදනය කරන්නාක් මෙන් ගුරුන්ගේ ගුණමකු කොට තමාගේ නුවණින්ම ප්‍රගුණකළ ශාස්ත්‍රමෙන් සෙස්සන්ට ගහවමින් ඔවුන්ගෙන් බහුමාන උපදවනු පිණිස:-

වාමෙන සූකරෝ හොති දක්ඛිණෙන අජාමිගෝ,
සරෙන තෙලකෝ හොති වීසාණෙන ජරගාවෝ'සි.

යනුවෙන් ඒ ඒ තැන අනුවන ජනයන් විස්මයපත් කරවමින් ගුරුන්ගේ පරම්මුඛයෙහි පැමිණි වචනයක් සම්මුඛයෙහි නො කියා අනිකක් කියමින් උන්ගේ ඇතිතාක් සුදුසු ගුණ අගුණ සේ සෙස්සන්ට ප්‍රකාශ කොට හිතෙසිකමක් නො ව හිතෙසි තමන් බැව් ගහවා වසති. එහෙයින් ඔවුන්ට කිවමනා අවවාද ව්‍යඤ්ජන වචනාදිය තමාගේ නුවණින් පරීක්ෂා කොට තත්වූ පරිද්දෙන් දැනගෙණ ඔවුන්ගේ ද සිත් නො තළා සිහිනුවණින් යෙදී ගැළපී විසීම ද, දැනය ශීලය ශ්‍රැතය ත්‍යාගය ප්‍රඥය යන පඤ්චධම්යන් ගෙන් සුකතව ප්‍රතිඝය අනුනය යන පාප ධම් දෙදෙනා කෙරෙන් දුරුව ධම්භූධම් ප්‍රතිපත්ති පූජාදින් බුඩ පූජා කොට ලෞකික ලොකොත්තර සම්පත් සිඩකරණු පිණිස යෙහෙන් වසන්නාවූ ශ්‍රාවකයන් වහන්සේ ශ්‍රැතබුඩ නම් වන සේක.

ශ්‍රැත බුඩවරයන්ගේ සහ අතීජානාදිවූ චතුර්විධ ශිෂ්‍යපුත්‍රයන්ගේ ප්‍රවෘත්තිකථාවෝ නිමියහ.

මේ බුඩශාසනයාගේ අවසානයෙහි මතු පහළවන පඤ්ච ප්‍රකාරවූ අනාගතඥාන කථාවන් අතුරෙන් ධාතු අනාගතඥානයාගේ සහ පඨවීජ්ජති අනාගතඥානයාගේ විභාගය බුඩ ගුණ ධම්විභාග

කොට දැක්වූ පරිවෙජද දෙක්හි ඇතුළත් කොට දැක්වූ බැවින් මෙසිදු දැක්වීයයුතු වූ ප්‍රතිවෙධ ඤාණය ප්‍රතිපත්තියි ඤාණය ලිඛිත ඤාණය යි කියා ත්‍රිවිධ වූ ඤාණ කථාවෝ ම මේ සඞ්ඝගුණ විභාග පරිවෙජදයෙහි ඇතුළත් කොට දක්වනු ලැබෙත්.

එහි ප්‍රතිවෙධ ඤාණය නම් කවරහ? යත්: යම් භියකලද ක්‍රමයෙන් නොයෙක් ප්‍රභෙද ඇති සෝවාන් මාර්ග ඵලය සකෘදාගාමි මාර්ග ඵලය අනාගාමි මාර්ග ඵලය අර්හත් මාර්ග ඵලය යන මේ සතර මග සතර ඵලය ද අභිඥාසමභිදය ධර්මප්‍රතිසම්භිදය නිරුක්තිප්‍රතිසම්භිදය ප්‍රතිභානප්‍රතිසම්භිදය යන සිවුපිළිසිඹියාවන ආදී වූ හැම ලොකොත්තර ගුණය භේදනීයාව පවත් පිරිහෙණ කල්හි සිවුපිළිසිඹියාවේ පවත් ක්‍රමයෙන් පිරිහෙන්නේ ය. මෙසේ ක්‍රමයෙන් මහත් ගුණධර්මයන් පවත් පිරිහීගණ අවුත් සෝවාන් මාර්ගඵට පැමිණීම්ක්වත් නැණිව පිරිහි එයින් නීල කසිණයට ද, එයින් ප්‍රථමධ්‍යානයට ද, එයින් කසිණපරිකර්මාදී යයි යන ධ්‍යානානුලෝමයට ද, එයින් නිමිත්තොත්පාදනයට ද' යි මෙසේ ක්‍රමක්‍රමයෙන් පිරිහි මාර්ගඵල ලත් හැම ශ්‍රාවකයන්ගෙන් කෙළවර අර්හත්ත්වය ලද්දහුගේ ජීවිතය නැසීයාමෙන් අර්හත්ත්ව ශාසනය පිරිහුණේ නම් වේ.

මේ ප්‍රතිවේධ ශාසනඥානය යි.

ප්‍රතිපත්ති ඤාණය නම් කවරහ? යත්: මෙසේ කල්යාමෙන් සතරමග සතරඵලයට පැමිණ තුන්ලොව වැඩ වඩා වැස ක්‍රමයෙන් පරමායු ගෙවුනු කල්හි පුථුවෙහි උත්වහන්දේලාගෙන් ලත් කර්මස්ථානානුකූල කසිණපරිකර්මාදිය කොට තුදුස් ආකාරයකින් චිත්ත පරිදමනය කොරෙමින් සාධිවිකුර්ව්ණ සමාපාදනය ද නිමිත්තොත්පාදනය ද අර්පණාදියට පැමිණීම ද ඡන්දඡුඩ්‍යාදියෙන් චිත්තය මෘදුකිරීම ද අධිෂ්ඨාන විකුර්ව්ණාදී වූ දශවිධ සාධිසමාපාදනාදිය ද නො හැකිව විදර්ශනා කිරීමට උපදෙශයන් නො ලැබෙමින් මාර්ගඵල උපදවන්ට නො හැකි වෙති. එතෙකුදු උවත් උත්සාහකිරීම සුදුසුයයි සිතා ප්‍රතිපත්තිශීලාදී වූ නොයෙක් ගුණ ධර්මයන් රක්ෂා කෙරෙමින් මත්තට හෙතු උවමනා වෙයි දැන ධ්‍යාන භාවනාදිය කොරෙති. මෙසේ උත්සාහ කිරීමෙන් ආලෝකමාත්‍ර යකුත් නො ලැබ කල් යවත් චතුපාරිශුද්ධිශීලය පමණක් රක්ෂා කෙරෙති. එයින් කල් යවත් භික්ෂූහු පිරිසිදුව සිල් රකිම්හ. භාවනා කරම්හ. මාර්ගඵලාධිගමයක් සිද්ධොවගත නො හෙම්හ.

මෙතෙලව ආශ්‍රීධම් ප්‍රතිවෙධයක් නැත්තේය යි කුසීතව අප කොතෙක් උත්සාහ කළත් නො වන දෙයක් නො වන්නේමය. ඊට වැයම් කිරීමෙන් කුමට ව්‍යසන විඳිමිදු යි පාපී අලජ්ජී ඝීන නපුරු කුසීතාධ්‍යාශයෙන් ඔවුනොවුන් කෙරෙහි වරද නිවරද නො සොයා නො දැනීමෙන් නිසැකව ක්ෂුද්‍රානු ක්ෂුද්‍ර ශික්ෂාපදයන් ඉක්මවා වරදට පැමිණෙනුයේ හෙතෙම නුවණ මඳ බැවින් මෙපමණ සුවල්ප වරදක්මය. එසිතුදු උතුනුන් දෙස් ගන්වා කියා ගැළවීමට බුදුන් වදුළ ධම් ඇතැයි වදුළ ලෙසම ඔවුනොවුන් පාමුල්හිදී දෙස්ගන්වා කියමින් මතා අදහසින් සමගිව වෙසෙති. එසින් කල්‌යියකාල සුඛිත මුදිතාහු සවකිය වූ කාය ව්‍යසන විඳිමට නො පිළිවන්ව රූඃඛප්‍රතිපත්ති පිරිමෙහි ප්‍රමාදව වෙසෙති. එසේ ප්‍රමාදව වසන ඔවුන් දුටු අදිශෙෂ භික්ෂූහු ප්‍රතිපත්ති රක්ෂා කෙරීමෙහි උත්සාහ නොවඩති. ඒ රූඃඛ පිරිවෙත් පිරිමෙහි යෙදී වසන භික්ෂූහු රෑ දුවල් දෙක්හි ම සම විෂම කල් නො සලකා නිදි වර්ජිත කිරීම් ආදියෙන් ත්‍රිවිධ දෙශඥන්ගේ උත්සන්නවීමෙන් නොයෙක් ව්‍යාධි උපදවා ජීවිත විනාශාදිවූ අනෙක ව්‍යසනවලට පැමිණෙනු දුඃඛ කුසීත පඤ්චයෙහි සිට ආදීනවානිසංඝ නො දක්නාහු දිවි රැක්කේ සිල් රැකෙයි. සිල් රැක්කේ නිවන් දහම් සාධාගන හැකියයි කියමින් මේ හැම ආදීනව සිහිකොට පිළිවෙත් පිරීමෙහි උත්සාහ නො කෙරෙති. එතැන් පටන් ක්‍රමයෙන් ප්‍රතිපත්ති ශාසනය පසුබැස පිළිවෙළින් ගුරුවර උවදෙස් පිරිහි මෙන් ලොව නැතිවූ කල්හි ප්‍රතිපත්ති ශාසනය පිරිහුණේ නම් වේ. මේ **ප්‍රතිපත්ති අන්තර්ධානය** යි.

ලිඛිත අන්තර්ධානය නම් කවරහ? යත්: මේ බුදුශාසනය මෙසේ පවතිමින් සිව පිරිහිමෙන් කල්යත් යත් භික්ෂූහු සිවුරු වළඳිනාකල ඊට ශික්ෂාපද පැණවූ ලෙස සිවුරු නො වළඳිති. හස්ත පාදාදි වූ ඉන්ද්‍රිය සංයමයෙහි යෙදී සත්පුරුෂයන් ගා විනය දන්නා සුණවන්න උපාසක ජනයන්ට සතුටු උපදනායේ වාසය නොකරති. භික්ෂූහු පාත්‍රය පසුම්බියෙහි ලා ත්‍රිවයෙහි එල්වා, ගෙණ භික්ෂාවෘත්තියෙහි ඇවිදිති. එසින් කල් යත් යත් පාත්‍රය අල්ලෙහි තබා ගෙණ හෝ උරෙහි තබා ගෙණ හෝ ලබුකබල් ගත් තීර්ථකයන් මෙන් භික්ෂාවෘත්තියෙහි ඇවිදිති. වළඳිනා සිවුරුත් රඳගන්නා කල විනයානුකූල ලෙස සරුප් සැපියේ නො රඳති. රඳතත් ඔටු ඇට පැහැයක් මෙන් මදක් කසාවන් කොට රැවූ පමණකින්ම මද දැ යි කියා සිවුරෙහි අගෞරවයෙන් කැප ලෙස නො රඳම සිවුරු වළඳිති. තවද

කල්යාමෙන් එපමණවත් රඳන්නොකොට කඩෙහි දවළු පම
ණක් සිඳහැර දියතනකින් තෙමා කලල් කොට වළදිති.
එසින් කල්හිය කල්හි නැවත දහවලු පමණක් සිද පරිවාජක
යන්මෙන් වසනුය දෙපවකොට හිනවට පවක් දවටා පවකින්
උරය වසා පොරවා ගෙණ දඹබිමට යන්නවුන්මෙන් අපි හිඤු
වම්හයි කියා ඇවිදිනි.

නවද කල් යත් යත් මෙපමණකිනුත් ප්‍රයෝජන කිම්
දැයි වසනුය හැඳගෙණ කසාකඩරෙද්දක් බොටුවෙහි බැඳ
ගෙණ හෝ හිස වසාගෙණ හෝ අපි හිඤුම්හ යි කියා
ඇවිදිති. එපමණ හිඤු හාවයකින් පුත්‍ර දාරයින් සහිතව
තුමූ සැපයෙන් ජීවත්ව ගතකොහි කෘෂි වණිජ් ආදිවූ අගා
රික කර්මාන්තයෙන් ජීවත්වෙති. එතැන් දක්වා බවුන්ට දන්
දෙන්නාහු සඛයා උදෙසා දක්ෂිණාව දෙද්ද එකල්හි ඒ
දානය සඛයා උදෙසා දුන් හෙයින් දායකයන්ට අසංඛෙය්‍ය
අප්පමෙය්‍ය විපාක දෙන්නේ යයි ආනන්ද ස්ථවිරයන් වහන්සේට
බුදුරජතෙම "හවිස්සනති බෝ පනානන්ද අනාගතමඛා
නං ගොත්‍රභුනෝ කාසාවකණ්ඨා දුස්සීලා පාප ධම්මා තෙසු
දුස්සිලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්ති තදුපහං ආනන්ද සංඝ
ගතං දක්ඛිණං අසංඛෙය්‍යං අප්ප මෙය්‍යං වදාමි"යි- සංඝගතදාන
යෙහි අනුසස් මෙසේ මහත් බව ප්‍රකාශකොට වදාළසේක.
නැවත කල්යත් යත් ඔහු තුමූ මෙසේ සිතත් අපි ප්‍රාණ
ඝාතාදි අකුසලුත් කරම්හ. සී වප් ආදි කෘෂි කර්මාදියත්
කරම්හ. මෙසේ ශ්‍රමණ වෙශයට පිටත් නොපණත් නුසුදුසු
දෑ කෙරෙමින් බුදුන්ගේ අසීදිඛඩජයවූ විවරය කරබැඳගෙණ ඉඳ
පවිපුරුගන්නේ කිම්දයි කියා බොටුවෙහි දවටාගත් කසා
රෙදි කඩ කඩා කැලැපිට දමා දැසින් හිස පිරිමැද ඉදින් සහ
පත්, ගත් වෙශයෙන් මිදිගියම්හ යි ස්වීය ගෘහයට ගොස්
පුත්‍රදාරාවන්ට එපවත් කියා එතැන් පටන් තමන්ගේ
පුත්‍රදාරාවන් රක්ෂාකොට ජීවත්වෙති. මෙසේ ශ්‍රමණ වෙශය
ඉතාමදකුත් ලොවනැනිවම නැතිවීමෙන් මහණ වෙශය යන
ලිඞ්ගශාසනය පිරිහුණේ නම් වේ. මේ ලිඞ්ග අනතර්ධානය යි.

මෙසේ ලෞකික ලොකොත්තර වශයෙන් විප්‍රකාරවූ සවි
ශ්‍රාමණ්‍ය ගුණයන් ප්‍රකාශකොට දෙව් මිනිසුන් සහිත සියලු
ලොකයාට කරුණ ලද සඛමීානුශාසනාව ඇති හෙයින් සඛමී
මාත දැයකවූ මාගේ බුදුහු ශාස්තෘ නම් වනසේක. එසේ
හෙයින් කියනලදී.

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං
දදන්‍යානං දමඝනතානං පුරිසා ජඤඤ තෙ නමෝ-යි.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සඛමීාවවාද සංග්‍රහයෙහි
සඞ්ඝගුණ වණිනා නම්වූ චතුර්ථ පරිච්ඡෙදය
කියා නිමවනලදී.

මෙසේ සතරවන පරිවෙජ්දයෙන් සඞ්ඝ ගුණ වර්ණනා කිරි මෙන් ලෝවැඩ දක්වා ර්ට අනතුරුව දක්වන ශීල කථාවන් අතුරෙනුදු යථොක්තප්‍රකාරවූ විශෙෂ ගුණ වර්ණනා ඇති විසු ඔවූ බුබාදි රත්නත්‍රයෙහි සරණයම සියලු සත්වයන්ට පිහිටවන කාරණයෙන් සරණ නම් වෙයි. එහෙයින් සරණාගමන සීල යාගේ ප්‍රභෙද පභෙදානිසංස වර්ණනා කථාවෝද මදක් මෙහි දක්වනු ලැබෙන්. හේ කෙසේ ද? යත්; අසරණ සරණ සරණා ගත වත්‍රපඤ්ජර කාරුණිකධානවූ භාග්‍යවත් ශාක්‍යෘන් වහන් සේ විසින් බරණැස ඉසිපතනාරාමයෙහි දී යස කුලපුත්‍රාදීන් පැවිදිකොට රහත්ඵලයට පමුණුවා ලීමෙන් බොහෝ සත්ව යන්ට හිතසැප පිණිස ධම්දෙශනා කරණ සමයෙහි සියලු දිව්‍ය මනුෂ්‍යාදීන්ට උපාසක භාවයෙන් හෝ පැවිදි ලබන්න වුන්ට ප්‍රව්‍රජිත භාවයෙන් හෝ පළමු කොටම සරණාගමන විමෙන් මේ බුදුසස්නට බස්නා පිණිස, "බුඞ්ං සරණං ගවජ්ාමි, ධම්මං සරණං ගවජ්ාමි, සඞ්ඝං සරණං ගවජ්ාමි," යන මේ සරණා ගමන සූත්‍රය බුදුන් විසින්ම වදාරණලදි.

එහි සත්වයන්ට වන සියලු සංසාර භයද විවෙකානුත්‍රාසයද කායික දුකඛ වෙදනාවද සතර අපායෙහි දුකඛයද යන මේ සියලුම දුක් නසන හෙයින් මේ බුබාදි රත්නත්‍රයට සරණය යි යනු නමෙකි. ඉදින් වෙන්වෙන්කොට ඒ තුණුරුවන් ගුණ සලකතහොත් ලෝක යාට සරණවූ සුපුෂ්පිත මහ පියුමක් වැනි බුදුන්ද ඒ පියුම්හි උපදනා මධුර රසය වැනි ධම්මයද ඒ මධුර රසය පිමෙන් සතුටු වන භාඛ්‍ය සමූහයා වැනි සඞ්ඝයා වහන්සේද යන තුණු රුවන් ගුණ සිහිකරණකල සීලසමාදානාදි හැම ගුණයන් දෙශනා කොට එහි සත්වයන් යොදා පැවැත්වීමෙන්ද ප්‍රාණ ඝාතාදි පාපකර්මයෙන්වන නොයෙක් අනිෂ්ටවිපාක ආදීනව දක්වා පවිකිරීමෙන් වැළකීමෙන්ද නිතානිත දැන සෙවන අසෙව නාදි වසයෙන් දුකඛය නසන හෙයින් බුදුහු සත්වයන්ට සරණ නම් වනසේක. සසර කාන්තරින් සත්වයන් එතර කිරීමෙන්ද කිසියම් අස්වැසිමක් නැත්තාවූ සත්වයන් අස්වසා ලීමෙන්ද සියලු සසරභය නසන හෙයින්ද ධම්මයද සත්වයන්ට සරණ නම් වන්නේය. ලෝකයා විසින් දන්දීමෙන්ද පූජාකිරීමෙන්ද පමුණුවනලද සවලප සත්කාරය පවා ඔවුන්ට මහත්ඵලානිසංස ඇතිකරණ හෙයින් පුණ්‍යක්ෂෙත්‍රවූ අෂ්ටාර්‍යපුද්ගල සඞ්ඝයා වහන්සේද සත්වයන්ට සරණ නම් වනසේක.

මෙසේවූ සරණගුණයෙන් යුත් තුණුරුවන් ගුණ විශෙෂ ත්‍රිවිධ රත්න බවද ගුරු ගුණවර්ණනා පරිවෙජ්දවල දක්වන ලද

ක්‍රමයෙන් අසා දැන එසේ සිහිකිරීමෙන් පළමු සිත්හි පැවති දෘෂ්ටිදෝෂකයද, මූලාවීමද අශ්‍රද්ධාවද, දුරුකොට බුද්ධාදි රත්නත්‍ර යෙහි ප්‍රසන්නබවද, ගුරුත්වයද, සිත්හි වඩාතගණ සංසාර යෙහි ජාතිදුක් ආදිවූ සියලු දුකට හාජනව අනාථව දුකින්ම පිඩිතව හැසිරෙණ අපට සසරකතරින් එතරවීමට උවදෙස් අවවාද දීමට බුදුන් හැර අන් කෙනෙක් නැතැයි කියාද, ඒ සසරින් එතරවීමට පය්‍යාප්ති සහිතවූ නවලෝකොත්තර ධර්මය හැර අන්පිහිටෙක් නැතැයි කියාද, වඤ්චනාමානාදි වශ යෙන් කරණලද සත්කාරය මහත්ඵලකිරීමට අයොග්‍යපුද්ගල සඞ්ඝයාවහන්සේ හැර අන් පිහිටෙක් නැතැයි සිතින් අදහා ගෙණ මට මේ රත්නත්‍රයෙහි සරණයම සරණයයි දැන සිත්හි තබාගෙණ බුදුන් වදාළ පාලිය වූ පරිදිදෙන් 'බුද්ධං සරණං ගච්ඡාමි,' යනාදි බහිනුත් කියා රත්නත්‍රයෙහි සරණයාම සරණා ගමන නම් වේ.

ඒ සරණාගමනය තෙම ලොකොත්තර සරණාගමනය ලෞකික සරණාගමනයයි කියා විප්‍රකාරවේ. එසින් **ලොකොත්තර සරණාගමනය** නම් සඞ්ඝයාගේ අප්‍රමාදය හෙතු කොට ගෙණ දුඃඛාදි චතුස්සත්‍යයන්ගේ අවබෝධ වීම හා සමග සෝවාන් මාගියට පැමිණි ක්ෂණයෙහිම සරණ යට විරුද්ධ ක්ලේශයන් සමුච්ඡේද ප්‍රහාණයෙන් නසා පැමිණි හෙයින් චිත්තය නිර්වාණයට අරඹුණු වීමෙන් රත්නත්‍ර යෙහි අචල ප්‍රසාද සිත් ඉපදවීමෙන් ලොකොත්තර සරණා ගමනයාගේ පිහිටීම වන්නේය. මේ ලොකොත්තර සරණා ගමනයාගේ ඵලානිසංස කෙසේද? යත්, සෝවාන් ඵලය සකෘ දාගාමි ඵලය අනාගාමි ඵලය අර්හත්ඵලය යි යනමේ චතුර්විධ වූ ශ්‍රමණඵලය විපාකඵලය නම් වේ. සියලු සසරදුකින් මිදීම අකුසස් නම් වන්නේය. එබදු ලොකොත්තර සරණාගමන යාගේ කිලුටු බවෙක් වත් බිදිමෙක් වත් නොම ඇත්තේයි. ඒ කවරහෙයින් ද? යත්, භවාන්තරයෙහි ද මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අන්‍ය ශාස්තෘ කෙනෙකුන් අපට සරණ යේකැ යි නො කියන්නේය.

තවද මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙම රහත් නොව භවාන්තර ගතවූයේ ද තමාගේ ප්‍රාණය පරිත්‍යාග කරන්නේ වී නමුත් අන් ප්‍රාණයක් නො නසන්නේය. සුරාපානාදියක් නො කරන්නේය. හේ මෙසේයි.

ගම්සේ ජාතිසම්පන්න හංස තෙම කිරි හා ජලය මිශ්‍ර කොට වත්කළත් ජලය එක් බින්දුවකුත් නොගෙණ තෝරා හැර කිරිපමණක්ම පානයකරන්නේද, එපරිද්දෙන් ම ආර්‍ය්‍ය

ශ්‍රාවක තෙමේද සුරා මිශ්‍රාහාරණ ලද ක්ෂීරයක් මුඛයෙහි වත් කළ කල කිරි පමණක්ම ගිලෙන බව මිස සුරා බින්දුවකුත් නොගිලෙන්නේය. මේ ලොකොත්තර සරණයාගේ ප්‍රභෙදනිසංසයයි.

ලෞකික සරණාගමනය නම් පෘථග්ජන සත්වයන්ට ශ්‍රද්ධාමූලිකා සම්‍යග්දෘෂ්ටිය හෙතුකොටගෙණ සිඛවන්නාවූ සරණය ලෞකිකා සරණාගමනය නම් වන්නේය, හෙද බුඛාදි රත්නත්‍රයෙහි ගුණ මහත්වය ප්‍රඥසම්පන්න සත්වයන්ගේ සිතට නිශ්ශංකාව අරමුණු කොට ගෙණ සරණාගමනයන්ගේ කිළිටු ආරණයන්ගෙන් දුරුව ශ්‍රද්ධාමූලිකව පවත්නාවූ සම්‍යග්දෘෂ්ටියවූ දශපුණ්‍යක්‍රියා වස්තුයෙහි සිත ඍජුභාවය ලැබීම සරණාගමන නමැයි කියති. මේ සරණාගමනය වනාහි **ආත්මසන්නියාතනය තත්පරායන තාය ශිෂ්‍යභාවුපගමනය ප්‍රාණිපාතයයි** කියා සතරවැදෑරුම් වන්නේය. එයින් ආත්ම සන්නියාතන නම් කිසි ශ්‍රද්ධාවන්ත පුරුෂයෙක් සිතත්‍රයේ අදපවන් මාගේ ආත්මය තුණුරුවන්ට පරිත්‍යාග කෙළෙමියි කියා ආත්මය තුණුරුවන් විෂයෙහි පූජාකෙළෙමියි කියා ආත්මපරිත්‍යාගයෙන් යෙදී "අජ්ජාදිං කත්වා අහං අත්තානං බුඛස්ස නියාතෙමි" යි කියාද "අජ්ජාදිං කත්වා අහං අත්තානං ධම්මස්ස නියාතෙමි" යි කියාද, "අජ්ජාදිං කත්වා අහං අත්තානං සංඝස්ස නියාතෙමි" යි කියාද, යන මේ වචනයන් වාග්භෙද කොට කියා මාගේ ජීවිතය තුණුරුවන්ටම පිදීමි පිදිමියි; ආත්ම පර්‍යන්තව ජීවිත පර්‍යන්තාව බුදුන්ම සරණ යෙමියි බුදුන්ම මට සරණය රක්ෂස්ථානයක නිලීයස්ථානයක උතුම් පිහිටකැයි යනාදින් ආත්මය පිදීමෙන් සරණ ගත්තේ ආත්ම සන්නියාතන සරණාගමනයේ පිහිටියේ නම් වේ.

තත්පරායනතා නම් අද පටන් මට තුණුරුවන් සරණය පිහිටය යි කියා "අජ්ජාදිං කත්වා අහං බුඛපරායනෝ, අජ්ජාදිං කත්වා අහං ධම්මපරායනෝ, අජ්ජාදිං කත්වා අහං සංඝ පරායනෝ ඉති මං ධාරෙථ" යන මේ වචනයෙන් බුඛාදිවූ රත්නත්‍රයෙන් මට පිළිසරණ සේකැයි කියා මෙසේ සරණ ගැන්මෙන් ආලම්බනාදින්ට සේ තත්පරායන සරණාගමනය පිහිටන්නේයි; ශිෂ්‍යභාවුපගමනය නම් "අදපටන් මම තුණුරුවන්ටම අතවැසිමි" යි කියා සාඤ්ඤ කොට මෙසේ ත්‍රිවිධරත්නයට ශිෂ්‍යභාවයට පැමිණීමෙන්, "අජ්ජාදිං කත්වා අහං බුඛස්ස අන්තෙවාසිකෝ, අජ්ජාදිං කත්වා අහං ධම්මස්ස අන්තෙවාසිකෝ, අජ්ජාදිං කත්වා සංඝස්ස අන්තෙවාසිකෝ ඉති මං ධාරෙථ" යන මේ වචනයෙන් බුඛාදි රත්නත්‍රයෙහි ශිෂ්‍යභාවයට පැමිණියෙමියි කියා සරණය ගැනීම

මෙන් ශිෂ්‍යභාවූපගමන සරණාගමනයෙහි පිහිටන්නේය. ප්‍රණිපාතය නම් "අද පටන් මම බුඩාදි තුණුරුවන්ට සරණය පිණිස වදිමි. තුණුරුවන් කරා එලඹෙමි. තුණුරුවන් දැකම සතුටුවෙමි. අනිත් ශාස්තෘකෙනෙකුන් වැඳදැහැ අනුශාසනා ඇහිසේකැයි නොකියමි. වෙන ශාස්තෘකෙනෙකුන්ට අඤ්ජලිකර්මී සාමීචිකර්මයක් නොකරමි. මේ බව හැමදෙනාම දනිත්වා" යි කියා සාක්ෂ්‍යකොට බුඩාදි රත්නත්‍රයෙහි මහත් ආදරයෙන් යටත්ව නිවපුවෘත්තියෙන් භක්තිඇතිව පැවතීමෙන් "අජ්ජාදිං කත්වා අහං අඥිවාදනං පවවුඨානං අඤ්ජලි කම්මං සාමීචිකම්මං බුඩාදීනං යෙව නිණ්ණං වත්‍ථූනං කරෝමි ඉති මං ධාරෙථ," යන මේ වචනය කියා බුඩාදිවූ රත්නත්‍රයට ඉතා මහත් ආදර කරමින් සරණය ගැන්මෙන් ප්‍රණිපාත සරණාගමනයෙහි පිහිටන්නේය. එහෙයින් තුණුරුවන් සරණයන උපාසක කෙනෙකුන් විසින් හෝ උපාසිකා කෙනෙකුන් විසින් හෝ මෙකී සතරප්‍රකාරයන් අතුරෙන් එක් ආකාරයක් කරන්නාහු විසින් ත්‍රිවිධරත්නයෙහි සරණගත වූයේ නම් වේ. තවද යමෙක් මාගේ ජීවිතය ආත්මය බුදුන්ට පූජාකෙරෙමි. විත්තය පිදීමි ජීවිතප්‍රමාණයෙන් තුණුරුවන් සරණ ගණිමි. ජාතිප්‍රමාණයෙන් තුණුරුවන් සරණගණිමියි හවප්‍රමාණයෙන් තුණුරුවන් සරණ ගණිමි. මට ත්‍රිවිධරත්නයම ප්‍රතිෂ්ඨාධාරය ත්‍රිවිධරත්නයම රක්ෂාස්ථානය ත්‍රිවිධරත්නයම සියලු සසරභයින් මිදී සැහැසීමට නිසි නිලීයනස්ථානය ත්‍රිවිධරත්නයම පරම ප්‍රතිෂ්ඨාධාරය යි කියා මෙසේ පිහිටීමද, **ආත්ම සන්නිය්‍යාතන සරණාගමන නම්** වෙයි.

තවද ඒකාන්තයෙන්ම අන්‍යශාස්තෘවරුන්හු උතුමැයි භක්තියෙන් නොගණිමි. මාගේ සම්‍යක් සම්බුඩ රාජොත්තමයන් වහන්සේම දකිමි. මාගේ ශාස්තෘන් වහන්සේ ම දකිමි. මාගේ සවීඥයන්වහන්සේම දකිමි. මාගේ දීපදෙත්තමවූ මුනීන්ද්‍රයානන් වහන්සේම දකිමි. මාගේ ලොකනාථවූ අනධිවරයානන් වහන්සේම දකිමියි යනාදීන් මේ වචනයන් කියා මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් ගත් සරණය **ශිෂ්‍යභාවූපගමන සරණාගමන නම්** වේ.

තවද "සෝ අහං විවරිස්සාමි ගාමාගාමං පුරාපුරං නමස්සමානෝ සම්බුඩං ධම්මස්ස ච සුධම්මතං" යනාදීන් ආලවකාදීන් විසින් ගත් සරණාගමනය **තත්පරායන සරණාගමන නම්** වේ.

තවද ඉත්මායු නම් ඉාත්මණතෙම ලොවුතුරා බුදුන් දැක තමා හුන් අස්තෙන් පැනනැඟී උතුරුසළුව එකාංසකොට බහාගෙණ

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාද යුග්මයට පසඟ පිහිටුවා වැඳ සිඹ සහා දැතින් දෙ පතුල හඹා හඹා හිස පිසිමින් "සවාමීන්වහන්ස! මම බ්‍රහ්මායු බ්‍රාහ්මණ නම් වෙමි" යි කියා තුන්විටෙක නම අස්වා කියමින් ද හත්තාවූ සරණය ප්‍රණිපාත සරණාගමන නම් වේ.

තවද නැගෙන්ට කුලාචාර නිසා වැඳීමය, රජ්ජුරුවන් ආදී ශ්‍රෙෂ්ඨයන්ට භය නිසා වැඳීමය, ගුරුවරයන්ට ශිල්ප ඉගැන්වීම පිණිස වැඳීමය යන මේ නමස්කාර කිරීම් හේතුකොට ගෙණ සරණය පිහිටන්නේ ත් නො වෙයි, බිඳෙන්නේ ත් නො වෙයි, යමෙක් මනාහි මුන්වහන්සේ අග්‍ර දක්ෂිණාහි සේක යනාදීන් බුබාදි රත්නත්‍රයට නමස්කාර කරන්නේ වී නම් සරණයෙහි පිහිටන්නේ වෙයි. එසේ පිහිටි සරණ ඇති සත්‍වතෙම මිථ්‍යාලබ්ධි ඇත්තොතුහුට මූ මාගේ නැකෙනෙකැ යි කියා වත් උන්කෙරෙහි භයෙන්වත් උගන්නා ශිල්පයක් නිසාවත් කරණලද නමස්කාරය නිසා සරණයෙන් පිරිහෙන්නේ ත් නො වෙයි. තවද ඤාතිවශයෙන් වැඳීම නම් යම්සේ ශාක්‍ය වංශයෙහි උපන් කෙනෙක් හෝ කොලියවංශයෙහි උපන්කෙනෙක් හෝ බුදුහු අපට ඤාති සම්බන්ධයක් ඇතිසේක. නැකමින් ඉතිරි ව සිටිනා නැනැත්තන් වහන්සේට නො වැඳීම යහපත් නො වන්නේය යි සිතා ශාක්‍ය කෝලියයෝ එපරිද්දෙන් වඳින් ද ඔවුන්ගේ ඒ වැඳීමෙන් සරණය පිහිටන්නේ නො වෙයි. යමෙක් සිතනකල මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ලොකපූජ්‍යසේක. මහත්වූ ආනුභාව ඇතිසේක. එසේවූ මුන්වහන්සේට නො වැඳි කල්හි අහසී යක් පමුණුවා ලනසේකැ යි සිතා හඟින් වඳිද්ද, එසේ වැඳීමෙනු දු සරණ පිහිටන්නේ නො වෙයි. යමෙක් සිතනකල බුදුන් බොධි සත්ත්වකාලයෙහි පහළකළ යම්කිසි ශිල්පයක් උගත්තේ ද ඒ බව සිහිකෙරෙමින් හෝ බුදුවූ කාලයෙහි පහළකොටදුන් ශිල්පයක් සිහිකොට හෝ නොහොත්,

එකෙන හොගෙ භුඤ්ජ්‍යය-වීහි කමමං පයොජයෙ
වතුත්ථං ව නිධාපෙය්‍ය-ආපදසු හවිස්සති.

යනුවෙන් වදරණලද අනුශාසනාවක් ඉගෙණ හෝ මුන්වහන්සේ මාගේ ආචාරීන් වහන්සේයයි කියා වඳින්නේ ද එසේ වැඳීමෙන් සරණය පිහිටන්නේ නො වෙයි, තවද යමෙක් වනාහි මේ සම්බුදුරජාණන් වහන්සේ සියලු ලොකවාසී සත්වයන් විසින් කරණලද සියලු ම ගුනමානාදී සත්කාර පිළිගැන්මෙන් සියලු අභිවාඩි වඩවඩා කිරීමෙන් සියලු සැපදෙන්නාවූ අග්‍රදක්ෂිණාහි භාවයෙන් උත්තමවූ නිවන්සැප දෙන මැනිකෙනෙකුන් වහන්සේ ය යි; කියා මහත්වූ ශ්‍රද්ධාචිත්තයෙන් නමස්කාර කෙරෙද් ද

එසේ ම ධර්මයට ද ආදර උපදවා එබඳු බුදුරජාණන් වහන්සේ කෙරෙන් ම පහළවූ උතුම් නෛයාණික ධර්මය යි කියා නමස්කාර කෙරෙද්ද, එසේ ම සංඝරත්නයට ද ආදර උපදවා එබඳු සඳර්මයට භාජනවූ සියලු ලොකයාහට පින්නෙතක් ව සිටි මහා පිළිවෙත්හි යෙදී වසන බුඩපුත්‍රවූ උතුම් අෂ්ටාර්‍යපුද්ගල සංඝයා වහන්සේ ය යි කියා ආදර උපදවා නමස්කාර කෙරෙද්ද, එසේවූ නමස්කාර කිරීමෙන් සරණගතවූ යේ වේ.

මෙසේ පිහිටි සරණඇති හැමදෙනා විසින් ම යථාකියාකලද ක්‍රමයෙන් මිත්‍යාදෘෂ්ටි ගත්තවුන් ආදි කිසිවක්හට මොහු අපගේ සියලු දුකට පිහිට වන්නේය යි දෘෂ්ටිවශයෙන් ආදර උපදවා වැඳීමෙන් සරණකොට ගැන්මෙන් මේ උතුම් බුඩාදි රත්නත්‍රයෙහි සරණය බිඳීමට ද නො පමුණුවා තුණුරුවන් ගුණ නො දැන් මෙනු ත් සැක කිරීමෙනුත් ගුණ අගුණකොට සිතා ගැන්මෙනුත් තුනුරුවන්ට අනදර කිරීමෙනු ත් සරණය කිලුටුවන හෙයින් එබඳු කිලුටුභාවයකට ද නො පමුණුවා නුවණැත්තන් විසින් ලෞකිකසරණාගමනය රක්ෂාකට යුත්තේය;

ඒ තුණුරුවන්ට අනාදර නම් කවරහ? යත්, බුදුන්ගේ ශාරීරික ධාතු පිහිටුවා කළ දාගැබ් ආදියට ආඝාතාව ඉඳ එහි ගොස් නො වඳ ද වෛද්‍යය පේණතන්හි උරදෙක වසා පෙරවා සිටි ද, පත් කුඩආදිය ඉසට කොට යේ ද, වහන් නැගියේ ද, පෙණෙන තැන සිට ස්නානය කෙරේ ද, මල මූත්‍ර කෙරේ ද යන ආදි වශයෙන් බුදුන්ට අනාදර දැ කිරීමය, බණ ඇසීමට කැදවූ කල්හි බණ අසන්ට නො යේ ද, ආදර ඇතිව නො අසා ද, කථාකොට අසා ඉදී ද සකස් කොට බණ නො ඇණිද, ආදර ඇති ව අනුන්ට නො කියවාද යන මේ ආදිවශයෙන් ධර්මයට අනාදර කිරීමය, භික්ෂූන් හුන්තැනින් අවසර නො ගෙණ හිදී ද, අවසර නො ගෙණ බණ කියා ද, ප්‍රශ්න ඒසදද, භික්ෂූන් ඇඟ ගැසියේ ද, එසේ ම ඉදී ද, පිළියෙන් හෝ අතින් හෝ අකවටු ගන්වාගෙණ හිදී ද, සඟමැද දෙවුරු වසාපෙරව ගෙණ ඉදී ද, කුඩපත් ඉසවකොට සිටී ද, වහනා නැගිසිටී ද, යන මේ ආදිවශයෙන් කරණ අනාදර එකතම කට කළ අනාදර සියලු සඞ්ඝයා වහන්සේට කළ අනාදර නම් වෙයි. ඒ සඞ්ඝරත්නයට අනාදර කිරීමය යන මේ ආදී ක්‍රමයෙන් පවත්නා අනාදර තුණුරුවන් විෂයෙහි කිරීමෙන් සරණාගමනා දිය කිලුටු භාවයට දැමිණීමෙන් මහත්ඵල මහානිසංශ නැති බව දැන එසේ කිලුටු භාවයට ම නො පමුණුවා සරණාගමනය පිරිසිදු වම රක්ෂා කට යුත්තේ ය.

මෙසේ රක්නා ලෞකික සරණාගමනයෙහි අනුසස් කවරහ? යත්, සුගති භවයේ උපදවා සම්පත් ලැබීම ද සියලු හොඟ

සම්පත් ලැබීම ද එහි ඵලනම් වන්නේය, මෙම ලෞකික සරණාගමනය සාවද්‍ය නිරවද්‍ය වශයෙන් විප්‍රකාර වේ. එහි සාවද්‍ය නම් වරද සහිතබව යි. එයින් අනිෂ්ටවූ අපල වූ දුක්විපාක ඇත්තේය. අන්‍ය ශාස්තෘන් කෙරෙහි ආත්ම පරිත්‍යාග කිරීමෙන් හෝ ඔවුන් ම සරණ කොට පිහිට සිතා ගැන්මෙන් හෝ "අද පටන් මම අන වැස්සෙමි" කියා ශිෂ්‍යභාවයට පැමිණීමෙන් හෝ යටත් නිවැ පැවතුම් දක්වා සරණය ම සිතා වැඳීමෙන් හෝ සරණය බිඳෙන් නේය. එසේ ශාස්තෘ නම් ලද මිථ්‍යාලබ්ධි ඇත්තාවූත් විසින් පණවනලද එකාන්තයෙන් අධර්මවූ ඔවුන්ගේ ධර්මයෙහි ද ඒ ධර්මානුගත පිළිවෙත්හි යෙදී වසන මිථ්‍යාශ්‍රාවකයන් කෙරෙහි ද ආදර උපදවා ගුණවශයෙන් ඔත්හි තබාගෙණ ආත්ම පරිත්‍යාග දිය කිරීම හෙතුකොටගෙණ සරණාගමනයෙදෙය වන්නේය, යම් කෙලෙක්හි ඔවුන්ගේ ගුණවශයෙන් කල්පනා නොකොට අන්‍ය ශාස්තෘන් හා ඉසුරුමත් රාජාදීන් විසින් යම්කිසි කාරණයකින් සරණවශයෙන් කොසිතා සහාය උපකාරාදියක් පතා ආත්මය පරිත්‍යාග කිරීමෙන් සරණභෙදය නොවන්නේය.

එසේ ම යම් කෙලෙක්හි ගුණවශයෙන් කල්පනා නොකොට සහාය උපකාර වශයෙන් සලකා තත්පරායණ වීමෙහුදු සරණය නොබිඳෙන්නේය, එසේ ම යම්කෙලෙක්හි කිසිකෙනෙකුන්ගේ ගුණ වශයෙන් කල්පනා නොකොට යම් කිසි කර්මස්ථානාදි ශිල්පයක් උගන්නා පිණිස ශිෂ්‍ය භාවයට පැමිණියේ වේ ද එයින් සරණය නොබිඳෙන්නේය, යම් කලෙක්හි වන්දනාදිය කරණුයේ නිර්ලිකාදීන් දක්ෂිණාර්හ වශයෙන් ම කල්පනා කොට අප විසින් කරණලද වන්දනාදිය ලැබීමෙන් මහත්ඵල සැදැ දෙන්නේය" යි සිතා වැඳීමෙන් ම සරණය භෙද වන්නේය, නිර්ලිකයන් කෙරෙහි පැහිදිවූ මේ අපගේ නෑ කෙනෙකැයි සිතා වඳනාහුගේ සරණය නොබිඳෙන්නේය, ලොකප්‍රජ්‍යවූ රජතෙම නොවැදිකල අනෂ්ඨ කරන්නේ ය යි හඟින් වඳින්නහුගේ ද එසේ ම යම්කිසි ශිල්ප ශෙක්හි නිර්ලිකයෙකු දු "මාගේ ආචාර්‍යයි කෙනෙකැ"යි සිතා වඳින්නහුගේ ද සරණය නොබිඳෙන්නේය. එසේ ම යම්කිසි වක්හුගේ අන්‍යවූ ද බහුශ්‍රැත හාවාදි ගුණයන් සලකා ගෞරව උපදවා වැඳීමෙහු දු සරණය නොබිඳෙන්නේ මය, එහි නිරවද්‍ය විපාක නැති හෙයින් අඵලයි, කාල පරිච්ඡේද නොකොට ගන්නා ලද ඒ මෙ සරණාගමනය තෙම ජීවිතාවසානය දක්වා පැවතීම වත බැවින් හා ව්‍යතවන ස්කන්ධයන්ගේ විනාශය හා සමකල් පැවතීම ඇති හෙයින්ද මරණය හා එක්ව බිඳීම වන්නේය.

ඒ ලෞකික සරණාගමනයාගේ භෙදය සාවද්‍යය නිරවද්‍ය ය යි කියා විප්‍රකාර වන්නේය, එහි අනික් ශාස්තෘවරයෙක්හට

ආත්ම පරිත්‍යාගය කිරීමෙන් සරණය බිඳීම සාවද්‍ය නම් වන් නේය. මරණින් මතු ශරීරයාගේ බිඳීම නිරවද්‍යනෙදය නම් වන් නේය. "කාලපරියන්ත ව පිහිටා ගත් සරණශීලයාගේ ඒ කෙළවර වූ කාලයෙන් මත්තෙහි යම් නො පැවැත්මක් ඇද්ද නො පැවැත් ම භෙදව්‍යවහාරයක් කැත ද කාලපර්‍යන්ත ව සමාදන්වූ ශීලයාගේ කෙළවර වූ කාලයෙන් මත්තෙහි නො පැවැත් ම මෙනැ" යි ප්‍රතිපත්තිසංග්‍රහයෙහි දක්වන ලදී. එසේ ම මරණින් ඔබ්බෙහි සරණභෙදය ඇති නමුදු මත්තෙහි උපදනා ජාතිවල සුවරිත කාරණ ඇතිවීමෙන් ජීවිතාන්තය දක්වා රක්‍ෂා කළ වූ සරණශීලය තෙම විශෙෂ හානී වන්නේය. එහෙයින් මේ බුද්ධශාසකයෙන් පිටත් සසර දුකින් මිදෙන සේ නිවන්මග පා අනුශාසකාකරණ ලොවුතුරා බුදුන් හැර යම් කිසි දෙවිකෙනෙක් හෝ බුදුකෙනෙක් හෝ ලොව ඇති සේකැ යි කියාද, එසේම උතුම් නිවන්මග ප්‍රකාශවූ සඩ්ඝයෙක් ඇතැයි කියා ද, එසේ ම මනාපිළිවෙත් පුරණ උතුම් නිවන්මගට පැමිණීමට උත්සාහ කරණ පැවිදි කෙනෙක් ඇතැයි කියාද, සිතින් අදහාගෙණ කියනලද ක්‍රමයෙන් ජීවිත පරිත්‍යාගාදිය කොට යමෙක් සරණ ගත්තේ වීනම් එක්‍ෂණයෙහි ම සරණ කොට ගත් ඒ උතුම් තුණුරුවන්හි වූ ඒ සරණය බිඳෙන්නේ යයි දතයුතු. අපණණක ජාතක දෙශනා වෙහි ආ ක්‍රමයෙන් අසා දතයුතුයි.

ඒ කෙසේද? යත්,

අප බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඬු මහසිටාණන් තමන් යහලු පන්සියයක් පමණ අඤ්‍යතීර්‍ථික භක්ති ගත්තවුන් කැඳවාගෙණ බොහෝ මල්ගඳ විලවුන් තෙල් මී සකුරු ඇ බෙහෙත් බඩු හා සිවුරුපිළි ආදිය ගෙන්වා ගෙණ විහාරයට ගොස් මල් සුවඳ ආදියෙන් බුදුන්ට පූජා කොට සංඝයා වහන්සේට බෙහෙත්බඩු සිවුරු පිළිගන්වා බුදු රජාණන් වහන්සේට සමීපව හුන් කල්හි ආකාශ ගංගාව බිමට බෑනා සේ ඉතා මිහිරි වූ බ්‍රහ්මස්වරය විහිදුවා භාග්‍යවතුන් වහන්සේ බණ වදළසේක. ඒ අසා අන්‍ය තීර්‍ථික ලබ්ධි ගත්තාහු ඒ තීර්‍ථික සරණය හැර බුදුන් සමීපයෙහි සරණගතව අනේපිඬු මහ සිටාණන් සමග විහාරයට අවුත් දන් දෙති. බණ අසති. සිල් රකිති. පෙහෙවස් වෙසෙති. එසේ ඔවුන් තුණුරුවන් කෙරෙහි පැහැදී පින්කම් කරමින් වසන කල්හි යළිත් තීර්ථක ශ්‍රාවකයෝ බුඩාදී තුණුරුවන්ගේ සරණය බිඳ නීච සරණගම ගත්තාහු ය. බුදුරජාණන් වහන්සේ ත් සත් අට මාසයක් ඇවැමෙන් සැවැත් නුවර දෙවිරමට ම පැමිණි සේක. එකල්හි

අනේපිඬු මහසිටාණෝ පෙරසේ ම තිසරණසරණය ගිය ඒ පන්සියයක් දෙනා ගෙණ ගොස් බුදුන් දැක සුවඳ මල් ආදියෙන් පූජාකොට වැඳ එකත්පස් ව හිඳ ඔහු හැමදෙනා උතුම් සරණය බිඳ තිසරණ සරණය ගිය බව දැන්වූකල්හි බුදුරජාණන් වහන්සේත් එම්බා උපාසක වරුනි! යටින් අවීචිමහානරකය හා මත්තෙන් භවාග්‍ර අවසන් කොට සරස අනන්තාපරිමාණ ලොකධාතුයෙහි ශීලසමාධ්‍යාදි ගුණරත්නයෙන් බුදුන් සම කෙනෙක් හෝ වැඩිතරම් කෙනෙක් හෝ නැති හෙයින් නොයෙක් ලෙසින් බුද්ධාදිරත්නත්‍රයෙහි ගුණ ප්‍රකාශ කොට මේ රත්නත්‍රයෙහි සරණගත වූ අය අපායට නොගොස් සුගතියෙහි භව භොග සම්පත් ලැබීමද සරණාගමන ඵල නම් වෙයි වදරණ බුදුරජාණන් වහන්සේ

> යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගම්ඝන්ති අපායං
> පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙඝන්ති" යි,

යනාදීන් සරණගමන ඵල ප්‍රකාශකොට ශ්‍රමණෙනෙක් බුත්සරණ ගියෝ ද, දහම් සරණ ගියෝ ද, සඟසරණ ගියෝ ද, ඒ හැම දෙවිලොව ඉපදීම පමණක් නො වෙයි, ඒකාන්තයෙන් අමාමහනිවණ්‍ හ් සිඛකරන්තාහුය යි වදරා එසේ වූ බුත්සරණය බිඳ අන්‍යතිර්ථිකයන් සරණගන්නාවූ තොප විසින් ඉතා ක්‍රුසු දුස්සක් කරණ ලද්දේය, එම්බා උපාසකවරුනි! පළමුත් බොහෝ මිනිස්සු සරණ නො වන ක්‍රුසුදුසු අයගේ බස් සරණ ය යි අනුව ණින් ගෙණ අමනුෂ්‍ය කාන්තාර මාර්ගයෙහි යක්ෂයන්ට ගොදුරුව මහත් විනාශයට පැමිණියාහුය, අවිරුඬවූ තෙපුල් ඇති මහ උතුමන්ගේ බස් ක්‍රුවණැත්තාහු මැනවැ යි ගෙණ එබදු යක්ෂාධිගෘහීත කාන්තාර මාර්ගයෙහි සැපතට පැමිණියාහුයයි වදාළසේක.

එවට අතිතකථාව ශ්‍රවණයට කැමති අනේපිඬු මහසිටාණන් විසින් ආරාධිතවූ නිලෝගුරු බුදුරජාණන් වහන්සේ යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රජකරණ සමයෙහි පුරණ ලද බොධිසමභාර ඇති අප මහ බෝසතාණන් වහන්සේ ඝාසඡාවාහ කුලයක ඉපිද වැඩි විය පැමිණ වෙළඳුම්න් ජීවත්වනුවෝ ගැල් පන් සියයක බඩු පුරාගෙණ වෙළඳුමට නික්මුනාහ. එකල්හි එසේම ගැල් පන්සියයක බඩු පුරාගෙණ අනික් ඝාසඡා නායක වෙලෙන්දෙක් ද "මම පෙරටුව යෙමි" යි කියා පළමුවිව නික්ම ගොස් තමා ක්‍රුවණ මද හෙයින් මිනිසුන් හා ගොන් දහස ඇතුළුවූ සියල්ල ම විනාශ ගට පැමිණිබව ද, යහපත් ක්‍රුවණ ඇති ඝාසඡා නායක මෙළඳ

තෙම පසු ව ඇමෙයි අනුසස් නුවණින් බලා නැවත නික්ම ගොස් තමන් නුවණැති හෙයින් අමනුෂ්‍ය උපද්‍රවයෙනුත් මිදී මහත් ලාභයට පැමිණ සියලු පිරිවර සහින ව අභිමතාර්‍ථ සංසිඳියට පැමිණියේ වේ දැයි යනාදි අතීතකථා සියල්ල ම හෙණ හැර දක්වා වදුරා එම්බා උපාසකවරුනි! මෙසේ එතුම් නුවණැති පුරුෂයාගේ බස් අසා ඔහු හජ්නය කළ හැමදෙනාට සියලු ම වැඩ සිඹිණි ද? එමෙන් සාරාසඬ්ඛ්‍ය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි දැන ශීලාදි දශධර්මයන් පුරා පඤ්ච මහාපරිත්‍යාගයන් කොට තොප සියල්ලවුන්ට ම පිහිටවන පිණිස සකලක්ලේශයන් නසා සදිඳුපද ප්‍රාප්ත වූ මා ත් එසේ වූ මා විසින් ප්‍රතිවෙධ කරණ ලද සියලු සංසාර දුඃඛය නසන්නාවූ සියලු සබර්මය ත් ඒ මාගේ ධර්මය අසා සකලක්ලේශයන් දුරු කොට සුප්‍රතිපන්නතාදි ගුණ ගණාඛ්‍ය සඞ්ඝන ව සිටි සඞ්ඝරත්නයත් හජ්නය නො කොට රාග වෙශ මොහාදියෙන් වැළදගත් නොයෙක් ලබ්ධි ගෙණ ලොකයා වඤ්චාකරණ ශාස්තෘහු යන මිථ්‍යා බස් ඇත්තන් ද ඔවුන් විසින් කියන ක්ලේශවර්ධනය කරන්නාවූ ධර්මය යන වචනයන් ද මිථ්‍යා මාර්‍ගයට පැමිණියාවූ ශ්‍රාවකයන් ද සරණය යි ගෙණ හජ්නය කරන්නාවූ තොප හැමට ම සතරඅපායෙන් ගැලවී නිවන් දක්නට සුදුසු කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයෙක් නො වන්නේය යි යනාදීන් වතුස්සත්‍යය දෙශනා කොට වදුළසේක. ධර්මදෙශනාවගේ කෙළවර ඒ පන්සියයක් උපාසකවරු සෝවාන් ඵලයට පැමිණියාහුය.

මෙසේ සියලු සතුන්ට පිහිටවන ත්‍රිවිධරත්න සරණය දක්වා ලොකයාහට කරණලද උතුම් සබර්මානුශාසනා ඇති හෙයින් බුදුරජතෙම ශාස්තෘ නම් වන්සේක. ඒ එසේමය, ලොකයෙහි සියලුම තිර්‍යක්කයෝ කාමුපාදානයාගේ ප්‍රහාණය ත් දෘෂ්ට්‍යුපාදානයාගේ ප්‍රහාණය ත් සීලබ්බතුපාදානයාගේ ප්‍රහාණය ත් යහපතැ යි කියා, ගත් ආත්මය යහපතැ යි කියා ගත් අතෙම්පාදානයෙන් වන දෙශ දූක පඤ්චස්කන්ධවිභාගය තත්වූ පරිද්දෙන් සලකා මේ අනාත්ම යයි කියා ගන්නා එක තිර්‍යක්කයෙකු ත් නැත. එබැවින් ඔවුන්ගේ වචනය ත් ප්‍රතිපත්තිය ත් සත්‍යයන් නිවණට පමුණුවා ලීමක් නැති හෙයින් නෛයර්‍යාණික නො වන්නේය. ඔවුන්ගේ වචනය ඇසුවාවූ ජනයාගේ ඒ ගුරුන් කෙරෙහි කළ ප්‍රසාදය ත් ඔවුන් සසර දුකින් මුදන්නේ නො වෙයි. ඒ එසේමය, තීර්‍යක ශ්‍රාවකතෙම ප්‍රාණඝාතාදි පව් නො කටයුත්තේය යි කියා අවවාද කරන්නේ වෙයි. ඒ ඇසූ ශිෂ්‍යතෙමේ ද "ප්‍රාණඝාතාදිය නො කරමි" යි කියා ප්‍රතිඥා කරන්නේ වෙයි. ඒ ගුරු ශිෂ්‍ය දෙපක්‍ෂයෙහි ඇත්තෝ ම රාගාදී අකුසල් නසා නිවන් නුදුටු හෙයිනු ත් සසර

සත්වයන්ගේ ඉපදීම අක්මුල් නැති හෙයිනුත්, අවවාද කළාවූ ශාස්තෘතෙම ඉදින් සිංහ ව ව්‍යාඝ්‍ර ව දිවි ව බල්ල් ව උපන්නේ වේද ඕහට ශිෂ්‍ය ව සිටි අය මුව ව ශූරැ ව කුකුල් ව මූෂික ව උපන්නාවුන් දැක "පෙර අපි ප්‍රාණඝාතාදි පව් නො කරණසේ මොවුන්ට අවව ද කෙළෙමිහ" යි කියා ද, "මොහු අප අවවාදයෙහි සිට අපට ප්‍රත්‍යාදියෙන් උපස්ථාන කෙළේ වේ දැ" යි කියා ද, ක්ෂාන්ති මෛත්‍රියක් වත් කරුණාවක් වත් නො කොට උන්ගේ මස්කකයට පැන නිසපදුරෙන් පලා දැඩි කොට සල්ව සල්වා අල්වාගෙණ ලේ බී මස් කන්නේ නෝ වෙයි. නැවත ආචාරිහු මාඝ සූකරාදි ඒ ඒ ජාතිවල උපන් කල සිංහ ව්‍යාඝ්‍ර දිවි ආදි සතුරු ජාතිවල උපන් ශිෂ්‍යයෝ ද එසේ ම අල්වාගෙණ "මොහු අපට සරණ ව උවදෙස් දුන් ආචාරිහුය" යි කියා ද "අප විසිනුත් ප්‍රාණඝාත නො කරණසේ ප්‍රතිඥ දෙනලදැ" යි ද නො සලකා ම මරා කන්නාහුය. එබැවින් ඔවුන්ගේ ප්‍රඥන්නතාව නුනුවණින් යෙදී උපදවාගත් අසිර දෙයක් වෙයි. රා බී මත්ව හොත් කැනහිලා කෙරෙහි බමුණා කළාවූ විහාරප්‍රසාදය මෙනි.

ඒ කෙසේද? යත්:—

පෙර එක් කැනහිලෙක් රාත්‍රියෙහි නුවරට පැමිණ රා පෙරා දැමූ තන්හි රාමණ්ඩි කා මත්ව තෝර කැලයෙක හොත්තේය. ඉරු උස්ව නැගි කල්හි පිබිද මෙහි විසීම ද මිනිසුන්ට පෙණී පෙණී යාම ද මට උවදුරු වන්නේය. ඒ හෙයින් "එකෙකු වඤ්චා කොට ගෙණ අන් කැනෙකට යෙමි යි සිතා ගුන්නේ යන්නාවූ බමුණකු දැක "මොහු වඤ්චා කොට ගෙණ යා යුතුය" යි සිතා බමුණාහන් වහන්සේය යි හඬගා බමුණ; ලඟට ආ කල "මා මෙයින් පිටතට ගෙණ ගියහොත් තොපට කහවණු දෙසියයක් දෙමි" යි කියා ඒ කහවණු ලොභයෙන් මුළාවූ බමුණා විසින් කැනහිලාගේ දෙපතුල අල්වා උසුලාගෙණ යන කල්හි සැඟව් යනගමන් තම කැමති හෙයින් "එම්බා බමුණ, කහවණු ලොව දම්පියන දෙයක්ද? මෙතෙක් කහවණු දෙන මට අනදර කොට ගෙණ ය.ම සුදුසුදැ" යි දන්වා කෙසේ ගෙණයෙම්දැ" යි විවාළාවූ බමුණාට 'උතුරු සළුවෙහි බැඳගෙණ යව" යි කී කල්හි මැනවැ යි හිඳිස උතුරු සළුව අතුට ඒ මත්තෙහි හොවා පොදියක් කොට බැඳ උරෙහි එල්වාගෙණ යනුයේ දකුණු වහසල් දෙර සමීපයට පැමිණ "මෙහි තබම්දැ" යි විවාළකල 'එම්බා බමුණ මෙබදු තැනක කහ වණු තබන්නෙක් ඇද්ද, තව ගෙණයව" යි කියා කටුමල් ගහන යක් සමීපයට පැමිණිකල "මෙතන තබව" යි කීයෙන් තබා

උතුරු සළුව ගෙණ සිටි බමුණාට කැනහිල් තෙම කියනුයේ "මා අසිති කහවණු මහානිධානයක් ඇත ඒ හැම තොප දක්වනු නො කැමැත්තෙමි, එහෙයින් බාරවූ කහවණු දෙසියය පමණක් වෙන් කොට ගෙණතුරු මේ ඉර බලා සිටුව" යි කියා ලොභ මොහ දෙකින් මුලා වූ ඒ බමුණා එසේ සිටුවා වැටකේ වකයට වැද තමා කැපූ සේ ගියේය. ඉර බලා සිටි බමුණාගේ නලළින් ද දෙ කිසිල්ලෙන් ද ඔහදිය නික්මෙන්ට වන. ඒ දුටු රුක්දෙවිඳෙක් මේ ගාථායෙන් මෙසේ කියේය.

සද්දහාසි සිගාලස්ස සුරා පිතස්ස බ්‍රාහ්මණ,
සිපපිකානං සතං නත්ථි කුතො කංස සතං දුවෙ.

එම්බා බ්‍රාහ්මණය, රා මතින් හොත් කැනහිලාගේ බස් සැබව යි ගත්ට කාරණා කිම? බෙල්ලන් සියයකු ත් නැති ඔහට කහවණු දෙසියයක් කොයින් ඇද්ද යි කියේය. එමෙන් ම රාග මොහාදීවූ අකුශලයෙන් හරිතවූ ධනලාභාදිය පිණිස බොරු කියන්නාවූ එහෙයින් ම ලොව වඤ්චාකරන්නාවූ මිථ්‍යාකල්පනාදියෙන් යෙදී වසන තීර්ථකවවන සැබව යි සිතා ශිවභක්ති විෂ්ණු භක්ති නොයෙක් ලබ්ධි ගෙණ කිසි පිහිටක් නැතිදැ ම පිහිටැ යි සිතා අපායගහාග් නො වී සසර දුකින් මිදී නිවන් දක්නා කැමැත්තාවූ එම්බා සත්පුරුෂයෙනි! බුඩාදී රත්නත්‍රයෙහි සරණගත වූ ගුරුවරුන් සිතින් අදහා නිරන්තරයෙන් පූජා සත්කාර කොට රත්නත්‍රය සෙවනයෙන් උපාසකධර්මය අඩු නො කොට පැවතිය යුත්තේය. මේ සරණගතවීමෙහි විපාක වෙලාමසූත්‍රය, කුටදන්ත සූත්‍රය ආදි නොයෙක් තන්හි බුදුන් වදාළ පරිද්දෙන් අසා දත යුතු.

මෙසේ වූ සරණා ගමන ප්‍රභෙද දී කථානිශංස ප්‍රකාශ කොට දෙවි මිනිසුන් සහිත වූ සියලු ලොකාභාසට කරණලද උතුම් සඛර්මානුශාස්තෘවන් ඇති හෙයින් ලොකසරණ වූ මාගේ බුදුරජ තෙම ශාස්තෘ තම් වනසේක. එහෙයින් කියනලදී.

දේව යක්ඛ ම නුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදන්තං දම්මදන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ-සි.

මෙතෙකින් ලෝවැඩ පිණිස කරණලද ශ්‍රී සඛමීවවාද සඞ්ග්‍රහයෙහි සරණ විභාගානිසංශ වර්ණනා කථාවන් ප්‍රකාශවූ

පස්වෙනි සරණාගමන පරිවෙජ්දය
නිමා විණි.

මෙසේ පස්වන පරිච්ඡේදයෙන් සරණාගමනානිසංස කථාවන් වණිනා කිරිමෙන් ලෝ වැඩ දක්වා ඊට අත්තුරු ව මෙහි දැක්විය යුතු නිත්‍ය ශීලාදි නොයෙක් ප්‍රභෙදගත ශීලකථාවන් අතුරෙහි පුබ්බෝක්ත ගාථාවගේ "සබ්බපාපස්ස අකරණං" යනු වෙන් ප්‍රකාශවූ ප්‍රාණඝාතාදි සාවද්‍යකර්මයන්ගේ නො කිරිම හේතු කොටගෙණ ඒ සියලු ශීලය ම ප්‍රකාශවූයේ වී නමුදු මේ මේ පාපකර්ම නො කොට දුරුකට යුතුය සි සමිතේ ගෙවා දන් බුදුන් විසින් ම වළකනලද සියලු පව් නො කොට දුරුවීමෙන් ම පිරිය යුතු විරති සංඛ්‍යාත චාරිත්‍ර ශීලයම ප්‍රකාශව මෙහි පෙණෙන හෙයිනු ත් අකනිට්ඨ වූ ඒ සියලු දුශ්චරිත අකුශලකර්මයන් කෙරෙන් දුරුවීම සත්ත්වයාහට සියලු වැඩට කාරණයෙක් වන හෙයිනු ත් පාපකර්ම විභාගාදිනව සත්ත්වයන්ට සුවසේ ම අවබොධ ව එයින් දුරුවීම පිණිස ලොව නො යායුතු මාගිය පළමුකොට දක්වා යායුතු මාගිය දෙවනු දක්වන්නා සේ **මඛලසුත්‍රාදියෙහි** දුරුකටයුතු බාලයන් ප්‍රථමයෙන් දක්වා සෙවිය යුතු පණ්ඩිත සත්පුරුෂයන් නැවත දැක්වූවා සේ මේ ශීලකථාව දක්වන්නාහු ද අප විසින් පළමුකොට ම දුරුකටයුතු අකුශලකර්මපථ ප්‍රභෙදාදි නව ඵල භූමිවශයෙන් ප්‍රකාශකොට දක්වා තදනන්තර ව එම අකුශලකර්මයන්ගේ විරතිසංඛ්‍යාත පඤ්ච ශීලාදිවූ ශීලබ්‍රහ්මචර්යකථාවන්ගේ ද සමාදාන ප්‍රභෙදානිශංස කථාවෝ දක්වනු ලැබෙත්.

එහි **අකුශලකර්ම** නම් කවරහ? යත්

පාපෙනති ලොභ මොහෙහි ෙදස මොහෙහි වා පුන,
සුඛමොහෙන වා යුත්තා චෙතනා පාප සඤ්ඤිතා.

පාප චිත්තෙන ජාතානි වාරිත්තය වසෙන ච,
අපුඤ්ඤකිරිය වත්ථූනි දස හොනතිති දීපයෙ-සි.

යනු හෙයින් මේ ලොයෙහි පාප නම් ලද අකුශලකර්මය නම් ලොභ මොහ දෙදෙනාගේ එක්වීමෙන් ද ද්වේෂ මොහ දෙදෙනාගේ එක්වීමෙන් ද, එකලාව මොහය හා එක්වීමෙන් ද, යෙදුනු චෙතනා ත්‍රිවිධ පාප යැයි යන නම් ලදී. ඒ පාපචෙතනා වෙන් උපදනා අකුශලකර්මයෝ කය වාඞ් මනෝ යන තුන්දෙර වශයෙන් දශප්‍රකාරවූවාහු දශඅකුශලකර්ම පථයෝ වෙත්. එම දශ අකුශලයන්ගේ ම විශෙෂ ප්‍රභෙද වූ නොයෙක් නාමයෙන් ව්‍යවහාරවූ සියලු අකුශලකර්මපථයන් අතුරෙන් **පඤ්චදුශ්චරිතය** පඤ්චානන්තරිය නාමය, ආර්‍යෝපවාදාදි පාපකර්මලක්ෂණය, පඤ්චනීවරණය, සප්තඅකුශලමූලය, අකුශල් සිඛ්‍රිමට සම්පවසිටි පාපධර්මයෝය, ක්‍රොධාදි අවශෙෂ පාපධර්මයෝය, අශෝත්තර්

ශතප්‍රභෙදවූ තද්භාවය යන මොහු නොයෙක් කටුක විපාක දුකඛ විපාක දෙන එකාන්ත අකුශලකම්යෝ නම් වන්නාහු ය. සියලු කුශලාකුශලකම්යන්හි සාධාරණ ව සිටි සූත්‍රාන්තික පර්‍යායයෙන් දැක්වූ දෘෂ්ටධම්මවෙද්‍ය කම්දි කම් එකොළොසෙක, එසේ ම අභිධම් පර්‍යායයෙන් දැක්වූ කම් සොළොසෙක, ප්‍රතිසංවින් මාගිපර්‍යාය යෙන් දැක්වූ කම් සොළොසෙකැ යි යන මේ සියලු කම්විභාගාදී තවාතාශංස දක්වා දෙව් මිනිසුන් සහිත සියලු ලොකයාහට උතුම් සද්ධම්මානුශාසනා ඇති හෙයින් අසාධාරණ ඤාණබලඇති මාගේ බුදුරජතෙම ශාස්තෘනම් වනසේක.

එහි දශ අකුශලකම්යෝ නම් සත්ත්වයාගේ කායවාරයෙන් සිඩවන ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය යන තුන් අකුසලයන්ද, වාග්වාරයෙන් සිඩවන මුසාවාදය පෙසුණ්‍යය ඵරුසවචනය සම්පප්‍රලාපය යන මේ අකුශලයන් සතරදෙන ද මනොවාරයෙන් සිඩවන අභිධ්‍යාවය ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යන මේ අකුශලයන් තුන්දෙන ද යන මොහු දශඅකුශලයෝ නම් වෙති. එහි ප්‍රාණාතිපාතය නම්, ලොකයෙහි ව්‍යවහාර වශයෙන් සත්වතෙම ප්‍රාණය යි කියනුලැබේ. පරමාර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබඩ්ධ ඝනතතිය, ඒ පඤ්චස්කන්ධියන්ගේ පිළිවෙළ ගෙණ ඊට සත්වයාසි යන ප්‍රඥප්ති ව්‍යවහාර මාත්‍රයෙක්මය. එසේවූ ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබඩ්ධ සත්වයාගේ රූපස්කන්ධිය කෙරෙන් ජීවිතය ගළවා වෙන් කිරීම ම ප්‍රාණාතිපාත නම්. ඒ ප්‍රාණාතිපාතය ම ප්‍රාණවධය ප්‍රාණ ඝාතය යි ද කියන්නේය. හෙ ද මෙහි අඛ්‍යවශයෙන් ජීවිතෙන්ද්‍රිය ඇති අන්කිසි සත්වයෙක් බවය. ඒ සත්වයාගේ ප්‍රාණය වෙන් කිරීමෙහි පැවති සිත් ඇති බවය. එම ප්‍රයත්න කරන්නහුගේ කාය වාග්වාර දෙදෙනාකෙරෙහිවූ සවැදෑරුම් ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයෝගයක් පවත්නාබවය. එසේ පැවැත්වූ උපක්‍රම සම්පත්ති එක් ප්‍රයොගයකින් එවිට ම හෝ පසුව හෝ ඒ සත්වයා ගේ දිවිනැසි යන බවය යන මේපස ඇත්තේය. මෙසේවූ අඛ්‍යවස සම්පූර්ණවීමෙන් ඔහට ප්‍රාණාතිපාත අකුශලය සිඩ වේ. එයින් එක් අඛ්‍යයකුදු අඩුවූ ඒ ප්‍රාණඝාතය අකුශලකම් බවට නොපැමිණේ.

එහි ස වැදෑරුම් ප්‍රයොග නම්:- සාහත්ථික ප්‍රයෝගය, ආණත්තික ප්‍රයෝගය, නිස්සග්ගික ප්‍රයෝගය, සඨාවර ප්‍රයෝගය, විද්‍යුමය ප්‍රයෝගය, ඍඩ්මය ප්‍රයෝගය යන මොහුයි. එයින් යම් කිසි සත්ව යෙකු තමා අතින් මරන්නහුගේ අත් පා ආදී ශරීර අවයවයකින් පැහැරීම හෝ කඩු දඬු තෙප ආදියකින් පැහැරීම හෝ සාහත්ථික

ප්‍රයෝගය නම් වේ. "මෙසේ විද, මෙසේ ඇන, කොටා මරවයි" කියා අනුන්ට නියෝගකිරීම ආණත්තික ප්‍රයෝග නම්. දුරුතැන සිටි එකකු මරණ පිණිස කයින් වත් කායප්‍රතිබද්ධවූ දුනු ආදිය කින් වත් තෙප් ආදිය දමා වත් ගල් ආදිය ගසා වත් ශර ආදිය විද වත් මරන්ට කරණ නොයෙක් ක්‍රියාවෝ නිස්සග්ගික ප්‍රයෝග නම් වෙති. උගුළු ලා බොරුවල් බිඳ උල් සිටුවා ගතුරු දුනු තබා කෙමින් ආදිය සදා වැටී පොකුණු ආදියෙහි විෂ යොදා කරණ නොයෙක් උපක්‍රම සථාවර ප්‍රයෝග නම් වේ. මන්ත්‍ර ජප කිරීමෙන් ජ්වරාතිසාර දුහාදි නොයෙක් රොග උපදවා මරන්ට කරණ උත්සාහය විද්‍යාමය ප්‍රයෝග නම් වේ. කිපී බැලූ පමණ කින් කුම්භාණ්ඩයන් මරන්නාවූ වෙසවුණු රජ්ජුරුවන්ගේ ඇස මෙන් කම්බලයෙන් සිඳවූ ශාඛියකින් සතුන් මරන්ට කරණ උපක්‍රමය ශාඛිමය ප්‍රයෝගය නම් වේ.

මෙහි පළමුකොට කියන ලද සාහත්‍යික ප්‍රයෝගය උද්දිස්ස අනුද්දිස්ස වශයෙන් ද්විප්‍රකාර වේ. ඒ කෙසේද? යත්, යම් සත්ව යකු මරවයි කියා නියම කොට තෙප් ආදිය දැමීමෙන් ද, ශරයක් විදීමෙන් ද, ඒ නියමකළ සත්වයාම මරණයට පැමිණියේ නම් ඔහුට ඒ අකුශල කර්මය සිඳවෙයි. එසේ නියමකර මරන්ට සිතා ගත් සත්වයා හැර අන් සත්වයෙකුට වැදී මළහොත් මරන් නහුගේ සිත්හි මොහු මරම් සි යන සිත් නැතිව ම වැදී මළ හෙයින් අඛ්‍යසම්පූණී කොට වන බැවින් ඔහුට ප්‍රාණඝාතය සිඳ නො වේ. නියමයක් නො කොට ලද යම් කොයි සතෙකු වුවත් මරම් සි සිතා ප්‍රයෝග කළ හොත් ඒ ප්‍රයෝගයෙන් කොයි සතෙකු මළ ත් ඔහුට ප්‍රාණඝාත අකුශලය සිඳ වන්නේය. යම් සත්ව යකු මරණු පිණිස පහරක් දුන් කල ඒ පහරින් එවිට ම මළත් ඒ පහරම මුල්ව කල්යවා මළ ත් පහරදුන් එකාට පහරදුන් ඇසිල්ලෙහි ම ප්‍රාණඝාතය සිඳ වේ. මේ සාහත්‍යික කර්මයෙහි විභාග සි.

මරණ ලෙස නියම කොට අනුන්ට මෙහෙවර කීමය යන ආණත්තික කර්මය ද සවැදෑරුම් වේ, ඒ කෙසේ ද? යත්,

> වත්‍ථු කාලෝ ච දෙසෝ ච සන්‍ථානඤ්ච ඉරියා පථෝ
> කරණස්ස විසෙසෝ ති ඡ ආණත්තී නියාමකා.

එහි වත්‍ථුව නම් මැරිය යුතු සත්වයා නියම කිරීමය. කාලය නම් පූජිත්ත අපරාහ්නාදි කාලය නියම කිරීමය. දෙස නම් ග්‍රාමාරණ්‍ය වීථි සන්ධි යනාදිය නියමකිරීමය. ආවුධ නම් කඩු තෙප් යනාදී ආවුධ නියමකිරීමය. ඉරියාපථ නම්, මැරිය

යුතු එකාගේ හෝ මරණ එකාගේ හිදීම් සිටීම් ආදි ඊර්යාපථ නියමකිරීමය. ක්‍රියා විශේෂ නම් විදීම් කෙටීම් ආදී මරණ ක්‍රියාව නියම කිරීමය යි මෙසේ සඟාකාරයක් වේ. එසේම අසවල් එකාය යි නියමකොට කිවහොත් එකී ලෙසම ඔහු මැරීමෙන් ඒ මෙහෙවර කි එකාට ම ප්‍රාණඝාතය සිඩවන්නේය ඔහු හැර අනිකක්හු මැරුව හොත් මෙහෙවර කි එකාට අකුසල් සිඩ නො වන්නේය. මේ මරණ සත්වයා නියම කිරීමෙහි විභාගයි.

පෙරවරු මරව යි කියා වත් පස්වරු මරව යි කියා වත් රාත්‍රි යෙහි මරව යි කියා වත් දහවල් මරව යි කියා වත් නියම කළ කල්හි එහි කල් වරදවා මරුව හොත් මෙහෙවර කි එකාට යට කී ලෙස ම ප්‍රාණඝාතය සිඩ නො වෙයි. මැරුවහුට ම අකුසල් සිඩවේ. මේ කල් නියම කිරීමෙහි විභාගයි.

ගම දී වත් නුවර දී වත් වනාන්තරයක දී වත් ගොඩන දී වත් දියක දී වත් මරව යි කියා මැරියයුතු තැන් නියම්කොට මෙහෙවර කි කල්හි ඒ නියම කොට කී තැන් හැර අන්‍යතු තැනක දී මැරුව හොත් ඒ මැරූ එකාට මිස කී වහුට ප්‍රාණඝාතය සිඩ නො වන්නේය. මේ ස්ථාන නියමයෙහි විභාගයි.

තෙඹින් මරව යි කියා වත් කඩුවෙන් මරව යි කියා වත් ආයුධය නියම කොට කී කල නියම කළ ආයුධයෙන් මැරුව හොත් මෙහෙවර කිවහුට ප්‍රාණඝාත අකුශලය සිඩ වේ. නො කී ආයුධයකින් මැරුව හොත් මරුවහුට ම අකුශලය සිඩ වේ. මේ ආයුධ නියමකිරීමෙහි විභාග යි.

සිවිය දී මරව යි කියා වත් ඉන්ද දී මරවයි කියා වත් යන එන තැන් ආදි මරණ එකාගේ හෝ මැරියයුතු එකාගේ හෝ ඉරියව් නියමකොට කිකල එ කී ලෙස ම නියමකළ ඉරියව්වක දී මැරුවහොත් කිවහුට අකුසලය සිඩ වේ. අනික් ඉරියව්වක දී මැරුවහොත් මැරුවහුට ම ප්‍රාණඝාතය සිඩ වේ මේ ඉරියව් නියම කිරීමෙහි විභාගයි.

විද මරව යි කියා හෝ කපා මරව යි කියා හෝ ඇන මරව යි කියා හෝ මෙහෙවර නියමකළ කල ඒ ඇසූ පුරුෂයා ද ඔහු කී ලෙසම මැරුයේ වී නම් මෙහෙවර කි එකාට ත් ඒ අසා මැරූ එකාට ත් යන දෙදෙනාට ම ප්‍රාණඝාතය සිඩ වේ. කී සැටි වරදවා මරුව හොත් ඒ මැරූ එකාට මුත් මෙහෙවර කි එකාට ප්‍රාණඝාත ය සිඩ නො වන්නේය. ඉදින් යම්කු මරන්ට කියා මෙහෙවර කි ද ඒ මෙහෙවර ඇසූ පුරුෂතෙම අවුරුදු පණසකින් වත්

සැටකින්වත් ඇවා නියමකළ ලෙස ම මරන්නේ වේ ද මරන්න නියොගකළ පුරුෂයා මෙහෙවර කි දවස්හි ම මළේ වී නම් ඕහට ප්‍රාණඝාත අකුශලය සිඩව සතර අපායෙහි උපදනේය. මේ ක්‍රියාවිශෙෂ නියමයෙහි විභාග යි.

මෙසේ අනුන් ලවා වත් අනුන්ව ව්‍යාජයෙන් පශ්චාත්‍යයෙන් කියා වත් වස විෂ කා මිය යව යි කියා වත් මරණයෙහි ගුණ වර්ණනා කොට කිම් ආදියකින් වත් තමා විධානකොට හෝ අනුන් ලවා විධාන කරවීමෙන් හෝ අනුන්ට පශ්චාත්‍යභාගයෙන් කියා හෝ එසේම අනුන්ලවා කියවා හෝ මරණ පිණිස මන්ත්‍ර ජප කිරීමෙන් හෝ එසේම අනුන් ලවා කරවා හෝ කරණ නොයෙක් ප්‍රයොග අතුරෙන් එක්තරා ප්‍රයොගයකින් යට කියනලද ප්‍රයොග සය අතුරෙන් එක්තරා ප්‍රයොගයක් හා පඤ්චාඞ්ගයන්ද සම්පූර්ණ වීමෙන් පළමුවෙනි ශික්ෂාපදයාගේ භෙදය වේ.

භෙද අල්පඝාවද්‍ය වූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය. මහා සාවද්‍යවූ ප්‍රාණඝාතයකුත් ඇත්තේය. එහි කුරු කුහුඹුවන් ආදිවූ කුඩා ප්‍රාණියකු මැරුව සුවල්ප අකුශලය. ඊට වඩා මහත් සූනු සිකනල් මූගටි සාවුන් පටන් ක්‍රමක්‍රමයෙන් මහත් මහත් සත්ත්වයන් මැරීමෙහි අකුශලය ත් එසේ ම එකිනෙකාට වඩා මහත් වන්නේය. මේ සියල්ලවුන්ගේ ප්‍රාණය කැපීම එකසේවරවූව ත් මහත් සතුන් මරන්ට කරණ ප්‍රයෝගය මහත් හෙයින් අකුශලය ත් මහත් වන්නේය. මේ හැමටම වඩා දුස්සීල පාපී නවුත් මිනිසකු මැරීමෙහි අකුශලය මහත් වන්නේය. ඒ දුස්සීල මිනිසකු මැරීමට වඩා ගොශීලාදියෙන් යුක්ත එකක්හුගේ මැරීමෙහි අකුශලය මහත. ඊට ත් වඩා අටසිල් රක්‍ෂාකරණ එකක්හු මැරීමෙහි අකුශලය මහත. ඊට ත් වඩා දසසිල් රකින මිනිසකු මැරීමෙහි අකුශලය මහත. ඊට ත් වඩා පෘථග්ජන නිෂ්ක්‍රුවක් මැරීමෙහි අකුශලය මහත. මේ හැමට ම වඩා ශ්‍රොතාපත්ති සකෘදාගාමි අනාගාමි අර්හත් යන මේ ගුණවැඩි උතුමන් මැරීමෙහි ක්‍රම ක්‍රමයෙන් අකුශලය මහත් වන බව දතයුතුයි.

මෙහි මරන්ට කරණ ප්‍රයොගය ම වී නවුත් ගුණයෙන් මහත් අය මැරීමෙන් ද, ප්‍රයොගය මහත් කොට කිරීමෙන් ද අකුශල් මහත් වේ. ශරීරප්‍රමාණ ගුණප්‍රමාණ ප්‍රයොග සම්පිණ්ඩිත වූ කෙලෙසුන්ගේ මන්දතීක්ෂ්ණ වශයෙන් ම අකුශලය අල්පවීම ද මහත් වී ම ද දතයුතුයි.

මෙහි කුරු කුහුඹුවන් මැරීම සුවලප අකුශලය යි කී වචනය ඊට ත් වඩා මහත් සත්ත්වයන් මැරීමෙන් සිඳුවන අති මහත් අකුශලය බලා කියනලදී. එ බැවින් ක්ෂුද්‍ර වූ සත්ත්වයන් නසා සිඳුවන අකුශලය ත් ඔවුන්ගේ ශරීර සේ කුඩාය යි නො සිතා නරකයට පමුණුවන හෙයින් මහත් අකුශලය යි දැන තමහට වැඩ කැමති සත්පුරුෂයන් විසින් කුරු කුහුඹු ආදි ක්ෂුද්‍ර ප්‍රාණීන් ගේ ජීවිතය තමාගේ ජීවිතය මෙන් සලකා ප්‍රාණවධය නො කොට සිලයෙහි පිහිටියයුතු. මෙම දක්වනලදී.

ඛුද්දකානම්පි ජන්තූනං ජීවිතං පි ව සබ්බථා,
ජන්තූනා රක්ඛිතබ්බං ව හිතකාමේන අත්තනෝ,

එහි ප්‍රාණඝාතයෙන් දුර වීම කැමැත්තන් විසින් මෙහි ප්‍රාණීන් ඇතැ යි යන සංඥ ඇති ව නොපෙරැ පැන් ප්‍රයෝජන යට නො ගතයුතු. ඒ පැන් විනාශකිරීම ද නුසුදුසු යි. මේ දියෙහි ප්‍රාණීන් නැතැ යි යන කල්පනා ඇත ත් දිය නො පෙරා ගැන්ම වරද පක්ෂයෙහි ඇතුළත් බැවින් අකුසල්මය යි දැන ප්‍රාණවධයට භය ඇත්තන් විසින් පැන් පෙරා ගත යුතුයි. මෙසේ දුරුකටයුතු වූ ප්‍රාණාතිපාත අකුශලකර්මය ලෝභය වෛෂය මෝහය යන අකුශලයන් තුන්දෙනාගේ එක්වීමෙන් සිඩ වේ.

ඒ කෙසේ ද? යත්:

මෝහුගේ මාංශ අනුභව කරම් යි ලෝභ උපදවා හෝ මස් විකුට ගන්නා මිලයෙහි ලෝභ උපදවා හෝ තමා විසින් මැරීමෙන් හෝ අනුන් ලවා මැරවීමෙන් හෝ ඇතුළත් කර ගැන්ම සහ මෙබඳු ලාභයක් උපදනේය යි පැවති ලෝභයෙන් හෝ ඝනාදි වශයෙන් ලෝභ සිත් උපදවා ප්‍රාණවධ කිරීමෙන් ඒ පාපය ලෝභය මුල් ව සිඩ වේ. මෝහු මට අනර්ථයක් කෙළේය යි බඩ වෛරයෙන් හෝ දැන් අනර්ථ කෙරේය යි වෛරයෙන් හෝ මතු අනර්ථ කරන්නේය යි ද, වෛරයෙන් හෝ එසේ ම මාගේ ප්‍රිය විශ්වාසයන්ට නපුරක් මෝහු පෙර කෙළේය. දැන් කෙරෙයි. මතු කරන්නේය යි වෛරයෙන් හෝ අප්‍රිය වූ මාගේ සතුරන්ට පෙර මෝහු වැඩක් උපකාරයක් කෙළේය. දැන් කෙරෙයි. මතු කරන්නේය යි වෛරයෙන් හෝ නො කැමැති ව වෙෂයෙන් ප්‍රාණවධ කිරීමෙන් ඒ පාපය වෛෂය ම මුල් ව සිඩ වේ. ශතයාග සහස්‍රයාගයෙහි එකි එකි කුලයෙන් සතුන් සියය බැගින් ගෙණ දහසකින් මරා යාග කරන්නා ඉට පව් නැති මහත් කුශලයකැයි කියා මැරීමෙන් හෝ වධයට පැමිණියවුන්ට වධ කිරීම වරද නැතැ යි කියා හෝ රජ්ජුරුවන්ට රාජමාත්‍යාදීන්ට ප්‍රාණවධ කිරීම වරද නැතැ යි කියා හෝ විහෙසාර සී

ගෝනුසු ආදීහු ද මනුෂ්‍යයන්ට උපද්‍රව කෙරෙති. එ බැවින් ඔවුහු මැරිය යුතුය සි ද මරන්නා හට වරද නැතැ සි කියා හෝ ඌරන් මූවන් කුකුළන් ආදී නොයෙක් සත්හු මනුෂ්‍යයන්ට උපකාර සඳහා උපන්නාහුය. එහෙයින් ඒ ඒ සතුන් මැරීමෙන් අකුශල් නැතැ සි දෘෂ්ටිගෙණ මැරීමෙන් හෝ ඝනාදි වශයෙන් මුළා ව ප්‍රාණවධ කිරීමෙන් ඒ පාපය මොහය මූල්ව සිඛ වේ. ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන් ප්‍රාණාතිපාත කර්මය සිඛ වනබව මේ ආදී ක්‍රමයෙන් දතයුතු.

මෙහි නිවැරදි විධිය නම්, මේ ප්‍රාණයක් නො වෙයි. මෙහි ප්‍රාණීන් නැත්තේය යන කල්පනාව ඇත්තාහට ද සිහිනැති ව නො දන්නාහට ද මේ සත්වයා මරම් යන සිත් නැත්තාහට ද උමතු ආදීන්ට ද ප්‍රාණාතිපාත සංඛ්‍යාත සතුන් නැසීමක අන් පරිද්දකින් යෙදුනු නමුත් අටුවාකථායෙහි නිවැරදිය සි දැක්වූ බැවින් ඔවුන්ට යටකී අඛඡයන්ගේ අඩු බව හෙතුකොටගෙණ ප්‍රාණඝාත අකුශලකර්මය සිඛ නො වේ. මේ ප්‍රාණාතිපාත අකුශල කර්මයෙහි හෙද සි.

එහි ආදීනව නම් කවරහ? යත්:

"පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතෙ තිරය සංවත්තනිකො හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකො හොති, පෙත්තිවිසය සංවත්තනිකො හොති, යො සබ්බහුලසො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අපපායුක සංවත්තනිකො හොති."

ඝනාදීන් බුදුන් විසින් වදුල හෙයින් අනෙකාදීනව ඇති ප්‍රාණාතිපාත අකුශලය යම්කිසිවක්හු විසින් ආසෙවිත භාවිත බහුලීකෘත වශයෙන් පුරුදුකරණලද ද ඒ සත්වතෙම නරක යෙහි ඉපිද නොයෙක් වාදහස් මුළුල්ලෙහි මහත් නරකදුක් විඳ එයින් මිදීගියකල තිරිසන් අපායෙහි ද ප්‍රමාණාතික්‍රාන්ත වූ දුක් විඳ එයින් මිදිකල බලවත් දුකින් ගැවසීගත් ප්‍රෙත අසුර අපා දෙක්හි දු ඉවසිය නො හැකි අනන්ත දුක් අනුභව කිරීමෙන් පව් ගෙවී ගිය කල කිසි පින්ඵල සිදුරකින් මිනිසත්බවට පැමිණියේ වී නම් ශෙෂව සිටි එම ප්‍රාණාතිපාත අකුශලකර්ම බලයෙන් මනුෂ්‍යදෙහය ශොභා ඇති පරිද්දෙන් නො ව ශරීර අවයවයන්ගේ විපරීත වූ විරූපබවය ආරොහපරිණාහ සම්පන්න නො ව කෘශ වූ ශරීර ඇති බවය ජවබලසම්පත්තියක් නැති බවය සම්ව කිම නො වදනා වක්වූ පතුල් ඇති බවය විරූපදර්ශනව දුටුවන්ට රිසි නො වන අප්‍රියබවය මෘදුමොළොක් නො ව ක්‍රූර වූ අතුල්

පතුල් ඇති බවය, සුවි පිරිසිදු කටක් නැති බවය, බල නැති බවය, වීසාරද නොවන වවන ඇති බවය, සියලුදෙනාට අප්‍රිය බවය, හැම කල් ම හසින් තැති ගන්නා බවය, අනුන් විසින් නැසිය හැකි බවය, එසේ කළ උපක්‍රමයෙන් මිය යන බවය, පිරිවර මද බවය, රූප නැති බවය, විවණ්‍ණී බවය, බොහෝ රෝග පීඩා ඇති වය, බොහෝ සෝක ඇති බවය, ප්‍රිය මනාපයන්ගෙන් වෙන්වන බවය, ආයු මද බවය යනාදී නොයෙක් අකුශල ඵල විපාකයෝ ඔහට ඇති වන්නාහුය.

තවද ප්‍රාණාතිපාත පාපකම්ය කිරීමෙහි නියුක්ත පුද්ගල තෙම එම ආත්මභාවයෙහි ම දඩු මුගුරු ආයුධවලින් පහර වැදීමෙන් නැසෙන්නේ ද වෙයි. එසින් චුතව ගොස් දක්වනලද ක්‍රමයෙන් ම සතර අපායක් විද බොහෝ දීඝකාලයකින් එසින් මිදී අවුත් මනුෂ්‍ය ජාතියෙහි දවසින් දවසට වඩනා මහත් සම්පත් ඇති කුලයෙක්හි දක්නට නිසි සේ දුටු දුටුවන්ට සතුටු ප්‍රසාද ඵලවන උතුම් ශරීරවණ්‍ණී පොකඩතායෙන් සම්පූර්ණව උපන්නේ වී නමුදු එබදු සම්පත් නොවළඳ තරුණ වයසෙහි ම එකාන්තයෙන් මරණයට පැමිණේ.

එ හෙයින් කියන ලදී.

සබ්බොපභොග ඛන ඛඤ්ඤ විසෙසලාභි,
රූපෙන හො ස මකරඬජ සන්නිභොසි
යො යොබ්බනෙ පි මරණං ලහතෙ අකාමං
කාමං සදු තු පරපාණ හරො නරො ගි සි.

එ හෙයින් ප්‍රාණාතිපාත අකුශලකම්ය කළ සත්ත්වයෝ අහස්හි සිටියාහු නමුදු සමුද්දම්බයට පැමිණියාහු නමුදු විදුරු පර්වතගුහාවකට වැදුනාහු නමුදු ඒ පාපකම්යෙන් නොමිදෙන්නාහු ය.

හේ කෙසේ ද? යත්:

පෙර එක් මිනිසෙක් කම්මාන්තයෙහි නොපවත්නා ගොණකු පිදුරු ලා ගිනි දල්වා මැරුයේය. හෙතෙම ඒ කම්මයෙන් අවීචි මහා නරකයෙහි ඉපිද නොයෙක් වාදහස් පැසී මහ දුක් විද එසින් මිදී ගියකල සියක් ජාතියන්හි අහස්හි ම පිදුරු ගින්නෙන් ද මරණයට පැමිණියේය.

අන්‍යවූ සත්‍යක් ද බල්ලෙකුගේ ග්‍රීවයෙහි වැලිකළයක් බැඳ දියෙහි ගිල්වා මරා ඒ පාපකම්යෙන් අවීචියෙහි ම ඉපිද අනන්තවූ දුක් අනුභව කොට එසින් මිදී ගියබාල සියක් ජාතියක නැවී නැගී යනකල මුහුදු මැදට නැව පැමිණිකල ඇගේ

ඒ පාපකම්බලයෙන් නැව නො ගොස් බැන්දුක්මෙන් සිටි බව දූක විමසා කාලකණ්ණි සලෑකය ඇද එය ඇඟේ නමට ම පැමිණි හෙයින් එසේ ම කර වැලි බැඳ දියෙහි ගිලනලදුව මරණයට පැමිණියාය.

අන්‍යවූ ද ගොපලු දරුවන් සත්දෙනෙක් ගොයකු තුඹස කට වන් බව දූක ඒ තුඹස සිදුරුමුඛ වසා සිට සත් දවසක් ගියකල හැරියාහු ය. ඒ ගවපාලක දරුවන් සත්දෙන ඒ ගොයා නො මැරූ බැවින් නරකයට නො ගොස් දසසහස්‍ර වාර යක පවිත්‍රවිවරයට වැද ගල්පුවරුවෙන් වැසිගිය දෙරණැතිව සත් සත් දවස් නිරාහාර ව දුකින් ම වැස ජීවිතය පමණක් රැකි නික්ම ගියාහුය. මෙසේ ප්‍රාණාතිපාත පාපකර්මය කළාහු අහස්හි සිටිය නවුත් මුහුදු මැදට පවිත්‍රවිවරයට එන්නාවූ නවුත් ඒ පාපයෙන් මිදීමක් නැත්තාහුය. මෙම බුදුන් විසින් වදරණ ලදමැයි.

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසෝ
යත්‍රට්ඨිතෝ මුච්චෙය්‍ය පාපකම්මා යි

අදත්තාදානය නම්.

වසතුව හිමියාගේ කැමැත්තෙන් හෝ වචනයෙන් හෝ නො දුන් අන්‍යයන් සන්තක වස්තුව ගැණීම අදත්තාදාන නම්. ඒ කෙසේ ද? කිවහොත්, යම්කිසි වස්තුවක් යමක්හු තමූ කැමැති පරිද්දෙන් අනුභවකරණ කල්හි ලොව ඇත්තෝ ඒ දූක අන්‍යයන් සන්තක දෙයක් මෙහු අනුභව කරන්නාහ. නින්දුවක් නො කෙරෙද්ද නීති දන්නා අය විචාරා දඩයක් ඔහුට නො පමුණුවද්ද, ඒ වස්තුව ඔහු සන්තක වස්තුව නම් වන්නේය. එසේවූ වස්තුවක් අන්‍යයන් සන්තකය යි දූන දූන ඒ වටිනා දෙයකු ත් නො දී යමෙක් හැරගන්නේ වී නම් ඔහුගේ ඒ හැර ගන්නා ප්‍රයෝගය පහළ කරන්නාවූ කායවාර වාග්වාර දෙක්හි යෙදී පැවැත්නාවූ චෙතනාව අදත්තාදාන අකුශල නම් වන්නේය, හේ වදාහි:-

මනුස්ස භණ්ඩං තථාඅඤ්ඤේ ථෙය්‍යවි ත්‍තං උපක්කමෝ,
තෙනෙව භණ්ඩහරණං පඤ්ච අඞ්ගානි ථෙනිතෙ-යි.

යනු හෙයින් යමෙකු ඇරගන්ට ඔහු වස්තුව අනික් මිනිසෙකු අයිති බවය. එසේ අන්‍යයන් අයිතිය යි කියා තමාව ත්

සිතෙන බවය; හිමියන් නො විචාරා නො කැමති සේ ඇරගැණීම් යන කල්පනා ඇති බවය අනුන් ලවා හෝ තමා විසින් හෝ ඇර ගන්ට කරණ පංචප්‍රකාර උත්සාහ ප්‍රයොගයන් අතුරෙන් එක්තරා ප්‍රයොගයක් ඇති බවය. ඒ කළ ප්‍රයොගයෙන් අනුන්ට හෝ තමාට හෝ අයිතිකොට ඒ වස්තුව ඇර ගැණීමය යන මේ කාරණයන් පස්දෙනාගේ එක්වීමෙන් අදත්තාදාන අකුශලය සිඹවේ. එයින් එක් කාරණයකු දු අඩුවුව අදත්තාදාන අකුශලය සිඹ නො වේ.

එහි අනුන් අයිති වස්තුව වංචාවෙන් ගැණීමය. යන **ථෙය්‍යාවහාරය** බලාත්කාරයෙන් ගැණීමය යන **පසභ්භාවහාරය** සහවා ගැන්මය යන **පටිච්ඡන්නාවහාරය** කල්පනා වශයෙන් නියම කර ගැන්මය යන **පරිකප්පාවහාරය** කුසප්පත් සලකුණු පමුණුවා ගැන්මය යන **කුසාවහාරය** යන මේ පංචප්‍රකාර අවහාර යන් වශයෙන් ද යමෙක් මහවනාන්තර බැදි තැන් ආශ්‍රයකොට එහි සැඟවී සිට කරණ සොරකම් ද, උමං බිඳ අදුරෙ සැඟවී සිට කරණ සොරකම්ද, තරුදියෙන් පලමින් කරණ සොරකම් ද තෙල් ආදිය මිනිමෙන් වස්තු හිමියන්ගේ ඔත් බිඳුවා කරණ සොරකම් ද, විදිආදිය මිනිමෙන් ඉම වරදවා ගැන්මෙන් කරණ සොරකම්ද, සොර පණම් ආදිය දී කරණ සොරකම් ද, යනාදි වශයෙන් ද පංචප්‍රකාර සොරකමු ත් අදත්තාදාන නම්වෙයි.

යමෙක් බලාත්කාරකම් හඟවා ගම් පැහැරීම ආදි වශයෙන් අනුන් සන්තක දේ බලාත්කාරයෙන් උදුරා ගැන්ම ද, ගතයුතු නියම වූ අයබදු අමුතුවෙන් වඩා වඩා ගැන්ම ද, ලොක නීති වර දවා දඩගැන්මද, අදත්තාදාන අකුශල නම් වේ. මේ හැම තන්හිම වස්තුව තමා අයිතිකොට ගත් කල්හි ම අදත්තාදාන අකුශලය සිඹ වේ. යමෙක් අනුන් සන්තක දැසයකුවත් දැසියකුවත් ගොන් මීහාන් දෙනුන් කුකුළන් බල්ලන් බළලුන් ආදිවූ යම් කිසි සත්තයකුවත් වංචාවෙන් ගණිමි යන සිත් ඇති ව කයින් කළ ප්‍රයොගයකින් හෝ වචනයෙන් කළ ප්‍රයොගයකින් හෝ හිටිතැනින් අහලක් පමණ තැන්වත් ඇත් මැත් කෙලේ වී නම් පසුව හැරපියා ගියත් අදත්තාදාන අකුශලය ඔහට සිඹවන්නේය. කෙත් වත් ආදි සථාවර වස්තු යම්කිසිවක් නිසා යුක්තායුක්ති නඩු විනිශ්චයකිරීමක් පැමිණි තැන හිමි කොට අහිමි කොට කී කල්හි හිමිපුරුෂතෙම ඒ අසා "මේ ලාභය මට සම්භ නො වන්නේ යයි සිතා" ඒ වස්තුයෙහි පැවති ඔහුගේ ආලය හැරපියේ වී නම් ඒ ආලය හැරපීම හා සමඟ ම අයුක්ති කොට කී අයව ද ඊට සහා

යම සාක්‍ෂ්‍ය කී අයට ද අදත්තාදාන අකුශලය සිදුධ වේ. ආරාම උද්‍යානාදි යම් තැනක තුබූ අන් සන්තක බඩුවක් දක "ඒ බඩුව වංචා කොට ගණිමි" සිතා බිමින් කෙසඟක් පමණතැන් ඔසවා ගත් කෙණෙහි හෝ ඈත කෙළවර මැත කෙළවර ගෙවා පැමිණි කෙණෙහි ම අදින්නාදාන අකුශලය සිඹ වේ. එසේ ගෙණ නැවත තුබූ ලෙස ම තබා ගිය ත් සසර විසිම ඇත්තාහට ඒ පාපයෙන් මිදී ම නැත්තේ ය. අනුන් අයිති කෙතකින් කරලක්වත් ගසකින් ඵලයක් වත් මල් කොළ ආදි කිසිවක් වත් සොරසිතින් නටුවෙන් වෙන්කළ ඇඹිල්ලෙහි ම අදත්තාදාන අකුශලය සිඹ වේ. යමෙක් අනුන් අයිති රත් පණම්ආදි යම්කිසි බඩුවක් දමා තුබූවා දැක පසින් යටකිරීම් ආදි ප්‍රයොගයකින් යටිකෙළවර තුබූ තැනට මතු කෙළවර පාස් වූ ක්‍ෂණයෙහි ම අදින්නාදාන අකුශලය සිඹවේ.

යමෙක් අනුන් කි මෙහෙවරකින් හෝ තමාගේ අභිප්‍රායෙන් හෝ අනුන් අයිති බඩුවක් ගෙණ "අසවල් තැනට ගෙණ ගොස් දෙමි" යි කියා ගෙණ යනුයේ ඒ යම්න් සිට අතර මඟදී උපන් සොරසිතින් "මම ගණිමි" යි සිතා තමා ගිය තුබූ බඩුව කරට හෝ කර තුබූ බඩුව හිසට හෝ ගත්තේ වී නම් එකෙණෙහි ම අදින්නාදාන අකුශලය සිඹ වේ. පසු ව ඒ බඩුව අයිති හිමියන්ට ගෙණ ගොස් දුන්නත් ඒ අකුශලයෙන් මිදීමක් නැත්තේය. එසේම බඩුවක් ගෙණ යන මිනිසකු හෝ ගොණෙකු හෝ දැක "ඒ බඩුව ඇර ගණිමි" යන සිතින් හඟ ගැන්වූකල ඒ බඩුව දමා ගේ නම් ඔහු ගෙන් ඒ බඩුව අත්ඇරුණුවිට ම මෙහු ණො ගත්තේ වී නවුත් අදින්නාදාන අකුශලය සිඹ වේ. යමෙකුට නයට දුන් බඩුවක් වත් රක්‍ෂා කර තබන්ට දුන් බඩුවක්වත් ඉල්ලූකල බඩුව ගත් එකා නො දෙන පිණිස වංචාප්‍රයොග කොට "නො දෙමි සිතා නම් බඩුව ඇත්තහුගේ එහි පැවති ආලය ත් උත්සාහය ත් දෙවනු නො ලැබෙයි ම සිතා හැරපු කෙණෙහි ම නය ගත් එකාට හෝ බඩුව රක්‍ෂා කළ එකාට හෝ අදත්තාදාන අකුශලය සිඹ වේ. බොහෝදෙනා එක්ව "යම් බඩුවක් හැරගණුම්හ යි එක් සිත්ව කථා කොට සිටි කල්හි ඉන් එකෙක් ඒ බඩුව හැර ගත්තේ වී නම් ඒ හැම දෙනාටම අදත්තාදාන අකුශලය සිඹ වේ.

තවද යමෙක් බැම බිඳ වත් ඇසින් තරු ලා වත් හසන පෑද සංඥවකින් වත් අන්සතුදෙයක් හැරගන්ට යමෙකුට සත් කළහොත් ඒ දැන ඔහුත් ඒ බඩුව හැර ගති නම් ඒ බැම බිඳීම් ආදි සංඥකළ එකාට අදත්තාදාන අකුශලය සිඹ වේ. තවද යමෙක් යමක්හට "අසවල්හුගේ බඩුව අසවල්

තැන තිබුවා ඇර ගන්ව"යි නියොග කෙළේ ද ඒ මෙහෙවර ඇසු වාවූ පුරුෂතෙම අවුරුදු පණසකින් සැවැසින් වත් ඒ බවුව ඒකා න්තයෙන් ගත්තේ වේ ද එසේ ඇතිකල්හි මෙහෙවර කී එකාට එකඟිව ම අදත්තාදුනඅකුසලය සිඹ ව එදවස්හි ම නැසියිය නමුත් සතරඅපායෙහි උපදනේය. එසේ අනිෂ්ටවූ විපාකඇති අදින්නා දුනයේ ත් දුස්සීල මිනිසුන් සන්තක දේ ගැන්ම අල්පවූ අකුශල ය. ගොශීලාදියෙහි යෙදී වසන එකාක්හුගේ අයිතිදෙය හැර ගැන්ම ඊටත් වඩා මහත් අකුශලය, තිසරණ පිහිටි කෙනෙකුගේ අයිතිදෙය හැරගැන්ම ඊට ත් වඩා අකුශලය, පන්සිල් රක්නා කෙනෙකුගේ දෙයක් හැර ගැන්ම ඊට ත් වඩා මහත් අකුශලය, අටසිල් රක්නා කෙනෙකුන් අයිති දෙය ගැන්ම ඊටත් වඩා මහත් අකුශලය. සාමණේර කෙනෙකුන්ගේ දෙයගැන්ම ඊටත් වඩා මහත් අකුශලය. පෘථග්ජන භික්ෂූහු කෙනෙකුගේ අයිතිදෙය ගැන්ම ඊට ත් වඩා මහත් අකුශලය. සෝවන්-සකෘදාගාමී අනාගාමී රහත් යන උතුමන්ගේ දෙය ගැන්මද සෑ සන්තක දෙය ගැන්ම ද, ධර්මසන්තක බුඩ සන්තක දෙය හැර ගැන්ම ද යන ක්‍රමයෙන් සරණ ගතයා පවන් බුඩාදි තුණුරුවන් සන්තක දෙය ගැන්ම දක්වා අකුශල් මහත් බව මහාපාළවේ පස්මෙන් අප්‍රමාණ බව දතයුතුයි.

තවද යමෙක් ජීවත්වනු සඳහා ද අඹුදරු ආදීන් රක්නා සඳහා ද අනුන් සන්තක තුදුන් වස්තුව ගත්තේ වී නම් ඕහට අදින්නාදුනය මොහය මුල්ව සිඩවේ. අනුන් සන්තක දෙසින් යමෙක් තමාට ප්‍රයෝජන කැත ත් යටකියනලද ක්‍රියෙන් නවා ඝාත වස්තූන් හෙතුකොටගෙණ වෛර උපදවා ගෙණ අනුන් සන්තක වස්තුව විනාශකරන්නාහට අදින්නාදුනය මෙඝය මුල්ව සිඩ වේ. නීතිශාස්ත්‍රයෙහි කී සේ "දුෂ්ට නිග්‍රහ කරම්" හ සි කියා අනුන් සන්තක වස්තුව උදුරා ගන්නා රජ්ජුරුවන්ට ද රාජා මාත්‍යයන්ට ද සොරුන් අයිති දේ හා නො දෙන්නන් සන්තකදේ ගන්නාහට ද පවිනැතැ සි යනාදි වශයෙන් නොයෙක්දෘෂ්ටිගෙණ අනුන් සන්තක දේ ගන්නාහට ද අදින්නා දුන අකුශලය මොහය මුල්ව සිඩ වේ. මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වී මෙන් අදින්නාදුන අකුශලය නොයෙක් ප්‍රකාරයෙන් සිඩවේ. මේ අදිනාදුන අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහ? යත්,

"අදින්නාදුනා භික්ඛවෙ ආසෙවිතා භාවිතා බහුලීකතා නිරය සංවත්තනිකා හොති. තිරච්ඡාන යොනි සංවත්තනිකා

හොති, පෙන්නිවිසය සංවත්තනිකං හොති, යො සබ්බලහුසො අදින්නාදානස්ස විපාකො මනුස්ස හුතස්ස මනුස්සදෙහත්ගිය සංවත්තනිකං හොති.''

ඝනාදීන් බුදුන් විසින් වදුළ හෙයින් යම්ක්‌හු විසින් අදින්නාදානඅකුශල කර්මය ආසෙවිත භාවිත බහුලීකෘත වශයෙන් කරණ ලදද ඒ සත්වයෝ නරක දුඃඛාදි සියලු දුඃඛොත්පත්තියට නිසි වූ බලාවූ එම පාපකර්ම බලයෙන් නරකාදි සතරඅපා දුක දක්වනලද ක්‍රමයෙන් අනුභවකිරීමෙන් ප්‍රමාණාතික්‍රාන්තවූ දීඝීකාලයක්‌හුගේ ඇවැමෙන් පවි ගෙවී ගියකල කිසියම් පින්කම් බලදරකින් මිනිසත් බවට පැමිණියාහු නම් අවශෙෂවූ සියල්ලෙන් කුඩාවූ අදින්නාදාන පාපකර්ම තෙම නොයෙක් පරිද්දෙන් අසරණවූ ඉතා දිළිදු දුගි බවට පමුණුවන්නේ වෙයි.

තවද,

''සඨාරූපානං වො පාපකානං කම්මානං හෙතු රූපානෙ, ආහුවාමිං වොරං හඤ්ඤන්වා විවිධා කම්මකරණා කාරෙන්ති'' යි වදුළ බැවින් ඒ අදත්තාදාන පාපකර්ම සම්බන්ධි පුද්ගලයාගේ මේ ආත්මභාවයෙහි නටු සහිත වේවැල්පහර ලැබීම් ආදි නොයෙක් දුඃඛානුභවයට නිසිවූ ඒ පාපකර්ම හෙතුවෙන් එම ජාතියෙහි ඔහට සත පහර වේවැල් පහර දෙති. අඩබානුප්‍රමාණ දණ්ඩන් තළති. එසේ ම ඔහු අත් කපති, පා කපති, අත් පා කපති, කන් කපති, නාසා කපති, කන් නාසා කපති. මේ ආදි සියලු දුකට කාරණවූ එම අදින්නාදාන පාපකර්මබලයෙන් ම නොයෙක් වර්ෂකොටි ශත සහස්‍රවල ඇරඹවූ නරකදුක් අනුභව කොට එයින් මිදී ප්‍රෙතයොනියෙහි ඉපිද එහි මහත්වූ සා පිපාසා දුක් අනුභවකිරීමෙන් නොයෙක් අන්‍යාකල්ප අන්ත්‍රාන්න ව ගියකල හෙතෙම මිනිසත් බවක් ලද්දේ වී නම් එහි ද ඉතා දිළිදු ව බැගැපත් ව යාචක ව දුටු දුටුවන්ට හො රිසි වන සේ විරූප ව නිඝු නපුරුවවන සියගණන් කියා තැති ගන්වනු ලබමින් නොයෙක් කුණුරෙදි වැරලි ශොතා ඉන වට වසාගෙණ උකුණන් විසින් ගැවසීගත් හිස් ඇති ව රජස් දූලි වැකිගිය ශරීර ඇති ව ශොක පිරිසිවි සිත් ඇති ව නිරන්තර සෙන් නොයෙක් අදෝනා විලාප කිමෙන් වෙහෙසවූ මුඛ ඇති ව මනුෂ්‍යප්‍රෙත ව වෙවලන බිඳුනු ශරීරයෙන් කබල් ගත් අත් ඇති ව දෙර දෙර සිහා ඇමිදින්නේය. එහෙයින් කියනලදී, පුරාතන යන් විසින්—

යො යාවකො හවති හින්න කපාල හත්ථො
මුණ්ඩා ඩිගකඛර සතෙහි ව තජ්ජයන්තො,
භික්ඛං සදූරි භවනෙ ස කුවෙලවාසො
ඥදිහි පරත්ථ දරවිත්ත හරො නරො හි.

මෙසේ මෙලෝ පරලෝ දෙක්හි ම සියලු දුක් ඵල කොට ඇති අදින්නාදාන අකුශලයෙහි යෙදුනු සත්ව තෙම මිනිස්ලොව උපනු පන් ජාතිවලැ බොහෝ වූ ධන ධාන්‍යයන් නැති බවය, හොග සම්පත් ඉතා මද බවය, නුපන් හොග නුපදිමය, උපන් හොග සිර කොට විමය, කැමති සේ පඤ්චකාමසැප කොට ලැබීමය, රජ සොර දිය ගිනි අප්‍රියෝය යන උපද්‍රව වලින් නැසෙනසුලු හොග සම්පත් ඇතිබවය, අසාධාරණ උතුම් ධනයන්ගේ කොට ලැබීමය, සියලු ලොකයාට යටත්වන නීවබවය, ඇතැ සි යන වචනයාගේ ඇසීමක් නැතිබවය, හැමකල්හි දුකින් ම වාසයකරණබවය, යන මේ ආදිවූ අනන්නවූ අකුශල ඵලවිපාකයෝ ඔහට ඇතිවන්නාහුය.

මෙසේ සියලු දුකට හාජනවූ අදින්නාදාන අකුශලයාගේ ප්‍රහෙදදීනව මේ ක්‍රමයෙන් අසා දැන ඇඳින තම්හට වැඩ කැමති සත්පුරුෂ ජනයන් විසින් අනුන් සන්තක සියලු වසතුව ගිනි සෙයින් විෂ සෙයින් සොරවිෂ සපියන් සෙයින් දුරින් ම දුරු කොට එයින් සුණුවතක් දැ කඹනුල් පවක් සමණවූ ඉතා මද දෙයක් වත් තම තමා ත් නො ගතයුතුයි. අනුන් ලවා ත් නො ගැන්විය යුතුයි. මෙම දක්වනලදමැයි,

එවං අදින්නං ධනමාදියන්නා
දිඨෙව ධම්මෙ නරඅකසු වාපි,
පපොති දුක්ඛං ව්‍යසනඤ්ච නෙකං
සදා පරත්තෙසු රතෝ නරෝ හි.

තතෝ අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි ක්වචි සාවකෝ බුජ්ඣමානෝ,
න හාරයෙ හරතං නානුජඤ්ඤ
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය-යි.

මේ අදින්නාදාන අකුශලයාගේ ආදීනවයි.

කාමම්මිච්ඡාචාරය නම්, ක්ලේශකාම වශයෙන් හැසිරෙණ ලාමකවූ නීචදිනවූ කායචාරයෙන් ම සිඛවන අකුශල කර්මපථ ශෙක්මය. හෙද වනාහි අනුන් සන්තක ස්ත්‍රියක් බවය, මේ ස්ත්‍රිය අන්සන්තකය යි දැන මෛථුනසෙවනය කෙරෙමි යන සිත ඇතිබවය, මහින් මඟ මෙහෙයන බවය, ඉවසීමය යන මේ කාරණයන් සතරදෙනාගේ එක්වීමෙන් කාමම්මිච්ඡාචාර අකුශලය සිඛ වේ.

එහි අනුන් සන්තක පරස්ත්‍රිහු නම් කවරහුද? යත්;

මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතුපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා,

ධම්මරක්ඛිතා ආරක්ඛා, සපරිදණ්ඩා, ඔනක්ඛිතා, ජඤ්ඤවාසිනි, පටවාසිනි, ඔදපත්තකිනි, ඔහිතවුම්බලා, දූසී, භරියා, කම්ම කාරී ච භරියා, ඔජාහලා, මුහුත්තිකා'' ති-ආදී.

මෙසේ පරස්ත්‍රිහු නම් විසිවැදෑරුම් වන්නාහුය. එයින් පුරුෂයන් හා අනාචාරයෙහි යෙදෙන්නා කැමැති ව මැනියන් විසින් රක්නාලද ස්ත්‍රිය මාතුරක්ඛිතා නම් වන්නීය. එසේ ම පියාගන් විසින් රක්නාලද ස්ත්‍රිය පිතුරක්ඛිතා නම් වන්නීය. මවු පිය දෙදෙනා විසින් රක්නාලද ස්ත්‍රිය මාතුපිතුරක්ඛිතා නම් වන්නීය. බෑයා විසින් රක්නාලද ස්ත්‍රිය භාතුරක්ඛිතා නම් වන්නීය. බුහුනනියන් විසින් රක්නාලද ස්ත්‍රිය භගිනිරක්ඛිතා නම් වන්නීය. නැගන් විසින් රක්නාලද ස්ත්‍රිය ඤාතිරක්ඛිතා නම් වන්නීය. සඛිය ගොත්‍රයෙහි ඇත්තන් විසින් රක්නාලද ස්ත්‍රිය ගොත්ත රක්ඛිතා නම් වන්නීය. ස්ත්‍රිය බාලකාලයෙහි ම "මෑ මට භායිත්‍රී වන්නීය" යි කියා මල් පිළි පලඳවා හෝ ඇවත්පිරිසෙසින් මල්දමක් පමණ වත් දීමෙන් නියමකරණලද ස්ත්‍රිය ආරක්ඛා නම් වන්නීය. මෙනම් ස්ත්‍රිය ලඟට ආවුන්ගෙන් මෙතෙක් දඬය යි සම්මතකරණ ලද ස්ත්‍රිය සපරිදණ්ඩා නම් වන්නීය. පුරුෂයා විසින් මිල දී ගෙණ වාසඅකරණලද ස්ත්‍රිය ඔනක්ඛිතා නම් වන්නීය.

පුරුෂයා හා තමාගේ හෘදයන් එක්ව වාසඅකරණ ස්ත්‍රිය ජඤ්ඤවාසිනි නම් වන්නීය. දෙමවුපිය ආදී කැයන් විසින් මේ භාර්යාගේ උදකය මෙන් තොප දෙදෙනා වෙන් නො වෙත්වා යි කියා මහුල් කොට පාවා දෙනලද ස්ත්‍රිය ඔදපත්තකිනි නම් වන්නීය. පැන් තොට ආදි තැන්හි දැක දිය දර අදනා පිණිස හිස තුබූ සුඹුලු බහවා පියා භාර්යා කොට ගෙන වසන ස්ත්‍රිය ඔහිත වුම්බලා නම් වන්නීය. දැසීව සිට සවාමියා කෙරෙහි වාසඅකරණලද ස්ත්‍රිය දූසී නම් වන්නීය. තමාගේ සවාමියා කෙරෙහි වාසඅකරණ ස්ත්‍රිය භාර්යා නම් වන්නීය. මේ කී තාක් ප්‍රකාරයෙන් පිටත් ව ගෙයි මෙහෙ කොට වසන ස්ත්‍රිය කර්මකාරී භාර්යා නම් වන්නීය. යුඛ කොට දිනූ තැනින් ගෙණෙනලද ස්ත්‍රිය ඔජාහලා නම් වන්නීය. අවධි පරිවෙජද කොට මෙතෙක් දවසට මෙතෙක් මිලය යි මිල නියම කොට ගත් වෙශාස්ත්‍රිය මුහුත්තිකා නම් වන්නීය යන මේ ස්ත්‍රිහු විසිදෙන ම පරදාරාවෝ නම් වෙත්. මොවුන් විසිදෙනා කෙරෙන් පලමු කොට දැක්වූ මාතුරක්ඛිතාදි ස්ත්‍රීන් අවදෙනා හා මාතා ආදී ඒ ඒ ආරක්ෂකයන්ගේ නියොගයෙන් අනාචාරයෙහි යෙදුනු පුරුෂයන්ට පාපකර්මය නො වෙයි. එසේ කැතිවුන්ට පරදාර පාපකර්මය සිඛ වේ. ඒ ස්ත්‍රීන් අවදෙනාගේ ශරීර

ස්පර්ශයට හිමිවූ අනික් සවාමිපුරුෂයෙකු නැතිහෙයින් මාතුරක්ෂිතාදි ඔවුන් අවදෙනාට කාමමිථ්‍යාචාර පාපය සිඹ නො වේ. අවශෙෂ දෙළොස්දෙනා හා අසඛර්මයෙහි පැවති පුරුෂයන්වද ඒ ස්ත්‍රීන් දෙළොස් දෙනාවද කාමමිථ්‍යාචාර පාපය ගව කියන ලද අඛ්‍යයන්ගේ එක්වීමෙන් ම සිඹ වේ. එහි අදින්නාදන අකුශලය ගුණහීනයන් පවත් අධික ගුණඇති උතුමන් දක්වා පාපය මහත්වූ සේ මෙහි ද නිසරණය පඤ්චශීලය අෂ්ටාඞ්ග ශීලය යනාදි ශීලගුණධර්මවල පිහිටා විසන සත්‍රීන් හා අනාචාර යෙහි යෙදීමෙන් ද අකුශල් මහත්වන බව දතයුතුයි.

තවද මෙහි ස්ත්‍රීන් විසිදෙනාගේ යහපත්වූ ශරීරවර්ණ ශොභාවෙහි හා වස්ත්‍රාභරණ හස්ත පාදාදියෙහි ආලය උපදවා ද තමාට ප්‍රියවූ එබඳු රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය යන පඤ්චකාම සෙවනයෙහි ආලය උපදවා ද ඔවුන් හා කළ එක්වීම් නිසා මෙවැනි ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ඇතාන් තර ලැබීම හා සුවසේ ජීවත්වීම පිළිවනැයි කියා ඒ හැමතැන්හි ලොභ උපදවා අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය ලොභය මුල් ව සිඹ වේ. පරස්ත්‍රීන් විසිදෙනා කෙරෙහි දු ඔවුන්රක්නා ෙවුපිය ආ්‍රන් හා සවාමිපුරුෂයන් කෙරෙහි දු වෛර උපදවා ඔවුන්ගේ මාන නසම් යන කල්පනාවෙන්, අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය වෙෂය මුල් ව සිඹවේ. යමෙක් එම ස්ත්‍රීන් විසිදෙනා අතුරෙන් මෙනම් මෙනම් ස්ත්‍රියක හා අනාචාරයෙහි යෙදීම් වරද නැතැයි යනාදීන් තමාගේ සිත් සේ ම නොයෙක් දෘෂ්ටිගෙණ අනාචාරයෙහි යෙදෙන්නාහට මිථ්‍යාචාර අකුශලය මොහය මුල් ව සිඹ වේ. මෙසේ ලොභාදි අකුශල ධර්මයන්ගේ එක්වීමෙන් මිථ්‍යාචාර අකුශලය නොයෙක් ප්‍රභෙද වේ. මේ කාමමිථ්‍යාචාර අකුශලයාගේ ප්‍රභෙදයි. එහි ආදීනව නම් කවරහ? යත්

කාමෙසුමිච්ඡාචාරෝ හිකඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති, තිරච්ඡානයොනි සංවත්තනිකො හොති, පෙත්තිවිසය සංවත්තනිකො හොති. යො සඛබලහුසො කාමෙසුමිච්ඡාචාරස්ස විපාකො මනුස්සභූතස්ස සපත්තවෙර සංවත්තනිකො හොති-යි

යනාදීන් බුදුන් විසින් වදාළෙහයින් අමෙඛ විසින් කාමමිථ්‍යාචාර අකුශලය ආසෙවිත භාවිත බහුලීකෘත වශයෙන් පුරුදුකරණ ලද ද ඒ සත්වයෝ බොහෝ දීඝීකාලයක් මුළුල්ලෙහි නරකාදි සතරඅපායක් අනුභවකොට එයින් මිදී ගියකල

මිදී හිඟකල කිසියම් පින්කම් සිදුරකින් මිනිස් පියක් ලද හොත් ශෙෂ ව සිටි එම මිථ්‍යාචාර අකුශලකර්ම විපාකයෙන් උපතුපන් ජාතිවල තමාට බොහෝ සතුරන් ඇති බවය, සියලු දෙනාට අප්‍රිය බවය, ආහාර පාන වස්ත්‍ර සයනාසනාදීන් තෘප්තියක් නොලැබීමය, දුකින්ම නිදීමය, නාවතබවය, දුකින්ම පුබුදිනාබවය, අපාය භයින් නොමිදෙනබවය, ස්ත්‍රී ව නපුංසක ව උපදනාබවය, බොහෝ ක්‍රොධ ඇතිබවය, නොපිරිසිදු කටයුතු ඇතිබවය, ස්කන්ධය නැමී වැටී සිටිනබවය. කිමට නැමී ගටිකුරු මුහුණ ඇතිව සිටි බවය, ස්ත්‍රී පුරුෂ දෙදෙනා ඔවුනොවුන්ට අප්‍රියබවය සම්පූර්ණ වූ ගඟපත් වූ වක්ෂුරාදි ඉන්ද්‍රියයන් නැතිබවය, සම්පූර්ණ ලක්ෂණ නැතිබවය, නිරන්තරයෙන් කුකුස් ඇතිබවය, හැමලෙසින් ම භය ඇතිබවය, ප්‍රිය මනාපයන් කෙරෙන් වෙන්වන බවය යනාදි නොයෙක් අනිෂ්ට දුර්විපාකයෝ එම මිථ්‍යාචාර අකුශලයෙන් වන්නාහුය.

තවද පරදුරසෙවනයෙහි නියුක්තවූ පුද්ගලතෙම මේ ආත්ම භාවයෙහි ම ධන පැහැර ගැනීම් වධ හිංසාකිරීම් ආදි අනෙකප්‍රකාර දුඃඛයෙන් අභිභූත ව මහත්වූ අනය ව්‍යසනයට පැමිණ වෙහෙසී මෙන් එයින් චුතව නරකයෙහි ඉපිද එහි නොඉවසියහැකි මහත් තීව්‍රදුක් අනුභව කොට ඉදින් යම්කිසි කලක මනුෂ්‍යත්වය ලබන්නේ වී නම් සියක් ජාතියෙහි එම අකුශලයෙන් ම ස්ත්‍රී බවට පැමිණේ. එබැවින් ලොකයෙහි ස්ත්‍රී නොවූ පුරුෂයෙකුත් නැත්තේ මය. එසේ ම පුරුෂ නොවූ ස්ත්‍රීයකුත් නැත්තේ මය. එ පමණක් මතු නොයෙසි. පණ්ඩක නපුංසක භාවයට ද ඒ මිථ්‍යාචාර අකුශලයෙන් ම පැමිණෙන්නේය. එහෙයින් "පුරිසා හි ඉත්ථියො වා ඉත්ථියො වා පුරිසා අභූතපුබ්බා නාම නත්ථි" යනාදීන් මෙම ආදීනව දක්වා වදරණලදී.

සුරාපානය කිරීමත් මිථ්‍යාචාර අකුශලය සේ ක්ලේශකාම යෙහි යෙදීම කැමැත්තන් විසින් සෙවනය කටයුතු පාපයක් වන බැවින් හා ක්ලේශකාම අකුශල් වූ කායදුශ්චරිත අකුශලය ම වන බැවිනුත් ඒ සුරාපාන අකුශලයාගේ ප්‍රභෙදදීනව ද මෙහි ම දක්වනු ලැබේ.

සුරාමෙරය නම්, සුර නම් වැද්දකු විසින් පළවූවෙන් ම දුටු බැවිනු දු ඔහු විසින් ගෙණ ආ බැවිනු දු මත්වන දෑයට සුරා යයි කියනු ලැබේ. හේ වනාහි පිටඨ සුරාය, පූව සුරාය, බදනීය සුරාය, කිණ්ණ පක්ඛිත්ත සුරාය, සම්භාර සංයුත්තක සුරාය යි කියා පඤ්චප්‍රකාර වේ. එම පඤ්චප්‍රකාර සුරාවන්ගේ ම

විශේෂයක් වූ මේරය ද, පුෂ්පාසවය, ඵලාසවය, ගුළාසවය, මධ්වාසවය, ඍමහාර සංයුක්තකාසය යි කියා පඤ්චප්‍රකාර වේ. මෙසේ නොයෙක් ප්‍රකාරවූ සුරා මේරය යි කියනලද යම් කිසිවක් බීපු කෙනෙකුන් කාපු කෙනෙකුන් මත්වන හෙයින් ද කවයුතු කාරියට පමා වන හෙයින් ද සුරා මේරය පානය කරන්නාවූ චෙතනාවට පමාදඬාන යනු නමකි. ඒ සුරාමේරය අකුශලය නම් වන්නේය. එහි පතක් පමණ සුරා බීම අල්ප අකුශලය. දෙතක් ප්‍රමාණ බීම ඊට ත් වඩා අකුශලය. කය වලිත කරවන්ට නිසි පමණ රා බීම ගම් පැහැරීම් මං පැහැරීම් කරන්නහුගේ සුරා පානය කිරීම මහඅකුශලයකි. ඒ එසේමැයි, සුරුපානය ද ශ්ව කියනලද ක්‍රමයෙන් නොයෙක ප්‍රකාරවූ සුරා අතුරෙන් එක්තරා රහමෙරක් බවය, බොහු කැමති සින් ඇතිබවය, බීමට කරණලද උත්සාහය ඇතිබවය, උතුරෙන් පල්ලේ වැටුන බවය යන මේ අඩහයන් සතරදෙනාගේ එක්වීමෙන් හා ලොභාදි අකුශලයන් තුන්දෙනාගේ එක්වීමෙන් ද ඒ අකුශලකර්මය කර්මපථ බවට පැමිණේ. මේ සුරාපාන අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහ? යත්, "'සුරාමේරය පානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරය සංවත්තනිකං හොති, තිරච්ඡාන යොනි සංවත්තනිකං හොති, පෙත්තිවිසය සංවත්තනිකං හොති, යෝ සබ්බලහුසෝ සුරාමේරය පානස්ස විපාකෝ මනුස්ස භූතස්ස උම්මාද සංවත්තනිකෝ හොති"– යි යනාදීන් බුදුන් විසින් වදළ හෙයින් යම් කිසිවක්හු විසින් සුරාපාන අකුශලය ආසෙවිත භාවිත බහුලීකෘත වශයෙන් සෙවනය කරණලද ද හෙතෙම නරකාදි සතරඅපායෙහි ඉපිද නොයෙක් වා දහස් මුළුල්ලෙහි මහදුක් විඳ පවි ගෙවී ගියකල එයින් මිදී කිසියම් පින්කම් සහායකින් මිනිසත් බවක් ලද්හොත් ශෙෂ ව සිටි සුරාපාන අකුශල විපාකයෙන් උපනුපන් ජාතිවලැ උමතුභාවයට පැමිණීමය, සිහිමුළාබවය, තුන්කල්හි පැවති කවයුතු කෘත්‍යයන්ගේ වහා දැන්මක් නැතිබවය, නුවණ හීනබවය, අලසබවය, ජඩබවය, ශෞචනමද්දියෙන් මත්වනබවය, කළමිනා දෙයෙහි ප්‍රමාදබවය, මුළාබවය; නැති ගන්නාබවය, ඊර්ෂ්‍යා බහුලබවය, දැඩිබවය, ගොළුබවය, බිහිරිබවය, බොරු කියන බවය, කේලාම් කියන බවය, පරුෂවචන කියන බවය, නිරර්ථක සම්ඵප්‍රලාප දෙඩවන බවය, හැම වේලාවෙහි ම කෘතඥ කෘර නො දන්නා බවය, ගුණ නැති බවය, මසුරු බවය, දුස්සීල බවය, වඩක බවය, ක්‍රොධ බහුල බවය, ලජ්ජා නැති බවය,

භය නැතිබවය, මිථ්‍යාදෘෂ්ටි ඇතිබවය, මහත් නො වනබවය සප්පාපොවිත ප්‍රඥ නැතබවය, පණ්ඩිත නො වනබවය, වැඩ අවැඩ දන්මෙහි සමර්ථ නො වනබවය යන මේ ආදී නොයෙක් අනිෂ්ට ඵල විපාකයෝ සුරාපාන අකුශලයෙන් ඇතිවන්නාහුයි. අපිව-යම් කෙනෙක් හලාහල විෂයක් වැනි සුරාමේරය පානය කරන්නාහු ද, ඔහු ඒ අකුශලයෙන් නරකයෙහි ඉපිද නොයෙක් වර්ෂ කොටි ශත සහස්‍රවල පැසී මහත් දුක් අනුභවකිරීමෙන් නැවත එයින් චුතව දුක සේ කිසිකලෙක්හි මනුෂ්‍යජාතියක් ලද්දහු වී නවුදු උමතු වන්නාහුය. ලජ්ජා නැතිවන්නාහුය. ඉතා බැගැවූ දුඃඛිතවූ ශොකයෙන් පිරිගිය සිත් ඇති මහත් විරූපවූ ශරීර ඇතිවන්නාහුය. එහෙයින් මෙම කියනලදි පුරාතනයන් විසින්:—

උම්මත්තකා විගත ලජ්ජි ගුණා භවන්ති
දීනා සදු ව්‍යසන සොක පරාහතා ච,
ජාතා හවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහල විසං ව සුරං විපඤ්ඤූ-හි.

සුරාව දිව්‍යලොක ගමන බාධාකිරීමට බැඳි මහත් පවුරක් වැන්න. රාගාදි කෙලෙසුන්ගේ උත්පත්තිස්ථානයකි. තුන් භවයට ම පිහිටය. බුබාදී තුන් මහා පුරුෂයන් විසින් ගර්හිතය. කායාදි චාරත්‍රයෙන් සිඛවන සියලු දුශ්චරිතයන්ගේ සිඛිවීමට කාරණය. තුන් ලෝවාසීන්ට පිහිටවූ උතුම් බුඛශාසනය ද විනාශ කරයි. එහෙයින් කියනලදී: –

නිදිවාවරණං නිමලපහවං
නිභවස්ස ගතිං නිජතා වමනං
නිවිධස්ස පි දුච්චරිතස්ස හිතං
නිභවුබහව සාසන නාසකරං-හි.

මෙසේ මහත් ආදීනව ඇති සුරාපානයෙහි ආදීනව මෙයට වඩා කුමක් කියමෝ ද? කෙසේ කියමෝ ද? එහෙයින් කිය නොහැකි අනන්ත ආදීනව ඇත්තේ හි බුඛශ්‍රාවකයන් විසින් දතයුතු. මේ සුරාපාන අකුශලයාගේ ආදීනවයි.

මුසාවාදය නම්:– නැත්තාවූ අසත්‍ය යම්කිසි කාරණයක් ඇත්තක් ලෙසින් සත්‍යයක් ලෙසින් අනිකක්හට දන්වීමයි. ලක්ෂණ හෙයින් ඒ සත්‍යවූ නැති යම්කිසි කාරණයක් සත්‍යවූ සැබෑ ලෙසින් අනිකක්හට දන්වනු කැමැත්තහුගේ

කායවාග් වාරදෙක්හි එසේ ම පවත්නා විඤ්ඤත්ති පහළ කරන්නාවූ චෙතනාව මුසාවාද නම් හේ කෙසේද? යත්; නැතිවූ හෝ ඇතිවූ හෝ යම්කිසි කාරණයක් අනුන්ට විපරීත කොට හඟවනු කැමති සිතින් කළ දෙයක් නො කෙළෙම් කිම ද, නො කළ දෙයක් කෙළෙම් කිම ද, දුටු දෙයක් නු දුටුයෙම් කිම ද, නො ඇසූ දෙයක් ඇසූයෙම් කිම ද යනාදි ක්‍රමයෙන් ඇසය, කණය, නාසය, දිවය, ඇඟය, සිතය යන මේ සඳෙරින් ස්පර්ශී වේදනා යනාදි වසයෙන් දත් දෙය නො දත්තෙම් යි කිම ද, නො දත් දෙය දත්තෙම් යි කිම ද, නො සිතූ දෙය සිතීම් යි කිම ද, සිතූ දෙය නො සිතීම් යි කිම ද, සිතා පිණිස වත් කුඛාවූ දෙය මහතැ යි කිම ද, මහත් දෙය කුඛා යි කිම ද, උස්වූවන් මිටිය යි කිම ද, මිටි වූවන් උසය යි කිම ද, යහපතුන් නපුරු යි කිම ද, නපුරු මිනිසුන් යහපතැ යි කිම ද, නුවණ ඇත්තවුන් නුවණ නැතැ යි කිම ද, නුවණ නැත්තවුන් නුවණ ඇතැ යි කිම ද යන මේ ආදී වශයෙන් සතර අඩහයන්ගේ එක්වීමෙන් මුසාවාද කම්පථය සිඛ වේ.

එහි සතර අඩහයෝ නම්:— අහුතවූ මුසාවාදයක් බවය, එසේ ඇති තතු නැතිකොට වරදවා හඟවම් යන සිත් ඇතිබවය, ඊට දක්වන තොයෙක් ප්‍රයෝගයන් අතුරෙන් එක් ප්‍රයෝගයක් ඇති බවය, ඒ ප්‍රයෝග දර්ශන ශ්‍රවණ වශයෙන් ලද්දහුට වන අර්ථය දැනීමය යි කියනලද මේ දැක්වූයේ සත්‍යය යි කියා සඛභාවයෙන් ම බොරු දෙය සැබෑ ලෙසින් ම හැඟෙන බවය යන මේ කාරණා සතරදෙනාගේ එක්වීමෙන් ම මුසාවාද අකුශලය සිඛ වේ. මෙයින් කාරණයකු දු අඩු වුව මුසාවාද අකුශලය සිඛ නො වේ.

යමෙක් තමා සන්තක දෙයක් අනුන්ට නො දෙන සිතින් නැතැයි කීම් සුවලප අකුශලය, අනුන්ට වන වැඩක් නසන පිණිස බොරු සාක්ෂ්‍ය කීම මහ අකුශලය, කියනලද ක්‍රමයෙන් ඇති දෙය නැතිකිරීමෙන් හෝ නැති දෙය ඇතිකිරීමෙන් හෝ බසින් බොරු කියන්නාහට ද මුඛ විකාරයෙන් හෝ අත්සන් කිරීමෙන් හෝ අකුරු ලියා දීමෙන් හෝ අනිකෙකුට ඇඟවීමෙන් සිඛවන්නාවූ අකුශලය ද එහි සුවලපවූ දෙයට පමණක් බොරු කීම ද සුවලප අකුශලය. අඛ්මස්සක් පමණ දේට බොරු කීම ඊට ත් වඩා මහඅකුශලය, මස්සක් පමණ දේට බොරු කීම ඊට ත් වඩා මහඅකුශලය.

කාමවණ්ණ හාගයක දේව බොරුකීම ඊටත් වඩා මහ අකුශලය. කාමවණ්ණවකට බොරුකීම ඊටත් වඩා මහත් අකුශලය; මෙසේ ලාභ වශයෙන්ද අකුශලය ක්‍රමයෙන් මහත් වේ.

යමෙක් ජීවත්වීම හා අන් අත්ලස් ගැන්ම ආදි කිසියම් ලාභයක් සඳහා බොරු කියන්නේ ඊ නම් ඔහුට මුසාවාද අකුශලය ලෙ හය මුල් ව සිඛ වේ. යමෙක්හට කියනලද ක්‍රම්යෙන් නවාඝාත වස්තූන් කාරණකොට ඝණ අතුන් කෙරෙහි කිපි නසමි යන සිතින් බොරු කියන්නේ වී නම් ඔහුට මුසාවාද අකුශලය වෙශය මුල් ව සිඛ වේ. යමෙක් ධම්ය හා එක්කොට බොරු කීම වරද නැතැයි කියා ද මෙථුන සෙවනය සඳහා සතුන් පොළඹා ගන්නා පිණිස බොරුකීම වරද නැතැ යි කියා ද විවාහ කාල යෙහි ඒ සිඛවනු සඳහා ද ජීවිත විනාශ වේ නම් දිවි රක්නා සඳහාද තමාගේ ධනයට විනාශයක් වේ නම් ඒ රක්නා සඳහා ද කී තැන් බොරුවෙන් දෙශ නැතැ යි කියා ද බොරුකීම පව් නැතැයි කියාද නොයෙක් දෘෂ්ටිගෙණ බොරු කියන්නාකට මුසාවාද අකුශලය මොහය මුල් ව සිඛ වේ මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වී මෙන් ද මුසාවාද අකුශලය අනෙකප්‍රකාර ව සිඛ වේ. මේ මුසාවාද අකුශලයාගේ ප්‍රභෙද යි.

එකි ආදිනව නම් කවරහ? යත්,

"මුසාවාදෙ භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලිකතො නිරය සංවත්තනිකො හොති තිරච්ඡාන යොනි සංවත්තනිකො හොති. පෙත්ති විසය සංවත්තනිකො හොති යො සබ්බලහුසො මුසාවාදස්ස විපාකො මනුස්ස භූතස්ස අහුනඛ්භක්ඛාන සංවත්ත නිකො හොති" යි.

යනාදින් වදුල භෙයින් මහත් ආදිනව ඇති මුසාවාදය යම් කිසි පුද්ගලයෙකු විසින් ආසෙවින භාවින බහුලිකෘත වශ යෙන් පුරුදුකරණ ලද ද ඒ සත්ත්වතෙම නරකාදි සතර අපායෙහි ප්‍රමාණාතික්‍රාන්ත කල්ප කොටි ශතසහස්‍රයක් මුළුල්ලෙහි මහත්දුක් විඳ එයින් මිදී යියකල යම්කිසි පින්කම් සහායකින් මිනිසත් බවක් ලද හොත් ශෙෂ ව සිටි එම මුසාවාද අකුශල කම්යෙන් උපහුපන් ජාතිවල ඔහු කෙරෙහි නැති දෙශ අහුන වවනයන් කියා නොයෙක් ලෙසින් වෙහෙසෙන්නේ ද වෙයි. ඉතා දුඃඛිත වෙයි, ජඩවෙයි, නුවණ නැති වෙයි, දුටු දුටුවන්ට අප්‍රිය වෙයි. මත්ස්‍යයන්ට මෙන් දිව නැති වෙයි. කපිල මත්ස්‍යයා සේ දුර්ගන්ධ වූ මුඛ ඇති වෙයි. දරුවෝ නැති වෙත්. ඇතිවී නමුත් ගැණුදරු වෝ ම වෙති. ඔවුන්ගේ දරු සුරතල් දක්නට අවකාශයක් නැති.

ව ම ලදරු කල ම මිය පරලොව යන්නාහුය. නො කිකරු වූ කි දූ නො අදහන නපුරු වූ පිරිවර ඇති වෙයි. වඤ්ඣරාදි ඉන්ද්‍රියයෝ යහපත් සේ නැති වෙති. දක්ෂ වූ විඤ්ඤාරද කමක් නැති වෙයි. මියුරු වූ වචන කිමක් නැති වෙයි. නො පිරිසිදු වූ විරූප වූ විෂමවූ දත් ඇති වෙත්. සවභාව ශරීරය නො ව ඉතා ස්ථූල වෙයි ඉතා මිටිබව හෝ නොහොත් අතිදීඝ හෝ වෙයි. දුක්වූ ශරීරස්පර්ශයක් ඇති වෙයි, මාදු නො වූ ලොහිත වර්ණ නුවූ දිව හා එසේ යහපත් ඇස් නැති වෙයි. ඉතා වපල වෙයි. මේ ආදී නොයෙක් අනිෂ්ට දුර්විපාකයෝ මුසාවාද අකුශලයෙන් ඇති වන්නාහුයි.

ප්‍රෛශුන්‍ය වචනය නම්, යමෙක් යම්කිසි වචනයක් කි කල ඒ වචනය ඇසුවහුගේ සිත්හි අනිෂ්ඨකුහට පැවති ප්‍රියමනාපභාව නැති කොට ශුන්‍ය කෙරේ ද, ඒ ප්‍රෛශුන්‍ය වචන නම් වේ. ඒ කෙසේද? යත්, විශ්වාස මිත්‍රව වසන්නවුන් කෙරෙන් එකෙක් එකෙකුට ජාති ආදියෙන් අඩු කොට නිඳා කරති. යනු අසා හෝ නො මිහිරි සේ පරුෂ කොට කියනු අසා හෝ ඔවුන් දෙ දෙනා බිඳුවනු පිණිස වත් එසේ බිඳුවා තමා හා මිත්‍ර කොට ගන්නා කැමති ව වත් අසවලා මෙනම් ජාති දෙෂයක් තට කියේයි කියද මේසේවූ ගොත්‍ර දෙෂයක් මෙනම් රෝගයක් ඇත්තේයයි කියාද මෙනම් නපුරු ශිල්පයක් නපුරු කම්මන්තයක් දන්නේය යි කියාද යනාදි වශයෙන් ඔවුනොවුන්ගේ තෙපුල් ඔවුනොවුන්ට කියා විශ්වාස ව වසන මිත්‍රයන් ඔවුනොවුන් හා බිඳවීමෙන් වන කේලාම් වචන කිම ප්‍රෛශුන්‍ය අකුශලය නම්.

යමෙක් යම්කිසි ලාභයක් උපදවා ගන්නා පිණිස, එහි පැවැති ලොභයෙන් ඔවුනොවුන් බිඳුවනු පිණිස කවර ප්‍රකාරයකින් වත් ඊට නිසි වචනයක් කියන්නේ වී නම් ඕහට ප්‍රෛශුන්‍ය අකුශලය ලොභය මුල් ව සිඛ වේ. යමෙක් නවාඝාත වස්තූන් හෙතුකොට ගෙණ උපන් වෛරයෙන්ද කිසියම් වරදක් නැති නිවැරැදියන්ට විනාශ උපදවනු සඳහා ද යනාදි වශයෙන් ඔවුනොවුන් බිඳීමට නිසි වචන කියන්නේ වී නම් ඕහට ප්‍රෛශුන්‍ය අකුශලය වෛෂය මුල් ව සිඛ වේ, යමෙක් එසේ කේලාම් කියා ඔවුනොවුන් බිඳුවා ලීම දෙෂ නැතැ යි කියාද දුෂ්ටනිග්‍රහය සඳහා කිම දෙෂනැතැ යි කියාද යනාදි ක්‍රමයෙන් නොයෙක් දෘෂ්ටිගෙණ කේලාම් කිමෙහි දෙෂ නැතැ යි කියා කියන්නේ වී නම් ඕහට ප්‍රෛශුන්‍ය වචන අකුශලය මොහය මුල් ව සිඛ වේ. මේ ප්‍රෛශුන්‍ය වචන අකුශලයාගේ ප්‍රභෙදය වේ.

එහි ආදීනව නම් කවරහ? යත්, කේලාම් කිවාහු මියගොස් ඒ පාපකර්මයෙන් සරකාදි සතර අපායෙහි ඉපිද එහි නොයෙක් වා දහස් මුළුල්ලෙහි නොයෙක් දුක් අනුභවකොට එයින් මිදී හිසි යම් කලෙක මිනිසත් බවක් ලදහොත් උපතුපන්තැන විඛ්ඩාය ව ඉතා බැදිසිටි ප්‍රිය මිත්‍රයන් කෙරෙන් නිසි කාරණා සේ ම බැඳි වෙන්වීමය කිසිකලෙකත් ඔහුට අමුතු මිත්‍රසහායයක් නො ලැබී මය යනාදි නොයෙක් අකුශල විපාකයෝ ප්‍රෙශුතය වවන බිණු අකුශලයෙන් වන්නාහුයි මේ ප්‍රෙශුත්‍ය අකුශලයාගේ ආදීනව යි.

පරුෂ වචනය නම්, යම් වචනයක් බිණුකල ඒ වචනය බිණු තමාට ද ඇසු අනුන්ට ද පරුෂ ව සිතට වැටහෙන සවභාව ඇත් තේ ද ඒ ඇසීමෙන් කණට සිතට සැප ඵලවන්නේ නො වේද, එසේ වූවාක් තොමෝ පරුෂවවන නම්, එසේ වාග්දෙශයෙන් යුක්තවූ නොකන්කළු වූ නො මිහිරිවූ ඇසුවන්ගේ වෙශවඛතා සිත ඇල ලීමට සුදුසු වූ අනුන්ට පිරිහෙලා ජාති නම් ගොක් ආදි වශයෙන් අඩුතරම් කොට ක්‍රෑර වූ රළුබස් කිම පරුෂවවනය යි දතයුතුයි;

හෙද යම්ක්ගට ජාති ආදියෙන් ගරා බිණුකල ඒ රළුබස් අසනු නො කැමැතිව යම්කිසි ද්‍රව්‍යයක් ඔහු දෙනී යි කියා හෝ එසේ ම අත්ලස් ලාභ උපදනේයයි කියා හෝ යනාදි වශයෙන් ලොභ උපදවා අනුන්ගේ ජාති නම් ගොත් ආදිය ප්‍රකාශකොට පිරිහෙලා කීම ආදී නොයෙක් ප්‍රකාර රළුබස් කියන්නාහට පරුෂ වවන අකුශලය ලොභය මුල් ව සිඹ වේ. එසේම යමෙක් නමා සාත වස්තූන් කරණකොට ගෙණ උපන් වෛරයකින් හෝ අනුන්ගේ ගුණකිර්ති වණීනා ලාභ සත්කාරාදියෙහි නො සතු ව ඉවසාගත නොහී උපන් වෛරයකින් හෝ අනුන්ට අප්‍රිය නො මිහිරිවූ රළුබස් කියනනේ වී නම් ඔහට පරුෂ වවන අකුශ ලය වෙශය මුල් ව සිඹ වේ. යමෙක් දූසයන්ට දූසයහ යි කීමේ හු දූ වණ්ඩාලයන්ට වණ්ඩාලයහයි කිමෙහු දූ දුශ්ටයින්ට නිහුග පිණිස නින්ද කොට පරුෂවවන කිමෙහු දූ ආක්‍රොශ නොවෙතියි යනාදී වශයෙන් නාස්තිකදෘෂ්ටි ගෙණ අනුන්ට අප්‍රියවූ අමබුර රළුබස් කියන්නේ වී නම් ඔහට පරුෂවවන අකුශලය මොහය මුල් ව සිඹ වේ. මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙනු දූ පරුෂවවන අකුශලය නොයෙක් ප්‍රභෙද වේ. මේ පරුෂවවන අකුශලයාගේ ප්‍රභෙද යි.

එහි ආදීනව නම් කවරහ? යත්, අනුන්ට පරුෂවවන බිණු වාහු මියගොස් ඒ පාප කර්මයන් සතර අපායෙහි ඉපිද එහි

නොයෙක් වාදහස් මුළුල්ලෙහි මහත් දුක් විඳ එයින් මිදි ශිෂකල මිනිසත් බවක් ලද හොත් ඕහට මියුරුවූ ප්‍රිය මනාප කණීරසායන වචනයෙක් නො ඇසෙයි. තමා කළ වරදක් නැතිව ම දුටු දුටුවන් විසින් නො රිසි ව කියනලද කර්කශවූ වචන අසනු ලැබේ. අසන්නවුන්ට නො මිහිරි වූ කටහඬ ඇතිවෙයි. මේ ආදිවූ නොයෙක් අනිෂ්ට ඵල විපාකයෝ පරුෂවචන අකුශලයෙන් ඇතිවන්නාහුයි, මේ පරුෂවචන අකුශලයාගේ ආදීනවයි.

සම්ඵප්‍රලාපය නම්, යම් වචනයක් කිකල තමන්ට ද ඇසුවන්ට ද කිසියම් අර්ථසිද්ධියක් වැඩක් නො වේ ද නිරර්ථක ද නිෂ්ප්‍රයොජන ද එසේවූ වචන කිම සම්ඵප්‍රලාපතම්, ඒ කෙසේ ද? යත්, යම් යම් වචනයක් සවභාව යහපත් ධර්මයෙන් සිටින් ද ඒ වචන ඛිණවා වූ ඇසුවා වූ අනුන්ට ද මේ ලොවින් හෝ පරලොවින් හෝ කිසියම් වැඩක් නැති කාව්‍ය නාටකාදි නිරර්ථක නිෂ්ප්‍රයෝජන වචන කිම සම්ඵප්‍රලාපය යි දතයුතුයි.

හෙද යමෙක් ජීවත්වීම පිණිස ලාභ උපදවමිසි සිතා කාව්‍ය නාටකාදී නොයෙක් සම්ඵප්‍රලාප දෙඩීමෙහිදු අභූත වචන රචනාකොට කීමෙහිදු අනුන් සිත් ගන්නා පිණිස කොයියම් ප්‍රලාපයක් වත් කීමෙහි දු යෙදුනේ වී නම් ඕහට සම්ඵප්‍රලාප අකුශලය ලොභය මුල්ව සිඩ වේ. යමෙක් අනුන් කෙරෙහි ශට කියනලද ක්‍රමඥෙන් නො සතුටු සිත්ඇති ව රැස්වූ පිරිස තුටු කොට පරිද්දෙන් සිනාලූ දෙනා විසින් නිස්ඵකරණ පරිද්දෙන් හාත්පසින් පරිභූත කොට බෙණෙම් යි සිතා ඉවසීමක් නැති ව ම අනුන්ට පිරිහෙළීම පිණිස නිරර්ථක සම්ඵප්‍රලාප කියන්නේ වී නම් ඕහට සම්ඵප්‍රලාප අකුශලය වෙහස මුල් ව සිඩ වේ. යමෙක් කාව්‍ය නාටකාදී සවරූප අනුන්ට මෙසේ හඟවමි යි යන සිතින් හෝ අභිධාන සංඛ්‍යාත නම් උගන්වමි යි කියා හෝ අනුන් විසින් අභිමත මෙ වැනි මෙ වැනි ආනුභාව ඇත්තෝ ද පවා අනිත්‍යතාවයට ගියාහු යි යන කාරණය හඟවන සිතින් හෝ නො කියා කාව්‍ය නාටකාදී නිරර්ථක වචනයන්ම පරමාර්ථකොටගෙණ පිළිවෙත් කොටගෙණ කිවමනා ඇසුව මනා දෙයක් සේ කාව්‍ය නාටකාදී ප්‍රලාපකිමෙනුදු යම් ප්‍රලාපයක් එසේ කියමින් හෝ අසමින් හෝ හුන්නන් එවිගස මල හොත් අපායෙහි උපදවන්ට නිසිවූ අසඛ්මියයි කියනලද ඒ කාව්‍ය නාටකාදිය කිම ද ඇසීම ද කුසලැයි සිතාගෙණද නාස්තික දෘෂ්ටි ආදී නොයෙක් දෘෂ්ටිගෙණ ප්‍රලාප දෙඩීමෙහි

යෙදුනේ නම් ඔවුන්ට සම්ඵප්‍රලාප අකුශලය මොහය මුල් ව සිඹ වේ. මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙනු දු සම්ඵ ප්‍රලාප අකුශලය නොයෙක් ප්‍රභේද වේ. මේ සම්ඵප්‍රලාපයාගේ ප්‍රභේදය යි.

එහි ආදීනව නම් කවරහ? යත්, "පාපකං සුකතං නාම, හරතයුබ සීතාහරණ වීසං යුත්තං පාපකං පටිභාගං දුබ්භාසිත යුත්තං තබබ නාවක විලම්බනාදි පටිසංයුත්තං" යි යනුවෙන් විජම් අටුවාවෙහි පාපයයි කියන ලද අසම්භින්න නිෂ්ප්‍රයෝජන ප්‍රලාප දෙසීමෙහි යෙදී වීසූ පුද්ගල තෙම එම අකුශල විපාක යෙන් නරකාදි සතර අපායෙහි ඉපිද එහි කොයෙක් වා දහස් මුළුල්ලෙහි මහත් දුක් අනුභව කොට එයින් මිදී හිඟකල මිනිසත් බවක් ලදහොත් උපනුපන් ජාතිවල අනුන් විසින් හෝ රවටන්ට නිසි වචන ඔහු කෙරෙහි ඇති වෙත්. අනුන් විසින් නො ඇදහිය යුතු වචන ඇති වෙත්. දුටුවන්ට අප්‍රියවන සේ අසම්බන්ධ වූ අවලක්ඛණ අඹහ ප්‍රත්‍යඹහ ඇතිවෙත්. මේ ආදි වූ නොයෙක් අනිෂ්ට නපුරු විපාකයෝ එම සම්ඵප්‍රලාප අකුශලයෙන් ඇතිවන්නාහුයි. මේ සම්ඵප්‍රලාප අකුශලයාගේ ආදීනව යි

අභිඛ්‍යාව නම් කවරහ? යත්, අනුන් අයිතිවූ දැයි දැස ඇත් අස් ගව මහිසාදී සවිඤ්ඤාණක වස්තූන් හා කොත්වත් මුතු මැණික් රන් රිදී ධන ධාන්‍යාදි අවිඤ්ඤාණක වස්තූන් දැක මේ සම්පත් මට වුවොත් යෙහෙක. එහෙයින් මා සතතක කොට ගන්නේ කෙසේ දෝ හෝ යි සිතීම අභිඛ්‍යා නම් වෙයි.

එහි යමෙක් එසේ විප්‍රකාරවූ අනුන්ගේ සම්පත් දැක ලොභ උපදවා "මේ සම්පත් මට වුවහොත් යෙහෙක" යි පතන්නේ වී නම් ඔහට ඒ අභිඛ්‍යා අකුශලය ලොභය මුල් ව සිඹ වේ. එසේ ම යමෙක් අනුන්ගේ සම්පත් දැක "මේ සම්පත් ඔවුන්ට නරම් නෙ, වෙයි. තමහට වීම සුදුසු ය" යි කියා අනුන් කෙරෙහි නොසතුටුව ඒ සම්පත් පතන්නේ වී නම් ඔහට අනුන් අයිති සම්පත් මට වේවා යන අභිඛ්‍යා අකුශලය ලොභය මුල් ව සිඹ වේ. යමෙක් අනුන්ට අයිති සම්පත් තමහට වේවා යි පැතීමෙහි පාපයක් නැතැයි කියාද එයින් සබ තෙම සතර අපායෙහි නො උපදනේ යයි කියාද අනුන් සන්තක කෙත්වත් ගව මහිෂාදි සිඟලු සම් පත්තියෙහි ලොභ ඉපදවූවන්ට එයින් වරද නැතැ යි කියාද යනාදි වශයෙන් නොයෙක් දෘෂ්ටිගෙණ අනුවණින් යෙදී පර

සන්තක වස්තුයෙහි ලොබ උපදවන්නේ වී නම් ඕහට අභිධ්‍යා අකුශලය මොහය මූල් ව සිඩ වේ. මෙසේ ලොභාදි අකුශල යන්ගේ එක්වීමෙන් වන අභිධ්‍යා අකුශලය නොයෙක් ප්‍රභෙද වේ. මේ අභිධ්‍යා නම් අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහ? යත්, මේ කියනලද ක්‍රමයෙන් යමෙක් අනුන් අයිති වස්තුයෙහි ලොභ කෙරේද හෙතෙම මරණින් මත්තෙහි තරකාදී සතර අපායක් අනුභව කොට එයින් මිදී ගිය කිසියම් කුශලයකින් මිනිසත් බවට පැමිණියේ වී නම් එහිදු කිසියම් කාරියක් සිඩ කොට ගන්නා කැමැති බවක් ඇති කල්හි ඒ කාරණය ඕහට සිඩ නො වීමය යනාදි නොයෙක් අනිෂ්ට අකුශල විපාකයෝ එම අභිධ්‍යා අකුශලයෙන් ඇති වන්නාහුයි. මේ අභිධ්‍යා අකුශලයාගේ ආදීනවයි.

ව්‍යාපාදය නම් කවරහ? යත්, අනුන්ගේ ඓශ්වර්‍යය විශිෂ්ට රූපශ්‍රිය ආදි කුශල විශෙෂය දැක ඉවසිය නො හි නො සතුටු ව ඔවුහු නැසෙත්වා යි කියා ද ඔවුන් සම්පත් එසේ නැසෙත්වා යි කියාද ඔවුන් හා සමග විශ්වාසයන් දැක නො සතුටුව ඔවුනොවුන් විරුඬ දිවහොත් යෙහෙකැයි කියාද යනාදි වශයෙන් වෙශ වසඟ ව අනුන් හා ඔවුන් සන්තක සම්පත් ආදිය නැසේවා යි කියා සිතීම ව්‍යාපාද අකුශලය නම් වේ.

භෙද යමෙක් අනුන් සන්තක සම්පතෙහි ලොභ උපදවා ඒ සම්පත් හිමියාගේ කැසීම යහපතැයි සිතන්නේ වීනම් ඕහට ව්‍යාපාද අකුශලය ලොභය මූල්ව සිඩ වේ. යමෙක් අනුන්ගේ ලාභ සත්කාරාදිය දැකීමෙනු දු ඇසීමෙනු දු ඉවසා ගත නො හි ඔවුන්ට නො සතුටු වීමනු දු නවාඝාත වස්තූන් හෙතුකොට ගෙණ කිපීමෙනු දු වෙශ වසඟ ව අනුන්ට කෝප ව සිතන්නේ වී නම් ඕහට ව්‍යාපාද අකුශලය වෙශය මූල්ව සිඩ වේ. ලොක යෙහි මැරුවන් මැරීමද, හැවූවන් හැවීම ද, ගැසුවන්ට ගැසීම ද, වස්තු විලුම්පනය කොට ගත්තවුන්ගේ වස්තු විලුම්පනය කොට ගැනීම ද, අපකාර දෙශ කළවුන්ට එසේම අපකාර දෙශ කිරීම සවභාව ධම්යෙකැ යි කියාද යනාදි වශයෙන් නොයෙක් කල්පනා සිත තඬාගෙණ අනුන්ට වධ බිංසා කිරීම සිතන රජ්ජුරුවන්ට ද එසේ ම රාජමාත්‍යාදීන්ටද මැරුවන් මැරිය යුතුයයි යනාදි විසින් විනාශ නීති ශාස්ත්‍ර ඉගෙණ අනුන්ට අනර්ථ සිතන්නවුන්ට ද නාස්තික දෘෂ්ටි ඉගණ අනුන් නසින්වා යි යන කල්පනාවෙන් දෙශ කැනැයි සිතන්නාට ද, ව්‍යාපාද අකුශලය මොහය මූල්ව සිඩ වේ. මෙසේ ලොභාදි අකුශලයන්ගේ එක්වීමෙන් ව්‍යාපාද අකුශලය නොයෙක් ප්‍රභෙද වේ. මේ ව්‍යාපාද අකුශලයාගේ ප්‍රභෙද යි.

එහි ආදීනව නම් කවරහ?යත්, මෙසේ වූ ව්‍යාපාද අකුසල යෙහි ඇලී යෙදී වාසඝකාරණ සඞ්ඛතෙම රූපස්කන්ධ හෙදයෙන්වූ මරණින් මත්තෙහි අපායෙහි ඉපිද එහි නොයෙක් වා දහස් මුළුල්ලෙහි මහත් දුක් විඳ එයින් මිදී ගියකල කිසියම් පින්කම් සහායකින් මිනිස්පියක් ලදහොත් උපනුපන් ජාතිවල අනිෂ්ටයන්ම රුව නැති වෙයි. විෂමවූ රෝග පීඩා ඇති වෙයි. අනුන්ට අප්‍රිය වෙයි. ඝනාදී නොයෙක් අනිෂ්ටවූ අකුසල විපාකයෝ ව්‍යාපාද අකුසලයෙන් ඇතිවන්නාහුයි, මේ ව්‍යාපාද අකුසලයාගේ ආදීනවයි.

මිථ්‍යාදෘෂ්ටිය නම්, දැන සීලාදී පින්කමින් සුගති සම්පත් සිඳ නො වෙයි. එයින් ඵල නැතැයි කියාද ප්‍රාණඝාතාදි පාපයෙන් අපාගමන සිඳ නො වෙයි කියාද ඔට උපන් ජන්මයකුත් නැත මතු උපදනා ජන්මයකුත් නැත සියල්ල ම නිත්‍යය යි කියා හෝ ඝනාදි වශයෙන් විපරිතකොට වරදවා නොයෙක් දුෂ්ටිගැන්ම මිථ්‍යා දෘෂ්ටිනම්. ඒ කෙබඳුයි කිව?හොත්, මේ මතු දක්වන උපමා කථාවෙන් අඟා එහි විභාග දතයුතු.

ගිලිනාකල මනොහර ව මියුරු ව ගිලපුකල මහත් දුක් දෙන බීලි බදුවූ ද, කිම්පක්ක නම් විෂඵල බදුවූ ද, හලාහල විෂ මිශ්‍ර වූ ශාලිමංසොදනයක් සේ මතොඥ ව සිතට වැටහෙන බැවින් එබදු නපුරුවූ සිතින් පිරිමැද නුවණින් විමසා බලනකල ගත හැකි කිසියම් සාරයක් ගුණයක් නැති මිථ්‍යාදෘෂ්ටි ගන්නාට අත්‍යන්ත ලොභ උපදනා බැවින් මිථ්‍යාදෘෂ්ටි අකුශලය ලොභය මුල් ව සිඹි වේ. ශුකර පොෂණඝකරණ මනුෂ්‍යතෙම ඒයලීගිය අසූවි රාශියක් දැක සතුටු ව උත්තරාසඞ්ගයෙහි පොදියක්කොට බැඳ හිස තබාගෙන යන කල්හි මහා වර්ෂාවෙන් තෙමී හිස පටන් පාදය දක්වා බස්නා අසූවි රාශිය දුටු හිතෙෂි මිනිසුන් විසින් උම්මත්තකය මෙසේ මේ අසූවි කුමට අදනෙහි දැයි කීකල "තෙපි උම්මත්තකයව අපි අපගේ සූකරයන්ට බත් ගෙණ යෙමි" යි කියා තමා ගෙණ යන අසූවි නො දමා ගෙණ යමින් සිට ඒ නුසුදුසු යයි ගර්හා කොට යුක්ති කිවවුන්ට නොයෙක් නිග්‍රහ පරුෂවචන කිමෙන් ශූකරපොෂණයෙහි නියුක්තවූ පුරුෂයා සේ යමෙක් මිථ්‍යාදෘෂ්ටික වීනම් හේ නරක යෙහි හෝ තිරිසන් ජාතියෙහි හෝ උපදනේය. මෙයින් පිටත් අන්තැනක නූපදනේ ය. මේසේ නපුරුවූ මිථ්‍යාදෘෂ්ටි හැරිය යුතු යයි කියන බණ අසාද කාරණ උත්කර අසාද ඒ කිවුන්

කෙරෙහි කොපයෙන් ගැටී අපට නිවන් සාදා දෙන්නේ මෙම කාරණයෙනැ යි යනාදී නොයෙක් දුෂ්ටි කාරණ දක්වා විපරීත දුෂ්ටි ගන්නා මිථ්‍යාදුෂ්ටි අකුශලය වෙශය මුල් ව සිඩ වේ.

කිසිසේත් ජීවත්වන උපායක් නැති ව අනාථ ව ඇවිදිනා යහළුවෝ දෙදෙනෙක් සතුන් වැහැරි දැක, 'යහළුව තෝ ද සතුන් වැහැරි භාගයක් ගණුව, මම ද භාගයක් ගණිමි" යි කථාකොට ගෙණ සතුන් වැහැරි දෙභාගය ම බැඳගෙණ දෙදෙනා ම එක්ව ගොස් කැවත සතුන් නුල් දැක සබඳ මේ සතුන් වැහැරිවලට වඩා සතුන් නුල් මහාඝිය. මම ද මේ සතුන් වැහැරි දමා සතුන් හූ භාගයක් බැඳගෙණ යෙමි. තෝ ද එසේ ගණුව" යි දැන්වූකල ඒ ඇසූ බුවණ මද පුරුෂතෙම කියනුයේ "සබඳ මම බොහෝ දුර සිට මේ ගෙණා බැවින් හැර යා නො හෙමි යි කියා සතුන් වැහැරි භාගය ම උසුලාගෙණ කැවතත් එක්ව ගොස් සතුන් පිළි දැක එසේ ම කියා ඔහු නො ගන්නා හෙයින් තමා ම සතුන් පිළි ගෙණ පෙර උසුලාගත් භාරය ම නො හැර ගෙනයන්නහු හා සමග ම යනුයේ පෙර සේ ම කපු දැක කපුනුල් දැක කපුපිළි දැක යකඩ දැක ලොහෝ දැක තඹ දැක රිදි දැක රන් දැක එකිනෙකට පලමු කී සෙයින් ම කියාලුකල ඒ ඉඡවම්ත්‍රයාගේ බස් නො ගෙණ "මම බොහෝ දුරුකතර සිට ගෙණ එමින් පිඩිතවිමි.

එහෙයින් මේ සතුන් වැහැරි මම නො දමා ම ; ගණයෙමි, තෝ තාගේ කැමැත්තක් ගෙණ එව" යි කිකල "එම්බා යහළුව මාගේ බස් තෝ නො ගන්නෙහි වි නම් මම කුමක් කරම්ද" යි කියා රිදියව වඩා රත්රන් මහාඝි හෙයින් ඒ බව දන් ඒ බුවණ ඇති පුරුෂතෙම රිදී භාරය හැරපියා රන්රන් භාරය ගෙණ තමාගේ ගෙට ගොස් තෙවට ද තමා නිසා වසන්නවුන්ට ද දුකක් නොව කායික වෛතසික සුවයෙන් සතුටුවන පණ්ඩිත පුරුෂයා සේ නොව හිතෙහිත් කී කියමන් නො ගෙන සතුන් වැහැරි භාගය ම උසුලාගෙන තමාගේ ගෙට ගොස් ඒ තමා උසුලාගෙණ ආ භාරයෙහි කිසිම සාරයක් මහාඝි බවක් නැති හෙයින් තමා ආශ්‍රයකොට සිටි ඇමදෙනා හා ශොකකිරීමෙන් අපමණ දුකට පැමිණ වෙහෙසෙන අඥන පුරුෂයා මෙන් නොයෙක් කප් අසඛ්‍යඥකිනු දු දුර්ලභ වූ මේ බුඩොත්පාදයට සම්ප්‍රාප්ත ව මෙම බුදුන් විසින් ම රුවනැ යි වදරණලද එහෙයින් ම අනෙකප්‍රකාර වූ සත්තිස් බෝපැකි දම් නාමයෙන් ප්‍රසිද්ධ වූ චතුර්විධ ස්මෘති ප්‍රස්ථානය, චතුර්විධ සම්‍යක් ප්‍රධානය, චතුර්විධ ඍඩිපාදය, පඤ්චේන්ද්‍රිය, පඤ්චබලය, සප්ත බොඛ්‍යඞ්ගය, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය යන විසින් දෙශිත වූ උතුම්

ධම්මරත්නයන් දක්වා මේ මේ රත්න ගණුව සි කිකල එයට කිපි සම්‍යග්දෘෂ්ටිකවූ ධම්මාන්විත කල්‍යාණ මිත්‍රයන්ගේ බස් නො ගෙණ එකාන්න අධම්මයට මේ ධම්මයයි ගෙණ තමන්ව ද තමන් අනුගතවූ පශ්චිම ජන සමූහයාට ද විනාශහාගිව නපුරු මිථ්‍යාදෘෂ්ටි ගන්නන්ට ඒ මිථ්‍යාදෘෂ්ටි අකුශලය මෝහය මූල්ව සිඩ වේ. මෙසේ ලොභාදී අකුශලයන්ගේ එක්වීමෙන් සිදුවන මිථ්‍යාදෘෂ්ටි අකුශලය නොයෙක් ප්‍රභෙද වේ. මේ මිථ්‍යාදෘෂ්ටි අකුශලයාගේ ප්‍රභෙදයි.

එහි ආදීනව නම් කවරහ්? යත්, මෙසේ මහත් ආදීනව ඇති මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු මිය ගොස් ඒ පාපකම්යෙන් අපායෙහි ම උපදිති. එහි නොයෙක් වා දහස් මුළුල්ලෙහි දරුණුවූ මහත් දුක්වීඳ එයින් මිදිගියහොත් ලම්කියි කුශලබලයකින් මිනිස් පියක් ලද්හොත් මිථ්‍යාදෘෂ්ටි ඇතිවෙයි. නපුරු මිථ්‍යාකල්පනා ඇතිවෙයි. යහපත් සෘජු ප්‍රතිපත්ති මාර්ගයෙහි පිහිටීම නො පිළිවන්වෙයි. එසේ සියලු පව් පදුරක් වැනි වූ හැම සසරදුකට හාජන වූ මිථ්‍යාදෘෂ්ටි ගෙණ වසනුයේ සියලු වැඩට කාරණ වූ මනා අදහස් ඇති කල්‍යාණ මිත්‍ර කෙනෙකුන් ලදින් ඔහු කි ලෙස සම්‍යක් පිළිවෙතෙහි සිත පිහිටුවාගෙණ නුසුදුසු අධ්‍යාශයෙන් දුරුව ඒ මිථ්‍යාදෘෂ්ටියෙන් දුරුව මිදිගියහොත් ඉතා යෙහෙක. එසේ නො ව හෙතෙමේ මිථ්‍යාදෘෂ්ටිය නො හැර සිටියේ ම නම් මඩ වැටුනු ගලක් සේ සංසාරයෙහි ම ඇලී අනන්ත වූ මහදුක් විඳිනේය. මහා පෘථිවිය හා සටන් කොට "නී පිට නො හිදිමියි" සි කියා අනෙකවාරයෙහි අහසට පැන පෘථිවියෙහි ම හෙන බාල දරුවන් සේ "සසරින් මිදෙන්නට නිසි පිළිවෙත් කරමහ" සි සිතා සසර දික්වන්ට නිසි වූ විපරීත පිළිවෙතක් කරණකොටගෙණ නුපන් අකුශල ධම්මෝ උපදිද්ද, උපන් අකුශලධම්මෝ විපුලත්වයට යෙද්ද, එබදු දෙයක් මේ මිථ්‍යාදෘෂ්ටිය හා නො ම දක්නා ලැබෙයි. මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයා හට නුපන් අකුශල් උපදින්. උපන් අකුශල විපුලත්වයට යෙති. එයින් වදලහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා භියෝභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා වෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ව අකුසලා ධම්මා භියෝභාවාය වෙපුල්ලාය සංවත්තන්ති" සි.

යමක් කරණකොටගෙණ නුපන් කුශල ධර්මයෝ නුපදිද්ද උපන් අකුශල ධර්මයෝ පිරිහෙද්ද එබඳු දේ කුදු මේ මිථ්‍යාදෘෂ්ටිය හා නොම දක්නා ලැබෙයි. විපරීත දෘෂ්ටි ඇති පුද්ගලයාහට නුපන් කුශලධර්මයෝ නුපදිත්. උපන් කුශල ධර්මයෝ පිරිහෙත්. එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා නුපජ්ජන්ති, උප්පන්නාවා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා වෙව කුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා ව කුසලා ධම්මා පරිහායන්ති" යි.

තවද මාතෘඝාතක පිතෘඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සංඝභෙදක යි කියනලද මේ පඤ්චානන්තරිය කර්ම්ය මහා සාවද්‍ය නම් වෙයි. මීටත් වඩා යම් නියත මිථ්‍යාදෘෂ්ටියක් ඇද්ද ඒ මිථ්‍යාදෘෂ්ටිය විශෙෂයෙන් ම මහාසාවද්‍ය වන්නේය.
කාරණා කිම්? යත්:

පඤ්චානන්තරිය කර්ම්ය කළ සත්ත්වයාට වනාහි කාලපරිච්ඡෙද ඇත්තේය. කල්පයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී කල්පාන්ත යෙහි නරක දුකින් මිදියන්නේය. නියත මිථ්‍යාදෘෂ්ටි සත්ත්වයාහට වනාහි එසේ කාල පරිච්ඡෙදයක් නැත්තේය. ඒ නියත මිථ්‍යා දෘෂ්ටිය සසරට මුල්වන බැවින් සසරදුකින් මිදීමක් නැත්තේය. ඒ නියත මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයාට මාගි ඵලාධිගමයකට පැමිණීම තබා සවනියෙහි ඉපදීම පමණකුත් නැත්තේය. කල්පවිනාශ කාලයෙහි නරකයෙහි වසන්නාවූ සත්ත්වයෝ අපරාපරිය වෙද්‍ය කුශලකර්ම වසයෙන් බ්‍රහ්ම ලොකයෙහි උපදනාහුය. ඒ නියත මිථ්‍යා දෘෂ්ටිගත් සත්වයෝ වනාහි කල්ප විනාශ කාලයෙහි බ්‍රහ්ම ලොකයෙහි නොඉපිද පිට සක්වළ නරකයෙහි උපදනාහුය. ඒ පිට සක්වළවල් නස්නාකල්හි ආකාශයෙහි එක් ප්‍රදෙශයෙක්හි කර්මානුරූපවූ පරිද්දෙන් මහත් දුක්විඳුනාහුය. මෙසේ මහත්වූ ආදීනව ඇති මිථ්‍යාපිළිවෙත් පිරීමෙන් සසරින් උඩුකුරුවිය නොහී අනන්තවූ දුකට පැමිණෙත්. මේ මිථ්‍යාදෘෂ්ටි අකුශල යාගේ ආදීනවයි.

මෙසේවූ ප්‍රාණඝාතාදි දශ අකුශල කර්මපථයන්ගේ ප්‍රභෙද හා එහි ආදීනව දැන හැඳින පවිකිරීමෙහි භයපත්ව තුෂ්ණීරූවන් සේවනයෙන් උපාසක ධර්මයෙහි පිහිටා අප්‍රමාද ව වාසයකළ පෙර කුවණැති සත්පුරුෂ ජනයෝ ද ලොවට රජ පැමිණි පින්

වත් රජදරුවෝ ද දෙදෙව්ලොවට අධිපති ශක්‍රදෙවෙන්ද්‍රයෝ ද පවා තම තමාගේ ජීවිතවිනාශයට නිසිව පැමිණ ඒසා මහත් අනතුරුවෙහි වූ දිවි නො සලකාම පැමිණි අකුශලයන් කෙරෙන් දුරුව රක්‍ෂාකටයුතුවූ මේ විරති ශීලය ම ශ්‍රේෂ්ඨත්ව රක්‍ෂාකළාහුය. ඒ කෙසේද? යත්;

මෙම ලඹකාව්පයෙහිවූ වක්කන නම් උපාසකයෙක් තම මවුන්ට වෙදකම්කරණ වෙදවරුහු අළුත් සාමස් උවමැනැයි කී හෙයින් බැයන් විසින් මෙහෙයන ලදුව ඇල්කෙතට ගොස් එහි පැල ගොයම් කමින් සිටි සාවෙක් යුහුව යනුයේ මලක' බැඳි කිරි කිරි යන ශබ්දයෙන් හැඹිය. ඒ අසා ඔහු මලින් ගළවා අතට ගෙණ ඒ උපාසකතෙම සිතනුයේ "මාගේ මැනියන්ගේ දිවි රක්නා පිණිස මොහුගේ දිවිනැසීම මට නුසුදුසුය. එසේ හෙයින් මම මූ නො මරම්"යි සිතා "සෙසු සාවුන් සමග නෝ සැපසේ මේ වල වාසයකරව"යි කියා ඒ සාවා හැරපියා ගෙවලට ම ගියකල්හි බහුගේ බැනෙම "කිමෙක්ද? තා විසින් සාවෙක් ලබනලදදැ"යි විවාළේය. එවිට ඔහු කලකිි සියල්ල නො වළහා ම කිය. ඒ අසා ඔහට හෙතෙම පරිභව බිණුයේය. නැවත වක්කන නම් උපාසකතෙම මවු ලඟට ගොස් "මම උපන්නැන් පටන් සිවිතැන් දක්වා දැන දැන ප්‍රාණාතිපාත අකුසලයක් නො කෙළෙමි. ඒ සත්‍ය වචනයෙන් මාගේ මේ මැනියන්ගේ ලෙඩ පාසු වේවා" යි කියා සත්‍ය ක්‍රියා කොට එකෙණෙහි ම මව ත් නිරෝගිකමින් සම්ප්‍රාප්ත විරතින් යෙදී පැමිණි අකුශලය නො කොට දුරුවීමෙන් විරති ශීලය ම රක්‍ෂාකෙළේය.

මෙසේ එම්බා පින්වත් සත්පුරුෂයෙනි! ඒ උපාසකතෙම අතට පැමිණි සාවකු මවුන්ගේ දිවිරක්නා පිණිස වත් නොමරා සම්ප්‍රාප්ත විරතින් යෙදී ශීලය රක්‍ෂාකළ සේ තමහට වැඩකැමති නුවණැත්තන් විසින් එසේ පවිකිරීමට අවකාශයක් ලත් නමුත් එහි නොයෙක් ආදීනව සැලකීමෙන් එයින් දුරු ව උතුම් ශීල ගුණයම රක්‍ෂාකටයුතු.

තවද උතුරු වඩුන්නා වැනි උපාසකයෙක් ගවයන් බානක් වල්මත් ව ගියහෙයින් ඔවුන් සොයා ගියගමනෙහි උතුරු වඩුන්නාගලට ගියේය. එකල්හි එහි සිටි පිඹුරෙක් ඒ උපාසකයා දැක වෙලාගත. එවිට හෙතෙම තමා කරකිබුනු තියුණු මුවහත් කැත්ත සඳහන් ව "මේ කැත්තෙන් මොහු හිස කපා හැර මා දිවි රකිම්" යි සිතා නැවත ත් මෙසේ සිතියා 'එසේ

මොහුගේ ජීවිතය විනාශ කළහොත් ඇඹරුලි වෙහෙර වසන පිඬඟල බුබරකඛිත තෙරුන්වහන්සේ සම්පයෙන් සමාදන්ව ගත් පඤ්චශීලය බිඳි යෙයි. එසේම නුසුදුසුය යි සිතා නැවත නැවත ත් බලවත් ජීවිත ලොභයෙන් "මොහු හිස මේ කැත්තෙන් කපමි" යන සිත උපදනා බැවින් කැත්ත ඇතිකල එසේවූ සිත උපදනේය. නැතිකල කුමට සිතේදැ යි යන කල්පනායෙන් නො මරම් යන සිත උපන් මිගස ම කැත්ත ඇත බැද්දේ දමා ගැසීය. එම ගුණානුභාවයෙන් එකෙණෙහි පිඹුරු ත් ඔහු හැර ගියේය. මෙසේ ඒ උතුරුවඩුන්නා වැනි උපාසක ද දිවි නො සලකා දුරුකටයුතුවූ අකුශලයෙන් දුරු ව ශීලය ම රක්ෂාකෙළේය. මෙසේ ඒ උපාසක ද තමා සමාදන්ව ගත් ශීලය සිහිකිරීමෙන් තමන් දිවි නො සලකා පැමිණි අකුශලයෙන් දුරු ව සමාදන විරතින් යෙදී සීලය ම රක්ෂා කළා සේ දුකින් ම මිදී සියලු සැපත් විඳිනා කැමති සත්පුරුෂයන් විසිනු දු එසේ පව්කිරීමක් පැමිණිකල එසේ සමාදන ආයති සංවර වශයෙන් තම තමා පිහිටවගත් ශීලයන්ං සිහිකොට ඒ ඒ අකුශලයෙන් දුරු ව ශීලය ම ආරක්ෂාකටයුතුයි.

තවද මෙම ලක්දිව අනුරාධපුර නුවර දැහැමි නිසස නම් රජ වටුමස් අනුභව කිරීමෙහි උපන් සිත් ඇති ව "අනිකක් හට මේ මාගේ අදහස් දැන්වූයේ වීම් නම් නුවර හාත්පස්හි වටුවන් විනාශයට පමුණුවති. එහෙයින් නො කියම්" යි තුන් අවුරුද්දක් මුළුල්ලෙහි උපන්සිත ඉවසීමෙන් මහත් දුඃඛ ආයාස විඳ පසු ව පන්සිල් රක්නා මිනිසකු තෝරාගෙණ මාගේ මේ අදහස දැන්වීම සුදුසුය යි සිතා එකලට නිසස නම් උපාසකයෙක් පන්සිල් රකිය යි අසා ගෙන්වා ඔහුගේ ශීලය පරීක්ෂා කරණු පිණිස ඔහු අතින් ම කුකුළෙකු මරා ව්‍යඤ්ජන පිණිස රාජ උපස්ථානයට ගෙණෙන සේ නියොග කෙළේය. එසේ ඔහු නො කරණහෙයින් "රාජාඥ ලෙස නො කළ හොත් ඔහුගේ හිස කප්පවමි" යි තරවටුයේ ම සලස්වා එසේ ත් නො මරණ හෙයින් රහසින් නියමකොට දන්වා යවු කල්හි රාජපුරුෂයෝ ඒ උපාසකයාගේ හිස මුදුන්කොට බැඳ රතු මල් දම් පලඳවා හුනුතිප්පලා ගස්වා විටියෙන් විටියෙහි වධ බෙර ගස්වමින් ගොස් සොරුන් මරණ දංගෙඩියෙහි හිස තලවා නැවතත් කුකුළා අතට දී කියන්නාහු "එම්බල නිසසය රජ ආඥ කළාවූ ලෙස කිරීමෙන් තාගේ දිවිරැකගෙණ නැවත සිල් සමාදන්වීම පිළිවන්මය, මිනිසත් බවක් මෙසේ ලැබගැනීම ඉතා දුර්ලභ

දෙයක, එහෙයින් තෝ මේ කුකුළා මරා ව්‍යඤ්ජන පිස අප කී ලෙස ම දැන්වත් කළ මැනව. එසේ නො කළ හොත් තාගේ හිස කපමිහ" යි කිවාහුය. ඒ අසා තිස්ස නම් උපාසක තෙම කියනුයේ "මේ ප්‍රාණඝාතය කිරීමෙන් මාගේ දිවි රැකීමට වඩා මියයෑම මට ඉකා උතුම. එහෙයින් මොහු නො මරමි" යි කියා කුකුළා අතින් අල්වා ගෙණ "කුකුළ, මාගේ ජීවිතය තව දිනිමි. තෝ සැප සේ වාසය කරව" යි කියා කුකුළා හැර විරති ශීලය මනාකොට රැකී මෙන් වන මරණය ම කැමතිව දංගෙඩියේ හිස තබා හොත්තේය.

මෙසේ ඒ කුකුළාට අභය දුන් තැන කුකුල්ගිරි නම් විය. ඒ දුටු රාජපුරුෂයෝ ඔහු නො මරා ම ගෙණ ගොස් ඒ හැම ප්‍රවෘත්තිය ත් ඇතිලෙස රජහට දන්වූ කල්හි මෙසේ සිල් රක්නා ඒ පුරුෂ තෙම විශ්වාසවූ කල්‍යාණමිත්‍ර කොට රාජසෙවයට ගෙණ ඔහට ම තමාගේ ඇති අදහස් දන්වාලීමෙන් ඒ දැහැමි තිස්ස නම් රජ ද දුරුකටයුතුවූ අකුශලයෙන් මෙසේ දුරු ව රැක්කයුතු විරති ශීලය ම මනාකොට රක්ෂාකෙළේය.

මෙසේ ඒ තිස්ස නම් උපාසක ද ඒ සා මහත් රාජභය පැමිණි තැන තමා අතට දුන් කුකුළා නො මරා ශීලයෙහි යෙදී වන මරණය ම කැමතිවූයේ ත් පව් කරමින් අවුරුදු සියයක් ජීවත් වීමට වඩා ඇසිල්ලක් වත් සිල් රැක මියයෑම් උතුමැ යි බුදුන් විසින් වදාරණලදැ යි කියා ද එසේ ම පින්වත් රජ තුමන්ගේ ජීවිත විනාශ වන තරම් උපන් රොගය පවා තුන්අවුරුද්දක් ඉවසීමෙන් ප්‍රාණවධයෙන් දුරු ව වාසය කෙළේ ත් පාපයෙහි කළ හසින් නො වේ ද, එසේවූ පව් අප විසිනුදු දුරුකටයුතුය යි සලකා යහපත් නුවණ ඇති ඇම දෙන ම අකුශලයෙන් දුරු ව සග මොක් සැප ලැබීමට උත්සාහ කටයුතුයි.

තවද ශක්‍රදෙවෙන්ද්‍ර තෙම මඝමාණවක කාලයෙහි ගුම්ගොඩක යෙහි පටන් අනලස් ව බොහෝ පින් රැස්කිරීමෙන් හා ප්‍රාණඝාතාදී අකුශලයෙන් දුරු ව පන්සිල් රකිමින් වසනුයේ මවුව උපස්ථාන කිරීමය පියාට උපස්ථානකිරීමය කුලජ්‍යෙෂ්ඨයන්ට උපස්ථාන ආදර කිරීමය, සැබැඳුන් කිමය, මොලොක් බස් කීමය, කේලාම් නො කීමය, මසුරු බැහැර කිරීමය, මසුරු බැහැර කිරීමය යි යන මේ ගුණධර්මයන් පුරා මරණින් මත්තෙහි තව්තිසා භවනයෙහි දෙදෙව්ලොවට අධිපති ශක්‍රදෙවෙන්ද්‍ර ව උපන්නේය. එකල්හි තව්තිසා භවනයෙහි පූර්වදෙවවූ අසුරයෝ වසති. එහෙයින් සක්දෙව් රජ "මොවුන් හා

එක්ව රාජ්‍යය කිරීමෙන් ප්‍රයෝජන කීමිද?" යි සිතා ඔවුන්ට රා පොවා මත්වූවන් මහමෙර පාතට දැම්මවිය. එකල්හි ඔහු හැම දෙන ම ඔවුන්ගේ කුශලබලයෙන් නිපන් අසුර භවනයට ම පැමිණියාහුය.

ඒ අසුර භවනය නම් මහාමේරුව යට තව්තිසා භවනය හා සමානව ම පිහිටියේය. එහි දෙමියන්ගේ පරසතු ගස මෙන් සිත්පළොල් නම් කල්පවෘක්ෂයෙක් පහළවිය. එහි මල් පිපි කල තව්තිසා භවනයෙහි පරසතුකෙළිය මෙන් අසුරයෝ එක්ව මහත් සතුටෙන් සැණකෙළි කෙළිති. ඒ අසුරසේනාව රණයිව ශක්‍රතෙම අප රා පොවා මත්කරවමින් මහමෙර මත්තෙන් හෙලා අපගේ දිව්‍යපුරය ගත්තේය, ඔහු හා සමග අපි යුඩ කරමිහ යි කියා වැඹක් ඔස්සේ නැගෙන කුහුඹු රැලක් සේ මහාමේරුව ඇසුරු කොට ගෙණ නැඟහුය. ඒ බව ඇසූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙම මුහුදු පිටින් ම ගොස් ඔවුන් හා යුඩ කොට පැරදුනේ ඒ පස්යොදුන් පමණවූ වෛජයන්ත නම් රථයානාවෙන් දකුණු මුහුදු පිටින් දුවන්ට වන. එසේ දිවන රථය කොළඹුල්වනයට පැමිණි කල ඒ රථවෙගයෙන් මග අසළ ඉඹුල්රුක් තල්ගස් සේ ඉදිර වැටෙන්ට වන. එසින් ගුරුළු පැටියෝ මහඟින් හඬා ම වැටෙමින් මුහුදු පිට පෙරළෙති. ශක්‍රදෙවෙන්ද්‍ර තෙම ඒ හඬ අසා මේ කුමන හඬෙක්ද යි විමැළි තැන මාතලි දෙවිපුත් "නුඹවහන්සේගේ රථ වේගයෙන් සිදී වගුළ කොළඟි හිඹුල්වනයෙහි ගුරුළු පැටවුන්ගේ හඬය" යි කීය.

ඍක්දේවිරජ ඒ අසා "අහෝ අප නිසා එසේ ගුරුළු පැටවුන්ට දුකෙක් නම් නො වේවා. ඒශ්වර්‍ය්‍ය නිසා වත් දිවි නිසා වත් ප්‍රාණඝාත අකුශලය නො කරමිහ. මොවුන් නිසා අපගේ ජීවිතය අසුරයන්ට දී අපි ප්‍රාණවධයෙන් මිදෙමිහ. එහෙයින් මාතලීය රථය නවත්වා ආපසු කරකවව" යි කියේය. එබස් ඇසූ මාතලි දෙවිපුත් රථය නවත්වා ආපසු තරකවා අන්දිසාවකින් දෙවි ලොවට යන සේ අභිමුඛ කෙළේය. එකල්හි පසු පස්සෙහි ලුහු බඳවා එන අසුරසේනාව ඒ නවත්වන්නාවූ රථය දැක "අනික් සක්වළකින් දිව්‍යසේනාවක් අවුත් මහා බල ලදින් ශක්‍රයා ආපසු කරකැවී නැවත ත් අප කරා ම එන්නේය" යි සිතා භයපත් ව නැවතී හොස් අසුර පුරයට ම වැදුනාහුය. මෙසේ දෙවිලෝ දෙකකට නායකවූ දෙකොළ පණස් ලක්ෂයක් පමණ දිව්‍යාඛ්‍යානවන් පිරිවරා දසදහසක් ඇදුන් ශක්‍ර පුරයෙහි ප්‍රමාණාතික්‍රාන්ත දිව්‍යෛශ්වර්‍යයට පැමිණි ශක්‍රදෙවෙන්ද්‍රයා පවා ඒසා මහත් දිව්‍ය සම්පත්තිය ත් තමාගේ ජීවිතය ත් නො සලකා ඒ හැමතන්හි පැවති

අාලය හැර ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරුවූයේත් පව් කිරීමෙහි නොයෙක් ආදීනව හා සිල් රැකීමෙහි මහානිසංස ඇතිහෙයිනි. එසේ හෙයින් එම්බා පින්වත්නි! තමහට වැඩ කැමති සත්පුරුෂ යෙනි! තම තමන් විසිනුදු අප හැමවත් ඒ පව් කිරීමෙන් වන සතරඅපා දුක් අනුභවකිරීම ආදි නොයෙක් ආදීනව හා එයින් වැළකීමෙන් දිව්‍යසම්පත් ලැබීම් ආදි ප්‍රමාණාතික්‍රාන්ත ආනිශංස කාරණයෝ ඒකාන්තයෙන් ඇතිවන්නාහුය යි නුවණින් යෙදී සැලකීමෙන් එසේ ම ඔවුනොවුන්ගේ ධන බන්ධු ජීවිතාදි සියල්ල ම විනාශයට නියි කාරණ පැමිණියේ වී නමුත් ඒ හැම නො සලකා අකුශලයෙන් දුරු ව උතුම් ශීලගුණය ම රක්ෂාකටයුතු.

තවද ලොකයෙහි කුශලාකුශල විභාගාදි නොයෙක් කාරණ කාරණයන් දන්නා දෙවි මිනිසුන් විසින් මෙසේ පාපයෙන් දුරු ව සිල් රක්ෂාකිරීම කුමන ආශ්චර්‍යයෙක් ද? දිව්‍යෛශ්වර්‍යය දූක ශක්‍රයාගේ අවවාද අැසු තිරිසන් සත්හු පවා අප්‍රමාද ව ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරු ව ශීලගුණය ම රක්ෂාකළාහුය. ඒ කෙසේද? යත්;

එම ශක්‍රදෙවෙන්ද්‍ර තෙම පළමුවෙන් මිනිස්ලොව මිය මානවක ව උපන්කල ඕහට භාග්‍යය ව සිටි පින් නො කර ප්‍රමාද ව විසූ සුජාතා නම් භාග්‍යවතිව තමා පින් නො කළ හෙයින් එක්ව වැස පින් කළ සෙසු භාග්‍යවතුන් හා සමග දෙව්ලොව නො ඉපිද එක් වෘක්ෂතරයෙක්හි කඳුරුලියක කන කෙකිනි ව උපන්නීය. ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම දෙව්ලොව නූපන් බව දැන කොතනක උපන්නීදැ යි බලනුයේ අැ පින් නො කළ හෙයින් තිරිසන්අපායයහි කන කෙකිනි ව උපන් බව දැන එතනට ගොස් අැ ගෙණ දිව්‍යලෝකයට අවුත් රමණීයවූ දිව්‍ය පුරය ද සුධර්මා නම් දිව්‍යසභාව ද යනාදි දිවෛශ්වර්‍ය්‍ය සියල්ල ම පෙන්වා අවවාද කොට පඤ්චශීලයෙහි පිහිටුවා නැවත එම කඳුරුලියම අැර සක්දෙවිරජ දෙවිලොවට ම ගියේය. ඒ කෙකිනී ද එතැන් පටන් ඒ අවවාද ලෙස සිල් රක්ෂාකරන්නීය. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍ර තෙම ඒ කෙකිනි සිල් රක්ෂාකරන්නට සමර්ථ වන්නීදැ යි පරීක්ෂා කරණු සඳහා මළ කුඩ මත්ස්‍යකු වෙශයෙන් අැ ඉදිරිපිට වැදහොත්තේය. ඒ දූක කෙකිනි මළ මත්ස්‍යශරීරක යන සිනින් තුඩින් ඉඟ අල්වාගත. එවිට ඒ මත්ස්‍යයා වරළ ශෝල්මාලිය ඒ දූක ජීවිතය ඇති එකෙකැ යි සිතා ඇරපූය. එවේලෙහි

ශක්‍ර තෙම සිල් රක්‍ෂාකිරීමෙහි නී සමර්ථවන්නිය යි ප්‍රශංසා කොට උත්සාහ වඩාව සි කියා දෙවිලොවට ම ගියේය. ඒ කෙකිනී ද එසින් මියගොස් බරණැස කුඹල්කුලයක ඉපිද පූර්ව අභ්‍යාස වශයෙන් පිරිසිදුව ම සිල් රක්‍ෂාකරන්නීය. ශක්‍ර තෙම නැවත ත් ඇගේ ප්‍රවෘත්තිය බලනුයේ මිනිස්ලොව උපන් බව දැන එතනට ගොස් ගැලක් පුරා ගෙණ ගිය රන්තියඹරා රැසකින් සංග්‍රහ කොට අප්‍රමාද ව සිල් රක්නා පරිද්දෙන් නැවත ත් අවවාද කොට දෙව් ලොවට ම ගියේය. ඇ ද ඒ අවවාද ලෙස අප්‍රමාද ව සිල් රක්‍ෂා කිරීමෙන් බොහෝ පින්කම් රැස්කොට ආයු කෙළවර **මෙපමිත්නි** නම් අසුර රාජයාට දුව ව උපන්නීය. සිල් රක්‍ෂාකළ කුශලයෙන් විශිෂ්ටවූ රූපශ්‍රීන් යුක්ත ව පෙර පුරුදුනායෙන් සක්දෙව්රජහට ම භාර්‍යා ව දෙකෙළපණස් ලක්‍ෂයක් පමණ දිව්‍යාඞ්ගනාවන්ට ප්‍රධාන ව දිව්‍යශ්‍රීසම්පත් අනුභවකෙළේය.

එහෙයින් එම්බා පින්වත්නි, තමහට වැඩ කැමති නුවණැති සත්පුරුෂයෙනි! මෙසේ කිසිම කාරණාකාරණ විභාග දැන්මක් නැති සියල්ලෙන් අධම නිශ්‍රීකවූ තිරිසන් ජාතියෙහි උපන් ඒ කානකෙකින්න පවා දිව්‍යලොකසම්පත් දැක සතුටු ව ශක්‍රයාගේ අවවාද අසාගත් ප්‍රමණකින් අප්‍රමාද ව තමන්ගේ ජාති සවභාව යෙන් ම පුරුදු සතුන් නැසීම හැර ජීවත්වීම පිණිස අන්කිසි උපායකු ත් නැතිව ම තිබියදී ප්‍රාණාතිපාත අකුශලයෙන් දුරු ව ශීලගුණය ම රක්‍ෂාකරමින් එම ශීලබලයෙන් ඒ සා මහත් දිව්‍ය සම්පත්තියක් ලත්කල මෙසේ හැම්ලෙසින් එබඳුවූ අගව්‍ය සථාන වලිනු ත් මිදී යහපත් මනුෂ්‍යජාති ලදින් කාරණාකාරණ කුශලා කුශලයෝ නම් මේ මෙය යි වෙන් වෙන් ව සලකාගත හැකි උතුම් ප්‍රඥාවත් ලදින් විහඳ වාදිවූ බුදුරජානන් වහන්සේ විසින් සියලු කුශලාකුශලයන් විභාගකොට වදළාවූ සඞ්ගීයත් අසා ප්‍රාණාති පාතාදි අකුශල් කිරීම හැර ලොව ජීවත්වීමට නියි ගොසිතැන් වෙළදුම් දෑදිවූ නොයෙක් උපාය කාරණාවලුත් ලොව ඇතිව තිබියදී ඒ කානකෙකින්න සේ දිව්‍යලොක සම්පත් මසැසින් නුදුටුවාහු නමුත් හැම දිව්‍යසම්පත් ආදිය නුවණැසින් මනා කොට දක්නා යහපත් මිනිසත් බව ලදින් ඒ සවගීසම්පත් ආදිය ලැබීමට නිසිවූ උතුම් ශීලගුණ පූරණයෙහි යෙදී පව් කිරීමෙන් දුරුවීමට උත්සාහ නො කරන්නාහු නම් තෙපි හැමට ම මෙසේවූ මිනිසත්බව ලැබුනාසින් මෙබදු බුදුබණ ඇසුවාසින් කවර ප්‍රයෝජන ද? මේ

උතුම් බුඩොත්පාදයෙන් බබළන යහපත් මිනිසත්බව ලැබ ඒ කෙනෙකින්නට ඇතිවූ කල්පනාව පමණවත් නොව අනු වණින් ම යෙදී අකුශල් කිරීමෙහි යෙදීමෙන් මතු තෙපි ඇම සසරින් මිදීම තබා සතර අපදුකින් මිදී ගැලවීගැන්ම පමණ වත් කෙසේද? නිරන්තරයෙන් ප්‍රාණාතිපාතාදි මේ දශ අකුසල්හි යෙදී වාසයකළවුන්ට සතර අපාය ම සවකීය ගෘහ යක් වාසස්ථානයක් සමානය යන කාරණය හා ඒ පව්කිරීමෙන් දුරුව වාසය කළවුන්ට සදෙව්ලොව සවකීය සවකීය ගෘහ යක් වැන්නැයි යන බව තොප ඇම කොහ අසනලදද? ඔම සතුන්වෙත පතළ මහාකරුණාවක් ඇති බුදුරජානන්වහන්සේ මෙසේ සියලු කුසලාකුසයන්ගේ විභාගාදීනවානිසංස ප්‍රකාශකොට කිමෙන් මේ සියලු ධර්ම දෙශනාකළෙත් ඔම්සතුන් සියලු දුකින් මුදා නිවන්දක්වන පිණිස ම ය. ඒ එසේමය; එසේ නොව අප ඔම ඇතුලුවූ මේ සියලු ලොකයාකරෙන් කිසි ශර්ම ලාභයක් ලැබ ගන්ට වත් යම් කිසි කාරණයක් කරගන්නා පිණිසවත් මේ ධර්ම බුදුරජහු දෙශනාකර වදාළ සේක් නොවෙයි යන කාරණය ත් තෙපි ඇම නොඇසුවහු ද?

අප විසිනු දු මේ ධර්ම තොප කෙරෙන් උපදනා කිසියම් ලාභසත්කාර ප්‍රශංසාදියක් ආශ්‍රයකොට ඒ නිසා මෙසේ ලියා කියා අවුතු සදන බණකුත් නොවෙයි. පිටකත්‍රයෙහි ප්‍රකාශව පෙණෙන සබ්මිත්‍රශාසනාවන් මෙසේ ප්‍රකාශ කොට දුන්වි මෙන් එහි පිහිටීම හෙතුකොටගෙණ තෙපි ඇම මේ අක්මුල් නැති සසර අනන්ත කාලයක් මහදුක් විඳිනා හෙයින් ඒ දුකෙන් මුදවනු පිණිස දයාවෙන් මෙහෙයකලද සිත් ඇතිව හිතසිව කියන බණක් හෙයින් මෙහි මහත් ආදර උපදවා කවර තරම් කෙනෙකුන් විසින් කෙබඳු බාධාවක් කළත් මදක්වත් පමා නොව නොනැවතී දුක සේ ලත් මේ බුඩොත්පාදයෙන් බබළන උතුම් ක්ෂණසම්පත්තිය හා මේ බණ ඇසීම ආදි නොයෙක් කාරණ සාවකකොට ගන්නාපිණිස අකුශලයන් කිරීමෙන් දුරුවනු කැමති කුවණැති සත්පුරුශයන් විසින් යම කියනලද ක්‍රමයෙන් ප්‍රාණඝාතාදි දශ අකුසල කම්පථයන්ගේ අනෙකප්‍රකාරවූ ප්‍රභෙදදීනව කාරණයන් නොයෙක් වර අසා දැන හැඳින ඒ ඒ පරිද්දෙන් ඔත තබාගෙණ එහි මෙලෝ පරලෝ දෙක්හි ම ඉන්දයුතු සසරඅපදුක් ආදි අනන්ත දුක් අනු භවනිරිමෙන් වන ආදීනව කාරණයන් සිහිකිරීමෙන් භයඋපදවා, දුරුකටයුතුවූ දශ අකුශලයන් කෙරෙන් ලොභාදි කිසියම් කාරණයකින් ප්‍රාණාතිපාත අකුශයක් කරන්ට පැමිණිකල අපි

අපගේ ජීවිත යම් සේ නො නස්නා කැමැත්තමෝ ද එසේ ම සියලු සත්වයෝ ත් තම තමන්ගේ ජීවිතය නො නැසීමෙහි කැමැත්තානුයයි යනාදි කාරණා සැලකීමෙන් ප්‍රාණාතිපාත චෙතනාවෙන් දුරු ව හැම සතුන් කෙරෙහි කරුණා මෙත් පතුරුවා වාසය කිරීමෙන් සිඩවන 'අපරිමාණකං සත්තානං අවෙරං දත්වා අභයං දත්වා" යනාදීන් වදළ අප්‍රමාණ වූ ආනිසංසයන් සිහිකිරීමෙන් යෙදී අනුන් විසින් මරණ සතුනු දු හැකි විනම් මැරිය නො දී අව්‍යාපාද සිතින් වාසය කිරීමය.

අදත්තාදානවශයෙන් අනුන් අයිති වස්තූන්ගේ පැහැරගැනීම් පැමිණිකල යම් සේ අපි අපසත්තක කිසිවකු ත් නො නස්නා කැමැත්තමෝ ද එසේ ම සියලු සත්වයෝ ත් තම තමන් සන්තක වස්තුව නොනස්නා කැමැත්තානු යයි යනාදි කාරණ සැලකීමෙන් සවත්පිරිසෙයින් අනුන් අයිති දුකඩ නූල් පටක් පමණවත් තමන් නො ගැන්මෙන් හා අනුන්ලවා නො ගැන්වීමෙන් ද අනුන් ගන්නා දැක වැලකීමෙන් හා ඒ නස්නා තැන රක්ෂාකිරීමෙන් ද යෙදී ඔවුනොවුන් අයිති වස්තු ඔවුනොවුන්ට ම සිරිත පවතින් ව යි යන වැඩදයි සිතින් වාසය කිරීමය.

පරදාරසෙවනයට නිසි පාපකමියන් කිරීමෙහි අවකාශයක් ලත්තැන දී "අපි අපසත්තක භාර්‍යාවන් රක්ෂාකිරීමෙහි තත්පරව යම්සේ යෙදී වසමෝ තම එසේ ම සෙස්සෝ ත් වසන්නානුය" යි දැන පරස්ත්‍රී සෙවනයෙන් දුරු ව සිටදරා සන්තොෂයෙන් සතුටු වීමෙන් හා පරදාරසෙවනයෙහි යෙදෙන්නා වූ සෙස්සන්ට ද එහි නොයෙක් ආදීනව කියා වැළකීමෙනු දු අනුන්ගේ කුලවංශ රැකීමෙන් යෙදී අව්‍යාපාද සිතින් වාසය කිරීමය.

ලොකයෙහි එසේ ම ක්ලේශකාමයෙහි හැසිරීම කැමැත්තන් විසින් සෙවනය කළ යුතු වූ සුරාපානයක් පැමිණි තැන එයින් වන මෙලෝ පරලෝ දෙක්හි ම නොයෙක් ආදීනව සලකා ඒ සුරා සෙවනයෙන් දුරුවීමය යන මෙසේ වූ කායසුචරිත පිරීමෙන් ත්‍රිවිධවූ කායදුශ්චරිතයෙන් වෙන්වීමෙන් ද,

මුසාවාද කිමට නිසිවූ යම්කිසි කාරණයක් පැමිණිතැන එසේ අසත්‍ය වවන කිමෙන් මෙලෝ පරලෝ දෙක්හි ම වූන නොයෙක් ආදීනව සලකා සිතා පිණිසවත් බොරු නො කියා නිරන්තරයෙන් මුසාවාදයෙන් දුරුව සැබෑ බස් කිමය.

කේලාම් කිමට නිසි අවකාශයක් ලත් තැන ද එයින් වන මහත් ආදීනව සලකා එසේ ඔවුනොවුන්ගේ භෙද විමට නිසි කේලාම් වවන නො කියා භෙදවූවන් සමගිවන සේ ඔවුනොවුන්ට ප්‍රියමනාප බස් කිමය.

පරුෂ වචනයෙන් අනුන්ට නිසරු නිග්‍රහ කිරීමට නිසිවූ සිදුරු කාරණයක් පැමිණිනැන එසේවූ පරුෂ කීමෙහි දෙෂ සලකා රළුබස් නොකියා හැමදෙනාට ප්‍රිය කන්කළු මියුරු වචන කීමය.

නිෂ්ප්‍රයෝජන වූ සම්ඵප්‍රලාප බිණ්ඩිමක් පැමිණිවිට ද නුවණින් ම යෙදී එයින් වන මහත් ආදීනව සැලකීමෙන් නිරර්ථක වූ නිෂ්ප්‍රයෝජන සම්ඵප්‍රලාපයෙන් දුරු ව අනුන්ට ද නෑන්ට ද මේලෝ පරලෝ දෙකින් ම වැඩදායක වූ ලෝකනීතිය ධර්මනීතිය යන දෙකට ම නො වරදනාවූ යහපත්වූ ප්‍රයෝජන වන කීමය යන මෙසේවූ වචි සුචරිත පිරීමෙන් වතුර්විධවූ වචීදුශ්චරිතයෙන් වෙන්වීමෙන් ද;

එසේම අනුවර්ණින් යෙදී පැවතීමය. යන අභිධ්‍යාව ද සියලු අකුසලමූලය යි යනාදි වශයෙන් එහි මහත් දෙෂ සලකා එයින් දුරුව අනුන්ගේ සම්පත් දැක "මේ මට වේවා" යි නොසිතා 'උන්ට සිර වේවා, ඒ සම්පතෙන් ඔහු නො පිරිහෙත්වා" යි යනාදි සිතීමෙන් අභිධ්‍යාවෙන් දුරුවීමෙන් අලොභ සිතින් යෙදී විසීමය,

ව්‍යාපාදයෙහි මහත් ආදීනව සලකා එයින් දුරු ව සියලු සත්ත්වයෝම ඔවුනොවුන් සමඟිවීමෙන් ප්‍රියව වාෂය කෙරෙත්වා සියලුම වැඩෙන් සම්පතෙන්. හැමසත්හු ම, නො පිරිහෙත වා" යි යනාදි සිත් සිතීමෙන් ව්‍යාපාදයෙන් දුරු ව අදෙෂ සිති යෙදී විසීමය.

මිථ්‍යාදෘෂ්ටියයි කියනලද විපරීත වූ නොයෙක් දෘෂ්ටි ගැණීම නිවණට යන මග අහුරා අකුසල් ව සිටිබව ද අපායදුකට මාගීය වූ බව ද නුවණින් සලකා "එබදු නපුරුවූ මිථ්‍යාදෘෂ්ටියෙන් දුරුව සම්‍යක් දෘෂ්ටිවූවානු ඒ පින්කමින් සුගතියෙහි ම ඉපිද එහි දිව්‍ය සම්පත් අනුභවනොව මිනිස් අත්බවෙහි උපන්කල සම්‍යක් දෘෂ්ටි සම්‍යක්කල්පනා ඇතිවෙයි තමාගේ ප්‍රාර්ථනාවූ පරිද්දෙන් තුන්බොධියෙන් එක්බොධියකට පැමිණ නිවත්නේ ය" යි දැක සම්‍යග්දෘෂ්ටි වීමෙන් අමෝඝසිතින් යෙදී විසීමය, යන මෙසේවූ මනො සුචරිත පිරීමෙන් ත්‍රිවිධවූ මනො දුශ්චරිතයෙන් වෙන්වීමෙන්ද යන මේ ත්‍රිවිධ සුචරිතය පිරීම මහතුකොටගෙණ කාය වාක් මනඃ යන තුන්දෙරින් සිඛවන අපායමාර්ගවූ දශඅකුශල කර්මපථයන් කෙරෙන් දුරුවනු කැමති නුවණැති සත්පුරුෂයන්. විසින මේ ලෝකයෙහි ජීවත්වීම කැමැත්තන් විසින් දුරුකොට යුතුවූ ප්‍රවණිඩ සිංහ ව්‍යාඝ්‍රයන්සේ ද භයානකවූ ප්‍රපාතාදිය සේ ද උග්‍රවූ ඇවර විෂඇති සර්පීන්සේ ද ත්‍රිවිධ දුශ්චරිත අකුසල්කිරීමෙන් දුරින් දුරුව දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සැප ලැබීමට එකාන්ත කාරණවූ හෙයින් සවඟී මොක්ෂ දෙකට මාර්ගවූ ත්‍රිවිධ සුචරිත කුසලයන් මෙහි දැක්වූ ක්‍රමයෙන් ම පිරීමෙන් ඒ සියලු සඟමොක් ලැබීමට අප්‍රමාදව උත්සාහ කටයුතු.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි මෙතෙකින් දශ අකුශල කර්මපථයන්ගේ ප්‍රභෙදාදි නවානුශාසනා කථාවන් ප්‍රකාශවූ ෂෂ්ඨපරිච්ඡේදය නිමා විය.

අනෙකාකාරවූ දශඅකුසලඵලයන්ගේ ප්‍රභවදායීනව මෙසේ ප්‍රකාශකිරීමෙන් දෙවිමිනිසුන් සහිත සියලු ලොකයාහට කරණ ලද උතුම් සද්ධම්මානුශාසනා ඇති හෙයින් හැමසතුන් වෙත පතළ කරුණා ඇති මාගේ බුදුරජාතන් වහන්සේ ශාස්තෘනම් වනසේක.

පඤ්චානන්තරිය අකුසලකර්මය නම් කවරහ? යන් මවුන් මැරීමය, පියන් මැරීමය, රහතුන් මැරීමය, සඞ්ඝයා වහන්සේ බිඳුවාපීමය, බුදුන්ගේ ශරීරයෙන් ලේ සෙල්වීමය. යන මේ පස ආනන්තරිය කම් නම් වෙත්. මාගීයට අනන්තරූ ව ඵලයට පැමිණීම සේ නොබලා මවුන් මැරීම ආදී මේ අකුසල කම් කළ සත්ත්වයා මරණානන්තරව නරකයෙහි ම උපදනා හෙයින් මොහු ආනන්තරිය කම් නමැති කියනු ලැබෙත්.

එහි මවු මැරීමය යි කියනලද මාතෘඝාතය නම් කෙසේ ද? යම් කිසිවෙක් මනුෂ්‍ය ජාති ඇති වැදූ මව මරමියි යන සිතින් දැන දිවි ගැලවූයේ වී නම් හේ මාතෘඝාතක කර්මය කෙළේ නම් වේ. එසේ හෙයින් යමෙකු විසින් මනුෂ්‍ය ස්ත්‍රී වූවද වැදූ මව හැර ඇති කළ මව හෝ සුළු මව හෝ මැරූයේ ද අමනුෂ්‍ය ස්ත්‍රීව සිටි වැදූ මව හෝ මැරූයේ ද ආනන්තරිය කර්මය නො වේ. යමෙක් තුමූ තිරශ්චීනව සිටි මනුෂ්‍ය ස්ත්‍රී නූවූ මව නැසූයේ වීනම් භෙද අනන්තරිය කර්මය නො වේ, ඔහුට එයින් වන කර්මය ඉහා මහත් ව ආනන්තරියෙන් පැහැර සිටිනේය.

එසේම යමෙකු විසින් මනුෂ්‍යවූ ජාතක පියා තුමූත් මනුෂ්‍යව සිට නැසූයේ වීනම් පිතෘඝාතක කර්මය වේ. යම්සේ මිනිසත් බව සිටියහුගේ කුසලධර්මයන්ගේ නික්ෂණ ප්‍රසන්න ගුරභාවයෙන් ඉපදීම හෙතුකොට ගෙණ ත්‍රිවිධ බෝධිසත්ත්වයන්ගේ ඒ ත්‍රිවිධ බෝධිඥව පැමිණීම යම්සේ වේද එපරිද්දෙන් මිනිසත්බව සිටියහුගේ ම අකුසල ධර්මයන්ගේ නිෂ්ක්ෂණ ප්‍රසන්නා ගුරභාවයට පැමිණීම දත්තේය. එසේ නොවීමෙන් කර්මය නිෂ්ක්ෂණ නො වන බව දතයුතු. ඉදින් වෛශ්‍යාවකගේ පුත්‍රයෙක් වේ ද හෙතෙම "මේ මාගේ පියානෝය" යි නොදැන යම්කිසිහුගේ සම්භවයෙන් උපන්නේද, හෙතෙම ඒ පුත්‍රයන් විසින් නසන ලද්දේ නම් පිතෘඝාතක කර්ම ගණනට ම පැමිණේ.

යමකු විසින් යටත් පිරිසෙයින් සෝවාන් ව හෝ ගිහිස්වභාව යෙහි සිටි මනුෂ්‍ය ජාති ඇති ක්ෂීණාශ්‍රව කෙනෙකුගේ දිවි දුන දුන ගැලවුයේ වේද මේ අරහන්තඝාතක කම්, අමනුෂ්‍ය වූ රහත් තමක් හෝ මනුෂ්‍යජාති ඇතිව සෙසු මෘදී ඵල සම්ප්‍රාප්ත වූ ආර්‍ය පුද්ගලයන් හෝ හැසිමෙන් ආනන්තර්‍ය කම්ය නො වන්නේය. එ හෙයින් සෙසු නියම ආනන්තර්‍ය කම්ය කලවුන්ට සේ ඕහට ප්‍රව්‍රජ්‍යාව ද නොවළක්වනලදී, අකුශලකම්ය බලවත් වේ. තිරිසන් ජාති ඇති යමෙක් මනුෂ්‍ය වූ රහත් තමක් හැසිමෙන් ආනන්තර්‍ය කම්ය නො වේ. කම්ය වනාහි මහත් යයි දතයුතු.

මාතෘ පිතෘ ඝාතක දක්වන තැන [1]ඵලකවතුක්ක උපමා යෙන් කම්ප්‍රභෙද දැක්වූයේ යම්සේ ද, එමෙන් මේ අරහන්තඝාතකාදී කම්ලක්ෂණය දතයයුතුයි. යම් භික්ෂූකෙනෙක් දෙවිදත් තෙරුන් මෙන් ශාසනය උඩම් උඩිනිය කොට අපලොකනකම්ය සිදුත්ති කම්ය සිදුත්ති දුතිය කම්ය; සිදුත්ති වතුත්ථකම්ය යි කියන ලද සතරප්‍රකාර සඞ්ඝකම්යන් අතුරෙන් එක්තරා සඞ්ඝකම්යක් එක සීමාවක සතර නමින් අඩු නො ව දෙපස්ස ව වෙන් වෙන් ව ගිඳ කරන්නාහු විසින් සඞ්ඝභෙද ආනන්තර්‍ය කම්ය කෙළේ නම් වේ. අන්පරිද්දකින් නො වෙයි දතයුතු.

යමෙක් දෙවිදත්හු මෙන් වෙජ්ජයන් දූෂ්‍යවූ තපුරු වෙතනා වෙන් ජීවමාන බුදුන්ගේ ශරීරයෙහි මදුරුවකු බොන පමණුවත් ලේ සෙලවූයේ වී නම් ඕහට ඒ [2]ලොහිතුප්පාදක ආනන්තර්‍ය කම්ය වේ. මෙහි ලේ ඉපදවීම නම් ශරීරය ඇතුළත ම ලෝහිතයා ගේ එක්වීම කිරීම වේ. තථාගතයන්ගේ කිසිවක්හු විසින් සිද බිඳපිය නො හැකි අභෙද්‍ය ශරීරයෙහි අනිකකුගේ උපක්‍රමයෙන් වම්ය සිද ලේ වගුරුවා ලීමක් නැත. ක්‍රොධයෙන් ශරීරය ඇතුළත ම එකතැනක ලේ කුප්පවා එක්කරවීමයි. යමෙක් රොග සමූහය පිණිස ජීවකයන් සේ සම ඉරා කුණුලේ හැර පහසුකළේ වී නම් මේ ලොහිතුප්පාද කම්ය නො වේ. කෙතෙම බොහෝ පින්රැස් කෙළේ යයි දතයුතු, මේ පංචානන්තර්‍ය අකුශල කම්යන්ගේ ප්‍රභෙදය වේ.

ආසෙවිතවාදී අකුශලකම්ය ද පිළියම් නො ලදහොත් මේ ආනන්තර්‍ය කම්යන් හා සම ව දෙවන ජාතියෙහිම විපාකදීම හා නිවන් මඟ ද බාධාවන හෙයින් ගරුතර කම්යක් වේ. හෙ ද එ හෙයින් මෙහි දක්වනු ලැබේ.

එහි ආඥෙය්‍යෝපවාද අකුශල කම්ය නම් කවරේද? යත් ලොකා ග්‍රවූ බුඩ ප්‍රත්‍යෙක බුඩ අශ්‍රීශ්‍රාවකයෝ ආශ්‍රීෂෝ නම් වෙති එහෙයින් යවත් පිරිසෙයින් ගිහි ව වසන සෝවාන්වූ පුද්ගලයා දක්වා බුඩාදිවූ ඒ උතුමන්ට අනඤ්ඤ උපදවනු කැමති ව යම්කු විසින් අන්තිම වස්තුවෙන් හෝ ගුණ නැසීමෙන් හෝ කියනලද යම් මේ උපවාද ආක්‍රොශ ගර්හා පරුෂවචන කෙනෙක් ඇද්ද. ඒ හැම ආඥෙය්‍යෝපවාද අකුශල කම් නම්.

එහි යමෙක් එබදු උතුමන්ට නො සතුටුව "මොවුන්ට ශ්‍රමණ ධම්යෙක් නැත මොහු අශ්‍රමණයෝය" යි කියන්නේ වී නම් ඒ අන්තිම වස්තුවෙන් උපවාද කෙළේ නම් වෙයි, "මොවුන් කෙරෙහි ධ්‍යානයෙක් වත්, විමොක්ෂයෙක් වත්, මාර්ගයෙක් වත් ඵලයෙක් වත් නැත" යි කියන්නේ වී නම් ගුණපරිධංසනයෙන් උපවාද කෙළේ නම් වෙයි.

එහි පුත්‍රයන්ට වැඩ කැමති ව දෙමව්පියන් විසින් කියනලද ගර්හා වචනයෝ ද ආශ්‍රය කොට සිටිනා අන්තේවාසිකාදින්ට වැඩ කැමැති ව ආචාර්ය උපාධ්‍යායයන් විසින් නික්මවන පිණිස කියනලද ගර්හාවචනයෝ ද උපවාද නො වන්නාහු යයි දක්වන ලදී. යම් කෙනෙක් "මේ ආර්‍යකෙනෙකැයි" දැන හෝ නො දැන හෝ ආර්‍ය්‍යන් වහන්සේ නමකට උපවාද බිනුව හොත් මෙහි ආර්‍ය්‍යබවට ම ප්‍රමාණ බැවින් ඔහට ආඥෙය්‍යෝපවාද අකුශලය වේ, මේ ආර්‍ය්‍යයයි නො දන්නාවූ වෙෂයෙන් නපුරු සිත් නැත්නා හුගේ එහි උතුම් ගුණ ඇති බව දැනගන්නා පිණිස කියන වචනය ගුණපරිධංස නො වෙයි, එහෙයින් ඔහට ආඥෙය්‍යෝපවාද නො වන්නේ යයි කියත්. ඒ මේ ආඥෙය්‍යෝපවාද කම්ය ආනන්තරිය අකුශලකම්යන් සදෘශ වන බැවින් මහත් ගරුතර පාපකම්යක, එයින් සුගති ගමනට ද නිවන්මග ලැබීමට ද අන්තරාය වෙයි. එසේ ද වුවත් ඒ ආඥෙය්‍යෝපවාද අකුශලකම්ය තෙකිළිඹ බැවින් පිළියම්න් සාධ්‍යය, එහෙයින් ආනන්තරිය කම්ය සේ අතෙකිළිඹ නො ව ක්ෂමාකර ගැන්මෙන් පව් නැති වේ, ඒ කාරණය ප්‍රකාශ කරන පිණිස මේ වස්තුව දක්වනලදී.

ඒ කෙසේද? යත්:-එක්තරා ගමක එක් තෙරුන්නාන්සේ නමක් ලදරු භික්ෂූ නමක් එක් ව දෙදෙනා වහන්සේ පිවූ පිණිස පැමිණියාහුය, ඒ උන්වහන්සේලා පළමුකොටම ශම්ප්‍රාප්ත ගෙවල දීම කිනිස්සක් පමණ උණු කැද ලද්දාහුය, තෙරුන්වහන්සේගේ බඩ වාතරොගයෙක් පකරන්නේය, එහෙයින් උන්වහන්සේ ඝිතනසේක් "මේ කැද මට පිහිටය, එහෙයින් සිසිල්වීමට පළමු

වෙන් ම වළඳමි''යි සිතා මිනිසුන් විසින් අවුළුපත් කැඳ පිණිස ගෙණ ආයේ ද දඹුකදක් මත්තෙහි උන්වහන්සේ වැඩ හිඳ එහි සැමට ම ප්‍රකාශව පෙණී පෙණී ම ඒ හුණු කැඳිත්ත වැලඳුවේක. අනික් උන්වහන්සේ ඒ දැක එයට පිළිකුල් ව ක්ෂුධා අධිකවූ මේ මහලුතෙම එකානතයෙන් අපව ලජ්ජාවිය යුක්තක් කෙළේය'' යි කියේය, තෙරුන්වහන්සේ ඒ ගම්හි ගැහැර ඉක්බිති විහාරයට ගොස් මෙතෙම සෝවාන් ව සිටින භික්ෂුකෙනෙකැ'' යි දැන ම ඒ ලදරු භික්ෂුනමට වදුරණසේක් ''ඇවැත්නි! තොපට මේ ශාසනයෙහි පිහිටෙක් ඇද්ද? යි විමැරා වදළසේක. එකල්හි අනික් උන්වහන්සේ ද ශාසනයෙහි පිහිට නම් දුකඛාදි වතුස්සත්‍යය දැනීමය'' යි සිතා ''එසේය සවාමීන්වහන්ස මම සෝවාන්යෙමි'' යි දැන්වූසේක; එවිට තෙරුන්වහන්සේ උන්වහන්සේට කාරණා උපවාද වදුරණසේක් ඇවැත්නි! තොප විසින් මතු පැමිණිය යුතු සකෘදාගාමි මාගීාදිය පිණිස උත්සාහ නො කර තා විසින් රහතුන්ට උපවාද කියනලදැ''යි කියා තමන්වහන්සේ ප්‍රකාශ කළසේක. අනික් උන්වහන්සේ තෙරුන්වහන්සේගේ එසේවූ කැදිනි වැළදීම දැක ''මෙතෙම ශ්‍රමණයන්ට සරුප් නො සරුප් හෝ ලොකව්‍යවහාර පමණවත් නො දන්නාසේකැ'' යි යන අභිප්‍රායෙන් එසේ කි බැවින් ගුණපරිධංසනයෙන් ගහී කොට කිමට ක්ෂමා කර වදුළමැනවැ'' යි කියා ක්ෂමාකරගත් කාරණයෙන් උන්වහන්සේට ඒ කම්ය තෙම සකෘදාගාමි මාගීාදියට පැමිණීමට ආවරණ නො වූයේය පළමුවෙන්ම උන්වහන්සේ අපාය මාගීය පිහිටව සෝවාන්වූ බැවින් ඒ අකුසල කම්යතෙම උන්වහන්සේගේ සුගති ගමනට බාධාකරන්ට අසමර්ථයි.

එහි අන්‍යවූද යම් කිසිවෙක් බුබාදී ආයුෂ්මන්ට වරදවා උපවාද කෙළේ වී නම් ඔහු සිතින් එතුමන් කරා ගොස් උක්කුටුක යෙන් හිඳ ඇදිලි බැඳ ගෙණ ''වහන්ස මම ඔබවහන්සේට මෙනම් මෙනම් වචනයකින් පිරිහෙලා කිමි, ඒ මට ක්ෂමාකර වදළමැනව'' යි කියා ක්ෂමාකරගතයුතු, ඉදින් සෝවාන් සකෘදාගාමී මාගීවයට පැමිණියාහු වෙශය මුල්සිද නො නැසූ බැවින් රොස්ව කිපීමෙන් හෝ අනාගාමි රහත්හු හෝ ඔහට වැඩ කැමති ව ආඝාති සංවරයෙහි පිහිටුවනු පිණිස ක්ෂමාකරන්නාහු වී නම් උන්වහන්සේලා වසන ඒ විහාරයෙහි යම් භික්ෂූන්වහන්සේ කෙනෙක් වසන්නාහුද උන්වහන්සේලාගේ සමීපයට ගොස් වැඳ උක්කුටුක යෙන් හිඳ ඇදිලිබැඳගෙණ ක්ෂමාකර ගතයුතු.

ඒ කෙසේද?- ''වහන්ස, මම අසවල් අයුෂ්මතුන්ට මෙනම මෙනම් දෙය වචනයක් බිණිමි. ඒ ආයුෂ්මතුන් වහන්ස මට ක්ෂමා කරණ සේක්වා'' යි කියා මෙසේ කියනතහු විසින් ක්ෂමා කරවා ගතයුතු.

තවද තමා වරදවා උපවාද බිඳු ඒ ආචාර්යන් වහන්සේ යම් දිශාභාගයකට නික්ම ගිය ගමනක් ඇති කල්හි අතවැසි ආදීන් යවාද ක්ෂමා කරවාගන්ට වටනේයි. ඉදින් එකලාව එතන හැසිරෙණ භික්ෂු නමක් වී නම් හෙතෙම වසන තැනක් ගිය තැනක් නො පෙණේ නම් සුවණැති එක් භික්ෂූන් වහන්සේ නමක් සමීපයට ගොස් ''වහන්ස, මම අසවල් නම් ඇති ආයුෂ්මතුන් වහන්සේට මෙනම මෙනම් වචනයෙන් බිණිමි. ඒ කාරණය සිහි කරන්නාවූ මට විපිළිසර උපදනේය. ඊට කුමක් කෙරෙම්ද'' යි කියයුතු. එවිට උන්වහන්සේ කියන සේක් නෙපි එසේ නො සිතව. ඒ තෙරුන් වහන්සේ තොපට ක්ෂමා කරණ සේක. තොප සිත සන්සිඳුවව'' යි කියන සේක. ඒ වචනය ඇසූ බහු විසිනු දු ඒ ආචාර්යන් වහන්සේ ගිය දිශාවට අතිවූඛව ඇදිලි බැඳගෙණ ක්ෂමා කරණ සේක්වයි කියයුතු. එසේ කිරීමෙවු දු පාපය නැතිවේ.

ඉදින් පිරිනිවියේක් වී නම් පිරිනිවීමඤ්චකසඨානයට හෝ පූජා කරණ තැනට හෝ යම් තැනක සුසානය ද එ තනට ගොස් පළමු කි සේ හිඳ ක්ෂමා කරවා ගතයුතු. මෙසේ කළ කල්හි සඛගීගමනයට ද නිවීරණ මාර්ගයට පැමිණීමට ද ආවරණ නො වේ. පව් නැති ප්‍රකෘති සවභාවම වේ. මෙහි ප්‍රකෘති නම් මෙසේ කළ කල්හි තමාගේ සිත පහදනේය. ''ඒ කර්මය සඛගියට නිවීරණයට ද ආවරණ නොවෙයි යන අනිප්‍රායෙකැ'' යි සමහරෙක් කියත්. මෙසේ ක්ෂමා කරගත් කල්හි ඒ අකුශල කර්මය ප්‍රයෝග සම්පත්ති යෙන් විපාකයා ගේ ප්‍රතිබාහනය කළ බැවින් අහොසි කම් වශයෙන් හෙවත් විපාක නැති කම් වශයෙන් විපාක නැති සවභාවට ම පැමිණෙන ලද්දේය. එහෙයින් සඛගි මොක්ෂ දෙකට ආවරණ නො වන්නේය'' යි මෙසේ මෙහි අර්ථ ගත යුත්තේය. මෙසේ කිරීමෙන් පව් නැතිවීම වනාහි ආචාර්‍යාපවාද පාපකර්ම යාගේ ද එම ආත්මයෙන් ම විත්ද යුතු දෘෂ්ටධර්ම වේදනීය කර්මයා ගේ ද සවභාව ධර්මතාවකි. යම් පාපකර්මයක් මෙසේ ප්‍රතිකර්ම නො කරණ ලද බැවින් ප්‍රකෘති වූවේ ද ඒ පාපකර්මය මහා සාවද්‍යම වේ. මහා සාවද්‍ය වූ ආචාර්‍යාපවාද පාපකර්මය ආනන්තරීය කර්මය සමාන වේ. ඒ කෙසේ ද? යත්:

''සෙය්‍යථාපි සාරිපුත්ත භික්ඛු සීලසම්පන්නෝ සමාධි සම්පන්නෝ පඤ්ඤා සම්පන්නෝ දිට්ඨෙව ධම්මෙ අඤ්ඤං ආරාධෙය්‍ය

එවං සම්පදමිදං සාරිපුත්ත වදාමි, තං වාචං අප්පහාය තං චිත්තං අප්පහාය තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජිත්වා යථාභතං නිකඛිත්තෝ එවං නිරයෙ ඨි."

යනුයෙන් බුදුරජතෙම යම්සේ සාරිපුත්‍රය "ශීලසම්පන්නවූ සමාධි සම්පන්නවූ ප්‍රඥාසම්පන්නවූ හිඤුතෙම ඉහාත්මභාවයෙහි ම රහත් බවට පැමිණේ ද, එපරිද්දෙන්ම යමෙක් ශ්‍රොත ආපත්‍යාදි ආර්‍යඵලයෙහි පිහිටි නමකට උපවාද කොට පරිභව බැණ ඒ පාපය එම ජාතියෙහි ඒ තම සෑමා කොට ගිත් ගෙණ සන්සිදුවා නො ගන්නේ වී නම් හෙතෙම ආක්‍රොශ වශයෙන් කියනලද ඒ උපවාද වචනය නො හැර ඒ විඥාණය නො හැර ඒ දෘෂ්ටිය නො හැර සිට කාලක්‍රියා කළ හොත් හෙතෙම අහස දමන කැටය යම්සේ බිම හෙන්නේ වේ ද, එසේම නරක දුකට පැමිණෙන්නේ ය" යි වදාළසේක.

මෙසේ මරණින් මත්තෙහි ආනන්තරිය කර්මයන් සේ අපාය දුකට පමුණුවනු ලබන ආර්‍යෝපවාද යයි කියනලද ලොවුතුරා බුදුන් හා සෝවාන්මාර්ගාදි ආර්‍යඵලයට පැමිණි දෙව් බඹ යක් බූ මිනිසුන් අතුරෙන් යම්කිසි කෙනෙකුට දැන දැන හෝ නො දැන හෝ නිසරු නිග්‍රහවූ පරුෂවචන බිණීම නොයෙක් ආදීනව ඇත්තේ යයි දැන එබදුවූ ගුණවන්තයන් කෙරෙහිද තුණුරුවන් විෂයෙහි ද අනාදර නො කොට සත්පුරුෂ ජනයන් විසින් ආදර ගෞරව බහුමාන කිරීමෙන් සියලු දුකින් මිදී සියලු ම සැප ලැබී මෙහි උත්සාහ කළ මැනවි. මෙතෙකින් ආර්‍යෝපවාද පාපකම් විභාගාදීනව කියා නිමවන ලදී.

බුඩ ධම් සඞඝ සංඛ්‍යාත තුණුරුවන්හි අනාදර කිරීමෙහි විශෙෂ කෙසේ ද? යත්: හේ මෙසේ දතයුතු. යමෙක් බුදුන්ගේ ශරීර ධාතු තුබූ දැගැබක් වඳිනට නො යේ ද, වෙත්‍ය මලුවට නැඟෙනකල කුඩ සේසත් ආදිය ඉසට කෙරේ ද, පය වහන්ලා ගෙණයේ ද, වන්දනා කරණකල නොයෙක් දික් බල බලා වඳී ද, අනුන් හා කථා කරමින් වඳී ද, පෙණෙන තැන දෙවුර වසා පෙරවා ගෙණ සිටී ද, දැගැබට පෙණෙන තැන පයවහන් ලා ගෙණ සක්මන් කෙරේ ද, පෙණෙන තැන හිඳ සිට ස්නානය කෙරේ ද, පෙණෙන තැන හිඳ සිට මල මූත්‍ර කෙරේ ද, පෙණෙන සේ දැගැබට උස්බිම සක්මන් කෙරේ ද, යටමාලේ ධාතු පිළිම වඩා තබා උඩ මාලේ වාසය කෙරේ ද, මෙකී අනාදර කාරණයන් දැක යමෙක් අවවාද කී කල්හි කිපේ ද යන මේ ආදි නොසරුප් දැ කිරීම බුදුන් කෙරෙහි අනාදර කළා නම් වේය.

යමෙක් "බණ අසන්ට වරෙව්" යයි කාලඝොෂා කළ කල අඩලු කල බණ අසන්ට නො ගොස් බාලජනයන් එක්ව හිඳී ද, සෙසු කී නො කී නො කටයුතු කෙරේ ද, බණ අසන කල සතුටු සොම්නස් නො වේ ද, සකස් කොට නො අසා ද අනුන් හා කථා කෙරේ ද, අවවාද කී කල සතුටෙන් පිළි නො ගණ්නී ද යන මේ ආදී දෑ කිරීම ධර්මයෙහි අනාදර කළා නම් වේ.

යමෙක් සහ මැද අවසර නො ගෙණ අනුන්ට බණ කියා ද, අවසර නො ගෙණ හිඳී ද, නො වැඳ හිඳී ද, අත් පා සල සලා හිඳී ද, ඉතා ලං ව හිඳී ද සිටී ද, ඉසට කළ කුඩ ආදිය නො හරී ද "මෙසේ නො කරවයි කී කල ආදරයෙන් පිළි නො ගණ්නී ද යන මේ ආදී දෑ කිරීම සතුරුවන් කෙරෙහි අනාදර කළා නම් වේ.

මෙසේ කරණලද අනාදර එක සතුරුවනක් කෙරෙහි ද කළ මහ සඞ්ඝයා වහන්සේ කෙරෙහි කළා නම් වේ. මෙසේ වූ අනාදර තුණුරුවන් කෙරෙහි නො කොට වැඩ කැමති සත්පුරුෂයන් විසින් ආදර භක්ති උපදවා ශ්‍රද්ධාවෙන් යෙදී උපස්ථාන කිරීමෙන් පින් රැස් කටයුතු.

මෙසේ ආනන්තරීය කර්ම ප්‍රභෙදාදීනව හා අයෙථ්‍යාපවාද අකුශල කර්ම ත්‍රිවිධරත්නයෙහි අනාදර විභාග ප්‍රකාශ කොට දෙවි මිනිසුන් සහිත සියලු ලොකයාගට කරණලද උතුම් සබ්මිනුශාසනා ඇති හෙයින් ධර්මාධිපතිවූ මාගේ බුදුරජ ශාසනා නම් වන සේක. එසේ හෙයින් කියනලදී.

දෙව යකඛ මනුස්සානං ලොකෙ අග්ග ඵලං දදං,
දදනතං දම යනතානං පුරිසාජඤ්ඤදෙන නමෝ.

ලෝවැඩ පිණිස කරණ ලද **මේ ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි, මෙතෙකින් ආනන්තරීය අයෙථ්‍යාපවාද කර්ම විභාගාදීනව හා ත්‍රිවිධ රත්නයෙහි අනාදර විභාග කථා නම් වූ සප්තම පරිච්ඡේදය කියා නිමවන ලදී.**

පඤ නීවරණ ධර්මයෝ නම් කවරහ? යත්: සියලුම සත්වයන්ට දෙවි මිනිස් සැපත් හා නිවන් සැප ලැබීමට නිසි පින්කම් කිරීමට අවකාශ නො දී කුශල්මලවසා වළකා මුවහ කොට ආවරණව සිටිනා පාපධර්ම නම් ලද **කාමච්ඡන්දය ව්‍යාපාදය ථීනමිද්ධය උද්ධච්ච කුක්කුච්චය විචිකිච්ඡාය** යන මොහු පඤ්චනීවරණයෝ වන්නාහුයි

එහි **කාමච්ඡන්දනීවරණය** කෙසේද? යම් චක්ෂුරාදි ඉන්ද්‍රිය යන් විෂයවූ රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය, ධර්මය යන මේ ඡඩාලම්බනයන් කෙරෙහි පවත්නා ලෝභය කාමච්ඡන්ද නම් වෙයි.

ව්‍යාපාද නීවරණය කෙසේද? යම් අනුන් කෙරෙහි සිත නො සතුටු බව ව්‍යාපාද නම් වේ.

ථීනමිද්ධය නම් කෙසේද යම්? චිත්තයාගේ සංකොචනය හැකිලීම වින නම්. වෙදනාදි ස්කන්ධත්‍රයාගේ අකර්මණ්‍යතාව මිද්ධ නම්. චිත්ත චෛතසික ධර්මයන්ගේ ලීනතා අකර්මණ්‍යතා වින මිද්ධ නම්.

උද්ධච්චකුක්කුච්ච නීවරණය කෙසේද? යම් උස්ලියක බැඳි ධ්වජයක් මෙන් නිරන්තරයෙන් වංචලව සිත එක අරමුණෙක නො පිහිටි සන්හුන් කමක් නැති බව උද්ධච්ච නම්. කළ නො කළ හැම දෙයට ම තැවෙන බව කුක්කුච්ච නම් වෙයි.

විචිකිච්ඡාව කෙසේද? යම් බුදුහු ඇති සේක් දෝ හෝ සියල්ල දන්නා සේක් දෝ හෝ නො වේ දෝ හෝයි, ධර්මය මනාහොට දෙසූ දෙයක් දෝ හෝ නො වේ දෝ හෝයි, සඞ්ඝයා වහන්සේ මනා ගඟපත් පිළිවෙත් පුරණසේක් දෝ හෝ නො වේ දෝ හෝයි, පෙර මම වීමි හෝ නො වීමි හෝ, මතු මම වෙමි දෝ හෝ නො වෙමි දෝ හෝයි, මම හෝ මම නො වෙමි හෝ කෙසේ මම වීමි හෝ කොයින් අවුදු මත්තේ කොයි යෙයි හෝ සියලු දහම් හු පිණිස උපදිනි හෝ එසේ නො වෙහි හෝ සසර දුකින් මිදෙන පිළිවෙත් ඇති දෝ හෝ නැති දෝ හෝ යනාදි විසින් සැක විමති පෙදීමෙන් එක් තැනක පිහිට නැති සවභාව විචිකිච්ඡා නම් වේ.

එහි එසේවූ කාමච්ඡන්දයතෙම ශුභවූ රූපාදි නිමිති ආරම්මණ යන් අනුවණින් යෙදි සලකන්නාහට ම උපදනේයි. එහි අනුව ණින් යෙදි සැලකීම නම් අනුපායයෙන් අමාගියෙන් යෙදී අනිත්‍ය යෙහි නිත්‍යයයි කියා ද, දුකඛයෙහි සැපය යි කියා ද, අනාත්ම යෙහි ආත්මයයි කියාද, අශුභයෙහි ශුභයයි කියාද, විපරිත කොට යම් සිහිකිරීමෙක් ඇද්ද, ඒ සිතිවිලි බහුලව පවත්නාහට ඒ කාමච්ඡන්දය උපදනේය. එහෙයින් "**අසිහිකඛවෙසුහනි මිත්තං**" යනාදින් කාමච්ඡන්දය උපදනා ක්‍රමය බුදුන් විසින් වදාරණලදී. ඒ නිත්‍ය නො වූ අනිත්‍ය සවභාව ඇති සියලු සංස්කාර

ධර්මයෝ ම අනිත්‍ය වන්නාහු යයි කීයා ද, ජාති ජරා මරණාදි සියලු දුකඛයන් දුකඛයයි කියාද, මේ දෙතිස්කුණප නොවසින් යුත් ආත්මය අනාත්ම යයි කියාද, දශ අශුභාදීන් අශුභයයි කියාද ඒ ඒ කාරණයන්ගේ ඇති සවභාව විපරීත නොකොට ඒ වූ පරිද්දෙන් නුවණින් යෙදී බහුලව සිහිකරන්නාහට නූපන් කාමවිතර්කය පහවන්නේය. අභාවූද කාමවිතර්කයාගේ පහවීමට නිසි කාරණ සයෙක් වන්නාහු සි.

ඔහු කවරෙක්ද?- උඛුමාතකාදි දස අශුභ උගන්නාහටද එම අශුභ භාවනාවන්හි යෙදී වසන්නාහටද, චක්ඛුවාරාදි ඉන්ද්‍රිය යන් සුපිහිතව රක්නාහට ද, බත් අනුභව කරනවිට සතර පස් ආලොපයකට අවකාශ ඇති කල්හි පැන් බීමෙන් දිවි රැකෙන කල්හි පමණ සවභාව දැන වැළඳීමෙන් යෙදී හොජනයෙහි පමණ දන්නාහටද, අශුභ භාවනාවෙහි ඇලුම් ඇති කල්‍යාණ මිත්‍ර සෙවනය ඇත්තාහටද, හිඳීම සිටීම ආදි හැම තන්හි දශ අශුභ නිශ්‍රිත සප්පාය කථා ඇත්තාහටද, කාමවිතර්කය පහව දුරුවන්නේයි.

හෙද ඡ ධම්මා කාමවිතක්කස්ස පහානාය සංවත්තන්තීති යනාදීන් කාමවිතර්කයාගේ දුරුකිරීම ද අතීත් මාගියෙන් ලෝවිජිතනව නැසීමද බුදුන් විසින්ම වදරණ ලදි.

ව්‍යාපාදය තෙම ක්‍රොධයෙන් ගැටීමට නිසි නිමිති අරමුණු වූ සිතෙහි විපත්ඨිස ගතිය වේ. අයොනිසෝ මනසිකාරයයි කියනලද අනුවණින් යෙදී සැලකීම බහුලවීමෙන් යමෙක් යෙදුනේ ද ඔහුට නූපන්ව්‍යාපාදයාගේ ඉපදීමද උපන්ව්‍යාපාදයාගේ බාහුල්‍යභාවයද වන්නේය. එසේ උපදනා වෙෂය, පටිඝය යන මෙතෙක් නම් ඇති ක්‍රොධයාගේ සිත වහා හිඳීම වෙන්වීම මෙත්සිත් පැහිරීමෙන් හා නුවණින් යෙදී ආදීනව කාරණ සැලකිමෙනුදු වන්නේය. එහි මෛත්‍රිය නම් සියල්ලන් කෙරෙහි මෛත්‍රිය වඩා කරණ භාවනාව උපචාර අර්පණා වශයෙන් ම සිත එකඟව සමාධියට පැමිණ වෙෂය කෙරෙන් සිත හිඳීම ම මෙහි කියනලදි. මෙසේවූ මෛත්‍රිය ම එහි බොහෝකොට පවත්නාහු කෙරෙන් ව්‍යාපාදය පහවන්නේ වෙයි.

අභාවූද කාරණා සයකින් වෙෂය දුරුවෙයි. හේ කෙසේද? යත්—උද්දිස්ස, අනොදිස්ස, දිසාඵරණයයි කියන ලද යම් සත්වකොටසකුන් නියමකොටගෙණ "ඔහු නිදුක් නිරෝගි වේව" යි යනාදීන් මෙත් කිරීමය. එසේම නියම නොකොට සමාන්‍යයෙන්

මෙත් කිරීමය. දිශාභාග වශයෙන් මෙත් කිරීමය යන ආකාරයන් අතුරෙන් එක්තරා මෛත්‍රී භාවනාවක් උපන්නාහට තෝ එසේවූ භාවනා කරන්නාහට හෝ වෙශය පහවේයි. යම්කු කෙරෙහි පවත්නා ක්‍රෝධය බලවත් වේනම් මෙසේ තෙමේ ම තමාහට අවවාද කරණුයේ "තෝ මොහුට කිපී කුමක් කරන්නෙහිද? ඔහුගේ ශීලාදි ගුණධර්ම නසන්ට හැකිද? තෝ තාගේ කර්මයෙන් සිට අවුත් තමාගේ කර්මයෙන් යන්නෙහි නොවේ ද? අනික්‌කෘත්‌වට කිපීම තම ගිනි අඟුරු දිලිහෙන යවට අසුවි යන ආදිය ගෙණ අනික්‌කෘත්‌වට පහරදීම සමාන වේ" ය යි සිතාද මෙසේ තමාසිත උපන් ක්‍රෝධය නවතාගත යුතු, "මෙතෙමේ ද තට කිපී කුමක් කෙරේද? තාගේ ශීලාදි ගුණධර්ම නසන්ට ඕනට හැකිද? තමාගේ කර්මයෙන් ම අවුත් සිට තමාගේ කර්මයෙන්ම යන්නේය. අනික්‌කෘත්‌වට ක්‍රෝධකිරීම තම රජස් මිටක් ගෙණ උඩු සුළඟට දැම්මක් වැන්න. එහෙයින් ක්‍රෝධය ඔහුගේ මස්‌සකයෙහිම හෙන්නේය" යි කියා මෙසේ අනුන්ගේ පූජි කම් බල සිහිකරන්නාහට ද කියනලද ක්‍රම යෙන්ම තමාගේද අනුන්ගේද යන දෙපක්‍ෂයෙහි ම කර්මබල සිහි කරන්නාහට ද මෛත්‍රී භාවනාවෙන් යෙදී වසන කල්‍යාණ මිත්‍ර සෙවනය ඇත්තාහට ද, හැම තැන්හි ම මෛත්‍රී නිස්‍රිත සැප කථා ඇත්තාහටද, ඒ නපුරුවූ වෙශය මැඩ පැවැත්වීම් වශයෙන් පහවීම හා අනාගාමී මාර්ගයට පැමිණීම තෙක ම එම වෙශය නැවත නූපදනා සේ මූලොච්ඡින්න ව කැසිම වන්නේයයි වදුරණලදී.

පිතර්‌ම්බය තෙමේ උකටලි බවය, කය අලස බවය කය නොනැමෙන බවය, හත්ත සමද නම්වූ හොජ්ජ ඕර්ජාය හොජ්ජපරිළාහය සිත හැඟවෙන සභාවය යනාදි කාරණ හෙතු කොටගෙණ චිත්තයාගේ අනුවණින් යෙදීමෙන් උපදනේය. එසේ උපදනා පිතර්‌ම්බය නම්වූ චිත්ත චෛතසිකයන්ගේ අකර්‌ම්‌ණ්‍යතාවන් අරමුණුවල නුවණින් යෙදී සිත පිහිටුවා ලීමෙහි දුබ්‌බල අනුභව කිරීමෙහි පමණ නොදන **ආහාර හත්ථක, තත්‍රවට්ටක, අලංසාටක, කාකමාසක, ගුත්තවමිත්තක** බඹුණන්සේ පමණ නොදන බත් අනුභව නොකොට දිවි පවත්නා සේ පමණ සලකා වළඳන්නාහටද, යම් ඉරියව්වකින් කල යවන කල පිතර්‌ම්බය පැමිණියේ වී නම් එයින් අනික් ඉරියව්ව කට කය පෙරළා පමුණුවන්නාහට ද, රාත්‍රියෙහි චන්‍ද්‍රාලෝක ප්‍රදීපාලෝකය හා දහවල් සූර්‍යාලෝක සිහිකරන්නා හටද,

අඛ්‍යවකාශයෙහි වසන්නාහටද, පිනමිඬ දුරුකිරීමෙහි නියුක්ත කල්‍යාණ මිත්‍රසෙවනය ඇත්තාහටද, සථාන නිෂද්‍යාදි ඒ ඒ තන්හි ධ්‍යානාඞ්ග නිශ්‍රිතසත්ප්‍රාය කථා ඇත්තාහටද, තදඞ්ග විෂ්කම්භණ ප්‍රහාණ විසින් පිනමිඬ දුරුවීම හා අර්හත් මාගීයෙන් මූලොච්ඡිත්ත්‍ව දුරුවීම ද වන්නේය යි වදරණලදී.

උඛවකුක්කුව්වය සිත සන්සිදීමක් නැතිකල්හි අනුවණින් යෙදී සැලකීම බහුලවීමෙන් උපදනේය. එසේ සිත නො සන්හුන් කමින් හා අනුවණින් සැලකීමෙන් උපදනා උඛවකුක්කුව්වය, සමාධි භාවනායෙන් සිත එකඟකොට ගෙණ නුවණින් යෙදී සැලකීමෙනු දු එක් නිකායක් හෝ, දෙකක් හෝ තුණක් හෝ සතරක් හෝ පස්නිකාය ම හෝ පාලි වශයෙන්ද, අර්ථ වශයෙන්ද, උගන්නාහටද, කැප අකැප ද බෙහෝ විචාරීම් ඇත්තාහටද, විනය සවභාවයෙහි පුරුදුවීම, වශීකෘත භාවනා යෙහි ප්‍රකෘතිඥත ඇත්තාහටද, වැනි මහලු සථවිරයන්වහන්සේ ලා කරා පැමිණෙන්නාහට ද උපාලි සථවිරයන් වැනි විනයධර කල්‍යාණ මිත්‍රයන් සෙවනය කරන්නාහටද සථාන නිෂද්‍යාදියෙහි කැප අකැප නිශ්‍රිත සත්ප්‍රාය කථා ඇත්තාහටද, උඛවකුක්කුව්ව නම් නීවරණය පහවීම හා අනාගාමි මාගීයට පැමිණීමෙන් මූලොච්ඡින්න ව නැසීම ද වන්නේය යි වදරණලදී.

විචිකිච්ඡා තොමෝ කුශලාදි ධර්මයන් කෙරෙහි ඇති දෝ හෝ නැති දෝ හෝ යනාදි වශයෙන් කුකුස් කොව අනුවණින් යෙදී සැලකීම බොහෝ වූවාහට උපදනේය. එසේ උපදනා විචිකිච්ඡාව කුශලාදි සඞ්ගීයන්ගේ ඇති සවභාව නුවණින් යෙදී සිහි කිරීමෙනුදු යට කියනලද ක්‍රමයෙන් බහුශ්‍රැත වීමෙනුදු තුණුරුවන් අරබයා බොහෝ ගුණ විශෂ විචාරා ඇසීමෙනුදු, විනය ධර්මයෙහි සවභාව පුරුදුවීමෙනුදු, ත්‍රිවිධරත්නයෙහි ඔකප්පනීය ශ්‍රද්ධායෙහි කියනලද අධිමොක්ෂ බහුලතායෙනුදු ශ්‍රද්ධාධික කල්‍යාණ මිත්‍රයන් සෙවනයෙනුදු, සථාන නිෂද්‍යාදි හැම තන්හි තුණුරුවන් ගුණමිශ්‍රවූ සත්ප්‍රාය කථායෙනුදු, විචිකිච්ඡාව සිතෙන් පහවීම වේ. සෝවාන් මාගීයට පැමිණීමෙන් මූලොච්ඡින්නව නැසීම ද වන්නේය යි බුදුන් විසින් වදරණලදී.

එහෙයින් එම්බා පින්වත් නුවණැති සත්පුරුෂ ජනයෙනි! මෙසේ දෙව් බඹ මිනිස්සැප හා නිවන් සැප ලැබීමට හිසි කාරණාවූ පින්කම් කිරීමට අවකාශ නොදී බාධාකරණ කාමච්ඡන්දාදි මේ පඤ්චනීවරණ අකුශල ධර්මයන්ගේ සවභාව රූප ඒ ඒ නීව

රණයන්ගේ ඉපදීමද දුරුවීමටද සහායව සිටී සියලු කාරණයන් මෙහි ප්‍රකාශ ක්‍රමයෙන් දැන ඇඳින ජීවිතාරක්ෂාව කැමති යන් විසින් හරණ සොරවිෂ සර්පාදීන්ගේ අහිතසෙවනයන් කෙරෙන් දුරුව දිවි රක්නවුන් සෙවුනා හිත වූ බෙහෙත් ආදිය සේ, හිතවූ කාරණා සෙවීමෙන් යෙදී වණ්ඩවූ ව්‍යාඝ්‍රාදීන්ගේ ආකුල හය සහිතවූ මාගියක්මෙන් මේ පඤ්ච නීවරණ අකුශල ධර්ම යෙහු දුර දුරුවිය යුත්තාහුයි.

ලෝවැඩ පිණිස කරණලද මේ **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයෙහි** මෙතෙකින් **පඤ්චනීවරණ අකුශල ධර්මයන්ගේ සවරූප කථාව** දක්වන ලදී.

අකුශල මූල නම් කවරහ? යත් සත්වයන්ට වන සියලු දුකට කාරණවූ අපාය මාගියවූ සියලු අකුශල කර්ම පථ සිඳවීමට මුල්ව සිටී **ලෝභය, ද්වේෂය, මෝහය** යන පාප වෙත කායෝ තුන්දෙන ම අකුශල මූලයෝ නම් වෙත්.

හේ කෙසේ ද? යත්; "තීනි මානි භික්ඛවෙ අකුසල මූලානි, කතමානි? තීනි ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො අකුසල මූලං, ඉමානි ඛො භික්ඛවෙ තීනි අකුසල මූලානි" යි මේ සූත්‍රයෙන් අකුශල මූලයෝ මෙසේ ප්‍රකාශකොට බුදුන් විසින් වදුරණ ලදී.

එහි **ලෝභය** නම්, ඇසින් දක්නා රූපය කණින් අසන ශබ්දය, නාසයෙන් ඉඹින සුවඳය, දිවින් විඳිනා රසය කයින් ලබන ස්පර්ශය, සිතින් සලකන ධර්මයි කාරණයක යන මේ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් සදෙනාට ගොදුරුවූ රූපාදි ආරම්මණයන් සදෙනා යහපත්කොට සලකාගන්නා සවභාව ඇත්තේය. වදුරු ලඟවූවන්සේ එම අරමුණෙහි බලවත්වී සිත ඇලෙන සවභාව ඇත්තේය, හුණු කබලෙක බහාලූ ලේමුසුමස් ගඩුවක් සෙයින් නිරන්තරයෙන් දුරුනොකොට හැකි සවභාව ඇත්තේය. තෙල් මුසු දැලිසෙයින් සියලු සංස්කාරධර්මයන් කෙරෙහි ම ඇලීමෙන් ආසවාස උපදනා සවභාව ඇත්තේය.

මෙසේ සිත්හුගේ නොයෙක් අරමුණුවල ඇලීම ලක්ෂණවූ ලෝභය උපන් විගස ඊට නිසි භාවනා ආදීනව කාරණා සිහි කිරීමෙන් දුරු නොකළහොත් යම් යම් තැනෙක වස්නා විෂ ජලය මුහුදටම පැමිණෙන්නා සේ ඒ ලෝභ සමංගී පුද්ගලයා ද අපාය දුකට ම පත්වන්නේ වෙයි. එහෙයින් මාරපාසවූ එබදු ලෝභය ද මූලමූත්‍රෝ නුවණැත්තන් විසින් දුරින් ම දුරුකටයුතු.

මෙඝය නම් දණ්ඩෙන් ගැසූ නයෙකු කිපෙන්නාසේ තෙමේ කිපෙන සවභාව ඇත්තේ ය. ක්‍රොධයාගේ පැතිරෙණ සවභාව හා වණයක ගැසූ විඝයක් සෙයින් ඇතුළෙන් දවන සවභාව ඇත්තේය. රුක්සිදුරෙක පවත්නා ගිනිකඳක් වැන්න, ප්‍රමාද යක් බලා මරම් සි එක්ව ඇවිදිනා සතුරෙකු වැන්න කිසි සේත් නොගතයුතුවූ විෂමිශ්‍රවූ මූත්‍රයක් වැනිමය. එඛෙයින් නුවණැත්තන් එබඳු වෙඝයද දරුණු විෂඇති සපියන් සේ ලංවිය නොදී දුරුකටයුතුමැයි.

මෝහඝ නම්: තෙමේ සිත්හුගේ අඛිභාවයක් වැන්න. නුව ණැති සවභාව වළකන්නේ මැයි. ඒ ඒ අරමුණුවල ඇති සවභාව මුවහකොට යහපත්සේ හඟවයි. අඛිකාරයක් වැන්න. ඒ මූලා විමයයි කියනලද මෙඝය අනුවණින් යෙදී සිහිකිරීමෙන් ම උපදනේය.

එසේවූ මෙඝය කමාභාවයෙහි ඇලී පවත්නා ලොකයා විසින් නො සෙවිය යුතු අන්ධකාරය සේ නුවණැත්තන් විසින් පණ්ඩිත සෙවන ධම්ශ්‍රවණ නුවණින්යෙදී ඈලකිම ආදි කාරණා සෙවනයෙන් දුරුකටයුතු.

මොවුන් තුන්දෙනාට අකුශල කම් සිඩ විමට ලජ්ජා භය නැති කම් සමිප කාරණා වෙත්. එහි පාප කම් කිරීමෙහි ලජ්ජානැති බවයයි කියනලද අහිරිකය යන අකුශල ධම්ය නම් අපවිත්‍රයට කැත නොවවි. අනුභව කරණ ගංහූරෙකු සේ ද ගිනි දුටු ඉටි සේ ද කුකුල්පත් සේ ද හැකිලීමක් නොව එහි පැතිර ව්‍යාප්තව පවත් නාවූ සවභාවයෙකි.

පාපකම් කිරීමෙහි භයනැතිකම යයි කියනුදු අනොත්තප්ප අකුශලධම්ය නම් නොඃයක් දුක් දෙන දුශ්චරිත අකුශල ධම් කිරීමෙහි භයක් නැතිගැන්මක් නොව පාපෙහි නොබා වැටෙක පලඟැටියෙකුසේ භයක් නැතිව බුහුටිව පාපකම් කරණ සවභාව ඇත්තේය. යන මේ පාප ධම්ඃයෝ දෙදෙන මෙසේ සියලු පව් කිරීමට සමිපකාරණා වන්නාහුයි.

යම් සත්ත්වකෙනෙකුගේ සිත්හි ලොභාදි පාපචෙතසාවක් ඉපිද පාපයෙහි ලජ්ජා භය නැතිවීමෙන්ම ඔහට ඒ පාපඝ සිඩවන්නේය. යමක් හට පව් සිඩ නොවන්නේ විනම් හෙද අමුතු කාරණයක් නොවෙයි. ලජ්ජා භය දෙදෙනාගේ සමිපකාරණයමය. එහෙයින් මිලිදු පැන ආදි නොඃයක් තැන පව් ලංවිය නොදෙන වැද්ද නොදෙන අවියෙන් උස්පවුරට හා ගැඹුරු අගලට උපමාකොට ලජ්ජා භය දෙදෙනා දක්වන ලදහුයි. එසේ

සියලු වැඩට කාරණවූ ඉෂ්ටමිත්‍රයන් වැනි ලජ්ජා භය දෙදෙනාගේ සේවනයෙන් යෙදී සියලු අවැඩට කාරණවූ දුෂ්ට අමිත්‍රයන් වැනි අහිරිකය අනොත්තප්පය යි කියනලද ලජ්ජා භය නැතිවීමෙන් දුරුව වැඩ කැමැති ත්‍රුවණැති සත්පුරුෂ ජනයන් විසින් අත්වැඩ පරවැඩ සැදියයුතු.

මෙසේ සියලු පව් කිරීමට මූල්ව සිටි ලොභාදි අකුශලමූලයන් හා පව් කිරීමට සමීප කාරණාවූ අකුශලධර්මයන් දෙදෙනාගේ සවරූප දක්වා දෙවිමිනිසුන් සහිත ලොකයාට කරුණලද උතුම් සබ්මාත්‍රුශාසනය ඇති හෙයින් ධර්ධවජවූ මාගේ බුදුරජාතන් වහන්සේ ශාස්තෘ නම් වනසේක.

ලෝවැඩ පිණිස කරුණලද මේ ශ්‍රී සබ්මාවවාද සංග්‍රහයෙහි මෙතෙකින් අකුශලමූලයන් හා අකුශලයට ආසන්න කාරණවූ පාපධර්මයන්ගේ සවරූප දක්වා නිමවනලදී.

තවද සෙසු ක්‍රොධ උපනාහ ආදී අකුශලධර්ම නම් කවරහ? යත්; හේ මෙසේ දතයුතු. ක්‍රොධය, උපනාහය, මක්ඛය, පලාසය, ඉස්සාය, මච්ඡරියය, මායාය, සාඨෙය්‍යය, ථම්භය, සාරම්භය, මානය, අතිමානය, මදය, පමාදය, තණ්හාය, විපරිතමනසිකාරය, දුශ්චරිතය, චතුර්විධ විපය්‍යාසය, චතුරාශ්‍රවය, සතරතණ්හුපාදාන, පඤ්චවෙතොඛිලය, ත්‍රිවිධාදමූලය, සත්තානුසය, අර්ධමිශ්‍රත්තය, නවතණ්හාමූලය, අශීශත තණ්හාවය යන මොහු අකුශලධර්මයෝ නම් වෙත්.

උපනාහ නම් වෛර බැඳීමය, **මක්ඛ** නම් කෙළෙහිගුණ නො දැනීමය, **පලාස** නම් මහතුන්ට සරිය යි සිතීමය, **ඉස්සා** නම් ඇති ගුණ ඇති ඓශ්වර්‍යය ඇති ත්‍රුවණ ආදිවූ දෙය නැතිකොට කීමය, **මච්ඡරිය** නම් තමාගේ සියලු ඓශ්වර්‍යය වෙන කෙනෙකුන්ට නො වේව යි සිතීමය, **මායා** නම් කළ වරද සැඟවීම්ය. **සාඨෙය්‍ය** නම් නැති ගුණ ඇති දෙයක් මෙන් ඇඟවීමය, **ථම්භ** නම් නගුලිස ගිලි පිඹුරෙකු මෙන් උතුම් තැන්වලට නො නැමෙන සවභාවය, **සාරම්භ** නම් යම් කෙනෙකුන් එකක් කීකල මම දෙකක් කියමි කරමි යි කීමය, **මාන** නම් සියල්ලන්ට වැඩිතරම් යි සිතීමය, **මද** නම් ඓශ්වර්‍යවිද්‍ය ආදියෙන් මත්වීමය, **පමාද** නම් කළමනා කිවමනා දෙයෙහි සිහි නැතිවීමය, **තණ්හා** නම් ලුණු පැන් බීපු එකෙකුට පිපාස බොහෝ වන්නාක් මෙන් ආසාව මහත් වීමය, **විපරිතමනසිකාර** නම් සැබවින් ම ඇති මේ දෙතිස් කුණප කොඩාසය පිළිකුල් කටයුතු කුණුකොටස්ය යි නො සිතා

සත්ත්‍ව පුරුෂයා සි වරදවා සිතාගැන්මය, **දුශ්චරිත** නම් කයින් සිඹ වන ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යන පවි තුන ද, වචන යෙන් සිඹවන මුසාවාද පිසුනාවාච පරුෂාවාච සම්ඵප්‍රලාප යන පවි සතර ද, සිතින් සිඹවන අභිද්‍ය නම්වූ අනුන්ගේ වස්තුව උන්ට කුමට ද මවය සි සිතීමය. **ව්‍යාපාද** නම්වූ අනුන් නසන්ට සිතීමය. මිථ්‍යාදෘෂ්ටි නම්වූ මෙලොව නැත, පරලොව නැත, කම් නැත, කම්පල නැත, දෙවියෝ නැත, බුදුහු නැත යනාදීන් සිතන්නාවූ මිථ්‍යාදෘෂ්ටියය යන මේ කාය දුශ්චරිත, වචී දුශ්චරිත, මනෝ දුශ්චරිත යන තුන් දුශ්චරිතයය.

චතුර්විධවිපර්‍යාස නම්, සියල්ල නැසෙන අනිත්‍යයට නිත්‍යය නොං නැසෙයි සිතා ගැන්මය. අපවිත්‍ර ශරීරයට පවිත්‍රය සි සිතා ගැන්මය, සියලු දුකඛයට සැපය සි සිතා ගැන්මය, මමය යන දෙයක් නැති නාමරූපයට මමය මගේය සි සිතා ගැන්මය යන මේසි.

චතුරාශ්‍රව නම්, කාමාශ්‍රවය, භවාශ්‍රවය, දෘෂ්ට්‍යාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය යන මොහු සි. ආත්ම ආත්මියාදි ග්‍රහණ වශයෙන් පැතිර පවත්නා හෙයින් ද මදකරණාදියෙන් ආශව සදෘශ බව හෙයින් ද ඒ කාමාදීහු ආසව නම් වන්නාහුය සි දතයුතු.

එහි කාමරාගය ම කාමාශ්‍රවය සි. රූපාරූප භවයන්හි පවත්නා ඡන්දරාගය භවාශ්‍රවය සි දෙසැවමසදිටු ම දෘෂ්ට්‍යාශ්‍රවය සි දුඃඛාදි අවතැන්හි නොං දැනීම අවිද්‍යාශ්‍රවය සි.

සතරතණ්හුප්පාද නම්, සිවුරු පිඬු විහාරාදියට ආස්වාදය, ගිහිව වසන්නවුන්ගේ වස්ත්‍රාභරණයෙහි ආසාවය, ග්‍රාමක්ෂේත්‍රාදියෙහි ආසාවය, දිව්‍යලෝක බ්‍රහ්මලෝක ආදිවූ හැම තැන්වල උපදිනු ආසාවය යන මොහු සතර තණ්හුප්පාද නම් වෙත්.

පඤ්චවෙතොඛිල නම්, පළමු බුදුවරයෝ ඇද්ද නැද්ද සි සැක සිතීමය, ධර්ම කෙරෙහි සැක සිතීමය, සෝවාන් සෙදගැමි අනගැමි රහතුන්වහන්සේ ඇද්ද නැද්ද සි සැක සිතීමය, ශීල භාවනා ප්‍රඥ යන මේ තුණින් නිවන් සිඹවිදේ හෝ නොං වේදේ හෝ සි සැක සිතීමය, සඬ්ඝයාවහන්සේ කෙරෙහි කෝප සිතීමය යන මොහු පඤ්චවෙතොඛිල නම් වෙති.

විවාදයට මුල් ඝය නම්, ක්‍රෝධය, කෙළෙහි ගුණ නොං දන්මය, ගහපත අගහපත කොට් කීමය, නැති ගුණ ඇති කොට ඇඟවීමය; බොහෝ කැමතිවීමය, සිතාගත්දේ ම එකක් කොට සිතා අතනැරීමය යන මොහු විවාද මුල් ඝය නම් වෙති.

කාමාසවානුසය නම්, කාම ආසාවය, තද කෝපය, තද මිථ්‍යා දෘෂ්ටිය, තද සැකය, දෙවෙනි කෙනෙක උපදින්ට ආසාවය, මම උතුම් යන මානය, තදවූ නොදැන්මය යන මොහු සිතෙහි වැද ගන්නා අනුසය යන නම් වෙති.

අඤ්ඤවිමුඤ්ඤන නම්, මිථ්‍යාදෘෂ්ටිය ද, ගිහිගෙයි ඇල්ම ද, අනුන්ට විනාශ වේවා යි සිතීම ද, අනුන්ට නිග්‍රහ කරමි යි සිතීම ද, බොරු කීම ද, කේලාම් කීම ද, රළුබස් කීම ද, වැඩ කෙනිබස් කීම ද යන මේ මිථ්‍යා සිතිවිලි හා වාචා සතර ද, මිථ්‍යාකම්මන්ත කම්වූ කයින් සිදුවන පව්තුණ කිරීම ද අධර්මයෙන් ජීවත්වීම ද යන මිථ්‍යාජීවය ද, නුපන් පාපයන් උපදවන්වත් උපන් පාපයන් වර්ධනය කරන්වත් නුපන් කුසල් නුපදුවන්වත් උපන් කුසල් නැතිකරන්වත් උත්සාහ කිරීමය යන මේ මිථ්‍යා ව්‍යායාමය ද, වැඩ කැමති දෙය සිතෙහි තබා ඉදීම ද, පරසමය ඇත්තන්ගේ භාවනාකිරීම ද යන මොහු **අඤ්ඤවිමුඤ්ඤන** නම් වෙති.

තණ්හාමූල් භවය නම්, ආසාවෙන් වස්තු සෙවීමය, ඒ වස්තු සොයා ලැබගැන්මය, ඒ ලත් ලාභය නිසා විනිශ්චයක් පැමිණීමය, විනිශ්චය නිසා ආලය ඇතිවීමය, ඒ ආලය මුල් ව මේ මාගේය යි සිතා තද වශයෙන් සිතාගැනීමය, ඒ එසේ සිතා තමාට කොට ගැනීමය, තමා සන්තක කොට ගත් කල මේ ලාභය වෙන කෙනෙකුට නො වේව යි සිතීමය; ඒ එසේ සිතා රැකවල් කිරීමය, ඒ රැකවල් මුල්ව දඩු මුගුරු ගැනීමය යන මොහු භවය තණ්හා මූල නම් වෙති.

එක්ඛියඅටක් තණ්හාව නම්, යහපත් රූපයට ආසාවය, යහපත් ශබ්දයට ආසාවය, එසේ සුවඳට ආසාවය, රසයට ආසාවය, ස්පර්ශයට ආසාවය, සිතින් සිතූ දෙයට ආසාවය යන මේ ආසා සයෙකි. ඒ සය ම කාමසැප වශයෙන් සයෙක, ශාස්වතදෘෂ්ටි වශයෙන් සයෙක, නාස්තිකදෘෂ්ටි වශයෙන් සයෙක්ද යි තෘෂ්ණා දහඅටකි. එය තමාගේ රූපාදියට දහඅටකි, බාහිර රූපාදියට දහඅටකි. මේ විධියෙන් තිස්හයකි. ඒ තිස්හය අවකාශ කාලයට තිස්හයක, පවතින කාලයට තිස්හයක, මතු එන කාලයට තිස්හයෙක යන මේ හැම ඇතුළු ව එක්සිය අටක් පමණ ප්‍රභෙද ඇති තණ්හාව ද අකුශලධර්මයෝ නම් වන්නාහුය.

මේ ක්‍රෝධාදී සියලු පාපධර්මයෝ නම් තමන්ගේ ස්වරූපයෙන් ම අකුශල නම් වෙති. ඔවුන්ගේ ම එක්වීමෙන් සිඳුවන යම්

යම් කෙනෙකුත් ඇද්ද, ඒ සියලු කෙනෝත් අපායමාර්ගවූ අකුශල කර්ම නම් වෙත්. එහෙයින් හිත බෙහෙත් සෙවනයෙන් උපන් රෝග සන්සිඳුවන්නා සේ ඇඟපත් කල්‍යාණපණ්ඩිත සෙවනයෙන් හා ධර්මශ්‍රවණයෙන් යෝනිසෝමනස්කාරාදියෙන් යෙදී ගිය උපදනා නොයෙක් ආදීනව ඇති ඒ ක්‍රෝධාදී පාපධර්මයන් කෙරෙන් දුරු ව සියලු වැඩට සමර්ථයට කාරණවූ උතුම් ගුණධර්ම පිරිමෙහි නුවණැති සත්පුරුෂජනයන් විසින් අප්‍රමාද ව උත්සාහ කටයුතුයි.

යම්කිසි සත්වයෙකුත් ක්‍රෝධාදි පාපධර්මයන්ගේ ආදීනව නො සලකා සත්වයන් කෙරෙහි නො සතුටු ව ඔවුන්ට හත්ත පාදදියෙන් හෝ ඛග්ග කුන්ත දඩුමුගුරු කැට කැබිලිති ආදියෙන් හෝ තළා වෙහෙසා දුක් දුන්නාහු වී නම් ඔහු මිය එ පවින් අපායදුක් අනුභව කොට මිනිස් අත්බවක් ලද කල විරූප ව දුර්ණ්‍ය ව රූ නැති ව අනුන් විසින් දක්නට පවා අප්‍රිය වන්නේය. යම් සත්ව කෙනෙක් අනුන් ලබන ලාභයෙහි අනුන් කරණ සත්කාරයෙහි ගරුකාරයෙහි, මානනයෙහි, වන්දනයෙහි පූජායෙහි ඉවසිය නො හී ඔවුන් කළ පින්කමින් ඒ හැම ලබනලද්දු හි ක්ෂමා නො කොට ඊර්ෂ්‍යා කළේ වී නම් ඒ පවින් අපායදුක් අනුභව කොට මිනිස්අත් බවක් ලද කල ආනුභාව නැති වෙයි, අප්‍රසිද්ධ වෙයි. හැමදෙනා විසින් ගර්හාකරන්නට නිසිවේ. යම් සත්වකෙනෙක් තම තමන්ගේ ශක්තිභොග පමණකින් දන් නො දී තමාගේ ආත්මය පොෂ්‍ය කිරීම ම පෙරදැරි ව මසුරුකමින් යෙදී වාසය කෙරෙද්ද ඒ පාප බලයෙන් අපායදුක් අනුභව කොට මිනිසත්බවට පැමිණි කල සම්පත් නැති වෙයි.

ඉතා දිළිඳු ව අනුන් ආශ්‍රය කොට ජීවත්වේ. සීලවන්ත ගුණ වන්ත තැන් කෙරෙහි කැදිමහිල් බැ බුහුනන් කෙරෙහි සරු නැති ව අගෞරව අවනඩු කළාහු වැන්දයුත්තන් නො වැඳ හුනස් නෙන් නැඟමකාවුන් දැක හුන් තැනින් නැඟි නො සිටීම ද, මඟින් පහවූවමනා තැන් දැක මඟින් පහ නො වේ ද, හිඳිනා ආසන සලසා දුනමනා තැන්වලට හිඳිනා අසුන් සලසා නො දී බහුමාන කළයුත්තන්ට බහුමාන නො කොට ගෞරව කළමනාවුන්ට ගෞරව නො කොට පිදියයුත්තන්ට නො පුදු අනාදර කළාහු ඒ පාපකර්මයෙන් අපායදුක් විඳ මිනිස්අත්බව උපදනා කල වණ්ඩාලාදි නීචකුලයෙහි උපන්නාහු යි බුදුන් විසින් දේශනාකරවදරණලද උතුම් නෛයර්‍යාණික ධර්මයවූ පරිද්දෙන් පින් පව් නෝරා බණ කියන පණ්ඩිතයින් කරා එළඹ වහන්ස, කුසල් නම් කවරේ ද? අකුසල් නම් කවරේ ද? ඍවද්‍ය කිම? කුමක් සෙවියයුතු ද? කුමක්

කළකල බොහෝ කලකට අහිතයට දුකඛයට කාරණා වේද කුමක් කළකල බොහෝකලකට හිත සැප පිණිස වේදැයි යනාදි ක්‍රමයෙන් නොවිචාරීමෙන් එසේ විචාරි මෙහි ආදර නොකිරීමෙන් විචාරා සම්‍යක්ප්‍රතිපත්තියෙහි නොපැවත්මෙන් හෙතෙම අපායෙහි දුක් අනුභවනොට මිනිස් අත්බව උපන් කල අඛිව කටයුතු නො දැනීමෙන් යෙදී නුවණැති වේ. කම්මං සත්තෙ විභජති යනාදින් චූලකම්මවිභඞ්ග සූත්‍රාදියෙහි දෙශනාකර වදළක්‍රමයෙන් සියලු කම්විභාගය අසා දතයුතු සි.

මෙසේ සියලු පාපධර්මයන්ගේ සවරූප හා ඒ ඒ අකුශල කර්මයන්ගේ ආදීනව දක්වා දෙවිමිනිසුන් සහිත ලොකයාහට කරණලද සබ්ර්මාත්‍රශාසනා ඇති හෙයින් ධර්මධවජවූ මාගේ බුදු රජ ශාස්තෘනම් වනසේක.

දෙවඅකඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදනතං දමථතානං පුරිසාජඤ්ඤ තෙ නමෝ සි

තවද සත්වයන් විසින් කරණලද කුශලා කුශල කර්මයෝ සූත්‍ර පිටකයෙහි එකාලෝස් ප්‍රභෙදයක්වන්නාහුයි, එහි සූත්‍රානතිකපර්‍යා යෙන් දැක්වූ එකොලොස්කර්ම කවරහ? යත් ඒ මෙසේ දතයුතු.

දෘෂ්ටධර්මවෙදය කර්මය උපපද්‍යවෙදය කර්මය අපරාපර්‍යවෙදය කර්මය ගරුකකර්මය ඉදිබහුලකර්මය යදුසන්නකර්මය කෘත කර්ම යෙන් උපස්ථම්භකකර්මය උපපීඩකකර්මය උපඝාතක කර්මය යන එකොලොස් ප්‍රභෙදයක් වන්නාහුයි.

එහි දෘෂ්ටධර්මවෙදය අකුශලකර්මය නම් කෙසේද?-නුවණින් ආවර්ජනාකලමනාප්‍රත්‍යයන්ගේ සන්තිරණසඞ්ඛ්‍යාත නියමකිරීමෙන් උපදනා ගුණමධ්‍යවූව විඳ ඉන්මෙහි එක්වූ ශ්‍රද්ධාසහිත කුශල පක්ෂයෙහිවූ ජවනවිත්තය නම් වෙයි, ආශලෝකයට ප්‍රතිපක්ෂව සිටි අඛ්කාරය සේ ඇත්තාවූ යම්පත් ගුණය තමාගේ විත්තයට නියෝග කොට දුනෙමින් සිටියදීම නුවණැතිකම පෙරදුරිකොට සැලකීමෙන් දක්වනලද යම්පත් කුශලජවනවිත්තයට විපරිතව පවත්නා අවිද්‍යාසම්ප්‍රයුක්ත අශ්‍රද්ධාසහිත අකුශලජවනවිත්තය නම් වේ.

මේ ජවනයන් අතුරෙන් ලද්දාවූ ආවර්ජනාප්‍රත්‍යය ඇති යම් ජවනයෙක් බබාහෝසේ සත්වරෙක එකජවනවීථියෙහි දිවේද, හෙවත් පවතීද, ඔවුන් ප්‍රඥාලඞ්ඝණවූ ප්‍රථ ජවනවිත්තය ශ්‍රද්ධාව හා එක්ව ඵල්ලසිවි ඇසිල්ලෙහි ඉපදුනු කර්මයෙක් ඇද්ද, ඒ කර්මය දෘෂ්ට ධර්මවෙදය කුශලකර්ම නම් වෙයි, අවිද්‍යාවයෙන් කියනලද අඥානය එක්ව ඵල්ල සිවි ප්‍රථම ජවනවිත්තය කෙලශවාසනාවූ ක්ෂණයෙහි ඉපදුනාවූ කර්මය දෘෂ්ටධර්මවෙදය අකුශලකර්මය නම් වේ.

මේ දුෂ්ටධර්මවෙදෑ කුශලාකුශලකර්ම දෙකම එම ආත්ම යෙහි විපාක දෙන්නාහුයි, එහි විපාක නුදුන්නේ විනම්, ඒ කර්ම අභාවකර්ම බවට යෙ, මෙපරිදිදෙන් පැවැත්තාවූ ජවනයන්ගේ සන්තන ජවන්විත්තය උපපද්‍යවෙදෑ කර්මය නම් වේ, ප්‍රථම ජවන යට හා සන්තතජවනයට අතර උපදනා ජවන්හු පස්දෙන අපරා පර්‍යායවෙදෑකම් නම් වේ, මෙයින් දුෂ්ටධර්මවෙදෑකර්මය ප්‍රවෘත්ති වෘයෙන් විපාකදීම මිස අමූතූතැනක උපදවා විපාකදෙන සවභා වක් නැති හෙයින් ඉහාත්මයෙහිම විපාක නුදුන්නේ වී නම්, මත්තෙහි කිසිකලකත් විපාක නොදෙන්නේමය, ඇස් පීමක් නැති බැදපු බිජුවට මෙන් විපාක ඇතිබවට පැමිණෙන්නේයි, එහෙයින් අභාවකර්ම නම් වේ.

මෙසේ කුශලාකුශලදෙක්හිම සාධාරණවූ දුෂ්ටධර්මවෙදෑ කර්මයෙහි අකුශලපක්‍ෂයෙහි විඤ්ඤාණවිභාය සුප්‍රබුද්ධශාක්‍යය දෙවදත්තය කොකාලිකය කතමොඩතිසය නාදයක්‍ෂයයි යන මොවුන්ට දුන්නාවූ විපාකමෙන් අකුශලවිපාක දෙන්නේයයි දත යුතුයි.

උපපද්‍යවෙදෑකර්මය නම් කවරහ? යත්-ඔත්වන ජවනවෙතනා වෙන් උපදනාකර්මය උපපද්‍යවෙදෑකර්ම නම් වේ, ඒ උපපද්‍යවෙදෑ යහි කියනලද දෙවනජාතියෙහි උපදවා ඵලදියයුතුවූ ඒ කර්මය කළ සවියාහට මේ ආත්මභාවයෙන් වුතව ගියකාල මීට දෙවනුව උපන්ජාතියෙහිම විපාකදෙන්නේය, එසේවූ පඨාතතරිය කර්මයෝ අකුශලපක්‍ෂයෙහි උපපද්‍යවෙදෑකර්ම නම්, ඉදින් කිසි පාපිවූ පුරුෂයෙක් මාතෘඝාතකකර්මයද පිතෘඝාතකකර්මයද අර හතතඝාතකකර්මයද ලොහිතුප්පාදකකර්මයද සංඝභෙද කර්මය දැයි යන මේ ආනතරිය කර්ම පසම කෙළේද, හෙතෙම නියත ගතිකර්ම කළහෙයින් එම ආත්මභාවයෙන් වුතව දෙවනජාතියෙහි එකතතනයෙන් නරකයෙහි ඉපිද කල්පයක් මුළුල්ලෙහි මහදුක් විඳි නේය, ඒ දෙවන ජාතියේ විඳසුතු අකුශලවිපාකයන් ඇතිබොහෝ කර්මයන් ඔහු විසින් කරණ ලද්දාහු වී නමුදු ඒ ආනතරිය කර්ම පසින් නරකයෙහි ඉපිද එක ආනතරිය කර්මයක් විපාක දුන් කල්හි තුන්වන ජාතියෙහි ඉපිද විඳසුතු පාපකර්ම සවභාවක් ඒ අනතරිය කර්මයන් කෙරෙහි නැතිහෙයින්සෙසු ආනතරිය කර්මයෝ සතරදෙන එහිම අනතරීත වී නමුත් එසා එක ආනතර රියකර්මයකට වෙන වෙනම විපාකදෙන්ට වෙන වෙනම ඉපදීමක් නැති හෙයින් ඔවුන්ගේ විපාකදීමද නොඇති වන්නාහුය, මේ එම කර්මස්වභාවයය දතයුතු, එහෙයින් මේ උපපද්‍යවෙදෑකර්මයද දෙවන ජාතියෙහි මෙසේ කිසියම් කාරණයකින් විපාකදීගත නුහු නුයේ විනම් මත්තෙහි කවරකලකත් විපාක නොදෙන බැවින් අභාවකර්ම නම් වේ. විපාක දීමක් නැති හෙයින් අහොසිකර්ම නමැති කියාද වේ.

යම්සේ වැද්දෙක් මුවදඹයට ගොස් නිරන්තරයෙන් මුවන් හැසිරෙන තැනක තමා සැඟවී හිඳ දණුඹ දුනුපිට ලාගෙණ සිටි කල්හි අභිමුඛයට පැමිණිමුවෙකු දැක ඇද නැතිව බලා දුන්න ඇද මිදිසාරය ඉදින්ශබ්දවරදීම වැදුනේ විනම් ඒ මුවා ඒ සථානයෙහිම

වැටෙන්නේය, ඒ විදිසැරය වැරදීගියේ වී නම් ඒ මුවාද හයින් තැතිගෙණ මහාවනාන්තරයෙහි වැදීයාම මිස වැද්දාගේ ඒ හීසැර යට ලංනොවන්නේය ඒ වැදිතෙම් කෙතෙක් ප්‍රයෝගකලේ වී තමුත් භයගෙණ දිවපු මෘගයා ඔහුට අසුකොට ගත නොහෙන් සේ ය.

එසේ මේ ලොවම දක්නා දුශ්චරිතවිපාකකර්මය හා දෙවන වර ඉපිද විඳදියුතු උපපද්‍යකර්මයාගේ විපාක නොහැරදීම් ඒ කර්ම විපාකදීම් කී ලෙසම වූයේ වීනම් ඒ සැරය නොවැරදීම් වැදුනාක් මෙහි, එසේ නොවූයේ වීනම් වැරදිගිය හීය නැවත ඒ මුවා කරා නොඑන්නාසේ ඒ කර්මයද ඒ සත්ත්වයා කරා නොහොස් විපාකනැති වන බව මේ උපමායෙන් දතයුතු, මේ උපපද්‍යවේදනීය කර්මලක්ෂණය යි.

වෙදනීයඤ්ච පාපජ්ජං පරියොසානමීරිතං,
පරිනිට්ඨිත කම්මත්තා විපච්චති අනන්තරෙ

මේ ආකාරයෙන් දුශ්චරිතවිපාක දෘෂ්ටධර්මවේදනීය කර්මයට නියමවූ පළමුවන ජවනචිත්තය හා උපපද්‍යවේදනීයකර්මයට නියමවූ සත්වන ජවන චිත්තය යන සිත් දෙක හැර ඒ අතර සිටි දෙවෙනි සිත පටන් සවස සිත දක්වා එක්ව ඒ සිත් හා උපදනා ජවන චිත්තයෝ පස් දෙනම අපරාපරවේදනීයකර්මයෝ නම් වෙත්.

ඒ පස්ජවනචිත්තයන් කෙරෙහි උපදනා අපරාපරවේදනීය කර්මය නම් කවරහි? යත් අපරාපරවේදනීයකර්මය කළාවූ සත්වයන්ට ඒ කර්මඵල එම ජාතිය ඊට දෙවන ජාතිය තුන් සතර පස් දස වැනි සියක් වැනි දහසක් ලක්ෂයක් වැනිද එසින් මත්තෙහිදු අසවල් වැනි ජාතියෙහි විපාක දෙයි යන නියමයක් නැත්තේය, ඒ අපරාපරවේදනීයකර්මය කළාවූ සත්වයෝ නිවන් නොදක්නා තෙක්ම මේ අනාදි අවකාශ දුටු සම්සිටක ඒ කර්මඵල විපාකය දෙන්නේමය, ඔහු නිවන් නොදුන සසර සිටිනා තාක් කල් මුළුල්ලෙහි දුන් දුන් යයි කියා අවකාශ බලා විපාක දෙන්ටම නියමව සිටීම මුත් අභාවකර්ම නොවන්නේමය.

ඒ කෙසේදැයි කිවහොත්? මුවවැද්දෙක් සුනඛයෙකු ගෙණ දඩයමට ගියේ මුවෙකු දැක සුනඛයාට පෙන්වා නියොගකළ කල්හි ඒ සුනඛතෙම සමානවතුප්පදිකයා සෙයින් පසුපස්සෙහි නොහැරම දන්ගණිමිසි දුන් ගණිමිසිසිතා ලුහුබදවා දුවන්නේඅවසරයක් ලත් විටම අල්වාමිස ;තුරෙහි අලසව නොසිටින්නේය, එපරිද්දෙන්ම අපරාපරවේදනීයකර්මය කම්විපාකයක් නොනැසී මතුවිපාකදෙන්ට තිබෙනපරිදි නම්, කිසිවෙක් තමා උපයාගත් ධනාදියක් කොටුවෙක්හි රැස්කොට තබාලා පමණක් ගෙණ ප්‍රයෝජන විදිමින් අඹුතුව අඹුතුව උපස්ථානාදිය කොටුවෙහිම රැස්කෙරේද, මදක් ප්‍රයෝජනයට ගෙණ බොහෝව උපයා රැස්කරණබවින් කොටුවෙහිලු විපිරුණුවනාම නිබේද, එමෙන් අපරාපරවේදනීය කුශලාකුශලකර්මයෝ

ද සමහරක් විපාක දුනත් බොහෝසේ කොටුවෙහි රැස්කළඛාන්‍යය මෙන් මතුමත්තෙහිත් ලදලද අවකාශයන විපාක දෙන්නම සිවියා හුය, එසේවූ ඒ අපරාපර්‍යවේදනීයකර්මයන්කෙරෙන් මිදුනු එකද සත්‍වයෙක් මේලොකයෙහි නැත්තේය.

සෙසානි වෙදනීයානි පරියායෙ පරෙ පහං,
ලබාසෙවනතෝ පාහං ජනෙති සහිපථවියෙ--සී

මේ අපරාපර්‍යවේදනීයකර්මලක්‍ෂණයයි.

ගුරුකර්මය නම් කවරහයත්?—යම් කිසිවක්හු විසින් කරණලද්දාවූ කුශලාකුශලයන්ට වඩා අකුශලකර්මය අධිකතරව ගුරුව තිබේද, අකුශලකර්මයට වඩා කුසලකර්මය හෝ අධිකතරව ගුරුව තිබේද, ඒ ගුරුකර්ම නම් වේ.

ඒ වන්හි කුශලපක්‍ෂයෙහි ධාතුසහිතවූ දහඅට්ඨ බැඳීම ආදිවූ මහාඝීකුශලයක් යමෙක් කොටගෙණ කුරුඹුහුඹුන් ආදීවූ ක්‍ෂුද්‍ර ප්‍රාණියක්හු ජීවිතෙන්ද්‍රියෙන් තොරකෙරේද, අකුශලපක්‍ෂයෙහි යමෙක් පඨාණනන්තරිකර්මය කොට අශුබවෙතනාවකින් සුතඛාදි තිරිසන්කුලයට ආහාර ආලොපඅඹයක් දුන්නේවේද මෙහින් මහාඝී වූ කුශලය දියමුදුනෙහි තුබූ මුතු ඇටයක් පමණ වීනමුත් අකුරෙක් හෝ යගුලියක් හෝ දියපිට ඉල්පෙන්ට නොහැකිව ඇතුලෙහිම ගැලේද, එපරිද්දෙන්ම කුශලය පෙරහෙයින් එම පළමුව විපාක දෙන්නේය, අකුශලපක්‍ෂයෙහිදු පඨාණන්තරියකර්මය ගරුතර හෙයින් පළමුව විපාකදෙන්නේයි, මේ ගත්ගරුකර්මලක්‍ෂණයයි.

ඝද්ධබහුලකර්මය නම් කවරහයත්?--යමෙකු විසින් කරණ ලද කුශලාකුශලකර්මදෙකින් යම් කර්මයක් බොහෝසේකරණලද, ඒ කර්මය ඝද්ධබහුලකර්ම නම් වේ.

හෙද වන්හි බොහෝකාලයක් ලද අවකාශයෙන් ආසෙවිත භාවිත බහුලීකෘතවශයෙන් වන්නේය. යමෙක් කුශලකර්මයෙහි බලවත්වූ සතුටු සන්තොෂ උපදවාද, අකුශලකර්මයෙහි බලවත්වූ සොක සන්තාප උපදවාද මේද ගත්බහුල කර්ම නමැයි දතයුතු.

සමසේ මල්ලවයෝ දෙදෙනෙක් යුඛහුමඝකට බැස යුඛකරණ කල්හි එසින් බලවත් එකෙක් දුර්ලඝ්‍ය හෙලා නික්මේද, එපරිද්දෙන්ම දුර්ලඝකර්මය මැඛපවත්වාගෙණ සෙවනසතුටු ආදිවශයෙන් බොහෝවූ කර්මය ඝද්ධබහුල වශයෙන් විපාකදෙන්නේයි, මේ ඝද්ධබහුල කර්මලක්‍ෂණයයි.

ඝදූසනන්‍යායමය නම් කවරහයත්?-යම්හේ ලදරුසඳවයෙක් කුශල්අකුශල් යන කර්මදෙක කෙළේද, එයින් ඔහුට **මරණාසන්** නයෙහි අකුශලයෙක් සිහිවිනම් අපාය දුකටම පැමිණන්නේයි, කුශලයෙක් සිහිවිනම් දෙවිලොව ඉපිද දිව්‍යසම්පත් ලබන්නේය.

යම්සේ ලදරු මහලු ආදිවූ බොහෝ ගවයන් යම් ගවපාලයෙක් සවස රැස්කොට ගෙණවුත් ගාලෙහිලා ඉදිදොර දඹුලම්නි රැකවල් කොට ගොස් උදෑසන අවුත් ගවයන් තණබිමට හරිණපිණිස ගාලේ දොරවූව ඉදිහැර දැමූකල්හි එහි පුරාමසිටි ගවයන්ගෙන් බල වත් වෘෂභරාජයන් ඇතත් ඉදිකඩට ලංව සිටි මහලුගවයෙක් හෝ ලදරු වස්සෙක් හෝ බලසම්පන්න වෘෂභයෙක් හෝ සිටියේ වී තම් ඉදිදොරසම්පව සිටි එකා පිටත්ව ගියකල සෙසුගවයන්ට නික්ම යන්ට අවකාශ පෙණෙන්නේය, එපරිදිදෙන්ම සත්‍යයා විසින් කරණලද කුශල් අකුශල් කොපමණක් ඇතත් **මරණාසන්නයෙහි** සිත එල්බිම්වශයෙන් පැමිණිසිටියාවූ නිමිත්තට ආසන්නව සිටියාවූ කුශල කර්මයක් හෝ අකුශල කර්මයක් හෝ පළමුව විපාක දුක් කල්හි මාගීඵලයට නොපැණියොත් සෙසු කුශලාකුශලකර්ම යෝද විපාක දෙන්නාහුයි.

එහි කුශලා කුශලකර්මයෙන් **මරණාසන්නයෙහි** සිහිවන පරිදි කෙසේද?යත් –යමෙක් බඹලොවට ගතිනියතවූ මහත් පින් කමක් හෝ නරකයට ගතිනියතවූ ආනන්තරියකර්මයක් හෝ කෙළේවේද, ඔහුගේ ගති නියතමය, එසේ නොකොට සිටි යම් කිසිවෙක් **මරණාසන්නයෙහි** තමාගේ ඇතිතාක් වස්තුයෙහි ලොභ උපදවා, "මේ වස්තුව අනුන්ට නොවේවයි, අහෝ මම මෙයින් මිදී මිය පරලොව යෙමි"යි යනාදිවශයෙන් ඇතිපමණ ඇතිපමණ සම්පත නිසා ලොභාදි නොයෙක් පාපවෙතනාවන් සිතිමෙනුදු "කුසල් නොකෙළෙමියි අකුශල් කෙළෙමියි පළමුකළ තාක් අකුසල් සඳහන් කොට පශ්චාත්තාපයට පැමිණෙන හෙයි හිඳු, වැන්දයුතු පිදියයුතු තුණුරුවන් විනා සෙසු දෙවතාදීන්ට හක්නි උපදවා මට සරණය පිහිටයයි සලකා වැඳීම්පිදීම් ආදිය කිරීමෙනුදු මිථ්‍යාදෘෂ්ටි ගැන්මෙනුහුදු, තමහට උපස්ථාන මෙහෙ කරන්නාවුන් විශයෙහිද ආහාරපානවශී වස්ත්‍රාසනාසන හිලාන ප්‍රත්‍යය ආදීන් උපකාර කරන්නාහ. නොකරන්නන් විශයෙහිද, තමා අයිතිවූතාක් වස්තුව නොකැමැත්තෙන් නුදුන්සේ ගන්නා වුන් කෙරෙහිද, නොසතුටුව වෛරඋපදිමෙනුදු, අඹුදරු ආදීන් කෙරෙහි බලවත් ලොභ ඉපදවීමෙනුදු, යනාදි විසින් **මරණාසන්නයෙහි** කලතාක් අකුශලකර්ම ආසන්නවයේ, පිළිසිඳ විපාක

දෙන්නේ අකුශලපක්ෂයෙහි ආසන්නකර්ම නම්, මෙසේ මරණ මඤ්චකයෙහි හෙව පරලෝ පිහිටට නිසිඋතුම් කුෂල්දහම් ශක්ති ඇතිදුපටන් තමා පුරුදු නොකළ බැවින් හෝ ලොභාදිනොයෙක් අකුසලධර්මයන්ම පුරුදුවූ බැවින් කිසිසේත් පිහිටක් නොලැබ එහිදු අනුවණින්ම යෙදි නොයෙක් පව්වුසිහිවිලි මෙසේ සිතන්නා හට නැවත නැවත ත් අකුසල් වඩනේය, ඒ කෙසේද? යත්-

සවස්වේලෙහි මහත්පඬිතයෙහි ඡායාව පොළොව පැහිර ගෙණ ක්‍රමක්‍රමයෙන් ඉතා මහත්ව පවත්නේද, එසේම අනුවණින් යෙදි සිහිකිරීම ආදි නොයෙක් සිහිවිලි සිතනනුවණමද බාලයන්ට අකුසල්ම වඩනේයයි දතයුතු, මේ අකුශල ආසන්න නමිතම්.

කුසල්කිරීමෙහි යෙදි වාසය කළ නුවණැතිපණ්ඩිතපුරුෂතෙම මරණාසන්න කාලයෙහි නුවණින් යෙදි සිහිකරන්නේමය, ඒ කෙසේද? යත්--යමෙක් මරණාසන්නයෙහි කියනලද ප්‍රකාර මහත් ගරුතරකම් හෝ ආසන්නපාපකම් හෝ නොකළහෙයින් ඔහුගේ සිත එල්බ නොසිටියහොත් තමාබාලකාලයෙහි පටන් සතතයෙන් කිරීමෙන් අභ්‍යාසකරණලද දැනමයවූ පින්කමක් හෝ සීලමයවූ පින්කමක් හෝ තවගුණසිහිකිරීම් ආදි භාවනාමයවූ පින් කමක් හෝ ඇත්නම්, නිරන්තරයෙන් අභ්‍යාසකළහෙයින් මරණ කාලයෙහිද සැපසේම සඳහන්වනහෙයින් එසේ කළ කුසල් සිහි කිරීමෙනුදු, තමාසන්තකව තුබුනාක් සියලුම්වස්තුයෙහි ලොභ නූපදවා සතුටු සිතින් තුනුරුවන් පිදීමෙනුදු, එතනට පැමිණි සහනවද යාවකඤ්ච සතුටුසිතින්ම දන්දීමෙනුදු ඤාතිආදීන් විසින් ඔවුන්ගේ මරණයට පළමුකොට සතුටුවන පිණිස වඩාහිඳුවූ පිළිමරු දැක බුදු ගුණසිහිකරමින් යෙදීමෙනුදු, එසේම කියනලද දහම්ගුණසිහිකිරීමෙන් හා එසේම වඩා හිදුවා ඛණකියන සඞ්ඝගුණ සිහිකිරීම්ආදි වශයෙනුදු, වෙෂවෙර ඇතිනාක් දෙනාකෙරෙහි වෛර හැර ක්ෂමා කිරීමෙනුදු, ආහාරපානවගිවස්ත්‍රශයනාවල් මල් සුවඳවිලවුන් සෙය්‍යාවන් ආසන ලැගුම්ගෙවල් ප්‍රදීප ආභරණ ධන ධාන්‍යාදි දියයුතුදැනවසතු ශ්‍රද්ධාසිතින්ම කම්ඵල සිතින් අදහා ලද පමණකින් දන් දීමෙනුදු, සුවඳදුම්පහන් ආදියෙන් තුනුරුවන් පිදි මෙනුදු, ප්‍රසන්නවූ සිතින්ම තුන්සරණ ගැන්මෙනුදු, පන්සිල් අටසිල් දසසිල්ආදිය සමාදන්වීමෙනුදු, තමාකළපින් අනුන්ට දීමෙනුදු, අනුන් කළපින් අනුමෝදන්වීමෙනුදු, නිවන්මග දෙන බුදුන්දෙසූ උතුම් දහම් ඇසීමෙනුදු, තුනුරුවන්ගුණ සිහිකිරීමෙනුදු, මෛත්‍රී කරුණාමුදිතාදිවූ භාවනා සිහිකිරීමෙනුදු, තිස්දෙකක්පමණ කුණු කොටස් එක්වූ මේ ශරීරය පිළිකුල්සේ නුවණැසින්

දැකිමෙනුදු මේ ආත්මය ස්ථිර නොවනසේ සියලු දුක්පිඩක්සේ වසහ නොවනසේ සිහිකිරිමෙනුදු, යනාදිවිසින් මෙසේ මරණාසන්නකාලයෙහි කල්‍යාණමිත්‍රසහායකයින් හෝ තුමූම හෝ සිහි එළවා කළතාක් කුශලකම්යෝ මියයනජාතියට සම්පවූ ආසන්න භවයෙහි පිළිසිඳ ගන්වා ඒ ඒ ජාතිවල විපාකදේනුයි ආසන්න කුශලකම්නම්.

මෙසේ මරණාවසානයෙහි වැදහෙවද නුවණින් යෙදී සිහිකරණ පණ්ඩිතජනයන්ට කුසල් වඩනාපරිදි කෙසේදයත්? — සවස් වේලෙහි මහත් පර්වතයෙහි ශ්‍රායාව පෘථිවියෙහි පැතිරෙමින් යම් සේ වඩිද, එසේම නුවණින් යෙදී පුළුයෙහි කළතාක් කුශල් හා එතැන්හිදු කළඹනාතාක් පින්කම් සිහිකොට එහි යෙදෙන පණ්ඩිතජනයාට බොහෝ කුශල් වඩන්නේයයි දතයුතු, මෙහි සෙයින් ආසන්නකුශලකම්ය වන්නේය, මේ යදාසන්නකුශලා කුශලකම්ලක්ෂණයි.

කාතක්ඛාත්කම්ය නම් කවරහ? යත්: මෙහි කම්යන් හෙරෙන් වෙන්ව සිටි නො දන්ම වශයෙන් කළා වූ කම්ය කාතක්ඛාත් කම් නම් වේ. ඒ කම්ය චිනාහි යම් සේ කුශලයෙහි හෝ අකුශලයෙහි හෝ පැමිණි විපාක දෙන කල කිසියම් උන්මත්තපුරුෂයෙක් දුනුගිගෙණ තමා උමතු හෙයින් නොපමණ වත් ඇද නොතනක කුමකට කුමක් පිණිසවත් විදිනා බවක් නො සලකා හිශරය හරනේද, ඒ ශරය ගොස් හැදීමෙන් හෝ ලකිණ් හෝ ඇද නොව බැලීමෙන් හෝ යන මේ කිසිදෙයකිනුත් ගරුභාවයක් නැතිව නියම නොව ශරය පැමිණේ ද, එසේ කාතක්ඛාත්කම් විපාකය ද නියම නොව ගුරුභාවයක් නැතිව ලද යම් තැනෙක්හි අසාරව විපාක දෙන්නේය. අඥාන භාවයෙන් යෙදී නො දන අසාර වශයෙන් වික්ෂිප්ත වූ සිතින් කළා වූ කුශලා කුශල කම්යෝ එපරිද්දෙන් අගරුව විපාක දෙන්නාහුයි. මේ කාතක්ඛාත්කම් ලක්ෂණයි.

ජනකකම්ය නම් කවරහ? යත්: යම් කිසිවක්හු කුශලයක් කළ කල ඒ කළාවූ කුශලානුභාවයෙන් පිරිසිදු වූ ක්ෂත්‍රියවංශයක පිළිසිඳ දෙමින් යහපත් ලෙස ගැබ පෙළහැර ලැබ උපන් කල්හි දු සත්කාර ලැබ එතැන් පටන් මත්තෙහි ජනකකම්යෙන් උපන් එම ආත්මය පැවැත්වීමට අනික් කම්විපාකයෙක් පැමිණ වැඩෙනු යේ ආහාර වස්ත්‍ර සයනාසනාදි වූ ඓශ්වර්‍ය්‍ය ලැබගත නොහි අපර පක්ෂයෙහි සඳමඬලක් සේ ක්‍රමයෙන් අඩු අඩුව අවුත් දුකසේ ජීවත් වන්නේය. මේ ජනකකම් කුශල ප්‍රතිසන්ධිය නම් වේ.

යම් සත්වයෙක් අකුශලයක් කොට එයින් තමා දුකඛිත කුලයක හෝ හීනකුලයක හෝ දුෂ්‍යකා කුස හෝ පිළිසිඳ ගෙණ ඔවුන් නිරන්තරයෙන් වැඩ මෙහෙවර කිරීමෙහි ව්‍යාවෘත වන කල්හි තැලි වැලි බොහෝ වෙහෙස විඳ ඔවුන් කෑකබොන වේලාවට කෑබොන දෙයක් නොලැබ ක්ෂුධාවෙන් පීඩිත වන කල්හි එයිනුදු වෙහෙස විඳ මවුකුසින් බිහිවන කල එයට නිසි ගෙවල ආදි වූ සැපතෙක් කිසියම් උපකරණයක් නොලදින් පැමිණි කිසියම් තැනක දී ඉපිද සැපවූ තෙල් කිරි ආදි හොජ්ජාදියත් සුදුසු ලෙස නොලැබ දුකඛ ජීවිතයෙන් වඩිනය වෙමින් මව්පියන්ගෙන් ලබන්ට වෙන කිසිවක් නැතත් එයින් මතු ජීවිත පැවැත්මෙහි අනික් කම්ඵලයක් පැමිණ පූර්වජන්මයෙහි සඳමඬලක් සේ වස්ත්‍රාභරණ අන්නපානාදි සියල්ල ලදින් රාජාමාත්‍යාදීන් සිත් ගෙණ වාසය කොට සිත් ගෙණ නැන් තනතුරු ලැබ උපභොග පරිභොග සම්පත් දැසිදස් ගවමහිෂාදි වූ ඓශ්වර්‍යය ම ක්‍රමයෙන් වඩවඩා ලැබගෙණ සැපසේ ජීවත් වන්නේය. මේ ජනකකම් අකුශල ප්‍රතිසන්ධි නම් වේ. මේ ජනක කුශලාකුශල ප්‍රතිසන්ධි ලක්ෂණයි.

උපසම්පාදකකම්ම නම් කවරහ? යත්: යම් කිසිවෙක් ප්‍රසන්න චිත්තයෙන් කුශලයක් කොට එයින් සුගතියෙහි ඉපිද ඒ කුශල කම්මයෙන් උපදනා නොයෙක් ඉසුරු විඳ ඒ ජාතික්ෂයව නැසීගිය කල්හි ජාතියෙහි සිට කොටගත් කුශල කම්මයකින් හෝ අපරාපර්‍යායවේදනීය කුශල කම්මයකින් හෝ දුර්ලභ ව වැඩෙන ගෙඟකට දිරාගිය වැඹක් හැර අළුතු දෙන වැඹක් සේ පූර්වයෙහි කරණලද කුශල කම්මයෙක් උපසම්පාදව සුගතියෙහි ප්‍රතිසන්ධි දෙමින් සඟී සැප විඳුවන්නේය. මෙසේ නොයෙක් ලක්ෂගණන් හවුරුදු දිව්‍ය මනුෂ්‍යලෝක දෙක්හි ඉපිද සුගතියෙන් සුගතියට සැරිසරා ඇවිද දුගතියකට නොපැමිණ දිව්‍ය මනුෂ්‍යලෝක දෙක්හි ම උපදවනුයේ පළමුවෙන් කළාවූ කුශල කම්මයට ආධාර වූවාක් මෙන් සුගතියෙහි ම ඒ ඒ ජාතිවල පිළිසිඳ ගැන්මට උපකාරව දුගතියකට යා නොදී සැප දෙනුයේ මේ කුශලය උපසම්පාදක කම් නම්. මේ කුශලාකුශල උපසම්පාදකකම් ලක්ෂණයි.

උපපීඩකකම්ම නම් කවරහ? යත්: පෙර තමා කළ කුශලාකුශල කම්මයකින් පිළිසිඳ ගත් කල ආත්මය එහි පැවැත්වීමෙහි උපන් දුක් සැප දෙකට එසේම පෙර කළ කුශල් අකුශල් දෙකෙන් එකක් උදව් පිඬු කරමින් කලක් පවත්වන්නට නොදී

බාධා කිරීමය. එහි කුශල කර්මය ම විපාක දෙන කල අකුශල කර්මයෙක් කුශල කර්මය පෙරළා උපපීඩිතව ඔහු විපාක දීමට කුශලයට අවකාශ නො දෙයි. අකුශල කර්ම විපාක දෙන්ට වන් කල්හි කුශල කර්මයෙන් අකුශල කර්මය පෙළා පීඩා කොට විපාක දීමට අවකාශ නො දෙන්නේය.

යම් සේ වැඩෙන වෘක්ෂලතාදියක් ශස්ත්‍රාදියෙන් ඡේදනාදියෙන් කළ කල මනා කොට නො වැඩෙන්නා සේ කුශල විපාකය දෙන කල වෙන්ව එයට ම අවකාශ නො දී අකුශලයෙන් පීඩිත වෙයි. අකුශල විපාකය දෙනකල එයට ම අවකාශ නො දී කුශලයෙන් පීඩිත වෙයි. එහි විභාග ඥානකෘත්‍යයාගේ අකුශල කර්මය පීඩිතවූ ක්‍රමයද, චොරඝාතකයාගේ කුශල කර්මය පීඩිතවූ ක්‍රමයද බලා දතයුතු. මේ උපපීඩකභාවී ලක්ෂණයි.

උපඝාතකකර්මය නම් කවරහ? යත්: කුශල කර්මයෙහි බලද අකුශලේ කර්මයෙහි බලද සමානව සිටි කල්හි මදක් එක් කර්මයක් දුර්වල වීනම් ඒ කර්මය මැඩපවත්වා ගෙණ දුර්වල කර්ම විපාකය දුරු කොට එයට අවකාශ නො දී තමාගේ විපාකය ම දෙන්නේය. එසින් සුගතියෙහි උපදවා කුශල කර්මය විපාක දෙන කල්හි එහි සැප වින්ද නො දී අකුශලකර්මයෙක් යොමුව කුශලකර්මය නසා තමාගේ විපාකය දෙන්නේය. දුගතියට පමුණුවා අකුශල විපාක දෙන කල්හි එක් කුශලකර්මයෙක් ඵල්බ ගිය ඒ අකුශලකර්මය සිද තමාගේ විපාක දෙන්නේය. මේ උපඝාතක කර්ම ලක්ෂණයි. මෙය ම උපචෙඡ්දක කර්මය කියාද කියත්. බොහෝ ආයු ඇති වෙන්ට හිසි කර්මයෙන් උපන්නාහට ද මේ උපචෙඡ්දක කර්මය පැමිණියේ වී නම් ආයුෂය එවිට සිදුවන්නේය. ඒ කුමක් මෙන් ද?

යම් සේ පුරුෂයෙක් අට ඉස්බක් තැන් නික්මෙන වෙග දක්වා සැරයක් විදි ද, ඒ සැරය ඔහුගෙන් පිටත් වූ ක්ෂණයෙහි ම අන් පුරුෂයෙක් එතැන්හි සිට මුගුරකින් ගසා සැරය එතැන්හි ම හෙලා ද, එපරිද්දෙන් ම බොහෝ ආයු ඇතිවෙන්ට හිසි කර්මයෙන් උපන්නහුගේ ආයුෂය උපචෙඡ්දක කර්මය පැමිණ සිද විනාශ කරන්නේය. මේ උපචෙඡ්දක කර්ම ලක්ෂණයි.

මෙසේ දක්වන ලද්දා වූ කර්ම එකොළොසින් දෙවෙනි ව කී උපපඤ්චවේදනීය කර්මයන් හා තුන්වැනි ව කී අපරාපරියවේදනීය කර්මය යන මේ දෙකින් සඞ්ගය ඒ ඒ තැන පිළිගිද. ගන්ථකර්තෘන් ඒ ඒ ප්‍රාති පාඨයන්හි නිසි විපාකයන් දෙන්නේය. පළමුවෙන් කී දෘෂ්ටධර්ම වේදනීය කර්මයෙන් ප්‍රවෘත්ති විපාකය දීම මිස ජාති පිළිසිඳ ගැන්වීමෙක් කරන්ට නො හැකි වන්නේය. රහතුන් වහන්සේ වනාහි උපපඤ්චවේදනීය කර්මය ද අපරාපරියවේදනීය කර්මය දූ සියයන මේ කර්මයෝ දෙදෙන ම කර්මයන් ක්ෂය කරන්නා වූ අර්හත් මාර්ගයෙන් ම නසන ලද්දාහු ම වෙති. දෘෂ්ට ධර්ම වේදනීය කර්මයක් ඇත්තේ වී නම් ඒ

කර්මය තෙම රහත් බවට පැමිණියා වූ උත්තමයාගෙන් වහන්සේලාට ද විපාක දෙන්නේමය යන මේ කාරණය දක්වනු පිණිස අරහත්තානං හි උපපජ්ජවෙදනීයව අපරාපරිය වෙදනීයවා නිඉමානි වෙකම්මානි කම්මභවයකරෙණ අරහත්තමග්ගඤාන සමුහනානි, දිඨධම්මවෙදනීයං අහොසි, තං අරහත්තපපත්තියා පි විපාකං දෙතියෙව-සි කී හෙයින් මෙහි ඇති අර්ථය ම සලකා දතයුතු, මෙසේ සුත්තපිටකෙසුහි එකොළොස් ප්‍රකාර කර්මයෝ විභාග කොට දක්වන ලද්දාහුයි.

මෙසේ සත්ත්වයන් විසින් කරණ ලද සියලු කර්මයෝ ම සූත්‍ර පිටකයෙහි දෘෂ්ටධර්මාදී වශයෙන් එකොළොස් ප්‍රභෙදයක් කොට සියලුම කුශලාකුශල කර්මවිභාග දක්වා දෙවි මිනිසුන් සහිත සියලු ලොකයා හට මෙසේ කරණ ලද අප්‍රමාණ වූ උතුම් සබ්බඤ්ඤුතා ඇති හෙයින් අනාවරණ ඥාන ඇති මාගේ බුදුරජාණන් වහන්සේ ශාස්තෘ නම් වනසේක.

මෙම සියලු කර්මයෝ ම අනිධර්මපර්‍යායෙන් භෞඛවිධ වූ පරිදි කෙසේද? යත්: පාප ලක්ෂණ වූ සියලු අකුශල කර්මයෝ ම ගති සම්පත්තිය උපධිසම්පත්තිය ප්‍රයොග සම්පත්තිය කාලසම්පත්තිය ගතිවිපත්තිය උපධිවිපත්තිය කාලවිපත්තිය ප්‍රයොග විපත්තිය කියා අටදෙනෙක් ද, කුශල ලක්ෂණ වූ කල්‍යාණකර්ම සමාදානයෝ ද ගතිවිපත්තිය උපධිවිපත්තිය කාලවිපත්තිය ප්‍රයොගවිපත්තිය ගතිසම්පත්තිය උපධිසම්පත්තිය කාලසම්පත්තිය ප්‍රයොගසම්පත්තිය කියා දක්වන ලද අට දෙනෙකු ඇතුළුව කර්මයෝ සොළොස් දෙනෙක් වෙති.

එහි විභාග කවරහ? යත්. දුක් අනුභව කිරීමට නිසි පාප කර්මයක් ඇති කල්හි ම සුගතියෙහි කිසිම කුශල බලයකින් යමෙක් උපදී ද, ඔහුගේ පාපකර්මය ගතිසම්පත්තින් බාධිතව ඔහට විපාක නො දෙන්නේය.

යමෙක් පාපකර්මයෙන් දුසිරුකගේ බඳ හෝ පිළිසිඳ ගෙණ රූපශ්‍රීන් යුක්තව උපධිසම්පන්නව වැඩිවිය පැමිණ සිටියේ ද එකල ඔහුගේ සාම්පුත්‍රතෙම රූපශ්‍රිය දැක ඔහට සතුටුව තමහට ජාත පුත්‍රයක්හු මෙන් සිතමින් සැපයෙන් වධිනය කොට භාණ්ඩාගාරික ස්ථානාන්තරාදිය කරවමින් එසට නිසි ලෙස පරිහරණය කෙරෙයි. මෙබඳු සත්ත්වයාගේ ඇත්තාවූ පාපකර්මය උපධිසම්පත්තින් බාධාව විපාක නො දෙන්නේය.

යමෙක් මනුෂ්‍යයන් කෙරෙහි සුලභ වූ ආහාරපාන වතිාදීන් ඇති කාලයෙහි ඉපිද ඔහුගේ පාපකර්මය කාලසම්පත්තින් බාධාව විපාක නො දෙන්නේය.

යමෙක් සම්‍යක්ප්‍රයෝග නිසා ජීවත්වෙයි. යම්කිහු සම්පත්ට ළඟඉන්ට සුදුසු කල්හි ළඟඉයි. ලංවන්ට නුසුදුසු කල්හි ඵලා

යහි. දුරු ගමනකට සුදුසු කල්හි නික්ම යෙයි. අත්ලස් දිමව නිසි කල අත්ලස් දෙයි. සුදුසු කලෙක සොරකම් කෙරෙයි. මෙබඳු වූ සත්වයාගේ ඇත්තා වූ පාපකර්මය ප්‍රයොග සම්පත්තියෙන් ශරීර විපාක නො දෙන්නේ ය.

සුගතියෙහි උපන්නාවූ සත්වයාගේ පාපකර්මය ගති විපත්තිය නිසා විපාක දෙන්නේය. යමෙක් දුසියක කුස පිළිසිඳ රූප ශ්‍රියක් නැතිව උපදී ද, ඒ පුරුෂයෙක් වී නම් ඇතුන් අසුන් ගව මහිෂ සුනඛාදීන් බලන සේ හෝ කෙලමලවහන් ආදිය තබනසේ හෝ බහු සලස්වයි. ස්ත්‍රියක් වී නම් ඇත් අස් සුනඛාදීන්ට බත් පිසන සේ නින්දිත වූ කර්මයක් සලස්වයි. මෙබඳු සත්වයාගේ පාපකර්මය උපධිවිපත්තිය පිණිස විපාක දෙන්නේය.

යමෙක් දුර්භික්ෂ කාලයෙහි හෝ පිරිහෙන්නා වූ සැප ඇති කාලයෙහි හෝ අන්තරාකල්පයෙහි කෙලවර මිනිසුන් කෙරෙහි හෝ උපදී ද, ඔහුගේ පාපකර්මය කාලවිපත්තිය නිසා විපාක දෙන්නේය.

යමෙක් කියනලද ක්‍රමයෙන් ප්‍රයොග යොදන සේ නො දනිද එළඹීම නො එළඹීම අත්ලස්දීම සොරකම් ආදී කර්මඵලවලට නිසි නිසි වූ කාලයෙහි ඒ හැම කරන්ට නො දනී ද, ඔහුගේ පාප කර්මය ප්‍රයොග විපත්තිය නිසා විපාක දෙන්නේය. මේ අනියතා ලම්බණ අෂ්ටකයයි.

යමෙක් ඉහවූ යහපත් සැප අනුභවයට නිසි කුශලකර්මයක් ඇති කල්හි ම ගොස් දුගතියෙහි ඉපිද ඔහුගේ කුශලකර්මය ගති විපත්තින් බාධිතව විපාක නො දෙන්නේය.

යමෙක් කුශල බලයෙන් රාජරාජමහාමාත්‍යාදි වූ ලොක ප්‍රසිඬ කුලයෙක්හි ඉපිද අඳ ගොළු බිහිරි කොරපිළිලි ආදි වූ ඉන්ද්‍රිය විකලත්වයකට පැමිණි කල්හි ඔහට සඛකිය වංශානුරූප වූ තරම් සුදුසු රජයුව රජසෙනෙවිරත්හාණ්ඩාගාරිකාදි වූ ඨානාන්තර යකට නො පමුණුවයි. ඔහට ඒ කුශලය උපධිවිපත්තින් බාධාව විපාක නොදේ.

යමෙක් බත් නැති කාලයෙහි ද සම්පත්තිඃයවන කාලයෙහි ද, අන්තරාකල්පයන්හි සත්වයන් කෙරෙහි ද උපන්නේ වී නම් ඔහුගේ කුශලකර්මය කාලවිපත්තියෙන් බාධාව විපාක නොදේ.

යමෙක් කුශලකර්මයෙන් සුගතිභවයෙහි උපන්නේ ද ඔහට ඒ කුශලය ගතිසම්පත්තිය නිසා විපාක දෙන්නේය. රාජරාජ මහාමාත්‍යාදි කුලයෙහි ඉපිද උපධිසම්පත්තියට පැමිණියේ ද එසේ රූපශ්‍රීන් ආත්මසම්භාවයට පැමිණියෙකු දැක මොහුට රජ සුවරජ සෙනෙවිරත් ආදී වූ උතුම් තනතුරු සුදුසුය'' යි කියා පමුණුවයි. මෙබඳු සත්වයාගේ කුශලකර්මය උපධිසම්පත්තිය පිණිස විපාක දෙන්නේය. යමෙක් සුදුසු කාලයෙහි තනතුරු වලට පැමිණ ධනවන්ත මන්ත්‍රීවරුන් කරා ගොස් සිත් ගෙණ

මධුර වචනයන් කියා සෙවනය කොට සිට ඒ මන්ත්‍රීවරු කිපි කිසිවක්හට වඩ කිරීම් ආදියක් යොදන කල්හි තෙමේ ඔහු ඇස නො පෙණීම ඉවත්ව යේ ද ඒ මන්ත්‍රීන් සත්වයන්ට ආපදාවී ඇත් පැමිණි කල්හි ගෙදරට ගමට රටවත් නො පෙණීම අන්‍ය රටවාට හෝ අනික් දෙශයාට හෝ පලායේ ද සොරකමට සුදුසු තැන සොරකම් කොට වසතු රුස් කොරේ ද ඒ හැම වසතු තමා කෙරෙන් පැහැර ගැන්මක් පැමිණි කල්හි මියුරු වචන හා ශාවිසඳ කිරීමෙන අත්ලස් දීමෙන් වසතුවට හානියක් විය නො දේද, තෙමේ සැප සේ ජීවත්වේද, මෙසේ ඒ ඒ ප්‍රස්තාවෙහි ප්‍රයොග සුදුසුලෙස යෙදීමෙහි සමර්ථවේද, ඔහුගේ කුශලකර්මය ප්‍රයොග සම්පත්තිය පිණිස විපාක දෙන්නේය.

සත්වයන්ගේ සියලු කාමයෝ මේ අභිධම්මපශ්‍යනයෙන් දැක්වූ සොළොස් ප්‍රකාර කාමලක්ෂණය නිමි.

මෙසේ අභිධම්මපශ්‍යනයෙහුදු අහුත්තකාමාදි දෙළොස් ප්‍රකාරවූ ප්‍රතිසම්භිදාමාතිපශ්‍යනයෙහුදු සියලු කාමවිභාග දක්වා දෙවි මිනිසුන් සහිත ලොකාගාට කරණලද උතුම් සද්ධර්මානුශාසනා ඇති හෙයින් කාම්ප්‍රභෙදදීපශයෙන් අනෙක ප්‍රකාරවූ දෙශනා විලාස ඇති මාගේ බුදුරජ යාණන් නම් වනසේනා, එහෙයින් කියනලදී—

දෙවයකඛමනුසසානං ලොකෙ අග්ගඵලංදදං,
දදංනානං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ —යි.

මෙතෙකින් මේ ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි සතර අපායදුක් ආදි සියලු දුකට පැමිණීමට කාරණාවූ එහෙයින්ම අපායමාර්ගවූ අකුශලකර්ම විභාගාදීනව දක්වා නිමවන ලදී. මෙසේ අෂ්ටම පරිච්ඡේදයෙන් ප්‍රාණඝාතාදී අකුශලකර්මපථ විභාගාදීනව ප්‍රකාශ කිරීමෙන් ලෝවැඩ දක්වා තදනන්තරව එම අකුශලකර්මඵලභූම් වූ නරකය තිරිසන් අපාය ප්‍රෙත අපාය අසුර අපාය යන සතර අපායන්ගේ සවරූප මදක් මෙහි දක්වනු ලැබේ. එහි නරකය නම්—

සඤ්ජීවෝ කාලසුත්තොව සඞ්ඝාතෝ වෙව රොරුවා,
තාපනෝ ව පතාපො ව මහාවීචි අථාපරෝ,
ඉච්චෙතෙ අට්ඨනිරයා මහාදොරා භයානකා- යි.

යනුහෙයින් සඤ්ජීවය කාලසූත්‍රය සංඝාතය රෞරවය මහා රෞරවය තාපය ප්‍රතාපය අවීචිය යන මොහු දොරවූ භයානක මහත් දුක් ඇති අටමහනරකයෝ නම් වන්නාහුයි.

එහි පළමුවන නරකය කඩකඩකොට ගමපලුන් විසින් සිදින ලද්දාවූ නැවත නැවත කර්මබලයෙන් ජීවිත නැති නොවන හෙයින් සංජීව නම් විය ගිනිගෙණ දිලිහෙන කළුහුගගසා සතරැස් අටස් සොළොස් කොට මහත් කුළුපමණ ගිනිගෙණ දිලිහෙන වැයෙන් සස්නාලද සතුන් ඇතිනරකය කාලසූත්‍ර නම්විය.

අයොමය පර්වතයෙන් සතුන් සුන්සුන්කොට මිරිකෙන නරකය සංඝාත නරක නමියි, කියේද? යත්--ඒ නරකයෙහි සත්වයෝ නව යොදුන් පමණ ගිනිගෙණ දිලිහෙන යපොලොව තට්ප්‍රදේශය දක්වා ගැලී නිශ්චලව සිටිති. එකල්හි පූර්වදිශාභාගයෙන් ගිනිගෙණ දිලිහෙන මහත් අයොමය පර්වතයක් නැගී අසනිසෝෂා සෙයින් ගජිනා කෙරෙමින් අවුදු සතුන් සියුම් කොට වටත් තලන සෙයින් සුන්කෙරෙමින් ගොස් පශ්චිම දිශාභාගයෙහි සිටී. පශ්චිම දිශාභාගයෙනුදු දක්ෂිණදිශාභාගයෙනුදු උත්තරදිශාභාගයෙනුදු නැගී එන පර්වතයන්ගෙන් එසෙයින්ම මිරිකෙමින් යෙති. දෙදිසා යෙන් දෙපර්වතයෙක් එනාවිට අවුදු සතුන් උක්දඹුකලඟක් සෙයින් මිරිනාමය. එසින් ඒ නරකය සංඝාත නම්වී. නිරිසතුන්ගේ නව වනමූඛමාංශවලින් සියළු ශරීරයට වදනා අග්නිජ්වලා හා ක්ෂාර ධූමයෙන් තුගුරා පස්නා සතුන් ඇති නරකය රෞරව නම්වී. එසේම රක්තලොහිතජ්වාලයෙන් පරිපූර්ණවූ බලවත් දුකින් තුගුරා පස්නා සතුන් ඇති නරකය මහාරෞරව නම් විය. ගිනිගෙණ දිලිහෙන යපොලොව එසේම දිලිහෙන යවුල්ගි ඇවිනි හිඳ නිශ්චලව පැසෙන නිරන්තරවූ ගින්නෙන් තැවෙන සතුන් ඇති නරකය තාප නම්විය. මෙසේම නිරන්තරයෙන් ගිනිගෙණ දිලිහෙන ආයුධයෙන් පැහැර දිලිහෙන යපර්වතයට නැඟුසතුන් කර්මජ්වාල යෙන් පැහැර උඩ්පාදකොට ගෙණ ගෙලා පිටත්ව පොලොව යකබලින් නැගි දිලියෙන යවුල්ගි හිසපටන් ගෙණ ඇවිනි බලවත් දුකින් පැසෙන සතුන් ඇති නරකය ප්‍රතාප නම්විය. අග්නිජ්වාල යෙනුදු දුකඛයෙනුදු සතුන් මිසිනුදු අතුරු නැති අවීචි නම් විය. එහි ජ්වාලයෙන් අතුරු නැති පරිදි කෙසේද? යත්--පූර්භිත්ති යෙන් අග්නිජ්වාලා නැගි සියළු නරක මණ්ඩලය පුරාගෙණ ගොස් පශ්චිම භිත්තිය පැහැර මිනි විද එසින් පිටත සියයක්යොදුන් තැන පැතිර සිට පශ්චිම භිත්තියෙන් නැගී යන අග්නිජ්වාලාගෙනුදු එසේම සකල නරක මණ්ඩලය පුරාගෙණ ගොස් පූර්භිත්තිය මිනිවිද පිටත සියයක් යොදුන් තැන් පැතිර සිටී, තුබ්බුතුන් දිශා යෙහිදු උබද යවද එලෙසින්ම අග්නිජ්වාලා නොමෝ පවතිත්. මෙසේ සදිසාවෙන්ම නැගිඑන ශබ්දවූ නිරාග්නිජ්වාලාවන්ගෙන් නිරන්තරවන බැවින් ඒ නරකය අවීචි නම් වේමය.

දුකඛයෙන් නිරන්තරපරිදි කෙසේද? යත්, කාශමාරයෙහි උපෙක්ෂාසහගත විත්තයන් උපතුදු දුකඛසහගත විත්තයක්ම උපදී. එතකුදුඋවත් යම්සේ ඒඑ්වාග්‍රහයෙහි එක් මධ්‍රබිඳුවක් තබා එක්තාම් ලොහෝ බිඳුවක් තුබූකල අනුදහනයම බලවත් වන බැවින් ඒ මී බිඳින් කම් නැත. එසේසින් කුමක් හිනැදුයි විවාරිම් ආදි උපෙක්ෂාසහගත විත්තයන් උපතුදු දුකඛසහගත විත්තයම බලවත්වන බැවින් දුකඛයම නිරන්තරය, තුබූ සිත් ඇතැද නැති, මෙසේ දුකඛයෙන් නිරන්තර වන බැවින් අවීචි නම් වේමය.

සතුන් විසින් අතුරුනැති පරිදි කෙසේද?යත්--ඒ නරකාභ්‍යන්තරයෙහි සියක්යොදුන්කැන් නලෙක පුරා තුබූ පිටිසෙසින් සතුන් විසින් නිරන්තරය, මෙහන සඬයෝ ඇති මෙහන සඬයෝ නැති හෙව ඉඳ ඇවිද පස්නා සතුන්ගෙන් කෙළවරක් නැති යන් නන්ට හිටියන් විසින් හුන්නන් විසින් හොත්තන් විසින් ආවරණ නැති, මෙසේ සඬයන් විසින් නිරන්තරවන බැවින් අවීචි නම් වේමය.

මේ අටමහා නරකයෝ සතරැස් වන්නාහුය. එහි එකි නරකයෙහි සතරසතරවාර ඒ අටමහානරකයෙහිම ඇතුළත්හි දිග පුළුල් හා උස ප්‍රමාණය සියක් සියක් යොදුන් පමණ වන්නාහ. එහි එකි හත්හිදු යපොළොවද යකබලද ඝනය නවයොදුන් පමණ ඇත්තාහ. ඒ හැම දුඃඛ කල්පයෙහි පටන් නිරන්තර පවත්නා නරකගින්නෙන් අතුරුනැතිව දිලිහි දිලිහි හාත්පසින් පිටනිතුදු සියක් යොදුන් තැන් පැතිර පවත්නාහ. අග්ගිඵ්ඵාලා ඇත්නාහ. එහි උපන් නිරිසත්හුම ඉඞ්ඛනකාත්‍යසංඛ්‍යාතදරකිස සාදන්නාහුයි. මේ අටමහ නරකවල එකෙකිවාරයෙහි සතර සතර උත්සදනරක වන බැවින් සොළසක් සොළසක්ව උත්සදනරක එක්සිය අට විස්සක් හා මහා නරක අට හා සමග එක්සියඅසූවෙක් වේය. ඒ අටමහා නරකයෝ හාත්පසින් ඒ ඒ නරකවල උත්සද හා සමගද දසදහසක්ද පමණ යොදුන් වන්නාහුයි. මෙම කියනලදී ලොකප්පදීපකසාරයෙහි:—

චතුක්කණ්ණා චතුවාරෝ මිහතෙන්නා භාගසෝ මිනා,
අයොපාකාරපරියන්තා අයසා පටිකුජ්ජිතෝ.

අබ්භන්තරං පනෙතෙසං විත්ථාරා ආසයා පිව,
උබ්බෙධාපිව අඨ්ඨන්ත සමන්නා පරිමාණතෝ.

යොජනසතං සතංයෙව භවතීති විඤ්ඤාය,
නවයොජනිකා නිත්ති පුථුලා උපරිපිව.

අයොකපල්ලංගෙඩාපි අයොභූමි ච තත්තකා,
සමන්නා උස්සෙදෙනෙව සඞ්ඛ්‍යස සහස්සකං,
දස සහස්සකාංයෙව යොජනානං භවන්තිහෙ--ති.

මේ අටමහාකරකවල ආයුෂ නම් කවරහ? යත්--මිනිස්ලොව අනුලක්ෂයක් අවුරුදු පළමුකොට දුක්වූ සංජීවනරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියායෙන් තිස්දවස් මස්කොට දෙළොස්මස හවුරුදු කොට ඒ නියාහවුරුද්දෙන් ඒ නරකයෙහි පන්සියයක් හවුරුද්දට ආයුෂය, මිනිස්ලොව තුන්කොළ සැටලක්ෂයක් හවුරුදු දෙවනකාලසූත්‍රනරකයෙහි එක්දවසක් වෙයි ඒ නියාදවසින් ඒ නරකයෙහි දහසක් හවුරුද්දට ආයුෂය. මිනිස්ලොව තුදුස්කෝළසතළිස් ලක්ෂයක් හවුරුදු තුන්වනසංඝාත නම් නරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ නියාදවසින් ඒ නරකයෙහි දහසක් හවුරුද්දට ආයුෂය,

මිනිස් ලොව සත්පණස්කෙළසැටලක්ෂයක් හවුරුදු සතරවන රෞරව නරකයෙහි එක්දවසෙක් වෙයි. ඒ නියා දවසින් ඒ නරකයෙහි සාරදහසක් හවුරුද්දට ආයුෂය, මිනිස්ලොව දෙසියනිස් කෙළ සතළිස්ලක්ෂයක් හවුරුදු පස්වන මහාරෞරව නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නියා දවසින් ඒ නරකයෙහි අටදහසක් හවුරුද්දට ආයුෂය, මිනිස් ලොව දෙසාතුකෙළසොළොස් ලක්ෂයක් හවුරුදු සවනතාපනම් නරකයෙහි එක්දවසෙක් වෙයි, ඒ නියා දවසින් නිස්දවස් මස් කොට දෙළොස්මස් හවුරුදු කොට ඒ නියා හවුරුද්දෙන් ඒ නරකයෙහි සොළොස්දහස් හවුරුද්දට ආයුෂය, සත්වන ප්‍රතාප නරකයෙහි අනන්තකල්පයකින්අඩියකට ආයුෂය, අටවන අවීචිමහානරකය එක්අනන්තකල්පයකට ආයුෂය.

එහි අනන්තකල්පය කොපමණ කලෙක්දැයි කිව? හොත්--එක් මහාකල්පයෙක් සංවර්තය සංවර්තස්ථායිය විවර්තය විවර්තස්ථායියයි සතරෙක් වෙති. ඒ සතරම සතරඅසංඛ්‍යකල්ප නම් වන්නාහුයි, එහි අනන්තකල්පයෙක් නම් අසංඛ්‍යකල්පවිස්සෙක් පමණ කල් වන්නේය, එක් අනන්තකල්පයෙක් නම් ශස්ත්‍රයෙන් හෝ රොගයෙන් හෝ දුර්භික්ෂයෙන් හෝ හැමසතුන් විනාශව ගියකල එහි රැකුනු සත්වයන්ගේ සිත්හි කුශලධර්මසමාදානයෙන් දශහවුරුද්දෙහි පටන් ගෙණ ක්‍රමයෙන් ආයු වැඩි ගොස් අසංඛ්‍යට පැමිණ අධර්මසමාදානයෙන් ක්‍රමයෙන් දසහවුරුද්දකට බැස පළමුකික්‍රමයෙන් තුන්සංවර්තීයන් අතුරෙන් එක සංවර්තියකින් හැමසතුන් විනාශයට ගියකල එහි රැකුනුසත්වයන්ගේ සිත්හි කුශලධර්මසමාදානයෙන් දශහවුරුද්දෙහි පටන්ගෙණ ක්‍රමයෙන් ආයු වැඩි ගොස් අසංඛ්‍යයව පැමිණ අධර්මසමාදානයෙන් ක්‍රමයෙන් දසහවුරුද්දකට බැස පළමුකී ක්‍රමයෙන් තුන්සංවර්තියන් අතුරෙන් එක සංවර්තියකින් හැමසතුන් විනාශයට ගියකල්හි එක්අනන්තකල්පයෙක් වෙයි, හේ පොළොව එක්යොදුන් තුන් ගව්වක් වඩා පමණකලි.

තවද අනන්තකල්පයෙක් නම් දුනුසියයක් පමණ උසද එසේම දිගපුළුලද ගෙණ කොටුගෙයක් තනා ඒ කොටුගෙයි අබෘකොට කොටා පුරාගෙණ අවුරුදුසියයක් ගියකල එකිනෙක අබඇටක් බැගින් ඇර දමා ඒ හැම අන්තාව ගියකල එක අනන්තකල්පයෙක් වෙයි, යන මේ උපමාව ගිගිහිනයෙහිදු දක්වනලදී, අන්තාකල්ප විභාගය මෙසේ දතයුතු.

මේ අටමහානරකයෝ සිල්වත්තව වරදවාපු සතුන් හා කෙරා වූ පුද්ගලයන් තවන්නාහ, බලවත්දුක්වන බැවින් කොරයහ,කාප

අවශත්කාල උපන්ගිනි නොනිවෙන බැවින් නිරන්තරවූ ගිනිසිළු ඇති බැවින් මහත් භය උපදවන්නාහ දක්නවද අසන්නවද, නොනිසිවූ මහත්දුක් ඇත්තාහ, මෙහි මහාවිවිධ පලල නවයොදුන් යක බල හා සමග තුන්සියඅටයොදුන, වටින් නවසියසුපණස්යොදුන බසුපත් හා සමග දසදහස්යොදුන් ප්‍රමාණය, එහි බොහෝ කලක් දුක් විඳ පවිනළ සඬියෝ නරකයෙන් යම්හයි සිතා පස්විමදිග සිවි කල පුම්දිශායෙහි දෙර හළවාසේ පෙණෙයි,අතරෙහි ජ්වාලායෙහි මහත් දුක් විඳ එහි සම්ප්‍රාප්තවූ කල දෙර වැසියෙයි, තුබූ දෙදිශා යෙහිද මෙම නියාය, මේ ආදි අනෙක ප්‍රකාර ඇති එක්සිය සතිසෙක් වේ. පළමුකොට දැක්වූ සඤ්ජීවාදි අටමහනරකයන් අතුරෙන් එකෙකි නරකයන සතර සතරදිශායෙහි පවිකල සතුන්ගේ වරද නිවරද විවාරීමට නිසි යමරජ්ජුරුවන් සතර සතරදෙනා බැගින් දෙතිස්යමරජ්ජුරු කෙණෙක් වන්නාහුය, එසේම යුක්තායුක්ති විවාරීමට සිරිගුත්ත අමාත්‍යයෝද සතර සතරදෙනා බැගින් දෙතිස් දෙනෙක් වන්නාහුය. එසේම පාපකම්වූ පරිද්දෙන් සතුන්ට අනුශාසනා කරණ නිරය පාලයෝද බොහෝ යමරාක්ෂසයෝද ඇත්තාහුය, ඔවුන්ගේම හැසිරීම් ඇති එකෙකි යමරජ්ජුරු කෙනෙකුන්ට යමලෝදශයක් දශයක් බැගින් වන හෙයින් සමොධාන වශයෙන් එක්කොට බැලුකල යමරජ්ජුරුවන් දෙතිස් දෙනාට යමලෝකයෝද තුන්සියවිස්සක් පමණ වන්නාහුයි මෙම කිහ. ලොකදීපකසාරයෙහි:--

ඉමෙසං පන අඪ්ඨානං නිරයානං වතුස්සු පි,
දිසාසු යමරජානො චත්තාරෝ ව භවන්තිහි.

සිරිගුත්තඅමච්චාපි තථෙව චතුරෝ සියුං,
යුත්තායුත්තං විචාරෙ ඨානා ඨඨකථාමානුසාසයං.

නිරයපාලකා චාපි බහුකා යමරක්ඛසා,
කරොන්තා කම්මකරණං විචාරෙන්ති භයානකා

සමොධානවසෙනෙතෙ යමලොකාපි සබ්බථා,
වීසාධිකාවතිසතං භවන්තීති විජානියා-සි.

මෙසේ ඇඪ්නවූ යමරාජාදි ඇමදෙනා විසින් බලවත් පාපකම් කළවුන්ගේ යුක්තායුක්ති විවාරීමෙක් නැත. ඔවුන් බලවත්ව කළ පාපකම් බලයෙන් ම ඇතුළු නරකවල ඉපද එහි ආයුෂ පමණින් සොරවූ අනන්තදුක්විඳ ඒ ඒ නරකවල ආයුගෙවී ගියකල පාපකම් නොගෙවුනහොත් නරකයන්ගේ පිදුරෙළින්ම එකිනෙකට දුක්විඳ ගොස් නරක ගෙවා සිරිකල කම්බලයෙන් නැවත මුල මහානරක

යෙහි ම උපදින්. එහෙයින් ඔවුන් නිසා කරවන විනිශ්චයෙක් නැත. යම් සත්වයෙකුගෙන් දුශ්චරිතකර්මයෙන් උපදින්නෝ ඇතුළුනරකවලට නොඉපද පිටත උපදිති. මෙසේ පිටත උපන් තැන් යමපල්හු දැක එසේ නරකයෙන් පිටත උපත්තාවූ අනිත්‍යව සතුන් යමරජහු සමීපයට ගෙණ ගිය මැනව සි ගිහා යමරජහුගෙරා ගෙණයෙත්. යමපල්හු තම් තමන් කළ පාපකර්මයෙන් නරක යෙහි ඉපිද පවි කළවුන්ට දුක් දෙන්නාවූ යමපල්හු තම් වෙත්. යමරජහු තම් විමානප්‍රේතයෝ සි. ඔහු සම්භරකලෙක පාපබල යෙන් දුක් අනුභව කෙරෙති. සම්භරකලෙක පිටතරකයෙහි උපන් සතුන් විවාරා කුසල් කළවුන් සුගතියට පමුණුවති. ඔහු එකොකි නරකයෙහි සතර යතරදෙනා වෙත්. ඔහු සතරදෙන ම ධර්මිකයහ. තමන් සමීපයට ගෙණ ආ සතුන් වෙසේ විචාරති. "ලෙඩ ගන්නවුන් ජරාවට පැමිණ දුක් ගන්නවුන් ඉදිමි කුණු ව වැදගොන් මිනී දුවුවා ද, කබල් ගෙණ සිඟාත් ගොදුරු නොලැබෙන මනුෂ්‍යප්‍රේතයන් දුටුවාද, මෙකිනාක් කාරණා දැන කුසල් නොකළා ද" යනාදීන් කියා කළ පින් ඇත් නම් සඳහන් කරවති, ඒ සඳහන් කරවූකල කුසල් කළ සත්වු තම් තමන් කුසල් දහම් කළ හෙයින් නරකයෙන් ගිලිහී සුගති යෙහි උපදිති. මෙසේ විචාළකල සඳහන් කොට ගහනුහුන යමරජ තෙමේ ම කළ කුසල් සඳහන් කොට සුගතියට පමුණුවයි. එසේ සඳහන් කරන්ට නිසි කුශලයෙක් නැත්නම් "නරකයෙහි දුක් විඳින්ට නිසි මේ පවිකම් තොපගේ දෙමවුපියන් විසින් තොපට කළේත් නොවෙයි. මල්බෑයන් විසින් තොපට කළේත් කොවෙයි. සෙසු නෑයන් මිතුරන් තොපට කෙළේත් නොවෙයි. තොප ම කෙළේ ය. එබැවින් තොප කළ පව් තොප ම එහි විපාක විඳුව" සි කියා රැහැනි ව නිහඬිරු ව කරබාගණිති. එකල්හි එතා සිටි යමපල්හු ඔවුන් තරකොවි නරකයෙහි දෙපය ඔසවා හිස යට කොට බහාපියත්.

මෙහි අටවන මහාවිවර අවයවහුතවූ ආයු විසින් වෙන් වෙන්වූ දඝනරක නම් කවරහි? යත්, අර්බුදය නිරර්බුදය අබබය අටටය අහහය කුමුදය සෞගන්ධිකය උත්පලය පුණ්ඩරීකය පදුමය යන මොහු සි.

එහි පළමුවන අර්බුදනරකයෙහි ආයුෂ කෙපමණෙක? යත් අටලක්ෂයක් තලඇට එක්තැලියෙක් වෙයි. ඒ නියා සතරනැලියෙක් එක්ලඟස්සෙක් වෙයි. ඒ නියා සතරලඟස්සෙක් එකද්‍රොණයෙක් වෙයි. ඒ නියා සතරද්‍රොණයෙක් එක් මාණිකාවෙක් වෙයි. ඒ නියා සතරමාණිකාවෙක් එක් ඛාරියෙක් වෙයි. ඒ නියා විසි ඛාරියෙක් එක් භිලවාහයෙක් වෙයි. ඒ වාහභේනි භාරභිය නවකොළ සැටලක්ෂයෙක් තලඇට වන්

නේය මෙයින් තලඇටයක් මිනිසුන්ගේ ආයු ගණනින් හවුරුදු සියයක් ගියකල නරණා නියායෙන් හැරත් ඒ තල හැම ගෙවී ගියත් අර්බුදනරකයෙහි ආයු නො ගෙවෙන්නේය. මේ පළමුවන නරකයෙහි ආයුෂයාගේ ප්‍රමාණ මහත් බව දැක්වූ කල යාලාදි ගණනින් කියත් එක්යාල් නවාමුණු සතරලහසෙක් වෙයි.

දෙවන නිරර්බුද නරකයෙහි මේ නීසා විසිගුණයකට වැඩි ආයුෂය. එහි තල විසිගුණයක් වැඩුනු බැවින් විසිවාහයෙක් පමණ වෙයි. යහලාදි ගණනින් විසිනව යහල එක්මුණු තුන්පැල් තුන්ලහසෙක. මේ දෙවන නිරර්බුද නරකයෙහි කි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. තුන්වන අබබ නරකයෙහි තලවාහ ගණනායෙන් සාරසියයක් වාහය. යහලාදි ගණනින් පන්සියඅසුඑක් සහ ; සොළසමුණු එක්පැල් පස් ලහස්සෙක. මේ තුන්වන අබබ නරකයෙහි කි පමණ තල එක් කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. සතරවන අටට නරකයෙහි එහි තුළ අටදහක් වාහය. යහලාදි ගණනින් එකොළොස් දහස් සසිය සතළිස් සතරමුණු එක්පැල් එක් ලාසෙක. සතරවන අටටනරකයෙහි මෙකි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. පස්වන අහහ නරකයෙහි හේ එක්ලක්ෂ සැටදහසක් වාහය. යහලාදි ගණනින් දෙලක්ෂ දෙපණස්දහස් සත්සිය සත්විසිපසමුණු එක්පැල් නවලාස්සෙක. පස්වන අහහනරකයෙහි කි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. සවන කුමුද නරකයෙහි හේ තල තිස්දෙලක්ෂ වාහය. යහලාදි ගණනින් සතළිස්සලක්ෂ පණස්සාර දහස් පන්සිය පන්සාළිස් යහල නවාමුණු සතර ලහස්සෙක. සවන කුමුදනරකයෙහි මෙකි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසි ගුණයකට වැඩි ආයුෂය. සත්වන සෞගන්ධික නරකයෙහි හේ තල සකෙළ සතිස්ලක්ෂයක් වාහය. යහලාදි ගණනින් නවකෙළ එක්තිස්ලක්ෂ අනූදහස් නවසිය නවයහල එකමුණු දෙපැල් තුන් ලහස්සෙක. සත්වන සෞගන්ධිකනරකයෙහි මෙකි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. අටවන උත්පල නරකයෙහි හේ තල එක් නහුත විසිඅටකෙළක් වාහය. යහලාදි ගණනින් එක්නහුත සයානූකෙළ අටලොස්දහස් එක්සිය දෙයානූයහල සොළොස් අමුණු එක්පැල් ලහස්සෙක. අටවන උත්පලනරකයෙහි මෙකි පමණ තල එක්කොට ගෙණ ඒ නියා විසිගුණයකට වැඩි ආයුෂය. නවවන පුණ්ඩරීක නරකයෙහි හේ තල පස්විසි නහුත සැටකෙළක් වාහය, යහලාදි ගණනින් සත්සිය නහුත තෙවිසිකෙළ තෙසැටලක්ෂ තෙසැටදහස් සසිය සතිස් යහල සතමුණු දෙපැල දසලහස්සෙක. නවවන පුණ්ඩරීක නරකයෙහි මෙකී පමණ තල එක්කොටගෙණ ඒ නියා විසිගුණයකට

වැඩි ආයුෂය දශවෙනි පද්ම නරකයෙහි, හේ තල පස්නින්නහුත දෙලොස්නහුතයක් වාහය. යහලාදි ගණනින් සත්නින්නහුත සුසාලිස්නහු ඇ දෙසැත්තැකෙල්ල දෙසැත්තැලක්ෂ දෙසැත්තැදාස් එක්ඔසතත්වීසි යහල තුදුස් අවුණු දෙපැල් දෙලහස්සෙක.

මෙහි පළමුවන නරකයෙහි කීවා සේ මතු තුබු නරකයෙහි දු මිනිසුන්ගේ ආයුගණනින් හවුරුදු ඔසයක් ඔසයක් ගිය කල එකෙකි තලඇට හරුත් ඒ නරකවලට ප්‍රමාණ නියමකොට දැක්වූ තලරාසී ඇ ගෙවියන්නාහුය. ඒ නරකවල එයට වැඩි මහත් නො ගෙවෙන ආයුෂයක් ඇත්නාහු යි දතයුතු යි.

මෙහි කෙළක්නහුතයක් නින්නහුතයක් යන ගණනාවෝ කෙසේද? යත්-දසදසයෙක් සියයෙක් වෙයි. දාසියයෙක් දහසෙක් වෙයි. සියක්දහසෙක් ලක්ෂයෙක් වෙයි. සියක්ලක්ෂයක් කොටියක් වෙයි. කොටිලක්ෂයෙක් ප්‍රකොටියෙක් වෙයි. ප්‍රකොටිලක්ෂයෙක් කොටිප්‍රකොටියෙක් වෙයි. කොටිප්‍රකොටිලක්ෂයෙක් නහුතයෙක් වෙයි. නහුතලක්ෂයෙක් නින්නහුතයෙක් වෙයි. නින්නහුතලක්ෂයෙක් හුත නහුතයෙක් වෙයි. හුත නහුතලක්ෂයෙක් ඛමහයෙක් වෙයි. ඛම්හ ලක්ෂයෙක් විස්ඛම්හයෙක් වෙයි. විස්ඛම්හලක්ෂයෙක් අඛබයෙක් වෙයි. අඛබ ලක්ෂයෙක් අටටයෙක් වෙයි. අටට ලක්ෂයෙක් අහහයෙක් වෙයි. අහහ ලක්ෂයෙක් කුමුදයෙක් වෙයි. කුමුද ලක්ෂයෙක් සෞගන්ධිකයෙක් වෙයි. සෞගන්ධික ලක්ෂයෙක් උත්පලයෙක් වෙයි උත්පල ලක්ෂයෙක් පුණ්ඩරීකයෙක් වෙයි. පුණ්ඩරීක ලක්ෂයෙක් ඨාඨානයෙක් වෙයි. ඨාඨාන ලක්ෂයෙක් මහාඨාඨානයෙක් වෙයි. මහාඨාඨාන ලක්ෂයෙක් අසංඛ්‍යයෙක් වෙයි. මෙයින් අසංඛ්‍යෙය අවසානවූ සංඛ්‍යාවින්ගේ ප්‍රමාණවිභාගය සි දතයුතු.

දක්වනලද ක්‍රමයෙන් ආයුෂප්‍රමාණ ආදි නොයෙක් විභාග ඇති අටමහානරකය ආදි නරකවල දුකට කවර අකුශලකම් කිරීමෙන් සත්වයෝ පැමිණෙන්නාහුද? යත්— යම් සත්ව කෙනෙක් වෙහ මොහ දෙකින් අභිභූත ව ප්‍රාණඝාත කරන්නාහු ද අධර්මයෙන් ලොව වැසියන්ට දුක් දෙන රාජපුරුෂාදීහු ද යම් සත්ව කෙනෙක් අන්‍යෝන්‍ය ඝතුරු ව යුධකරන්නාහු ද මන්පැහැරීම් වශයෙන් අනුන්ට දුක් දී අපරාධයෙහි හැසිරෙන සොරු ද යන මේ සියල්ලෝ. ඔට කියනලද ක්‍රම මහදුක් ඇති සඤ්ජීවනරකයෙහි ඉපිද කොයෙක් දුක් අනුභව කිරීමෙන් පැසෙන්නාහු සි.

යම් සත්ව කෙනෙක් දෙමව්පියන් කෙරෙහි දු ගුණවන්තයන් කෙරෙහි දු දෙඟකළාහු ද ඔවුන් හා මුසාවාද කිවාහු කාලසූත්‍රනරක

යෙහි ඉපද කළුගසා යමරාජයෝ දඩුකඩක්මෙන් සසිත්, අති කෲරවූ කිඔත්වලිනුදු කපමින් දුක් දෙන්නාහුයි.

යම් සත්වකෙනෙක් එළුවන් කොටළුවන් මිමුන් සාවුන් මියන් ඇ නොයෙක් නම් ඇති සතුන් මැරුවාහුද හසුනපාදීන් අනුන්ට තලා වෙහෙස දුන්නාහුද ඒ සත්වයෝද හසුනි අඟවදමනයෙහි යෙදී නොයෙක් ලෙසින් බවුන්ට දුක් දුන්නාහුද යන මොහු මහි සාදී නොයෙක් නම් නොයෙක් විරූපශරීර ඇතිව සංඝාත නරක යෙහි ඉපද යට කියන ලද ක්‍රමයෙන් මහත් දුක් අනුභව කරන්නාහුයි.

යම් සත්ව කෙනෙක් කූටසාක්ෂි කියන්නාහු කූටිවෙළඳුම් කරන්නාහුද මායාඝප්‍රයොග ඇත්තාහුද ඒ සත්වයෝ රෞරව නරකයෙහි ඉපද බලවත් සන්තාපයෙන් කායවිහාදෙහා තැවී මෙන් සොවූ නරක ගින්නෙන් දඩු නිරන්තරයෙන් ගිනි ගෙණ දිලිහෙන ශරීර ඇතිව හඝනාක හඩින් හඩමින් මහත් දුක් අනුභව කරන්නාහුයි.

යම් සත්වකෙනෙකුන් විසින් බුඩ සංඝ ගුරුන් දූඛිතයන් වසතු ගෙණ නසන ලදද ඒ සත්වයෝ මහාරෞරවනරකයෙහි ඉපද සොරවූ මහත්දුක් අනුභව කෙරෙත්.

පරුෂවචන කියා ගුණවෘඩදි වෘඩජනයන්ට වෙහෙසදුන්නා හුද සතර අගතියට ගොස් රවිවැස්සන්ට වෙහෙස කළ රජදරු වෝද කුශලාකුශලධම් නැත යනාදීන් උවෙජ්දදුශ්චිගත්තාහුද යන මොහු තාප-නරකයෙහි ඉපද මහත් නරක දුක් අනුභව කෙරෙත්.

එසේම නොයෙක් අකුශලකර්ම කොට ශාස්වතාදි විපර්‍යාශ දෘෂ්ටි ගෙණ පව්රැස්කළාහුද, ප්‍රතාප නම් නරකයෙහි ඉපද එහි නිෂ්ඣණ ගින්නෙන් දඩු මහත් දුක් අනුභව කරන්නාහුයි.

යම් සත්වකෙනෙක් අධිමාත්‍ර පාපයන් කාංශාවක් නැතිව ම කරන්නාහුදමාතෘපිතෘඅරහන්තඝාතලෝහිතුපපාදසංඝභෙදඝන පඤානන්තරිය කර්මය කරන්නාහුද බොධිසත්ව ගුණධර්මයෙහි පිහිටුතුමින් නසන්නාහුදඅධික ගුණඇත්තන් මරා වෙහෙස දෙන්නහුද දහගොප් බොධිවෘක්ෂ සිඳබිඳ දමන්නාහුද බුඩ ධර්ම සංඝ ඝන තුනුරුවන් අසිති වස්තුන් පැහැර ගන්නාහුද මිත්‍රද්‍රොහි කම් කළා හුද යම් ජන කෙනෙක් අවෙරවූ මිත්‍රයන්වද අධිකගුණ ඇති ස්තුන්ට හායිඥාවන් කෙරෙහිදු වරදවා පිළිපදනාහුද සුරාපානය කොට ගම් පහරන්නාහුද ශාඝවත උවෙජ්දදුශ්චි ගත්තාහුද, නොයෙක් ලෙසින් දුස්සීලව පව් රැස්කළාහුද, යන මේ සියල්ලෝ අච්චිමහානරකයෙහි ඉපද මහත් දුකින් පැසෙන්නාහුයි.

එහි උපන්සත්වයෝ ගව් දෙගව් තුන්ගව් සොළොස් පමණ ශරීර ඇත්තාහුය, දෙවදත්තයන්ගේ ශරීරය සියක්යොදුන් පමණ විය, ඔවුන්ගේ ශරීරපෙණපිඬු දෙඩරුයේ තර නොවෙයි, හෙනෙල්මල් ගබපෙත්තකිනුදු ගැසුව සිවිසම කඩා ගොස් ඇට මුල මිස නොවෙයි. මෙසේ දුකටම හාජනව උපන් මොලොක් ශරීර ඇති දෙවිදත්හුගේ හිස අවීචිමහානරකය උඩින් වසා සිටි අයොමය ගිනි ගෙණ දිලිහෙන යකඩලෙහි බැමගෙන් උඩ ප්‍රවිෂ්ටව මස්සාකය වැදී පාදගෝ ගොප්මත් සඳි දක්වා එසේම දිලිහෙන යකඩමය භූමි යෙහි ගැලී ඉතා තද වෙහෙස විඳිමින් සිටිකල්හි ගිනිගෙණ දිලිහෙන යකපොළවින් මහත් යවුලක් නැඟී ඒ සියලු ශරීරය විද ගෙණ ගොස් හිස විත් විද යකඩලෙහි වැදී සිටිනේය, එසේම පූළි හිත්තියෙන් ගිනිගෙණ දිලිහෙන යවුලක් නික්ම හෘදමධ්‍යයෙන් වැදී විනිවිද ගොස් පශ්චිමභිත්තියෙන් වැදී සිටිනේය, දක්ෂිණ භිත්තියෙහුදු එසේම යහුලක් නැඟිගොස් දකුණුලයෙන් වැදී ඒනිවිද උතුරු භිත්තියෙහි වැදී සිටිනේය, ගසාතල දෙකද දක්ෂිණ උත්තර භිත්ති දෙක්හි එසේම යවුල් ගසා නිශ්වල කොට සිටුවනලද්දේය, මෙසේ ඒ නපුරු කල්පනාවෙන් ම නිශ්වලවූ බුදුන් කෙරෙහි වරදවා බොහෝ පව් රැස්කොට ගත් දෙවිදත් තෙම නරකයෙහි බොහෝ නිශ්වලවම දුක් විඳිමින් පැසෙන්නේය, මෙම ද කිහ, ලොකපදීපසාරයෙහි:-

දෙවදත්තස්ස කායොතු සතයොජනවුච්චතෙ,
සීසං අඡෙකාළලෙල තු පවිඨං භූමිකොටරි,
පාදෙ යාව ගොප්ඵසන්ධි පවිඨා අයභූමියං.

තත්තායය භූමියා සංකු යාව සීසාභිනිකඛම්,
පුරත්ථිමාය භිත්තියා නිකඛමම අයසංකු ව.

විජඣිත්වාන උරං තස්ස භිත්තියා පච්ඡිමෙ ඝනී,
දක්ඛිණායව භිත්තියා නිකඛමම අයසංකුව.

විජඣිත්වා දක්ඛිණං පස්සං භිත්තියං උත්තරෙ ඝනී,
වෙපි හත්ථතලා විඛා දක්ඛිණුත්තාරභිත්තියං.

එවං සො නිච්චලෙ බුඬෙ පරාභිත්වාන දුම්මති,
නිච්චලොව සයව ඡුත්වාන පච්චති නිරයං ඡුසං—සි.

මෙසේ නරකයෙහි පැසෙන දෙවිදත්හු අරහයා මිලිඳුරජ නාගසෙන සඨවිරයන්වහන්සේගෙන් උභතොකොටික ප්‍රශ්නය විවාරණ තැන "බුදුරජ කරුණා ඥානදෙකම්ඇතිසේක් දෙගෝ!" සි යනාදි ක්‍රමයෙන් විවාළකල දෙවිදත්හු පැවිදි නොලදහෙත්

බොහෝපව් රැස් කොට නිරන්තරයෙන් නිරයට ඇවිද අවීචිමහඉදු තොයෙක්වර පැසී විඳිනාදුක් සම්ඥතාඥනයෙන්ම දැන කරුණා වෙන් පැවිදිකොට දුක් අන්තව ගියකල මතු සවිසිසර තම් පසේ බුදුවන බවත් ප්‍රකාශකොට ප්‍රශ්න මිසදු පරිදි මිළිඳප්‍රශ්නයෙන් අසා දතයුතු, එසේ හෙයින් බුදුරජ කරුණාඥන ඇතැයි දතයුතු.

තවද මව්පියන් තලා මරා වෙහෙස දුන්නාවූ ලොහොකුඹු නරකයෙහි දිලිහෙන යතුලි මුඛයෙහි හෙලකලදුව පැසෙති දරු ගැප් හෙලුවෝ බොහෝ වා දහස උඩුමුවහත්ව ගිවි ක්ෂුරධාරානරක යෙදු පැසෙති, වෙතරණීනම් නරකයෙහිදු පැසෙත්, ශරීරබල හොඟ බල ආඥබලයෙන් සමන්විතව මේ නරනමැති දුම්ලයන්ට අහින් පහරදීම් ආදිවශඃයන් වෙහෙසුවන්ටද නානාප්‍රකාර ආක්‍රොශ නපුරු පරිහව බැණ අනුන් වෙහෙසුවන්ටද නිරය පාලයෝ දිලිහෙන අසිසත්තිතෝමර හෙණ්ඩිවාල මුද්ගරාදි ආයුධ හෙණ පැහැරවිද දුක් දෙති, ඔව්හු නැවත හෙණ්ඩිවාල ප්‍රමාණ වෙතුලතාඃයෙන් ගැවසී ගත් කම්බලයෙන් උපන් දුගිඛවෙතුලතා යෙහි නොයෙක්වා දහස් කඩකඩව කැඩී ඉක්බිති වෙතුලතායෙන් ගැලවී දිලිහෙන තල්කඳ සා යකඩහුල්හි මිනිසුන් සේ ඇමිනී නොයෙක්වා දහස්පැසී ඉක්බිති යහුලින් ගැලවී කරමුවාත්වැනි දිලිහෙන පොකුරුපෙත ති එයිනුදු නොයෙක් වා දහස් ක ඛඤඩව කැඩී මහදුක් විඳ ඉක්බිතිව දිලියෙන දුම්නැගෙන දුගිඛඤාරෝ දකයෙහි දුක්විඳ ඉක්බිති දියඇට ගියකල අස්වැසක් පිහිටෙක් ඇතිදෝහෝ ගැලි ක්ෂුරද්‍රාරයෙහි කඩඤඩවකැඹී ඒ දුක් ඉවසාගත නොහී මහඟඬින් හඬන්නාවූ කලක් උඩුනදියට ගෙණයනු ලැබෙති. එකල්හි කරකයෙහි සිවි යමපල්හු හිඳබි ශාස්ත්‍රාදීන් විදිති, එසල්හි, මහඟඬින් හඬත්, ඉක්බිති දිලියෙන යබිලි බහා ගන්වා නගාගෙණ ගිනිගෙණ දිලියෙන යපොළව හොවා මුඛයෙහි ගිනිගෙණ දිලියෙන යතුලි බහාලත්.

දන්නොදෙන මසුරනුදු අනුන්දෙන දන් වලකාපු නද මසුර නුදු මහණබමුණන්ව නින්දුපරිහාස බිනුවාහුද ඒ පාපයෙන් පස් වණක් පැහැඳුනි මහඇතුන් පමණ බල්ලෝ වටාගෙණ තුන්ගවු ශරීර ඇතිව උපන් නිරිසතුන් ලුහුබැඳ තීරුකොටගෙණ යපොළව හොවා පෙරදෙපසින් ලැම්බියේ ඇක්ම සිව ඇට තබා මහඟඬින් හඬවහඬවා කති, මහත් ගැල්සක් පමණ තුඩුඇති ගිජුලිහිණි ලොහොතුඩින් ඇට විද ඇට මුල් කති, අතිභයානකවූ ලොහොතුඩු ඇතිකවුඛෝද කත්.

සීලාචාරාදි ගුණසම්පන්න සත්පුරුෂයන්ව තලා වෙහෙස දී මිය ඒ පවින් නරකයෙහි දිලිහෙන තුන්ගවු උසශරීර ඇතිව උපන් තන් යමපල්හු දිලියෙන තවයොදුන් යකඩල්පිටදී ගිනිගෙණ දිලි යෙන තල්කඳසා මුහුරෙන් පයපැහැර හුකුවන්සිපාසුංසුංකෙරෙත්.

අවකාශයක් ලදකලත් දෙමිහ පූජාකරම්හ විහාර හෝ කර වම්හයි කියා දැහැමින් එක්කොට තුබූවස්තු තමින් සිත්සේ විසදම් කොට එහි විනිශ්චයෙහි යෙදුනවුන්ට අත්ලස් දී මෙතෙක් මෙතෙක් ධන මෙනම් මෙතම් දේට විසදම් කෙළෙම්හයි කුට සාක්ෂින් ලවා කියවීමෙන් නිවරදිව ඒ ධනය නසා මිය නරකයෙහි උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන ආයුධයෙන් පැහැර ගාලට නොවදිනා ගවයෙකුසේ වටා තිරුකොට දිලියෙන අතුරු වල ඵලති, ඔවුන් අතුරුමල කපිප්‍රදෙශය දක්වා ගැලුනත් හිසදිදු නේ මහත් යපැසින් අතුරු උකා බහත් තුමුදු කම්බලයෙන් තමන් හිස තුමුම අතුරු බහාලාගණිති, මේ දුකින් නොයෙක් වාදහස් මහ හඬින් හඬා පැසෙති.

ආවාරගුණසම්පන්න සීලවන්නතැන්වලට තලාබැණ වෙහෙස දුන්නාහු මිය ඒ පවින් නරකයෙහි උපන්නන් භයානක යමපල්හු මහත් පජිත හා ගිනිගෙණ දිලියෙන කපමුලුල්ලෙහි සිටිකා ලොහොකුඹුරකයෙහි උඩුපාදකොට ගෙණ බහාලති, එහි නොයෙක් වා දහස්ගණන් පැසෙත්.

පක්ෂින්ගෙණ කර අඹරා මරා මිය එම පාප කම්බලයෙන් නරකයෙහි උපන්නන් යමපල්හු දිලියෙන ලොහාසයාත් කර බැඳ තුන්ගවුපමණවූ නිරිසතුන්ගේ ශරීර තමා කරා අඹරා කඩා කකියන ලොහොදියෙහි බහාලති, කාවුකාවුතැන් හවගණිති, මේ නියායෙන් නොයෙක් වා දහස් පැසෙති.

ඉඹවූ සප්තවිධධාන්‍ය දෙමිහ යි අනුන් අතින් අසති ගෙණ බොල්අකුරු පස් ආදිය මුසුකොට දී ඒ කම්යෙන් නරකයෙහි උපන්නානු නොයෙක් කල් නරකයෙහි පැහී එයින් නික්ම මනා සොට ඇති සිහිල් දිය සේ පෙණෙන දියට පිපාස ඉදිසාගත නො හී පැන් බොම්හ යි බසිති. ඔවුන් බවකල ඒ නදිය දෙදිසා වෙන් ඉවුරු බිඳවැටී දිය ගැඹුරු වෙයි. දිලියෙන යබුහු වෙයි. ඒ යබුහු කර්මබලයෙන් ගෙණ කැකල ශරීරයෙහි අධොභාගයෙන් නික්මෙයි. ඔවුහු ඒ දුක් අධිවාසනය නො කොට හෙන්නෝ මහහඬින් හඩහඩා වලපිත්.

අනුන්ගේ සම්භාවනාදුණක අවිඤ්ඤාදුණක වසතු සන්ධිවෙජදාදි කොව ගන්නාවූ භයානකවූ නිරයපාලයෝ අරණ්‍යයෙන් මුවන් තිරුකොට වටාගන්නා වැද්දන් සෙයින් ඉසුසත්තිතෝමරාදි ගිනි ගෙණ දිලියෙන ආයුධ ගෙණ දිරාගිය පතක් සේ සිදුරු සිදුරු කොට මහහඬින් හඬව හඬවා විදිති. එයින් මහත් දුක් අනුභව කෙරෙත්.

එලුවන් හූරන් ගෙරින් මිවුන් මූවන් මසුන් මරා මස් විකුණ මින් පවිකළාහු මිය නරකයෙහි උපදිති. එසේ උපන්නන් දිලියෙන

ලොහොයොතින් ත්‍රිවයෙහි බැඳ ඇදහෙලා ලොහොපොලොව හෙවා යමපල්හු නානායුධයෙන් කොටති, සඬඛඬකොට කපති, යකඛමයපුවරුවෙහි මස්කපාරුස් කෙරෙති මෙසේ නොයෙක්වා දහස් පැසෙත්.

අතිවාරිව තමන්හිමි සවාමිපුරුෂයන් හැර පරපුරුෂ සෙවනය කළස්ත්‍රීහුද පරස්ත්‍රීසෙවනය කළපුරුෂයෝද මහත්දුගින්ධවූ වෙතරණිනම් නරකයෙහිද උස යොදුන් පමණවූ දිලිඝෙන සොලොස් අගුල්කටු ඇති සිඹබලිවනයෙහිදු ලොහොකුඹු නරකයෙහිදු පැසෙත්.

සවාමීන්කෙරෙහි සවාමීන්ගේ බැයන්හොරෙහි බුහුතන් සොහොයුරන් කෙරෙහි ලජ්ජානැතිව පැවති ස්ත්‍රී තොමෝ නාප නරකයෙහි පැසෙයි, එහි තුන්ගවු ශරීර ඇතිව පැසෙන්නියගේ ද දිව තුන්ගවු පමණ වෙයි, ඒ දිව යමපල්හු පිටතට ඇද ශස්ත්‍රයෙන් කොටති, එක්හොරුනැම් සා පණුවෝද වෙති, මෙසේ නොයෙක්වා දහස් දැසෙත්.

එලුවන්, හූරන්. මසුන්, මුවන්, සොරුන්, ගෙරින්, මැරුවෝද කේලම් කියා උනුන්හු කෙරෙහි බිදුවාහුද එපවින් නරඝයෙහි උපදිති, එසේ උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන සැතින් සිපා මිරිකති, දිරාගියපතක් සේ හියෙන් විද සිදුරු කෙරෙති

කුලුසවන් කොට කුලුදෙස් කියා ඉය එ පවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් යමපල්හු ගිනිගෙණ දිලියෙන යකුලෙන් ගසා සිපා මිරිකති.

බඩුයෙහි කුවයෙන් වරදවා අගය තුබුවෝ මිය ඒ පවින් නරකයෙහි උපදිති. එසේ උපන්නන් ගිනිගෙණ දිලියෙන යකුලින් ඉස පැහැර විදිති. බිදුනු තැනින් වැහුරුණු ඉස් මුල් නව යොදුන් දිලියෙන යකඛලෙහි කකියවා බඳින්ට ම පොවති. ඉක්බිති ක්ෂාරොදක නදියෙහි වැටී පැසෙති. කොක්නහු ද කවුවුවෝ ද කැනහිල්හු ද ගිජුහු ද ලොහොතුඬින් හඬව හඬවා විඳිති.

මුවන් සේ පැමුවන් මරන්නෝ ද සැලලිහිණියන් බැඳ පැ පක්ෂීන් මරන්නෝ ද මිය ගොස් එ පවින් නරකයෙහි ඉපද නානාප්‍රකාර නරකදුක් කම්කටුල් අනුභව කෙරෙත්.

රහපිවාහු මිය එපවින් නරකයේ තුන්ගවුශරීර ඇතිව උපදිති. එසේ උපන්නාහු යමපල්හු ගිනිගෙණ දිලියෙන යපොළව ගොව, නඛතල්කදන්සා ගිනිගෙණ දිලියෙන යහුලක් එක් අතක ගසති.

එහි ප්‍රචණ්ඩවායු ඇති තෙනක තැඟ මඩුයෙක එක් කොණක බැඳි වියනක් සෙයින් කර්පමානවූවාහු ගිනිගෙණ දිලියෙන නහඹ තල් කඳසා යහුලක් දෙවන අත්හි ගසති. එකල්හි ප්‍රචණ්ඩවාතයෙන් කම්පිතධවනියක් සෙයින් කාපමානවූවාහු ගිනිගෙණ දිලියෙන නාඹ තල්කඳ සා යහුලක් එක් පයක ගසති. එකල්හි තුන් තැනෙක බැඳි වියනක් සේ කර්පමාන වූවාහු ගිනිගෙණ දිලියෙන නාඹ තල්කඳ සා යහුලක් දෙවන පය ගසති. ඉක්බිති කඹුරු උදු නෙක බැඳි සමක් සෙයින් ශරීරය මැදින් අහසට පෙවෙන්නාහු ගිනිගෙණ දිලියෙන නාඹ තල්කඳ සා යහුලක් ලය මැද ගසා නිශ්වල කෙරෙති. මෙසේ පඤ්චවිධ බන්ධනකර්මයෙන් නිශ්චලව වස්නාහු කුමක් රුස්වයි පිළිවිස පිපාසිතයෙමි වහන්සැයි කී කල ගිනිගෙණ දිලියෙන ලොහොදිය ගෙන්වාගෙණ ලඟා කෙරෙත්. ඒ බලා දැක ඇස්මුව පියා ත්‍රාසවූවාහු නොකැමැති පරිදෙන් යම පල්හු ගිනිගෙණ දිලියෙන යහඹුවෙන් මුව විවෘතකොට වත් කෙරෙති. එකල්හි බහු තොල් දවා දිවි දවා අතුනු දවා අතුනු බහන් දවා අධොභාගයෙන් නික්ම යේ. මෙසේ මහ දුක් විඳ පස්නාහු වැලිදු කුමක් රුස්වයි පිළිවිස බඹසා දුකින් පිඬිතයෙමි වහන්සේයි කී කල්හි යමපල්හු ගිනිගෙණ දිලියෙන යවට ගිනි ගෙණ දිලියෙන ලොහො පැස බහාගෙණ ලඟ කෙරෙත්. ඒ බලා බලවත් දුක් දෙම්නස් ඇතිව ඇස්වූව පියා නැතිගත්තාහු නො කැමැති පරිදෙන්ම ගිනිගෙණ දිලියෙන යහඹුයෙන් මුඛය විවෘත කොට එහි යවට බහාලති. ඔහු තොල් දිවමුව උගුර අතුනු අතුනු බහන් දවා අධොභාගයෙන් නික්ම යේ.

මෙසේ නොයෙක් වාදහස් මේ කම්කටුල් විඳී. කකියන දිය සැලක බහාලූ පරඛලාපතක් සෙයින් එක් තැනක නොසිට ලුණු පිඬක් සේ සිත්විරෙනුව බලවත් දුක් දෙම්නසින් තැම්තැම් තිස්වා දහසකින් පැසී සැල පත්ලට බැස තිස්වාදහසකින් පැසී සැල මුවවිටට නැගෙන බලවත් දුක් ඇති ලොහොකුඹි නරකයෙහි බහා ලනු ලැබේ.

මේ හැම අකුශලකර්මයන්ගේ විපාක මුඛයවූ හෙවත් ප්‍රමුඛව ඒ ඒ පාපකර්මයට දුක්වූ කම්කටුල් විසින් කියේය. බලවත්ව නොයෙක් පව් කළ සත්වයෝ වූකලි මෙකී හැම නරකවලම පිළිවෙළින් ඒ ඒ නරකවල ආයු කී පමණින් පැසී කළ අකුශල කර්මය ගෙවී නොගියහොත් නැවත මහනරකයෙහිම බහාලනු ලැබෙත්. ලොකයෙහි සැපය මේ අයයයි කියනලදී. ඒ අයසංඛ්‍යාත සැපයක් නැති හෙයින් නිරය නම්වූ නරකයන්ද අතුරෙත් මහානරකයෙහි එසේ බහලනලද පව් කළ සත්ව තෙම ගිනිගෙණ දිලියෙන

අඩිගප්‍රත්‍යඩිග ඇතිව බැගෑ ගඩින් හඩමින් ඔබ්නොඔ බලා දිවමින් යම් දුකක් අනුභව කෙරේද ඒ දුඃඛයාගේ එක දෙශමාත්‍රයක්වත් ප්‍රකාශකරන්නට කවරෙක් සමර්ථද නොහැකිමැයි.

තවද යම් නිරයක්හු අයොමයව වැලඳ සිටින යොදුන් ඝනය ඇති යකඩල ඇතුළෙහි වහ්නි වෙගයෙන් දිලිහි පමණ නැති මුහුදු දිය සතරදිහින් වඩබාමුඛයෙහි වැහුනු වතුර පැමිණි ඇසිල්ලෙ කින්ම වියලාතම් ඒ නරකයාගේ ඇතුළෙහි පවත්නා මොළොක් ශරීර ඇති මහත් දුකින් පීඩිතවූ වඤ්චලවූ තැනතැන පැකිලෙන වැටෙන කෙණෙහි කෙණෙහි මූර්ඡාව බලවත් සොහයෙන් කම්පිතව ඉතා බැගෑකොට ඒ ඒ දෑ බැන අසරණව නොයෙක් දෑ සිතන අසන්නතුදු විසින් නොඉවසියහැකි පමණ නැති බලවත්වූ දුක කවරෙක් වර්ණනාකොට විස්තරයෙන් කියන්නේද නොහැකි මැයි.

අයොමයවූ මහත් සොළොස් අතුල් පමණ කටු ඇති ගිනිසිලු පෙළින් වැලඳගෙණ උස යොදුන් පමණ ඇති ඉඹුල් ගසට නිරි සතුන් නහන පිණිස වණ්ඩවූ යමදූතයන් විසින් නැවත නැවත ආඥාකරමින් කෙවිටියට අගින් විදිනා තෙප්දුනු ආදීන් පහරණ යකවුගෙන් පලන අහපසඟ ඇතිව බැගෑහඩින් හඩමින් හඝපත්ව කදුලුමුසු මුහුණු ඇතිව නැවත නැවත නැගෙන්නන් නැගෙමින් සිට මුහුණ අඩිරාගෙණ යමරාඡසයන්ම බලමින් වැලිදු හයින් ඇස් පියාගෙණ තමාගේ ශරීරය තමාගේ ශරීරයෙහිම සඟවමින් අමුතු සැඟවෙන තැනක් නොලදින් වෙවුලා සිහිමුලාව යම් දුකක් අනුභව කෙරේද ඒ දුකට උපමා තම් කවරක් වන්නිද?-මෙසේ නිරයෝ ඉතා දරුනුවූ තද දුක් ඇත්තේය. එහෙයින් තථාගත වූ බුදුරජ තෙම එහිදු කිමෙන් කෙළවර පැමිණිය හැකි නොවෙයි වදාළසේක. මෙහි; ප්‍රකාශවූයේ පිටකත්‍රයෙහි ආ නරක දුක් අති සංක්ෂෙපයකා. අනෙකප්‍රකාරයෙන් ඒ ඒ තන්හි නරක දුක් දෙසූ බුදුරජ තෙම මෙසේ වදාළ කල නරක දුක් විස්තරයෙන් වර්ණනා කොට දක්වන්ට කවරෙක් සමර්ථද? - එකානනයෙන් නො පිළිවන්මය.

යම් සේ ගිනි හා සඳුන් යන දෙදෙනාගේ එකාකාරයක් නොවේද, වෙනසම වෙද්ද, එහෙයින් නරක ගිනි හා මෙහි පවත්නා ගිනි යන දෙදෙනාගේ වෙනසද එබදුමැයි.

තවද යම් සේ තුන්සියයක් තෙප්පහරින් ඇන විදිනා ලද්දාහු ගේ වනමුනත් සසියයක්ව නොසිතියහැකි සේ ඉදින් යම් බලවත් නොඉවසියහැකි දුකෙක් ඇද්ද ඒ දුක් නරකයෙහි දුකට සම

නොවන බැවින් තුන්දහස් යොදුන් හිමාලය පර්වතය හා අඛ ඇටක් යන මේ දෙක්හි සම බවක් නැත්තාසේ නරක දුකට තෙප්පහර තුන්සියය ලැබීමෙන් වන දුක සම නොවේ.

තවද යට කියනලද ක්‍රමයෙන් මහත් දුක් ඇති අවීචිමහා නරකය අසූචිනරකය හලුනරකය කොලහිඹුල්නරකය අසිපත්‍රනරකය ක්ෂාරෝදිකා නම් නරකය අඟුරුපර්වතනරකය ලොහොකුඹුනරකය කල ඇත් නරකය මහත් යන්ත්‍ර නරකය ආදි එක්සිය සතිස් නරක යෝම දුකින් පමණ නැති නො ඉවසිය හැකි භයානක ඝෝර දරුණු දුක් ඇත්තාහ. එහෙයින් ආසන්නවූහුදු එහෙයින් පවි කළ සතුන් මිසින් විඳයුතු මහත්දුක් ඇත්තානුයි. එබදු නරක දුකට පමුණුවන අකුශලකම්පථපරිභෝගයෙහි දක්වනලද ක්‍රමයෙන් නොයෙක් විභාගාදිනව ඇති පාපකර්මයන් අතුරෙන් එකෙකි කම් යක්හුගේ විපාකද ඉතා බොහෝව මෙතෙකැයි කියන්නට නො පිළිවන. නොයෙක්වාදහස් මුලුල්ලෙහි යට කී ප්‍රකාර දුක් ඇති නරකවල දුකඛ්පශි කොට විඳිමෙන්ම දතයුතුය, කියන්නෙකුදු එසේවූ නරකදුක් නිඃශෙෂකොට කියා හඟවාද නොහැකිමැයි.

තවද යමෙක් යමෙකුට ගිනිමැඹ ඉක්මෙන්ට තිබෙන බව දන ගිනියයි කිපමණින්ම ඇසුවහුගේ පාදය දන්නේ නොවෙයි. එබස් අසා වහා පය නොගෙණ ගිනිඇක්ම සිවියහුගේ පය ද මහත් දුකට පැමිණෙන්නේය. එසේම බුදු පසේබුදු ආදි මහ උතුමන්ගේ වචන නොගැන්මෙන් වන්නාවූ, මේ සියලු භයානක නරකදුක් දන භයපත්ව එම උතුමන්ගේ වචන මනාකොට ගැන්මෙන් අත් පත් වන සවඟිමොක්ෂ සම්පත් මහත් බැව් සිත තබා ගෙණ පවි දුරින්ම දුරුකොට හිතයෙන් කිබස් ගෙණ ගිනි නොමැඹි පුරුෂ මෙන් නුවණැති පුරුෂ සියලු නරක දුකින් ගැලවීමට ම උත්සාහ කටයුතු.

තවද යම්සේ කටුවෙන් විදිනලද්දාහුට ගිතෙල් බිඳුව හුණුව වැගිර යන පමණ පිළියම් පිණිසවූ ගින්නෙන් දැවීම යම්තාක්කල්ද එපමණ කල්වත් ඉවසීම යම්සේ උගහටද එසේවූ තැන නොයෙක් වාදහස් නරකයෙහි තීක්ෂ්ණගින්නෙන් එකප්වාලාවද දැ වෙහෙසෙන්නාහුගේ දුක් මෙතෙකැයි පමණකොට කවරෙක් කියන්නේද එසේ එක ගින්නක්ව නරක ගින්නෙන් දැ වෙහෙසෙන ඒ ගිනි රැසක්හු කම්බලයෙන්ම මිය නොගොස් ජීවත්වීම අහෝ විසමය හා කම් නම් දෙයත් ඉතා දරුණු බැව් නොසිතිය යුතුමය.

එසේ හෙයින් කම් විශෙෂය අවිඥතය නො සිතිය යුතුයයි බුදුන් විසින්ම වදරණලදී.

තවද ඉතා මදවූ සවල්පතර සැපයක් පිණිසම ඇසිල්ලකින් සිඳවන අකුශලකර්මයක් කොට ඒ කර්මයාගේ ඵලවිපාක පමණ නැති කල් කර්මඵල භුම්යෙහිලා මෙබඳු මෙනම් ඒ කාරණය සඬර්මයෙන්ම අසා බලා දැන උමතු වියරු නැති කාරණා කාරණා දන්නා මනුෂ්‍ය තෙම මිනිස්ලොව ඇතිතාක් දුක් විඳිමින් පෙලි පෙලි සිට මද ඇසිල්ලක්වත් නපුරු පව් කිරීමෙහි ආදර නො කරන්නේ මැයි. මෙසේ යට කියනලද නරක දුක් සියල්ල විඳීම පාපයෙහි ඵලමය.

එහෙයින් පාප කර්මයන්ගේ ම ඵලහුම් වූ ඒ සියලු නරක දුකට භය ඇත්තවුන් විසින් පව් කිරීමෙහිදු භය ලජ්ජා ඇතිව අකුශලකර්ම කිරීමෙන් දුරින්ම දුරුව සියලු වැඩට කාරණාවූ පින්කම් කිරීමෙහි අප්‍රමාදව උත්සාහ කටයුතු. මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත නරක දුක්. අනුභව කිරීමෙන් දුකකිතවූ අකුශලකර්ම බලවූ පරිද්දෙන් නොයෙක් දුක් විඳිනා සියලු සත්වයන් ඒ වූ පරිද්දෙන් විශෙෂයෙන් දැන කලකිරුණු සිත් ඇතිව දැනගිලාදි අනෙකවිධ කුශලමාගී සෙවීමෙහි යෙදී වාසය කරණ යහපත් සත්පුරුෂ ජනයෝ උතුම් අමෘත මහා නිර්වාණ මාගිය සොයමින් එහි පැමිණ අති භයානක නරක දුක් ආදි සියලු දුක් නැසීමෙන් නිවන් පුරට පැමිණෙත්වා.

ඉති ව අමිතදුක්ඛා දුක්ඛිතෙ සබ්බසත්තෙ
අකුසලබලභූතෙ භූතතො සංවිදිත්වා,
විවිධකුසලමග්ගං මග්ගයන්තානුසූසත්තා
පරමඅමතමග්ගං මග්ගයන්තා භවන්තු.

සියල්ල දත් බුදුන් විසින් පිටතත්‍රය ධර්මයෙහි ඒ ඒ තන්හි දෙශනා කොට වදාළ නරක දුඃඛයන්ගේ මේ දුක්වූයේ සංක්ෂෙප මාත්‍රයෙක. විස්තාරාර්ථයින් විසින් නිමිජාතකාදියෙහි බලා දනයුතු. එම බුදුන් විසින්ම වෂී සියයක් වෂී දහසක් ඔළුඵලෙහි වදාළත් නො ගෙවෙන එසා මහත් භයානක නරක දුක් බෝසත් කලද නිමිරජව තුමූම ගොස් නිරයවල අනෙකප්‍රකාර දුක් විඳිනා නිරිසතුන් මසැසින්ම බලා පාපකර්මාදි සියල්ල විවාරා දැන ලොකයාහට නිරය දුක් දක්වා කරණ ලද අනුශාසනා ඇති හෙයින්ද බුදුවූ කල අඥාවරණවූ සර්ව්වඥතාඥානයට ම පෙණී ගිය එම් නිරයදුක් ප්‍රකාශ කිරීමෙන් දෙව් මිනිසුන් සහිත සියලු ලොකයා හට කරණ ලද උතුම් සබ්ර්මානුශාසනා ඇති හෙයින්ද කරුණාවට ආකරවූ මාගේ බුදුරජාණන් වහන්සේ ශාස්තා නම් වනසේක. එසේ හෙයින් කියනලදමැයි:-

දෙවියකඩ මනුස්සානං ලොකෙ අග්ගඵලං දදං
දදනතං දමයනතානං පුරිසාජඤඤ තෙනමොං-සි.

මෙතෙකින් මේ ශ්‍රී සඩ්ඝීඃවවාද සංග්‍රහයෙහි නරක දුකඛ වර්ණනා කියා නිමවන ලදී. ලෝවැඩ පිණිස කරණ ලද මේ ශ්‍රී සඩ්ඝීඃවවාද සංග්‍රහයෙහි නිරය දුකඛ වර්ණනාවන්ට ඉක්බිතිව තිරිසන් අපාය දුකඛ වර්ණනා මදක් මෙහි දක්වනු ලැබේ.

යම් සත්වකෙනෙක් ඝොරවූ නරකයෙහි පැසීමට නිසි බලවත් වෙෂාධික අකුශලකම් නො කොට තිරිසන් යොනියෙහි උපදින්ට නිසි මොහයෙන් අඛිව බාල ජඩ නපුරු කල්පනායෙන් කටයුතු නො කටයුතු නො දැන හිනාඛ්‍යාශයෙන් පාපකම් කළාහුද, යම් සත්වකෙනෙක් ලොභ වෙෂ මොහ අධිකව යට කියන ලද ක්‍රමයෙන්ම කටයුතු නො කටයුතු නො දැන බලවත් පාපකම් කොට නරකාදි සෙසු අපා දුක් බොහෝ කලක් විඳ එයින් මිදී තිරිසන් අපායෙහිදු ඉපද දුක් විඳීමට නිසිව සිටියාහු වී නම් ඔහුද යන මේ හැමසත්හු තිරිසන් යොනියෙහි ඉපද එකාන්ත අහෙතුකයොනි වන බැවින් එහි දුක් විඳිනාහුයි.

එහි ඔවුන්ගේ අහෙතුයෙන්ම පිළිසිඳ ගන්නා බැවින් අහෙතුක ප්‍රතිසන්ධි වශයෙන් ඒ සියල්ලම එක විධවෙයි. සවභා ඇසින් දක්නට විෂය අවිෂය වශයෙන් විවිධ වන්නාහුයි. ශරීර දික් ලුහුඩුමඛ්‍යම වශයෙන් ත්‍රිවිධ වන්නාහුය. සූක්ෂම්මඛ්‍යම මහත් වශයෙනුදු ත්‍රිවිධ වන්නාහුය. බිජුවෙහිදු වැදෑමස්හිදු බාදියෙහිදු ඔපපාතිකවද යන මේ චතුර්විධවූ උත්පත්ති භෙදයක් ඇත්තාහුය. සියලු තිරශ්චීනයෝ අපාදයෝය ව්පාදයෝය චතුස්පාදයෝය බහුප්පාදයෝය යි සතර ප්‍රකාරයෙක් වන්නාහුය.

එහි අපාදයෝ නම් සම්මත්ස්‍යාදීහුය. ව්පාදයෝ නම් පක්ෂි ජාතීහුය. චතුස්පාදයෝ නම් සිංහ දිවි ඔව මහිසාදීහුය. බහුස්පාද යෝ නම් බොහෝ පා ඇති ගෝඤුඵ ආදි සත්හුය. මේ සියලු තිරිසන්හුම ඔවුනොවුන්ට වෙහෙස කොට ගන්නා සවභාව ඇත්තාහ. එහෙයින් ඔවුන්ගේ රජභවද කිසි කලකත් සැප නැත. ඔවුන් අතුරෙන් ව්‍යාඝ්‍රද උරන් මරා කන්නේය. ගූරුද සපියන් මරා කන්නේය. සපී ගෙමැඹි සතුන් මරා කන්නේය. ගෙමැඹි සත්හුද ක්ෂුද්‍ර ප්‍රාණීන් මරා කන්නේය. මෙසේ ගොඛ වසන සත්හුද යම් සේ ඔවුනොවුන් අනුභව කරන්නාහුද එසේම දියෙහි වසන සත්හුද ඔවුනොවුන් ගොවර කොට ඇත්තාහුයි. එහි මහත්

සත්හු ක්‍ෂුද්‍ර සතුන් අල්වා ගෙණ කන්නාහ. කුඩා සත්හුද අති ක්‍ෂුද්‍ර සතුන් අල්වා ගෙණ කන්නාහ. ඒ කාරණයෙන් ඔහු හැම දෙනම නිරන්තරයෙන් සොක සහිතව පෙළමින් භයට පැමිණීම යනාදි නොයෙක් ඉරියව් පවත්වන්නාහුයි.

මනුෂ්‍යයන් වසන තැන්වලට ඉතා ඈතුරු ප්‍රදේශවල වසන අනෙක ප්‍රකාර තිරිසන් සතුන් අතුරෙන් සම්පොතු මාංශ ඇට දත් අං ආදි ඒ ඒ ප්‍රයෝජන පිණිස මනුෂ්‍යයෝ අනෙක ප්‍රකාර යෙන් බොහෝ සතුන් විනාශයට පමුණු වන්නාහුය. ඒ සත්හු වනාහි තිරිසන් භවයෙහි වූ සියලු දුක් පාපකම් වූ පරිද්දෙන් අනුභව කෙරෙත්. එහෙයින් ගැලවී ගන්නට නො පිළිවන්වූ මහත් දුක් ඇති තීක්ෂණ වූ බලයක් ඇති මහත් භය ඇති සිතින් පහවූ ධර්මසංඥ රාග ඇති සියලුම තිරිසන් ජාතිවල කර්ම බල යෙන් ඉපද ධර්මයෙහි මුළුහවූ ඉවජා ඇති හෙයින් තිරවඡ්ඡන නම්වූ ඒ හැමසත්හුම යහපත්ව කළමනා කටයුත්ත හැර සසරම සිතා සසරම හෙව නිරන්තරයෙන් අකුශල් වඩවඩා පුරා ගණිමින් වසන තිරිසන් සතුන්ගේ ජාති ගණන පවා දැක්වීම් කාතාර්ත්‍යවූ සියල්ල දත් බුදුහුදු විසින් දුස්කරය. එසේ කල ඒ පැවති දුක් එක් කොට කවරෙක් වර්ණනා කරන්නේද? නො හැකිමැයි.

මෙසේ මෙසේ දුක් හා ජාති මෙතෙකැයි පමණ කොට ගත නො හැකි ඒ තිරිසන් සත්හු කුණුවූ මාංශයෙහිද වුණයෙහිද කැකියන අසුචියෙහිද දුගඳබව පැන නැඟී සිට අසුචි හා මිශ්‍රවූ මොලංකතද ගවරවලේද කසලගොඩද වැසිකිළියෙහිද දෙනියෙහි ද ගෙවල්හිද ග්‍රාමයෙහිද ක්ෂේත්‍රයෙහිද පළිතයෙහිද කදුරැලියෙහිද ගල්ගුහායෙහිද පොළොව ඇතුලෙහිද ආකාශයෙහිද ජලයෙහිද යම්කිසි කුණු දෙසක්හිදු සියලු සතුන්ගේ ශරීර ඇතුළෙහිදු යනාදි නොයෙක් තැන උපදනාහුයි.

එසින් එක මිනිසෙකුගේ ශරීරයෙහි උපදනා පණුවන් කුල ගණනායෙන් අසුදහසක් කුලවල පණුවෝ ඇත්තාහුයි සෙසු තැන් කියයුතු කිම්? මෙසේ උපදනා තිරිසන් ජාති අතුරෙන්, ඇසට නො පෙණෙන තිරිසනුන් පවන් ගෙණ පන්සියයක් ගොදුන් දිග ඇති තිමිරපිඹුල නම් මහමසුන් දක්වා අනෙක ප්‍රකාර ඇතිව ඉපද කාමතෘෂ්ණා ගොවර තෘෂ්ණා පුරණ සිතින් බොහෝ පව් පුරා ගෙණ මරණ භයින් නිරන්තරයෙන් භයපත්ව සිට වැදි කෙවුල් ආදීන් විසින්ද බවුකොවුන් විසින්ද ජීවිත විනාශයට පැමිණීමෙන් බොහෝ දුක් අනුභව කරන්නාහුයි.

මේ ආදි ක්‍රමයෙන් දුක් විඳිනා තිරිසන් සත්ත්ව අනන්ත බව එසෙකි මිනිසෙකුගේ ශරීරයෙහි අසුදහසක් අසුදහසක් පණුවෝ ඇත්තාහුයයි වදුල හෙයින්ද එකතුඔසක වසන වේයන් අපමණ හෙයින්ද මූහුදින් අල්ලා ගොඹලන කුඹාසතුන්ගේ රාශිය අපමණ හෙයින්දැයි යනාදි වශයෙන් තිරිසන් යොනියෙහි සතුන් අපමණ බව දතයුතු. තවද සියලු අසූවියට ආකරවූ මේ ශරීරයෙහි වසන පණුකැලට වදන ගෙයද වැඩීමටද ඛබරවද සිපීමවද ඇවිදීමටද හෙව සැතපීමටද බවුන්ට ගොදුරුද වැඩිකිළිද ගිලන්හලවද හොඟ ඓශ්වර්‍යය ආධිපත්‍යාදිය පැවැත්වීමට නිසි භූමිද මල ශරීර දවන සොහොනද යන මේ ආදි සියලු කාරණයටම මේ ශරීරයම සථාන වන බැවින් විදර්ශනාඥන භාවනා පුරුදු කළ්‍හු නුවණැසින් බලා මේ ශරීරයෙහි ආලය නොකෙරෙත්.

තවද අකුශල කර්මයන්ගේ භෙද වශයෙන්ම අනෙක ප්‍රකාරව සිටි තිරිසන් ජාතීන් අතුරෙන් සමහර සත්තෙනෙක් දරුවන් ලබති. සමහර සත්තෙනෙක් උපදිති. සමහරෙක් ඇවිදිති. සමහරෙක් ගොදුරුකෑ ඇවිදිති, සමහරෙක් කාමසෙවනය කෙරෙති. සමහරෙක් හොවති, සමහරෙක් මරණයට පැමිණෙත්.

තවද අනිශයින්ම අසූවියෙහිම ඉපද එයම අනුභව කරණ සුලු සතුන්ගේ සවභාව සිතිමෙනුදු ත්‍රර්ද්දි උපදවන්නේය එසේ සිතන්නවුන්ට පවා පිළිකුල් බව උපදවන සතුන්ගේ ප්‍රකාර කිමෙන් ප්‍රයෝජන කිම,-තවද ගවදෙනුන් ආදිහු අධිකතර හුණුදිය වත්කිරීම් ආදි නොයෙක් ප්‍රයොග කිරීමෙන් ඇඟ සම් ලොලන දුකින් වෙවුලමින් යම් දුකකට පැමිණෙද්ද ඒ දුකට කුමක් උපමා කෙරේද?-තවද පක්ෂීහු ඇස්දෙක විදහා බිම්බලා එල්වා ගෙණ මරණ පිණිස ගෙණයන කල යම් දුකකට පැමිණෙද්ද?-දිවි ඇතිවම හුණුදියෙහි බහාලා පිසන කල යම් දුකකට පැමිණෙද්ද?-ඒ දුක් කවරෙක් පමණ කෙරේද?-තවද කිසියම් කලෙකවත් ගොඹහුදුවූ එසේම නොසිදුනු දියෙහි ඇලි වාසය කළ ප්‍රාණීන් කරුණා නැති මිනිසුන් විසින් දිවි ඇතිව ම තිබියදී ගොඹට නගා රුක්ෂවූ වියලි පස්හි දමන ලදුව ගලින් මත්තෙහි වතුරුවා පයෙන් මිරිකි මෙන් වෙහෙස විඳ උපන් දුකින් හා සිත් නැවිලි දුකින් පිඩිතව බලවත් සාපිපාස දෙකින් පෙළිපෙළි ඉතා බැගෑව කොදුරමින් මවුන් පියන් නැයන් හා එක්වද ඇසිල්ලකවත් නොර කොට ගත නො හැකි දුකඛවේදනා ඇත්තාහුගි.

තවද ලෙව්හි සක්කැබෙල්ල ගසන සත්ත්‍ව යම් දුකෙක් ලබද්ද ඔවුන්ගේ ඒ දුකඛයෙහි අඛ්‍යයෙන් අඛ්‍යයකුදු දක්වන්නට නො

හැක්කෙමි තවද ඇතැම් සත්ත්වයෙක් දණ්ඩෙන්ද අංකුසයෙන්ද සැමිටියෙන්ද පහර ලබමින් කෙවිටෙනුදු විඳුඹෙනුදු අතිනුදු ඇන තැතිගන්වා බම්බාලද්දහු නොයෙක් රුහැණින් බඳනා ලදින් තමන්ගේ සිත්සේ ඇවිදීමක් නොලැබ තම තමා කළකම් යෙන්ම බන්ධනාදි නොයෙක් දුකට පැමිණෙන ලද්දහු තුමූ බලා ඇවිදද සිටද අඥතුක යොනියේ සිටිබැවින් දුර්ල සත්ත්වයන්වම සමගම ඔවුන් සිත්සේ බර උසුලති; යම්කෙනෙකුන්ගේ සියලු පැව තුම් අනුන් අයිනිද සිත්සේ හැසිරීමක් නැද්ද ඔවුන්ගේ දුකඛයා ගේ ප්‍රමාණය ඔවුන් කෙරෙන් පිටත් කවරෙක් නම් දන්නේද?- තවද ඇතම් සත්ත්වයෙක් රථවුරයෙහිද තහුලෙහිද ගැල්හිද යනාදි වශයෙන් නොයෙක් ප්‍රකාර බර ඉසිලීමෙහි යොදනලද්දහු වුණ ඇතිකද ඇතිවද බ නැතිවද නොලස්ව සිටි කල්හි දණ්ඩෙන් කෙවිටෙන් වෙහෙසදී බම්බාලද්දහු ඉතා අධිකබරද එවිට මහත් ආයාසයෙන් උසුලන්නාහුයි, එකල්හි ඔහු "මේ බර උසුලන්නට නොපිළිවනැ" යි කියාද ශ්‍රීෂ්මයයි කියාද බඩගිනියයි කියාද පිපාස යයි කියාද අධිකබරුයි කියාද යනාදි නොයෙක් අදෝනා කියන් නටවත් නොපිළිවන් මේ තිරිසන් යොනියෙහි යම්සත්ත්වයෙක් නත ශක්තිනැද්ද එසේවූ දුර්ලයන්වද නොඉසිලියහැකිවූ මහාබර නඟා උසුලන්ට අසමර්ථව සිටි කල්හි නැවත නැවත තලති, නඟා යෙහි රැගෙණ අදිති, වාලඝියද හකුළුවාලා මිරිකති, කෙව්වින් විදිති, විළඹින් පහරති; වාලඝිමූලය පතුය හොටය පිටය බඩය ඇලය යනාදි තන්හි දු ගින්නෙන් දවති. කන් කපති. දඬුමුගුරු ආදීන් බමති. හැම පරිද්දෙන් ම පලහා දවති. කැමිටෙන් හිරි ද ඇදපියත්. එ කල්හි ඔහු භයපත් ව නැගී සිටීමට අසමර්ථ ව හොත්තාහු යම් දුකකට පැමිණෙද්ද, ඒ දුක් කවරෙක් කියා ද? තවද මේ තිරිසන්යොනියෙහි ලෝවැස්සන් විසින් මේ තෙම දෙවතාවාහනය යි කියා උතුම් කොට දක්වනලද රසයන් අතුරෙන් අශ්‍රුවූ කිරි ද ඝෘතයන් ද දීමෙන් මවක සේ ය යි ආදරයෙන් පෝෂ්‍ය කරණලද මිනිස්නට රක්ෂායෙහි සහාය බැවින් මනොඥය යි කියා ද මඛඵල සම්මතය යි කියා ද පවිත්‍රඵල යි කියා ද ශුචි දෙන්නීය යි කියා ද මෝවුන් දුට හඬ ඇසුව ශරීරයෙහි අන්ලුව ඕහට ඵලපත් වන්නේය යි කියා යම් ගව කෙනෙක් ලෝවැසියා විසින් සලකන ලද ද එසේ මඛඵල සම්මතවූ ඔවුන්ගේ දුක් පමණ කොට ගත නොහැකි කල ඒ තිරිසන් යොනියෙහි සෙසු සතුන් කෙරෙහි ඇති දුක් කියයුතු කිම? ඒ එසේ මැයි.

ලොකයෙහි මඛඵල සම්මතවූ ගවදෙන් ආදීහු කතුයෙහි පය බැඳ වට සිසාරා ගිනිකොට පිපාසිත වූවන් නැවත නො පියහැකිවූ ලුණුදිය පොවා විරෙවණ ව කියකල අතිදුකඛයට හෙතුවූ ඉතා දුක

සේ කුළුදිය පොවා මහත් දණ්ඩින් දයාකරුණා නැතිව තලා දැඩි දුහඟෙන් දනුලබන ගොන් දෙන් ආදිහු මහත් දුහඟෙන් වීඩාව මිරිකී පාපයෙන්වූ ඵලවිපාක වශඟෙන් දක්නාහු විස්මයතරව මරණභයින් භයපත්ව හඬ ඇතිව හඬන්නාහු එක්කොට මියුඩුහුරු ලන්නාහු මලානික බැඟැවූ මුහුණු ඇතිව ඔබමොබ බලමින් අපමණ දුකින් තැවෙන්නාහුයි.

මෙසේ තිරිසන්යොනියෙහිලා ඇසිමෙහිදු දුෂ්කරවූ නොඉවසිය හැකි යම්දුකෙක් අනුභව කෙරෙද්ද ඒ දුක්ති තමාගේ ලය පැලියන්නාක්මෙන් ලොව සියල්ලන් විසින් අනුකම්පා කටයුතුවූ බාල බැවිහි පවත්නා යම් කරුණාවෙක් ඇද්ද ඒ කරුණා නොමෝ තිරිසන් ජාතියෙහි පැමිණියවුන්ට මැයි, ඒ කාරණ හෙයින් කිසේදැයි නුවණැත්තෙක් කියානම් හේමෙසේ දතයුතු.

ඔවුන්ගෙන් මදමද ඇසිල්ලකුදු වෙන්විය නොහැකි තිරිසන් යොනියෙහි පැටහු අසරණව ඉතාලදරුහෙයින් දුවිලව උපන් තැන ම හොත්නාහු උදැසනම නික්ම ගියමැනියෝ කුමකින් නොපෙණේදෝ මාගේ පැටහු ඇතයන සිතිවිල්ලකුදු ඇට නැද්දෝගෝයි සිතා කොදුරමින් බැඟැවූ ඇස් ඇති මැනියන්දිහාවට ඒ එන මවගේ ශරීරගඤ්ඡ අසනපිණිස හිඹිනාහු සවස්වේලෙහි ගොදුරුබිමින් ආ මව දකිමින් ප්‍රීතියෙන් ඉපිළුණු බැවින් සතුටුව මව, අභිමුඛව දිවෙති, එසේ දිවගොස් මාතෘප්‍රේමයෙන් මව සිසාරා පනිමින් කන් හා වාලඛිය සනලීලායෙන් ඒ ඔවුන් බඹ ස.ඟ බැවින් අපගේ මෙයයි සිතා කිරි බොන්නට ලඟවුවත් බාලදරුවන් විසින් හිස් සලසලා හැඩීම සෙනහයෙන් බලනකල්හි පුත්‍රප්‍රේමය පවා හැර එම මවු තොමෝ ඉතා රෞද්‍රවූ දැඩිබැව් පිහිටා එකෙණෙහි අනිකකමෙන් දරුපිළවුන් හඬව හඬවා වෙවලව වෙවුලමින් සිටියදී ඉදින් කානම් එසෙවු තිරිසන් ජාතියෙහි ඇති බිය මෙයින් මත්තෙහි කියයුතු කිම? මෙසේ යම්තැනක දරුවන්ට මවකෙරෙන්පවා මහත්දුක්බව පැමිණේ එසේවූ තිරිසන් යොනියෙහි දුක් කෙළවරක් නැත්තේය. ඉතා මදවූ හෝ ලජ්ජාවෙද්ද ධම්මය යන සිත පමණකුදු මේ තොකට යුක්තකැයි කියාද යන කිසියම් කල්පනාවෙක් ඔවුන්කෙරෙහි නැත්තේය, එසේවූ තිරිසන් යොනියෙන් ගැලවීමක් කෙසේවේද? මෙසේ ගැලවී ගැන්මට නොපිළිවන්වූ නිරන්තරයෙන් උද්වෙගවූ මහත්දුක් ඇති අන්‍යොන්‍යභක්ෂවූ ශාන්තකමක් නැත්තාවූ මොහ නමැති දැලින් බැඳී මුලා බැවින් අනුවණීන්ම වළඳනාලද සියලු අනර්ථ අවැඩ එක්වූ රැසක් බදුවූ තිරවඡ්ඡනය යන නම් ඇති මේ භවඝ සසර ඇවිදිනා වතුස්සත්‍යය නොදන් යටත්පිරිසෙයින්

සෝවාන් මාගීඵක්වත් නොලත් කෙලෙස් සහිතසත්වයන්ට නොකැමැති පරිද්දෙන්ම තිරිසන්යෝනියට යාම නියතමය, එසේ නැතයන නිසැකයක් නැතිහෙයින් නොකැමැතිසේම තිරිසන් ජාති වලඉපදීම සසරප්‍රමාදව සිටිනා සත්වයන්ට නිත්‍යයෙන්ම වන්නේ යයි දැන නිරන්තයෙන් සංවෙගයට පැමිණ භයපත්වූ සිත් ඇති සත්වතෙම මේ සියලු තිරිසන් අපායට යනමාගිවූ අකුශලකම්පථ පරිවේජදයෙහි ප්‍රකාශ සියලු පාපකම්යන්ට මුල්ව සිටි සියලු අවැඩට මුල්වූ අවිද්‍යායයි කියනලද මෝහය දුරුකරණ පිණිස ඇදි කඩ ඖස ගිනිගත්තෙක් ඒ ගිනිවන්ට වහාකරණ උත්සාහයක් මෙන් අප්‍රමාදව බණ ඇසීමෙන් හා ඒ දහම්වූ පරිද්දෙන් සිත තබාගෙණ මෙබදු සියලු දුකින් මුදු සියලු වැඩට පමුණුවන උතුම් බුඩාශාසනා පිළිපැදීමෙන් අඛ්ඩාලඅකල්‍යාණ සියලු වැඩ සාධාදීමට සහාවූ අසත්පුරුෂජනසෙවනයෙන්දුරුව කල්‍යාණපාඨග්ජනසෙවන යෙන්යෙදි එබදු මිත්‍රයන්ගේම සෙවනභජන පයුරුපාසනාදිය කිරීමෙන් හා බවුන් කී අවවාද මුදුතෙන් පිළිගෙණ සඩම්ශ්‍රවණාදියෙන් අපායමාගීවූ සියලු අකුශලයන්ට මුල්වූ මෝහය දුරුකොට නුවණැති පණ්ඩිත බවට පැමිණ සෝවාන් ආදී මාගීඵල උපදවන පිණිස අප්‍රමාදව උත්සාහ කටයුතු.

මෙසේවූ ප්‍රමාණාතික්‍රාන්ත දුකින් ගැලවීගත් තිරිසන් ජාතිවල ඇති සියලුම දුක් එකාන්තයෙන් දුක්වන්නේයයි දැන ඒ දුකින් මිදෙනු කැමති යහපත් සත්පුරුෂ ජනසමූහයෝම දැනාදී පින්කම් කිරීමෙහි අප්‍රමාදවයෙදී ශ්‍රෙෂ්ඨවූ නිවන්පුරයටම පැමිණෙත්වා

එවං තිරච්ඡානභවෙසු දුක්ඛං
දුක්ඛන්ති ඤත්වා ජනතා සුසන්තා,
පුඤ්ඤේසු දානාදිසු අප්පමත්තා
පපොන්තු නිබ්බාණපුරංව සෙඨං—යි.

ඇසු සත්තට සංවේග උපදනාසේ තිරිසන් ජාතිවල දුක්ප්‍රකාශ කිරීමෙන් දෙවිමිනිසුන් සහිත සියලු ලොකයාහට කරණලද සඩම්ශාසනා ඇති හෙයින් සවුනේ ගෙවා දත් මාගේ බුදුරජානන් වහන්සේ ශාස්තා නම් වන සේක, එසේ හෙයින් කියනලදි:-

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දම්මන්තානං පුරිසාජඤ්ඤ තෙ නමෝ—යි.

මෙතෙකින්මේ ශ්‍රී සඩම්ශවවාද සංග්‍රහයෙහි තිරච්ඡාන දුක්ඛවණ්ණා කියා නිමවනලදි. ලෝවැඩපිණිස කරණලද මේ ශ්‍රී සඩම්ශව

වෘද්ධ සංග්‍රහයෙහි නිරවශේෂ දුක්ඛවර්ණනාවට ඉක්බිති ව ප්‍රෙතදුක්ඛ වර්ණනා තොමෝ මදක් මෙහි දක්වනු ලැබේ.

යම් සත්ව කෙනෙක් තමන්ගේ ශක්තිවූ පරිද්දෙන් හොග බල පමණින් දන් නොදෙන්නාහු ද, ඊර්ෂ්‍යා ඔහුල ද තමාගේ සම්පත් සහවන සවභාව ඇත්තේ ද ඔහු ගැමදෙන ද, යම් සත්ව කෙනෙක් නරකාදී සතරඅපා දුක් විඳීමට නියි බලවත් පව් කළාහු ද ඔහු ද යන මේ සියල්ල ප්‍රෙතඅපායෙහි ඉපද එහි අනන්ත දුක් අනුභව කෙරෙත්. එහි සත්වයා අනන්ත අප්‍රමාණ දුක් විද වෙහෙසීමෙන් රැස්කළාවූ සියලු සම්පත්තියෙහි ලොභයෙන් සිත බැඳුනු සත්වයා මරණින් මත්තෙහි ප්‍රෙතභවයට පමුණුවන්නාහු වීනම්, එසේවූ වස්තූන්ට සම්පත්තියෙක අභියෙක කියා ලෝවැසි තෙම කුමක් පිණිස කියා ද ආදී මඛ්‍ය අනන්ත හැමතන්හි ම මේ අභියෙක වැඩෙකැ යි කියා සපයන සම්පත්තිහු ඒ සවාමියාට දුක් ඵලවන්නාහු යි. එහි ප්‍රෙතයෝ නම් සවකීයවූ තම තමා විසින් කරණලද පාපකාමයෙන් වැලකී ගිය බත් පැන් ඇති ව අලස නොව එක් තෙනක වැදගෙව සැතපීමක් නැති ව කෙසේ ආහාර යක් ලබම්දෝ හෝ යි බබින් මොබ මොබින් බබ ඇවිදිනා හෙයින් ප්‍රෙතයෙහ යි ලද නම් ඇති ඔහු ක්ෂුධා පිපාස දෙකින් පීඩිත ව මිරිකී ගිය ඉනා කෘශවූ ශරීරය හා මහත් හිස් ඇත්තාහු එසේ ම දෘශ්‍යමාන ව පෙණෙන ඇටසැකිලි ඇති තුනීවූ අතුරු ඇති මහපලඇට හා කොදු ඇට ඇති අධිකතර බඩසා දුකින් පීඩිත හෙයින් පිටකොදුඇටයෙහි ඇලිපියා තිබෙන ඉනා වියලීගිය බඩසම් ඇති මූහුණුකරා ම ඉනා වියලීගිය ඉනා ලා ලබුපලයක් සෙයින් රැලිහුනු හැකිලගිය පිඩහැට ඇති ඇට සම් නහර ම ඉතිරි ව තිබෙන ශරීර ඇති ඉනා වල ව තිබෙන ඇස් හා යපොල ඇති දික් ව අවුල්වූ හිස කෙසින් අදුරු ව මූවහ කරණලද මූහුණු ඇති ඉනා දික්වූ කකිශ හිසලොම් හා ශරීරයෙහි ලොම් හා නියපොතු ඇති රෞද්‍රවූ තීක්ෂ්ණ වර්ණ ව රැලිහුනු ශරීර ඇති ලොකයෙහි හැම රුව නැති විරූප වස්තු එක්කොට කැපි කළාක් වැනි ප්‍රෙත තෙම පශ්චාත්කෘප දුකෙන් අනිශයින් ම වියලනලද ද දුවුදුවුවන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් පෙණෙන ශ්‍රියා නැති දැක බලා සසර කලකිරීමට නිසිවූ නොවසන ලද රහස් පියෙස් ඇති කම්බලයෙන් ම බත් විකක් පැන් විකක් නොලබා බඩගින්නෙන් ම පීඩිත ව මහත් විබාවෙන් සයනය කරන්නාහු යි.

එසේ හොත් ප්‍රෙතයන්ට නොයෙක් වාදහස් ගියකල බවුන්ගේ ම කම්බලයෙන් ඈසා වැඩිවීමට නිසිවූ "මොබ එව බත් කව පැන් බොව" යි යන තුවිඡවූ ප්‍රයෝජන නැති ඕස්වූ ශබ්දයෙක් ඇසෙයි. එකල්හි ඒ හඬ ඇසූ හැමදෙන ම සතුටු ව නැගීසිටිනට අසමර්ථ ව බත්

පැන් ලබන ආසාගෙන් ඔවුනොවුන් ඇඟ එල්ලිගෙණ මහත් දුකින් නැගී සිටින්.මෙසේ නැගී සිටීමෙහි ලස්වූ ඒ ප්‍රේතයෝ මහත් දුකට පැමිණ සිටිනට අසමර්ථ ව ශක්ති නැති බැවින් වැටී හොත්නාහු ඔවුනොවුන් ඇඟ එල්ලී ගත් කල අත ගලවා හරින්. එ කල්හි දුර්වල ව වෙවුලා තමා බලවත් ව නො සිට එලෙසි. අහෝ විස්මය හා නො කරුණා නැත්තෙහි කියා නොයෙක් නැලවිලි පවත්වා එසේ නැගී නැවත ගෙන්නාහු දියෙහි පෙණෙන ඡායාව සේ බල නැති බැවින් වළඳුල ව ඔවුන් පළමු සේ ම නො ලත් ලාභයෙහි පැවති තෘෂ්ණා තෙමෝ යට කියනලද ක්‍රමයෙන් ම නැවත නැවත ත් තගා සිටුවා මහත් දුක් දෙන්නිය. ඇටසැකිළි මාත්‍රවූ ඒ ප්‍රේතයන්ගේ ලාභාසා නැගී සිටින කල විඳිනා දුක් කරුණා ඇති උතුමෙක් ජීවිතය කෙසේ උසුලන්නේ ද, දිවි පිදීමෙන් ඒ දුකින් මුදා හරිනට උත්සාහ කරන්නේමය.

ඛතෑ සි කියා ද පෑනෑ සි කියා ද ඇසූ මේ ශබ්දය "පෙර නො ඇසූ දිව්‍යස්වරයක් මෙන් අපූර්වවූ වර්ණයක් උපන් තැන් පටන් අද අන්තාලදැ" සි යන සොම්නස් වචන කියමින් ම දෙහොත් බැඳගෙණ තමන්ට බත් පැන් ආදී වස්තුවක් දෙන්නාක්හු නො දැක ම එ දිග සොයාදුවත්, එ කල්හි මද ඇසිල්ලකින් ම ඒ ප්‍රේතයන්ට විඩා කරණ නැත යන හඬකුදු ගිනි ගත් කල අයසලාකයක් සෙයින් කණියන් විදිද් ද, ඒ එසේ මැ සි.

පෙර ඒ සත්හු මිනිස්පියෙහි සිටි කල දන් දෙන්ට සුදුසු දැනොපකරණ වස්තු ඇති ව ම සිට යාචකාදීන් පැමිණි තැන නැතැ සි කියා පිටත් කොට හරිමින් සියලු අවැබට මුල් ව සිටි ලොභමය අකුශලයාගේ උත්පත්තියට සථානවූ සම්පත්තිය ම රැක්කාහු ද එහෙයින් ඔහු ප්‍රේත ව උපන් කල ඉතා දරුණුවූ නැත යන ශබ්දය අසා වෙහෙසෙන්නාහු සි. ඒ ප්‍රේතයෝ සවභාවයෙන් ම දුර්වල ව විසාදයෙන් පරිශ්‍රානන ව සිඳීගිය ආසාතෘෂ්ණා ඇති ව සිහිමුලා වූවාහු මුලින් කපනලද තල්රුක්ක් සෙයින් බිම වැතිර ගණිත්. ලොකයෙහි එක්දවසෙක්හි වූ සුන්බතින් වන යම්සා දුකක් ඇද්ද හෙ ද නො ඉවසියහැක්ක. එසේවූ කල ප්‍රේතයන්ගේ කම්බලයෙන් බොහෝ කල් එහි විඳිනා සා පිපාස දුක් කවරෙක් සිතන්නේ ද? ඇතැම් ප්‍රේත කෙනෙකුන්ගේ රොමකූප යෙන් නැගි ගිනිජ්ල පන්තිහු තමා ආශ්‍රයකොට ම ධරා සිටිනා අග්නිජ්වාලා සෙයින් නිරන්තරයෙන් ඔහුගේ සියලු ශරීරය ඇතුළත බැසගින්නෙන් ද පිටත ශරීරයෙන් නැගි ගින්නෙන් ද සිත පශ්චාත්තාප දුකින් ද හැම වේලෙහි ම දවයි. එසේ ද ඇ සිටත් කම්බලයෙන් මිය නො යෙත්.

තවද ලෝවැස්සන් විසින් ඉතා පිළිකුල් කටයුතුවූ එසේ පිළිකුල් කෙසින් ම ශරීරයෙහි ධාරා නො තබා නසාපියා මුවෙන් දමනලද සෙම් ද වැදුවන්ගේ ගර්හමල ද මෙකී දෙසින් පිටත් අතිත් යම් අපවිත්‍රයෙක් අසුවියෙක් ඇද්ද ඒ ඒ කුණු පිණිස ඒ ප්‍රෙතයෝ නොයෙක් යොදුන් ගණන් දිවන්නාහු ඔවුනොවුන් පැහැර උදුරාගෙණ ද ඇතැම්හු මදවූ කුණක් උත්සාහයෙන් ලබති. ඇතැම්හු එපමණත් නො ලබති. අහෝ ප්‍රෙතයන්ගේ කම්බලයන මහත. ඔවුන්ට ලොකයෙහි ප්‍රකෘති ශීතල ජාායා සියල්ල ම විපර්‍යාස බවට පැමිණෙත්. මෙසේවූ ප්‍රෙතලොකයෙහිත් කෙළවරක් නැති දුක් කෙළවරවූ ජීවත්වීම ඇත්තාහු කෙසේ වණිනා කෙරෙද්ද, නො පිළිවන් මය. මෙසේ සාමාන්‍යවූ ප්‍රෙතදුකඛවණිනා සංක්ෂෙප යෙන් දක්වා මෙයින් මත්තෙහි මිනිස්පිය ලත්කල කරණලද ඒ ඒ අකුශලකම්වූ පරිදිදෙන් ප්‍රෙත ව ඉපද විඳිනා දුක්විශෙෂ හා එසේ ම පාපකම්දිනාව ප්‍රකාශ ප්‍රෙතවස්තූහු දක්වනු ලැබත්.

කිසේයයත්?-ගවයන් මරා මිය එ පවින් නරකයේ ඉපද නොයෙක් වා දහස් නරකදුක් අනුභව කොට එයින් මිදී අවශෙෂ ව සිටි කම්බලයෙන් ලේ මාංශ නැති ව ඇටසැකිල්ලක් සේ ප්‍රෙත ව ඉපද එහි දුක් විඳිමය. පක්ෂීන් මරා මිය එ පවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් දුක්විඳ එයින් මිදී ගියකල ශෙෂකම්බලයෙන් මස්පිඬක් සේ එහි ඉපද දුක් විඳිමය. එළුවන් මරා මිය එ පවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් නරකදුක් අනුභව කොට ශෙෂකම්බලයෙන් ඡවි නැති මස් රුසක් බදුවූ ප්‍රෙත ව ඉපද දුක් විඳිමත්,එසේ උන්නත් ගිජුන් ද උස්සෝ ද ලොහොතුඩු වැනි තුඩින් හඹව හඹවා ලුහු බැඳ විදිමින් ගනාදී නොයෙක් වා දහස් දුක් දෙන්නාහුය. සූරන් මරා මිය එ පවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් පැසී දුක් අනුභව කොට ශෙෂ ව සිටි කම්බලයෙන් අඛයට වැනි ලොම් ඇති ව ප්‍රෙත ව උපන්නාහු ඒ අඛයට වැනි ලොම් අහසට නැගි නැගි හිමෙන් ඔවුන් ම විඳි ඒ දුක් ඉවසාගත නො හී මහහඬින් හඬහඬා නොයෙක් වා දහස් මහදුක් අනුභව කෙරෙත්. වධයට සම්ප්‍රාප්තවූ සත්වයන්ට නොයෙක් කම් කටුළු සලස්වාලා දුක් දුන්නාකු මිය එ පවින් නරකයෙහි නොයෙක් වා දහස් පැසී ශෙෂ ව සිටි කම්බලයෙන් ප්‍රෙත ව උපන්නත්ගේ සියලු ශරීර යෙහි දඩු වැනි ලොම් ඇති වෙයි. ඒ ලොම් අහසට නැගි නැගි ඔහු ම විදිත්. ඒ දුක් ඉවසාගත නො හී මහහඬින් හඬහඬා නොයෙක් වා දහස් මුළුල්ලෙහි මහදුක් අනුභව කෙරෙත්. කේලාම් කියා මිය එ පවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් පැසී එයින් මිදී ප්‍රෙත ව උපන්නාහුගේ සකලශරීරයෙහි ලොම් ඉදික ටු වැනිවෙයි. ඒ ලොම් අහසට නැගී නැගි ඉස්මුදුනෙන්

වැද මූඛයෙන් නික්ම යෙයි, මූඛයෙන් වැද ලැම්බියෙන් නික්ම යෙයි, ලැම්බියෙන් වැද උදරයෙන් නික්මයෙයි, උදරයෙන් වැද කලවයෙන් නික්මයෙයි, කලවයෙන් වැද සිහින් කකුලෙන් නික්ම යෙයි, සිහින් කකුලෙන් වැද දෙපතුලෙන් නික්මියෙයි, එහි ඒ දුක් ඉවසාගත නොහි මහ හඬින් හඬහඩා නොයෙක්වා මහදුක් අනුභව කෙරෙත්.

නොමද අය හා දඩගෙණ අධම්යෙන් ගම්වැසියන්ට වෙහෙස දුන් ගම්ලද්දෝ එපවින් නරකයෙහි නොයෙක්වාදහස් දුක් විඳ එපවින් මිදී හියකල අවශෙෂ කම් බලයෙන් මහ දියකල සා අණ්ඩ ඇතිව ප්‍රෙතව උපදිති, හෙතෙම එත්යත් ඒ අණ්ඩයද සරි යෙන් උසුලාගෙණ ඇවිදින්ය, හිදින්ෙ වි නම් එම අණ්ඩයෙහිම හිදිති, හිජ්ජුද උකුසෝද ලොහොතුඩු වැනි තුඩින් හඬව හඬවා විදිති, මෙසේ නොයෙක්වාදහස් මුළුල්ලෙහි මහදුක් අනුභව කෙරෙත්.

පරදාරකම්ය කොට මිය එපවින් නරකයෙහි ඉපද නොයෙක් වා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතයොනියෙහි ඉපද ඉසදක්වා ගැලියන අසූවිවලෙහි හි නොයෙක්වා දහස්මහදුක් අනුභව කෙරෙත්.

අසූවි කවයි කියා අනුන්ට බැණ මිය එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතව ඉපද අසූවිවළේ වැටී එම අනුභව කරමින් මහත් දුක් අනුභව කෙරෙත්.

ස්ත්‍රීහු තමන් සවාමියන් කෙරෙන් පිටත් සෙසු පුරුෂයන් හා අසඩම්යෙහි යෙදී එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නරකදුක් අනුභවකොට එයින් මිදී දිවිතැනි ප්‍රෙතිව ඉපද හිජ්ජුද උකුසෝද ලොහොතුඩු වැනි තුඩින් හඬව හඬවා විද මහදුක් දෙත්.

දේවගැනිකම්කොට ලෝවැසියන්ට තොපගේ දුක් දුරලම් යනාදිසේකිමෙන් ලොවතලවා කැවාහු මිය එපවින් දුගතිඛ විරූපවූ බැලිය නොහැකි භයානක වේස ඇති ප්‍රෙතව ඉපද බඩසාගින්නේ හා පිපාසාවෙන් පිඩිතව මහදුක් විඳිත්.

සොරකම් කොට මිය නරකයෙහි ඉපද නොයෙක්වාදහස් නරකදුක් අනුභවකොට එයින් මිදී හියකල හිස්නැති කවඩ ප්‍රෙතව උපදිති, හිජ්ජුද උකුසෝද ලොහතුඩු වැනි තුඩින් විද මහ දුක්දෙත්, ඒ දුක් ඉවසා ගත නොහි මහ හඬින් හඬ හඬා පැසෙති.

සිලවන්ත තැන්වලට නීඝපරුෂ බැණ එපවින් නරකයෙහි ඉපද නොයෙක්වාරුත්ගස් නරකයෙහි පැසී එයින් චුත ව සූකරමුඛ ප්‍රෙත වශඉපද ඛුප්පිපාසාදෙකින් පීඩිතවාමහදුක් අනුභව කෙරෙති.

කේලාම් කියා ඝගුන් ඔවුනොවුන් කෙරෙහි බිඳුවා මිය එපවින් නරකයෙහි ඉපද පොළෝ එක්යොදුන් තුන්ගව්වක් වඛනා තාක් නරකයෙහි පැසී එයින් මිදී අවශෙෂවූ කම්බලයෙන් ප්‍රෙතව ඉපද විරූපවූ අවලක්ෂණ පූතිමුඛ අසූචි වැහෙන මුඛ ඇතිව එහි උපන් පණුවන් හා දුගීන්ධව බඛසාගින්නෙන් හා පිපාසයෙන් පීඩිතව නොයෙක් වා දහස් දුක් අනුභව කෙරෙත්.

බත්දෙන්නාක් නොපට අසූචි වෙවසි බැණ පිළිදෙන්නන් නෙල පිළි නොපට යපට වෙවසි බැණ මිය ප්‍රෙතයොනියෙහි ඉපද විරූපව අවලක්ෂණව ඛාපිපාසාදෙකින් පීඩිතව නග්නවූ ශරීරඇතිව මහත් දුක් අනුභව කෙරෙත්, ඔවුන්ට දිව්‍යභොජන දුනද ඒ හැම අසූචිවෙයි, දිව්‍යවස්ත්‍රාලදද ගිනිගෙණ දිලියෙන යපව වෙයි.

අනුන්ට දෙන දානාදි උපකාර වස්තූන් දැක අසා දැන ලබන්නන් කෙරෙහි උපන් ක්‍රොධයකින් හෝ තමාගේ කැමතිලෙස අන් කෙනෙකුට පිරිනමා දෙන පිණිස හෝ තමන් සිත්සේ ඔවුන්ට නොදෙව මෝහට දෙව යනාදි වශයෙන් කියා අනුන් ලබන ලාභ වැලකුවාහු මිය එපවින් ප්‍රෙතව ඉපද දුටුදුටුවුන්ට ඉතා පිළිකුල් අප්‍රියතර අරූප වෙති, දියගත් ගිනිසේ කුසඝ ඇතුළත නිරන්තර යෙන් දිලියෙන ගිනි ඇතිවෙති, මුඛය විවෘතකළකල පිටතට ගිනි නැඟී දිලියෙයි, මුඛය පියාලූකල මුවහව ගිනිසිළු පිටතට නික්ම නොහොස් ඇතුළුකුසම දිලියෙයි, යොදුන් පළල යොදුන් ගැඹුර පිරියන ගඟෙහි හඬ අසා පැන් බොම්හයි සිතා ගඟට බටකළ තුවූ තුවූ පියවර ගිනිනැඟී දැ කරව යෙයි, එහි පිනිබින්දුවක් සා දිගටික කුත් ඇසට නොපෙණෙයි, සිහිල් සෙවන කැමතිව රුක් සෙවන කට ගියකල ගිනි රැස් බදු රැස් ශරීරයෙහි වදනේය, මෙසේ පිහිටක් අස්වැසීමක් නොලබන්නාහු මහදුක් අනුභව කෙරෙත්.

අසූචිවූ නොපිරිසිදු කායවාක් සම්භාර ඇති පාපධම්වූ රහසින් පව්කරණ අශ්‍රමණව ශ්‍රමණප්‍රතිඥ ඇති අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරියෙ මියි ලොවට හඟවන සිත ඇතුළත නිරන්තරයෙන් උපදනා අකුශල ධර්මයන් විසින් ඇතුළතින් කුණුවූ සතතයෙන් කෙලෙසුන් විසින් මඛනාලද සිත්ඇති නීත්‍යයෙන් සාස්කාරකරන්ව නොඟැකි කසල ගොඩක් බදුවූ දුස්සීල භික්ෂූහුද දුස්සීල සාමණෙරයෝද සාමණෙරී හුද භික්ෂමානයෝ ද යන මේ හැමට සිල්රක්ෂාකරණ යහපත් සිල්

ඇති තැන්යයි දෙනලද චතුර්විධ ප්‍රත්‍යයයි බලා ඒ ගුණධර්ම තමන් කෙරෙහි නැතිව ඒ ප්‍රත්‍යය හොජන විඳ මිය නරකයෙහි ඉපද නොයෙක් මා දහස් නරකදුක් අනුභවකොට එයින් චුතව ප්‍රෙතව ඉපද සිවුරුදු කාඛානුදු පාත්‍රද ගිනිගෙණ දිලිසෙයි, එසේ තමන් දවන සිවුරු ආදිය පහකොට ගතනොහැකිවෝ කලපාතන්ත ගිනි සේ කුස ඇවිල දිලිසෙන බඩසාදුක් ඉවසාගතනොහී නොයෙක්වා දවස් මහදුක් විඳින්.

ආවාසයෙහි ලොභව අනිකක්හට නොපැමිණෙවයි ඝනාදි විසින් මසුරුකොට මිය ඒ ගෙහි ප්‍රෙතව ඉපද ඒ ගෙහි කසල උසුලනුවෝ මහදුක් අනුභව කෙරෙත්, සංසරන්නාය සන්තකවූ ලාභයෙහි මසුරුව පුද්ගලික පරිභොගයෙන් එකලාව ප්‍රයෝජන විඳ මිය ප්‍රෙතව විසීමට ගෙවල්නැතිව මහදුක් අනුභව කෙරෙත්, ගිකියා බෙරගසා නටා ඒ අකුශලකර්මයෙන් ප්‍රෙතව උපන්නාහු බලනුවන්ට ප්‍රාසාද තොරණ අට්ටාල ගොපුරප්‍රාකාරාදීන් සලිකවූ දෙවිනුවරක්සේ පැණෙන තැන අනුන්ට ගී කියා බෙරවයා නටනුවන්සේ පැණෙන්නාහු මහදුක් අනුභව කෙරෙත්, මවුපියන් කෙරෙහි ලජ්ජා හය නැතිව කල්යවුවෝද සෙසු බලවත් පව් කළෝද යන මොහු බලනුවන්ට පිපිඝිය පියුමක්සේ පැණෙන බුරවක්‍රයෙන් හිස පවන්ගෙණ පයදක්වා කඩනු ලැබෙත්, සකල ශරීරයෙන් බස්නා රුධිරයෙන් සියලු ශරීරය රක්සඳුන් කල්ක ගැල්වූවාසේ පැණෙති, මෙසේ මහඟඹින් ගඩගඩා පස්නාහු ගිකියනුවන් පැණෙත්, එසේ පැසෙනුවන්ගේ කර්මගෙවී ගියකල නැවතත් එසේ දුක්විඳීමට නිසි පව්කළාහු ඔවුන්ගේ කර්මබල යෙන්ම බලනුවන්ට පිපිඝිවි පියුමක්සේ පෙණෙන ඒ බුරවක්‍රමාලාව දැක මට ලැබේවෝහෝයි පතා ඉල්වා ලැබගෙණ ඔවුන් මුදහැර පළමුයේම එයින් උපදනා මහදුක් විඳින්, කලක් කුසල්කොට කලක් අකුසල් කොට් ඒ කුශලවූ අකුශලවූ ඒ එකම ජන්මයෙක විපාක දෙන්නේ වී නම් පළමු තමා ප්‍රමාදව විටෙක අකුසලවූ විටෙක කුසලවූ කළපරිද්දෙන්ම ඇතැම් දවසෙක ඇතැම් විටෙක දිව්‍ය සම්පත් අනුභව කෙරෙති, ඇතම් දවසෙක ඇතැම් වේලක ප්‍රෙතව මහදුක් අනුභව කෙරෙත්, මෙසේ සුවදුක් මිශ්‍රව විඳිමින් වසනුවෝ විමානප්‍රෙතයෝ නම් වෙත්.

තවද මෙසේ අනෙකප්‍රකාර දුක් ඇති ප්‍රෙතලොකයෙහි ඉපද මහදුක් අනුභවකරණ ප්‍රෙතයන් අතුරෙහි පාෂාණ ප්‍රෙතවස්තුව නම් කවරඟයන්?–හේ මෙසේ දතයුතු.

මේ ලඞ්කාවිපයෙහි රොහණවාසී සැවතමක් පමණ භික්ෂූන් වහන්සේලා එක්ව දඹදිව ජයමහාබොධිය වඳනා පිණිස දඹදිවට

පැමිණ ක්‍රමයෙන් දුරුකතර මග ගෙවා ශත්නාහු මහා අරණ්‍යයට පැමිණ එහි මංවුළාව නොදැක අන් පාරකට පැමිණ නිමි මැහීයසි සිතා වඹනා භික්ෂූන්වහන්සේලා තුන් දවසක් මන්වුළාව හොස් ඒ මහවනයෙහි එක් කොළයක් පමණ තැන වැහිර ගෙණ හොත් ප්‍රෙතයෙකු දැක ගල්තලාවයසි සිතා හැමදෙනා වහන්සේම එයට නැඟී මාගීකලාහාන බැවින් ඒ ඒ තැන සැතපුණු සේක්ලාය එකල්හි මහතෙරුන්වහන්සේ නැඟී සිට වීතීනා භාවනායෙන් යෙදී සක්මන් කරණසේක් ඒ ප්‍රෙතයාගේ ඔස්ඵාපාද යක්ඛස්ථාන දැක මේ ප්‍රෙතයෙකා පව්තයක් නොවෙයි දැන, එතෙණෙහි භික්ෂූන් කැඳවා "ඇවැත්නි මේ පව්තයෙක් නොවෙයි, එව බස්ව" යි වදාළ කල්හි ඒ හැමදෙනා වහන්සේ වහා බැස්සාහුයි, එකල්හි ඒ ප්‍රෙත මහත් උත්සාහයෙන් හිස නැගුසේය, මහතෙරුන්වහන්සේ ඒ දැක "දුනු පන්සියයක් පමණ භූමිප්‍රදේශය වසාගෙණ වැදගොත් මහත් ශරීරයකින් සිටින සක්මන් කිරීම් ඇ ඉරියව්ව පෙරළීමක් නැතිව මහදුක් විඳිනා තා විසින් තවර අකුශල කම්යක් කරණලද දැ" යි විවාළසේක.

එවිට ප්‍රෙතතෙම දක්වනුයේ "සවාමීන්වහන්ස මම මිනිසක්ව පූජිගෙහිවූ කාශ්‍යප බුදුන් කාලයෙහි සංඝසන්තක දැ නැසීම්, එසේ සංඝසන්තක ආරාම කොත්වත් නසා එපවින් මෙබදු ප්‍රෙතදුක් අනුභවකොට මේ ප්‍රෙතභවයෙන් මිදී එම පව්බෙලෙන්ම නැවත අව්වීමහානරකයෙහි උපදින්නෙමි "යි දැන්වූසේක.

එවිට මහතෙරුන්වහන්සේ "එම්බා ප්‍රෙතය, තොප කුමක් කැමැත්තෙහි දැ" යි ඔහු විවාළ කල්හි ප්‍රෙතතෙම පිපාසිතයෙමි මාගේ මුඛයෙහි පැන් වත්කළ මැනවැ" දුන්දීය, එකල්හි සැවතුනමක් පමණ භික්ෂූන්වහන්සේලා පාත්‍රසැටකින් ගගින් පැන්ගෙණ වුත් පෙරයම පටන් අරුණුනැගෙන කල් දක්වා නොකඩවම ඒ ප්‍රෙත යාගේ මුඛයෙහි පැන් වත්කළාහුය. එසේ දියවත් කිරීමෙන් ඔහුගේ දිවපමණවත් නොතෙමුනේය, තෙරුන්වහන්සේ විවාරණ සේක් "එම්බල පින්වත මේ සැවතුනමක් එක්ව රාත්‍රිය මුළුල්ලෙහි පැන් වත්කිරීමෙන් කිසි ආස්වාදයක් ලබන ලද්දෙහි දැ"යි විවාළසේක.

එවිට ප්‍රෙතතෙම කියනුයේ "සවාමීන්වහන්ස ඉදින් මාගේ මුඛයෙහි සත්රියක් මුළුල්ලෙහිදු දහසක් භික්ෂූහුදු නිබඳ පැන්වත් කරන්නාහු වී නමුත් දිව අග පමණවත් නොතෙමෙන්නේය. කොහින් කණ්ඨයට පැමිණෙන්නේද?-එසේ කල සැඟ කුමක් පිණිස ලබිමිද? ඉදින් භවත්සේලා විසින් වතකළ දිය මාගේ ශ්‍රීවය

ඉක්ම ගියේ නම් ප්‍රේතාත්ම භාවයෙන් මම මිදුනේ වෙමි, සංඝ සන්තක දෙය ගැණීමෙහි පාපකර්මය මෙබදු කටුකවූ මහත් දුක් ඵල වන්නේයැයි දැන එයින්ම දුරුවිය යුතු, මාහා සමග සංඝසන්තක ද්‍රව්‍ය අනුභව කළ කැයෝද මාහා සමගම ප්‍රේතාත්ම භාවයට පැමිණියාහුය" යි දක්වා කැවත ඒ ප්‍රේතතෙම "සවාමීන්වහන්සේලා කවර කෙනෙකුන්ගේ ශිෂ්‍යයෝද නුඹවහන්සේලාගේ ආචාරීන් වහන්සේ කිනම් සේක් දැ" යි ආදරයෙන්ම භික්ෂූන් විමාලේය, ඒ අසා මහතෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාට මෙසේ වදළසේක:--

සක්‍යරාජකුලෙ ජාතෝ ජිනෝ ගොතමෝ ගොතමෝ,
අමහාකං භගවා සත්ථා තස්ස සිස්සගතා මයං,
වන්දන්‍යඵං මහාබොධිං ලඛ්කාදීපා ඉධා ගමුනති--යි

මෙසේ "ශාක්‍යකුලයෙහි උපන් ගෞතම ගෝත්‍ර ඇති පස් මරුන් දිනූ ඒ භාග්‍යවත් ශාස්තෘන්වහන්සේගේ අපි ශිෂ්‍යයෝය. මහාබෝධීන්වහන්සේ වඳනා පිණිස ලඞ්කාවිපයෙන් නික්ම අවුත් මෙහි පැමිණියමහ" යි වදළසේක, ඒ අසා හෙතෙම බුදුරජානන් වහන්සේ ලොකයෙහි උපන්සේකැයි විස්මයපත්ව "මම මෙතැන් පටන් සත්දවසක් ඉක්මගිය කල්හි අවිවියෙහි උපදිමි, කාශ්‍යප බුදු රජානන්වහන්සේගේ කාලය පටන් ගෞතම බුදුරජානන්වහන් සේගේ කාලය දක්වා මෙදූතුරෙහි මම භූමිය සත්ගව් පමණ වැඩි මෙන් වමියන්ගේ අසඞ්ඛ්‍ය ගණන් බොහෝ ඉක්ම ගියාහුය, එතෙක් කල් මුළුල්ලෙහි ප්‍රේතලොකයෙහි පාපකර්ම ඵලවූ බොහෝ දුක් අනුභව කෙළෙමි, දැනුදු එම අකුශලකර්ම ශෙෂයෙන් අවිවි යෙහි උපදිමි, ප්‍රමාදව ලොභමූලයෙන් උපදනා පාපකර්මය මෙසේ විපුලවූ මහත් දුකට සඞ්ඛ්‍යා පමුණුවන්නේය, මෙසේ සංඝසන්තක දැ නැසීම මහත් දෙගඵලවන්නේ වෙයි, යම් කෙනෙක් ඒ සංඝ සන්තක දැ රක්ෂාකිරීමෙන් ඔවුන්ට විපුලවූ ප්‍රමාණාතික්‍රාන්ත ගුණ ඵල ඊමද මහත් බැව්.එසේම දතයුතු.

කැවත ඒ ප්‍රේතතෙම දක්වනුගේ දැන් මාගේ ශරීරය අග්නිජ්වාලාවෝ නිරන්තරයෙන් දවන්නාහුය, එසේවූ මා දැක "සවාමීනි නුඹවහන්සේලා වඩනාසේක්ලා අප්‍රමාදව බුඞ්ධශාසන යෙහි යෙදෙනසේක් වා" යි දැන්වූ කල්හි ඒ භික්ෂූන්වහන්සේලා එයින් නික්ම වැඩියාහුය, එකල්හි ඒ ප්‍රේතයාගේ ශරීරයෙහි අග්නිස් කඩ නැගී දිලින, ඒ භික්ෂූන්වහන්සේලාද රාත්‍රිභාගයෙහි නික්ම ගවූ පමණ මගගෙවා ගොස් සංවේගයට පැමිණ හැමදෙනාවහන් සේම විශෙෂාධිගමයට පැමිණිසේක. පාඨණ ප්‍රේතවස්තුව නිමි.

පාෂාණඵලක ප්‍රෙතවස්තුව නම් කවරහු?යත්—ඒ මෙසේ දත යුතු, මෙම ලඞ්කාද්වීපයෙහි වැසි ශ්‍රද්ධාසම්පන්න බොහෝ භික්ෂූන් වහන්සේලා එක්ව ඉහබොහිය වදනා පිණිස දඹදිව ගොස් ක්‍රම යෙන් දුරුභූතර මග ගෙවා අරණ්‍යගතව පැමිණියාහුය, එහි උන් වහන්සේලා මංමුලාව ඒ ඒ දිග බලා ඇවිද ඇත්පාරක් දැක ඒ මෘගී යට පැමිණ යන්නාහු සතර යොදුන් පමණ විස්තාර ඇති මහ පර්වතයක් මුදුනෙහි අඩි ශරීරයක් ගැලි මහදුක් විඳිනා එක්තරා ප්‍රෙතයෙකු දැන මිනිසෙකැයි සිතා ඒ ප්‍රෙතතෙම යම් තැනෙක්හිද එහි පැමිණි සේක්ලාය, එසේ ඔහු කරා පැමිණ ඒ ප්‍රෙතයා කෙරෙන් තෙරුන් වහන්සේ මහ විවාරණසේක් 'එම්බල සත්ව අපි සත් රියක් සත් දවාලක් මංමුලාව ඇවිදිමිහ, එහෙයින්;පර්වත මධ්‍යයෙහි සිටම භික්ෂූන්ට මගදන්ව" යි වදළසේක. ඒ තෙරුන්වහන්සේගේ ඒ වචනය අසා ඒ ප්‍රෙතතෙම මෙසේ දැන්වී, සත්රියක් සත් දවාලක් මංමුළාව භ්‍රමවහන්සේලා හැමදෙන ඇවිදිනාහුය, මම වූ කලි සතර බුබ්‍රාන්තරයක් මුළුල්ලෙහි මංමුළාව මේ පර්වතයෙහි අඩි ශරීරයෙන් ගැලි සිටිනෙමි" යි දැන්වීය.

එවිට තෙරුන්වහන්සේ "එම්බල තෝ මෙසේ දීඝිකාලයක් කවර කාරණයකින් මං මුළාවූයෙහිද? පූර්වයෙහි තා විසින් කවර පාප කර්මයක් කරණ ලදද" යි විවාළසේක.

මෙසේ විවාරණලද ප්‍රෙතතෙම මහ තෙරුන්වහන්සේට දන් වනුයේ "ලෝකනායකවූ ක්‍රකුසඳ බුදුරජාණන්වහන්සේ ලෝක යෙහි පහළ වූසේක, එසමයෙහි මම මිනිසෙක්ව පාපකර්ම කොට මේ ප්‍රෙතදුකට පැමිණ සතර යොදුන් පමණවූ මේ පර්වත මුදුනෙහි පව්බෙලෙන් උපන්මි, ඒ මට සතර බුබ්‍රාන්තරයක් ඉක්ම ගියේය, කවර කලෙක මාගේ පාපකර්ම ගෙවී යේ දෝ හෝයි නොද නිමි" යි දැන්වූ කල්හි මහතෙරුන්වහන්සේ "එම්බල යහළුව බුදු වරයන් බුදුවූ කාරණය කුමකින් දන්නෙහි ද" යි විවාරා වදළ කල්හි මහ තෙරුන්වහන්සේට ඒ කාරණය දන්වන ප්‍රෙතතෙම "බුදුවන මහ බෝසතාණන් ම විකුසු පිළිසිඳ ගැන්මෙහිද බුදුවීමෙහිද දම්සක් පැවැත්වී මෙහිද ආයුසංස්කාරයාගේ හැරීමෙහිද පිරිනිවන් පෑමෙහිද බොහෝ විස්මයපත් කාරණා පහළ වූවාහුය" යි දැන්වූ කල එම ප්‍රෙතයා කෙරෙන්ම ඒ විස්මයපත් කාරණ කවරක්හුදැයි විවාරා වදළ තෙරුන් වහන්සේට ඒ කාරණා ප්‍රකාශ කොට දන් වන ප්‍රෙතතෙම මෙසේ දැන්වීය.

අහස්හිද ගල්පර්වත මස්තකයෙහිද ගල්වනලද පොළෝතලයෙහිද දියෙහිද යන හැමතැන්හි එදවස් පියුම් පැහැනැංහුය, මම් ඒ

කාරණයෙන් බුදුවීරයෙක් ලෙව පහළවූ වශදනිමි"යි දැන් ය, ඒ අසා මහතෙරුන්වහන්සේ තැවතත් විවාරණයේක් "මෙසේ අනිශයින් කර්කශවූ පමණ නැති මහ දුක් බොහෝ වර්ෂ බුඩියන්තර ගණනක් මුළුල්ලෙහි තවර පාපකර්මයක් නුගේ විපාකයෙන් ලබන ලදදැ"යි විවාළසේක.

ඒ තෙරුන්වහන්සේගේ වචනය අසා ප්‍රෙතතෙම මෙසේ දැන් විය. "සවාමීන්වහන්ස අනිතකාලයෙහි ලොකනායකභූත කකුසඳ නම් බුදුකෙනෙකුන් වහන්සේ ලොව පහළවූසේක. එසමයෙහි මම කාෂිකකර්මයෙන් ජීවත්වන එකෙක් වීමි, සඞ්ඝයා සන්තක කුඹුරක් සම්පයෙහි මාගේද කුඹුර විය. ඒ කුඹුරු දෙකට අතරවූ ඉමනියරෙහි හිදුවකලද ගල් මැඩ උදුරා නහාගෙණ සංඝ සන්තක කුඹුරෙන් ඇතුල් කොට ගෙණ ඒ සංඝ සන්තක කුඹුරෙහි ගල් ටැඹ මා විසින් සදන ලද්දේය, මෙසේ සඞ්ඝ සන්තක කුඹුරෙහි මා විසින් වරදවා පිළිපැද එම අකුශල බලයෙන් මේ පවින මුදුනෙහි අභිශරිරයක් ගැලි සිටින ප්‍රෙතව උපන්නෙමි. උපන් තැනින් සෙල් වීමක් නැතිවම උපන් තැන් පටන් මේ සා දුක් විඳිමි. මේ දරුණුවූ කර්මාන්තයාගේ ඵලය බැලුව මැනව"යි කියා ඒ ප්‍රෙතතෙම ආදරයෙන්ම භික්ෂූන්වහන්සේලා විවාරණුයේ "සවාමීවූ නුඹවහන්සේලා හැමදෙනා වහන්සේලා කවර කෙනෙකුන්ගේ ශිෂ්‍යයෝද"යි විවාළේය. ඒ අසා මහතෙරුන්වහන්සේ ඒ ප්‍රෙතයාට මෙසේ වදළසේක:—

පුරෙතා පාරමීසඛඛා පත්තෙතා සබ්බොධිමුත්තමං,
ගොතමෙන ගොතමෝ බුඩෝ තස්ස සිස්සගණාමයං–යි.

ඇතුවෙන් "සියලු පාරමිධර්මයන් පුරා සම්‍යක්සම්බොධියට පැමිණි ගෞතම ගොත්‍ර ඇති ගෞතම බුදුරජානන්, වහන්සේගේ අපි ශිෂ්‍යගණයා වම්හ" යි වදළකල්හි ඒ ප්‍රෙතතෙම මේ වචනය ප්‍රකාශකළේයි 'ලොකනායකභූත ගෞතම බුදුරජානන්වහන්සේය" යි ඇතු සැබව, මම මෙයින් සත්දවසක් ඉක්ම ගිය කල්හි මේ ප්‍රෙතාත්ම භාවයෙන් මිදී ගොස් අවිවිමහානරකයෙහි ඉපද එහි තොවින්ද හැකි උපමා නොකොට හැකි මහාදුක් අනුභව කෙරෙමි, කකුසඳ බුදුරජානන්වහන්සේගේ කාලයෙහි පටන් ගෞතම ශාස්තෘන්වහන්සේගේ කාලය දක්වා වෙදතුරෙහි පාවිච්චිතොවූ එක්ගව්වක් අඩු සතර යොදුනක් වැඩී ගිය කලැයි කියනලද වර්ෂගණනයෙන් බොහෝවූ අසංඛ්‍යෙයෝ ඉක්ම ගියාහුය, මෙසේවූ මහත් දුකින් කවර කලක මිදෙම්දෝ හොත්"යි කියා මෙසේ සඞ්ඝසන්තකද ඇසීම මහත් දුක් ඵලවන්නේ වෙයි. යම් කෙනෙකුන් විසින් සඞ්ඝ

ඝනනකදෑ රක්නාහු පිනම් ඔවුන්ට හැම කල්හිම මහත් ගුණ ඵල වන්නේවෙයි, මෙසේ කම්ප්‍රත්‍යයෙන්ම අනන්තදුකඛයෝ උපදනා හුයයි දැන පාපධර්මයන් හා එක්වීමක් නොව දුරින්ම දුරුකට යුත් සේය, පාඡාණසඨමහාප්‍රෙත වස්තුව නිමි.

කසීප්‍රෙතවස්තු නම් කවරහයත්?-නාමුපඤ්ඤී දීප නම් මෙම ලක්දිවින් ශ්‍රද්ධාසම්පන්න බොහෝ භික්ෂූන්වහන්සේලා එක්ව මහාබොධිය වඳනා පිණිස පළමු පරිද්දෙන්ම නික්ම ගොස් දකිදිවි පැමිණ අනුක්‍රමයෙන් නුවරවල් ගෙවා යමින් ඒ භික්ෂූහු මහ අරණ්‍යයට වැද එහි සත්දවසක් මංවුළාව ඇවිද උන් වහන්සේලාත් පළමුසේම හැත්තිමාතීයකට බැස යන්නාහු ගිනි තෙණ දිලියෙන යකඛමය නගුලෙක යෙදූ එසේම දිලියෙන මහත් යකඛමය ගොන් ඇතිව සීසාමින් මහත් දුක් විඳ වෙහෙස විඳිනා එක්තරා කසී ප්‍රෙතයෙකු දැක මිනිසෙකැයි සිතා නුදුරුතෙනක සිට ඒ මහ තෙරුන්වහන්සේ ඔහු අතින් මග විවාළසේක.

එවිට ප්‍රෙතතෙම තෙරුන් වහන්සේට මෙසේ දන්වීය, "නුඹ වහන්සේලා ඇම සත්රැසක් සත්දවලක් පමණ මංමුළාවූහ. මමවූ කලි, අතුරුකපක් මූළුල්ලෙහි මංමුළාවූයෙමි" යි කිය, ඔහුගේ ඒ වචනය අසා නැවත ඒ ප්‍රෙතයා කෙරෙන්ම විවාරණසේක් "මෙසේවූ දීඝීකාලයක් කුමකිත් නෝ මංමුළාවූයෙහිද, එම්බල යහළුවූ නෝ කවරෙක්ද පුථීයෙහි තාවිසින් කවර පාපකම්යක් කරණලදද්ද" යි විවාළසේක.

එයත් ඇසූ ප්‍රෙතතෙම මෙසේ දන්වීය, "පෙර කාශ්‍යප බුදු රජානන්වහන්සේගේ කාලයෙහි මම සීඝනාමිනිසෙක්ව මූඛයෙන් පාපකම්යක් කොට මේ කසීප්‍රෙතාත්මභාවයට පැමිණියෙමි, ඒ මම මේ බඩනානාරය මූළුල්ලෙහි කිඹිවක් නොපිමි; නොකැමි, හිදිමක් සැතපිමක් නම් නොසිත්ද?-රෑ දුවල් දෙක්හි නිරන්තරයෙන් සීසා ගින්ම ඇවිදිනෙමි, මෙසේ සීසාමින්ම ඇවිදිනා මගේ ශරීරය ගිනිගෙණ දිලිහෙන්නේය, රාත්‍රියෙහි විශතගුල්ද ගොන්සි වැල්ද ගිනිගෙණ දිලියෙන්නාහුය, එසේ ගින්නෙන් දහුලබම්මින් වෙහෙසෙන ශරීරයක් ඇතිව දඩ වෙහෙසී මහදුක් විඳිනා මේ ප්‍රෙත ලොකයට පැමිණීමට මේ මහා පාපිවිතොමෝ සත්ගව්වක් වැඩී ගියාය, මෙසේ බොහෝ වර්ෂගණනක් කායිකමානසික දුකඛයෙන් අභිභූතව පෙලී පෙලී දහුලබම්මින් මහදුක් විඳිමි, පාපකම්ඵලය බැලුවී මැනවැ" යි දැන්වීය, ඒ ප්‍රෙතයාගේ වචනය අසා තෙරුන් වහන්සේ ඔහුකෙරෙන් විවාරණසේක් "කෙබඳුවූ කවුක පාප කම්යක් නා විසින් මූඛයෙන් කරණලදද?- ඒ සියල්ල අසනු කැමැත්තෙමි ඒ මට කිවමැනවැ" යි දන්වූසේක.

ඒ අසා ප්‍රේතතෙම මෙසේ දැන්විය "හැමදෙනා වහන්සේ එක්ව මාගේ වචනය ඇසුව මැනව, අතීතකාලයෙහි මවිසින් යම් කිසියක් කරණලදද ඒ කිසිය ප්‍රකාශකොට කියමි" යි කියා දන්වා නුයේ "යටගිය දවස කසීනම් නුවර කිකීතව් රජ්ජුරුකෙනෙක් රාජ්‍යයකරන්නේය, ඒ රජ්ජුරුවන්ගේ ඒ නුවර නිසා කාශ්‍යප බුදුරජානන් වහන්සේ වස්වසා වැඩහිඳ පවරා ඉක්බිති සඞ්ඝානුකම්පායෙන් දනවු සැරිසරා වඩනාසේක් එසමයෙහි අපවසනා ගමට මහත් කරුණායෙන් පැමිණිසේක, එකල්හි ඒ ගම්හි වසන හැම මනුෂ්‍යයෝම එක්ව කුල්මත්ව ශ්‍රාවක සංඝයා වහන්සේ සහිතවූ ඒ කාශ්‍යප බුදුරජානන්වහන්සේ වඩාගෙණවුත් දන්දෙන පිණිස කලමනාදද එක්ව කරන්නාහුය, එකල්හි මමද වියනාගුල් ගෙණ සිසාතා පිණිස මනුෂ්‍යයන් එක්ව දන්දීමට නිසිදුකරණ තැනින් යන්නෙමි, එවිට මා දැක හිතෙහි වැඩකැමති එක්තරා පුරුෂයෙක් මට අනුකම්පායෙන් මේ වචනය දැන්විය, ඒ කෙසේද? ලෝකනායකවූ මේ කාශ්‍යපබුදුරජානන්වහන්සේ අපකරා පැමිණි සේක, ඒ පූජනියවූ බුදුන් හැමදෙනා එක්ව මනාකොට පුදන්නාහුය, යහලුව තෝ කුමක් පිණිස නොපුදන්නෙහි දැ" යි මෙසේ දැන්වූකල්හි මම ඕහට ක්‍රොධව මොහයෙන් විශෙෂයෙන් මුළාව වහාම නොකියයුත්තක් කිමි, ඉදින් කාශ්‍යප බුදුරජානන්වහන්සේ මාගේ කුඹුර සීසාදෙන සේක් නම් එසේ ඇති කල්හි මමද පුදමි, එසේ නැති නම් කුමට පුදමිදැයි කිමි, මේ පරුෂවචනය කියා එයින් මිය එම පව් බෙලෙන් මේ ප්‍රේතාත්මභාවයව පැමිණ දුඃඛ වෙදනාවන් විඳිමි, මෙසේ මහ දුක් විඳිනා මා දැක සංවෙගයට පැමිණ ඕත් ඇතිව යහපත් නුවණැති නුඹ හැමදෙනා වහන්සේම සියලු දුකින් මිදුම පිණිස බුඬානුශාසනාවෙහි යෙදෙනු මැනවැ" යි කියා ඒ ප්‍රේතතෙම තැවත විවාරණුයේ "නුඹවහන්සේලා කවර කෙනෙකුන්ගේ ශිෂ්‍යයෝද ඒ මට වදාළමැනවැ" යි දැන්විය, එවිට තෙරුන් වහන්සේ වදාරණසේක:-

යෝ යෝ දසබලෝ සත්ථා වෙසාරජ්ජවිසාරදෙ,
ගොතමත්ත ගොතමෝ බුඬෝ තස්සසිස්සගතාමයං-යි.

යනුවෙන් "දශබලඛාරීවූ චතුවෛශාරද්‍යයෙහි විසාරදවූ ගෝත්‍රයෙන් ගෞතම නම්වූ යම් ශාස්තෘවූ බුදුරජ කෙනෙක් වූසේක්ද ඒ බුදුරජානන් වහන්සේගේ ශිෂ්‍යගතයෝ වම්හ" යි වදාළකල්හි ඒ ප්‍රේතතෙම තෙරුන්වහන්සේට "මහේ දැන්වූසේක, "ලෝකනායකවූ ගෞතම බුදුරජානන් වහන්සේ කොතැනකැ"යි යනු සැබව මෙතැන්පටන් සතියක් ගිය කල්හි මම අවීචිමහනරකයට පැමිණෙන්නෙමි, කාශ්‍යප බුදුරජානන්වහන්සේහටද ගෞතම බුදුරජානන්වහන්සේ යන ශාස්තෘන් දෙදෙනාවහන්සේව මෙදුතුරේ මේ

පෘථිවියෙහි සත්ත්වයෙක් උපන්නාහු, වර්ධනයෙන් අසංඛ්‍යයෝ ඉක්මගියාහුය, එසේවූ බොහෝ කාලයක් ප්‍රේතලෝකයට පැමිණ දුක්විඳින මාගේ අකුශලකර්මවිපාකය ගෙවී නොගියේය. මෙයින් චුතව ගොස් අවීචිමහානරකයෙහි ඉපද පාපකර්මයෙහිය අනුභව කටයුතුය, අහෝ මොහය මූල්ව කරණලද පාපකර්මය මෙසේ ඉතා විපුලවූ මහත් දුක් ඵලවන්නේයි, ගුණ අධික උතුමන් කෙරෙහි වරදවාලීම මෙසේ මහත් දෝෂයක් වන්නේවෙයි, එසේම ඔවුන් කෙරෙහි කරණලද සිල්පතර විත්තප්‍රසාදය මහත් සැප ඵලවන්නේවෙයි, මේ වචනදෝෂයෙන් අනන්තවූ දුකට පැමිණි කාරණය දැන, වැඩ සැප කැමති හැමදෙනම වචනයෙන් අසත්‍ය යෙන් දුරු වීමට උත්සාහකටයුතු, ඝණිප්‍රේත වස්තුව නිමි.

අඹිතණඩුලඛ්‍යාලිප්‍රේතවස්තුව නම් කවරහි?යත්- ඒ මෙසේ දතයුතු, මෙම ලක්දිව අනුරාධපුරයට නුදුරුවූ මිහින්තලා විහාර යෙහි වසන එක් භික්ෂූන්වහන්සේ තමක් බොහෝ භික්ෂූන් හා සමග තමන්වහන්සේගේ ගමට ගොස් එනගමනෙහි පියානන් හා එක්ව මිහින්තලා විහාරයට පැමිණ තමන්වහන්සේගේ පියානන් පිණිස ආරාමිකයන් අතින් හාල්නැලියෙන් හාඟයක් ගෙණ පින් පව්විභාග තමන් දන්නාගෙයින් සෙවදවස නැළිය පුරවා හාල් දෙමිසි සිතා ඒ සංඝඝන්නක හාල් නැලියෙන් හාඟයක් ගෙණ ඒ භික්ෂූන්ගෙම එදා රාත්‍රියෙහිම මිය පරලොව් ගොස් ගමටද මිහින්තලා විහාරයටද අතරෙහි සංඝඝන්නක දෙය ගෙණ නැවත දී නිමවා නොගත් පව්බෙලෙන් ප්‍රේතව ඉපද මහදුක් අනුභව කරන්නේය.

එකල්හි පිණ්ඩවාරිවූ එක භික්ෂූන්වහන්සේ තමක් ඒ මාගීයට පැමිණ වඩනාසේක් පස්විමයාමයෙහි ගිනිකඳක් මෙන් දිලියෙන් නාවූ ඒ ප්‍රේතයා දැක වදාළසේක, එසේ දැක කම්පාවූ සිත් ඇති කරුණාවට ආකාරව සිටි ඒ භික්ෂූන්වහන්සේ ඒ ප්‍රේතයාකෙරෙන්ම විවාරණසේක් "දීඝීවූ ශරීරයක් ඇති දුගීන්ඩවූ ගිනිකඳක්මෙන් දිලිහි පෙණෙන ඇවසම්වැලදි මාත්‍රාව සිටි තෝ කවරෙක්ද?" සි විවාළසේක, එවිට ප්‍රේතතෙම කියනුයේ "ස්වාමීන් වහන්ස, මා පිපාසයෙන් පීඩිතව දුකිතවූ මම සිල්පවූ පාපකර්මයක් කොට මේ ප්‍රේත ලෝකයෙහි උපන්මිසි" දන්වූයේය, ඔහුගේ වචනය අසා තෙරුන් වහන්සේ කැවතත් ඔහු විවාරණසේක් "කායවාක් මනෝ ශුභ චාරිත්‍රයෙන් පුරීයෙහි තා විසින් කවර පාපකර්මයක් කරණලදද?-කවර අකුශලවිපාකයකින් ප්‍රේතලෝකයට පැමිණියේද" සි විවාරා වදාළ කල්හි ඒ තෙරුන්වහන්සේට ඒ ප්‍රේතතෙම දන්වනුයේ "මම මීට පෙර ජාතියෙහි භික්ෂූකම්කිව මිහින්තලා විහාරයෙහි ම වාසය කෙළෙමි, එකල්හි එහි පැමිණි මාගේ

පියානන්ට අනුභව කරණ පිණිස එක වේලකට සැහෙන පමණ සාලක් සොයා නොලැබ ඒ වීහාර පිරි මැසීමෙහි ආරාම්භකයින් අතින් සංඝසන්තකවූ සාලෙන් සෙට දවස තැළිය පුරවා දෙමිසි සිතා තැළියෙන් හාඟයක් ගෙණ සිතුලෙස දෙන්ට නො හැකිව එම රාත්‍රිභාගයෙහි කාලක්‍රියා කොට ප්‍රේතාත්ම භාවයට පැමිණි සෙමි"සි දැන්විය.

ඔහුගේ එම වචනය අසා තෙරුන්වහන්සේ ඔහට වදාරණ සේක" ඒ භික්ෂුතෙම මම දනිමි, හෙතෙම සීලසම්පන්නය, බහුශ්‍රැතය මෙබදු සීල සම්පන්නවූ ශික්ෂා කාමී යහපත් තැන තවර කාරණය කින් දුගතියට පැමිණියේක්ද"සි මෙසේ විමසූසේක. තෙරුන් වහන්සේගේ වචනය අසා ප්‍රේතතෙම තැවතත් තෙරුන්වහන්සේට දන්වනුයේ "ඒ භික්ෂුතෙම සීලසම්පන්නය, බහුශ්‍රැතය, බුදු සස්නෙහි ඇළුම් ඇතිසේක. එසේ වුවත් සංඝසන්තකදෙය ගැණීම ඉතා ආසන්නව සම්ප හෙයින් එම ඵලවිපාකදිම් වශයෙන් පැසෙන් නෝය, එබැවින් යම්කිසි සවල්පතර සංඝික භාණ්ඩයක් වී නමුත් සවල්පයකි සිතා සරුනැතිකෙක් අවඥවක් නොකරන්නේකි, එසේ ප්‍රමාද වශයෙන් කළහොත් ඉතා සවල්පතර පාපකර්මය වී නමුත් විපාක කාල නම්වූ ඵලදෙන තැන ඉතා විපුලවූ දුකඵලය පමුණුවා දෙන්නේය"සි ප්‍රේතතෙම කී කල්හි තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයා කෙරෙන්ම නැවතත් විචාරණසේක් "කවරනම් කුශල යක් කොට තෑගේ මේ දුකඵලයෙන් මිදිමවන්නේදැ"සි පිළිවිසි කල ඒ අසූ ප්‍රේතතෙම මෙසේ දැන්විය, ඒ කෙසේද?

මිහින්තලා පර්වතය පවන් යම්තාක් එගමද මේ අතර තුන්ගව්වක් පමණ ඇති මාඟියෙහි ගැලින් ගැල පැහැර සිටිනා සේ අතුරු නොකඩිව ගැල් ඉදු ඒ සියලු රථවල සාල් පුරවමින් ගෙණ ඉදින් සඞ්ඝයාවහන්සේට දන් දුන්නේ වී නම් එසේ ඇති කල්හි මම මේ ප්‍රේතාත්මයෙන් මිදෙමි"සි දැන්වූයේය, "මෙසේ තැලියෙන් හාඟ යක් පමණවූ හාල් දෙවන ජාතියෙහි දෙන හෙයින් විපුලව බොහෝ බවට පැමිණියේ වෙයි, ඉදින් මේ දෙවන ජාතියේවත් එසේ නුදුන හොත් මෑනේ දුකඵලයෙන් මිදීමත් දුර්ලභය"සි ප්‍රකාශ කෙළේය.

ඒ අසා තෙරුන්වහන්සේ අළුයම් රාත්‍රිය ඉක්මගිය කල්හි අනුරාධපුරයට ගොස් සඤ්ඤානිස්ස රජ්ජුරුවන්ගේ ඉදිරියට පාත්‍රාගතෙණ වැඩසිටියේක, ඒ රජතෙම උන්වහන්සේ අතින් පාත්‍රය ලබාගෙණ නැවතු තෙරුන් වැඳ වැඩිකරුණු විමසූසේය. එවිට තෙරුන්වහන්සේ ඒ ප්‍රවෘත්තිය ප්‍රේතයා කී පරිද්දෙන් විස්තරකොට වදාළ

සේක, තෙරුන්වහන්සේගේ වචනය අසා සඛාතියස්ස නම් මහරජ තෙම ඒ ප්‍රේතයා දුකින් මුදන කරුණා උපදවා කියන ලද ක්‍රම යෙන් ම තුන්ගව්වක් පමණ තැන් ගැල් පිළිවෙළින් සදා ඒ හැම ගැල් සාලෙන්ම පුරා පින් කැමති රජතෙම ප්‍රේතයා සඳහන් කොට ඒ ප්‍රේතයා හට පින් අභිනිවෙවයි කියා දක්ඛිණෝදක පානයෙන් භික්ෂු සඞ්ඝයාවහන්සේට දන් දෙවූයේය, එකෙණෙහි ප්‍රේතද පින් අනුමෝදන්ව ප්‍රේතාත්මභාවයෙන් මිදී දිව්‍ය ශ්‍රී සම්පත් ලදින් ඉක්බිතිව හෙතෙම රාත්‍රී භාගයෙහි පූජෝපකාර තෙරුන්වහන්සේ කරා අවුත් වැඳ එකත්පස්ව දසදික්හි ආලෝක පතුරුවමින් දිලිහී සිටියේය, ඒ දැක කාරුණිකවූ තෙරුන්වහන්සේ විවාරණසේක් "සුවඳවිලුවුන් ඇඟගල්වා උතුම් ත්‍රිවාභරණයක් දරා සියලු අලඞ්කාර යෙන් සැරහී මෙතනට අවුත් සිටින්නේ කවරෙක්ද"යි විවාරා වදාළ සේක. ඒ අසා දිව්‍යරාජතෙම ඒ තෙරුන්වහන්සේට දන්වනුයේ 'සවාමීන්වහන්ස මම මිට පුළුයෙහි දුකින් පීඩිතවූ ප්‍රේතයෙක් වීමි, එහි මහත් දුකානුභව කරණ මා දැක කරුණාශ්‍රයවූ බුඩවහන්සේ මහරජ්ජුරුවන් කෙරෙහි දන්වා උතුම්වූ මහත් සංඝදානය දෙවා ඒ සඞ්ඝයාවහන්සේ ලවා මා සඳහන් කොට පින්දෙවා මහරජද මහ දන්දී එවේලෙහි මා උදෙසා සඳහන් කොට පින්දීම, මම ඒ දැන පින්කම් අනුමෝදන්ව එම කුශලානුභාවයෙන් දුකිත ප්‍රේතාත්ම භාවයෙන් මිදී මෙසා දිව්‍යසම්පත්තියක් ලදිමි"යි ප්‍රකාශ කෙළේය.

මෙසේ ප්‍රකාශ කොට දන්වා නැවත අනන්තවූ කරුණාවට ආකරව සිටි සවාමීන්වහන්ස, මේ යම්සේ දිව්‍යසුවලදින් සතුටු වෙමිද කැමතිසේ හැසිරෙමිද එසේම මහා වීරවූ බුඩවහන්සේද සතුටුවන සේක්වා, කැමතිසේ හැසිරෙන සේක්වා' යි කියා තෙරුන් වහන්සේට ඒ දිව්‍යරාජතෙම දැන්වූයේය, අඹිතඤ්ඣුලනාම්ප්‍රේත වස්තුව නිමි.

පතාකප්‍රේතවස්තුවනම් කවරහ? යත්-ඒ මේසේයි, මේ ලංකා ව්පයෙහි රුහුණුරට දිගාවූ නම් එක්මහ දඟඹෙක් විය, ඒ වෛත්‍යය සන්තකවූ පතාකයක් බැඳ තුබූ තැනින් වෘතයෙන් තහා ගෙණ ගොස් එක් කෙළෙඹි පුත්‍රයෙකුගේ ක්ෂේත්‍රයෙහි වැටිනා, ක්ෂේත්‍රඛිමියාද ඒ ඒ තැන කුඹුරු බලා ඇවිදිනේ තමන් අසිහි කුඹුරෙහි වැටී තිබූ පතාකවස්ත්‍රය දැක තුබූ තැනින් නහා ගෙණ එඹි තුබූ අකුරු දැක ලොහ සිතින් ඒ ඝිඳහැර වස්ත්‍රය පෙරවා ගෙණ ගියේය, හෙතෙම තමාගේ ගෙවලටම ගොස් කල්‍යාමෙන් මිය පරලොව ගොස් ප්‍රේතාත්මභාවයට පැමිණ සිතිගෙණ දිලියෙන පවදහසක් දරමින් දිලිහී සංසාහිතුව ඇවිදිමින් මහදුක් විඳිනේය.

ඒ ප්‍රේතතෙම එක්දවසෙක මධ්‍යමරාත්‍රියෙහි එක්තරා භික්ෂූන් වහන්සේ තමක් සමීපයට ගොස් සැප කැමතිව සිටියේය, උන් වහන්සේ එසේ සිටි ප්‍රේතයා දැක මෙසේ විචාළසේක, "සියලු ශරීරය හිස පටන් වැසිගොස් එයින් නැඟෙණ හිනිදැල් වලින් තැවී තැවී මහදුක් විඳිමින් මෙහි සිටිනා තෝ කවරෙක්දැ"යි විචාළ තෙරුන්වහන්සේට ප්‍රේතතෙම මෙසේ දැන්වීය, "ස්වාමීන්වහන්ස මම ප්‍රේතයෙක, ගිනි ගෙණ දිලියෙන දහසක් යපට හිසවසා පෙරව නිරන්තරයෙන් තැවී තැවී ඇවිදිනෙමි"යි දැන්වීය, ඒ ප්‍රේතයාගේ වචනය අසා තෙරුන්වහන්සේ නැවතත් ඒ ප්‍රේතයා කෙරෙන් විචාරණසේක් "පූර්ව්‍ජාතියෙහි කායාදි චාරිත්‍රයෙන් කවරපාපකර්මයක් නා විසින් කරණ ලදද? කවර අකුශල කර්මයකින් යපටින් ද මෙහෙසෙන්නේදැ"යි විචාරා වදළකල්හි ප්‍රේතතෙම තෙරුන් වහන්සේගේ වචනය අසා නැවත උන්වහන්සේට දන්වනුයේ "ස්වාමීන්වහන්ස මම මේ ජාතියට පූර්ව්‍ජන්මයෙහි මිනිසෙක්ව ඉපද බොහෝ ධන ඇතිව විසුයෙමි, එකල්හි බොහෝ කුඹුරු බලා ඇවිදිනෙමි මේ දිසතඹ විහාර මහා චෛත්‍යයෙන් පතාකවස්ත්‍රයක් වාතවේගයෙන් ගෙණ ගොස් ළතැවෙක් ගවුගණනින් මත්තෙහිවූ මාගේ කුඹුරේ වැටිය. ඒ වස්ත්‍රය දැක අතින් ගන්නෙමි එහිතුවූ අකුරු දැක ඒ හිඳ හැර ලොභ සිතින් ඒ වස්ත්‍රය පෙරව සඛකීය ගෘහයවම ගොස් ඉක්බිනිව කාලක්‍රියා කොට එම පාපකර්මයෙන් ප්‍රේත ලෝකයට පැමිණි මම දහසක් යපටින් හිසවසා පෙරව වැළඳ ගණිමින් ඒදහසක් යපටින් මාගේ කය විශේෂයෙන් තැවී දවන්නාහුය, එවිට කිසි අස්වැසිමෙක් නැත, දුකඛයමනිරන්තරය, හිදීමක් සැන පිමක් නැත, එසේවූ මට බත් පැන් නම් කොයින්ද?-මෙසේ අනන්ත දුක් අනුභව කරන්නෙමි, මරණය මට නොවන්නේය"යි දැන්වීය.

ඔහුගේ ඒ වචනය අසා තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයාගෙරෙන්ම විචාරණසේක් "එම්බා සත්ත්ව මම නිවැ කවරකර්මයක් කෙරෙම්ද?-කවරකාරණයකින් මේ දුකඛයෙන් මුදම්ද?-නා පිණිස බුඩධම්සංඝ යන තුනුරුවන් විෂයෙහි ඛජපූජා කෙරෙමැදැ"යි විචාළ සේක, එකල්හි ඒ ප්‍රේතතෙම තෙරුන්වහන්සේට මෙසේ දැන්වීය, "ඉදින් දහසක් වස්ත්‍ර පතාක කොට මේ සෑ වූ චෛත්‍යයට පිදුව ම. නව, එසේ ඇතිකල්හි මාගේ මේ ප්‍රේ ; දුකින් මිදීම වන්නේය"යි කියා ඒ ප්‍රේතතෙම එහිම අන්තර්ධාන විය, ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ ඒ රාත්‍රිය පහන්ව ගිය කල්හි වහා උත්සාහ කොට වස්ත්‍ර සපයා පණසක් ලැබ දිසතඹ චෛත්‍යයෙහි පුදා තෙරුන්වහන්සේ ඒ ප්‍රේතයා සිහිකොට පින්දුන්සේක. එකල්හි රාත්‍රිභාගයෙහි ප්‍රේත තෙම තැවත අවුත් තෙරුන්වහන්සේට මෙසේ දැන්වීය, බුඩ

වහන්සේ මා උදෙසා කළ පින්කම් මදක් කොට පින් දුන් හෙයින් මාගේ හිස මස්කඳක පටන් අටගුල් පමණ තැන්හි විවෘතව සෙල්ලි දහසක් යපට පාත්ව ගියේය" යි දුන්විය. තෙරුන්වහන්සේ නැවතද වැඩ වසනු සපයා පණසක් ලදින් එසේම චෛත්‍යයට පුදමින් පින් දුන්සේක. එයින් එදවස්ද අටගුලක් පමණ යපටවල් ගැලවී මිදින. මෙම ක්‍රමයෙන් අනුන් වෙත පතළ කරුණාවට ආකරවූ ඒ මහ තෙරුන් වහන්සේගේ උත්සාහයෙන් මෙසේ ක්‍රමක්‍රමයෙන් පිළි සපයා එම චෛත්‍යයට පූජාකොට පිළි දහසම සම්පූර්ණව ගිය කල්හි ශරීරයෙහි ධරාසිටි දහසක් යපටම සඝීකාරයෙන්ම ගැලවී ගියේය.

ඉක්බිත්තෙන් දෙවන දවස්හි හෙතෙම සියලු දිව්‍යාලඞ්කාර යෙන් සැරහි අවුත් අධිරාත්‍රියෙහි මහ තෙරුන් වැඳ ඉදිරියෙහි සිටි සේය. තෙරුන් වහන්සේ දිව්‍ය විලාසයෙන් සිටි ඔහු අතින් විමාරණ සේක:—

වණ්ණවා අභිරූපොසි සබ්බාභරණභූසිතො,
සුඛවත්ථෝ සුගන්ධොසි තොත්තුම්මසි මාරිස-සී.

යනුවෙන් "එම්බා පින්වත් නිදුකානෙනි වණ්ණසම්පන්න වූ විශිෂ්ට රූ ඇති සඝීාභරණයෙන් සැරහී ශුභවස්ත්‍රයක් හැඳ සුවඳ විලවුන් ඇඟ ගල්වා බබලමින් සිටි තෝ කවරෙක්දැ" යි විමාළ කල, තෙරුන් වහන්සේගේ වචනය අසා දිව්‍යපුත්‍ර තෙම මෙසේ දන්විය ස්වාමීනි මම මීට පූර්වයෙහි ගිනිගෙණ දිලියෙන දහසක් යපට දරා සිට මහත් දුක් අනුභව කරමින් භයානක රූපව සිටියෙමි. මෙසේ මහත් දුක් අනුභව කරන්නා වූ මා ඒ දුකින් ගොඩනඟා මෙබඳු සැපතෙහි නුඹවහන්සේ මා පිහිටුවා වදාළසේක. එසේ හෙයින් මාගේ මවු පිය දෙදෙනා හා නැඟන් විසින් මා උදෙසා සඝීකාරයෙන් කළමනා කටයුතු නුඹවහන්සේ මට සාධාරණ සේක. දැන් මාගේ මේ දිව්‍ය සැප නුඹවහන්සේගේ මෛත්‍රී ආනුභාවයෙන් ප්‍රෙත භවයෙන් මිදී ලදිමි" යි ප්‍රකාශ කෙළේය. දිව්‍යාත්මය ලදින් නුඹවහන්සේ වඳනට මෙහි පැමිණි මම යම් සේ දුකින් මිදී සැපයෙහි සිටියෙම්ද එසේම මහා විරවූ නුඹවහන්සේද අහවූ සුවයෙහි හෙදී සිටිනා සේක්වයි කියා නැවතද ඒ දිව්‍යපුත්‍ර තෙම තෙරුන් වහන්සේට මෙසේ දන්විය. "ස්වාමීන් වහන්සේ උතුම් බුදරත්නයෙහිද නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර සඞ්ඝරත්නයෙහිද වරදවා කරණලද සවල්පවූවත් පාපකර්ම අනන්තවූ දුක් පමුණුවා දෙන්නේය. එසේම ත්‍රිවිධරත්නය විෂයෙහි කරණලද ඉතා සවල්පවූද ත්‍රිවිධ සම්පත සාධක වූ පූජාව අනන්ත ඵල දෙන්නේ වෙයි. එහෙයින් බුඞ්ධාදි රත්නත්‍රය විෂයෙහි වරදවා

පිළිපැදීමෙක් කිසි කලෙකත් නොකටයුතුය. සම්සම්පත්තීන් සාධනු කැමැත්තාහු විසින් රත්නත්‍රය පිදීම් ආදි පින්කම් කිරීම සුදුසු යයි කියා ඒ දිව්‍යපුත්‍ර තෙම තෙරුන් වහන්සේ වට ප්‍රදක්ෂිණා කොට වැඳ අවසරගෙණ එහිම අන්තර්ධානව ගියේයි. පතාක ප්‍රේත වස්තුව කියා නිමවන ලදී.

මහාදෙවවස්තුව නම් කවරහ? යත්-ඒ මෙසේ දතයුතු. මෙම ශ්‍රී ලඞ්කාවිපයෙහි වස්තුග්‍රාමයෙහි ශ්‍රද්ධාසම්පන්න වූ දැහැමින් ජීවත් වන මහදෙව නම් උපාසකයෙක් වූයේය. හෙතෙම වනාන්තරයෙහි කෙතක් නොව එහි ශස්‍යයන් ඇති වූ කල එයට නුදුරු වූ කුටිපැලෙක ශස්‍යයන් රක්නා පිණිස ගොස් හොත්තේය. එකල්හි මධ්‍යම රාත්‍රියෙහි එක්තරා ප්‍රේතයෙක් බත් පැන් ඉල්වා හඬමින් මහා මාගීයෙහි යන්නේය. ඔහුගේ ඒ ශබ්දය අසා මහාදෙව නම් උපාසක හොත් තැනින් නැගි දුරින්ම සිට විවාරණුයේ "එම්බා යහලුව මේ රාත්‍රියෙහි මිනිසුන් නැති වෙනෙහි බත් පැන් ඉල්වා විලාප කියමින් හඬන තෝ කවරෙක් දැ" යි විවාළේය. එවිට ඒ ප්‍රේත තෙම මේ වචනය දන්වූයේය. "යහළුව මම වනාහි මසුරු කම් නැමති යක්ෂ තෙම ආවෙසව පාපකම් කොට ප්‍රේත ලොකයට පැමිණි එක් ප්‍රේතයෙක් වීමි. මා සඳහන් කොට දන් දී පින්දෙන මාගේ කිසි නැකෙනෙකුදු නැත. එහෙයින් මම අනාථ වූයෙමි. මේ සෙස්සෝ වනාහි කැමති සේ අන්‍ය පානවගියන් කාබී ඇත් අස් රථ යානාවල නැගී නොයෙක් දිව්‍යාලඞ්කාරයෙන් සැරහී සනාථව කැමති සේ හැසිර ඇවිදිනාහු ය" යි දැන්වීය.

ඒ අසා මහාදෙව නම් උපාසක තෙම ඒ ප්‍රේතයා කෙරෙන්ම විවාරණුයේ "සියලු සම්පත් ඔහු හැමදෙන කොසින් ලැබුවාහුද?-තෝ කුමක් නිසා කුමක් නොලබන්නෙහිදැ" යි මෙසේ විවාළ කල්හි ප්‍රේත තෙම උපාසකයාට මෙසේ දැන්වීය. "ස්වාමිපිඪ නම් ගම බොහෝ මනුෂ්‍යයෝ ආහාර පාන වගියන් දන් දී නා ප්‍රේතයන් සිහිකොට පින්පෙත් දෙන්නාහුය. ඒ නා ප්‍රේතයෝ එහි ගොස් ආදරයෙන්ම පින් අනුමෝදන් වූවාහුය. එහෙයින් ඔහු හැම දෙනම ඉතා පිළිකුල් කටයුතු වූ ප්‍රේතාත්මභාවය හැර අතිශයින්ම ප්‍රවරවූ ශොභාසම්පන්න දිව්‍යශ්‍රී ලද්දානුයයි, එසේ සම්පත් ලදින් ඇවිදිනාහු ඔවුන් දැක හඬා වලපමි" යි කියා මහා මාගීයේ යමින්ම සොක කරමින් නැවත නැවත යාච්ඤා නොයෙක් අපේනා කියා මෙසේ දැන්වූ කල්හි උපාසක තෙම ඒ ප්‍රේතයාට මෙසේ දැන්වීය.

යම් කෙනෙක් මනුෂ්‍ය දෙහය හැර ප්‍රේතලොකයට පැමිණියා හුද ඔවුන් සිහිකොට පින් දෙන්නාහු නැයෝදැ" යි විවාළ කල්හි ඒ

ප්‍රෙත තෙම මහාදෙව නම් උපාසකයාට මෙසේ දැන්වීය. මිනිස්පිය සිටි කල්හි ඔවුන්ගේ නැයෝවත් නොනැයෝවත් යම් ප්‍රෙතකෙනෙකුන් උදෙසා දන් දී පින් දෙන්නාහුවි නම් ඉදින් ඒ ප්‍රෙතයෝ පින් අනුමෝදන් වන්නාහුය. ඒ පින්පෙත් ඔවුන් කරා පැමිණෙන්නාහුය" යි ප්‍රෙත තෙම දැන්වූ කල්හි උපාසක තෙම ඒ ප්‍රෙතයාට මෙසේ දැන්වීය. "මම සෙට දවස සීලවන්ත තැන් කෙරෙහි අන්නපාන වගීදි වස්තු දන්දෙමි. තෝ මනාකොට අනුමෝදන් වුවමැනව. හෙතෙම ඒ දැනගෙහි පින් ඔහු සිහි කොට දින ප්‍රෙත තෙම එසිත් පින් අනුමෝදන්ව එකල්හි දිව්‍යාත්මභාවය ලද්දේය එසේ ලත් දිව්‍ය රූපයෙන්ම ඒ ප්‍රෙත තෙම අවුත් නුදුරුව සිට පළමු සේ ම හෙතෙම අසල පැලක හොත් මහාදෙව නම් උපාසකයාට "එම්බා යහලුව කුමකින් සයනය කරන්නෙහිද? - සාන්දෘෂ්ටිකවූ කුසලඵලය නැහී බැළුව මැනව. යහපත් ඉශ්වමිත්‍ර සහාය ලදින් උතුම් දිව්‍ය සැපයට පැමිණියෙමි" යි ප්‍රකාශ කෙළේය. ඉක්බිත්තෙන් උපාසකද ඒ ශබ්දය අසා පැලෙන් පිටතට නික්ම ඔහට මෙසේ දැන්වීය. "එම්බා යහලුව දුරුව සිටි තෝ කවරෙක්හිද? - මා සමීපයට ආ මැනව, දිව්‍යාලඞ්කාරයෙන් අලඞ්කාරව සිටි හොප දිටිමි. තෝ මා කරා රිමට කුමකින් ලජ්ජා වන්නෙහිදැ" යි විවාළේය.

එවිට හෙතෙම කියනුයේ "යහලුව උපාසකය මම තන්න හෙයින් සෙසු සියලු සම්පත් සමාඩ්ඪිනම්‍වූදු මට වඤ්ඣයක් නැතිව ලජ්ජාවෙන් දුරුව සිටිමි" යි ප්‍රෙත තෙම දැන්වීය. එකල්හි උපාසක තෙම මාගේ වඤ්ඣයක් ඇති, මම තට දෙමි. වඤ්ඣය ගෙණ ඇද මා සම්පයට එව" යි දැන්වීය. එසේ කි කල්හි ඒ ප්‍රෙත තෙම උපාසකයාට මෙසේ කියේය. "මෙසේ මා අතට දෙන වඤ්ඣ සියයක් පී නමුත් මට නොපැමිණෙන්නේය. සීලවන්ත තැන් කෙරෙහි දෙනලද යම් දැන වස්තුවක් ඇද්ද ඒ හැම ප්‍රෙතයෝ අනුභව කරන්නාහුය" යි දැන්වීය. එකල්හි උපාසක තෙම රාත්‍රිය ඇවැමෙන් ආරාධනා කොට භික්ෂූන් වහන්සේලා අටනමක් වඩාගෙණවුත් සැපසේ වලඳවා ඉක්බිති එකි එකි භික්ෂූ නමකට පිළි දෙකක් බැගින් පූජා කොට උදෙන පතනය කිරීමෙන් ඒ ප්‍රෙතයා උදෙසා පින්පෙත් දුන්නේය. එකල්හි ඒ ප්‍රෙත තෙම රාත්‍රිභාගයෙහි සියලු දිගුන් ආලෝක පතුරුවා සම්පූර්ණාභරණයෙන් බබලන දිව්‍ය රූපයෙන් මහාදෙව උපාසකයාගේ ඉදිරිපිට සිට මෙසේ දැන්වීය. "මාගේ දෙමව්පියන් හා ඤාතිසාලෝහිතයන් විසින් පවා කරන්නට දුස්කර වූ ඉතා දුස්කර කම්යක් මාගේ යහලු වූ තෝ කෙළෙහිය. එහෙයින් මම උපකාරයක් කෙරෙමි: යි කියා ඔහු අත අල්වාගෙණ ගොස් නුගරුක්මුල සඩ්ඝීයෙන් පිරිසිවි නිධාන තුණක් දක්වා මේ හැම ගෙණ සැප සේ ප්‍රයෝජන විඳුව,

පින්කම්ද කොට මට පින්පෙත් දෙව" යි කියා ඔහුගේ ගෙදරට පමුණුවා ඒ හැම අන්කිසිවක්හු විසින් නො ගතයුතු සේ ආරක්ෂා කොට මහත් ඍද්ධි ඇති ඒ දිව්‍යපුත්‍රතෙම අන්තර්ධානව ගියේය.

එහෙයින් තමහට වැඩ කැමති හිතෙහිවූ ප්‍රඥසම්පන්න ජනයන් විසින් මසුරුමල නැමති යක්ෂයා දුරු කොට හැමකල්හි දැනගෙහි ඇළුම් ඇතිව වාසය කොට ඒ හැමදෙනාද මහාඍද්ධ උපාසකයා මෙන් මහත් වැඩට පැමිණෙත්වා. මෙබඳු ධර්මදේශකා වන් ඇසීමෙන් බොහෝ ජනයෝ දන් දී සඳුනි ප්‍රේතයන් උදෙසා පින්පෙත් දුන්නාහුය. එහෙයින් කුශලකාමීවූ නුවණැත්තන් විසින් දැහැමෙන් සෙමෙන් දැනවසතු සපයා දන්දීමෙන් මෙසේ අත්වැඩ පරවැඩ සැදීමෙහි අප්‍රමාදව උත්සාහ කටයුතු. **මහාඍද්ධ වස්තුව නිමි.**

තවද මෙසේ අනෙක ප්‍රකාරවූ දුක් ඇති ප්‍රේතලෝකයෙහිම තුන්ගවු පමණ උස ඇති ශරීරයෙහි ලේ මස් නැතිව ඇට සැකිලි පමණව ඒ වසා සිටිනා සමකුදු නැතිව මහදුක් විඳිනා අශීසංඛලික නම් ප්‍රේතයෝය, ඇටද නහරද වසා සිටිනා යමකුදු නැතිව කුණු මස් රැසක් සේ ඇඟ ඇති මාංශපිණ්ඩ ප්‍රේතයෝය, සියලු ශරීරයෙහි ඊදජාල කවුළුවක් මෙන් සිදුරු කරණ කඩු වැනි ලොම් ඇති අසිලෝම ප්‍රේතයෝය, නරවැනි ලොම් ඇති එම ලොම්නම් සියලු ශරීරය විඳිනා ලදුව බොහෝ දුක්ගන්නා සූචිරෝම නම් ප්‍රේතයෝය යනාදී නොයෙක් නම් ඇති ප්‍රේතයෝම උත්පත්ති යොනි වශයෙනුදු අනෙකවිධ වන්නාහුයි. ඒ මෙසේ දතයුතු.

පෙතා බහුවිධා හොන්ති පරදත්තූපජීවිනෝ,
නිජ්ඣාමතණ්හිකා වෙව පෙතාව ඛුප්පිපාසිකා,
පංසුපිසාවකා වෙව කාලකාඤ්ඤරාපිව-සි.

යනු හෙයින් "නිජ්ඣාමතණ්හික නම් ප්‍රේතයෝය, ඛුප්පිපාසික නම් ප්‍රේතයෝය, පාංසුපිසාවක නම් ප්‍රේතයෝය කාලකඤ්ඤ සුර නම් ප්‍රේතයෝයයි කියාද ප්‍රේතයෝ මෙසේ උත්පත්තියොනි වශයෙන් නොයෙක් ප්‍රභේද ඇති වන්නාහුයි.

එහි නිජ්ඣාමතණ්හික නම් ප්‍රේතයෝද ක්ෂුත්පිපාස නම් ප්‍රේතයෝද යන මේ සියලුම ප්‍රේතයෝ නොයෙක් බුඩානන්තරවල ජීවත්ව සිටිනා ඉතා දීඝ් ආයුෂයක් ඇත්තාහුය. ඔහු නැගන් විසින්ම දෙන ලද දැනයක පින්පෙත් අනුමෝදන් වීමෙන් ඒ ප්‍රේත දුකෙන් මිදෙන්නාහුය. පාංසුපිසාවක නම් වූ යම් ප්‍රේත කෙනෙක් ඇද්ද ඔහු පාංශුයෙහිම ධරා සිටි ඉතා පිළිකුල්වූ සෙම්

සොවු ආදී පිළිකුල්දේ ම අනුභව කෙරෙමින් ඇවිදිනාහුය. බෙහෙත් මූලක් අතින් ගෙණ යම් කෙනෙක් අදෘශ්‍යමානව යන්නාහු වී නම් ඔවුන්ට ඖෂධ ආනුභාවයෙන් ඒ ප්‍රේතයෝ පෙණෙන්නාහුය. ඒ ප්‍රෙතයෝද, කාලකඤ්ඤ අසුරයොනි නම්වූ යම් ප්‍රෙත කෙනෙක් ඇද්ද ඔහු වනාහි සක්වළ වට හෙයින් තුන් තුන් සක්වළ එක්වූ තැන අසූසාර දහසක් අසූසාර දහසක් යොදුන් පමණ විස්තාරායාම ඇති සක්වළගල් තුණට මැදිවූ අතුර හිරු සඳුරැස් කිසිකලෙකත් එහි නො පවත්නා මහත් ඝන අඳුරු ඇති මහාමේරු පර්වතය පවා එහි බහාලුවහොත් ලුණු පිඬක්සේ විරි වැගිර යන අධිකවූ සීත ඇති සියලු ශරීරය කපන්නට නිසිවූ ක්ෂාරොදක ඇති ලෝ ඇඳිරි මහා නරකයයි ප්‍රසිද්ධ ඒ මහානරක යෙහිවූ සියලන අධිකතරකාරන් තබා සිදියන්නාසේ කැපි යන ක්ෂාර උදකයෙහි ඉපද කකියන කබලෙක බහාලූ වෙඩරු පිඬක් සේ විරිවිරි වැගිරිමෙන් නොයෙක්වා දහස් මුළුල්ලෙහි දුක් අනුභව කොට එහි ක්ෂාරොදකයෙහිම වැගිර ගිය්කල නවදෙරින් ක්ෂාරොදකය ශරීරයට වැදී ඔවුන්ගේ සියලු ශරීරයම කියත් ආදියෙන් වෙහෙස දී කපන කලක් පරිද්දෙන් මහ දුක් විඳ ඒ දුකින් මිදී පහව යම්හයි සිතා ඇඟිලි අග කුළු වැනි නියඇති අතින් සක්වළගල අල්වා ගෙණ නැඟී එසේ නැගෙන සෙස්සන් අඳුරු හෙයින් නො දැක ඔවුනොවුන්ගේ ශරීරවල අත් වැදී ගිය කල ගන්නට නිසි දෙයක්යයි සිතා ඔවුනොවුන් ගන්නට යයි සිතා සක්වළගලින් අත්හැරපියත්, එකෙණෙහි නැවත හිස යට කොට ගෙණ ක්ෂාරොදකයෙහිම වැගිර ගියකල පළමුසේම නව දෙරින් ක්ෂාරොදක වැද කැපීමෙන් බොහෝ දුක් විඳිනාහුයි. මෙසේවූ ඒ කාලකඤ්ඤික අසුරයොනියෙ උපන් ප්‍රෙතයන්ගේ තුන්ගවු පමණ ශරීර වන්නේය. ඉදිකටුමල සිදුර සේ අති ක්ෂුද්‍රවූ මුඛය විය. කඣුළුවන්ගේ ඇස් වැනි පිටතට නික්ම නිඛෙන ඇස් ඇතිවෙත්. හිස මුදුනෙහි පිහිටා නිඛෙන ක්ෂුද්‍රමුඛය නික්ම නිඛෙන ඇස්වලින් දක්නාහුය. ඒ ප්‍රෙතයෝ යම්ක් කෑනබොන කල හිස නමා ගෙණ කා බී පියන්නාහුය. ගිනිගෙණ දිලිහෙන අයොමය මහා මුගුරු වලින් ඔවුනොවුන්ට මහත් දුක් උපදවා තලා ගෙණ අන්‍යොන්‍ය ශරීරවල යම්ගුරු පහරෙන් නැගීගිය පුගා අනුභව කරන්නාහුවෙති.

මෙසේ කාලකඤ්ඤික නම් අසුරයොනියෙහි ඉපද මහදුක් විඳිනා නිස්සිරිකවූ භයානක සවරූප ඇති ඒ ප්‍රෙතයෝද ප්‍රෙතයන්

උදෙසාම දෙන ලද දානය අනුමෝදන්ව ඒ අහෙතුක ප්‍රෙත යොනියෙන් මිදෙත්. තවද මෙසේ අනන්ත දුක් විඳිනා සඳහි ප්‍රෙතාදීන් නිසා දන් දී පින්පෙත් දීම සුදුසු පරිදි මේ මතු දක්වන කථාවෙන් අසා දතයුතු. ඒ කෙසේද? යත්:-

එක්තරා බ්‍රාහ්මණයෙක් බුදුරජානන් වහන්සේ කරා පැමිණ වැඳ එකත්පස්ව හිඳ විවාරණුයේ "ගෞතම ගොත්‍ර ඇති සම්බුදුරජානන් වහන්ස අපි අපගේ මිය පරලොව ගිය නැයන් උදෙසා දන් දී පින්පෙත් දෙමිහ. ඒ දානඵලය ඔවුන්ට පැමිණේදෙහෝ"යි විවාළේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඕනට ඒ කාරණය ප්‍රකාශ කොට දක්වා වදාරණසේක් "එම්බා බමුණ නරකයෙහි ද තිරිසන් යොනියෙහිද මනුෂ්‍ය යොනියෙහිද දිව්‍ය යොනියෙහිද උපන්නාහට ඒ විගස එහි සන්නිහිතව පින්කම් අනුමෝදන් වන්නට නො පිළිවන් බව හා ඔවුන් විසින් අනුමෝදන් වුවද ඒ ඒ ජන්මවල සිට ජාතිය පෙරළී නැවත දෙවිව දිව්‍යසම්පත් අනුභව කිරීමක් කොට පිළිවන් බව ප්‍රකාශ කොට ප්‍රෙතයන්ට එම ජන්මයෙහි සිට පින් අනුමෝදන්ව දිව්‍යව පෙරළී සියලු දිව්‍යසම්පත් අනුභව කරන්නට පිළිවන් බවද එසේ මිය පරලොව ගිය සඳහි ප්‍රෙතාදීන් පිණිස දෙන දානයත් දුස්සීලයන්ට දන් දීමෙන් ඒ දානයෙහි පින්පෙත් ප්‍රෙතයන්ට නො පැමිණෙන බවද ඒ හැර අඛණ්ඩාදි වශයෙන් යහපත්ව සිල් රක්නා යම්කිසි කෙනෙකු හට දුන් දානයෙහි පින්පෙත් නො මුලාව ප්‍රෙතයන්ට පැමිණෙන බවද එබදු පින්කම් බලා එහි පින්පෙත් ප්‍රෙතයෝ ආදරයෙන්ම අනුමෝදන් වන බවද එම පුණ්‍යානුමෝදනා හෙතු බලයෙන් ඒ ප්‍රෙතයෝ එම ජාතියෙහිම සිට නිශ්‍රීක ප්‍රෙතයොනිය හැර සශ්‍රීක දිව්‍යගතියට පෙරළී එහි ප්‍රමාණාතික්‍රාන්ත දිව්‍යසම්පත් අනුභව කරණ බවද යනාදීන් ධම් දෙශනා කොට වදාළසේක.

ඒ අසා බ්‍රාහ්මණතෙම "සවාමිවූ බුදුරජානන් වහන්ස යම් තැනක නැ ප්‍රෙතයෝ නැත්නම් ඔවුන් නිසා දුන් දානයේ පින්පෙත් කවුරු අනුමෝදන් වෙද්දෙහෝ" යි විවාළේය. එවිට බුදුරජානන් වහන්සේ "එම්බා බමුණ යම් තැනෙහා නැ ප්‍රෙතයෝ නැතිවෙද්ද එබදු තැනෙක් ලොව නැතැ" යි වදාළසේක.

මේම කාරණය අරභයා මිළිඳු රජ නාගසෙන සථවිරයන් කෙරෙන් ප්‍රශ්න විවාරණ තැන මෙසේ විවාළේය. ඒ කෙසේදයත් "සවාමිවූ නාගසේන සථවිරයන් වහන්ස දන් දෙන්නාහු මිය පරලොව ගිය නැයන් උදෙසා දන් දී ප්‍රෙතයන්ට පින්පෙත්

දෙන්නාහු ඒ දානමය පින් ඔවුන්ට කෙසේ පැමිණේ දැ" යි විචාළේය. ඒ අසා නාගසේන මහරහන්වහන්සේ 'මහරජ එසේ දෙනලද දානමය කුශලය සථානයෙහිම පැමිණෙන්නේය, අසථාන යෙහි නොපැමිණෙන්නේය" යි වදළසේක. ඒ ඇසූ මිළිඳුරජ සවාමීන්වහන්ස එහි නවර නම් තැනෙක් සථානද නවර නම් තැනෙක් අසථාන දැ" යි විචාළ රජහට තෙරුන්වහන්සේ මෙසේ වදළසේක. "යම් සඳ කෙනෙක් නරකයෙහිද තිරිසන් ජාතියෙහිද මනුෂය ජාතියෙහිද දිව්‍ය ජාතියෙහිද උපන්නාහු වී නම් ඒ ඇම දෙනම තම තමන්ගේ බන්ධුමිත්‍රාදීහු කළ පින්කම් සිහිකොට බලා අනුමෝදන් වීමට හිසි කාරණ ඒ ව තන්හි නැති හෙයින් මෙහි තැන් අසථාන නම් වෙත්. එහෙයින් ඔවුන් කරා ගොස් ඒ දානාදී පින්තෙත් නොපැමිණෙන්නේය, යම් ඤාතිසාලෝහිත කෙනෙක් මිය පරලොව ගොස් ප්‍රෙත ලොකයෙහි උපන්නාහුද ඒ ප්‍රෙතයන්ට සථාන වශයෙන්ම දානඵලය ගොස් පැමිණෙන්නේය. එහෙයින් ප්‍රෙතයෝම සථානවෙති" යි වදළ සේක ඒ අසා මිළිඳු රජතෙම නැවතත් තෙරුන්වහන්සේට දන්වනුයේ "සවාමීවූ නාගසේන සථවිරයන්වහන්ස ඒ දානය අනුමෝදන් වීමට ඉදින් ඒ සථානයට ඒ නෑ ප්‍රෙතයෝ නොපැමිණියාහු නම් කවරක්හු ඒ දාන ඵලය ප්‍රයෝජන විඳිද්දැ" යි වදළ රජහට තෙරුන්වහන්සේ වදරණසේක් "මහරජ ඤාති ප්‍රෙතයන් නැති තැනෙක් නැත. එසේද වුවත් ඔවුන්ට නොපැමිණියහොත් ඤාති ප්‍රෙතයන් කෙරෙන් පිටත් සෙසු අන්‍යවූ ප්‍රෙතයෝ ඒ දානය අනුමෝදන් වන්නාහුය" යි වදළ සේක. එවිට මහරජ දන්වනුයේ "සවාමීන්වහන්ස අන්‍යවූ ප්‍රෙත යෝද ඒ දානය අනුමෝදන් වීවට එහි නො පැමිණියාහු වීනම් කව රක්හු ප්‍රයෝජන විඳිද් දැ" යි විචාළ රජහට රජ දානඵලය දන්දුන් දායකයෝම අනුභව කරන්නාහුය" යි වදළ කල්හි මිළිඳු රජ ඒ අසා 'සවාමීවූ නාගසේන සථවිරයන්වහන්ස මේ කාරණය උපමායෙන් හෙවා වදළ මැනවැ" යි දන්වූ කල්හි උපමායෙන් වදරණසේක් "මහරජ මේ ලොකයෙහි සමහර කෙනෙක් තමන්ගේ නෑයන් දක්නා පිණිස යහපත්ව ආහාර පානවගී සදහන් ඔවුන් කරා ගිය කල ඒ නෑයෝද එහි සිටියාහු වීනම් ගෙණ ගිය හැම උපකරණයෝ ඔවුන්ට පැමිණෙන්නාහුය. ඔවුන් එහි නැතහොත් මහරජ ගෙණ ගිය ආහාර පානවගීයන් කුමක් කෙරේ දැ" යි විචාළ කල "ගෙණ ගියාහුම අනුභව කරන්නාහුය, කුමට වීනාශ කෙරෙද් දැ" යි දන් වීය. "එපරිද්දෙන්ම මහරජ ඤාති ප්‍රෙතාදීන් නිසා දුන් දානයාගේ ඵලය ඔවුන් කරා නොපැමිණිය හොත් දන්දුන් දායකයන්වම ඒ

දුනඵලය පැමිණෙන්නේය" යි කියා ප්‍රශ්න විසඳු කල්හි ඒ අසා සතුටුවූ මිලිඳු රජ ප්‍රශ්න විසඳීමෙහි නාගසේන සථවිරන්වහන්සේ ඉතා දක්ෂයේකැ" යි කියා ප්‍රශංසා කෙළේය.

මෙසේවූ නොයෙක් ප්‍රභේද ඇති ප්‍රේතයන් විසින්ම සියලු ලොව ගහණව බෙහෙවින් වසන පරිදි මේ මතු දක්වන කථාවෙන් අසා දතයුතු. ඒ කෙසේද?යත්--

අනුරාධපුර නුවර ථූපාරාම විහාරයෙහි සිට වඩනා එක් මහ තෙර කෙනෙකුන්වහන්සේ නුවරට අහර සිහා වඩනා සේක් එකල්හි ථූපාරාම දොරටුව සමීපයෙහි සිටි ප්‍රේතියෙකුගේ දරුවෝ දෙදෙනෙක් බලවත් බඩසාදුක් ඉවසා ගත නොහී හොත්තාහු ඒ වඩනා මහතෙරුන් දැක මෙසේ දැන්වූවාහුය. "පළමුවෙන්ම ලද යම්කිසි කෑයුතු දෙයක් හැර ගෙණ අනලස්වම වරට අප කරා එන ලෙස සවාමීන් වහන්සේ දැන් වුවමහාත් යෙහෙකැ" යි කිවූය. මහතෙරහු ඒ අසා ඇ අපට නොපෙණෙයි. ඊට කුමක් කෙරෙමි ද" යි වදළහ. ඒ අසා "වහන්ස මේ බෙහෙත් මුලගෙණ වදළ මැනව. එසේවූ කල පෙණෙන්නීය" යි කියා මුලක්දී ඔවුන් මවගේ සලකුණු කීහ. මහතෙරහු බෙහෙත් මුලේ ආනුභාවයෙන් ගහණව සිටි ප්‍රේතයන් දැක ගමනට අවකාශ නොලදින් මහත් උත්සාහ යෙන් ඉතා කල් ආසන්න වෙලාවට දකුණු දොරටුයෙහි සකුරු හල්බුවරුවකරා වැඩ දරුවන් කී සලකුණෙන් ප්‍රේතිය හැඳින ඔවුන් කී හසුන් වදළහ. එවිට ඒ ප්‍රේති "මා කෙසේ දුටුසේක් ද" යි විමාරා නි දරුවන් දුන් මේ මුලේ ප්‍රභාවෙන් දුටුම්හ" යි වදළහ. එවිට ප්‍රේති "මේ මුල අත නිබුවහාත් ගහණව පෙණෙන ප්‍රේතයන් ගෙන් මගයාමට අවකාශ නොලැබ මේ වහන්සේ සුන්බත් වෙනියි සිතා අතින් බේත් මුල හැරගත. එවිට ප්‍රේතයෝ නොපෙණුණාහ. මහතෙරුන්වහන්සේ වෙලා නොවරදිදු සිහා අහර ලැබුසේක, සියලු ලොව ප්‍රේතයන්ගෙන් ගහණ බව මෙයින් දතයුතු.

මෙසේ ලොව ගහණව වසන අප්‍රමාණවූ ප්‍රේතයන්ගේ සියලු දුඃඛස්කන්ධය ගට කියනලද ක්‍රමයෙන් අප්‍රමාණ වන්නේය. එසේ ඔවුන්ගේ දුක් මෙතෙකැයි පමණ නැත්තාසේ ආයුෂයද අප්‍රමාණ වන්නේය. ඔවුන් විසින් කරණ ලද පව් ගෙවී යන තාක් අනෙකා කාර කම්පාවුල් මහදුක් විඳිත්, ඒ කෙසේ දැයි කිවහොත් මේ මතු දක්වන් ලද කථාගෙන් අසා දත යුතු.

මේ කල්පයට දෙයානු කල්පයකි. එහි නම් සම්මාසම්බුදු රජානන් වහන්සේ දවස බුදුපා මොක් දන්දී තොප සිහිකොට දන්වැට සරහා දන් දෙන කල සමහර කෙනෙක් ශ්‍රද්ධායෙන්ම ඒ දානය මනා කොට පවත්වා දෙව්ලොව උපන්නාහුය, සමහර කෙනෙක් අශ්‍රද්ධායෙන් දානයත් සිඳ පුත්‍රදාරවන්ට තමතමන් කැමතිසේ දන්වැට ගසාකා ඒ පාප බලයෙන් එම කල්පය පවන් මේ කල්පය දක්වා අතුරෙහිවූ අනූ දෙකල්පයක් මුළුල්ලෙහි නාකයෙන් නරකයට ඇවිදිමෙන් නැවත නැවත අපා දුක් විඳ කකුසඳ සම්මා සම්බුදුන් දවස බොහෝ මනුෂ්‍යයෝ දන්දී නා ප්‍රෙතයන් උදෙසා පින්පෙත් දීමෙන් ප්‍රෙතාත්ම වලින් මිදී දිව්‍ය සම්පත් ලදින් හැසිරෙන්නවුන් දුන් ඒ ප්‍රෙතයෝ කකුසඳ බුදුරජාණන් වහන්සේ කරා එවුත් "සඟමින් වහන්ස තුඹවහන්සේ දවස අපට ආහරයක් ලැබේවේ හෝයි පිළිවිස අප දවස නොලැබෙන්නේය. මතු කොනාගමන නම් බුදුකෙනෙක් පහළවෙති. ඔවුන් දවස විවාළ මැනවැ" යි වදළ කල්හි ඒ බුදුන් උපදනාතාක් පොළොව සත්ගවිවක් උස වඩනාතාක් කල් මුළුල්ලෙහි මහදුක් විඳ කොනාගමන නම් බුදුරජානන්වහන්සේ දවසද පළමු ප දිදෙන්ම පැමිණ වහන්සේ දවස අපට ආහරයක් ලැබේවේ හෝයි විවාරා ඒ කොනාගමන නම් බුදුරජානන් වහන්සේ විසිනුදු ප දවස නොලබන්නේය මතු කාශ්‍යප නම් බුදුකෙනෙක් පහළ වෙති. ඔවුන් දවස විවාළ මැනවැ" යි වදළ කල්හි ඒ බුදුනුදු උපදනාතාක් පොළොව සත්ගවිවක් උස වඩනාතාක් කල් මුළුල්ලෙහි මහදුක් විඳ කාශ්‍යප නම් බුදුරජානන්වහන්සේ දවසද එසේම පැමිණ 'වහන්සේ දවස අපට ආහරයක් ලැබේවේ හෝ" යි විවාරා ඒ කාශ්‍යප බුදුන් විසිනුදු "අප දවස නොලැබෙන්නේය. මතු ගෞතම නම් බුදුකෙනෙක් ලොව පහළ වෙති. එකල්හි මිට දෙයානු කපකින් ඉට තොප නුවූ බිම්බිසාර නම් රජෙක් රජ පැමිණෙන්නේය. ඒ රජ බුදුපාමොක් දන්දී තොප සිහිකොට උදකපාතනයෙන් පින් දෙන්නේය. එකල්හි තෙපි හැම ප්‍රෙතාත්ම වලින් මිදී දිව්‍ය සැප ලදින් සතුටු වන්නහුය" යි වදළ කල්හි ඒ ප්‍රෙතයෝ සෙට ලබන දෙයක්මෙන් සතුටුව එතැන් පවන් පොළොව සත්ගවු උස වඩනා කලැයි කියන ලද බුඩාන්තරය මුළුල්ලෙහි මහදුක් විඳ අප භාග්‍යවත් ගෞතම බුදුරජානන්වහන්සේ ලොව පහළවූ කල්හි බිම්බිසාර නම් රජද රජවිය. ඒ රජ සුතු ප්‍රෙතයන් උදෙසා දන්දී න්දෙන කාරණයෙන් එම ර ගෙට එක්ව මහත්කොට ශබ්ද පැවැත්වූ කල්හි රජ ඒ අසා භයපත් බුදුන්කරා පැමිණ විවාළේය එවිට බුදුරජානන්වහන්සේ "මහරජ

තොපට එයින් වන උපද්‍රවයෙක් නැත. මේ දෙදෙනු කපුකින් යව තොප නැයෝ ප්‍රේත ලොකයෙහි උපන්නාහුය. ඔහු එක් බ්‍රහ්මතෙර යක් තොපම පතා හැසිරෙන්නාහු නොව කෙරෙන් පින්පෙත් නොලැබ ශෝකයෙන් ශබ්ද පැවැත් වූවාහු ය" යි වදළ කල්හි ඒ බිම්බිසාර රජ බුදුපාමොක් මහසඟනට ආරාධනා කොට මහදන් සරහා ආරොචිත කාලයෙන් වැඩි බුදුන් ප්‍රධාන කොට ඇති මහ සඞ්ඝයාවහන්සේ රජගෙයි මතා කොට පවත්වනලද ආසනවල වැඩහුන් කල ප්‍රේතයෝද පින් අනුමෝදන් වන පිණිස එහි රැස්ව ප්‍රාකාරාදි ඒ ඒ තැන සිටියාහුය. බුදුරජාණන්වහන්සේ ඒ දැන ඔවුන් රජගට පෙණෙනසේ අදිසිඨාන කළසේක. එහෙයින් ඒ ප්‍රේතයෝ රජගට ප්‍රකාශව පෙණෙන්නාහ. ඒ දැන සොම්නස්වූ රජ මහාවූ ආදර ඇතිව මහදන්දී "ඉදං මේ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ" යි යන මේ වාක්‍යය කියා ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේව දකිණෝදකය පානනය කළ කල්හි ඒ ප්‍රේතයන්ව එකෙණෙහිම සිහිල් දිය පිරි සිවි පස්පියුම්මන් සැදුමිලත් පොකුණු පහළ විය. ඒ දැන සතුටුවූ රජ ආහාරපාන වශීදි සියලුම දැනවස්තු ක්‍රමක්‍රමයෙන් බුදුපාමොක් මහසඟනට දන් දින. ඒ ඒ දැ දන්දුන් කෙණෙහිම ඒ ප්‍රේතයන්ට පහළ වන්නේ ඒ බව දැක අනිශයින් සතුටුවූ බිම්බිසාර රජහට අනුමෝදනා කරණ පිණිස මේ ගාථාවන් දෙශනා කළසේක.

තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිඞ්ඝාටකෙසු ච,
වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං

පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ,
න තෙසං කොචි සරති සත්තානං කම්ම පච්චයා

එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා,
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං,

ඉදං වෝ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ,
තෙව තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා,

පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ,
චිරං ජීවන්තු නො ඤාති යෙසං හෙතු ලභාමසෙ,

අම්හාකඤ්ච කතා පූජා දායකා ච අනිප්ඵලා
න හි තත්ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති'

වණිජාතාදිසු නත්ථි හිරඤ්ඤත්ථ කථාක්කථං,
ඉතොදින්නෙනයාපෙන්ති පෙතා කාලකතා තහිං

උන්නමෙ උදකංවට්ඨං යථානින්නං පවත්තති,
එවමෙවඉතෝ දින්නං පෙතානං උපකප්පති.

යථාවාරිවහා පූරා පරිපූරෙන්ති සාගරං,
එවමෙව ඉතෝ දින්නං පෙතානං උපකප්පති.

අදාසි මෙ අකාසි මෙ ඤාතිමිත්තා සඛා ච මෙ,
පෙතානං දක්ඛිණා දජ්ජා පුබ්බෙ කතමනුස්සරං.

නහිරුණ්ණං'ව සොකෝ වා යාවඤ්ඤ පරිදෙවනා,
නත්තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයෝ.

අයං බෝ දක්ඛිණා දින්නා සංඝම්හි සුප්පතිට්ඨිතා,
දීඝරත්තං හිතායස්ස ඨානසෝ උපකප්පති.

සොඤ්ඤිඛමෙවා ච අයංනිදස්සිතෝ
පෙතානපූජා ච කතා උළාරා.

බලඤ්ච හිඛ්ඛුන මනුප්පදින්නං,
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකන්ති.

නිරෝ කුඩඛ සූත්‍රය යි.

මේ නිරෝකුඩඛසූත්‍ර ධම්දෙශනාව නිමවා වදාළ කල්හි අසූහාර දහක් පමණ ප්‍රාණීහු සංවෙග සිත් ඇතිව අමාමහ නිවන්පුර වැදුනාහුය. එසේම දෙවන දවස්හිද තුන්වන දවස්හිද සතරවන දවස්හිද පස්වන දවස්හිද සවන දවස්හිද සත්වන දවස්හිද ගන සතියෙහිම එකි එකි ලෙස අසූසාරදහස අසූසාරදහස බැගින් පස් ලක්ෂ අටඅසූදහසක් පමණ දෙන ප්‍රෙතලොකයෙහි අන්නන දුක් ඇති ප්‍රෙතයන් අරභයා බිම්බිසාර රජහට දෙශනාකර වදාළ මේ සූත්‍රදෙශනාව අසා ප්‍රෙතලොකය නම් මෙබදු නිස්සිරික තැනෙක. සසර ප්‍රමාදව විසුවාහු එහි අන්නන දුක් විඳිනාහුයයි දැන කල කිරීමට පැමිණි සිත් ඇතිව සසර උත්පත්ති මූලය සිදුමහයි දෘඪතර සමාදානයෙන් ඇසූ ධම්යම ප්‍රත්‍යය කොට ගෙණ ලොභාදි කෙලෙසුන් කොරෙන් දුරුව අමාමහ නිවන්පුර වැදී සැනකී ගියාහුය. මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත නික්ෂණවූ ඇසුවන් සිතුවන්

ලය කකියන තරම් ඒසා මහත් දුක් අනුභව කිරීමක් ඇති නොයෙක් අකුශල කම්ඵල අනුභව කිරීමට සථානවූ සියලු ප්‍රෙත ලොකයෙහිවූ හැම දුකඛයන් ඇත්තේමයයි දූන ඒ ප්‍රෙතභවයෙන් මිදෙනු සඳහා දූනය ශිලය භාවනාවය යන අනනතවූ කුශලකම් රැස්කිරීමෙහි අප්‍රමාදව යෙදීමෙන් එම්බා නුවණැති සත්පුරුෂ ජනයෙනි අග්‍රවූ ශ්‍රෙෂඨවූ කෙළවරක් නැති දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නවන් සම්පත් අත්පත් කිරීමෙහි උත්සාහ කළ මැනවි.

ඉතිව සකලපෙතෙ නිබබදුකඛානුභොනෙතා
අකුසලඵල්හුතෙ හුතතොා සංවිදිතවිා,
නිවිඩකුසලකමමං සංවයහතා අනනතං
නිවිඩසුඛමනනතං වාඝමෙ සෙවිඨමඝහනති.

ප්‍රෙතලොකයෙහි ඒසා මහත් ප්‍රෙත දුක් ප්‍රකාශ කිරීමෙන් දෙව මිනිසුන් සහිත සියලු ලොකයා හට එම ප්‍රෙතභවයෙන් මිදී නිවන්පුර වදනාසේ කරණ ලද උතුම් සඛමීානුශාසනා ඇති හෙයින් අනුන් වෙත පතල කරුණා ඇති මාගේ බුදුරජාණන් වහන්සේ ශාසතෘ නම් වනසේසා. එසේ හෙයින් කියන ලදි:-

දෙවයකඛමනුසසානං ලොකෙ අසසඵලං දදං,
දදනතං දමයනතානං පුරිසාජඤඤ තෙ නමොා-සි.

මෙතෙකින් මේ ශ්‍රී සඛමීවවාද සංග්‍රහයෙහි අසුර අපාය දුකඛයන් හා ප්‍රෙතදුකඛ වණීනාවන් කියා නිමවනලදී. මේ ශ්‍රී සඛමීවවාද සංග්‍රහයෙහි අකුශල කම්ඵල හුම්වූ සතර අපායන්ගේ සවරූප ප්‍රකාශවූ අසුවම පරිවිජෙදය නිමි.

මෙසේ නවවන පරිවෙජ්දයෙන් අකුශල ඵල භූමිසංඛ්‍යාත සතර අපායන්ගේ සවරූප ප්‍රකාශ කිරීමෙන් ලෝවැඩ දක්වා තදනනතරව යථොකත ආදීනව ඇති එම අකුශල කම් විරති සංඛ්‍යාත පවශිලාදීන්ගේ සමාදාන ප්‍රභෙද ආනිසංසතාවෝද මෙහි දක්වනු ලැබෙත්.

භෙද වනාහි "එවං සරණාගතෙහි පන උපාසකොපාසිකා ජනෙහි සීලෙපනිච්ඡාය" යනාදි වීසින් උපාසක ජනාලඞ්කාරයෙහි ද ප්‍රතිපත්ති සංග්‍රහයෙහිද ප්‍රකාශ ක්‍රමයෙන් නිත්‍යශිල උපොෂථ ශිලයන්ගේ සමාදානාදිය දක්වන්නේසි. යට කී ක්‍රමයෙන් සරණ ගිය උපාසකොපාසිකා ජනයන් වීසින් ඒ නිත්‍යශිල උපොෂථ ශිලයෙහි පිහිටා සුදුසු ඛුතාඛය සමාදානයෙන් යෙදී ශිලය

පිරිසිදු කොට ගෙණ පස් වෙළඳුමෙන් දුරුව දූහැමෙන් ජීවත් වීමෙන් උපාසක පද්ධතියට පැමිණ දවසක් දවසක් පාසා දස පින් ක්‍රියාවන් පුරා සඟමොක්ෂ දෙකට අන්තරායකරවූ පාප ධර්මයන් කෙරෙන් දුරුව ලොව්තුරා සම්පත් සාධනය යුතු.

ඒ උපාසක ශීලය වනාහි නිත්‍යශීලවූ පවශීලය හා දශශීලයද උපෝෂථශීලවූ අෂ්ටාඞ්ගශීලයද යන මේ දෙවැදෑරුම් වේ. ශීලයන් අතුරෙන් පවශීලය නම් සැවැත්නුවර නිසා දෙවරම්හි වාසය කරණ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සාමණේර ශික්ෂාපද නියම කරණ පිණිස පාණාතිපාතා වෙරමණී සිකඛාපදං සමාදියාමි, අදින්නාදානා වෙරමණී සිකඛාපදං සමාදියාමි, අබ්‍රහ්මචරියා වෙරමණී සිකඛාපදං සමාදියාමි, මුසාවාදා වෙරමණී සිකඛාපදං සමාදියාමි, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සිකඛාපදං සමාදියාමි, විකාලභොජනා වෙරමණී සිකඛාපදං සමාදියාමි, නච්චගීත වාදිත විසූකදස්සනා වෙරමණී සිකඛාපදං සමාදියාමි, මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සිකඛාපදං සමාදියාමි, උච්චාසයන මහාසයනා වෙරමණී සිකඛාපදං සමාදියාමි, ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී සිකඛාපදං සමාදියාමි" යන මේ දශශීල ශික්ෂාපදයෝ පණවා වදරණ ලද්දහුගි.

ඒ දශශීල ශික්ෂාපදයන් අතුරෙහි ප්‍රාණාතිපාතාදි පස්පව් අබුඩොද්පාද කාලයෙහිදු ලොව නුවණැත්තන් විසින් හැරියයුතු මහත් ලොකවජ්‍යවූ පාප කර්මයන් බැවින් අප බුදුන් බුදුවූ කලත් එම පස්පව් නො කරණ ලෙසම ශික්ෂාපද පණවා වදළ හෙයින් ප්‍රඥප්තිවජ්‍යවූ ඒ අකුශලයන් කෙරෙන් දුරුවීම පවශීල නම් වේ. මේ පවශීලය දක්වන තැන දශශීලයෙහි තුන්වෙනි අබ්‍රහ්මචරියා විරමණ ශික්ෂාපදය හැර පරදුර සෙවනයෙන් දුරුව තමන් අයිති භාර්‍යාවන් නිසා සතුටුවීමත් මේ බ්‍රහ්මචරියාව වන බැවින් "කාමේසුමිච්ඡාචාරා වෙරමණී සිකඛාපදං සමාදියාමි," කියා මිථ්‍යාචාර අකුශලයෙන් දුරුවීම තුන්වෙනි කොට දක්වනලදි. ඒ පවශීලය සමාදන්වන උපාසක ජනයන් විසින් පළමුකොට තමා විසින් සමාදන්ව ගත් සරණගමනයාගේ නො බිඳීම පරීක්ෂා කටයුත්තේය. ඉදින් යම්කිසි අසත්පුරුෂ සංසර්ගාදි යම් කාරණයකින් සරණය බිඳුනේ වී නම් ඔහු විසින් පළමුකොට සමාදන්වූ සරණය නැවතත් සමාදන් විය යුතු. සරණය නො බිඳුනේ වී නම් පඤ්චශීලය පමණක් සමාදන් විය යුතු. නමුත් සරණය ඇත්තහුම වී නමුත්

නැවත සරණයාම නිවරදි බැවින් ශීල සමාදානයට පූර්වයෙන් පිහිටා ගත් සරණාගමන ප්‍රණාමයෙන් තමාගේ චිත්තසන්තානයෙහි පැවති විරුද්ධ ක්ලේශයන් පහවූ කල්හි පහවූ පවශීලයාගේ විපුල තරඵල ප්‍රතිලාභයට හෙතුවන බැවින් සරණාගමනය පූර්වාඞ්ගම්ව සමාදන්වීම සුදුසු මැයි. එසේ සමාදන්වන්නහු විසිනුදු ශීලලක්ෂණ දන්නා භික්ෂූනමක් හෝ භික්ෂුණියක හෝ සාමණේර උපාසක උපාසිකා කෙනෙක් හෝ ලද්දේ විනම් ඔවුන් සමීපයෙහි බුදුන් කෙරෙහි ගෞරව උපදවාගෙණ සතුටු සොම්නසින් පිරීම හිත් මෙත් ඇතිව අජ්ජදිවසං කියා හෝ අජ්ජාදිංකත්වා කියා හෝ ඉමස්මිං පකෙඛමාසෙ උතුමිනි සංවච්ඡරෙ කියා හෝ මෙසේ කාල පරිච්ඡේදවත් උත්සාහ ඇතොත් ආපාණකොටිකා කියා ජීවිත පරිච්ඡේදවත් සිල් දෙන්නාහු විසින් තම තමන්ගේ සවකිය භාෂාව කියා හෝ වාක්භේද කොට පව ශීලය සමාදන් වීය යුත්තේය. එසේ සීලදායක අන් කිසි කෙනෙකුන් නොලද හොත් තුමූම කියන ලද ක්‍රමයෙන් සමාදන් වීය යුතුය:—

උපොසථ ශීලය නම් යට කියන ලද දශ ශීලයෙහි ප්‍රාණාති පාතාදි පව ශික්ෂාපදයන් හා විකාලභොජන විරති ශික්ෂාපදය සමෙනි කොට ගෙණ සත්වෙනිවූ නච්චගීතාදීන් විරමන ශික්ෂා පදය ද අටවෙනි වූ මාලාගඞ්ධාදීන් විරමන ශික්ෂාපදය ද යන මේ දෙක අෂ්ටාඞ්ග ශීලය දක්වන තැන සත්වෙනි එකම ශික්ෂාපදයක් කොට සමාදන්ව උච්චාසයන විරමන ශික්ෂාපදය අටවෙනි කොට සමාදන් වන ලද ශීලය අෂ්ටාඞ්ග ශීලය නම් වේ. ඒ ශීලය වනාහි අට්ඨඞ්ගසමන්නාගතෝ බෝ විසාඛේ උපොසථෝ උපවුත්ථෝ යනාදි ක්‍රමයෙන් උපොසථ සූත්‍රයෙහි දක්වා වදාළ බැවින් උපෝසථ ශීල යයි කියනු ලැබේ. එහි ප්‍රාණාතිපාතාදි පස්පව් විභාගය ද දශ අකුශලකර්ම පථ ප්‍රභේදය කී තැන ප්‍රකාශ ක්‍රමයෙන් බලා දතයුතු.

අබ්‍රහ්මචරියා විරමන ශික්ෂාපදාදි සෙසු ශික්ෂාපද විභාගය මෙහි දක්වනු ලැබේ.

අබ්‍රහ්මචරියාව නම් ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ සම්වාසසංඛ්‍යාත අසෙට්ඨචරියාවය. ඒ මෛථුනය වනාහි "අපපඤ්ඤතාමා බහු දුක්ඛා බහුපායාසා බහුආදීනවා එත්ථනියෝ," යනාදි ක්‍රමයෙන් නින්දිත වූ ගර්හිත වූ හීන ක්‍රියාවක් වන බැවින් ශ්‍රේෂ්ඨ නොවූ ප්‍රශස්ත නුවූ ස්ත්‍රී පුරුෂයන්ගේ ලාමකචර්‍යාව යයි කියනු ලැබේ. අනිෂ්ට වශයෙන් වනාහි කායචාරයෙහි පැවති අසඞ්ගම් ප්‍රතිසේවන ස්ථානයෙහි මෛථුන සේවන වෙක නාව අබ්‍රහ්මචර්‍යා නම්. එහි අසඞ්ගම් ප්‍රතිසේවන

ස්ථානයම සත්‍ව පුරුෂාදීන්ගේ තුන් ප්‍රකාර වූ ද ස්ත්‍රීප්‍රකාර වූ ද මාංශ යන්ගේ ප්‍රකෘතිවාතය නොවදනා තැන අසඛ්‍යප්‍රතිසෙවනස්ථාන නම් වේ. ඒ මාංශ සෙවනය කිරීමය යන අර්ථ්‍යවශ්‍යතාවෙන් වෙන් වීම ශ්‍රේෂ්ඨවූ වරියා නම්.

විකාලභොජනය නම්, වැළඳිය යුතු අවීයෙන් භෝජන නම්වූ කෑද බත් ආදි පෙරවරු වැළඳිය යුතු සියල්ල යාවකාලිකවස්තු නම්, අවීවශයෙන් වනාහි ඒ යාවකාලික වස්තූන්ගේ විකාලයෙහි වැළඳීමය යන කායවාරයෙහි පැවැත්තාවූ විකාලයෙහි යාවකාලිකවස්තු අනුභව කරණ චෙතනාව විකාලභොජනයයි දතයුතු.

නව්වගීතවාදිත විසූකදස්සනා යන්තෙහි නව්ව නම් තමා නැටීම හා අනුන් ලවා නටවාලීමයි. ගීත නම් තමා ගායනා කිරීම හා අනුන් ලවා ගායනා කරවීමයි. වාදිත නම් තමා බෙර ආදිය ගැසීමහා අනුන් ලවා ගස්වාලීමයි. විසූකදස්සන නම් මෙකී නෘත්‍ය ගීත වාදනයන්ගේ දැකීම හා ඇසීම ද බ්‍රහ්ජාල සූත්‍රයෙහි හස්ති අශ්ව යුධ දැකීම හා එළුවන් කුකුළන් ආදීන්ගේ පොරසෙනග දැකීමය යනාදි විසුළු දස්සනෙන් දුරුවීම වදුළ බැවින් නෘත්‍යාදීන්ගේ දර්ශන ශ්‍රවණය වනාහි සබ්බපාපස්ස අකරණං යනාදි නයින් පැවැත්තා වූ භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනාවට අනුලෝම නොවන බැවින් නුසුදුසු බැවින් නොකටයුතුමය. මෙහි විසූකදර්ශනයෙන් ශ්‍රවණය ද සංගෘහීත විය. එහෙයින් නමා හෝ මෙහෙයන ලද නෘත්‍ය ගීතාදි සියල්ල දක්නට හෝ අසන්නට හෝ පෙහෙවස් සමාදන් වූවාහට නොවටනේ යැ කියනලදී. අවී වශයෙන් වනාහි නෘත්‍යාදිය තුමූ කිරීම අනුන් ලවා කරවාලීම මෙහෙයන ලද දෙයක් දැකීම ඇසීම යයි කියන ලද කායවවිචාර දෙක්හි පැවැත්තාවූ දුස්සීල්‍යචෙතනාව නව්ව ගීත වාදිත විසූක දස්සනයයි කියනලදැ යි දතයුතු.

මාලාගන්ධවිලෙපන ධාරණමණ්ඩනවිභූසනට්ඨානයන්හි මාලා ශබ්දයෙන් කියේ ගෙතූ නොගෙතූ කිසියම් මල්ජාති ඇද්ද ඒ සියල්ල මාලා යයි දතයුතු. පෙහෙවස් සමාදන් වූවාහට අලඞ්කාර පිණිස කයින් ඒ මල් දැරීම නොවටනේයි. ගන්ධ ශබ්දයෙන් කියේ සුවඳ කැවූ වූණී සුවඳ දුම් හා විලෙපනයෙන් පිටත් අන්‍ය වූ ද යම් සුවඳ ජාතියෙක් ඇද්ද ඒ හැම උනුනැන් පිරවීම ද සුවඳවත් මණ්ඩනය ද නොවටනේයි. විලේපන ශබ්දයෙන් කියේ ශරීර මුඛ ජිව්වණීය වඛනා පිණිස ගැල්වීමට අඹරා පිළියෙල කරණ ලද

මැටිකල්ක තලකල්ක කාසාකල්ක ආදි වූ යම් කිසි මුඛ වූණියෙක් ඇද්ද ඒ සියලු ශ්‍රවිරාග කරණය විලෙපන නමැයි දතයුතු. ඒ සියල්ල ශ්‍රවිවණී වශයෙන් විභූෂණය ද නොවටනේයි. ඒ මෙසේ තුන්වැදෑරුම් වූ මල්ගඳවිලවුන් යථා ක්‍රම වූ ධාරණාදි වශයෙන් ලෝවැසි ජනතෙම කායවාරයෙහි පැවති දුස්සීල්‍ය චෙතනාව හෙතු කොට ගෙණ සෙවනය කරන්නේය. ඒ මාලාගඛ්ධ විලෙපනයන්ගේ ධාරණය ද මණ්ඩනය ද විභූෂණය ද යන මේ සියල්ල පෙහෙවස් සම්දන් වූවාහට නොවටනේයි. සැරහිම් වශයෙන් නොඉවසන්නාහට මුඛයෙහි විවණීභාවය පහකරණ පිණිස බෙහෙත් වසයෙන් සෙවනය කරන්නාහට ද වරද නැති.

උච්චාසයන මහාසයනා යන්නෙහි උච්චාසයන නම් මධ්‍යම ප්‍රමාණ වූ පුරුෂයාගේ අතින් මිටිරියනින් උස් පා ඇති සයනය උච්චාසයන යයි දතයුතු. හෙද මධ්‍යම ප්‍රමාණ පුරුෂයාගේ අතින් මිටි රියන් උස් පා ඇති සයනය උච්චාසයන යයි දතයුතු. හේ මධ්‍යම ප්‍රමාණ පුරුෂයාගේ මිටිරියන් ප්‍රමාණය වනාහි දැන් මේ ලොව පවත්නා වඩුරියනෙන් රියනෙක. ඒ ප්‍රමාණය ඉක්ම සිටි ආසන්දි යයි කියනලද පාදවල ව්‍යාලරූප පිහිටුවා කරණ ලද දික්සඟලා පුටුව පයීඞ්ක නම්. එහෙයින් සයන ග්‍රහණයෙන් ගත් පමණ ඉකුත් හිඳිනා ආසනයක් හෝ සැනපෙන ආසනයක් හෝ ලැබ කැප ඇතිරිලි අතුලේ වී නමුදු උස් ආසනය දේ හෝ නොවේ දේ හෝ සි පරීක්ෂා කොට පාදතල පවත් සයනයාගේ අවනියට කෙළවර දක්වා ඇසින් දුටු ප්‍රමාණයෙන් හෝ හස්ත ප්‍රමාණයෙන් හෝ මැන නියම කොට ගෙණ කියන ලද ක්‍රමයෙන් ඉදින් මිටිරියන් පමණ පා ඇති කැප ආසනයෙක් වීනම් වලංජනය කටයුතු. හෙවත් හිඳීම් සැනපීම් වශයෙන් පරිභොග කටයුතු. කැප නැත්තේ වීනම් දැමිය යුතු, මඤ්චඡ්මාසංවේ සයෙථ සන්ථතෙ යනු වදුළ බැවින් කැප ඇතිරි අතුල බිම හෝ තො අතුල බිම හෝ තෘණ පණි අතුට කරණ ලද ආසනාදියෙහි හිඳීම සැනපීම කටයුතුය. කලාල් පැදුරු ආදිය කැප ඇතිරිලි සංග්‍රහයට ගියහසි දතයුතු. මහාසයන නම් කැප ඇතිරිලි මහත් බැවින් මහාසයනය යන සතරහුලෙන් අධික දික් ලොම් ඇති ගොන කාදි අකැප ඇතිරි අතුල ඇද පුටු යසි දතයුතු. එහි අකප්පියාස්තරණයෝ නම් ගොනකො චිත්තිකා පටිකා තූලිකා උද්දලෝමී එකන්තලෝමී කාඃසිඃසුං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරකො අස්සත්ථරකො රථත්ථරකො අජිනපව්හෙණී කාදලිමිගපවරපව්වත්ථරණං සඋත්තරච්ඡදං උභතො

ලොභිතකූපධානං යි අනෙකප්‍රකාරවූ අකප්පිය ආස්තරණයන් අතුෂ්ණන් යම්කිසි ඇතිරියක් අතුල සන්තානසන්තයක හෝ යටත්පිරිසෙයින් හුමියෙහි හෝ අතුව හිඳිනට හෝ සැතපෙන්නට හෝ පෙහෙවස් සමාදන්වූවාහට නොවටනේය.

එහි ගොඝකාදි ආස්තරණයන් දක්නා කැමැත්තන් විසින් බ්‍රහ්මජාලසූත්‍ර ව්‍යාඛ්‍යානාදියෙන් බලාදතයුතු, අජීවහේතුයෙන් වනාහි කායවාරයෙහි පැවති අකප්පිය උවාසඝන මහාසඝනයන් පරිභෝග කිරීමය යන දුස්සීල්‍යචෙතනාව උවාසඝන මහාසඝන යයි දතයුතු, යටකියනලද ක්‍රමයෙන් අනෙකාදීනව ඇති ප්‍රාණාතිපාතාදි අකුශලයන් කෙරෙන් විරමනසුභාවවූ උවාසඝනාදීන් විරමනය අවසානව සිටි මේ විරතිශීලශික්ෂාපදයන් අටදෙනාගේ සමාදානය උපොසථශීල නම්වේ, ඒ උපොසථශීලය සමාදන්වන්නහු විසින් සෙව දවස පෙහෙවස් සමාදන් වෙමියි සිතා අද දවස මෙනම්මෙනම් දෙයක් කරවයි කියා දෙවෙනිදු පෙහෙවස් සමාදන්ව සිට ගෙදරදොර කළමනා කවයුතු, විවාරීම ක්‍රසුදුසු බැවින් ආහාරාදි සියලු කවයුතු නොමුළාව කරණලෙස විවාරා ඔවුනොවුන්ට හාරකොට පෙහෙවස් සමාදන්වනදු උදසනම යටකියනලද ක්‍රමයෙන් සීලලක්ෂණාදන්නා තැනක් කරා පැමිණ හෝ තැන හොත් උපාසකශීලය තුමූම සමාදන්වීම වටනා බැවින් තුමූම හෝ පළමුවෙනකොට සරණාගමනය සමාදන්ව අහං භන්තෙ අජ්ජ ඉමවදිවසං ඉමවරත්තිං කියා වේ ආදි ක්‍රමයෙන් කාලපරිවේදකොට උපොසථං උපවසාමි අට්ඨඞ්ගසමන්නාගතං සීලං සමාදියාමි යනුයෙන් එක්කොට සමාදන්ව නැවත ඒ ඒ ශික්ෂාපද නානාවිරති වෙතනාවන බැවින් වෙන්වෙන්වද සමාදන්වීම සුදුසු හෙයින් පාණාතිපාතා වෙරමණි සික්ඛාපදං සමාදියාමි—පෙ— උවාසඝන මහාසඝනා වෙරමණි සික්ඛාපදං සමාදියාමි යන මේ පාලික්‍රමය කියා හෝ පාලිය නොදන්නාක්හු විසින් සිකපද වෙන්වෙන්ව තමතමාගේ භාෂාවෙන් කියා හෝ එසේත් නො පිළිවන් විනම් බුඩපඤ්ඤත්තං උපොසථං අධිට්ඨාමි කියා එක්කොට අධිෂ්ඨාන කිරීම වශයෙන් හෝ යන මේ එක්තරා ආකාරයකින් හෝ වාක් භෙදකොට සමාදන්විය යුතු මෙසේ පෙහෙවස් සමාදන්වූ උපාසකඋපාසිකා ජනයන්විසින් සීලසමාදානයෙන් ලැදුනුතැන්පවන් අන්සොහොනකුට හිංසාපීඩාවන කම්මාන්ත විධාන නොකට සුත්තේය, ගෙහි අය වියදම් ගණන් නොබලා ගෙට අවුත් නිතිබත් වලඳන භික්ෂුකෙනෙකුන් මෙන් සංඝිදී හිඳ දිළිඳු විහාරයට

ගොස් බණ ඇසීමෙන් නොහොත් විවෙක සථානයෙක්හි හිඳ බුදුන්ගේ ගුණ සිහිකිරීමය තමාගේ ශීලය සිහිකිරීමය ආනාදිවූ අව තිස් අරමුණෙන් එක් අරමුණක් නිරන්තරයෙන් සිහිකොට සිත පිරිසිදු කටයුත්තේය, මේ අෂ්ටාඞ්ගශීලය ලබන ලාභ සත්කාර කීර්තිප්‍රශංසාදියක් නිසා රක්ෂාකිරීමෙනුත් සීලය කිළිටුවන්නේය.

තවද මෛථුනයෙනුත් සීලයකඩවන්නේය ඒ සප්තමෛථුනය නම් කවරහුයත්, මේ පෙහෙවස් වසන අතුරෙහි ස්ත්‍රීන් හා සමග අසඞ්ගියෙහි නොපවතිනත් සන්‍රියමියින් කරණලද ඇඟ ඉලීම් ආදියක් ඉවසිනම් මේත් එක මෛථුනයක. එසේ නොඉවසනත් ස්ත්‍රීන් හා එක්ව කථා සිනා ක්‍රීඩා ආස්වාදදිය කෙරේද මේත් එක මෛථුනයක, මෙකී දෙය නොකරනත් තමාගේ දෘෂ්ටියෙන් සන්‍රියගේ දෘෂ්ටිය පැහැර බලාද ඇඟ බැලීමෙන් ආස්වාදදිය කෙරේද මේත් එකඇමෛථුනයක. එසේ නැවත කථාසල්ලාප රොදින ගායනාදි ස්ත්‍රීශබ්දය පිටිබිතක හෝ පවුරෙන් පිටත හෝ සිට අසාද ඒ ඇසූශබ්දය ආස්වාදකෙරේද සහානුභවෙද මේත් එක මෛථුනයෙක, එසේ නොකරනත් ස්ත්‍රිය හා සමග පූර්ෂානුභූත කෙළි සිනා සිහිකොට ආස්වාසාදිය කෙරේද මේත් එක මෛථුනයක, එසේනැත දරුශබ්දාදි පස්කාමරසයෙන් සන්තර්පිතව වසන්නාවූ ගෘහපතිපුත්‍රාදීන් දැක ආස්වාදවශයෙන් සන්තුෂ්ටවේද මේත් එක් මෛථුනයෙක, එසේ ඉසුරුමතුන් දැක ඔවුන්ගේ සැප විඳීමට ආස්වාදනොකරත් මේ රක්ෂා කරණශීලාදියෙන් ශක්‍රාදි දෙවිකෙනෙකුන්ගේ තනතුරට පැමිණෙම්යි පතාද දිව්‍යසම්පත්හි යට ආශ්වාදකෙරේද මේත් එකමෛථුනයෙක, මෙසේ දක්වනලද සප්තවිධ මෛථුනයන් අතුරෙන් එකකින්ම ශීලය කඩවන්නේය සිදුරුවන්නේය, කිළිටුවන්නේය, එසේම පෙහෙවස් සමාදන්වූ උපාසිකාවන් විසිනුදු පුරුෂයන්ගේ ඇඟඉලීම ආදිය මෙකී ක්‍රමයෙන්ම ඉවසා සතුටුවන්නේවිනම් ඒ සීලයද කඩවන්නේය, සිදුරුවන්නේය, කිලුටුවන්නේය, අන්‍යවූප්‍රකාරයකිනුදු පෙහෙවස් විසීම අනුදුන වදරණලදී, ඒ කෙසේදයත්, "පාලියං තාවේ බහුමනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤඤ බ්‍රහ්මඤඤ කුලෙජෙට්ඨාපචායිනෝ උපොසථං උපවසන්ති පරිපූරොන්ති පුඤඤානි කරොන්තී" ති.

මෙහි අර්ථ නම් මනුස්සෙසු, මිනිසුන් කෙරෙහි; බහුමනුස්සා බොහෝ මිනිස්සු. මත්තෙය්‍යා පෙත්තෙය්‍යා, මවුපියන් පුදන්නාහුය.

සාමඤ්ඤබ්‍රහ්මඤ්ඤ, ශ්‍රමණබ්‍රාහ්මණ ඒ පුදන්නා ; කෘල ජේට්ඨාපචායිකො, කුලදෙටුවන් පුදන්නාහුද; උපසථං උපසන්නි, මසකට අටවරක් බැගින් පොහෝ වස්වල පෙහෙවස් සමාදන්ව වසන්නාහුය; පටිජාගරොන්නි, පටිජාගරතම් උපොසථඤ්ඤමිය කරන්නාහුය; පුඤ්ඤනිකරොන්නි, තමාගේ සිතපිණවනහෙයින් පින්යයි කියනලදනම් ඇති අන්‍යවූද කුශලකම් කරන්නාහුයැයි කියා පාලියෙහි ප්‍රකාශ බැවින් පටිජාගරොන්නි යන මේ පදයෙහි අත්ථවණ්ණනාකරණ පූර්වාචාර්‍යවරයන් විසින් මෙසේ වර්ණනා කරණලදී. ඒ කෙසේද? පොහොයක් පොහොයක් පාසා පෙහෙවස් සමාදන්වන පින්කැමති සත්පුරුෂ උපාසක උපාසිකා ජනයන් විසින් වඩවඩා කුශල්වඩන අධිකතරශ්‍රද්ධාවෙන් පොහොදිනවලට පූර්වපර දවස්වලද පව්වුග්ගමනානුභාවන වශයෙන් උපොසථ ශීලය සමාදන්විය යුතුමයැයි කියා ප්‍රකාශකරණලදී, එසේ අන්‍යවූද පෙහෙවස් විසිමක් ඇත්තේය, ඒ කෙසේද? යත්:-

චාතුද්දසිං පඤ්චදසිං යාවපකඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතන්ති

යනාදී පාලියෙහි අත්ථවණ්ණනාකල තැන පාටිහාරියපක්ෂයැයි කියා දැක්වූයේ නිස්සූන්වහන්සේලා ශාසනපිළිවෙත් පුරමින් වස් ඉවා වාසයකරණ ඇතුළුතුන්මාසය, ශ්‍රද්ධාසම්පන්න උපාසකජනයෝ ඒ වස්තුන්මාසයෙහි නිබඳ පෙහෙවස් සමාදන්ව කුශල වඩනයෙන් යෙදී වසන්නාහුය, එසේ නොහැකි වූවන් විසින් මහා පවාරණයැයි නමිලද වක්මාසපුරදෙපෝය පටන් පශ්චිමපවාරණ නම්ලද ඉල්මස පුරදෙපෝය දක්වා එක් මාසයක් පමණ නිබඳ පෙහෙවස් වස්තුන්මස හෝ මාසයක් හෝ අඩමාසයක් පමණ කාලයෙහි හෝ අධිකවියැයිකොට උපොසථශීලය රක්ෂාකිරීම උපාසකොපාසිකාජනයන්ට සුදුසුවන්නේමය, සෙසු ආචාර්‍යයන් වහන්සේලාගේ මතයෙන් එකවර්ෂයකට හෙමන්න ගිම්හානය, වස්සානයකියා යාතුතුනෙක් වන්නාහුය, ඒ තුන් යාතුයෙහිම එකිනෙක අඩමාසය අඩමාසය බැගින් පෙහෙවස් සමාදන්වීම වවිනේයැයි කියනලදී. උපොසථශීල ශික්ෂාපදයන්ගේ ඝණීභූතය පොහොදවස හැර සෙසු දවස්හි විරුඬදූයි කිවහොත් විරුඬනැත්තේය, ලොකයෙහි සතදිවසයැයි කියා වෙන්ව දවසක් ඇත්තේ නොවෙයි සතකෙළිකාල දවසට කියනනමෙක, එමෙන් උපොසථශීලය

සමාදන් වූ පින්ට පොහොදිනය යනු නමෙක. එහෙයින් ලොකයෙහි අධිකතරව කුශල වර්ධනය කරගන්නා කැමති නුවණැත්තන් විසින් පවමි අෂ්ටමි චාතුර්දසී පඤ්චදසී යන පොහෝ දිනවලට පුරීපර දවස්වල පටිහත උපොසථයයි කියා පෙළෙවස් සමාදන් වීමෙන්ද ප්‍රාතිහාර්‍ය උපෝෂධයයි කියලද ඇසළ මස පුර දෙපෝයෙහි පටන් වස්තුන්මස හෝ වක්මස දෙපෝයෙහි පටන් මාසයක් හෝ අර්ධමාසයක් හෝ උපොසථශීලය සමාදන් වන උපොසකොපාසිකා ජනයන්ගේ ශ්‍රද්ධාවීර්‍ය බල ප්‍රමාණයෙන්. ඒ ඒ කාලපරිවේදවූ ලෙස පෙළෙහවස් රක්ෂාකිරීමෙන්ද ධම්ශ්‍රවණාදි කුශල ධර්මයෙහි අප්‍රමාදව යෙදෙනසේ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ අනුදැනවදරණ ලදී. එහෙයින් දුකසේ ලත් මනුෂ්‍යසම්පත් සඵල කොට ගන්නා කැමති නුවණැති සත්පුරුෂයන් විසින් සෘතුමාසපක්ෂ දිවාරාත්‍රාදි වශයෙන් කාලපරිවේද නියම කොටගණ මෙසේ උපොසථාඞ්ග වශයෙන් රැක්ක යුතු සීලය උපොසථශීල නම් වෙයි. එසේ කාල නියම කිරීමෙන්වත් නොකොට ජීවිතාන්තය දක්වාවත් නියම ගෙණ සමාදන්ව රක්නා ශීලය නිත්‍යශීල නම් වේ. ඒ නිත්‍යශීලයයි කියා පවශීලය හා දශශීලය පමණක් ප්‍රකාශ බැවින් හා තුන්වෙනි ධම්සඞ්ගායනා කථාවෙහි ධර්මාශෝක මහරජ අසූහාරදහසක් විහාර කරවා විහාර පූජා කාලය නියම කොට ඒ තාක්කල් හැමදෙනම අෂ්ටාංගශීලය සමාදන්ව රක්ෂා කළ යුතුයයි ආඥා කළ හෙයින්ද අෂ්ටාඞ්ග ශීලයම උපොසථශීලයයි ප්‍රකාශව පෙණෙන හෙයින්ද ප්‍රතිපත්ති සංග්‍රහයෙහි නිත්‍යශීල වශයෙන් අෂ්ටාඞ්ග ශීලයාගේ රැකිම නිවරදි බව ප්‍රකාශවී නම්වූ විමසා බලා දත යුතුයි කියා උපාසක ජනාලඞ්කාරයෙන් දැක්වූයේ වී නම්වූ ඊට පළමුව වදරණ ලද ප්‍රතිපත්ති සංග්‍රහයෙහි නිත්‍යශීල වශයෙන් රක්නට අනුදත් දශශීලයෙහිම අෂ්ටාඞ්ගශීලය ඇතුළත්ව සිටි හෙයින් විශුද්ධිමාර්ගයෙන් නිත්‍යශීලය දැක්වූ තැන 'දසවා" යන වා ශබ්දයෙන් අෂ්ටාඞ්ගශීලයත් ඇතුළත්ව සිටි හෙයිනුත් දශශීලයෙන් පිටත් ශික්ෂාපදයන් අෂ්ටාඞ්ගශීලයෙහි දක්නට නැති හෙයිනුත් භික්ෂූන්වහන්සේලාට අනුදත් විනය පිටකයෙහි නා හිකඛවෙ අනුපොසථෙ උපොසථො කාතබබා යනුයෙන් අනුපොසථ දිනයෙහි පොහොය නො කටයුතුයයි කියා භික්ෂූන්ට ප්‍රතික්ෂේප කළසේ පොහොදින හැර සෙසු දවස්වල උපොසථ ශීලය සමාදන් නොවිය යුතුයයි ප්‍රතික්ෂේපයකුත් නැති හෙයිනුත් උපාසක ජනයන්ගේ ශ්‍රද්ධාප්‍රමාණයෙන් අෂ්ටාඞ්ගශීලයද නිත්‍යශීලාදි වශයෙන් රක්ෂාකිරීම සුදුසු වන්නේයයි හඟිමි?

එහි සෙසු ශික්ෂාපදවලට ඒ ඒ හෙයින් ජාතරූප රජතාදීන් විරමන ශික්ෂාපදයන්ගේ අර්ථය පමණක් මෙහි දක්වනු ලැබේ ජාතරූප යන්නෙහි ජාතරූප නම් රත්රන්ය, රජත නම් රිදීය, ලොහමාසක් ජතුමාසකාදී යම් යම් තැනක ව්‍යවහාරයට යන මසුරුජාතියෙක ඇද්ද රන් රිදී තඹ එක්කොට රූනගාකල් කහ වණුද යන මේ සියල්ල තමා පිණිස දුන් තැන හෝ අස්වාමිකව තුබූ රන්රිදී ආදි යම් කිසිවක් දැක තමා විසින් ගැන්මෙන් හෝ අනුන් ලවා ගන්වාලීමෙන් හෝ මේ මිළය සාමීන්ට වේවයි සම්මුඛවත් අසම්මුඛවත් කයින් හෝ වචනින් හෝ දුන් දෙයක් කාය වාක් දෙකින් ප්‍රතික්ෂේප නොකොට කයින් වචසින් මනසින් යන තුන් දෙරින් වෙන්ව හෝ එක්ව හෝ පිළිගත්තේ ඉවසුයේ විනම් හෙතෙම රන් රිදී පිළිගත්තා නම්වෙයි. ඒ සඛණ්ඩීන්ගේ පිළිගැණීමෙන් විරමන්‍යයද දශවෙනි ශික්ෂාපදයාගේ අර්ථතම වේ. කම් ප්‍රයොජනයයි කියන ලද සියලු ශික්ෂාපදයන්ගේ පිළිවෙල වූ පරිදි මෙසේ දතයුතු, ඒ කෙසේද? යත්,

සඛියන්ගේ සියලු ආරම්භයට ජීවිතෙන්ද්‍රිය මූල කාරණය වන ඛැවින්ද සත්වයන්ට ජීවිතය ඉතා ප්‍රියමනාප ඛැවින් පළමු කොටම ප්‍රාණාතිපාතයෙන් විරමන ශික්ෂාපදය වදරණ ලදී. ඊට ඉක්බිති ධන පැහැර ගැන්මද සත්වයන්ගේ ජීවිත හරණයමෙන් අප්‍රිය ඛැවින් අදත්තාදානයෙන් විරමණ ශික්ෂාපදය වදරණ ලදී. සත්වයන්ගේ ජීවිත හා ධනයම්පත් දෙක සත්‍රීන්ගේ ස්පර්ශාදිය තිසා පරිත්‍යාග කරන්නාහුයයි දැන ඊට ඉක්බිතිව අබ්‍රහ්මචරියා විරමණය හා කාමමිථ්‍යාචාර විරමණ ශික්ෂාපදය වදරණ ලදී. යථොක්ත මේ කාය දුශ්චරිතයන්ට අනතුරුව වාක් දුශ්චරිත දක්වනු පිණිස ඊට ඉක්බිතිව මුසාවාද විරමණ ශික්ෂාපදය වදරණ ලදී. සුරාපානය කායකර්ම වී නමුදු ඒ සුරාපානය කිරීමෙන් ප්‍රාණඝාතාදි මේ සියලු පාප සිඛවන්නේයයි දක්වන පිණිස ඊට ඉක්බිතිව සුරාපානයෙන් විරමනය වදරණ ලදී. ලොකවජ්‍යයන්ට අනතුරුව දුක්විය යුතුවූ ප්‍රඥප්තිවජ්‍යයන් අතුරෙහි පළමුකොට නිරොගි භාවාදියට කාරණාවූ හොජන කාලය ප්‍රකාශකොට විකාල හොජනයෙන් විරමන ශික්ෂාපදය වදරණ ලදී. ඊට ඉක්බිතිව කයින් සිඛ වන අනාචාරයන් අතුරෙහි මහත් වරදවූ නැටීමෙන් වැලකීමද ඊට ඉක්බිතිව වාචසික අනාචාරයන් අතුරෙහි මහත් වරදවූ ගී කීමෙන් වැලකීමද ඊට අනතුරුව ඒ නාට්‍ය ගීතවලට අනුරූපවූ හෙරි ආදීන්ගේ වැයීමෙන් වැලකීමද ඊට අනතුරුව එම නාට්‍යගීත

වාදියන්ගේ දෘෂ්ටාදියෙන් වැරකිමද වදුරණ ලදි. ඊට අනතුරුව ස්පර්ශ රම්මණවූ මාලාවකිවිලෙපනයන්ගේ යථාධර්මයෙන් ධාරණ මණ්ඩණ විභූෂණයෙන් වැලකීමද ඊට ඉක්බිතිව ස්පර්ශරම්මණ වශයෙන් සංස්කාරාරම්මණවූ උච්චාසය මහාසයනයන් කෙරෙන් වැලකීමද අන්‍යතෙකි වාහි කායවවි මනොකම්මූතවූ රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැලකීමද දශශීල ශික්ෂාපදයන් කෙරෙහි ඇතුලත් කොට වදුරණ ලදුයි දතයුතු.

විසුද්ධිමග්ගෙ පන සති වා උස්සාහෙ දසාති යනුයෙන් විසුද්ධි මාර්ගයෙහි උපාසක නිත්‍යශීලය දැක්වූ තැන පළමුවෙන්ම ශාසන යට භික්ෂා උපාසකොපාසිකා ජනයන්ට හෙදුවීන් වශයෙන් මේ දශශීලය දැක්වුවහොත් ශාස්තෘපසින් තමාවෙලා හිදුවාක්මෙන් සිතුයේ කිසිවක් රක්නට උත්සාහ නොකරන්නේ හෝ රක්නේද ශීලභෙදයට පැමිණීමෙන් හා රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුව ශාහ වාසයෙහි කටයුතු විචාරා පිරිමසා ගැන්ම හාර ලෙසින් සිතන්නාවූ උපාසක ජනයන්ගේ වශයෙන් උත්සාහ යක් තැතුම රැක්කයුතු පවශික්ෂාපද කෙනෙක් නියමකොට වදුරණ ලද්දහුයි. රක්ෂාකිරීම කිසිවෙක් විසිනුත් දුස්කර නොව පහසු බැවින් ඒ ප්‍රාණතිපාතාදි පස්පවින් වැලකීම නිත්‍ය ශීල වශ යෙන් පළමුකොටම වදුරා දෙවනු මේ ශාසනයෙහි හැසිරීම හෙතු කොටගෙණ ශ්‍රද්ධාප්‍රඥාදි ගුණ වැඩීමෙන් උත්සාහ ඇතහොත් නිත්‍යශීල වශයෙන් අෂ්ටාඞ්ගශීලයන් ඇතුළත්ව සිවි ජෝෂාවූද දශශීලයම රක්නට අනුදත් බැවින් පින්වත් ජෝතිපාල මහතෙරුන් වහන්සේ විසින් එසේම ඒ සියලු සීලයන්ම නිත්‍යශීල උපෝසථ නියමාදි වශයෙන් සමාදන්වීම සුදුසුලෙස වදුරා එම අර්ථය ප්‍රකාශ කරන්නාහු විසින් වාශබ්ද අනියෙන් පවසීලය හෝ අෂ්ටාඞ්ග සීලය හෝ දශශීලය හෝ නිත්‍යවශයෙනුදු උපෝසථාඞ්ග වශයෙන් සමාදන්ව රක්නට වටනා හෙයින් සියළු සීලයන් කල්පනා කරණු ලැබෙයි, දක්වන ලදී.

එහි ප්‍රාණාතිපාතාදි අකුශලයන් කෙරෙන් දුරුවීම සභාව කොට ඇති නිත්‍යශීල උපෝසථ සීලයන් තමාගේ ජීවිතයෙහිදු අපෙක්ෂා නොකරන්නාහු විසින් බුදුන් කෙරෙහි ශ්‍රද්ධාපිහිටා ගැන්මෙන් අප්‍රමාදව මනාකොට රක්ෂාකටයුතු.

අපේක්ඛං අකරොන්තෙන ජීවිතෙපි තථාගතෙ,
සඞ්ඝෙ අපමත්තෙන රක්ඛිතබ්බංව සාධුකං යි.

කියනලද බැවින් යම්සේ කිණිතම් සකුණිකාව ඇතුගේ පසින් සුණුවිසුණුව යන්නී වී තමුදු ජීවිත පරිත්‍යාගකොට තමාගේ බිත්තු වවමරක්නීද යම්සේ වැද්දන් විසින් පිරිවරණලද සෙමර ඩෙනුව ජීවිතය තෘණලවයක් මෙනුදු නොසිතන්නී කටුවතලැහැබි ආදියෙහි ලග්නවූ තමන්ගේ වාලධිඃම රක්නීද එපරිද්දෙන් දිවි නොසලකා සීලය රක්‍ෂාකටයුත්තේය, හෙද එක් ප්‍රිය පුත්‍රයෙක් ඇති මවසේ එක් ඇසක් ඇති මිනිසෙකුසේ අප්‍රමාදව රක්‍ෂාකටයුත්තේයි, මෙම කියනලදමැයි:-

කිණිව අණ්ඩං වමරිව වාලධිං,
පියංව පුත්තං නයනංව එකකං,
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා-ති.

මෙසේ නිත්‍යසීලය හා උපොසථසීලය රක්‍ෂාකරන්නාහු විසිනුදු:-

ඛණ්ඩ දීනමහාවෙන භුජිස්සාදිගුණෙහි ව,
අවියුත්තතං තථා හොති රක්ඛිතබ්බං තථාදරා

යනුහෙයින් ඒ ඒ සීලයන්ගේ ආදියෙහිවූ පළමුවෙනි ශික්‍ෂා පදය හෝ අන්තයෙහිවූ කෙලවර ශික්‍ෂාපදය හෝ බිඳුනේවිනම් ඒ සීලය කෙළවර සිදිගිය වස්ත්‍රයමෙන් වූ හෙයින් කබවූ සීලය නම් වෙයි, යම් සීලයක මධ්‍යයෙහි ශික්‍ෂාපදයෝ බිඳුනාහු විනම් ඒ සීලය සිදුරුවූ වස්ත්‍රයමෙන් වූ හෙයින් ඡිද්‍රසීලය නම් වෙයි, යම් සීලයක පිළිවෙළින් එක්තැනක දෙතුන් ශික්‍ෂාපදයෙක් බිඳුනේවිනම් ඒ සීලය කාලරක්තාදි එක්තරා වණිශකින් විෂඝාත වණිව පිවෙහි හෝ බඩෙහි හෝ සබලවශ්‍යායවසේ හටගත් කැලල් ඇති දෙනකමෙන් වූ හෙයින් සබලසීල නම් වෙයි, යම් සීලයක අතරතුරෙහි තැනින් තැන එකක් හැර එකක් බැගින් ශික්‍ෂා පදයෝ බිඳුනාහු වෙද්ද ඒ සීලය ශරීරය අතුරෙහි නානාවණී විෂඝාතබිඳුසේ කැලල් නැගී විවිත්‍රව ගියදෙනකමෙන්වූ හෙයින් තව්වාසසීල නම් වෙයි, මෙසේ දුරුකටයුතුවූ දෙඝාඩගවූ ඛණ්ඩය ඡිද්‍රය සබලය කල්මාසය යන මේ සතර අඩුකයන්කෙරෙන් අඛණ්ඩ අඡිද්‍ර අසබල අකල්මාස වශයෙන් රක්නා ඒ සීලය නිර්ණාශට උපනිශ්‍රය බැවින් තණ්හා නමැති ආසාවට දැසවම අසර අනාදිමත් කාලයක් විඳිනාලද මහත් දුකින් තෘෂ්ණා මූල භූජිස්සය

යන නිදහස කරණ හෙයින් හුදීසසීල නම් වෙයි, ප්‍රඥාවෙනැත්තන් විසින් තෙපි රක්නා සීලය ඉතා ඇසපත ශ්‍රේෂ්ඨයයි කියා ප්‍රශංසා කරණලෙස රක්නාසීලය විඤ්ඤුප්පසත්ථසීල නම් වෙයි, තණ්හාදෘෂ්ටි දෙකින් පරාමර්ශණය නොකොට හෙවත් මේ සීලය රැකීමෙන් ශක්‍රවෙමි රජවෙමි යනාදි වශයෙන් සසර විඳඳුනු සම්පත් කොපතා තණ්හාවෙන් දුරුව මේ රක්නා සීලයෙන් ඵල ඇද්දැයි ඇනාදි ක්‍රමයෙන් සිහිකරණ දුර්වියක් හා මිශ්‍ර නොකොට මෙසේ තණ්හාදෘෂ්ටි දෙකින් වෙන්ව රක්නා සීලය අපරාමට්ඨ සීල නම් වෙයි. පිරිසිදුව රක්නා තැමාගේ සීලය සිහිකිරීමෙන් සිත එකඟව උපචාර අප්පණා සමාධි උපදනාසේ රකිනා සීලය තෙම සමාධිසංවත්තනික සීල නම් නම් වෙයි, මෙකියනලද දෙශ අඟ සතරින් දුරුකොට හුදීසසා විඤ්ඤුප්පසත්ථ අපරාමට්ඨ සමාධි සංවත්තනික යන මේ ගුණාඟ සතා එක්කොට අවෝහසමංවිතව පවසිලාදිවශයෙන් සමාදන්වනලද ඒ ඒ සීලයන්ගේ සිඟළු ශික්ෂා පදයන් සම්හාරයෙන් නොබිඳීමෙන් හා ප්‍රමාදයකින් හෙදවූ ශික්ෂාපදකෙනෙක් ඇත්නම් සාමණේර සීලයේ එකක් බුන් කල හැම සීලය නැතිනොව තිදුනු ශික්ෂාපදය පමණක් සමාදන්වූ තැන සිඟලු උපාසකසීලයන් සම්පූර්ණවනහෙයින් එසේ නොවත සමාදන්ව ප්‍රතිකම් කිරීමෙන් යහපත්ව පිරිසිදුකොට රක්නා ලද සීලයතෙම කවර අර්ථයක් සාධා නොදේද? සම්භාවනත් සාධා දෙන්නේයි:—

වජ්ජිතං වතුහි දෙසෙහි සමුපෙතං වතුහි ව,
ගුණෙහි රක්ඛිතං සීලං සංපන්නෙව නාඝයෙති.

මෙසේ අඛණ්ඩාදිභාවාදව පමුණුවමින් රක්‍ෂාකටයුතුවූ නිත්‍ය සීලය හා උපොසථසීලය අමිත්‍රවූ පවිටු දුර්ජන පාපමිත්‍රසංසර්ගීන් දුරුව ක්‍රෝධාදි පාපධර්ම සිත්හි පැවතීමෙන්ද සීලය කිළිටුවන්නේය, ඒ එසේමැයි, නිත්‍යසීලාදිවශයෙන් සීලසමාදානයෙහි යෙදී වසන සැටිතෙම අනුන්ගේ වරදක් දැක ක්‍රෝධ උපදවාද එපමණ කිනුදු ඔහුගේ සීලය කිළිටුවන්නේය, එසේම සෙසු පාපධර්මයනුදු සිත්හි පැවතීම හෙතුකොටගෙණ තමාගේ සීලය කිළිටුවනහෙයින් සිල් පැහැරගන්නා සුනිස්සොධනම්ලද එම ක්‍රෝධාදි පාපධර්මයන් අකුශලකර්මපථවිභාග පරිවෙශ්දයෙහි ප්‍රකාශ ක්‍රම යෙන් බලාගෙණ එයින් තමාගේ සිත පිරිසිදුකොට සිල් පිරිසිදු කිරීමට උත්සාහ කළමැනවි.

එහෙයින් අප මහබෝසතාණන් වහන්සේ ඤාතත්තිවාදි තාපසව සංඛපාල නාගරාජ ව උපන් තැන් පවා කලාබු රාජාදීන් විසිනුදු මහාජවත්තාදීන් විසිනුදු නොයෙක් අනර්ථ කරණ කල්හි ඔවුන් කෙරෙහි කිපී බලන බැල්මක් පමණකුදු නො කළසේක. විධුර ජාතකාදියෙහි ශක්‍රාදි දෙමියන් පවා දිව්‍යලෝකාදිය හැර අවුත් මෙහි උගස් ආදියෙහි පෙහෙවස් විසුවාහුය යි යනාදි ඒ ඒ ජාතක.ද මෙහි දැක්වියයුත්තාහු යි.

උපෝසථ සූත්‍රයෙහි පෙහෙවස් සමාදන් ව නුසුදුසු විතකී දුරු කරන්ව වදාළ පරිදි කෙසේ ද? යත්- පෙහෙවස් සමාදන් ව සිට ඇතැම් කෙනෙක් "අද දවස මම මෙනම් මේනම් ඛාද්‍යයක් කෑමි, මෙනම් මෙනම් භොජනයක් අනුභව කෙළෙමි, සෙට දවස මම මෙනම් මෙනම් ඛාද්‍යයක් කන්නෙමි, මෙනම් මෙනම් භොජනයක් අනුභව කරන්නෙමි" කියා ද හෙතෙම ලොභසහගත විත්තයෙන් යෙදී විසිමෙනුදු අන්‍යවූ ද කාමවිතකී දි නුසුදුසු විතකීයන් කල්පනා කිරීමනුදු උපෝසථසීලය කිළිටු වන්නේය. සීලය කිලුටු කරණ මේ පාපධර්මයන් අතුරෙහි යම්කිසි දාපචේතනාව කින් කිළිටුවූ නිත්‍ය සීලය හෝ උපෝසථ සීලය හෝ මහත් ඵල මහත් ආනිශංස නො වන්නේය.

සංකිලෙස විසුඛං ගි රකඛතෙනා සීලවත්තතෝ,
විසං ජීවිතුකාමෝ'ව ආරකඛා තං විවජ්ජයෙ.

ශ්‍රමණයෙකුගේ නිත්‍යසීලය හා උපෝසථසීලය රක්නා කැමැති සත්ව තෙම ක්‍රෝධ උපනාහාදි පාපධර්මයන් ඔත්හි නුපදවාලීමෙන් හා උපන් පාපචේතනා මැඩපවත්වා ගෙන්මෙන් ද කුසල්දහම් තුණුරුවන් ප වත්නා ශ්‍රමණ ප්‍රදේශයක විසිමෙන් ද වැඩෙහි ශොදන කල්‍යාණ මිත්‍රයන් හා එක්වීමෙන් ද ස්ඛම්ශ්‍රවණ යෙන් හා සුචරිතාඛ්‍යාශයෙන් ගෙදී වාසය කරන්නේ විනම් හෙතෙම සඛේපද්‍රවයෙන් මිදී ශරත් කාලයෙහි අහස දිලිහෙන ඖරම්ඛල සේ බබලන්නේය.

විසුජ්ඣනති යථා සත්තා පහාය මලජල්ලිකා,
සංකිලෙසෙ විහායෙව චොදයෙ සීලමත්තනෝ.

තවද පෙහෙවස් වැස්නහුගේ විත්තය ඉදින් කිසියම් උපක්ලේශ කෙනෙකුන් විසින් කිලුටු වූයේ විනම් එකල්හි ඔහු

වීසින් මාගේ සිත කිළිටු වූයේය. එහෙයින් සීලය නො පිරිසිදුය සි දැන ඒ සීලය පිරිසිදු කරණ පිණිස "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුඩෝ" යනාදි ක්‍රමයෙන් බුදුගුණ සිහි කටයුත්තේය. මෙසේ තථාගතවූ බුදුන් සිහි කරන්නහුගේ සිත පහදනේය, ප්‍රීති ප්‍රමෝදය උපදනේය. එකල්හි සිත්හි හටගත් ක්ලේශයෝ පහවන්නාහු වෙත්. ඒ කෙසේදැ සි කිවහොත්- යම් සේ පුරුෂ යෙක් තමාගේ හිස කිලුටුවූ බව දැක ඊට නිසි ඇඹුල්කල්ක මැටි ආදිය ගෙණ හිස උලා සෝදා ඔහු වීසින් කරණලද උත්සාහය හෙතු කොටගෙණ කිලුටුවූ හිස පිරිසිදු වේ ද? එපරිද්දෙන් ම මේ බුඩානුස්මෘති භාවනාව සිහිකිරීම හෙතුකොටගෙණ ඔහුගේ සීලය පිරිසිදු වන්නේය. මෙසේ බුඩගුණ සිහිකරමින් වසන මෙතෙම ලෝකාග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ බුදුගුණ සිහි කරමින් ශ්‍රෙෂ්ඨ උපාසකාඛ යෙන් යෙදී බුදුන් හා සමග වසන්නේ නම් වේ.

ඉදින් එසේ ම සීලය කිළිටු වූවාහු වීසින් "සවාකඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ" යනාදි ක්‍රමයෙන් පාලිධම්ම හා නවලෝකොත්තර ධර්මය සිහි කටයුත්තේය. එසේ ධර්මය සිහි කරන්නහුගේ සිත පහළවූ පරිද්දෙන් ම ක්ලේශයෝ පවත්නාහු වෙත්. ඒ කෙසේදැ සි කිව? හොත් යම් සේ ශරීරය කිලුටුවූ පුරුෂ යෙක් කුරුඳුවැලිආදිය ගෙණ ඇඟ උලා සෝදා සම්ඨෙවනාදි වශ යෙන් කරණලද ඔහුගේ ව්‍යායාමය හෙතුකොටගෙණ කිලුටුවූ ශරීර යාගේ පිරිසිදුවීම වේ ද? එසේ ම මේ ධර්මානුස්මෘති භාවනාව සිහි කිරීමෙන් සිත වැලඳගෙණ සිටි ක්ලේශයන් පහවීමෙන් සීලය පිරිසිදු වන්නේය. හෙතෙම ධර්මඋපොසථයෙන් යෙදී ධර්මය හා සමග වසන්නේ නම් වේය.

එසේ ම සීලය කිලුටු වූවාහු වීසින් 'සුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ' යනාදි ක්‍රමයෙන් සඞ්ඝගුණ සිහි කටයුත්තේය. එසේ ම සඞ්ඝගුණ සිහිකරන්නහුගේ සිත ප්‍රීතිප්‍රමෝද ඉපදි මෙන් ක්ලේශයෝ පහවන්නාහුය, ඒ කෙසේදැ සි කිව? හොත් යම් සේ කිලුටුවූ වස්ත්‍රය පිරිසිදු කරණු කැමති රජක තෙම දෙතුන්වරක උණුගැන්වීම හා හලු ගෝමයාදි උපකරණත් ගෙණ සෝදා සෝඩා කරණලද ඔහුගේ ව්‍යායාමය හෙතුකොටගෙණ වස්ත්‍රය පිරිසිදු වේ ද එපරිද්දෙන් ම මේ සඞ්ඝානුස්මෘති භාවනාව

සිහිකිරීමෙන් සිත වැළඳගත් ක්ලේශයෝ දුරුව සීලය පිරිසිදු වන්නේය, මෙතෙම සංඝඋපොසථයෙන් යෙදී සංඝයා හා සමග වසන්නේ වෙයි.

එසේම තමනමන්ගේ සීලය පිරිසිදු කරන්නහු විසින් තමා සමාදන්වූ සීලය මෙසේ සිහිකටයුත්තේත්ය, ඒ කෙසේද? යත් මා සමාදන්වූ සීලය කෙළවරකින් නුබුන්බැවින් මාගේ සීලය අඛණ්ඩය, මැද ශික්ෂාපදයක් නුබුන් හෙයින් මාගේ සීලය අවිච්ඡිද්‍රය, දෙතුන් ශික්ෂාපද කෙනෙක් නුබුන් හෙයින් මාගේ සීලය අසබලය, එකක් හැර එකක් නුබුන් හෙයින් මාගේ සීලය අකල්මාෂය, තමා තණ්හාදාසබවයෙන් මුදා නිවන් දක්වන හෙයින් මාගේ සීලය භුජිස්සය, නුවණැත්තන් විසින් ප්‍රශංසා කටයුතු හෙයින් මාගේ සීලය විඤ්ඤුපසත්ථය, සසර සම්පත් පැතීමක් නැති හෙයින් මාගේ සීලය අපරාමට්ඨයයි සිහිකිරීමෙන් සිත එකඟව සමාධි උපදනා හෙයින් මාගේ සීලය සමාධි සංවත්තනිකයයි කියා අෂ්ටාංගයෙන් යුක්තව පිරිසිදුකොට රක්නාසීලය සිහිකිරීමෙන් ප්‍රීතිප්‍රමෝදය හෙතුකොටගෙණ ක්ලේශයෝ පහවන්නාහුය, ඒ කෙසේ දැයි කිව්? හොත්—යම්සේ කිළිටුවූ කැඩපත තෙල්හලු හා අස්වලින් හෝ නියදින් කරණ ලද්ධූකය කියන කොස්ස ගෙණ මැදීමෙන් පුරුෂයා විසින් කරණලද ව්‍යායාමය හෙතු කොටගෙණ කැඩපත පිරිසිදුවේද? එපරිද්දෙන්ම මේ සීලානුස්මෘති භාවනාව මෙසේ සිහිකිරීමෙන් සිත වැළඳගෙණ සිටි ක්ලේශයෝ දුරුව ශීලය පිරිසිදු වන්නේය, මේතෙම සීලඋපොසථයෙන් යෙදී සීලයා හා සමග වාසයකරන්නේ වෙයි.

එසේම තමාගේ සීලය සිහිකරන්නහු විසින් මහානුභාව සම්පන්න දෙවතාවෝ සිහිකටයුත්තාහුයි, ඒ කෙසේද? වාතුම්මහාරාජිකය තාවතිංසය යාම තුසිත නිම්මානරති පරනිර්මිත වශවර්තියන සඳෙවිලොව හා බඹලොව වසන ආනුභා සම්පන්නවූ යම් යම් දෙවතාකෙනෙක් වූවාහුද- ඔහු යම්බඳුවූ ශ්‍රද්ධාවකින් සීලයකින් ශ්‍රැතයකින් ත්‍යාගයකින් ප්‍රඥාවකින් සමන්විතව මෙසින් චුතව ඒ ඒ දෙවිලොව උපන්නාහුවෙද්ද මිවද එබඳුවූ ශ්‍රද්ධාවක් සීලයක් ශ්‍රැතයක් ත්‍යාගයක් ප්‍රඥාවක් ඇත්තේයයි කියා තමාගේද ඒ දෙවතාවන්ගේ ශ්‍රද්ධාවද සීලයද ශ්‍රැතයද ත්‍යාගයද ප්‍රඥාවද සිහිකරන්නහුගේ සිත පැහැද ප්‍රීතිප්‍රමෝදය උපදනේය, එකල්හි සිත කෙලසන උපක්ලේශයෝ පහවන්නේය,

ඒ කෙසේද යි කිවහොත්- යම් සේ නො පිරිසිදු සවණ්ණය පිරිසිදු කරණු කැමති කර්මකාර තෙම උදුන නිසා ද ලුණු මැටි නිසා ද ගුරු සුණු නිසා ද පිඹිනා තලඅඹුව නිසා ද ඒ පුරුෂයාගේ ඊට කරණ ව්‍යායාමය නිසා ද කිලුටුවූ සවණ්ණයාගේ පිරිසිදු බව වේ ද- එපරිද්දෙන් ම මේ දෙවතාත්‍රුස්මැනි භාවනාව සිහිකිරීමෙන් කාමවඡ්ඡාදි පඤ්චනීවරණයන් කෙරෙන් සිත පිරිසිදු වීමෙන් ඔහුගේ ශීලය ද පිරිසිදු වන්නේය. මෙතෙම දෙවතාවන්ගේ ශ්‍රද්ධාදි ගුණධර්මයන් සිහිකොට තමා කෙරෙහිදු එබදු ගුණ ඇති හෙයින් දෙවියන් හා සම බවට පැමිණ දෙවතාඋපොසථයෙන් යෙදී වසන හෙයින් දෙවතාවන් හා සමාග වසන්නේ නම් වෙයි.

තවද උපොසථ ශීලය පිරිසිදු කරණු කැමැත්තා විසින් තමා බුද්ධාදි රහතුන් හා සම සම ව තබා මෙසේ සිහි කටයුත්තේය, "රහතුන් වහන්සේලා දිවි ඇති තෙක් ප්‍රාණාතිපාතයෙන් අදත්තාදානයෙන් අබ්‍රහ්මචරියාවෙන් මුසාවාදයෙන් රහමෙර පිමෙන් විකාල භොජනයෙන් නාට්‍යගීතවාදිත විසූකදස්සනාදීන් හා මාලාගන්ධ විලෙපනධාරණමණ්ඩන විභූසනට්ඨානයෙන් උච්චාසයන මහාසයනවල හිදීමෙන් සැතපීමෙන් දුරුවූසේක්ලා මය, මම අද මේ රාත්‍රිය මේ දවල ප්‍රාණාතිපාතාදි ඒ ඒ අකුශලයන් කෙරෙන් දුරුව උපොසථාඞ්ගය සමාදන්වූ හෙයින් මේ ගුණයන් කරණකොට ගෙණ ඒ රහතුන් වහන්සේලාට අනුකූල ව ආර්‍යඋපොසථයෙන් යෙදී වසන හෙයින් ඒ ශීලය විශෙෂයෙන් බබලන්නේ යි.

සුපරිකම්මකතෝ ඛෙතෝ යථා වෙළුරියෝ මණි,
මහග්ඝෝ ජෝතිමා එවං සීලම්පස්ස විරොචති.

මේසේ බබලනු ලබන්නාවූ ඔහුගේ ශීලය තෙම විපාක ඵල ගෙන් මහත් ඵල වන්නේය, විපාකානිසංසයෙන් මහානිසංස වන්නේය, විපාකානුභාවයෙන් මහත් ප්‍රීතික වන්නේය. විපාක ව්‍යාප්තිය මහත් බැවින් මහාව්‍යාප්තිය වන්නේ යි.

ඒ සීලය කෙරෙහි මහත් ඵල වේ ද? කෙපමණ මහානිසංස වේ ද? කෙපමණ මහත් දීප්ති වේ ද? කෙපමණ මහත් පැතිරීම වේදැ යි යනහොත්-යම් පුරුෂයෙක් අතුරවය මඟඛරවය කසිරවය කොසොල්රවය වැදුරවය මල්ලරවය වෙනියරවය වඟුරවය කුරුරවය පඤ්චාලරවය මච්ඡරවය සූරසෙනරවය අස්සකරවය අවන්තිරවය ගන්ධාරරවය කාම්බොජරවය කියනලද දහසයක්

මහ රටවලින් සැදුම් ලද්දාවූ සියලු දඹදිව හෙරිතලයක් සේ සම කොට ඒ හැමතැනම ඉන් පමණ උස සත් රුවනින් පුරා හැම තැනටම ඒකාතපත්‍රව චක්‍රවර්ති රාජ්‍යය කරන්නේද? ඔහු එසේ ලද්දාවූ රාජ්‍ය ඓශ්වර්‍යය එක රැයක් එක දවලක් විසූ අෂ්ටාඞ්ග ශීලයයි කියනලද කුශලය සොළොස් භාගයක් කොට පහළොස් භාගයක් හැර එකාභාගයක් ගත්කල ඒ භාගයටත් සම නොවන්නේය. එසේ සම නොවන්ට කාරණා කවරේදැයි යත? හොත් එක් රැයක් එක් දවලත් අෂ්ටාඞ්ගශීලය රක්‍ෂාකළාවූ ඒ පුරුෂ තෙම එම කුශලයෙන් මේ මනුෂ්‍ය දෙභයාගේ නැසීමෙන් මත්තෙහි වාතුම්භාරාජික දෙවියන් කෙරෙහි උපදනේය.

මේ මනුෂ්‍යයන්ට පණස් අවුරුද්දෙක් නම් ඒ දෙවියන්ට එක් දවසෙක, ඒ දවසින් තිසක් ඔවුන්ට මසෙක, ඒ මස් දෙළසෙක් ඔවුන්ට අවුරුද්දෙක, ඒ අවුරුදු ගණනින් ඔවුන්ට පන්සියයක් අවුරුද්දට ආයුෂ වන්නේය. ඒ මනුෂ්‍යයන්ගේ අවුරුදු ගණනින් අනුලක්‍ෂයක් අවුරුදුය. එහි උපන්නාවූ දෙවියන්ට ඇසටත් අමනොඥවූ අරමුණෙක් නො පෙණෙයි. කණටත් අමනොඥවූ ශබ්දයක් අසනු නැත. නාසිකාවටත් දුගඳක් ආඝ්‍රාණයක් නැත. දිවෙනුත් අමනොඥ රසයක් විඳිනු නැත. කයිනුත් අනිෂ්ට දෙයක් ස්පර්ශ කරණු නැත. සිතට දුඃඛදායකවූ අරමුණක් සිතෙනු නැත. මෙසේ සදෙරින්ම සැප විඳිනාවූ ඒ දෙවියන්ගේ ඓශ්වර්‍ය්‍ය දුටු කෙනෙකුන්ට සියලු දඹදිවට ඉසුරු පවත්වා රාජ්‍යය කරන්නාවූ පළමු කී සක්විති රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍ය්‍ය ඉතා සවල්පයේක. යාවකායෙකුගේ ජීවිකාවාත්තියක් වැන්න.

නැවත මේ එක රැයක් එක දවලක් අෂ්ටාඞ්ගශීලය රක්‍ෂා කළාවූ පුරුෂතෙම එම කුශලයෙන් තව්තිසා දිව්‍ය ලොකයෙහි උපදනේය. ඒ දෙවියන්ට මනුෂ්‍යයන්ගේ සියයක් අවුරුදු එක දවසෙක, ඒ දවසින් තිස් දවසෙක් මසෙක, ඒ මසින් දෙළොසෙක් අවුරුද්දක, එයින් ඔවුන්ගේ ආයුෂය අවුරුදු දහසෙක, අවුරුදු දහස නම් මේ මිනිස්ලොව තුන්කෙළ සැවැල්ලයක් අවුරුදුය.

ඒ එක් දවසක් රක්‍ෂාකළාවූ මේ ශීලයෙන් යාම දිව්‍ය ලොකයෙහි උපදිනි. ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට මිනිසුන්ගේ ආයු ගණනාවෙන් දෙසියයක් අවුරුදු එක දවසෙක, ඒ දවසින් තිහක්

මසෙක, ඒ මසින් දෙළසක් අවුරුද්දක් කොට ඒ ගණනාවෙන් ඒ දෙවියන්ට දෙදහක් අවුරුදුය, ඒ අවුරුදු දෙදහ නම් මිනිසුන්ට තුදුස්කෙළ සතළිස් ලක්‍ෂයක් අවුරුදුය.

ඒ එක දවසක් රක්‍ෂාකලාවූ අෂ්ටාඞ්ගශීලයෙන් තුෂිත දිව්‍ය ලොකයෙහිත් උපදිති. මිනිස්ලොව සාරසියයක් අවුරුදු ඒ දෙවියන්ට එක් දවසෙක, ඒ දවසින් තිසක් මසෙක, ඒ මසින් දෙළසක් අවුරුද්දෙක, ඒ අවුරුද්දෙන් හාරදාසක් අවුරුද්දට ආයුෂය, ඒ සාරදාස නම් මනුෂ්‍යයන්ගේ ආයුෂ ගණනාවෙන් සත් පණස්කෙළ සැටලක්‍ෂයක් අවුරුදුය.

එක දවසක් රක්‍ෂා කළාවූ මේ අෂ්ටාඞ්ගශීලයෙන් නිම්මාණරති දිව්‍යලොකයෙහිත් උපදිති. මිනිස්ලොව අටසියයක් අවුරුදු ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට එක දවසෙක, ඒ දවසින් තිස් දවසක් මාසයක, ඒ මසින් දෙළසක් අවුරුද්දෙක, ඒ අවුරුද්දෙන් අටදහක් අවුරුද්දට ආයුෂය, ඒ අටදහ නම් මනුෂ්‍ය ගණනාවෙන් දෙසිය තිස්කෙළ සතළිස් ලක්‍ෂයක් අවුරුදුය.

තවද එක් දවසක් අෂ්ටාඞ්ගශීලය රක්‍ෂාකලාවූ සත්‍ර පුරුෂ කෙනෙක් එම කුශලයෙන් පරනිර්මිත වසවර්ති දිව්‍යලොකයෙහි උපදනාහුය. මනුෂ්‍ය ගණනාවෙන් එක්දාස සසියයක් අවුරුදු නම් ඒ දිව්‍යලොකයෙහි දෙවියන්ට එක දවසෙක, ඒ දවස් මස් කොට ඒ මස් අවුරුදු කොට ඒ අවුරුදු ගණනාවෙන් ඒ දෙවියන්ට සොළොස් දහසක් අවුරුද්දට ආයුෂය, ඒ මිනිස්ලොව ගණනින් නවසිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් අවුරුදුය.

මෙසේ අෂ්ටාඞ්ගශීලයෙන් සදිව්‍යලොකයෙහි උපන්නාවූ දෙවියන්ගේ ඓශ්වර්‍යය කිමෙහි පමණක් නැති නිසා බුදුහු ආයුෂ පමණක් වදාළසේක. මෙබදු ආයුෂ ඇත්තාවූ ඓශ්වර්‍ය ඇත්තාවූ ඒ දෙවියන් දුටු අයට ඉන පමණ උස සත්රුවන් පිරූ දඹදිවට චක්‍රවර්ති රාජ්‍යය කරන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍යය කෙසේ මහතැයි සිතේ ද? දිළිදු කෙනෙකුන් වැන්නැයි සිතමි.

තවද චන්ද්‍ර සූර්‍ය දෙදෙනම මහමෙර වට ඇවිද යම් පමණ තැනක් ආලොක කොට ඇවිදිද්ද? ඇතුළත සතර මහ දිවයිනද දෙදහසක් කොදෙව්වලද සමුද්‍රයෙහිද ගොඩෙහිද යන හැම කැන්හිද වසත්‍රාහරණාදී වූ යම් ධනයෙක් ඇද් ද? යම්

රත් මැණික් නිල් මැණික් ජාතියෙක් ඇද්ද, පණුවන් විසින් සාරා ගොඩ දමන ලද හවක තම්වූ රත්න ජාතියෙක් ඇද්ද, ඒ සියලු වසතුහු චන්ද්‍රාලෝකයට අඩුව සිටි හැම තාරකා සමූහයාගේ ආලෝකය මෙන්ම සොළොස් භාගයක් කරණ ලද අමාවාරාත්‍රි සංඛ්‍යාත එක දවසක් විසූ අෂ්ටාඞ්ගශීලයාගේ පින්කම් කලාවය යන එක් භාගයකුත් අගනේ නො වෙයි. එහෙයින් සිල්වත්වූ සියලු සත්‍ව පුරුෂයෝ අෂ්ටාඞ්ගයෙන් යුත් පෙහෙවස් සමාදන්ව රක්‍ෂා කොට සුඛවිපාක දෙන දානාදි කුශල් කිරීමෙන් අනිඳිත දිව්‍ය ලෝකයෙහි උපදනාහුයයි යන මේ කාරණය භාග්‍යවත් බුදුරජානන් වහන්සේ විසින් වදරණ ලදී.

වෙජ්ජෙ ව සුරියෝ ව උභෝ සුදස්සනා,
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොහුදා තෙ පන අන්තලික්ඛගා
නහෙ පභාසන්ති දිසා විරොචනා.

එතාසම්ං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තාමණී වෙළුරියව භද්දකං,
සිංගීසුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං භවකන්නි වුච්චති.

අවිඨංගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙනානුභවන්ති සොළසිං,
චන්දප්පභාතාරගණාව සබ්බෙ
නසමා හි නාරීව නරෝ ව සීලවා.

අවිඨංගුපෙතං උපවස්සුපොසථං
පුණන්ති කත්වාන සුබ්‍රහ්මචාරිනි
අනිඳිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

එහෙයින් එම්බ. පින්වත් ලොව ඇති සත්පුරුෂයෙනි, මෙසේ මහත් විපාක ඇති අෂ්ටාඞ්ගසීලය රක්ෂාකරන්ට තොපට බැරි දෙයෙක් ඇද්ද? ප්‍රාණඝාත නම්වූ අනුන්ගේ දිවි නැසීම ආයුධ ආදී නොයෙක් උපකරණ ගෙණ මහත් ව්‍යායාමයෙන් කටයුතු දෙයක, ඒ ප්‍රාණඝාත මම නො කරම් සිතාගන්නා සිහිවිල්ල එසේ උත්සාහයකින් කටයුතු දෙයක් නොවෙයි, නිදුකින් සිඹවන්නේය, අදත්තාදානයක් අනුන් සන්තක දෙයක් ඇරගැන්මක, එහෙයින් සොරාඇරගණිතත් බලාත්කාරයෙන් ඇරගණිතත් උත්සාහයෙන් ගතයුතු දෙයෙක; ඒ නො ගණිම් යි සිතාගැන්ම නිදුකින් ම සිඹවන දෙයක, අබ්‍රහ්මචර්‍යාවෙන් ඉන් වන උපද්‍රව හා සැත්තේගේ නුගුණ සිතාගන්නා කෙනෙකුට ඉන් වැලැකෙම් යි සිතාගැන්මත් නිදුකින් සිඹවන දෙයක, බොරු කිම නම් අනුන්ගේ වැඩත් නසයි, බොහෝ දෙනත් අප්‍රියකරයි, බොරු කිමෙන් නො කළ හැකි පව් නැතැ යි යනු හෙයින් බොහෝ අකුශලයන්ට මුල් ව සිටින්නේය යනාදීන් සිතාගන්නා කෙනෙකුන්ට ඉන්වැලකීමින් දුක් නොවන්නේය, රහමෙරපිම නම් සියලු කටයුතු පමා කරන්නේය, වියරු ඵලවන්නේය. හඟලජ්ජාදෙන නැතිකර වන්නේය, යනාදීන් සිතා ගන්නා කෙණෙකුන්ට ඉන් වැලකීමත් දුක් නොවන්නේය, විකාලභොජනය නම් පෙරවරු අනුභව කිරීමත් එක්ක දෙවේලත අනුභව කිරීමය. ඒ දෙවේලත අනුභවකිරීමෙන් ව්‍යාධි උපදවින්නේය, භොජනයට දෙවරක් ව්‍යාපෘත කිරීමෙන් කටයුතුකාරිය නැසෙන්නේය සිල්රක්ෂා කරණ නිසා පෙරවරු බත් අනුභව කිරීමෙන් සවගීසම්පත්තිය සිඹවන්නේය යනාදිය සිතාගන්නා කෙනෙකුන්ට. විකාල භොජනයෙන් වැලකීමත් දුක් නොවන්නේය, නෘත්‍ය නම් වියරුවක් වැන්න, ගී නම් හැඩිමක් වැන්න, නෘත්‍යගීතවාද්‍යයෙන් කවර ප්‍රයෝජනයෙක්ද? මාලාගන්ධ විලෙපනාදිය පූජාකළහොත් නොයෙක් කෙළගණන් කප්මුලුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසම්පත්තිය සිඹවන්නේය. ඒ තමා පරිභොග කිරීමෙන් කවර වැරැද්දෙක් සිඹවේද කෙරෙද්දූයි සිතාගන්නා හට එයින් වැලකීමත් දුක්නොවන්නේය. නැවත උච්චාසන මහාසයනයෙන් වැලකීම වනාහි මේ සිශල්ලට වඩා නිදුකැයි සිතන්නාවූ එම්බා සත්පුරුෂයෙනි තොප විසින් මේ බුඩොද්පාද කාලයෙහි මනුෂ්‍යත්වාදිමහාවය ලත් තැනදීම පොහොයෙන් පොහොය අෂ්ටාඞ්ග ශීලය රක්ෂාකොට සසර බොහෝ කලක් දිව්‍යමනුෂ්‍යසම්පත් විඳීමටත් නිවන්සම්පත් ලැබීමටත් සුදුසු කුසල් කටයුත්තේය.

බුඩොද්පාද කාලයට පැමිණ බුදුන් වදළ බණ අසා අෂ්ටාඞ්ග ශීල යෙන් ලබන අනුසස් විභාග දැන නුවණැතිව මනුෂ්‍යත්ව සිටිනා තොප තබා පෙර අබුඩොද්පාද කාලයෙහි ගෙයක් දොරක් පාන වගීයක් නැතිව නිරන්තරයෙන් ගොදුරු සොයා ඇවිදිනා සාපිපාස සංසිදුවාගත නොහෙන්නා වූ ඔවුනොවුන් කෙරෙහි හයින් සැහවී ඇවිදිනා වූ තිරශ්චීනයෝ පවා වනුයාගේ සම්පූර්ණතායෙන් පසලොස්වක් පොහෝ දිනයයි දැන අෂ්ටාඞ්ග ශීලය රක්ෂා කෙළේය. මෙබඳු ජාතියෙක මෙබඳු නුවණැතිකමෙක මෙබඳු රක්ෂාවෙක සිටිනා තොපට බැරි කවරේ ද? කවර ආලස්‍යකමෙක් ද? දුස්සීලව සිටියාම පැමිණෙන නපුරත් සීලවත් වීමෙන් වන අනුසසුත් දැන තොප වීසින් අප්‍රමාදව අෂ්ටාඞ්ග ශීලය රක්ෂා කට යුත්තේය. පෙර අබුඩොද්පාද කාලයෙහි තිරශ්චීනයෝ අෂ්ටාඞ්ග ශීලය රක්ෂා කළ පරිදි මෙසේ අසා දතයුත්තේය.

පෙර දඹදිව මගධරට ආදිවූ රට තුණකට අතුරෙහි එක් වනාන්තරයෙක් වූයේය. බුදුවීමට බොධිසම්භාර පුරා ඇවිදිනා වූ අප මහබෝසතාණන් වහන්සේ මගධරට බමුණු කුලයක ඉපද වැඩිවිය පැමිණියේක් ගිහි සැපත් අනුභව කිරීමෙහි දෙඟ දැන ගිහි ගෙන් නික්ම පැවිදිව ඒ වනාන්තරයෙහි පන්සලක් කොට වසු සේක. උන්වහන්සේ වසන පන්සලට නුදුරු තැන එක් උන කැලයක තමාගේ භාර්‍යාවම ගා සමග එක් කොබෝ පක්ෂියෙක් වසන්නේය. එක් තුඹසෙක සපියෙක් වසන්නේය. එක් වන ලැහැබෙක කැනහිලෙක් වසන්නේය. එක් වන ලැහැබක වලසෙක් වසන්නේය. ඔහු සතරදෙනම කලින් කල අවුත් ඒ තාපසයන් වහන්සේගෙන් බණ අසති. එකල්හි එක් දවසක් කොබෝ තෙම භාර්‍යාව සමග කැදැල්ලෙන් නික්ම ගොදුරු පිණිස ගියේය. ඔහු පස්සේ ගන්නා වූ පක්ෂිඩෙනුව එක් උකුස්සෙක් අල්වාගෙණ ගියේය. ඈ ඇඬූ අඬ අසා කොබෝ තෙම ආපසු බලන්නේ උකුස්සා අල්ලාගත් බව දුටුයේය. ඒ දැක කොබෝ තෙම ඇගෙන් තමන් වෙන්වූ නිසා රාගාග්නියෙන් දවනු ලබන්නා වූ ශරීර ඇතිව මෙසේ සිතුයේය. මේ රාගය මට ඉතා දුක් කෙරෙයි. මේ රාගයට නිග්‍රහ කොට ගොදුරව නොයමියි, සිතා තාපසයන් වහන්සේගේ සමීපයට ගොස් බණ අසා නිග්‍රහ කොට පෙහෙවස් සමාදන්ව එකත්පසෙක හුන්නේය.

සපී ද ගොදුරු සොයමින් තමා වසන තුඹසින් නික්ම පසල් ගමක ගෙරින් ගොදුරු කන තැන්හි ඇවිදින්නේය. එකල්හි

ගම් දෙටුවාගේ සම්බන්ධ ධවලවූ මඛාල වෘෂභ තෙම ගොදුරු ගෙණ එක් තුඹසක් මූල දන බඩා අන්මිටි තලමින් කෙළින්නේ ය. සපි තෙම ගොඹුන්ගේ කුර අඹින් හය ගෙණ තුඹසට වදින්ට දිවන්නේ ගොණා පස අසුව කිපුනේ ගොණා දෂ්ට කෙළේ ය. ගොන් එතන වැටී මළේය. ගම් වැස්සෝ බහු මළේයි යනු අසා සියල්ලම අවුත් අඩා වැලප පුෂ්පාදීන් පුදා වළලා හියෝය. සපි තෙම ඔවුන් ගිය කල්හි නික්ම මාගේ ක්‍රෝධය නිසා වෘෂභයා මරා මෙතෙක්දෙනා සොකයට පැමිණෙවීමි. මේ ක්‍රෝධයට නිග්‍රහ කොට මම ගොදුරට නොයමිමි, අසපුවට ගොස් ක්‍රෝධ නිග්‍රහය පිණිස පෙහෙවස් සමාදන්ව එක් ප්‍රදේශයක හොත්තේය.

කැණහිලා ද ගොදුරු සොයා ඇවිදිනේ එක් මළ ඇතෙකු දැක මහත් ගොදුරක් ලදිමියි වහා ගොස් සොඬ බැහැ බැලිය ටැඹක් සේ ඉතා දැඩිව නිබුනේය. එහි ආස්වාදයක් නොලැබ දළ බැහැ බැලිය. ඒත් ගලක් මෙන් දැඩිව නිබුණේය. බඩ බැහැ බැලිය. අවුපතක් සේ කිසි මොලොකක් නැති විය. නහුට බැහැ බැලිය. මොලොකක් සේ ඉතා දැඩි විය. මළමාගිය බැහැ බැලිය. එහි එළගිතෙල් මූලක් සේ මොළොක්ව නිබුනේය. එතෙම ලොභ යෙන් ඒ මස් කනුයේ බඩ ඇතුළට වැද පිපාසිත කල්හි ලේ බොමින් ක්ෂුධා වූ කල්හි මස් කමින් වැතිරෙන කල්හි අතුනු හෝ බඩවැල් අතුට වැතිරෙන්නේය. එතැන් පටන් එතෙම "ආහාර යත් පානයත් සයනයත් මෙහිම ඇත. අන් තැනකට ගොස් කුමක් කෙරෙම් දැ" සි එහිම සිත් අලවා විසීය. දවස් ගණනකින් කුණ ඊයලෙන කල්හි මලමාගියත් වැසින. කැණහිල් තෙම බොහෝ කලක් දුක් විඳ උන් බැවින් ඒ සිදුරට ඉසින් පැහැර නික්මින. සිදුර අහක්ව තිබූ හෙයින් ද ශරීරය ඉදී බඩ ඇතුළෙහි උපන් උෂ්ණයෙන් ශරීරය මස් සිදී පඹුවන්ව නික්ම යන්ට මගක් නොලැබ උන්නේය. එක් දවසක් නොකල් මහ වැස්සක් වවුයේ ය. මලමාගිය තෙම් මොලොක්ව සිදුරු දැක්විය. කැණහිල් තෙම බොහෝ කලක් දුක් විඳ උන් බැවින් ඒ සිදුරට ඉසින් පැහැර නික්මින. සිදුර අහකව තිබූ හෙයින් ද ශරීරය ඉදී තිබූ හෙයින් ද සියලු රෝමයෝම මලමාගියෙහිම ලග්න වූහ. ඒ තෙම තල් අලයක් මෙන් ලොම් නැතිවම නික්මින. ඒ කැණහිල් තෙම "මාගේ සිතෙහි උපන් ලොභය නිසාම මා විසින් මෙතෙක් දුක් විඳිනා ලද බැවින් ලොභයට නිග්‍රහ කොට ගොදුරු අනුභව නොකරමි" සි ලොභනිග්‍රහ පිණිස පෙහෙවස් සමාදන්ව එක් පසෙක හොත්තේය.

වලසා ද වනාන්තරයෙන් නික්ම මෙතෙක් කල් ගොදුරු ගන්නා තැනින් ගොදුරු නොගෙණ අනිවර්ජිතවන් මඛනා ලද සිත් ඇත්තේ මලයරට පසල් ගමකට ගියේය. වලසෙක් ආය සි අසා ගම් වැස්සෝ දුනු දඬු ආදිය ගෙණ ඔහු හුන් වනය වට කළෝය. ඔවුන් වටකළ බව දැන ඒ කැලයෙන් නික්මින. එසේ යන්නා වූ ඔහු දැක දුනු දඬු මුගුරු ගෙණ තැලූහ. එසේම බිදුනු ඉස් ඇතිව තමා ලග්නා තැනට ගොස් "මේ දුකඛය මට අනිවර්ජිතව නිසා උපන. රිට නිග්‍රහ කොට ගොදුරට නොයෙමි" සි අසපුවට ගොස් අනිවර්ජිතවට නිග්‍රහ පිණිස පෙහෙවස් සමාදන්ව එක් ප්‍රදෙශයක හොත්තේය

තාපසයන් වහන්සේ ද ජාතිය නිසා උපන් මානයෙන් ධ්‍යාන උපදවාගත නොහෙන බව පසේ බුදුරජානන් වහන්සේ දැක "මෙතෙම ලාමක සත්වයෙක් නොවෙයි. මේ කල්පයේම බුදු වන බොධිසත්වයෙන. ඔහුගේ මානයට නිග්‍රහ කොට ධ්‍යාන උපදවා ගන්නා ආකාර කරමි" සි සිතා ඒ තාපසයන් වහන්සේ පන්සල හුන් කල්හි හිමාලය වනයෙන් තමන් වහන්සේ වැඩ ඒ තාපසයන් වහන්සේ ඉන්නා රුක් මූල තිබූ ගල්පුවරුවක වැඩ හුන්සේක. තාපසයන් වහන්සේ ද පන්සලෙන් නික්ම වැඩ හුන්නා වූ පසේ බුදුන් වහන්සේ දැක උන්වහන්සේ කරා එළඹ "වණ්ඩාල වූ කාල කණ්ණි වූ ඉසමුඛු මහණ මා ඉන්නා වූ පෝරුවේ කුමට උන්නෙහි ද" සි කී සේක. එවිට පසේ බුදුන් වහන්සේ වදාරණසේක් "එම්බල සත්පුරුෂය තෝ කුමට නින්ද කරන්නෙහි ද" මම ප්‍රති වෙධ කරණලද සත්‍යඥන ඇති පසේ බුදුකෙනෙක. තෝ මේ කල්පයෙහි සම්‍යක්සම්බුද්ධ වන්නාවූ පාරමිතා පුරා ආවාවූ බොධි සත්වයෙක. තෝ මෙතෙක් කල් ගිය තල බුදු වන්නෙහිය. ඒ ජාතියෙහි සිබාලී නම් කුමාර වන්නේය. ගෞතම නම් බුදු වන්නේය යනාදීන් සිගල්ල ප්‍රකාශ කොට කියා එසේ වූ තෝ මාන නිශ්‍රිත කොට කුමට පරුෂ බස් කියන්නෙහි දැයි වදළසේක. ඒ අසා බොසතාණන් වහන්සේ "කවරදා කවර කලෙක ද මා බුදු වන්නේයි යනාදීන් සාමීවි කථා විවරවත් නොකළ සේක. පසේ බුදුන් වහන්සේ ද තාගේ ජාතියගේවත් මාගේ ජාතියගේවත් පමණ තොපිම දුන් දැනගණුව. ඉදින් හැකි වූ නම් අහසට නැගී මා හා සමග උතුරු හිමවතට එව" යි තමන් වහන්සේ අහසට නැගී තමන් වහන්සේගේ පා ධූලිය ඒ බෝසතාණන් වහන්සේගේ ජටා අතුරෙහි විසුරුවමින් අහසින් වැඩි සේක.

තාපසයන්වහන්සේ වැඩි කල්හි සිත කලකිරී "මුන්වහන්සේ විහත් ශරීර ඇතුව සැඩ පවන් වේගයෙන් සැඩපවන් කඳට දැමූ පුළුන් පෙදක්මෙන් අහසට පැන නැගී වැඩිසේක. මම ජාතිමානේ නිසා මෙබඳු මහෝත්තමයානන් වහන්සේගේ ශ්‍රීපාදයත් නොවැන්දෙමි ප්‍රිය කථාවකුත් නොකෙළෙමි. ජාතිමානය නම් අකුශලයක, ඒ කවරක් හට කුමන වැඩක් සිදු කරන්නේද? ශීලාචාරයම උතුම් වන්නේය, මේ මානය මෙසේ වැඩුනේ වී නම් මා නරකයට ගෙණ යන්නේය" යි දැන "මේ මානයට නිග්‍රහ කොට ඵලාඵලයට නොයමි" යි පන්සලට වැද උපොසථ වාසයෙන් කිසුණු භාවනා කොට පඤ්ඤවන් හා අෂ්ටසමාපත්තීන් උපදවා සක්මන් කෙළවර ගල් පෝරුවෙහි වැඩ උන්සේක.

කොබෝ පක්ෂියා ආදිවූ සතර දෙනද උස්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ එකත් පස්ව උන්නාහුය, බෝසතානන්වහන්සේ ඔවුන් සතර දෙනා කෙරෙන් වෙන් වෙන්ව "තෙපි පෙහෙවස් සමාදන් වන්ට කාරණ කිම්ද" යි විචාළ කල්හි ඔහු සතර දෙනම "අපි මෙනම් මෙනම් කාරණයකින් පෙහෙවස් සමාදන් වූම්හ" යි කියා පළමු පරිද්දෙන් ඒ ඒ කාරණ ප්‍රකාශ කොට කියා නැවත ඒ සතර දෙනම මහබෝසතානන් වැඳ "නුඹවහන්සේ ඵලාඵලයට නොගොස් කවර හෙයකින් පෙහෙවස් සමාදන්වූ සේක්ද" යි විචාළෝය. එසේ විචාළාවූ ඔවුන්ට තෝරා වදුරණ බෝසතානන්වහන්සේ වදුරණ සේක් "රාගාදි කිසිවක තැලුනු සිත් ඇති පසේබුදු කෙනෙකුන් වහන්සේ මාගේ අසපුවට ඇවිත් මොහොතක් කල් වැඩ උන්නාවූ උන්වහන්සේ මා විසින් මිය ගොස් උපදිනා තැන්ද අනාගතයෙහි මාගේ ප්‍රවෘත්තියද බුදුවන ජාතියෙහි මාගේ නාම ගොත්‍රයද මා රක්ෂා කරන්නාවූ ධර්මයන්ද යනමේ සියල්ලම මට දන්වා වදළසේක, එසේ ඇති කල්හිත් සිත්හි උපන් මානයෙන් උන්වහන්සේගේ ශ්‍රීපාදයටත් නොවැන්දෙමි. ඒ උතුමන් වදුළ ප්‍රවෘත්තිය මා සිතට සැකහැර නොවිවාළෙමි. එසේ කළේ මාගේ ජාතිමානය නිසාය. එබැවින් ඒ මානනිග්‍රහ කරණ පිණිස ඵලාඵල සොයා නොගොස් උපෝෂථ වාසයෙන් උන්නෙමි" යි වදුළසේක.

මෙසේ මහබෝසතානන්වහන්සේ තමන්වහන්සේගේ උපොසථ වාසය ඔවුන්ට කියා ඔවුන් උන් උන්ගේ වාසස්ථානයට ගමන් කරවා තමන් වහන්සේත් පන්සලට වැඩිසේක. ඒ නිරස්වීනයෝ

සතර දෙනද බෝසතාණන්වහන්සේගේ අවවාද අසා තුණ ධම් ගන් රකුණා කොට එයින් මිය දිව්‍යලෝකයෙහි උත්තානුය. බෝසතාණන්වහන්සේ ඛ්‍යානලාභී හෙයින් බ්‍රහ්මලෝකයෙහි උපන් සේක.

මෙසේ පෙර තිරශ්චීනයෝ පවා පෙහෙවස් රකුණා කොට නිවන් සැප සිඹ කලෝය, මනුෂ්‍ය ජාතියෙහි උපන්නාවූ එම්බා සඩ්ගයෙනි තොපට කවර බැරි දෙයෙක් ඇද්ද?--එබැවින් අප්‍රමාදව අෂ්ටාඩ්ග ශීලය රකුණා කොට සතර අපායෙහි නොඉපද සද්ව්‍යලෝකයෙහි ඵෙඛ්‍යයී විද සොළවර අමා ඔහ නිවන් දකින්ට උත්සාහ සිතැතිව දිවා රෑ දෙක්හි සිල් රකුණා කළ අයට පැමිණෙන විපාක කියා දුන් වූහ. අඩපෝයක් රකුණා කළාවූ බොහෝ දෙනාත් ලත් දිව්‍ය ඵෙශවයන්ය බුදුබණින් බොහෝසේ පෙණෙයි. ඒත් මෙසේ දත යුත්තේය.

යටගිය දවස දඹදිව බරණැස් නුවර සැදුහැ ඇති බුහ්මදත්ත නම් රජෙක් විය. ඒ රජතෙම දන්දීමය නිති පන්සිල් රකුණා කිරි මය පොහොය අටසිල් රකුණා කිරීමය. යන මෙහි පමානුෂෝය. රජ තෙම අමාත්‍යාදීවූ සෙසු නුවර ඇත්තන් දැන ශීලාදියෙහි සමාදන් කරවන්නේය ඔහුගේ පුරොහිත බ්‍රාහ්මණ තෙම අත්ලස් ගන් නේය. හිමියන් අභිමිකොට අයුක්ති බණන්නේය. රජතෙම එක් පොහෝ දිනයක් පැමිණි කල්හි උදැසනම තම තමන්ගේ අමාත්‍ය යන් කැඳවා පෙහෙවස් වසවයි මෙහෙවර කියේය. සෙස්සෝ සිල් සමාදන් වූහුය. පුරෝහිත බ්‍රාහ්මණ තෙම පෙහෙවස් සමාදන් නොවිය. දැවල් අත්ලස් ගන්නේය. අයුක්ති කියා පෙහෙවස් සමාදන් නොවී රජගට ආය. රජතෙම තෙපි සිල්සමාදන්වූ ද" යි අමාත්‍යයන් විචාරණුයේ "ආචාරිනි තෙපිත් සිල්සමාදන් වූද" යි පුරොහිත බමුණා අතින් විචාළේය. එතෙම "එසේය සිල් සමාදන් වීමි" යි බොරු කියා රජගෙන් බවුසේය.

එක් අමාත්‍යයෙක් මගදී ඔහු අතින් තොගත් ශීලය ගනිමි" යි බොරු කියේ ඇයි ද" යි කිය. එවිට බ්‍රාහ්මණ තෙම කියනුයේ "මම වේලා නොවරදවාම බත් කැමි. දැන් ගෙට ගොස් කට සෝදා දමා සිල් ඉටාගෙණ රෑ බත් අනුභව නොකොට සිල් රකුණා කෙරෙමි එසේ කල්හි මට අඩපෝයක් පිරෙන්නේය"යි කීය. ඒ අමාත්‍යද යහපතැයි ගිවිස ගියේය. පුරොහිතද එපරිද්දෙන් අඩ පොහොයක් සිල්සමාදන්ව හුන්නේය. මේ ඔහු රකුණා කළ ශීලය,

නැවත එක් පොහොදිනෙක ඔහු යුක්ති කියන සභාවෙහි උන් කල්හි යුක්ති කියන්ට ආවාවූ සිල්වත් සත්‍රියක් වෙලා ආගන්නවූ කල්හි කට හෝදන්ට ආරම්භ කළාය. එවේලාවට බමුණාට පැසුනු අඹකැනක් ගෙණාවාහුය. හෙතෙම ඇ පෙහෙවස් සමාදන් වූබව දැන "මේ අනුභව කොට පෙහෙවස් රක්ෂා කරව" යි අඹකැන දුන් නේය. ඕතොමෝ අනුභව කෙළේය. බමුණු දුන් දන් මෙපමණය. ඒ බ්‍රාහ්මණ තෙම මැත භාගයෙහි කෝසඹි නම් ගංගාතීරයෙහි තුන් සොත්තක් දිග පළල ඇති අඹ උයනෙක දිලියෙන්නාවූ විමාන යක සරහනලද ශ්‍රී යහනෙක නිදා පිබිදියාක් මෙන් උපන්නේය. උතුම්වූ රූපශ්‍රීධරවූ සොළොස් දහසක් දිව්‍යස්ත්‍රීහු පිරිවරා හිටි සෝය. ඒ තෙම රාත්‍රියෙහි ඒ ඒ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය අනුභව කරන් නේය. විමාන ප්‍රේතව උපන් බැවින් පෙර ජාතියෙහි කළ අකුසල යට සුදුසුවූ දුක් විඳිනේය. එබැවින් අරුණු නැගෙන කල්හි ඒ අඹ වනයට වදනේය. ඔහු අඹ වනයට වන් කල්හිම දිව්‍යාත්මභාවය නැති වන්නේය. අසූරියන් උස ඇති ප්‍රේතාත්ම භාවය පහළවන් නේය. සියලු ශරීරය ගිනි ඇවිල දන්නේය. හාත්පසින් මල් පිපුනු කැලයක්මෙන් පෙණෙන්නේය. දූතම ඒ ඒ ඇසිල්ලෙහිත් වන් නේය. ඒ ඇසිලි දෙකෙහිම උඳළු තැවලි පමණවූ නියපොතු වන් නේය. ඒ නියපොතු දෙකින් තුමාගේ පිට පලා මස් උදුරා කමින් මහඟඩින් මොරගා දුක් විඳිනේය. හිරු ගසතගතවන කල්හි ඒ ශරීරය අනාඩාන වන්නේය. දිව්‍යාත්මභාවය පහළවන්නේය. දිව්‍ය ස්ත්‍රීහු ඇවිදින් පිරිවරා ගන්නාහුය. එතෙම මහාඓශ්වයෙන් දිව්‍යප්‍රසාදයකට නැඟගන්නේය. මෙසේ පෙහෙවස් රක්ෂාකරණ ස්ත්‍රියට අඹකැන දුන් විපාකයෙන් දෙලොස් ගවු දිග පළල ඇති අඹ උයන පහළ විය. ඒ අත්ලස් කැ විපාකයෙන් පිටමස් පලා උපුටා කනුවිය. අඹපොහොයෙහි විපාකයෙන් රාත්‍රියහි දිව්‍යසම්පත් අනුභව කරන්නේය.

ඒ බරණැස් රජතෙම වස්තුකාම් ක්ලේශකාමයෙහි දෝෂ දැක රාජ්‍යසම්පත් හැර තාපසව එම කොඤ්චකිනම් ගඹහාතීරයෙහි ප්‍රේතයාගේ අඹුයන පාත පන්සලක් කොට වනමූල් ඵලාඵල අනුභව කොට වාසය කෙළේය. ඉක්බිති එක්දවසක් ඒ අඹ උය නින් මහ කළයක් පමණ මහත ඇති විලිකුනු අඹගෙඩියක් ගඹහා දියෙහි අවුත් වැටී ඒ තාපසයන් දියනාන ගඟතොට සම්පැවට ආය. ඒ දැක තාපසයෝ දිය පිනා ගොස් අඹගෙඩිය අසපුවට ගෙණ වුත් සැතකින් කැපා යපෙන පමණක් අනුභව කොට සෙස්ස

කෙහෙල් පතකින් වසා තිබ්බේය. මෙසේ අනුභව කොට අඹ ගෙඩිය නිමාව ගිය කල්හි දිව්‍ය රසය අනුභව කළ කල්හි බොධි සත්ව සිට ද රස තෘෂ්ණාව නවත්වාගත නොහී අන් ඵලාඵලයක් අනුභව කරන්ට රුචි නැතිව ගත් තෙරට ගොස් අඹ ගෙඩියක් කොලුබ නොනැගී සිටිමයි ගඟ බලාගෙණ සත් දවසක්ම නීරාහාරව උන්නේය. සත්වෙනි දවස ඒ ගබඟාවෙහි අරගත්තා වූ දිව්‍ය සන්‍ති තොමෝ සිතන්නී "මේ තාපස තෙම අඹ ඵලයක් නොලැබ මිය යන්නේය. ඔහු මළහොත් මට නිදුවන්නේය" යි සිතා අවුත් ඒ බෝසතාණන් වහන්සේ වැඩ හුන් තැන අහස සිටගෙණ:—

කිං ඡ්‍රෙදූ කිමධිපායො එකො සමමසි සමමසි,
කිං පත්‍ථයානො කිං එසො තෙන අත්‍ථෙන බ්‍රාහ්මණාති.

යනාදීන් ඒ බෝසතාණන් අතින් මෙබදු උණු වැල්ලෙන් කකියන්නා වූ ගබඟාතීරයෙහි මෙසේ නිරාහාරයෙන් සැනපීමට කාරණ කවරේ දැයි විවාළිය, ඒ බෝසතාණන් වහන්සේද.—

යථා මහාවාරිධරො කුම්භො සුපරිනාගවා,
තථූපමං අත්ඛපක්ඛං වණ්ණගන්ධාරසූපතං.

යනාදීන් තමන් වහන්සේ ගඟදියෙහි යන අඹ ඵලය ගෙණ අනුභව කළ තැන් පටන් ආහාරයකට රුචි නැති බව දන්වා වදාළ සේක. මෙසේ අඹ පොහොසෙනුත් මෙබදු විපාක ඇත්තේ යයි දන්නා එම්බා සත්පුරුෂයෙනි තොප විසින් අප්‍රමාදව උපොසථ ශීලය රක්ෂා කට යුත්තේය. මේ මෙසේ විපුලතර ආනිසංසඳයක වූ අෂ්ටාඞ්ග ශීලය එක් දවසෙක පමණ වී නමුත් සමාදන්ව රක්ෂා කිරීම හෙතුකොට ගෙණ අපමණ ආනිසංස ඇතිවන්නේය. ඒ කෙසේ ද? යත්;

මේ මහා භද්‍රකල්පයට එකානූවන කල්පයෙහි එකුපොසථික නම් සථවිරින් වහන්සේ පූජි බුදුවරයන් කෙරෙහි කාමාධිකාර මහපින් ඇතිව ඒ ඒ භවයෙහි නිර්‍වාණ සම්පත්තියට හෙතුවූ කුසල් රැස් කරන්නී විපස්සි නම් බුදු රජානන් වහන්සේගේ කාලයෙහි බන්ධුමතී නුවර එක්තරා කෙළෙඹියක්ගට දුසිව ඉපද වැඩිවිය පැමිණ ගිමියන්ට මෙහෙ කරමින් ජීවත්ව වසන්නීය. එසමයෙහි බන්ධුමතී රජ තෙම පොහොයක් පොහොයක් පාසා පෙහෙවස් සමාදන්ව පෙරබත දානාදී පින්කම් කොට පස්වරු බණ

අසන්නේය. නුවරවාසී මහජන සමූහයා ද එසේම කුසල්හි හැසිරෙන්නේය. එකල්හි ඒ ඝර දුසියහට මෙබඳු සිතිවිල්ලෙක් විය. "දැන් මේ රජ ද මහජනසමූහයා ද පෙහෙවස් සමාදන්ව කුසල්හි හැසිරෙති. එහෙයින් මම පොහෝ දවස සවාමීන්ගෙන් අවසර ගෙණ පෙහෙවස් සමාදන් වෙමි" යි සිතා සවාමීන්ට දන්වා අවසර ගෙණ එක් දවසක් පිරිසිදුව පෙහෙවස් රක්‍ෂා කොට ඒ කුසලයෙන් එයින් චුතව තව්තිසා දෙව් ලොව ඉපිද ඔබිනොබ සවගීයෙහිම සැරිසරා ඇවිදිමින් ලක්‍ෂයක් පමණ දිව්‍යාඞ්ගනාවන් කරණ ලද උපස්ථාන ඇතිව සූසැට වරෙක ශක්‍රදෙවෙන්ද්‍රයන්ට මහෙසිකාව තෙසැට වරෙක චක්‍රවර්ති රජුන්ට අගබිසෝව උපන් තැන සවණ් වණ් වූ අප්‍රමාණ වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කොට නිවන් රස වළඳනු කැමතිව මේ බුඬොද්පාද කාල යෙහි දෙව් ලොවින් චුතව සැවැත් නුවර මහ සිටු කුලයෙහ ඉපද ප්‍රාඥ බවට පැමිණ පටාචාර නම් සථවිරියගේ සම්පයෙහි බණ අසා පැවිදිව විදර්ශනා වඩා ප්‍රව්‍රජ්‍යා ඛමීය මුදුන් පත් කරගන්ට කොහැකි වූවාය. පටාචාර සථවිරි තොමෝ ඇගේ චිත්තාචාරය දැන අවවාද දින. ඒ අවවාදයෙහි පිහිටා සිව සිවු පිළිසිඹියා හා සමග රහත්ව ප්‍රව්‍රජ්‍යාසුඛ විඳින්නී මහත් ප්‍රීති උපදවාගෙණ උදාන වශයෙන් මේ ගාථා කියනලදි:—

නගරෙ බඤ්ඤමතියා බඤ්ඤා නාමඛත්තියෝ,
දිවසෙ පුණ්ණමායං සෝ උපගච්ඡි උපොසථං.

අහං තෙන සමයෙන කුමාරදාසී අහූ තදා,
දිසවා සරාජිකායෙතං එවාහං චින්තයිං තදා.

රාජාපි රජ්ජං ඡඩ්ඩෙත්වා උපගංඡි උපොසථං,
සථලං වත්තං කථිං ජනකායෝ පමොදිතෝ.

සොහිසෝ පවිවෙකඤ්ච දුද්දදංව දළිද්දතං,
මාතං සංපහංසෙත්වා උපගංඡි උපොසථං

අහං උපොසථං කත්වා සම්මාසම්බුඬසාසනෙ,
තෙන කම්මෙන සුකතෙන තාවතිංසං අගච්ඡහං

තත්‍රා මෙ සුකතං ව්‍යාමිහං උඞ්ං සොජනමුග්ගතං,
කූටාගාරවරූපෙතං මහාසයනභූසිතං.

අච්ඡරාසත සහස්සානි උපට්ඨිස්සන්ති මං සදා,
අඤ්ඤෙ දෙවෙ අතික්කම්ම අතිරොචාමි සබ්බදා.

චතුසච්චිදෙවරජානං මහෙසිත්තමකාරයිං,
තෙසච්චිවකකවත්තිනං මහෙසිත්තමකාරයිං

සුවණ්ණවණ්ණා හුත්වාන සංසරාමි භවාභවෙ,
සබ්බත්ථ පවරා හොමි උපවාසස්සිදං ඵලං.

හත්ථියානං අස්සයානං රථයානව කෙවලං,
ලභාමි සබ්බමෙවෙතං උපවාසස්සිදං ඵලං.

සොවණ්ණමයං රූපිමයං අථොපි ඵලිකාමයං,
ලොහිතඞ්කමයඤෙව සබ්බා පටිලභාමහං.

කොසෙය්‍යකම්බලියානි ඛොමකපාසිකානිව,
මහග්ඝ නා ව දුස්සානි සබ්බං පටිලභාමහං.

අන්නං පානං ඛාදනියං වත්ථං සෙනාසනානි ව,
හොගෙ ව උත්තතා නත්ථි උපවාසස්සිදං ඵලං.

වරගන්ධව මාලඤ්ච චුණ්ණකඤ්ච විලෙපනං,
සබ්බමෙතං පටිලභෙ උපවාසස්සිදං ඵලං.

කූටාගාරඤ්ච පාසාදං මණ්ඩපං හම්මියං ගුහං,
සබ්බමෙතං පටිලභෙ උපවාසස්සිදං ඵලං.

ජාතියා සත්තවස්සාහං පබ්බජිං අනගාරියං,
අඩ්ඩමාසෙ අසම්පත්තෙ අරහත්තමපාපුණිං.

එකානවුතෙ ඉතො කප්පෙ උපොසථ මුපාවිසිං,
දුග්ගතිං නාභිජානාමි උපවාසස්සිදං ඵලං.

කිලෙසා ඣාපිතා මය්හං භවාසබ්බෙ සමූහතා,
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවං.

ඍගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකං,
තිස්සොවිජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

පටිසම්භිදා චතස්සොව විමොක්ඛාපිව අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්සසාසනන්ති.

තවද දවසින් බාගයක අධි උපොසථයක් විසිමෙනුදු ලැබූ අනුසස් මෙසේ දතයුතු. අප බුදුහු සැවැත් නුවර දෙවරම්හි

වැඩ වසන සමයෙහි කොසඹැ නුවර ඝෝසක සිටානෝය කුක්කුර සිටානෝය පාවාරිය සිටානෝය යි යන සිටුවරුන් තුන් දෙනෙක් වූවාහුය. ඔවුන් වස්වසන කාලය සම්පවූ කල්හි හිම වතින් අවුත් නුවර පිඬු පිණිස හැසිරෙණ පන්සියයක් පමණ තාපසවරුන් දැක පැහැද වළඳවා ප්‍රතිඥ ගෙණ වස් සාරමස තමන් සමීපයෙහි වසවා නැවත වස්සානය පැමිණි කල වඩනා පිණිස ආරාධනා කොට යැවුවාහුය. තාපසයෝද එතැන් පටන් අටමසක් හිමවත වැස සාරමසක් එහි සිටුවරුන් තුන්දෙනාගේ සමීපයෙහි වසන්නාහුය.

මැන භාගයෙහි ඔහු හැමදෙන හිමාලයවනයෙන් නික්ම එන්නා හුය. ආරණ්‍යයෙහි එක් මහ නුගරුකක් දැක ඒ නුගරුක ශ්‍රීල හුන්නාහුය. ඔවුන් අතුරෙහි ප්‍රධාන තාපසතෙම සිතනුයේ "මේ නුගරුකෙහි මහෙශාක්‍ය දිව්‍යරාජයෙකු වසින් අධිගෘහීත වූයේ වන. හෙතෙම මේ ඍෂිගණයාට බොහා පැනක් දුන්නේ වී නම් මැනවැ" යි සිතූසේක. ඒ සිත හා සමගා දෙවතාතොම බොහා පැන් දින, නැවත තාපසතෙම නහන පැන් සිතූයේය. එකෙණෙහි නහන පැන් දින. එකල්හි තාපස සිතනුයේ "මේ දිව්‍යරාජයා වනාහි අප වසින් සිතූ සිතූ ලෙස සියල්ලම දෙන්නේය. ඒ දිව්‍ය රාජයා අපි දැක්කමෝ නම් ඉතා යෙහෙකැ" යි සිතූ ක්ෂණයෙහි හෙතෙම නුග කඳ දෙබැ කොට පැන නැඟී දිව්‍යරාජ විලාසයෙන් සිටී තමා තවුස් පිරිසට දැන්වූයේය. එකල්හි තාපසයෝ "දිව්‍ය රාජය තොපගේ සම්පත් ඉතා බොහෝය. තොප විසින් කවර පින්කමක් කොට මේ සම්පත් ලබනලදදැ" යි විමාළාහුය.

එකල්හි ඒ දිව්‍යපුත්‍ර "සවාමිනි මා නො වීමාළ මැනවැ" යි කියා නැවත නැවතත් "දිව්‍යරාජය තා කළ කුශලය කියව" යි විවාරණුයේ තමා විසින් කරණ ලද කුශලකර්මය සවලා බැවින් කියන්නට ලජ්ජායෙන් නො කැමැතිව ඉතා ගැහැටව එසේ වී නම් අසව" යි කියා කියේය.

හෙතෙම ඊට පූර්ව ජාතියෙහි මිනිසෙක්ව බැලමෙහෙ සොයා ගොස් අනේපිඬු මහසිටානන් සමීපයෙහි බැලමෙහෙයක් ලැබ එසින් ජීවිකාව කරන්නේය. එකල්හි එක් පොහෝ දිනයක් පැමිණි කල්හි අනේපිඬු මහසිටානෝ විහාරයෙන් අවුත් බැළ මෙහෙ කරණ පුරුෂයාට අද පොහෝදින බව කියේ ඇද්දැ" යි විවාළ තැන සවාමිනි කිසිවක්හු විසිනුත් නො කියන ලද්දේය" යි

කිවෑහුය. "එසේ වී නම් ඔහට සවස බත පිසුව මැනවැ" යි දැන්වීය. එකල්හි ඔහට පමණක් සාල් නැළියක් ගෙණ බත් පිසුවෑහුය. හෙතෙම දහවල් අරණෙහි කමිනනකොට සන්ධ්‍යා කාලයෙහි අවුත් බත් එළවා දුන් කල්හි ක්ෂුධායෙමියි සිතා වහා බත් අනුභව නො කොට සෙසු දවස්වල මේ ගෙදර "බත් දෙව, මාළු දෙව" යි කියා මහා කොලාහල වන්නේය. අද හැමදෙනම නිශ්ශබ්දව හොත්තාහුය. එකලාව මට පමණක් ආහාර එළවා දුන්නහුය. මේ කිමෙක්ද" යි සිතා 'සෙසු අය බත් අනුභව කළාහුද? නො කළාහුද? කාරණා කිම්' යි විමැලේය.

එකල්හි සිටාණන්ගේ පිරිවර ජනයෝ කියන්නාහු "එම්බල බැළය මේ ගෙදර පොහොදවස්වල සවස බත් නො පිසන්නේය. සියල්ලෝ පෙහෙවස් සමාදන් වන්නාහුය. ශරත් පිරිසෙයින් මේ ගෙදර ලදරුවන් පවා මුඛ සොඩ්ඩ වතුමධුර මුඛයෙහි බහාලවා අපගේ මහ සිටුතෙම මෙසේ ලදරුවන් වී නමුත් උපොසථිකයන් කරවන්නේය. සුවඳ තෙල් පහන් දිලියෙමින් සිටි කල්හි සඟන ගතවූ කුඩා මහත් දරුවෝ දෙනිස්කුණප කොවිඳාඝ කියන්නාහුය. නොපට වනාහි පොහොදවස බව කියන්නට සිහි නොවුම්හ. එහෙයින් නොපටම බත් උයන ලද්දේය. ඒ බත් අනුබව කරව" යි කිවුය.

එවිට දුගීතෙම "පෙහෙවස් සමාදන් වෙන්ට වටනේ වී නම් මමත් දැන් සමාදන් වෙමි" යි කියා. එවිට සෙස්සෝ "මේ කාරණය මහ සිටුතෙම දන්නේය" යි කිවුය. "එසේ වී නම් ඔහු විමැරව" යි කියා ගොස් සිටාණන් විමැළි කල්හි කියනුයේ දැන් බත් අනුභව නො කොට මුව සෝදා ඒ උපොසථ ශීලයන් ඉටා ගත් තැනැත්තේ අඹ උපොසථ කමියක් ලබන්නෙහිය" යි කිවේක.

දුගීපුරුෂ ඒ අසා එසේ කෙළේය. දවල් මුළුල්ලෙහි කමිනනකොට රාත්‍රියෙහි බඩසායෙන් සිටි ඒ දුගී පුරුෂයාගේ ශරීරයෙහි වාතයෝ කුපිත වූවාහුය. හෙතෙම රුහැණකින් බැඳ යොත් කෙළවර ගෙණ පෙරළා අදනේය. වෙදනාව ඉතා බලවත් විය. මහ සිටුතෙම ඒ ප්‍රවෘත්තිය අසා දඹුවැටපහන් ලවා ගෙණ වතුමධුර ගෙන්නා ගෙණ ඔහුගේ සමීපයට ගොස් "දරුව

කිමෙක්ද" යි විවාළහ. "සවාමිනි වානය කුපිතවිය" යි දැන්විය. "එසේ වී නම් දරුව නැඟී මේ බෙහෙත් කව" යි කිහ. එවිට දුගී තෙම "සවාමිනි නුඹත් කන්නෙහිද" යි විවාළේය. "අපට අපායු වෙක් නැත. මේ තෝ වතුමධුරය කව" යි කිහ. "සවාමිය පෙහෙවස් වසන්නාවූ මම දවස මුළුල්ලේ රක්නට නො හැකිවීමි. මාගේ අඩුපොසථ කමියද භික්ෂාලභොජනය වේ දෝ" යන හසින් නො කැමැති විය. සිටානන් විසින් "දරුව මෙසේ නො කරව" යි කියනු ලබන්නේද ශිල භෙද හසින් බෙහෙත් අනුභව කරන්ට නො කැමැතිව වේදනා උපදවමින් කල් යවා අරුණු නැඟෙන කල්හි මලානිකව ගිය මල්දමක් මෙන් කාලක්‍රියා කොට ඒ නුග රුක එබදු දිව්‍ය සම්පත්තියකින් යුක්තව උපන්නේය.

එහෙයින් මේ කාරණය ප්‍රකාශ කොට දිව්‍යපුත්‍රතෙම තාපස වරුන්ට තත්වූ පරිද්දෙන් කියා ඒ අනේපිඬු මහසිටුතෙම "බුදුන් මමය මාගේය" යන සිත් ඇත්තේය. ධම්ය මමය මාගේය යන සිත් ඇත්තේය. සංඝයා වහන්සේ මමය මාගේය යන සිත් ඇත්තේය. ඔවුන් නිසා කරණ ලද අඩිඋපොසථ කම්යාගේ ආනුභාවයෙන් මේසා මහත් දිව්‍ය සම්පත්තියක් මා විසින් ලබන ලදැයි දැන්විය.

මෙසේ සිල සම්පත්තිය මහානිසංස ඇත්තේයයි දැන එක් ඇසක් රක්නා මිනිසෙකුමෙන් අප්‍රමාදව උපොසථසීලය රක්ෂා කළ මැනව. කාලපරියන්තවූද ශිලයාගේ ඵලසම්පත් මෙසේ ඇතිවන කල කාලපරියන්ත නොව රක්ෂා කරණ ලද ශිලයාගේ ආනිසංස මහත්බිය මෙයට වඩා කුමක් කියමෝද? ජීවිතාන්තය දක්වා රක්ෂා කරණ ලද යම් නිත්‍යශිලයෙක් ඇද්ද? ආනිශංස වශයෙන් ඒ ශිලය ප්‍රකාශ කොට කියන්ට බුදුරජ්ම පොහොසත් වාසේක. මෙම කියන ලද්මැයි:-

එවං මහානිසංසන්ති විදිත්වා සීලසම්පදං,
නයනං එකනෙත්තෝවරක්ඛ සීලමුපොසථං.

කාලපරියන්තක්ඛණාපි සීලස්සෙසෝ එලෝදයෝ
අපරියන්තස්ස කිං වක්ඛාම ඉතෝපරං

ආපානකොටිකං යාව නිච්චසීලං හි රක්ඛිතං,
මුනිනෙව පහූහොති ඵලන්තං තං විභාවිතුං.

මෙහේ නවවෙනි පරිච්ඡේදයෙන් නිත්‍යශීල උපොසථශීල යන්ගේ ප්‍රභෙදනිශංස ප්‍රකාශ කිරීමෙන් ලෝවැඩ දක්වා තදනන්තර දානාදි කුශලකර්ම පථප්‍රභෙදනිශංස කථාවෝද මෙහි දක්වනු ලැබෙත්.

දශකුශලකර්මයෝ නම් කවරහ?යත්--දානය ශීලය භාවනාය අපචායනය වෛය්‍යාවච්චය පත්තිදානය පත්තානුමෝදනාවය ධර්ම ඇසීමය ධර්ම දෙසීමය දෘෂ්ටිය ඍජුකිරීමය යන මොහු දශකුශල කර්මයෝ නම් වෙත්. ඔහු තමතමාසමංගිපුද්ගලයාට අනෙක ප්‍රකාරවූ පුණ්‍යඵල උපදවා දෙන බැවින්ද ඔහුගේ චිත්තසන්තානය පිණවා සතුටු කරණ හෙයින්ද පින්ය යන මොහු සත්වයන් විසින් කරන්ව යුතු හෙයින් ඒ ඒ කුශලානිශංස කථාවස්තුහු ගණන් වශයෙන් දශයෙක්හුයි දශපුණ්‍යක්‍රියා වස්තුහු නම් වෙත්.

එහි දානයතෙම දශපාරමිතාවන් කෙරෙන් පළමුවන පාරමිතාවය, සතර සංග්‍රහ වස්තූන් කෙරෙහි පළමුවන සංග්‍රහවස්තුවය. දාන ශීල භාවනා යන තුන් පුණ්‍ය ක්‍රියාවස්තූන් කෙරෙහි පලමුවන පිණ්‍ය ක්‍රියා වස්තුවය. හැම බෝසතුන් හැසිරෙන මාර්ගය. හැම බුදුන්ගේ වංශය, ඒ දානය නම් ධර්මදානය ආමිසදානයයි කියා විප්‍රකාර වන්නේය. එහි බුදුන් වදාළ පිටකත්‍රයෙන් එක ගාථාවක් වත් පුහුණු කොට මෙහින් මොවුන් සසර දුකින් මිදවම් යන කරුණාවෙන් ලාභසත්කාරාදියක් නොපතා අනුන්ට බණකීමද එසේම අනුන් ලවා බණ කියවා ලීමද ධර්මදාන නම් වන්නේය. භික්ෂූන්වහන්සේලාට දියයුතු චීවරපිණ්ඩපාතාදිවූ ප්‍රත්‍යයද කටික පටිකාපෙරාණිකාදිවූ යාවකාලයන්ට දියයුතුවූ ධනධාන්‍යගොමහිස වස්ත්‍රාභරණාදිය ආමිසදාන නම් වන්නේය.

ඒ විප්‍රකාරවූ දානයන් අතුරෙන් ධර්මදානයම ලොව උතුම් වන්නේය. ඒ ආමිසදානය අවිඤ්ඤත්තිකා සවිඤ්ඤත්තිකා වශයෙන් අති ප්‍රභෙද ගතව අනෙක ප්‍රකාරවී නවුදු දානවස්තූන්ගේ වශයෙන් දශවිධවේ. එහි දශවිධ දානවස්තූහු නම් කවරහ? යත්--

අන්නං පානං ඝරං වත්ථං යානං මාලාවිලෙපනං,
සෙය්‍යාවසථපදීපෙය්‍යං දානවත්ථු ඉමේ දස--සී.

අන්නං සාලිවීහි ආදි ශප්තවිධ ධාන්‍යයෙන් කළ ආහාර දානය; පානං, මධුමුද්දිකාදි පානවගි දානය; වත්ථං, ඛෝමකොසෙය්‍යාදි වස්ත්‍රදානය; යානං, ඉත්ථිලිත්ථිලිකුනම් ආදි යානවාහන දානය; මාලා, ගෙතු නොගෙතු දුසමන් ආදි පුෂ්ප දානය ගන්ධ, කසතුරි කර්පූරාදි සුගන්ධදානය; විලෙපනං, සඳුන් කසාගොරද කොකුම් ආදි විලෙපන දානය; සෙය්‍යං, හිසිවිමිලිකාදි දශවිධ සෙය්‍යාදානය; ආවසථ, ආවාස දානය; පදීපෙය්‍යං, ප්‍රදීපයට ගිතවූ පහන්වැටි පහන් තෙල ආදිය හා ප්‍රදීප දානය යන; ඉමෙ, මොහු, දසදාන වස්තු; දශවිධවූ දානවස්තුහු නම් වෙත්.

මෙම ආහාරාදී දානවස්තූන්ගේ යහපත්වූ මනා ත්‍රුවණ පෙර දැරි කොට ඇති යම් දීමෙක් ඇද්ද ඒ දීම දානයයි කියා අග්‍ර දානයන් නොපැකිලදෙන සවභාව ඇති බුදුවරයෝ වදාරත්, එයින් කීහ. සඞ්ගෝපාගතයෙහි:-

අන්නාදිදානවත්ථූනං වාගෝ සුබුඞ්ගුබබඤ්ඤෝ,
යෝ නං දානන්ති දීපෙති බුඞ්ගුනගග්ගදයිනෝ.

මෙසේ ලදනම් ඇති දානය පවත්වන දායකයන්ගේ වශයෙන් දාන දායක දාන සහායය දානපති යයි කියා තුන් දෙනෙක් වෙත්. එහි යමෙක් මධුර දෙයක් වළඳ අමධුර දෙයක් අනුන්ට දෙන්නේ වීනම් හෙතෙම දානවස්තු සවාමියෙකු මෙන් සිතා තමා ඝටත්ව දායව සිට දෙන හෙයින් ඒ දානය දායදාන නම් වෙයි. යමෙක් මධුර වීනවූදු අමධුර වීනමුදු තමා වළඳන නියාමයෙන් අනුන්ට දෙන්නේ වීනම් හෙතෙම දාන වස්තුව තමා සම කොට යහළුවකු මෙන් සිතා දෙන හෙයින් ඒ දානය සහාය දානය නම් වෙයි. යමෙක් යම් යම් දෙයකින් තමා යැපී අනුන්ට මධුර කොට දන් දෙන්නේ වීනම් හෙතෙම දාන වස්තුවට තමා හිමිව අධිපතිව සිට නොපැකිළ දෙන හෙයින් ඒ දානය දානපති නම් වෙයි.

තවද අවර්ෂිය ප්‍රදෙශ වර්ෂිය සවිත්‍ර වර්ෂිය කියා දානය තුන්වැදෑරුම් වේ, එහි යම්කිසි තැනෙක්හි නොවස්නා වලා සෙයින් යමෙක් යම්කිසිවක්හට දන් නොදෙන්නේ වීනම් හෙතෙම අවර්ෂි නම් වෙයි, කිසි තැනෙක්හිම වස්නා වැසිවලා සෙයින් යමෙක් සම්භර කෙනෙකුන්ට දන් දෙන්නේ වීනම් හෙතෙම

ප්‍රදෙශවර්ෂි නම් වෙයි. හැමතැන්හි සතර මහා දිවයින එක පැහැර වස්නා මහවලා සෙයින් යමෙක් විභාග ඥානය සියල්ලටම දන් දෙන්නේ විනම් හෙතෙම සර්ව්‍රවර්ෂි නම් වෙයි.

එහෙයින් දානපති හැම දෙනා කෙරෙහි මෙත් සිත් පතුරුවා සාධාරණව සියල්ල වුන්ට දන්දෙන්නාවුන් විසින් පූර්වෙතනාය මඛ්‍යවෙතනාය අපර වෙතනාය යන තුන් සිත් පිරිසිදු කොට දන් දීම දානසම්පත් නම්. මෙම වදරණ ලදමැයි බුදුන් විසින්:—

පුබ්බව දානා සුමනෝ දදං චිත්තං පසාදයං,
දත්වා අත්තමනෝ හොති එසා යඤ්ඤස්ස සම්පදා ති.

එහි ආදිමධ්‍යාවසාන චෙතනාවන්ගේ ප්‍රභෙදය කෙසේද? යන් දන් දෙන පිණිස දානවස්තුව දැහැමෙන් සෙමෙන් උපදවන්නාවූ කාලයේහිද ඒ දානවස්තුව අනුන්ට දෙමිසි සිතන කාලයෙහිද දන් පිළිගන්වා සුදුසු තැන් සොයන කාලයෙහිද යම්තාක් තමා අයිති දානවස්තුව පිළිගන්නා කෙණෙකුන් දසාවට පිරුනමා ඔහු අතට පමුණුවා තමාගේ අත අල්වාලීමද ඒ තාක් හැම තන්හි සතුටුව දායකයා විසින් පූර්භාග චෙතනාවෙන් ලෝභාදියෙන් පිරිසිදු කිරීම ආදී සිත පිරිසිදු කළා නම් වෙයි. දානවස්තුව තමා කෙරෙන් පිරිනමා අනින් මුදා ගලවා අනුන්ට දෙන කාලයෙහි චෙතනාව පිරිසිදු කිරීම මඛ්‍යසිත පිරිසිදු කළා නම් වෙයි· තමා දුන් දානවස්තු වෙහි ආලය නොකොට "සාධු මැනව මා විසින් අග්‍රදානයක් දෙන ලදැ" යි සොම්නස්ව කැවත කැවත සතුටු වීමෙන් දිවිහිමියෙන් ඒ දානචෙතනාවන් පිරිසිදු කිරීම අපරභාගසිත පිරිසිදු කළා නම් වෙයි. මෙසේ තුන්ප්‍රකාරවූ සිත එකතුව පිරිසිදු කිරීමෙන් දානමය කුශලය සම්භව වන්නේයි. මෙම කියන ලදී. උපාසක ජනාලඞ්කාර යෙහි:—

පුරිමා මුංචනාවෙව පරාණිසෝපි චෙතනා,
හොති දානමයං පුඤ්ඤං එවං සෙසෙසු දීපයෙ ති.

සෙසු ශීලාදි සියලු පින්කම්හි තුන්සිත පිරිසිදු කිරීමද මෙකී කෙසින් දතයුතු. යමෙක් තෙමේ දන්දේද අනුන් සමාදන් නොකර වාද හෙතෙම උපන් උපන් තන්හි භොග සම්පත් ලබයි, පිරිවර සම්පත් නොලබයි. යමෙක් තෙමේ දන්නොදේද අනුන් සමාදන්

කරවාද හෙතෙම උපන් තන්හි පිරිවර සම්පත් ලබයි, භොග සම්පත් නොලබයි. යමෙක් තෙමේ දන්දේද අනුන් සමාදන් කරවාද හෙතෙම උපන් උපන් තන්හි භොගසම්පතුදු ලබයි. පිරිවර සම්පතුදු ලබයි, යමෙක් තෙමේ දන්නොදේද අනුන් සමාදන් නොකරවාද හෙතෙම උපන් උපන් තන්හි භොගසම්පතුදු නොලබයි. පිරිවර සම්පතුදු නොලබයි.

දන් දෙනුගේ බොහෝදෙනාට ප්‍රිය වෙයි. සත්පුරුෂ ජනයන්ගේ සමාගම ලබයි. බහුගේ යසසද දශදිශායෙහි පැතිර බබලෝ දක්වා නැගෙයි. ගිහිගේ වැසියන්ගේ ධර්මයෙන් පහ නොවෙයි. ශරීර භෙදයෙන් මත්තෙහි සුගතිපද ප්‍රාප්තවේ. මෙම වදුරණ ලද මැයි.

"පඨමේ භික්ඛවෙ දානෙ ආනිසංසා, කතමෙ? පව – බහුනො ජනස්ස පියොහොති. මනාපො සප්පුරිසා භජන්ති කල්‍යාණෙ කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ගිහිධම්මා අනපෙතො හොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, ඉමෙ ඛො භික්ඛවෙ දානෙ ආනිසංසා ති"

ඒ දානයතෙම කාලවශයෙන් පවප්‍රකාරවේ, යමෙක් ආගන්තුකයාහට දේද, ගම්කයාහට දේද, ගිලන්හට දේද, දුර්භික්ෂයෙහි දේද, අග්‍රඝස්‍ය අග්‍රඵලයන් පළමුකොට ශීලවන්ත තැන් කෙරෙහි පිහිටුවාද යන මේ පස පවකාලදානයෝ නම් වෙත්. වදලේමැනෝ.

පවමානි භික්ඛවෙ කාලදානානි, කතමානි? පව--ආගන්තුකස්ස දානං දෙති, ගම්කස්ස දානං දෙති, ගිලානස්ස දානං දෙති, දුබ්භික්ඛෙ දානං දෙති, යානි තානි නවසස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති, ඉමානි ඛො භික්ඛවෙ පව කාලදානානීති"

යමෙක් වනාහි සකස්කොට දන්දේද දානවස්තුවෙහිදු දන් පිළිගන්නා තැන් කෙරෙහිදු ගෞරව නැතිව දේද පරහස්තයෙන් දෙවාද දමාපියන දෙයක් සෙයින් කිසිකාලයෙක්හි දේද අනාගත භවයෙහි උපදනා කුශලඵලය නොඅදහා දේද යන මොහු පව අසත්පුරුෂ දන නම් වෙති. වදලේමැනෝ,

"පඤ්චිමානි භික්ඛවෙ අසප්පුරිසදානානි, කතමානි? පාණං හත්වා— අසඤ්ඤං දෙති අවිත්ති කත්වා දෙති, අපච්චං දෙති, අනාගතඤ්ච දිට්ඨිකතා හොති, ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච අසප්පුරිස දානානීති"යි.

යමෙක් දෙන දාන වස්තුවට සත්කාර නොව බත් හාල් ආදී දෙශ සමන්විතව ආහාර දෙකුයේද භිඳිනාස්ථාන හා හැමදීම් ආදී වශයෙන් පිරිහිදු නොකොට කොසියම් තැනකවත් හිඳුවා කොසි යම් ආහාරයක් මත් තබා පුද්ගලයාට සත්කාර නොකොට දන් දීමද අසක්කාච්චදාන නම් වේ, ඒ නොකොට යමෙක් දෙයාධම් සංඛ්‍යාත දානවස්තුව පවිත්‍ර මධුරකොට දානප්‍රතිග්‍රහණයට සුදුසු තැන් සොයා ගෙණ දේද යටකී ක්‍රමයෙන් දානවස්තුවටද දන් පිළිගන්නා තැන්වලටද ගෞරව නැතිව දීම කොසකස්දීම නම් වේ. එසේනොව විසිතුරු ගෞරවයෙන් දේද දැසිදස් කම්කරු ආදීන්ලවා දෙවාපිම අසහත්ථදාන නම් වේ, එසේ නොදෙවා අක් මුල් නැති සඟර මා අත්පෑනැතිව උපන් ජාති කල් පමණ නැති එහෙයින් සියඅතින් දුනමැනවැයි සිතා තමා අතින් දන්දේද භවුරුද්දෙන් ඵලදෙන හොඬලවැල්සෙයින් කිසිකලෙක්හි දන් දීම අනපවිබදාන නම් වේ, එසේ නොව නිරන්තරයෙන් දන්දේද අනාගතකුශලඵලය නොඅදහා දීම අනාගමනදිට්ඨිකදීම නම් වේ, එසේ නොව මතුභවයෙහි මට කුසලඵල උපදනේයයි සිතා දන්දේද මේ සත්පුරුෂ දාන නම් වේ, වදළේමැනෝ

"පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි, කතමානි? පාණං සකකච්චං දෙති, චිත්තීකතා දෙති, සහත්ථා දෙති, අනපවිබං දෙති, ආගමනදිට්ඨිකා දෙති, ඉමානි ඛො භික්ඛවෙ සප්පුරිසදානානීති"යි.

යමෙක් ශ්‍රබාගෙන් දන්දේද සත්කාර කොට දන්දේද කාල යෙන් දේද මපුරුෂිත් වැළද නොඟැන්මෙන් දානවසතුවෙහි පැවති ලොභය හැර අපරිගාහිත චිත්තව දන් දේද තමාවද අනුන්වද පීඩා නොකොට දන්දේද යන මොහු පස්දෙන සත් පුරුෂ දාන නම් වෙති, එහි ශ්‍රබාගෙන් යමෙක් දන් දුන්නේ ඒ නම් ඔහට ඒ දානය ඵලදුන්කල මහාභොගසම්පත් ඇතිවෙයි. විශිෂටවූ රූපශොභා ඇති වෙයි, සත්කාර කොට දන්දීමෙනුදු එසෙයින්ම මහාභොග ඇති වෙයි, ඔහුගේ පුත්‍රදාරදාසකර්මකාරාදීවූ

සියල්ලෝ ඒ සවාම්වචනය ඇදහිම් වශයෙන් අසන්නාහුය, කාල යෙන් දන්දීමෙත්දු ඕහට මහාභොග ඇති වෙයි, යුක්තප්‍රාප්ත කාලයෙහි සම්පත් අනුභව කරන්නට නිසි වයස ඕහට උපදනා අතීයෝ විපුලවද උපදිත්. මසුරු සිත් නොව දන් දුන්නේ මහා භොගද ඇති වෙයි, උදුරවූ පඤ්චකාම ගුණ පරිභොගයට සිත කැමෙයි, තමාවද අනුත්වද වෙහෙස නොකොට දත් දුන්නේ මහාභොග ඇතිවෙයි, ඔහුගේ සම්පතට දියෙන් ගින්නෙන් රජුන් සොරුන් විසින් උපද්‍රව නොවේ, මෙයිදු සත්පුරුෂදාන නම් වේ, වදාළේමැනෝ;

"පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි කතමානි? පඤ්ච සඛාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති, අනඤ්ඤ භිතවිතෙනා දානං දෙති, අත්තානඤ්ච පරඤ්ච අනුපඛව්වදානං දෙති,

යනාදි පාලි ක්‍රමය දතයුතු.

එක් සමයෙක්හි සුමනා නම් රාජ කුමාරිකාව පන්සියයක් රථපිරිවරින් ජේතවනාරාමයට ගොස් පන්සියයක් පමණ කුමාරි කාවන් පිරිවරා බුදුන් වැඳ එකත් පස්ව හිඳ "භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ප්‍රඥාවෙන් සමන්නාගතවූවාහුය, ඔවුන් දෙදෙනා කෙරෙන් එක් කෙණෙක් තමාලද දෙයක් අනුන්ට බෙදාදී වළඳති, එක් කෙනෙක් නොදී වළඳති, මේ දායක අදායක දෙදෙනා දිව්‍යලෝකයෙහි උපන්කල විශෙෂ ඇත්තාහුද" යි විවාළේය.

එකල්හි බුදුරජ අපරිභොග දුෂ්පරිභොග අත්‍යානනියොජන ශ්‍රද්ධාදෙය්‍ය විනිපාතන කුලදූෂනයන්ට නොපමුණුවා තමා ලද ප්‍රත්‍යය සාරාණීය ධර්මයෙහි සිට දන් දුන් දායකයා දෙවලොව උපන්කල දිව්‍යවූ ආයුෂයෙන් දිව්‍යවූ වර්ණයෙන් දිව්‍යවූ සැපයෙන් දිව්‍යවූ යසසින් දිව්‍යවූ ආධිපත්‍යයෙන් සෙසු දෙවියන් අභිභවන ශක්‍රදෙවෙන්ද්‍රයා සෙයින් දන් නුදුන්නහු අභිභවනය කොට දිලියෙන පරිදි ප්‍රකාශ කොට වදාළහ.

"යො සො සුමනෙ දායකො සෙ අමුං අදායකං දෙවහුතෙ සමානෙ පවණ්ණානෙහි අධිගණ්හාති, දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන" යි.

ඒ දෙදෙනා මිනිස්ලොව උපන්කල මානුෂක ආයුෂයෙන් මානුෂකවර්ණයෙන් මානුෂකසැපයෙන් මානුෂකයසයින් මානුෂක ආධිපත්‍යයෙන් සෙසුමිනිසුන් අභිභවන චක්‍රවර්ති රජ්ජුරුවන් සෙයින් දන් හුදුන් පුද්ගලයා අභිභවා දිලියෙන පරිදි වදුරා ඒ දෙදෙනා පැවිදිවූ කලද දන් හුදුන් පුද්ගලයාට වඩා අග්‍රප්‍රත්‍ය ලාභීව අනුන්ගේ ආරාධනාවෙන් බොහෝවූ 'චීවරපිණ්ඩපාතසෙනාසන ගිලාන ප්‍රත්‍යය යන සිවුපසඳනයන් පරිභෝගකරණපරිදි වදුරා එම දෙදෙනා රහත්වූ කල ලොකොත්තර සම්පත්තියෙහි විශෂයක් නැති පරිදි ප්‍රකාශ කොට වදළසේක.

මෙසේ දානය නිර්මාණප්‍රාප්ත වන තැන් දක්වා අති විපුල විශිෂටඵලදායක වන්නේයි, 'බුදුහු මහණෙනි ඉදින් සත්‍යයෝ මා සේ ම දානයෙහි ඵල දනිත් නම් දන් නොදී නොලවලදනි, මිසුරුමල බවුන් ඇවිලගෙණ සිටිනේ නොවේ"යි එක ආලොපයකුදු ලද හොත් බෙදාදී වලඳනි ඉදින් ගන්නා කෙණෙක් ඇත්මැ"යි වදළෝ මනාපදානයන් දුන්නේ මනාපස්ථාන ලැබෙයි, අග්‍රදානයන් දුන්නේ අග්‍රවූ ස්ථාන ලැබෙයි, වරදානයන් දුන්නේ දුන්නේ වරපද ප්‍රාප්ත වෙයි, භාණ්ඩයන් බෙදන තැනදී උතුම් භාණ්ඩයන් ලැබෙයි, ශ්‍රෙෂ්ඨදානයන් දුන්නේ ශ්‍රෙෂ්ඨ පදප්‍රාප්ත වෙයි, හේ උපන් උපන් තන්හි දිගිවූ ආයුෂ හා මහත් යසස් ඇතිවෙයි, වදළේමැනෝ ඵලදෙවපුත්‍රහට:—

මනාපදානි ලභතෙ මනාපං අග්ගසාදානා ලභතෙ පුනග්ගං,
වරස්ස දානා වරලාභි හොති සෙට්ඨං දදෙ සෙට්ඨ මුපෙති ඨානං.

යො අග්ගදානි වරදානි සෙට්ඨදානි ච යො නරෝ,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජති—යි.

තවද මේ ආමිසදානය මහා සංඝික දානය පුද්ගලික දානයයි කියා දෙවැදෑරුම් වන්නේය, එසේවූ භේදකාර දානයන් අතුරෙන් සංඝික දානය සත්වැදෑරුම් වේ, කෙසේද? යත්: —

බුදුන් ජීවමාන කාලයෙහි එක් පාර්ශ්වයෙක්හි භික්ෂු සංඝයා වහන්සේද එක් පාර්ශ්වයෙක්හි භික්ෂුණී සංඝයා වහන්සේද මැද ලොවුතුරා බුදුන්ද වඩා හිඳුවා චීවර පිණ්ඩපාතයෙන් දෙන්නාවූ දානය පළමුවෙනි සංඝික දානය නම් වන්නේය. මේ දානට සමවූ විපාක ඇති අනික් ප්‍රත්‍යදානයක් නම් නැත්තේය.

බුදුන් පිරිනිවන් පෑ කල්හි භික්ෂු භික්ෂුණී සඞ්ඝයා වහන්සේ වඩා හිඳුවා ඊමැද ආසනයක ධාතු පිහිටුවා කළ ප්‍රතිමාවක් වඩා පිළිමය ඉදිරියෙහි පාත්‍රාවලල්ලක පාත්‍රයක් තබා දක්ෂිණොදකාදි සියල්ල ම පළමුවෙන් ප්‍රතිමාවට පවත්වා ඊට ඉක්බිති එහතෝ සංඝයාට දෙන දානය දෙවෙනි සංඝිකදානය නම් වේ.

එසේ ම භික්ෂු සඞ්ඝයා පමණක් වඩා හිඳුවා මෙද ධාතුපිළිමයක් වඩා දෙන්නාවූ දානය තුන්වෙනි සංඝිකදානය නම් වෙයි. එසේ ම භික්ෂුණී සඞ්ඝයා වඩා හිඳුවා ධාතුපිළිමයක් වඩා දෙන්නාවූ දානය සතරවෙනි සංඝිකදානය නම් වෙයි. "මෙතෙක් භික්ෂූන් වහන්සේ ද මෙතෙක් භික්ෂුණීන් වහන්සේ ද සඟින් දෙව යි ඉල්වාගෙණ දෙන දානය පස්වෙනි සංඝිකදානය නම් වෙයි. උපසම්පදා සතර නමකින් අඩු නො ව සඞ්ඝයා වසන විහාරයට ගොස් "මම සංඝික දානයක් දෙන්නෙමි, මට සඞ්ඝයා දුන මැනවැ" යි යටත්පිරිසෙයින් එක නමක් වත් ඉල්වාගෙණ දෙන්නාවූ දානය සවෙනි සංඝික දානය නම් වෙයි. එසේ ම භික්ෂුණීසඞ්ඝයා වහන්සේගෙන් එක නමක් ඉල්වාගෙණ දෙන දානය සත්වෙනි සංඝිකදානය නම් වේ.

මේසේ සංඝික දානය සත්වැදෑරුම් වේ. මේ සියලු ම සංඝික දානයෙහි විපාක පොළොව පස් මෙන් අප්‍රමෙය්‍ය වන්නේය. ඒ බුදුන් පිදූ දෙය කුමක් කටයුතුදැ? යි යතහොත්- බුදුන්ට වත් පිළි වෙත් කොට පිළිදහන යම් මහණෙක් ඇත්නම් ඔහට දියයුතුය, නොහොත් වලඳන්ට උන් මහසඞ්ඝයාට හෝ බෙදා දියයුතු වන්නේය. ගිතෙල් තෙල් ආදිය ගෙණ බුදුන්ට පහන් පිදිය යුත්තේය. පිදූ පිළි ගෙණ බුදුන්ට ධජයක් කොට බැන්ද යුත්තේය.

මේ ශාසනය නැසී ගොස් එන දවස කසාකඩක් අතෙහි හෝ බෙල්ලෙහි හෝ බැඳ අඹුදරුවන් ගෙණ කෘෂිවණික් කම්නන කොට "අපි මහණුම්හ" යි කියා ඇවිදින්නා අයකුත් ඇත. එවැනි දුස්සිලයන්ටත් "සංඝික ව දෙම්හ" යි අශෝයපුද්ගල සඞ්ඝයා සිනින් වෙත් නො කොට යම් කෙනෙක් සංඝික කොට දානයක් දුන්නාහු විනම් ඒ සංඝිකදානයෙහි විපාකත් බුදුහු අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය වෙති යි වදළසේක.

සාංඝිකදානය සංඝයාට ආදර කොට දීම පුළුවන් අයට ම සිඹ වෙයි වදුළ හෙයින් "සඞ්ඝයාට දන් දෙමිය" යි දානවස්තු සපයා වෙහෙරට සඞ්ඝයාට පැහැ පිඟුවා වැඳ තමාගේ දානවස්තු පමණට මහත්ය, "මේ සඟින් නමක් හෝ දෙනමක් හෝ දුන මැනවැ" යි යාචඤ්ඤා කළ කල්හි සඞ්ඝයා විසින් සාමණේරයෙකු දුනත් තමා දන්නා දුස්සීල නමක් දුනත් "මම දුස්සීල නමක් ලදිමි" යි "මම සාමණේර නමක් ලදිමි" යි දෙමිනස් නො කව යුත්තේය, ඛුතාඞ්ගධර කෙණෙකුන් මහතෙර කෙණෙකුන් ලදත් "මම ඛුතාඞ්ගධර කෙණෙකුන් ලදිමි" යි "මහතෙර කෙණෙකුන් ලදිමි" යි සොම්නස් නො කටයුත්තේය. ඉදින් තමා සඟින් ලත් මහණුන් "අඩු තරම වැඩි තරමැ" යි සිතුවහොත් සාංඝිකදානය සිඹ නො වන්නේය. එබැවින් ලත් යම් කෙණෙකුන් වහන්සේට සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට මෙන් පුෂ්ප සුගන්ධාදියෙන් තමා ශක්ති පමණින් පූජා කොට ආදරයෙන් දන් දියයුත්තේය. ඉදින් එසේ සිතාගෙණ දන් දෙන්ට පුළුවන් විනම් එක් රහත් කෙණෙකුන් වහන්සේට දුන් දානයටත් වඩා සඟින් ලත් දුස්සීල කෙනෙකුන්ට දුන් දානය ම වැඩිතරම් වන්නේය.

පුද්ගලික දානය ද තුදුස් වැදෑරුම් වේ. ඒ කෙසේ ද? යත්— සම්‍යක් සම්බුදු කෙනෙකුන් වහන්සේට දන් දීමය, පසේබුදු කෙනෙකුන් වහන්සේට දන් දීමය, රහතුන් වහන්සේ කෙනෙකුන්ට දන් දීමය, රහත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන් කෙනෙකුන්ට දන් දීමය, අනාගාමි කෙනෙකුන්ට දන් දීමය, අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන් කෙනෙකුන්ට දන් දීමය, සකෘදාගාමි කෙනෙකුන්ට දන් දීමය, සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්ෂ කිරීමට පිළිපන් කෙනෙකුන්ට දන් දීමය, සෝවාන් කෙනෙකුන්ට දන් දීමය, සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන් කෙනෙකුන්ට දන් දීමය. සත්තෙන් පිටත් ඛාහනයෙන් රාගාදි අකුසල් සංසිඳුවා වසන කෙනෙකුන්ට දන් දීමය, පඤ්ච ශිල අෂ්ටාඞ්ගශිලාදියෙන් සිල්වත්වූ පෘථග්ජන කෙනෙකුන්ට දන් දීමය, වැද්දන් කොවුලන් ආදිවූ දුස්සීල මනුෂ්‍යයෙකුට දන් දීමය, ඔලු කුකුළු ආදිවූ තිරශ්චීනයෙකුට දන් දීමය යි කියා තුදුස් වැදෑරුම් වන්නේය.

මෙයින් තිරශ්චීනයා රූපාදි විශිෂ්ට ගුණ ඇතැ යි සිතා ඔහුගේ බඩ පුරා ආහාරයක් දුනහොත් ඒ දානයත් "මෙහු පොෂ්‍යය කොට වඩමි" යන සිතින් දෙන්නාවූ දානයත් සැර පිඬක්

දෙපිඹක් දීමය යි කියනලද අසම්පූර්ණ දානයත් හැර කුක්කුර කුක්කුටාදීන් අතුරෙන් යමක්හට මේ දානයෙන් මට පින් ඇතැ යි සිතා ඔවුන්ගේ බඹපුරා ආහාරයක් දුනහොත් ඒ දානය දන් දුන්නාහට සියක් ජාතියෙහි ආයු ඇති කරන්නේ වෙයි, සැප විඳුවන්නේ වෙයි, මෙසේ සියක් ජාතියෙහි වර්ණ ඇතිකරන්නේ වෙයි, බල ඇතිකරන්නේ වෙයි, ප්‍රඥාව ඇතිකරන්නේ වෙයි, මෙවැනි අනුසස් පසක් දෙන්නේ වෙයි, මෙසේ ම දුස්සීල මනුෂ්‍ය යෙකුට දන් දුන්නේ ඒ දානය දහසක් ජාතියෙහි ආයුශය ද වර්ණය ද සැප ද බල ද ප්‍රඥ ද සිඹකරන්නේ වෙයි මෙසේ ම ශාසන යෙන් පිටත් සිල්වත් මනුෂ්‍යයක්හට දනක් දුනහොත් ඒ දානය ලක්ෂයක් ජාතියෙහි ආයුශය වර්ණය සුඛය බලය ප්‍රතිභානය යන පස සිඹකරන්නේ වෙයි, මෙසේ ශාසනයෙන් පිටත් විතරෑයි කෙනෙකුන්ට දුනහොත් කෙළලක්ෂයක් ජාතියෙහි ආයුෂාදිවූ අනුසස් පස සිඹ කරන්නේ වෙයි. මෙසේ ම සරණගිලයෙහි පිහිටා සිටි උපාසකයෙකුට දන් දුනහොත් ඒ දානය අසංඛ්‍යය අප්‍රමේය්‍ය ජාතියෙහි මෙකී විපාක දෙන්නේය, සරණගත ව පන්සිල් රක්නා එකෙකුට දුන් දානය ඊට වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය, උපසම්පදා කෙනෙකුට දුන් දානය ඊට වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය, එයිනුත් වත්පිළිවෙත්හි මනාව පිහිටිහට දුන්නාවූ දානය ඊටත් වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය.

මෙසේ විදර්ශික ආරබ්ධ විදර්ශික ශ්‍රොතාපන්න සකෘදාගාමී ඵලයට පිළිවෙත් පුරන්නේය, සකෘදාගාමී අනාගාමිඵලයට පිළිවෙත් පුරන්නේය, අනාගාමී අර්හත්ඵලයට පිළිවෙත් පුරන්නේය, රහත් කෙනෙකුන් වහන්සේය, පසේබුදුන් වහන්සේය, ලොවුතුරා බුදුහුය යන මෙතෙක්දෙනා වහන්සේට දුන් දානය එක් කෙනෙකුන් වඩා වඩා අප්‍රමේය්‍ය විපාක වන්නේය.

යම් සේ දෙලක්ෂ සතළිස්දහසක් යොදුන් ඝන ඇති පොළොව කල්වීවක් පමණ තැන පසුත් අප්‍රමේය්‍ය වේ ද? ගව්වක් ගව්වක් පමණ තැන පසුත් අප්‍රමේය්‍ය වේ ද? ඊටත් වඩා යොත්තක් පමණ තැන පසුත් අප්‍රමේය්‍ය වේ ද? චක්‍රවාට පර්වතය අවසන් කොට ඇති මහපොළොවේ පස් ඉතා ම අප්‍රමේය්‍ය වේ ද? එමෙන් සරණගතයා පටන් ලොතුරා බුදුන් දක්වා දුන් දානය ක්‍රම ක්‍රම යෙන් ඊට ඊට වඩා අප්‍රමේය්‍ය විපාක ඇති බව දත යුත්තේය.

මේ දානය තෙම ප්‍රතිග්‍රාහකයන් නිසාම මහත්ඵල වීමක් නැතිවම දායකයා නිසාත් මහත්ඵල වන්නාවූ එක් දානයක, දායකයාගෙන්ම මහත් ඵලවීමක් නැතිව ප්‍රතිග්‍රාහයන් නිසා මහත්ඵල වන්නාවූ එක් දානයක, ප්‍රතිග්‍රාහයන් නිසාත් දායකයන් නිසාත් මහත්ඵල නැත්තාවූ එක් දානයක, දායකයන් නිසාත් ප්‍රතිග්‍රාහයන් නිසාත් මහත්ඵල වන්නාවූ එක් දානයකැයි සතර වැදෑරුම් වේ.

එහි යම් දනෙක දායකයෝ සිල්වත් වෙද්ද සුවිවූ චිත්ත සන්තාන ඇත්තෝද ප්‍රතිග්‍රාහකයෝ දුස්සීලයෝද පව් කරණ අයෙක්ද දානඵලවත් දැහැමෙන් සෙමෙන් ලත් වසතුව වේද දායකයාගේ සිතත් ඉතා ප්‍රසන්නද මින් පිරිසිදු ඇතැයි දානඵලත් අදහා සිටියේද ඒ දායකයා නිසා මහත්ඵල වන්නාවූ දානය නම් වන්නේය. ඒ ශ්‍රේෂ්ඨ බ්‍රාහ්මණයා දුස්සීලව ලාමකව සිටියදී ඔහට වෙස්සන්තර රජ්ජුරුවන් දන් දුන් තැන පොළොව කම්පා විය. එසේ පොළොව කම්පාවන්ට කාරණා වූයේ ශ්‍රේෂ්ඨ බ්‍රාහ්මණයාගේ ශක්තියෙන් නො වෙයි. වෙස්සන්තර රජ්ජුරුවන් වහන්සේගේ සිල්වත්කම නිසාමය.

යම් දනෙක දායකයෝ දුස්සීලද පවිත්‍රවූ චිත්තසන්තාන ඇත්තේ ද ප්‍රතිග්‍රාහකයෝ සිල්වත්වෙද්ද අලාමකයෝද දානවස්තුවත් අධර්මයෙන් ලබනලද වස්තුවෙක්ද දායකයාගේ චිත්තයත් අප්‍රසන්නද දානඵලත් අදහා නො දෙද්ද ඒ දානය ප්‍රතිග්‍රාහකයා නිසා මහත්ඵල වන්නාවූ දානයඛ. කාලණිගංමෝදර වසන්නාවූ එක් කොවුලෙක් දීඝසුමන නම් මහතෙරුන් වහන්සේට දුන් පිණ්ඩපාත දානය මා සතර අපායෙන් ගොඩනගන්නේය යි කිය.

යම් දානයඛ ප්‍රතිග්‍රාහකයෝ දුස්සීලයෝද දානවස්තුවත් අධර්මයෙන් ලබන වස්තුවෙක් වේද චිත්තයත් අප්‍රසන්න ද දානඵලයත් අදහාගෙණ නො දෙද්ද ඒ දායක ප්‍රතිග්‍රාහඛ දෙදෙනා නිසා මහත්ඵල නො වන්නාවූ දානයෙක් නම් නො වන්නේය. වඩුන්නාවේ වසන වැද්දෙක් මළ නෑ කෙණෙකුන් නිසා පින් පෙත් කොට දුන්නේය. එක් දුස්සීල මහණෙක්හට තුන්වරෙඛ දන් දුන්නේය. ඒ තුන්වරෙහිම ප්‍රේතයාට පින් නො පැමිණියේය. තුන්වෑරෙම ප්‍රේතතෙම "දුස්සීලයෙක් මාගේ දන්

වොලෝ ගන්නේය" මොරගැයූ. ඒ අසා වැදිතෙම සිල්වත් කෙනෙකුන් වහන්සේව දන් දී පින්පෙත් දින. එකෙණෙහිම ප්‍රෙතයොනියෙන් මිදී දිවසිරි ලද්දේය.

යම් දානයක දායකයෝත් සිල්වත් වෙද්ද ප්‍රතිග්‍රාහයෝත් සිල්වත් වෙද්ද දානවස්තුවත් දැහැමෙන් ලබනලද්දේ වේද චිත්තයත් ප්‍රසන්නද කම්ඵලත් අදහා ගෙණ දේද් ඒ දානය දායකයන් නිසාත් ප්‍රතිග්‍රාහකයන් නිසාත් මහත්ඵල වන්නේය. බුදුන්ට අසදෘශ මහදන් දෙන කල්හි උපායකෞශල්‍ය නිසා දානය මහත් ඵලවිය.

එම්බා සත්පුරුෂයෙනි මෙසේ අසංඛ්‍ය ගණන් ජාතියෙහි විපාකදීමට සමර්ථවූ මෙබඳු දානයෙක් බුබගුහ්‍යවූ අසංඛ්‍ය ගණන් කල්පයන් අතුරේ යම් කිසි තැනෙකවත් බුද්ධශාසනයෙන් පිටත් අන්තැනෙකවත් මේ මගුල් සක්වළන් පිටත් අන්සක්වළකවත් බුදුන්ගේ බණ නැසූ අන් සත්වයක්හටවත් සිද්ධවන්නේ නොවෙයි. එබැවින් ඉදිරි සසර බොහෝ කලක් දිව්‍ය මනුෂ්‍ය ලෝක දෙක්හි සැප විඳුවන්නාවූ උත්කෘෂ්ට දානඵල තොප විසින් නිරන්තරයෙන් උත්සාහ කටයුතු වන්නේය. එබැවින් නුවණැති සත්පුරුෂයන් විසින් අක්ඛන්තිකාවූ ද අවිඤ්ඤණක සවිඤ්ඤණක සියලු වස්තූන්ගේ සාරභූයක් නැති බවද මෙය මාගේය යි කියා ගත හැකි දෙයක් ලොව නැති බවද දානමය කුශලයාගේ මහානිසංස බවද නුවණැසින් බලා මනා කොට සිත තබා ගෙණ එක්වන් බණ ඇසීමෙන් දානලක්ෂණයන් දැන ඇදින තම තමාගේ ශක්ති වූ පරිද්දෙන් අප්‍රමාදව දන් දෙන දාන වස්තුවෙහි පැවති ලොභයද දුරු කොට දන් ලබන ප්‍රතිග්‍රාහක තැන් හොරෙහිදු ආදර ගෞරව බහුමාන උපදවා විපුලතර වූ කම්ඵල විශේෂද සිහි කිරීමෙන් දානවස්තු පරිත්‍යාග කොට සියලු ලෞකික ලොකොත්තර සම්පත් සාදා ගැන්මෙහි උත්සාහ කළ මැනවි. දානානිසංසවණ්ණනාවයි.

මෙසේ සංක්ෂෙපයෙන් දානානිසංස දක්වා තදනන්තරව සීලානිසංස කථාවෝද දක්වනු ලැබෙත්. එහි සීලවිභාගානිසංස යට දක්වූ හෙයින් මෙහි ආනිසංස මාත්‍රයක් දක්වනු ලැබේ. ඒ කෙසේ ද? යත්:

සීලං සුඛානං පරමං නිදානං,
සීලෙන සීලෝ නිදිවං පයාති,
සීලං හි සංසාරමුපාගතස්ස,
තානව ලෙනව පරායනව.

අවස්සයෝ සීලසමෝ ජනානං
කුතෝ පනඤ්ඤෝ ඉධවා පරත්ථ,
සීලං ගුණානං පරමා පතිට්ඨා
යථා ධරා ථාවරජඞ්ගමානං.

ඝනාදි දූක්වූ හෙයින් සීලඝනෙම සියලුම උතුම් සැපඝට කාරණ ය, සිල් ඇති තැනැත්තේ සීලඝ කරණකොට ගෙණ දෙවිලොව වසන්නේය. සීලඝ වනාහි සංසාරගත සත්ත්වඝට රක්ෂාස්ථානද වෙයි. නිලීනස්ථානද වෙයි. පිහිට නමුදු වෙයි. සියලු සත්ත්වඝන්ට මෙලෝ පරලෝ දෙක්හි සීලඝ සම වූ අනික් අවශ්‍ය ඝෙක් පිහිටෙක් ඇත්තේ නොවෙයි. මේ මහා පොළොව ලොව ඇති සියලු ථාවරජඞ්ගම වස්තූන්ට ආධාර වේද, එසේම සීලඝ සියලුම ගුණඝන්ට උතුම් පිහිටෙකැයි දැන අප්‍රමාදව ඇම්දෙනා විසින් ඝට කියනලද ක්‍රමඝෙන්ම සිල් විභාගනිසංස දැන ඇඳින සිලපූරණඝෙහි උත්සාහ කළ මැනවි.

දුනෙ සිලෙ වයෙ වුත්තා ආනිසංසා අසෙසකා,
තෙ මන්දභාවනායාපි සංසිජ්ඣන්ති අසංසයං.
භාවනාබලඝොගෙන බුඞ්භාවොපි සාධියෙ,
තදඤ්ඤදා කා හි සමපත්ති භාවනාඝ අසාධියා.

ඝනාදි වශඝෙන් ප්‍රකාශවූ හෙයින් දුන්ඝෙහිද සිලඝෙහිද යම් යම් ආනිසංසඝෙක් ප්‍රභාශවී ද ඒ සියලුම ආනිසංසඝෝ නිසැකින්ම අසුරුසණක් පමණකල් වී නමුත් භාවිතා කළ මදවූ භාවනාමය කුශලඝෙන් සමෘඞ්ධන්නාහුය. එපමණක් මතු නොවෙයි. භාවනා බලඝෙන්ම ලොවුතුරා බුදුබව පවා සිඞ්ධන කල ඒසින් අන්‍යවූ කාවර නම් සමපත්තිඝක් භාවනා බලඝෙන් සිඞ්ධ නොවන්නිද? සියලුම ලෞකික ලොකොත්තර සම්පත් සිඞ්ධ වන්නේමය.

තවද යටකී ක්‍රමඝෙන්ම දුනවස්තු සෝඝා සපඝා ගැන්මෙහි පවන් දන්දීම දක්වාත් දුන් දුනඝ මරණාසන්නඝ දක්වාත් තැවත තැවත ක්ෂයව්‍යය වශඝෙන් හෝ සිහි කිරීමෙන් සොම්නස් වශඝෙන් හෝ පවත්නාවූ සියලු පූර්ව්‍යපර චෙතනාවන් පවා මේ භාවනාමය කුශලඝෙහිම ඇතුළත්වූ කල තුන් සිත පිරිසිදු කරණ සෙසු සිලාදී කවර නම් කුශලඝෙක් එහි එක් නොවේද, ඒ සියළු කුශලඝෝම එක්වන්නාහු මැයි "භාවෙනි කුසලධමේම ආසෙවනි

එඩිසති එතායාති භාවනා" යනු හෙයින් යොගාවචර සත්තෙම මේ භාවනා කිරීමෙන් යියලු කුශලධම්යන් භාවිතා කෙරේනුයි සෙවනය කෙරේනුයි වඩානුයි භාවනා නම් වී. තවද,

විඤ්ඤුපකප්පිලෙසානං යා චින්තා පටිපක්ඛිතා,
තස්සා යා භාවනා සා හි භාවනාති පකිත්තිතා හි.

එබැවින් සත්තයාගේ සිත කෙලෙසෙන ලොභාදි යියලු කෙලෙසුන්ට ප්‍රතිපක්ෂවූ යම් චින්තාවෙක් ඇද්ද කුශලපක්ෂගත ඒ චිත්තාවගේ යම් භාවිතා කිරීමෙක් කෙලෙසුන් දුරු කිරීමෙක් ඇද්ද ඕතොමෝ භාවනා නමැයි කියනලදු. ඒ කෙලෙසුන්ගේ දුරුකිරීමත් තදඔග විස්කම්භනසමුච්ඡේද ප්‍රහාණ වශයෙන් තුන් වැදෑරුම් වේ. එයින් ඒ පාප කෙලශයන්ගේ දුරුවීමට නියි සිල සමාදානාදි ඒ ඒ අඩගයෙන් දුරුකිරීම තදඔග නම්. භාවනාවෙන් සිත එකඟ කොට දුරුකිරීම විස්කම්භන නම්. ආයෑමාගියෙන් කෙලෙසුන් මුල්සිඳ නසා දුරුකිරීම සමුච්ඡේදප්‍රහාණ නම්. මෙසේ වූ තදඔගාදියෙන් කාමච්ඡන්දදීනිවරණ කෙලශයන්ගෙන් දුරුව සිත එකඟවීම සමථ නම් වෙයි. විතක්කිවිචාරප්‍රීතිසුඛාදිවූ ඒ ඒ ධ්‍යානාඩගයන්ගේ එක්වීම් වශයෙන් ඒ සමථ ප්‍රථමධ්‍යානාදීහු නම් වෙත්. ඒ සමථ සමාපත්ති නම් වෙති. රූපස්කන්ධාදීන්ගේ අනිත්‍ය වශයෙන් සභාවදර්ශනය විදර්ශනා නම් වේ. මේ සමථ විදර්ශනාය යන මොහු දෙදෙනා රථධුරයෙහි යෙදූ අශ්වයුගලයක් සෙයින් යොගාවචර සත්තයාගේ සිත් නැමැති රථය නිවන්පුරයට ගෙණ යෙත්මැයි. එසේවූ සමථ විදර්ශනා දෙදෙනා අවිනාභාවීයි. අසදෘශමැයි, ඒ සමාධි භාවනාවෙහි වසන තැනැත්තාගේ කෙලෙසුන් විසින් සිත ඇල්ලීමක් නැති හෙයින් මේ ජානියෙහි සිත විවේකව උතුම් සැප ඇති වේ.

යමෙක් සමථ විදර්ශනා වශයෙන් භාවිතා කරණ ලද භාවනා ඇත්තේ ද හෙතෙම මහසුප් මහතෙරුන් වහන්සේ ද සැරියුත් මහතෙරුන් වහන්සේ ද මුගලන් මහතෙරුන් වහන්සේ ද දර්ශනීය වේ. කුලෙහි ගෙණෙහි ඇළුම් නැති රට්ඨපාල මහා තෙරුන් ඉන්ද්‍රියසංවරය ඇති නන්ද මහතෙරුන් වහන්සේ ද ක්ෂමායෙන් ප්‍රසිඩ පුණ්ණ මහතෙරුන් වහන්සේ ද දුටු දුටුවන්ට ප්‍රසාදනාය වෙත්.

තවද භාවනා පුරුදුකළ තැනැත්තා නොකටයුත්තෙහි උපදනා ආලය දුරුකිරීමද නිසි කටයුත්තෙහි මැලි බව හැර ඇලය වැඩිමට සමර්ථවෙයි සිත උපන්කෙලෙසුන්ට වසඟනොව ඔවුන් දුරුකිරීමෙහිද සමර්ථ වේ, ලාභාදියෙහිදු සිත රක්නට හැකි වේ, කාඨචිත්තාවිවෙකයෙන් උපන් ප්‍රීති තොමෝ සිත පැතිර බුදු පසේබුදු ආදි මහරහතුන් විසින් සෙවුකා ලද උතුම්වූ පමණ නැති නිරාමිස සැපය විඳිනේය, එසේවූ සැපයෙක් දෙදෙවිලොවට අධිපති ශක්‍රදෙවෙන්ද්‍රයාටත් නැත්තේසි, මෙසේ දණ්ඩමී සැප විහරණ ඇති භාවනානුයොගයෙන් සිත ඇල්ලීමක් නොව අපිණා සමාධිසංඛ්‍යාත දැනයෙන් සන්සුන් සිතින් පඤ්චස්කන්ධාදීන් සවභාව වශයෙන් දක්නට ඵාසුවේ. එකෙසේදයි කිව්? හොත් නොකැලඹුනු දියෙහි මුහුණ බැලීම මෙනි, නොපිරිහුනුඛ්‍යාන ඇති තැනැත්තාගේ මරණින් මත්තෙහි ධ්‍යානයාගේ බලවශයෙන් රූපාරූපභවයෙහිම උපදනේය, ලොකයෙහි යහපත්ව සිඹකළ මන්ත්‍රවිද්‍යානුභාවයෙන් ඕහට වන ලාභ සමෘඛිය මෙන් සමාධි භාවනා බලයෙන් යුක්තයා හට පවාහිඥවෝද පහළ වෙත්.

පවාහිඥවෝ නම් නොයෙක් සෘඛි ඇතිවීමය, පරසිත් දැන්මය, පූර්ජාති දැක්මය, දිවැස් දිවකන් ලැබීමය යන මොහුයි, මෙසේ භාවිතභාවනා ඇති තැනැත්තේ ලෞකලෞකික පාරලෞකිකවූ සව්‍යාපත්තිසංසිඛියට පැමිණේ, ඒ භාවනා තොමෝ දශඅනුස්සතියයි කියාද දස අසුභයයි කියාද දසකසිණයයි කියාද සතර බ්‍රහ්ම විහරණයයි කියාද සතරධ්‍යානයයි කියාද ආහාර ප්‍රතික්කූල සංඥව යයි කියාද ධාතුව්‍යවස්ථානයයි කියාද සම සතළිස් ප්‍රභෙදයක්ව සිටි කම්ඨානයන් අතුරෙන් බුබානුස්මෘති ආදි යම්කිසි අනුස්මෘතියක හෝ උඹුමාතකාදි යම්කිසි අසුභයෙක හෝ පඨවි කසිණාදි යම්කිසි කසිණයක හෝ මෛත්‍රිය ආදි යම්කිසි බ්‍රහ්ම විහරණයක හෝ ප්‍රථමධ්‍යානාදි යම්කිසි ධ්‍යානයක හෝ පිළිකූල් සංඥයෙහි හෝ ධාතුව්‍යවස්ථානයෙහි හෝ යෙදී වසනු කැමති යොගාවචරයාගේ සිත පිහිටුවා ගතහැකි යම්කිසි අරමුණෙක විසුඩි මාගීයෙහි භාවනානුයොග ප්‍රකාශ ක්‍රමයෙන් ගුරුඋපදෙශ ලද ක්‍රම යෙන් විතර්කවිඝ්‍යාන ආදිකිරීම් වශයෙන් විතතය සොයාගෙණ එම භාවනාරම්මණයම විවාර සංඛ්‍යාත සිතින් පිරිමැදීමෙන් ඔබ නොබ යානොදී සිත පිහිටුවා වැඩීමෙන් යම් කම්ඨාන භාවනා ඛමානුභාවයකින් චෙතසිකයන් කෙරෙන් සිත තොර කොට

චෛතසිකයන්ගේ එක අරමුණෙකම පිහිටුවා කරණ පරිකර්ම භාවනානන්තරව උපදනා අප්පණාසමාධි තොමෝ භාවනා නම් ලදු.

අවික්ඛේපලක්ඛණවූ වික්ඛේප දුරුවීමම රසවූ, කම්පාවක් නැති බව වැටහීම් කොට ඇති, ඒ සමාධිය සමථයයි කියනු ලැබේ. ඒ සමාධිසංඛ්‍යාත සමථයෙහි සිත පිහිටුවා සිව රූපස්කන්ධාදීන්ගේ තත්ස්වභාව හා දර්ශනය හෙවත් රූපාදිය අතුහ අසාරවසින් දැක්ම විදර්ශනා නම්, ඒ සමථ විදර්ශනා දෙදෙනාගේ බල යෙන්ම අනිත්‍යාදි කාලත්‍රයෙහිවූ බුබ්බාදි සියල්ලන් විසින් නිවන් සැදීම නියත ධර්මතාවක් හෙයින් නිවන්පුර වැද ඇතෙනු කැමති අප හැමදෙනා විසිනුදු මේ භාවනා මාර්ගය පිළිපැදීමෙහි ආදර ගෞරව බහුමාන උපදවා කියනලද ක්‍රමයෙන් නොයෙක් කර්මස්ථානයන් අතුරන් තමතමාට වැටහෙන කර්මස්ථානයක අප්‍රමාදව ඒකාන්ත වැඩීමෙන් යෙදී භාවනා වඩා නිවන් දක්මෙහි උත්සාහ කළ මැනවි, තවද මෙසේ වඩනලද භාවනාවෙහි අනුසස් නම්:—

සුඛෙත්තා සත්ත වස්සානි භාවෙත්වා මෙත්තමුත්තමං,
සත්ත සංවට්ටකප්පෙසු නාභිමං ලෝකං පුනාගමි.

සංවට්ටෙ ව විවට්ටෙ ච බ්‍රහ්මලෝකෙව සංසරි,
ඡත්තිංසකඛත්තුං දෙවින්දෙ ආසි තෙනෙව කම්මුනා.

අනෙකසතකඛත්තුං සො චක්කවත්ති මහායසෝ,
ආසීති සුත්වා කිමඤ්ඤං භාවනාවණ්ණනා වදෙ.

යනු හෙයින් සුඛෙත්‍ර නම් ශාසනාතෙම ගත්අවුරුද්දක් මෛත්‍රී භාවනා කොට සත්සංවර්ත කල්පයක් මුළුල්ලෙහි මෙලොවට නොඇවිත් බඹසිරිම වින්දේය. මෙසේ සංවර්තයයි නම් ලද මහා කල්පය තැසී සිටීමෙහිද විවර්තයයි නම් ලද කල්පය හට ගැණී සිටීමෙහිද මහාකල්ප නම් ලද සතර අසංඛ්‍ය කල්ප ගණනයෙන් විසිඅට අසංඛ්‍ය කල්පයක් මුළුල්ලෙහිම බඹලොවම සැරිසරා ඇවිද අපමණවූ බ්‍රහ්මසම්පත් අනුභව කොට නැවත එම භාවනා කුශලානුභාවයෙන් සතිස්වරෙක ශක්‍රදෙවෙන්ද්‍ර විය, නොයෙක් සියගණන් වාරයෙහි මහායස පිරිවර ඇති චක්‍රවර්තිරජවීයයි අසාද එයින් අන්‍යවූ කවර නම් භාවනානිසංසවර්ණනාවක් කියමිද?— තවද:—

අනිච්චානත්තසඤ්ඤාසු චෙතනාතො ඨපේලා
තාසංඵලමහන්තං කො පදෙසඤ්ඤූ පවණ්ණයෙ.

යකාදි කිහෙයින් සුතෙත්‍රා ශාස්තෘන් වහන්සේ මෛත්‍රී භාව නාව වඩා එම කුශලයෙන් විශිෂ්ට අසංඛ්‍ය කල්පයක විදි බඹ සුවද දෙව්ලෝ මිනිස්ලෝ හැම රජ සුවද විඳිමෙහි පැවතිනාක් සියළු ලොභාදි සියලුම භවතණ්හාව ඉතා මද කලක් භාවිතා කළ අනිත්‍යාදි තිලකුණු භාවනා බලයෙන් අතුරුදන්ව නැතිවන හෙයින් ඒ මෛත්‍රීභාවනාවම වඩා අනිත්‍යාදි තිලකුණු භාවනාවෝම මහත් ඵල ඇත්තාහුය, ඔවුන්ගේ ඵල මහත් බව ප්‍රදෙශික ඤාණයෙහි සිටී කවරෙක් වර්ණනා කෙරේද?-

තවද තමා ආශ්‍රය කළතාක් දෙය දවාම නැතිකරණ ඉතා මදවූද ඝනිසෙයින්ම තිලකුණු භාවනාවෝ භාවිතා කළාහුගේ සිත්හි පැවති භවත්‍රයගතවූ නොයෙක් දහස් ගණන් කප මුළුල් ලෙහි විඳුයුතු ත්‍රිභූමලෝක සැප ආදි සියල්ලෙහි පැවති තණ්හාව නැතිකොට දවමින් උපදනාහුයි.

එහි භවත්‍රයගත සියලු සඞ්ඛාර ධර්මයෝම ඇතිව නැති වන හෙයින් අනිත්‍යයහ, උත්පත්ති විනාශ දෙකින් පෙළෙන බැවින් දුකඛයහ, මමය මාගේයයි ගතහැකි කිසියම් එකද වස්තුවෙක් නැති බැවින් අනාත්මයහයි සිත්හි උපදනා භාවනා බලයෙන් සත්වයාය සංස්කාරය යන දෙතැන්හි ඇළුම් නැති බව සභාව කොට ඇති නිවන්මඟ දෙන මේ භාවනාවෝ මෛත්‍රීයට වඩා විශිෂ්ටයෝයි. වේලාම දූතයෙහි පවන් උහතෝ භාගමඛ්‍ය ගත බුදුපාමොක් මහසඟනට දෙන ලද දූනයද, ඇතුළුවූ සියලුම දූන ඵල වදුරා ඒ සියළු දූනයවම වඩා සිටි ශීලයද එයටද වඩා සිටි මදවූ කලක් පැවැත්තාවූ මෛත්‍රී භාවනා ඵලයද වදුරා ඒ මෛත්‍රී භාවනාවට වඩා අසුරුසණක් පමණ කලෙක්හිදු සිත්හි පැවැත්වූ අනිත්‍ය සංඥව මහත් ඵලයයි තුන්ලෝවැසියන්ට පිහිටවූ නිවන් දෙන ලොකනාථකවූ මුනිරජ වදළේය.

එහෙයින් සංසාර තැමති භයඛ්කරවූ සියළුදුක් ඇති නරක යෙන් මිදෙනු කැමති සත්වතෙම මෙසේ මහත්වූ අවිනත්‍යවූ ගුණ ඇති අනිත්‍ය දුකඛ අනාත්ම යන තිලකුණු සංඥවෝ හැම වේලෙහිම වඩන්නේයි, මෙසේ කම්ඨාන තැමති ජයස්ථානයෙහි සිත පිහිටුවා සිව සතුරන් වැනිවූ කොයෙක් දුකට පමුණුවන ගව කියන ලද කාමච්ඡන්දාදී පඤ්චනීවරණයන් නැමති සතුරන්

බිඳ කාම යුඛයෙහි ක්ලේශකාම සංග්‍රාම සමඝත හිඛම ජය කොට ගෙණ රූප තැමති ගැඹුරු මහත් බර හැර අරූප බ්‍රහ්ම ලෝක යෙහිදු ඇළීම් හැරපියා නිසෙසඝු භවත්‍රය තුන්ලොව වඤ්චලය, සිවිසේ නොසිරින්නේයයි දැන උත්තම ඖෂධී කොට සත්තිස් බොධිපාඣික ධම් නම්වූ කායානුපසඝනාදි සතර සතිපට්ඨානය සතර සම්‍යක් ප්‍රධානය, සතර ඍඛිපාදය පඤ්චවිදුය, පඤ්චබලය සප්තබොඛ්‍යඞ්ගය, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාගීයයි යන මේ බුඛකාරක ධම්යන් වඛා බොධිපාඣික ධම්යන්ගේ භාවනා බලයට පැමිණි යත්වනෙම විගතවූ මරණ ඇති ජරා නැති රොග නැති සොක නැති එහෙයින්ම මදවූද ක්ලේශ සංග්‍රාමයකුදු නැති අනවරාග්‍ර සංසාරය හා නොහැනී ඉක්ම සිටි නිත්‍යවූ සුවකොළවරක් නැත්තා වූ වීරවූ බුදුපසේබුදු ආදී මහොත්තමයන් වියසින් පැමිණියාවූ සුලභ නොවූ අද්භූතවූ අසදෘශවූ ඉතා සාඝනවූ නිවන් පුරය උතුම් ඤාණ සම්පත්නිය කොවරදවා මාගේ පින්වත නුවණැත්තන් සේවනය කර නිවන්පුර වදු, භාවනා විභාගනිසංස වර්ණනාවයි.

මෙසේ සංක්ෂෙපයෙන් භාවනාවිභාගානිසංස දක්වා ඊට ඉක්බිතිව අපවාඝනානිසංස විභාග දක්වනු ලැබේ. ඒ කෙසේද? යත්--

> මානං පරිවජ්ජිත්වාන උපපාදෙත්වාන ගාරවං,
> ගුණං උපපරිකඛිත්වා උපකාරඤ්ඤූ තාදිසං.

ඝනාදි කි හෙයින් යම් සඞ්ඝ කෙණෙක් සිත්හි උපදනා මානය දුරුකොට විද්‍යමානවූ ගිලාදි ගුණයක් වත් තමහටවූ උපකාරයක් වත් පරීක්ෂා කොට සිතින් ගෞරව උපදවා ගෙණ බුඛාදි ශ්‍රෙෂ්ඨ ගුණවන්තයන් කෙරෙහිද දෙමව්පිය ආදි මදවූත් උපකාරවූවන් කෙරෙහිද ශ්‍රඛාවෙන් හා කෘතොපකාර සැලකීමෙන් ප්‍රඥ ගෞර වාදි ගුණයෙන් යුක්තව සිතින්ම ගෞරව උපදවා පූජා වසතුව කින් පූජා කරන්නේ වී නම් එම කුශලානුභාවයෙන් දවසින් දවසට වඛනා මහාඝම්පත් ඇති මහත් ආඪ්‍යවූ සුඛභාවයෙන්ම නිසැකව සත්වයන් විසින් වඳනව නිසිව උතුම් වංශයන ගෙතෙම උපදනේයි, එසේ පිදිය යුත්තන් දැන ඇඳින පිදූ තැනැත්තේ පරලොව යම් යම් තැනක උපන්නේ වී නම් ඒ ඒ තන්හි සිඟල්ලන් විසින් පූජ්‍යවූ ශ්‍රෙෂ්ඨවූ සථාන තනතුරුද ලබන්නේයි-

තවද පැහැදීමට සුදුසු ගුණ ඇති යමෙක් මනාව පැහැදී ප්‍රශංසා කරණලද ද ඒ කුශල බලයෙන් හෙතෙම උපනුපන් තැන යහපත් අඛණ්ඩප්‍රත්‍යඔඝ ඇති ව දුටු දුටුවන්ට සතුටු එළවන විශිෂ්ට රූපශ්‍රියා ඇති වන්නේය. පූර්ව ජාතියෙහි කළ උපකාර සලකන ගුණ ඇති සත්වයා විසින් මේ ජාතියෙහි කෘතොපකාර නො සලකන අධමයක් හට වී නමුත් කරණ උපකාරය ඔහුගේ පූර්ව පින් බෙලෙන් නිෂ්ප්‍රයෝජන නො ව ඉතා මහත් ඵල ඇතිවන්නේය. අන්‍යයන් කරණලද උපකාර නො සලකන අකෘතඥයා විසින් මෙලොව කෘතොපකාර ගුණ ඇතියක්හට වී නමුත් කරණ ලද මහත් පරිත්‍ත ප්‍රමාණ උපකාරය පවා ඔහුගේ පව් බෙලෙන් පරමාණුවක් සේ සුවල්ප ව වැටහීමෙන් නිෂ්ප්‍රයෝජන වේ. එහෙයින් නුවණැතියන් විසින් කෘතොපකාරගුණ දැන ඇදින ඉතා මද ව කළ උපකාරයක් වී නමුත් සැලකීමෙන් ඔවුන්ට කළමනා ප්‍රත්‍යුපකාරය තම තමා ශක්ති පමණින් කළ මැනවි.

තවද නුවණින් යෙදී පින් කළ තැනැත්තේ ඒ කුශලඵලය විඳිනා කල්හිදු නුවණින් වෙන් නො ව ඉතා මහත් නුවණැති වීමෙන් ලද සම්පත් සාරවීක වේ.

තවද යමෙක් නෙමේත් සීලාදී ගුණයෙන් යුක්ත ව අතිශයින් සීලාදී ගුණයෙන් විශිෂ්ටවූ ලොවුතුරා බුදුන් හා බුදුසව්වන් පුදන්නේ වී තම් ඒ කුශලඵලය බුදුන් මුත් අනිකකු විසින් නො දත හැකි නො කිය හැකි ඉතා විපුල මහත් ඵල ඇති වන්නේය.

තවද ශීලාදි ගුණයෙන් වැඩිහිටියන් දැන ඇදින සතතයෙන් වඳිනා සුල්ලහුට ආයුශය ශරීරවර්ණය සැපය බලය යන සතර ධර්මයෝ වඩනාහුය යි කියා ද එක ම මලක් පුදු අසුකෙළක් කප මුළුල්ලෙහි දුගතියට නො ගොස් සුගතියෙහි ම සැරිසරා සැප වින් දෙමි යි කියා ද පිදිය යුත්තන්ට පිදීම උතුම් මඟුරු යි කියා ද මඟුලසුත්‍රාදි නොයෙක් තැන නොයෙක් පරිද්දෙන් වදාරණ ලදී. බුදුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සඞ්ඝයා කෙරෙහි හෝ ආදරයෙන් එකාවිටෙක වුද දෙඅත් නගා එක් කොට කරණලද නමස්කාරමය කුශලය තෙම ඕනට වන සියලු ම සසර දුක් නැමැති ගිනි නිවා, නිවන් සම්පත් සාධන්ට සමර්ථ වේ. ඉතා දුර්ලභ ව කිදෙනසුළු වූ ඒකාන්තයෙන් දුර්ගතියුතු වූ නිස්සාර වූ මේ කුණු ශරීරයෙන් වැඳීම් පිදීම් ආදි වශයෙන් කළමනා තාක් මහත් සාරඵලවූ උතුම් නිවන් සැප දෙන පින් කරන්ට පිළිවන්

විනම් එසේ වූ පින් නො කොට සිත් ඇති කවරෙක් ප්‍රමාද වේ ද? නො පමා වන්නේ මැ සි.

තවද පිදිය යුත්තන් පිදීමෙහි ඵල කෙසේ දැ සි කිවහොත්- සුමනමාලාවසතු ආදි වස්තූන් හා අපදානවිමානවසතු ආදියෙන් අසා දතයුතු. සුමේධ නම් බුදුන්ව කිණිහිරිමල් තුනකින් පිදූ විද්‍යාධරයෙක් එම පින් බෙලෙන් තිස්දහසක් කප් මුළුල්ලෙහි කිසි යම් දුකකට නො පැමිණ දෙවිලෝ මිනිස්ලෝ දෙක්හි සැරිසරා ඇවිදිමින් මහත් සැප අනුභව කරණුයේ පන්සියයක්වර ශක්‍ර දෙවෙන්ද්‍ර ව තුන්සිය ශක්වර වක්‍රවර්ති ව අසඛ්‍යයක්වර දඹදිවට අගරජ ව අපමණ ශ්‍රී සම්පත් විඳ මේ බුඩොත්පාදයෙහි උතුම් නිවන් සම්පතුදු ලද්දේය.

කිසියම් වස්තුවකින් නුපුදු වෙදියපවිතයෙහි වූ ඉන්ද්‍රශාලා ගුහාචාරයෙහි භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා වැඩහුන් බුදුන් දැක සිත පහදවා ආදර ගෞරව දැක්වූ බකමූහුණු පක්ෂියෙක් බුදුන් කෙරෙහි හා සඞ්ඝයා කෙරෙහි කළ විත්ත ප්‍රසාද කුශලඵලයෙන් කප් ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො ගොස් දෙව් මිනිස් සැප විඳ කෙළවර සෞමනස් නම් පසේබුදු වන්නේය. ධම්මරත්නයෙහි කරණ චිත්තප්‍රසාද ඵලය වූකලි ධම්ශබ්දමාත්‍රය නිමිත්තග්‍රහණය කොට දෙව්ලොව උපන් මණ්ඩූකදිව්‍යපුත්‍රයාගේ වස්තුව ආදි නොයෙක් වස්තුකථා ආදියෙන් අසා දතයුතු. මේ ශාසනයෙහි අනුරුඬ නම් මහතෙරුන් වහන්සේට ඉන්ද්‍රක නම් දුගියෙක් තමා පිණිස මෙහෙයූ බත්සැන්දක් පමණ පුදු එම පිණින් දෙවලොව ඉන්ද්‍රක නම් දිව්‍යපුත්‍ර ව ඉපද සරු තැන හිදුවූ බිජුවවින් මහපුලතර ඵල ලද්දු සේ උතුම් පින්කෙත්හි පිදූ හෙයින් සෙසු පින්කම්වලින් දෙව්ලෝ උපන් හැම දෙවියන් අභිභවා දිලිහී දිලිහී කෙතෙම අනොපම වූ දිව්‍යශ්‍රීසම්පත් විඳිනේය. මෙසේ තුණුරුවන් ආදි පිදියයුත්තන් පිදීමෙහි මහානිසංස බව දැන ඇඳින එම්බා පින්වත් තමහට වැඩ කැමති සත්පුරුෂ ජනයන් විසින් අප්‍රමාද ව බුඬාදි පිදියයුත්තන් දැන හැඳින තම තමා ශක්ති පමණින් මල්පහන් ආදි පූජාවස්තුවෙන් පුදු වන්දනාමානාදි වශයෙන් පින් රැස් කළ මැනවි' පූජානිසංස වණ්නාව සි.

මෙසේ අපචායනානිසංසය සි කියතලද පූජානිසංස සංක්ෂෙප යෙන් දක්වා ඊට ඉක්බිති ව වෙය්‍යාවච්චානිසංසය දක්වනු ලැබේ.

ආපදාසු සහායානං ලාභා ඉච්ඡිතබ්බියා,
පරිවාරසම්පදාවෙති වෙය්‍යාවච්චඵලං මතං

සීලාදිගුණවන්තානං දානාදිකිරියාසු වා,
වෙය්‍යාවච්චං හි සම්භූතං කෝ ඵලං වණ්ණයිස්සති,

ඝනාදී කී හෙයින් වෙය්‍යාවච්චය යි කියනලද ශීලනුන්ට හා ගුණවතුන්ට උපස්ථාන මෙහෙ කිරීමෙහි නියුක්ත සත්‍වයා හට යම් කිසි විපත්තියක් පැමිණි කල්හි ඊට සහායයන්ගේ ලැබීමය, කැමති අර්ථයක් සිඛිමය, බොහෝ පිරිවර සම්පත් ලැබීමය යන මේ ආනිසංසයෝ ඇතිවන්නාහු යි. එසේ රෝගීන්ට ද ගුණවතුන්ට ද කොයෙක් පූජාසත්කාර දානාදි පින්කම් කරණ තැන්හි ද මනා කොට සිත පහදවා කරණලද මෙහෙයෙන් නිපදනා කුශලානිසංසය කවරෙක් වර්ණනා කෙරේ ද? ඔහට ඉතා මහත් ඵල වන්නේ මැ යි.

"යමෙක් රෝගීන්ට උපස්ථාන කෙරේ ද? හෙතෙම මට උපස්ථාන කළා නම් වෙයි කියා මහා කරුණා ඇති බුදුන් විසින් විශෙෂයෙන් වර්ණනාකර වදරණලදී. එසේ රෝගීන්ට උපස්ථාන යත් ලොව සියලු ම දනමනා දෑ අතැඹුලක් සේ දත් අනාවාස්‍ය වූ ලෝකාග්‍ර බුදුන්ට කරණ උපස්ථානයත් සම වීමට කාරණ කිම? යත්— තථාගත වූ බුදුරජ වනාහි අනුන්ට වඩ වැඩක් තමන් වහන්සේට ම වන වැඩක් මෙන් සිතන සේක. එසේ හෙයින් "රෝගීන්ට මෙහෙකිරීම ද බුදුන්ට මෙහෙකළා නම් වෙති" යනු අශ්චර්‍ය්‍ය නොවෙයි. ශීලනුන්ට උපස්ථාන කිරීම බුදුරජ අනුදත් හෙයින් හෙතෙම බුදුන්ගේ වචනය පිළිගැන්මෙන් උපකාරී හෙයින් බුදුන්ට ම මෙහෙකළා නම් වෙයි. එසේ හෙයින් එබඳු විපුලතා ඛොනිසංස වූ ඒ කුශලානිසංසය බුදුන් හැර වර්ණනා කරන්නට හෝ සිතන්නට හෝ කවරෙක් සමර්ථ වේ ද? නො හැකි මැ යි.

ඛිදෙනසුළු වූ නිස්සාර වූ මේ කුණු ශරීරයෙන් කළමනා උතුම් කුශලය කිරීමට අවකාශ ලැබ උමතු වියරු නො වූ සිත් ඇති කවරෙක් නො කරන්නේ ද? නුවණැති සැම තෙම කරන්නේ මැ යි. මෙසේ අප්‍රමෙය්‍ය වූ මහානිසංස ඇති වෛත්‍ය වියාරවත් පිළිවෙත් කිරීමෙහි ද ශීලනුන්ට හා ගුණවතුන්ට කළමනා සියලු උපස්ථානයෙහි ද අප්‍රමාද ව යෙදීමෙන් නුවණැත්තන් විසින් අත්වැඩ පරවැඩ සැදීමෙහි උත්සාහ කළ මැනවි. වෙය්‍යාවච්චානිසංස වර්ණනාව යි.

මෙසේ සීලාදි ගුණවතුන්ට හා ගිලනුන්ට කරණ උපස්ථාන යෙහි විහාර වෛත්‍ය වත් පිළිඉවත් පිරිමෙහි ද ආනිසංස සංක්ෂේප යෙන් දක්වා තදනන්තර ව පත්තිදාන නම් වූ පින් දීමෙහි ආනිසංස වර්ණනාව දක්වනු ලැබේ.

අත්තාත්ථම්පනපෙක්ඛිත්වා පරත්ථං දියතෙ යතෝ,
කරුණාකතං සඳුණයොගං පත්තිදානං තියෙසිතං.

යෙ ආනිසංසා නිද්දිට්ඨා දානෙ මානපහායිනා,
සව්සෙසාව තෙ සබෙබ පත්තිදානෙපි වෙදියා ති.

යනාදි කී හෙයින් යමෙක් අනුන් වෙත පතළ කරුණාවෙන් හා කෘතොපකාර සැලකිමය යන ගුණ දෙදෙනාගේ එක්වීමෙන් යෙදී තමහට වන වැඩ නො බලා අනුන්ට වැඩ පිණිස යම් පින්කමක පින්පෙත් දීමෙක් ඇද්ද, ඒ ප්‍රාප්තිදානය යි කියනලදී. සම්බුදුරජාණන් වහන්සේ ආදී තථාගතයන් විසින් දානයෙහි යම් අනුසස්කෙනෙක් විසතර කොට වදාරණලදහු ද, ඒ හැම අනුසස්හු විශෙෂයෙන් ම මේ ප්‍රාප්තිදාන නම් ලද පින් දීමෙහි ද දානයුත්තාහු යි.

තවද තමා කළ උපකාරයට නැමති ප්‍රත්‍යුපකාර කරන්ට සමර්ථ වූ එකක්හට ප්‍රතිකාරයෙහි නැලුනාවූ ආසාවට ම දැස ව සිටි ලොකයෙහි කවරෙක් නම් උපකාර කරන්නේ ද, නො කරන්නේ මැ යි. තමා කළ පාප කම් බලයෙන් මියගොස් ප්‍රෙත ව උපන් හව ද මෙලොව ව්‍යසනයට පැමිණි දුක්පතුන්හට ද කරුණා උපදවා අනුකම්පායෙන් උපකාර කරන්නේ ඉතා දුර්ලභ යි. ඒ ප්‍රෙතයෝ වූකලී ඤාතිමිත්‍රාදීන් විසින් දන් දී පින්පෙත් දුන් කල පරිභෝග කොට ගෙණ ඒ පින් අනුමෝදන් වූවාහු හිනම් ඒ අනුමෝදන් හිම හා සමග ඇසිල්ලකින් ඔවුන්ට දිව්‍යසම්පත් නිසැකයෙන්ම පහළ වේ. ඒ කාරණය සැරියුත් මහතෙරුන්ගේ මවු ප්‍රේතවූව පිණිස දුන් පින්පෙතින් දානයුතු මැ යි.

ධර්‍යියෙන් ප්‍රත්‍යය සපයා ජීවත් වන මිනිසුන්ට ඔවුනොවුන් ගේ ධර්‍යියෙන් උත්කෘෂ්ට වූ ද ලාමක වූ ද සතරපසයෝ සුව සේ ලැබෙන්නාහ. එහෙයින් මනුෂ්‍යජාති ඇත්තවුන්ට දන්දීම පිළිවන්මය. ප්‍රෙතයෝ නොයෙක් වර්ෂශතසහස්‍රයෙහිදු නොදයක් අතුරුකප්වල ද පිපාසයෙන් පීඩිත ව හැමලෙසින් සොයා වෙහෙසී ඇවිදි නමුත් කිසියම් ආහාරයක් ආස්වාදයක් නො ලබන්නාහු යි.

එසේ තම තමන්ගේ කම්දෙහෙයෙන්ම ඒ මහත් දුක් නැමති සාගරයෙහි ගැලී අපරිමිත වූ කොටිශත සඟ සුවල අනන්‍ය දුක්විඳිනා ඔවුන්ගේ ඒ ගිනළු දුක් දුරුකොට දිව්‍යසම්පත්තියෙහි පිහිටුවන කරුණාවෙන් සියල්ල දත් බුදුන් විසින් ප්‍රේතයන්ට පින් දෙන ක්‍රමය වදාළලෙස අසාදුන යමෙක් නොකරන්නේද,--ඕහට වඩා කරුණා නැත්තෙක් ලොව ඇත්තේ නොවෙයි. එහෙයින් දුකට පැමිණි ප්‍රේතයන් උදෙසා පින්පෙත් දීමෙන් ඔවුන්ට එකණෙහිම සිඹවන දිව්‍ය සම්පතුදු තමතමන්ට සිඹවන පත්තිදානමය පින් කමද සිඹ කිරිමෙන් වන අන්වැඹ පරවැඹ කැමැති නුවණැති සත් පුරුෂ ජනයෙනි කුශල ධර්මය මුත් අනික් කිසි පිහිටක් නැති බව දැන ආදර උපදවා තම තමා ශක්ති පමණින් සියලු පින්කම් කිරිමෙන්ද ප්‍රේත දුකින් වෙගෙසන ඤාතිප්‍රේතාදීන් සිහිකොට ඒ සියළු පින්පෙත් දීමෙන්ද ආත්මාර්ථ පරාර්ථ සාදිමෙහි උත්සාහ කළ මැනවි, පත්තිදානානිසංස වණ්ණනාවයි. මෙසේ පින්දීමෙහි විභාගානි සංස සංක්ෂේපයෙන් දක්වා ඊට ඉක්බිතිව අනුමොදනා විභාගානි සංසඳ දක්වනු ලැබේ. හේ කෙසේද? යත්,--

ඉස්සාවඤ්ඤාදමච්ඡේරං විහිංසා වාපි නාසිය,
ගුණභූසිතචිත්තෝයං අනුමොදනි මොදකෝ.

යතෝ තතෝ මහෙසක්ඛා සුරූපෝ හොගවාපිව,
දීඝායුකෝ සදා හථෙඨා හොතිපුඤ්ඤානුමොදකෝ

යනාදී කී හෙයින් අනුන් විසින් කරණ ලද කුසලයෙහි පින් අනුමෝදන් වන තැනැත්තේ සිත්හි උපදනා ඊර්ෂ්‍යාවෙශමාත් සයෂී විහිංසාවිතර්කාදිය දුරුකොට ශ්‍රද්ධාප්‍රඥදි ගුණසම්පන්න සිත් ඇතිව පින් අනුමෝදන් වේද, එසේ අනුන්ගේ පින් ආදර ඇතිව අනුමෝදන්වූ ඒ සැබෑතෙම උපනුපන් ජාතිවල මහෙශාක්‍යව ප්‍රධානව යහපත් රූඇතිව වස්තු ඇතිව හැම කල්හි සතුටු සිත් ඇතිව බොහෝකල් ආයු ඇතිව වසන්නේ වෙයි.

තවද වස්තු ආලයක් නොව සිවු පණස් කෙළක් ධනවියදමින් දෙවරම් වෙහෙර කරවා ඉක්බිති ධර්මරාජන්වූ බුදුන් ප්‍රමුඛ කොට ඇති සංඝයාට පූජාකරණ පිණිස දක්ෂිණොදක දෙන්නට රන් කොණ්ඩිය ගත් අත් ඇති සුදත්ත මහ සිටුහුගේ ශ්‍රියොභාව දැක මේ දැනය අශ්වය්‍යියයි කියා බොහෝසේ ප්‍රීතිවාක්‍ය පවත්වමින් පින්

අනුමෝදන්වූ කතාව කැඩි කිඹුලාද දෙවියට සමාරක් පමණවූ මද මිලයකුදු නුදුන් එක් මානවකයෙක් ඒ සතුටුව අනුමෝදන්වූ පින්බලෙන් ඒ දෑය කයා අධිකවූ පින්පල රැසක් ලදදේයි.--

මෙසේ අමුතු කිසියම් උත්සාහයකුත් කොකොට යම් කිසි ධනයකුත් නොදී පහන් සිතින් අනුමෝදන්වූ පමණකින් සිදුවන පාපුවෙන් මතාකොට ගත හැකි මේ පින්කම කොකොට ලොව ඇවිදිනා මූර්ඛවූ ජනතෙමේ තැවත මහත් සෝකයට පැමිණේ- ඒ බව දත් නුවණැති සත්පුරුෂ ජනයෙහි මේ නිරායාස පින් කමෙහි සිත් අලවා අනුන් කළ පින් තමන්ට දුනද නුදුනද පින් කම් කළවුන් කෙරෙහිදු ඒ පින්කම්හිදු ආදර බුහුමින් උපදවා ප්‍රශංසාකොට සතුටු සිතින්ම පින් අනුමෝදන් වියයුතු-

පත්තානුමෝදනා විභාගානිසංස වණ්ණනාවසි.

මේසේ පුණ්‍යානුමෝදනා විභාගානිසංසය දක්වා ඊට ඉක් බිතිවා ධම්ශ්‍රවණ විභාගානිසංසයද දක්වනු ලැබේ-ඒ කෙසේද? යත්.

සද්ධම්මං සුණමානස්ස යොහි අත්ථානුසාරිනෝ,
පමොදෙ නිබ්බිලඛස්ස දලිද්දස්සාපි තාදිස.

පඤ්ඤවා සුණමානෝ හි සද්ධම්මං බුද්ධදෙසිතං,
සුගම්භීරම්විතථං මධුරං අමතංවිය.

ලභතෙ පරමංපීතිං දෙවිඳෙනාපි දුල්ලභං,
තදෙවාලංඵලං තස්ස මෙඛෙතුපරලොකිකං.

යනාදී කිඹෙයින් සතුන් වෙත පතළ මහාකරුණා ඇති බුදුන් විසින් හැම සත්තව වැඩ පිණිස දෙසූ උතුන් සඩම්ය අර්ථානුසාරීව අසමින් ඒ අර්ථයන් අනුවම නුවණ මෙහෙයා සිහි කරන්නහුට උපදනා යම් ප්‍රීතියෙක් ඇද්ද, එබඳු ප්‍රීතියෙක් මහනිධාන ලත් දිළිදු දුකඛිතයෙකු වී නමුත් නොවන්නේය.

තවද බුදුන් විසින් දෙසිනවූ ඉතා ගැඹුරුවූ ඒකාන්ත සත්‍යවූ අමාසේ මියුරුවූ සදහම් අසන නුවණැති තැනැත්තේ දෙදෙව් ලොවට අධිපති ශක්‍රයා විසිනුදු ලබන්ට දුලීහවූ විශිෂ්ට ප්‍රීතිසැප ලබන්නේය. ඕනට පරලොව වන විපාක ඵලය නැතද ඒ ධම් ශ්‍රවණය ම ප්‍රීතිසැපයම ප්‍රමාණ වන්නේය.

තවද ගිනිගෙණ දිලියෙන යවටකට ලං නො වන මැස්සන් සේ බණ ඇසීමෙන් ධර්මය ධරා සිටි සිතට කෙලෙස් තැමති මැස්සෝ නො වදිත්. බණ ඇසීම එසේ වූ ද මහානිසංස ඇත්තේය. තවද මේ ශාසනයෙහි ධර්මයාගේ ගැන්ම බණ ඇසීම නැතිව නොවෙයි. දහම් අසා නො ගැන්මෙන් අර්ථ පරීක්ෂා කිරීම නොවෙයි. අර්ථ පරීක්ෂා කිරීම නැති තැනැත්තේ තමහට වත් අනුන්ට වත් හිත වූ වැඩදායක ප්‍රතිපත්ති පිරීමෙහි සමර්ථ නොවේ. ඒ පිළිවෙත් පිරීම් නැති කල්හි කිසිසේත් ධර්මය නො පවත්නේය. එසේ ම බණ ඇසීම නැති කල්හි පිවකත්‍රධර්මය නො පවත්නේය. එහෙයින් ප්‍රචර සඞ්ඝර්මයාගේ ශ්‍රවණය කිරීම ම උතුම් වත්නේය. ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ විසින් මනෝප්‍රණිධානයෙහි පවත් වීසතා සංඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි මහත් උත්සාහයෙන් පාරමී ධර්මය පූරණය කොට බුදුව සඞ්ඝර්මය අප කරා පමුණුවන ලද්දේය. ඒ ධර්මය ඇසීම් නැති ව අප හැමට වත පිරිහීමත් ධර්මයාගේ නො පැවැත්මත් දැන ඇඳින ආදර උපදවා ගම්මෙයකින් නො පමා ව බුදුරජ ධර්මය නිසා අප වෙනුවෙන් මහත් දීඝිකාලයක් තරණලද වියදී විශෙෂය ද බලා සිහිකරමින් අමෘතමහා නිර්වාණපුර ප්‍රවෙශවීම පිණිස ඇමදෙනා විසින් සඞ්ඝර්මය ම ඇසියයුතු යි. යම් පමණ ඇසීමක් ඇසූ ජාතියෙහි පටන් නුවණ වඩන්නේ ද, සඞ්ඝර්මය බොහෝ කලක් සිටීමට කාරණා ද, එසේ වූ සඞ්ඝර්මශ්‍රවණයාගේ ඵල පමණ කරන්නට බුදු නො වූ කවරෙක් සමර්ථ වේ ද?

එසේ බණ ඇසීම මහත්ඵල මහානිසංස ඇති බැවින් එකණෙහි දිව්‍යරාජ්‍යය සාදගන්ට පිලිවන් වී නම්බුදු ඒ දිව්‍යරාජ්‍යය හැර ලොව් තුරා බුදුන් කෙරෙන් පහළවූ ධර්මයම සිත හෙලා ආදර ඇතිව ඇසිය යුතු. ඒ ධර්මරාජන්වූ බුදුන් විසිනුදු සිරිපියෙහිම වැඩසිට ඇසීමෙන් ගරු තැන්හි තුබූ මහිම ඇති ධර්මයක දෙව් බඹ මුනි ආදීන් විසිනුදු, ආදර බුහුමන් උපදවා ඇසූ ධර්මයකැයි යනාදී ලස යෙන් ධර්මයේ මහත්ත්වය ශ්‍රවණයමය කුසලානිසංස විශේෂය සැලකීමෙන් එම්බා පින්වත් නුවණැතියෙනි, කල්පසංඛ්‍ය ගණන කිනුදු ලැබගත නොහැකි දුර්ලභවූ සඞ්ඝර්මය අසා ආත්මාර්ථපරාර්ථ සංසිද්ධියෙහි උත්සාහ කළ මැනවි –

සඞ්ඝර්මශ්‍රවණානිසංස වර්ණනාවයි

මෙසේ සංක්ෂෙපයෙන් සඞ්ඝර්මශ්‍රවණානිසංසය දක්වා තදනන්තරව ධර්මදේසනානිසංසවර්ණනාව දක්වනු ලැබේ.

දුරදුරකනෙත්තෑදී දුනංදත්වා අනෙකසෝ,
විරවිරිය යෙ ලබං ධම්මංදෙසෙති සබ්බදා.

අපතෙථයසොලාභං සක්කාරාදීනි අත්තනෝ,
ඝිතජඤ්ඣාසයතොඑව සද්ධම්මං කරොව සෝ.

සබ්බදුනං ධම්මදුනං ජිනාති ජිතොබ්‍රවී දෙසයි දෙසෙතා දුල්ලභොපිව— යනාදී කී හෙයින් අපරිමිත කල්පකෝටි ශතසහස්‍රවල පුත්‍රදාරාවන් හා ඇස් ඉස් මස් ආදී අධ්‍යාත්මික බාහිර වස්තු දුනාදි සමතිස්පෙරුම් පුරා බුදුවූ තථාගතයන් විසින් අව බොධ කරණලද උතුම් සබ්බර්මය යමෙක් තමහට වත ලාභ සත්කාර කිර්ති ප්‍රශංසාදී කිසිවක් නො පතා ඝිජ්ඣාසයෙන් ම ධර්ම දෙසනා කෙරේ ද, හෙතෙම ප්‍රවර ලොකඝාසාභාසාභාග්‍ය කරන්නේ ම වෙයි. පස්මරුන් බිඳ දිනූ හෙයින් ජින නම් තථාගත නෙම ධර්ම දුනය සියළු දුනයට උතුම්ය යි වදාරා ඒ ධර්මය දෙසන්නවුන් කෙරෙහි යට කී ගුණයෙන් යුක්ත වූ යහපත් බණ කියන්නකුදු ලොව දුලබය යි වදාළේ—

තවද යම් වස්තුවක් දන් දුන් කල ඒ වස්තුව විනාශ වීමෙන් හෝ පිළිගත්තහුගේ මරණින හෝ ඒකාන්තයෙන් ම ප්‍රතිග්‍රාහකය, කෙරෙන් ඒ වස්තුව වෙන් වේ මය. දෙශනා වශයෙන් යමෙකුට දෙනලද ධර්මදුනය විනාශි මෙලොව පරලොව දෙක්හි ම ඔහට සියළු ම අභිවාඩිවැඩට කාරණ වෙයි. තවද ලොකඝත්වයන් අතුරෙහි අල්පරජස්කවූ හෙවත් මදවූ රාගාදි කෙලෙස්රජස් ඇති ශ්‍රද්ධාදි ගුණසම්පන්න සත්ත්වයෝ ද බොහෝ සේ විද්‍යමානව ම ඇත්තා හට ඒ ඇමදෙනම තමන් ඇදින බණ කියන තරම් ධම්කථික කෙනෙකුන්ගේ නොලැබීමෙන් නිර්වාණයට නොපැමිණ සිටිනාහුයි එහෙයින් ශබ්ද ලක්ෂණාදි පරිඥානයෙන් හා ගෞරව වසයෙන් සකස් කොට සබ්බඥ නොවරදවා තත්ත්ව පරිද්දෙන් ඉගෙන තුළුත් සෙස්සහුත් සසරින් මුදන කරුණාව ද සබ්බඥ මෙසේ මා විසින් කියන ලද්දේ අනුන්ගේ සිත්හි ධර්ම පිහිටුවා බොහෝ කලක් පවත්නේයයි යන සබ්බඥ ගෞරවයද සිත්හි පිහිටුවා ගෙණ සිහිකුළුණ ඵලවා බණ කියන්නේයි. තමා නොදත් නොඋගත් දෙයක් වරදවා අනුන්ට නොකියන්නේයි. ශාස්තෘවූ බුදුරජද කිසිම ලාභසත්කාරාදියක් සිතා පතා ලොකඝාභට දහම් දෙසූ සේක් නොවෙයි. ඒ බුබකෘත්‍ය මෙන් පවත්නේ ආමිසගරුක නොව ධර්ම ගරුකපඬිතතෙමේපරවැඩ පිණිස දහම් දෙසන්නේයි. කුවණින් සිහි කිරීමය අනුන්ට කරණ ධර්ම දෙසනාය, යන මේ දෙක මාඝඤ්ඤයට හෙතුවන්නාහුගයි කියා මාඝඳන්නා බුදුන් විසින්ම වදාරණලදී.

ප්‍රත්‍යාත්පන්නධර්මයන්ගේ සවලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ වසයෙන් තත්වූ පරිද්දෙන් දුක්මය, සංසාරයෙහි ආදීනව මූහුකත්‍ර විදර්ශනා ඥනයෙන් දුක්මය, චතුසත්‍යයන්ගේ අධිගමය යන මාහී ඥනයද යන මෙහි තාක් ගුණ විසේස සියල්ල අනුන් විසින් කරණ ධම් දෙසනාව ඇසිමෙන්ම උපදනාහු වෙත්. යම් ධම්දේසකයෙක් කි ලෙස ගුණාඛ්‍ය සම්පන්නව සියලු සම්පත්තියට කාරණාවූ ධර්මය අනුන්ට දෙසාද, ඕහට මේ සාසනයෙහි සියලු සම්පත් ඵලකොට සම්භවන්නාහුයි. මෙසේ මහානිසංසඳවූ ඉතා දුර්ලභ සඩර්මය දෙසන්ට සමර්ථවද යමෙක් නොදෙසා නම් ඔහුගේ ජීවිතය ඉතා නිෂ්ඵලයි එබැවින් අත්වැඩ පරවැඩ කැමති නුවණැතියන් විසින් යථොක්ත ධම්නිශංස සැලකීමෙන් ධම්දේසනයෙහි ආදර උපදවා තමතමාගේ නුවණ පමණින් අනුන්ට බණ කියා අකුසල ගෙන් මුදා කුසල මාගීයෙහි යොදා ලොව් ලොවිතුරා සම්පත් සැදීමෙහි උත්සාහ කළ මැනවි.

ධම්දෙසනා විභාගානිසංස වණ්නාවයි.

මෙසේ ධම්දෙසනා විභාගානිසංස දක්වා ඊට අනතුරුව දිට්ඨිජ්ජුකම්විභාගානිසංසයද දක්වනු ලැබේ. ඒ කෙසේද? යත්, පසංසාසරණගමනානුස්සතීනං දිට්ඨිජ්ජුකම්මනෙතානගධත්තා තෙ සංවසෙන තත්‍ථ ආනිසංසො වෙදිතබෙබා—යනාදි කී හෙයින් ප්‍රසංසා කිරීමය සරණාගමනය අනුස්සතිය යන මේ ත්‍රිවිධවූ පින් කම්හු දිට්ඨිජ්ජුකම්යයි කියන ලද සම්‍යක් දෘෂ්ටියෙහි ඇතුලත් හෙයින් ඒ ත්‍රිවිධ කුසල කම්යන්ගේ විභාගානිසංස ප්‍රකාශ ක්‍රම යෙන් දිට්ඨිජ්ජුකම්යෙහිද විභාගානිසංසය දතයුතු.

තවද පුණ්‍යානුමොදනාවෙහිද, ධම්දෙසනාවෙහිද, යම් යම් අනුසස් කෙනෙක් කියන ලද්දාහුද ඒ සියලු ආනිසංසයෝද සුදුසු පරිද්දෙන් සම්පගංසන සංඛ්‍යාත ප්‍රසංසාවෙහිද ගෙදිය යුත්තාහුයි. යමෙක් බුත්සරණයෙද, දහම් සරණයෙද, සඟසරණයෙද, ඒ සඩ්‍ඝයාගේ මූලට පැමිණීමෙහිද සරණගත හෙයින් පිබා කිරීමෙක් නොවන්නේයි. සිහිකටයුතුවූ දසවිධ අනුස්සතින් අතුරෙහි ගෞරව සහිතව සසරදුක් නසනු කැමති සඩ්‍ඝතෙම නිරන්තරයෙන් ඒ අනුස්සතීන් සිහිකරන්නේයි. තවද දානාදි යම්කිසි කුසල ධම් යෙක් ඇද්ද ඒ හැම තැන්හි දන් දීමෙහිද සිල් රැකීමෙහිද භාවනා කිරීමෙහිද ඵලානිසංස ඇත යනාදි වසයෙන් පවත්නා උතුම් සම්‍යක් දෘෂ්ටියෙන් සිත පිරිසිදු වූයේ විනම් ඕහට, මහත්ඵල මහානි සංස ඇත්තේයි.

මේ මෙහි දිට්ඨිජ්ජුකම්යෙහි විභාගානිසංස වණ්නාවයි.

"දසමෙවං පන පුඤ්ඤවත්ථූනං විසුං විසුං සම්පරිමන්ති තෙ ඵලං සම්භාහුතානමසෙසතො කථං කථෙයි තෙසං මුනීනං ඵලොදයං''යනාදි කී හෙයින් මෙසේ දානාදි දශපුණ්‍යක්‍රියා වස්තූන්ගේ විභාගානිසංස වෙන් වෙන්ව වර්ණනා කොට මුනිශ්වරවූ බුදුරජ තෙම නිරවශෙෂයෙන් එක්වූ ඒ දශපුණ්‍ය ක්‍රියාවන්ගේද යම් ඵලෝදකයෙක් ආදේද ඒ ආනිසංසලාභය කිඛිනසුත්‍රයෙහි විශෙෂයෙන් වර්ණනා කොට වදාළ සේක. ඒ හෙයේද ගාථ--

යසසදානෙන සීලෙන සඤ්ඤමෙන දමෙන ච,
නිධි සුනිහිතො හොති ඉත්ථියාපුරිසස්ස වා.

වෙතියම්හි ව සංඝෙවා පුග්ගලෙ අතිථීසු වා,
මාතරිපිතරිවාපි අථොජෙට්ඨම්හි භාතරි.

එසො නිධි සුනිහිතො අජෙය්‍යො අනුගාමිකො
පභාගමනියෙසු එතං ආදයගච්ඡති.

මෙසේ නවවෙනි පරිවෙජ්දයෙන් දානාදි දසකුසල කම්පථා දීන්ගේ විභාගානිසංස ප්‍රකාශ කිරීමෙන් ලෝවැඩ දක්වා තදනන්තරව එම කුසල කම්ඵලභුම්වූ, ලෞකික ලොකොත්තර සම්පත් ප්‍රකාශ කථාවෝද මෙහි දක්වනු ලැබත්. එහි ලෞකික සම්පත්තිහු නම් සුවරහ්යත්, ගෘහපති මහාසාල සම්පත්තිය, බ්‍රාහ්මණ මහාසාල සම්පත්තිය, ක්ෂත්‍රිය මහාසාල සම්පත්තිය ප්‍රදෙශ රාජ්‍ය සම්පත්තිය, චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය, දිව්‍යරාජ්‍ය සම්පත්තිය යනාදි වශයෙන් අනෙක ප්‍රභාර වන්නාහුයි. එයින් මනුෂ්‍යලොක සම්පත් නම් යම් සිටු කුලයෙක සතළිස් කෙළක් ධන නිධාන කොට තබා දවස දවස පසාමුනක් කහවණු වැයවෙමින් දසාමුනක් කහවණු අයවන්නේය. මේ ගෘහපති මහාසල සම්පත් නම් වේ. යම් බ්‍රාහ්මණ කුලයෙක, අසූකෙළක් ධනනිධාන කොට තබා දවස දවස දසාමුණක් කහවණුවැයවෙමින් විසිඅමුනක් කහවණු අයවන්නේය. මේ බ්‍රාහ්මණ මහාසාල සම්පත් නම් වේ. යම් රජකුලයක සියක් කෙළක් ධන නිධානගතව දවස දවස විසිඅමුනක් කහවණු වැය වෙමින් සතළිස් අමුනක් කහවණු අයවන්නේය. මේ ක්ෂත්‍රිය මහාසාල සම්පත් නම් වේ. ප්‍රදෙශ රාජ්‍ය සම්පත් නම්, දෙයොදුන් තුන්යොදුන් විසියොදුන් තිස්යොදුන් සතළිස් යොදුන් පණස් යොදුන් සැට සැත්තෑ අසූ අනූයොදුන් එක්සියවිසියොදුන් ප්‍රමාණ වූ ඒ ඒ රටවල රජකරණ රජදරුවන් විසින් අනුභවකටයුතුවූ උදාරතර රාජ්‍යසම්පත්තිහුයි. චක්‍රවර්ති රාජ්‍ය සම්පත් නම්—

සතරමහ දිවයිනෙන් ක්ෂුද්‍රද්වීප දෙදහසකින් ප්‍රතිමණ්ඩිතවූ සියලුම චක්‍රවාඨබ්‍යන්තරයෙහි ඒශ්වර්‍යාධිපත්‍යය කරන්නාවූ චක්‍රවර්ති රජ්ජුරුවන් විසින් අනුභව කටයුතුවූ සම්පත්තියයි. ඒ චක්‍රවර්ති රාජ්‍ය සම්පත් මෙසේ දතයුතු.

"අනෙනාජ්ඣාසයං බලකායෙ ධම්මිකාඤ්ච රක්ඛාවරණගුත්තියා සංවිධානං" යන්නෙහි-- අනෙනාජ්ඣාසයයි කියනලද ඒ රජහුගේ පුත්‍රදාරාවන් සීලසංවරයෙහි පිහිටුවමින් වස්ත්‍ර ගන්ධමාලාභරණාදියෙන් ඔවුන්ට සංග්‍රහ කොට සවෝපද්‍රවයන් වලකා රක්‍ෂා කිරීම ධාර්මික රක්‍ෂාවරණගුත්ති නම් වේ. එසේම බලකායයයි කියනලද සේනාවවද කල් නොඉක්මවා බත් වැට්ප ආදිය දී අනුග්‍රහ කිරීමෙනුදු අභිසේක ලත් රජදරුවන්වද යහපත් අජානීය අශ්වයන් ආදී මාහැගිරත්න දීමෙනුදු අනුයුක්ත ක්‍ෂත්‍රියයෝයයි කියනලද. එක්ව යෙදී වසන රජදරුවන්ට දුදුසු යානවාහන දීමෙන්ද, ගාමභෝජකයන්ට බත්බිජුවට නගුල් ගොන් මීගොන් ආදී නිසිකමෙමාපකරණ දීමෙන්ද, එසේම නිගමග්‍රාමවාසීන්වද බත් බිජුවට ආදියෙන් සංග්‍රහ කිරීමෙන්ද, සතුටු කරවිය යුත්තාහුයි.

සමිතපාප බාහිතපාප මහණ බමුණන්ට ශ්‍රමණ පරිස්කාර දීමෙන් සත්කාර කිරීමය. රෝගපක්ෂීන්ට අභයදානයදී අස්වැසීමය අධර්මකිරීම වැලකීමය, ධන නැත්තවුන්ට ධන දීමය, ශ්‍රමණයන් කරා පැමිණීමය, ප්‍රශ්න විචාරීමයයි කියා මෙසේ දසවිධවූ සක්විති වත් පුරා පෙහෙවස් සමාදන්ව ප්‍රාසාදයාගේ මතුමහල් තෙලෙහි ශ්‍රීශයන් ගතව හුන් චක්‍රවර්ති රජහට රථාකාර විලෙන් චක්‍රවර්ති රත්නය පහළ වන්නේය.

ඒ චක්‍රරත්නයෙහි ඉඳුනිල මාණික්‍යමය නාභිය වෙයි. සත් රුවනමයවූ දහසක් අරවෙයි. සුරක්තවූ සිනිදුවූ ප්‍රවාලමය නිම් වලළු වෙයි. සඛ්‍යාරාශ සස්සිරිකාලංකත ජාම්බොනදසුවණ්ණමයනෙමි සන්ධිවෙයි. ඒ නිම්වලළු පිට සවභාවයෙන් පිඹිනා වස් කුලල්මෙන් ඇතුළතින් සිදුරුවූ විවිත්‍රශිල්පලිඛිතාවෙන් පවන් ගෙණ දසෘවාදයන් විසින් වයන ලද පඤ්චාංගික තූර්‍ය්‍ය නාදයක් මෙන් මධුර නාද පවත්වන මනහර ප්‍රවාල දඹුවැට සියයෙක් වෙයි. ඒ ප්‍රවාලශ්‍රේෂ්ඨි මස්තකයෙහි කිරිමුහුදු අලලා පැන නැගී පෙණ බුබුළු පන්තියක් මෙන් අතිධවල ධවලාත පත්‍ර සියයෙක් වෙයි. ඒ දෙපස රත්න දාමානුබන්ධරන්කොනත දෙසියයෙක් වෙයි. නාභිපනාලියාගේ උභතෝ පාර්ශ්වයෙහි සිංහ මුඛ දෙකෙක් වෙයි. ඒ සිංහ මුඛ

දෙකෙන් තරුණතාලස්කන්ධ ප්‍රමාණ සඳරුස් කලඹසේ ශෝභමාන මුතුලැල් කඳු දෙකෙක් ලඹදෙසි. ඒ මුක්තාලතිකාග්‍රයෙහි ලහිරු මඩල දෙකක් සේ පහස්හුවට දෙකක් බබලයි.

මෙසේ දිව්‍යරත්නමය ඝට්ටාලංකාරයෙන් සොභමානවූ ඒ චක්‍රරත්නය කරන්ඩනක හෝ කරවන්නෙක් හෝ ලොව ඇත්තේ නොවෙයි. කර්මප්‍රත්‍ය නැමති ඍතුයයි කියනලද චක්‍රවර්තිභාවයට පමුණුවන දානදමසංයමාදි පුණ්‍යහෙතු නැමති ඍතුයෙන් පහළ වන්නේය.

යටකියනලද ක්‍රමයෙන් දශවිධවූ සක්විතිවත් පුරා පුරපස ලොස්වක් පොහොදින අෂ්ටාඞ්ගශීලය සමාදන්ව රජ තමාගේ සීලය ආවර්ජනා කරමින් හුන්කල්හි සම්පූර්ණවූ සදමඬලසේ හිර මඬලසේ සොභමත්ව නැගෙන්නාවූ යථෝක්ත චක්‍රරත්නය දක්නේය. ඒ චක්‍රරත්නයෙහි මධ්‍යරනාද දෙලොස් යොදනක් නැන් ඇසෙයි. තුන් යොදනක් ආලෝක පැතිරෙයි. ඒ දුටු මහ ජනයා විසින් කුල්මත්ව සඳමඬලට අනුවම නැගි හෙයින් මේද මෙහිම උදවූයේ සඳ මඬලෙක්දෝ හිරමඬලෙක් දෝහොයි කියා අතිශයින් කුතුහල උපදවා බලමින් සිටියදීම නුවර මත්තඤ්ඤයෙන් අවුත් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට පැදුම් දෙස ඉතා උත්තොවූ ඉතා මිටි නොවූ මහජනයා විසින් මල්සුවඳ ආදියෙන් පූජාකිරීමට සුදුසු ආකාශ ප්‍රදේශයෙහි චක්‍රරත්නය අකඹාහත සවරූපයෙන් නිශ්චලව සිටිනේය. ඒ චක්‍රරත්නයට අනුවම හස්තිරත්නය පහළ වන්නේය. ඒ හස්ති රත්නය කාලපිලකාදී කිසිවක් නොව රිදී පර්වතයක් මෙන් සම්ඵාඞ්ගධවල සප්තාංග ප්‍රතිෂ්ඨිත ඉර්ධිමත් ආකාස චාරිවූ හස්ති ශික්ෂාවෙහි මනාව හික්මුනාවූද මානයෙන් යුක්තවූ උපෝසථ කුලයෙන් හෝ ශවිදනත කුලයෙන් හෝ එන්නේය. උපෝසථ කුලයෙන් එන්නේ වී නම් සියල්ලට ජ්‍යෙෂ්ඨ හස්තිතෙම එන්නේය. ශවිදනතයෙන් එන්නේ වී නම් හැමට කනිෂ්ඨ හස්තිතෙම එන්නේය. ඒ හස්ති වාහනාරූඪව රජතෙම දෙලොස් යොදනෙක පැතිර සිටි පිරිස ගෙණ පෙරවරු නික්ම සියළු ජම්බුද්වීපයෙහි හැසිර අවවාද කොට දවල් බතට සඛකිය රාජධානියටම එන්නේය.

මෙසේ හස්තිරත්නය පහළවූ ඉක්බිති ප්‍රවාලාඞ්කුරයෙන් වලඳනාලද කිරිමුහුදක රලපතරසේ ශුභ්‍රිකවූ රත්වූ බුර හා මුඛ ඇති වඳුමරිවි සමූහයක්සේ පිරිසිදුවූ සිනිදුවූ ඔවලවූ ඝනව හැසිරීවට මවව සම්පූර්ණව.තිබෙන ශරීර ඇති කපුටු කරක් මෙන් කළුහිස් ඇති සරියේ කපා සිවුමනලද මුදුන නමුදු මොලොක් සියුම් මව සිඳවූ කෙලින් නැගීකෙස් ඇත්කාවූ යව සදෘශමුඛතාදි සත්ලක්ෂණ

යෙන් සම්පූර්ණවූ වලාහකකම් අශ්වරාජයෙක් ශෛඛ්‍යකුල යෙන් අවුත් සරහා පිළියෙලකරණලද මගුල්අස්සල සිවින්නේය— එකල චක්‍රවර්තිරජතෙම අශ්වරාජයා දැක පළමුපරිද්දෙන්ම රුවන් උරසැත කිංකිනිදූල් රන්වූකරසු ත්‍රිකුසගහීතිලිඅඟණසත් ඇසත පටසියළුසවරිඇදිවූ නොයෙක් සැරහුම්වලින්ද සරසා ඒ අසු පිටට පැනනැඟි පිරිවරහා සමග සුලුසක්වළුවටකොට ඇවිද පෙරවරු මේ නිමිවිමට පළමුවෙන්ම තමාගේ රාජධානියට එන්නේය—

මේ අශ්වරත්නය පහළ වූ ඉක්බිති සතරරියන් පමණ දිගඇති ගැල්වැඹක්පමණවූ වටඇති දෙකෙලවර කෙම්කෙලවරින් නික් මෙන්නාවූ ඉතා පිරිසිදු මුතුලැල්තදින් හා රන්පියුම්දෙකකින් සැරහුතාවූ සුවාසූදහසක්පමණ මැණික්පිරිවරකොටඇති තාරකා පිරිවැරූ පුණ්‍යවන්‍තයාගේ ත්‍රිසමඹියට ස්පර්ධාකරන්නාක් වැනිවූ මාණික්‍යරත්නය වෙළුල්ලපවිතයෙන් එන්නේය. ඒ මාණික්‍ය රතනය මුතුසහල්ලෙකතබා උනදඹුපරම්පරාවෙන් සැටරියනක් පමණ ආකාශයට නහනලදකල්හි රාත්‍රිභාගයෙහි වවින් ගොදනක් පමණවූ සියලුඅවකාශය අරුණුනැගෙන වේලාවක්මෙන් ඒකා ලෝකවෙයි. ඒවේලෙහි ගොවිහු සිසැම්ආදිවූ ගොවිකම්නන කෙරෙති. වෙළෙඳු සල්පිල්සදති. ඒ ඒ කම්මාන්තදන්නාවූ සඹයෝ දවල්හයි සිතා තමතමන් කරණ මෙහෙකරන්නාහුය. ගටත්පිරිසෙයින් කුරුකුහුඹුවන් පවන් හැමවස්තූන් දක්නාහුය—

මෙසේ මාණික්‍යරත්නය පහළවූ ඉක්බිති චක්‍රවර්තිරජ්ජුරු වන්ට පඤ්චාමසැපයට විසෙසකාරණවූ සකලජන නයනාමෘත භාගප්‍රශස්ත රූපලාවන සම්පත්තියෙන් රමණියවූ රත්තඟුර යෙන් මවනලද රූපයක්බඳුවූ කප්රුකකින්උපන් දිවසළුවෙන් හා මිණිබටුනුආදිවූ සිව්සැවඅාභරණයෙන් සැරහී එහි මුක්තේහු නිලපත්මරාගවෙඩුයිආදි රත්නකිරනාංකුරයෙන් මිශ්‍රවූ තමාගේ ශරීරකාන්තියෙන් දෙලොස්රියනක්තැන් එකපැහැර බබුළුවන්නා වූ සියක්වටගසානැංතු පුලුනට වඩා සියදහස් ගුණයෙන්අධික වූ මෘදු ස්පර්ශඇතිවූ චක්‍රවර්තිරජහට සීතාවස්තාවෙහි උෂ්ණවූ උෂ්ණාවස්තාවෙහි සීතලවූ මතා ස්පර්ශදන හැම සකස්කොට අඹරණසඳ අළුත් සිවිදුගඳ හා එක්කොටයොදනලද සදුන්සුවඳ වැනිවූ සරිරසුගන්ධඇති ඒක්ෂණයෙහිපිපුනු මහනෙල්මල් සුවඳක් වැනිවූ ඉතා මනොඥවූ මුඛසුගන්ධයෙන් යුක්තවූ දක්ෂගාන්ධී යන් විසින් ගායනාකරණලද චිත්තාදයකටඹදුවූ මිහිරි කටහඬ ඇත්තාවූ ලක්ෂමියට බදු වූ ශ්‍රී සෞභාග්‍යඇති සරස්වතියට

බඳුවූ නුවණ ඇති අරුණිසයබඳුවූ පනිවුනාගුණයෙන් යුක්තවූ සත්‍රිරත්නයෙක් උතුරුකුරු දිවයිනින් එන්නිය. නොගොස් මදු රට සාගල නුවර මදු රජ්ජුරුවන්ගේ කුලයෙන් ගෙණෙන ලද අග මෙහෙසුන් බිසවකට මේබදු රූපශබ්දගන්ධරසස්පර්ශ සම්බිය පහළ වන්නේය. මෙසේවූ සත්‍රිරත්නය පහළ වන්නේය.

මෙ ස් සත්‍රිරත්නය පහළවූ ඉක්බිති පළමුවෙන් රජ්ජුරුවන්ට වස්තුරාසිය වර්ධනාකරණ ධුරාසෙභිසිටියාවූ අනාල්පවූ උපභොග පරිභොග වස්තුඇත්තාවූ ගොවිකුලයෙහි උපන්නාවූ සිවානන්ට චක්‍රරත්නානුභාවසහිතවූ කම්මවිපාකයෙන් උපන්නාවූ දිවස් පහළ වන්නේය. ඒ දිවසින් පොළෝ ඇතුළෙහි යොදනක් පමණ ගැඹුරෙහි තුබූ නිධාන දක්නේය. ඒ සිටුපුත්‍ර තුමාගේ දිවස් සම්බිය දැන සතුටුවූ සිත් ඇතිව ගොස් රජ්ජුරුවන් වහන්ස ඔබවහන්සේ වස්තු සෙවීමට උත්සාහ නොකළ මැනව. මම වස්තුයෙන් කළ මනා කටයුතු සැපයේ සිඹ කරන්නෙමියි රජ්ජුරුවන් ධනයෙන් පවරා රන්මසු පිරුණු මහාසලක් ගොඩනහාගෙණ මහරජ්ජුරුවන් වහන්ස මෙපමණක් සෑහෙන්නේදැයි කියා තමාගේ සාමර්ථ්‍යය දක්වන්නේය. මේබදුවූ ගෘහපතිරත්නය පහළවූ ඉක්බිති සක්විති රජ්ජුරුවන්ගේ ප්‍රධාන පුත්‍රවූ සවභාවයෙන්ම ප්‍රඥන්න ඤාණයෙන් යුක්තවූ සථානොචිත ප්‍රඥ ඇති සංවිභාගසිලිවූ සියලු කාශ්‍යවිධාන යෙහි සමර්ථවූ රාජකුමාරයාහට ඒ රජ්ජුගේ කුසලානුභාවය නිසා ඔහුගේ පූර්වකම්මානුභාවයෙන් පරසිත් දන්නා නුවණ පහළවන්නේය, ඒ පරචිත්ත ඤාණයෙන් දෙලොස් යොදුනෙහ පැතිර සිටි පසේදෑගේ සිත් හසර දැන ලංකළමනා කෙනෙකුන් ලංකරන්නටද දුරුකළමනා කෙනෙකුන් දුරුකරන්නටද නිස්සන් දැන ඒ ඒ තනතුරුවලට පමුනුවන්වද රජ්ජුරුවන්ට ගිහගන් නිශ්චය කරන්නටද සමර්ථ වන්නේය. මෙබඳු පරිනායක රත්නසංඛ්‍යාතවූ රාජකුමාරයාද තමාගේ ආනුභාව දැන සතුටු සිත් ඇතිව ගොස් මහ රජ්ජුරුවන් වහන්ස ඔබ වහන්සේ සැපසේ රාජ්‍ය ශ්‍රී අනුභව කොට වදුළ මැනව. මම සේනාවට අවවාද අනුශාසනා කරමිසි සේනාව විවාරීම ආදිවූ සියලු කටයුතු මට භාරයයි රජ්ජුරුවන්ට ආරාධනා කරන්නේය.

මෙසේ මේ සප්තරත්න රත්නයෙන් සමන්විතවූ චක්‍රවර්ති රජ තෙම වාමහස්තයෙන් සුවණ්ණභිංකාරය ගෙණ දක්ෂිණ හස්තයෙන් චක්‍රරත්නයට පැන් ඉස "පවත්තතු භවං චක්කරතනං අභිවිජිනාතු භවං චක්කරතනං" යනුවෙන් ආරාධනා කළ කල්හි ඒ චක්‍රරත්නය හා සමග චක්‍රරත්නය ආකාශයට පැන නැගි කිසියකලද් ක්‍රමයෙන් මධුරනාද පතුරුවමින් නික්ම යන්නේය.

ඒ චක්‍රරත්නය හා සමග චක්‍රවර්තිමහරජ සම්භාරණයෙන් සැරසී හස්තිරත්නය අශ්වරත්නය යානවාහනදෙකින් කැමති වාහනයකට පැනනැඟි එසේම සම්භාරණයෙන් සැරහුනාවූ දෙව භවන් හා සමාන විශෙෂ රූපසෝභාවෙන් විරාජමානවූ මනහර පුරභවන් හා එසේම අන්තේකාලංකාරයෙන් විභූෂිතව තල්වැට වාමර ඡත්‍රනිපත් පුන්කලසයෙන් කෝල්පිල් කඹ කුඹකොඹි සේ සත් මගුල්කවු ආදිකොටඇති නොයෙක් මගුල්පෙළහර ගත්තාවූ පරිවාරජනයන්ද ඵපරිද්දෙන්ම අනෙකවිධ කම්මන්තයෙන් විවිත්‍ර පරදුකුප්පායන් ආදිවූ නානාවණ්ණසන්නාහයෙන් අලංකෘතව අනෙකප්‍රකාර ආභරණප්‍රභායෙන් දිලිඇඹෙමින් අතින් ගන්නාලද ඛඩ්ගකුන්තතෝමර වඳුවක්‍රභණ්ඩිවාලාදිවූ විවිධායුධයන්ගේ විද්‍යුද්දාම සහස්‍රප්‍රභාවෙන් හා නගනලද නොයෙක් දශස්ගණන් ධ්වජපතාකයෙන් ප්‍රතිමණ්ඩිතවූ තමන්ගේ මහසෙනග හා සමග අහසින් අවුත් සිටගත්තාවූ යුවරජසෙනෙවිරත් ඇපාමාපාආදීවූ මඩලිකවරුන් හා එපරිද්දෙන්ම පෙල පෙල සැදී වෙන වෙන අවුත් රැස්වෙමින් සතළිස්යොදනක් පමණ තන්හි අතුරණනොහැර දිව්‍ය සේනාවක්මෙන් සැරසී සිටගත්තාවූ මහසෙනග පිරිවරා තරු පිරිවරණලද පූර්ණචන්ද්‍රයාසේ දිලිහිදිලිහි ආකාශයෙන් නික්මෙත්තාහ—

එසඳ රජ්ජුරුවන්ට අභිමුඛව දිව්‍යාංගනාවන් හා සමානවූ සැට දහසක් පමණ කාවකාස්ත්‍රිහු ආකාශයෙහි දිව්‍යලීලායෙන් නටා ගෙණ යෙති. උන්ට අභිමුඛව එසේම දෙවඟනන් හා සමානවූ සැටදහසක් පමණ පුරාංගනාවෝ වේත්‍රවතී නාලවන්හි වතීවස්දඹු ඒකචක්‍රමහිපවිජ්ජොඛනි ඔහනුතන්හිරි පටසිරිවිලිකොලස්සර ආදියෙන් මධුරස්වර පතුරුවා ගායනාතාද කෙරෙමින් නික්මෙන්නාහ—එසේම දෙවිකුමරුවන් බදුවූ සැටදහසක් පමණ ඛාඩ්ඩපීතුහුයෝ නොයෙක් ලෙසින් සැරසී. ඉදිරිව සිට, ගැටබේර, පනාබේර, තුඩිබේර, මහබේර, පොකුරුබේර, රොදුබේර, එකැස්බේර, දුදුගුබේර, ඇඳුරුබේර, තලපප, රවිරඤ්ඡ, තම්මැට්ට නිසාන ආදිවූ අනෙකප්‍රකාර හෙරිඝොෂාවෙන් එනකෝලාහල කෙරෙමින් නික්මෙන්නාහ—

මෙසේ ඔරාජිකාපඤ්ඤ හා සමග නික්මුනාවූ ඒ චක්‍රරත්නයේ බලයෙන් මහාසම්මතපවේතය පහකොට මහාසම්මුදුය මතුපිටින් සත් දහසක් යොදුන් පමණ ඇති පුළුවිදෙහට ගොස් ඒ පුළුවිදෙහ යෙහි දිගින්පුටුලින් දකුණුලොස් යොදනක් පමණ ඇති වටින් සතිස්

යොදනක් පමණ තන්හි පැතිරසිටිනා පඤ්චවාසකරන්ට යොග්‍යවූ පානවර්ගඇති සිනිදු සෙවනින් හා සිහිල්දියෙන් සම්පූර්ණවූ පවිත්‍රවූ සමතලා රම්‍යභූමිප්‍රදේශයෙක්හි චක්‍රරත්නය අකුරක් ගැසුවාක් මෙන් සිටින්නේය -ඒ සලකුණෙන් සියලුසත්වයෝ කිමටබැස සැපසේ කැමතිපරිදි දෙන් ස්නානභෝජනාදිය කෙරෙමින් වාසය කරන්කාහුය--මෙසේ චක්‍රවර්තිරජ්ජුරුවන් ව සයවි පැමිණිකල්හි පූර්වදේහයෙහි යම් රජදරුකෙනෙක් ඇත්නම් ඔහු හැම දෙනම සතුරුසේනාවෙක් ආවාහුයයි සිතා තමන්ගේ සේනාව සුඹයට නොසරහන්කාහුමය. එයට කාරණා කවරේද? යත්, තමන්ගේ ආනුභාවයෙන් සියලු සතුරන් දමනයලනහෙයින් අරිඤ්ජමයයි යන තමින් ප්‍රසිඛවූ ඒ චක්‍රරත්නයාගේ උත්පත්තිය හා සමඟ සතුරු සංඥාවෙන් ඒ චක්‍රවර්තිරජ්ජුරුවන් උදෙසා ආයුධයක් ඔසවා ගන්ට සමර්ථවූ සත්වයෙක් තම් කිසි තැනෙහත් නැත්තේමය.--

මේ චක්‍රරත්නයාගේ ආනුභාවයෙන් වන්නේය-එසේ හෙයින් කියඇලදී.

චක්කානුභාවෙනහිතඃඃරකෙඤ්ඤ අරිඅසෙසා දමථංඋපෙන්ති,
අරිඤ්ජංනාමනරාධිපස්ස තෙනෙවතං වුච්චති තස්ස චක්කංයි

එසේ හෙයින් සියලු දරුවෝ තමතමන්ගේ රාජ්‍ය ශ්‍රීඃ මෑයට සුදුසු පඹුරු ගෙණ ඒ චක්‍රවර්තිරජ්ජුරුවන් කරා එලඹ තමන්ගේ කිරුළුකුළුම්ණි රියැස් තැමැති අභිසේක ජලඃයන් ඒ රජ්ජුරුවන්ගේ පාද පූජාව කොට මහරජ්ජුරුවන් වහන්ස මෙසේ වැඩිය මැනව නුඹවහන්සේ වැඩියාවූ ගමන ඉතා යහපත්වූ ගමනෙක මේ රාජ්ජය නුඹවහන්සේ සන්තකය එසේ හෙයින් අනුසාසනා කොට වදාළ මැනවැයි ඒ චක්‍රවර්තිරජ්ජුරුවන්ව තමන් විසින් කළමනා කටයුතු කෙසේ කරම් දැයි විවාළ කල්හි චක්‍රවර්තිරජ්ජුරුවන් අවිරුද්ධක් පාසා මෙතෙක් අය පඹුරු දෙවයි නොකියන්නේය. එකක්හුගේ වස්තුව උදුරා අනිකක්හට නොදෙන්නේය. වැලිත් ආකාශයෙහි දේවේන්ද්‍ර ලීලාවෙන් පත්මාසතයෙන් වැඩහිඳ තමාඃගේ ධර්මරාජත්ව බවට සුදුසුවූ ත්‍රුවණින් පරීක්ෂා කොට බැන නැතීම සමඟ මුඛයෙන් නීකුත් යොදනක් දිවන මහඃනල්මල් සුවඳ ශරීරයෙන් නික්මුනු සතර ගව්වෙක පැතිර සිටිනා දිවසදුන් සුවඳ හා මුසුකොට මියුරු කටහඬින් මෙසේ කියන්නේය.

එබා පින්වත් සඬයෙනි ප්‍රාණවධ නොකරව. අනුන් සතනක වස්තු නොගණුව. කාමමිථ්‍යාචාර නොකරව. බොරු නොකියව.

රාජාතොබොව්. තොප තොපගේ භුක්තිවූ පරිද්දෙන්ම රාජ්‍යශ්‍රී අනුභව කරවයි අවවාද කොට ඉක්බිති චක්‍රරත්නය ආකාශයට පැන නැඟි නැගෙනහිරි සමුද්‍රයට බට කල්හි ඔෂධ ගන්ධයක් ආඝ්‍රාණ කොට පෙණ ගහිය අකුළුවන්නාවූ නාගරාජයන්හු මෙන් ඇකිල ගියාවූ රලපතර ඇතිව පසුබස්නාවූ සමුද්‍ර ජලය යොදුනක් පමණ තැන් පසු බැසවෙවූයේමයවූ හිත්තියක් මෙන් සිටිනේය. ඒ ඇසිල්ලෙහි මහසමුද්‍රයෙහි විසිර සිටියාවූ අනෙක ප්‍රකාරවූ රත්න සමූහය දැක සතුටුවූ රජපිරිස කැමති පරිද්දෙන් සත්රුවන් උකාගත් කල්හි ඒ චක්‍රරත්නය පෙරළා නික්මෙන්ට පටන් ගන්නේය. එකල්හි සේනාව ඉදිරිවෙයි. රජ්ජුරුවන් මධ්‍යයෙහි යෙහි චක්‍රරත්නය හැමට පසුව යන්නේය. ඒ සමුද්‍රජලයද චක්‍රරත්නයට පසු ගමන් කරන්නාක් මෙන් අවුත් නිම්වලලු කෙළවර ගැසෙමින් ගොඩවම එන්නේය. මෙසේ පූර්වසමුද්‍රපර්‍යන්තවූ පූර්වදේහය ජය ගත්තාවූ සක්විති මහරජ තෙම චක්‍රරත්නය විසින් දක්වන ලද මාගීයෙන් දක්ෂිණ දිශානිමුඛ දසදහසක් යොදුන් ඇති ජම්බුද්වීපය ගෙණ පළමු පරිද්දෙන් දක්ෂිණ සමුද්‍රයට බැස අහසට නැඟි සත්දහසක් යොදුන් පමණ ඇති අපරගොඤාන යද පළමු පරිද්දෙන් ජයගෙණ බස්නාහිරි සමුද්‍රයෙන් අහසට නැඟී අටදහසක් යොදුන් පමණ ඇති උතුරුකුරු දිවයින පළමු කී පරිද්දෙන් ජයගෙණ උත්තර සමුද්‍රයෙන් අහසට නැගෙන්නේය.

මෙසේ චතුස්සමුද්‍රවෙලා පර්‍යන්තවූ මහා පෘථිවීමණ්ඩලය ජය ගත් චක්‍රවර්ති මහරජතෙම ඔහුගේ රාජ්‍යශ්‍රීසමෘද්ධිය දක්නා පිණිස පෂීද් හා සමග තුන්සියයක් යොදුන් පමණ උස ඇති ආකාසතල යට පැන නැඟී සුපුස්පිතවූ පත්මෝත්පලපුණ්ඩරික වනයෙන් විසිතුරුවූ සඝංජාත ඉහවිල් සතරක් මෙන් පන්සියයක්ක්ෂුද්‍රදිප පිරිවර කොට ඇති සතර මහාද්වීපය චක්‍රරත්නානුභාවයෙන් මේරු යුගන්ධරාදීන්වන ආවරණයක් නැතිව ඒත්තසත්තෝඝයෙන් බලාගිව ක්‍රමයෙන් තමාගේ රාජ්‍යාභිෂේකයටම එන්නේය.

මෙපමණකින් චක්‍රවර්ති රජ්ජුරුවන් විසින් සමුද්‍රපර්‍යන්තවූ මුළුපොළොව ඒශ්වර්‍යාධිපත්‍යයට පැමිණියේ නම් වේ. මෙසේ චක්‍රවාට පර්‍යන්තයෙහිම කොටා මුහුදු කෙළවර කොට සිටි සක්වළ ගැබ ඒශ්වර්‍යාධිපත්‍යයට පැමිණි චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ දිව්‍යාභරණයන් මෙන් විශිෂ්ටවූ රූප ශ්‍රී ඇති අනේකප්‍රකාර විසිතුරු සත්ත්වාභරණයෙන් සැරහුනාවූ සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලානුසාර සිත් කළු මුහුණු ඇති සුරකතවූ බිම්බඵල සදෘශවූ දනතාවරණ ඇති

නිම්ලාභිධවලසමඝගිත අම්බර දන්ත පන්ති ඇති නිල්වූ නේත්‍ර කේසකලාප සම්පන්න අනිනිලවංක බැමසඟළ වරින් හා මනාව හටගත් සම්පූර්ණ සමඝගිත පයොධරා ලංකෘත රතිකරණකඤ්ඤක රජත රක්තඤ්ඤකනිම්මිත විචිත්‍ර මෙවුල්ද්ම පැලඳි ඇත්සොඬව බදු සමඝගිත තෝරා යුගලාදි සම්භවයව ලක්ඛණ ශ්‍රී සොභාධර නාත්‍ය ගීතවාදිතාදී දක්ෂවූ ප්‍රියභාසන භාසිත නාටකස්ත්‍රීහු අසුසාර දහ සක් වත්නාහුය.

ඒ රජ්ජුරුවන්ගේ පුත්‍රයන් දහසම ප්‍රධාන පරිනායක රත්න නම්වූ ජේෂ්ඨ පුත්‍රරත්නය වන්නේය. දෙළොස් යොදුනක් තැන අතුරු නොහැර දිව්‍යශාන්ධර්ම සේනාව සේ හැසිර සිටි පංචාංගික තූර්‍යසේනාව වන්නේය පස්දිසියොදනෙක හැසිර සිටි බ්‍රාහ්මණ මඬලය වන්නේය. අවසාළිස් යොදනෙක හැසිර සිටි සම්භරණ විභූෂිත පංචාසුධ සන්නද්ධ අනේකප්‍රකාර වේශධාරිවූ අනූයොදනෙක හැසිර සිටි අමාත්‍ය මඬලය වන්නේය. පන්සියයක් යොදුන් තැන හැසිර සිටිනා මහඃසතඟ වන්නේය.

මෙසේ චක්‍රවර්ති රජහට හාත්පස්හි සතර දිසාවෙහි අසූඅතර කෙළදහසක් පමණ සංඛ්‍යාවට ගිය බලකාය වන්නේයි. මේ ආදී අනේක ප්‍රකාර ශ්‍රී සම්පත් සමූහයෙන් දිලිසෙන්නාවූ සම්පත් නිය චක්‍රවර්ති සම්පත් නම් වේ. මෙසේවූ චක්‍රවර්ති සම්පත් ආදි සියළු මනුෂ්‍ය සම්පත්නියවද ත්‍රිවිධ බුද්ධානුශාසනා ප්‍රතිග්‍රහණ යෙන් දසකුසල ධර්මයෙහි හැසිරුණු සඬයෝ පැමිණ ප්‍රමාණාති ක්‍රාන්තාවූ නොයෙක් මනුෂ්‍යලෝක සම්පත් අනුභව කරන්නාහුයි.

මෙසේ සියළු සත්වයන් මෙසා සියළු මනුෂ්‍යලෝක සම්පත්හි යට පමුනුවනසේ කරණලද අනේකප්‍රකාර විශිතුරු සඛම්මානු ශාසනා ඇති හෙයින් ශාස්‍යකුලතිලකවූ මාගේ සර්වාඥරුවූ බුදුරජා නන් වහන්සේ ශාස්තෘ නම් වන්නාසේක.

තාවද දිව්‍යරාජ්‍යය සම්පත් නම් කවරහෝයත්, පොළෝ තෙලෙහි පවත් දෙසාළිස් දහසක් යොදුන් ගිය තැන යුගන්ධර පර්වතය හා සමවූ ආකාස ප්‍රදේශයෙහි වාතුම්මහාරාජික දිව්‍යලෝකය සන්වළගල දක්වාම පිහිටියේය. ඒ වාතුම්මහාරාජිකයෙහි ඇතුළු ජීවි මාංශී හැර සෙසු සියළු තැන සඛණ්ඩරංජිත මාණික්‍යාමය භූමිතලවලින් අතුරු කැත්තේය. සතරවරම් රජදරුවන්ගේ සත්රුවන් ඇ දිව්‍යමය නගරය ඒ යුගඳුරු මූදුතෙහි ඕය. ඒ දිව්‍ය

ලෝකයෙහි දෙවියෝ මනුෂ්‍ය ගණනින් අනුලක්ෂයක් අවුරුදු දිව්‍ය සම්පත් අනුභව කෙරෙති. දිව්‍යරාජ සම්පත් නම් තාවතිංසය යාමය තුසිතය නිම්මාණරතිය පරනිර්මිත වසවර්තියය යි කියන ලද දිව්‍යලෝකවල දිව්‍යරාජයන් විසින් මිනිස් යුතු දිව්‍යසම්පත් වන්නේය. ඒ චාතුර්මහාරාජික දිව්‍යලෝකයෙහි පවත් දෙසාළිස් දහසක් යොදුන් ගියතැන මහමෙර මුදුන හා සම වූ ආකාශ ප්‍රදේශයෙහි තව්තිසා දිව්‍යලෝකය සක්වළගල දක්වා පිහිටියේය. මේරු මස්තකය ඉඳුනිලමාණික්‍යමයය. එහි පිහිටි පිවිතුවර හැර මැද පිහිටි ශක්‍රපුරය ඇතුළත පූර්වාරයෙන් පශ්චිමාරයට දසදහසක් යොදුන. දහසක් රුවන්දෙරටුවෙන් හා සප්තරත්න ප්‍රාකාරවලයෙන් පරික්ෂිප්ත කනක රජතෙඳුනිල ස්ඵටිකාදියෙන ප්‍රකාර විමාන මාලාවෙන් සමලංකෘතය.

එතුවරට පූර්ව දික්හි සප්තරත්න ප්‍රාකාර ගෝපුරයෙන් වට කරණ ලද දහසක් යොදුන් නන්දන වන නම් උද්‍යානයෙක් ඇත. ඒ උද්‍යානයටත් නුවරටත් දෙඅතුරෙහි පණස් පනස් යොදුන් නන්ද නම් චුල්ලනන්ද නම් පොකුණු දෙකෙක් ඇත. ඒ පොකුණු තීරයෙහි කඳලි මුව සම් සෙසින් ස්පර්ශ දෙන්නා වූ නන්ද නම් චුල්ලනන්ද නම් රුවන් ගල්තල දෙකෙක් ඇත—දක්ෂිණ දික්හි සප්ත රත්නප්‍රකාර ගෝපුරයෙන් පරික්ෂිප්ත පන්සියයක් යොදුන් පමාණ සහ නම් උද්‍යානයෙක් ඇත. ඒ උද්‍යානයටත් නුවරටත් දෙඅතුරෙහි පණස් පණස් යොදුන් භද්‍රා නම් සුභද්‍රා නම් පොකුණු දෙකෙක් ඇත. ඒ පොකුණුතීරයෙහි සැපපහස් දෙන්නා වූ පණස් පණස් යොදුන් භද්‍රා නම් සුභද්‍රා නම් රුවන් ගල්තලා දෙකෙක් ඇත. පශ්චිම දික්හි සප්ත රත්න ප්‍රාකාර ගොපුරයෙන් පරික්ෂිප්ත පන්සියයක් යොදුන් චිත්‍රලතා නම් උයනෙක් ඇත. ඒ උයනටත් නුවරටත් දෙඅතුරෙහි පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ලචිත්‍රා නම් පොකුණු දෙකෙක් ඇත. ඒ පොකුණු තීරයෙහි තෙහෙල් මුවසම් සෙසින් මුඛ ස්පර්ශ දෙන්නා වූ පණස් පණස් යොදුන් චිත්‍රා නම් චුල්ල චිත්‍රා නම් රුවන්ගල් තලා දෙකෙක් ඇත.

උතුරුදික්හි සප්ත රත්නප්‍රාකාර ගෝපුරයෙන් පරික්ෂිප්ත පන්සියයක් යොදුන් මිශ්‍රක නම් උයනෙක් ඇත. ඒ උයනටත් නුවරටත් දෙඅතුරෙහි පණස් පණස් යොදුන් ධර්මා නම් චුල්ල ධර්මා නම් පොකුණු දෙකෙක් ඇත. ඒ පොකුණු තීරයෙහි සැපපහස් දෙන්නා වූ පණස් පණස් යොදුන් ධර්මා නම් චුල්ල ධර්මා නම් රුවන්ගල් තලා දෙකෙක් ඇත. ඒ නුවරට ප්‍රාචීනොත්තර කණ්ණයෙහි සප්ත

රත්න ප්‍රාකාර ගෝපුරයෙන් පරිශෝභිත සත්දහස් යොදුන් මහා වන නම් උයනෙක් ඇත. ඒ උයන හා නන්දා නම් උයන අතු රෙහි සත්රුවන්මය දහසක් කූටාගාරවලින් හෙබියාවූ සියක් යොදුන් පමණ සුරතනදු නම් පොකුණෙක් ඇත.

ඒ නුවර මැද රත්නමය ධජපන්ති උස්වලිත වූ සප්තරත්න මය සත්සියයක් යොදුන් උස ඇති වෛජයන්ත නම් ප්‍රාසාදයෙක් ඇත. ඒ ප්‍රාසාදයෙහි හාත්පසින් නගන ලද සවණ්ණයෂ්ටියෙහි ඉඳුනිලමාණික්‍යමය ධවජයෝ වූහ. ඉඳුනිලමාණික්‍යමය යෂ්ටියෙහි සවණ්ණමය ධවජයෝ වූහ. ප්‍රවාලමය යෂ්ටියෙහි මුකුතාමය ධවජයෝ වූහ. මුකුතාමය යෂ්ටියෙහි ප්‍රවාලමය ධවජයෝ වූහ. සත්රත්නමය යෂ්ටියෙහි සත්රත්නමය ධවජයෝ වූහ. එහි කිමි ඉඳුනිලමාණික්‍ය මය වැම් ඝනරත්නමයය. කෝතුඛු පේතඛ රිදීමයය. ව්‍යාඝ්‍රපන්ති ප්‍රවාලමයය. මුත්තැස් ගොනැස් සත්රුවන්මයය. පලසේ මිණිරත් මයය. එහි සියක් පමණ මහල් ඇත. එකි එකි මාලෙහි සත්සිය යක් සත්සියයක් බැගින් සැත්තෑ දහසක් රුවන් ගබඩා ඇත. එකි එකි ගබඩාවෙහි සත් සත් දිව්‍යාඞ්ගනාවන් බැගින් සාරලක්ෂ අනූ දහසක් ඔහට වලඳහ වූ දෙවඟනෝ වෙසෙති. එකි එකි දිව්‍යාඞ්ග නාවන් මල්සුවඳ පලඳවා සරහන සත් සත් පරිවාර සත්‍රීන් බැගින් සුනිස්ලක්ෂ තිස්දහසක් පිරිවර දිව්‍යාඞ්ගනාවෝ වෙසෙති. මෙසේ ඒ එක වෛජයන්ත නම් මහපාසාදයෙහිම එකුන් සතළිස් ලක්ෂ විසිදහසක් පමණ වල්ලභ දෙවතාවෝ වෙසෙති. ඒ ප්‍රාසාදයට පූර්ව දික්හි සත්රත්නප්‍රකාර ගෝපුරයෙන් පරිශෝභිත වූ නන්දාපුෂ්කරණී නම් උද්‍යානයක් ඇත. ඒ උද්‍යානයෙහි බොල පස්යොදුන් වට පස්ලොස් යොදුන් උස පණස් පණස් යොදුන් කඳ ඇති පාරිච්ඡත්තක නම් දිව්‍යවෘක්ෂයෙක් ඇත. ඒ වෘක්ෂයෙහි ශාඛාග්‍රයද සතර ශාඛාවද පණස් පණස් යොදුන් මූල පටන් ශාඛාග්‍රයට සියක් යොදුන පූර්වදික් ශාඛාග්‍රය පටන් පශ්චිමදික් ශාඛාග්‍රයට සියක් යොදුන් දක්ෂිණදික් ශාඛාග්‍රය පටන් උත්තර දික් ශාඛාග්‍රයට සියක් යොදුන ශාඛාමණ්ඩලය තුන්සියයක් යොදුන ඒ වෘක්ෂය සුපුස්පිත කල්හි කුසුමප්‍රභා පණස් යොදුන් තැන් පැතිර සිටී. සුවඳ සියක් යොදුනෙහි පැතිර සිටී. ඒ වෘක්ෂ මූලයෙහි දිග සැටයොදුන් පුළුල පණස් යොදුන් බොලපසළොස් යොදුන් උන් කලම තාභිය දක්වා ගැලී යන්නාවූ නැගිසිටිකල හෙරිහලයක්සේ සමව කැමති කැමති සෘතුවක් දෙන බන්ධුජීව කුසුමදල ආස්තරණයක් සේ රත්වූ පඬුකඹල නමිවූ ශෛලාසනයෙක් ඇත. ඔහු සම්බුදුවරයෝ එහි වැඩ හිඳ විජම් දෙසති.

ඒ ප්‍රාසාදයට උතුරුදිග සුධම්මා නම් දෙවි සභාවෙක් ඇති එහි භූමිය ඉන්ද්‍රනීලමාණික්‍යමය ය. හිත්තිස්ඵටික මාණික්‍යමය ය. සප්තඝණරත්නමය ය, ඝටිකා, රජතමය ය, ව්‍යාඝ්‍රපනතිප්‍රවාලමය ය, දූවගෝනෑස්මුත්තෑස් සප්තරත්නමය ය, අනන්තඝ්ජනය ඉන්ද්‍රනීල මාණික්‍යමය ය, බහිස්ඝ්ජනය, ඝණකනකමය ය, ස්තූපිකාව, රජතමය ය, ආයාම විස්තාරයෙන් තුන්සියක් තුන් සියක් යොදුන, වට නවසියක් යොදුන, උස පන්සියක් යොදුන, දෙදෙවිලොව එයට වඩනා රම්‍ය තැනෙක් නැත. දෙවතාවෝ ඒ සභාවෙහි රැස්වෙනකල පාරිඡත්තකකුසුමොත්සවයට රැස්වෙත් මය. විනිශ්චයට රැස්වෙත්මය. භික්ෂූන් වස් එලෑඹෙන කල රැස්වෙත් මය. පවුරුණු කලද රැස්වෙත්මය. දෙවියෝ දවස්පතා පාරිඡත්තක වෘක්ෂයට ගොස් බලන්නාහු, එහි පත් විලිකුන්කල මද දවසකින් වැම්මෙයි කියා, උත්සව ක්‍රීඩා කෙරෙති. පත් වගුලකලමද දවසකින් අන්කුරලයි, සතුටුව කෙලිති. අංකුර මූකල මද දවසකින් කැකුළුගණී, සතුටුව කෙලිති. කැකුළු ගත් කල මද දවසකින් මුකුලිත වෙයි, සතුටුව කෙළිති. මූකුලිත වූ කල මද දවසකින් සුපුස්පිත වෙයි, සතුටුව උත්සව ක්‍රීඩා කෙරෙති. ඒ වෘක්ෂය සුපුස්පිත කල්හි මල් බිඳිනා නිසා වෘක්ෂයට නැගෙන කෘත්‍යයෙක් නොද ඇත. මල් කතුරු ගෙණ අතු නමන කෘත්‍යයෙක් නොම ඇත. මල් බිඳලන පෙට්ටි පුළුළු ලවන කෘත්‍යයෙක් නොම ඇත. එක් සුළඟෙක් නැගී මල් තුවටුයෙන් ගලවයි. එක් සුළඟෙක් මල් ගෙණ සිටවී, එක් සුළඟෙක් මල් සුවඳ, සුධම්මා නම් දෙව්සභාවට ගෙණ වදිදී, එක් සුළඟෙක් එහි මල් පරණලා ගැමද ගෙණ යෙයි. එක් සුළඟෙක් එහි පෙනී කෙසරුකෙම් රදවමින් මල් අතුරයි. මඛ්‍යයෙහි ධර්මාසනයෙක් වෙයි. ඒ ධර්මාසන මස්තකයෙහි ශෝදනක් උස රත්න පය්‍යාංකයෙක් වෙයි. ඒ පය්‍යාංක මස්තකයෙහි තුන් ශෝදනක් උස දිව්‍යසේවතඡත්‍රයෙක් වෙයි. ඒ ධර්මාසන සමීපයෙහි ශක්‍රදේව රාජයාගේ අස්තෙක් වෙයි. ඉක්බිති දෙතිස් දිව්‍යපුත්‍රයන්ට අසුන් පණවති. ඉක්බිති මහානුභාව දෙවියන්ට අසුන් පණවති. සෙසු දෙවියන්ට පරසතුමල් කෙම්ම අසුන් වෙයි. එහි සුගන්ධ මකරන්දරෙණු කර්ණිකා මඬලයෙහි පැහැර බැස දෙවතාවන්ගේ තුන්ගවු උස ඇති ඝනකවණී ශරීරය ලාඝාරස පරිසේකයක් මෙන් තවරයි. ඒ ධර්මාසනයෙහි සනත්කුමාර නම් මහාබඹ හෝ අවුත් හිඳ බණ කියති. බණ දන්නා රහත් මහ තෙර කෙනෙක් හෝ ගොස් හිඳ බණ කියති. සක්දෙවිරජ හෝ බණ කියයි. සනත්කුමාර නම් මහබඹහු බණ කියන කල පවසිඛ දිව්‍යපුත්‍රයාගේ වේශය ගෙණ හිඳ බණ කියා කුමක් පිණිසදයත් ඒ පවසිඛ නම් දිව්‍යපුත්‍රයා තුන් ගවුවක් පමණ රන්කඳක් සේ

දිලියෙන්නා වූ ආත්මභාව ඇත්තේය. දහසක් ගැල් පමණ පලදනා පැලඳ යෙල යාලක් සුවඳ කලලින් විලවුන් ගෙණ රත්වූ දිව්‍යමය පිළි ඇඳ රක්ත කුඩලාභරණාදීන් විභූසිතව ඉසකේ පස් කොඩයක් කොට බැඳ ඇවිදින්නේය. හැම දේවතාවන්ට ප්‍රියය. එසේ හෙයින් ඌගේ වේශය ගෙණ ඉඳ බණ කියති.

දේවතාවන් සුධර්මා නම් දෙව්සභාවෙහි **රැස්වන්නාම**, ධෘතරාෂ්ට්‍ර නම් වරම් මහරාජයා කෙළ ලක්‍ෂයක් රජතපලඟ හා ඤාණමය අඩයටිගත් ගාන්ධර්ව දිව්‍යරාජයන් පිරිවරා පුවිදින්හි ආරක්‍ෂා ගන්නී—විරූළ්හක නම් මහරාජයා කෙළ ලක්‍ෂයක් මාණික්‍යය පලඟ හා රජතමය අඩයටිගත් කෙළ ලක්‍ෂයක් කුම්භාණ්ඩ පිරවරා දක්‍ෂිණ දික්හි ආරක්‍ෂා ගන්නී—විරූපාක්‍ෂ නම් මහාරාජයා ප්‍රවාල පලඟ හා ඤාණමය අඩයටිගත් කෙළ ලක්‍ෂයක් නාග හවයන් පිරිවරා පශ්චිම දික්හි ආරක්‍ෂා ගන්නා—වෛශ්‍රවණ නම් මහාරාජයා කෙළ ලක්‍ෂයක් මාණික්‍යය පලඟ හා ඤාණමය අඩයටියත් කෙළ ලක්‍ෂයක් යක්‍ෂ හවයන් පිරිවරා උත්තර දික්හි ආරක්‍ෂා ගන්නී.

මෙසේ ආරක්‍ෂා ගත් දෙවතාවන්ගේ කුසුමොත්සව ක්‍රීඩා සාරමසකින් නිමයි. පෘථිවිතලයෙහි පටන් ගෙණ කල්පවෘක්‍ෂ දිව්‍යාඛනාවන් නිසා දෙවතාවන් ඔවුනොවුන් හා කරණ්ඩ ශක්‍රදෙවෙන්ද්‍රයා සන්සිඳුවයි. දෙවතාවන්ගේ දූ ද, පුත්හු ද ඕපපාතිකව ඇතෙහි උපදිති. පාදපරිවාරිකාවෝ යහන්හි උපදිති. ඔවුන් පලඳනා පලඳවා සරහන දෙවතාවෝ යහන සිසාරා උපදිති. මෙහෙ කරණ දෙවතාවෝ ඇතුළු විමානයෙහි උපදිති. ඔවුන් නිසා කරණ විනිශ්චයෙක් නැත. යම් කෙනෙක් යම් දෙදෙනෙක්හුගේ සීමාන්තරයෙහි උපන්නෝ නම් ඔවුන් නිසා විනිශ්චය කෙරෙති. ඒ ශක්‍රදෙව රාජයා අසා යුක්ති නිශ්චය කොට දෙයි. මෙසේ විනිශ්චයද ඒ සුධර්මා නම් දෙව්සභාවෙහි පවත්නි. නිෂ්ක්‍රූන් වස් එලැඹෙන දවසුත් රැස්වෙත්මය. පවරණ දවස් රැස්වූ දෙවතාවෝ අද කොයි ගොස් කා කෙරෙහි පවරමෝ දෙහෝසි කතා කෙරෙති. ඔවුන් කෙරෙන් බොහෝ සේ ශක්‍ර දෙව රාජයා පොහොතු දිවසිතට හෝ ලක්දිවට හෝ ගොස් පවරා දුගොප් මහබෝ වදී. සෙසු දෙවතාවෝ පාරිච්ඡත්තක කුසුමාදී වූ දිව්‍ය කුසුම හා දිව්‍ය වන්දනවූර්ණ ගෙණ තම තමන්ගේ රජ්ජිතස්ථානයට ගොස් පවරා මහබෝ වඳිති. ශක්‍රදෙව රාජයා දෙවතාවන් රැස්වන පිණිස මාගේ එක්සිය විසිරියන් ඒජයෝත්තර සංඛ්‍ය එක වරෙක නාද කෙරෙවයි සිත හා පැවති ඒ සංඛ නාදය සියලු දසදහසක් යොදුන් සක් පුරයෙහි පැතිර සාර ඔසකින් සන්හිඳෙයි.

මෙසේ විචිත්‍රවූ ශක්‍ර පුරයෙහි ඒක රාජ්‍යය කරන්නාවූ ශක්‍ර දෙව රාජයෝ උද්‍යාන ක්‍රීඩාවට යන වේලෙහි ධෘතරාෂ්ට්‍ර නම් මහා රාජයා පැදුම්දිග සක්වළමේරුව තමාගේ සේනාව පිහිටුවා රජතමය ඛඩ්ගදරු කෙළ ලක්ෂයක් ගාඛිඹි දිව්‍ය හටයන් පිරිවරා, හාත්පසින් කෙළ ලක්ෂයක් තන්හි රජත දඬදිපිකා දැරූ අත් ඇති ශ්වේත වස්ත්‍රාලංකාරයෙන් සැදි ශ්වේත අශ්වරාජයකු පිටට පැන නැඟී යුගදුරු මුදුනෙහි ප්‍රාචීනදික්හි ආරක්ෂා ගන්නී – විරූල්හක නම් මහා රාජයා දකුණු සක්වළ මේරුව තමාගේ සේනාව පිහිටුවා අසිතොමර ගන්නි ලෝහිත්ථල දලංකාර ඛඩ්ග දරූ කෙළ ලක්ෂයක් තන්හි රන්මයදඬ දිපිකා දැරූ අත් ඇතිව නිල වස්ත්‍රාලංකාරයෙන් සැරසී නිල අශ්වරාජයකු පිටට නැඟී යුගදුරු ගල් මුදුනෙහි දක්ෂිණ දික්හි ආරක්ෂා ගන්නී--විරූපාක්ෂ නම් මහ රාජයා පැලඳිග සක්වළ මේරුව තමාගේ සේනාව පිරිවරා ප්‍රවාල මය ඛඩ්ග දරූ කෙළ ලක්ෂයක් නාග හටයන් පිරිවරා හාත්පසින් කෙළ ලක්ෂයක් තන්හි ප්‍රවාලමය දඬ දිපිකා දැරූ අත් ඇතිව රක්තවර්ණ වස්ත්‍ර රක්තවර්ණාලංකාරයෙන් සැදි ප්‍රවාලවර්ණවූ අශ්වයකු පිටට නැඟී යුගදුරු ගල් මුදුනෙහි පශ්චිම දික්හි ආරක්ෂා ගන්නී--වෛශ්‍රවණ මහා රාජයා උතුරුදිග් සක්වළ මේරුවෙහි තමාගේ සේනාව සිටුවා කනකමය ඛඩ්ග දරූ කෙළ ලක්ෂයක් යක්ෂ හටයන් පිරිවරා හාත්පසින් කෙළ ලක්ෂයක් තන්හි කනක මය දඬ දිපිකා දැරූ අත් ඇතිව සවර්ණ වස්ත්‍රාලංකාරයෙන් සැදි සවර්ණවර්ණ අශ්වයකු පිටට නැඟී යුගදුරු ගල් මුදුනෙහි උතුරු දික්හි ආරක්ෂා ගන්නී.

සුධර්ම නම් ගාඛිඹි දිව්‍යපුත්‍රයෙක් සම්පඤ්ඤ නම් හෙරියක් කරලා අටසැට දහසක් හෙරින් විසින් පිරිවරණ ලදුව නොයෙක් දහස් ගණන් දිව්‍යනාටකයන් හා සමග අවට පණස් යොදුන් තන්හි මඩුලු බැඳ ප්‍රාචීනව කටාට මස්තකයෙහි ගායනා කෙරෙති.

නිඔරු ගාඛිඹි දිව්‍යපුත්‍රයෙක් ඒකාප්‍රමුඛ නම් හෙරියක් කරලා අටසැට දහසක් හෙරින් විසින් පිරිවරණ ලදුව නොයෙක් දහස් ගණන් නාටකයන් හා සමග අවපණස් යොදුන් පමණ තන්හි මඩුලු බැඳ දක්ෂිණ වක්‍රවාල මුඛවට්ටියෙහි ගායනා කෙරෙති. දික් ප්‍රමුඛ නම් ගාඛිඹි දිව්‍යපුත්‍රයෙක් මහාභාඩ නම් හෙරියක් කරලා අටසැට දහසක් හෙරින් විසින් පිරිවරණ ලදුව නොයෙක්

දහස් ගණන් දිව්‍ය නාටකයන් හා සමග අවට පණස් යොදුන් තන්හි මඩුලු බැඳ පශ්චිම මුඛවට්ටියෙහි ගායනා කෙරෙයි. පවසිධ නම් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෙක් පුෂ්පවර නම් හෙරියක් කරලා අටසැට දහසක් හෙරින් විසින් පිරිවරණ ලදුව නොයෙක් දහස් ගණන් දිව්‍ය නාටකයන් හා සමග අවට පණස් යොදුන් තන්හි මඩුළු බැඳ උතුරු සක්මළු මුවවිට සිට ගායනා කෙරෙයි.

මෙසේ හෙයින් සතරපාර්ශ්වයෙහි සතරවරම් මහරාජයන් විසින් ගත් ආරක්ෂා ඇතිව හාත්පසින් දක්වන ලද නාට්‍යගීත වාද්‍යාදීන් දැක අසා සතුටුවෙමින් ශක්‍රදෙව රාජයා උද්‍යාන ක්‍රීඩාවට යන්නේය. ඇතැම් කලෙක්හි විශ්වකර්ම නෙර්මිත නාරිවාහන ඇති රත්න මණ්ඩපයකින් යෙයි. ඇතැම් කලෙක්හි දිව්‍ය අඟවියන් දහසක් ගෙදු පවවණී ධවජපතාවන් ගැවසීගත් ගෙල සියයක් යොදුන් වෛජයන්ත නම් සත්රුවන් රථයකින් යෙයි. ඇතැම් කලෙක්හි වෙරාවණ නම් හස්තිරාජයාගේ දිග ගෙල සියයක් යොදුන් උස අනු යොදනක බොල පස් යොදුන බහුගේ තෙනිස් කුම්භයෙක් වෙයි. එකි එකි කුම්භයෙක්හි දිගින් පණස් පණස් යොදුන් සත් සත් දළෙක් වෙයි. එකි එකි දළෙක්හි සත් සත් පුෂ්කරණීහු වෙති. එකි එකි පුෂ්කරණියෙක්හි සත් සත් නෙළුඹු ලියවෙයි. එකි එකි ලියෙක්හි සත් සත් පියුම් වෙයි. එකි එකි පියුමෙක්හි සත් සත් පෙති වෙයි. එකි එකි පෙත්තෙහි සත් සත් කම්මිත්තන් පිරිවරා සත් සත් දෙවඟනෝ සිට නටති. මෙසෙයින් සැදී ඇත් රජු පිට දිග පණස් යොදුන් උස පසළොස් යොදුන් රත්න මණ්ඩපයෙක් වෙති. මණ්ඩපයෙහි සුදර්ශන නම් මහා කුම්භයේ දෙළොස් යොදුන් රත්න මණ්ඩපයෙක් වෙයි. ඒ මණ්ඩපයෙහි සාසූදහසක් රත්න සප්තමයෙහි. එකි එකි සප්තමයන් වැලඳි සත් සත් රත්න කුසුමලතා වෙයි. උඩද අනේක සහස්‍ර මාලාදාමලතිකා වෙයි. අතරතුරෙහි සත්රුවන්මය ධවජපතති වෙයි. ඒ ඒ ස්ථානයෙහි ලම්බමාන මාණික්‍යාමය කිංකිණිඝ ජාලා වෙයි. ඒ ජාලාවෝ මඳ මාරුතයෙන් පහරණ ලද කල්හි පවාගික තූර්‍යරාවයෙන නාද කෙරෙති. ඒ මණ්ඩපයාගේ අවට මාණික්‍යාමය වෙදිකා වෙයි. පිටත ආයුධ ගත් අත් ඇතිව අවවියියක් සෙනෙවියෝ සිටිති. ඒ වෙදිකාවෙන් ඇතුළත දෙවරාජයා කෙරේ වලඳන වූ මහානුභාව දෙවියෝ සිටිති.

දෙපාර්ශ්වයෙහි දෙනිස් කුම්භ පිහිටි රත්න මණ්ඩපයෙහි දෙනිස් දෙවරජහු හිඳිති. මධ්‍යයෙහි සුදර්ශන නම් මහා කුම්භයෙහි පිහිටි දෙළොස් යොදුනක් රත්න මණ්ඩපයෙහි යොදනක් පමණ මාණික්‍ය පර්‍යාංකයේ තුන් යොදනක් උස

රුවන් සේසත යට ගැලක් පමණ ආභරණ පැලඳ ගැලක් පිරූ සුවඳ ගල්වා අහසගිරි වෙහෙර සා තෝඩු දෙකක් පැලඳ මහවැලි ගඟ සා මුත්හරක් කරලා මෙසේ සම්භාරණයෙන් විභූසිතව ශක්‍ර දෙවේන්ද්‍රයා හිඳිනේය. ශක්‍රදේව රාජයාගේ සුධම්මා නම් භාග්‍යවතී දිව්‍යාභරණයෙන් සර්ජිතව නොයෙක් ලක්ෂ ගණන් දිව්‍යඛනාවන් පිරිවරා අභිමුඛයේ හිඳිනීය. ඒ පරිද්දෙන්ම සුජාතා නම් භාග්‍යවතී ද නඳු නම් භාග්‍යවතී ද චිත්‍රා නම් භාග්‍යවතී ද දිව්‍යාභරණයෙන් සම්සර්ජිතව දිව්‍යාඛනාවන් පිරිවරා දක්ෂිණ පාර්ශ්වයෙහි වාම පාර්ශ්වයෙහි පිටිපස්සෙහි යසි යන තුන් දිශාවෙහි හිඳිති. වල්ලභ වූ දෙයානු දහසක් සක්දෙවිඳු සම්භාරණ විභූසිතව රත්නාසවිකා ආදි වූ පානීය භාජන ගෙණ සිටිති. නොයෙක් දහස් දිව්‍ය නාට්‍යාවෝ පූර්ණචාලස් ගෙණ පිරිවරා සිටිති. නොයෙක් දහස් සුරසුන්දරිහු වාද්‍යාභයෙහි නටති. අලඹුසාදි වූ ප්‍රධාන දිව්‍යනාටක යක්‍ෂීන් හෙරෙහි ගඟිරා නම් දෙවිදුවක් මහාවීණා නම් වීණාවක් ගායනා කෙරෙමින් සිටී. ඒ වීණාවට පරිවාර සැටදහසක් වීණා තෙමේ නාද කෙරෙති. සුසාම නම් සුර සුන්දරියක් සුන්දරාරව නම් වංශියක් පිඹ පිඹ සිටී. එවංශියට පරිවාර සැටදහසක් වංශි තෙමේම නාද කෙරෙයි. අහත්‍යාරියා නම් දෙවිදුවක් මධුරස්සර නම් නකුල වීණාවක් ගායනා කෙරෙමින් සිට ගන්නී. ඒ වීණාවට සැටදහසක් පරිවාර වීණා තෙමේම නාද කෙරෙයි. මණිමේඛලා නම් දෙවිදුවක් විජයොත්තර නම් සංඛයක් පිඹ පිඹ සිටී. එම සංඛයට පරිවාර සැටදහසක් සංඛ තෙමේම නාද කෙරෙයි. මනොහර නම් දෙවිදුවක් පෘථුවිබිඹ නම් මෘදඟහෙරියක් ගස ගසා සිටී. ඒ හෙරියට පිරිවර සැටදහසක් හෙරි තෙමේම නාද කෙරෙයි. අනිවර්තිකා දෙවිදුවක් ආනන්ද ජනකා නම් මෘදඟ හෙරියක් ගස ගසා සිටී. ඒ හෙරියට පිරිවර දහසෙක් හෙරි තෙමේම නාද කෙරෙයි. නඳු නම් දෙවිදුවක් කොඉලසවර නම් වීණාවක් ගායනා කෙරෙමින් සිටී. ඒ වීණාවට පරිවාර සැට දහසක් කොඉලසවර වීණා තෙමේම නාද කෙරෙයි. මන්තකී නම් දෙවිදුවක් දිසාප්‍රමුඛ නම් එකාවජ්ඣ හෙරියක් ගස ගසා සිටී. ඒ හෙරියට පරිවාර සැටදහසක් එකාවජ්ඣ හෙරි තෙමේම නාද කෙරෙයි. යාම නම් දෙවිදුවක් චිත්‍රපුත්‍රකාර නම් පටහයක් ගසා ගසා සිටී. ඒ පටහයට පරිවාර සැටදහසක් පටහ තෙමේම නාද කෙරෙයි. සොරස්සර නම් දෙවිදුවක් මධුරස්සර නම් මණි පවියක් ගස ගසා සිටී. ඒ මණි පවියට පරිවාර සැටදහසක් මණි පවි තෙමේ නාද කෙරෙයි. සම්මොඛසොහනා නම් සුර සුන්දරියක් දිබ්බඝොසා නම් මහා හෙරියක් ගස ගසා සිටී. ඒ හෙරියට පරිවාර සැටදහසක් හෙරි තෙමේම නාද කෙරෙයි.

මෙසෙයින් නොයෙක් දහස් ලක්ෂ සුර සුන්දරිහු නා නා නාමයෙන් විශිෂ්ටවූ ආතතය, විතතය, ආතතවිතතය, ඝනය, සුසිරය, ඝන පවාහිත තුර්‍යධ්වනි හෙණ ගස්ගසා සිටිති. එකී එකී තුර්‍යයට පරිවාර සැටදහසක් තූර්‍යධ්වනි තෙමේම නාද කෙරෙයි මෙසෙයින් දෙදෙවිලොව දේවතාවන් අනුගතව ලෝකපාලයන් විසින් ගත් ආරක්ෂා ඇතිව අවවියි යක් සෙනෙවියන් පමුණුවන දිව්‍යසේනාව හා සමග සත්රුවන්මය කලසාදි සලිල හාජන දරු අඩු තුන් සොළක් පුරසුන්දරීන් විසින් පිරිවරණ ලදුව සුවිසිසොළක් දිව්‍ය නාටකයන්ගේ නෘත්‍යගීත වාදනයෙන් සහතුෂ්ටවෙමින් උද්‍යාන ක්‍රීඩාවට ගොස් ඒකපුඩරීක නම් උද්‍යානයට වැද වාක් විෂය නොවන්නාවූ උද්‍යාන ශ්‍රී අනුභව කොරෙමින් රිසිහුන්ද කලක් එහි වැස නැවත වෛජයන්ත නම් ප්‍රාසාදයට යන්නේය.

මෙසේ වූ දිව්‍යරාජ ශ්‍රී සම්පත්තියට පැමිණ ශක්‍ර දිව්‍යරාජ ද තුන්කෙළ සැවිලක්ෂයක් අවුරුදු මුළුල්ලෙහි දිව්‍යසම්පත් අනුභව කරන්නේයි. මේ ශක්‍ර සම්පත් ආදි දෙදෙවිලොව දිව්‍යසම්පත්තියට ද බුඬානුශාසනාවන්ගේ ශ්‍රවණ ධාරණාදියෙහි යෙදුන සත්වයෝ පැමිණ එහි නොයෙක් දිව්‍යසම්පත් විඳිනාහුයි. තවද,

ඉතොපපභූති දෙවෙසු, රාජූනං විහවෝ පන,
තසකකාහොති වණ්ණෙතුං අබ්බෙන යතෝ තතෝ,
තස්සායුනානුමානෙන විඤ්ඤුදයෙය්‍යව සුබෝදයෝ.

යනු හෙයින් මෙතැන් පටන් යාම දෙවලොව ආදි සෙසු දිව්‍යලෝකවල දිව්‍යරාජයන්ගේ දිව්‍යසම්පත් වනාහි යම් හෙයකින් බුදු නොවූ අන්කිසිවක්හු විසින් වර්ණනා කරන්ට නොහැකි වේ ද, එහෙයින් එහි ආයුඃප්‍රමාණ දැක්වූ කල ඒ ක්‍රමයෙන් සියලු සම්පත් ද, එකිනෙකට වැඩි ගිය බව බලා අනුමානයෙන් සියළු දිවසැපත පහළවීම මහත් බව දත යුත්තේය. එහි තුන්වෙනි යාම නම් දෙවිලොව උපන්නාවූ බුඬානුශාසනා ශ්‍රවණ ධාරණාදියෙහි යෙදුන සත්වයෝ මිනිස්ලොව ආයු ගණනින් තුදුස් කෙළ සතළිස් ලක්ෂයක් අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභව කොට ඒ සියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘත වන්නාහුයි. එසේම සතරවෙනි තුසිත පුර දෙවිලොව උපන්නාහු විසින් ලොව ආයු ගණනින් සත් පණස් කෙළ සැටලක්ෂයක් අවුරුදු එහි දිව්‍ය සම්පත් අනුභව කොට ඒ සියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘත වන්නාහුයි. එසේ ඒ පස්වෙනි නිම්මාණරති දෙවිලොව උපන්නාහු ඒ මිනිස්ලොව ආයු ගණනින් දෙසිය සතළිස් ලක්ෂයක් අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභව කොට ඒ සියළු දිව්‍යසම්පත්තියෙනුදු අලංකෘත වන්නාහුයි.

එහේම සවෙනි පරනිර්මිත වසවර්ති දෙව්ලොව උපන්නාහු එහි මිනිස්ලොව ආයු ගණනින් නවසිය එක්මැසි කෙළ සැට ලක්ෂයක් අවුරුදු එහි දිව්‍යසම්පත් අනුභව කොට අප්‍රමාණවූ ඒ දිව්‍යසම්පත්තියෙනුදු තෙමේම අලංකෘත වන්නාහුමයි.

මෙසේ බුඩානුශාසනා ශ්‍රවණයෙන් දශ කුශලධර්මයෙහි හැසුරුණු සත්වයෝ සදෙව්ලොව නැවත නැවත අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ඉපද බොහෝ දීර්ඝකාලයක් රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යසංඛ්‍යාත දිව්‍යවූ පඤ්චකාමසැප අනුභවකෙරෙමින් සතුටු වන්නාහුමයි.

මේ සදෙව්ලොව දිව්‍යසම්පත් මහත්බැව් කෙසේදැයි කිව හොත්.

සග්ගෙසුහෙට්ඨිමසුඛං චක්කවත්තිසුඛෙනහි,
පාණිමත්තඤ්චපාඨානං හිමවන්තසමංමතං.

යනුහෙයින් දෙව්ලොව අතුරෙහි හැමට පාතවූ චාතුම්හා රාජිකයෙහි හැමටම අඩු ඉතා දිලිඳු දුප්පත් දෙවියෙකුගේ දිව්‍ය සැප එඤ්ඡවිසැපයට කියනලද ක්‍රමයෙන් මිනිස්ලොව අති විසාර වශයෙන් චක්‍රවර්තිරාජ්‍යසැපය හා සදෘශකොට උපමා කරත්ගොත් හුන්දහසක් යොදුන් හිමාලපර්වතයට අවුත් ලාඤ්ඡා සවල්ප ගල්කැටක් උපමාකිරීමවැන්න. එහෙයින් සදෙව්ලොව දිව්‍යසම්පත් උපමාවකින්වත් නොදැක්විය හැකි මහත්බව දතයුතු මේ සියළු දිව්‍ය සම්පත්තියවද බුඩානුශාසනා ශ්‍රවණ ධාරණාදියෙහි යෙදුනු සත්වයෝ පැමිණෙන්නාහුයි—"එවරූපං කාම භව සම්පත්තිං අනුභවිත්වා රූප භවසම්පත්තිම්පි අනුභවිතු කාමෙන උපාසකජනෙන"—යනාදි උපාසක ජනාලංකාරයෙහි කී හෙයින් මෙබඳුවූ උපමා විශයාතික්‍රාන්ත අග්‍රවූ පව කාමසම්පත් අනුභව කොට රූප භවසම්පත්තියද අනුභව කරණ්නැකැමැති උපාසකෝ පාඨිභා ජනයන් විසින්.

පියොවගරුභාවනීයෝ චිත්තාවවවත්තකඛමෝ,
ගම්භීරඤ්චකථංකත්තා නොවඨානෙ නියොජයෙ-නි

මේආදී කල්‍යාණගුණ සම්පාවිත යහපත් කල්‍යාණ මිත්‍රයෙකු කරා පැමිණ විසුබ්මාගියෙහි කී ක්‍රමයෙන් වර්තානුකූල කම් සථානයන් ගෙණ භාවනාවිභාගානිසංස කී තැනද ප්‍රකාශ ක්‍රමයෙන් කාමවිජ්ඣදය. ව්‍යාපාදය, ථිනමිඛය උඛ්ඛච්චකුක්කුච්චය, විචිකිච්ඡාය, යන පඤ්චනීවරණ අකුසලධර්මයන් පහකොට චිත්තාභ

විවාරය ප්‍රීතිය සැපය සිත එකඟබවය යන පවාහයෙන් යුක්තවූ ප්‍රථමධ්‍යානාදිය වැඩියයුතු--එහි ප්‍රථමධ්‍යාන තිතියධ්‍යාන තෘතියධ්‍යාන යන මොහු ගින මධ්‍යම ප්‍රණීතවශයෙන් තුන්තුන් ප්‍රකාර වෙත්. මේ තුන්ධ්‍යානයන් හැවුමෝ බ්‍රහ්මපාරිෂද්‍යදී නව බඹතෙලෙහි උපදිත්.

ඒ කෙසේද යත්, ප්‍රථමධ්‍යානය උපන් පමණකින් ආසේවිත භාවිත බහුලීකෘත වශීප්‍රාප්ත නොවූයේ ගිනනම්වේ. බහුලීකෘත වසයෙන් වඩා වශිභාව අපරිපූර්ණව එතෙක් දෙකෙක් වශි ප්‍රාප්ත කළහොත් මධ්‍යමවෙයි. පවවශිතාප්‍රාප්තබල මහත් ප්‍රණීතනම්වෙයි. එහි පවවයිතාවෝනම්. ආවජ්ජනය, සමාපජ්ජනය, අධිට්ඨානය, උට්ඨානය, පවවවෙක්ඛනයයි යන මොහුයි. එයින් ප්‍රථමධ්‍යානය ගිනවබැමි නොපිරිහුන ධ්‍යානව ඛාලක්‍රියා කොට බ්‍රහ්මපාරිෂද්‍යනම් බඹලොව උපදිත්. එසේම මධ්‍යමව හැවුවෝ බ්‍රහ්ම පුරෝහිතනම් බඹලොව උපදිත්. ප්‍රණීතව හැවුවෝ මහාබ්‍රහ්මනම් බඹලොව උපදිත්. මේ බඹලොව තුණම සම බිමකවූ තුන්රවක්සේ සමව පිහිටියාහුයි. තිතිය ධ්‍යානයද කියනලද ක්‍රමයෙන් තුන්ප්‍රකාරව හැවුවෝ එසේම පිළිවෙළින් ප්‍රථමධ්‍යාන තුන්තලයට මතුයෙහිවූ පරිත්තාභය අප්පමාණාභය ආභස්සරය යන තුන්තලයෙහි උපදිත්. මේ තුන්තලයද, පළමුකි තුන්තලය සේ සමානතලයි. තෘතියධ්‍යානයද කියනලද ක්‍රමයෙන් හැවුවෝ එසේම තිතියධ්‍යාන තුන්තලයට මතුයෙහි පිහිටි පරිත්තසුභය, අපපමාණසුභය, සුභකිණ්ණය යන තුන්තලයෙහි එසේම පිළිවෙළින් උපදිත්, මේ තුන්තලයද පළමු කිවාසේම සමාන තලයි. චතුත්‍රිධ්‍යානය සංඥාවිරාගභාවනා වශින් පෘථග්ජනයන්ට උත්පත්තිස්ථාන වශින් සඞ්ඛ්‍යාදි ඉන්ද්‍රියන්ගේ භෙද වශින් හැවුවෝ මෙකී නවතලයෙන් මතුයෙහි පිහිටි වෙහප්ඵලනම් බඹලොව ආදිකොට ඇති මත්තෙහිවූ සත්තලයෙහි උපදිත්. මේ සත්තලයෙහි ආදිවූ බෘහත්ඵලනම් ලද තෙහප්ඵල අසංඥසත්ත් දෙතලය පළමු කිවාසේම සමානව පිහිටි බැවි වූයේය. මේ දෙතලයෙන් මත්තෙහි, අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සිය, අකනිෂ්ඨය යන පවශුඛාවාසය, එයට එයට මතු මතුව වූයේය. ආයතීයන්වම වාසසථාන හෙයින් සුඛාවාස නම් එහි පෘථග්ජන සත්වයෝ නූපදිත්. සෙසු බඹලෝවල උපදිත්මය. පව සුඛාවාස ඉන් මතුයෙහි අරූපබ්‍යාන හැවුවෝ උපදනා ආකාසානඤ්චා ඨතනය විඤ්ඤණඤ්චායතනය ආකිඤ්ඤයතනය නෙවසඤ්ඤ නාසඤ්ඤ ඨතනය, යන සතර අරූතලයද, එයට එයට මතු මතුවෙහි වූයේය. මේ සතර අරූතලයෙන් මතුයෙහි

සත්වාවාසයක් නැති හෙයින් අජටාකාස නම් වේ. වතුර්ධ්‍යාන ගෙහි හවාඞ්ග සිත් නැති උවහොත් ගෙහෙකැයි සිතා සඤ්ඤ විරාග භාවනා කළාහු අසඤ්ඤ සත්වයන් කෙරෙහි උපදිති ඔවුන්ට සිත් නොවූපදී. මිනිස් ලොවදී හෙව කාලක්‍රියා කළාහු ම තම් අසඤ්ඤ බඹලොව උපනද හොවිති. හිඳ කාලක්‍රියා කළාහු ම තම් එහිදූ හිඳිති. සිට කාලක්‍රියා කලාහු ම තම් සිටිති. එදෙවිලොව පිළිම රූ වැනි මය. එහි උපදනෝ කම්වාදී ක්‍රියාවාදී නිජීවකයහ. ඔහු මෙසේ වරදවා ගෙණ උපදිත්. නාස්ති හෙතුක අක්‍රියා දෘෂ්ටික නිජීවකයෝ වූකල අපායේ මිස අනික් තැනක නොඋපදිති. නරක ගති නියතයි. වතුර්ධ්‍යාන වඬා භාවනා කළ බුඬානු ශාසනාවෙහි පිහිටි බුඬ ශ්‍රාවකයෝද සවෙනි වෙහප්ඵල නම් බඹලොව උපදිත්. එම වතුර්ධ්‍යානය හැවූ අනාගාමිහු වූකල ශ්‍රද්ධා ඉන්ද්‍රිය අධික වුවහොත් ආශුද්ධිගුණානුභාවයෙන් පංචසුඛවාසයන් අතුරෙන් හැමට පාත අවිහ නම් බඹලොව උපදිත්. වීර්‍ය ඉන්ද්‍රිය අධික වුවහොත් අතපප නම් බඹලොව උපදිත්. සති ඉන්ද්‍රිය අධික වුවහොත් සුදස්ස නම් බඹලොව උපදිත්. සමාධි ඉන්ද්‍රිය අධික වුවහොත් සුදස්සි නම් බඹලොව උපදිත්, ප්‍රඥ ඉන්ද්‍රිය අධික වුවහොත් අකනිෂ්ඨ නම් බඹලොව උපදිත්. අරූපබ්‍රහ්ම යතරින් ආකාසානඤ්චායතනය හැවූවෝ ආකාසා නඤ්චායතන බඹලොව උපදිත්. විඤ්ඤාණඤ්චායතනය හැවූවෝ විඤ්ඤාණඤ්චායතන බඹලොව උපදිත්. ආකිංචඤ්ඤායතනය හැවූවෝ ආකිංචඤ්ඤායතන බඹලොව උපදිත්. නෙවසංඤ්ඤා නාසංඤ්ඤා යතනය හැවූවෝ නෙවසංඤ්ඤා නාසංඤ්ඤායතන බඹලොව උපදිත්. ගටකියන ලද අසඤ්ඤ සත්ව නම් බඹලොව රූපස්කන්ධය පමණක් උපදී සෙසු වෙදනාදි සතර කඳු නොඋපදින්. හැමට මතුගෙහිවූ අරූතල ඝනරෙහි උපන් බඹනට රූපස්කන්ධය පමණක් උපදී. සෙසු වෙදනාදි සතරකඳු නොඋපදිත්. හැමට මතුගෙහිවූ අරූතල ඝන රෙහි උපන් බඹනට රූපස්කන්ධය, නුපදී. ඉතිරි වෙදනාදි සතර කඳු උපදී. මේ දෙතැනින් පිටත උපදනා සත්තට පංචස්කන්ධයම උපදී.

මේ විසිබඹලොව ස්ත්‍රීහු ධ්‍යාන වඬා භාවනා කොට උපදින්මය. පුරුෂයෝ ධ්‍යානභාවනා කොට උපදින්මැයි. යටකී කාමභව ගෙහි ලා ස්ත්‍රීන්ට ස්ත්‍රීන්ද්‍රිය උපද්දී. පුරුෂයන්ට පුරුෂෙන්ද්‍රිය උපද්දී. බඹලොව උපන් කල වනාහි ඉන්ද්‍රිය දෙකම නොඋපද උපදී. එබැවින් බඹලොව ස්ත්‍රියහ පුරුෂයහ යන වෙනසෙක් නැත. හැම දෙන එකාකාර වෙත්. එයින් චුතව කාමාවචර භවයෙහි උපන්කල ස්ත්‍රීන්ට ස්ත්‍රීන්ද්‍රියවෙයි පුරුෂයන්ට පුරුෂෙන්ද්‍රිය වෙයි. අසංඥසත්වය තම් බඹතල උපන් බඹහු වස්ත්‍රාභරණයෙන් සැදුනු රූපකාය ඇතිවෙති. ආයුෂයෙනුත් අධික වෙත්. තුබූ පසලෝස්රූ බඹලොව

උපන් බඹහු වස්ත්‍රාභරණයෙන් සැදුනු රූපකායද ඇති වෙති. උදාන විමාන ආයුවණ් සැප යස ආදි ප්‍රත්‍යයාදීහුත් අධික වෙත්. අරූපලවල උපන් බඹහු ආයුෂය ආදි ප්‍රත්‍යයාදීන් අධිකවෙත්. රූප බඹතලයෙහි වඤ්ඣේන්ද්‍රිය ඇති වෙයි. ඒ වඤ්ඣව ආශ්‍රයකළ විඥාන ඇතිවෙයි. හේ දෂිතාඤ්ඤාතාවරියවූ බුඩරූප දක්නා සඳහායි. ශ්‍රොතෙන්ද්‍රියද ඇතිවෙයි. තදාශ්‍රයවූ ශ්‍රොතවිඥානයද ඇති වෙයි. හේ ශ්‍රවණාඤ්ඤාතාවරියවූ ධම්ශ්‍රවණය සඳහායි. අවශිෂ්ටවූ ඝ්‍රාණ නිමිත්තාදිහු ලඤණ මාත්‍රාව ඇති වෙත්. තදාශ්‍රයවූ ඝ්‍රාණෙන්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය කායෙන්ද්‍රිය යන මොහු නොඋපදනාහුය. ඒ ඉන්ද්‍රියයන් තුන්දෙනාගේ නොවීමෙන් තදාශ්‍රිතවිඤ්ඤාණද නොඋපදී. ඒ බඹහු බුදුන් ඇතිකල අවුත් බුදුන් දක්නාහ. බණ අසන්නාහ. එසේ නැතිකල ධ්‍යාන සමාපත්තීන් තපස්වීන් සෙයින් වාසය කෙරෙත්. රූපලවල උපන් පාඨජ්ජනයෝ නම් රූපාරූප අෂ්ටසමාපත්ති උපදවති. ආයතියෝ විනම් මතු මතුයෙහිවූ මාගිඵල උපදවති. මේ එකුන්වීසි බඹතලයෙම උපන් ආයතියෝ ඝට ඝට නොඋපදිත්. මතු මතුයෙහිම උපදිත්. වෙහප්ඵලය අකනිෂ්ඨය නෙවසංඥා නාසංඥ යතනය යන භවශිඛරයෙහි උපන් ආයතියෝ එයින් බැහැර අමුතු තැනක නොඋපදිති. එහිම සිට නිරූපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිණිවෙත්. පෘථග්ජන සත්වයෝ පඤ්චස්කන්ධවාසය හැර තුබූ සවිසි තලයෙහි උපදිත්. උන්මත්තකයෝ තමන් ගත් පැස අසුචි ගෙණ බහාලත්මය. සත්රුවන් ලද ඒ ගෙණ බහාලත්මය. එසේම උමත්තකයන් ගත් පැසක් වැනි පෘථග්ජන සත්වයෝ කලක් සතර අපායෙහි උපදනට නිසි අසුචි වැනිවූ අකුශලකම් සිඹ කෙරෙත්. සමහර කලක සුගතිය උපදනට නිසි සත්රුවන් වැනි යහපත් කුසලකර්ම සිඹ කෙරෙති.

බඹලොව ආයුෂ කෙපමණෙක්ද? යත්-විසිබඹතලයෙහි ආදිවූ ප්‍රථමධ්‍යානතල තුණින් බ්‍රහ්මපාරිසද්‍යයෙහි කපින් තුණින් එකකට ආයුෂය. බ්‍රහ්මපුරොහිතය කපින් භාගයකට ආයුෂය මහා බ්‍රහ්මතලයෙහි කල්පයකට ආයුසයි. විතියධ්‍යානතල තුණින් ආදි පරිත්තාභ නම් තලයෙහි කල්ප දෙකකට ආයුෂය. දෙවන අප්ප මානභ නම් තලයෙහි සතර කල්පයකට ආයුෂය. තුන්වන ආභස්සර තලයෙහි අටකල්පයකට ආයුෂයි වතුර්ථධ්‍යානතල සත ආදිවූ වෙහප්ඵලයෙහිදු අසංඥසත්වයෙහිදු පන්සියයක් කල්පයට ආයුෂයි. සුඛාවාස පයින් ආදිවූ අවිහ තලයෙහි දහසක් කල්පයකට ආයුෂය. දෙවන අතප්ප නම් තලයෙහි දෙදහසක් කල්පයට ආයුෂය. තුන්වන සුදස්ස නම් තලයෙහි සාරදහසක් කල්පයට ආයුෂය. සතරවන සුදස්සී නම් තලයෙහි අටදහසක් කල්පයට ආයුෂය. පස්වන අකනිෂ්ඨ තලයෙහි සොළොස් දහසක් කල්පයට

ආයුෂයයි. අරූපාවචර සතරින් ආකාසානංචායතනයෙහි විසිදහසක් කල්පයට ආයුෂයයි. විඤ්ඤාණංචායතනයෙහි සතළිස් දහසක් කල්පයට ආයුෂයය. ආකිංචඤ්ඤායතනයෙහි සැටදහසක් කල්පයට ආයුෂයය. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි සහසූදහසක් කල්පයට ආයුෂයයි.

එවංවිධෙනෙක විභූතියාරෙ කාමෙ භවෙරූපභවෙතරෙපි,
පපෙපාතිසිලාදි ගුණෙන යෙන කො නාම තඤ්ඤිනබුධොපමජ්ජේ.

යනුහෙයින් මෙබදුවූ අනෙකප්‍රකාර සම්පත්සාරයෙන් සොභමානවූ කාමභව රූපභව අරූපභව යන තුන් තැන්හි සියළු සම්පත්තියට සැවතෙම යම් සීලාදි ගුණධර්මයන් පූරණයක් හෙතු කොටගෙණ පැමිණෙන්නේ වී නම් ඒ සීලාදි ගුණධර්ම පූරණයෙහි කවර නම් ප්‍රාඥයෙක් ප්‍රමාද වන්නේද, නොපමාවන්නේමැයි.

මෙසේ සංඛ්‍යෙපයෙන් ලෞකික සම්පත් ප්‍රකාශවූ කාමභව රූපභව අරූපභව විභාගානිසංස දක්වා ඊට ඉක්බිතිව ලොකොත්තර සම්පත් විභාගද මදක් මෙහි දක්වනු ලැබේ ඒ කෙසේද? යත් උපාදූනඛන්ධසංඛ්‍යාය ලොකතො උත්තරන්ති, උත්තිණ්ණාති වා ලොකුත්තරාති එවං ලබ්භාමසම්පත්ති-එබැවින් සියළු සසර දුකට මූලකාරණවූ පඤ්චඋපාදානස්කන්ධ සංඛ්‍යාත ලෝකයෙන් සත්වයෝ එතර වූවාහුනුයි කියා හෝ ලොකොත්තරයයි මෙසේ ලද නම් ඇති සම්පත්ති තොමෝ ලොකොත්තර සම්පත්ති නම් වේ. ඕතොමෝ ශ්‍රාවක බෝධිය ප්‍රත්‍යෙක බෝධිය සම්‍යක් සම්බෝධියයි කියා තුන් වැදෑරුම්වේ. තවද—

ඛාසිතොඅභිතාභා වෙ පිතිභක්ඛාභිභිකා,
බ්‍රහ්මානොකොසුඛංතෙසං නමූනිවණ්ණයිස්සති.

ඝනාදි කී හෙයින් ධ්‍යාන සම්පන්නවූ ප්‍රමාණාතික්‍රාන්ත ශරීර ප්‍රභාවෙන් දිලිහෙන ප්‍රීතියම ආහාරවූ බ්‍රහ්මරාජයෝ ඒකාන්තයෙන් මහත් ඉඩ්‍යානුභාව ඇත්තාහුය. ඔවුන්ගේ යස සැප ආදි සියල්ල බුදු නොවූ අනිකෙක් වර්ණනා කෙරේද නොහැකිමැයි. බ්‍රහ්මලොක අතුරෙන් පාන බඹලොව ත්‍රිභාග කල්පයට ආයුෂය ඔත්තෙහි බඹලොව අසූසාර දහසක් කල්පයට ආයුෂයයි. කල්පය නම්, සතර ගව්වු දිග පුළුල උස ඇති කොටුවෙක ශ්වේතසර්ෂප පුරා එයින් වර්ෂ සියයක් සියයක් ගියකල එකිනෙක හැරදමා යම්තාක් කලකින් ඒ සියළු සර්ෂපරාසිය හෙවී ගියේ වී නමුත්

අවුරුදු කොහෙවෙන හෙයින් එයට වඩා කල්පය දික්වන්නේයි. එහෙයින් ඉතා දිගිවූ ආයුෂයෙන් දනයුතුවූ ඔවුන්ගේ ඒ සියළු සම්පත් මේ කුනු ශරීරයෙන් ඉතා මද කාලකින් සැදිය යුතු බැවින් එහි නොපමා විය යුතු. නොයෙක් කල්ප සියදහස් ගණන් පවත්නා යම් බ්‍රාහ්මණ කෙනෙකුන්ගේ මනොමයවූ ආයු සැප ආදි සියල්ලෙක් ඇද්ද, ඔවුන්ගේ ඒ සුඛාග්‍රයට කවර නම් උපමාවක් හිද, නොවන්නේමැයි. මෙහි යම් කුසලයෙක් නිවන් සැප දේද ඒ කුශලය ශ්‍රේෂ්ඨ වෙයි. යම් කුසලයෙක් බඹ ලොව උදරවූ බ්‍රහ්ම සැප දේද, ඒ කුශලය මධ්‍යම නම් වෙයි. යම් කුශලයෙක් කාම ලොව උපදවා සුවල්පවූ පංචකාම සැප ගා අනාවූද යිසළු භිත සැප සාධා දේද ඒ කුසලය හීනවෙයි. තවද –

සුදුලුහං බුබ්බුලදුබ්බලංඉමං,
සරීරමෙවංඉධ පුසඤ්ඤසාධකං
අපුඤ්ඤසඤ්ඤමෙමසු පයොජයංජන්තා,
සිනෙරුම්‍ලිඛා පතිතොව සො වයො.

ඝනාදි කිහෙයින් අතිශයින් දුර්ලභවූ, දියබුබුළුසේ ඉතා දුර්බලවූ මේ කුනු ශරීරය, මෙබදු පින්කම් සැදීමට හේතු වේද, පිහිට වේද, ඒ ශරීරය අකුසල් කිරීමෙහි යොදන සත්ත්වයා මෙන් නැවත සෝකයට පැමිණෙන්නේයි. යම්සේ සර්ෂපප්‍රමාණවූ බීජුවවින් යිශගණන් ශාඛා ප්‍රශාඛාදීන් බබලන මහත් නිල්මෙකුලට බදු උපමා ඇතිව. නුගරුකය ගටගන්නේ වේද, එපරිදි දෙන් පරමාණුවක්සේ, ඉතා මදවූ පින්කමින් ඕපුලතර මහත්ඵල දෙන්නේයයි, දැන ප්‍රාඥතෙම කුසලය සවල්පයයි, අවඥ නොකරන්නේය යනු හාවයි ලොකෙ තතර සම්පත් නම් කවරහ ගත්.

උපාදානක්ඛන්ධසංඛ්‍යාත ලොකතො උත්තරන්තීති උත්තිණ්ණලොකිවා ලොකුත්තරාති එවං ලබ්ධ නාම සම්පත්ති

යූ බැවින් රූපවේදනා සඤ්ඤාසංඛාර විඤ්ඤාණ යන පංචස්කන්ධ ලෝකයෙන් එතර වෙත්නුයි එතර වූවාහුනුයි කියා හෝ මෙසේ උතුම් ලෝකෝත්තර ගුණ ධර්මයට පැමිණි ඒ බුබාදි සියලු ආර්‍යයන්ගේ ගුණසම්පත්තිය ලෝකෝත්තර සම්පත් නම්, ඒ සම්පත් තොමෝ ශ්‍රාවක බොධිය, ප්‍රත්‍යෙක බොධිය, සම්‍යක් සම් බොධියයි කියා තුන්වැදෑරුම් වේ. එහි ශ්‍රාවකබොධිය නම් ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේගේ ධර්මදෙශනාවන් ශ්‍රවණාදියෙහි, උපන් බැවින් ශ්‍රාවකයෝයයි මෙසේ ලද නම් ඇති ඒ ශ්‍රාවකයන්

විසින් ශ්‍රොතාපත්‍යාදි මාර්ගපිළිවෙළින් හොත් දුක්ඛ සමුදය නිරෝධ මාර්ග ඇත, වතුස්සත්‍යයන්ගේ අවබෝධ වීමෙන් පැමිණිය යුතු සම්පත්තියයි. ඒ එසේමැයි. විසුද්ධිමාර්ගයෙහි කියන ලද ක්‍රම යෙන් ශ්‍රොතාපත්ති මාර්ග දිබ්‍ය දස්සනවිසුද්ධිඥාන ප්‍රතිපාටියෙන් නසා පහකරණ ලද අපාය ගමන් ඇති සත්තක්ඛත්තු පරම වූයේ ශ්‍රොතාපන්න නම් වේ. ඒ සෝවාන් පුද්ගල තෙම වත්තාභි ඒකබීජිය කොලංකොලය සත්තක්ඛත්තු පරමයයි කියා තුන් වැදෑරුම් වේ. එහි එක් වරක උපදනා බිජුවට යම්සේ භවයෙහි එකම ජාතියෙක පිළිසිඳ ගෙණ එපමණකින් ම ඒ භව තණ්හාව හකුළුවා ගෙණ, එයින් දෙවෙනිවූ ජාතියෙක මිනිස් ලොව නොඉපද එම ජාතියෙහි හෝ අනික් දිව්‍ය ජාතියෙක හෝ රහත් බවට පැමිණීමෙන් දුක් අන්ත කොට සන්හිදී යන සෝවාන් පුද්ගල තෙම ඒකබීජි නම් වන සේක. භවයෙහි දෙවරක් හෝ තුන්වරෙක හෝ, පිළිසිඳ ගෙණ සතරවෙනිවූ ජාතියෙහි හෝ අනික් දිව්‍ය ජාතියෙක හෝ රහත් බවට පැමිණීමෙන් දුක් අන්ත කොට සන්හිදී යන සෝවාන් පුද්ගල තෙම, කොලංකොල නම් වනසේක, එසේම භවතණ්හා නොසිනිදු බැවින් මේ මනුෂ්‍ය ලොකයෙහිම සත් ජාතියක් ඉපදීම මිස එයින් පිටත් අටවෙනි ජාතියෙක මිනිස් ලොව නොඉපද වාසනාබල වූ සරිද්දෙන් රහත් බවට පැමිණීමෙන් සියළු දුක් අන්ත කොට සන්හිදී යන සෝවාන් පුද්ගල තෙම සත්තක්ඛත්තු පරම නම් වනසේක.

මෙසේ තුන්ප්‍රකාරවූ සෝවාන් පුද්ගලයන් මේම, මෙහි ජාති ප්‍රමාණ දුක්වූයේ, මනුෂ්‍ය ලොකයෙහි උපදනා ජාති ගණන්මය සදෙවිලොව බඹලොව ඒ සෝවාන් තෙම උපදනා ජාති එයට අධිකතර වන්නාහුයි. ඒ කෙසේ වේදැයි කිවහොත් විසාඛා නම් උපාසිකාවෝද, අනේපිඬු මහ සිටාතෝද, සක්දෙවිරජද යන මෙතුන් දෙන, ඔවුන්ගේ භවතණ්හාව බලවතර බැවින්, සදෙව් ලොව අනුක්‍රමයෙන් ඉපද, ඒ එදෙවිලොව ආයුශ්‍රී ප්‍රමාණයෙන් මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් හා සමාපත්ති සැප අනුභව කොට පර නිම්මිත දිව්‍යලෝකයෙහි සිට ධ්‍යාන උපදවා ගෙණ බඹලෝ උප දනා, ඉහමපාරිශුද්ධ බඹලෝ පටන් අනුක්‍රමයෙන් හොස් උලාරවූ ප්‍රීති සැප අනුභව කොට, සුභකිණ්හ තලයට පැමිණ, එහි සිට මාර්ගාවනා වැඩීමෙන් අනාගාමී ඵලයට පැමිණ එයින් හොස් පංචසුඛා වාසයෙහි උපදනාහු අනුක්‍රමයෙන් ඉපද ඒ බඹතලවලද ආයු ප්‍රමාණයෙන්ම, මහත් විපුලතරවූ, සමාපත්ති සැප අනුභව කොට හොස් කල්ප සොළොස් දහසකට ආයුශය ඇති අකනිට්ඨ බඹ තලයෙහි ඉපද අර්හත් මාර්ගය වඩා සකල ක්ලේශයන් නසා

රඟත් ඵලයට පැමිණ එහි ආයුෂ පමණින් ඔට පිරිනිවන් පෑනුයි එසේම අසද්ධර්මානුශාසනාවන්ගේ ශ්‍රවණයෙන්, භාවනා මාර්ගය වඩා ගොස් සමහර කෙනෙක්, රාග දෙස මෝහ යන අකුසලයන් තුනී බව කරන්නාවූ, සකෘදාගාමී මාර්ගයට වඩා සකෘදාගාමී වන්නේය. ඒ සකෘදාගාමී පුද්ගලතෙම ප්‍රතිසන්ධි වසයෙන්, මේ මිනිස්ලොවට එක් වරෙක ඒනුයි, හෙවත් එක් ජාතියක් මෙහි උපදනා බැවින් සකෘදාගාමී නම් වන සේක. එහි සමහර පුද්ගල කෙනෙක්, මිනිස් ලොව ආදිකොට ඇති කාම භවයෙහි දී, සකෘදාගාමී ඵලයට පැමිණෙන්නේය. සමහර පුද්ගල කෙනෙක් බ්‍රහ්මපාරිෂද්‍යාදී රූපභවයෙහිදී, සකෘදාගාමී ඵලයට පැමිණෙන්නේයි. සමහර පුද්ගල කෙනෙක් ආකාසානංචායතනාදී අරූප භවයෙහිදී, සකෘදාගාමී ඵලයට පැමිණෙන්නේය.

මෙසේ තුන් භවයන්ගේ වසයෙන් සකෘදාගාමී තෙම තුන් ප්‍රකාර වේ. තවද සද්ධර්මානුශාසනාවන්ගේ ශ්‍රවණයෙන් එසේම භාවනා වඩා ගොස් කාමරාගව්‍යාපාද අකුසලයන් නිරවශෙෂව, සමුච්ඡේද ප්‍රහාණයෙන් නසන්නාවූ අනාගාමිමාර්ගය වඩා අනාගාමී නම් වන්නේය. ඒ අනාගාමී තෙම වතාහි ප්‍රතිසන්ධි වශයෙන් මේ කාමවචර ලොකයට නො ඒනුයි, හෙවත් අනාගාමී වීමෙන් පසු මේ මිනිස්ලොව ඉපදීමක් නැත්තුයි, අනාගාමී නම් වන සේක. කොහි උපදනා සේක්දයත්-හෙතෙම භාවිතා කළාවූ ශ්‍රද්ධාය වීර්‍යය ස්මෘතිය, සමාධිය, ප්‍රඥය යන පංචප්‍රකාරවූ, මනා ඉන්ද්‍රියයන්ගේ එකිනෙකට අධිකව සිටි ගුණානුභාවය හෙතු කොට ගෙණ කෙලෙසුන් කෙරෙන් සුඛසඤ්ඤයන්ගේ ඉපදීමට සප්‍රත්‍යවූ හෙයින් සුඛාවාස යයි ලද නම ඇති බ්‍රහ්මලොකවල උපදනා නැනැත්තේ ශ්‍රද්ධාව අධිකව භාවනා වැඩීමෙන් අවිහ නම් බඹලොව ඉපද එහි ආයු පමණින් කල්ප දහසක් මුළුල්ලෙහි බ්‍රහ්මසම්පත් විඳිනේය. එසේම වීර්‍යාවඩා භාවනා කිරීමෙන් අනාගාමිවූ නැනැත්තේ ද අතප්ප නම් බඹලොව ඉපද එහි කල්ප දෙදහසක් මහත් ප්‍රීති සැප විඳිනේය. එසේම සිහිය වඩා ගොස් භාවනා කිරීමෙන් අනාගාමිවූ නැනැත්තේද සුදස්සා නම් බඹලොව ඉපද එහි කල්ප සාරදහසක් මුළුල්ලෙහි ඉතා විපුලවූ ප්‍රීති සැප විඳිනේය. එසේම විත්තයාගේ එකාග්‍රතාව වැඩීමෙන් භාවනා කොට අනාගාමිවූ නැනැත්තේද සුදස්සී නම් බඹලොව ඉපද එහි කල්ප අට දහසක් මුළුල්ලෙහි ඉතා උදාරවූ බ්‍රහ්මසම්පත් විඳිනේය. එසේම ප්‍රඥාව වඩා ගොස් භාවනා කිරීමෙන් අනාගාමිවූ නැනැත්තේ ද අකනිට්ඨ බඹලොව ඉපද එහි කල්ප සොළොස්දහසක් මුළුල්ලෙහි මහත් උදාරතරවූ බ්‍රහ්මසම්පත් අනුභව කරන්නේය.

මෙසේ ඒ අවිහාදී පස්මහ බඹතලයෝ කෙලෙසුන් කෙරෙන් මිදී සුඛවූ අනාගාමී රහත් ගුණ ප්‍රතිලාභ යුත් අනුත්තර ප්‍රතිඝය යන ලොභ වෙශයන්ගේ නොඑමෙන් පිරිසිදු බ්‍රහ්මයන්ටම වාසස්ථානවූ හෙයින්ම ශුද්ධාවාස නම් විය. මේ පස්මහ බඹතලයන් අතුරෙහි ප්‍රථම තලවාසීහු අල්පවූ මදකලක් එහි වැස තමන්ගේ වාසස්ථානය නොහැර කල්ප දහසක්ම වෘත්ත හෙයින් අවිහ නම් විය. දෙවෙනි තල වාසීහුද කිසිවකින් තැවීමෙක් නැති හෙයින් අතප්ප නම් විය. තුන්වෙනි තල වාසීහුද පරමසුඳුරුවූ රූපශ්‍රී ඇති බැවින් සැපසේ ද්‍රිශ්‍යේ ත්‍රූයේන් දකින්නුයි සුදස්ස නම් විය. සතරවෙනි තල වාසීහුද එසේම අනිසයින් පිරිසිදුවූ දර්ශන ඇති බැවින්ම සුදස්සී නම් විය. පස්වෙනි තලවාසීහුද සියල්ලෙන් වැඩි උත්කෘෂ්ටවූ ශ්‍රේෂ්ඨ සම්පත් ඇති බැවින් මොවුන්ගේ සම්පත් කනිෂ්ඨභාවයක් නැත්නුයි, අකනිට්ඨ නම් වියයි දතයුතු. මේ පස්මහ තලවාසීව උපදනා අනාගාමී බ්‍රහ්මරාජයෝ වනාහි.

අන්තරා පරිනිබ්බායිය, උපහච්ච පරිනිබ්බායිය, අසංඛාරපරිනිබ්බායිය, සසංඛාරපරිනිබ්බායිය, උද්ධංසොතෝ අකනිට්ඨගාමියයි කියා පවත්‍ප්‍රකාර ප්‍රභෙදව රහත්ඵලයට ඒ ඒ බ්‍රහ්මලෝකවලදීම පැමිණීමෙන් සවාසනා සකල ක්ලේශයන් නසා පිරිනිවන් පාන්නා හුයි. එසේ ඒ ඒ බ්‍රහ්මලෝකවල අනාගාමී බ්‍රහ්මයන්ගේ නියමවූ ආයු ඉක්ම දෙබාගව බෙදූකල වේ. මධ්‍යයට නොපැමිණ පූර්භාගය නොඉක්ම සිටිකලම සකල ක්ලේශයන්ගේ පරිනිර්වාණයයි කියනලද රහත් බවට පැමිණි බ්‍රහ්මරාජතෙම අන්තරාපරිනිබ්බායි නම් වේ. ඒ අන්තරාපරිනිර්වාණයද මෙසේ ත්‍රිවිධ වේ.

ඒ කෙසේදයත්, කල්පදහසකට ආයු ඇති අවිහ නම් බඹලොව උපන් සමහර අනාගාමී කෙනෙක් උපන් දවස්හිම රහත් බවට පැමිණෙන්නේ හෝ වෙයි. එසේ නොපැමිණියහොත් පළමුවෙනි කල්පයාගේ මැද්දකයෙහි හෝ පැමිණෙන්නේ වෙයි. හෙතෙම පළමුවෙනි අන්තරාපරිනිබ්බායි නම් වේ. අන්‍යවූ සමහර අනාගාමී කෙනෙක් මෙසේත් කල්ප දෙසියයකින් මත්තෙහි රහත් නොවූයේ ඒ නම් කල්ප සාරසියයකින් මත්තෙහි රහත් බවට පැමිණෙන්නේය. මෙතෙම තුන්වෙනිවූ අනන්තරාපරිනිබ්බායි නම් වේ. පස්වෙනි කල්ප සියයක් ඉක්මවා ගොස් ආයුෂ්‍යයාගේ පශ්චිම භාගයට පැමිණ රහත් බවට පැමිණ අනාගාමී තෙම උපහච්ච පරිනිබ්බායි නම් වේ. අතප්පාදී සෙසු බ්‍රහ්මලෝක සතරෙහිද අනාගාමීන්ගේ රහත් බවට පැමිණීමෙහි විභාග මේ කී නයින්ම දතයුතු. යම්කිසි කෙනෙක උපන් කෙණෙක්හේ සහිස්කාර ධර්මයන් සහිතවූ ප්‍රයෝග

සහිතවූ මහත් උත්සාහයෙන් ක්ලාන්තව දුකසේම රහත් බවට යම් පැමිණීමෙක් ඇද්ද, ඒ සසංස්කාර පරිනිර්වාණ නම් වේ. එසේ කිසියම් සසංස්කාරයෙක් ප්‍රයෝගයක් නොගෙණ අනුත්සාහයෙන් ක්ලාන්ත නොවී සැපසේම රහත් බවට යම් පැමිණීමෙක් ඇද්ද, ඒ අසංඛාර පරිනිබ්බාති නම් වේ. මොහු සතරදෙනම පඤ්ච ස්‍රුද්‍රාවාසයෙහි දක්නා ලැබෙත්. උඩංසොත අකනිට්ඨගාමිවූ අනාගාමි තෙම වක්‍රාහි අභිභය පවන් යථාක්‍රමයෙන් දෙවිලෝ සතරෙහිම ඌර්ධශ්‍රොතව මහුමත්තට ගොස් ඉපද ඒ ඒ තන්හි ආයු පමණින්ම උදුරතර ත්‍රිති සැප අනුභව කිරීමෙන් ස්‍රුද්ධ අකනිෂ්ඨයෙහි ඉපද කියනලද ක්‍රමයෙන්ම රහත් බවට පැමිණ එහිම පිරිනිවන් පාන්නේය. එහෙයින් මෙතෙම උඩංසොත අකනිට්ඨගාමිවූ අනාගාමි නම් වේ.

මේ අනාගාමි ආර්‍යයන් වහන්සේගේ විභාගයයි.

යට කියනලද ක්‍රමයෙන්ම සද්ධර්මානුභාවකාවන් ශ්‍රවණයෙන් භාවනා මාර්ග පිළිවෙළින් හොත් සමිහර කෙනෙක් අර්හත් මාර්ග වඩා නිරවශෙෂව සකල ක්ලේශයන් ප්‍රහීණ කොට ක්ෂීණවූ ආශ්‍රවයන් ඇති අග්‍රදක්ෂිණෙය්‍ය අර්හත් නම් වන සේක. මෙසේ ශ්‍රොතාපත්තිමාගීාදි මාගී පිළිවෙළින්ම හොස් අවබොධ කටයුතුවූ දුකඛාදි චතුරාර්‍ය සත්‍යයන් දැන ගැන්ම ශ්‍රාවකබොධියයි කියනු ලැබේ. පසේබුදුවරයන් වහන්සේ ලෝකයෙහි කොසේ බබලන සේක්ද යත්.

මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති විහතාසව දස්සනං,
අධිකාරොඤ්ඤතා එතෙ දුභිණ්හාරකාරණා.

යනු හෙයින් මනුෂ්‍යාත්මභාවය පණ්ඩක නපුංසක ස්ත්‍රීභාවයෙන් මිදී පුරුෂාත්මය ලැබීමය බුඩ්ධත්‍යොත්පාදක බුඩ ආශ්‍රාවක යම් කිසි ලෝකොත්තර පුද්ගල කෙනෙකුන්ගේ දක්මය එතැන්හි ජීවිත පරිත්‍යාගය බුදුවීමෙහි නිස්සඤ්ඤවූ අදහස් ඇතිවීමය යන මේ පඤ්චඞ්ගසමොධානයෙන් යුක්තවූ පසේබෝධිඤාණයට ප්‍රථමාභිනීහාර නම්වූ පළමුවෙනි විවරණය ලැබෙන්නේය. එසේ විවරණත්‍රි ලැබ පසේබුදුවන්නාවූ බොධිසත්ත්වවරයෝ දෙගොඩංඛෙය්‍ය කප්ලක්ෂයක් මුළල්ලෙහි අඩුනොව පාරමී ධර්මයන් යටකියනලද ක්‍රමයෙන්ම පූරණය කොට දඹදිවින් උදා යම් තැනක ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති සංඛ්‍යාතවූ තුන්වංශයන් අතුරෙන් එක්තරා වංශයක ඉපද මිනිසත් බව ලදින් වැඩිවිය පැමිණ පාරමිතා බෙලෙන්ම වාසනා

කුලව ඇස දුටු අනිත්‍ය ලක්ෂණාදියක් අරමුණු කොට ගෙණ ලත් කර්මස්ථානයෙන් සකල ක්ලේශයන් නසා නානාස්ථානවලදීම සර්වඥබුඩවූ පසේබුදු බවට පැමිණෙන සේක්ලාය. එසේ බුදුවන පසේ බුදුවරයෝ බුඩොත්පාද කාලයෙහි නුපද්නාහුය. එතකුදු උවත් ලොවුතුරා බුදුන්ගේ ඉපදීමටම සුදුසුවූ විවර්ත කල්පයෙහිම අවුරුදු ලක්ෂයකට වැඩිවූ හෝ අවුරුදු සියයකට අඩුවූ හෝ විපරීත කල්ඛැර මඩ්ඣිමස්තවූ සුදුසුවූ කාලයෙහිම උපදනා සේක්ලාය, එසේ උපදනා ලොවුතුරා බුදුන් මෙන් මුළුලොවට නිමන් අමාරස බෙදදී ඔවුන් සසරින් ගැලවිය නොහි පසේ බුදුව සර්වඥඥානයෙන් ලත් නිවන් පුරයට අමුතු එක් ප්‍රාණියකු විවරත් පමුණුවා ලීමට අසමර්ථව තමන් වහන්සේලා විදිනාවූ අසීරු රසයම ප්‍රතිවේධ කරණ සේක්ලාය. ධර්මරසය ප්‍රතිවෙධ කිරීමට අසමර්ථවූවා හුය. ලොකොත්තර ධර්මය ප්‍රඥප්තියට නගා සෙස්සන්ට අවබෝධ වනසේවිශේෂයෙන් දෙසනා කිරීමට අසමර්ථයහ. හේතුම්ක්මෙන්ද? මූගපුරුෂයෙක් මහත් විසිතුරු සර්ජනයක් දැක අනුන්ට තත්වූ පරිද්දෙන් කියම් යන අභිප්‍රා ඇත්තේවී නමුත් තමා ගොළුභෙයින් කර්ණරසායන කොට කියා උගන්වා ගත නොහෙන්නේය. තවද වනචරයෙක් කිසියම් දවසෙක තමා වසන වනයෙන් නික්ම අවුත්මහත් නුවරකට පැමිණ බෝකල් ක්ෂුධායෙන් පීඩිතව ඇවිදිනා ඔහු දැක සුවපත් පුරුෂයෙක් තමාගේ ගෙට කැඳවා බොජ්‍ය හොජ්‍යාදීන් සහිතවූ රාජමසවුලෙන්යුක්තවූ ආහාරය ඔහු යැ පෙන පමණක් අනුභව කරවූයේද නැවත ඒ වනචර තෙම වනයට වන් කල සෙසු වනචරයන් ඔහු මනුෂ්‍ය පථයට පැමිණ අනුභව කළ ආහාරයෙහි කවර රසයෙක් දැයි විමාළ කල්හි තමා නුපුරුදු හෙයින් මේවැනි මධුර රසය නැයි සඟවා කියන්ට යම්සේ සිතේද එමෙන් නොකැකි වන්සේද එමෙන් සර්වඥයන් සිත් හෙණ තමන් දත් නිවන් රසය ප්‍රකාශ කොට ධර්ම දේශනා කරන්ට සමර්ථක් සම්බුඩ නොවී පසේ බුදුව නොපිළිවන් බව ප්‍රවේණි වරිතයක් සෙයින් ලොකාසක්වඥන්ට නිවීණයයි කියන ලද උතුම් ධර්මාභිසමය කරන්ට නොහැකි. එතකුදු උවත් සියළු සෘධි සමාපත්ති ඔිවුපිළිසිඹියා ප්‍රභෙදදියට පැමිණෙන්නාහු මැයි. ගුණවිශෙෂලත් වසයෙන්ම ලොවුතුරා බුදුන්ට අඩුව ශ්‍රාවකයන් වහන්සේට වැඩි තරම් සිටි ගුණ විශෙෂ ඇත්තාහුය:

එහෙයින් අනුන් පැවිදි කරවා ක්ෂුද්‍රශික්ෂාපදයෝයයි කියන ලද අභිසමාචාරික ශික්ෂාවන් ප්‍රගුණ කරවා සිත්හි හටගන්නා ක්ලේශයන්ගේ තුනීකරවා ලීමමුත් ඔවුන්ගේ සමූලඝාත ප්‍රහාණ වසයෙන් අවසානයට පත්වා ගත නොහෙන්නාහුය. තවද උදෙසවසයෙන් පොහොය කරන්නාහුද, අජ්ජුපොසථෝ යන වචනය

පමණ කිමෙන් පොහොය කරන්නාවූ එපසේ බුදුවරයන් වහන්සේලා හිමාලයෙහි ගඛ්ඛමාදන පර්වත ප්‍රාන්තයෙහිවූ දියෙහිගොබෙහි හටගන්නා සියළු මල් ජාති පිපී සැරහී සිටි මජ්ඣසක නම් වෘක්ෂමූල යෙහි රුවන් මළුයෙහි රැස්ව වැඩහිඳ කමටහන් විවාරා පොහොය කොට සත්වානුග්‍රහ බුද්ධියෙන් ගම් නියම්ගම් දනවු රාජධානි ආදි යෙහි හැසිරෙමින් ලොවැඩ කරන්නාහුය. ඒ දැක දිව්‍ය මනුෂ්‍යාදී හුදෑ අබුඩොත්පාදකාලයෙහි ලද හෙයින් ඝනාන්ධකාරයෙහි ලද පහන් ආලෝකයක්සේද මහසාගරයෙහි ලද මධුර හෝජනයක්සේද අසාධ්‍ය රෝගයෙහි ලද දිව්‍යඖෂධයක් සේද ඉතා සතුටුව දර්ශන සෙවනභජන පසිරුපාසනාදියෙන් යෙදී අප්‍රමාණවූ සමිලෙකික ලොකොත්තර සම්පත්ති ප්‍රතිලාභයට මූලකාරණවූ දානසීලාදි කුසලරාශි වඩනය කරන්නාහුයි.

මෙසේවූ පසේ බුදුවරයන් වහන්සේලාගේද ප්‍රවෘත්තිතොමෝ මේසේ දතයුතු, සමිලෝකාග්‍රවූ සම්‍යක් සම්බුඩ සමිඳුරාජෝත්තම යානන් වහන්සේ කෙසේ ලොව පහළ වනසේක්ද? යත්. ඒ සම්‍යක් සම්බුඩවන මහාබොසතාණෝ පාරමිතා භූමියෙහි හැසිරෙණ කල පවා විශිෂ්ටවූ ශ්‍රඩාප්‍රඥාදීගුණානු භාවයන් හෙතුකොටගෙණ අනේක ප්‍රකාර ලෝවැඩ කිරීමෙන් සියළු ලොව බබුළුවා අනුන්ට වැඩ පිණිසම දානසීලාදිවූ අප්‍රමාණ කුසලසම්භාරයන් රැස්කොට මෙහිම සම්බුඩගුණවර්ණනා පරිවෙර්දයෙහි ප්‍රකාශ ක්‍රමයෙන්ම අෂ්ටධර්ම සමොධානයෙන්ගෙදී විවරණශ්‍රී නියතව ලත්තැන් පටන් ප්‍රඥඩික වූයේ විනම් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ ශ්‍රඩාධික වූයේ වී නම් අටාසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ වීර්‍යාධික වූයේ වී නම් සොළසා සංඛ්‍ය කල්පලක්ෂයක් හෝ සමන්ත්‍රිංශත් පාරමී ධර්මයන් පූරණයෙන් එහි මස්තක ප්‍රාප්තව තුසිපුර පැමිණ දසදහසක්සක්වල දිව්‍යබ්‍රහ්මාදීන්ගේ ආරාධනාවෙන් මිනිස් ලොව මවුකුස්හි පිළිසිඳගෙණ එයින් බිහිවෙන කල්හිද බ්‍රහ්මාසුරාදීන්ගේ රන් දැල් දිවදුහුල් සඟිතවූ හස්තතලක්‍රමයෙන් භූමියට පැමිණ එකණෙහිම නිරුත්තරවූ උත්තර දිසාභිමුඛව සත්පියවරක් ඔසවා වැඩ අග්ගොහමස්මි ලොකස්ස යනාදීන් තමන් වහන්සේම ලෝකයේ අග්‍ර බව ප්‍රකාශ කොට ප්‍රතිවාක්‍යපවත්වා මුවෙන්ම මාරබල විධ්වංසනය කොට පෙරයම සත්වයන්ගේ පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණ ලැබ මඩ්‍යමයාමයෙහි දිව ඇහ පිරිසිදුවීම හා සත්වයන්ගේ චුති උත්පත්ති දෙක දක්නා ඥානයද අනාගතංසඤ්ඤාණයද ලැබ පශ්චිම යාමයෙහි පටිච්චසමුප්පාද ධර්මයන් විමසා බලනුවෝ ඒකාන්තයෙන් දුක්ඛිතවූ මේ ලෝවැසි තෙම මේ ලෝකයෙහි ඉපදීම ලැබී මද ජීවත්වනු ලැබීමෙහිද මියයනු ලැබීමෙන්ද නැවත නැවතත්

එසේම වුතවිමද ඉපදිමද දුකසේම වන්නේයයි දැන එසේද ඇති කල්හි මේ දුකඛයෙන් එතරවීම අවිද්‍යාවෙන් නොවන්නේය, එහෙයින් ජරාමරණස්ඛන්ධ යනාදී ක්‍රමයෙන් ප්‍රතීත්‍ය සමුත්පාද මුඛ යෙන් විදර්ශනාවට අභිනිවෙසුව මහත් වනගහනයක් සිඳින්ට නිසානසිලා යෙදි පොරොවමුවහත්කරන්නකුමෙන් කෙලෙස්ගහන ය සිඳ හරිනට සුදුණ නැමති පරසුව තියුණු මුවහත් කිරීමෙන් බුඛ භාවයට හෙතුවූ ධර්මසමපත්තීන්ගේ පරිපාකයට ගිය බැවින් සම්මසනඥානාධිගමය පිණිස විදර්ශනා ගැබ් ගන්වන සේක් අතර තුරෙහි නානාප්‍රකාර සමාපත්ති වලට සමවැද චිත්තකාය දෙදෙ නාගේ යථාසවභාවය සැලකිමෙන් අනිත්‍ය දුකඛ අනාත්ම ඝන ත්‍රිලක්ෂණයට නහා අනුපදධර්ම විදර්ශන වසයෙන් අනේක ප්‍රකාර වොකාරා සංස්කාර ධර්මයන් සමමර්ශනයෙන් සතිස්කෙලලක්ෂයක් මුඛයෙන් අනුසමරණවාරය විසතර කොට එහිම භාවප්‍රඥන සංඛ්‍යාත විදර්ශනා ඥනය නිෂ්ඨාන සුරභාවයට පැමිණ උච්ඡාඛ ගාමිණී, භාවයෙන් පවත්නා කල්හි යම්කලෙක ඒ චිත්තය ආයතී මාගීය හා එක්ව සෑවෙමින් පවත්නේද එකල්හි ශ්‍රොතාපත්‍යාදි මාගී පිළිවෙළින් ගොස් එක්දහස් පන්සියක් පමණ ක්ලේසයන් සමුචෙදප්‍රහාණයෙන්ම ක්ෂය කිරීමෙන් අග්‍රමාගීඥනයෙන් සම්‍යක් සම්බොධියට පැමිණෙනසේක, ඒ අග්‍රලාභයාගේ ප්‍රතිලාභ ක්ෂණය පටන් අන්‍යවූද දසබලවතුවේසාරද්‍යාදී අසාධාරණ අපරි මිත ඒ ගියළු බුදුගුණයෝ එකල්හි හස්ත ගතවූවාහු නම් වෙත්.

මෙසේ සම්බුදපදප්‍රාප්ත බවවපැමිණි සම්මාසම්බුඛොයනුගෙයින් සම්බුඛීයන් තමන් වහන්සේම මනාකොට අවබොධ කළ බැවින් හා එසේම අනුන්වද අවබොධ කළ බැවින් සම්මාසම්බුද්ධ තම් ගැම ගුණයෙන් දෙවිබඹ සහිතවූ ගියළු ලොකයාහට අග්‍රප්‍රාප්තව සකල ලොකාභි සන් ගිඩියට කතීවීමෙන් ලොකගුරුවූ තුන්ලෙවගිම පතල බඛ ලාඛිකාර විඛවංඡන සමාධී මහා ප්‍රදීපයක්සේ සත්වලෝකයෙහි පැවති මොහාන්ධකාර දුරු කිරීමට හෙතුවූ බුඛඥන නැමති මහා ප්‍රදීපාලොකයක් ඛරාගත් තිලෝගුරු සම්බුදුරජාණන් වහන්සේද තමන්වහන්සේට සම අධික කිසි කෙනෙකුන් ලෝකයෙහි නැති හෙයින් අසහාය අවිතීයව මහමේරුවට වැඩි අනික් පව්තයක් නැත්තාසේ භවාග්‍රයට වැඩි අනික් උස් තැනක් නැත්තාසේ යුගාන්ත ගින්නට වැඩි අනික් ගිණිකදක් නැත්තාසේ යුගාන්ත වාතයට වැඩි අනික් ප්‍රචඩවාතයක් නැත්තාසේ එසේම කෙලලක්ෂ

යක් සක්වළ එක පැහැර ගල සිටි යුගාන්ත සාගරයට වැඩි අනික් උදකසථානයක් නැත්තා සේ සියළු ලෝකාගතට විශෙෂයෙන් වැඩි තරම්ව සිටි එකා මහත් ඉඩිසුණ කරුණා ගුණානුභාවයකින් ලොවැඩ නිරිමෙන් ලෞකික ලොකොත්තර සම්පත්ති ප්‍රදානයෙන් සකල ප්‍රාණීන් සතුටු කරවා තමන් වහන්සේම විශෙෂයෙන් ලොව බබලන සේක.

මෙසේවූ ලොවුතුරා බුදුබව කෙළවර කොට ඇති මේ සියලු ලොකොත්තර සම්පත්තියට පැමිණෙනු කැමති සත්පුරුෂ ජනයන් විසින් මෙසේ නවවෙනි පරිවෙශ්දයෙන් කුසලකම් ඵල භුම්වූ ලෞකික ලොකොත්තර සම්පත් ප්‍රකාශ කිරීමෙන් ලොවැඩ දක්වා තදනන්තරව සියලු ලොවැඩ වීමෙහි රාජධම්මයම මූලකාරණා වන බැවින් රාජධම් විභාගාදිකවානිසංස ප්‍රකාශන කථාවෝද මෙහි දක්වනු ලැබෙත්. ලෝවැඩ වීමෙහි රාජධර්මයම මූලකාරණාවූ පරිදි කෙසේද? යත් යම් කලෙක්හි රජදරුවෝ අධර්මිෂ්ට වෙද්ද එකල්හි රාජ පුරුෂයෝ අධර්මිෂ්ඨ වෙත්. රාජ පුරුෂයන් අධර්මිෂ්ට කල බ්‍රාහ්මණ ගෘහපතිහු අධර්මිෂ්ට වෙත්. බ්‍රාහ්මණ ගෘහපතීන් අධර්මිෂ්ටවූ කල නිගම වාසීහුද ජනපද වාසීහුද අධර්මිෂ්ට වෙත්. නිගම ජනපද වාසීන් අධර්මිෂ්ටවූ කල විසමව වඳු සුය්‍යීයෝ ප්‍රවර්තිතවෙත්. විසමව වන්ද්‍ර සුය්‍යීයන් පවත්නා කල විසමව නක්ෂත්‍ර තාරකා රූපයෝ ප්‍රවෘත්තිත වෙත් විසමවනක්ෂත්‍ර තාරකාරූපයන් පවත්නා කල විසමවරාත්‍රින්ද්‍රිවයෝ ප්‍රවර්තනය කෙරෙත්. විසමරාත්‍රින්ද්‍රිවයන් පවත්නා කල මාසාර්ධමාසයෝ විසම කෙරෙත් විසමව මාසාර්ධමාසයන් පවත්නා කල විසමව ඍතු සංවත්සරයෝ ප්‍රවර්තනය කෙරෙත්. විසමඍතු සංවත්සරයන් පරිවර්තනය කළ කල විසම වාත හමයි. විසමවාත ගැමුණ දෙව තාවෝ ප්‍රකුපිත වෙත්. දෙවතාවන් කුපිත වූ කල වරුෂා සම්‍යක් ධාරාගෙන් වර්ෂණය නොකෙරේ. වර්ෂා සම්‍යක් ධාරාගෙන් නියම ලෙස නොවස්නා කල සස්‍යයෝ විසමපාකී වෙත්. සස්‍යයන් විසමව පැසෙන කල එ විසමව පැසෙන සස්‍යපල පරිභොග කරණ මනුෂ්‍යයෝ ආයුෂ්මද වෙති, රූව නැති වෙති, බල නැති වෙති, අඛාධෝ රොග පීඩා ඇති වෙත්. මෙම වදාළහ බුදුහු.

ගුත්තංවෙ තරමානානං පිළිභං ගච්ඡති පුඛවෝ,
සබ්බානාජිමිභං ගච්ඡතති නෙතෙතාජිමිභගෂත සති.

එවමෙව මනුසෙසසු යොගොති සෙට්ඨසම්මතෝ,
සොවෙ අධම්මං චරති පගෙව ඉතරාපජා.

සබ්බංරට්ඨංදුඛංසෙති රාජාවෙ හොත්‍ය ධම්මිකෝ
යසම්හිකඛිවෙසමයෙ රාජානෝ අධම්මිකාහොන්ති.

යනාදි, යම් කලෙක්හි රජදරුවෝ ධර්මිෂ්ඨවෙද්ද ධර්මිෂ්ඨවූ කල. රාජපුරුෂයෝ ධර්මිෂ්ඨවෙත්. රාජපුරුෂයෝ ධර්මිෂ්ඨ වූ කල යළොකා ක්‍රමයෙන් බ්‍රාහ්මණගෘහපතිකයෝද නිගමවාසීහුද ජනපද වාසීහුද ධර්මිෂ්ඨ වෙත්. ඒ හැම ධර්මිෂ්ඨ වූ කල සමව වසු සුයාමයෝ පවතිත්. එසේ හෙයින්ම නක්ෂත්‍රතාරකා රූපයෝද රාත්‍රිඥිවයෝද මාසා ර්ධමාසයෝද ඍතුසංවත්සරයෝද විසම නොව සමව පවතිත්. එකල්හි විසම වාත නොහමසි. දෙවියෝ කුපිත නොවෙත්. සම්‍යක්ධාරායෙන් නියම ලෙස වර්ෂාකෙරෙසි. සම්ව පැසෙන සස්‍යයෝ ඇතිවේ. සම්ව පැසෙන සස්‍යඵල අනුභව කරණ මනුෂ්‍යයෝ දීඝායුෂ්ක වෙති. බලවත් වෙති. රූපශ්‍රීවර්ණන ඇතිවෙත්. රෝගපීඩා නැතිවෙත්. මෙම වදළඟ බුදුහු.

ගුත්තාංවෙතරමානානං උජ්ජුංගවඡිතිප්‍රඛඛවෝ
සබබා තාංඋජ්ජුංගවඡිනති නෙත්තෙඋජ්ජුගතෙසති
එවමෙවමනුසෙසු යොහොතිසෙට්ඨසම්මතෝ
සොවෙටධම්මංවරති පගෙවඉතරාපජා
සබබංරට්ඨිය්ංසුඛංයෙති රාජාවෙහොතිධම්මිකෝ
යසම්ිං හිකබවෙසමසෙ රාජා නෝ ධම්මිකාහොනති

යනාදී එහි රජදරුවෝ නම් භවරහයත්,

ප්‍රථම කල්පයෙහි උපන් මහජනයාගේ සම්මතයෙන්ම වූ හෙයින් මහාසම්මත නම් වූ රජහු පටන් කපිලවස්තු පුරයෙහි රජ පැමිණි සුබොදන නරවරාවසානවූ අසම්හිත්තව පැවති එකවංස ප්‍රසූත සත්ලස්ස සක්දහස් සත්ගිය සතානුවක් පමණවූ රාජතඥන ගෝද්ර ඊට ඉක්බිති බුදුන් ධරමානකාලයෙහිවූ අජාසත් රජු පටන් ධර්මාසෝක රාජාවසානව දඹදිව රජපැමිණි සත්දෙනෙක් පමණ වූ රාජ නන්දනගෝද්‍ර, සඩම්රාජන්වූ බුදුන් පිරිනිවිදුම මේ ලක් දිවට පැමිණි විජයරජ පටන් මෙකලට රජපැමිණි අපගේ කීර්තිශ්‍රී රාජසිංහාභිධාන රජතුමානන් දක්වා ලංකාධිපතිවූ එක්සිය සුවාසූ දෙනෙක් පමණ වූ රාජතඥනගෝද්‍ර රජදරුවෝ නම් වෙත්. ඔහු භවර අධිපතීන් රජවූවාහුද? යත්, වතුහිසංගහවත්‍රුහි ජනාරංජයතීති රාජා, යනු හෙයින් යම් කෙනෙක් හොගයක් කැමතිවූ නම් ඔවුන්ට ඒ හොග දීමෙන් රංජනය කරවීමය යන අර්ථයෙන්ද, යම් කෙනෙක් ප්‍රියවචන කැමති වූ නම් ඔවුන්ට ප්‍රිය වචන කීමෙන් රංජනයකරවීමය යන ප්‍රිය වචනයෙන්ද, යම් කෙනෙක් තමන්ට අනර්ථයක් උපන් කල්හි ර්ථ සහාය කැමති වූනම් ඔවුන්ට පිහිට වීමෙන් රංජනය කරවීමය යන අර්ථචර්‍යාවෙන්ද, යම් කෙනෙක් එක අස්තෙහි හිදීම් ආදිය කැමති වූනම් ඔවුන්ගේ ඒ අභිප්‍රායසමපා දනයෙන් සතුටුකරවීමය යන සමානාත්මතායෙන්ද යන මෙසතර

සංග්‍රහවස්තුවෙන් ජනයන් තමන් හෙරෙහි නොවෙනස්ව හැසිරෙන සේ අනුග්‍රහකරවන හෙයින් අන්වර්ථ නාම වසයෙන් රාජ නම් වූවාහුයි. ඔවුන්ගේ රාජධර්මය නම් කවරහයක්, දශරාජ ධර්මයයි. දශරාජ ධර්මය හා නොයෙක් රාජධර්මවිභාග සම්භාර යෙන් ඒ ඒ සූත්‍රාභිධාර්ථ ජාතකවල ප්‍රකාශ වේය. මිස්තරාර්ථීන් විසින් ඒ ඒ තන්හි බලා දතයුතු. මෙවනාහි එක් දෙශයක් දක්වනු ලැබේ. ඒ කෙසේද? යත්.

සැවැත්නුවර නිසා දෙව්රමහි වසන බුදුරජානන් වහන්සේ එක් දවසෙහ බණ අසන්ට ආ කොසොල් මහරජහට අඛ්ගා වදුරා මහරජ රජදරුවන් විසින් දශරාජධර්මයෙන් රාජ්‍යය කළමැනවි. යම් සමයෙක්හි රජ්ජුරුවෝ අධර්මයට වුවහොත් එසමයෙහි රාජ පුරුශයෝද අධර්මයට වෙත් යනාදි යට කියනලද ක්‍රමයෙන් අඞ්ගුත්තර නිකායෙහිවූ චතුස්කනිපාතයෙහි රාජෝවාද සූත්‍රයෙන් අවවාද කොට අපායට යාමෙහි ආදීනවද සුගතියට යාමෙහි අනුසස්ද වදුරා පවකාමය නම් සවජනයට බදු උපමා ඇතත්ගයි යනාදි කාමයෙහි ආදීනව විස්තරකොට වදුරා, තවද පාලිජාතක අටුවාවෙහි වූ සතළිස්වන නිපාතයෙහි තෙසකුන ජාතකයෙනුදු ධර්මදෙශනා කරණසේක්.

මවිවුතාසංගරොතපි ලවඟාහොතවිජ්ජති,
යුඛංතාජිජයොනාම සබෙඛිමවිවු පරාජයා.

යනාදි වසයෙන් ධර්මදේශනා කරණසේක් තවද මහරජ මරහු කෙරෙහි හැම සත්හු විශ්වාසයෙක්වත් අත්ලස්දි කියා කවර ගැන්මෙක්වත් යුඛකොට දිනීමෙක්වත් නැත. එහෙයින් ඕයඑම සඞ්ගෝ මරණ පත්වීමෙන් මහාසුමාරයාම පරම්ප්‍රතිෂ්ඨා කොට ඇත්තාහ. එසේ මිය පරලොව යන්නා වූ සඞ්ගයාට තමා විසින් කරණලද කුශලකාමය විනා අනික් පියවෙක්ම නම් නැත. ඒ කාරණයෙන් ඉතා සුවල්ප වූ සැපයක් පිණිස කුසලකරණයෙහි ප්‍රමාදවීම නුසුදුසුය. අප්‍රමාදව ධර්මයෙන් රාජ්‍යය කරව. පුරාතන අබුඩොත්පාද කාලයෙහි පවා රජදරුවෝ නුවණැත්තවුන්ගේ අවවාදයෙහි පිහිටා දැහැමින් රාජ්‍යය කොට දිව්‍යලෝකයට ගියෝ වේදැයි වදුරා ඒ කොසොල් රජු විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

යටගිය දවස බරණැස රජකරණ බ්‍රහ්මදත්ත නම් රජෙක් දරු නැති හෙයින් දෙවතා ආරාධනා කොට එසිනුත් දුදරු කෙනෙකුන් නොලැබ නැවත පසින් තුන්දෙනකු ලැබ පුත්‍ර ව්‍යවහාර

යෙන් පොහොයකරවා ඔවුන් මහත් තුවණැති බව දැන රාජධර්මය විවාරණු කැමතිව පළමුව වෙස්සන්තර නම් පක්ෂියා තන් සමීපයට ගොස් ඔවුන් සටහ්පිඨයෙක වඩාහිඳුවා:-

වෙස්සන්තරන්තංපුච්ඡාම සකුණානංහදුවස්ථූ තෙ,
රජ්ජංකාරණ්ඩකාමෙන කිංසුකිච්චංකතංවරනති.

යන මේ ගාථාවෙන් රාජධර්ම විවාළාවූ ඒ බ්‍රහ්මදත්ත රජහට සවිඤාණිකයට මූලකාරණවූ ප්‍රමාදයෙහි ආදීනව—

තතොකිච්චාතිඛාරෙය්‍ය තං වතං ආහුඛත්තිය

යනාදීන් රාජධර්මය ප්‍රකාශකොට කියා යන්නාහු රජ්ජුරුවන් වහන්ස, රජදරුවන් විසින් රාජධර්මයන් තුන්දෙනෙකු කෙරෙහි පිහිටිය යුතු. එයින් පළමුකොටම රජදරුවන් විසින් බොරු කීමෙන් දුරුවිය යුතුය. මුසාවාද කියන රජදරුවන්ගේ රාජ්‍ය යෙහි තෘණ වෘක්ෂලතාදියෙහි ඔජස්නැති වන්නේය. ගොයම් ආදි සස්‍යයන් කරණ භූමියෙහි රසඔජවද සත්ථියනක් පාත්ව බස්නේ එකල සස්‍යයන් අනුභව කරන්නාවූ ආහාරයෙහිද තෙල් මී සකුරු ආදියෙහිද ඖෂධයෙහිද රසඔජවද නැත්තේය. එසේ ඔජාගුණ නැත්තාවූ ආහාරාදිය අනුභව කළාවූ සත්ත්වයෝ බොහෝ ව්‍යාධිපීඩා ඇතිවන්නාහුය. තවද මුසාවාද කියන රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි දියෙන් ගොඩින් උපදනාවූ යම්කිසි ලාභයෙක් ඇත්නම් හේද නුපදනේය. එසේ වසනු නුපන් කල්හි රජදරුවෝ දිළිඳු වන්නාහ. එකල රජදරුවෝ සේවකාදීන්ට සංග්‍රහකරන්ට නොහැකි වෙත්. සංග්‍රහයක් නැති ඒ රජදරුවන්ට සියල්ලෝම ආදර නොකරන්නාහ. එහෙයින් මහරජ්ජුරුවන් වහන්ස මෙසේ නිරෝජස්කවූ බොරු ජීවිතය පිණිසත් නොකියයුතු වන්නේය. සැබෑ බස නම් මධුරවූ රස ඇත්තේය. එහෙයින්ම රසායනයක් සමානයයි දැන රැක්ක යුත්තේය. තවද මේ මුසාවාදය නම් සත්ත්වයන්ගේ අවශෙෂ වූ යම් ගුණයෙක් ඇද්ද ඒ සියළු ගුණද නැතිවන දෙයක. ඉපත්ති කෙළවර කොට ඇත්තේය. චුතිචිත්තයට දෙවන චිත්තවාරයෙහි අවීචිමහ නරකයට පමුණුවන්නේය. වෙනියරජු ඒ අසා ඉර්ෂ්‍යානුභාවයක් ඇතිව සිට පවා හි මුසාවාදයෙන් නරකයට ගියේය. එහෙයින් මුසාවාදයෙන් වැළකිය යුතුවන්නේය. තවද රජදරුවන් විසින් පළමුකොට කිපීම සවභාවවූ ක්‍රොධය දුරුකටයුතු වන්නේය. සෙස්සන්ගේ ක්‍රොධය වහා මුදුන්පැමිණීමක් නැත. රජදරුවෝ වධකායුධ හෙයින් හි බැළු පමණකිනුත් අනුන්ට විනාශ වන හෙයින් වහා මුදුන්පැමිණෙයි. ඒ කාරණයෙන් සෙසු මිනිසුන්ට

වඩා අනිශයින්ම කොපය දුරුකටයුතු වන්නේය. ක්ෂාන්ති මෛත්‍රී යෙන් දයාවෙන් යුක්තව එකසුතකු ඇති මවක මෙන් ප්‍රියදර්ශීන යෙන් ලොකවාසීන්ට අනුශාසනා කටයුත්තේය. අධිකවූ ක්‍රොධ ඇති රජහට උපන් යසස හෙතෙම සිරකොට ගත නොහෙයි. තවද වුල්ලධම්පාල ජාතකයෙහි මහාප්‍රතාප නම් රජතෙම තමා ගේ ප්‍රියවූ පුත්‍රයා මරා ඒ පුත්‍රසොකයෙන් ලය පැලී මියගිය බිසව කෙරෙහි හෙමේද සෝකකොට ලය පැලී මිය නුන්දෙනම එනම සොකයට පැමිණියහ. එසේ හෙයින් රජ්ජුරුවන් විසින් පළමු කොටම මුසාවාදයෙන් වැළකිය යුත්තේය. දෙවෙනිව ක්‍රොධ යෙන් වැළකිය යුත්තේය.

තවද රජ්ජුරුවන් වහන්ස, රජදරුවන් විසින් නම් නිරන්තර යෙන් ක්‍රීඩාශීලී නොවිය යුතුය. සිනිපත් ඇතිවම රාජ්‍යපරිපා ලනය කටයුතුය. කෙළියෙහි වීදන්ධවූ වචලවූ සිත් ඇතිව අමාත්‍යයාට කටයුතු විචාරන්නේ නම් ඒ තෙම තමහට උපන් යස සිරකොටගත නොහි නසාපියන්නේය. ඒ කෙසේදැයි කිව හොත්, සරභඞ්ග ජාතකයෙහි පුරොහිතයාගේ බස්ගෙණ කිස වෙහි තාපසයන්ට ද්‍රොහකොට රාජ්‍යය හා සමග නැසී තුම්බිද සඟපිරි වරින් හොස් කුක්කුල නම් නරකයෙහි උපන්හ. තවද මාතඞ්ග ජාතකයෙහි මේඣි නම් රජතෙම බමුණන්ගේ බස් ගිවිස මාතඞ්ග තාපසයන්ට පිඩාකොට රාජ්‍යවාසීන් සමග විනාසයට පැමිණ නරකයෙහි උපන්නේය. තවද ඝතජාතකයෙහි දයබෑරජදරුවෝ මොහයෙන් මුළාව කණ්හදීපායන තාපසයන්ට පිඩාකොට මාසු දෙවකුලය නැසූහ. එසේ හෙයින් අපරික්ඛාකාරී රජදරුවෝ තමන්ට පැමිණි යස සිරකොට ගත නොහෙති. එසේ හෙයින් රජදරුවන් විසින් නම් පළමුකොට මුසාවාදය දුරුකට යුතු වන්නේය. දෙවෙනිව ක්‍රොධය දුරුකට යුතු වන්නේය. තුන්වෙනිව ක්‍රීඩාශීලීව රාජ්‍යපරිපාලනයෙහි ප්‍රමාද බව කටයුතු වන්නේය. මේ තුන් කාරණයෙන් දුරුව සිට රාජ්‍යය වාසීන්ට කළමනා අනු ශාසනා කිරීම යන මා විසින් කියනලද මේ සියල්ලම රජදරුවන් ගේ වත්තසම්පදානයෙකැයි පුරාතන කුවණෑත්තෝ කියන්නාහ. එසේ හෙයින් රජ්ජුරුවන් වහන්ස, ඔව පළමුව ඉදින් කුඛවහන්සේ රාගාදි වසඥයන් පශ්චා තාපයට නිසිවූ යම් අකුසලකම්යක් කළ සේක් වීනම් මෙසින් මතු එබන්දක් නොකළ මැනව. තවද ප්‍රමාද වාසය ඇති රජහුගේ සියළුම භෝගයෝ විනාශයට පැමිණෙන් නාහ. ඊට කාරණා කිම? යත්—

මහරජ්ජුරුවන්වහන්ස සිරිය කාලකණ්ණිය යන මොනු දෙදෙනා අතුරෙන් ශ්‍රීතොමෝ කියන්නී යම් සභියෙක්

උත්සාහවියෆී ඇතිව අප්‍රමාදව කුසල් කෙරේද පරහන්තක වසතු දූන ලොභ නූපදවාද එසේවූ සත්වයා කෙරෙහි තමා අභිරමනය කරන්නේයයි කිව. එසේ හෙයින් රජ්ජුරුවන්වහන්ස කුඛවහන් සේ සියල්ලවුන් කෙරෙහිම මෛත්‍රී ඇතිව සියල්ලටම රක්‍ෂාසථාන වුව මැනව. කාලඤාත්තියට අවභාස නොදී ශ්‍රියාව වාසසථානවුව මැනව. දෙදෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍රදේවෙන්ද්‍රයෝ පවා එසේවූ උවිසාහවියෆීයෙහි අප්‍රමාදව දෙදෙව්ලොව දෙවියන් සමග නවවිධ නම් ආශ්‍රම ප්‍රදෙශයට ගොස් සරහ ශාසනයන් කෙරෙන් ප්‍රශ්න විචාරා ධර්මය ඇසූහ. කාශ්‍යප සම්බුදයන්වහන්සේගේ ශාසනය පහළුවන්නා දූන තමන්ගේ ආනුභාවයෙන් මහජනයා තැතිගන්වා ඒ ශාසනය බොහෝකලක් පවත්නා පරිදෙන් කළහ. මෙසේ උවිසාහවියෆීදිය කළමනාදෙයෙක්මය.

තවද චාතුමහාරාජිකයෙන් යට අණ්ඩජ ජලාබුජ සංසේදජ ඔපපාතිකසංඛ්‍යාතවූ චතුර්විධයොනියෙහි උපන්නාවූ දෙවතාවෝද බ්‍රහ්මසමූහයාද සදෙවිලොව් දෙවියෝද යන මේ සියළු දෙව තාවෝ බලවත්වූ කුසල අදහස් ඇති එබඳු රජදරුවන් හා සමාන ජීවිකාවෙන් ජීවත්වන්නාහ. එකුසල් සිත් ඇති රජදරුවෝ දූනා දීවූ පින්කම්කොට දෙවියන්ට පින්දෙන්නාහ. ඒ දෙවතාවෝ ඒ පින් අනුමෝදන්ව දිව්‍යවූ යසපිරිවරින්ද්වැඩෙන්නාහ. එසේ දිව්‍ය ඓශ්වර්‍යයෙන් අභිවෘඩියට පැමිණියාවූ ඒ ඒ දෙවතාවෝ ඇමතේ ලෙහිම භෞතියකොට කුසල්කරන්නාවූ අප්‍රමාදව වාසය ඇති එබදුවූ රජදරුවන්ට ධාර්මිකවූ රක්‍ෂා වරණගුප්තියකෙරෙමින් ඒයාවක් මෙන් අනුව පවත්නාහ. එසේ හෙයින් මහරජ කුඛවහන්සේ වූකලී දසකුසලධර්මයෙහි අප්‍රමාදව නිදැහැ නොව සියළු කාරිය කළමනා නොනැවත ඒ ඒ රාජකාර්‍යයෙහි විචාරා පරීක්‍ෂාකොට කුඛවහන්සේට ප්‍රත්‍යක්‍ෂව වැටහුනු දෙයකටම නිග්‍රහසංග්‍රහ දෙකක් කළමැනව. මේ ලෝකයෙහි අලසවූ ඓශ්වර්‍යමදසම්බෝ පැවිදිව ගත නොහෙන්නාහ. කුඛවහන්සේ එසේ නොව සියළු කාර්‍යයෙහි අප්‍රමාදව ඓශ්වර්‍ය ඇති වුව මැනව. මහරජ්ජුරුවන්වහන්ස මා විවාළ රාජධර්මය මා විසින් පළමුකොටම මූසාවාදය දුරුකටයුතුයයි ඝනාදීන් යම් මේ ව්‍රත කොටස්සකෙනෙක් නියත ලද්දාහු වීනම් එහි පැවැත්ත මැනව. ඒ ආචාරවෘත්තියම කුඛවහන්සේට අවවාද අනුශාසනා වන්නේය. මෙසේ මේ ධර්මයෙහි පවත්නා රජතෙම තමන්ගේ ඔතුරන්ට සැප දෙන්වත් සතුරන්ට දුක්දෙන්වත් සම්බ්‍රියයි ඝනාදීන් ධර්මදෙශනා කළ කල්හි ඒ අසා සතුටුවූ මහජනයා සහිත මහරජ ඒ වෙස්සන්තර නම් පඤ්චියාට මහත් සත්කාර සම්මානකොට ඉක්බිති කුඩලි

නම් ලිහිණියා සමීපයට ගොස් පළමු පරිද්දෙන්ම මඩපමඩ්‍යයෙහි වූ සවණ්ඩියයෙහි හිඳුවා රාජධර්මය පිවාරන්නාහු

සකුණි එවං කුණ්ඩලිනි මයඤ්ඤසිඛත්තිය බබ්බුනි
රජ්ජංකාරෙතුකාමෙන කිංසුකිච්චංඉතංවරන්ති-

යන මේ ගාථාවෙන් කුඩලි නම් පක්ෂි ධෙනුව හෙරෙන් රාජ ධර්මය පිවාරන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජතෙම රාජ්‍යය කරණු කැමති රජදරුවන් කවර කාර්‍යයක් කිරීම උතුම්දැයි පිවාළ තැන කුඩලිනී තොමෝ—

වෙවතානං පදකානි යෙසුසඩංපතිට්ඨිතං,
අලඩ්සා ව යොලාභො ලඩ්සාඅනුරක්ඛතා-

යනාදි ගාථා එකලොසකින් සියළුම රාජධර්මය පදවයෙක් හීම ඇතුළත් කොට දක්වා කියන්නී මහරජ්ජුරුවන්වහන්ස යම් කාරණා දෙකක සියළු අභිජාතය හා ඝනසැප පිහිටියේ වීනම් එසේවූ කාරණා පද දෙකක වෙත්. ඕහු කවරහයත්-පෙර නොලබන ලද ලාභයාගේ ලැබීමය ලබනලද ලාභය නැසීය නොදී රක්ෂාකිරීමය යන මේ දෙකෙක් වන්නේය. එසින් නුපන් ලාභය උපදවුම් බැරැරුම් නොවෙයි. උපන් ලාභය සොරු සතුරු ආදීන්ගෙන් නැසීමට නොදී රක්ෂාකිරීම බැරැරුම් වන්නේය. සමහර තෙනෙක් සම්පත් උපදවාගෙණත් යස නිසා ප්‍රමාදව මානය උපදවාගෙණ ප්‍රාණඝාතාදී පව් කෙරෙමින් ප්‍රසිද්ධවූ සොරකම් කෙරෙමින් අපරික්ෂාකාරිව රට නොල්ලකා ඇවිදිනා කල්හි ඔහු රජදරුවෝ අල්වාගෙණ මහත්වූ චිත්තාසයට පමුණුවන්නාහ. නොහොත් රූපා දිවූ පවකා කොට්ඨාසයෙහි ඇළුම් ඇතිව ප්‍රමාදව නුවණින් වසනු නිමාගිය කල්හි දුක්පත්ව ඉතා බැගැවෙ රෙදිවැරලි හැඳගෙණ කබලක් ගත් අත් ඇතිව දෙර සිඟා ඇවිදින්නේය. ප්‍රව්‍රජිතයන් වහන්සේත් ග්‍රන්ථධුර විදර්ශනා ධුරයෙහි යෙදීමෙන් ලාභසත්කාර උපදවා කාලකින් ප්‍රමාදව නිගිහාවයට පැමිණෙනසේක. සමහර තපස්වී තෙනෙක් ධ්‍යාන උපදවා සිහිමුළාගෙන් නපුරු රූපා දිස්නැයන බැඳී ඒ ධ්‍යානයෙන් පිරිහෙනසේක. මෙසේ ලත් යස ලාභාදිය රැකීම දුෂ්කරය. යමෙක් ලාභසත්කාරාදිය උපදවා අප්‍රමාදව සිට කුසලකර්මයේ යෙදී වසන්නේ වීනම් ඔවුන්ගේ යසස ශුක්ලපක්ෂයෙහි කලාවෙන් කලාවට වැඩී යන සඳමඩලමෙන් අභිවෘඩියට පැමිණෙන්නේය. එහෙයින් මහරජ්ජුරුවන් වහන්ස නුඹවහන්සේ අප්‍රමාදව ප්‍රයොගසම්පත්තියෙහි සිට දැහැමෙන් සෙමෙන් රජකෙරෙමින් නුඹවහන්සේට උපන් යසස් නොනසා රැක්ක මැනව.

තවද යමෙක් දූකෙළියෙහි ලොල්නොවූ කෙරෝටික නොව පුපසුගඹිමාල්‍යාදියෙහි ලොල්නොව නුඹවහන්සේ අයිති ධන ධාන්‍යාදිය, සුරක්ෂිතව රැකව තිබෙන්නේ වීනම් එබඳු පුරුෂ නුඹවහන්සේට අමාත්‍යභාය යුතුය. යම්සේ රථාචාර්‍යයෙක් මාගි ගමනින් වන පිඬා දුරුකරණ පිණිස සියළු වස්තුව හා සමග රථය නොනසා රැකගෙණ නිසි තැනි මගින් ගොස් ක්ෂේම භූමියට පමුණුවා ලීමෙන් රක්නේද, එමෙන් නුඹවහන්සේගේ වස්තු සමග නුඹවහන්සේ රක්නට සමර්ථවූ අමාත්‍යයෙක් වීනම් එසේවූ අමාත්‍යයාම නුඹවහන්සේට අමාත්‍ය නම් වන්නේය, ඔහු ලවා හා භාණ්ඩාගාරගෙයි කාරියකරවුව මැනව, අතුළඵරජගේ වසන හැමදෙනම නිරණ්‍යසවණාදියෙන් සංග්‍රහ නොලද්දාහු නම් ඒ කාරණයෙන් ඒ වස්තූන් හානිවිනාශයෙන් මහත් වීනාශ පැමිණෙන්නේය, ඇතුළේ ගිතවසයෙන් කළමන්ත්‍රණයත් පිටතට පතළ වන්නේය, එහෙයින් නුඹවහන්සේ ඇතුළු රජපිරිස සංග්‍රහයෙන් සිත්ගෙන මාගේ මෙතෙක් වස්තු ඇනැයි තුමූම සමපත් පරීක්ෂාකොටගෙණ අසවල් තැන මෙතෙක් දූ නිධානවිය. ඉන් දූනගත් මෙතෙකැයි සතුටුව ප්‍රත්‍යක්ෂයෙන් දන මැනව. තුමූ නොදූන අනුන් බස්ගෙණ වස්තු සැඟවීමත් නයදීමත් නොකළමැනව.

තවද ඒ ඒ තැනින් උපදනා අයද ඔවුනොවුන්ට දියයුතුවූ අයද තුමූම දූනගන දුන මැනව. යුබයෙහි හෝ ගාහකමියෙහි හෝ අන්‍යවූ සෙසු රාජකාරියෙහි හෝ මොහු විසින් මෙනම් දෙස කරණලද, මොහු විසින් මෙනම් දෙසක් නොකරණ ලදැයි යන මේ සියල්ලන් නුඹවහන්සේම දතමැනව. අනුන්ගේ බස් අදහා නොගතමැනව.

තවද මංපැහැරීම් උමංකැනීම් ආදිවූ නිග්‍රහයට නිසි නොයෙක් දෙෂකාරයකු ගෙණවුත් දක්වාලූ තැන ඔහුගේ දෙස විවාරා නියමකොට පුරාතනයන් විසින් නියමකොට නිග්‍රහයට තබනලද දණ්ඩනය පරීක්ෂාකොට දෙෂානුරූපවූ නිග්‍රහකරණසේක් ගමෙක් නුඹුන්කාවූ පරසේනාව බඳවාදීලාද බිඳීනිය සිය සෙනග සිටුවන්ට සමර්ථද නොලන් රාජ්‍යයන් ඇරදීලන්ට යොග්‍යද ලත් රාජ්‍යයත් ස්ථිර කොට ලන්ට සමර්ථද සමක්ෂු විසින් ජීවිතපරිත්‍යාගකොට කාරියකරණලද්දේවේද එබඳු වුවන්ට මහත් සත්කාර සම්මාන දීමෙන් සංග්‍රහ කරන්නේසි. එසේ ඇති කල්හි ඒ රජගෙයි සියළු රාජකාරියෙහි සෙස්සෝද කළමනාකාරියවල් එකල සංග්‍රහ බලා නොපමාව සිත්දී කරන්නාහ. තවද සියළු ජනපදවාසීන්ට වන්නාවූ අභිවෘඞ්ධියත් රවරක්මත් මෙසේ මෙසේ විය යුතුයයි

පරීක්ෂාකොට තුමූම දැන ඒවූ පරිද්දෙන්ම ඔවුන්ට අනුශාසනා කළ මැනව. රාජ නියෝගයෙන් ඒ ඒ කාර්‍යාධිකාරවල යෙදී සිටිනා අධර්මික කාපුරුෂයෝ අන්ලස් ගෙණ ධාර්මිකවූ සවභාවිනිශ්චය බිඳ නුඹවහන්සේගේ ධනයද සියළු රටද විනාස කරන්නාහුය. එහෙයින් අප්‍රමාදව තුමූම රාජ්‍යවාසින්ගේ යුක්ති විචාරා අනුශාසනා කළ මැනව. අපරීක්ෂාකාරීව නිසිවක් යුහුව නොකළ මැනව. අනුන් ලවාත් නොකරවුව මැනව. පරීක්ෂා නොකොට ජාත්‍යාදි වසයෙන් අගතියට ගොස් කරණලද කාරියෙන් මෙලොවම පල්වාත්‍යාපයටත් පරලොව නරක ගින්නෙන් තැවීමවත් කාරණාවන්නේය. එහෙයින් හැම තැනම පරීක්ෂාකාරීව කළමැනව. තවද නුඹවහන්සේගේ සිත කුසලය ඉක්ම පාපයෙහි පවත්නේද එනාල්හි යෙසු සත්වයන්ගේ සිත ඉතා බලවත්ව පාපයෙහි පවත්නේය, එහෙයින් ඒ පාපයෙහි සිත හළමැනව. ඉතිශ්වසස්ථානයෙහි සිටිකල මොහු ඉසින් ඉනිසකු නසනාලද සත්ත්වෙශ්දුදිය හෝ කරණලදැයි කියා සොරකු ගෙණ දැක්වූ කල ක්‍රොධ වශයෙන් ගෙණ යුහුව ඔවුන් අනුන්ට හිංසාපීඩා නොකළමැනව. නිවරදිඅනුත් වරදකළ වුන්සේ දක්වනි. එහෙයින් එදෙපසෙහි බස් විචාරා නුඹවහන්සේවම සැබෑවීමෙන් වරද දැන රාජපරම්පරාගත ක්‍රමයෙන් ඔහට කළමනාදණ්ඩ නිග්‍රහ කළ මැනව. කෝප උපන් කල ලය සිහිල්ව ගියේ නම් එකල්හි ඉනිශ්චය මණ්ඩලයෙහිද සියළු රාජකාරිය විචාළ යුත්තේය.

තවද මම පෘථිවීශ්වරයෙමියි කියා මහජනයා කායදුශ්චරිතාදිවූ අවැඩෙහි නොයෙදුව මැනව. නුඹවහන්සේගේ විජිතයෙහි මනුෂ්‍යාදී හැම සත්නට දුකෙඛාත්පත්තියක් නොවේවයි ධර්මයේ අධර්මිෂ්ට රජදරුවන්ගේ විජිතයෙහි මනුෂ්‍යයෝ කායදුශ්චරිතාදි පවිකොට නරකයෙහි උපදිද්ද. එපරිද්දෙන් නුඹවහන්සේගේ රාජ්‍යවාසින්ට නරකොත්පත්තිය නොකොට ධර්මයේ දුක් නොවිඳ සැපවිඳිද්ද එසේවූ යහපතක්ම කළමැනව- තවද ගම් පැවිදි ශ්‍රවරයෙක් ලොභ වුවමනා අත්තානුවාදදිවූ හයින් නිර්ගීතව ඒ කිසිවෙක්හි සාංකානොකොට යෂ්ටිඅග්‍රයෙන් වෙන්වූ අඹයෙකු මෙඳු අකුස්ස නැති ප්‍රවඩ හස්තියකු මෙන්ද තමන්ගේ අභිප්‍රාය දෙයෙක්හි හැසිරීමෙන් සවවශඳුද්වාරවසයෙන් ගමක්කැමැත්තෝ වීනම් ඒ ඒ දෙගම කෙරෙද්ද ඔවුන්ගේ සියළුභොගයෝ විනාශ වන්නාහුය. ඕහට ඒ භොගවසනාශ මහ දුකඛගයි කියනු ලැබෙයි. එහෙයින් මහරජ්ජුරුවන් වහන්සේට මා ඉසින් ඉට කියනලද්දාවූ සියළු රාජධර්මයෙහි පිහිටිය මැනව. ඒ රාජධර්මයෙහි දැඟව අනලසව කුසල් කොට දුස්සීල සත්වයෙම තමා නරකයෙහි මහත්වූ දුකට පමුණුවන හෙයින් සුරාපානාදී පාපකර්ම දුරුකොට

ඓහලෞකික පාරලෞකික සියළු වැඩට කාරණාවූ සීලාචාරාදී ගුණසම්පන්න ව රාජධර්මාදියෙහි පිහිටා රජකළ මැනවැයි අවවාද කොට ධර්මදේශනා කළාය. ඒ අසා සතුටුවූ මහජන සහිතවූ බ්‍රහ්ම දත්ත රජතෙම කුඩලී නම් ලිහිණියට බොහෝ සත්කාර සම්මාන කොට ඉක්බිති, තවද ධර්මය අසනු කැමැත්තාවූ ඒ රජතෙම ජම්බුක පණ්ඩිත නම්වූ ගිරාපක්ෂි රාජයා සමීපයට ගොස් එපරිද්දෙන් ම සවණ් පියගස වඩාගිදුවා ප්‍රශ්න විචාරන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජතෙම,

පුච්ඡාමහං නොසිකාංව කොඤ්චං තථෙව ජම්බුකං,
චිංදනි පදෙහි ජම්බුක බලානංබල මුත්තමමනති.

මෙසේ රජ්ජුරුවෝ මහබෝසතානන් අතින් ප්‍රශ්න විචාරණුයේ සෙසු දෙදෙනා අතින් විවාල සැටියේ නොවිචාරා රාජ ධර්මයද උතුම් බලයද කියවයි කියා විශේෂ කොට විවාළහ. එකල්හි මහබෝසතාණෝ එසේ වී තම් රජ්ජුරුවෙනි, කන් යොමා අසව, නොපට සියළු රාජධර්මය කියමිහි කියා දික්කළ අත දහසින් බැඳි පියල්ලක් තබන්නක්හු මෙන් ධර්මදේශනා කරණ සේක් මහ රජ්ජුරුවෙනි, සඳ ලොකයෙහි මහත්වූ අඛ්‍යාශ ඇති පුරුෂයා කෙරෙහි පඤ්චවිධවූ බලයෙක් වන්නේය. එයින් කාය බලය ඉතා මහත් වී නමුත් ලාමක වන්නේය. ඊට කාරණා කව රේද? යත් - අඥානබල බැවිනි. ඉදින් කාය බලය මහත් වී නමුත් ඒ බලයට වඩා කැට කිරිලි බලය අල්ප නොවන්නේය. ඇන්බලය වූකලී අඥාන බල බැවින්, මරණ ප්‍රාප්ත විය. කැට කිරිලි තොමෝ තමාගේ ප්‍රඥ සාමර්ථ්‍යයෙන් හස්තිරාජයා ජීවිතක්ෂයට පැමිණවුව, එහෙයින් හැම තන්හි කායබලය ප්‍රශෝජන නැත. අඥානයන්ගේ කායබලය ආත්ම වධය පිණිස වන්නේය. එහෙයින් කායබලයට වඩා හිරණ්‍ය සවණ්දීවූ භෝග බලය ඉතා මහත් වන්නේය. ඒ භෝග බලයට වඩා හෙදයට නොපමුණුවන්නාවූ මන්ත්‍රණය ඇති සෙනරවියෑ මනා සිත් ඇති සන්සුන් අමාත්‍ය මණ්ඩලය ඇතිව වසන ලද බලය යුධ යොගය බැවින් පූර්වබලයට ඉතා මහත් වන්නේය. බ්‍රාහ්මණ වෛශ්‍ය ක්ෂුද්‍ර කියන ලද ත්‍රිවිධ කුලයන් ඉක්ම සිටි ක්ෂත්‍රිය කුල වශයෙන් ජාති සම්භිය ඇති බව යට කී සෙසු ත්‍රිවිධ බලයන්ට වඩා ඉතා මහත් වන්නේය. ජාති සම්පන්න යෝම ශුද්ධ වන්නාහ, සෙසු සත්වයෝ ශුද්ධ නොවන්නාහ, යම් මේ චතුර්විධ බලයට නුවණැත්තාවූ සත්ව තෙම පැමිණියේ විනම් ඒ සියළුම බලයට වඩා ප්‍රඥ බලයම ඉතා ශ්‍රේෂ්ඨ වන්නේය; ඒ ප්‍රඥ බලයෙන් යුක්තවූ සත්ව තෙම ඉතා මහත් අභිවෘද්ධියට පැමිණෙන හෙයින් ප්‍රඥවම අග්‍රවන්නේය. ප්‍රඥ නැති පුද්ගල තෙම සත්රුව තින් සම්පූර්ණවූ පෘථිවිමණ්ඩලය ඉදින් ලද්දේ වී නමුත් ඔහු

නොකැමැති පරිද්දෙන්ම බලාත්කාරයෙන් අනික් බලසම්පන්න යෙක් රාජ්‍ය භාරය පිළිගැන්වූයේය. අඥාන සත්ව තෙම ලබන ලද යසස රක්නට වේගයි තමාගේ කුසල සන්තානය පරම්පරාවෙන් පැවත ආ රාජ්‍යයට පැමිණෙන්ට වේවයි අසමර්ථ වන්නේය. නුවණ මඳව ජාති සම්පත්තිය නිසා කුල සන්තානයූ රාජ්‍යය ලැබත් සියළු රාජ්‍ය ශ්‍රීන් යුක්තවත් ජීවත් වීමත නොගී උපායගි අඥාන බැවින් දුක්පත් වන්නේයයි මෙසේ මහබෝසතාණෝ නොයෙක් කාරණ යෙන් අඥානයාගේ අගුණ කියා දැන් ප්‍රඥාවට ප්‍රශංසා කරන්නාහු මෙසේ කිහ.

මේ ලෝකයෙහි උතුම් ප්‍රඥා ඇති සැබෑ තෙම බහුශ්‍රැත බැවින් කාරණාකාරණ හා යුක්තායුක්ති විශේෂයෙන් නිශ්චය කරන්නේය. නැවත කීර්ති ඝෝෂාවටත් පැමිණෙන්නේය. ලාභ සත්කාරයත් වඩනේය. දුක් උපන් කල්හිද උපායෙහි දක්ෂ බැවින් නිර්භීතව සැපයට පැමිණෙන්නේය.

යම් සත්වයෙක් දශකුශලකර්මපථ විභාගයෙහි දක්ෂද විය්‍යක්තව සුදුසු තැන්හි ව්‍යක්ත කෙරේද, නුකුසිතව ඒ ඒ දෙය කරන්ට නිසිතන්හි ඒ ඒ කාය්‍ය කෙරේද, එසේවූ ශ්‍රද්ධාදන් පුද්ගලයා හට කර්මඵල සමෘර්ධ වන්නේය. ලාභ යස ඇප ආදී සියළු වැඩට ආකර නොවූ සියළුම දුකට ආකරවූ දුස්සීල ක්‍රියාවන් යුක්ත පුද්ගලයන් සේවනය කරන්නාවූ කුසලකර්ම කරණ කාලයෙහි කලකිරී මැලිව උකටලීව කරන්නාවූ මෙබඳු පුද්ගලයාහට කර්ම විපාක සිඩ නොවන්නේය. සඳෙව්ලොව නුපදනේය. අනිත්‍ය භාවනාදි වශයෙන් යුක්තවූ ශ්‍රද්ධාන් සීලවන්ත පුද්ගලයන් සේවනය කරන්නාවූ කුසල් කරණ තැන නොකලකිරී මැලිනොව කායික්‍ය කරන්නාවූ පුද්ගලයාහට ඒ කර්මවිපාකය සමෘඩවන්නේය. මහත්වූ ඓශ්වර්‍යයට පැමිණෙන්නේය.

තවද මහරජ්ජුරුවන් වහන්ස, යෙදිය යුතු කාරණයෙහි යෙදීම් සංඛ්‍යාතවූ සියලු වැඩට කාරණාව ගිවි ප්‍රඥා කොට්ඨාසයද රැස් කරණ ලද වයතුව රක්‍ෂා කිරීමද යන මේ දෙක හා පළමු මා විසින් කියන ලද සියළු කාරණයන් සේවනය කළ මැනව, මා කී අවවාද සිත තබා ගෙණ බුඩවහන්සේගේ ඉගයි වසතුව රකිමින් ජීවත්වූව මැනව, නිෂ්කාරණයෙහි වසතුව කොනැසුව මැනව, නුවණ මඳ පුද්ගල තෙම නිෂ්කාරණයේ සියළු වයතුව අවිද්‍ය නැමැති ගින් නෙහි දවා නැතිකොට පසුව දුගීබවට පැමිණෙන්නේය. යම්සේ උනපතු බවපතු ආදියෙන් කරණ ලද්දවූ ගෙය මුල දක්වා දිරා

සම්මාදිට්ඨි ප්‍රතිඥාවක් නැති බැඹින් වැටිශේද, එපමණ දෙන් අඥාන සත්ව තෙම නිෂ්කාරණයේ වසකුව නසා අපායෙහි ඉපද මහත් දුක් අනුභව කරන්නේයයි මෙසේ මහබෝසතානෝ මෙතෙක් කාරණා දක්වා යටකියන ලද ක්‍රමයෙන් කාමබලය වසකුබලය යහපත් අමාත්‍ය මණ්ඩල බලය උතුම් ජාතිසම්පන්න බලය ප්‍රඥා බලය යන මේ පංචවිධවූ බලයන් නොයෙක් පරිද්දෙන් වර්ණනා කොට නැවතද ඒ සියළු බලයන්ට වඩා ප්‍රඥා බලය උසස් කොට ගෙන මේ ධර්මබලයෙහි හුදනාසේ ප්‍රකාශ කොට දැන් ගාථා දෙකකින් අවවාද කරන්නාහු මෙසේ කීහ.

ධම්මං වර මහාරාජ මාතාපිතූසු ඛත්තිය,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.
ධම්මං වර මහාරාජ පුත්තදාරෙසු ඛත්තිය—පෙ—
ධම්මං වර මහාරාජ මිත්තාමච්චෙසු ඛත්තිය—පෙ—

ධම්මං වර මහාරාජ වාහනෙසු බලෙසු ව—පෙ—
ධම්මං වර මහාරාජ ගාමෙසු නිගමෙසු ව—පෙ—
ධම්මං වර මහාරාජ රට්ඨෙ ජානපදෙසු ව—පෙ—
ධම්මං වර මහාරාජ සමණබ්‍රාහ්මණෙසු ව—පෙ—

ධම්මං වර මහාරාජ මිගපක්ඛීසුඛත්තිය—පෙ—
ධම්මං වර මහාරාජ ධම්මෝ චිණ්ණෝ සුඛාවහෝ,
ඉධ ධම්මං චරිත්වාන රාජ සග්ගං ගමිස්සසි.
ධම්මං වර මහාරාජ සබ්බ දේවා සබ්‍රහ්මාපිච,
සුචරිතෙන දිවාපත්තා ධම්මෙ රාජමාපමාදෙනී—

මහරජ්ජුරුවන් වහන්ස, උදෘෂ්ටක්සේ නැගී දෙමවුපියන්ට දුගැටි පැන්දීම් ආදිවූ සියළු වතාවත් කොට කැද අවුළුපත් බුලත් ආදිවූ දෙය අනුභව කරවා ශරීර සන්තර්පණය කොට පය තෙල් ගා අතපය මැඩීම් ආදිවූ ශරීර පරිහරණය කෙරෙමින් මාතාපිතෘ උපස්ථානය කරන්නාවූ බුඹවහන්සේ ධර්මයෙහි හැසුරුණ මැනව. රජ්ජුරුවන් වහන්ස, දෙමවුපියන්ට මෙහෙකිරීම් සංඛ්‍යාතවූ කුසලකර්ම ධර්මය මේ මනුෂ්‍ය ලෝකයෙහිදී කොට පරලොව සුගතීන්ප්‍රාප්තියට උත්සාහ කළ මැනවි. මහරජ්ජුරුවන් වහන්ස දරුවන් අකුසලයෙන් වලකා කුසලයෙහි පිහිටුවා ශිල්ප උගන්වා මැඩිවිය පැමිණි කල්හි සුදුසුවූ කුලයන් හා ආවාහ විවාහ කොට උන්උන්ට සුදුසු ගව මහිෂ වස්ත්‍රාභරණාදි වසකු දීමෙන් දරුවන් කෙරෙහි හැසුරුණ මැනව.

සාමාන්‍ය අන්තඃපුරස්ත්‍රීන්ට හා ඕඝයෝවරුන්ට සම්මාන කෙරෙමින් උන් ඕක්ම නොපැවැත, ඔයළු වෙශ්‍රවණ උන්ගේ ඕධානයට හරිමින් උතුම්වූ වස්ත්‍රාදිය දෙමින් අග්‍ර මහෙසිකාව හා අන්තඃපුරස්ත්‍රීන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව මහ රජ්ජුරු වන් වහන්ස; යාළු ඒශ්වාසයන් හා අමාත්‍යයන් හා අවශෙෂවූ ඔයළු සඛියන්ට දැනට්‍ඨ වචනය අවවශ්‍ය සම්මානාත්මකයයි කියනලද සතර සංග්‍රහ කෙරෙමින් මව සිළුවූ ප්‍රිය තෙපුල් හිමෙන් හා පරුෂ වචන නොකිමෙන් හා මුසාවාදාදීවූ වතුර්ඕධ වාක්දුශ්චරිතයෙන් ඔයළු ජනයා නොඝටා ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව; මහරජ්ජුරුවන් වහන්ස, හත්‍යශ්වාදි වාහනයන්ට හා සේනාවට දියයුතු වැටුප් ඒයදම් ආදිවූ ඔයල්ල දීමෙන් හා සත්කාර සම්මාන කිරීමෙන්ද හත්‍යශ්වාදීන් වැඩ අවසථාවෙහි කර්මාන්තය නොයොදු ඔවුන් කෙරෙහි ධර්මයෙන් හැසුරුණ මැනව. මහරජ්ජුරුවන් වහන්ස, රාජ්‍ය වාසීන්ට හා ජනපද වාසීන්ට නිශ්කාරණයෙහි පීඩා කොට උන් කෙරෙහි ද්‍රොඩ සිත් නොඅලවා ජන පීඩා නොකොට ඔයළු සත්වයන් කෙරෙහි මෛත්‍රී පතුරුවන්නාවූ නුඹ වහන්සේ රටවැස්සන් හා දනවු වැස්සන් කෙරෙහි හැසුරුණ මැනව. මහ රජ්ජුරුවන් වහන්ස, ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ඒවර පිණ්ඩපාත සේනාසන ගිලාන ප්‍රත්‍යයයි කියන ලද චතුර්ඕධ ප්‍රත්‍යය දීමෙන් ඔවුන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. රජ්ජුරුවන් වහන්ස, ඔයළු මෘග ශුකරාදිවූ චතුෂ්පාදයන් හා පක්ෂි සමූහයන්ට අභය දීමෙන් මෘග පක්ෂීන් කෙරෙහි ධර්මයෙහි හැසුරුණ මැනව. මහරජ්ජුරුවන් වහන්ස, සාමාන්‍යයෙන් ඔයළු සත්වයන් කෙරෙහි මෛත්‍රී පැතිරීමෙන් හැම දවසම ධර්මයෙහි හැසුරුණ මැනව. මහා කොට පුරුදු කරණ ලද්දාවූ දැනසීලාදිවූ සුචරිත සංඛ්‍යාතවූ කුසල ධර්මය සදිව්‍යලොකයෙහි උපදවා මහත් දිව්‍යසැපත් වැළදීමෙන් යැප ඵලවන්නේය. එසේ හෙයින් මහරජ්ජුරුවන් වහන්ස, මේ මනුෂ්‍ය ලෝකයෙහිදී කුශල ධර්මයෙහි හැසිරී සුඛීයට ගොස් දිව සැපත් අනුභව කළ මැනව. මහරජ්ජුරුවන් වහන්ස, ශක්‍රදෙවෙන්ද්‍රයන් ප්‍රධාන කොට ඇති දෙවියන් හා සහම්පතී මහා බ්‍රහ්මයා ප්‍රධාන කොට ඇති ඔයළු බ්‍රහ්මයෝ මනුෂ්‍ය ලොකයෙහිදී කරණ ලද්දාවූ කායසුචරිතාදිවූ උත්තම සුචරිතයෙන් දිව්‍ය බ්‍රහ්මලෝක සංඛ්‍යාතවූ සුඛීයට පැමිණ එහි යසස් සමෘඞ්ධිය අනුභව කරන්නාහ. එසේ හෙයින් මහරජ්ජුරුවන් වහන්ස; නුඹ වහන්සේ ජීවිත පරිත්‍යාග කොටත් කුශල ධර්මයෙහි අප්‍රමාදව වුව මැනවැයි මෙසේ දසවිධවූ රාජධර්මය කියා මත්තෙහිත් අවවාද කරන්නාවූ මහබෝසතාණෝ මෙසේ කිහ:—

මහ රජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේ මා විසින් කියන ලද්දා වූ අවවාදය සිත තබා ගෙණ හැම කල්හිම නුවණැත්තාවූ සත්වයන් සේවනය කොට කල්‍යාණ ගුණයෙන් සමන්විතවූ සියළු කාර්‍යය කාරයී තුමූම දැන සියළු රාජධර්මය සම්පූර්ණ කොට ඉගෙණ මා විසින් අවවාද අනුශාසනා කළාවූ පරිද්දෙන් පිළිපැද්ද මැනවැ යි මේසේ මහබෝසතාණෝ ආකාශ ගර්භාව ගෙණහැර පාන්නා කලක් මෙන් සමිඳු විලාසයෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කළහ. මහ ජනයෝ මහබෝසතාණන් වහන්සේ කෙරෙහි පැහැද වස්ත්‍රාභරණ යෙන් පූජාකොට බොහෝ සත්කාර සම්මාන කළහ. දහස් ගණන් සාධුකාර නාද පැවැත්වූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද බොහෝ සතුටුවම මහබෝසතාණන් වහන්සේට රාජ්‍යයෙන් පවරා නොයෙක් සත්කාර සම්මාන කොට ඒ අවවාදයෙහි පිහිටා සිව දහමෙන් රාජ්‍යය කොට ආයු කෙළවර සවගිපරායණ වූහ. බෝසතාණන් වහන්සේගේ රාජෝවාදධර්මය රාජ්‍ය පරම්පරාණුගතව සතළිස් දහසක් අවුරුදු මුළුල්ලෙහි පැවැත්තේය. මෙසේවූ මේ රාජ ධර්මය දැන ඇදින දැහැමෙන් රාජ්‍යය නො කොට අධර්මයෙන් රජකළ පුරාතන නොයෙක් රජ දරුවෝ ආත්ම වධාදීවූ මහත් අනයව්‍ය සනයට පැමිණියාහුයි හේ කෙසේද? යත්.

මෙසේ නවවන පරිවෙජ්දයෙන් රාජධම් විභාගානිසංස ප්‍රකාශ කිරීමෙන් ලෝවැඩ දක්වා තදනතරව ඒ සියළු රාජධම් යෙහිපිහිටා ලෝවැසියන්ට හා නම තමන්ට වැඩ සැදීම කැමැති රජදරුවන්ට ස්‍රුවරජ සෙනෙවිරත් ආදී නොයෙක් ඇමතිවරුද ධර්මිෂ්ට සහායවන බැවින් ගෘහපති නම් ලද ඒ ඇමති ආදීන් විසි නුදු පිළිපැද්ද යුතු ධර්ම මාගීය දැන හැසිරෙණ පිණිස ගෘහපති ධම්විභාගානිසංස කථාවෝද මදක් මෙහි දක්වනු ලැබෙත්. එහි ගෘහපතිහු නම් පූර්වජාතිවල කරණ ලද කුසලානුභාවයෙන් මහත් සිටු සම්පත් ලදින් වසන්නාවූන් හා රජ දරුවන් කෙරේ එසේම නොයෙක්යස නානතුරු ආදිය ලදින් හෝ නො ලදින් හෝ ගෘහ වාසයෙහි වසන්නාහු නම් වෙත්. ඔවුන්ගේ ධර්මය නම් කවරහ යත්. දෙමව්පිය ගුරුවර පුත්‍රදාරාදීහි දාසම්ත්‍රාමාත්‍ය ශ්‍රමණ බ්‍රාහ්ම ණාදීන් දැන ඇදින මනාව පවතිමින් අත්වැඩ පරවැඩ දෙක්හි යෙදී දෙලොවින්ම වැඩවන සේ ගෘහවාසයෙහි විසීම ඒ ගෘහපතීන් ගේ ධම්මතා නම්වේ. හෙද වනාහි ගෘහපති ධර්ම ප්‍රකාශක සූත්‍රාදී කථාදියෙහි ආ ක්‍රමයෙන් මෙහි දක්වම්හ. ඒ කෙසේද? යත්,

සිඟාලොවාදකාදීහි සුත්තනෙතහිතෙසිතා,
ඵහොලෝකජයාගෙති පවිපත්තිපකාසිතා.
ගහට්ඨානං පතිට්ඨාය තත්ථධම්මෙන පවෙය,
එසිතබබාතථා තෙසං තෙ සඤ්ඤායන්ති ධම්මතො.

භගවතාහි වත්තබ්බෝ කම්මකිලෙසා පහාතබ්බා, වතුභිඨානෙහි පාපකම්මං නකාතබ්බං ඉව හොගානං අපායමුඛානි වජ්ජිතබ්බානි වත්තරෝ අම්මත්තා පරිවජ්ජිතබ්බා වත්තාරෝ මිත්තා සෙවිතබ්බා ඉදිසා පටිවිඡාදෙතබ්බාති ඝරාවාස වසන්නානං කුලපුත්තානං ඉහලොක රාලොකසංඛාතෙසු ඒසු ලොකෙසු දණ්ඩදු ඝාතිභයානං විජ්ඝතතෝ උභොලොක ජයායෙති පවිපත්ති පභාගිතා.

යතාදි ක්‍රමයෙන් හැම සතුන් වෙත පහළ මහකරුණාව ඇති භාග්‍යවතුන් වහන්සේ විසින් සිහාලොවාද සූත්‍රාදි නොයෙක් තැන්හි මෙලෝ පරලෝ දෙක්හි වත සියළු භය දුරුවීමෙන් ජයාහි වෘඩිය වන පිළිවෙත් ප්‍රභාශ කිරීමෙන් ගෘහවාසීන්ට හිත පිණිස ධම්මෙතපවවයා එසිතබ්බා යතාදි ප්‍රතිපත්හි වදුරණ ලදු, එහි ආදියෙහි ම පවිමානි භික්ඛවෙ වණ්ඩිජ්ජා උපාසකෙන අකරණියා, "කතමානි? පඤ්ච සඵවණ්ඩිජ්ජා සත්තවණ්ඩිජ්ජා මංසවණ්ඩිජ්ජා මජ්ජවණ්ඩිජ්ජා විසවණ්ඩිජ්ජා, ඉමා ඛො භික්ඛවෙ පඤ්ඤවණ්ඩිජ්ජා උපාසකෙන අකරණියා ති"-යනු වදළ බැවින් ධම්මානුශාසනාවෙහි පිහිටි ගෘහපති සඛ්‍යාත උපාසක ජනයන් විසින් නො කටයුතුවූ පරහිංසාවට කාරණා වූ ශස්ත්‍ර වෙළඳමය යි කියනලද ආයුධ භාණ්ඩ සවහත්තයෙන් කිරීමෙන් හෝ අනුන් ලවා කරවාලීමෙන් හෝ යම්කිසි ප්‍රකාරයකින් ලදින් හෝ ආයුධ වික්කිණීමය, අනුන් දුස කිරීම සවභාව වූ සත්ව වෙළඳම යන මිනිසුන් වික්කිණීමය, වධයට කාරණා වූ මාංස වෙළඳමය යි කියනලද සුනඛාදීන් මෙන් මෘග ශූකරාදීන් පෝෂ්‍යය කොට වධ මස් සපයා ඒ මාංස වික්කිණීමය, ප්‍රමාදයට කාරණා වූ රා වෙළඳමය යි කියනලද සුරා මෙරය සපයා වික්කිණීමය, සත්ව හිංසාවට හෙතු වූ විෂ වෙළඳමය යන මේ පස්වෙළඳ ඒ සාවද්‍ය කෙසින් උපාසකවරුන් විසින් කොකොට හැරීම ම වදුරණලදී. එසේ නො කටයුතු වූ මේ පස් මිථ්‍යා වෙළඳමෙන් දුරු ව ධම්මෙනසමෙකානි යනුවෙන් දැහැමෙන් සෙමෙන් ප්‍රත්‍යය සපයා දිවි පැවැත්වීම වදළ හෙයින් ධම්මෙන යන පදයෙන් ප්‍රකාශ වූ ඒ පස්වෙළඳමෙන් අන්‍යවූ ද අධර්ම ක්‍රියා අධර්ම ලාභ අධර්ම ජීවිකාවන් දුරු කොට ධර්මයෙන් වෙන් නො ව ධර්මානුකූල ව කරණ කියන ගොවිතැන් වෙළඳම් ආදියෙන් ප්‍රත්‍යය සපයා ගැන්ම ද සමෙන යන පදයෙන් ප්‍රකාශ වූ යඤපත් කායසමාචාරාදීවූ සුචරිතයෙන් බුබාදී ආර්‍යයන් විසින් පිළිකුල් නො වූ යම් කිසි ජීවිතූපකරණ සපයා ගැන්මෙක් ඇද්ද

එයින් ප්‍රත්‍යය සපයා ගැන්මද නිවැරදි හෙයින් යථොක්ත ක්‍රම යෙන්ම දූහැමෙන් යෙමෙන් ප්‍රත්‍යය සපයා ගෙණ ඒ ලද ප්‍රත්‍යය තමුන් ධම්නුකූලව පරිභොග කිරීමද එම පදවීයෙහි ඇතුලත් කොට පෙණෙන හෙයින් ගෘහස්ථොපාසකොපාසිකා ජනයන් විසින් සුදුසුයේ එහි පිළිපැදීද මැනව. ගෘහවාසීන් ධම්නුපරියෙසන පරිභොගවශයෙන් ප්‍රත්‍යය සම්පාදනය කිරීම මෙසේ දතයුතු, එහි දූහැමින් ප්‍රත්‍යය සෙවීම ප්‍රව්‍රජිතයන්ට පවා දුෂ්කර තැන ගෘහ ස්ථයන්ට දුෂ්කර බව කියනුම කවරේද? එතකුදු උවත් තමහට වැඩ කැමතියන් විසින් භාග්‍යවතුන්වහන්සේ වදාළ පිළිවෙත්හි හැසිරීමෙන්ම ප්‍රත්‍යය සෙවිය යුත්තේය. එසේ බුදුන් වදාළ ලෙස පිළිපැදීම අති කල්හි දූහැමින්ම ඒ ප්‍රත්‍යයෝ ඕහට සමෘඩ වෙත්. ඒ මෙසේ දතයුතු.

එක් සමයෙක්හි අප භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර වේළු වනාරාමයෙහි වාසය කරණසේක. එසමයෙහි එක්දවසක් අළුයම්හි ලොව බලා වදාරා "අද දවස ගිහිධර්ම ප්‍රකාශ කොට ධම්දෙශනා වක් කරම් යන කරුණාවෙන් එකලාව පා සිවුරු ගෙණ වදාරා ඒ නුවරට වැඩ සිහාලක නම් ගෘහපති පුත්‍රයාට අඩහා වදාරා ගෘහ පතිය ගිහිව වයන තොප විසින් චතුර්විධකර්මක්ලේශ කෙනෙක් දුරුකට යුත්තාහුය. සතර කාරණයකින් පාපකර්ම නොකට යුතුය, වසතුන්ගේ විනාශ වීමට නිසි කාරණා දෙකෙක් හැරිය යුත්තාහ අම්ත්‍රයෝ සතර දෙනෙක් දුරුකට යුත්තාහුය. මිත්‍රයෝ සතර දෙනෙක් සේවනය කිරියුත්තාහ. ඡඩ්දිශාවෝ වැසිය යුත් තාහුය. එසේ අති කල්හි ගෘහවාසයෙහි වසන්නාවූ කුලපුත්‍රයන්ට මෙලෝපරලෝ දෙක්හිම වන්නාවූ දණ්ඩබුද්ගරාදි නොයෙක් භය හා දුගීතිභය ආදිවූ නොයෙක් භයොපද්‍රව දුරුවීමෙන් ජය ගැණීම පිණිස මේ කාරණයෝ වන්නාහුයයි කියා දෙලොවම හිතවැඩ සාධන පිළිවෙත් මෙසේ පළමු කොට සංක්ෂෙපයෙන් වදාරා නැවත ඒ ගෘහපතියාගේ ආරාධනාවෙන් විස්තර කොට වදාළසේක. ඒ සතර කර්මක්ලේශයෝ නම් කවරහයත්—

පාණාතිපාතො අදින්නාදානං මුසාවාදෙපවුව්වනි.
පරදාරගමනංවෙව නපපසංසන්ති පණ්ඩිතාති.

එහි පාණාතිපාතය අදත්තාදානය කාමම්ථ්‍යාචාරය මුසාවාදය යන මේ පාපකර්මයන්ගේ කිරීමට නුවණැත්තෝ නින්දා කෙරෙති. ඒ පාප කර්ම හේතු කොට ගෙණ සත්වයෝ තම තමන්ගේ

ප්‍රතිබද්ධ වූ ඡායාව මෙන් ජාතියක් ජාතියක් පාසා එක්ව ම ලුහුබඳවා යන කම්ම කෙලසන හෙයින් ඔහු කම්ක්ලේශයෝ නම් වෙත්. ඒ පාපකම්යෝ කියකාලද ක්‍රමයෙන් නොයෙක් ආදීනව ඇති හෙයින් දුරුකටයුත්තාහු යි. සුරාපානයෙහි ආදීනව මතු පහළවන හෙයින් මෙහි නො දක්වනලදී. පාපකම් සිඛවන සතර අඛයෝ නම් කවරහ? යත්—

ඡන්දූ දෙසා භයා මොහා යෝ ධම්මං අතිවත්තති,
නිහීනෝ තස්ස යසෝ කාලපක්ඛව වඩ්ඪතී.

මෙහි ඡන්දාගතිය දෝසාගතිය භයාගතිය මොහාගතිය යන මේ සතර අගතීන් අතුරෙන් යමෙක් මෙතෙම මාගේ මිත්‍රය යි කියා හෝ නෑයෙකැ යි කියා හෝ මට අත්ලස් දීනැ යි කියා හෝ ඡන්දාදි වශයෙන් අභිමියන් හිමි කෙරේ ද මේ තෙමේ ඡන්දයෙන් අගතියට ගොස් පවි කරන්නේ නම් වෙයි. යමෙක් තෙම මට වෛර එකෙකැ යි කියා ප්‍රකෘතිවෛර වශයෙන් හෝ ඒ ක්ෂණයෙහි උපන් ක්‍රෝධ වශයෙන් හෝ අභිමියන් හිමි කෙරේ ද හිමියන් අභිමියන් කෙරේ ද මෙතෙම දෝසයෙන් අගතියට ගොස් පවි කරන්නේ නම් වෙයි. යමෙක් තෙම රාජවල්ලභයෙකැ යි කියා හෝ විෂමනිශ්‍රිත යෙකැයි කියා හෝ මට අනර්ථ ද කරන්නේයයි කියා හෝ භයපත්ව අභිමියන් හිමිකෙරේ ද හිමියන් අභිමි කෙරේ ද මෙතෙම භයින් අගතියට ගොස් පවි කරන්නේ නම් වෙයි. යමෙක් තෙමේ නුවණ මදව මෝහයෙන් මුළා බැවින් යම්කිසි කවට ආවක් කියා ඇති ලෙස යුක්ති විනිශ්චය කිරීමෙහි අසමර්ථ ව අභිමියන් හිමි කෙරේ ද හෙතෙම මෝහයෙන් අගතියට ගොස් පවි කරන්නේ නම් වෙයි.

මෙසේ කිසිවක් බෙදනුයේ මෙතෙම මාගේ මිත්‍රයෙක නැයෙක යනාදී වශයෙන් ප්‍රේම උපදවා අධික කොට දේ ද මෙතෙම මට වෛරය යි වෙඟ වශයෙන් අඛු කොට දේ ද මෝහයෙන් මුළා බැවින් දුන් නුදුන් අග නො දැන කිසිවක්හට අඛු කොට කිසිවක්හට අධික කොට දේ ද මෙතෙම මෙය නුදුන් කල්හි මට අනර්ථ ද කරන්නේය යි භය පත්ව කිසිවක්හට අධික ව දේ ද හෙතෙම යථා ක්‍රමයෙන් ඡන්දාදි සතර අගතියට ගොස් පවි කරන්නේ නම් වෙයි. මෙසේ සතර අගතියෙන් අගතියට ගොස් සඛභාව ධර්මය ඉක්ම පැවතීමෙන් පවි කරන්නේ ද, ඔහුගේ යස පිරිවර සියල්ල කෘෂ්ණ පක්ෂයෙහි සඳමඬල මෙන් පිරිහෙන්නේයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද වචනය සිහිකිරීමෙන් හෝ සවභාවයෙන් පවිකිරීමෙහි මැදහත් කමින් හෝ මේ සතර පවිටු කාණයන් යම්හෙයකින් ආශ්‍රාවකතෙම දුරුකරන්නේ වේද, එහෙයින් සතර කාරණයකින් හෙතෙම පාප කම් නොකරන්නෝ වෙයි. මේද වදාරණ ලද මැයි බුදුන් විසින්— යතෝ ඛෝ ගහපතිපුත්තස අරියසාවකෝ තෙව ඡන්දාගතිං ගච්ඡති, න දෝසාගතිං ගච්ඡති, න මෝහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ඉමෙහි ඛෝ වතූහි ඨානෙහි පාපං කම්මං න කරොතීති තසෙවං වුත්තිඨානෙහි පාපකම්මං අකරොනතස්ස ගිරග්ගසමුස්සවණ්ණ දුසි දුසාම්මවාදිනං ථුතිඝොසවසෙන වුඩ්ඪිඒව ආකංඛිතබ්බා නොහානි-

ඡන්දදෙසා භයා මොහා යෝ ධම්මං නාතිවත්තති,
තස්ස යසෝ ආපූරති සුක්කපක්ඛෙව චන්දිමාති,

ගෘහපතිපුත්‍රය මෙසේ මේ සතර අගතියෙන් අගතියට ගොස් පව් නොකරණ ඒ පුද්ගලයාගේ ගිරග්‍රසමුස්සිත දුසි දුසාදි වස්තු විධානය වීම හා මිත්‍රාමාත්‍යාදීන්ගේ සතුති සොෂාවන්ගේ වශයෙන් ඔහට අභිවෘද්ධිය වන්නේය. පිරිහීමක් නොවන්නේය. තවද එසේ ඡන්දයෙන් වෙෂයෙන් භයින් මෝහයෙන් යමෙක් අගතියට ගොස් පාපකම් නොකරන්නේද ඔහුගේ යසපිරිවර ආදි සියල්ලම පුවිපක්ෂයෙහි වන්‍ර මණ්ඩලය මෙන් සම්පූර්ණ වන්නේය. තවද ඉහලෝකයෙහිම වස්තූන්ගේ විනාශ වීමට අවැඩට හිසි කාරණා සය කම් කවරහ? යත්, සුරාමෙරය පානය කිරීමය නොකල්හි විජි ආදියෙහි ඇවිදීමය නාට්‍ය ගීතාදිය දක්නට යාමය දූ කෙළිමට යෑ?ය පාපමිත්‍රයන් හා එක්වීමය, අලසවීමය යන මේ කාරණයෝ සදෙන මේ ලොවම වස්තු විනාශ වීමට අවැඩට හිසි කාරණා හෙයින් දුරුහාවයුත්තාහුයයි වදළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මේසේ මේ සුරාපානාදි කාරණයන් සම්බන්ධ වන සැප වළකන පිණිස දුරුකිරීම වදළ සේක් නොවෙයි. මහාකාරුණික බැවින් ඒ සුරාපානාදි අකනීය්‍යවල ශෙදීම් වශයෙන් ඒ ඒ කාරණා හෙතු කොට ගෙන වන්නාවූ නොයෙක් ආදීනව සවිඥානාඥානයෙන් දැක වදාරා එයින් සත්වයන් ගලවන පිණිස වදළ සේක. සුරාමෙරය පානයෙන් මේ ජන්මයෙහි වන ආදීනව කවරහයත්:— උපයා තුබූ ධනය විනාශ කෙරෙයි කලහ වඩයි. අක්ෂරොගාදි ඒ ඒ රොගයන්ට භෙත්‍රයය, සුරායෙන් මත්ව මව්පියාදීන්ට පවා දණ්ඩ නිග්‍රහ කිරීම් ආදි වශයෙන් නොයෙක් අකනීය්‍ය කරණ බැවින් මහත් අයස් අකීර්ති උපදනිව.

ලජ්ජා භය උපදනව නිසි තැන ලජ්ජා භය දෙන නසයි. සියළු වැඩට කාරණාවූ ප්‍රඥව දුරු කොට අඥන හෙරෙයි. මෙසේ ඒ පුද්ගලයා විසින් එම ජාතියෙහි දුක්ක යුතු ආදීනව සයෙක් වේ. රාත්‍රි භාගයෙහි වීථි ආදියෙහි ඇවිදීමේහි ආදීනව කවරහ?යත් නොකල්හි ඇවිදින්නේ නොකී නොකළ නොයෙක් වරද පැමිණි මෙන් ආත්මයද රැකගත නොහෙයි. තමා බැහැර ගිය හෙයින් අඹුදරුවෝද රක්ෂා නොකී කැමති සේ හැසිරෙත්. නුඹත් අඹුදරු වෝත් පිටත හැසිරෙණ බව දැන ඔහුගේ දෙපල සිස්වෙයි සම්පතද රැකගත නොහෙයි. අනිකෙකු කළ වරදෙක වී නමුත් අසවල් පුරුෂ රාත්‍රි භාගයෙහි ඇවිද්දේයයි ඔහු කෙරෙහි සැක කරන්ට නිසිවෙයි. නොකළ වරද වීදිනත් ඔහු නෙරෙහි පිහිටයි. කුනු කටු සපි යක්‍ෂෝපද්‍රවාදී නොයෙක් දුකට කාරණයන් පූර්‍ණයම වෙයි. මෙසේ නොකල්හි වීථි ආදියෙහි ඇවිදීමෙහි ආදීනව සයෙක් වෙයි.

බොගෝදෙනා එක්ව ක්‍රීඩා පවත්නා සථානවල නෘත්‍යාදීන් දක්නව යාමෙහි ආදීනව කවරහ?යත්— නැටුම් ගී ආදිය ඇති තැනව යෙමි. මල්සුවඳ පිළි අන්න පානාදිය සපයා ගැන්මෙනුත් එහි කිප දිනක් ප්‍රමාදව බලා සිටිනා හෙයිනුත් ඒ ඒ කලට තමා විසින් කළමනා ගොයිතැන් වෙළඳුම් ආදි ප්‍රයෝජන කටයුතු පිරිහීමෙන් අර්‍ථහානි වීමය, ගේ හැර පිටතට ගිය හෙයින් රන්රිදී මසුරන් ධාන්‍යාදිය හා කෙත්වත්වල තුබූ පොල් පුවක් අඹ කොස් ආදි ඵලාඵල ආදියෙහි රැකවල් නැති බව දැන සොරු ගෙණ යාමද ගී නැටුම් ආදිය පිණිස යාමෙහි ආදීනවයි. දුකෙන් වසනු හැකි වෙයි. රැස්කළ ධන විනාශ වෙයි. සබයෙහි මෝහු කිබස නොගන්නේය. මිත්‍රයන් විසින් නිහඬවට පැමිණෙයි, ආමාහ විවාහ කරන්නෝ නොකැමති වන්නාහුය. මේසේ දුකෙළිමෙහි ආදීනව සයෙක් වේ. පාප මිත්‍රයන් හා මිත්‍රව විසීමෙහි ආදීනව කවරහ? යත්, යම් කෙනෙක් දුකෙළි කැමති වේද්ද, ඔහු හා මිත්‍ර වන්නාහ. යම් කෙනෙක් ස්ත්‍රිධූර්‍ත වේද්ද, ඔහු හා මිත්‍රවන්නාහ. යම් කෙනෙක් රා සොඬහුද ඔහු හා මිත්‍රවන්නාහ, යම් කෙනෙක් ඇතිසේ නොදක්වා වඤ්චාවේද්ද, ඔහු හා මිත්‍රවන්නාහ, යම් කෙනෙක් අභිමුඛයෙහි වඤ්චක වෙත් ද, ඔහු හා මිත්‍ර වන්නාහ, යම්කෙනෙක් පවි කිරීමෙහි හය නැතිව සාහසික ක්‍රියා කෙරෙද්ද, ඔහු හා මිත්‍රවන්නාහ, මෙහි පාපමිත්‍රයන් හා එක්ව වාසය කළ පුරුෂතෙමේ ග්‍රාමක ඉකරාදීන් අසුවියට දුවන්නාසේ මේ පාපමිත්‍ර යන් කැවිවම ඇලෙන්නේය, මෙසේ පාපමිත්‍රයන් හා මිත්‍රවීමෙහි ආදීනව සයෙක් වෙයි.

අලසවීමෙහි ආදීනව කවරහ? යත් - යමෙක් දැන් ඉතා සීත යයි කියා තමා විසින් කළමනා කෙත්වත් ආදියෙහි කම්නැත

නොකරන්නේද ඉතා උත්තරියයි කියා කමිනානා නෙ කරන්නේද ඉතා සවස්ව ගියේයයි කමිනානා නොකරන්නේද ඉතා උදෑසනයයි කමිනානා නොකරන්නේද ඉතා බුබාගෙමියි කමිනානා නොකරන්නේද ඉතා පිපාසයෙමියි කමිනානා නොකරන්නේද මෙසේ අලස භාවයෙන් යුකත වූවාහට නුපන් සම්පත් නුපදී. උපන් සම්පත් වස්තු විනාසයට පැමිණෙයි. මෙසේ අලස විමෙහි ආදීනව සඳහක් වේ. මෙතෙකින් ඉහලොකයෙහි හොග විනාශ කාරණ කාරණා සඅක් දක්වනා ලදී.

තවද දුරුකටයුතු අමිත්‍රයෝ නම් කවරහ? යත්—

අසඳසදත්ථුහරොමිතෙනා යො ව මිතෙනා වවිපරෝ,
අනුපපියසඳව සො ආහ අපායෙසු ව යොසඛා.

යනු හෙයින් අසඳසදත්ථුහරය වවිපරමස අනුප්පියභානිය අපාය සහාය යන මොහු සතරදෙන මිත්‍රයන් සේ හඟවන ලකානා අමිත්‍රයෝ නම් වෙත්. ඔවුන් අතුරෙන් මිත්‍රයාගේ ගෙට අවුත් දුනද නුදුනද ඒකානතයෙන් යම්කිසිවක් දුනත් ගෙණ යන අසඳසදත්ථුහර නම් අමිත්‍රයා සතර කාරණයකින් හැඳිනිය යුතු වේ. මිත්‍රයාගේ ගෙට සිස් අතින් අවුත් හදනා පිළි ආදි යම්ම වසතුගෙක යහපත කිය කියා හැරගෙණ බලන හෙයින් තෙපි මේ වසතුය කැමතියාදැයි විචාරා ඒ වස්තුාදිය දුන් නුදුන්නේ ගෙණයේද, දෙයි දෙඩම් ආදි දීමද, උපකරණ දෙයක් මිත්‍රයාගේ ගෙට ගෙණ වුත් දී ඔවුන් ගෙන් බොහෝ දේ පතා සිටීද, තමහට භයක් වූ කල දෑසෙකු මෙන් ඔහුගේ ගෙයි කටයුතු කරන්නේද, ගැඹුම් ප්‍රේමයෙන් නොකරන්නේද, තමහට වන ප්‍රයෝජනය සලකා සේවනය කෙරේද යන මේ සතර කාරණයන් වසතු ගෙණ යන මිත්‍ර ලෙසයෙන් ආ මිත්‍රයා දතයුතු.

තවද සතර කාරණයකින් වවිපරමවූ මිත්‍ර ප්‍රතිරූපක ,මිත්‍රයා හැඳිනිය යුතු වේ. යමක් මිත්‍රයා අවුත් ඉල්වූ කල පළමු තෙපි නොඅහ. ඒ කාලයෙහි නම් අප දුන්නම්හයි අතීත දෙයින් සංග්‍රහ කරන්නේද, දෙවනු එව, එවිට අපගේ සසාදිය සමඟ වෙයි. තොප කැමති දෑ ඒ කාලයෙහි දෙම්හයි අනාගත දෙයින් සඟයින් සංග්‍රහ කෙරේද, තාවකාලික කොට ගැල් නතුල් පිලිගන් ආදිය කිසිවක් ඉල්වූකල ඇතිව තිබේදීත් නැතිසේ ව්‍යසන දක්වා කියා මුළාකෙරේද, යන මේ සතර කාරණයෙන් වනයම උතුම් කොට ඇති අමිත්‍රයා ඇඳිනිය යුතු වේද, සතර කාරණයකින්

අදහස් බල බලා අනුකූලවූ ප්‍රිය වචන කියන අමිත්‍රයා දතයුතු වේ ප්‍රාණඝාතාදි පාපකර්මයකි කී කල ඔහු කැමති බව දුන යහලු ඒ කළමනාමියයි කියන්නේ ද යහපතක් කරමතැයි කී කලත් එසේම කියන්නේද, මෙසේ කීවක්ම අසා වැඩ අවැඩ පරීක්ෂා කොට යහපත නපුරු ඇතිසේ නො කියන පාපමිත්‍රයා අතිවුඛයෙහි ගුණ කියාදී පිටතදී නුගුණ කියාදී යන මේ සතර කාරණයෙන් අනුකූලව බස් කියන අමිත්‍රයා ඇඳින්න යුතු.

තවද සතර කාරණයකින් අපායට ගෙණයන්ට සාහයවූ අමිත්‍රයා දතයුතු වේ සුරාමෙර පානය සඳහා යහළු වන්නේද රාත්‍රී භාගයෙහි පිටියෙහි ඇවිදීමට යහළුවන්නේද, ගී නැටුම් බලන සඳහා යහළුවන්නේද, දූ කෙළිනා සඳහා යහළුවන්නේද, යන මේ සතර කාරණයෙන් අපායට ගෙණයන පාපමිත්‍රයා ඇඳිනිය යුතු. මෙසේ වූ මේ අමිත්‍රයෝ සතර දෙනම දුරුකට යුත්තානුයි. ඒ කෙසේද? යත් -

ඒතේ අමිත්තෙන වත්තාරෝ ඉතිවිඤ්ඤුය පණ්ඩිතෝ,
ආරකාපරිවජ්ජේය්‍ය මහාං පථිනයං යථා තිං.

තමා කෙරෙන් කිසිවක් ගෙණයන අමිත්‍රයාද අනුකූලව බස් කියන අමිත්‍රයාද අපායට ගෙණයන අමිත්‍රයාද යන මේ සතර දෙන දුන හැඳින සොරුන් විසින් ව්‍යාඝ්‍රාදීන් ආකුලවූ මාගිය සේ විෂ සෝර සපියන් සේ මේ ඒ පාපමිත්‍රයන් දුරු කටයුතු. මේ පාප මිත්‍රයෝ සියළු අනර්ථයට මූල්ව සිටි බාලයෝ නම් වෙත්. ඔවුන් අනේක උපද්‍රව වෙති. බුදුන් විසිනුදු මහණනි යම් සේ හුණදඹු තණ පිදුරුන් ආදී සෙවිලිකල ගෙහි ඇවිලි ගිහි වෙත සිටි කවුළු දොර බැයෙන් යුකත වූ ප්‍රාසාද කූටාගාරයන් දවාද එසේම යම් හයෙක් උවදුරෙක් වේ නම් බාලයන් විසින් වෙති, පණ්ඩිතයන් විසින් නො වෙති. පණ්ඩිතයෝ සතුරුහු නම් වැඩෙක්ම සාදති. බාලයා මිත්‍රහු නම් විනාසම කෙරෙනිසි වදුල බැවින් පාපමිත්‍රයන් හැර පණ්ඩිත වූ ඉඟ මිත්‍රයන් දුන සෙවිය යුතු

තවද හිර නැගෙන තෙක් නිද්‍රා කිරීමද පරදුර සේවනයද අනුන්ට වෛර ඉපදවීමද තමහටද අනුන්වද අනර්ථයට අවැඩ කට යුතු කිරීමද, පාපමිත්‍රයන් ඇති බවද, කෙරොටික බවද, මිනිස්නට විනාස මූල්කාරණය හා ලාමකවූ කාසවෘක් සමාවෘදද නොගියමනා තැනට යාමද, ධූර්තයන්ගේ සේවනයද, දූ කෙළිනා රා බොන පුරුෂ යන් හා එක්වීමද ගී නැටුම් කරා යාමද, පණ්ඩිත සේවනයෙන් දුරු බාල අඥන සේවනයද සතතයෙන් සුරායෙන් මත්වීමද යන මෙතෙක් කාරණයෙන් යුත් ප්‍රමාදසමය සඳ සේ පිරි හෙයින් ගෘහ වාසයට නො නිසි වේ. තවද සතර කාරණයකින් මනා සිත් ඇති ඉෂ්ටමිත්‍රයෝ සතරදෙනෙක් වන්නාහු ය. ඔහු කවරෝ? යත්—

උපකාරොව යො මිත්තො යොව මිත්තො සුඛෙදුඛෙ,
අත්ථකාමොව යො මිත්තො යොව මිත්තානුකම්පකො නි.

උපකාර මිත්‍රය, සුව දුක් දෙකෙහි සම ව පවත්නා මිත්‍රය වැඩ කියන මිත්‍රය අනුකම්පා ඇති මිත්‍රය යන මොහු ය. එහි යතර කාරණයෙන් මනා සිත් ඇති උපකාර මිත්‍රයා ඇඳින්න යුතු වේ. මත් ව හෝ විෂමූර්ඡාදි කිසිවකින් මිත්‍රයා ප්‍රමාද වූ කල ඒ ඒ දුකින් මිදෙනතාක් ඔහු රක්නේ ද, මිත්‍රයා මුලා වූ බව දැන කිසිවෙක් ඔහුගේ වසතු ගෙණ යේ ද්වේෂ ය සිතා සම්පත් රක්නේ ද, භයක් පැමිණි කල්හි පිහිට වන්නේ ද, මෙ වැන් මාගේ කටයුත්තක් ඇතැ යි යනාදි යමක් ඉල්වා අ කල ඔහු ඉල්වූ විවරට දිවුණක් දෙන්නේ ද, යන මේ සතරකාරණයෙන් උපකාරවූ මනා සිත් ඇති මිත්‍රයා දනයුතු. තවද සතරකාරණයකින් සුව දුක්හි සම වූ මිත්‍රයා ඇඳින්න යුතු වේ. ඒ කෙසේ ද? යත්— තමාගේ රහස් නො හඟවා මිත්‍රයාට කියාද, මිත්‍රයා කී රහස් අනුන්ට මඳකුත් නො කියා රකී ද, ආපදාවක් වූවිට මිත්‍රයා නො හැර එක් ව විඳගණී ද තමාගේ ජීවිතය පරිත්‍යාග කොට මිත්‍රයා රකී ද යන මේ සතරකාරණයෙන් සමාන සුවදුක් විඳිනා මිත්‍රයා ඇඳින්න යුතු.

තවද සතරකාරණයකින් වැඩට නිසි බස් කියන මිත්‍රයා ඇඳින්න යුතු වේ. ඒ කෙසේ ද? යත්— පණිවා ආදි පවු කරණු තො දී අවවාද කියා මිත්‍රයා එයින් වළකා ද, යහපත් කළමනා දුනාදි පින්කම් කියා උගන්වා ද, මිත්‍රයා නො ඇසූ සඟවොන් සැප සාදන බණ අස්වා ද, සවගීයට යන්ට නිසි පිළිවෙත් කියා ද යන මේ සතරකාරණයෙන් වැඩට වැටෙන්නක් කියන මනා සිත් ඇති මිත්‍රයා ඇඳින්න යුතු. තවද සතරකාරණයකින් අනුකම්පා ඇති මිත්‍රයා ඇඳින්න යුතු වේ. මිත්‍රයා අනාථ ව දුප්පත් ව ශිය කල තමහට වූවාක් මෙන් දෙමිනසට පැමිණේ ද, මිත්‍රයා සුවපත්වූ කල තමා ලද සැපතක් මෙන් සතුටු වේ ද, අගුණ කියනු අසා මගේ මිත්‍රයා කෙරෙහි එවැනි නුගුණ නැත යනාදිය කියා වළකා ද ගුණ කියනු අසා මාගේ මිත්‍රයාගේ ඇති ගුණමය යනාදීන් ගුණ කියමින් සතුටු වේ ද යන මේ සතරකාරණයෙන් අනුකම්පා ඇති මිත්‍රයා ඇඳින්න යුතු. මෙසේ වූ මේ මිත්‍රයෝ සතරදෙන සේවනය කටයුත්තාහු ය. ඒ කෙසේ ද? යත්—

එතෙව වත්තාරෝ මිත්තෙ ඉති විඤ්ඤාය පණ්ඩිතො,
සක්කච්චං පයිරුපාසෙය්‍ය මාතාපුත්තං ව ඔරසං නි.

මෙසේ මේ සතරවැදෑරුම්වූ මිත්‍රයන් ඇඳින මෙබඳු පණ්ඩිතවූ සත්පුරුෂයන්ගේ සමාගම මෙලෝ පරලෝ දෙක්හි සියළු වැඩට ද

නිවන් සම්පතට ද කාරණය යි දැන මවුපියන් කෙරෙහි පවත්නා සේ ඒ ඉෂ්ටමිත්‍රයන් කෙරෙහි පැවත ඔවුන් කී බසට උත්තර කොං කියා කී අවවාද මුදුතෙන් පිළිගෙණ ඒ අවවාද නොවරදවා පිළිපැද ඔවුන් නොසතුටු වන්නට නිසි වරදක් මනා කොට දිවි හිමියෙන් මිත්‍රභෙද නොවන සැටියේ වාසය කොට නොදැන කළ වරදකින් හෝ භෙදයන්ගේ බසින් හෝ දෙම්නත් වූවක් හැහුනී නම් කළ වරද නොකෙළෙමි නොකියා නොදැන කෙළෙමි, මෙසින් මතු නොකෙරෙමි කියා ද කළහොත් ගෙදපිණිස කී බස ගිවිස්වා වහා ක්ෂමා කරවා දෙම්නස සිතින් හරවා පෙර සේ ම වාසය කොට දෙලොවින් ම වැඩ සාදගත යුතු.

මෙසේ දක්වනලද ක්‍රමයෙන් පාපමිත්‍රයන් දුරු කොට පණ්ඩිත වූ ඉෂ්ටමිත්‍රයන් හා එක් ව ධර්මිෂ්ඨ ව වසන බුබාතුශාසනා වෙහි පිහිටි උපාසකවරුන් විසින් දෙමව්පියන් කෙරෙහි ද අඹු දරුවන් කෙරෙහි ද මිත්‍රයන් කෙරෙහි ද දැසිදසුන් මෙහෙකරුවන් කෙරෙහි ද සීලාචාරාදි ගුණසම්පන්න ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ද පවත්නා මේ ද බුදුරජානන් වහන්සේ වදුල පරිද්දෙන් පිළිපැද දෙලොවින් ම වැඩ සාදගත යුතු. ඒ කෙසේ ද? යත්—

මාතාපිතා දිසාපුබ්බා ආචරියා දක්ඛිණාදිසා,
පුත්තදාරා දිසාපච්ඡා මිත්තාඅමච්චාව උත්තරා.
දාසකම්මකරාහෙට්ඨා උඩ්ඩං සමණබ්‍රාහ්මණා,
එතාදිසා තම්සෙය්‍යත්‍ථ අලමත්තොඋලෙගිහිනි.

යන මේ ගාථාවයෙන් ඡට්දිසා ප්‍රතිවිශාදනය කොට වදුරණ ලේක් දෙමවුපියෝ තමාට පූජියෙන් උපකාර වූ හෙයින් පූජිදිග නම් දෙමවුපියෝය යි කියා ද තමා විසින් කරණලද වන්දනමානාදි යට සුදුසු හෙයින් දකුණුදිග නම් ආචාර්‍යශ්‍රීවරයෝය යි කියා ද සවාමිපුරුෂයාට පසු ව පවත්නා හෙයින් පශ්චිමදිග නම් අඹුදරුවෝය යි කියා ද තමා යම් කිසි දුකකට පැමිණි කල එතර කරණ හෙයින් උතුරුදිග නම් නැගණි හා මිත්‍රාමාත්‍යයෝය යි කියාද සවාමියාගට යටවහත් ව පවත්නා හෙයින් යට දිසාව නම් දැසිදස කම්කරුවන් හා පිරිවරජනයෝය යි කියා ද සීලාදි ගුණධර්මයෝය තමාට උත්තරිතර ව උස් ව සිටි හෙයින් උඩදිසාව නම් සීලාදි ගුණ සම්පන්න වූ ශ්‍රමණ බ්‍රාහ්මණය යි කියා දස දිසාවන් ප්‍රතිවිශාදනය කොට හෙවත් සතරදිගය උඩය යටය යන ඡට්දිසාවෙන් තමාට යම්කිසි උපද්‍රවයක් නොවන්නේද එපරිද්දෙන් නම් ලද දෙමව්පියෝය, ගුරුවරයෝය, අඹුදරුවෝය, නැගණි හා මිත්‍රාමාත්‍යයෝය, දැසි දස කම්කරුවන් හා පිරිවර ජනයෝය, ශ්‍රමණ බ්‍රාහ්

මණ්ඩෝස යන මේ සියල්ලන් කෙරෙන් හෝ මෙලෝ පරලෝ දෙකින් අවැඩ නො ව වැඩක් වන සේ ඇමදෙනා විසින් ඔවුනොවුන් කෙරෙහි පස් පස් කාරණයකින් සංග්‍රහ කළ මැනවි.

එහි දරුවන් විසින් දෙමව්පියන්ට උපස්ථාන කටයුතු පස් කාරණය නම් කවරහ? යත්- දස මසක් කුසින් උසුලා බිහිවූ තැන් පටන් රෑ දුවල් දෙක්හි මහදුක් විඳ ප්‍රේමයෙන් පිළිකුල් නො ව මුඛයෙන් සෙම් සොඟ මල මූත්‍ර හැරදමා නහවා අදුන් තෙල් ගා, අතපය හඹා මවුපියන් විසින් රක්නා ලද්දෙමි. උපකාරයට නිසි කොට මම දැන් මවුපිය දෙදෙනා මහළු අවස්ථාවෙහි උණුපැන් ගෙණ පා සෝදා නහවා කැද බත් ආදීන් රක්‍ෂා කෙරෙමි යි ද මාගේ කටයුතු නිමියදීත් දෙමවුපියන්ගේ ඒ ඒ කටයුතු කෙරෙමි යි ද මවපියන්ගේ කුලවංස නො නසා පවත්වමි යි ද දරුවන් විසින් දෙමවුපියන්ට කළමනාතාන් කටයුතු නො පිරිහෙළා කොට දැයාද ගාගයෙහි හිමිවෙමි ද මෙසේ දෙමවුපියන් ඇතිකල ඔවුන් ඝිත් ගෙණ වාසය කොට මළ කල දන් දී පින්පෙත් දෙමි යි ද මෙසේ මේ පස් කාරණයෙන් දරුවන් විසින් සංග්‍රහ කරණලද දෙමවුපියෝ පුත්‍රයාට කාරණා පසකින් අනුකම්පා කෙරෙත්. කියේස යත් පාපකම් කරන්ට නො දී හික්මවති, යහපත් කුසල කිරීමෙහි යොදවති, සිල්පයෙහි හික්මවති. ඔහට සුදුසු වයස කලත්‍රගෙණ දෙති- දුනමනා සමයෙහි සියළු සම්පතට හිමිකොට පිහිටුවා දැයාද දෙති.

යන මේ පස්කාරණයකින් දෙමව් පියන් විසින් දරුවන්ට අනුකම්පා කටයුතුය. මෙතෙකින් දෙමව්පියන් විසින් දරුවන්ට ක්‍ෂෙම වෙයි. නිර්භය වෙයි උපද්‍රව නොවෙයි. ශිෂ්‍යයන් විසින් ගුරුවර යන්ට පස්කාරණයකින් උපස්ථාන කටයුතු කියේස, යත්, දුරින්ම එන්නාවූ ගුරුන් දැක ශිෂ්‍යයන් විසින් උන් තැනින් නැගිසිට පෙර මගට ගොස් අත තිබූ කිසිවක් හැර ගෙණ සුරැකි කොට තබා ආසන පණවාදී ගුන් කල පවන්සලා පය සෝදවා තෙල්ගා සුවදුක් විවාරීමෙන් හා නො මැලිව හැදෑරීමෙන් ඇස්වීමෙන්ද නොසඟ ගුරුන්කරා ඵලඹ කළමනා උපස්ථාන කිරීමෙන්ද ගුරුන් කී බස් අවවාද නොඇදහීමෙන් විශෙෂයට නොපැමිණෙන හෙයින් ඇද හිමි වසයෙන්ඇසීමෙන්ද අනෙතාවාසිකයා විසින් ගුරුන්ට කලින්ම නුඟුපැන් සිහිල්පැන් ආදිය දී මෙහෙකිරීමෙන්ද ආචාරීන් ලබ මදක් කියවා ගෙණ බොහෝව හැදෑරීමෙන් මනාව සිල්ප උගැන්මෙන්ද යන මේ පස්කාරණයන් ශිෂ්‍යයන් විසින් උපස්ථාන කරණලද ආචාර්‍යවරයෝ පස්කාරණයකින් ශිෂ්‍යයන්ට අනුකම්පා කටයුතු-හේ කෙසේද? යත්—

මේ සැරියේ හිඳුව, මේ සැරියේ සිටුව, මේ සැරියේ කව පොව, පවිටු මිත්‍රයන් දුරුකරව පණ්ඩිත මිත්‍රයන් සම්පයට එළඹෙව යනාදි සියළු ආචාර උගන්වා භික්ෂූන්ගේ ශිෂ්‍යයන්ට උගන්වන ශාස්ත්‍ර උන් සිතට නැගෙනතාක් අවිගෙන් පාලියෙන් ප්‍රයෝජන කොට දක්වා, උගැන් වීමෙන්ද ශිෂ්‍යයන්ගේ නැගන් හා මිත්‍රාමාත්‍යයන් ඉදිරියෙහි ඔවුන්ගේ ගුණානුවණ යහපත මා උගත් ශාස්ත්‍ර හා උගත වැකිතය බහුශ්‍රැතය දැන් මාහා සරි බවට පැමිණියේය. මෙසේ සිහිකරව යනාදීන් නිසා ඔවුන් පිහිටකර වීමෙන්ද, ශිෂ්‍යයන් ගිය ගිය දිසාවෙහි යම් යම් ලාභසත්කාරාදියක් උපන්නහොත් ඒ හැම ආචාරීන් විසින්ම ගන්නා නම් වෙයි. ගුණ කියන්නාවූ මහජනද අසවල් ආචාරීන් වහන්සේගේ පාදෙව වැඩුනු මේ අඹැයි නමැයි, පළමුකොට ආචාරීන් වහන්සේගේම ගුණ කියන්නාහුය. ශිෂ්‍යයාට බ්‍රහ්මලෝක ප්‍රමාණ උස මහත් ලාභයක් උපනද ඒ හැම ආචාරීන් සන්තකමය. එසේ ශිල්ප හික්මවාලීමෙන් ගිය ගිය දිග පුජ්‍යවනසේ රැකගාරවීමෙන්ද යන පස් කාරණයෙන් ගුරුන් විසින් ශිෂ්‍යයන්ට ක්ෂේම වෙයි. නිර්භය වෙයි. උපද්‍රව නොවේ--

කුලපුත්‍රයන් විසින් යුත් යුතු සංඝ රත්නයට පස්කාරණය කින් උපස්ථාන කටයුතු-කෙසේදයත්;දුටුකල ආදර උපදවා හුනස්නෙන් නැගි පෙර මගට යාම වන්දනා අංජලිකම් කිරීම පැන් පරඟා දැහැවිදඬු කැපකර දීම් ආදිවූ මෛත්‍රීන් යුක්ත කාය කර්මයෙනුදු සවාමීනි පාසු අපාසු කිමෙක්ද රෝගදුක් නැද්ද යමක්, කැමති නම් ඒ මට වදුළ මැනවැයි යනාදීන් ආදර ගෞරව සහිතවූ මෛත්‍රීන් යුක්ත වචනයෙනුදු අපගේ වහන්සේ නිදුක් නිරෝගි වනසේක්වයි සස්නෙහි උසුවලි නෙව ගුණානුවණ වඩන්වයි යනාදි කර්මයෙනුදු තමාගේ ගෙට ගුරුවන් වඩිනා දුර දුටුකල දෙර නොමසා ගෙයි නැතැයි නොකියා වැඩි බවට දෙමිනස් නොව මෙවෙනි ශිල්වතුන් අපගේ ගෙට වැඩියේය. යාපනැයි ප්‍රීති උපදවා කුළුණු නුවණින් ගෙදී ආදර දක්වා අතපානාය ඇත ඒ ගෙණ ඇතුළු ගෙට වැඩියේ යහපතැයි ගෙට අවුත් අසුන් පණවා වඩා පත්ල සොධා පත්සලා දැනිවා පැන් පිපාස විවාරා, කැමති උව පැන් වලඳවා ගෙයි මහශබ්ද පවත්වා, නම් වලක්වා නිශ්ශබ්ද කොට වැඩ අදහස් දැන ඒ ආවයුතු ඇපයිමෙනුදු තමන්ගේ විනව නිබු පරිද්දෙන් සතර පසයන් උපස්ථාන කිරීමෙනුදු මේ පස්ඇන්හි කුල පුත්‍රයන් විසින් උපස්ථාන කරණලද සඟහු පස්කාරණයකින් කුලදරුවන් කෙ රහි අනුකම්පෙරෙත්? කෙසේදයත්;පවිටුකර්ම යෙන් වැළකීමෙන්ද යහපත් දැනසීලාදි කුශල කර්මයෙහි සිටුවා

ලීමෙන්ද හැමඅත්හුම සුවපත් වෙන්වයි අනුකම්පා කිරීමෙන්ද නොඇසුනාක් බණකියා ඇසීමෙන්ද, ඇසුබණ ග්‍රන්ථිසථාන නොලා උගන්වා පිරිසිදු කිරීමෙන්ද සවගී සෙහි ඉපදීමට මග දැන්වීමෙන්ද යන මේ පස්කාරණයෙහි සහුරුවන් විසින් උපාසකවරුන් කෙරෙහි අනුකම්පා කටයුතු. මෙතෙකින් සහුරුවන් විසින් උපාසකවරුන්ට සෙමවෙයි, නිර්භයවෙයි, උපද්‍රව නොවේ--

මිත්‍රයන් විසින් මිත්‍රයන්ට පස්කාරණයකින් උපස්ථාන කට යුතු වෙත්. කෙසේදයත්, මිත්‍රයා ගමක් ඉල්ලුවත් නොඉල්ලුවත් තමා සෙරෙහි ඇති දැ නොසඟවා දීමෙන්ද. ප්‍රියවූ කන්නළු වමන කීමෙන්ද, ඔවුන්ට වැඩට වැටෙන කල්පනාකාරී කටයුතු නොපිරිහෙලා කිරීමෙන්ද, මිත්‍රයන්ට අනාදර නොකොට සෞඛ්‍ය නම්බු කෙරෙමින් තමන් හා සමකොට තිබීමෙන්ද මිත්‍රයන්ට බෙර නොකියා වංචා නොකොට සැබැඳස් කීමෙන්ද යන මේ පස්කාරණයකින් මිත්‍රයන් විසින් අනුකම්පා කරණලද මිත්‍රයෝ කාරණා පසකින් මිත්‍රයන් සෙරෙහි අනුකම්පා කෙරෙත්. කෙසේද? යත්, ප්‍රමත්තයන් රැකීමෙන්ද, ප්‍රමත්තවූවන්ගේ සමපත් රැකීමෙන්ද, භයට පැමිණි කල පිහිටවීමෙන්ද, අපදාජීයක් වූ විට නොහැරීමෙන්ද, මිත්‍රයාගේ දරු මුණුබුරන් කෙරෙහි ගරුසර නම්බුප්‍රේම ඇති වීමෙන්ද යන මේ කාරණා පසකින් මිත්‍රයන් විසින් අනුකම්පා කාරණලද මිත්‍රයෝ කාරණා පසකින් මිත්‍රයන් කෙරෙහි අනුකම්පා කෙරෙත්. මෙතෙකින් මිත්‍රයන් විසින් මිත්‍රයන්ට සෙමවෙයි. නිර්භයවෙයි. උපද්‍රව නොවේ.

සවාමීහු විසින් පඤ්චවිධසංඛ්‍යාත භාර්‍යාවන්ට පස් පරිද්දෙකින් අනුකම්පා කටයුතු වේ. කෙසේද? යත්, කතාකරණ විට දැසින්ට කියන්නාක් මෙන් මෙසේ වර තෙල කරව යනාදීන් වෙහෙස දී නිසරු කොට නොකියා සබඳ දෙව 'මාතෙනිස්සමාතෙත' යනාද් ප්‍රියමනාපවූ සම්භාවිත වචනයෙන් කථාකිරීමෙන්ද, සෙසු සත්‍රීන් හා අනාචාරයෙහි නොහැසිරීමෙන්ද, තමාගේ ගෙයි ඇති භාණ්ඩ සියළු ඉසුරු සමපත් දක්වා දීමෙන්ද, වස්ත්‍රාභරණාදි අලංකාර දීමෙන්ද යන මේ පස් කාරණයෙන් සවාමියා විසින් අනුකම්පා කාරණලද භාර්‍යාව විසිනුදු සවාමියා කෙරෙහි පස් කාරණයකින් අනුකම්පා කටයුතු. ඒ කෙසේද? යත්, තමන් සවාමීන්ට බත් කැඳ පූ ව්‍යංජනාදි පිසන කල මනාකොට තැන්පත්කොට කිරීමෙන්ද, දැසිදැසයනුදු සෙසු ගෙයි මෙහෙකරුවනුදු සෙසු ජනයනුදු නොකලකිරුමා ඔවුන් හැමදෙන ප්‍රියවචනයේ හක්ති කරණ පරිද්දෙන් සංග්‍රහ කිරීමෙන්ද, තම සවාමීන් හැර සෙසු පුරුෂයන් හා අසඬමයෙහි නොපැවැත්මෙන්ද, උපයා රැස්කොට

ගෙයි තුබූ ධනධාන්‍යාදි සම්පත් විසඳම්කොට නොනසා රැක දක්වා දිමෙන්ද, සියළු කළ මනා කටයුතු අලස නොව උත්සාහ ඇතිව සැපයිමෙන්ද යන මේ කාරණා පසින් භාග්‍යවිව විසින් සවාමි පුරුෂයා කෙරෙහි අනුකම්පා කටයුතු. මෙතෙකින් භාග්‍යවන් කෙරෙන් සෙමවෙයි. නිගිය වෙයි. උපද්‍රව නොවේ.

සවාමිහු විසින් දැසිදැසයෝ පස් කාරණයකින් අනුකම්පා කට යුතු. ඒ කෙසේද? යත්, ඔවුනොවුන්ගේ බලයට වයසට තරමට සුදුසු සැටියේ පිළිවන් කම්හන කරවිමෙන්ද, ඔවුනොවුන්ට දුන මනා බත් වැටුප් විසඳම් නොඉවුවා දිමෙන්ද, දැසිදස් ආදීන් ලෙඩ කල ඔවුන්ට කම්හන විධාන කොකොට ඒ ඒ රෝගයට සුදුසු පිළියම් කරවිමෙන්ද, මධුරවූ අසුවිවූ කෑදු බොනු දැ ලදින් තමා පමණ අනුභව නොකොට නොසහවා ඔවුන්ට බත් බෙදදි අනුභව කිරීමෙන්ද ඔවුන් මෙහෙකොට දුවිලවූකල්හිද ඔවුන්ගේ මහුල්ආදී එක්තරා කටයුත්තක් ඇති කල්හි ද මෙහෙ නොගෙණ ඒ ඒ කටයුත්තට උවමනා විවාරා වි සාල් ආදි උපකරණ දී ඇරිමෙන් ද යන මේ පස්කාරණයෙන් සවාමිහු විසින් අනුකම්පා කරණලද දැසිදසුන් විසිනුදු සවාමීන් කෙරෙහි පස්කාරණයකින් අනුකම්පා කටයුතු. ඒ කෙසේ ද? යත් — අළුයම තමන් සවාමීන්ගේ කළමනා තැක් කම්හන සලකා පළමු කොට නැගි සිට කිරීමෙන් ද, හැම කටයුතු නිමවා පෙරයම සවාමිහු සැතපුනුකල සැතපීමෙන් ද, සවාමිහු නුදුන් දෙය සොරා නො ගෙණ දුන් දෙය ගැන්මෙන් ද, තමන් කරණතැක් කම්හන නො වරදවා පසු නො කොට එසින් ලබන ලාභ අඩු නො වන සේ කිරීමෙන් ද, තමන් ගියතැක් තැන සවාමීන්ගේ ගුණ කියමින් අපි අප දැස බව නො දන්නන් වැන්නමහ, දෙමව්පියන්ගේ ගෙහි නො වෙන්නන් වැන්නමහ යි යනාදි කීමෙන් ද යන මේ පස් කාරණයෙන් දැසිදැසයන් විසින් සවාමීන් කෙරෙහි අනුකම්පා කටයුතු. මෙතෙකින් දැසිදැසයන් විසින් සෙම වෙයි, නිගිය වෙයි, උපද්‍රව නොවේ.

පණ්ඩිතො සිල සම්පන්නො ජලං අග්ගිව භාසති,
භොගෙ සංහරමානස්ස භමරසෙව ඉරියතා.
භොගාසන්නිවයං යන්ති වම්මිකොවූපචියති,
එවං භොගෙන මාගන්ත්වා අලමත්තො කුලෙගිනි.

යනු වදළ බැවින් යට කියන ලද ක්‍රමයෙන් ශීලයෙන් සමන්විත වූ ප්‍රඥාවන්ත වූ පුද්ගල තෙම ඝණාක්‍රිකාරයෙන් යුක්තවූ රාත්‍රි යෙහි පවීන මස්සකයෙහි දිප්තිමත් ව බබලන්නාවූ මහ නිනිකදක් මෙන් දිප්තිමත් ව බබලන්නේය. අනුන්ට ද තමාට ද පීඩා නො කොට ධර්මයෙන් වස්තූන් රැස් කරන්නාහට ඔවුන්ගේ වසතු මහත් බහුල භාවයට පැමිණෙන්නේය. ඒ කුමක් මෙන් ද යි

කිවහොත් යම් සේ ගාඹග තෙම පුෂ්පයන්ගේ වණ්ණගන්ධාදීන් නො කසමින් නාවුගෙන් හා පණ්ණපත්‍රාදීන් මකරන්දයන් ගෙන වඤ්චනාර්ථ මධුපවිලයන් කරන්නේ වේ ද එමෙන් වස්තූන් රැස් වන්නේ ය. තවද යම් සේ වෙයන් විසින් අනුක්‍රමයෙන් බඳනා ලද තුඹස යම් සේ වඩි ද එමෙන් කල්‍යාණමිත්‍ර වූ ඒ කුලපුත්‍රයාගේ වස්තූහු ක්‍රම ක්‍රමයෙන් රැස් ව මහත් වන්නාහු ය. එසේ ඇති කල්හි හෙතෙම ගාඹවාසයෙහි වසන්ට සමර්ථ වන්නේ ය. එසේ රැස්කරණලද හොගසම්පත්තියෙහි පිළිපදනා විධි කෙසේද? යත්—

චතූඛ වීහජේ හොගෙ සවේ මිත්තානි ගන්ථතී
එකංසා හොගෙ භුඤ්ජේය්‍ය විභිතමමං පයොජයෙ
චතුත්‍ථංච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති ති.

යනුවෙන් හොගසයෙහි පිළිපදනා සැටි වදුල ක්‍රමයෙන් ඇති තාක් හොගයන් සතර කොටසක් කොට බෙදා එයින් එක් කොට සක් අනුභවයට ගතයුතුය. දෙකොටසක් ගොවිතැන් වෙළඳුම් ආදී කම්මාන්තවල යෙදිය යුතුය. සතරවන කොටස ගම් නියි ආපදාර්ථයක් පැමිණි කල භිය යුතුය යි කියා සඟවා රක්ෂාකටයුතු යයි වදුළසේක. මෙසේ දෙලොස් වෙනි පරිච්ඡේදයෙන් ගාඹපති ධර්‍මානුශාසනා කථාවන් ප්‍රකාශකිරීමෙන් ලෝවැඩ දක්වා නදනන්තරව සප්තාධිකරණවූ සාමාන්‍ය සඛර්‍මානුශාසනා කථාවෝද මෙහි දක්වනු ලැබෙත්. ඒ කෙසේද? යත්, සප්ජගද්ගුණාලංකාර ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවතාවෝ මගුල්කථා පහළකොට බුදුරජ මගුල් වදාරණ සේකැයි කියා ලොව මඞ්ගලකෝලාහලය පහළවූ කැන් පටන් දෙලොස් හවුරුද්දක් ඉඳුල්ලෙහි ඔවුනොවුන් අතින් විවාරා මගුල් තෝරා කියන්ට නියි කෙනෙකුන් නොලැබ දසදහසක් සක්වළ දෙවියෝම මේ මගුල්සක්වළට රැස්ව දෙවිරමහි වසන බුදුන් කරා පැමිණ

බහූදේවා මනුස්සාච මඞ්ගලානි අචින්තයුං,
ආකංඛමානාසොත්ථානං බ්‍රූහිමඞ්ගල මුත්තමං.

යන මේ ගාථාවෙන් එක්තරා දෙවතාවෙකු විසින් බොහෝ දෙවියෝද මනුෂ්‍යයෝද මගුල් සිතන්නාහුය. ඔවුන්ගේ සැක දුරු කොට මගුල් වදුළ මැනවැයි ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ —

අසෙවනාච බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා,
පූජාච පූජනීයානං එතං මඞ්ගල මුත්තමං.

යනාදීන් මෙලෝ පරලෝ දෙකින් වැඩට කාරණාවූ මගුල් වදාරණසේක්, සියලුම අනර්‍ථයකවුත් සියලුම අවැඩට කාරණාවූ බාලසේවනය කොකිරීමත් ප්‍රඥාවතුන් සේවනය කිරීමත් පිදිය යුතු වූ බුදු පසේබුදුසවුවන්ට පිදීමත් සියළුම ලොව්ලොවුතුරා වැඩට කාරණා හෙයින් මගුල්ය.

තවද මබ්‍යදේසාදීවූ යම් දේශයක සිවුවණක් පිරිස් වෙසෙත් නම් දානාදි දසපින් කිරීමත් පවනී නම් තෙවළා බුදුවදන් පවනී නම් එසේවූ නිසි තෙන මිසිමත් බුබාදින් අරහයා පෙරහළ පින් ඇති බවත් යම් කෙනෙක් සිල් නොරැකිමෙහි ආදීනව සලකා පන්සිල් පමණක් උවත් අෂ්ටාඞ්ග සීලාදිය උවත් රැකීම් කිරීමත් අනාත්ත දිවසැපත් සාදාදි ලත හෙයින් මහුල.

තවද බොහෝ ඇසුපිරු තැන් ඇති බවත් අකුශලකම්පථ විරහිත බැවින් නිරවද්‍යවූ මණිකාරසවණ්ණකාරාදී අගාරියසිල්පය මිවර මිවාරණසිබ්බනාදි ප්‍රව්‍රජ්ජාවට නිසි අනගාරිය සිල්පය ඇත මේ මිප්‍රකාර සිල්ප දැක්මත් ගිහි වුවොත් ප්‍රාණඝාතාදි දස අකුශල කම්පථයන් කෙරෙන් දුරුව දානමානාදියෙහි හැසිරීමත් පැවිදි වුවොත් සිවුපිරිසිදු සිල් පිහිටීමත් මුසාවාදාදි වතුර්විධ වාක් දුශ් වරිතාදියෙන් දුරුව නිවාණ මහනිවුම් දෙන හෙයින් ඒත් මහුල.

තවද දෙමවුපියෝ තම වැදුපු දරුවන්ට ඉතා උපකාරී හෙයින් පිවත නෙළපියා ආ දරුවන් දැන ඇඟමැලි පස්පිස හිස සිඹපියා උපදවාපු සෙනෙහස අවුරුදු සියයක් වුවත් දැසක් උවත් මුළුල් ලෙහි කිමිබා නොතබා මවුපිය දෙදෙනා කඩින් උසුලාත් ගෙවාලිය නොහැකි හෙයින් දෙමවුපියන්ට නැවීම් හිස්සේදීම් සැවීම් පෙවීම් ආදියෙන් උපස්ථාන කෙරෙද්ද ඒ උපස්ථාන කිරීමත් අඹුදරුවන්ට සළමතා දැන සීල සමාදාන ප්‍රියවචන වස්තුාහරණාදි ධාර්මිකවූ සංග්‍රහ කිරීමත් අකුශලකම්පථයන් කෙරෙන් දුරුව කිසිවණ්ජ්‍යාදි නිරවුල් කම්නන කිරීමත් නොකිරීමය කල් ඉක්මවා කිරීමය නපුරුනොව කිරීමය මැලිමැලිව කිරීමය යනාදිය නැතිව කල් දැන නිසි ලෙසින් නොමැළිනොව ගත්තාවූ සීවප් ආදීවූ කම්නන කිරීමත් මෙලෝ පරලෝ දෙක්හි වැඩට කාරණා හෙයින් මහුල

තවද ආමිසදාන ධම්දාන වසයෙන් ව්‍රප්‍රකාරවූ දන්දීමත් දස කුසල ධම්යෙහි හැසිරීමත් මවුපිය පියපාසයෙන් සත්වන කුල පරම්පරාව පටන් පැවත ආ නැයන් අතුරෙන් දුක්පත්ව තමා සමීපයට ආ නැයන්ට බල පමණින් ඉත්පිළි ආදිය දීමෙන් සංග්‍රහ කිරීමත් පොහොදවස් නොවරදවා පෙහෙවීම ගුරුන් සිල්වතුන් කුලදෙවුවන්ට මෙහෙකිරීම් මල්වතු පැන් පොකුණු උයන් ගොනවු අම්බලම් භේදඛ්‍රාදිය කිරීමත් දෙලොවින්ම වැඩට කාරණ හෙයින් මහුල.

තවද පාපයෙහි ආදීනව සලකා මේ අපගේ ජානියට අපගේ තරමට නොනිසියයි දැන පවින් වැලක්මත් මෙබඳු පාපයක් මෙවක් පවත් නොකරම්හයිකියලා පවනොකිරීමත් රාමිමත්වූ වානු කාරණා නොදැන මවිපියන් කුලදෙවුවන් බුදු පසේබුදු මහරහ

තුන් වුවත් නොඉදුනන හෙයිනුත් මෙලොවම වියරු මෙස්ගෙණ ඇවිද පරලොව අපායදුක් විඳි හෙයින් ඒ රාජිමත් වැලක්මත් කරණ පින්කම් සතස්සොට කිරිම නොකඩවා සතතයෙන් කිරිම නොමැලිව වියයුතු ඇතිව කිරිමය යන මේසේ පින්කම්හි නොපමා වීමත් සියළු වැඩට කාරණා හෙයින් උතුම්මහුල.

තවද ගෞරව සත්‍රම්නා බුබාදි රත්නත්‍රයෙහිද මවුපියන් ආදි වාඩියන් කෙරෙහිද වන්දනමානනාදි වසයෙන් කරන්නාවූ ගෞරවයෙන් ගුණෙන් නුවණින් තමා වැඩිතර වී නමුත් නිහතමානිව ගුරුන්සිල්වතුන් දෙමවුපියන් ආදිවූ වාඩියන් කෙරෙහිද යටත්වූ පැවතුම් ඇති බවත් යථාබල යථාලාබ යථාසාරුප්‍ය වශයෙන් තුන්වැදෑරුම්වූ ත්‍රිවිධ සන්තොෂයෙන් සතුටුවන බවත් මදක්වුවත් බොහෝ වුවත් අනුන් තමහට කළ උපකාර දැන්මත් යම්සේලෙස සිත උඩහු වේද කාමවිතකාදීන් විහින් මඩනාලද වේද එකල්හි කල්‍යාණ මිත්‍රයන් සමීපයට එලඹි තදනුරුපවූ බණ ඇසීමත් දෙලොවින්ම වන සියලු වැඩට කාරණ හෙයින් මහුල.

තවද අනුන්ගේ අපරාධ වරද සහනය කිරීම් ආදී ක්ෂමාල ක්ෂණවූ ඉවසීමත් කාරණ දක්වා නියා අවවාද කරණ කල්හි ගුණාගුණ සිතිකිරීම් වසයෙන් චිත්තවික්ෙෂපයට නො පැමිණ යහපතැයි නියා වරද පිළිගන්නා බවත් සංගිදුවන ලද ක්ලේශයන් හා වඩනාලද ප්‍රඥ සිල සමාධ්‍යාදි ගුණයන් ඇති ශ්‍රමණයන්ගේ දැකීමත් පෙරයම හෝ අළුයම හෝ යුතුනිධමීයන් ඔවුනොවුන් හා කරන්නාවූ සාකච්ඡාවන් විවාරීමත් සියළු වැඩට කාරණා හෙයින් මහුල.

තවද යම් කෙනෙක්නට චක්ෂුරාදි සදෙරට විෂයවූ ෂඩාරුපාදිසාරම්මණෙහි ඇලී මුත් අනිෂ්ටවූ දෙයෙහි ඇවී මක් නොවේද. එසේවූ ඉන්ද්‍රිය සංවරය හෝ නෙලෙසුන් තවන වියයුතු හෝ යන මේ දෙකින් සමන්විතයන් නෙනෙක් මෙවුන්දමින් වැලැක්ෂේද සෙසුත් ශ්‍රමණධර්මයෙහි යෙදී වෙසෙද්ද ප්‍රතිවෙධය පසුකොටත් පශ්‍යාප්ති ප්‍රතිපත්ති දෙක්හි යෙදී වෙසෙද්ද ඒ සියළු ශාසනබ්‍රහ්ම වරණයන්ට දුකඛසමුදය නිරොධමාගිය යන චතුරාර්ය සත්‍යයන් ගේ දැක්මත් පවගති වාණයයි දන්නාලද නාත්‍රණයෙන් නික්මුනු හෙයින් නිවණැයි කිය්නලද නිර්මාණ පුරයට පැමිණීමත් සියළුම දුකින් මිදෙන හෙයින් මහුල.

තවද යම්කෙනෙක් ලාභයක් වත් යසසක්වත් ප්‍රසංසාවක් වත් සැපයක්වත් ලදින් එම වැඩි තරම් සාරයක්සේ සිතා උඩහු නොවෙද්ද නැවත අලාභයකට හෝ අයසකට හෝ නින්දාවකට

හෝ දුකෙහිට හෝ පැමිණ අනිත්‍යතාව සැලකීමෙන් ධර්මානුසාරණයෙන් ලෙඩ වෙහෙස නොවෙද්ද එසේ අෂ්ටලෝක ධර්මයෙන් යම්කිසිවක්හුගේ සිත නම්පා නොවේද? එසේවූ ක්ෂීණාශ්‍රවයාගේ සිත අර්හත් මාර්ගඥානයෙන් උපුටාහරණලද සොඳ තැමති හුල් ඇති හෙයින් සොකපිඩා නැති වේද ඒ ක්ෂීණාශ්‍රවයාගේ සිත මාර්ගඥානයෙන් දුරුකරණලද රාගවෙෂ මොහාදී පාපධර්මයන් ඇති හෙයින් නික්ලේශවූ රහතුන් එසේ නිස්සෝඝ නික්ලේශිවූවත් දෙවිබඹු සහිත සියළු ලෝවැසියන්ට අගුදක්ෂිණෙය්‍යවන බැවින් මහුල.

ශාස්තෘවූ බුදුරජ අසෙවනාවබාලානං යනාදි ගාථාදෙසයකින් මෙසේ මහුල් නිස් අවක් වදාළසේක. මේ මඞ්ගල සූත්‍රය දෙසනාව වදාළ කල්හි දෙවියෝ සෝළ ලක්ෂයෙක් රහත්වූහ. අසංඛ්‍යයෙක් සෝවාන් ආදී මාර්ගඵල ප්‍රාප්තවූහ. දෙවන දවස් බුදුහු ආනන්දමහ තෙරුන් කැඳවා ආනන්දයෙනි, ඊයේ රෑ එක් දෙවතාවෙක් මා කරා අවුත් මහුල් විවාළේය, මම ඕහට මහුල් අවබෝධ කිමි. ආනන්දය මේ මඞ්ගල සූත්‍රය ඉගෙණගෙණ භික්ෂූන්ට උගන්වයි වදාළසේක. උන්වහන්සේත් ඉගෙණ සෙසු භික්ෂූන්වහන්සේට ඉගැන්වූසේක. එහෙයින් එවක පටන් මෙවක දක්වාත් මෙවක් පටන් පස්වා දහස මුළුල්ලෙහි මේ සූත්‍රය ප්‍රයෝජන වන්නේ එහෙයින් ලොව නැත්තවුන් විසින් නුවණ නැති අඥාන බාලජනයන්ට එක් නොව යහපත් නුවණැත්තවුන් හජනය කොට පිදියයුත්තවුන් පුදා, සුදුසු පියසෙ පෙරකළ පින් ඇති බැවින් තමා යහපත්ව නිරවද්‍ය සිල්ප ඉගැන්මෙන් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බැවින් පිළිවෙහින් සන්න ගොඩවා කියන බසෙක් ඇත්නම් යහපත්ව කියමින්.

දෙමව්පිහන්ට උපස්ථාන කිරීමෙන් අඹුදරුවන්ට සංග්‍රහ කිරීමෙන් නිරවද්‍යවූ කෘෂිවණිජ් ආදිය ඇරවීමෙන් ධනධාන්‍ය සම්පත් ඇතිව දන්දීමෙන් භෝගයෙහි සාරයගෙණ සිලසංරක්ෂණයෙන් ජීවිතසාරය හැරගෙණ නැයන්ට සංග්‍රහ කිරීමෙන් සවජ්‍ය සහිත කරවමින් නිරවද්‍යවීමෙන් අනුන් හිතකරමින් පවින් වැළැක්මෙන් පින්පිබාත් නැතිව රා මෙරෙන් දුරුවීමෙන් තමාට වන පිබාත් නුසා කොපමාවීමෙන් කුසල් දහම් වඩමින් පිණට සින් නැමුනු බැවින් ගිහි සැපත් හැර මහණවූ බුබාදීන් කෙරෙහි ගෞරවත් ඇතිව උඩතමාසය ශාසනානුරූප නොවන බැවින් කොතැන් කෙරෙහිත් යටත්වූ පැවතුම් ඇතිව එත් පිළිවෙත් සාරම සතර පසයෙහි වාදසම්ඛවූ ආයුෂ්සන්නොෂය ඇති බැවින් ප්‍රත්‍යයෙහි ලොල්බව හැර කළ උපකාර දන්මෙන් සත්පුරුෂව පින්කම්හි මැලි බවෙක් ඇත්නම් බණ ඇසීමෙන් දුරුකොට සෘජුභාව පෙරදුරිකොට ගෙණ

සියළු උවදුරු නසා භිකරු බැහින් සියළු වැඩට නිසිව ගුණ ඇත්ත වුන්ගේ දුක්ම නිසා උන්ගේ අනුශාසනාවෙන් තමාත් ගුණ ඇතිව කුසල් විසයෙහි උපන් සැනෑ ඇත්තම් නුවණැත්තවුන් හා කථා කිරීමෙන් ඒ දුරුකොට ගෙණ සිවුපිරිසිදු සිල් පිහිටීමෙන් සීල සුඛය සපයා ගෙණ සමථානියෝගයෙන් විතර්ක විසුඛය උපදවා දෘෂ්ටි විශුඛය ආදිය තැතිව ඥානදර්ශන විශුඛය සපයන්ට බැරි බැවින් ලෞකණාදී ඊසින් කාමරූපනිශ්‍රයාදී විසින් සෙසු විශුඛින් සපයාගෙණ මාගේ පිළිවෙළින් ගොස් මහත්ව සුලභෙකින් මහඉමර සොලවාලිය නොහැක්කා මෙන් අෂ්ටලෝකධර්ම නැමැති පවනින් නොවෙවුලා නිස්සෝඝ වීමෙන් නිකෙලස වීමෙන් හැම තැන්හි නොපරදනා සේ ආත්මභාවය සාදිය යුතු.

මේ මඞ්ගල සූත්‍රය දෙසූ දෙවන දවස්හි ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ මඞ්ගල සූත්‍රයෙන් සඞ්ගහයන්ට වන අභිවෘද්ධි කාරණයම වදාළසේක. එහෙයින් පිරිගිම වන අවැඩ කාරණා විවාරම්හයි කියා දසදහසක් සක්වළ දෙවියෝ මේ එක් සක්වළකට රැස්ව කෙස් ලොම් අගක් සා තැන දස වීසි නිස් පණස් සැට සත්‍යා අසූදෙන බැහින් හැසිර සිටි මහපිරිස් මැද ශක්‍රදෙවේන්ද්‍රයාගේ නියෝගයෙන් එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ--

පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං
භගවන්තං පුට්ඨුමාගම්ම කිම්පරාභවතෝ මුඛං.

යනාදි එකක් අතුරු කොට ඇති ගාථාවෙන් අවැඩ කාරණා විවාළාවූ ඒ දිව්‍යපුත්‍රයා හට--

සුවිජානෝ භවං හොති සුවිජානෝ පරාභවෝ
ධම්මකාමෝ භවං හොති ධම්මදෙස්සී පරාභවෝ.

යනාදි ගාථා දෙළසකින් බහු විවාළපුවඡාගාථාවන් එකි නෙකට අනතුරුව සඞ්ගහයන්ට පිරියම වන අවැඩ කාරණා ප්‍රකාශ කොට පුද්ගලාදිඝ්‍යානයෙන් වදාරණ සේක් යම් පුද්ගලයෙක් දස කුසලධර්මපථයන් කැමති වේද ප්‍රාර්ථනා කෙරේද අසා පිළිපදනේ ද ඔහුගේ ඒ ප්‍රතිපත්තිය දැකිමෙන්ද ඇසීමෙන්ද හෙතෙම වැඩට පැමිණෙන තැනැත්තේය යි සැපසේම දතහැකිවේ. ඒ දස කුසල ධර්මයන් යමෙක් නොකැමැත්තේද අසා පිළිපැදීමක් නැත්තේද ධර්මය නොකැමැතිවූ ඔහුගේ ඒ දුශ්ප්‍රතිපත්තිය දැන අසා මෙතෙම පිරිහෙන අවැඩට පැමිණෙන තැනැත්තෙක්ය යි සැපසේ ඔහුගේ

සවභාවයෙන්ම සිත දත හැකි වෙයි. යන මේ පළමුවෙනි පිරිහීම් කාරණය වදුරණ බුදුහු ඒ පිරිහීමට පැමිණෙන පුද්ගලයා හට පූරණකාශ්‍යපාදි නොසන්හුන් කායාදි මාරත්‍රයෙන් පාපකම් කරණා අසත්පුරුෂයෝ ප්‍රියවෙත්. ඒ පිරිහෙන පුද්ගල බුබාදීන් හා අන්‍යවූද සන්හුන් කායාදී කම් ඇති සත්පුරුෂයන් නමහට ප්‍රිය මිතුාපයන් නොකරන්නේමි නොහොත් නොසෙවුනේමි. යට කී පූරණ කාශ්‍යපාදි අසත්පුරුෂයන්ගේ දෙසැට මිථ්‍යාදෘෂ්ටිය හෝ කායාදිය අසාහනවූ අසත්පුරුෂයන්ගේ, සවභා කම්වූ අකුශලකම් පථ හෝ යන අධර්මය කැමතිවෙයි, යන මේ කාරණා තුණ ඒ පුද්ගලයාහට දෙලොව අවැඩ වන කාරණයයි වදුරා,

තවද තුන්වෙනිවූ පිරිහීම් කාරණය වදුරණ බුදුහු යම් සත්‍ව යෙක් නිදනසුළුද හෙවත් හුන් තැනත් සිටි තැනත් හොත් තැනත් නිදන්නේම වේද සහාසිලිව ගණ සංගණීකාගෙහි ඇලීම සහාසිශ්‍රිත සවභා ඇතිව එම කථාවෙහිම ඇලි කැවහා කැවත යෙදේද වියහී කළ මනා තන්හි වියහී තෙජස් කැතිව හිදිද හෙවත් හිඟිව වසන්නේ හිඟිකම් හෝ, පැවිදි වූයේ පැවිදිකම් හෝ අනුන් මිසින් මෙහෙයනු ලබන්නේම කිසි කලෙක කෙරේද පවන්ගනිද සවභාවයෙන් කුසීතද අනිශයින් ජාති අලසව හුන් තැනින් සිටි තැනින් හොත් තැනින් තමාගේ බලයෙන් අනික් ඉරියවුවක් නොකරේද සෙසුන් මිසින් මේ අලසයකි දහයුතු වේද, රථයට ධුරය මෙන් ගින්නට දුම මෙන් ක්‍රොධයම සලකුනුව පෙරදුරිව ඇති හෙයින් චෙතවරිනව වහා කිපෙන සුළුද ඕහට නිදනසුළු බව දැඩනසුළු බවද උපඨාන වියහී කැතිබව කුසීත බව කිපෙන බව යන මේ පරිහානි කාරණයයි වදුරා--

තවද සතරවෙනි වූ පිරිහීම් කාරණය වදුරණ බුදුහු යම් ක්ෂත්‍රියාදි කිසිවෙක් ශරීරශෛථිල්‍යයෙන් දිරා මහළුවූ යෞවනය ඉක්මගිය අසූ අනූ වයස් ඇති සිය අතින් කම්මැත කිරීම නොකැකි වැදූ මවුපියන් පෝහොසත්ව සිට පොෂනය නොකරේද ඕහට ඒ මවුපියන්ට උපසථාන උපකාර නොකිරීම පරිහානි කාරණයයි වදුරා--

තවද පස්වෙනිවූ පිරිහීම් කාරණය වදුරණ බුදුහු ක්ෂත්‍රියාදි යම් කිසිවෙක් පිටත් කරණලද පවු ඇති ක්ෂීණශ්‍රමණයකු හෝ සන්සිදුවනලද පවි ඇති ශ්‍රමණයකු හෝ නොහොත් බමුණු කුල යෙහි උපන් බමුණකු හෝ පැවිදි ලත් ශ්‍රමණයකු හෝ අන් කිසි වක් ඉල්වන යාචකයකු හෝ මුසාවාද කීමෙන් වඤ්චාකෙරේද

හෙවත් වහන්ස කාමැත්තක් වදුල මැනවයි පවරා ඉල්වූ තැන හෝ දෙමි කියා නොදීමෙන් හෝ ඔවුන්ගේ ආසාව වලකාපිම ඕහට පැවරීමෙන් යුක්තවූ පුද්ගලයා මෙලොව නින්දාවවද පරලොවදුගතිය යෙහි මහත් දුකටද පැමිණ බොහෝ දුක් විඳ, එයින් චුතව මූසාවාද යෙන් රවටා වවා කාළ එ සඬ්තෙම මිනිසත් බවට පැමිණීමේ වේද, ඔහු විසින් මෙහෙයවන ලද ගොව්තැන් වෙළඳුම් විපත්ති විමෙන් ආසාව සිදෙන්නේයි, එහෙයින් පිරිහීම වන්නේයයි වදාරා—

තවද සමෙනි පිරිහීම් කාරණය වදාරණ බුදුහු යම් පුද්ගලයක් හට තුම්පිජනයෙන් විඛතනම්වූ රත්‍රන් රිදී මිණිරුවන් ඇත්තේද කාවුම් සහිතවූ නොයෙක් සූපව්‍යජනයෙන් යුක්ත භොජනයන් ඇත්තේද ඒ පුරුෂ මියුරුවූ බොජුන් තමා අඹුදරුවන්ට නොදී පිළිසන් නොනසා සැහවී හිද එ කලාව අනුභව කෙරේද? ඕහට ඒ මියුරු රසයෙහි ගිජු මසුරුබව නොයෙක් නින්දා පරිභවයවද දුගතියට පැමිණීමවද, හෙතුවන හෙයින් පිරිහීමවද කාරණයයි වදාරා—

තවද සත්වෙනි පිරිහීම් කාරණය වදාරණ බුදුහු යම් සඬ්ඝෙක් ජාතිය හෙතුකොට ගෙණ මානයෙන් තදව මම ජාති සම්පන්නයෙමියි මානය උපදවා එයින් තදව වාතය පිරී සිටි සම් පසිඳක් මෙන් ඉදිමුනු සඬභාව ඇත්තේ කිසිවක් හටත් නොනැමේද රන් රුවන් ආදි ධන ඇත්තෙමියි ධනය හෙතුකොට ගෙණ කිනියෙන්ම ධන නිසා උපන් මානයෙන් තද වූයේද උත්තම ගොත්‍ර ඇත්තෙමියි ගොත්‍රය හෙතුකොට ගෙණ එසේම මානයෙන් තදද තමාගේ නැයන්ටත් අවනම්බු කෙරේද? ශාක්‍ය විඬූඩභයාට මෙන් ජාතියෙනුත් තදද? මේ දිළිඳුය යි ධන යෙනුත් තමා වැඩිය යි දැක සාමීචි පමණකුත් නොකෙරේද? ඕ හට ඒ නැයෝ පරිභව බැවින් නින්දා කෙරෙත්. මෙසේ වසතු වසයෙන් චතුර්විධවූ ලක්ෂණ හෙයින් එකම මාන යුත් යථොක්තය හට පිරිහීම වන්නේය යි වදාරා—

තවද අටවෙනි පිරිහීම් කාරණය වදාරණ බුදුහු යමෙක් සත්‍රීන් විසයෙහි ඇළුනේද තමාගේ සිගලු සම්පත් දීත් නැවත නැවත මාගම් සිත් ගන්නේද රා බීමෙහි ලොල්ව තමා සතු සියල්ල දීත් රා බීමෙහි ඇළුනේද? හිතකඛ උගස් තබාත් දූකෙළියෙහි ලොල් වූයේද? ලද ලද යම් කිසිවක් ඒ ඒ තැනට දීමෙන් නසාද ඒ ත්‍රිවිධ කාරණය ඕ හට ධන හානියෙන් හා නින්දායෙන් හා දුගතිය ඉපදීමෙන්ද පිරිහීමට කාරණයයි වදාරා –

තවද නවවෙනිවූ පිරිහීම් කාරණය වදාරණ බුදුහු යමෙක් සවකිය භාග්‍යවීන්ගේ හේතුකොටගෙණ නො සතුටු වූයේ වෙශ්‍යා වන් කෙරෙහි දක්නා ලැබේද එසේම අනුන් අයත් පරසන්තින් කෙරෙහි දක්නා ලැබෙන මේ ප්‍රකාරය ඔහට ධනහානිවීම් ආදි පිරිහීමට කාරණයයි වදාරා.

තවද දසවෙනිවූ පිරිහීම් කාරණය වදාරණ බුදුහු ඉක්මනින් යෙදවනය ඇති අසුඅනුවයස් ඇති පුරුෂයෙක් තිබිරි ඵල වැනි තන ඇති ලදරියක කලණ වසයෙන් තබා ගෙණ ඒද හෙතෙම ඇට ඊර්ෂ්‍යාවෙන් නොනිදුද ලදරියගේ මහල්ලා හා කාම රතියක් සහ වාසයක් නොවන හෙයින් ලදරුවකු පසා දෝහෝයි ඊර්ෂ්‍යාවෙන් ඇ රක්නේ නොනිදන්නේය. හෙතෙම යම්හෙයකින් කාමරාග යෙන් හා ඊර්ෂ්‍යාවෙන් දනු ලබන්නේ පිටත කළමනා කම්නාහුද නොයෙදීමෙන් ඔහට පිරිහීමට ඒ කාරණය වන්නේයයි වදාරා,

තවද එකොළොස්වෙනිවූ පිරිහීම් කාරණය වදාරණ බුදුහු මත් ස්‍යාමාංස සූරාවෙහි ලොල්වූ තෘෂ්ණා ඇති ඒ මත්ස්‍යමාංසාදිය නිසා ධනසම්පත් පස්මෙන් වියුරුවාත් නසන්නාසුළුවූ යාඥයක හෝ තවද එසදිය මැනි ධූතිව සම්පත් නසන පුරුෂයකු හෝ භික්ෂුදු ආදිය දී ගෘහවාසයෙහි හෝ කම්මාරාම කිරීමෙහි හෝ වෙළඳාම් ආදියෙහි හෝ ඉසුරු බැවිහි තබාද හෙවත් එකිසෙහි නියුක්තයා කෙරෙහිද හෙතෙම ඒ ධූතිව වස්තු නසන පුරුෂයාගේ දෙසයෙන් ධනය ක්ෂයවීමට පැමිණියේ වෙයි. එහෙයින් ඔහට පිරිහීමට ඒ කාරණය වන්නේයයි වදාරා,

තවද දෙළොස්වන පිරිහීම් කාරණය වදාරණ බුදුහු පළමු වෙන් රැස්කොට තබන ලද හොගයක් නැති හෙයින්ද, අය ඉපදීමට නිසි තැනක් නොවිමෙන්ද, මද උපහොග පරිහොග වස්තුවක් ඇති මහත්වූ හොග තෘෂ්ණා ඇති ලද දෙයකින් සතුටු නොවන ක්ෂත්‍රියයෙක් වූයේද ඒ ක්ෂත්‍රිය ජාති ඇති අල්පභොගවූ මහා තණ්හා ඇත්තෙක් ඒ තණ්හාව හේතුකොට ගෙණ උපායෙන් නොයාදී වැරදි වරදවා ආපිළිවෙතින් තමා සන්තකවූ හෝ තමාට නොලැබෙන අනුන් අයිතිවූ හෝ රජබව පතාද එසේ ඒ රාජ්‍යය පැතීමෙන් උත්සාහ කිරීමෙන් ඒ අල්ප හොගය යොඩාදින්ට දිමෙන් රාජ්‍යයට නොපැමිණම නසන හෙයින් ඔහට පිරිහීමට ඒ කාරණය වන්නේයයි වදාළ කල්හි ශක්‍රදෙවේන්ද්‍රයාගේ නියොගයෙන් ශාස්තෘවූ බුදුන්ට අභිමුඛව නුදුරු නොලංව සිට පිරිහීම් කාරණා විවාළ ඒ දිව්‍ය පුත්‍රතෙම තෙළෙස් වනි පිරිහීම් කාරණය නොවිවරා මෙසේ මා විසින් එසි

නෙසා ඝනසඟප්‍රයක් පිරිහීම් කාරණ විවාළෙන් වී නමුත් බුදුරජ එතෑක් පිරිහීම් කාරණා වදාරණසේක්මය. මෙ විවාරමෙන් කිම මෙහි එකාම අනිවාඩි කාරණයකුත් නැත. ඒ සියල්ල විනාසමූඛ කාරණයයි දැන නොවිවාරා තූෂ්ණීම්භූතවිය. ඒ අධ්‍යාසය දත් භාග්‍යවතුන්වහන්සේ

එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතෝ සමවෙකඛිය,
අරියොදයඤ්ඤනඤ්ච පජ්ඤා සලොකං භජතෙ සිවන්ති.

යන මේ අවසාන ගාථාවෙන් කාරණා කාරණා වැඩ අවැඩ මේ මෙයයි විමසන නුවණින් යුකතව ප්‍රඥව ඇති පණ්ඩිතතෙම සඟ ලොකසෙහිවූ යථොක්ත ප්‍රකාර මේ තෙවිස්සක් පමණ පරිහානි කාරණයන් නුවණැසින් බලා පරිහාණකොට දැන ආයතිමාගී ඵලාධිගමයට පැමිණීමේ ආයති නොවනත් මේ පරාභව මුඛයයි කියන ලද අකාරණයෙහි නොපවත්නා හෙයින් ආයතිවූ මේ පිරිහීම් කාරණයන් දන්නා සම් නුවණකින් දුරුකෙරේද ඒ දශිනවූ ඥන යෙන් යුකතවූ පුද්ගලතෙම නිරුපද්‍රවවූ උතුම් දෙව්ලොව සේවකය කරන්නේය හෙවත් දිව්‍යලොකා සම්පත්තියට පැමිණෙන්නේයයි වදාළසේක. මේ ධම්දෙශනාවගේ කෙළවර උපන් සංවෙගානුරූප පරිද්දෙන් සෝවාන් සෙදෑගැමි මගින් ගොස් සංඛ්‍යාපථාතික්‍රාන්ත දෙවතාවෝ සඟර දුනිත් මිදී ගියහ.

මෙසේ සමසත සත්වයන්ට සම්බුදිසිඛියට කාරණාවූ අටනිසක් මගුල් කථාවන් ප්‍රකාශ කිරීමෙන්ද සිගළු අවැඩ කාරණාව සිවි තෙවිස්සක් පමණ පරිහානි කථාවන් ප්‍රකාශකොට දක්වීමෙන්ද සතරාමර සම්ලෝකයාට කරණලද සම්සාමාන්‍ය සබ්බඤ්ඤුඝනා ඇති හෙයින් සම්පජ්ජ ත්‍රිජගතර මාර ජන භයංකර ආඥාධම් වක්‍ර ඇති දේවාතිදේවවූ මාගේ බුදුහු ඝාත්‍යා නම් වන සේක. එසේ හෙයින් කියන ලදී.

දෙවජඝකඛමනුස්සානං ලොකෙ අඝඝඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤදං තෙ නමෝ.

ලෝවැඩ පිණිස කරණලද මේ ශ්‍රී සබ්බඤ්ඤවාද සංග්‍රහයෙහි සාමාන්‍ය සබ්බඤ්ඤඝනා ප්‍රකාශවූ තෙළෙස්වන පරිවෙජ්දය නිමා නිමවනලදී.

කියනලද නොයෙක් අසංඛ්‍ය නයින් බබලන මෙසේ මෙසේවූ විවිධ විශෙෂ අනේකප්‍රකාර සද්ධම්මානුශාසනා කථාවන් ඇති හෙයිනුත් ග්‍රන්ථබාහුල්‍යභීමේන්වත ග්‍රන්ථගිරුඋකයන්ගේ කුසීත භාවය හරණ පිණිස අප විසින් දැන දැනද මෙහි නොදැක්වූ නොයෙක් සද්ධම්මානුශාසනා කථාවන් ඇති හෙයිනුත් අපවැනි පුහුදුන්ගේ නුවණින් තබා සැරියුත් සාමින් වැනි මහනුවණැති මහ පිණැති ලොකොත්තර ඥානයෙහි අගතැන් පත් මහඋතුමන් විසිනුදු නොදතහැකි අසාධාරණවූ අනන්තාපරිමාණ සද්ධම්මානුශාසනා කථාවන් ඇති හෙයිනුත් සම්සත්තව සරණවූ හැම සතුන් වෙත පතළ මහාකරුණාවක් ඇත්තාවූ අනුන් පිණිසම මහදුක් විඳදුවූ සතුන් පිණිසම දසපෙරුම් පිරුවාවූ සැරියුත් සාමින් වැනි ජ්‍යෙෂ්ඨපුත්‍රයන් ලද්දාවූ අනඳසාමින් වැනි උපස්ථායකයන් ලද්දාවූ සබ්බඤ්ඤ වැනි ගුරුන් ලද්දාවූ සබ්බඤ්ඤ වැනි මියුරුරසයක් ලෝවැසි යන්ට බෙදදුන්නාවූ බුදුබව වැනි මහත් තනතුරක් ලද්දාවූ සම්මාසම්බුද්ධඤාණ වැනි ඤාණයක් ලද්දාවූ සප්තබොධ්‍යඞ්ගයන් වැනි සත්රුවන් ලද්දාවූ නිවන් වැනි ක්‍ෂෙම පුරයක් ලද්දාවූ මධ්‍යම ප්‍රතිපත්ති වැනි නිවන් මහවතක් ලද්දාවූ වජ්‍රාසනය වැනි ආසනයක් ලද්දාවූ දෙතිස් මහපුරුෂලක්ෂණ වැනි ලක්ෂණ ලද්දාවූ ශක්‍රයා වැනි බ්‍රහ්මයා වැනි මෙහෙකරුවන් ලද්දාවූ අනේපිඬු මහසිටාණන් වැනි විසාඛාවන් වැනි උපාසක පිරිස් ලද්දාවූ සසර නැමැති මහා කාන්තාර තරණයට දිව්‍යරථයක් වැනිවූ හැම ගුණෙන් හැම නුවණින් හැම රුවින් හැම පිණින් මැවිසිටීමද හැමසත්තවද මවු පියවූ ගුරුවරවූ මටම පිහිටවූ මටම සරණවූ මාගේ සවාමිදරුවූ අප මහ ගෞතම බුදුරජාණන්වහන්සේ –

"ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථි සත්ථා දෙව මනුස්සානං බුද්ධෝ භගවාති" යන මේ නව අරහාදි බුදුගුණයෙහි සත්වෙනිවූ සත්ථායන ශාස්තෘගුණෙන් යෙදුනු සේකැයි දතයුතු. එසේ හෙයින් කියනලදී.

දෙවමනුස්සානං ලොකෙඅග්ගපුග්ගලංදේදං
දදන්තානංදමයන්තානං පුරිසාජඤ්ඤතෙ නමෝ.

ශාස්තෘවූ අපතිලෝගුරු ගෞතම බුදුරජාණන්වහන්සේ ජීවමාන කාලයෙහි කොසලඛ්මිබිසාර අජාතශත්‍රු කරවරාදි ලොවැසි සඞ්ඝයෝ ඒ දිවමන් බුදුන්ගේ රූපශ්‍රීදර්ශන සද්ධම්මශ්‍රවණාදියෙන් යෙදී නොයෙක් කුශලරාශිවර්ධනයෙන් තමතමන්ලද ජීවිතාදිය සඵලකොටගත්හ. ඒ බුදුන් පිරිනිවි පසු ධම්මාශොක දුටුගැමුණු

පරාක්‍රමබාහු ආදි නරවරයෝද නිර්මිත බුඛරූප දර්ශන ධර්ම
ශ්‍රවණාදි වසයෙන් නොයෙක් වැඛ සැලූහ. එසින් මෑතභාගයෙහිදු
ලංකාධිපතිවූ දඛදෙනි පරාක්‍රමබාහුය ආපවූ නුවර බුවනෙකබාහුය,
කෝට්ටයේ ජයවර්ධන ශ්‍රී පරාක්‍රමබාහුය, මෙම නුවර නරෙන්ද්‍ර
සිංහය, යන නරොත්තමයෝද ලජ්ජින් වහන්සේට බලය දී
නොයෙක් ලෙසින් සංග්‍රහකොට තමතමන්ගේ සඛර්මානු රූපවූ
පරිද්දෙන් බුදුසසුන් පවත්වා නොසයක් ලෙසින් ශ්‍රී දන්තධාතු
පූජාද කිරීමෙන් තමතමන් දවස පැමිණි ඒ ඒ යතිතුමන් විසින්
අමූතු හෙළබස රචනාකොට ඇස්වූ මහපූජාවලිය සඛර්මාලංකාරය
සඛර්මරත්නාකරය සාරාර්ථසංග්‍රහය යන ධර්ම ප්‍රකරණයන්ද සාදරව
ශ්‍රවණය කිරීමෙන් කර්ණාලංකාර කොට අවශෙෂ ලංකාවාසීන්ද ඒ
ඒ ධර්ම ප්‍රකරණ ශ්‍රවණය කිරීමෙහි යොදූ ධර්මදූතයද පවත්වා
ලීමෙන්ද අප්‍රමාණවූ කුසලරාශි වර්ධනය කළාහ. එසේම මෙකලට
රජ පැමිණි ප්‍රවර මහා සම්මත රාජවංශ පරම්පරා නිධිනිදර්ශන
දක්ෂිණ මධුරාපුර උද්දම කුලෝදිත සහස්‍රාංශුප්‍රතිභාඝධිරවීර
සාරාවාර ශ්‍රඛාදි ගුණාකර අනින්දිතාඛය සම්පන්න ශ්‍රීනිවාස ජය
නයනඤ්ජනරසායන රූපලාවන්‍ය ශ්‍රීසාර විරාජිතපුණ්‍යයාඛිතේජෝ
බලපරාක්‍රම අතුල්‍ය අසදෘශ ඇති ගම්භීර ප්‍රවරෝදුර කුශලඵල සමුද්
භව දශබල ශාසන ධාරවූ—ශ්‍රීමත් කීර්තිශ්‍රී රාජසිංහාභිධාන අපමණ
රජතුමාතෝද පෙර මහ පිණැති මහරජුන්සේ මමද බුදුසසුන් වඩා
ගෙණ රජකෙරෙමි යන උදාරතර රාජාභිමාන උපදවා ගෙණ ත්‍රිවිධ
රත්නාභිපාලන ඔසින් ඇතිව අපරිමිත කුශලරාශි වර්ධනය
කෙරෙමින් ශ්‍රීවර්ධන පුරයෙහි වසනුවෝ--පළමුකොට ශ්‍රී දන්ත
ධාතු පූජාවට පවන් ගෙණ දර්ශනීය සප්තශෛලමය භිත්තිසප්තභූමි
කම් නිර්මිතවූ දිව්‍ය මන්දිර ප්‍රතිභාඝ විචිත්‍ර චිත්‍රකර්මාන්තොඒව
ලිත සවර්ණ රජතකර්ම නිර්මිතාඝන වාරකවාටෝපශෝභිතවූ
දෙමහල් ප්‍රාසාදයක් කරවා සුරෙන්ද්‍ර ක්‍රීට ප්‍රතිභාඝ රත්න නීලමණි
මුක්තාදී මාහැඟිවූ රුවනින්ම අතුරු නැති විසිතුරු අඛදෙරියන්
ප්‍රමාණවූ ඝනරත්න කරඬුවක්ද තදන්තොඝධවූ එසේම මාහැඟිරත්න
මය කරඬු දෙකක්ද කරවා දිව්‍ය පුරයක් මෙන් සවකිය ශ්‍රීවර්ධන
පුරප්‍රවරයද අලංකෘතකොට ලංකාවාසී නොයෙක් ජනසමූහයාද
රැස්කරමින් අපරිමිතවූ පූජොත්සවයෙන් ජිනවර ශ්‍රීදන්තධාතූන්
වහන්සේ එහි වඩා දර්ශන ප්‍රතිලාඝයෙන් දිවමන් බුදුන් දුටුවාසේම
අතිඝයින් ඝන්තුෂ්ටව ලද ජීවිතය සඵල කොට ගෙණ අවසේස
ලංකාවාසීන්වද මුනිවර ශ්‍රීදන්තධාතූන් වහන්සේ දක්වලීමෙන්
විශෙෂයෙන් සතුටු කරවා ලෝවැඛද කිරීමෙන් මුක්තාමාණික්‍ය

හිරණ්‍ය සුවර්ණ මාහැගි වස්ත්‍රාභරණ ග්‍රාමක්ෂෙත්‍ර දාසිදාස ගෝ මහිෂ හස්ත්‍යශ්වාදී අනේක ප්‍රකාර පූජාවස්තූන් පුදා වැඳ ලද සම් පතද සඵල කොට ගෙණ පෙර පැවති නොයෙක් පුද සිරිත් නොක ඩවා වඩවඩා පැවැත් වීමෙන් හා අමුතු අදිටුදද නොයෙක් පුද සිරිත් පැවැත් වීමෙන්ද අනේක කෝටි ශතසහස්‍ර සංඛ්‍යාපරිමිත සුමන චම්පක නාගකණිකාර කෙතකී සෞගන්ධිකාදි පුෂ්ප පූජාවෙන් හා සතතොජ්වලිත සුගන්ධතෛලප්‍රදීපධූපසුරභිසුගන්ධ තුර්‍ය්‍ය ඝෝෂාදි නොයෙක් පුදසැළහරින් වක්‍රරත්නය පුදන සක්විති රජ්ක හුගේ සාදරසතතයෙන් පිදීමෙන් අප්‍රමාදවූ කුශලරාශින් වර්ධනය කොටගෙණ --

තවද දිවමන් බුදුරුව නොදැක්මෙන් දෙමනස් ලොකයා ඝෝෂනස් වන තරම් මහත් ශෛලමයවූ බුදුරුවකුදු කරවනු පිණිස සිලාකොටකාදින් රුස්කරවා භූවරට පුළිදිග පෙරත් කර මානන පවන් ගෙණ කොට අඛාලව තුබූ ඒ පළිතය වසා කරණ ලද්දේ දෙමහල් ප්‍රාසාදයාගේ ඇතුළත්හි වඩු නවරියන් ශෛලමය සදිඳ ප්‍රතිමාවක් කරවා රන්පතින් වසා බොහෝ ධන පරිත්‍යාග යෙන් විහාර පින්කම සම්බඳ ග්‍රාමක්ෂෙත්‍රාදි නොයෙක් පුද සිරිත් පවත්වා තම තමද ලංකාවාසින්ද බොහෝ කුසල රාසි වර්ධනය කොට ගෙණ කැවත කැවත එසේ නොයෙක් තැන අභි නව විහාර ජීනබිම්බාදිය කරවා ලීමෙන් හා ජරාවාසගත විහාර ප්‍රකෘති කම් කරවා දිවමන් බුදුන් ඇතිසේ ලක්දිව නානා ස්ථානවල බුබපූජාවද පවත්වා ලීමෙන් අප්‍රමාණවූ කුශල රාසි වර්ධනය කොට ගෙණ--

තවද එවකට හැමසතුන්ගේම පින්කෙත්වූ සංඝයාවහන්සේද සියළු ලක්දිව නැති හෙයින් ශ්‍රීමත් අනගි පඬුරු දෙසාන්තර ගවා අශෝඛ්‍ය පුරයෙන් ප්‍රවරෝපාලිමහා ස්ථවිරාදි මහසංඝයා ගෙන්වා මහවංසයෙහි ශාසනාභිවෘධි පරිවෙර්දයෙහි ප්‍රකාශ වූ ක්‍රම යෙන් නොයෙක් දහස්ගණන් කුලදරුවන් මහණමහළු පැවිදිකරවා, සිවුපස දානයෙන්සංග්‍රහකොට ශබ්දශාස්ත්‍රාදියෙහි දක්ෂකරවා ධර්ම ධර විනයධරවීමෙන් අමුතු ධර්මව්‍යාඛ්‍යාන ශස්ත්‍රපඤ්ඤදියද උපද වනසේ දක්ෂකරවා පඨ්‍යාප්ති ප්‍රතිපත්ති ශාසනවශද මතු බොහෝ කලක් ලක්දිව සවසිරව පවත්නාසේ ඇතිකෙරෙමින් මේසේද තමන් දවස වර්ධනය කොට පවත්වාගත් විසුබබුබාදි ත්‍රිවිධ රත් නොදැයෙන් පිරිසිදු කරණලද සුපරිශුබවූ ආත්මභාවයෙන් සුක් තව සුරකරාදින් සතුටු කරමින් දානසීලාදි දසපින් ක්‍රියාවන් නිර තුරුව පුර පුරා තුෂ්ණිරුවන් පුදපුද මහතොසින් පිණපිණා රජ සිරි විඳිනාවූ නෙකදිගන්තරවාප්ත කීර්ති ප්‍රබන්ධ ඇති කීර්ති ශ්‍රී

රාජසිංහාභිධාන මහ රජතුමාණන් විසින් සාදරයෙන් කරණලද
ආරාධනා ඇති, ශ්‍රඞ්ඛාසිලඛුතවත්තාල්පෙවජ්තාරණ්‍යවාසි සල්
ලේඛ ප්‍රවෘත්තිඤ්ඤානති මෛත්‍රී උපෙක්ෂාදි ලෞකික ගුණරත්නා
ලංකෘත ජිනවර ශාසනොපකාරිවූ සරණංකරාභිධාන සංඝරාජ
මහාස්ථවිර සාමීන් ධම්මෝත්තෙවාසිවූ රක්ඛිත පොෂිත විමලසීලාචාර
සම්පන්න ධානිස්මාති බහුශ්‍රැත විවක්ෂණ සුශික්ෂිත විපුලතර ශ්‍රද්ධා
විඒයාපාය කෞසල්‍ය විසුඛ බෞඛාගමඒයි දක්ෂ විචිත්‍ර කාව්‍ය
කාරක ඡන්දස් අලංකාර වෛය්‍යාකරණාදි නෛක ශාස්ත්‍රඥ ඛුත
ත්‍රිතාලෙවජ්තාදි නිඛිල තපොගුණ ගණාභරණ විභූෂිතව තමන්
හෙරණ පැවිදි කාලයෙහි පටන් යථා ශක්තීන් ආමිස ප්‍රතිපත්තීන්
බුදුන් පුදනුවේ රාජ්‍රාජ මහාමාත්‍යාදීන්ගේ සහායෙන් රිදීවිහා
රය, පනලි විහාරය, වැලිගල විහාරය, ඇතුළුවූ විහාර කර්මාන්ත
කාරවා ඒ ඒ විහාර ඝලස්සා අතිරේක විසඟස්‍ර ප්‍රමාණ සයනාසනි
නිසිදනසවරූප ජිනවරාසේඛ ප්‍රතිබිම්බ රූප අනිනව දිලි පාන් සිති
යම් වසයෙන්ද කාරවාලීමෙන් හා දර්ශනීය ශොභමානවූ වඩු
දෙලොස්රියන් නවරියන් උස ප්‍රමාණ වෛත්‍යාඒයක් හා සංඝාරාම
පුෂ්පාරාම ඵලාරාමාදී නොඅයක් කර්මාන්තද කරවා බත් මල් පහන්
ආදී ආමිස පූජා පැවැත්වීමෙනුදු සූත්‍රානිධම්විනය සංඛ්‍යාත පිටකත්‍ර
යෙහි විද්‍යමාන පෙල අටුවා ටීකාසන්න ගැටපදදි නොයෙක්
පොත්පතුදු ලියවා ධම්ය රක්ෂා කොට පැවැත්වීමෙන් හා සානි
රෙක ත්‍රිඥත ප්‍රමාණ සම්බුද්ධි ධම්දෙශනාවන් කොට ධම්දානය
දීමෙන් හා බොහෝ ශිෂ්‍යගණයා ශබ්ද ශාස්ත්‍ර ධර්මවිනයෙහි
ශික්ෂාවාලීමෙන් හා මහාසතිපට්ඨාන සූත්‍රව්‍යාඛ්‍යානයද මහාවංශාභි
ධාන සඝීඛ්ඛි මහා කාව්‍ය බඛ්ඛනයද සහ අන්‍යවූද ධර්ම ප්‍රකරණ
කිරීම් ආදි වශයෙන් ප්‍රතිපත්ති පූජාවෙන්ද, බුදුන් පිදීමෙන් යෙදී
ආත්මාර්ථ පරාර්ථ සංසිද්ධියෙහි අප්‍රමාදව වසන්නාවූ ඉනිවර ශාස
නාභිවෘඩ්වඛ්ඛනයෙහි නිරතාභිලාෂී ප්‍රතිපත්තිකාම් තපොගුණ
ගවෙෂිත සාරගුණ විභූෂිත, ධිරජන නිසෙවිත, සාධුගුණ සමන්
විත, ජිනශාසන රත්නාකරයෙහි, ප්‍රාදුර්භූත රත්නාඞ්කුර ප්‍රති
භාගවූ සිඛාර්ථි බුඛරක්ෂිත තවිනාමොපලක්ෂිත ප්‍රවරපොඝඨාරාම
යතීශ්වර මහා සථවිරයන් වහන්සේ යටින් අවීචියෙහි පටන් උඩින්
භවාග්‍රය දක්වා සරයින් අනන්නා පඤ්චත්‍ත ලෝක ධාතුයෙහි විස්
තීර්ණව පවත්නාවූ අර්හත්තාදි නවගුණ පදයන් අතුරෙන් සත්‍ය යන
අක්ෂරවයෙන් ප්‍රතිමණ්ඩිතවූ පදය ගෙණ ශ්‍රී බුඛ වර්ෂයෙන් දෙදස්
තුන්සිය සොළොස් වන්නෙහි, ශ්‍රීලංකාධිපතිවූ කීර්තිශ්‍රීරාජසිංඝ
නම් පෘථිවිඝ්වරයානන් ප්‍රභූත කොට ඇති සමස්ත ලංකාවාසින්ට
වැඩ පිණිස නොයෙක් ධම්ථ කථාවන් සත්‍ය යන අක්ෂරවයෙන්

ශබ්දයෙහි අනාගත කොට වර්ණනා කිරීම වශයෙන් තෙළෙසක් පමණ පරිච්ඡේදයෙන් ප්‍රතිමණ්ඩිත මේ ශ්‍රී සඞ්ඝමිත්‍රවංශ සංග්‍රහ කම්වූ ධර්මප්‍රකරණය කොට සම්පූර්ණ කළේය.

සම්බුද්ධ පරිනිබ්බානා විසඝසතති සතෙපන,
සොළසෙ හායනෙ පතෙත ලංකාදීපෙ මහොරමෙ.

කිත්තිස්සිරිරාජ සිහරඤ්ඤ රජ්ජං සුඝොහනං,
කරොහෙනාවාපි ධම්මෙන සිරිවඩ්ඪ පුරෙවරෙ.

සුඛාපි වෙරතො නිච්චං සඛාදි ගුණ භූසිතො,
අඛාරඤ්ඤවසනෙතායො බුඛ්ඛොවාදං සරං සදා.

අපිච්ඡාදිගුණූවජ්ජනෙතා ජිගුවජ්ජනෙතා මහිච්ඡතං,
සුසිකඛනෙතාව සිකඛාසු ජීවිතංව සදාදරෙ.

වෙය්‍යාකරණෙසු සම්බුද්ධ වචනෙසුව විසාරදෙ,
පවිපත්තිමෙව පූරෙනෙතා සඛම්ම ගරුකො තථා.

යථා ඛෙ රවි වඤ්ඤව තථා ලංකම්බරෙ වරෙ,
සරණංකරාහිධානොසි සංඝරාජාති විස්සුතො.

තස්සසිස්සසුතො ධිරො සිඛපඨ බුඛරකඛිතො,
භූසිතොවිභිතාමෙහි සීලාචාර ගුණාකරො.

සුඛබුඛගමෙ දකෙඛා සඛෙසුඛ දයාඛකො,
ලඛපඤ්ඤබලොබුඛ සාසනුඛි කරොවරො.

බහුස්සුතොමහුස්සාහො ජිනසාසන වුඩ්ඪිය,
සෙවිතො භූරිසිස්සෙහි විස්සුතොගුණ නිස්සිතො.

සීලංසිලෙන පාලෙනෙතා පාලෙනෙතා ජිනසාසනං,
ජීවිතංවිය ආජීවං සර නෙතාව නිරන්තරං.

පාරාවාර මහාරාවරිවොරූ කිත්ති පෙසලෙ,
සද්දසත්ථෙසු නෙකෙසු සිපෙපසුව විසාරදෙ.

එවංපිර ගුණූපෙතො ථෙරොපිර බුඩ්ඪිමා,
පවරූපොසථාරාමෙ යතීසර වරෙමිදං.

සඛම්මසිනිකාමෙන සඛම්මාවාද සංගහං,
අකාසිසඛ භාසාය ගිතඤ්ඤාණමපි සාධුකං.

ධම්මොපවත්තතතුවිරං සුගතපපසත්ථෝ,
සංඝොපිවෙහවතුසාධු සදා සම්ගෙහා.

දෙවොපවස්සතුජනා සුඛිතාභවනතු,
පාලෙනතු ලොකමපිධම්ම සමෙනභූපා.

විරංනිවත්තතු සබ්බෙවා දෙවෝ සම්මා පවස්සතු,
ලොකං පාලෙතාතු රාජානෝ සුඛිතා හොනතු පාණිනෝ.

නි ම්.

මෙසේ අප විසින් ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ නම්වූ මේ එකම ධර්ම්‍යාඛ්‍යාන කථාවෙහි දක්වන ලද පළමුවන ධර්මානිසංස වර්ණනා පරිච්ඡේදයෙහි, ප්‍රකරණ මහාකථාවන් හා ධර්මානිසංස වර්ණනා කථාවෝය, සද්ධර්මානුශාසනා කථාවන්ගේ විශේෂ මහත්වය හා ශ්‍රවණානිසංස ත්‍රිවිධ ශික්ෂානිශංස කථාවෝය, දෙවන සම්බුද්ධ ගුණ වර්ණනා පරිච්ඡේදයෙහි බාහිර නිධානයෙහි මාතු පොසක ධර්මාදි නොයෙක් ධර්මකථාවෝය, මහා නිධානයෙහිවූ සත් අසංඛ්‍යයක් ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂ පස්විසි දහසක් බුදුවරයන් දැක සිතින් බුදුබව පැතූ සැටි ප්‍රකාශ කථාවෝය, අතිදූරෙ නිධානයෙහිවූ නවසංඛ්‍යයක් ඇතුළත ලොව උපන් තුන් ලක්ෂ සතාසූදහසක් බුදුවරයන් දැක වාක්හෙද ප්‍රාර්ථනාවෙන්ම බුදුබව පැතූ සැටි ප්‍රකාශ කථාවෝය, දූරෙ නිධානයෙහිවූ සාරසංඛ්‍ය කප්ලක්ෂයක් ඇතුළත ලොව උපන් සුවිසි බුදුවර කෙනෙකුන් දැක සුවිසි මහා පූජාවක් කොට කායවාක් ප්‍රනිධානය මුදුන් පත්වූ සැටි ප්‍රකාශ කථාවෝය, අවිදූරෙ නිධානයෙහිවූ වෙස්සන්තර රජ්ජම පටන් බුදුවීම දක්වා පැවති බෝසත් චරිතයද ප්‍රකාශ කථාවෝය, සන්තිකෙ නිධානයෙහිවූ සත්සති යවූ සැටි හා පණස්වෙනිදා මිහිපිඩු වළඳ අවශෙෂ දවස්වල බෝමැඩට නුදුරුවූ සේනානී තම නියමගම් දිඹු පිණිස හැසිරෙමින් ඉහ්මාරාධනා වෙන් ඉසිපතන් වැඩි ප්‍රවෘත්ති කථාවෝය, එහි ධම්මක්‍රම දෙසී මෙන් පස්වග මහණුන් හා සක්වල පිරි සිටි දෙව්බඹ පිරිසට වැඩ සාදු ගසකුල පුත්‍රාදීන් හා හදුවගී රජකුමරුවන් පැවිදි කොට යශ තුන්බෑ ජටිලාදීන් දමනයෙන් පැවිදි කොට ගෙණ රජගහ නුවරට වැඩ බිම්බිසාර නරවරාදීන්ට වැඩ සැදූ ප්‍රවෘත්ති කථාවෝය, අග්‍රශ්‍රාව කාදී විසිදහසක් රහතුන් පිරිවරා කිඹුල්වත් පුරට වැඩ සුඛෝදන

කරවරාදි සියළු ම බ්‍රහ්මයන්ට වැඩ සැදූ ප්‍රවෘත්ති කථාවෝය, සැවැත් නුවර ජෙතවන පූජාරාම විහාර ප්‍රතිග්‍රහණයෙන් සඞ්ඝානුග්‍රහ කොට ගණඩඹ වෘක්ෂමූලයෙහිදී ඍද්ධිකප්‍රාතිහාර්යය දක්වා තීර්ථික දමනයෙන් දෙව්ලෝ වැඩ ප්‍රවෘත්ති කථාවෝය, තුන්මසක් මුළුල්ලෙහි දෙවිලෝ වැඩහිඳ අභිධර්ම දෙශනා කොට දෙවොරොහණයෙන් සකස්පුර දෙරටු පැමිණි ප්‍රවෘත්ති කථාවෝය, සැරියුත් සාමින් ලවා ප්‍රශ්න විසඳීනයෙන් සතුටු වූ මෛත්‍රීබෝසතාණන් වහන්සේගේ බුදුවීමට විවරණශ්‍රී දෙවා වදාළ ප්‍රවෘත්ති කථාවෝය, දෙව්ලොව බඹලොව මිනිස්ලොව වාරිකා කොට ලෝවැඩ කළ ප්‍රවෘත්ති කථාවෝය, පන්සාළිස් වසක් නිබඳනිබඳ වශයෙන් වැස්වැස සඞ්ඝානුකම්පා කොට සැවැත්නුවරදි ලොකධර්මීනාවෘයෙන් අඟසුවූ දෙදෙනා වහන්සේගේ පිරිනිවන්පෑමට අවසර දෙවා වදාරා විසාලාමහනුවර පාවාලවෛත්‍ය නම් විහාරයට වැඩ ආයුසංස්කාර හැර වදාරමින් භික්ෂුසඞ්ඝයා වහන්සේලා රැස් කොට තුන් මසකින් වන පිරිනිවන්පෑම දක්වා ඒ භික්ෂූන්ට අප්‍රමාද ව ධර්මයෙන් අවවාද කළ ප්‍රවෘත්ති කථාවෝය, පාවා නම් නුවර වුන්ද නම් කම්මාරපුත්‍ර යාගේ අඹුඋයනට වැඩ ඒ කර්මාරපුත්‍රයා විසින් දෙවෙනි දිනයට කළ ආරාධනාවෙන් ඔහුගේ ගෙට වැඩ පිණ්ඩපාත ප්‍රතිග්‍රහණයෙන් එමදු සවඳහි දුරුකතර මඟ ගෙවා කුසිනාරානුවර සල්උයනට වැඩි ප්‍රවෘත්ති කථාවෝය, ප්‍රථමයාමයෙහි සියළුම මල්ලරජදරුවන්ට අනිත්‍යතාප්‍රතිසංයුක්ත ධර්ම දෙශනා කොට අවසර දී යවා මධ්‍යමයාමයෙහි සුභද්ද පරිබ්‍රාජකයන් විනයකය කෙරෙමින් පශ්චිමයාමයෙහි භික්ෂූන්ට අනාගතය පැ ධර්ම දෙශනාකර වදාළ ප්‍රවෘත්ති කථාවෝය, බලවපවුසයෙහි පිරිනිවි පසු තුන්සතිය මුළුල්ලෙහි පැවති සියළු පූජාප්‍රවෘත්ති කථාවෝය, ධාතු බෙදූ ප්‍රවෘත්තිය හා මිනිස්ලොව දෙවිලොව නාලොව ඒ ධාතු වඩා පූජා පවත්නා ප්‍රවෘත්ති කථාවෝය.

නැවත ඒ සියළු ධාතූන් වහන්සේ ඉ ම බෝමැඩට එක්ව ධාතු පරිනිර්වාණය වීමෙහි ප්‍රවෘත්ති කථාවෝය, තුන්වන සඞ්ගායනාවෙහි පැවති සියළු පිටකත්‍රයධර්මාළි කථාවෝය, එසේම දෙවෙනි ධර්මසඞ්ගායනාවෙහි පැවති ධර්මාළි කථාවෝය, එසේ ම තුන්වෙනි ධර්මසඞ්ගායනාවෙහි පැවැති ධර්මාළි කථාවෝය, එසේ ම ථූපාරාම යෙහි සතරවන ධර්මසඞ්ගායනාවෙහි පැවැති ධර්මාළිකථාවෝය, වලගම්අබා මහරජ දවස අවුරුද්දක් මුළුල්ලෙහි පොත්වල ලියා පිහිටුවාලූ එම සියළු ත්‍රිපිටක ධර්මකථාවෝය මහාසාම රජ දවස බුද්ධඝෝෂ ස්වාමීන් විසින් ලියා පිටකත්‍ර අළුකථාවෝය, පොළොන්නරු පරාක්‍රමබාහු

මහරජ දවස මහාකාශ්‍යප සථවිරාදි දහසක් භික්ෂූන් වහන්සේ රැස් ව ලියාලූ පිටකත්‍ර විසාළු කථාවෝය, රජබල පෙරදුරි ව මහා සථවිරවරාදි මහසඞ්ඝයා වහන්සේ විසින් මෙකල් දක්වා ම සඞ්ගීය පවත්වා ආ ප්‍රවෘත්තිකථාවෝය.

මේ සියළු ම පයාප්තිධම්මාගේ අනන්ධානකථාවෝය, සතර වන සඞ්ඝගුණවණ්ණනා පරිවෙජ්දයෙහි, සුප්‍රතිපන්නාදි ලෞකික ලෝකොත්තර වශයෙන් ත්‍රිප්‍රකාර වූ සඞ්ඝගුණවණ්ණනා කථාවෝය, අසීතිමහාශ්‍රාවකයන් වහන්සේලාගේ ප්‍රවෘත්තිකථාවෝය, ශ්‍රැතබුද්ධ වරයන්ගේ ප්‍රවෘත්තිය හා අභිඥාතාදි චතුර්විධ වූ ශික්ෂාපුත්‍රයන්ගේ ප්‍රවෘත්තිකථාවෝය, ප්‍රතිවෙධ අනන්ධාන කථාවෝය, ප්‍රතිපත්ති අනන්ධාන කථාවෝය, ලිඛිත අනන්ධාන කථාවෝය පස්වන සරණාගමන පරිවෙජ්දයෙහි සරණප්‍රභෙද කථාවෝය, සරණාගමන ප්‍රභෙද කථාවෝය, ලෞකොත්තර සරණාගමනානිසංස කථාවෝය, පෘථග්ජන සත්වයන්ගේ ලෞකික සරණාගමන විමෙහි ආත්මනියාතනාදි චතුර්විධ වූ සරණාගමන ප්‍රභෙදය හා එහි ආදීනවානිසංසප්‍රකාශ කථාවෝය, සවනඅකුශල කම්පථ පරිවිජ්දයෙහි දශඅකුශලකම්පථ ප්‍රභෙදාදීනව කථාවෝය, පඤ්චදුශ්චරිත ප්‍රභෙදාදීනව කථාවෝය, පඤ්චානන්තරියකම් ප්‍රභෙදාදීනව කථාවෝය, ආයෙෂ්ඨාපවාද ප්‍රභෙදාදීනව කථාවෝය.

තුණ්ඩරුවන්හි කරණලද අනාදර විභාගාදීනව කථාවෝය පඤ්චනීවරණ පාපකම් විභාගාදීනව කථාවෝය, සත්‍රිකුශලමූල ප්‍රභෙදාදීනව කථාවෝය, කුශලාකුශලකම් දෙක්හි සම්පව සිටි ධම් ප්‍රභෙදාදි කථාවෝය, අවශෙෂ වූ ක්‍රොධාදි පාපකම් ප්‍රභෙද කථාවෝය, සූත්‍රපය්‍යායෙන් දැක්වූ එකාලෝස් කම්ප්‍රභෙද කථාවෝය, අභිධම්මපය්‍යායෙන් ශොඞශවිධවූ ද මාගිපය්‍යායෙන් වාදසවිධවූ ද කම්ප්‍රභෙද කථාවෝය, සත්වන අකුශලකම්ඵල භූමි වණ්ණනා පරිවෙජ්දයෙහි නිරයදුක්ඛ වණ්ණනා කථාවෝය, තිරච්ඡාන දුක්ඛ වණ්ණනා කථාවෝය, අසුරාපාය සහිත වූ ප්‍රෙතදුක්ඛ වණ්ණනා කථාවෝය, අටවන ශීලවිභාගානිසංස වණ්ණනා පරිවිජ්දයෙහි නිත්‍යශීල වූ පඤ්චශීල දශශීලයන්ගේ සමාදාන ක්‍රමය හා ශික්ෂාපදාදී පිළිවෙළ රක්නා ක්‍රම ප්‍රකාශ කථාවෝය, නොයෙක් ප්‍රභෙද ඇති උපොසථ ශීලයන්ගේ සමාදාන ක්‍රමය හා ඒ හැම ශීලානිසංස කථාවෝය, නවවන කුශලකම්පථ වණ්ණනා පරිවිජ්දයෙහි දාන විභාගානිසංස කථාවෝය, ශීලවිභාගානිසංස කථාවෝය, භාවනා විභාගානිසංස කථාවෝය, පූජාවිභාගානිසංස කථාවෝය, වෙය්‍යාවච්ච

විභාගානිසංස කථාවෝය, පින්දිමෙහි විභාගානිසංස කථාවෝය, පුණ්‍යානුමෝදනා විභාගානිසංස කථාවෝය, ධම්ශ්‍රවණවිභාගානිසංස කථාවෝය, ධම්දෙසනා විභාගානිසංස කථාවෝය, දුශ්චිප්‍රුකම්යෙහි විභාගානිසංස කථාවෝය, ශක්‍රසම්පත් හා සදෙවුලොව දිව්‍යසම්පත් විභාග වණ්නා කථාවෝය, බ්‍රහ්මපාරිෂද්‍යාදි විසි බඹ තලෙහි ම ආයුෂාදි ඒ ඒ බ්‍රහ්මලොක සම්පත් වණ්නා කථාවෝය, ශ්‍රාවකබොධිය ප්‍රත්‍යෙකබොධිය සම්‍යක්සම්බොධිය කෙලවර කොට ඇති ලොකොත්තර සම්පත් වණ්නා කථාවෝය, එකොළොස්වන රාජධම් වණ්නා පරිච්ඡේදයෙහි දක්වනලද රාජධම් විභාගාදි නවානිසංස සතර සංග්‍රහවස්තු ප්‍රකාශ කථාවෝය, තෙසකුණ ජාතකයෙහි ප්‍රකාශවූ තොයෙක් රාජධම්නුශාසනා කථාවෝය, අධර්මිෂ්ට රජදරුවන්ට වන අකම්වාඩිය හා ධර්මිෂ්ට රජදරුවන්ට වන අනිවාඩි කාරණා ප්‍රකාශ කථාවෝය, අප්‍රම ද ධම්නුශාසනා කථාවෝය, දෙලොස්වන ගෘහපති ධම්විභාග වණ්නා පරිච්ඡේදයෙහි ගෘහපති සංඛ්‍යාත අමාත්‍ය සිටුවරු ආදි ගෘහවාසයෙහි වසන සියල්ලවුන්ට අගතිගාමි නොව දෙලොවින් වැඩ වන පිළිවෙත් හා ඔවුනොවුන්ට වැඩ වන සේ දහැමෙන් ප්‍රත්‍යය සපයා ගෙණ පාප කම්යන් හා මේ ලොව ම වස්තු විනාස වන කාරණා පාපමිත්‍රයා දුරු කෙරෙමින් කල්‍යාණමිත්‍ර සේවනයෙන් යෙදි දෙමවුපිය ගුරුවර ශ්‍රමණ බ්‍රාහ්මණ මිත්‍රාමාත්‍ය පුත්‍රදාර දාසිදාසාදීන් දුන ඇඳින මනා ව ඔවුනොවුන් වෙතස් නො වන ලෙස පිළිපදිනා ක්‍රම ප්‍රකාශවූ කථාවෝය, දුහැමින් වස්තු රැස්කිරීමත් වස්තු බහුලවීම හා එහි මනා ව පිළිපැදීමෙන් සවඳී මෝක්ෂ සම්පත් සැදිය යුතු බව ප්‍රකාශ වූ ධර්මානුශාසනා කථාවෝය, තෙළෙස්වන සාමාන්‍ය සඞ්ඝානුශාසනා වණ්නා පරිච්ඡේදයෙහි මඞ්ගලසූත්‍රයෙහි ප්‍රකාශ සියළු මැඩව කාරණා වූ අවිනිසක් මඞ්ගල්‍ය කථාවෝය, පරාභව සූත්‍රයෙහි ප්‍රකාශ සියළු අවැඩව ම කාරණා ව සිවි දෙළසක් පමණ පිරිහීම් කාරණා කථාවෝය.

ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ පොත් වහන්සේ නිමි.